
භදන්තාචරිය ධම්මපාල ස්ථවිරපාදයන් විසින් විරචිත

## පරමත්ථදීපනී නම් වූ

# ඉතිවුත්තකට්ඨකථා

## (සිංහල පරිවර්තනය)



ප්‍රකාශනය

**බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය**

# ඉතිවුත්තකට්ඨකථා
# සිංහල පරිවර්තනය

පාලි අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉල්ලීම පරිදි භදන්තාචරිය ධම්මපාල ස්ථවිරපාදයන් විසින් විරචිත පරමත්ථදීපනී නම් වූ ඉතිවුත්තකට්ඨකථාව සිංහලට පරිවර්තනය කරන ලද්දේ පූජ්‍ය ඇස්වත්තේ රේවත හිමිපාණන් වහන්සේ විසිනි.

එක්දහස් නවසිය හැට පහේදී සසුන්ගත වූ උන්වහන්සේ අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්ම විශ්ව විද්‍යාලයෙන් ත්‍රිපිටකවේදී උපාධියද ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයයෙන් ශාස්ත්‍රපති උපාධියද ලබාගත්හ.

ඉඹුල්ගොඩ පැරකුම්දෙනියේ ශ්‍රී වීරසිංහ පිරිවෙන්හි නියෝජ්‍ය පරිවේනාධිපති වසයෙන් ද, මීරිගම ශාසන වර්ධන පිරිවෙන්හි පරිවේනාධිපති වසයෙන්ද සේවය කල උන්වහන්සේ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තක මණ්ඩලයේ පරිවර්තකයකු වසයෙන්ද අධීක්‍ෂකයකු වසයෙන්ද සේවය කරති.

"වහලය ගලවන්න" නමින් විනය පොතක්ද, දහම්පාසල් පොත්පෙළෙහි අභිධර්ම භාවනා කොටස්ද, ගිම්හාන වසන්තය නමින් රතන සූත්‍ර වර්ණනාවද, සෙනෙහසක මූර්තිය, දූවිලි සෙල්ලම, මවුපියන් ආදී ළමා පොත් පෙළක්ද උන්වහන්සේ විසින් රචනා කර ඇත.

ඉතා විශිෂ්ඨ ධර්මඥාණය-කින් හෙබි, බහුශ්‍රැත පඬිවරයෙක් වන උන්වහන්සේගෙන් ශාසන චිරස්ථිතිය සඳහා සිදුවන මෙහෙය ඉතා ප්‍රශංසනීයයි.

Vol - xxxii

භදන්තාචරිය ධර්මපාල මහා ස්ථවිරපාදයන් විසින් විරචිත

# ඉතිවුත්තකට්ඨ කථා

## (සිංහල පරිවර්තනය)

*බුද්ධශාසන අරමුදලේ භාරකාර මණ්ඩලයේ අනුග්‍රහයෙනි.*

පාලි අට්ඨකථා සිංහල පරිවර්තන - 49

භදන්තාචරිය ධර්මපාල මහා ස්ථවිරපාදයන් විසින් විරචිත

# ඉතිවුත්තකට්ඨ කථා

## (සිංහල පරිවර්තනය)

*සිංහල පරිවර්තනය*

**ඇස්වත්තේ රේවත හිමි**

**ශාස්ත්‍රපති**

*අධීක්ෂණය*

**මැදගම්පිටියේ විජිතධම්ම හිමි**

**පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ, පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ කථිකාචාර්ය**

**රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති.**

*ප්‍රකාශනය*

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.

දුරකථන: 2734256 ෆැක්ස්: 2736737

අර්ථකථාචාර්ය ධර්මපාල මහා ස්ථවිරපාදයන් විසින් විරචිත

# ඉතිවුත්තකට්ඨ කථා

(සිංහල පරිවර්තනය)

ප්‍රථම මුද්‍රණය 2008

ISBN 978-955-1604-43-1

*පරිගණක අකුරුකරණය*

උපමාලි කුලසේකර - කටුගස්තොට.

*පිටකවරය*

සුසිල් ජයශාන්ත පෙරේරා - මහරගම.

මුද්‍රණය

අජිත් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

342, පරණ කැස්බෑව පාර, රත්තනපිටිය, බොරලැස්ගමුව.

දුරකථනය: 0112517269

*ප්‍රකාශනය*

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.

දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස්: 2736737

විද්‍යුත් තැපැල: bcc456@sltnet.lk

www.buddhistcc.com

# ප්‍රස්තාවනා (අට්ඨකථා)

පාළි භාෂාව මධ්‍යතන ඉන්දු ආර්ය පූර්ව අවධියට අයත් ප්‍රාකෘත විශේෂයක් බවත්, එම ප්‍රාකෘතය වූ කලී එකල උත්තර භාරතයේ ඒ ඒ ප්‍රදේශවල පැවති පොදු ජනයාගේ කථා ව්‍යවහාරය බවත්, පිළිගත් විද්වත් මතයයි. ප්‍රාකෘත ව්‍යවහාරය පොදු ජනතාවගේ හා ශ්‍රමණ සම්ප්‍රදාය ගරු කළ චින්තකයන්ගේ ද භාෂා මාධ්‍යය විය. එය උත්තර භාරතයේ පැතිරී ගිය ඉන්දු යුරෝපීය භාෂා ව්‍යවහාරයෙන් ජනිත වූවක් සේ සැලකිය යුතුය. මෙම ප්‍රාකෘත ව්‍යවහාරයේ ලිඛිත සාධක අනුව මූල අවස්ථාවක් සේ පෙනෙන පාළි භාෂාව උත්තර භාරතයේ කිසියම් විශේෂ ප්‍රදේශයක කථා ව්‍යවහාරයේ මාධ්‍යයක් විය.

1. පාළි භාෂාව ක්‍රි.පූ. 6 වැනි 7 වැනි සියවස්වල කොසොල් රට පැවති කථා ව්‍යවහාරය පදනම් කොට ඇති වූවෙකැයි ද එය නොයෙක් ජනපදවල ජනයාගේ පොදු භාෂා මාධ්‍යය වී යැයි ද මහාචාර්ය රීස් ඩේවිඩ්ස් තුමා පවසයි.

2. පාළිය උජ්ජයිනී ප්‍රදේශයේ භාෂාව යැයි වෙස්ටර් ගාඩ් සහ ඊ කුන් සහ ඔටෝ ප්‍රොන්කේ වැනි විචාරකයෝ පවසති.

3. පාළිය මගධයේ කථා ව්‍යවහාරයයි යන බුද්ධඝෝෂ හිමියන්ගේ මතය මහාචාර්ය ගෛගර් තුමා අනුමත කරයි.

4. බුදුරජාණන් වහන්සේ මුලදී කොසොල් රට බසින් දහම් දෙසන්නට ඇතැයි සලකන වින්ටර්නීට්ස් පාළි ත්‍රිපිටකයේ භාෂාව පැරණි මගධ ව්‍යවහාරය බව පදනම් කොට වෙනත් ප්‍රදේශ ව්‍යවහාරයන්ගේ සම්මිශ්‍රණයද ඇතිව ගොඩනැගුණු බෞද්ධයන්ගේ සාහිත්‍යයික භාෂාවකැයි පවසයි.

5. බුදුන් වහන්සේ ධර්ම ප්‍රචාරයේ යෙදුණු පන්සාළිස් වසින් වැඩි කොටසක් කොසොල් මගධ ප්‍රදේශවල සැරිසැරූ බව බෞද්ධ සාහිත්‍යයේ පෙනෙන බැවින් පාළි භාෂාව කොසොල් මගධ දෙරට

කථා ව්‍යවහාරය පදනම් කොටගෙන බිහි වූවාක් සේ සැලකීමට පුළුවන් බව ඊ කුන් නම් විචාරකයා පෙන්වා දෙයි.

මෙම විග්‍රහයන් ශාස්ත්‍රීය වශයෙන් වැදගත් වන අතර විශේෂයෙන් සැලකිය යුත්තේ බුදුන් වහන්සේගේ මතයයි. බුදුරජාණන් වහන්සේ දක්වා වදාළ ආකල්ප විග්‍රහ වන්නේ මජ්ඣිම නිකායේ අරණ විභංග සූත්‍රයෙනි. මෙම සූත්‍රයෙන් පෙන්වන්නේ උන්වහන්සේ භාෂා මාධ්‍යයෙහි අනවශ්‍ය ලෙස දැඩිව එල්බ ගත් ශාස්තෘවරයෙකු නොවන බවයි. එකම දෙය විවිධ ජනපදවල නාම කීපයකින් හඳුන්වනු ලබන කල ඒ එක නාමයක් දැඩිව අල්ලා නොගෙන ඒ ඒ ලෙසට ව්‍යවහාර කළ යුතු බවත් ලෝක ව්‍යවහාරය නොඉක්මවිය යුතු බවත් අරණ විභංග සූත්‍රයෙහි උගැන්වෙයි.

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ත්‍රිපිටකය සංගීත වූ භාෂාව වන පාළි භාෂාව ථේරවාදීන්ගේ ආගමික භාෂාව විය. එය සමස්ත ත්‍රිපිටකය පුරා රැඳී ගියේය. ථේරවාදීන්ගෙන් බිඳී ගිය මහායානිකයෝ බුද්ධ ධර්මය සංස්කෘතයට පෙරළා ගත්හ. ඔවුන්ගේ සංස්කෘත සාහිත්‍යය දියුණුවීමත් මුස්ලිම් ආක්‍රමණ වැනි ආක්‍රමණත් මහායානික දර්ශනය විශ්ව විද්‍යාල මගින් රට මුළුල්ලෙහි බෙදා හැරීමත්, මහායානිකයන් ආමිස පූජා යන්ත්‍ර, මන්ත්‍ර ආදියෙන් පෘථග්ජන ප්‍රසාදය දිනාගැනීමත්, භික්ෂු විනය නීති ලිහිල් ලෙස මහායානිකයන් විසින් සකස් කිරීමත් ආදිය නිසා බුද්ධ ධර්මයත් පාළි භාෂාවත් බුද්ධජන්මභූමියෙන් අතුරුදහන් විය. එය ශ්‍රී ලංකාදීපයේ තහවුරු විය.

## හෙළඅටුවා

සම්බුද්ධ පරිනිර්වාණයෙන් දෙසිය පන්තිස් වැන්නෙහි අශෝක අධිරාජයාගේ දායකත්වයෙන් පැලලුප් නුවරදී තුන්වන සංගායනාව පැවැත්විය. මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රහතන් වහන්සේලා දාහක් සම්බන්ධ වෙමින් මෙම සංගායනාව පවත්වා ඇත. සාහස්සිකා නමින් හඳුන්වන මෙම සංගායනාව නව මසකින් සම්පූර්ණ විය.

තෘතිය සංගායනාවසානයේ දඹදිව ථේරවාදාචරිය පරම්පරාවේ අවසන් පුරුෂයා වූ මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ ශිෂ්‍ය

මිහිඳු මහ රහතන් වහන්සේ විසින් තෘතීය සංගායනාවේදී තෝරා බේරා ගෙන සංග්‍රහ කළ, ථේරවාදී ත්‍රිපිටකය ශ්‍රී ලංකාවට ගෙන එන ලදී. මිහිඳු හිමියන් විසින් ලක්දිවට ගෙන එන ලද පාළි ත්‍රිපිටකය මහා අරිට්ඨ රහතන් වහන්සේ ප්‍රමුඛ කොට ඇති සිංහල භික්ෂූන් වහන්සේලා උගත්හ. පාළියෙන් තිබූ ත්‍රිපිටකයේ ගැටලු තැන් සිංහල ජනතාවට පැහැදිළි කර දීම අවශ්‍ය විය. බුද්ධ කාලයේ සිට වාචනා මාර්ගයෙන්, ආචාර්ය පරම්පරා වලින් පැවත ආ අර්ථ විවරණ ක්‍රම මිහිඳු හිමියන්ගෙන් සිංහල භික්ෂූන් වහන්සේලා උගෙන ත්‍රිපිටකයේ ගැටලු තැන් හෙළ බසින් අරුත් විවරණය කළහ. හෙළටුවා නමින් මේවා හඳුන්වයි.

අටුවා වනාහි ත්‍රිපිටකයට අයත් පොත් වලට ලියා ඇති ව්‍යාඛ්‍යාන සංග්‍රහ සමූහයයි. අටුවාවල පරමාර්ථය පෙළෙහි ඇති දුරවබෝධ වචන සහ ධර්මයේ ගැඹුරු තැන් විස්තර කිරීමත් අවශ්‍ය තැන්වලදී විස්තරාර්ථ සැපයීමත්ය. මෙම පරමාර්ථයෙන් ලියන ලද හෙළටුවා නම්,

**මහා අට්ඨකථා**
**කුරුන්දි අට්ඨකථා**
**පච්චරිය අට්ඨකථා** නම් වේ.

හෙළ අටුවා අතුරින් ප්‍රමුඛ ස්ථානය දරුවේ මහා අට්ඨකථාව හෙවත් මූල අට්ඨ කථාවයි. බුද්ධඝෝෂ හිමියන්ගේ අට්ඨ කථා සියල්ලටම පාහේ ශරීරය කරගෙන ඇත්තේ මෙම අටුවාවයි. තුන් පිටකයටම අයත් අට්ඨ කථාවන්හි මහා අට්ඨකථාව ගැන සඳහන් වන බැවින් එය තුන්පිටකයම අළලා සකස් වුනු හෙළටුවාවක් වශයෙන් සැලකිය හැකිය. වස්තු විෂය අතින් සෙසු හෙළටුවාවන්ට වඩා පරිපූර්ණ වී තිබුණ මහා අට්ඨකථාවේ ලක්දිව සිදුවූ දේ පිළිබඳව බොහෝ වෘතාන්ත ද සඳහන්ව තිබුණ බව සිතා ගත හැකිය.

මහා පච්චරිය අට්ඨකථාවට එම නම ලැබුනේ පච්චරියක් හෙවත් පහුරක් උඩදී එය ලියන ලද බැවිනි. කුරුන්දිවේලු විහාරයේදී ලියන ලද හෙයින් කුරුන්දි අටුවා නම් විය.

මෙම ප්‍රධාන හෙළටුවාවන්ට අමතරව තවත් අටුවා කීපයක් දක්නට ඇත. අන්ධ අට්ඨකථාව එයින් එකකි. දකුණු ඉන්දියාවේ කාඤ්චිපුර

(කොන්ජිවරම්) යෙහි පැවති අටුවාවයි. එය ආන්ධ්‍රා භාෂාවෙන් ලියා ඇතැයි සැලකේ.

## බුද්ධඝෝෂ හිමි

දඹදිව බෝමැඩට නුදුරු ඝෝෂ නම් ග්‍රාමයේ බමුණු කුලයක උපත ලද බුද්ධඝෝෂ වාදයෙහි දක්ෂ වූ රේවත නම් මහා තෙරපාණන් වෙත පැවිදි වූ බව ප්‍රචලිත මතයයි. බුද්ධඝෝෂ මහාබෝධි මණ්ඩපයට දකුණුදිග බමුණුගම උපන් බව සද්ධම්මසංගහ නම් පොතෙහි සඳහන් වේ. බෝමැඩට නුදුරෙහි ඝෝෂ නම් වූ ගමේ උපන් බව බුද්ධඝෝසුප්පත්ති නම් කථාවේ ද සඳහන් වේ. මෙවැනි විවිධ කරුණු විමංශනයෙන් පසුව බුද්ධඝෝෂ ජන්ම භූමිය මොරණ්ඩඛේටක නම් ගම බව පිළිගෙන ඇත. ආන්ධ්‍ර දේශයේ ගුන්ටූර් දිස්ත්‍රික්කයේ පාල්නාඩ් තලුන් පෙදෙසේ "කෝටනේමලී පුරිගුන්ඩලු පල්ලි" යන ලඟ පිහිටි ගම් දෙක මොරන්ඩඛේටක යැයි පැවසේ. උන්වහන්සේ උපන් පෙදෙස මොරන්ඩඛේටක යැයි විසුද්ධි මග්ගයෙන් පෙනේ. මජ්ඣිමනිකායට්ඨ කථාවේ කර්තෘ සංදර්ශක ගාථාවක මයූර සුත්ත පට්ඨන හෝ මයූර රූප පට්ඨන සඳහන් වන බැවින් එතුමා එහි විසූ බව ද සිතිය හැකිය.

ව්‍යාකරණ විෂයෙහි ද දර්ශන ශාස්ත්‍රයෙහි ද වෛදික ග්‍රන්ථ විෂයෙහි ද ඉතිහාස පුරාවිද්‍යා විෂයෙහිද කාය ව්‍යවච්ඡේද විද්‍යාවන් හීද ලක්ෂණ ශාස්ත්‍රයෙහිද පැතිරී ගිය බුද්ධි ප්‍රභාවයක් එතුමා කෙරෙහි පැවති බව පැහැදිලිය. බුද්ධඝෝෂ හිමියන් ලංකාවට පැමිණීමට පෙර ඥාණෝදය නම් ධර්ම ප්‍රකරණයත් අත්ථසාලිනී අටුවාවත් දඹදිව දී කළ බවද සඳහන්ය. බුද්ධෝඝෝෂ හිමියන් කලින් සර්වාස්ති වාදියෙකුව සිට පසුව ථේරවාදී වූ බව ඇතැම් විචාරකයන්ගේ පිළිගැනීමයි.

බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට පැමිණියේ අනුරාධපුරය රාජධානිය කරගත් මහානාම රජ දවසය. බුද්ධවර්ෂ 953-975 අතර කාලයේය. උන්වහන්සේ ලංකාවට වඩින විට අට්ඨකථා සංහිතා කීපයක්ම මේ දිවයිනේ පැවති බවත් ඒවා හෙළ බසින්ම උගත් බවත් මෙයින් සමහරක් ග්‍රන්ථ ස්වරූපයෙන්ද සමහරක් පූර්වාචාරීන්ගේ මතවාද ඇතුලත් වුන සාහිත්‍යය වශයෙන්ද පැවති බවත් ආචාර්ය අදිකාරම් මහතා පවසයි.

මිහිඳු හිමියන් දවසම ආරම්භ වූ සිංහල අටුවා කථා වසර 700ක පමණ කාලයක් සිංහල ත්‍රිපිටකය හෙළි පෙහෙළි කරමින් පැවතියහ. ත්‍රිපිටක පාළියට සිංහල අටුවා ලියා ඇති බව දඹදිව විසූ රේවත හිමියන්ද දැන ගැනීමෙන් සිංහල අටුවා පාළියට පරිවර්තනය කිරීම, බුදුදහම චිරස්ථායී වීමට හේතුවක් යැයි උන්වහන්සේ ද සලකා හෙළටුවා පාළියට පරිවර්තනය කිරීම සඳහා බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට එවන්න ඇතැයි සැලකිය හැකිය.

බුද්ධඝෝෂ හිමියන් මෙහි පැමිණ බුදුන් වදාල දෙලක්‍ෂ පන්සැත්තෑ දහස් දෙසියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් ඇති ආගමයට තුන්ලක්‍ෂ එක්සැටදහස් සත්සියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් පමණ අටුවා කථා ලියා ආගමයෙහි පහන් නැගූ සේකැයි දත යුතු යැයි පූජාවලියේ සඳහන්ව තිබේ.

සංස්කාරකයෙකු හා අනුවාදයකු වශයෙන් බුද්ධඝෝෂ හිමියන්ගේ කාර්යය වූයේ තමන් ඉදිරියෙහි වූ හෙළටුවාවන්හි අන්තර්ගත වූ විවරණ වෙනස් කිරීම නොව, ඒවා සකස් කිරීම සහ අවශ්‍ය ස්ථාන පිඬු කරමින්, අවශ්‍ය ස්ථාන විස්තරාර්ථ දක්වමින්, විධිමත්ව සුගමව පාළි භාෂාවට නැගීමයි. බුද්ධඝෝෂ හිමියන්ට අට්ඨකථා සකස් කරන්නට මහාවිහාරයෙන් ඉඩ ලැබී ඇත්තේ මහාවිහාර වාචනා 'මාර්ගයට විරුද්ධ මත ඒවායේ ඇතුලත් නොවිය යුතුය' යන කොන්දේසිය ද සහිතවය.

"මහා අට්ඨකථාව ශරීරය කොටගෙන මහාපච්චරිය කුරුන්දි ආදී විශ්‍රැතඅර්ථ කථාවන්හි යම් විනිශ්චයක් වේද එහි යුක්තාර්ත සහ ඇතුලත් වන්නා වූ ස්ථවිර වාදයද අත්නොහරිමින් සංවර්ධනය හොඳින් ආරම්භ කරන්නෙමු."

තව ද එම අර්ථ කථාවලින් භාෂාන්තරය පමණක් අත්හැර විස්තර තැන් පිඬුකොට සියලුම විනිශ්චයන් ඇතුලත් කොට කිසිම තන්හි යුත් අත් නොඉක්මවා සංවර්ණනය කරන්නෙමු යි බුදුගොස් හිමියෝ පවසති.

බුද්ධඝෝෂ හිමියන් විසින් කරන ලද අට්ඨකථා සියල්ලම මිහිඳු මාහිමියන් විසින් ලක්දිවට ගෙන එන ලදුව මහා විහාරිකයන් විසින් ආරක්ෂා කරනු ලැබූ හෙළටුවාවන්හි පාළි අනුවාද බවත් මහා අට්ඨකථාවේ සාරය ගෙන පාළි අට්ඨකථා රචිත බවත් මෙම අට්ඨකථාවල සඳහන් වේ.

මේ අනුව බුදුගොස් හිමියන්ගේ කාර්යය වූයේ බුදුසමය පිළිබඳව අමුතුවෙන් පොත් ලිවීම නොව එතෙක් හෙළටුවාවන්හි ආ කරුණු විධිමත්ව හා සුගමව පාළි භාෂාවට නැගීම වෙයි. පාළි අටුවා පොත්වලින් අඩකටත් වඩා සපයා ඇත්තේ බුදුගොස් හිමියන් විසිනි. බෞද්ධ අට්ඨකථාචාරීන් අතුරෙන් එතුමා ශ්‍රේෂ්ඨතමයායි. එතුමාගේ ජීවන චරිතය වටා විවිධ ජනප්‍රවාද ගෙතී ඇත්තේ ඒ නිසාමය. එතුමා මෙලොව පහළ වූයේ බුදුන්ගේ පර්යාප්ති ශාසනය දීර්ඝ කාලයක් නිර්මලව පවත්වාගෙන යාම සඳහා පාළි අට්ඨකථා ලිවීමටමය යන ජන ජනප්‍රවාදයක් ද ඇත.

## අටුවා විස්තරය

### විනය පිටකය

| | පෙළ | | අටුවාව | කර්තෘ | කාලය |
|---|---|---|---|---|---|
| උභය විභංග | 1 පාරාජිකා පාළි | 1 ආණා දෙසනා | සමන්තපාසාදිකා | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| | 2 පාචිත්තිය පාළි | 2 යථාපරාධ සාසන | විනය අට්ඨකථා | | |
| ඛන්ධක | 3 චුල්ල වග්ග පාළි | 3 සංවරාසංවර කථා | | | |
| | 4 මහාවග්ග පාළි | | | | |
| පරිවාර | 5 පරිවාර පාළි | | | | |
| | | භික්ඛුපාතිමොක්ඛ | කඞ්ඛා විතරණී | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| | | භික්ඛුණී පාතිමොක්ඛ | (මාතිකට්ඨ කථා) | | |

### අභිධර්ම පිටකය

| | | | | |
|---|---|---|---|---|
| 1 ධම්මසංගණිප්පකරණ | 1 පරමත්ථ දේසනා | අත්ථසාලිනී | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| 2 විභංගප්පකරණ | 2 යථාධම්ම සාසන | සම්මොහ විනොදනී | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| | 3 නාමරූප පරිච්ඡේද කථා | | | |
| 3 කථාවත්ථුප්පකරණ | | | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| 4 පුද්ගලපඤ්ඤත්තිප්පකරණ | | | | |
| 5 ධාතුකථාප්පකරණ | | පරමත්ථදීපනී | | |
| 6 යමකප්පකරණ | | පඤ්චප්පකරණට්ඨකථා | | |
| 7 පට්ඨානප්පකරණ | | | | |

## සූත්‍ර පිටකය

| | | | |
|---|---|---|---|
| 1 දීඝනිකාය | 1 වොහාරා දේශනා | සුමංගල විලාසිනී | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 2 මජ්ඣිමනිකාය | 2 යථානුලෝමසාසන | පපඤ්ච සූදනී | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 3 සංයුක්තනිකාය | 3 දිට්ඨී විනිවෙඨන කථා | සාරත්ථප්පකාසිනි | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 4 අංගුත්තරනිකාය | | මනෝරථපූරණී | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 5 ඛුද්දක නිකාය | | | |
| 1 ඛුද්දකපාඨ | පරමත්ථ ජෝතිකා | | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 2 ධම්මපද | ධම්මපදට්ඨ කථා | | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 3 උදාන | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 4 ඉතිවුත්තක | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 5 සුත්තනිපාත | පරමත්ථ ජෝතිකා | | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 6 විමානවත්ථු | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 7 පේත වත්ථු | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 8 ථේර ගාථා | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 9 ථෙරී ගාථා | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 10 ජාතක | ජාතකට්ඨකථා | | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 11 නිද්දේස (චුල්ල-මහා) | | සද්ධම්ම ජෝතිකා | උපසේන ආචාර්ය 6වන ශ.ව. |
| 12 අපදාන (ථේර-ථෙරී) | | විසුද්ධ ජන විලාසනී | මහානාම ආචාර්ය 7වන ශ.ව. |
| 13 පටිසම්භිදා මග්ග | | සද්ධම්මප්පකාසිනී | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 14 බුද්ධවංස | | මදුරත්ථප්පකාසිනි | බුද්ධදත්ත හිමි 5වන ශ.ව. |
| 15 චරියාපිටක | | පරමත්ථ දීපනී | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| | | විසුද්ධි මග්ග | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| නෙත්තිප්පකරණ | නෙත්තී අට්ඨකථා | | ධර්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| චතුභාණවාරපාළි | චතුභාණවාර අට්ඨකථා | | ආනන්ද වනරතන 8වන ශ.ව. |

බුද්ධඝෝෂ හිමියන් විසින් පාළියට නොනගන ලද අට්ඨ කථා පාළියට නගන ලද්දේ බුද්ධදත්ත ධම්මපාල උපසේන සහ මහානාම තෙරවරුන් විසින්ය.

## බුද්ධදත්ත හිමි

බුද්ධඝෝෂ හිමියන්ගේ සමකාලීනයෙකි. මධුරත්ථ විලාසිනි නම් බුද්ධවංශ අටුවාව උන්වහන්සේ ලියා ඇත.

### උපසේන හිමි

සද්ධම්මජෝතිකා නම් නිද්දේශ අට්ඨකථාව මහාපරිවේනවාසී උපසේන හිමියන් විසින් කරන ලදි.

### මහානාම හිමි

පටිසම්භිදාමග්ග අට්ඨකථාව වන සද්ධම්මප්පකාසනිය මුන්වහන්සේ විසින් ලියන ලදී.

### ධම්මපාල හිමි

පරමත්ථදීපනී අට්ඨකථා - උදාන - ඉතිවුත්තක - විමානවත්ථු - ප්‍රේතවත්ථු - ථෙර ථෙරී ගාථා අට්ඨකථා මුන්වහන්සේ ලියන ලදී.

මෙම අට්ඨකථාවන් උගෙන ඒවා ආරක්ෂා කළ අය අට්ඨකථිකා නමින් හඳුන්වා ඇත. අට්ඨකථාචරියා යනු අට්ඨකථා සම්පාදනය කළ ආචාර්යවරයෝය. ආචරිය වාද, ආචරිය මත, ආචරිය වාද යන නම්වලින් කියවෙන්නේ අට්ඨකථාවන් මැයි.

අට්ඨකථාවන් පිළිබඳ විවිධ විවේචන හා මතවාද උගතුන් අතර පවතී. මෑතකාලීන වියතුන් අතුරින් අග්ගමහාපණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ එවැනි විවේචකයෙකි. උන්වහන්සේගේ අටුවා පරීක්ෂණ නම් පොතෙන් එවැනි විවේචන ඉදිරිපත් කර ඇත. අටුවාකථා බුදුන් වහන්සේගේ දේශනා නොවන බව කවුරුත් පිළිගනිති. අටුවාචාරීන් වහන්සේලා අතරද විවිධ මතභේද තිබූ බව දක්නට ඇත. වසර හත්අට සියයක් ගෙන ආ ලිඛිතව නොතිබූ අර්ථ කථා සාහිත්‍යයට එවැනි දේ ඇතුළත් වන්නට පහසුකම් තිබේ. මිහිඳු හිමියන් විසින් ගෙන එන ලද පාළි විවරණ මහාවිහාරික භික්ෂූන් විසින් සිංහලට පරිවර්තනය කොට එම හෙළටුවා පස්වන සියවසේ බුද්ධඝෝෂ හිමියන් විසින් නැවත පාළි භාෂාවට පරිවර්තනය කළ බව පිළිගත් සම්ප්‍රදායයි. මේ තැන්වලදී එම මතිමතාන්තර ඇතුළත් වන්නට ඇති බව සිතිය යුතුය.

මහාවිහාරීය සම්ප්‍රදාය එකකි. අභයගිරි ජේතවන පරම්පරා හිද එවැනි සම්ප්‍රදායන් පැවතුණු බවට සැකයක් නැත. ස්වකීය පාරම්පරික මතවලට පටහැනි සූත්‍ර ධර්මයන් පෙළෙහි ඇති බව දැන දැනත් සිය මතය

තහවුරු කරනු සඳහා ඒවා මදකිනිදු වෙනස් නොකර, ඉවත් නොකර, සංගායනාවලදී පැවති තත්ත්වයෙන්ම ත්‍රිපිටකය රැකගෙන ඒම ගැන මහාවිහාරීය පරම්පරාවට බෞද්ධයාගේ ප්‍රණාම පූර්වක ගෞරවය හිමිවිය යුතුය.

මේ අන්දමින් පැවතගෙන ආ අට්ඨකථා අපේ හාමුදුරුවරු තවත් වර්ෂ සිය ගණනක් තම ආරාමවල පොත්ගුල්වල තබා පුස්තකාලවල තැන්පත්කොට උදේ සවස සුවඳ දුම් අල්ලා ධර්ම ගෞරවයෙන් ධර්ම රත්නය රැකගෙන ආහ. අනගාරික ධර්මපාලතුමාගේ ජාතික ආගමික වැඩපිළිවෙළ ආරම්භ වීමෙන් පසුව එතුමාගේම පවුලේ නෑයන් විසින් අට්ඨකථා මුද්‍රණය කිරීමේ වැඩපිළිවෙළ ආරම්භ කර ඇත. ඒ ධර්මපාලතුමා විසින් ඇතිකරන ලද ආගමික ප්‍රබෝධයේ එක් ආභාෂයකි. 1916 ජූලි 05 දින **ත්‍රිපිටක මුද්‍රණසභා** නම් ආයතනයක් සයිමන් ඇලෙක්සැන්ඩර් හේවාවිතාරණ මහතුන්ගේ මැදහත්වීමෙන් කොල්ලුපිටියේ පාම් හවුස්හි පිහිටුවා ඇත. 1929 ජූනි 29 දින මෙම ත්‍රිපිටක සභාවේ රැස්වීමක් කොළඹ ඩික්මන් පාරේ තක්සලාහිදී පවත්වා තිබේ. මෙම රැස්වීමට අති පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල මහා නාහිමියන්ද, රත්මලානේ ශ්‍රී ධම්මානන්ද ධර්මාලෝක නායක හිමියන්ද ප්‍රධාන පණ්ඩිත ධර්මධර භික්ෂූන් වහන්සේලා 25 නමක් සහභාගී වූ බව සඳහන් වේ. අනගාරික ධර්මපාලතුමා ප්‍රධාන සාසනමාමක පිරිස්ද මෙම රැස්වීමට සහභාගී වී ඇත. මෙම නායක පණ්ඩිත ස්වාමීන් වහන්සේලා එක් එක් අටුවා ග්‍රන්ථ සංස්කරණය භාරගත් බවද සඳහන් වේ.

සයිමන් හේවාවිතාරණ මහතාගේ අභාවයෙන් පසුව සෝමලතා හේවාවිතාරණ ළමාතැනී විසින් ත්‍රිපිටක මුද්‍රණය සඳහා අරමුදල පිහිටුවීය. එම අරමුදල මගින් හේවාවිතාරණ අට්ඨකථා ග්‍රන්ථ සමූහය මුද්‍රණය කර ඇත. ආගම ධර්මය, ඉතිහාසය, පුරාවිද්‍යාව, සාහිත්‍යය ආදී ශ්‍රී ලංකා සංස්කරණ විවිධ ක්ෂේත්‍රයන් පර්යේෂණාත්මක අධ්‍යයනවලට යොමු කරමින් ශාස්ත්‍රීය පොතපත සපයා සංස්කෘතිය පිළිබඳව අවබෝධයක් ජනතාවට ලබාදීමේ අරමුණින් 1845 දී ආරම්භ කළ ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ සිංහල අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය මගින් පොත් දහයක් මුද්‍රණය කිරීම මහඟු කාර්යයකි.

අභාවයට යන පැරණි බෞද්ධ පොත්පත් හා අලුතින් ලියැවෙන බෞද්ධ පොත්පත් මුද්‍රණය කරවීමත් ඉංග්‍රීසි බෞද්ධ පොත්පත් සිංහලට

පරිවර්තනය කර මුද්‍රණය කිරීමත් පරපුරෙන් පරපුරට බුද්ධ ධර්මය ගෙන යාමත් බෞද්ධ සංස්කෘතියේ ආරක්ෂාවත් සඳහා පිහිටුවා ඇති අප ආයතනය වන බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් බුද්ධ ජයන්ති ත්‍රිපිටකයේ පුනර්මුද්‍රණය නිමවීමෙන් පසු අට්ඨකථා සිංහලට පරිවර්තනය කොට මුද්‍රණය කිරීමට ප්‍රතිපත්ති සකස් කරන ලදී. සිංහලෙන් මුද්‍රණය අවසන් කොට අටුවා කථා ඉංග්‍රීසියට පරිවර්තනය කර මුද්‍රණය කිරීම අපේ අදහසයි.

"කථා පවත්තිනී" නම් පාඨයක් ත්‍රිපිටකයේ අංගුත්තර නිකායේ සඳහන් වෙයි. ධර්මදේශකයා පෙළත් අටුවාවත් දනී නම් දහම් අසන්නා පෙළත් අටුවාවත් දනී නම් දහම් දෙසන්නාත් අසන්නාත් දෙදෙනාම පෙළත් අටුවාවත් දනීනම් එම ධර්ම දේශනාව සාර්ථක දේශනාවක් වන බව මෙහි සාමාන්‍ය අදහසයි. තථාගත ධර්මය වඩාත් ප්‍රකට වීම විවෘත වීම එහි පැවැත්මට හා උත්තරීතර භාවයට හේතුවන බව සඳහන්ය. මෙම කරුණු පිළිබඳ විමසිලිමත් වනවිට අට්ඨකථා පරිවර්තනයේ හා මුද්‍රණයේ අවශ්‍යතාව වඩාත් පැහැදිලි වන්නේය. එයට අමතරව විශ්ව විද්‍යාලවල පාළි හා බෞද්ධ අධ්‍යයනාංශවල උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ට විෂය නිර්දේශානුකූල අට්ඨකථාවල සිංහල පරිවර්තන නොමැතිකමේ බාධාවද, එම ගුරු ශිෂ්‍ය දෙපිරිසටම මේ මගින් දුරු කිරීමද අපේ පරමාර්ථයකි.

අපගේ ඉල්ලීමද පූජ්‍ය රාජකීය පණ්ඩිත වැළමිටියාවේ කුසලධම්ම නාහිමියන්ගේ අනුශාසනාවද අනුව අටුවා කථා සිංහලට පරිවර්තනය කර මුද්‍රණය කරවීමේ භාරදූර කර්තව්‍යය ශ්‍රී ලංකා ජනරජයේ වර්තමාන ආගමික අමාත්‍යාංශය මගින් ඉතාම කෙටි කාලයක් තුළ අවසන් කිරීම සඳහා අපට පවරන ලදි. බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය මගින් අප දැක්වූ ආදර්ශයත් ගොඩනැගූ විශ්වාසයත් මෙයට හේතු වූ බව නිසැකය. මෙම කාර්යය අපට පැවරීම පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ ගරු ජනාධිපතිතුමන්ට, ගරු අගමැතිතුමන්ට, ගරු බුද්ධශාසන නියෝජ්‍ය ඇමතිතුමන්ට, ආගමික අමාත්‍යාංශයේ ලේකම් මහතාට සහ අමරහේවා මද්දුම මහතාට ද අපේ කෘතඥතාවය, පුණ්‍යානුමෝදනාපූර්වකව පළකරමු.

අටුවා පරිවර්තනයේදී ආමිෂ ලාභයම නොව ශාසනික සේවයම සලකා එක් එක් පොත භාරගෙන මැනවින් සිංහලට පරිවර්තනය කරදුන් පණ්ඩිත ස්වාමීන් වහන්සේලාට ද, උගත් ගිහි මහතුන්ට ද අපගේ

කෘතඥතාව හිමිවේ. සිංහල අටුවා පරිවර්තන සමීක්ෂණය කළ උගත් ගිහි පැවිදි දෙපිරිසටම අපගේ කෘතඥතාව හිමිවේ.

අටුවා කථා පරිවර්තන කාර්යය සම්බන්ධීකරණය කරමින් කටයුතු කළේ විජිතනන්ද සරත්චන්ද්‍ර මහතාය. එම ග්‍රන්ථාවලිය මුද්‍රණය කරවීමේ කාර්යය භාරවූයේ අප ආයතනයේ මුද්‍රණ කටයුතු අධ්‍යක්ෂ පාලිත ලියනගේ මහතාටය. මෙම මහත්වරු දෙපළම ඉතා උනන්දුවෙන් මෙම කටයුතුවල නියැලීම පිළිබඳව එම මහත්වරුන්ටද මාගේ කෘතඥතාවය පළවේ. මෙයට අමතරව මෙම කාර්යයට හොඳහිතින් අවංකව සහාය දුන් සියලු දෙනාටම පින් පුරවමින් ආසිරි පතම්හ.

මෙයට,

ශාසනස්ප්‍රීතිකාමී,

**කිරම විමලජෝති ස්ථවිර,**
**අධ්‍යක්ෂක, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,**
නැදිමාල, දෙහිවල.

# බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තක මණ්ඩලය

පූජ්‍ය රාජකීය පණ්ඩිත ආඳාවල දේවසිරි නායක මාහිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත යාලේගම චන්දකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත වටගෙදර විමලබුද්ධි හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත විදුරුපොල ආනන්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත හත්තොටුවේ ඉන්දරතන හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පල්ලේගම සමිත හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මාවතානේ සෝමින්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බලපිටියේ සිරිසීවලී හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පන්නල සුමේධ හිමිපාණන් වහන්සේ

| | |
|---|---|
| රාජකීය පණ්ඩිත | කීර්ති නාරම්පනාව මහතා |
| ශාස්ත්‍රවේදී | ඇන්.එච්. පෙරේරා මහතා |
| පණ්ඩිත | ජේ.පී. නිමල්ලාල් රංජිත් මහතා |
| පණ්ඩිත | ටී.ජී. ජයතිලක මහතා |
| පණ්ඩිත | ඒ.ඇම්.ඩී.වයි. සරත්චන්ද්‍ර අමරතුංග මහතා |
| පණ්ඩිත | බී.ඇම්.පී. බාලසූරිය මහතා |
| පණ්ඩිත | සෝමරත්න ගම්ලත් වෙලගෙදර මහතා |
| පණ්ඩිත | දයා ගුණසේකර මහතා |
| පණ්ඩිත | ඩබ්ලිව්. ඇල්.පී. ධර්මදාස මහතා |
| පණ්ඩිත | ජිනදාස ගොඩකන්ද මහතා |
| පණ්ඩිත | පී.ඇල්.කේ. පෙරේරා මහතා |

**සම්බන්ධීකරණය:-** විජිතනන්ද සරත්චන්ද්‍ර මහතා

# බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තක සමීක්ෂණ මණ්ඩලය

1. පූජ්‍ය මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ (පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
2. පූජ්‍ය කොටියාගල උපරතන හිමිපාණන් වහන්සේ (කැලණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
3. පූජ්‍ය මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
4. පූජ්‍ය ඇස්වත්තේ රේවත හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
5. හේමචන්ද්‍ර දිසානායක මහතා. (ශාස්ත්‍රවේදී)
6. පණ්ඩිත දයා ගුණසේකර මහතා (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව)
7. පණ්ඩිත ඒ ලසිත් නලන්ත මහතා (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව)
8. පණ්ඩිත සිරිමෙවන් සේනක මහතා (ශාස්ත්‍රවේදී)
9. අභිධර්මාචාර්ය බුද්ධික විජේසිංහ මහතා (ශාස්ත්‍රවේදී-විද්‍යාවේදී)

# පටුන


| | | | පිටු අංක |
|---|---|---|---|
| | **ඒකක නිපාත වර්ණනාව** | | 01-137 |
| | **ප්‍රථම වර්ග වර්ණනාව** | | 01-82 |
| | නිදාන වර්ණනාව | | 01-47 |
| 1 | පළමු (ලෝභ) | සූත්‍ර වර්ණනාව | 47-62 |
| 2 | දෙවන (දෝස) | සූත්‍ර වර්ණනාව | 62-68 |
| 3 | තෙවන (මෝහ) | සූත්‍ර වර්ණනාව | 69-70 |
| 4 | සිව්වන (කෝධ) | සූත්‍ර වර්ණනාව | 71- |
| 5 | පස්වන (මක්ඛ) | සූත්‍ර වර්ණනාව | 71-72 |
| 6 | හයවන (මාන) | සූත්‍ර වර්ණනාව | 72-76 |
| 7 | සත්වන (සබ්බ පරික්ඤ්ඤා) | සූත්‍ර වර්ණනාව | 76-80 |
| 8 | අටවන (මාන පරික්ඤ්ඤා) | සූත්‍ර වර්ණනාව | 81-82 |
| 9 | නවවන (ලෝභ පරික්ඤ්ඤා) | සූත්‍ර වර්ණනාව | 82- |
| 10 | දසවන (දෝස පරික්ඤ්ඤා) | සූත්‍ර වර්ණනාව | 82- |
| | **දෙවන වර්ග වර්ණනාව** | | |
| 1 | පළමු (මෝහ පරික්ඤ්ඤා) | සූත්‍ර වර්ණනාව | 82- |
| 2 | දෙවන (කෝධ පරික්ඤ්ඤා) | සූත්‍ර වර්ණනාව | 82- |
| 3 | තෙවන (මක්ඛ පරික්ඤ්ඤා) | සූත්‍ර වර්ණනාව | 82- |
| 4 | සිවුවන (අවිජ්ජා නීවරණ) | සූත්‍ර වර්ණනාව | 83-85 |
| 5 | පස්වන (තණ්හා සංයෝජන) | සූත්‍ර වර්ණනාව | 86-88 |
| 6 | හයවන (පළමු සේඛ) | සූත්‍ර වර්ණනාව | 88-94 |
| 7 | සත්වන (දෙවන සේඛ) | සූත්‍ර වර්ණනාව | 94-98 |
| 8 | අටවන (සංඝභේද) | සූත්‍ර වර්ණනාව | 98-101 |
| 9 | නව වන (සංඝ සාමග්ගි) | සූත්‍ර වර්ණනාව | 102-103 |
| 10 | දසවන (පදුට්ඨ පුග්ගල) | සූත්‍ර වර්ණනාව | 103-106 |

| | | | |
|---|---|---|---|
| | තෙවන වර්ග වර්ණනාව | | 106-137 |
| 1 | පළමු (පසන්න චිත්ත) | සූත්‍ර වර්ණනාව | 106- |
| 2 | දෙවන (මා පුඤ්ඤභායී) | සූත්‍ර වර්ණනාව | 107-115 |
| 3 | තෙවන (උභො අත්ථ) | සූත්‍ර වර්ණනාව | 115-119 |
| 4 | සිවුවන (අට්ඨී පුඤ්ජ) | සූත්‍ර වර්ණනාව | 119-125 |
| 5 | පස්වන (සම්පජාන මුසාවාද) | සූත්‍ර වර්ණනාව | 125-126 |
| 6 | හයවන (දාන සංවිභාග) | සූත්‍ර වර්ණනාව | 127-129 |
| 7 | සත්වන (මෙත්තා චේතෝ විමුත්ති | සූත්‍ර වර්ණනාව | 129-137 |

ඒකක නිපාත වර්ණනාව නිමි.

| | | | |
|---|---|---|---|
| | දුක නිපාත වර්ණනාව | | 137-252 |
| | ප්‍රථම වර්ග වර්ණනාව | | 137-166 |
| 1 | පළමු (පළමු භික්ඛු) | සූත්‍ර වර්ණනාව | 137-143 |
| 2 | දෙවන (දෙවන භික්ඛු) | සූත්‍ර වර්ණනාව | 144- |
| 3 | තෙවන (තපනීය) | සූත්‍ර වර්ණනාව | 144-146 |
| 4 | සිවුවන (අතපනීය) | සූත්‍ර වර්ණනාව | 146- |
| 5 | පස්වන (පාපක සීල) | සූත්‍ර වර්ණනාව | 146-147 |
| 6 | හයවන (භද්දක සීල) | සූත්‍ර වර්ණනාව | 147-148 |
| 7 | සත්වන (අනාතාපී) | සූත්‍ර වර්ණනාව | 148-151 |
| 8 | අටවන (පළමු ජනකුහන) | සූත්‍ර වර්ණනාව | 151-160 |
| 9 | නවවන (දෙවන ජනකුහන) | සූත්‍ර වර්ණනාව | 160- |
| 10 | දසවන (සෝමනස්ස) | සූත්‍ර වර්ණනාව | 161-166 |
| | දෙවන වර්ග වර්ණනාව | | 166-252 |
| 1 | පළමු (විතක්ක) | සූත්‍ර වර්ණනාව | 166-217 |
| 2 | දෙවන (දේසනා) | සූත්‍ර වර්ණනාව | 217-219 |
| 3 | තෙවන (විජ්ජා) | සූත්‍ර වර්ණනාව | 220-221 |
| 4 | සිවුවන (පඤ්ඤා පරිහානි) | සූත්‍ර වර්ණනාව | 221-223 |
| 5 | පස්වන (සුක්ක ධම්ම) | සූත්‍ර වර්ණනාව | 223-228 |

| | | | |
|---|---|---|---|
| 6 | හයවන (අජාත) | සූත්‍ර වර්ණනාව | 228-232 |
| 7 | සත්වන (නිබ්බාන ධාතු) | සූත්‍ර වර්ණනාව | 233-236 |
| 8 | අටවන (පටිසල්ලාන) | සූත්‍ර වර්ණනාව | 236-239 |
| 9 | නවවන (සික්ඛානිසංස) | සූත්‍ර වර්ණනාව | 239-242 |
| 10 | දසවන (ජාගර) | සූත්‍ර වර්ණනාව | 243-247 |
| 11 | එකොළොස්වන (ආපායික) | සූත්‍ර වර්ණනාව | 247-249 |
| 12 | දොළොස්වන (දිට්ඨිගත) | සූත්‍ර වර්ණනාව | 249-252 |

**දුක නිපාත වර්ණනාව නිමි.**

**තික නිපාත වර්ණනාව** 253-

**ප්‍රථම වර්ග වර්ණනාව** 253-282

| | | | |
|---|---|---|---|
| 1 | පළමු (අකුසල මූල) | සූත්‍ර වර්ණනාව | 253-254 |
| 2 | දෙවන (ධාතු) | සූත්‍ර වර්ණනාව | 255-257 |
| 3 | තෙවන (පළමු වේදනා) | සූත්‍ර වර්ණනාව | 257-268 |
| 4 | සිවුවන (දෙවන වේදනා) | සූත්‍ර වර්ණනාව | 268-271 |
| 5 | පස්වන (පළමු ඒසනා) | සූත්‍ර වර්ණනාව | 272-274 |
| 6 | හයවන (දෙවන ඒසනා) | සූත්‍ර වර්ණනාව | 274-275 |
| 7 | සත්වන (පළමු ආසව) | සූත්‍ර වර්ණනාව | 276- |
| 8 | අටවන (දෙවන ආසව) | සූත්‍ර වර්ණනාව | 276- |
| 9 | නවවන (තණ්හා ආසව) | සූත්‍ර වර්ණනාව | 277-279 |
| 10 | දසවන (මාරධෙය්‍ය) | සූත්‍ර වර්ණනාව | 279-282 |

**දෙවන වර්ග වර්ණනාව** 283-302

| | | | |
|---|---|---|---|
| 1 | පළමු (පුඤ්ඤකිරිය වත්‍ථු) | සූත්‍ර වර්ණනාව | 283-286 |
| 2 | දෙවන (චක්ඛු) | සූත්‍ර වර්ණනාව | 286-288 |
| 3 | තෙවන (ඉන්ද්‍රිය) | සූත්‍ර වර්ණනාව | 289-291 |
| 4 | සිවුවන (අද්ධා) | සූත්‍ර වර්ණනාව | 291-295 |
| 5 | පස්වන (දුච්චරිත) | සූත්‍ර වර්ණනාව | 295-296 |

| | | | |
|---|---|---|---|
| 6 | හයවන (සුචරිත) | සූත්‍ර වර්ණනාව | 296- |
| 7 | සත්වන (සෝචෙය්‍ය) | සූත්‍ර වර්ණනාව | 297- |
| 8 | අටවන (මෝනෙය්‍ය) | සූත්‍ර වර්ණනාව | 297-299 |
| 9 | නවවන (පළමු රාග) | සූත්‍ර වර්ණනාව | 299-300 |
| 10 | දසවන (දෙවන රාග) | සූත්‍ර වර්ණනාව | 301-302 |
| | **තෙවන වර්ග වර්ණනාව** | | 302-343 |
| 1 | පළමු (මිච්ඡාදිට්ඨි කම්ම සමාදාන) | සූත්‍ර වර්ණනාව | 302-304 |
| 2 | දෙවන (සම්මාදිට්ඨි කම්ම සමාදාන) | සූත්‍ර වර්ණනාව | 304- |
| 3 | තෙවන (නිස්සරණීය) | සූත්‍ර වර්ණනාව | 305-306 |
| 4 | සිවුවන (සන්ත තර) | සූත්‍ර වර්ණනාව | 306-307 |
| 5 | පස්වන (පුත්ත) | සූත්‍ර වර්ණනාව | 307-329 |
| 6 | හයවන (වුට්ඨි) | සූත්‍ර වර්ණනාව | 330-332 |
| 7 | සත්වන (සුඛපත්ථනා) | සූත්‍ර වර්ණනාව | 333-336 |
| 8 | අටවන (භිදුර) | සූත්‍ර වර්ණනාව | 336-337 |
| 9 | නවවන (ධාතු සංසන්දන) | සූත්‍ර වර්ණනාව | 338-340 |
| 10 | දසවන (පරිහාන) | සූත්‍ර වර්ණනාව | 341-343 |
| | **සිවුවන වර්ග වර්ණනාව** | | 343-384 |
| 1 | පළමු (විතක්ක) | සූත්‍ර වර්ණනාව | 343-344 |
| 2 | දෙවන (සක්කාර) | සූත්‍ර වර්ණනාව | 345-347 |
| 3 | තෙවන (දේව සද්ද) | සූත්‍ර වර්ණනාව | 347-350 |
| 4 | සිවුවන (පුබ්බ නිමිත්ත) | සූත්‍ර වර්ණනාව | 351-357 |
| 5 | පස්වන (බහුජනහිත) | සූත්‍ර වර්ණනාව | 357-364 |
| 6 | හයවන (අසුභානුපස්සී) | සූත්‍ර වර්ණනාව | 364-367 |
| 7 | සත්වන (ධම්මානුධම්ම පටිපන්න) | සූත්‍ර වර්ණනාව | 368-370 |
| 8 | අටවන (අන්ධකරණ) | සූත්‍ර වර්ණනාව | 370-374 |
| 9 | නවවන (අන්තරාමල) | සූත්‍ර වර්ණනාව | 374-380 |
| 10 | දසවන (දේවදත්ත) | සූත්‍ර වර්ණනාව | 380-384 |

පස්වන වර්ග වර්ණනාව 384-431

| | | | |
|---|---|---|---|
| 1 | පළමු (අග්ගප්පසාද) | සූත්‍ර වර්ණනාව | 384-396 |
| 2 | දෙවන (ජීවිකා) | සූත්‍ර වර්ණනාව | 396-401 |
| 3 | තෙවන (සංඝාටිකණ්ණ) | සූත්‍ර වර්ණනාව | 401-403 |
| 4 | සිවුවන (අග්ගි) | සූත්‍ර වර්ණනාව | 403-406 |
| 5 | පස්වන (උප පරික්ඛ) | සූත්‍ර වර්ණනාව | 406-408 |
| 6 | හයවන (කාමුප්පත්ති) | සූත්‍ර වර්ණනාව | 408-410 |
| 7 | සත්වන (කාමයෝග) | සූත්‍ර වර්ණනාව | 410-412 |
| 8 | අටවන (කල්‍යාණසීල) | සූත්‍ර වර්ණනාව | 413-420 |
| 9 | නවවන (දාන) | සූත්‍ර වර්ණනාව | 421-424 |
| 10 | දසවන (තෙවිජ්ජ) | සූත්‍ර වර්ණනාව | 424-431 |

තික නිපාත වර්ණනාව නිමි.

චතුක්ක නිපාත වර්ණනාව 432-498

ප්‍රථම වර්ග වර්ණනාව

| | | | |
|---|---|---|---|
| 1 | පළමු (බ්‍රාහ්මණ) | සූත්‍ර වර්ණනාව | 432-438 |
| 2 | දෙවන (චතුරනවජ්ජ) | සූත්‍ර වර්ණනාව | 439-441 |
| 3 | තෙවන (ආසවක්ඛය) | සූත්‍ර වර්ණනාව | 441-445 |
| 4 | සිවුවන (සමණ බ්‍රාහ්මණ) | සූත්‍ර වර්ණනාව | 445-446 |
| 5 | පස්වන (සීල සම්පන්න) | සූත්‍ර වර්ණනාව | 446-450 |
| 6 | හයවන (තණ්හුප්පාද) | සූත්‍ර වර්ණනාව | 451- |
| 7 | සත්වන (සබ්‍රහ්මක) | සූත්‍ර වර්ණනාව | 452-457 |
| 8 | අටවන (බහුකාර) | සූත්‍ර වර්ණනාව | 458-460 |
| 9 | නවවන (කුහ) | සූත්‍ර වර්ණනාව | 460-462 |
| 10 | දසවන (පුරිස පියරූප) | සූත්‍ර වර්ණනාව | 462-471 |
| 11 | එකොළොස්වන (චර) | සූත්‍ර වර්ණනාව | 471-474 |
| 12 | දොළොස්වන (සම්පන්න සීල) | සූත්‍ර වර්ණනාව | 474-488 |
| 13 | දහතුන්වන (ලෝක) | සූත්‍ර වර්ණනාව | 488-498 |

චතුක්ක නිපාත වර්ණනාව නිමි.

* අර්ථකථාචාර්ය ධර්මපාල මහා ස්ථවිරයන් වහන්සේගේ ප්‍රකාශය 499-501

# පරමත්ථදීපනී නාම
# ඉතිවුත්තකට්ඨ කථා

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

**ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාරය වේවා !**

1. මහා කාරුණික වූ අනුන්ට පිහිටවන දතයුතු දෙය නමැති සාගරයෙහි පරතෙරට පත්, සියුම් වූ ගැඹුරු වූ විසිතුරු ක්‍රමයෙන් දහම් දෙසන බුදුරජාණන් වහන්සේ මම වදිමි.

2. යම් ධර්මයකින්, විද්‍යාචරණ සම්පන්න ගුණයෙන් යුක්ත වූ පුද්ගලයෝ ලෝකයෙන් එතරට පමුණුවත් ද සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් පුදන ලද ඒ උතුම් ධර්මය මම වදිමි.

3. යම් පුද්ගලයෙක් ශීලාදී ගුණසම්පන්න වූයේ ද මාර්ගඵලයන්හි පිහිටියේ ද ඒ අනුත්තර පින්කෙත වූ ආර්ය සංඝයා මම වදිමි.

4. මෙසේ රත්නත්‍රය කෙරෙහි වන්දනා කිරීමෙන් උපන් යම් පිනක් ඇද්ද ඒ පින් තෙදින් මම හැමතැනම නසන ලද අනතුරු ඇත්තෙක් වී.

5. විශේෂයෙන් ලෝභාදී ධර්මයන්ගේ ප්‍රහාණය පැහැදිලි කරමින් බුදුරජාණන් වහන්සේ විසින් ඒකක ආදී ප්‍රභේද වශයෙන් දේශනා කරන ලද.

6. ඉතිවුත්ත යන පදයෙන් යුක්ත සූත්‍ර එකතු කොට මහාර්ෂී වූ ධර්ම සංගායක ස්ථවිරයන් වහන්සේලා සංගායනා කළහ.

7. පෙර මහ තෙරවරු යම් ගැඹුරු පදාර්ථ ක්‍රමයක් වීද එය ඉතිවුත්තක යන නමින් ඛුද්දක නිකායෙහි සංග්‍රහ කළහ.

8. ගැඹුරු නුවණින් ඊට බැසගතයුතු බැවින් මා විසින් එහි අර්ථ වර්ණනා කරන්නට දුෂ්කර නමුත්.

9. යම් හෙයකින් ශාස්තෲ ශාසනය අර්ථ වර්ණනා සමග පවතී ද පෙර ඇදුරුවරුන්ගේ විනිශ්චය පවතී ද,

10. එහෙයින් එහි එල්ලී නිකාය පහට බැසගෙන පැරණි අටුවා කථා ක්‍රමය ඇසුරුකොට,

11. මහා විහාරවාසී තෙරවරුන්ගේ සියුම් වූ අර්ථ විනිශ්චය ඇති පිරිසිදු වූ නිරවුල් වූ ඉගැන්වීම් පිළිවෙළ (වාචනා මාර්ගය) ඇසුරුකොට,

12. නැවත නැවත ආවා වූ අර්ථ දුරුකොට මනාකොට ශක්ති පමණින් ඉතිවුත්තක වර්ණනාව කරන්නෙමි.

13. සත්පුරුෂයිනි, මෙසේ සද්ධර්මයේ බොහෝකල් පැවැත්ම කැමතිවන්නා වූ මා විසින් බෙදා දක්වන්නා වූ ඒ ඉතිවුත්තක පාළියේ අර්ථකථාව අසව්. (අසනු මැනවි.)

එහි ඉතිවුත්තකය යනු ඒකක නිපාත, දුක නිපාත, තික නිපාත, චතුක්ක නිපාත යන නිපාත සතරක සංග්‍රහයයි. එය විනය පිටකය, සූත්‍ර පිටකය, අභිධර්ම පිටකය යන පිටක තුන අතුරෙන් සූත්‍ර පිටකයට ඇතුළත්ය. දීඝනිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අංගුත්තර

නිකාය, ඛුද්දක නිකාය යන නිකාය පහ අතුරෙන් ඛුද්දක නිකායට ඇතුළත්ය. සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූත ධම්ම, වේදල්ල යන නවංග ශාසනය අතුරෙන් ඉතිවුත්තක අංගයෙහි විද්‍යමානය.

**ද්වාසීතිං බුද්ධතො ගණ්හිං ද්වෙ සහස්සානි භික්ඛුතො**
**චතුරාසීති සහස්සානි යෙ මෙ ධම්මා පවත්තිනො'ති**

'අසූ දෙදහසක් බුදුරජාණන් වහන්සේගෙන් ද දෙදහසක් භික්ෂූන්ගෙන් ද ගත්තෙමි. (මෙසේ) අසූහාර දහසක් යම් මේ ධර්මයෝ පවතිත්දැ'යි මෙසේ ධර්ම භාණ්ඩාගාරික ආනන්ද ස්ථවිරයන් වහන්සේ විසින් ප්‍රතිඥා කරන ලද අසූහාර දහසක් ධර්මස්කන්ධයන් අතුරෙන් ධර්මස්කන්ධ කීපයක සංග්‍රහයකි. පළමුකොට සූත්‍ර වශයෙන් ඒකක නිපාතයෙහි සූත්‍ර විසිහතක් ද දුක නිපාතයෙහි සූත්‍ර විසි දෙකක් ද තික නිපාතයෙහි සූත්‍ර පනහක් ද චතුක්ක නිපාතයෙහි සූත්‍ර දහතුනක් දයනුවෙන් සූත්‍ර එකසිය දොළසක සංග්‍රහයකි.

ඒ ඉතිවුත්තක පාළියේ නිපාත අතුරෙන් ඒකක නිපාතය පළමුකොට ඇත. වර්ග අතුරෙන් පාටිභෝග වර්ගය පළමුකොට ඇත. සූත්‍ර අතුරෙන් ලෝභ සූත්‍රය පළමු කොට ඇත. එයිනුදු '**වුත්තං හෙතං භගවතා**' යනුවෙන් මුල්කොට ඇති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ විසින් ප්‍රථම සංගීති කාලයෙහි වදාරන ලද නිදානය පළමුකොට ඇත. ඒ මේ ප්‍රථම මහා සංගීතිය වනාහි විනය පිටකයෙහි දී (චුල්ලවග්ග පාළියෙහි) පාළියට (පෙළ දහමට) නගන ලද්දේම ය. එහි නිදානයෙහි දක්ෂභාවය පිණිස කිවයුතු කථා මාර්ගය **සුමංගල විලාසිනී** දීඝනිකායට්ඨකථාවෙහි විස්තර වශයෙන් කියන ලද්දේමය. එහි කියන ලද ආකාරයෙන් ම එය දතයුතුය.

'**වුත්තං හෙතං භගවතා**' යනාදිය නිදානය යි. '**එකධම්මං භික්ඛවෙ පජහථ**' යනාදිය සූත්‍රය යි. එහි **වුත්තං** **භගවතා** යනාදිය නාමපදය. **ඉති** යනු නිපාත පදය යි. **පජහථ** යන මෙහි 'ප' යනු උපසර්ග පදය යි. 'ජහථ' යනු ආඛ්‍යාත පදයයි, මේ ක්‍රමයෙන් සැමතැන පද විභාගය දතයුතුය.

අර්ථ වශයෙන් පළමුකොට **වුත්ත** ශබ්දය උපසර්ග ඇතිව ද උපසර්ග නැතිව ද බීජ වැපිරීමෙහි, වැපිරූ බිම සම කිරීමෙහි, කෙස් කැපීමෙහි,

ජීවිත පැවැත්මෙහි, බන්ධනයෙන් මිදීමෙහි, බුද්ධ වචන වශයෙන් පැවැත්මෙහි, ඉල්ලා සිටීමෙහි (අජ්ඣෙනෙ) කීමෙහි යන මේ ආදියෙහි දක්නට ලැබේ. එය එසේම යි.

**ගාවො තස්ස පජායන්ති ඛෙත්තෙ වුත්තං විරූහති**
**වුත්තානං ඵලමස්නාති යො මිත්තානං න දූහතී'ති**[1]

මිත්‍රයන්ට එරෙහි නොවන තැනැත්තාගේ ගවයෝ බොහෝ වෙති. කෙතෙහි වැපිරූ දෙය වැඩෙයි. ඒ ධාන්‍යඵල (අස්වැන්න) අනුභව කරයි.

ආදියෙහි වැපිරීමෙහි ආයේය. '**නො ච ඛො පටිවුත්තං**' ආදියෙහි අට්ඨදන්තක ආදී උපකරණවලින් වැපිරූ බිම සම කිරීමෙහි ආයේය. 'කාපට්ඨිකො මානවො දහරො වුත්තසිරො'[2] ආදියෙහි කෙස් කැපීමෙහි ආයේය. '**පණ්ණලොමො පරදවුත්තො මිගභූතෙන චෙතසා විහරති**'[3] ආදියෙහි ජීවිත පැවැත්මෙහි ආයේය. '**සෙය්‍යථාපි නාම පණ්ඩුපලාසො** බන්ධනා පවුත්තො අභබ්බො හරිතත්තාය'[4] ආදියෙහි බන්ධනයෙන් මිදීමෙහි ආයේය. 'යෙසමිදං **එතරහි බ්‍රාහ්මණා** පොරාණං **මන්තපදං ගීතං පවුත්තං සමීහිතං**'[5] ආදියෙහි බුද්ධවචන වශයෙන් පැවැත්මෙහි ආයේය. ලෝකයෙහි වනාහි (ලෝක ව්‍යවහාරයෙහි) '**වුත්තො ගණො වුත්තො පාරායනො**' ආදියෙහි ඉල්ලා සිටීමෙහි ආයේය. '**වුත්තං ඛො පනෙතං භගවතා ධම්මදායාදා මෙ භික්ඛවෙ භවථ මා ආමිසදායාදා**'[6] ආදියෙහි කීමෙහි ආයේය. මෙහි ද 'කීමෙහි' දතයුතුය. එහෙයින් (වුත්තං, කථිතං, භාසිතං=) කියන ලද යන අර්ථයි.

දෙවන 'වුත්ත' ශබ්දය වචනයෙහි ද පුරුදුකරන ලද බවෙහි ද දතයුතුය. හි යනු ඒකාන්තයෙන් ව්‍යක්ත (දක්ෂ) යන මේ අර්ථයෙහි නිපාතයකි. ඒ 'හි' නිපාතය දැන් කියනු ලබන සූත්‍රයේ භාග්‍යවතුන් වහන්සේගේ දක්ෂ (අර්ථවත්) ලෙස කියන ලද බව ප්‍රකට කරයි. වචනවලින්

---

1. මූගපක්ඛ ජාතකය
2. ම.නි. - ම.ප - චංකී සුත්ත
3. චු.පා. - සංඝභේදක ඛන්ධක
4. ම.පා - මහාක්ඛන්ධක
5. ම.නි. - ම.ප - සුභ සුත්ත
6. ම.නි. - මූ.ප. - ධම්මදායාද සුත්ත

කියන ශබ්දය (අර්ථය) තීරණය කිරීමෙහි යෙදුණු නිපාත, ඒවායින් කිවයුතු අර්ථය ප්‍රකට කරයි. එතං යනු මේ එත ශබ්දය

**යො ච බුද්ධං ච ධම්මඤ්ච සංඝඤ්ච සරණං ගතො**
**චත්තාරි අරියසච්චානි සම්මප්පඤ්ඤාය පස්සති**

යමෙක් බුදුරජාණන් වහන්සේ ද ධර්මය ද සංඝයා ද සරණ ගියේ වේ නම් සතර ආර්ය සත්‍ය මනාව විදසුන් නුවණැසින් දකින්නේ නම්

**දුක්ඛං දුක්ඛසමුප්පාදං දුක්ඛස්ස ච අතික්කමං**
**අරියඤ්චට්ඨංගිකං මග්ගං දුක්ඛූපසමගාමිනං**

දුක්ඛ සත්‍යයත් දුක්ඛ සමුදය සත්‍යයත් දුක්ඛ නිරෝධ සත්‍යයත් දුක් සන්සිඳුවන ආර්ය අෂ්ටාංගික මාර්ග සත්‍යයත් මනාව විදසුන් නුවණැසින් දකින්නේ නම්,

**එතං ඛො සරණං ඛෙමං එතං සරණ මුත්තමං**
**එතං සරණ මාගම්ම සබ්බ දුක්ඛා පමුච්චති**[1]

මේ සරණය නිර්භයය. මේ සරණය උතුම්ය. මේ සරණයට පැමිණ සියලු දුකින් මිදෙන්නේය යන ආදියෙහි කියන ලද ආකාර ඇති ආසන්න ප්‍රතිපක්ෂයෙහි ආයේය.

**'අප්පමත්තකං ඛො පනෙතං භික්ඛවෙ ඔරමත්තකං සීලමත්තකං යෙන පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය'**[2]

'මහණෙනි, තථාගතයන් වහන්සේගේ ගුණ කියන පෘථග්ජන (පුහුදුන්) පුද්ගලයා යම් ගුණයක් කරණකොට කියන්නේ නම් ඒ ගුණය අල්පමාත්‍ර එකකි. ස්වල්පමාත්‍ර එකකි. ආචාරශීලමාත්‍ර එකකි' යනාදියෙහි කියනු ලබන ආසන්න ප්‍රත්‍යක්ෂයෙහි යෙදේ. මෙහි ද කියනු ලබන ආසන්න ප්‍රත්‍යක්ෂයෙහිය යි දතයුතුය. සංගායනා වශයෙන් කියන්නා වූ

---

1. ධම්මපද - බුද්ධවග්ග
2. දීඝනිකාය - බ්‍රහ්මජාල සුත්ත

සූත්‍රය ධර්මභාණ්ඩාගාරික (ආනන්ද) ස්ථවිරයන් වහන්සේ විසින් බුද්ධියෙහි තබා එකල්හි එතං යනුවෙන් කියන ලදී.

භගවතා යන මෙහි 'භගවා' යනු ගරු වචනයකි. 'ගරු' යන පදය ලෝකයෙහි 'භගවා' යයි කියති. තථාගතයන් වහන්සේ සියලු ගුණවලින් විශිෂ්ට (උතුම්) හෙයින් සත්ත්වයන්ගේ ගරුකළයුත්තා වෙති. එහෙයින් භගවා යයි දතයුතුය. පැරැන්නන් විසින් ද මෙසේ කියන ලදී.

**භගවාති වචනං සෙට්ඨං භගවාති වචනමුත්තමං**
**ගරුගාරවයුත්තො සො භගවා තෙන වුච්චති**

භගවා යන වචනය ශ්‍රේෂ්ඨය. භගවා යන වචනය උතුම්ය. ඒ භාග්‍යවතුන් වහන්සේ ගරුය, ගෞරවයෙන් යුක්තය. එහෙයින් භගවා යයි කියනු ලැබේ.

ශ්‍රේෂ්ඨවාචක (උතුම් බව කියන්නා වූ) වචනය ශ්‍රේෂ්ඨ ගුණ සමග හැසිරෙන බැවින් ශ්‍රේෂ්ඨ යයි කියන ලදී. නැතහොත් 'කියනු ලැබේ' යන අරුතින් වචනය නම් වේ. එනම් අර්ථය යි. එහෙයින් 'භගවා' යන වචනය ශ්‍රේෂ්ඨයි. භගවා යන මේ වචනයෙන් කිවයුතු යම් අර්ථයක් වේද, එය ශ්‍රේෂ්ඨ යන අර්ථය යි. 'භගවාති වචනමුත්තමං' යන මෙහිද මේ ක්‍රමයමයි. 'ගාරව යුත්තො' යනු ගරු කළයුතු බවෙන් යුක්ත වූ, ගරුකළයුතු ගුණයෙන් යෙදුණු හෙයින් ගරුකිරීමට හෝ අතිශයින් ගරු කිරීමට සුදුසුය යන අරුතින් ගාරවයුත්ත නම් වේ. ගෞරවයට සුදුසුය යන අර්ථයයි. මෙසේ ගුණයෙන් විශිෂ්ට, සත්ත්වයන්ට උතුම්, ගරු, ගෞරව කළයුතු යන මේ වචන 'භගවා' යන්නට යෙදෙන වචනය. තවද,

**භගී භජී විභත්තවා ඉති**
**අකාසි භග්ගන්ති ගරූති භාග්‍යවා**
**බහූහි ඤායෙහි සුභාවිතත්තනො**
**භවන්තගො සො භගවාති වුච්චති**

යනුවෙන් සො ගරු 1. භගී ඉති 2. භජී ඉති 3. භාගී ඉති 4. විභත්තවා ඉති 5. භග්ගං අකාසි ඉති 6. භාග්‍යවා ඉති 7. බහූහි ඤායෙහි සුභාවිතත්තනො ඉති 8. භවන්තගො ඉති 'භගවා' ඉති වුච්චති

ඒ තුන්ලොවට ගුරු වූ බුදුරජාණන් වහන්සේ

1. සම්පත් ආදී භේද ඇති භග ධර්ම ඇත්තේය යන අරුතින්ද
2. දුර සෙනසුන් ආදිය ඇසුරු කළේය යන අරුතින් ද
3. අර්ථ, ධර්ම, විමුක්ති, රස භාග ඇත්තේය යන අරුතින් ද
4. ලෞකික ලෝකෝත්තර ධර්ම විභාග කළේය යන අරුතින් ද
5. රාගාදිය බිඳදැමීම කළේය යන අරුතින් ද
6. භාග්‍ය ඇත්තේය යන අරුතින් ද
7. නොයෙක් භාවනා ක්‍රමයෙන් වඩන ලද සිත් ඇත්තේය යන අරුතින් ද
8. භවයෙහි අන්තයට ගියේය යන අරුතින්ද භගවා යයි කියනු ලැබේ.

යනුවෙන් නිර්දේශයෙහි (නිද්දෙස අටුවාවෙහි) ආවා වූ ක්‍රමයෙන් ද

භාග්‍යවා - භගවා - යුතෙතා භගෙහි ච - විභත්ත වා
භත්තවා - වන්තගමනො භවෙසු භගවා තතො

1. භාග්‍ය ඇත්තේය යන අරුතින් ද
2. කෙලෙස් බින්දේය යන අරුතින් ද
3. සම්පත් ඇත්තේය යන අරුතින් ද
4. සියලු ධර්මයන් බෙදුවේය යන අරුතින් ද
5. දිව්‍ය-බ්‍රහ්ම-ආර්ය යන විහරණ ඇසුරුකළේය යන අරුතින් ද
6. භවත්‍රයෙහි වමනය කළ තෘෂ්ණා ගමන් ඇත්තේය යන අරුතින්ද භගවා නම් වේ. මෙසේ මේ ගාථාවෙහි එන කරුණු වශයෙන් ද භගවා යන පදයට අරුත් කිවයුතුය. ඒ මේ අර්ථය වනාහි සියලු ආකාරයෙන් විසුද්ධි මග්ගයෙහි බුද්ධානුස්සති නිද්දේසයෙහි කියන ලද්දේය. එහි කියන ලද ක්‍රමයෙන්ම දතයුතුය.

වෙනත් ක්‍රමයක්

1. භාගවාති = භගවා
2. භතවාති = භගවා
3. භාගෙවනීති = භගවා
4. භගෙවනීති = භගවා
5. භත්තවාති = භගවා

6. භගෙවමීති = භගවා
7. භාගෙවමීති = භගවා

**භාගවා - භතවා - භාගෙ - භගෙ ච වනි භත්තවා**
**භගෙ වමි - තථාභාගෙ වමිති භගවා ජිනො**

1. එහි භාග්‍යවතුන් වහන්සේ කෙසේ භාගවා නම් වෙත් ද?

අනුන්ට පොදු නොවූ, ඉතා අධික වූ ඒ ශීලාදී ධර්මස්කන්ධ ගුණ කොටස් තථාගතයන් වහන්සේට ඇත, ලැබේ. එසේ උන්වහන්සේට සීල - සමාධි - ප්‍රඥා - විමුක්ති - විමුක්ති ඥාන දර්ශන - හිරි- ඔත්තප්ප - ශ්‍රද්ධා - වීර්ය - සති - සම්පජඤ්ඤ- සීල විසුද්ධි - දිට්ඨි විසුද්ධි - සමථ - විපස්සනා ද

කුසල මුල් තුන - සුචරිත තුන - සම්මා විතක්ක තුන අනවජ්ජසඤ්ඤා තුන - ධාතු තුන ද

සතර සතිපට්ඨාන - සතර සම්මප්පධාන - සතර ඉද්ධිපාද - සතර ආර්ය මාර්ග - සතර ආර්ය ඵල - සතර පටිසම්භිදා - යෝනිසතර වෙන්කොට දැනගන්නා ඤාණය - අරියවංස සතර - වෛසාරද්‍ය ඥාන සතර ද පධානියංග පහ - අංග පහකින් යුත් සම්මා සමාධිය - ඤාණපහක් ඇති සම්මා සමාධිය - ඉන්ද්‍රිය පහ - බලපහ - නිස්සරණිය ධාතු පහ - විමුක්තායතන ඥාන පහ - විමුක්ති පරිපාචනීය ප්‍රඥා පහ ද අනුස්සතිට්ඨාන හය - ගෞරව හය - නිස්සරණීය ධාතු හය - සතතවිහාර හය - අනුත්තරිය හය - නිබ්බේධභාගිය ප්‍රඥා හය - අභිඥා හය - අසාධාරණ ඤාණ හය ද,

අපරිහානිය ධර්ම හත - ආර්යධන හත - බොජ්ඣංග හත - සත්පුරුෂ ධර්ම හත - නිර්ජර වස්තු හත - සඤ්ඤා හත - දක්ඛිණෙය්‍ය පුද්ගල දේශනා හත - ඛීණාසව බල දේසනා හත ද,

ප්‍රඥා ප්‍රතිලාභ හේතු දේශනා අට - සම්මත්ත අට - ලෝකධර්ම අතික්‍රම අට - ආරම්භ අට - අක්ෂණ දේශනා අට - මහා පුරුෂ විතර්ක අට - අභිභායතන දේශනා අට - විමෝක්ෂ අට ද

යෝනිසෝ මනසිකාර මූලක ධර්ම නවය - පාරිසුද්ධි පධානියංග නවය - සත්තාවාස දේසනා නවය - ආඝාත පටිවිනය නවය - සඤ්ඤා නවය - නානත්ත දේශනා නවය - අනුපුබ්බවිහාර නවය ද

නාථකරණ ධර්ම දහය - කසිණායතන දහය - කුශල කර්මපථ දහය - සම්මත්ත දහය - ආර්යවාස දහය - අසේඛ ධම්ම දහය - තථාගත බල දහය ද

මෛත්‍රී ආනිසංශ එකොළහ - ධර්මචක්‍ර ආකාර දොළහ - ධුතගුණ දහතුන - බුද්ධඤාණ දාහතර - විමුක්ති පරිපාචනීය ධර්ම පහළොව - ආනාපාන සති දාසය ආකාරය - අපරන්තපනීය ධර්ම දාහත - බුද්ධ ධර්ම දහඅට - ප්‍රත්‍යවේක්ෂණ ඥාන දහනවය - ඥානවස්තු හතළිස් හතර - උදයව්‍ය ඤාණ පනහ - පණහට වැඩි කුශල ධර්ම - ඥාන වස්තු හැත්තෑහත - කෝටි විසිහතර ලක්‍ෂයක් සමාපත්ති-සංචාරි මහා වජිර ඤාණය - අනන්ත නය සමන්ත පට්ඨාන පවිචය පච්චවෙක්ඛණ දේසනා ඤාණ ද

එසේ ම අනන්ත ලෝකධාතුවල අනන්ත සත්ත්වයන්ගේ ආසය ආදිය හෙළිකරන ඤාණදැයි මේ ආදී අනන්ත අප්‍රමාණ භේද ඇති අන්‍යයන්ට පොදු නොවූ ඉතා අධික වූ ගුණභාග ගුණ කොටස් විද්‍යමාන වේ, ලැබේ. එහෙයින් කියන ලද ආකාර බෙදීම් ඇති ගුණ භාග උන්වහන්සේට ඇත යන අරුතින් භගවා නම් වේ. භාගවා යනුවෙන් කිවයුත්තෙහි (භා යන්නෙහි) ආකාරයට කෙටි (හ්‍රස්ව) බව කොට භගවා යනුවෙන් කියන ලදී. මෙසේ පළමුකොට භාගවානි = භගවා නම් වෙති.

**යස්මා සීලාදයො සබ්බෙ ගුණභාගා අසෙසතො**
**විජ්ජන්ති සුගතෙ තස්මා භගවාති පවුච්චති**

සීලාදී සියලු ගුණභාග ඉතිරි නොකොට සුගතයන් වහන්සේ කෙරෙහි විද්‍යමාන වන (පෙනෙන) නිසා භගවා යයි කියනු ලැබේ.

2. භාග්‍යවතුන් වහන්සේ කෙසේ **භතවා** නම් වෙත් ද?

සියලු ලෝකයාගේ හිත පිණිස උත්සාහවත් බවට පැමිණි මිනිසත් බව මුල්කොට ඇති කරුණු අට එක්රැස් කොට සම්මා සම්බෝධිය පිණිස

කරන ලද ප්‍රාර්ථනා ඇති මහාබෝධිසත්ත්වයන් වහන්සේලා විසින් පිරිය යුතු වූ ඒ දාන පාරමී - සීල පාරමී - නෙක්ඛම්ම පාරමී - පඤ්ඤා පාරමී - විරිය පාරමී - ඛන්ති පාරමී - සච්ච පාරමී - අධිට්ඨාන පාරමී - මෙත්තා පාරමී - උපෙක්ඛා පාරමී යන දස පාරමී, දස උපපාරමී, දස පරමත්ථ පාරමී යන සමතිස් පාරමී, දානාදී සතර සංග්‍රහ වස්තු, සතර අධිෂ්ඨාන, ආත්ම පරිත්‍යාගය, ඇස් පරිත්‍යාගය, ධන පරිත්‍යාගය, රාජ්‍ය පරිත්‍යාගය, අඹුදරුවන් පරිත්‍යාගය යන මහා පරිත්‍යාග පහ, පූර්වයෝග, පූර්ව චර්යා, ධර්මය කීම, ඤාතත්ථ චරියා, ලෝකත්ථචරියා, බුද්ධත්ථචරියා යන මේ ආදිය කෙටියෙන් කිවහොත් පුණ්‍ය සම්භාර (රාශිය), ඥාණ සම්භාර, බුද්ධකාරක ධර්මයෝ ය. ඒවා මහාභිනීහාරයේ පටන් කල්ප ලක්‍ෂයක් අධිකකොට ඇති සතර අසංඛ්‍යයක් කල් හානභාගිය (ලැබූ ගුණධර්ම පිරිහෙන ගතියට නැඹුරු වූයේ) සංකිලෙස භාගිය (කෙලෙසෙන ගතියට නැඹුරු වූයේ) ඨිතිභාගිය (ලැබූ ගුණධර්ම එලෙස ම පැවතීමක්) නොවී මතු මත්තෙහිත් විශේෂභාගියම (ඉහළ ඉහළ ගුණධර්ම ලැබීමට නැඹුරු වූයේ) වෙයි.

මෙසේ සකස්කොට, නිරතුරුව, ඉතිරි නොවන ලෙස, රැස්කරන ලද මනාව රැස්කරන ලද ගුණ උන්වහන්සේට ඇත යන අරුතින් භතවා නම් වෙති. නිරුක්ති ක්‍රමයෙන් 'ත' කාරයට 'ග' කාරය කොට භතවා යන්න භගවා නම් වේ. නොහොත් භගවා යනු කියන ලද ආකාර ඇති ඒ බුද්ධකාරක ධර්මයන්ම කියන ලද ආකාරයෙන් රැස්කළේය. මනාව රැස්කළේය, සම්පූර්ණ කළේය යන අර්ථයි. මෙසේ ද (භතවා ති) රැස් කරන ලද අරුතින් භගවා නම් වෙති.

**යස්මා සම්බොධියා සබ්බෙ දානපාරමි ආදිකෙ**
**සම්භාරෙ භතවා නාථො තස්මාපි භගවා මතො**

යම්හෙයකින් සම්බෝධිය පිණිස වූ දාන පාරමිතාව මුල්කොට ඇති සියලු පුණ්‍ය සම්භාර ධර්ම බුදුරජාණන් වහන්සේ රැස්කළාහු ද එහෙයින් (භතවා යන්න) භගවා යනුවෙන් දන්නා ලදී.

3. භාග්‍යවතුන් වහන්සේ කෙසේ භාගෙවනි නම් වෙත් ද?

යම් ඒ කෝටි විසිහතර ලක්‍ෂයක් දිනපතා වළඳන (සමවදින) සමාපත්ති භාග (කොටස්) ඇත්ද ඒවා ඉතිරි නොකිරීම් වශයෙන් ලෝකයාට

හිත අර්ථය පිණිසද තමාගේ මෙලොව සැප විහරණය පිණිස ද නිරතුරුව භජනය කළේය. සේවනය කළේය. බහුල වශයෙන් කළේය යනුවෙන් (සමාපත්ති) භාග භජනය කළේය යන අරුතින් භගවා නම් වෙති.

නැතහොත් අභිඤ්ඤෙය්‍ය (විශේෂයෙන් දතයුතු) ධර්මවල ද කුසලාදියෙහි ද ස්කන්ධ ආදියෙහි ද පරිඤ්ඤෙය්‍ය (පිරිසිඳ දතයුතු) ආදී වශයෙන් කෙටියෙන් සතරාකාර අභිසමය භාග හෝ විස්තර වශයෙන් ඇස පිරිසිඳ දතයුතුය. (චක්ඛු පරිඤ්ඤෙය්‍යං) -පෙ- ජරාමරණ පිරිසිඳ දතයුතුය. (ජරාමරණං පරිඤ්ඤෙය්‍යං) යන ආදී පිරිසිඳ දතයුතු නොයෙක් භාග ද ඇසේ හටගැනීමට හේතුව (චක්ඛුස්ස සමුදයො) පහකළ යුතුය. -පෙ- ජරාමරණ හටගැනීමට හේතුව දුරුකළ යුතුය යනාදී දුරු කළයුතු භාග ද ඇසේ නැතිවීම (චක්ඛුස්ස නිරොධො) ප්‍රත්‍යක්ෂ කළ යුතුය, ජරාමරණ නැතිවීම ප්‍රත්‍යක්ෂ කළ යුතුය යන ආදී ප්‍රත්‍යක්ෂ කළයුතු භාග (සච්ඡිකාතබ්බ භාගා) ද ඇස නැතිවීමට පමුණුවනප්‍රතිපදාව (චක්ඛු නිරෝධගාමිනී පටිපදා) වැඩිය යුතුය. -පෙ- සතර සතිපට්ඨානය වැඩිය යුතුය යනාදී වශයෙන් නොයෙක් භේද ඇති වැඩිය යුතු ධර්ම භාග ද යන ඒ සියල්ල භජනය කළේය. සුදුසු පරිදි ගෝචර වශයෙන් - භාවනා වශයෙන් - සේවන වශයෙන් ඇසුරු කළේය. මෙසේ ද භාග (කොටස්) ඇසුරු කළේය යන අරුතින් (භාගෙ වනීති) භගවා නම් වෙති.

නැතහොත් මේ සාධාරණ ශීලාදී ධර්මස්කන්ධ, ගුණකොටස් ගුණභාග හික්මවිය යුතු සිත්වල කෙසේ පිහිටුවන්නෙම් දැයි මහා කරුණාවෙන් ප්‍රාර්ථනා කළහ. උන්වහන්සේගේ ඒ ප්‍රාර්ථනාව අදහස් කරන ලද ප්‍රතිඵල ගෙනෙන ලද්දේ විය. මෙසේ කොටස් භජනය කළේය යන අදහසින් භගවා නම් වෙති.

**යස්මා ඤෙය්‍ය සමාපත්ති ගුණභාගෙ තථාගතො**
**භජී පත්ථයි සත්තානං හිතාය භගවා තතො**

තථාගතයන් වහන්සේ යම්හෙයකින් දතයුතු දේ, සමාපත්ති (ආදී) ගුණ භාග හෙවත් ගුණ සත්ත්වයන්ගේ හිතසුව පිණිස ප්‍රාර්ථනා කළසේක්ද එහෙයින් භගවා නම් වන සේක.

4. භාග්‍යවතුන් වහන්සේ කෙසේ භගෙ වනි නම් වෙත් ද?

පළමුව කෙටියෙන් කරන ලද පින්වලින්, ප්‍රයෝගවලින් පිරුණු සම්පත් ඇති ආකාරයෙන් භජනය කරනු ලැබෙත් යන අර්ථයෙන් 'භග' නම් වේ. (එනම්) ලෞකික ලෝකෝත්තර සම්පත් ය. එහි තථාගතයන් වහන්සේ සම්බුද්ධත්වයට පෙර බෝසත්වරයෙක්ව සිටිමින් ලෞකික සම්පත් ඉතා උසස් අයුරින් භජනය කළහ, සේවනය කළහ. යම්තැනක පිහිටා නිරවශේෂ වශයෙන් බුද්ධකාරක ධර්ම රැස්කරමින් බුද්ධකාරක ධර්මයන් දියුණු කළාහුද බුදුබවට පත්වී ඒනිවැරදි සැප ඇසුරු කළා වූ අන්‍යයන්ට පොදු නොවූ ලෝකෝත්තර සම්පත් ද භජනය කළහ, සේවනය කළහ. විස්තර වශයෙන් ප්‍රදේශ රාජ්‍ය සම්පත්, සක්විති සම්පත්, දිව්‍යරාජ්‍ය සම්පත් ආදී වශයෙන් ධ්‍යාන, විමෝක්ෂ, සමාධි, සමාපත්ති, ඥාන දර්ශන, මාර්ග භාවනා ඵල ප්‍රත්‍යක්ෂ කිරීම ආදී උත්තරී මනුෂ්‍ය ධර්ම වශයෙන් ද නොයෙක් ආකාර වූ අන්‍යයන්ට පොදු නොවූ සම්පත් භජනය කළහ, සේවනය කළහ. මෙසේ සම්පත් (භගෙ) භජනය කළහ (වනි) යන අරුතින් භගවා නම් වෙති.

**යා තා සම්පත්තියො ලොකෙ යා ච ලොකුත්තරා පුථූ**
**සබ්බා තා භජි සම්බුද්ධො තස්මාපි භගවා මතො**

ලෝකයෙහි යම් ඒ සම්පත්තියක් වේද බොහෝ වූ යම් ලෝකෝත්තර සම්පත්තියක් වේද ඒ සියලු සම්පත් සම්බුදුරජාණන් වහන්සේ භජනය කළහ. එහෙයින් උන්වහන්සේ භගවා යනුවෙන් දන්නා ලදී.

5. භාග්‍යවතුන් වහන්සේ කෙසේ භත්තවා නම් වෙත් ද?

උන්වහන්සේට භක්තිමත් වූ දැඩිසේ භක්තිමත් වූ අය බොහෝ ඇත යන අරුතින් භගවා නම් වෙති.

තථාගතයන් වහන්සේ මහාකරුණා -සර්වඥතා ඥානාදී ප්‍රමාණයක් නැති, උපමා නැති, බලවත් වූ ගුණ විශේෂයන්ගෙන් යුක්ත බැවින් සියලු සත්ත්වයන්ට උතුම් වූ, සියලු අර්ථවල (යහපතෙහි) ආරක්ෂාව පෙරටුකොට ඇති නිරවශේෂ සියලු හිත සැප නියම කිරීමෙහි යෙදුණු ඉතා අධික වූ

(නිරතිසයාය) ප්‍රයෝග සම්පත්තියෙන් දෙවිමිනිසුන් සහිත ප්‍රජාවට ඉතාමත්ම උපකාරී වූ බැවින් ද දෙතිස්මහා පුරුෂ ලක්ෂණ, අසූවක් අනු ව්‍යඤ්ජන (කුඩා සලකුණු) බුදුසිරුරින් නික්මෙන බඹයක් පමණ වූ ආලෝකය (බ්‍යාමප්පභා) ආදී අන්‍යයන්ට පොදු නොවූ ගුණ විශේෂයන්ගෙන් සැරසුණු රූපකාය ඇති බැවින් ද 'ඉති පි සො භගවා' යනාදී ක්‍රමයෙන් පැවති සත්‍ය වශයෙන් අවබෝධ කරන ලද ගුණ ඇති තුන්ලොව පතුරුවන අතිශය මහත් වූ අතිශය පිරිසිදු වූ ස්තුති ඝෝෂාවෙන් යුක්ත වූ බැවින් ද

උසස් ම ආකාරයෙන් කෙළවරට පැමිණි අල්පේච්ඡ බව, ලද දෙයින් සතුටුවන බව ආදී ගුණයන්හි මනාව පිහිටි බැවින් ද දසබලය, චතුර්වෛසාරද්‍ය (නිර්භය භාවය ඇතිකරන කරුණු සතර) ආදි ඉතා වැඩි (නිරතිසය) ගුණ විශේෂයන්ගෙන් යුක්ත වූ බැවින් ද 'රූපප්පමාණො රූපප්පසන්නො, ඝොසප්පමාණො ඝොසප්පසන්නො, ලූඛප්පමාණො ලූඛප්පසන්නො ධම්මප්පමාණො ධම්මප්පසන්නො' 'උස, මහත ආදී වශයෙන් රූපයෙහි ප්‍රමාණය ගෙන රූපයට ප්‍රසන්න වූයේ, අනුන්ට ස්තුති කිරීමාදී ගුණ කීමෙහි ප්‍රමාණය ගෙන එහි ප්‍රසන්න වූයේ, රළු සිවුරු, සෙනසුන් ආදියෙහි ප්‍රමාණය ගෙන එහි ප්‍රසන්න වූයේ, සීල, සමාධි, ආදී ධර්මයෙහි ප්‍රමාණය ගෙන එහි ප්‍රසන්න වූයේ' යනුවෙන් මෙසේ ප්‍රමාණ සතරකින් යුත් ලෝකවාසීන්කෙරෙහි හැම අයුරින්ම ප්‍රසාදය ගෙන එන බැවින් හාත්පසින් ප්‍රසාදය ඇතිකරන බැවින් දෙවි මිනිසුන් සහිත අප්‍රමාණ සත්ත්වයන්ගේ ආදර - බහුමාන ගෞරවයට ආයතනයක් වූ බැවින් උතුම් ප්‍රේමයට සම්භක්තියට ස්ථානයක් වෙති. උන්වහන්සේගේ අවවාදයෙහි පිහිටියා වූ අය ගුණ දැන නොසැලෙන ප්‍රසාදයෙන් යුක්ත වූවාහු වෙත් ද, කිසියම් ශ්‍රමණයකු විසින් හෝ බ්‍රාහ්මණයකු විසින් හෝ දෙවියකු විසින් හෝ මාරයකු විසින් හෝ බ්‍රහ්මයකු විසින් හෝ ඔවුන්ගේ සම්භක්තිය සෙලවිය නොහැකි ය.

එසේ ම ඔවුහු උන්වහන්සේගේ අණට දැඩි භක්තිමත් භාවයෙන් හෝ තමාගේ ජීවිත පරිත්‍යාගයෙහි දී ද එහි (උන්වහන්සේ කෙරෙහි) ප්‍රසාදය දුරු නොකරති.

එහෙයින් 'යො වෙ කතඤ්ඤූ කතවෙදී ධීරො - කල්‍යාණ මිත්තො

**දළ්හභත්ති ච හොති'** යි කියන ලදී.[1] අනුන් තමාට කළ උපකාර දනී ද උපකාර කළවුන්ට ප්‍රත්‍යුපකාර කෙරේ ද, නුවණැත්තේ ද, කල්‍යාණ මිත්‍රයෙක් වේද, මිතුරන්ට මහත් භක්ති ඇත්තේදැයි කියන ලදී. **'සෙය්‍යථාපි භික්ඛවෙ මහා සමුද්දො ඨිතධම්මො වෙලං නාතිවත්තති එවමෙව බො භික්ඛවෙ යං මයා සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං තං මම සාවකා ජීවිතහෙතු පි නාතික්කමන්ති'**[2]

මහණෙනි, යම්සේ මහා සමුද්‍රය පිහිටි ස්වාභාව ඇත්තේ වෙරළ නො ඉක්මවයි ද එසේම මහණෙනි, ශ්‍රාවකයන්ට මා විසින් පනවන ලද යම් ශික්ෂාපදයක් වේ ද එය මගේ ශ්‍රාවකයෝ ජීවිතය රැකගැනීමේ හේතුවෙන්වත් නො ඉක්මවති.' මෙසේ භාග්‍යවතුන් වහන්සේ භත්තවා නම් වෙති. නිරුක්ති ක්‍රමයෙන් 'භත්තවා' යන දෙයෙහි එක් 'ත' කාරයක් ලොප්කොට අනිත් 'ත' කාරයට 'ග' කාරයකොට භගවා යනුවෙන් පදය සාදාගනු ලැබේ.

**ගුණාතිසය යුත්තස්ස යස්මා ලොකෙ හිතෙසිනො**
**සම්භත්තා බහවො සත්ථු භගවා තෙන වුච්චති**

ලෝකයාට හිතෛෂී වූ අතිශය ගුණයෙන් යුක්ත වූ ශාස්තෘන් වහන්සේට යම්හෙයකින් බොහෝ භක්තිමත් වූවෝ වෙත් ද ඒ කාරණයෙන් භගවා යයි කියනු ලැබේ.

6. භාග්‍යවතුන් වහන්සේ කෙසේ 'භගෙ වමි' නම් වෙත් ද?

යම්හෙයකින් තථාගතයන්වහන්සේ බෝසත්වරයෙකු වශයෙන් සිටියදී ම පෙර ජාතිවලදී පාරමිතා පුරමින් භග නම් වූ යස-ඉසුරු සිරි සම්පත් වැමෑරී ද කෙළපිඩක් මෙන් බලාපොරොත්තු නැතිව ඉවතා දැමී ද එසේ ම උන්වහන්සේ විසින් සෝමනස්ස කුමාරකාලයෙහි, හත්ථිපාල කුමාර කාලයෙහි, අයෝඝර පණ්ඩිත කාලයෙහි, මූගපක්ඛ පණ්ඩිත කාලයෙහි, චූල සුතසෝම කාලයෙහි යන මේ ආදී කාලවල නෙක්ඛම්ම

---

1. සරභංග ජාතකය
2. චුල්ල වග්ග පාළි - පාතිමොක්ඛ ඨපනක්ඛන්ධක
   අං.නි. - 8 නිපාත - පහාරාද සූත්‍රය

පාරමිතාව පිරීම් වශයෙන් දිව්‍යරාජ්‍ය සමාන රජසැප පරිත්‍යාග කරන ලද ආත්මභාවයන්ගේ ප්‍රමාණයක් නැත.

අවසන් ආත්මභාවයෙහි දී ද අතට පත් දෙව්ලෝ අධිපතිකමට සමාන සතර දිවයින්වල සම්පත් ද සක්විති සම්පත් ඇසුරු කොට ඇති සත්රුවනින් බබලන සම්පත් ද ඇති සක්විති සැපත තණකොළයක් තරම්වත් නො හඟිමින් අපේක්ෂාවක් නැතිව දුරුකොට අභිනිෂ්ක්‍රමණය කොට සම්‍යක් සම්බෝධිය අවබෝධ කළාහුය. එහෙයින් මේ සම්පත් ආදී භග වැමෑරූහ යන අරුතින් භගවා නම් වෙති. නැතහොත් භානි නම් තාරකාවෝය. ඒවා හා සමානව ගමන් කරති, පවතිත් යන අරුතින් 'භග' නම්වේ. කල්පයක් පවත්නා බැවින් සිනේරු, යුගන්ධර, උතුරුකුරු, හිමවත ආදී ලෝක වස්තු විශේෂයන් ඇසුරු කළ යම් ශෝභාවක් වේද එයද භාග්‍යවතුන් වහන්සේ වැමෑරූහ. එහි ඇති සත්තාවාස ඉක්මවීම් වශයෙන් එය හා බැඳුණු ඡන්දරාගය පහකිරීමෙන් දුරුකළහ යන අර්ථයි. මෙසේ භග වැමෑරූ අරුතින් භගවා නම් වෙති.

**චක්කවත්තිසිරිං යසමා යසං ඉස්සරියං සුඛං**
**පහාසි ලොකචිත්තඤ්ච සුගතො භගවා තතො**

යම්හෙයකින් සුගතයන් වහන්සේ සක්විති සැපත ද යස-ඉසුරු සැප නම් වූ ලෝක සම්පත් ද දුරුකළ සේක් ද හෙයින් භගවා නම් වෙති.

7. භාග්‍යවතුන් වහන්සේ කෙසේ භාගෙ වමි නම් වෙත් ද?

භාග නම් කොටස්ය. ඒවා ස්කන්ධ, ආයතන, ධාතු වශයෙන් ද එහි ද රූප, වේදනාදී වශයෙන් ද අතීතාදී වශයෙන් ද නොයෙක් ආකාරය. භාග්‍යවතුන් වහන්සේ ඒ සියලු ප්‍රපඤ්ච (කෙලෙස්) සියලු (කාමාදී) යෝග, සියලු (අභිජ්ඣාදී) ග්‍රන්ථ, සියලු සංයෝජන සහමුලින් සිඳ දමා අමෘතධාතුව අවබෝධ කරමින් වැමෑරූහ. බලාපොරොත්තු නැතිව ඉවත දැමූහ. (අත්හළ ඒවාවෙත) පසුව නොගියහ.

එසේම මුන්වහන්සේ හැමතැන පැතිර ඇත්තා වූ
පඨවි, ආපෝ, තේජෝ, වායෝ,
ඇස, කණ, නාසය, දිව, කය, මන

රූප, සද්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම
චක්ඛු විඤ්ඤාණ, සෝතවිඤ්ඤාණ, ඝාන විඤ්ඤාණ,
ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ, මනෝ විඤ්ඤාණ
චක්ඛු සම්ඵස්සය -පෙ- මනෝ සම්ඵස්සය (මනෝ ස්පර්ශය)
චක්ඛු සම්ඵස්සජ වේදනාව -පෙ- මනෝ සම්ඵස්සජ වේදනාව (මනෝ ස්පර්ශයෙන් උපන් වේදනාව)
චක්ඛු සම්ඵස්සජ සඤ්ඤාව -පෙ- මනෝ සම්ඵස්සජ සඤ්ඤාව
චක්ඛු සම්ඵස්සජ චේතනාව -පෙ- මනෝ සම්ඵස්සජ චේතනාව
රූප තණ්හාව -පෙ- ධම්ම තණ්හාව
රූප විතක්කය -පෙ- ධම්ම විතක්කය

රූප විචාරය -පෙ- ධම්ම විචාරය යනාදී වශයෙන් පදයක් පාසා ධර්ම විභාග වශයෙන් ද සියලුම දහම් කොටස් ඉතිරි නොකොට වැමෑරූහ. බලාපොරොත්තු නැතිව පරිත්‍යාගයෙන් (හැර දැමීමෙන්) ඉවත දැමූහ. **'යන්තං ආනන්ද චත්තං වන්තං මුත්තං පහීනං පටිනිස්සට්ඨං තං තථාගතො පුන පච්චාවමිස්සතීති නෙතං ඨානං විජ්ජති'**[1] 'ආනන්ද, තථාගතයන් වහන්සේ විසින් යමක් අත්හරින ලද ද, බැහැර කරන ලද ද, මුදන ලද ද, පහකරන ලද ද, දුරුකරන ලද ද, (යම් වචනයක් කියන ලද ද) ඒ වචනය තථාගතයන් වහන්සේ නැවත වමාරන්නේය යන කාරණය විද්‍යමාන නොවේ. මෙසේ ද භාග (කොටස්) වැමෑරූහ යන අරුතින් භගවා නම් වෙති.

නැතහොත් 'භාගෙ වමි' යනු සියලුම කුසල් අකුසල්, සාවජ්ජ (වැරදි සහිත) අනවජ්ජ (වැරදි රහිත), හීන (පහත්) ප්‍රණීත (උසස්), කණ්හ (පව්) සුක්ක (පින්) යන සප්‍රතිභාග ධර්මයන් ආර්යමාර්ග ඥානය නමැති මුඛයෙන් වැමෑරූහ. බලාපොරොත්තු නැතිව හැර දැමූහ, දුරුකළහ, අන්‍යයන්ට ද ඒ සඳහා ධර්මය දේශනා කළහ යනුයි. **'ධම්මාපි වො භික්ඛවෙ පහාතබ්බා පගෙව අධම්මා, කුල්ලූපමං වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි නිත්ථරණත්ථාය නො ගහණත්ථාය'**[2] 'මහණෙනි, ඔබ විසින් (ශමථ විදර්ශනා) ධර්මයෝ ද අත්හළ යුතුය අධර්මය ගැන කියනුම කිම, මහණෙනි, තොපට මම පසුරු උපමා කොට ඇති දහම් දෙසන්නෙමි. එය

1. මහා පරිනිබ්බාණ සුත්ත
2. මජ්ඣිම නිකාය - අලගද්දූපම සුත්ත

එතෙරවීම පිණිසය, ගැනීම පිණිස නොවේ'ය යන මෙය කියන ලදී. මෙසේ කොටස් වැමැරූහ යන අරුතින් භගවා නම් වෙති.

"ඛන්ධායතනධාතාදි ධම්මභෙදා මහෙසිනා
කණ්හා සුක්කා යතො වන්තා තතොපි භගවා මතො"

ස්කන්ධ, ආයතන, ධාතු, කණ්හ, සුක්ක ආදී ධර්මයන්ගේ භේද මහාර්ෂී වූ බුදුරජාණන් වහන්සේ විසින් වැමැරූ හෙයින් ද උන්වහන්සේ භගවා යනුවෙන් දන්නා ලද්දාහුය. එහෙයින්

"භාගවා භතවා භාගෙ භගෙ ච වනි භත්තවා
භගෙ වමි තථා භාගෙ වමීති භගවා ජිනො" යනුවෙන් කියන ලදී. ඒ භාග්‍යවතුන් වහන්සේ විසින්,

**අරහතා** යනු කෙලෙසුන් කෙරෙන් දුරු වූ බැවින් ද, ඉතිරි නොකොට කෙලෙස් සතුරන් නැසූ බැවින් ද සංසාර චක්‍රයේ ගරාදි නැසූ බැවින් හෝ (චීවරාදී) ප්‍රත්‍ය ආදියට සුදුසු බැවින් පව් කිරීමෙහි රහසිගත බවක් නැති බැවින් යන මේ කරුණුවලින් සුදුසු වූ බැවින් 'අරහ' නම් වෙති. මේ මෙහි කෙටි කිරීමයි. විස්තරය විශුද්ධි මාර්ගයෙහි කියන ලද ආකාරයෙන් දතයුතු ය.

මෙහි **භගවතා** යන මෙයින් උන්වහන්සේගේ භාග්‍යවත් බව දැක්වීමෙන් කල්ප අසංඛ්‍ය ගණනකදී රැස්කරන ලද පුණ්‍ය රාශීන් ඇති බැවින් සියගණන් පුණ්‍ය ලක්‍ෂණ දරන, දෙතිස්මහා පුරුෂ ලක්‍ෂණ, අසූවක් අනුව්‍යඤ්ජන, ව්‍යාමප්‍රභා (සවනක් බුදුරැස්) කේතුමාලාදියෙන් සරසන ලද අනුන්ට පොදු නොවූ රූපකාය සම්පත්තිය දක්වන ලද්දේ වෙයි.

**අරහතා** යන මෙයින් උන්වහන්සේගේ ඉතිරි නොකොට කෙලෙස් දුරුකිරීම දැක්වීමෙන් ආශ්‍රවයන් ක්‍ෂය කිරීමට ආසන්න කාරණය වූ සර්වඥතා ඥානය අවබෝධකිරීම දැක්වීම් වශයෙන් දසබල - සතර විශාරද ඥාන - අසාධාරණ (අන් අයට නැති) ඥාන හය - ආවේණික බුද්ධ ධර්ම දහඅට ආදී සිතිය නොහැකි, ප්‍රමාණයක් නැති ධර්මකාය සම්පත්තිය දක්වන ලද්දේ වෙයි. ඒ දෙකින් ම ලෞකික පරීක්‍ෂකයන්ගේ බොහෝ මත ඇති බව ද ගිහි පැවිදි අය විසින් උන්වහන්සේ වෙත

විශේෂයෙන් යාමට සුදුසු බව ද එසේ ගියා වූ ඔවුන්ගේ කායික චෛතසික දුක් ඉවත් කිරීමෙහි සමත් බව ද ආමිසදාන ධර්මදානවලින් උපකාර කරන ලද බව ද ලෞකික ලෝකෝත්තර ගුණ සංයෝජනයෙහි (එකට යෙදීමෙහි) සමත් බව ද ප්‍රකාශ කරන ලද්දේ වෙයි.

එසේ 'භගවතා' යන මේ වචනයෙන් චරණ ධර්ම අතුරෙන් ඉහළින් ඇති දිව්‍ය විහාර ආදී විහාර විශේෂයන් එකට යෙදීම දැක්වීමෙන් චරණ සම්ප්‍රදාව දක්වන ලද්දේ වෙයි. 'අරහතා' යන මේ වචනයෙන් සියලු විද්‍යාවන්හි මුදුන්පැමිණි ආශ්‍රවයන් ක්ෂය කරන ඥානය අවබෝධ කිරීම දැක්වීමෙන් විද්‍යා සම්ප්‍රදාව දක්වන ලද්දේ වෙයි. පළමු කරුණෙන් අනතුරුදායක හා සසරින් එතරට පමුණුවන ධර්මයන් නොවෙනස් ආකාරයෙන් බෙදා දක්වන ලද බව දැක්වීමෙන් අවසන් විසාරද ඤාණ දෙක එකට යෙදීම ද අවසන් කරුණින් වාසනා සහිත ඉතිරි නොකොට කෙලෙසුන් දුරුකිරීම දැක්වීමෙන් පළමු විසාරද ඤාණදෙක එකට යෙදීමද ප්‍රකට කරන ලද්දේ වෙයි.

එසේ පළමු කරුණෙන් තථාගතයන් වහන්සේගේ ප්‍රතිඥා (පොරොන්දු) සත්‍යය, වාග් (කතා) සත්‍යය, ඥාන සත්‍යය දැක්වීමෙන් කාම ගුණ - ලෝකාධිපත්‍යය - යස (පිරිවර) - ලාභ සත්කාර ආදිය පරිත්‍යාග කිරීම දැක්වීමෙන් ද සත්‍යාධිෂ්ඨානය ත්‍යාගාධිෂ්ඨානය සම්පූර්ණ වීම ප්‍රකාශ කරන ලද්දේ වෙයි. දෙවැන්නෙන් සියලු සංස්කාරයන්ගේ සන්සිඳීම හා අවබෝධය දැක්වීමෙන් ද සම්‍යක් සම්බෝධිය දැක්වීමෙන් ද උපසම අධිෂ්ඨානය ප්‍රඥා අධිෂ්ඨානය සම්පූර්ණ කිරීම ප්‍රකාශ කරන ලද්දේ වෙයි.

එසේ ලෝකෝත්තර ගුණයෙහි කරන ලද ප්‍රාර්ථනා ඇති බෝධිසත්ත්වයකු වූ භාග්‍යවතුන් වහන්සේගේ මහා කරුණාව යෙදීමෙන් පොරොන්දු වූ පරිදි සියලු පාරමිතාවන්ගෙන් ඉවත් නොවීමෙන් සත්‍යාධිෂ්ඨානය ද පාරමිතාවන්ට විරුද්ධ දේ පරිත්‍යාගයෙන් ත්‍යාගාධිෂ්ඨානය ද පාරමිතා ගුණවලින් සිත සන්සිඳීමෙන් උපසම අධිෂ්ඨානය ද අනුන්ට යහපත සලසන උපායෙහි දක්ෂභාවයෙන් ප්‍රඥාධිෂ්ඨානය සම්පූර්ණ බවට ගියේ වෙයි. එසේම යාචක ජනයාට බොරු නොකියා දෙන්නෙමියි පිළිගැනීමෙන් හා පොරොන්දුවට අවිරුද්ධව (පොරොන්දුව කඩනොකර) දීමෙන් සත්‍යාධිෂ්ඨානය ද දිය යුතු දේ හා

ඉන් ලැබෙන විපාක පරිත්‍යාගයෙන් ත්‍යාගාධිෂ්ඨානය ද දිය යුතු දේ, පිළිගන්නා අය, දීම, දිය යුතු දේ නිම වූ කල්හි ලෝභය, ද්වේෂය, මෝහය, භය සන්සිඳීමෙන් උපසම අධිෂ්ඨානය ද සුදුසු පරිදි සුදුසු කාලයෙහි සුදුසු විධියෙන් දන්දීමෙන් ද ප්‍රඥාවෙන්, වඩා උසස් බැවින් ප්‍රඥාධිෂ්ඨානය ද සම්පූර්ණ බවට ගියේ වෙයි. මේ ක්‍රමයෙන් සෙසු පාරමිතාවන්හි ද සතර අධිෂ්ඨාන (සත්‍ය - ත්‍යාග - උපසම - ප්‍රඥා) සම්පූර්ණ වීම දතයුතුය.

සියලුම පාරමිතා, සත්‍යයෙන් වඩන ලද්දේය. වචනවලින් සලකුණු කරන ලද්දේය. සන්සිඳීමෙන් වඩන ලද්දේය. ප්‍රඥාවෙන් පිරිසිදු වූයේ වෙයි. මෙසේ සතර අධිෂ්ඨානයෙන් හටගත්තා වූ තථාගතයන් වහන්සේගේ සත්‍යාධිෂ්ඨානය ද සත්‍යාධිෂ්ඨානය හටගැනීමෙන් ශීල විශුද්ධිය ද ත්‍යාගාධිෂ්ඨානය හටගැනීමෙන් ආපදාවන්හිදී ශක්තිය ද දතයුතුය. ප්‍රඥාධිෂ්ඨානය හටගැනීමෙන් ආජීව (ජීවිකාවේ) පිරිසිදුකමද උපසම අධිෂ්ඨානය හටගැනීමෙන් චිත්ත විශුද්ධිය ද ප්‍රඥාධිෂ්ඨානය හටගැනීමෙන් දෘෂ්ටි විශුද්ධිය ද එසේ සත්‍යාධිෂ්ඨානය හටගැනීම නිසා ආශ්‍රයෙන් උන්වහන්සේගේ සීලය දතයුතුය. ත්‍යාගාධිෂ්ඨානය හටගැනීම නිසා කථාවෙන් පිරිසිදු බව දතයුතුයි. උපසම අධිෂ්ඨානය හටගැනීම නිසා සාකච්ඡාවෙන් ප්‍රඥාව දතයුතුය.

එසේ සත්‍යාධිෂ්ඨානය හටගැනීමෙන් දුෂ්ට නොවූයේ ඉවසති. ත්‍යාගාධිෂ්ඨානය හටගැනීමෙන් නොඇලුනේ පරිභෝග කරති. උපසම අධිෂ්ඨානය හටගැනීමෙන් අහිතවත් අය වර්ජනය කරති. ප්‍රඥාධිෂ්ඨානය හටගැනීමෙන් නොමුළා වූයේ දුරු කරති. එසේ උන්වහන්සේගේ සත්‍යාධිෂ්ඨානය හටගැනීමෙන් කෙලෙසුන්ගෙන් නික්මීමේ (නෙක්ඛම්ම සුඛ) සැපයට පැමිණීම, ත්‍යාගාධිෂ්ඨානය හටගැනීමෙන් (කාය - චිත්ත - උපධි යන විවේක වශයෙන්) පවිවේක සැපයට පැමිණීම, උපසම අධිෂ්ඨානය හටගැනීමෙන් කෙලෙස් සංසිඳීමේ (උපසම) සැපයට පැමිණීම, ප්‍රඥාධිෂ්ඨානය හටගැනීමෙන් නිවන් (සම්බෝධි) සැපයට පැමිණීම දක්වන ලද්දේ වෙයි.

සත්‍යාධිෂ්ඨානය හටගැනීමෙන් විවේකයෙන් උපන් ප්‍රීතියට හා සැපයට පැමිණීම, ත්‍යාගාධිෂ්ඨානය හටගැනීමෙන් සමාධියෙන් උපන් ප්‍රීතියට හා සැපයට පැමිණීම, උපසම අධිෂ්ඨානය හටගැනීමෙන්

අප්‍රීතියෙන් උපන් (ප්‍රීතිය නැතිව උපන්) කාය සැපයට පැමිණීම, ප්‍රඥාධිෂ්ඨානය හටගැනීමෙන් සති පාරිශුද්ධියෙන් උපන් උපේක්ෂා සැපයට පැමිණීම දක්වන ලද්දේ වෙයි. එසේ සත්‍යාධිෂ්ඨානය හටගැනීමෙන් බොරු නොකිරීම් වශයෙන් පරිවාර සම්පත්ති ලක්ෂණය හා ප්‍රත්‍ය සැප එක්වීම දක්වන ලද්දේ ය. ත්‍යාගාධිෂ්ඨානය හටගැනීමෙන් ලොල්නැති බැවින් ලද දෙයෙහි සතුටු වීමේ ලක්ෂණය හා ස්වභාව සැප එක්වීම දක්වන ලද්දේය. උපසමාධිෂ්ඨානය හටගැනීමෙන් කෙලෙස්වලින් මැඩ නොපවත්වන බැවින් කරන ලද පින් ඇති බව නම් වූ හේතුවෙන් සැප එක්වීම දක්වන ලද්දේය. ප්‍රඥාධිෂ්ඨානය හටගැනීමෙන් ඥාණ සම්පත්තියෙන් නිර්වාණාවබෝධ වශයෙන් විමුක්ති ලක්ෂණය හා දුක් සන්සිඳුවන සැපය එක්වීම දක්වන ලද්දේය. එසේ සත්‍යාධිෂ්ඨානය හටගැනීමෙන් ආර්ය වූ ශීලස්කන්ධයේ අනුබෝධය හා ප්‍රතිවේධය සිදුවීමද ත්‍යාගාධිෂ්ඨානය හටගැනීමෙන් ආර්ය වූ සමාධි ස්කන්ධයේ අනුබෝධය හා ප්‍රතිවේධය සිදුවීම ද ප්‍රඥාධිෂ්ඨානය හටගැනීමෙන් ආර්ය වූ ප්‍රඥා ස්කන්ධයේ - අනුබෝධය හා ප්‍රතිවේධය සිදුවීම ද උපසම අධිෂ්ඨානය හටගැනීමෙන් ආර්ය වූ විමුක්ති ස්කන්ධයේ අනුබෝධය හා ප්‍රතිවේධය සිදුවීම ද දක්වන ලද්දේ වෙයි.

සත්‍යාධිෂ්ඨානය සම්පූර්ණ වීමෙන් සිවුපසය ලැබීම සමෘද්ධ වීමද ත්‍යාගාධිෂ්ඨානය සම්පූර්ණ වීමෙන් සියල්ල අත්හැරීම සමෘද්ධ වීමද උපසම අධිෂ්ඨානය සම්පූර්ණ වීමෙන් ඉන්ද්‍රිය සංවරශීලය සමෘද්ධ වීමද ප්‍රඥාධිෂ්ඨානය සම්පූර්ණ වීමෙන් බුද්ධිය සමෘද්ධ වීම ද එයින් ම නිර්වාණය සමෘද්ධ වීම ද වෙයි. එසේම සත්‍යාධිෂ්ඨානය සම්පූර්ණ වීමෙන් චතුරාර්ය සත්‍ය අවබෝධය ලැබීම ද ත්‍යාගාධිෂ්ඨානය සම්පූර්ණ වීමෙන් සතර ආර්යවංශය ලැබීම ද උපසම අධිෂ්ඨානය සම්පූර්ණ වීමෙන් සතර ආර්ය විහාරය ලැබීම ද ප්‍රඥාධිෂ්ඨානය සම්පූර්ණ වීමෙන් සතර ආර්ය ව්‍යවහාරය ලැබීම ද දක්වන ලද්දේ වෙයි.

වෙනත් ක්‍රමයක්

භගවතා යන මෙයින් සත්ත්වයන්ගේ ලෞකික ලෝකෝත්තර සම්පත්තිය බලාපොරොත්තු වීම දැක්වීමෙන් තථාගතයන් වහන්සේගේ මහා කරුණාව ප්‍රකාශ කරන ලද්දේ වෙයි.

**අරහතා** යන මෙයින් ප්‍රහාණ සම්පත්තිය දැක්වීමෙන් ප්‍රහාණ ප්‍රඥාව ප්‍රකාශ කරන ලද්දේ වෙයි.

එහි උන්වහන්සේගේ

* ප්‍රඥාවෙන් ධර්ම රාජ්‍යයට පත්වීම ද කරුණාවෙන් ධර්මය බෙදීම ද,
* ප්‍රඥාවෙන් සසර දුකෙහි කලකිරීම ද කරුණාවෙන් සසර දුක් ඉවසීම ද,
* ප්‍රඥාවෙන් අනුන්ගේ දුක් පිරිසිඳ දැනීම ද කරුණාවෙන් අනුන්ගේ දුකට ප්‍රතිකාර කිරීමේ ආරම්භය ද,
* ප්‍රඥාවෙන් පිරිනිවීමට අභිමුඛ බව ද කරුණාවෙන් එය ලැබීම ද,
* ප්‍රඥාවෙන් තමා තරණය කිරීම ද කරුණාවෙන් අනුන් තරණය කරවීම ද,
* ප්‍රඥාවෙන් බුදුබව සිදුවීම ද කරුණාවෙන් බුදුකිස සිදුවීම ද නැතහොත්,
* කරුණාවෙන් බෝධිසත්ත්ව භූමියෙහි දී සසරට අභිමුඛ බව ද ප්‍රඥාවෙන් එහි නො ඇලීම ද,
* එසේ කරුණාවෙන් අනුන්ට හිංසා නො කිරීම ද, ප්‍රඥාවෙන් තමා අනුන් විසින් බිය නොකිරීම ද,
* කරුණාවෙන් අනුන් රකිමින් තමන් රකියි. ප්‍රඥාවෙන් තමන් රකිමින් අනුන් රකියි.
* එසේ කරුණාවෙන් අනුන් නො තැවීම ද ප්‍රඥාවෙන් තමා නො තැවීම ද එයින් තමාට හිත පිණිස පිළිපැදීම ආදියෙහි එන සිවුවන පුද්ගලභාවය සිදුවූයේ වෙයි.
* එසේ කරුණාවෙන් ලෝකයාට පිහිටවන බව ප්‍රඥාවෙන් තමාට පිහිටවන බව.
* උන්වහන්සේගේ කරුණාවෙන් නො නැමුණු බව ප්‍රඥාවෙන් උඩඟුකම නැති බව

* එසේ කරුණාවෙන් සියලු සත්ත්වයන් කෙරෙහි උපන් අනුග්‍රහය, ප්‍රඥාව අනුව ගිය බැවින් සියලු තැන්හි නො ඇලුණු සිත් නැත්තේ, ප්‍රඥාවෙන් සියලු ධර්මයන්හි නො ඇලුණු සිත් ඇත්තේ, කරුණාව අනුව ගිය බැවින් සියලු සත්ත්වයන්ට අනුග්‍රහ පිණිස නො පවත්නේ නොවේ.

යම්සේ තථාගතයන් වහන්සේගේ කරුණාව, සෙනෙහසින් ශෝකයෙන් තොර ද එසේ ප්‍රඥාව මම වෙමි (අහිංකාර), මගේ වෙයි (මමිංකාර) යන්නෙන් තොරය. මෙසේ අන්‍යොන්‍ය වශයෙන් මනාව පිරිසිදු කළ හෙයින් පරම විශුද්ධයයි දතයුතුය. එහි ප්‍රඥා ක්ෂේත්‍රය (තථාගත) බලය වෙයි. කරුණා ක්ෂේත්‍රය විශාරද ඥාන වෙයි. ඒවා අතරින් බලය යෙදීමෙන් අනුන් විසින් මැඩ නො පවත්වයි. විශාරද ඥාන යෙදීමෙන් අනුන් මැඩපවත්වයි. බලවලින් ශාස්තෘ සම්පත්තිය සිද්ධ වෙයි. විශාරද ඥානවලින්ශාසන සම්පත්තිය සිද්ධ වෙයි. එසේම බලවලින් බුද්ධ රත්නය සම්පූර්ණ වෙයි. විශාරද ඤාණවලින් ධර්මරත්නය සම්පූර්ණ වෙයි. මේ මෙහි 'භගවතා' 'අරහතා' යන පද දෙකෙහි අර්ථ යෙදීම පිළිබඳ මුඛමාත්‍ර දැක්වීමයි. (ප්‍රධාන කරුණු කීපයක් ඉදිරිපත් කිරීමයි.)

කුමක් නිසා මෙහි දී 'වුත්තං හෙතං භගවතා' යනුවෙන් කියා නැවතත් 'වුත්තං' යනුවෙන් කියන ලද ද? අසා දැනගත් දේ ප්‍රතික්ෂේප කිරීමෙන් නියම කළ දෙය දැක්වීම පිණිසය. යම්සේ කිසිවකු විසින් අනුන්ගෙන් අසා කියන ලද්දක් දන්නා කෙනෙකු විසින් කියන ලද්දක් අනුන් විසින් කියන ලද්දක් නිසා ඔහු විසින්ම කියන ලද්දක් නොවේ. ඔහු විසින් එය නොකියන ලද්දේමය. තව ද ඇසීම ද නැත.

මෙසේ මෙහි දී භාග්‍යවතුන් වහන්සේ විසින් අනුන්ගෙන් නො අසා තමන් වහන්සේගේ ඤාණයෙන් තමන්වහන්සේ විසින් අවබෝධ කළ දෙය ම දේශනා කරන ලදී යන මේ විශේෂය පෙන්වීම පිණිස දෙවරක් 'වුත්තං' යනුවෙන් කියන ලදී. 'වුත්තං හෙතං භගවතා' යන කරුණ භාග්‍යවතුන් වහන්සේ විසින් ම දේශනා කරන ලදී. අනිකකු විසින් කියන ලද දෙයක් අසන ලද්දක් මෙන් නොවේ යන මේ අදහස කියන ලද්දේ වෙයි. අධික වචනය අනිත් අර්ථයක් අවබෝධ කරවයි යන අරුතින් පුනරුක්ති දෝෂයක් නැත. මෙයින් පසුව ද මේ ක්‍රමය යි. පෙර සූදානම් නොවූ (පිළියෙළ නොකළ) බව දැක්වීම පිණිස දෙවරක් 'කියන ලදී' යැයි කියන ලදී.

භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුදු බැවින් අවස්ථාවට ගැළපෙන ලෙස උපන් වැටහීමෙන් පැමිණි පිරිසේ අදහසට අනුරූපව දහම් දෙසති. දන්දීමාදියට මෙන් ඒ සඳහා පෙර සූදානමක් නැත. එහෙයින් ඒ කාරණය දක්වයි. එය ද පෙර සූදානම් නොකරන ලද්දකි. තර්කයෙන් නො මඬනා

ලද්දකි. තම හැඟීමට අනුව නො විමසන ලද්දකි. එසේ වුවත් හික්මවීමට සුදුසු පුද්ගලයන්ගේ අදහසට අනුරූපව තැනට සුදුසු වශයෙන් පැවතියේමය යන මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලදී. (අනිකකු විසින්) නො පැවැත්විය හැකි වචනයක් බව දැක්වීම පිණිස හෝ දෙවරක් 'වුත්තං' යයි කියන ලදී. භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද යමක් වේ නම් එය දේශනා කරන ලද්දේමය. එය අක්ෂර සම්පත්තියෙන් හෝ අර්ථ සම්පත්තියෙන් කිසිවකු විසින් ප්‍රතික්ෂේප කළ නොහැක. **'එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා'** 'ශ්‍රමණයකු විසින් හෝ බ්‍රාහ්මණයකු විසින් හෝ නො පැවැත්විය හැකි ඒ අනුත්තර ධර්මචක්‍රය බරණැස ඉසිපතන මිගදායෙහි දී භාග්‍යවතුන් වහන්සේ විසින් පවත්වන ලදී' යනුවෙන් එය කියන ලද්දේම ය.

අනිකක් ද කියන ලදී. **'ඉධ භික්ඛවෙ ආගච්ඡෙය්‍ය සමණො වා බ්‍රාහ්මණො වා න ඉදං දුක්ඛං අරිය සච්චං යං සමණෙන ගොතමෙන පඤ්ඤත්තං අහමිදං දුක්ඛං අරියසච්චං ඨපෙත්වා අඤ්ඤං දුක්ඛං අරියසච්චං පඤ්ඤාපෙස්සාමීති නෙතං ඨානං විජ්ජති'**

මහණෙනි, මේ ලෝකයෙහි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ පැමිණෙන්නේ ය. පැමිණ ශ්‍රමණ ගෞතමයන් විසින් පනවන ලද මේ දුක්ඛ ආර්ය සත්‍යය වනාහි දුක්ඛ ආර්ය සත්‍යය නොවේ. මම මේ දුක්ඛ ආර්ය සත්‍යය හැර අනිත් දුක්ඛ ආර්ය සත්‍යයක් පනවන්නෙමි යි යන මේ කාරණය විද්‍යමාන නොවේ' යනාදී වශයෙනි. එහෙයින් අනිකකු විසින් නො පැවැත්විය හැකි වචනයක් බව දැක්වීම පිණිස ද දෙවරක් වුත්තං = (කියන ලදී) යයි කියන ලදී.

නැතහොත් අසන්නන්ට ප්‍රයෝජනයක් ඇතිකරන බව (අර්ථ නිෂ්පාදනය කරන බව) දැක්වීම පිණිස දෙවරක් 'කියන ලදී' යයි කියන ලදී. අනුන්ගේ ආසය (සිතේ ස්වභාවය) ආදිය නො දන්නා වූ සර්වඥ නොවන කෙනෙකු විසින් අදේශයකදී (නුසුදුසු තැනකදී) අකාලයක දී (නුසුදුසු කාලයකදී) කියන ලද දෙය සත්‍ය වුවත් එය අසන්නන්ට අර්ථ නිෂ්පාදනයෙහි අසමත් බැවින් නො කියන ලද්දක් නම් වන්නේය. අසත්‍යයක් කියන ලද නම් කවර කතා ද? සම්මා සම්බුදු බැවින් මනාව අනුන්ගේ ආසය ආදිය ද දේශ-කාල-අර්ථ සිද්ධිය ද දන්නා වූ භාග්‍යවතුන්

වහන්සේ විසින් කියන ලද්ද ඒකාන්තයෙන් අසන්නන්ට අදහස් කරන ලද අර්ථය නිෂ්පාදනය වන බැවින් (එය) කියන ලද්දක්ම වෙයි. උන්වහන්සේගේ නො කියන ලද ක්‍රමයක් නැත. එහෙයින් අසන්නන්ට අර්ථ නිෂ්පාදක බව දැක්වීම පිණිස ද දෙවරක් 'වුත්තං' යයි කියන ලදී. තව ද යම්සේ යම් නොදන්නා ලද අර්ථයක් ඇත්තේ ද, සත්‍ය පිණිස යමකට නො පිළිපන්නේ ද එය නො අසන ලද්දක් නම් වේ. මෙසේ යමක් මනාව නො පිළිගන්නා ලද ද එය නො කියන ලද්දක් නම් වේ.

භාග්‍යවතුන් වහන්සේගේ වචනය සිවු පිරිසම මනාව පිළිගෙන සත්‍යාවබෝධය පිණිස (තථත්තාය) පිළිපදිති. එහෙයින් මනාව පිළිගත් බව දැක්වීම පිණිස ද දෙවරක් 'වුත්තං' යයි කියන ලදී.

නැතහොත් ආර්යයන් වහන්සේලා විසින් කරන දේශනාවල විරුද්ධ නොවන වචන ඇති බව දැක්වීම පිණිස දෙවරක් 'වුත්තං' යයි කියන ලදී. භාග්‍යවතුන් වහන්සේ යම්සේ කුසල-අකුසල, සාවද්‍ය-අනවද්‍ය භේද ඇති ධර්මයන් ද පැවැත්ම නැවැත්ම, සම්මුති-පරමාර්ථ ද බොරු නොකරමින් දේශනා කරත් ද එසේම ධර්ම සේනාපති ආදී වූ ආර්යයන් වහන්සේලා ද භාග්‍යවතුන් වහන්සේ වැඩසිටින කල්හි ද පිරිනිවි කල්හි ද උන්වහන්සේගේම දේශනාව අනුව ගොස් කියති. එහි නානා වාදයක් නැත. එහෙයින් වුත්තමරහතා එයින් පසු කාලයෙහි අර්හත් වූ ආර්ය සංඝයා විසින් දැයි මෙසේ ආර්යයන් අතර අවිරුද්ධ වචන ඇති බව දැක්වීම පිණිස ද මෙසේ කියන ලදී.

නැතහොත් පෙර සම්මා සම්බුදුරජාණන් වහන්සේලා විසින් කියන ලද න්‍යාය ඇති බව දැක්වීම පිණිස ද දෙවරක් 'වුත්තං' යි කියන ලදී. ජාති ගෝත්‍ර ආයු ප්‍රමාණාදී විශේෂයන් ඇතත් දශබල ආදී ගුණයන් සමග මෙන් බුදුවරුන්ගේ ධර්මදේශනාවේ විශේෂයක් නැත. උන්වහන්සේලා අන්‍යොන්‍යව ද තනිව ද මුලින් කී දෙයට පසුව කියන ලද්ද විරුද්ධ නො වන ලෙසම කියත් ද එහෙයින් මේ කාරණය කියන ලදී. යම්සේ පෙර බුදුරජාණන් වහන්සේලා තමන් වහන්සේලා විසින් ද දැන් අපගේ අර්හත් වූ භාග්‍යවතුන් වහන්සේ විසින් ද එසේ ම කියන ලදී. මෙසේ පෙර බුදුරජාණන් වහන්සේලා විසින් ද තමන්වහන්සේ විසින් ද සූත්‍රාන්තරයන්හි කියන ලද න්‍යාය ඇති බව දැක්වීම පිණිස

දෙවරක් 'වුත්තං' යි කියන ලදී. ඒ කාරණයෙන් හැමතන්හිම බුදුවරුන්ගේ දේශනාවේ අවිරෝධය දක්වන ලද්දේ වෙයි.

නැතහොත් 'වුත්තං' යන යම් මේ දෙවන පදයක් ඇද්ද එය රහතන් වහන්සේ විසින් කියන ලද වචනයක් යයි දතයුතුය. **'එකධම්මං භික්ඛවෙ'** යන්න මුල්කොට ඇත්තා වූ ද දැන් කියනු ලබන වචනය ද භාග්‍යවතුන් වහන්සේ විසින් ද රහතන් වහන්සේ විසින් ද කියන ලදී යන මේ අදහස කියන ලද්දේ වෙයි. නැතහොත් 'වුත්තං' යන යම් මේ දෙවන පදයක් ඇද්ද එය වෙනත් පදයක වචනාර්ථයක් නොවේ. එය වනාහි තැබීම පිණිසය (ඨපනත්ථං)යි දත යුතුය. එයින් මේ අදහස දක්වයිඃ භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය කියන ලදී. එය ද කීම් මාත්‍රයක් නොවේ. කථිත මාත්‍රයක් නොවේ. එය වනාහි හික්මවිය යුත්තන්ගේ කුශලමූලය රෝපණය කරන ලදී යන අර්ථය යි. නැතහොත් 'වුත්තං' යන යම් මේ දෙවන පදයක් ඇද්ද එය පැවැත්ම පිණිසය (පවත්තනත්ථං)යි දතයුතුය. මේ එහි අර්ථයයි. අර්හත් වූ භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය කියන ලදී. එයද කීම් මාත්‍රයක් නොවේ. එය වනාහි ඒ උපන්නා වූ චරිතය යන අදහස කියන ලදී. ඒ කාරණයෙන් භාග්‍යවතුන් වහන්සේ කියන ආකාරයට කටයුතු කරන (යථාවාදී තථාකාරී) බව දක්වයි.

නැතහොත් භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලදී. අර්හත් වූ බුදුරජාණන් වහන්සේ විසින් කියන ලදී යනුවෙන් කියන්නට සුදුසුය යන අර්ථයි.

නැතහොත් 'වුත්තං' යන්න සංක්ෂිප්ත කථාව කීම සඳහා ය. නැවත (දෙවන) 'වුත්තං' යනු විස්තර කථාව දැක්වීම සඳහාය. භාග්‍යවතුන් වහන්සේ සංක්ෂේපයත් (කෙටියෙන්) ද විස්තර වශයෙන් ද දහම් දෙසති.

නැතහොත් භාග්‍යවතුන් වහන්සේගේ නොමනා කොට කියන ලද වචන නැති බව දැක්වීම පිණිස 'වුත්තං හෙතං භගවතා' යනුවෙන් කියා නැවත 'වුත්තං'යි කියන ලදී.

හැමකල්හි ඥාණය අනුව ගිය වචී කර්මය ඇති, සසර පුරුදු සමග දුරුකරන ලද සියලු දොස් ඇති නිදොස් වචන මාර්ගය ඇති භාග්‍යවතුන් වහන්සේගේ නොමනා කොට කීමක් නම් කිසිකලෙකත්

නැත. ලොව ඇතැමෙක් සිහිමුළාවෙන් හෝ ඉක්මන්කම නිසා (දවා) හෝ අනිකක් කියන්නෙමියි අනිකක් කීමෙන් (රවා) හෝ යමක් කියා පසුව ලබන ලද සංඥාව (සිහිය) ඇතිව පෙර කියන ලද්ද නොකියන ලද්දක් හෝ කරති. නැතහොත් සංශෝධනය හෝ කරති. භාග්‍යවතුන් වහන්සේ එසේ නොකරති. හැමකල්හි සත්සුන් වූ නුමුළාවන ස්වභාව ඇති සර්වඥතා ඥානයෙන් ගැවසී ගත් භාග්‍යවතුන් වහන්සේ පටිභාණ පටිසම්භිදාවෙන් තමා ම ළඟට පමුණුවන ලද අර්ථ ඇත්තේ අප්‍රමාණ කාලයක් පුරා රැස්කරන ලද පුණ්‍ය රාශියෙන් මතු වූ අන්‍යයන්ට සාධාරණ (පොදු) නොවූ ඉතා පිරිසිදු වූ විශේෂ කටයුතුවලින් සෝතායතනයට (සවනට) රසායනයක් වූ අසන්නන්ට අමා වැසි වස්සවන්නාක් මෙන් ඇසීමට සරු වූ ඇසීමට ඊට වඩා උතුම් දෙයක් නැති (සවණානුත්තරිය), දක්ෂ බව ප්‍රකාශ කරමින් කොවුල් හඬ වැනි මිහිරි හඬින් ස්වභාව නිරුක්තියෙන් හික්මවීමට සුදුසු අයගේ අදහස්වලට අනුරූප වූ වචන කියති. එහි කෙසඟක් (කෙස්ගසක අගක්) තරම්වත් දොසක් නැත. වැරදි ලෙස කීමට ඉඩක් කොයින් ද? එහෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් යමක් කියන ලද ද, එය කියන ලද්දේම ය. එය කිසිකලෙකත් නො කියන ලද්දක් හෝ නො මනා කොට කියන ලද්දක් හෝ නොවේ යන්න දැක්වීම පිණිස 'වුත්තං හෙතං භගවතා'යි කියා නැවත 'වුත්තමරහතා'යි කියන ලදී. මෙසේ එහි පුනරුක්ත දෝෂයක් නැත. මෙසේ මෙහි නැවත කියන ලද 'වුත්ත' ශබ්දයේ සාර්ථක බව දතයුතුය.

ඉති මෙ සුතං යන මෙහි 'ඉති' යනුඃ මේ ඉති ශබ්දය හේතුව - පරිසමාපනය (නිම කිරීම) - ආදි (අවයවය) - පදාර්ථ විපර්යාසය (පදවල අර්ථ වෙනස්වීම) - පකාරය (ආකාරය) - නිදර්ශනය - අවධාරණය ආදී නොයෙක් අර්ථ ප්‍රභේද ඇත්තේ වෙයි. එය එසේම ය.

'රුප්පතීති ඛො භික්ඛවෙ තස්මා රූපන්ති වුච්චති'[1]

'මහණෙනි', 'බිඳේ' යන හේතුවෙන් රූපය යි කියනු ලැබේ' යනාදියෙහි හේතුව යන අර්ථයෙහි පෙනේ.

---

1. ඛන්ධ සංයුත්තය - ඛජ්ජනීය වර්ගය - බු.ජ.මු. 3 භා - 148 පිට

'තස්මාතිහ මෙ භික්ඛවෙ ධම්මදායාදා භවථ, මා ආමිස දායාදා. අත්‍ථි මෙ තුම්හෙසු අනුකම්පාඃ කින්ති මෙ සාවකා ධම්මදායාදා භවෙය්‍යුං නො ආමිස දායාදා'[1]

එහෙයින් මහණෙනි, මගේ ධර්මයට දායාද වවු. ආමිසයට දායාද නොවවු. මාගේ ශ්‍රාවකයෝ කෙසේ නම් ධර්මදායාද වන්නහුද? ආමිස දායාද නොවන්නහුදැයි තොප කෙරෙහි මගේ අනුකම්පාව ඇත' යනාදියෙහි පරිපමාපන (නිම කිරීම) යන අර්ථයෙහි පෙනේ.

'ඉති වා ඉති එවරූපා විසූකදස්සනා පටිවිරතො'[2]

මේ ආදී වූ හෝ මෙබඳු වූ විසුළුදස්නෙන් වැළකුණේ වෙයි. යනාදියෙහි ආදි (අවයවය) යන අර්ථයෙහි පෙනේ.

'මාගණ්ඩියොති වා තස්ස බ්‍රාහ්මණස්ස සංඛා, සමඤ්ඤා, පඤ්ඤත්ති, වොහාරො, නාමං, නාමකම්මං, නාමධෙය්‍යං, නිරුත්ති, බ්‍යඤ්ජනමභිලාපො'[3]

මාගණ්ඩියො යනු ඒ බමුණාගේ සංඛ්‍යාය, සංඥාය, ප්‍රඥප්තිය, ව්‍යවහාරය, නමය, නම් කිරීමය, නම් ඇති, නිරුක්තිය, ව්‍යඤ්ජන අභිලාපය' යනාදියෙහි පදාර්ථ විපර්යාසයෙහි පෙනේ.

'ඉති ඛො භික්ඛවෙ සප්පටිභයො බාලො, අප්පටිභයො පණ්ඩිතො, සඋපද්දවො බාලො, අනුපද්දවො පණ්ඩිතො, සඋපස්සග්ගො බාලො, අනුපස්සග්ගො පණ්ඩිතො'[4]

'මහණෙනි, මෙසේ වනාහි බාලයා ප්‍රතිභය සහිත වේ. පණ්ඩිතයා ප්‍රතිභය රහිත වේ. බාලයා උපද්‍රව සහිත වේ. පණ්ඩිතයා උපද්‍රව රහිත වේ. බාලයා උපසර්ග (දුක්වෙමින් ඒ ඒ තැන ලැග සිටීම) සහිත වේ. පණ්ඩිතයා උපසර්ග රහිත වේ' යනාදියෙහි ප්‍රකාරයෙහි (ආකාරයෙහි) පෙනේ.

---

1. මජ්ඣිම නිකාය - මූලපණ්ණාසකය - ධම්මදායාද සූත්‍රය
2. දීඝ නිකාය - බ්‍රහ්මජාල සූත්‍රය
3. මහා නිද්දේස පාළි - මාගණ්ඩිය සූත්‍රය
4. අංගුත්තර නිකාය - තික නිපාත - බාල වර්ගය

**'සබ්බං අත්ථීති ඛො කච්චාන අයමෙකො අන්තො සබ්බං නත්ථීති අයං දුතියො අන්තො'**[1]

කච්චාන, සියල්ල ඇත යන මෙය පළමු අන්තයයි. සියල්ල නැත යන මෙය දෙවන අන්තයයි' යනාදියෙහි නිදර්ශනයෙහි පෙනේ.

**'අත්ථි ඉදප්පච්චයා ජරාමරණන්ති ඉති පුට්ඨෙන සතා ආනන්ද අත්ථීතිස්ස වචනීයං, කිං පච්චයා ජරාමරණං ඉති චෙ වදෙය්‍ය, ජාතිපච්චයා ජරාමරණන්ති ඉච්චස්ස වචනීයං'**[2]

'ආනන්දය, මේ යම් ප්‍රත්‍යයකින් ජරා මරණ වේ නම් එසේ වූ ප්‍රත්‍යයක් ඇද්දැයි විමසන ලද්දහු විසින් ඇතැයි ඔහුට කිවයුතුය. කුමන ප්‍රත්‍යයෙන් ජරාමරණ වේදැයි මෙසේ විමසන්නේ නම් ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණ වේයයි මෙසේ ඔහුට කිවයුතුය' යනාදියෙහි අවධාරණයෙහි පෙනේ. තීරණය කිරීමෙහි (සන්නිට්ඨානෙ) යන අර්ථයි.

ඒ ඉති ශබ්දය මෙහි ප්‍රකාර-නිදර්ශන-අවධාරණ යන අර්ථවල යෙදෙන බව දතයුතුය. එහි ප්‍රකාර අර්ථය ඇති ඉති ශබ්දයෙන් මේ අර්ථය පැහැදිලි කරයිඃ නොයෙක් නොයෙක් න්‍යායවල දක්ෂ වූ නොයෙක් අදහස්වලින් හටගත් අර්ථ-ව්‍යඤ්ජන (අකුරු-ශබ්ද) වලින් යුක්ත වූ විවිධ ප්‍රාතිහාර්ය ඇති ධර්මයෙන්, අර්ථයෙන්, දේශනාවෙන්, ප්‍රතිවේධයෙන් (අවබෝධ කිරීමෙන්) ගැඹුරු වූ සියලු සත්ත්වයන්ට තම තමන්ගේ භාෂාවට අනුරූප වශයෙන් සවන් මගට පැමිණෙන (කනට වැටෙන) ඒ භාග්‍යවතුන් වහන්සේගේ වචනය මුළු ශක්තියෙන් අසනු කැමති බව උපදවාගෙන වුවද සියලු ආකාරයෙන් දැන ගන්නට කවරෙක් සමත් වේද? ඉති මෙ සුතං යනු මා විසින් ද එක් ප්‍රකාරයකින් අසන ලදී.

මෙහි ද ඒකත්ත, නානත්ත, අබ්‍යාපාර, එවං ධම්මතා සංඛ්‍යාත (නම්) වූ ද නන්දියාවත්ත, තිපුක්ඛල, සීහවික්කීළිත, දිසාලෝචන, අංකුස සංඛ්‍යාත වූ ද නැතහොත් විෂය භේදයෙන් නානාවිධ න්‍යාය ද නැතහොත් පාළියෙහි එන නා නා න්‍යාය ද ඒවා ද පඤ්ඤත්ති, අනුපඤ්ඤත්ති ආදී

---

1. අභිසමය සංයුත්තය - ආහාර වර්ගය - කච්චාන ගොත්ත සූත්‍ර
2. දීඝ නිකාය - මහා නිදාන සූත්‍රය - බු.ජ.මු. 2 භාගය

වශයෙන් ද සංකිලෙස භාගිය ආදී වශයෙන් ද ලොකිය (ලෞකික) ආදී වශයෙන් ද ඒ දෙක ම මිශ්‍රවීම් වශයෙන් වොමිස්සතාදි වශයෙන් ද කුශලාදී වශයෙන් ද ස්කන්ධාදී වශයෙන් ද සංග්‍රහ ආදී වශයෙන් ද සමය විමුත්ත ආදී වශයෙන් ද ඨපනාදී වශයෙන් ද කුශලමූලාදී වශයෙන් ද තිකපට්ඨානාදී වශයෙන් ද නානාප්‍රකාර වන හෙයින් 'නානා නය' නම් වේ. ඒ න්‍යායවලින් නිපුණ (දක්ෂ) වූ සණ්හ (මෘදු) වූ සුඛුම (සියුම්) වූයේ යන අරුතින් නානා නය නිපුණ නම් වේ. ආසය ම අජ්ඣාසය වේ. එය ද ශාස්වතාදී භේදයෙන් ද අප්පරජක්ඛ (කෙලෙස් අඩු බව) ආදී භේදයෙන් ද අනේකවිධ වූ අත්තජ්ඣාසය ආදී වූ ම අනේක වූ අජ්ඣාසය (අදහස) අනේකජ්ඣාසය යි. එය (අනේකජ්ඣාසය නම් වූ) මේ කාරණයේ හටගැනීමට උත්පත්තියට හේතුව යන අරුතින් අනේකජ්ඣාසය සමුට්ඨාන නම් වේ.

කුශලාදී අර්ථ සම්පත්තියෙන් ද එය පැහැදිලි කරන ව්‍යඤ්ජන (අකුරු-පද) සම්පත්තියෙන් ද සංකාසන (පැහැදිලි කිරීම), පකාසන (ප්‍රකට කිරීම), විවරණ (විස්තර කිරීම), විභජන (වෙන්කොට දැක්වීම), උත්තානීකරණ (සරල ලෙස ඉදිරිපත්කිරීම), පඤ්ඤත්ති (පැණවීම) වශයෙන් ඇති අර්ථපද හයෙන් ද අක්ඛර (අකුරු), පද, බ්‍යඤ්ජන, ආකාර, නිරුක්ති, නිර්දේශ වශයෙන් ඇති බ්‍යඤ්ජන පද හයෙන් ද යුක්ත බැවින් අත්ථබ්‍යඤ්ජනසම්පන්න නම් වේ.

ඉද්ධි - ආදේසනා - අනුසාසනී යන බෙදීමෙන් ද ඒවා අතරින් එක එකක් ගැන විෂයාදී වශයෙන් බෙදීමෙන් ද මෙයට විවිධ වූ හෝ බහුවිධ වූ හෝ පාටිහාරිය ඇත්තේය යන අරුතින් 'විවිධ පාටිහාරිය' නම් වේ. එහි ප්‍රතිවිරුද්ධ ධර්ම ඉවත් කිරීමෙන් හෝ රාගාදී කෙලෙස් ඉවත් කිරීමෙන් හෝ පාටිහාරිය යන අර්ථය ඇතිකල්හි ඉවත් කළයුතු රාගාදී ප්‍රතිවිරුද්ධ ධර්මයන් භාග්‍යවතුන් වහන්සේට නැත. පහ වූ උපක්ලේශ ඇති, ගුණ අටකින් යුක්ත වූ, ප්‍රතිවිරුද්ධ ධර්මයන් නැසූ සිත ඇතිකල්හි පෘථග්ජනයන්ට ද ඍද්ධිවිධ පවතියි. එහෙයින් එහි පවතින ව්‍යවහාරයෙන් ද ඉද්ධි පාටිහාරිය යනුවෙන් කියන්නට නොහැකිය. යම්හෙයකින් වෛනෙය්‍යගත (හික්මවිය යුතු බවට ගිය) කෙලෙස් මහා කාරුණික වූ භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවිරුද්ධ වේද එහෙයින් ඒවා ඉවත් කිරීම් වශයෙන් පාටිහාරිය නම් වේ. නැතහොත් භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයට තීර්ථකයෝ ප්‍රතිවිරුද්ධ වෙත් ද ඔවුන් ඉවත්

කිරීම් වශයෙන් පාටිහාරිය නම් වේ. ඔවුහු දෘෂ්ටි හැරීම් වශයෙන් ද දෘෂ්ටි ප්‍රකාශ කිරීමෙහි අසමත් බැවින් ද ඉද්ධි - ආදේශනා - අනුසාසනී යන මේවායින් ඉවත් කරන ලද්දාහු වෙති. 'පටි' යනු පසුව යන අර්ථය හෝ වෙයි. එහෙයින් සත්සුන් සිත් ඇති කල්හි උපක්ලේශ පහවූ කල්හි කළකිස ඇති තැනැත්තා (රහතන් වහන්සේ) විසින් ද පසුව ගෙන යා යුතුය පැවැත්විය යුතුය යන අරුතින් පාටිහාරිය නම් වේ. චතුර්ථධ්‍යානයෙන් හා මාර්ගවලින් තමාගේ උපක්ලේශ ඉවත්කළ කල්හි පසුව ගෙනයාම ද පාටිහාරිය නම් වේ. ඉද්ධි-ආදේසනා-අනුසාසනී යන මේවා පහවූ උපක්ලේශ ඇති තැනැත්තා විසින් ද කළ කිස ඇති තැනැත්තාවිසින් ද සත්ත්වයන්ගේ යහපත පිණිස නැවත පැවැත්විය යුතුය. තමාගේ උපක්ලේශ නැසූ කල්හි ද අන්‍යයන්ගේ සිතෙහි උපක්ලේශ ඉවත් කිරීම සිදුවෙයි යන අරුතින් පාටිහාරිය වෙයි. පටිහාරියම පාටිහාරිය (ප්‍රාතිහාර්යය) යි. ඉද්ධි - ආදේසනා - අනුසාසනි යන සමූහයෙහි එක එකක් වීම ද පාටිහාරිය යි කියනු ලැබේ. චතුර්ථ ධ්‍යානය ද මාර්ගය ද ප්‍රතිවිරුද්ධ ධර්ම ඉවත් කිරීම් වශයෙන් හෝ පටිහාරිය නම්. එහි හටගත්තේය, හේතුව වූ එයින් ආයේය යන අර්ථයෙන් පාටිහාරිය නම් වේ. යම් හෙයකින් තං යනු අර්ථ දේශනාව වේ. එහි ව්‍යවහාරය අවබෝධ කිරීම් සංඛ්‍යාත හේතුව, හේතුඵලය, ඒ දෙකෙහි පැනවීම, හෝ අවබෝධ කිරීම් සංඛ්‍යාත ප්‍රතිවේධ ගම්භීර වූ ධර්මාර්ථ දේශනය රැස් නොකරන ලද කුසල් සමූහ ඇති පුද්ගලයන් විසින් ආදී කුඩා සතුන් විසින් මහ මුහුද මෙන් දුකසේ බැසගත යුත්තාහු වෙති. නොලැබිය හැකි ප්‍රතිෂ්ඨා ඇත්තෝ වෙති. නැතහොත් භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයට තීර්ථකයෝ ප්‍රතිවිරුද්ධ වෙත් ද ඔවුන් ඉවත් කිරීම් වශයෙන් පාටිහාරිය නම් ඔවුහු දෘෂ්ටි හැරීම් වශයෙන් ද දෘෂ්ටි ප්‍රකාශ කිරීමෙහි අසමත් බැවින් ද ඉද්ධි - ආදේශනා - අනුසාසනී යන මේවායින් ඉවත් කරන ලද්දාහු වෙති. 'පටි' යනු පසුව යන අර්ථය හෝ වෙයි. එහෙයින් සත්සුන් සිත් ඇති කල්හි උපක්ලේශ පහවූ කල්හි කළ කිස ඇති තැනැත්තා (රහතන් වහන්සේ) විසින් ද පසුව ගෙන යා යුතුය පැවැත්විය යුතුය යන අරුතින් පාටිහාරිය නම් වේ. චතුර්ථධ්‍යාන මාර්ගවලින් තමාගේ උපක්ලේශ ඉවත්කළ කල්හි පසුව ගෙනයාම ද පාටිහාරිය නම් වේ. ඉද්ධි-ආදේසනා-අනුසාසනී යන මේවා ද පහ වූ උපක්ලේශ ඇති  තැනැත්තා විසින් ද කළ කිස ඇති තැනැත්තා විසින් ද සත්ත්වයන්ගේ යහපත පිණිස නැවත පැවැත්විය යුතුය. තමාගේ උපක්ලේශ නැසූ කල්හි ද අන්‍යයන්ගේ සිතෙහි උපක්ලේශ ඉවත් කිරීම සිදුවෙයි අරුතින් පාටිහාරිය වෙයි. පාටිහාරියම පාටිහාරිය

(ප්‍රාතිහාර්යය)යි. ඉද්ධි-ආදේසනා-අනුසාසනි යන සමූහයෙහි එක එකක් වීම ද පාටිහාරිය යි කියනු ලැබේ. චතුර්ථ ධ්‍යානය ද මාර්ගය ද ප්‍රතිවිරුද්ධ ධර්ම ඉවත් කිරීම් වශයෙන් හෝ පාටිහාරිය නම්.

එහි හටගත්තේය, හේතුව වූ එයින් ආයේය යන අර්ථයෙන් පාටිහාරිය නම්. යම්හෙයකින් තන්ති, අර්ථ, දේශනා, ඒ ව්‍යවහාරය අවබෝධ (අභිසමය) කිරීම් සංඛ්‍යාත වූ හෝ හේතුව, හේතුඵලය, ඒ දෙකෙහි පැණවීම, අවබෝධ (පටිවෙධ) කිරීම් සංඛ්‍යාත වූ හෝ ධර්ම, අර්ථ, දේශනා, ප්‍රතිවේධ (යන මේවා) ගැඹුරු ය. සා ආදී (කුඩා) සතුන් විසින් මහා සමුද්‍රයට දුකසේ බැසගත යුතුවාක් මෙන් රැස් නොකරන ලද කුසල් සමූහ ඇති පුද්ගලයන් විසින් (ඒ ගැඹුරු වූ කරුණු සතරට) දුකසේ බැසගත යුත්තාහු වෙති, නොලැබිය හැකි ප්‍රතිෂ්ඨා ඇත්තෝ වෙති.

එහෙයින් ඒ ගම්භීර භාව සතරෙන් යුක්තය යන අරුතින් ධර්ම-අර්ථ-දේශනා-ප්‍රතිවෙධ යන මේවා ගැඹුරුය. එකම මොහොතක පවතින්නා වූ භාග්‍යවතුන් වහන්සේගේ එකම ධර්මදේශනා ඝෝෂාව නොයෙක් නොයෙක් භාෂා කථාකරන සත්ත්වයන්ට තම තමන්ගේ භාෂාව වශයෙන් පෙර පසු නොවී අල්ලා ගැනීමට (තේරුම් ගැනීම් සංඛ්‍යාවට) පැමිණ අර්ථාවබෝධය සිදුවෙයි. බුදුවරුන්ගේ බුද්ධානුභාවය සිතිය නොහැක්කේ යයි ද සියලු සත්ත්වයන්ට තම තමන් කථා කරන භාෂාවට අනුරූප වශයෙන් සවන් මගට එන්නේ යයි ද දතයුතුය.

නිදර්ශනාර්ථයෙන් : මම තෙමේ ම වටහා ගන්නා ලද්දේ නොවෙමි. ම විසින් මෙය ප්‍රත්‍යක්ෂ නොකරන ලදැයි තමා (කියනු ලබන දෙයට ඇති වගකීමෙන්) මිදෙමින් මගේ ඇසීම මෙසේය, මා විසිනුදු මෙසේ අසන ලදී යන මෙයින් දැන් කිවයුතු සියලු සූත්‍රය දක්වයි.

අවධාරණාර්ථයෙන්: **'එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං බහුස්සුතානං යදිදං ආනන්දො, ගතිමන්තානං - සතිමන්තානං - ධිතිමන්තානං - උපට්ඨාකානං යදිදං ආනන්දො'**[1] 'මහණෙනි, යම් ආනන්ද නම් භික්ෂුවක් වේද බොහෝ ඇසූ පිරූ තැන් ඇති මගේ ශ්‍රාවක භික්ෂූන් අතරින් මොහු අග්‍ර වෙයි. ශාස්තෲන් වහන්සේ විසින් කියන ලද ක්‍රමයෙන් ම

1. අංගුත්තර නිකාය - ඒකක නිපාත - එතදග්ග පාළි

සියලු පදයන් දන්නා වූ............. බුද්ධවචනය මතක තබාගැනීමේ සිහිය ඇති................., වීර්යය ඇති............ උපස්ථායක භික්ෂූන් අතරින් මොහු අග්‍ර වෙයි' යනුවෙන් මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් ද **'ආයස්මා ආනන්දො අත්ථකුසලො, ධම්මකුසලො, බ්‍යඤ්ජනකුසලො, නිරුත්ති කුසලො, පුබ්බාපර කුසලො'**[1] 'ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ අර්ථ කුශලයහ, ධර්ම කුශලයහ, නිරුක්ති කුශලයහ, පූර්වාපර කුශලයහ' යනුවෙන් ධර්ම සේනාපතීන් වහන්සේ විසින් ද පසස්නා ලද බවට අනුරූප වූ තමාගේ ධාරණ බලය දක්වමින් මෙසේ මා විසින් අසන ලදී. එය ද අර්ථ වශයෙන් හෝ ව්‍යඤ්ජන වශයෙන් හෝ අඩු නැත. වැඩි නැත. මෙසේ ම මිස අන් අයුරකින් නො දත යුතුය.

භාග්‍යවතුන් වහන්සේගේ හමුවෙහි අසන ලද ආකාර වශයෙන් අන් අයුරක් ද භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද ආකාර වශයෙන් අන් අයුරක් ද නැත. භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සිතිය නොහැකි ආනුභාව ඇත්තේය. ඒ දේශනාව සියලු ආකාරයෙන් දැනගන්නට නොහැකිය යන මේ අර්ථය කියන ලද්දේම ය. අසන ලද ආකාරය වරදවා නොගැනීම ම ධාරණ බලයයි.

මෙහි අර්ථ දෙකට ම එකම විෂය ඇති බැවින් අර්ථවල වෙනස් බවක් සැලකීමක් නැත. අනිත් අතට ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සියලු ආකාරයෙන් අල්ලා ගැනීමෙහි සමර්ථ ද අසමර්ථ ද යන තැනට පැමිණෙන්නේ ය.

මෙ ශබ්දය අර්ථ තුනක දක්නා ලැබේ. ඒ මෙසේය. **'ගාථාභිගීතං මෙ අභොජනෙය්‍යං'**[2] ගාථා ගායනාකොට ලබන ලද්ද මා විසින් වැළඳීමට සුදුසු නොවේ' යනාදියෙහි මා විසින් යන අර්ථයි. **'සාධු මෙ භන්තෙ භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු'**[3] 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට කෙටියෙන් ධර්මය දේශනා කරන සේක්වා' යනාදියෙහි මට යන අර්ථයි. **'ධම්මදායාදා මෙ භික්ඛවෙ භවථ'**[4] 'මහණෙනි, මගේ ධර්මයට

1. අං.නි. - පංචක නිපාත - චතුත්ථ පණ්ණාසක - වර්ගය 2 - සූත්‍රය 9
2. බ්‍රාහ්මණ සංයුත්තය
3. සංයුත්ත නිකාය - ඛන්ධ සංයුත්තය - න තුම්හාක වර්ගය
4. මජ්ඣිම නිකාය - ධම්ම දායාද සුත්ත

දායාද වවු' යනාදියෙහි මගේ යන අර්ථයි. මෙහි වනාහි මා විසින් අසන ලදැයි ද මගේ ඇසීම යයි ද යන අර්ථ දෙකෙහි යෙදෙයි. මෙහි ද යමෙක් අනිකෙක් නොවේ ද හෙතෙම තමාය යි කිවයුතු කල්හි නියත අධ්‍යාත්ම සංඛ්‍යාත ස්වකීය සන්තානයෙහි (තම සිතෙහි) පැවතීම් වශයෙන් ත්‍රිවිධ වූ 'මෙ' ශබ්දය එකම අර්ථයක දක්නා ලැබේ.

කරණ සම්ප්‍රදාන ආදී විධි විශේෂ සංඛ්‍යාත මේ අර්ථභේදය මෙහි දක්නා ලැබේ යයි 'මෙ සදෙදා තීසු අපෙොසු දිසසති' යි කියන ලදී.

**සුතං** යන මේ සුත ශබ්දය උපසර්ග සහිතව ද උපසර්ග රහිතව ද ගමන - ප්‍රකට - තෙත් - රැස්කළ - යෙදීම - කනින් දතයුතු - ශ්‍රෝතද්වාර අනුසාරයෙන් දන්නා ලද යනාදී නොයෙක් අර්ථ ප්‍රභේද ඇත්තේ ය. එසේ වුවද ක්‍රියා විශේෂක උපසර්ගය පැහැදිලි කරන බැවින් එය ඇතිකල්හි ද 'සුත' ශබ්දයම ඒ අර්ථය කියති'යි උපසර්ගයක් නැති සුත ශබ්දයේ අර්ථ දැක්වීමෙහි දී උපසර්ග සහිතව ද ගෙනහැර දක්වනු ලැබේ. එහි **'සෙනාය පසුතො'** 'සේනාව සමග යන්නේ' යනාදී තන්හි යන්නේය යන අර්ථයි. **'සුතධමමසස පසසතො'**[1] 'ප්‍රකට වූ දහම් ඇති (ඒ උපධි විවේකය නුවණැසින්) දකින්නහුට' යනාදී තන්හි ප්‍රකට ධර්මයාගේ යන අර්ථයි. **'අවසසුතාවසසුතසස'**[2] 'රාගයෙන් තෙත් වූවා රාගයෙන් තෙත් වූ' යනාදි තන්හි ක්ලේශයෙන් තෙත් වූවා හා තෙත් වූවහුගේ යන අර්ථයි. **'තුමෙහි පුඤඤං පසුතං අනපපකං'**[3] 'තොප විසින් අනල්ප වූ පිනක් රැස්කරන ලදී' යනාදී තන්හි රැස්කරන ලද යන අර්ථයි. **'යෙ ඣානපසුතා ධීරා'**[4] 'ධ්‍යානයෙහි යෙදුණු යම් පණ්ඩිතයෝ වෙත් ද' යනාදී තන්හි ධ්‍යානයෙහි යෙදුණු යන අර්ථයි. **'දිට්ඨං සුතං මුතං'**[5] දක්නා ලද, අසන ලද, නාසය-දිව-සිරුර යන දොරටුවලින් දැනගන්නා ලද' යනාදී තන්හි ශ්‍රෝත විඥානයෙන් දතයුතු යන අර්ථයි. **'සුතධරො සුතසනනිචයො'**[6] 'ඇසූ දේ දරන්නේ වේද, ඇසූ දැය රැස් වූ තැනෙක්

---

1. මහාවග්ග - මුචලින්ද කථා
2. පාචිත්තිය පාළි - භික්ඛුණී විභංග
3. ඛුද්දක පාඨ - තිරෝකුඩ්ඩ සුත්ත
4. ධම්මපද - බුද්ධවග්ග
5. මජ්ඣිම නිකාය - අලගද්දූපම සුත්ත
6. මජ්ඣිම නිකාය - මහා ගොසිංග සුත්ත

වේ ද' යනාදී තන්හි ශ්‍රෝත ද්වාරානුසාරයෙන් දතයුතු දේ දරන්නා වූ යන අර්ථයි. මෙහි වනාහි මේ සුත ශබ්දයේ ශ්‍රෝතද්වාරානුසාරයෙන් සලකා බැලූ හෝ සලකා බැලීම යන අර්ථය ඇත. 'මෙ' ශබ්දයට මා විසින් යන අර්ථය ඇතිකල්හි මෙසේ මා විසින් අසන ලදී, මා විසින් එය ශ්‍රෝතද්වාරානුසාරයෙන් සලකා බලන ලදී යන අර්ථයි. 'මගේ' යන අර්ථය ඇති කල්හි මෙසේ මගේ ඇසීමයි. ශ්‍රෝතද්වාරානුසාරයෙන් සලකා බැලීම යන අර්ථයි.

මෙසේ මේ පද තුනෙහි සුත ශබ්දය ළංකොට යෙදීමෙන් 'ඉති' ශබ්දයෙන් ඇසීමේ ක්‍රියාව ප්‍රකාශ වීම සිදුවන හෙයින් 'ඉති' යනු ශ්‍රෝත විඤ්ඤාණ කෘත්‍යය දැක්වීමයි. 'මෙ' යනු කියන ලද විඤ්ඤාණයෙන් යුක්ත පුද්ගලයා දැක්වීමයි. 'එව' යන්න සහිත වූම සියලු වාක්‍ය අවධාරණ අර්ථය ගෙන දෙයි. එහෙයින් සුතං යනු නො අසන බව ප්‍රතික්ෂේප කිරීමෙන් නො අඩුව, මුළා නොවී ගැනීම දැක්වීමයි. යම් සේ වනාහි අසන ලද්ද අසන ලද්දේම යයි කිවයුතු බවට සුදුසු ද එය මනාව අසන ලද්දේ ද වෙයි. නො අඩුව ගැනීම ද වෙයි. මුළානොවී ගැනීම ද වෙයි. නැතහොත් ශබ්දාන්තර අර්ථ ප්‍රකාශ කිරීම් වශයෙන් ශබ්දය තෙමේ අර්ථය කියයි ද යම්හෙයකින් සුතං යනු මොහුගේ නො අසන ලද්දක් නොවේය යන මේ අර්ථය වේද එහෙයින් සුතං යනු නො අසන බව ප්‍රතික්ෂේප කිරීමෙන් නො අඩුව, මුළානොවී ගැනීම දැක්වීමයි. මේ අදහස කියන ලද්දේ වෙයිඃ මෙසේ මා විසින් අසන ලදී, නො දකින ලදී, තමාගේ ඤාණයෙන් ප්‍රත්‍යක්ෂ නොකරන ලදී, අන් අයුරකින් හෝ අවබෝධ නොකරන ලදී. එය ද මනාකොට ය යන අර්ථයෙන් ඉති ශබ්දය අවධාරණ අර්ථය හෝ වෙයි. මේ අර්ථ යෝජනාව යයි ද එය අපේක්ෂා කරන්නා වූ සුත ශබ්දයේ නියමාර්ථය හටගන්නේ යයි ද නො ඇසීම ප්‍රතික්ෂේපය ද නො අඩුව, මුළනොවී ගැනීම දක්වන බව ද දතයුතුයි. මෙසේ ශ්‍රවණ හේතු - ශ්‍රවණ විශේෂ වශයෙන් ද පද තුනෙහි අර්ථ යෝජනාව කරන ලදැයි දතයුතුයි.

එසේම ඉති ශබ්දය ආකාර අර්ථයයි ගෙන 'ඉති' යනු ශ්‍රෝතද්වාර අනුසාරයෙන් පැවති විඤ්ඤාණ වීථියෙන් නා නා අර්ථ ව්‍යඤ්ජන ගැනීම් වශයෙන් නා නා ප්‍රකාරයෙන් අරමුණෙහි පැවති බව ප්‍රකාශ කිරීමයි. කියන ලද ආකාර ඇති විඤ්ඤාණ වීථියෙන් පර්යාප්ති ධර්මය අරමුණු කරන බැවින් 'මෙ' යනු ආත්ම ප්‍රකාශනයයි 'සුතං' යනු ධර්ම ප්‍රකාශනය යි.

නොයෙක් අයුරෙන් අරමුණෙහි පැවති විඤ්ඤාණ වීථියෙන් කාරණයට හේතු වූ (කාරණ භූතාය) මා විසින් අනිකක් නො කරන ලදී. මේ ධර්මය අසන ලදී යන මෙය මෙහි සංක්ෂේපය යි. එසේම 'ඉති' ශබ්දය නිදර්ශනාර්ථයයි ගෙන නිර්දේශ කළයුතු දෙය පිළිබඳ නිර්දේශ කළ යුතු දෙයක් නැති බැවින් 'ඉති' ශබ්දය යනු නිර්දේශ කළ යුතු දෙය පැවසීමයි. එහෙයින් 'ඉති' ශබ්දයෙන් සියල්ලම අසන ලදී. පරාමර්ශනය කරන ලදී යයි දතයුතුය. 'මෙ' යනු පුද්ගල ප්‍රකාශනයයි. 'සුතං' යනු පුද්ගල කාර්ය පැවසීමයි. සුත ශබ්දයෙන් වනාහි ලබන්නා වූ ශ්‍රවණ ක්‍රියාව ශ්‍රවණ විඤ්ඤාණ ධාරාව සමග බැඳී ඇත. එහි ද පුද්ගල ව්‍යවහාර සහිත වූ ධර්ම ධාරාවෙහි (ප්‍රබන්ධයෙහි) ශ්‍රවණ ක්‍රියාව ලැබේ. යම් සූත්‍රයක් නිර්දේශ කරන්නෙම් ද එය මා විසින් මෙසේ අසන ලදී යන මෙය එහි සංක්ෂේප අර්ථයයි.

එසේම 'ඉති' යනු යම් චිත්ත සන්තානයක නොයෙක් නොයෙක් අරමුණු පැවතීමෙන් නානාර්ථ ව්‍යඤ්ජන ගැනීම වේද 'ඉති' ශබ්දය ආකාර අර්ථය ලෙස ගෙන එහි නොයෙක් ආකාර දැක්වීම වෙයි. ඒ ඒ පවතින ආකාරය ගෙන පැණවිය යුතු ස්වභාවය ඇති බැවින් 'ඉති' යනු ධර්මයන්ගේ ආකාර ප්‍රඥප්තිය යි. මෙ යනු කරන්නා දැක්වීමයි. සුතං යනු විෂය දැක්වීමයි. ඇසිය යුතු ධර්මය වනාහි ඇසීමේ ක්‍රියාව කරන පුද්ගලයාගේ ඇසීමේ ක්‍රියාව වශයෙන් පැවැත්මට ස්ථානය වෙයි. මෙපමණකින් නොයෙක් ආකාරයෙන් පවතින චිත්ත සන්තානයෙන් එය යුක්ත තැනැත්තාගේ කර්තෘ විෂය ග්‍රහණය නිශ්චය කිරීම දක්වන ලද්දේ වෙයි.

නැතහොත් **ඉති** යනු පුද්ගල කෘත්‍ය නිර්දේශය යි. අසන ලද ධර්මයන් ගන්නා ලද ආකාරය හෝ නිදර්ශනය හෝ අවධාරණය හෝ ප්‍රකාශන ස්වභාවයෙන් යුක්ත ඉති ශබ්දයෙන් ඒ ආකාර ආදිය ධාරණය පිළිබඳව පුද්ගල ව්‍යවහාර-උපාදාන-ධර්ම-ව්‍යාපාර ස්වභාවයෙන් පුද්ගල කෘත්‍යය පෙන්වන ලද්දේ වෙයි. **සුතං** යනු විඥාන කෘත්‍ය නිර්දේශය යි. පුද්ගලවාදීහු ද ශ්‍රවණ ක්‍රියා විඥානය අපේක්ෂා රහිත වූවෝ නොවෙති. මෙ යනු උභය කෘත්‍යයෙන් යුක්ත පුද්ගල නිර්දේශය යි.

'මෙ' යන ශබ්දයේ පැවැත්ම ඒකාන්තයෙන්ම සත්ත්වයාගේ විශේෂ විෂයයකි. විඥාන ක්‍රියාව ද එහිම බැස්විය යුතුය.

ශ්‍රවණ කෘත්‍ය විඥානයෙන් සමන්විත පුද්ගලයා වූ මා විසින් විඥාන වශයෙන් ලබන ලද ශ්‍රවණ කෘත්‍ය ව්‍යවහාරයෙන් අසන ලදී යනු මෙහි සංක්ෂේපයයි.

එහි **ඉති** යනු ද මෙ යනු ද සච්ඡිකට්ඨ පරමත්ථ (ප්‍රත්‍යක්ෂ කළ පරමාර්ථ) වශයෙන් අවිද්‍යමාන ප්‍රඥප්තියයි.

ශ්‍රද්ධාවෙන් අවබෝධ කළ යුතු සියලු අර්ථයට ප්‍රඥප්ති ප්‍රධානත්වයෙන්ම පැමිණිය යුතු බැවින් සියලු ප්‍රඥප්තීන්ගෙන් විජ්ජමාන ආදි ප්‍රඥප්ති සයෙහි අවහිරයක් වේ. එහෙයින් යම් මායාවක් මිරිඟුවක් මෙන් හටනොගත් අර්ථයක් ද නොවෙයි. ඇසීම් ආදියෙන් ගතයුත්තක් මෙන් අනුමාන අර්ථයක් ද නොවේ. ඒ රූප-ශබ්ද ආදිය රුප්පනය (වෙනස්වීම), ඇසීම ආදී වශයෙන් පරමාර්ථ ස්වභාවය ද සච්ඡිකට්ඨ පරමාර්ථ වශයෙන් විද්‍යමාන වෙයි. **ඉති** යනුවෙන් ද **මෙ** යනුවෙන් ද කියනු ලබන්නා වූ ඒ ආකාර ආදී පරමාර්ථ නොවන ස්වභාවය **සච්ඡිකට්ඨ** පරමාර්ථ වශයෙන් නොලැබෙන අවිද්‍යමාන ප්‍රඥප්තිය නම්. මෙහි පරමාර්ථ වශයෙන් කුමක් ඇද්ද? **ඉති** යනුවෙන් හෝ **මෙ** යනුවෙන් හෝ යම් නිර්දේශයක් ලැබෙන්නේ ද එය යි. **සුතං** යනු විද්‍යමාන ප්‍රඥප්තියයි. යමක් කනින් ලබන (අසන) ලද ද එය පරමාර්ථ වශයෙන් විද්‍යමානය. එසේ ම **ඉති** යනු ශ්‍රෝතපථයට (කන් මගට) ආවා වූ ධර්ම ගෙන ඒවා සලකා බැලීම් ආකාරාදිය නැවත ස්පර්ශ කිරීම් වශයෙන් පරමාර්ථ වශයෙන් විද්‍යමානය. මෙ යනු සන්තති සහිත පර්යාපන්න ස්කන්ධයන් ද කරණාදී විශේෂ විශිෂ්ට කරුණු ද ගෙන කිවයුතු බැවින් උපාදාය ප්‍රඥප්තිය. **සුතං** යනු දෘෂ්ටි (පෙනීම) ආදිය සමීපකොට කිවයුතු බැවින් උපනිධාය ප්‍රඥප්තියි. දෘෂ්ටි (පෙනීම) ආදී ස්වභාව නැති ශබ්දායතනයෙහි පවත්නා වූ ද අසන ලද වචනය සුත ව්‍යවහාරය පළමුවැන්න ඇසුරුකොට දෙවැන්න, තුන්වැන්න ඇත්තාක් මෙන් දිට්ඨ-මුත-විඤ්ඤාත අපේක්ෂා නොකොට සුතං (අසන ලදී) යනුවෙන් දතයුතු හෙයින් දෘෂ්ටි ආදිය සමීපකොට කිවයුතු වෙයි. මෙසේ අසන ලද අර්ථ පෙන්වනු ලැබේ.

**සුතං** යන වචනයෙන් අසන ලද ආකාරය තත් වූ පරිද්දෙන් දක්වන හෙයින් මුළානොවීම දක්වයි. මුළා වූ තැනැත්තේ නොයෙක් ආකාරයෙන් වටහා ගැනීමෙහි සමර්ථයෙක් නොවේ. ලෝභය ප්‍රහාණාදී වශයෙන් නානාප්‍රකාර වූ ප්‍රතිවේධයට අපහසු වූ අර්ථ ඇති සූත්‍රාන්ත

නො අසන ලද්දේ නොවේ යන මේ අර්ථය සුතං යනුවෙන් ප්‍රකාශකරන ලද්දේ වෙයි. මෙහිද **ඉති** යන වචනයෙන් මුළානොවීම දක්වයි. අර්ථයේ ආකාර විශේෂ අවබෝධ කරන ලදමැයි මෙහිදී ආයුෂ්මත් ආනන්ද තෙරුන් විසින් ස්පර්ශ (සඳහන්) කරන ලදී. එහෙයින් මෙයින් මුළා නොවීම දක්වන ලද්දේ වෙයි. යමෙකුගේ අසන ලද්ද සිහිනැති වූයේ (අමතක වූයේ) වෙයි ද හෙතෙම කාලාන්තරයෙහි (පසුකලෙක) මා විසින් අසන ලදැයි ප්‍රතිඥා නො කරයි. මෙසේ ඔහුට සිහි මුළා නොවීමෙන් මුළාවීම නැති බැවින් ප්‍රඥාවෙන් ම අසන කාලයෙහි හටගත් ඊට වඩා උසස් වූ කාලප්‍රඥා සිද්ධිය වේ. එසේ ම සිහිමුළා නොවීමෙන් සති සිද්ධිය වේ. එහි ප්‍රඥාව පෙරටුකොට ඇති සිහියෙන් ව්‍යඤ්ජනාවධාරණය කිරීමේ සමත් බව වේ. ව්‍යඤ්ජනයන් අවබෝධ කරන ආකාරය නො ගැඹුරුය. ඇසූ අයුරින් දරාගැනීම ම එහිලා කළ යුතුය යනුවෙන් සිහියෙන් කළයුත්ත අධිකය. ප්‍රඥාව සතිය පූර්වාංගම කොට ගැනීමෙන් එහිදී ප්‍රඥාව ගුණයක් වෙයි. සතිය පූර්වාංගම වූ ප්‍රඥාවෙන් අර්ථ ප්‍රතිවේධ සමර්ථතාව වෙයි. අර්ථය අවබෝධ කළයුතු ආකාරය ගැඹුරුය යනුවෙන් ප්‍රඥාවෙන් කළයුත්ත අධිකය. සතිය, ප්‍රඥාව පූර්වාංගම කොට ගැනීමෙන් එහිදී එය (සතිය) ගුණයක් වෙයි. ඒ දෙවදෑරුම් සමර්ථතා යෝගයෙන් අර්ථ ව්‍යඤ්ජන සම්පන්න වූ ධර්මකෝෂය රැකීමේ සමත්කමින් ධර්මභාණ්ඩාගාරික බව සිද්ධ වෙයි.

වෙනත් ක්‍රමයක් ද වෙයි. **ඉති** යන වචනයෙන් යෝනිසෝ මනසිකාරය දක්වයි. එයින් කියනු ලබන්නා වූ ආකාරවලට නිදර්ශන, අවධාරණ අර්ථයෙන් මතු කියනු ලබන්නා වූ නානාප්‍රකාර ප්‍රතිවේධ පිළිබඳ පැහැදිලි කිරීම්වලට, ධර්මය විෂයකොට ඇති බැවින් අවිපරීත සිද්ධිය වෙයි.*

නුනුවණින් මෙනෙහි කරන්නාට නොයෙක් ආකාර වැටහීම ඇති නොවේ. **සුතං** යන වචනයෙන් නොවිසුරුණු බව දක්වයි. නිදානය විමසීම් වශයෙන් අවස්ථාවට පැමිණි කියනු ලබන්නා වූ සූත්‍රයේ ඇසීම (සිත) එකඟ කිරීම අතරතුර සිදු නොවේ. විසිරුණු සිත් ඇති තැනැත්තාට ඇසීමක් ඇති නොවන බැවිනි. එසේ ම සියලු සම්පත්තියෙන් යුක්තව කියනු ලබන කල්හි ද විසිරුණු සිත් ඇති පුද්ගලයා 'මා විසින් නො අසන ලදී. නැවත කියන්නැ'යි කියයි. මෙහි යෝනිසෝ මනසිකාරයෙන් තමාගේ

---

* උදානට්ඨ කථාවේ 11 පිටුවෙහි අදාළ කොටස ඇසුරෙනි.

සිත මනාව පිහිටුවා ගැනීම ද පෙර කළ පින් ඇති බව ද සාධනය කරයි. (තම සිත) මනාව නොපිහිටුවා ගත්තහුට හෝ පෙර නොකළ පින් ඇත්තෙකුට හෝ එය නොමැති බැවිනි. සිත නොවිසිරීමෙන් සද්ධර්ම ශ්‍රවණය ද සත්පුරුෂ ආශ්‍රය ද සිදුකරයි.

ධර්මය නොඇසූ තැනැත්තාටත් සත්පුරුෂ ආශ්‍රය නැති තැනැත්තාටත් එය නැති බැවිනි. විසිරුණු සිත් ඇති තැනැත්තා සද්ධර්මය අසන්නට නොහැකි කෙනෙක් වෙයි. සත්පුරුෂයන් ඇසුරු නොකරන්නාට (සදහම්) ඇසීමක් ද නැත.

වෙනත් ක්‍රමයක් : යම් චිත්ත සන්තානයක නොයෙක් ආකාර පැවතීමෙන් නානා අර්ථ ව්‍යඤ්ජන ගැනීමක් වේද එයට නානාකාර දැක්වීම යයි කියන ලදී. යම්හෙයකින් භාග්‍යවතුන් වහන්සේගේ වචනය පිළිබඳව අර්ථ ව්‍යඤ්ජන ප්‍රභේද පරිච්ඡේද වශයෙන් සකල ශාසන සම්පත්තියට බැසගැනීමක් වේද, එය නිරවශේෂ වූ අන්‍යයන්ගේ යහපත සම්පූර්ණ වීමට කාරණය වූයේ වෙයි. මෙසේ යහපත් ආකාරයක් (තම සිත) මනාව නො පිහිටුවා ගත්තහුට හෝ පෙර නො කළ පින් ඇත්තහුට හෝ නොවේ. එහෙයින් **ඉති** යන මේ යහපත් ආකාරයෙන් තමාගේ අවසන් චක්‍රද්වය සම්පත්තිය දක්වයි. **සුතං** යනු ශ්‍රවණ යෝගයෙන් පළමු චක්‍රද්වය* සම්පත්තිය යි. නුසුදුසු පෙදෙසක වාසය කරන්නාට හෝ සත්පුරුෂ ආශ්‍රය නැත්තහුට හෝ (ධර්ම) ශ්‍රවණයක් නැත. මෙසේ ඔහුගේ අවසන් චක්‍රද්වය* සිද්ධියෙන් ආසය සුද්ධිය සිද්ධ වූයේ වෙයි. (තම සිත) මනාව පිහිටුවා ගත් තැනැත්තා ද පෙර කළ පින් ඇති තැනැත්තා ද විසුද්ධආසය ඇත්තේ වෙයි. එය විසුද්ධියට හේතු වූ කෙලෙසුන්ගේ දුර බැවින් වෙයි. ඒ බව '**සම්මා පණිහිතං චිත්තං සෙය්‍යසො නං තතොකරෙ**'[1] 'මනාව පිහිටුවන ලද සිත ඔහුට ඊට වඩා යහපතක් කරන්නේය.' යනුවෙන් ද '**කතපුඤ්ඤොසි ත්වං ආනන්ද පධාන මනුයුඤ්ජ ඛිප්පං හොහි අනාසවො**'[2] 'ආනන්ද ඔබ පින් කළ කෙනෙකි. ප්‍රධන් වීර්යය වැඩීමෙහි

1. ධම්මපද - චිත්තවග්ග
2. දී.නි. මහා පරිනිබ්බාණ සුත්ත

* චක්‍ර සතර
1. සුදුසු පෙදෙසක වාසය
2. සත්පුරුෂ ආශ්‍රය
3. සිත මනාව පිහිටුවා ගැනීම.
4. පෙර කළ පින් ඇති බව (අං.නි - ච.නි)

යෙදෙන්න. වහා රහත් වන්නෙහිය' යනුවෙන් ද කියන ලදී. මුල් චක්‍රද්වය සිද්ධියෙන් පයෝග සිද්ධිය වෙයි. සුදුසු පෙදෙසක වාසයෙන් ද සත්පුරුෂ ඇසුරෙන් ද සත්පුරුෂයන්ගේ පැවැත්මට අනුකූල බවට පැමිණීමෙන් ද විශුද්ධ ප්‍රයෝගය වෙයි.

මුලදීම තෘෂ්ණා දෘෂ්ටි සංක්ලේශවලින් පිරිසිදු වූ බැවින් ඒ ආසය ශුද්ධියෙන් අධිගම ව්‍යත්ති සිද්ධිය වෙයි. ප්‍රයෝග සිද්ධියෙන් ආගම ව්‍යත්ති සිද්ධිය වෙයි. සුපිරිසිදු කය වචන ප්‍රයෝග ඇති, විපිළිසර බවක් නැති බැවින් නොවිසිරුණු සිත් ඇති තැනැත්තා වනාහි පර්යාප්තියෙහි විශාරදයෙක් වෙයි. මෙසේ පයෝග ආසය සුද්ධිය ඇති ආගම අධිගමයෙන් යුක්ත වූවහුගේ වචනය උදාවන හිරුට අරුණ නැගීම මෙන් ද කුශල ධර්මයට යෝනිසෝ මනසිකාරය මෙන් ද භාග්‍යවතුන් වහන්සේගේ වචනයට පූර්වාංගම වීමට සුදුසු වේනුයි ස්ථානයෙහි නිදානය තබමින් ඉති මෙ සුතං යනාදිය කීහ.

අනෙක් ක්‍රමයක් : **ඉති** යන මෙයින් පෙර කියන ලද ආකාරයෙන් නා නා ප්‍රකාර ප්‍රතිවේධ දැක්වීමෙන් තමාගේ අත්‍ථ - පටිභාන පටිසම්භිදා සම්පත්ති ඇති බව පෙන්වයි. **සුතං** යන මෙයින් ඉති ශබ්දය සමීපකොට තැබීමෙන් කියනු ලබන අපේක්ෂාවෙන් හෝ ඇසිය යුතු වූ ප්‍රභේද ප්‍රතිවේධ දැක්වීමෙන් ධම්ම-නිරුත්ති පටිසම්භිදා සම්පත්ති ඇති බව දක්වයි. කියන ලද ආකාරයෙන් ම **ඉති** යන මේ යෝනිසෝ මනසිකාරය දක්වන්නා වූ වචනය කියමින් 'මා විසින් මේ ධර්මයෝ මනසින් විමසා බලන ලදහ. දෘෂ්ටියෙන් මනාව වටහාගන්නා ලදහ'යි දක්වයි. මෙහි සීලය කියන ලදී, මෙහි සමාධිය කියන ලදී, මෙහි ප්‍රඥාව කියන ලදී, මෙහි මෙපමණ අනුසන්ධි ඇත ආදී වශයෙන් පර්යාප්ති ධර්මයෝ මනසින් විමසා බලන ලදහ. අනුශ්‍රව - ආකාර පරිවිතර්ක සම්බන්ධතාවෙන් හෝ දහම් වැටහීම (ධම්ම නිජ්ඣානඛන්ති) වූ ඤාතපරිඤ්ඤා සංඛ්‍යාත දෘෂ්ටියෙන් හෝ ඒ ඒ තන්හි කියන ලද රූප අරූප ධර්මයන් මෙය රූපයයි, රූපය මෙපමණකැයි ආදී ක්‍රමයෙන් මනාව තීරණයකොට වටහාගන්නා ලද්දාහු තමාටත් අනුන්ටත් හිතසැප පිණිස වෙති.

**සුතං** යන ශ්‍රවණ යෝගය හඟවන වචනය කියමින් 'මා විසින් බොහෝ ධර්මයෝ අසන ලදහ, දරන ලදහ, වචනයෙන් පුරුදු කරන ලදහ'යි දක්වයි. පර්යාප්ති ධර්මය කන් යොමු කිරීම සමග බැඳී ඇත.

ඇසීම, දැරීම පුරුද්ද කොට ඇත. ධර්මය මනාකොට දේශනා කර ඇති හෙයින් ඒ දෙකින් ම අර්ථ ව්‍යඤ්ජන පූර්ණත්වය දක්වමින් ඇසීමෙහි ආදරය ඇති කරවයි. අර්ථ ව්‍යඤ්ජන පරිපූර්ණ වූ ධර්මය ආදරයෙන් නො අසන්නා මහත් වූ යහපතෙන් පරිබාහිර වූයේ ය යි ආදරය උපදවා සකස්කොට ධර්මය ඇසිය යුතුය.

ඉති මෙ සුතං යන මේ සියලු වචනවලින් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද ධර්ම විනය තමාගේ දහමක් ලෙස නොපිළිගන්නාහු අසත්පුරුෂ භූමිය ඉක්මවති. ශ්‍රාවක බව පිළිගැනීමෙන් සත්පුරුෂභූමියට බැස ගනිති. අසත්ධර්මයෙන් සිත නැගිටුවති. සද්ධර්මයෙහි සිත පිහිටුවති. තනිකරම මෙය මා විසින් අසන ලද්දකි. ඒ භාග්‍යවතුන් වහන්සේගේම වචනයකියි දක්වමින් තමා (ඒ වගකීමෙන්) නිදහස් කරති. ශාස්තෘන් වහන්සේ සාක්ෂිකොට දක්වති. ජින වචනය (බුද්ධ වචනය) පිහිටුවති. ධර්ම නෙත්තිය (ධර්මයේ මාර්ගෝපදේශකත්වය) පිහිටුවති. තව ද 'ඉති මෙ සුතං' යන්න තමා විසින් උපදවන ලද්දක් බව නොපිළිගනිමින් පෙරඇසීම විවෘත කරමින් මෙය මා විසින් විශාරද ඥාන සතරෙන් විශාරද වූ දසබලධාරී වූ ශ්‍රේෂ්ඨ ස්ථානයෙහි සිටියා වූ සීහනාද පවත්වන්නා වූ සියලු සත්ත්වයන්ට උතුම්වූ ධර්මයට ඊශ්වර (අධිපති) වූ, ධර්මරාජ වූ ධර්මාධිපති වූ ධර්මදීපයක් වූ ධර්මසරණ වූ උතුම් සද්ධර්මයට චක්‍රවර්ති වූ සම්මා සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි දී පිළිගන්නා ලදී. මෙහි (මේ සූත්‍රවල) අර්ථයෙහි හෝ ධර්මයෙහි හෝ පදයෙහි හෝ අකුරුවල හෝ සැකයක් හෝ විමතියක් හෝ නොකළ යුතු ය යි සියලු දෙව් මිනිසුන්ගේ මේ ධර්මවිනය ගැන ඇති අශ්‍රද්ධාව විනාශ කරති. ශ්‍රද්ධා සම්පත්තිය උපදවති. එහෙයින් මෙය කියනු ලැබේ.

'විනාසයති අස්සද්ධං සද්ධං වඩ්ඪෙති සාසනෙ
ඉති මෙ සුතමිච්චෙවං වදං ගොතම සාවකො'

මා විසින් මෙසේ අසන ලදැයි මෙසේ කියමින් ගෞතම ශ්‍රාවකයා අශ්‍රද්ධාව විනාශ කරයි. ශාසනයෙහි ශ්‍රද්ධාව වඩයි. මෙහිලා (මේ ප්‍රශ්නය) ඇසීය. යම්සේ අනිත් සූත්‍රවල 'එවං මෙ සුතං එකං සමයං' යනාදී වශයෙන් කාලය-දේශය දක්වාම නිදානය කියන ලද ද, කුමක් නිසා මෙහි මෙසේ නො කියන ලද ද? තෙරුන්වහන්සේ විසින් නොකියන ලද

නිසා යයි අන් අය කියති. මේ නිදානය ආයුෂ්මත් ආනන්ද තෙරුන් විසින් නො කියන ලදී. භාග්‍යවතුන් වහන්සේ විසින් උපාසිකාවන් අතර බහුශ්‍රැත භාවයෙන් අග තනතුරෙහි තබන ලද සේඛ පටිසම්භිදාවට පත් ආර්ය ශ්‍රාවිකාවක වූ ඛුජ්ජුත්තරාව විසින් සාමාවතී ප්‍රමුඛ පන්සියයක් ස්ත්‍රීන්ට පළමුව කියන ලදී. මේ එහි අනුපිළිවෙල කථාවයි.

මෙයින් කල්ප ලක්‍ෂයකට මත්තෙහි පදුමුත්තර (පියුමතුරා) නම් සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලෝකයෙහි ඉපිද පවත්වන ලද උතුම් ධර්මචක්‍රය ඇත්තාහු හංසවතී නුවර වැඩවාසය කරති. ඉක්බිති එක්දිනක් හංසවතී නුවර එක් කුලදුවක් ශාස්තෲන් වහන්සේගේ ධර්ම දේශනාව අසන්නට යන්නා වූ උපාසිකාවන් සමග ආරාමයට යන ලදුව ශාස්තෲන් වහන්සේ එක් උපාසිකාවක බහුශ්‍රැතයන් අතර අග තනතුරෙහි තබනු දැක ප්‍රාර්ථනාවක් කොට ඒ තනතුර පැතුවාය.

ශාස්තෲන් වහන්සේ ද අනාගතයෙහි ගෞතම නම් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවිකා වූ බහුශ්‍රැත උපාසිකාවන්ටඅග්‍ර වන්නීයයි ඇයට විවරණ දුන්හ. ජීවිතාන්තය තෙක් කුසල්කොට දෙව්ලොව ඉපිද නැවත මිනිසුන් අතරදැයි මෙසේ දෙව් මිනිසුන් අතර සැරිසරන්නා වූ ඇයට කල්ප ලක්‍ෂයක් ඉක්මගියේ ය.

ඉක්බිති මේ භද්‍රකල්පයෙහි අපගේ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි දෙව්ලොවින් චුතව ඝෝසිත සිටුවරයාගේ නිවසෙහි කිරිමවකගේ කුසෙහි පිළිසිඳ ගත්තාය. ඇයට උත්තරා යන නම තැබූහ. ඈ උපන් කාලයෙහි කුදු වූ නිසා ඛුජ්ජුත්තරා යනුවෙන් ප්‍රකට වූවාය. ඈ පසුකලෙක ඝෝෂිත සිටුවරයා විසින් උදේන රජතුමාට සාමාවතිය දුන්කල්හි ඇගේ පරිචාරිකාව (සේවිකාව) වශයෙන් දෙන ලදුව උදේන රජුගේ අන්තඃපුරයෙහි වාසය කරයි.

එසමයෙහි කොසඹෑ නුවර ඝෝෂිත සිටුවරයා ද කුක්කුට සිටුවරයා ද පාවාරික සිටුවරයා ද භාග්‍යවතුන් වහන්සේ උදෙසා විහාර තුනක් කරවා ජනපද චාරිකාවෙහි හැසිරෙන තථාගතයන් වහන්සේ කොසඹෑ නුවරට සපැමිණි කල්හි බුද්ධප්‍රමුඛ භික්‍ෂු සංඝයාට විහාර පවරා දී මහදන් පැවැත්වූහ. මාසයක් පමණ ඉක්ම ගියේය. ඉක්බිති උන්වහන්සේලාට බුදුවරු නම් සියලු ලෝකයාට අනුකම්පා ඇත්තාහුය, අන් අයටත් අවස්ථාව දෙමුයි

යන මේ අදහස ඇතිවූහ. මෙසේ කොසඹෑ නුවර වැසියන්ටද අවස්ථාව සැලසූහ. එතැන් පටන් නුවරවැසියෝ සමානව වීථි බෙදාගෙන මහදන් දෙති.

ඉක්බිති එක්දිනක් ශාස්තෘන් වහන්සේ භික්ෂු සංඝයා විසින් පිරිවරන ලදුව වැඩිහිටි මාලාකාරයාගේ ගෙයි වැඩහුන්හ. එකෙණෙහි ඛුජ්ජුත්තරාව සාමාවතියට මල් ගෙනඑන්ට කහවණු අටක් ගෙන ඒ ගෙට ගියාය. වැඩිහිටි මාලාකාරයා ඇය දැක උත්තරා මෑණියනි, අද ඔබට මල් දීමට කාලයක් නැත, මම බුද්ධප්‍රමුඛ භික්ෂු සංඝයාට දන් වළඳවමි, ඔබද දන් වැළඳවීමට සහායිකාවක් වන්න, මෙසේ මෙයින් පසු අන්‍යයන්ගේ වැඩකටයුතු කිරීමෙන් මිදෙන්නී යයි කීය. එහෙයින් ඛුජ්ජුත්තරාව බුදුරජාණන් වහන්සේලා දන් වළඳන තැන වතාවත් කළාය. ශාස්තෘන් වහන්සේ විසින් ළඟ සිටින්නන්ට කරන (උපනිසින්නක) කථා වශයෙන් දේශනාකළ සියලු ධර්මය ඇ උගත්තාය. අනුමෝදනාව අසා සෝවාන් ඵලයෙහි පිහිටියාය.

ඇ අන් දිනවල කහවණු හතරක් දී මල් ගෙන යයි. ඒ දිනයෙහි වනාහි දක්නා ලද සත්‍ය ඇති බැවින් (සෝවාන් වූ නිසා) අන්සතු දෙයෙහි (සොර) සිතක් නො උපදවා කහවණු අටම දී කුඩය පුරවාගෙන මල් රැගෙන සාමාවතිය සමීපයට ගියාය. ඉක්බිති ඈ (සාමාවතිය) උත්තරා මෑණියනි, ඔබ අන් දිනවල බොහෝ මල් නොගෙනාවාය. අද බොහෝ ඇත. ඇයි රජතුමා අපට වඩාත් පැහැදුනේදැයි ඇගෙන් (උත්තරාවගෙන්) විමසුවාය. ඈ බොරු කියන්නට නුසුදුසු බැවින් අතීතයේ දී තමා විසින් කළ දේ නො සඟවා ඇත්ත කීවාය. එසේ නම් කුමක් නිසා අද බොහෝ මල් ගෙන එන ලදදැයි විමසූවිට අද මම සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ධර්මය අසා අමෘතය (නිවන) ප්‍රත්‍යක්ෂ කළෙමි. එහෙයින් මම ඔබ නොරැවටුවෙමියි කීවාය. එය අසා 'බොල දුෂ්ට' දාසිය මෙපමණ කාලයක් තා විසින් ගන්නා ලද කහවණු දෙන්නැ'යි තර්ජනය නොකොට පෙර (කළ පින්) හේතුවෙන් මෙහෙයවනු ලබන්නී මෑණියනි, ඔබ විසින් පානය කරන ලද අමෘතය අපට ද පොවන්නැයි කියා එසේනම් මා නහවන්නැයි කී කල්හි සුවඳ පැන් කළ දහසයකින් නහවා සිනිඳු සළු දෙකක් දෙවුවාය. ඈ එක් සළුවක් හැඳ එකක් පොරවා අසුනක් පණවා ආසනයෙහි හිඳ විසිතුරු විජිනිපත ගෙන පහත් ආසනවල හිඳින පන්සියයක් ස්ත්‍රීන් අමතා ශෛක්ෂ ප්‍රතිසම්භිදාවෙහි සිට ශාස්තෘන්

වහන්සේ දේශනා කළ ක්‍රමයෙන්ම ඒ ස්ත්‍රීන්ට ධර්මය දේශනා කළාය. දේශනාව අවසානයෙහි සියල්ලෝම සෝවාන් ඵලයෙහි පිහිටියහ. ඒ සියලු දෙනාම ඛුජ්ජුත්තරාවට වැඳ මැණියනි, අද පටන් ඔබ කිලිටි වැඩ නො කරන්න. අපගේ මව් තනතුරෙහි ද ගුරු තනතුරෙහි ද සිටින්නැයි කියා ගරු කටයුතු ස්ථානයෙහි තැබූහ.

කුමක් හෙයින් වනාහි ඈ දාසියක් වී උපන්නී ද? ඈ වනාහි කාශ්‍යප සම්මා සම්බුද්ධ කාලයෙහි බරණැස සිටුදූවක් වී ඉපිද (එම) උපස්ථායක නිවසට ගියා වූ එක් ක්ෂීණාශ්‍රව (රහත්) තෙරණියක ලවා ඒ සිටුදූව ආර්යාවෙනි, මට ඔය ආභරණ පෙට්ටිය දෙන්නැයි කියා වැඩක් කරවා ගත්තාය. තෙරණිය ද එය නොදෙන්නා වූ මා කෙරෙහි වෛර උපදවා නිරයෙහි උපදින්නීය, දෙන කල්හි අනුන්ට දාසියක වී උපදින්නීය, නිරයෙහි තැවීමට වඩා දාසිභාවය උතුම් ය යි දයාව නිසා ඇගේ වචනය ඉටු කළාය. ඈ ඒ කර්මයෙන් ජාති පන්සියයක් අනුන්ට දාසියකම වී උපන්නාය.

කුමක් හෙයින් කුදු වූවා ද? බුදුරජාණන් වහන්සේ නූපන් කල්හි බරණැස් රජුගේ ගෙයි වාසය කරන්නා වූ ඈ රජකුලයට හිතවත් තරමක් කුදු වූ පසේබුදු කෙනෙකුන් දැක තමා සමග එකට වාසය කරන කාන්තාවන් ඉදිරියේ පරිහාස (කවටකම්) කරමින් උන්වහන්සේගේ කුදු බවට අනුව තමන් ද සෙල්ලමට කුදු වූ ආකාරය දැක්වූවාය. එහෙයින් කුදු වී උපන්නාය.

කුමක් සිදුකොට මහා ප්‍රඥාවන්තියක් වූවා ද? බුදුරජාණන් වහන්සේ පහළවීමට පෙර බරණැස් රජුගේ ගෙයි වාසය කරමින් සිටියදී පසේබුදුවරු අටනමක් රජමැදුරෙන් උණු කිරිබත් පිරුණු පාත්‍ර අතින් අතට මාරු කරමින් ගන්නා ආකාරය දැක දළවලින් සාදන ලද තමන් සතු දරණු අටක් මෙහි තබාගන්නැයි කියා දුන්නාය. උන්වහන්සේලා එසේ කොට ඇය දෙස බැලූහ. ඔබවහන්සේලාටම ඕවා පරිත්‍යාග කරන ලදී, රැගෙන වඩිනු මැනවැයි කීවාය. උන්වහන්සේලා නන්දමූලක පබ්භාරයට (ගුහාවට) වැඩියහ. අදත් ඒ දරණු එසේම පවතී. ඈ ඒ කර්මයේ විපාකයෙන් මහා ප්‍රඥා ඇති තැනැත්තියක් වූවාය. ඉක්බිති (ඉන්පසු) සාමාවතී ප්‍රධාන පන්සියයක් ස්ත්‍රීහු මැණියනි, ඔබ දිනපතා ශාස්තෘන් වෙත ගොස් භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ධර්මය අසා අපට දේශනා

කරන්නැයි ඇයට කීවාහුය. ඈ එසේ කරමින් පසුකලෙක ත්‍රිපිටකධර වූවාය. එහෙයින් ශාස්තෲන් වහන්සේ '**එතදග්ගං භික්ඛවෙ මම සාවිකානං උපාසිකානං බහුස්සුතානං යදිදං ඛුජ්ජුත්තරා**'[1] 'මහණෙනි, යම් ඛුජ්ජුත්තරා නම් උපාසිකාවක් ඇද්ද බහුශ්‍රැත වූ මාගේ ශ්‍රාවිකා උපාසිකාවන් අතරෙහි ඈ අග්‍ර වේ' යනුවෙන් අග තනතුරෙහි තැබූහ.

මෙසේ උපාසිකාවන් අතර බහුශ්‍රැත භාවයෙන් ශාස්තෲන් වහන්සේ විසින් අග තනතුරෙහි තබන ලද පිළිසිඹියා පත් ඛුජ්ජුත්තරා ආර්ය ශ්‍රාවිකාව ශාස්තෲන් වහන්සේ කොසඹෑ නුවර වැඩවාසය කරන කල්හි කලින් කල ශාස්තෲන් වහන්සේ වෙත ගොස් දහම් අසා අන්තඃපුරයට ගොස් සාමාවතී ප්‍රධාන පන්සියයක් ආර්යශ්‍රාවිකා වූ ස්ත්‍රීන්ට ශාස්තෲන් වහන්සේ දේශනා කරන ලද ක්‍රමයෙන් ඇසූ පරිදි දහම් කියන්නී තමා නිදහස් කොට ශාස්තෲන් වහන්සේ සමීපයෙහි ඇසූ බව ප්‍රකාශ කරන්නී '**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**' භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සූත්‍රය වදාරණ ලද්දේය. අර්හත් වූ බුදුරජාණන් වහන්සේ විසින් මෙයම වදාරණ ලද්දේය' යන නිදානය නැංවූවාය. (තැබුවාය.) යම් හෙයකින් වනාහි ඒ නගරයෙහිදීම භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි අසා එදිනෙදා ම ඈ (ඛුජ්ජුත්තරාව) විසින් ඒ ස්ත්‍රීන්ට කියන ලද ද එහෙයින් '**එකං සමයං භගවා කොසම්බියං විහරති**' 'එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවර වැඩවාසය කරන සේක' යනුවෙන් කාලය-දේශය දැක්වීමට ප්‍රයෝජනයක් නැත්තේ සුප්‍රකට බැවිනි. භික්ෂුණීහුද ඇය සමීපයෙන් මේ සූත්‍ර උගත්හ. මෙසේ පරම්පරාවෙන් භික්ෂූන් අතරෙහිද ඇය විසින් නගන ලද නිදානය ප්‍රකට විය.

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසුකලක සප්තපර්ණි ගුහාවෙහි අජාතසත්තු රජතුමා විසින් කරවන ලද සද්ධර්ම මණ්ඩපයෙහි මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රමුඛ රහතන්වහන්සේ මැද වැඩහිඳ ධර්මය සංගායනා කරමින් මේ සූත්‍රවල නිදානයට දෙයාකාරයක් පවත්වා ගනිමින් ඇය විසින් නංවන ලද ක්‍රමයෙන් ම නිදානය නැංවූහ. ඇතැමෙක් මෙහිදී බොහෝ ආකාරයෙන් විස්තර කරති. ඒවායින් ඇති ඵලය කුමක් ද? ඒ ඇරත් නොයෙක් නොයෙක් ක්‍රමවලින් සංගීතිකාරක මහරහතන්

---

1. අං.නි. - ඒකක නිපාත - එතදග්ග පාළි

වහන්සේලා ධර්ම විනය සංගායනා කළහ. ධර්ම සංග්‍රාහක මහා ස්ථවිරයන් වහන්සේලා අනුබුද්ධයහ. (බුදුරජාණන් වහන්සේට පමණක් දෙවෙනි වූහ.) උන්වහන්සේලා මැනවින් ධර්ම විනය සංගායනා කරන ආකාරය දනිමින් තැනක 'එවං මෙ සුතං' යනාදී වශයෙන් ද තැනක 'තෙන සමයෙන' යනාදී වශයෙන් ද තැනක ගාථාවලින් නිදානය තබමින් ද තැනක හැම අයුරකින්ම නිදානයක් නොතබමින් ද වර්ග සංග්‍රහ කිරීම් ආදී වශයෙන් ද ධර්මවිනය සංගායනා කළහ. මෙහි 'වුත්තං හෙතං' යනාදී වශයෙන් නිදානය තබා සංගායනා කළහ. මේ බුද්ධ වචනය සූත්‍ර ගෙය්‍ය ආදී වශයෙන් අංග නවයකින් යුක්ත වූවාක් මෙන් සියලු සම්මා සම්බුදුවරුන් විසින් එය කියන ලදී. උන්වහන්සේලාගේ සූත්‍ර ගෙය්‍යාදිය ස්වල්ප විය. එහි (ඒ බුද්ධ ශාසනවල) එයට නිමිත්ත වූ 'වුත්තං හෙතං - පෙ- මෙ සුතං' යන මේ වචනය හැර ඉතිවුත්තක අංගයේ අන් කිසිවක් නොපෙනේ. එහෙයින් 'වුත්තං හෙතං භගවතා' යනාදී වශයෙන් පැවති සූත්‍ර එකසිය දහයක් ඉතිවුත්තක යයි අට්ඨකථාචාර්යයන් වහන්සේලා කීහ. එහෙයින් ශාස්තෘන් වහන්සේගේ අදහස දන්නා වූ ධර්මසංග්‍රාහක ආර්ය ශ්‍රාවකයන් වහන්සේලා විසින් ද මේ සූත්‍රවල ඉතිවුත්තක අංගය ඇති බව දැනගැනීම සඳහා මේ ක්‍රමයෙන්ම නිදානය තබන ලදැයි දතයුතුය.

ධර්මවිනය සංගායනා කරන කල්හි නිදාන වචනය කුමක් පිණිසද? භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කළ වචනය පමණක් සංග්‍රහ කළ යුතු නොවේද? (එයට හේතු ලෙස) දේශනාවේ පැවැත්ම, දේශනාව ගැන මුළා නොවීම පිණිස, ඇදහිය යුතු බව ඇතිවීම පිණිස යන කරුණු කියනු ලැබේ. කාලය - දේශය - දේශක - පිරිස - අපදේස වලින් යුක්තකොට තබන ලද දේශනාව බොහෝ කල් පවතින්නේ ද මුළා නොවන ස්වභාව ඇත්තේ ද ඇදහිය යුතු වන්නේ ද වෙයි. දේශය - කාලය - කර්තෘ - හේතුව - නිමිත්ත යන මේවායින් ව්‍යවහාර විනිශ්චය බැඳී ඇත්තාක් මෙනි. එහෙයින්ම ආයුෂ්මත් මහා කාශ්‍යප රහතන් වහන්සේ විසින් බ්‍රහ්මජාල, මූල පරියාය ආදී සූත්‍රවල දේශය ආදිය විමසූ කල්හි ඒවා විසඳීම කරන්නා වූ ධර්ම භාණ්ඩාගාරික ස්ථවිරයන් වහන්සේ විසින් 'එවං මෙ සුතං' යනාදී වශයෙන් නිදානය කියන ලදී. මෙහිදී දේශය - කාලය ගැනීමට ඇති කරුණු කියන ලද්දේමය.

තවදුරටත් නිදාන වචනය (යොදන්නේ) ශාස්තෲ සම්පත්තිය ප්‍රකාශ කිරීම පිණිසය. තථාගත භාග්‍යවතුන් වහන්සේගේ පෙර සූදානමක් - අනුමානයක් - අනුගමනයක් - තර්කයක් නැති බැවින් සම්මා සම්බුදු බව සිද්ධ විය. සම්මා සම්බුදුරජාණන් වහන්සේට පෙර සූදානම් වීම් ආදියෙන් ප්‍රයෝජනයක් නැත. ඒ දතයුතු ධර්මයන්හි හැමතන්හිම නොහැපුණු ඤාණය හැසිරෙන බැවින් හා එක පමණට ඇති බැවිනි. එසේ ම ගුරුමුෂ්ඨි, ධර්ම මච්ඡරිය ශාසනය සහිත ශ්‍රාවකයන් වෙත ඇලීම නැති බැවින් ක්ෂීණාශ්‍රව බව සිද්ධ විය. සුවිසුද්ධ වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේට ඒ පරානුග්‍රහ පැවැත්ම සියලු ආකාරයෙන් ඇති නොවේ. මෙසේ දේශකයා කිලිටි කරන දිට්ඨි - සීල සම්පදාවන් දූෂණය කරන අවිද්‍යා - තණ්හා අතිශයින්ම නැති බව ප්‍රකාශ කරන ඤාණ සම්ප්‍රදාව පහාන සම්ප්‍රදාව යන සලකුණුවලින් ද මනාව අවබෝධ කිරීම විසුද්ධ භාවයෙන් ද පළමු විශාරද ඥාන දෙක සිද්ධ විය. එහෙයින් ම අන්තරායික ධර්මයන්හි හා නිවනට පමුණුවන ධර්මයන්හි මුළා නොවන බව සිදුවීමෙන් අවසන් විශාරද ඥාන දෙක ද සිද්ධ වෙයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේගේ සතර විශාරද ඥානයෙන් යුක්ත බවද ආත්මාර්ථ පරාර්ථ යහපත පිණිස පවතින ප්‍රතිපත්තිය ද ඒ ඒ තැනට පැමිණි පිරිසේ අදහස්වලට අනුරූප වූ, තැනට සුදුසු වැටහීමෙන් ධර්මදේශනා පැහැදිලි කිරීමෙන් ද නිදාන වචනයෙන් ප්‍රකාශ කරන ලද්දේ වෙයි. මෙහිදී වනාහි ඉතිරි නොකොට කාමය හා ද්වේෂය ප්‍රහාණය කිරීම සලසා දේශනාව පැහැදිලි කිරීමෙන්දැයි මෙසේ යෙදිය යුතුය. එහෙයින් 'සත්‍ථු සම්පත්ති පකාසනත්‍ථං නිදානවචනං' 'නිදාන වචනය ශාස්තෲ සම්පත්තිය ප්‍රකාශ කිරීම පිණිස' යනුවෙන් කියන ලදී. මෙහි 'භගවතා, අරහතා' යන මේ පද දෙකෙන් කියන ලද අර්ථ පැහැදිලි කිරීම් මුලදීම දක්වන ලදී. එසේම නිදාන වචනය ශාසන සම්පත්තිය ප්‍රකාශ කිරීම පිණිසය. ඤාණයෙන් කරුණාවෙන් අල්ලාගන්නා ලද සියලු ක්‍රියා ඇති භාග්‍යවතුන් වහන්සේට නිරර්ථක හෝ තමාට හිත වූ හෝ ප්‍රතිපත්ති නැත. එහෙයින් අනුන් සඳහාම පැවති සියලු ක්‍රියා ඇති සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ පවත්නා අයුරින් කියන්නා වූ සියලුම කය - වචන - මනෝ කර්ම මෙලොව පරලොව පරමාර්ථවලින් සුදුසු පරිදි සත්ත්වයන්ට අනුශාසනා කරන අර්ථයෙන් ශාසනය කලින් සකස් කරන ලද්දක් නොවේ. එය කාල - දේස - දේශක - පිරිස - අපදේශවලින් ඒ ඒ තැන නිදාන වචනවලින් ද සුදුසු පරිදි ප්‍රකාශ කරනු ලැබේ. මෙහි වනාහි දේශක - පිරිස - අපදේස යොදාගත යුතුය. එහෙයින් 'සාසන සම්පත්ති පකාසනත්‍ථං නිදාන වචනං'යි කියන ලදී. තවද නිදාන

වචනය ශාස්තෘන් වහන්සේගේ ප්‍රමාණ භාවය ප්‍රකාශ කිරීමෙන් ශාසනයේ ප්‍රමාණභාවය දැක්වීම පිණිසය. ශාසනයේ ඒ ප්‍රමාණ බව දැක්වීම මුලින් කියන ලද ක්‍රමය අනුව භගවතා, අරහතා යන මේ පදවලින් ප්‍රකට කළේයයි දතයුතුය. මෙය මෙහි නිදාන වචනය දැක්වීමේ ප්‍රයෝජනය ගැන මුඛමාත්‍ර නිදර්ශනයකි.

**නිදාන වර්ණනාව නිමියේ ය.**

## 1.1.1

දැන් **එකධම්මං භික්ඛවෙ පජහථ** යනාදී ක්‍රමයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් තබන ලද සූත්‍රයේ වර්ණනාවට අවකාශය පැමිණියේ වෙයි. ඒ මේ අර්ථ වර්ණනාව වනාහි යම්හෙයකින් සූත්‍ර නික්ෂේපය විමසා කියනු ලබන්නේ ප්‍රකට වේද, එහෙයින් පළමුකොට සූත්‍ර නික්ෂේපය විමසන්නෙමු.

1. අත්තජ්ඣාසය
2. පරජ්ඣාසය
3. පුච්ඡාවසිකය
4. අට්ඨුප්පත්තිකය යනුවෙන් සූත්‍ර නික්ෂේප සතරකි.

නොයෙක් සිය ගණන් දහස් ගණන් භේද ඇති සූත්‍ර, සංකිලේසභාගිය ආදී වූ පට්ඨාන න්‍යායයෙන් දහසය (16) ආකාරය නො ඉක්මවන්නා සේම අත්තජ්ඣාසයාදිය සූත්‍ර නික්ෂේප වශයෙන් සතර ආකාරය නො ඉක්මවයි.

අත්තජ්ඣාසය ද පරජ්ඣාසය ද<br>
අත්තජ්ඣාසය ද පුච්ඡාවසිකය ද

අට්ඨුප්පත්තිකය ද පරජ්ඣාසය ද

අට්ඨුප්පත්තිකය ද පුච්ඡාවසිකය ද යනුවෙන් අජ්ඣාසය - පුච්ඡා අනුසන්ධි ලැබෙන බැවින් අත්තජ්ඣාසයට ද අට්ඨුප්පත්තිකයට ද පරජ්ඣාසය - පුච්ඡා සමග එක්වීම් භේදය ලැබේ. මෙසේ තවදුරටත් අට්ඨුප්පත්තිකයට අත්තජ්ඣාසය සමග එක්වීම ලැබුණත් ඉදිරියෙන් සිටි අත්තජ්ඣාසයාදිය සමග අට්ඨුප්පත්තියේ එක්වීමක් නැත. මෙසේ නිරවශේෂ වූ පට්ඨාන න්‍යාය නො ලැබේ. ලැබෙන්නා වූ සෙසු නික්ෂේප එහි ඇතුළත් බැවින් හෝ මූල නික්ෂේප වශයෙන් සූත්‍ර නික්ෂේප සතරක් කියන ලදැයි දතයුතුය. මේ එහි වචනාර්ථය යි. බහා තබනු ලැබේ යන අරුතින් නික්ඛේප නම් වේ. සූත්‍රය බහා තැබීම ම සූත්‍ර නික්ෂේප නම් වේ. නැතහොත් බහා තැබීම නික්ෂේපය යි. සූත්‍රයේ නික්ෂේපය සූත්‍ර නික්ෂේපය යි. සූත්‍ර දේශනාව යන අර්ථයි. තමාගේ අදහස අත්තජ්ඣාසය යි. එය මෙයට කරුණු වූයේ ය යනුවෙන් අත්තජ්ඣාසය නම් වේ. නැතහොත් මෙයට තමාගේ අදහස ඇත්තේය යනුවෙන් අත්තජ්ඣාසය නම් වේ. පරජ්ඣාසයෙහි ද මේ ක්‍රමය යි. විමසීමට යටත් වූයේ යන අරුතින් පුච්ඡාවස නම් වේ. එය මෙයට ඇත්තේය යන අරුතින් පුච්ඡාවසික නම් වේ. සූත්‍ර දේශනාවට කාරණය වූ අර්ථයේ උත්පත්තිය අත්ථුප්පත්ති නම් වේ. අත්ථුප්පත්තියම අත්ථුප්පත්තික නම් වේ. නැතහොත් එය මෙයට ඇත්තේය යන අරුතින් අත්ථුප්පත්තික නම් වේ.

නැතහොත් මෙය කරණකොට සූත්‍රය බහාතබනු ලැබේ යන අරුතින් නික්ඛේප නම් වේ. අත්ථජ්ඣාසයාදියම ය. මේ අර්ථ විකල්පයෙහි දී තමාගේ අර්ථය පිළිබඳ අදහස අත්තජ්ඣාසය යි. අනුන්ගේ අර්ථය පිළිබඳ අදහස පරජ්ඣාසය යි. විමසනු ලැබේ යන අරුතින් පුච්ඡා නම් වේ. විමසිය යුතු අර්ථය යි. විමසීම් වශයෙන් පැවති ධර්මය පිළිගන්නවුන්ගේ වචනය පුච්ඡාවසයයි. එය ම නික්ඛේප ශබ්දය අපේක්ෂාවෙන් පුල්ලිංග වශයෙන් කියන ලදී. එසේම අත්ථුප්පත්තිය ම අත්ථුප්පත්තිකයයි මෙසේ මෙහි අර්ථය දතයුතුය.

තවද අනුන්ගේ ඉන්ද්‍රිය මෝරා යාම් ආදී කරුණු අපේක්ෂා රහිත බැවින් අත්තජ්ඣාසයට වෙනම සූත්‍ර නික්ෂේපභාවයක් යෙදීම සුදුසුය. එහෙයින් බුදෙක් තමන්ගේ අදහසින්ම යයි ධර්මපාළිය තැබීම සඳහා පවත්වන ලද දේශනාවක් බැවිනැයි කීය. අනුන්ගෙන් අදහස් විමසන දේශනා පැවැත්මට හේතු වූ උත්පත්තියෙහි පැවති පරජ්ඣාසය පුච්ඡාවසික

දෙක පිළිබඳ අවිරුද්ධත්වය කෙසේ වේද? පුච්ඡාවසිකයට හේතුවූ පරජ්ඣාසයට ගැලපෙන සේ පැවති පරජ්ඣාසය පිළිබඳ අවිරුද්ධත්වය කෙසේවේද යනුවෙන් මෙය චෝදනා කළයුතු නොවෙයි. අනුන්ගේ ප්‍රාර්ථනා, විමර්ශන ආදියෙන් තොර වූ සූත්‍ර දේශනාවේ හේතුව වූ අර්ථෝත්පත්ති භාවයෙන් ගන්නා ලද බැවින් පරජ්ඣාසය පුච්ඡාවසික දෙකෙහි වෙන්ව ගැනීමයි.

එසේම බ්‍රහ්මජාල, ධම්මදායාද සූත්‍රාදියේ වර්ණනය, අවර්ණනය, ආමිෂ පහළවීම ආදී දේශනා නිමිත්ත අට්ඨුප්පත්ති යයි කියනු ලැබේ. අනුන්ගේ විමසීමක් නැතිව අදහසම නිමිතිකොට දේශනාකරන ලද්දේ පරජ්ඣාසයයි. විමසීම් වශයෙන් දේශනා කරන ලද්දේ පුච්ඡාවසිකයයි යන මේ අර්ථය ප්‍රකටය.

අන්‍යයන්ගෙන් ආරාධනා නොලැබූ භාග්‍යවතුන් වහන්සේ හුදෙක් තමන් වහන්සේගේ අදහසින්ම ආකංඛෙය්‍ය සූත්‍රය, තුවටක සූත්‍රය ආදී යම් සූත්‍ර දේශනා කරත් ද ඒ සූත්‍ර දේශනාවලට අත්තජ්ඣාසය නික්ෂේපය වෙයි. '**පරිපක්කා ඛො රාහුලස්ස විමුත්ති පරිපාචනීයා ධම්මා යන්නූනාහං රාහුලං උත්තරිං ආසවානං ඛයෙ විනෙය්‍යං**'[1] යනුවෙන් මෙසේ අනුන්ගේ අදහස, රුචිය, ප්‍රාර්ථනාව, අවබෝධ කරන බව ද බලා රාහුලෝවාද සූත්‍රය, ධම්මචක්කප්පවත්තන සූත්‍රය ආදී මේ සූත්‍ර අනුන්ගේ අදහස් වශයෙන් දේශනා කරන ලද ද ඒවාට පරජ්ඣාසය නික්ෂේපය වෙයි. ඒ ඒ දෙවිවරු ද මිනිස්සු ද සිවු පිරිස ද සතර වර්ණයට අයත් වූවෝ ද භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ 'ස්වාමීනි, බොජ්ඣංග බොජ්ඣංගයයි කියනු ලැබේ. නීවරණ නීවරණ යයි කියනු ලැබේ යනාදී වශයෙන් විමසත්. මෙසේ විමසන ලද භාග්‍යවතුන් වහන්සේ විසින් බොජ්ඣංග සංයුත්තාදී යම් දහමක් දේශනා කරන ලද ද ඒවාට පුච්ඡාවසිකය නික්ෂේපය වෙයි. උපන්නා වූ යම් ඒ කාරණයක් නිසා දේශනා කරන ලද ධම්ම දායාද, පුත්තමංසූපම, දාරුක්ඛන්ධූපම ආදී යමක් වේද ඒවාට අට්ඨුප්පත්තිකය නික්ෂේපය වෙයි. මෙසේ මේ සූත්‍ර නික්ෂේප සතර අතරින් මේ සූත්‍රයට පරජ්ඣාසය නික්ෂේපය වෙයි. මෙය වනාහි පරජ්ඣාසය වශයෙන් තබන ලදී. ලෝභයෙහි ආදීනව දකින්නා වූ ඒ පුද්ගලයන්ගේ අදහස් වශයෙනි. ඇතැමෙක් අත්තජ්ඣාසය යි කියති.

---

1. මජ්ඣිම නිකාය - චූලරාහුලෝවාද සුත්ත

එහි 'ඒකධම්මං භික්ඛවෙ' යනාදියෙහි ඒක ශබ්දය '**සස්සතො අත්තා ච ලොකො ච ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ඉච්චෙකෙ අභිවදන්ති**'[1] යනාදියෙහි 'අන්‍ය' යන අර්ථයෙහි ඇත. '**චෙතසො ඒකොදිභාවං**'[2] යනාදියෙහි ශ්‍රේෂ්ඨ අර්ථයෙහි ඇත. '**ඒකො වූපකට්ඨො**'[3] යනාදියෙහි අසහාය අර්ථයෙහි ඇත.

'**ඒකොව ඛො භික්ඛවෙ ඛණො ච සමයො ච බ්‍රහ්මචරියවාසාය**' යනාදියෙහි සංඛ්‍යා අර්ථයෙහි ඇත. මෙහි ද සංඛ්‍යා අර්ථයෙහිම ය යි දතයුතුය.'

ධම්ම ශබ්දය පරියත්ති - සච්ච - සමාධි - පඤ්ඤා - පකති - පුඤ්ඤ - ආපත්ති - සුඤ්ඤතා - ඤෙය්‍ය - සභාව ආදියෙහි දක්නා ලැබේ. ඒඅනුව එයට '**ඉධ භික්ඛු ධම්මං පරියාපුණාති**'[4] 'මේ ශාසනයෙහි භික්ෂුව ධර්මය ඉගෙන ගනියි' යනාදියෙහි පරියත්ති (පර්යාප්ති) යන අර්ථය ඇත්තේය. '**දිට්ඨධම්මො**'[5] 'දක්නා ලද ධර්මය' යනාදියෙහි සත්‍ය යන අර්ථ ඇත්තේය. '**එවං ධම්මා තෙ භගවන්තො අහෙසුන්ති**[6] ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු ධර්ම ඇත්තෝ වූහ' යනාදියෙහි සමාධිය යන අර්ථය ඇත්තේය. '**සච්චං ධම්මො ධිතී චාගො සවෙ පෙච්ච න සොචති**'[7] යනාදියෙහි ප්‍රඥාව යන අර්ථ ඇත්තේය. '**ජාති ධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති**'[8] 'මහණෙනි, ඉපදීම ස්වභාව (ප්‍රකෘතිය) කොටඇති සත්ත්වයන්ට මෙසේ කැමැත්තක් උපදින්නේය යනාදියෙහි ප්‍රකෘතිය යන අර්ථ ඇත්තේය. '**ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං**'[9] 'ධර්මය තෙමේ ම ධර්මචාරී පුද්ගලයා ආරක්ෂා කරයි' යනාදියෙහි පුඤ්ඤ (පින) යන අර්ථය ඇත්තේය. '**තිණ්ණං ධම්මානං අඤ්ඤතරෙන වදෙය්‍ය**

---

1. මජ්ඣිම නිකාය - පඤ්චත්තය සුත්ත
2. මජ්ඣිම නිකාය - භයභේරව සුත්ත
3. මජ්ඣිම නිකාය - කුක්කුරවතික සුත්ත
4. අංගුත්තර නිකාය - පංචක නිපාතය - සද්ධම්ම වග්ග
5. මහා වග්ග පාළි - මහාක්ඛන්ධක - පඨම භාණවාර
6. දීඝනිකාය - මහාපදාන සූත්‍රය
7. සංයුත්ත නිකාය - යක්ඛ සංයුත්තය
8. සච්ච විභංග සූත්‍රය
9. ජාතක පාළි

**පාරාජිකෙන වා සංඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා'**[1] "ඇවැත් තුන අතුරින් පරිජියෙන් හෝ සඟ වෙසෙසින් හෝ පචිතියෙන් හෝ එකකින් චෝදනා වශයෙන් කියයි නම්"

යනාදියෙහි ආපත්ති යන අර්ථ ඇත්තේය.

**'තසමිං බො පන සමයෙ ධම්මා හොනති'**[2] 'එසමයෙහි වනාහි ධර්මයෝ වෙති' යනාදියෙහි සුඤ්ඤතා (ශූන්‍යතාව) යන අර්ථ ඇත්තේය. **'සබ්බෙ ධම්මා සබ්බාකාරෙන බුද්ධසස භගවතො ඤාණමුඛෙ ආපාථං ආගචඡනත'**[3] 'සියලු ධර්මයෝ සියලු ආකාරයෙන් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ඤාණය ඉදිරියට පැමිණෙත්' යනාදියෙහි ඤෙය්‍ය (දතයුතු දේ) යන අර්ථ ඇත්තේය. **'කුසලා ධම්මා අකුසලා ධම්මා'**[4] 'කුශල ධර්ම අකුශල ධර්ම' යනාදියෙහි ස්වභාව අර්ථ ඇත්තේය. මෙහි ද ස්වභාව අර්ථ ඇත්තේය. එහෙයින් 'එකධම්මං' යනු එක් සංකිලේස ස්වභාවයක් යන අදහසයි. එකක් වූයේ ද එයයි, ධර්මය වූයේද එයයි = එකධම්මොය, ඒ එක් ධර්මය.

**භිකඛවෙ** යනු භික්ෂූන්ට ආමන්ත්‍රණය කරති. කුමක් සඳහා භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසමින් භික්ෂූන්ට අමතත් ද ධර්මයම දේශනා නොකරත් ද? සිහිය ඉපදවීම (ජනනය) පිණිසයි. භික්ෂූහු වනාහි අනිකක් සිතමින් ද ධර්මය නුවණින් සලකා බලමින් ද කමටහන් මෙනෙහි කරමින් ද වැඩහුන්නාහු වෙති. උන්වහන්සේලාට පළමුව ආමන්ත්‍රණය නොකොට ධර්මය දෙසන කල්හි මේ දේශනාව කුමක් නිදාන කොට ඇතිද? කුමක් ප්‍රත්‍යකොට ඇත්දැයි සලකන්නට නොහැකි වෙති. ආමන්ත්‍රණය කල කල්හි සිහිය එළඹවා සැලකීමට හැකිවෙති. එහෙයින් සිහිය ඉපදවීම පිණිස 'භිකඛවෙ' යනුවෙන් අමතති. එයින් (ඒ ඇමතීමෙන්) භික්ෂූන්ගේ සිඟායාමේ ස්වභාවය ඇති බව ආදී ගුණයෙදීම සිදුවන වචනයෙන් වඩා පහත් වූ ජනතාව විසින් සේවනය කරන ලද පැවැත්ම ප්‍රකාශ කරමින් උඩඟු බවට හා පහත් (දීන) බවට නිග්‍රහ කරති. 'භිකඛවෙ' යන කරුණාව පැතිරෙන සෞම්‍ය වූ ප්‍රසාද නුවන් (බැල්ම) හෙළීම පෙරටුකොට ඇති මේ වචනයෙන් භික්ෂූන් තමන් වහන්සේට අභිමුඛ

1. භික්ඛු විභංග - පඨම අනියත
2. ධම්මසංගණී
3. නිද්දෙසපාලි
4. ධම්මසංගණී - තිකමාතික

කරමින් කියනු කැමති බව දක්වන ඒ වචනයෙන් ම භික්ෂූන්ගේ අසනු කැමති බව උපදවති. ඒ අමතන අර්ථයෙන්ම මනාකොට ඇසීම හා මෙනෙහි කිරීමෙහි ද යොදවති. මනාකොට ඇසීම මෙනෙහි කිරීමට අයත් බව වනාහි සාසන සම්පත්තියයි. අනිකුත් දෙවිමිනිසුන් ද පිරිසට ඇතුළත් බව පෙනෙද්දීත් කුමක් හෙයින් භික්ෂූන්ට ම ආමන්ත්‍රණය කරත්ද? ජ්‍යෙෂ්ඨ, ශ්‍රේෂ්ඨ, ආසන්න බවට හැමකල්හි ඇතුළත් බැවිනි. භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම දේශනාව සියලු පිරිසට සාධාරණය. භික්ෂූහු පළමුව උපන් බැවින් පිරිසට ජ්‍යෙෂ්ඨය. අනගාරිය බව මුල්කොට ශාස්තෘ චර්යාව අනුව සම්පාදනය කරන බැවින් ද සකල ශාසනය පිළිගත් බැවින් ද ශ්‍රේෂ්ඨය. එහි හුන්නවුන් අතරින් සමීප පැවැත්මෙන් ආසන්නය. ශාස්තෘන් වහන්සේගේ සමීපයෙහි හැසිරෙන බැවින් හැමකල්හි ඇතුළත්ය. තවද උන්වහන්සේලා ධර්මදේශනාවට බඳුන් වූ බැවින් ද අනුශාසනා කළ පරිදි ප්‍රතිපත්තිය ඇති බැවින් ද (එසේ) වෙයි. විශේෂ වශයෙන් මේ දේශනාව ඇතැම් භික්ෂූන් සඳහාය යනුවෙන් උන්වහන්සේලාට ම ඇමතුහ.

පජහථ යන මෙහි ප්‍රහාණය නම් තදංගප්පහාණ, වික්ඛම්භනප්පහාණ, සමුච්ඡේදප්පහාණ, පටිප්පස්සද්ධිපහාණ, නිස්සරණප්පහාණ යනුවෙන් පස් ආකාර වෙයි.

එහි පහන් ආලෝකයෙන් මෙන් අඳුරට ප්‍රතිවිරුද්ධ බැවින් අලෝභාදියෙන් ලෝභාදී වූත්, නාමරූප පරිච්ඡේදාදී විදර්ශනා ඥානයෙන් ඒ ඒ අනර්ථයේ යම් ප්‍රහාණයක් වේද ඒ කෙසේද යත්: පරිත්‍යාගයෙන් ලෝභාදි කිලුටෙහි ද සීලයෙන් ප්‍රාණඝාත ආදී දුශ්ශීල බවෙහි ද ශ්‍රද්ධාදියෙන් අශ්‍රද්ධාදියේ ද නාමරූප වෙන් කිරීමෙන් සක්කාය දිට්ඨියේ ද ප්‍රත්‍ය පරිග්‍රහණයෙන් (විමසීමෙන්) අහේතු විසමහේතු දෘෂ්ටීන්ගේ ද එයට පසුකාලයේදී කංඛාවිතරණයෙන් සැක ඇති බවේ ද කලාප විමසා බැලීමෙන් මම ය මගේය යන ගැනීමේ ද මග්ගාමග්ග (මග-නොමග) වෙන් කිරීමෙන් අමාර්ගයෙහි මාර්ග සංඥාවද උදය (හටගැනීම) දැකීමෙන් උච්ඡේද දෘෂ්ටියේද වය (නැතිවීම) දැකීමෙන් ශාස්වත දෘෂ්ටියේ ද භය දැකීමෙන් භය සහිත දේවල් කෙරෙහි අභය සංඥාවේද ආදීනව දැකීමෙන් ආශ්වාද සංඥාවේ ද නිබ්බිදානුපස්සනාවෙන් (කලකිරීම අනුව දැකීමෙන්) ඇලීම් සංඥාවේ ද මුඤ්චිතුකම්‍යතා (මිදෙනු කැමති) ඥාණයෙන් නොමිදෙනු කැමති ඥාණයේ ද උපෙක්ඛා ඥාණයෙන් අනුපෙක්ඛාවේද

අනුලෝමයෙන් ධම්මට්ඨිතියේ ද නිවනින් ප්‍රතිලෝම භාවයේ ද ගෝත්‍රභූ ඥානයෙන් සංඛාර නිමිති ගැනීමේ ද ප්‍රහාණය මේ තදංගප්‍රහාණය නම් වේ.

උපචාර අර්පණා ප්‍රභේද ඇති සමාධියෙන් පවතින බව වැළැක්වීම් වශයෙන් කළගෙඩි පහරින් ජලය මතුපිට සෙවෙල ඉවත් වන්නාක් මෙන් ඒ ඒ නීවරණාදී ධර්මයන්ගේ යම් ප්‍රහාණයක් වේද මෙය විෂ්කම්භන ප්‍රහාණය නම් වේ.

සතර ආර්ය මාර්ග භාවිත කළ බැවින් ඒ ඒ මාර්ගයෙන් 'අත්තනො සන්තානෙ දිට්ඨිගතානං පහාණාය' 'තමාගේ සිතේ දෘෂ්ටීන්ගේ ප්‍රහාණය පිණිස' යනාදී ක්‍රමයෙන් කියන ලද සමුදය පක්ෂයට අයත් කෙලෙස් සමූහය සම්පූර්ණ වශයෙන් නොපවතින ස්වභාවයෙන් යම් සහමුලින් සිඳී යාමක් වේද මෙය සමුච්ඡේද ප්‍රහාණය නම් වේ.

ඵලය ලැබෙන මොහොතෙහි කෙලෙසුන්ගේ යම් සන්සිඳුණු බවක් වේද මෙය පටිප්පස්සද්ධි පහාණය නම් වේ. සියලු සංඛතයන් ඉවත්කළ බැවින් ප්‍රහීණ වූ සියලු සංඛත ඇති යම් නිර්වාණයක් වේද මෙය නිස්සරණප්පහාණය නම් වේ. මෙසේ පස්ආකාර වූ ප්‍රහාණයෙහි අනාගාමී ශ්‍රාවකයාගෙන් ප්‍රහාණය අදහස් කළ බැවින් මෙය සමුච්ඡේද ප්‍රහාණය යනුවෙන් දතයුතුය. එහෙයින් 'පජහථ' යනු දුරුකරව්. සහමුලින් නසව් යන අර්ථයි. **අහං** යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේ දක්වති.

වො යන මේ 'වො' ශබ්දය පච්චත්ත (ප්‍රථමා විභක්ති), උපයෝග (කර්ම විභක්ති), කරණ විභක්ති, සාමි වචන (සම්බන්ධ විභක්ති), පද පූරණය, සම්පදාන (චතුර්ථි විභක්ති) යන අර්ථයන්හි දක්නා ලැබේ. ඒ මෙසේය. **'කච්චි පන වො අනුරුද්ධා සමග්ගා සම්මෝදමානා'**[1] 'අනුරුද්ධයෙනි, කිම **තෙපි** සමගිව සතුටුව' යනාදියෙහි ප්‍රථමා විභක්තියෙහි ආයේය. **'ගච්ඡථ භික්ඛවෙ පනාමෙමි වො'**[2] 'යව මහණෙනි, **තොප** බැහැර කෙරෙමි' යනාදියෙහි කර්ම විභක්තියෙහි ආයේය.

---

1. මජ්ඣිම නිකාය - චූලගෝසිංග සූත්‍රය
2. මජ්ඣිම නිකාය - චාතුම සූත්‍රය

**'න වො මම සන්තිකෙ වත්ථබ්බං'**[1] 'තොප මා වෙත නො විසිය යුතුය' යනාදියෙහි කරණ විභක්තියෙහි ආයේය. **'සබ්බෙසං වො සාරිපුත්ත සුභාසිතං'**[2] ශාරිපුත්‍රයෙනි, තොප හැමගේ භාෂිතයෝ' සුභාෂිතයහ. යනාදියෙහි සම්බන්ධ විභක්ති අර්ථයෙහි යෙදේ. **'යෙ හි වො අරියා පරිසුද්ධකාය කම්මන්තා'** 'යම් ආර්ය කෙනෙක් පිරිසිදු කාය කර්ම ඇත්තාහු' යනාදියෙහි පද පූරණයෙහි ආයේය. **'වනපත්ථ පරියායං වො භික්ඛවෙ දෙසිස්සාමි'** 'මහණෙනි, තොපට වනපත් (ගමින් දුර වූ සෙනසුනක්) දහමක් දෙසමි' යනාදියෙහි සම්ප්‍රදානයෙහි ආයේය. මෙහි ද සම්ප්‍රදානයෙහිම ය යි දතයුතුය.

**පාටිභොගො** යනු ඇපකරු ය. ඔහු වනාහි ණය ගත් තැනැත්තා නිසා ණය දුන් තැනැත්තාට ද ණය දුන් තැනැත්තා නිසා ණය ගත් තැනැත්තාට ද අතරමැදි පුද්ගලයා (ප්‍රතිනිධිය) වූයේ ණය දුන් තැනැත්තා සතු වූ දේ ඔහුගෙන් ගෙනයාම් ආදී වශයෙන් අනුභව කරන හෙයින් භෝග ඇත යන අර්ථයෙන් පටිභොග නම් වේ. පටිභොගය ම පාටිභොගය යි. **අනාගාමිතාය** යනු අනාගාමී බව පිණිස, පිළිසිඳ ගැනීම වශයෙන් කාම භවයට නොපැමිණීමෙන් අනාගාමි යයි කියනු ලැබේ ද ඵලය සහිත වූ ඒ තෙවන මාර්ගය අනාගාමිතා නම් වේ.

මෙසේ හික්මවිය යුත්තන් දමනය කිරීමෙහි දක්ෂ වූ භාග්‍යවත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ යම්සේ බිඳුණු භූමිකා (කොටස්) ඇති පටිසසංයෝජනාදී තෙවන මාර්ගයෙන් දුරුකළ යුතු කෙලෙස් යම්සේ කාමරාග ප්‍රහාණය නො ඉක්මවයි ද එසේ හික්මවිය යුත්තන්ගේ අදහසට අනුකූල වූ තුන්වන මාර්ගාවබෝධය සැහැල්ලු උපායෙන් එක් ධර්මයක් පිරිම් මාත්‍රයෙන් ස්ථිරකොට දැක්වූහ.

කුමක් හෙයින් භාග්‍යවතුන් වහන්සේ තමන්වහන්සේ ඇපකරු බවෙහි තැබුවාහුද? ඒ භික්ෂූන්ට අනාගාමි මාර්ගාවබෝධයට උත්සාහ ඉපදවීම පිණිසයි. මා විසින් 'මහණෙනි, එක් ධර්මයක් දුරුකරව්. මම ඔබලාට අනාගාමි බව පිණිස ඇපවෙමියි කී කල්හි මේ භික්ෂූහු ඒකාන්තයෙන් ඒ එක් ධර්මය දුරුකොට තෙවන භූමිය අවබෝධ කරන්නට හැකි වෙති.

1. මජ්ඣිම නිකාය - චාතුම සූත්‍රය
2. මජ්ඣිම නිකාය - මහාගොසිංග සූත්‍රය

යම්හෙයකින් ධර්මස්වාමීන් වහන්සේ පළමුකොට මම ඇපවෙමියි කීවාහු ද එහෙයින් හටගත් උත්සාහ ඇත්තාහු ඒ සඳහා පිළිපැදිය යුතුය යනුවෙන් හඟින්නාහු ය යි භාග්‍යවතුන් වහන්සේ දකිති. එහෙයින් අනාගාමී බව පිණිස උත්සාහය ඉපදවීම පිණිස ඒ භික්ෂූන්ට තමන්වහන්සේ ඇපවීමෙහි තැබූහ.

**කතමං එකධම්මං** යන මෙහි 'කතමං' යනු විමසන වචනයයි. මේ විමසීම ද අදිට්ඨජෝතනා පුච්ඡා, දිට්ඨසංසන්දනා පුච්ඡා, විමතිච්ඡේදනා පුච්ඡා, අනුමති පුච්ඡා, කථේතු කම්‍යතා පුච්ඡා යනුවෙන් පස් ආකාරය. එහි ස්වභාවයෙන් ලක්ෂණය නො දන්නා ලද්දේ, නොදක්නා ලද්දේ, තුලනය (කිරීම) නො කරන ලද්දේ, තීරණය නො කරන ලද්දේ, නොදැනගන්නා ලද්දේ, අප්‍රකට වූයේ, විස්තර නොකරන ලද්දේ වෙයි. ඒ පිළිබඳ දැනගැනීම පිණිස, දැකීම පිණිස, තුලනය කිරීම පිණිස, තීරණය කිරීම පිණිස, දැනීම පිණිස, ප්‍රකට කිරීම පිණිස, විස්තර කිරීම පිණිස ප්‍රශ්නයක් විමසති. මෙය 'අදිට්ඨජෝතනා පුච්ඡා' නම් වේ. ස්වභාවයෙන් ලක්ෂණය දන්නා ලද්දේ, දක්නා ලද්දේ, තුලනය කරන ලද්දේ, තීරණය කරන ලද්දේ, දැනගන්නා ලද්දේ, ප්‍රකට වූයේ විස්තර කරන ලද්දේ වෙයි ද එය අන්‍ය පණ්ඩිතයන් සමග සැසඳීම පිණිස ප්‍රශ්නයක් විමසති. මෙය 'දිට්ඨ සංසන්දනා පුච්ඡා' නම් වේ.

මෙසේ ද? මෙසේ නොවේ ද? කුමක් වේද? කෙසේ වේද? යනුවෙන් ස්වභාවයෙන් සැකයට බැසගත්තේ වෙයි. විමතියට බැසගත්තේ වෙයි. සැකය උපන්නේ වෙයි. ඒ සැකය දුරුකිරීම පිණිස ප්‍රශ්නයක් විමසති. මෙය විමතිච්ඡේදනා පුච්ඡා නම් වෙයි. 'මහණෙනි, ඔබලා කුමක් සිතවුද? රූපය නිත්‍යද අනිත්‍යද?' ආදී වශයෙන් භාග්‍යවතුන් වහන්සේ අනුමතිය ගැනීම පිණිස ප්‍රශ්නයක් විමසති. මෙය අනුමති පුච්ඡා නම් වේ. 'මහණෙනි, හටගත් සත්ත්වයන්ගේ පැවැත්ම පිණිසත්, හටගන්නා වූ සත්ත්වයන්ට අනුග්‍රහ පිණිසත් මේ ආහාර සතරක් ඇත. කවර සතරක්ද? යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට කියනු කැමැත්තෙන් ප්‍රශ්නයක් විමසති. මෙය කථේතුකම්‍යතා පුච්ඡා නම් වේ. එහි මුල් විමසීම් තුන බුදුවරුන්ට නැත. කුමක් හෙයින් ද? සම්මා සම්බුද්ධරජාණන් වහන්සේලා විසින් නො දක්නා ලද, තුලනය නො කරන ලද, තීරණය නොකරන ලද, නොදැනගන්නා ලද, අප්‍රකට වූ, තුන් කාලයට අයත් කිසියම් සංඛතයක් හෝ විමුක්තයක් හෝ අසංඛතයක් හෝ ඒකාන්තයෙන් නැත. එහෙයින්

උන්වහන්සේලාට අදිට්ඨජෝතනා පුච්ඡාවක් නැත. උන්වහන්සේලා විසින් තමන්ගේ ඤාණයෙන් අවබෝධ කරන ලද යමක් ඇද්ද එයට අනිත් ශ්‍රමණයකු සමග හෝ බමුණකු සමග හෝ දෙවියකු සමග හෝ මාරයකු සමග හෝ බ්‍රහ්මයකු සමග හෝ සැසඳීමේ කෘත්‍යයක් නැත. එහෙයින් උන්වහන්සේලාට දිට්ඨසංසන්දනා පුච්ඡාවක් නැත. යම්හෙයකින් වනාහි භාග්‍යවත් වූ බුදුවරු සියලු ධර්මයන්හි සැක නැත්තාහු දුරුකළ විචිකිච්ඡා ඇත්තාහු පහ වූ සැක ඇත්තාහු වෙත්ද එහෙයින් උන්වහන්සේලාට විමතිච්ඡේදනා පුච්ඡාවක් ද නැත. අනිත් විමසීම් දෙක ඇත. ඒ දෙක අතරින් මෙය කථේතුකම්‍යතා පුච්ඡා යනුවෙන් දතයුතුය. දැන් ඒ විමසීමෙන් විමසන ලද අර්ථය ස්වරූප වශයෙන් දක්වමින් **'ලොභං භික්ඛවෙ එකධම්මං'** යනාදිය කීහ.

එහි එය කරණකොට ඇලෙත් හෝ තමා ඇලෙයි හෝ ඒ ඇලීම් මාත්‍රයම හෝ ලෝභ නම් වේ. එය අරමුණු ගැනීම ලක්‍ෂණකොට ඇත්තේය. මක්කටාලේපයක් (කොහොල්ලෑවල වඳුරෙකුගේ ඇලීමක්) මෙනි. අරමුණෙහි ඇලීම රසයයි. රත්වූ කබලෙහි දමන ලද මස් පිඩක් මෙනි. පරිත්‍යාග නොකිරීම වැටහෙන ආකාරයයි. තෙල් අඳුන් ඇලීම මෙනි. සංයෝජනයන්ට හිත වූ ධර්මයන් කෙරෙහි ආශ්වාද වශයෙන් දැකීම ආසන්න කාරණයයි. තෘෂ්ණාව නමැති නදී ස්වභාවයෙන් වැඩෙන්නා වූ යම් තැනක උපන්නා වූ ලෝභය තෙම වේගවත් සැඩපහරක් ඇති නදියක් මහා සමුද්‍රයට යන්නාක් මෙන් ඒ සත්ත්වයා ගෙන අපායටම යතියි දතයුතුය. මේ ලෝභ ශබ්දය සියලුම ලෝභයට සාමාන්‍ය වචනයක් වුව ද මෙහි වනාහි කාම රාගයට වචනයකැයි දතයුතුය. එය ද අනාගාමි මාර්ගයෙන් දුරුකළ යුතුය. නැවත 'භික්ඛවෙ' යන ඇමතීම ධර්මය පිළිගැනීම් ස්වභාවයෙන් අභිමුඛ වූවන්ට එහි ආදරය ඉපදවීම පිණිසයි.

'පජහථ' යන මෙයින් ප්‍රහාණ අභිසමය (දුරුකිරීම පිළිබඳ අවබෝධය) යෙදුණේ වෙයි. එය ද පරිඤ්ඤා අභිසමය, සච්ඡිකිරියා අභිසමය, භාවනා අභිසමය සමගම පවතී. වෙන්ව නො පවතී. චතුසත්‍ය අධිෂ්ඨානයෝ සතර සම්‍යක් දෘෂ්ටියේ කෘත්‍යයන් යෙදුණාහුම වෙත්. යම්සේ ලෝභය දුරුකරව් යනුවෙන් කී කල්හි එක්ව දුරුවීම් වශයෙන් දෝස ආදියේ ද ප්‍රහාණය අර්ථ වශයෙන් කියන ලද්දේම වෙයි. මෙසේ සමුදය සත්‍ය විෂයෙහි සම්‍යක් දෘෂ්ටි කෘත්‍ය, පහාණ අභිසමය කී කල්හි එය (සමුදය සත්‍ය) සමග ක්‍රියා කරන්නා වූ සම්මා සංකප්පාදී වූ සෙසු මාර්ගාංග

වල ද සමුදය සත්‍ය විෂය කෘත්‍යය අර්ථ වශයෙන් කියන ලද්දේම වෙයි. මෙසේ ආර්ය මාර්ග ව්‍යාපාරය පරිපූර්ණ යයි මෙහි කියන ලද්දේ යයි දතයුතුය. මේ ක්‍රමයෙන් සතිපට්ඨානාදී වූ බෝධිපාක්ෂික ධර්මයන්ගේ ව්‍යාපාරය (කටයුතු) පිළිබඳ මෙහි කියන ලද බව සුදුසු පරිදි විස්තර කළ යුතුය.

තවද මෙහි 'ලොභං පජහථ' යන මෙයින් පහාණ පරිඤ්ඤාව කියන ලදී. එය (පහාණ පරිඤ්ඤාව) ද තීරණ පරිඤ්ඤාවට ආසන්න කාරණයයි. තීරණ පරිඤ්ඤාව ද ඤාත පරිඤ්ඤාවට ආසන්න කාරණය යි. මෙසේ වෙන් නොවීම් වශයෙන් පරිඤ්ඤා තුනම අවබෝධ කරන ලද්දේ වෙයි. මෙසේ මෙහි ඵලය සහිතව චතුසත්‍ය කර්මස්ථානය පරිපූර්ණ කොට ප්‍රකාශිත යයි දතයුතුය. නැතහොත් 'ලොභං පජහථ' යන මෙයින් ඵලය සහිත ඤාණදස්සන විසුද්ධිය දේශනා කරන ලදී. එය ද පටිපදා ඤාණ දස්සන විසුද්ධිය ආශ්‍රයෙන් ද -පෙ- චිත්ත විසුද්ධි, සීල විසුද්ධි ආශ්‍රයෙන් ද අතරක් නැති බැවින් ඵලය සහිත සප්ත විශුද්ධි සියල්ල ප්‍රකට කරන ලදැයි දතයුතුය. මෙසේ මේ විශුද්ධි ක්‍රම භාවනාවෙන් පරිඤ්ඤා තුන සම්පාදනයෙන් ලෝභය දුරුකරනු කැමති තැනැත්තා විසින්

**අනත්ථ ජනනො ලොභො ලොභො චිත්තප්පකොපනො**
**භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති**[1]

ලෝභය අනර්ථය උපදවන්නේය. ලෝභය සිත කලඹවන්නේය. ඇතුළත උපන්නා වූ ඒ බියට හේතුව අන්ධබාල ජනයා නොදනී.

**ලුද්ධො අත්ථං න ජානාති - ලුද්ධො ධම්මං න පස්සති**
**අන්ධං තමං තදා හොති - යං ලොභො සහතෙ නරං**[2]

ලෝභී තැනැත්තා අර්ථය නොදනී. ලෝභී තැනැත්තා ධර්මය නොදකී.ලෝභය යම් මිනිසකු මඩියි ද එකල්හි අන්ධභාවය ඇතිකරන අඳුර වේ.

---

1. ඉතිවුත්තක පාලි - තික නිපාත - 4 වර්ගය - 9 සූත්‍රය
2. ඉතිවුත්තක පාලි - තික නිපාත - චතුත්ථවග්ග

**රත්තො ඛො ආවුසො රාගෙන අභිභූතො පරියාදින්න චිත්තො පාණම්පි හනති, අදින්නම්පි ආදියති, සන්ධිම්පි ඡින්දති, නිල්ලොපම්පි හරති, එකාගාරිකම්පි කරොති, පරිපන්ථෙපි තිට්ඨති, පරදාරම්පි ගච්ඡති, මුසාපි භණති, තදපි තෙසං භවතං සමණ බ්‍රාහ්මණානං ආජානතං අපස්සතං අවෙදයතං තණ්හානුගතානං පරිතසිතං විප්ඵන්දිතමෙව'**[1]

'ඇවැත්නි, රාගයෙන් රත් වූ, රාගයෙන් මැඩගත්තා වූ රාගයෙන් ඇදගන්නා ලද සිත් ඇති තැනැත්තා සතුන් මරයි. නොදුන් දේ ගනියි. ගෘහසන්ධි ද සිඳියි. කොල්ලකෑම් කරයි. එක් ගෙයක් පැහැර ගැනීම ද කරයි. මංපැහැරීමද කරයි. පරඹුවන් කරා ද යයි. බොරු ද කියයි. එය ද නො දන්නා ලද නො දක්නා ලද නොවිඳිනා ලද තණ්හාවට අනුගත වූ තැති ගත් ඒ පින්වත් මහණ බමුණන්ගේ දැගලීමකි.

**තණ්හා දුතියො පුරිසො දීඝමද්ධාන සංසරං**
**ඉත්ථභාවඤ්ඤථාභාවං සංසාරං නාතිවත්තති**[2]

තෘෂ්ණාව දෙවෙනි කොටගත් පුරුෂයා දිගුකලක් සැරිසරනුයේ මෙලොව පරලොව නමැති සංසාරය නොඉක්මවයි.

**නත්ථි රාගසමො අග්ගි නත්ථි දොසසමො කලි**[3]

රාගය සමාන ගින්නක් නැත. ද්වේෂය සමාන අපරාධයක් නැත.

**කාමරාගෙන ඩය්හාමි චිත්තං මෙ පරිඩය්හති**[4]

(මම) කාමරාගයෙන් දැවෙමි. මගේ සිත හාත්පසින් දැවෙයි.

**යෙ රාගරත්තානුපතන්ති සොතං**
**සයං කතං මක්කටකොව ජාලං**[5]

---

1.
2. අංගුත්තර නිකාය - චතුක්ක නිපාත - භණ්ඩගාම වග්ග
3. ධම්මපද - සුඛ වග්ග
4. සංයුත්ත නිකාය - වංගීස සංයුත්ත - ආනන්ද සුත්ත
5. ධම්මපද - තණ්හා වග්ග

යමෙක් රාගයෙන් රත්වූවාහු ද ඔවුහු තමන් විසින් කළ තෘෂ්ණා සැඩපහරට වැටෙති. මකුළුවා කළ දැලට සතුන් වැටෙන්නාක් මෙනි.

මේ ආදී සූත්‍ර පදානුසාරයෙන් නොයෙක් නොයෙක් ක්‍රමයෙන් ලෝභයේ ආදීනව (දොස්) නුවණින් සලකා බලා එය පහකිරීම පිණිස පිළිපැදිය යුතුය. තව ද ධර්ම හයක් කාමරාගය දුරුකිරීම පිණිස පවතී. ඒ අශුභ නිමිත්ත ඉගෙනීම, අශුභ භාවනාවෙහි යෙදීම, ඉඳුරන්හි වසන ලද දොරටු ඇති බව, භෝජනයෙහි පමණ දන්නා බව, කල්‍යාණ මිත්‍රයන් ඇති බව,සුදුසු කථා යනුවෙනි. දසවිධ වූ අශුභ නිමිත්ත ඉගෙන ගන්නාගේ ද කාමරාගය දුරුවෙයි. කායගතා සති භාවනා වශයෙන් විඤ්ඤාණය සහිත අශුභයෙහි ද උද්ධුමාතක (ඉදිමුණු) ආදී වශයෙන් විඤ්ඤාණය නැති අශුභයෙහි ද අශුභ භාවනාවෙහි යෙදුනහුගේ ද මනස සයවැනි කොට ඇති ඉඳුරන්හි සංවර කිරීම් වශයෙන් සිහිය නමැති දොර පළුවෙන් වසන ලද දොරටුව ඇති තැනැත්තාගේ ද (බත්) පිඬු සතරකට හෝ පහකට හෝ ඉඩ ඇති කල්හි ජලය පානයකොට යැපෙන ස්වභාවය ඇති භෝජනයෙහි පමණ දන්නා තැනැත්තාහුගේ ද කාමරාගය දුරුවෙයි.

එහෙයින්,

**චත්තාරො පඤ්ච ආලොපෙ අභුත්වා උදකං පිවෙ**
**අලං ඵාසුවිහාරාය පහිතත්තස්ස භික්ඛුනො**

බත්පිඬු සතරක් පහක් නො වළඳ පැන් බොන්නේය. එය වීර්යය වඩන භික්ෂුවට පහසු විහරණය පිණිස සුදුසුය'යි කීහ.

අශුභ කර්මස්ථාන භාවනාවෙහි ඇලුණු කල්‍යාණ මිත්‍රයන් සේවනය කරන්නාගේ ද සිටීම, හිඳීම ආදියෙහි දස අශුභය ඇසුරුකොට ඇති සුදුසු කථාවෙන් ද (කාමරාගය) දුරුවෙයි. එහෙයින් '**අත්ථි භික්ඛවෙ අසුභ නිමිත්තං තත්ථ යොනිසො මනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස අනුප්පාදාය උප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස පහාණාය**'

'මහණෙනි, අසුභ නිමිත්තක් ඇත. එහි නුවණින් මෙනෙහි කිරීම බහුල වශයෙන් කිරීමක් වේද මෙය නූපන් කාමච්ඡන්දයේ නූපදීම පිණිසත් උපන්නා වූ කාමච්ඡන්දයේ දුරුකිරීම පිණිසත් වේ' යනුවෙන් කීහ. මෙසේ

පූර්ව භාගයෙහි කාමරාග සංඛ්‍යාත ලෝභයේ ප්‍රහාණය පිණිස පිළිපන් තැනැත්තා විදර්ශනාවට උනන්දු කරවා තෙවන මාර්ගයෙන්ම එය ඉතිරි නොකොට සහමුලින් සිඳ දමයි. එහෙයින් '**ලොභං භික්ඛවෙ එකධම්මං පජහථ අහං වො පාටිභොගො අනාගාමිතාය**' යනුවෙන් කියන ලදී.

මෙහිදී මේ ප්‍රශ්නය ඇසීය. මෙහි වනාහි කවර ලෝභයක් දුරු වෙයිද? අතීත ද? නැතහොත් අනාගත ද නැතහොත් වර්තමාන ද? මෙහිදී පිළිතුර කුමක්ද? ඒවා නැති බැවින් පළමුකොට අතීත ලෝභය හෝ අනාගත ලෝභය හෝ පහ නොවන්නේය. පහවූ හෝ නූපන් හෝ ලෝභයක් ඇතැයි නො කියනු ලැබේ, උත්සාහයද අඵල බවට පැමිණේ. ඉක්බිති වර්තමානය, ලෝභයේ ස්වභාවය බිඳී ඇති බැවින් මෙසේම උත්සාහය අඵල වෙයි. කිලිටි වූ මාර්ග භාවනාවට ද පැමිණේ. චිත්ත විප්පයුත්ත වූ ලෝභයක් ඇත්නම් මේ න්‍යාය කැමති නොවන ලද්දේයයි කියනු ලැබේ. කියන ලද අයුරින් අතීත-අනාගත-වර්තමාන ලෝභය දුරු නො වෙයි. මෙහි යම්සේ ගෙඩි හට නොගත් තරුණ ගසක් ඇත් ද පුරුෂයෙක් ඒ ගසේ මුල් කෙටේරියෙන් කපන්නේය. ඒ ගස කැපීමක් නැති කල්හි යම් (පමණ) ගෙඩි හටගන්නේ නම් ගස කපන ලද බැවින් 'නූපන්නා වූ ගෙඩි නූපදින්නේය. එසේම ආර්යමාර්ග අවබෝධය නැතිකල්හි ඉපදීමට සුදුසු වූ ලෝභය, ආර්ය මාර්ග අවබෝධයෙන් ප්‍රත්‍ය නසන ලද බැවින් නූපදී. අට්ඨකථාවන්හි මෙය භූමියක් ලැබ උපන්නේ යයි කියනු ලැබේ. විදර්ශනාවට අරමුණු වූ පංචස්කන්ධය ඒ ලෝභය ඉපදීමට තැනක් වන බැවින් භූමිනම් වේ. ඒ භූමිය එයින් (ලෝභයෙන්) ලබන ලදැයි ගෙන භූමියක් ලැබ උපන්නේ ය යි කියනු ලැබේ. අරමුණු අයත්කොට උපන්නේ ද විෂ්කම්භනය නොකිරීමෙන් උපන්නේ ද සහමුලින් විනාශ නොකිරීමෙන් උපන්නේ ද මෙයම යයි කියනු ලැබේ.

**තත්ථ** යනු ඒ සූත්‍රයෙහි. **එතං** යනු දැන් ගාථා බන්ධන වශයෙන් කියන්නා වූ මේ උපන් අර්ථය යි. **ඉතිවුච්චති** යනු කවරකු විසින් කියනු ලැබේද? භාග්‍යවතුන් වහන්සේ විසින්මය. එබඳු අනික් තැන්වලදී සංගීතිකාරක රහතන් වහන්සේලා විසින් ද සම්බන්ධ කරන ලද ගාථා වෙයි. මෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් ම ගාථාවන්ට කැමති පුද්ගලයන්ගේ අදහස් වශයෙන් කියන ලද්දා වූ ම අර්ථය සංග්‍රහ කොට ගාථා කියන ලදී.

**එහි යෙන ලොභෙන ලුද්ධා සෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං** යනු යම් අරමුණු ගැනීම් ලක්ෂණයකින්, එයින්ම ඇලීම නම් රසයෙන් යුක්ත වූ ලෝභයෙන් ඇලුණා වූ ආධ්‍යාත්මික බාහිර ආයතනයන්හි ගිජු වූ ගැටගැසුණා වූ, 'සෙ' යනු නිපාත මාත්‍රයකි. අක්ෂර චින්තකයෝ (ව්‍යාකරණඥයෝ) වනාහි මෙබඳු තැන්හි 'සෙ' කාරයක් ආගම කිරීමට කැමති වෙති. එසේ ඇලුණු බැවින් ම කාය සුචරිතාදීන් අතරින් කිසියම් සුචරිතයක් නොකොට කාය දුශ්චරිතාදිය රැස්කොට රූපාදියෙහි ඇලුණු බැවින් සත්ත්වයෝ යනුවෙන් ලබන ලද නම් ඇති ප්‍රාණීහු දුකට ඉපදීමට ස්ථානයක් වන බැවින් දුග්ගති සංඛ්‍යාවට ගිය නිරයට ද තිරිසන් යෝනියට ද ප්‍රේත විෂයට ද ප්‍රතිසන්ධි ගැනීම් වශයෙන් යති එළඹෙති.

**තං ලොභං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො** යනු ඒ කියන ලද ආකාර ඇති ලෝභය ස්වභාව වශයෙන්, සමුදය (හටගැනීම්) වශයෙන්, විනාශයට යාම් වශයෙන්, ආශ්වාද වශයෙන්, ආදීනව වශයෙන්, නිස්සරණ (නිදහස් වීම්) වශයෙන් යන මේ ආකාරවලින් මනාකොට නොවෙනස් වූ හේතුවෙන් න්‍යායයෙන් දැන ඤාත - තීරණ පරිඤ්ඤා සංඛ්‍යාත වූ ප්‍රඥාවෙන් දැන රූපාදී පංච උපාදානස්කන්ධයන් අනිත්‍යාදී විවිධ ආකාරවලින් දැකීමෙන් විදර්ශනා කරන්නෝ ඉතිරි වූ කෙලෙස් විදර්ශනාව පෙරටුකොට ඇති මාර්ග ප්‍රඥාවෙන් සමුච්ඡේද ප්‍රහාණ වශයෙන් දුරුකරති. නැවත තමාගේ සිතෙහි ඉපදීමට නොදෙති.

**පහාය න පුනායන්ති ඉමං ලොකං කුදාචනං** යනු මෙසේ එකට ඉපදීම් වශයෙන් එක්ව සිටි, එකට දුරුකිරීම් වශයෙන් එක්ව සිටි ඉතිරි කෙලෙස් සමග ඒ ලෝභය අනාගාමි මාර්ගයෙන් දුරුකොට නැවත පසුව මේ කාමධාතු සංඛ්‍යාත ලෝකයට ප්‍රතිසන්ධි ගැනීම් වශයෙන් කිසිකලෙක නො පැමිණෙත්. ඔරම්භාගිය සංයෝජන මනාව ප්‍රහීණ බැවිනි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අනාගාමි ඵලයෙන් දේශනාව නිම කළහ.

**අයම්පි අත්ථො** යනු නිදානය අවසන් වූ තැන් පටන් ගාථා අවසානය තෙක් මේ සූත්‍රයෙන් ප්‍රකාශ කරන ලද අර්ථය. 'අපි' ශබ්දය දැන් කියන්නා වූ සූත්‍ර අර්ථය සම්පිණ්ඩනය (එක්රැස්) කිරීමයි. සෙස්ස කියන ලද පරිදිමය.

මේ සූත්‍රයෙහි සමුදය සත්‍යය ස්වරූප වශයෙන් ම ආයේය. ප්‍රහාණ ප්‍රදේශයෙන් මාර්ග සත්‍යය ආයේය. ඉතිරි සත්‍ය දෙක ද ඒ දෙකට හේතුවන බැවින් වෙන්කොට දැක්විය යුතුය. ගාථාවෙහි වනාහි දුක්ඛ-සමුදය - මාර්ග සත්‍යයෝ කියන ලද පරිද්දෙන්ම දන්වති. අනික (නිරෝධ සත්‍යය) වෙන්කොට දැක්විය යුතුය. මෙයින් පසු සූත්‍රයන්හි ද මේ ක්‍රමයමයි.

**පරමත්ථදීපනී ඛුද්දක නිකායට්ඨකථා ඉතිවුත්තක වර්ණනාවේ පළමු සූත්‍ර වර්ණනාවයි.**

## 1.1.2

වුත්තං හෙතං -පෙ- දොසං යනු දෙවන සූත්‍රය යි. මේ එහි පෙර නොකියන ලද පදවල වර්ණනාව යි. මේ සූත්‍රයෙහි දී මෙසේ පෙර නොකියන ලද පද වර්ණනා කරන්නා සේ මෙයින් පසුවද හැමතැනදීම පෙර නොකී පද වැනුම ම කරන්නෙමු. මේ සූත්‍රය ද්වේෂ බහුල පුද්ගලයන්ගේ අදහස් බලා ද්වේෂය සන්සිඳීම පිණිස දේශනා කළ හෙයින් 'දොසං භික්ඛවෙ එකධම්මං පජහථ' යනුවෙන් ආයේය.

එහි දොසං යනු 'අනත්ථං මේ අචරීති ආඝාතො ජායති'[1] 'මට අවැඩ පිණිස හැසිරුණේයයි ද්වේෂය උපදියි ආදී ක්‍රමයෙන් සූත්‍රයෙහි කියන ලද නවය ද 'අත්ථං මෙ නාචරි' 'මට වැඩ පිණිස නොහැසිරුණේය' යනාදී එයට ප්‍රතිවිරුද්ධ වශයෙන් ඇති වූ නවයදැයි යන දහඅට ද කණු කටු ආදියෙහි හැපීමෙන් ඇතිවන අස්ථාන කෝපය සමග දහනවයක් වූ ආඝාත වස්තු අතරින් එක්තරා ආඝාත වස්තුවකින් උපන් ආඝාතයක් (ක්‍රෝධයක්). ඒ ද්වේෂය වනාහි එය කරණකොට කිලිටි වෙයි. නැතහොත් තමා කිලිටි වෙයි. නැතහොත් කිලිටිවීම් මාත්‍රයම ද්වේෂය යි කියනු ලැබේ.

1. විභංගප්පකරණය - ඛුද්දක වත්ථු විභංග

ඒ ද්වේෂය දණ්ඩෙන් පහරලත් සර්පයකු මෙන් චණ්ඩ බව ලක්‍ෂණ කොට ඇත්තේය. සිරුරට විෂක් වැටුණු කලක මෙන් දැඟලීම කෘත්‍ය (රසය) කොට ඇත්තේ ය. නැතහොත් තම හදවත ලැව්ගින්නක් මෙන් දැවීම කෘත්‍ය කොට ඇත්තේය. ලබන ලද අවස්ථාවක් ඇති සතුරකු මෙන් කෙලෙසීම (දූෂණය) වැටහෙන ආකාර කොට ඇත්තේය. විෂවලින් අනන ලද ගොමුත්‍රය (පූතිමුත්ත) මෙන් මුලින් කියන ලද ආඝාත වස්තු ආසන්න කාරණය කොට ඇත්තේය.

පජහථ යනු සහමුලින් නසව්. එහි 'පඤ්චිමෙ භික්ඛවෙ ආඝාත පටිවිනයා යත්ථ භික්ඛුනො උප්පන්නො ආඝාතො සබ්බසො පටිවිනෙතබ්බො කතමෙ පඤ්චඃ යස්මිං භික්ඛවෙ පුග්ගලෙ ආඝාතො ජායෙථ මෙත්තා තස්මිං පුග්ගලෙ භාවෙතබ්බා -පෙ- කරුණා - උපෙක්ඛා -පෙ- අසති අමනසිකාරො තස්මිං පුග්ගලෙ ආපජ්ජිතබ්බො, එවං තස්මිං පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බො, යස්මිං භික්ඛවෙ පුග්ගලෙ ආඝාතො ජායෙථ කම්මස්සකතා එව වා තස්මිං පුග්ගලෙ අධිට්ඨාතබ්බා - කම්මස්සකො අයමායස්මා කම්මදායාදො භවිස්සතී'ති.[1]

'මහණෙනි, යම් අරමුණක භික්‍ෂුවට උපන් ආඝාතය (ද්වේෂය) සියලු ආකාරයෙන් දුරු කළයුතු නම් එබඳු වූ මේ ආඝාතය දුරුකරන උපාය පහක් ඇත. ඒ පහ කුමක් ද?

1. මහණෙනි, යම් පුද්ගලයකු කෙරෙහි ආඝාතය උපන්නේ නම් ඒ පුද්ගලයා කෙරෙහි මෛත්‍රිය වැඩිය යුතුය. මෙසේ ඒ පුද්ගලයා කෙරෙහි උපන් ආඝාතය දුරු කළ යුතුය.

2. මහණෙනි, යම් පුද්ගලයෙකු කෙරෙහි ආඝාතය උපන්නේ නම් ඒ පුද්ගලයා කෙරෙහි කරුණාව වැඩිය යුතුය. මෙසේ ඒ පුද්ගලයා කෙරෙහි උපන් ආඝාතය දුරුකළ යුතුය.

3. මහණෙනි, යම් පුද්ගලයකු කෙරෙහි ආඝාතය උපන්නේ නම් ඒ පුද්ගලයා කෙරෙහි උපේක්‍ෂාව වැඩිය යුතුය. මෙසේ ඒ පුද්ගලයා කෙරෙහි උපන් ආඝාතය දුරුකළ යුතුය.

---

1. අංගුත්තර නිකාය - පංචක නිපාතය - ආඝාත වර්ගය (අටුවාවෙහි කරුණාව ළඟට මුදිතාව යොදා ඇතත් එය සූත්‍රයෙහි නො ආ බැවින් මෙහි නොයෙදූවෙමි.)

4. මහණෙනි, යම් පුද්ගලයකු කෙරෙහි ආඝාතය උපන්නේ නම් ඒ පුද්ගලයා කෙරෙහි උපේක්ෂාව වැඩිය යුතුය. මෙසේ ඒ පුද්ගලයා කෙරෙහි උපන් ආඝාතය දුරුකළ යුතුය.

5. මහණෙනි, යම් පුද්ගලයකු කෙරෙහි ආඝාතය උපන්නේ නම් මේ ආයුෂ්මත් තෙමේ කර්මය තමා අයත්කොට ඇත්තේ වෙයි. කර්මය දායාද (කර්ම විපාක කොටස ගන්නෙක්) වන්නේ යයි ඒ පුද්ගලයා කෙරෙහි කර්මය ස්වකීය (තමා අයත්) කොට ඇති බව මෙනෙහි කළ යුතුය. 'මෙසේ ආඝාතය දුරුකරන කරුණු පහ වදාරණ ලද්දේම ය.

**'පඤ්චිමෙ ආවුසො ආඝාත පටිවිනයා යත්‍ථ භික්ඛුනො උප්පනො ආඝාතො' සබ්බසො පටිවිනෙතබ්බො කතමෙ පඤ්ච: ඉධාවුසො එකච්චො පුග්ගලො අපරිසුද්ධ කාය සමාචාරො හොති අපරිසුද්ධ වචී සමාචාරො එවරූපෙපි ආවුසො පුග්ගලෙ ආඝාතො පටිවිනෙතබ්බො'**[1] ති.

'ඇවැත්නි, යම් අරමුණක භික්ෂුවට උපන් ආඝාතය සියලු ආකාරයෙන් දුරුකළ යුතු නම් එබඳු වූ ආඝාතය දුරුකරන උපාය පහක් ඇත. ඒ පහ කුමක්ද? ඇවැත්නි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් අපිරිසිදු වූ කායික හැසිරීම් ඇත්තේ වෙයි. අපිරිසිදු වූ වචන කතා කරන්නේ වෙයි. ඇවැත්නි, මෙබඳු පුද්ගලයා කෙරෙහි ද ආඝාතය දුරුකළ යුතුය' යනාදී ක්‍රමයෙන් ආඝාතය දුරුකරන කරුණු පහ වදාරණ ලදී. ඒවා අතරින් ආඝාතය දුරුකරන යම්කිසි විධියකින් නුවණින් සලකා බැලිය යුතුය.

**'උභතො දණ්ඩකෙන චෙපි භික්ඛවෙ කකචෙන චොරා ඔචරකා අංගමංගානි මකනෙතයුං තත්‍රාපි යො මනො පදූසෙය්‍ය න මෙ සො තෙන සාසනකරො'**ති[2]

තව ද, 'මහණෙනි, ඉදින් පහත් හැසිරීම් ඇති සොරු, දෙපස දඬු ඇති කියතකින් ශරීර අවයව කපන්නාහු ද එහිදී ද යමෙක් සිත දූෂිත කරන්නේ නම් එයින් හෙතෙම මගේ අනුශාසනය කරන්නෙක් නොවේ.' යනු ශාස්තෲන් වහන්සේගේ අවවාදයයි.

---

1. අංගුත්තර නිකාය - පංචක නිපාතය - ආඝාත වර්ගය
2. මජ්ඣිම නිකාය - කකචූපම සුත්ත

**තස්සෙව තෙන පාපියො යො කුද්ධං පටිකුජ්ඣති
කුද්ධං අප්පටිකුජ්ඣන්තො සංගාමං ජෙති දුජ්ජයං**

**උභින්නමත්ථං චරති අත්තනො ච පරස්ස ච
පරං සංකුපිතං ඤත්වා යො සතො උපසම්මති**[1]

'යමෙක් කිපුණු තැනැත්තාට පෙරළා කිපේ ද එයින් ඔහුට ම පව සිදු වේ. කිපුණු තැනැත්තාට පෙරළා නො කිපෙන තැනැත්තා දුකසේ ජයගත හැකි ක්‍රෝධ යුද්ධය දිනයි.

යමෙක් කිපුණු අන් අයෙකු දැන සිහි ඇතිව ඉවසා ද ඔහු තමාටත් අනිත් තැනැත්තාටත් යන දෙදෙනාට ම යහපත සදයි.'

**'සත්තිමෙ භික්ඛවෙ ධම්මා සපත්තකන්තා සපත්තකරණා කොධනං ආගච්ඡන්ති ඉත්ථිං වා පුරිසං වා, කතමෙ සත්ත ? ඉධ භික්ඛවෙ සපත්තො සපත්තස්ස එවං ඉච්ඡති - අහො වතායං දුබ්බණ්ණො අස්සාති, තං කිස්ස හෙතු? න භික්ඛවෙ සපත්තො සපත්තස්ස වණ්ණවතාය නන්දති, කොධනායං භික්ඛවෙ පුරිස පුග්ගලො කොධාභිභූතො කොධ පරෙතො කිඤ්චාපි සො හොති සුන්හාතො සුවිලිත්තො කප්පිත කෙසමස්සු - ඔදාතවත්ථවසනො, අථ ඛො දුබ්බණ්ණොව හොති කොධාභිභූතො. අයං භික්ඛවෙ පඨමො ධම්මො සපත්තකන්තො සපත්තකරණො කොධනං ආගච්ඡති ඉත්ථිං වා පුරිසං වා.'**

**පුනචපරං භික්ඛවෙ සපත්තො සපත්තස්ස එවං ඉච්ඡති, අහොවතායං දුක්ඛං සයෙය්‍යාති -පෙ- න පචුරත්ථො අස්සාති -පෙ- න භොගවා අස්සාති -පෙ- න යසවා අස්සාති -පෙ- න මිත්තවා අස්සාති -පෙ- කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උප්පජ්ජෙය්‍යාති, තං කිස්ස හෙතු? න භික්ඛවෙ සපත්තො සපත්තස්ස සුගති ගමනෙන නන්දති, කොධනායං භික්ඛවෙ පුරිස පුග්ගලො කොධාභිභූතො කොධ පරෙතො කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති,**

1 සංයුත්ත නිකාය - බ්‍රාහ්මණ සංයුත්තය

සො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්සභෙදා පරම්මරණා -පෙ- නිරයං උපපජ්ජති කොධාභිභූතො'[1] ති

'මහණෙනි, වෛරී පුද්ගලයන්ට ප්‍රිය වූ වෛරී පුද්ගලයන්ට ප්‍රයෝජනවත් වූ මේ කරුණු හත ක්‍රෝධ කරන ස්ත්‍රිය වෙත හෝ පුරුෂයා වෙත හෝ පැමිණෙයි. ඒ හත කුමක්ද?'

1. මහණෙනි, මෙලොව සතුරා (තමාගේ) සතුරාට මොහු ඒකාන්තයෙන් දුර්වර්ණ වන්නේ නම් මැනවැයි මෙසේ සතුටු වෙයි. එයට හේතුව කුමක්ද? සතුරා සතුරාගේ වර්ණවත් බවට සතුටු නොවෙයි. මහණෙනි, මේ පුරුෂයා ක්‍රෝධයෙන් යුක්තය. ක්‍රෝධයෙන් මැඩගත්තේය. ක්‍රෝධය අනුව ගියේය. හෙතෙම යම් ලෙසකින් හොඳින් ස්නානය කොට සුවඳ විලවුන් මනාව ඇඟ තවරාගෙන කෙස් රැවුල් කපා සුදු ඇඳුම් ඇඳ සිටියත් ක්‍රෝධයෙන් මැඬුණේ දුර්වර්ණම වෙයි. මහණෙනි, සතුරාට ප්‍රිය වූ සතුරාට ප්‍රයෝජනවත් වූ මේ පළමු කරුණ ක්‍රෝධකරන ස්ත්‍රීන් වෙත හෝ පුරුෂයා වෙත හෝ පැමිණෙයි.

2. තවද මහණෙනි, මොහු ඒකාන්තයෙන් දුකසේ නිදන්නේ නම් මැනවැයි මෙසේ සතුටු වෙයි.

3. තවද මහණෙනි, මොහු ඒකාන්තයෙන් බොහෝ ධනය ඇත්තෙක් නොවන්නේ නම් මැනවැයි මෙසේ සතුටු වෙයි.

4. තවද මහණෙනි, මොහු ඒකාන්තයෙන් බොහෝ සම්පත් ඇත්තෙක් නොවන්නේ නම් මැනවැයි මෙසේ සතුටු වෙයි.

5. තවද මහණෙනි, මොහු ඒකාන්තයෙන් බොහෝ පිරිවර (හෝ කීර්තිය) ඇත්තෙක් නොවන්නේ නම් මැනවැයි මෙසේ සතුටු වෙයි.

6. තවද මහණෙනි, මොහු ඒකාන්තයෙන් බොහෝ මිතුරන් ඇත්තෙක් නොවන්නේ නම් මැනවැයි මෙසේ සතුටු වෙයි.

---

1. අංගුත්තර නිකාය - සත්තක නිපාත - අව්‍යාකත වග්ගය

7. තවද මහණෙනි, මොහු කය බිඳීමෙන් මරණින් පසු අපාය දුගති විනිපාත නම් වූ නිරයට පැමිණෙන්නේ නම් මැනවැයි මෙසේ සතුටු වෙයි.

එයට හේතුව කුමක්ද? මහණෙනි, සතුරෙක් සතුරෙකුගේ සුගති ගමනින් සතුටු නොවෙයි. මහණෙනි, මේ පුරුෂයා ක්‍රෝධයෙන් යුක්ත වූයේ ක්‍රෝධයෙන් මැඩගත්තේ, ක්‍රෝධය අනුව ගියේ කයින් දුසිරිත් කරයි. වචනයෙන් දුසිරිත් කරයි. මනසින් දුසිරිත් කරයි. ක්‍රෝධයෙන් යුක්ත වූ හෙතෙම කයින් දුසිරිත් කොට වචනයෙන් දුසිරිත් කොට මනසින් දුසිරිත් කොට කය බිඳීමෙන් මරණින් පසු අපාය - දුගති - විනිපාත නම් වූ නිරයට පැමිණෙයි.'

**'කුද්‍ධො අත්‍ථං න ජානාති කුද්‍ධො ධම්මං න පස්සති -පෙ-'**[1]

'කිපුණු තැනැත්තා අර්ථය (යහපත) නොදනී. කිපුණු තැනැත්තා ධර්මය (සමථ-විදර්ශනා) නොදකී.'

**කොධං ජහෙ විප්පජහෙය්‍ය මානං**
**සංයොජනං සබ්බ මතික්කමෙය්‍ය**[2]

'ක්‍රෝධය දුරු කරන්නේය. මානය දුරු කරන්නේය. සියලු සංයෝජන ඉක්මවන්නේය.'

**අනත්‍ථජනනො කොධො කොධො චිත්තප්පකොපනො**[3]

'ක්‍රෝධය අනර්ථය උපදවන්නේය. ක්‍රෝධය සිත කෝප කරන්නේය.'

**'කොධස්ස විසමූලස්ස මධුරග්ගස්ස බ්‍රාහ්මණ'**[4]

'බමුණ, විෂ වූ මූල ඇති මිහිරි වූ අග ඇති ක්‍රෝධයේ'

---

1. අංගුත්තර නිකාය - සත්තක නිපාත - අව්‍යාකත වග්ග
2. ධම්මපද - කෝධ වග්ග
3. අංගුත්තර නිකාය - සත්තක නිපාත - අව්‍යාකත වග්ග
4. සංයුත්ත නිකාය - බ්‍රාහ්මණ සංයුත්ත

**'කෝධං ඡෙත්වා* සුඛං සෙති කොධං ඡෙත්වා න සොචති'[1]**

'ක්‍රෝධය සිඳ දමා සැපසේ නිදයි. ක්‍රෝධය සිඳ දමා ශෝක නොකරයි.'

**'එකාපරාධං ඛම භූරිපඤ්ඤ න පණ්ඩිතා කොධබලා භවන්ති'[2]**

'මහා ප්‍රඥාවන්තයාණෙනි, එකම අපරාධය ඉවසනු මැනවි. පණ්ඩිතයෝ ක්‍රෝධය බලය කොට ඇත්තෝ නොවෙති.'

මේ ආදී ක්‍රමයෙන් ද්වේෂයෙහි ආදීනව (දොස්) ද කියන ලද ආකාරයට ප්‍රතිවිරුද්ධ වශයෙන් ද්වේෂය දුරුකිරීමෙහි අනුසස් ද නුවණින් සලකා බලා මුල් අවස්ථාවෙහි ද්වේෂය තදංගප්පහාණාදී වශයෙන් පහකොට විදර්ශනාවට (සිත) උත්සාහවත් කරවා තුන්වන මාර්ගයෙන් (අනාගාමි මාර්ගයෙන්) සියලු ආකාරයෙන් ද්වේෂය සහමුලින්ම සිඳින්න දුරුකරන්න යනුවෙන් ඒ ද්වේෂය දුරුකිරීමෙහි ඒ භික්ෂූන්ගේ යෙදවීම. එහෙයින් 'දොසං භික්ඛවෙ එකධම්මං පජහථ' යනුවෙන් වදාරණ ලදී.

දුට්ඨාසෙ යනු ආඝාතයෙන් දූෂිත වූ සිත් ඇති බැවින් ඉතා දුෂ්ට වූ මෙහි ඉතිරි වූ යමක් කිව යුතු නම් එය පළමු සූත්‍ර වර්ණනාවෙහි කියන ලද පරිදිම දතයුතුය.

දෙවන සූත්‍ර වර්ණනාවයි.

---

1. සංයුත්ත නිකාය - බ්‍රාහ්මණ සංයුත්ත
2. ජාතක පාලි

* ඡෙත්වා යන්න ඝත්වා යනුවෙන් ද යෙදී ඇත.

# 1.1.3

තුන්වන සූත්‍රයෙහි **මොහං** යනු නොදැනීමයි. එය දුකෙහි නොදැනීම, දුක හටගැනීමෙහි නොදැනීම, දුක නැතිවීමෙහි නොදැනීම, දුක නැතිකිරීමට පමුණුවන ප්‍රතිපදාවෙහි නොදැනීම යනාදී ක්‍රමයෙන් විභංගයෙහි නොයෙක් ප්‍රභේදයන් ද - එය කරණකොට මුළා වෙයි. තමා හෝ මුළා වෙයි. ඒ මුළාවීම් මාත්‍රයම හෝ මෝහයයි කියනු ලැබේ. එය සිතෙහි අන්ධභාවය ලක්‍ෂණකොට ඇත. නොදැනීම හෝ ලක්‍ෂණකොට ඇත. අනවබෝධය රසය (කෘත්‍ය) කොට ඇත. අරමුණෙහි ස්වභාවය වැසීම හෝ රසයයි. මුළාවූ පිළිවෙත වැටහෙන ආකාරයයි. අන්ධකාරය හෝ වැටහෙන ආකාරයයි. අනුවණින් මෙනෙහි කිරීම ආසන්න කාරණයයි. සියලු අකුසලයන්ට මූලයයි දතයුතුය. මෙහි ද **පජහථ** යන පදයේ

**මූළ්හො අත්‍ථං න ජානාති මූළ්හො ධම්මං න පස්සති**
**අන්‍ධං තමං තදා හොති යං මොහො සහතෙ නරං**[1]

මුළා වූ තැනැත්තා අර්ථය නොදනී. මුළා වූ තැනැත්තා ධර්මය නොදනී. මෝහය යම් මිනිසකු මැඩගෙන සිටිනවිට අන්ධභාවය ඇතිකරන අඳුරක් වේ.

**'අනත්‍ථජනනො මොහො මොහො චිත්තප්පකොපනො'**[2]

'මෝහය අනර්ථයක් උපදවන්නේය. මෝහය සිත කෝප කරන්නේය.'

**'අවිජ්ජා භික්ඛවෙ පුබ්බංගමා අකුසලානං ධම්මානං සමාපත්තියා'**[3]

'මහණෙනි, අකුසල ධර්මයන්ගේ රැස්කිරීම පිණිස අවිද්‍යාව පෙරදැරි වේ.'

---

1. ඉතිවුත්තක - 3 නි - 4 වර්ගය
2. ඉතිවුත්තක - 3 වර්ගය - 4 වර්ගය
3. ඉතිවුත්තක - 2 නි - 4 වර්ගය

**'මොහ සම්බන්ධනො ලොකො භබ්බරූපොව දිස්සති'**[1]

'මෝහය හා බැඳුනා වූ ලෝවැසියා හේතු සම්පන්නයෙක් මෙන් දක්නා ලැබේ.'

**'මොහො නිදානං කම්මානං සමුදයාය'**[2]

'මෝහය කර්මයන්ගේ හටගැනීමට හේතු වේ.

**'මූළ්හො බො බ්‍රාහ්මණ මොහෙන අභිභූතො පරියාදින්නචිත්තො' දිට්ඨධම්මිකම්පි භයං වෙරං පසවති සම්පරායිකම්පි භයං වෙරං පසවති'**

'බමුණ, මෝහයෙන් මුළා වූ, මැඩුණා වූ, හාත්පසින් අල්ලා ගන්නා ලද සිත් ඇති තැනැත්තා මේ ජීවිතයෙහි බියජනක වූ වෛරය රැස්කරයි. පරලොවෙහි ද බියජනක වූ වෛරය රැස් කරයි.'

යනාදී ක්‍රමයෙන් ද,

**යො කොචි ධම්මො කාමච්ඡන්දාදි සංකිලෙස ධම්මෙහි**
**නිබ්බත්තෙතබ්බො අත්ථො සබ්බො සො මොහ හෙතුකො**

'යම්කිසි අකුසල ධර්මයක් කාමච්ඡන්දාදි ක්ලේශධර්මයන් විසින් නිපදවිය යුතු ද ඒ සියල්ල අර්ථ (කරුණු) වශයෙන් මෝහය හේතුකොට ඇත්තේ ය.'යි මෝහයෙහි ආදීනව (දොස්) ද එයට ප්‍රතිවිරුද්ධ වශයෙන් මෝහය දුරුකිරීමෙහි අනුසස් ද නුවණින් සලකා බලා කාමච්ඡන්දාදිය දුරුකරන ක්‍රමයෙන් ම මුල් අවස්ථාවෙහි තදංගාදි වශයෙන් (ඒ ඒ කරුණෙහිදී දුරුකිරීම් වශයෙන්) මෝහය දුරුකරමින් තුන්වන (අනාගාමී) මාර්ගයෙන් කියන ලද පරිදි ලෝභ දෝෂ සමග එකට උපන් මෝහය සහමුලින් (සමුච්ඡේද වශයෙන්) දුරුකරව් යන අර්ථය දතයුතුය. අනාගාමී මාර්ගයෙන් දුරුකළ යුතු වූ ම මෝහය මෙහි අදහස් කරන ලදී. **මූළ්හා සෙ** යනු කුසල අකුසල වැරදි සහිත වැරදි රහිත ආදී භේද ඇති තමාගේ යහපතෙහි හා අයහපතෙහි මුළා වූ. ඉතිරිය කියන ලද පරිදිමය.

**තෙවන සූත්‍ර වර්ණනාවයි.**

---

1. උදාන පාළි - චූලවග්ග
2. අංගුත්තර නිකාය - 3 නි - දේවදූත වග්ග

# 1.1.4

සිවුවන සූත්‍රයෙහි කොධං යනු ද්වේෂය යි. ද්වේෂය ම ක්‍රෝධයට සමාන අර්ථයෙන් අවබෝධ කරන පුද්ගලයන්ගේ අදහස් වශයෙන් මෙසේ වදාරණ ලදී. එහෙයින් දෙවන සූත්‍රයෙහි කියන ලද ආකාරයෙන් ම මෙහි ද අර්ථය දතයුතුය. තව ද ක්‍රෝධය කිපීම ලක්‍ෂණකොට ඇත්තේ ය.

විනාශ කිරීම කෘත්‍ය (රසය) කොට ඇත්තේය. සිතේ දූෂිත බව වැටහෙන ආකාරය කොට ඇත්තේය. සිතේ කුණු බව ආසන්න කාරණයකොට ඇත්තේය යන මේ වෙනස ද දතයුතුය.

**සිවුවන සූත්‍ර වර්ණනාවයි.**

# 1.1.5

පස්වන සූත්‍රයෙහි මක්ඛං යනු අනුන්ගේ ගුණ මැකීමය. ඉදින් හෙතෙම අශූචි ගෙන අනිකෙකුට ගසනවිට තමාගේ අත පළමුකොට ම අශූචියෙන් තැවරෙන්නේම ය. එසේ ම අනුන්ගේ ගුණ මකන අදහසින් පවත්වා ගතයුතු බැවින් අනුන්ගේ ගුණ මැකීමයයි කියනු ලැබේ. එසේම හෙතෙම ස්නානය කළ තැනැත්තාගේ සිරුරෙහි ඇති ජලය පිසදමන සාලුවක් (තුවායක්) මෙන් අනුන්ගේ ගුණ මකයි, පිසදමයි, විනාශ කරයි. අනුන් විසින් කරන ලද මහත් වූ ද ක්‍රියාවන් ගෙවාදමන හෙයින්, පිරිහෙළන හෙයින් 'මක්ඛ' යයි කියනු ලැබේ. ඒ මකුකම අනුන්ගේ ගුණ මැකීම ලක්‍ෂණකොට ඇත්තේය. ඒ ගුණ විනාශ කිරීම කෘත්‍ය (රසය) කොට ඇත්තේය. ඒ ගුණ වසාදැමීම වැටහෙන ආකාරයයි. අර්ථ වශයෙන් අනුන්ගේ ගුණ මකන ආකාරයෙන් පවතින දොම්නස් සහගත සිත ඉපදීමයයි දත යුතුය.

**පජහථ** යනු එහි කියන ලද ප්‍රභේද ඇති ද්වේෂයත්, ද්වේෂයෙහි කියන ලද ආකාර ඇති ආදීනවත් දුරුකිරීමෙහි ද එය දුරුකිරීමෙහි අනුසස් ද නුවණින් සලකා බලා මුල් අවස්ථාවෙහි තදංගාදි වශයෙන් දුරුකරමින් විදර්ශනාවට උත්සාහවත් කරවා තුන්වන (අනාගාමී) මාර්ගයෙන් ඉතිරි නොකොට සහමුලින් දුරුකරව් යන අර්ථය යි. **මක්ඛාසෙ** යනු මකන ලද්දා වූ, මකන ලද ගුණ ඇත්තා වූ, අනුන්ගේ ගුණ මකන්නා වූ (සත්ත්වයෝ) එහෙයින් ම තමා විසින් ද නැසූ ගුණ ඇති යන අර්ථය යි. ඉතිරිය පෙර කියන ලද පරිදිමය.

**පස්වන සූත්‍ර වර්ණනාවයි.**

# 1.1.6

සයවන සූත්‍රයෙහි මානං යනු ජාති ආදිය වස්තුකොට ඇති සිතේ උඩට නැමුණු ගතිය යි. ඔහු වනාහි මම උසස් කෙනෙක් වෙමි. ආදී ක්‍රමයෙන් හඟියි (සිතයි). එයින් (එය කරණකොට) තමා හෝ සිතයි. ගෞරවය ඔසවාගැනීම හෝ මානය යි කියනු ලැබේ. ඒ මේ මානය

* මම උසස් කෙනෙක් වෙමි යන මානය
* මම උසස් කෙනාට සමාන වෙමි යන මානය
* මම උසස් කෙනාට පහත් වෙමි යන මානය යනුවෙන් මෙසේ තුන් ආකාර වේ.

නැවත
* මම උසස් කෙනාට වඩා උසස් වෙමි යන මානය
* මම උසස් කෙනාට සමාන වෙමි යන මානය
* මම උසස් කෙනාට පහත් වෙමි යන මානය

* මම සමානයාට උසස් වෙමි යන මානය

* මම සමානයාට සමාන වෙමි යන මානය
* මම සමානයට පහත් වෙමි යන මානය

* මම පහත් කෙනාට උසස් වෙමි යන මානය
* මම පහත් කෙනාට සමාන වෙමි යන මානය
* මම පහත් කෙනාට පහත් වෙමි යන මානය යනුවෙන් මානය මෙසේ නව ආකාරද වෙයි. උඩට නැමුණු ගතිය ලක්‍ෂණය කොට ඇත. මම වෙමි යන අහංකාරය කෘත්‍ය (රසය) කොට ඇත. නොහොත් මනාව ඔසවාගැනීම රසය කොට ඇත. ඉදිමුණු බව වැටහෙන ආකාර කොට ඇත. කොඩියක් මෙන් ඉහළින් සිටීමට ඇති කැමති බව හෝ වැටහෙන ආකාරය යි. දෘෂ්ටි විප්‍රයුක්ත (දෘෂ්ටිය නොයෙදුන) ලෝභය ආසන්න කාරණයයි. මානය උමතුවක් මෙනැයි දතයුතුය. (මානයෙන් යුත් පුද්ගලයා පිස්සකු මෙනැයි දතයුතුය.)

**පජහථ** යනු ඒ සියලු ආකාර මානයට තමා උසස් කිරීමය, අනුන් හෙළා දැකීමය යන නිමිති ඇති බැවින් ද ගරුකළ යුත්තන් කෙරෙහි පසඟ පිහිටුවා වැඳීම (අභිවාදන) දැක අසුනෙන් නැගිටීම, (පච්චුපට්ඨාන), ඇඟිලි එක්කොට දෑත් නළලෙහි තබා වැඳීම (අංජලිකම්ම), අසුන් පැනවීම, පවන්සැලීමාදී සුදුසු ක්‍රියා කිරීම (සාමීචි කම්ම) යනාදිය නොකිරීම අවැඩට හේතුවන බැවින්ද ජාතියද, පුරුෂමද ආදිය ඇතිවීමෙන් ප්‍රමාදයට පැමිණීමට හේතුවන බැවින්දැයි මේ ආදී ප්‍රභේද ඇති ආදීනව ද එයට ප්‍රතිවිරුද්ධ වශයෙන් අභිමානයෙන් තොරවීමෙහි අනුසස් ද නුවණින් සලකා බලා රාජ්‍ය සභාවට පැමිණි සැඩොලෙකු මෙන් සබ්‍රහ්මචාරීන් කෙරෙහි යටහත් පහත් (නීච) සිත් ඇති බවට පමුණුවාගෙන මුල් අවස්ථාවෙහි තදංගාදි වශයෙන් එය දුරුකරමින් විදසුන් වඩා අනාගාමි මාර්ගයෙන් සහමුලින් සිඳ දමන්න යන අර්ථයි. අනාගාමි මාර්ගයෙන් දුරුකළයුතු මානයම මෙහි අදහස් කරන ලදී.

**මත්තාසෙ** යනු ජාතිමද පුරුෂමද ආදී වශයෙන් ප්‍රමාදයට පත්වීමට හේතු වූ මානයෙන් මත්ව තමා (මානයෙන්) ඔසවාගෙන හැසිරෙන්නා වූ (සත්ත්වයෝ). ඉතිරිය කියන ලද පරිදිමය. පිළිවෙළින් මේ සූත්‍රහයෙහිද ගාථාවල ද අනාගාමි ඵලයට පමුණුවා දේශනාව නිමවන ලදී.

එහි අවිහ, අතපප, සුදසස, සුදසසී, අකනිට්ඨ* යනුවෙන් අනාගාමීහු පස්දෙනෙක් වෙති. ඔවුන් අතුරෙන් අවිහ බඹලොව උපන් අය අවිහ නම් වෙති. ඔවුහු :

1. අන්තරා පරිනිබ්බායී
2. උපහච්ච පරිනිබ්බායී
3. අසංඛාර පරිනිබ්බායී
4. සසංකාර පරිනිබ්බායී
5. උද්ධංසොත අකනිට්ඨගාමී යනුවෙන් පස් ආකාරය. අතප්ප, සුදස්ස, සුදස්සී බඹලොව උපන් අය ද එසේ පස් ආකාර වෙති. අකනිටා බඹලොවෙහි උද්ධංසෝත අකනිට්ඨගාමී පුද්ගලයා අඩුවෙයි. (නොලැබෙයි)

අවිහාදී බඹලොවක ඉපිද එම බඹලොවට අයත් ආයුෂයෙහි මැද (අඩක්) නො ඉක්මවා අර්හත්වයට පැමිණීමෙන් ක්ලේශ පරිනිර්වාණයෙන් පිරිනිවෙන තැනැත්තා අන්තරා පරිනිබ්බායී නම් වේ.

අවිහාදී බ්‍රහ්මලෝකවල මුලින් කල්ප පන්සියයක් ආදි වශයෙන් ප්‍රභේද ඇති ආයුෂයේ මැද ඉක්මවා (ක්ලේශ පරිනිර්වානයෙන්) පිරිනිවෙන තැනැත්තා උපහච්ච පරිනිබ්බායී නම් වේ.

අසංඛාරයෙන්, වැඩි ප්‍රමාණයක් උත්සාහ නොකොට අල්ප දුකකින් කෙලෙස් පිරිනිවීමෙන් පිරිනිවන්පාන තැනැත්තා අසංඛාර පරිනිබ්බායී නම් වේ.

සසංඛාරයෙන් වැඩි ප්‍රමාණයක් උත්සාහ කොට දුකින් අපහසුවෙන් (කෙලෙස් පිරිනිවීමෙන්) පිරිනිවන්පාන තැනැත්තා සසංඛාර පරිනිබ්බායී නම් වේ.

අනිත් තැනැත්තා අවිහාදියෙහි දී ඉහළට ඔසවන බැවින් ඔහුගේ තණ්හා සෝතය (තණ්හා නමැති දියර), වට්ටසෝතය (සසර නමැති දියදහර) මග්ගසෝතය (අරිඅටඟි මග නමැති දියදහර) උඩට ම ඇත්තේය

---

* ආයුෂ : අවිහ - කල්ප 1000, අතප්ප කල්ප 2000, සුදස්ස කල්ප 4000, සුදස්සී කල්ප 8000, අකනිට්ඨ කල්ප 16000 දී.නි. සක්කපඤ්හ සූත්‍ර අටුවා.

යන අර්ථයෙන් උද්ධංසෝත නම් වේ. අවිහාදියෙහි ඉපදී රහත්වීමට නොහැකි තැනැත්තා ඒ ඒ බ්‍රහ්මලෝකයෙහි ආයුෂ ඇති තාක් සිට ප්‍රතිසන්ධි ගැනීම් (ඉපදීම්) වශයෙන් අකනිටා බඹලොවට යන හෙයින් 'අකනිට්ඨගාමී' නම් වෙයි. මෙහි ද උද්ධංසොත අකනිට්ඨගාමී යනුවෙන් සතරක රාශියක් (චතුක්ක) දතයුතුය. කෙසේද?

* අවිහයෙන් පටන්ගෙන මුල් දෙව්ලොව (බඹලොව) සතරෙහි කල්ගෙවා අකනිටාවට ගොස් පිරිනිවන්පාන තැනැත්තා උද්ධංසෝත අකනිට්ඨගාමී නම් වෙයි

* පහළ දෙව්ලොව තුනෙහි කල්ගෙවා සුදස්සී දෙව්ලොව සිට පිරිනිවෙන තැනැත්තා උද්ධංසෝත වෙයි. අකනිට්ඨගාමී නොවෙයි.

* මෙයින් (මේ මිනිස්ලොවින්) අකනිටාවට ගොස් පිරිනිවෙන තැනැත්තා උද්ධංසෝත නොවේ. අකනිට්ඨගාමී වෙයි. පහළ දෙව්ලොව (බඹලොව) සතරෙහි ඒ ඒ තැනදීම පිරිනිවන්පාන තැනැත්තා උද්ධංසෝත ද නොවේ. අකිනට්ඨගාමී ද නොවේ.

අවිහයෙහි ඉපිද කල්ප සියයකින් මත්තෙහි (පසු) පිරිනිවෙන්නා ද කල්ප දෙසියයකින් මත්තෙහි පිරිනිවෙන්නා ද කල්ප පන්සියයකට නොපැමිණි කල්හි පිරිනිවෙන්නා ද යනුවෙන් අන්තරාපරිනිබ්බායී තිදෙනෙක් වෙති.

**උපපන්නං වා සමනන්තරා අප්පත්තං වා වෙමජ්ඣං**[1]

ඉපදීමට අනතුරුව හෝ (ආයුෂ) මැදට නොපැමිණි' යනුවෙන් මෙය කියන ලදී. 'වා' ශබ්දයෙන් (ආයුෂ මැදට) පැමිණීම ද ඇතුළත් කරන ලදී.

මෙසේ අන්තරා පරිනිබ්බායීහු තිදෙනෙකි. උපහච්ච පරිනිබ්බායි එක් අයෙකි. උද්ධංසෝත එක් අයෙකි. ඔවුන් අතුරෙන් අසංඛාර පරිනිබ්බායීහු පස්දෙනෙක්ද සසංඛාර පරිනිබ්බායීහු පස්දෙනෙක්දැයි

1. පුග්ගල පඤ්ඤත්තිප්පකරණ

දසදෙනෙක් වෙති. අතප්ප, සුදස්ස, සුදස්සී යන බඹලොව ද එසේම දසදෙනා බැගින් ලැබේ. දශක හතරක් හතළිහකි. අකනිට්ඨාවෙහි උද්ධංසෝත පුද්ගලයා නොලැබෙන බැවින් අන්තරා පරිනිබ්බායීහු තිදෙනෙකි. උපහච්ච පරිනිබ්බායී එක් අයෙකි. අසංඛාර පරිනිබ්බායීහු සිවුදෙනෙක්ද සසංඛාර පරිනිබ්බායීහු සිවුදෙනෙක්දැයි අටදෙනෙකි. මෙසේ මේ අනාගාමීහු හතළිස් අටකි. මේ සූත්‍රවලදී ඒ සියලු දෙනා ම (අනාගාමී යන) විශේෂ නොවූ වචනයෙන් ගන්නා ලදැයි දතයුතුය.

**හයවන සූත්‍ර වර්ණනාවයි.**

## 1.1.7

සත්වන සූත්‍රයෙහි සබ්බං යනු ඉතිරිනොවූ (සියල්ල) යනුයි. මේ සබ්බ ශබ්දය ඉතිරි නැති බව කියන්නකි. මේ සබ්බ ශබ්දය යම් යම් පදයක් සමග සම්බන්ධ වෙයි නම් ඒ ඒ පදයේ ඉතිරි නැති බව (සියල්ල) පැහැදිලි කරයි. සියලු රූපය සියලු වේදනා, සියලු සක්කායට ඇතුළත් වූ ධර්මයන්හි මෙනි. 'සබ්බ' ශබ්දය සප්පදේස, නිප්පදේස යන කරුණු වශයෙන් දෙපරිදිය. එසේම

1. සබ්බ සබ්බ
2. පදෙස සබ්බ
3. ආයතන සබ්බ
4. සක්කාය සබ්බ යන සතර කරුණෙක්හි දක්නා ලද ප්‍රයෝග ඇත්තේය.

**'සබ්බෙ ධම්මා සබ්බාකාරෙන බුද්ධස්ස භගවතො ඤාණමුඛෙ ආපාථමාගච්ඡන්ති'[1]'**

'සියලු ධර්ම සියලු ආකාරයෙන් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ නුවණ නමැති දොරටුව ඉදිරියට පැමිණෙයි.' යනාදියෙහි සබ්බ සබ්බයෙහි (සර්ව සර්වයෙහි) ආයේය.

1. නිද්දේස පාළි

'**සබ්බෙසං වො සාරිපුත්තා සුභාසිතං පරියායෙන**'[1]

'සැරියුත්, ඔබ සියලු දෙනාගේ කීම ඒ ඒ ක්‍රමයෙන් යහපත් කීම් වෙයි.' යනාදියෙහි පදෙස සබ්බයෙහි (ප්‍රදේශ සර්වයෙහි) ආයේය.

**සබ්බං වො භික්ඛවෙ දෙසිස්සාමි චක්ඛුං චෙව රූපඤ්ච -පෙ- මනඤ්චෙව ධම්මෙච**[2]

'මහණෙනි, ඔබට සියල්ල දේශනා කරන්නෙමි. ඇස ද රූපය ද -පෙ- මනස ද ධර්ම ද' යන මෙහි ආයතන සර්වයෙහි ආයේය.

**සබ්බධම්ම මූලපරියායං වො භික්ඛවෙ දෙසිස්සාමි**'[3]

'මහණෙනි, ඔබට සියලු ධර්මයන්ට මූලකාරණය දේශනා කරන්නෙමි' යනාදියෙහි සක්කාය සර්වයෙහි ආයේය.'

එහි සර්ව සර්වයෙහි ආවා වූ දෙය නිප්පදේස විසය යි (ප්‍රදේශ රහිත = සියල්ල) ඉතිරි තුනෙහි ආවා වූ දෙය සප්පදේස විසයයි. (ප්‍රදේශ සහිත) මෙහි සක්කාය සබ්බයෙහි යයි දතයුතුය.

විදර්ශනාවට අරමුණු වූ ත්‍රෛභූමික ධර්ම මෙහි සබ්බං යයි ඉතිරි නොකිරීම් වශයෙන් ගන්නා ලදී.

**අනභිජානං** යනු මේ ධර්ම කුශලය, මේ ධර්ම අකුශලය, මේවා වැරදි සහිතය. මේවා නිවැරදියයි ආදී වශයෙන් ද මේ පංචස්කන්ධය, මේ දොළොස් ආයතනය, මේ අටළොස් (18) ධාතුය, මේ දුක්ඛ ආර්ය සත්‍යය, මේ සමුදය ආර්ය සත්‍යය යි ආදී වශයෙන් ද දතයුතු සියලු ධර්ම නොවෙනස් (යථාභූත) ස්වභාවයෙන්, විශිෂ්ට ඥානයෙන් නොදන්නේ. **අපරිජානං** යනු වෙන්කොට (පිරිසිඳ) නොදන්නේ. ත්‍රෛභූමික ධර්ම (කාම-රූප-අරූප ධර්ම) වශයෙන් උපන් සියල්ල පිරිසිඳ දන්නා වූ

---

1. මජ්ඣිම නිකාය - මහා ගොසිංග සුත්ත
2. සංයුත්ත නිකාය
3. මජ්ඣිම නිකාය - මූල පරියාය සූත්‍රය

පුද්ගලයා ඤාත පරිඤ්ඤාවෙන්, තීරණ පරිඤ්ඤාවෙන්, පහාණ පරිඤ්ඤාවෙන් යන පරිඤ්ඤා තුනෙන් පිරිසිඳ දැනගනියි.

එහි ඤාත පරිඤ්ඤා යනු කුමක්ද? ත්‍රෛභූමික සියලු නාමරූප ධර්ම මේ රූපය, රූපය මෙපමණකි, මීට වඩා වැඩි නැත, මේ නාමය, නාමය මෙපමණකි, මීට වඩා වැඩි නැතැයි භූත, පසාද ආදී ප්‍රභේද ඇති රූපය ද ඵස්ස ආදී භේද ඇති නාමය ද ලක්‍ෂණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨාන වශයෙන් වෙන් වෙන්කොට සලකා බලයි. මේවාට කර්මය අවිද්‍යාව ආදිය ප්‍රත්‍යයයි (හේතුයයි) පරීක්‍ෂා කර බලයි. මෙය ඤාත පරිඤ්ඤාව ය.

තීරණ පරිඤ්ඤාව යනු කුමක් ද? මෙසේ ඤාත පරිඤ්ඤාව දැන ඒ සියල්ල අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, රෝග වශයෙන් යනාදී හතළිස් දෙයාකාරයකින්* තීරණය කරයි. මෙය තීරණ පරිඤ්ඤාව ය.

පහාණ පරිඤ්ඤාව යනු කුමක්ද? මෙසේ තීරණයකොට අග්‍ර (අරහත්) මාර්ගයෙන් සියල්ල කෙරෙහි ඇති ඡන්දරාගය දුරුකරයි. මෙය පහාණ පරිඤ්ඤාව ය.

දිට්ඨි විසුද්ධි, කංඛා විතරණ විසුද්ධි ඤාත පරිඤ්ඤා ය. මග්ගාමග්ග ඤාණ දස්සන විසුද්ධි, පටිපදා ඤාණදස්සන විසුද්ධි, කලාප විමසා බැලීම ආදී අනුලෝමය අවසන්කොට ඇති ප්‍රඥාව හෝ තීරණ පරිඤ්ඤාවය. ආර්ය මාර්ගයෙන් දුරුකිරීම පහාණ පරිඤ්ඤාව ය. සියල්ල පිරිසිඳ දැනගන්නා පුද්ගලයා මේ පරිඤ්ඤා තුනෙන් පිරිසිඳ දැනගනියි. මෙහිදී (මේ සූත්‍රයෙහිදී) විරාග ප්‍රහාණයන් ප්‍රතික්‍ෂේප කිරීම් වශයෙන් වෙන්ව ගන්නා ලද බැවින් ඤාත පරිඤ්ඤා, තීරණ පරිඤ්ඤා වශයෙන්ද පිරිසිඳ දැනීම දතයුතුය. මෙසේ පිරිසිඳ නො දන්නා වූ පුද්ගලයා සඳහා 'අපරිජානං' යනුවෙන් කියන ලදී.

**තත්ථ චිත්තං අවිරාජයං** යනු ඒ අභිඥෙය්‍යය විෂයෙහි පරිඥෙය්‍යය විෂයෙහි තමාගේ චිත්ත සන්තානය නො අලවන්නේ, එහි රාගය ඇති නොවන ලෙස විරාගානුපස්සනාව නො ඉපදවන්නේය යන අර්ථය.

---

* මහා නිද්දේස පාළි - ගුහට්ඨක සුත්ත - මෙහි අනිත්‍යාදී වශයෙන් 44 ක් ඇත. - බු.ජ.මු 76 පිට. විසුද්ධි මග්ග - 21 පරි - පටිපදා ඤාණ දස්සන විසුද්ධි නිද්දේසයෙහි 42 ක් ඇත. 1041 පිට.

**අපජහං** යනු විදර්ශනා ප්‍රඥාව සහිත මාර්ග ප්‍රඥාවෙන් එහි දුරු කළයුතු ක්ලේශ වෘත්තය (කෙලෙස් වළල්ල) ඉතිරි නොකොට දුරු නොකරන්නේ. මේ ආකාරයට මෙසේ අභිජානන ආදිය ද මිශ්‍රක මාර්ග වශයෙන් දතයුතුය. පූර්ව භාගයෙහි නොයෙක් සිත් වශයෙන් ඥාත-තීරණ-පහාණ යන පරිඥ්ඥාවලින් ක්‍රමයෙන් අභිජානන (පිරිසිඳ දැනීම්) ආදිය සපයාගෙන මාර්ග කාලයෙහි එක මොහොතෙහිම කෘත්‍ය වශයෙන් ඒ සියල්ල උපදවන එකම ඥාණය පවතියි.

**අභබ්බො දුක්ඛක්ඛයාය** යනු නිවන පිණිස, සියලු සංසාර දුක ගෙවාදැමීම පිණිස සුදුස්සෙක් නොවේ, යෝග්‍ය නොවේ, සමත් නොවේ යන අර්ථයි.

**සබ්බඤ්ච ඛො** යන මෙහි 'ච' ශබ්දය අතිරේක (වැඩිපුර) අර්ථයෙහිය. 'ඛො' ශබ්දය අවධාරණ අර්ථයෙහිය. ඒ දෙකින් අභිජානනාදි වශයෙන් ලැබිය යුතු විශේෂය ද ඔහුගේ දුක් කෙළවර කිරීම පිණිස ඒකාන්ත කාරණය ද පැහැදිලි කරයි. අභිජානන ආදියෙහි කිවයුතු දෙය කියන ලද්දේම ය. එහි ප්‍රතික්ෂේප කිරීම් වශයෙන් කියන ලදී. මෙහි විධාන (නියම කිරීම්) වශයෙන් දතයුතුය. මෙය ම වෙනසයි.

තව ද 'අභිජානං' යනු උපාදානස්කන්ධ පංචකය නම් වූ සක්කාය සබ්බය ස්වරූප වශයෙන් ද ප්‍රත්‍ය වශයෙන් ද ඥාණය ඉදිරියට පැමිණවීම් (අභිමුඛීකරණ) වශයෙන් ද පිරිසිඳ දන්නා කෙනෙක් වී නොවීම් ආකාර ආදිය විමසමින් එය අනිත්‍යාදි ලක්‍ෂණවලින් පිරිසිඳ (වෙන්කොට) දැනීම් වශයෙන් පිරිසිඳ දන්නා වූ.

**විරාජයං** යනු මනාකොට මේ ධර්මය පිළිබඳ අනිත්‍ය බව ආදි අවබෝධයෙන් උපන් භය - ආදීනව - නිබ්බිදා යනාදී ඥාණ ආනුභාවයෙන් තමාගේ සිතෙහි එහි අණුමාත්‍රයක් පමණ වූ ද රාගයන් ඇති නොකරන්නා වූ නොඋපදවන්නා වූ,

**පජහං** යනු වුට්ඨානගාමිනී විදර්ශනා සහිත මාර්ග ප්‍රඥාවෙන් සමුදය පක්‍ෂයට අයත් ක්ලෙශ වෘත්තය දුරුකරන්නා වූ සහමුලින් සිඳින්නා වූ. **භබ්බො දුක්ඛක්ඛයාය** යනු කෙලෙස්මල දුරුකිරීමෙන් ම සියලු කෙලෙස් වළල්ල (වෘත්තය) ගෙවුණු බැවින් ඉතිරි නොකොට විපාක වෘත්තය

ගෙවා දැමීම පිණිස සියලු සංසාර වෘත්ත දුක ගෙවා දමන්නා වූ අනුපාදිසේස නිබ්බානධාතුව ලැබීමට සුදුසු වූයේ ඒකාන්තයෙන් එයට පැමිණීමට යනුවෙන් මෙසේ මෙහි අර්ථය දතයුතුය.

**යො සබ්බං සබ්බතො ඤත්වා** යනු සුදුසු පරිදි යෙදුණු ආරම්භ කළ විදර්ශනාව ඇති තැනැත්තා උපන්නා වූ සියලු ත්‍රෛභූමික ධර්ම සියලු ආකාරයෙන් සියලු අංශවලින් කුශලාදිය බෙදීම් වශයෙන් ස්කන්ධාදිය බෙදීම් වශයෙන් ද දුක් ආදිය බෙදීම් වශයෙන් ද පෙළීම් ආදිය බෙදීම් වශයෙන් ද දැන, නැතහොත් 'සබ්බතො' යනු සියලු ආකාරයෙන් රළු ස්පර්ශාදී වශයෙන් ද ලක්‍ෂණාදි වශයෙන් ද අනිත්‍යාදි වශයෙන්දැයි සියලු ආකාරයෙන් දැන විදර්ශනාව පෙරටු කොටගත් මාර්ග ඥානයෙන් අවබෝධකොට හෝ විදර්ශනා ඥානයෙන්ම දන්නා හේතුව (ජානන හේතු)

**සබ්බත්‍ථෙසු න රජ්ජති** යනු අතීතාදි වශයෙන් නොයෙක් ප්‍රභේදවලට බිඳීගිය සියලු සක්කාය ධර්මයන්හි නො ඇලෙයි. ආර්ය මාර්ගය අවබෝධයෙන් රාගය නො උපදියි. මෙයින් මේ තණ්හාවේ අල්ලාගැනීමේ අභාවය දක්වමින් ඒ නිමිතිකොට ඇති බැවින් දෘෂ්ටි මාන ග්‍රහණය කිරීම් පිළිබඳ එය මගේය. එය මම වෙමි. එය මගේ ආත්මය වේයැයි මේ සාවද්‍ය ග්‍රහණ දෙකෙහි ම අභාවය දක්වයි.

**සවෙ** යන මෙහි 'ස' යනු නිපාත මාත්‍රයයි. 'වෙ' යනු දක්‍ෂ (ඛ්‍යත්තං) හෝ ඒකාන්තයෙන් (එකංසෙන) යන මේ අර්ථයෙහි නිපාතයකි.

**සබ්බං පරිඤ්ඤා** යනු සියල්ල පිරිසිඳ දැනීම් වශයෙන්.

**සො** යනු කියන ලද ආකාර ඇති යෝගාවචරයා හෝ ආර්යයා හෝ.

**සබ්බදුක්ඛං උපච්චගා** යනු සියලු සංසාර දුක ඉක්ම ගියේය යන අර්ථය යි.

**සත්වන සූත්‍ර වර්ණනාවයි.**

# 1.1.8

අටවන සූත්‍රයෙහි - පෙර නො කියන ලද්දක් නැත. හුදෙක් මාන වශයෙන් දේශනාව පැවතුණි. ගාථාවලදී **මානුපෙතා අයං පජා** යනු කර්ම ක්ලේශයන් කරණකොට ජාත (උපන්) බැවින් පජා යනුවෙන් ලබන ලද නම් ඇති මේ සත්ත්වයෝ මැනීම් ලක්‍ෂණයෙන් මානයෙන් යුක්ත වූවාහුය.

**මානගන්ථා භවෙ රතා** යනු පඤ්ච ගැඩවිල් පළගැටි ආදී ආත්මභාවයෙහිද මානයෙන් ගෙතුනාහු මාන සංයෝජනයෙන් යුක්ත වූවාහු එහෙයින්ම බොහෝ කාලයක් පුරුදු කරන ලද අහංකාර වශයෙන් මේ මගේ යයි සංස්කාරයන්හි ගිලගැන්ම (ඇල්ම) බහුල බැවින් එහි නිච්ච(නිත්‍ය) ධ්‍රුව(ස්ථිර) සුභ(යහපත්) සුඛ(සැප) අත්ත(ආත්ම) ආදී විපර්යාස (වෙනස් ආකාර) වශයෙන් ද කාමාදි භවයෙහි ඇලුණාහු.

**මානං අපරිජානන්තා** යනු එහෙයින් ඒ මානය පරිඤ්ඤා තුනෙන් පිරිසිඳ නො දන්නාහු අර්හත් මාර්ග ඥානයෙන් හෝ නො ඉක්මවන්නාහු. 'මානං අපරිඤ්ඤාය' යනුවෙන් ඇතැම්හු කියති.

**ආගන්තාරො පුනබ්භවං** යනු නැවත මත්තෙහි උත්පත්තිභවය. නැවත නැවත සිදුවීම් වශයෙන් හෝ පුනර්භව නම් වූ සංසාරය ඔබිමොබ පෙරළීම් වශයෙන් හෝ යන්නාහු එළඹෙන්නාහු වෙති. භවයෙන් නො මිදෙතියි යන අර්ථයි.

**යෙ ච මානං පහත්වාන විමුත්තා මානසංඛයෙ** යනු යමෙක් අර්හත් මාර්ගයෙන් සියලු ආකාරයෙන් මානය දුරුකොට මානයේ සම්පූර්ණ ප්‍රහාණය වූ අර්හත් ඵලයෙහි හෝ නිවනෙහි හෝ මානය සමග උපන් සියලු කෙලෙසුන්ගෙන් මිදීමෙන් මිදුනාහු ද මනාව මිදුනාහු ද.

**තෙ මානගන්ථාභිභූනො සබ්බං දුක්ඛමුපච්චගුං** යනු ගෙවාදමන ලද භව සංයෝජන (බන්ධන) ඇති ඒ රහත්හු සියලු ආකාරයෙන් මානයෙන්

ගෙතීම, මාන සංයෝජනය සහමුලින් දුරුකිරීමෙන් මැඩපවත්වා සිටියාහු සසර දුක ඉතිරි නොකොට ඉක්මවූවාහුය යන අර්ථයි. මෙසේ මේ අටවන සූත්‍රයෙහි* ද රහත් බව දේශනා කරන ලදී.

අටවන සූත්‍ර වර්ණනාවයි.

## 1.1.9-10

නවවන දසවන සූත්‍රවල පෙර නොකියන ලද්දක් නැත. දේශනා විලාස වශයෙන් හෝ එසේ අවබෝධ කරන හික්මවිය යුත්තන්ගේ අදහස් වශයෙන් හෝ එසේ දේශනා කරන ලද්දේයයි දතයුතුය.

නවවන දසවන සූත්‍ර වර්ණනායි.

ප්‍රථම වර්ග වර්ණනාව නිමියේ ය.

## 1.2.1-2-3

දෙවන වර්ගයෙහි ද පළමු ආදී සූත්‍ර තුන කියන ලද ආකාරයෙන්මය. එසේම දේශනාවට කාරණය ද කියන ලද්දේම ය.

# 1.2.4

සිවුවැනි සූත්‍රයෙහි **නාහං භික්ඛවෙ** යනාදියෙහි 'න' කාරය ප්‍රතික්ෂේප කිරීම් අර්ථ ඇත්තේය. 'අහං' යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේ පෙන්වති. **අඤ්ඤං** යනු දැන් කිවයුතු අවිද්‍යා නීවරණයෙන් අනිකක්. **එකනීවරණම්පි** යනු එක් නීවරණ ධර්මයකුත්. **සමනුපස්සාමි** යනු දිට්ඨි සමනුපස්සනාව ද ඤාණ සමනුපස්සනාවදැයි සමනුපස්සනා දෙකකි. එහි **'රූපං අත්තතො සමනුපස්සති'**[1] 'රූපය ආත්ම වශයෙන් දකියි' යනාදී වශයෙන් පැමිණි මෙය දිට්ඨි සමනුපස්සනා නම් වේ. **'අනිච්චතො සමනුපස්සති නො නිච්චතො'** 'අනිත්‍ය වශයෙන් දකියි. නිත්‍ය වශයෙන් නොදකියි' යනාදී වශයෙන් පැමිණි මෙය ඤාණ සමනුපස්සනා නම් වේ. මෙහිදී ද ඤාණ සමනුපස්සනාව ම අදහස් කරන ලදී. 'සමනුපස්සාමි' යන පදය න කාරයෙන් සම්බන්ධ වෙයි.

'මහණෙනි, සර්වඥතා ඥාන සංඛ්‍යාත සමන්ත චක්ෂුවෙන් (සමතැසින්) සියලු ධර්මයන් අතෙහි වූ නෙල්ලි ගෙඩියක් බලන්නාක් මෙන් බලමින් අන් එක නීවරණයකුදු නො දකිමි' යන මෙය කියන ලද්දේ වෙයි.

**යෙන නීවරණෙන නිවුතා පජා දීඝරත්තං සන්ධාවන්ති සංසරන්ති** යනු නීවරණක ස්වභාවය ඇති යම් නීවරණයකින් ධර්ම ස්වභාවය දැනගන්නට, දැකගන්නට, අවබෝධ කරගන්නට නොදී වසාගෙන හාත්පසින් වසාගෙන සිටීමෙන් අන්ධකාරයෙන් වසන ලද සත්ත්වයෝ මූලක් නැති සසරෙහි අප්‍රමාණ කල්පයෙහි මහත් වූද කුඩා වූද භවවල භවයෙන් භවයෙහි උපපත්ති වශයෙන් සියලු ආකාරයෙන් දිවීමද කරති, හැසිරීමද කරති. අරමුණු අතර ගමන් කිරීම් වශයෙන් පැවැත්ම හෝ සන්ධාවනයයි. භවයෙන් භවය ගමන්කිරීම් වශයෙන් පැවැත්ම හෝ සංසරණයයි. කෙලෙසුන්ගේ බලවත් බැවින් සන්ධාවනය වෙයි. දුර්වල බැවින් සංසරණය වෙයි. එක ජාතියක ඇසිල්ලෙන් ඇසිල්ල මැරීම් වශයෙන් සන්ධාවනය වෙයි. නොයෙක් ජාතීන්හි ව්‍යවහාර මරණ වශයෙන්

---

1. අංගුත්තර නිකාය - චතුක්ක නිපාතය - මහා වග්ග

සංසරණය වෙයි. **'චිත්තමස්ස විධාවති'**[1] 'ඔහුගේ සිත ඔබමොබ දුවයි' යනුවෙන් කියන ලද හෙයින් චිත්ත වශයෙන් සන්ධාවනය වෙයි. කර්ම වශයෙන් සංසරණය වෙයි. මෙසේ සන්ධාවන සංසරණ යන පදවල වෙනස දතයුතුය.

**යථයිදං** යනු යථා ඉදං, ය කාරය පද සන්ධි කරන්නාය. සන්ධි වශයෙන් ('ථා' හි ඇති 'ආ' යන්න) කෙටි බවට පැමිණේ.

**අවිජ්ජා නීවරණං** යනු මෙහි පුරවන්ට නුසුදුසු අර්ථයෙන් කාය දුශ්චරිතාදියය අවින්දිය නම් වේ. නොලැබිය යුතුය යන අර්ථය යි. ඒ නොවිඳියයුක්ත විඳියි යන අර්ථයෙන් අවිද්‍යා නම් වේ. මෙයට විරුද්ධ අර්ථ වශයෙන් කාය සුචරිතාදිය විඳිය යුතු ධර්ම නම් වේ. ඒ විඳිය යුත්ත නො විඳියි යන අර්ථයෙන් අවිද්‍යා නම් වේ. ස්කන්ධයන්ගේ රාශි අර්ථය ආයතනයන්ගේ රැස්කිරීම් අර්ථය, ධාතූන්ගේ හිස් වූ (ශූන්‍ය) අර්ථය, ඉන්ද්‍රියයන්ගේ අධිපති බව යන අර්ථය, සත්‍යයන්ගේ නොවෙනස් වූ අර්ථය, දුක්ඛාදීන්ගේ පීඩාකිරීම් ආදී වශයෙන් කියන ලද සිවුවැදෑරුම් අර්ථය නො දනියි යන අර්ථයෙන් ද අවිද්‍යා නම් වේ. අගක් නැති සසරෙහි සත්ත්වයන් දුවවයි යන අර්ථයෙන් හෝ අවිද්‍යා නම් වේ. පරමාර්ථ වශයෙන් අවිද්‍යමාන ස්ත්‍රී පුරුෂ ආදීන් කෙරෙහි දුවයි, පවතියි, විද්‍යමාන ස්කන්ධාදීන් කෙරෙහි නො දුවයි, නො පවතියි යන අර්ථයෙන් අවිද්‍යා නම් වේ. තව ද චක්ඛු විඤ්ඤාණාදීන්ගේ ද චක්ඛු ආදි වස්තුවල ද රූපාදී අරමුණුවල ද පටිච්ච සමුප්පාද පටිච්ච සමුප්පන්න ධර්මයන්ගේ ද වැසීම කරන හෙයින් අවිද්‍යා නම් වේ. අවිද්‍යාවම නීවරණය හෙයින් අවිද්‍යා නීවරණ නම් වේ.

**අවිජ්ජා නීවරණෙන හි භික්ඛවෙ නිවුතා පජා දීඝරත්තං සන්ධාවන්ති සංසරන්ති** යන මෙය පළමු වැකියේ අර්ථයම දැඩි කිරීම පිණිස කියන ලදී. මුලින් ඇති **'යථයිදං භික්ඛවෙ අවිජ්ජානීවරණං'** යන්න මෙසේ උපමා දැක්වීම් වශයෙන් වදාරන ලදී. මෙය නීවරණ ආනුභාවය දැක්වීම් වශයෙන් වදාරන ලදී. කුමක් නිසා මෙහිදී අනිත් ධර්ම නො වදාරා අවිද්‍යාවම වදාරන ලද්දේ ද? ආදීනව (දොස්) වසාදමන හෙයින් කාමච්ඡන්දාදී

1. සං.නි. - දේවතා සංයුත්තය - ජරාවග්ග

නීවරණයන්ට විශේෂයෙන් ප්‍රත්‍ය වන (හේතුවන) හෙයිනි. එය එසේමය. ඒ අවිද්‍යාවෙන් වසා දමන ලද දොස් ඇති තැන කාමච්ඡන්දාදිය පවතියි.

**නතථඤ්ඤො** යන්න මුල්කොට ඇති ගාථා වදාළ අර්ථයත් නොවදාළ අර්ථයත් එකතුකිරීම් වශයෙන් වදාරන ලදී. එහි **නිවුතා** යනු වැසුණා වූ, ඔතන ලද්දා වූ සඟවන ලද්දා වූ යන අර්ථය යි. **අහොරත්තං** යනු දවල් ද රාත්‍රිය ද, සියලු කාලය කියන ලද්දේ වෙයි. **යථා මොහෙන ආවුතා** යනු යම් ආකාර අවිද්‍යා නීවරණ සංඛ්‍යාත මෝහයෙන් වැසුණු සැඟවුණු මනාව දතහැකි දේ නොදන්නා වූ ප්‍රජාවෝ (සත්ත්වයෝ) සසරෙහි සැරිසරත් ද එබඳු අන් එක් ධර්මයකුදු එක් නීවරණයකුදු නැතැයි යෙදිය යුතුය.

**යෙ ච මොහං පහත්වාන තමොකඛන්ධං පදාළයුං** යනු යම් ආර්ය ශ්‍රාවකයන් වහන්සේලා පූර්වභාගයෙහි (සෝවාන් ආදී මාර්ගයට පත්වීමට පෙර අවස්ථාවෙහි) තදංග ආදී ප්‍රහාණ වශයෙන් හෝ පහළම මාර්ගවලින් ඒ ඒ මාර්ගයෙන් දුරුකළ යුතු මෝහය දුරුකොට අග්‍ර මාර්ගයෙන් වජ්‍රයකට උපමාකොට ඇති ඤාණයෙන් මෝහ සංඛ්‍යාත වූ ම අන්ධකාර රාශිය සිඳ දැමුවාහුය. ඉතිරි නොකිරීම් වශයෙන් සහමුලින් සිඳ දැමුවාහුය.

**න තෙ පුන සංසරන්ති** යනු ඒ රහතන් වහන්සේලා

**ඛන්ධානං පටිපාටි ධාතු ආයතනාන ච**
**අබ්බොච්ඡින්නං වත්තමානා සංසාරොති පවුච්චති**

ස්කන්ධ, ධාතු, ආයතනවල පිළිවෙළ නොසිඳී පැවැත්ම සංසාරයයි කියනු ලැබේ යනුවෙන් මෙසේ කියන ලද මේ සසරෙහි නො හැසිරෙත්. පරිභ්‍රමණය නො කරති. කුමක් නිසා ද **හෙතු තෙසං න විජ්ජති** සංසාරයට හේතුව මූලකාරණය අවිද්‍යාවයි. උන්වහන්සේලා කෙරෙහි ඒ අවිද්‍යාව විද්‍යාමන නොවේ. සියලු ආකාරයෙන් නැත. සහමුලින් සිඳදමන ලද බැවිනි.

**සිවුවන සූත්‍ර වර්ණනාවයි.**

# 1.2.5

පස්වැනි සූත්‍රයෙහි යමෙකුගේ විද්‍යාමානත්වය වේද ඒ පුද්ගලයා දුක්වලින් කර්මය හෝ විපාකවලින් භවය - යෝනිය - ගතිය - විඤ්ඤාණයේ සිටීම - සත්ත්වාවාස හෝ භවයෙන් භවය ආදියෙහි යොදන්නේය යන අර්ථයෙන් සංයෝජන නම් වේ. ආසා කිරීම් අර්ථයෙන් තණ්හා නම් වේ. මෙය කරණකොට තමා ආශාකරයි හෝ ආශාවෙන් පීඩිත වෙයි හෝ ආශා කරති හෝ තණ්හා නම් වේ.

සඤ්ඤුත්තා යනු ඇස ආදී ඇලුම් කටයුතු වස්තුවල බැඳුණු, සෙස්ස කියන ලද ක්‍රමයටම ය. ඒකාන්තයෙන් මෙහි අවිද්‍යාවේ සංයෝජන භාවයද තණ්හාවේ නීවරණභාවය ද ඇත්තේම ය. එහෙත් අවිද්‍යාවෙන් වසන ලද ආදීනව ඇති භවයන්හි තෘෂ්ණාව සත්ත්වයන් යොදවන්නේය යන මේ වෙනස දැක්වීම සඳහා පළමු සූත්‍රයෙහි අවිද්‍යාව නීවරණයක් වශයෙන්ම ද මෙහි තණ්හාව සංයෝජනයක් වශයෙන් ද කියන ලදී. එය ද නීවරණ, සංයෝජනයන්ගේ ප්‍රධාන බව දැක්වීම පිණිසය. යම්සේ නීවරණ වශයෙන් අවිද්‍යාව සංක්ලේශ ධර්මයන්ට ප්‍රධාන වන්නේ ද පූර්වාංගම වන්නේ ද මෙසේ සංයෝජන වශයෙන් ම අවිද්‍යා තණ්හා දෙක අතුරෙන් තණ්හාව එයට සම්බන්ධ ප්‍රධානභාවය දක්වන්නට සූත්‍ර දෙකෙහි ඒ ධර්ම මෙසේ කියන ලදී. එහෙත් විශේෂයෙන් අවිද්‍යාව නිවන්දොර ආවරණය කරන හෙයින් නීවරණය යි කියන ලදී. තණ්හාව සසර දුක සමග සත්ත්වයන් යොදන හෙයින් සංයෝජනයයි කියන ලදී. සෝවාන් මාර්ගය නම් වූ දර්ශන ගමනට අනතුරු කිරීම් වශයෙන් ද විද්‍යාචරණ ධර්මයන්ට විරුද්ධ හෙයින් ද දෙක දෙකක් කොට කියන ලදී.

විද්‍යාවට කෙළින්ම විරුද්ධ වූ අවිද්‍යාව නිවන් දැකීමටත් නොවෙනස් වූ (යථාභූත) දැකීමටත් විශේෂ වශයෙන් අන්තරායකරය. චරණ ධර්මයන්ට කෙළින්ම විරුද්ධ වූ තණ්හාව යහපත් ප්‍රතිපත්තියේ ගමනට අන්තරායකරය. මෙසේ අවිද්‍යාවෙන් වැසුණු, අන්ධ කරන ලද තණ්හාවෙන් වැසුණු බැඳුණු මේ අශ්‍රැතවත් පෘථග්ජන තෙමේ අන්ධයකු මෙන් බැඳුනේ මහා කාන්තාරය වූ සංසාර කාන්තාරය නො ඉක්මවයි. අනර්ථය උපදවන හේතු දෙක දැක්වීම පිණිස (අවිද්‍යා-තණ්හා) දෙක දෙයාකාර කොට කියන ලදී. අවිද්‍යාවෙන් යුක්ත වූ පුද්ගලයා මෝඩ

බැවින් යහපත පිරිහෙළයි. නුසුදුසු ක්‍රියා කිරීමෙන් අදක්‍ෂ රෝගියකු මෙන් තමාට අයහපතද කරයි. දන්නා වූ ද බාලයා මෝඩ බැවින් යහපත පිරිහෙළයි. නුසුදුසු දෙය පරිහරණය කරන දන්නා වූ රෝගියකු මෙන් අයහපත ද කරයි. **මක්කටාලේපෝපම** සූත්‍රය මේ කරුණට සාධකයකි.

පටිච්ච සමුප්පාදයේ මූලකාරණ දැක්වීම පිණිස ද මෙහි දෙක දෙයාකාර කොට කියන ලදී. විශේෂ වශයෙන් සම්මෝහය බලවත් බැවින් අවිද්‍යා ක්‍ෂේත්‍රය අතීත කාලයට ඇතුළත්ය. ප්‍රාර්ථනාව බලවත් බැවින් තෘෂ්ණා ක්‍ෂේත්‍රය අනාගත කාලයට ඇතුළත්ය. එය එසේම ය.

සම්මෝහය බහුල වූ බාලයා අතීතය අනුව ශෝක කරයි. මොහුට අවිජ්ජා පච්චයා සංඛාරා යන ආදී සියල්ල පමුණුවා ගතයුතුය. ප්‍රාර්ථනාව බහුල පුද්ගලයා අනාගතයට ආශා කරයි. මොහුට 'තණ්හාපච්චයා උපාදානං' යනාදී සියල්ල පමුණුවා ගතයුතුය. මේ කාරණයෙන් ම ඔවුන්ගේ මුල්කෙළවර ගෙන ඒමෙන් ද අග කෙළවර සම්බන්ධ කිරීමෙන් ද පිළිවෙළින් මුල් කාරණය ඇති බව දක්වන ලදැයි දතයුතුය.

ගාථාවල - **තණ්හා දුතියො** යනු තණ්හා සහායකයා ය. තණ්හාව වනාහි දිය නැති (නිරුදක) කාන්තාරයෙහි මිරිඟුවෙන් ජලය යන සංඥාව උපදවා සතුටු වන්නාක් මෙන් පිපාසයෙන් මැඩුණු, පිළියම් කළ නොහැකි දුකින් මැඩුණු සත්ත්වයාට ආස්වාද දැක්වීම් වශයෙන් සහාය කටයුතු කරමින් භවාදියෙහි කැඩීයාමක් නොකොට ඇවිද්දවයි. එහෙයින් තණ්හා පුරිසස්ස දුතියා = තණ්හාව පුරුෂයාගේ දෙවැන්නිය යි කියන ලදී. අනිත් කෙලෙස් ආදිය භවයෙහි ඉපදීම පිණිස ප්‍රත්‍ය නොවේද? එය ඇත්තයි. එහෙත් තණ්හාව මෙන් විශේෂ ප්‍රත්‍ය නොවේ. එය එසේම ය. ඒ තණ්හාව කුශලයන්ගෙන් තොරව අකුශලයන් සමග ද කාමාවචරාදි කුශලයන්ගෙන් තොරව රූපාවචරාදි කුශලයන් සමග ද භවයෙහි ඉපදීම පිණිස විශේෂ ප්‍රත්‍ය වෙයි. යම්හෙයකින් සමුදය සත්‍යය යි කියන ලද ද එහෙයිනි.

**ඉත්ථභාවඤ්ඤථාභාවං** යනු ඉත්ථභාවය ද අඤ්ඤථාභාවය ද ඉත්ථභාවඤ්ඤථාභාවය යි. එය මොහුට ඇත්තේ යයි ඉත්ථභාවඤ්ඤථා භාවයයි. එනම් සසරය. එහි ඉත්ථභාවය ඒ මිනිසත් බවයි. එයින් අවශේෂ වූ සත්ත්වාවාස අඤ්ඤථාභාවය යි. ඒ ඒ සත්ත්වයන්ගේ වර්තමාන ආත්මභාවය හෝ ඉත්ථභාවයයි. අනාගත ආත්මභාවය අඤ්ඤථාභාවයයි.

මෙබඳු අනිකුත් ආත්මභාවය හෝ ඉත්ථභාවය යි. මෙබඳු නොවූ ආත්මභාවය අඤ්ඤථාභාවයයි. එය ඉත්ථභාව අඤ්ඤථාභාවය යි.

**සංසාරං** යනු ස්කන්ධ ධාතු ආයතනයන්ගේ පිළිවෙළයි.

**නාති වත්තති** යනු නො ඉක්මවයි.

**එවමාදීනවං ඤත්වා තණ්හං දුක්ඛස්ස සම්භවං** යනු මෙසේ සියලු වට්ට (සංසාර) දුක්ඛයාගේ හටගැන්ම, සමුදය, තණ්හාව, ආදීනවය, ආදීනව වශයෙන් දැනගෙන යන අර්ථය යි. නැතහොත් 'එතමාදීනවං ඤත්වා' යන කියන ලද පරිදි සසර නො ඉක්මවන මේ ආදීනවය, දෝෂය දැනගෙන. **තණ්හං දුක්ඛස්ස සම්භවං** යනු තණ්හාව ද කියන ලද ආකාරයෙන් සංසාර දුක්ඛයාගේ ප්‍රධාන කාරණය යි දැනගෙන. **වීතතණ්හා අනාදානො සතො භික්ඛු පරිබ්බජෙ** යනු මෙසේ පරිඤ්ඤා තුනෙන් දනිමින් විදසුන් වඩා මාර්ග පිළිවෙළින් තණ්හාව දුරුකරමින් අග්‍ර (රහත්) මාර්ගයෙන් සියලු ආකාරයෙන් දුරුකළ තණ්හාව ඇත්තේ පහවූ තණ්හාව ඇත්තේ එහෙයින් ම සතර උපාදාන අතුරෙන් කිසිවකුත් නැති බැවින් මතු ප්‍රතිසන්ධි සංඛ්‍යාත අල්ලාගැනීම නැති බැවින් අල්ලා ගැනීම් නැත්තේ සිහිය විපුල (මහත්) බවට පැමිණීමෙන් හැමතන්හි සිහි ඇතිව කටයුතු කිරීමෙන් සිහි ඇති, බිඳින ලද කෙලෙස් ඇති භික්ෂුව හැසිරෙන්නේය යන්නේය. ස්කන්ධ පරිනිර්වාණයෙන් සංස්කාරයන්ගේ පැවතීම් වශයෙන් ඉවත් වන්නේය යන අර්ථයි.

**පස්වන සූත්‍ර වර්ණනාවයි.**

# 1.2.6

සයවැනි සූත්‍රයෙහි. **සෙක්ඛස්ස** යනු මෙහි කුමන අර්ථයකින් සෙක්ඛ (සේඛ-ශෛක්ෂ) නම් වේද? ශෛක්ෂ ධර්ම ප්‍රතිලාභයෙන් සේඛ නම් වේ. **'කිත්තාවතානු බො භන්තෙ සෙක්ඛො හොතී ති? ඉධ භික්ඛු සෙක්ඛාය**

**සම්මා දිට්ඨියා සමන්නාගතො හොති -පෙ- සෙක්ඛෙන සම්මා සමාධිනා සමන්නාගතො හොති එත්තාවතා ඛො භික්ඛු සෙක්ඛො හොති**'[1]

'ස්වාමීනි, කොපමණකින් ශෛක්ෂ වේද? මේ ශාසනයෙහි භික්ෂුව සේඛ සම්මා දිට්ඨියෙන් යුක්ත වූයේ වෙයි. -පෙ- සේඛ සම්මා සමාධියෙන් යුක්ත වූයේ වෙයි. මෙපමණකින් භික්ෂුව සේඛ වෙයි' යනුවෙන් මෙය කියන ලද්දේය.

තව ද හික්මෙයි යන අර්ථයෙන් ද සේඛ වෙයි. '**සික්ඛති සික්ඛතීති ඛො භික්ඛු තස්මා සෙක්ඛොති වුච්චති, කිඤ්ච සික්ඛති ? අධි සීලම්පි සික්ඛති අධි චිත්තම්පි සික්ඛති අධි පඤ්ඤම්පි සික්ඛති, සික්ඛති සික්ඛතීති ඛො භික්ඛු තස්මා සෙක්ඛොති වුච්චති**'[2]

'භික්ෂුව හික්මෙන හික්මෙන නිසා සේඛ යයි කියනු ලැබේ. කුමක හික්මෙයි ද? අධි ශීලයෙහි ද හික්මෙයි, අධි චිත්තයෙහි ද හික්මෙයි, අධි ප්‍රඥාවෙහි ද හික්මෙයි. භික්ෂුව හික්මෙන හික්මෙන නිසා සේඛ යයි කියනු ලැබේ යයි මේ කාරණය කියන ලදී.

යම් කල්‍යාණ පෘථග්ජනයෙක් අනුලෝම ප්‍රතිපදාව සම්පූර්ණ කරන්නේ සීල සම්පන්න වූයේ ඉන්ද්‍රියයන්හි වසන ලද දොරටු ඇත්තේ භෝජනයෙහි පමණ දන්නේ නිදි වැරීමෙහි යෙදුනේ පෙර පසු රාත්‍රීවල (රාත්‍රිය පටන් ගැනීමේදී හා රාත්‍රිය අවසන් වීමේ දී) බෝධිපාක්ෂික ධර්ම වැඩීමෙහි යෙදුනේ අද හෝ හෙට හෝ එක්තරා මාර්ග ඵලයකට පැමිණෙන්නෙමි යි වාසය කරයි ද, හෙතෙමේ ද සේඛ යයි කියනු ලැබේ. මේ අර්ථයෙහි අවබෝධ නොකරන්නා වූම සේඛයා අදහස් කරන ලදී. කල්‍යාණ පෘථග්ජනයා ද අදහස් කරන ලදී.

**අප්පත්තමානසස්ස** යනු මොහු විසින් නොපැමිණි මානස ඇත්තේය යන අර්ථයෙන් අප්පත්තමනස නම් වේ. මානස යනු '**අන්තළික්ඛචරො පාසො ය්වායං චරති මානසො**'[3] 'අහසෙහි හැසිරෙන අය පවා බැඳගන්නා

1.
2. අංගුත්තර නිකාය - තික නිපාත - සමණ වග්ග - 5 සූත්‍රය
3. සංයුත්ත නිකාය - මාර සංයුත්තය

වූ සිතෙහි හටගත්තා වූ යම් මේ රාග නමැති මලපුඩුව (උගුල, පාශය) හැසිරේද' මෙහි රාගය මානස යයි කියන ලදී. **'චිත්තං, මනො, මානසං'**[1] යන මෙහි සිත මානස යයි කියන ලදී. **'අප්පත්තමානසො සෙක්ඛො කාලං කයිරා ජනෙසුතා'**[2] ජනයා කෙරෙහි ප්‍රසිද්ධ වූ භාග්‍යවතුන් වහන්ස, නො පැමිණි රහත්ඵල ඇති ශෛක්‍ෂ වූ ඔබවහන්සේගේ ශ්‍රාවකයෙක් කෙසේ නම් කලුරිය කරන්නේ ද? යන මෙහි අර්හත්වය අදහස් කරන ලදී. මෙහි ද අර්හත්වයම අදහස් කරන ලදී. එයින් නොපැමිණි අර්හත්වය ඇති භික්ෂුවට යි කියන ලද්දේ වෙයි.

**අනුත්තරං** යනු ශ්‍රේෂ්ඨ, අසමාන යන අර්ථයි.

නිර්භය වූ විපතට නොපත් යන අර්ථයෙන් **යොගක්ඛෙමං** නම් වේ. අර්හත්වයම අදහස් කරන ලදී.

**පත්ථය මානසස** යනු තණ්හා ප්‍රාර්ථනාව ද ඡන්ද ප්‍රාර්ථනාවදැයි ප්‍රාර්ථනා දෙකකි.

**'පත්ථය මානසස පජප්පිතානි පවෙධිතං වාපි පකප්පිතෙසු'**[3]

'ප්‍රාර්ථනා කරන්නාටම තෘෂ්ණාවෝ වෙති. තෘෂ්ණා දෘෂ්ටිවලින් කල්පනා කරන ලද වස්තූන් කෙරෙහි අතිශයින් සැලීම ද වෙයි.' යන මෙහි තෘෂ්ණා ප්‍රාර්ථනාව ය.

**'ඡින්නං පාපිමතො සොතං විද්ධස්තං විනලීකතං**
**පාමොජ්ජබහුලා හොථ ඛෙමං පත්තෙථ භික්ඛවො'**[4]

පාපී මාරයාගේ තෘෂ්ණා නමැති සැඩ දියපහර සිඳින ලදී. විනාශ කරන ලදී. මානය නමැති නළ දුරුකරන ලදී. මහණෙනි, ප්‍රමෝදය (සතුට) බහුලකොට ඇත්තෝ වවු. නිවන පතවු' යන මෙහි කත්තුකම්‍යතා

1. ධම්ම සංගණිප්පකරණ පදභාජනිය
2. සංයුත්ත නිකාය - මාර සංයුත්තය
3. සුත්ත නිපාත - අට්ඨක වග්ග
4. මජ්ඣිම නිකාය - චූල ගෝපාලක සුත්ත

කුසලච්ඡන්ද ප්‍රාර්ථනාවය (කුසල් කිරීමට කැමති පැතුම). මෙහි මෙයම අදහස් කරන ලදී. එහෙයින් 'පත්‍ථයමානස්ස' යනු ඒ අර්හත්වය සිදුකරගනු කැමති වූ, එයට නැඹුරු වූ යන අර්ථයි. (තන්නින්නස්ස, තප්පොනස්ස, තප්පබ්භාරස්ස යන මේවා එයට නැඹුරු වූ යන්නට සමාන පදය)

**විහරතො** යනු එක් ඉරියවුවකින් ඇතිවන දුකක් අනිත් ඉරියව්වකින් සිඳ දමා බිඳ නො වැටෙන ආත්මභාවය පවත්වාගෙන යන්නා වූ භික්ෂුවට. නැතහොත් '**සබ්බෙ සංඛාරා අනිච්චාති අධිමුච්චන්තො සද්ධාය විහරති**' සියලු සංස්කාර අනිත්‍යය යි ස්ථිර ලෙස පිහිටා ශ්‍රද්ධාවෙන් යුක්තව හැසිරෙයි' ආදී වශයෙන් නිද්දෙස ක්‍රමයෙන් ද මෙහි අර්ථය දතයුතුය.

**අජ්ඣත්තිකං** යනු තමා අයත් අධ්‍යාත්ම සංඛ්‍යාත අධ්‍යාත්මයෙහි වීම (තම සිතෙහි වූ) අජ්ඣත්තික නම් වේ. අංගං යනු කාරණය යි. **ඉති කරිත්වා** යනු මෙසේ කොට. **න අඤ්ඤං එකංගම්පි සමනුපස්සාමි** යන මෙහි මේ කෙටි අර්ථය යිඃ මහණෙනි, අධ්‍යාත්මය වූ තම සන්තානයෙහි (සිතෙහි) හටගත් කරුණකැයි (සැලකීම) කොට '**එවං බහූපකාරං යථා යොනිසො මනසිකාරො**' මෙසේ බොහෝ උපකාර වූ යෝනිසෝ මනසිකාරය බඳු අන් එක් කරුණකුදු නො දකිමි. උපාය මනසිකාරය, පථමනසිකාරය, අනිත්‍යාදිය කෙරෙහි අනිත්‍යාදි ක්‍රමයෙන් ම මෙනෙහි කිරීම, අනිත්‍යානුලෝමික ක්‍රමයෙන් හෝ සිත පිළිබඳ ආවර්ජනය, අනුව ආවර්ජනය, සිතාබැලීම, යන මෙය යෝනිසෝ මනසිකාරය යි කියනු ලැබේ.

දැන් යෝනිසෝ මනසිකාරයේ ආනුභාවය දක්වන්නට '**යොනිසො භික්ඛවෙ භික්ඛු මනසිකරොන්තො අකුසලං පජහති කුසලං භාවෙති**' 'මහණෙනි, භික්ෂුව නුවණින් මෙනෙහි කරමින් අකුසල් දුරුකරයි. කුසල් වඩයි' යනුවෙන් වදාරණ ලදී. එහි **යොනිසො මනසිකරොන්තො** යනු මේ දුක්ඛ ආර්ය සත්‍යය, මේ දුක්ඛ සමුදය ආර්ය සත්‍යය, මේ දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය, මේ දුක්ඛ නිරෝධගාමිනී පටිපදා ආර්ය සත්‍යයයි චතුරාර්ය සත්‍ය කෙරෙහි නුවණින් මෙනෙහි කරමින්, මේ එහි අර්ථ පැහැදිලි කිරීමයිඃ මේ සූත්‍රය අවිශේෂයෙන් ශෛක්ෂ පුද්ගල වශයෙන් පැමිණියේ වුවද සතර මාර්ගයට සාධාරණ වශයෙන් කෙටියෙන්ම කර්මස්ථානය කියන්නෙමු. චතුසත්‍ය කර්මස්ථානික වූ යෝගාවචරයා තණ්හාව හැර භූමි තුනට අයත් ස්කන්ධ දුකයයි ද තණ්හාව සමුදය යයිද

මේ දෙකෙහි නො පැවැත්ම නිරෝධයයි ද නිරෝධයට පමුණුවන්නේ මාර්ගය යයි ද මෙසේ කලින් ම ගුරුවරයා සමීපයෙහි දී උගත් චතුසත්‍ය කර්මස්ථානය ඇත්තෙක් වන්නේය.

හෙතෙම පසුකලෙක විදර්ශනා මාර්ගයට නැගුනේ ත්‍රෛභූමික ස්කන්ධ මේ දුකයයි නුවණින් මෙනෙහි කරයි, යහපත් වූ උපායෙන් මාර්ගයෙන් සිතා බලයි, විදර්ශනා ද කරයි. විදර්ශනාව මෙහිදී මනසිකාර ශීර්ෂයෙන් කියන ලදී. ඒ දුක උපදවන පෙර භවයට අයත් යම් මේ තණ්හාවක් වේද මේ දුක්ඛ සමුදය යයි නුවණින් මෙනෙහි කරයි. යම්හෙයකින් මේ දුක, මේ සමුදය මෙතැනට පැමිණ නිරුද්ධ වේද නොපවතී ද එහෙයින් නිවන දුක්ඛ නිරෝධයයි නුවණින් මෙනෙහි කරයි. නිරෝධයට පමුණුවන අංග අටකින් යුත් මාර්ගය මේ දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපදාවය යි නුවණින් මෙනෙහි කරයි. උපායෙන්, මාර්ගයෙන් සිතා බලයි. විදර්ශනා ද කරයි.

මේ එහි උපාය යි. සිතින් දැඩිකොට ගැනීම නම් වූ අභිනිවේසය ස්කන්ධයෙහි වෙයි. නිවනෙහි නොවෙයි. එහෙයින් මේ අර්ථය යිඃ මේ කයෙහි පඨවි ධාතුය, ආපෝ ධාතුය යනාදී ක්‍රමයෙන් සතර මහාභූතද ඒ අනුසාරයෙන් උපාදාරූප ද විමසා මේ රූපස්කන්ධයයි ද තීරණය කරයි. එය තීරණය කරන ඔහුට උපන්නා වූ ඒ අරමුණෙහි චිත්ත චෛතසික ධර්මයන් මේ සතර අරූප ස්කන්ධය යි තීරණය කරයි. එතැන් සිට මේ පංචස්කන්ධය දුක යයි තීරණය කරයි. ඒවා කෙටියෙන් නාමය රූපය යනුවෙන් දෙකොටසක් වෙයි. මේ නාමරූප ද හේතු සහිතව ප්‍රත්‍ය සහිතව උපදියි. මේ අවිද්‍යාව භව තණ්හාව මුල්කොට ඇත්තේ හේතුවය. මේ ආහාරය මුල්කොට ඇත්තේ ප්‍රත්‍යයයි. ඒ නාමරූපයන්ගේ හේතුප්‍රත්‍ය තීරණය කරයි.

හෙතෙම ඒ ප්‍රත්‍යයන්ගේ ද ප්‍රත්‍යයෙන් උපන් ධර්මයන්ගේ ද තත් වූ පරිදි ස්වභාව ලක්ෂණය තීරණය කොට මේ ධර්මයෝ පෙර නොතිබී හටගනිත්. ඇතිවී නිරුද්ධ වෙත්. එහෙයින් අනිත්‍යයයි අනිත්‍ය ලක්ෂණයට නංවයි. ඇතිව නැතිවීමෙන් පීඩාවට පත් වූ බැවින් දුකයයි දුක්ඛ ලක්ෂණයට නංවයි. තමාගේ වසඟයෙහි නොපවත්නා හෙයින් අනාත්මයයි අනාත්ම ලක්ෂණයට නංවයි. මෙසේ ත්‍රිලක්ෂණයට නංවා විදර්ශනා කරමින් ඇතිව නැතිවීම පිළිබඳ (උදයබ්බය) ඤාණය උපන්විට ඕභාසය (ආලෝකය)

ආදිකොට ඇති විදර්ශනා උපක්ලේශයන් මාර්ගය නොවේ යයි ද උදයබ්බය ඤාණයම ආර්ය මාර්ගයට උපාය වූයේ පූර්වභාග මාර්ගයයි මග නොමග (මග්ගාමග්ගං) තීරණයකොට නැවත උදයබ්බය ඤාණය ද පිළිවෙළින් භංග ඤාණාදිය ද උපදවමින් සෝතාපත්ති (සෝවාන්) ආදී මාර්ගයන්ට පැමිණෙයි. එකෙණෙහි සත්‍ය සතර එකම අවබෝධයෙන් අවබෝධ කරයි. එකම අභිසමයෙන් (අවබෝධයෙන්) අභිසමය (අවබෝධ) කරයි. එහිදී දුක පිරිසිඳ අවබෝධයෙන් අවබෝධ කිරීමෙන් (පරිඤ්ඤා පටිවෙධෙන) ද සමුදය දුරුකිරීම පිළිබඳ අවබෝධයෙන් අවබෝධ කිරීමෙන් (පහාණ පටිවෙධෙන) ද සියලු අකුසල් දුරුකරයි. නිරෝධය ප්‍රත්‍යක්‍ෂ කිරීම් වශයෙන් අවබෝධ කිරීමෙන් (සච්ඡිකිරියා පටිවෙධෙන) ද මාර්ගය වැඩීමෙන් ලබන අවබෝධයෙන් අවබෝධ කිරීමෙන් (භාවනා පටිවෙධෙන) ද සියලු කුසල් වඩයි.

ආර්ය මාර්ගය වෙනත් ක්‍රමයක් නැති හෙයින් (නිප්පරියාය වශයෙන්) නින්දිත, චංචල ආදි අර්ථයෙන් කුසල නම් වේ. එය වැඩූ කල්හි සියලු ම කුසල් ද නිවැරදි වූ බෝධිපාක්‍ෂික ධර්ම ද වැඩීම පරිපූර්ණ බවට යන්නේ යයි මෙසේ නුවණින් මෙනෙහි කරමින් අකුසල් දුරුකරයි. කුසල් වඩයි. එහෙයින් **'ඉදං දුක්ඛන්ති යොනිසො මනසිකරොති අයං දුක්ඛසමුදයොති යොනිසො මනසිකරොති'** 'මේ දුක යයි නුවණින් මෙනෙහි කරයි. මේ දුක්ඛ සමුදය යයි නුවණින් මෙනෙහි කරයි' ආදිය වදාරන ලදී. **'යොනිසො මනසිකාර සම්පන්නස්සෙතං භික්ඛවෙ භික්ඛුනො පාටිකංඛං අරියං අට්ඨංගිකං මග්ගං භාවෙස්සති අරියං අට්ඨංගිකං මග්ගං බහුලීකරිස්සති'** 'මහණෙනි, යෝනිසෝ මනසිකාරයෙන් යුක්ත වූ භික්‍ෂුව විසින් අරිඅටඟි මග වඩන්නේය. අරිඅටඟි මග බහුල වශයෙන් කරන්නේය යන මෙය කැමතිවිය යුතුය' යන අනිකක් ද වදාරන ලදී. 'යෝනිසෝ මනසිකාරෝ' යන ගාථාවෙහි මේ කෙටි අර්ථයයි.

ශික්‍ෂාපදයන්හි හික්මෙන නිසා හෝ ඒ ඔහුට හික්මෙන ස්වභාවය ඇත්තේය යන නිසා හෝ සෙක්ඛ නම් වේ. සසරෙහි භය දකියි යන අර්ථයෙන් භික්ඛු නම් වේ. **සෙක්ඛස්ස භික්ඛුනො උත්තමත්ථස්ස** ඒ ශෛක්‍ෂ භික්‍ෂුවට උත්තමාර්ථය වූ අර්හත්වයට පැමිණීම පිණිස එය අවබෝධ කිරීම පිණිස යෝනිසෝමනසිකාරය තරම් **බහුකාරෝ** මෙසේ බොහෝ උපකාර වූ අන්කිසි ධර්මයක් නැත. කුමක් නිසාද? නුවණින් උපායෙන් න්‍යායෙන් මනසිකාරය පෙරටුකොට **පදහං** සතරාකාර යහපත්

උත්සාහයෙන් බලවත් උත්සාහ කරමින් බයං දුක්ඛසස පාපුණෙ සංකිලේස සංසාර දුකෙහි ගෙවීම වූ අවසානය වූ නිවනට පැමිණෙන්නේ ය. එහෙයින් යෝනිසෝ මනසිකාරය බොහෝ උපකාර ඇත්තේය.

සයවන සූත්‍ර වර්ණනාවයි.

## 1.2.7

සත්වන සූත්‍රයෙහි බාහිරං යනු තමාගේ සිතින් (අජ්ඣත්ත සන්තානතො) පිටත ඇති බව. කල්‍යාණ මිත්තතා යනු යමෙකුට ශීලාදී ගුණයෙන් යුක්ත වූ විපත් නසන්නා වූ හිතවැඩ ඇතිකරන්නා වූ සියලු ආකාරයෙන් උපකාරක වූ මිත්‍රයෙක් වේද ඒ පුද්ගලයා කල්‍යාණ මිත්‍රයා ය. ඔහුගේ ගතිය කල්‍යාණ මිත්‍රතාවයි.

එහි මේ කල්‍යාණ මිත්‍රයා ස්වභාවයෙන් ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ වෙයි. ශීලයෙන් යුක්ත වූයේ වෙයි, ඇසීමෙන් යුක්ත වූයේ වෙයි, ත්‍යාගයෙන් යුක්ත වූයේ වෙයි, වීර්යයෙන් යුක්ත වූයේ වෙයි, සිහියෙන් යුක්ත වූයේ වෙයි, සමාධියෙන් යුක්ත වූයේ වෙයි, ප්‍රඥාවෙන් යුක්ත වූයේ වෙයි. එහි ශ්‍රද්ධා සම්පත්තිය කරණකොට තථාගතයන් වහන්සේගේ (සතර මාර්ග ඥාන නමැති) බෝධිය අදහයි. ඔහු විසින් සම්මා සම්බෝධියට හේතු වූ සත්ත්වයන් කෙරෙහි හිතවත් බව දුරු නොකරයි. ශීල සම්පත්තියෙන් බ්‍රහ්මචාරීන්ට ප්‍රිය වෙයි. ගරු කරන්නෙක් වෙයි. සිතිනුත් ගෞරවයෙන් පිළිගත යුත්තෙක් වෙයි. වරදට චෝදනා කරන්නෙක් වෙයි. පව්කාරයන්ට ගර්හා කරන්නෙක් වෙයි. කීමෙහි දක්ෂයෙක් වෙයි. අවවාද පිළිගන්නෙක් වෙයි. ශ්‍රැත සම්පත්තියෙන් ස්කන්ධ, ආයතන, සත්‍ය, පටිච්ච සමුප්පාද ආදී ගැඹුරු කථාවන් කරන්නෙක් වෙයි. ත්‍යාග සම්පත්තියෙන් අල්පේච්ඡ (ස්වල්ප දෙයක් කැමති) කෙනෙක් වෙයි. ලද දෙයින් සතුටු වන්නෙක් වෙයි. කාය විවේක චිත්ත විවේක දෙකින් යුක්ත කෙනෙක් වෙයි. සමූහය සමග එකට විසීමට අකමැති කෙනෙක් වෙයි.

වීර්ය සම්පත්තියෙන් තමාටත් අනුන්ටත් හිත පිළිවෙතෙහි අරඹන ලද වීර්ය ඇත්තෙක් වෙයි. සති සම්පත්තියෙන් එළඹ (පැමිණ) සිටි සිහි ඇත්තෙක් වෙයි. උතුම් වූ සිහියෙන් හා නුවණින් යුක්ත වූයේ බොහෝ කලකට පෙර කරන ලද්දක් බොහෝ කලකට පෙර කියන ලද්දක් සිහි කරන්නෙක් වෙයි. නැවත නැවත සිහි කරන්නෙක් වෙයි. සමාධි සම්පත්තියෙන් නො විසිරුණු සිත් ඇත්තෙක් වෙයි. සන්සුන් වූයේ එකඟ වූ සිත් ඇත්තෙක් වෙයි. ප්‍රඥා සම්පත්තියෙන් අවිපරීතව (යමක් ඇති ආකාරයෙන්) දැන ගනියි.

හෙතෙම සිහියෙන් කුශලාකුශල ධර්මයන්ගේ ස්වභාවය සොයමින් ප්‍රඥාවෙන් සත්ත්වයන්ගේ හිතසැප තත් වූ පරිදි දැන සමාධියෙන් එහි එකඟ වූ සිත් ඇතිව වීර්යයෙන් සත්ත්වයන් අයහපතෙන් වළක්වා ඒකාන්ත යහපතෙහි යොදවයි. එහෙයින්

**පියො ච ගරු භාවනීයො වත්තා ච වචනක්ඛමො**
**ගම්භීරඤ්ච කථං කත්තා නො චට්ඨානෙ නියොජයෙ'**[1]

ප්‍රිය වූයේ වේද, ගරු වූයේ වේද, ගෞරවයෙන් පිළිගත යුත්තේ වේද, කථාවෙහි දක්ෂ වේද, අවවාද පිළිගන්නේ වේද, ගැඹුරු කථා කියන්නේ වේද, නුසුදුසු තැන නොයොදන්නේ ද යනුවෙන් ද

**කල්‍යාණ මිත්තො භික්ඛවෙ භික්ඛු අකුසලං පජහති කුසලං භාවෙති**

'මහණෙනි, කල්‍යාණ මිත්‍ර වූ භික්ෂුව අකුසලය දුරුකරයි. කුසලය වඩයි' යනුවෙන් ද කීහ.

කල්‍යාණ මිත්‍ර පුද්ගලයා කල්‍යාණ මිත්‍රයා නිසා කම්පල ඇදහීමේ නුවණ (කම්මස්සකතං ඤාණං) උපදවයි. උපන්නා වූ ශ්‍රද්ධාව වැඩිදියුණු කරයි. හටගත් ශ්‍රද්ධාව ඇති තැනැත්තා (ධර්මය ඇසීමට සුදුසු කෙනෙකු වෙත) එළඹෙයි. එළඹ ධර්මය අසයි. ඒ ධර්මය අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ලබයි. ඒ ශ්‍රද්ධාව ලැබීමෙන් ගිහිගෙයි වාසය දුරුකොට පැවිද්ද (අනුව සිටියි) ලබයි. සිවු පිරිසිදු සිල් (සම්පාදනය කරයි) රකියි.

---

1. අංගුත්තර නිකාය - සත්තකනිපාත - දේවතා වග්ග

ශක්ති පමණින් ධූතාංග ධර්මයන් සමාදන්ව පවතී. දසකථා වස්තු ලාභියෙක් වෙයි. ආරම්භ කරන ලද වීර්යය ඇත්තෙක්ව වාසය කරයි. එළඹ සිටි සිහි ඇතිව නුවණින් යුතුව පෙර පසු රාත්‍රීන්හි බෝධිපාක්ෂික ධර්මයන් භාවනා කිරීමෙහි යෙදී නොබෝ කලකින්ම විදර්ශනාවට උත්සාහවත් කරවා ආර්ය මාර්ගය අවබෝධ කිරීමෙන් සියලු අකුසල් සහමුලින් නසයි. සියලුම කුසල් වැඩීම පරිපූර්ණ බවට පමුණුවමින් වඩයි.

මෙය වදාරණ ලද්දේම ය.

"මේඝියයෙනි, සිල්වත් වන්නේ ය. ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් සංවරව, ආචාර ගෝචර සම්පන්න, අල්පමාත්‍ර වූ ද වරදෙහි බිය දක්නා සුලු ව වසන්නේය. සමාදන් වී ශික්ෂාපදයන්හි හික්මෙන්නේය යන මෙය කලණ මිතුරන් ඇති කලණ යහළුවන් ඇති කලණ පුගුලන්ට නැමුණු භික්ෂුව විසින් කැමතිවිය යුතුය.

මේඝියයෙනි, අල්පේච්ඡ කථා ය, සන්තුෂ්ටි කථා ය, ප්‍රවිවේක කථාය, අසංසර්ග කථාය, වීර්යාරම්භ කථා ය, ශීලකථාය, සමාධි කථාය, ප්‍රඥා කථාය, විමුක්ති කථාය, විමුක්තිඥාන දර්ශන කථාය යන කෙලෙස් තුනීකරන, සිතෙහි නීවරණ දුරුකිරීම් වශයෙන් සමථ විදර්ශනාවන්ට සුදුසු වූ යම් කථාවක් ඒකාන්තයෙන් සසර කලකිරීම පිණිස, සසර නොඇලීම පිණිස, සසර නැවැත්ම පිණිස, කෙලෙස් සංසිඳුවීම පිණිස, දතයුතු දැය දැනගැනීම පිණිස, සතර මාර්ග ඥානයෙන් චතුරාර්ය සත්‍යය අවබෝධ කිරීම පිණිස, නිවන් පිණිස පවතී ද මෙබඳු කථා කැමති පරිදි අසනු ලබන්නෙක් වන්නේය. පහසුවෙන් ලබන්නෙක් වන්නේය. බොහෝ සේ ලබන්නෙක් වන්නේය යන මෙය කලණ මිතුරන් ඇති, කලණ යහළුවන් ඇති, කලණ පුගුලන්ට (පුද්ගලයන්ට) නැමුණු භික්ෂුව විසින් කැමතිවිය යුතුය.

මේඝියයෙනි, අකුසල් දහම් පහකරනු පිණිස, කුසල් දහම් වඩනු (උපදවනු) පිණිස ශක්තිමත්ය, දැඩි වූ වීර්යය ඇත්තේය. කුසල් දහම්හි ඉවත නොදැමූ වීර්යය ඇත්තේය යන මෙය කලණ මිතුරන් ඇති, කලණ යහළුවන් ඇති, කලණ පුගුලන්ට නැමුණු භික්ෂුව විසින් විසින් කැමති විය යුතුය.

මේඝියයෙනි, උදයබ්බය නම් වූ ඇතිවීම නැතිවීම අවබෝධ කරන්නා වූ, නිදොස් වූ, ආර්ය මාර්ගය ඇසුරු කරන්නා වූ මනාකොට දුක් නසන මාවතට පැමිණෙන ප්‍රඥාවෙන් යුක්ත වූ ප්‍රඥාවන්තයෙක් වන්නේය යන මෙය කලණ මිතුරන් ඇති, කලණ යහළුවන් ඇති, කලණ පුඟුලන්ට නැමුණු භික්ෂුව විසින් කැමතිවිය යුතුය.[1]"

මෙසේ සියලු සසර දුකින් මුදන නිමිත්ත කලණ මිතුරු බවයයි දතයුතුය. එහෙයින් 'ආනන්ද කලණ මිතුරු වූ මා වෙත අවුත් ඉපදීම ස්වභාව කොට ඇති සත්ත්වයෝ ඉපදීමෙන් (ජාතියෙන්) මිදෙති.[2] ජරාව ස්වභාව කොට ඇති සත්ත්වයෝ ජරාවෙන් මිදෙති යනාදිය වදාළහ. එහෙයින් 'මහණෙනි, කලණ මිතුරන් ඇති භික්ෂුව අකුසල් දුරුකරයි. කුසල් වඩයි' යනුවෙන් දේශනා කරන ලදී.

ගාථාවෙහි **සප්පතිස්සො** යනු පතිස්සව නම් වූ කීකරු බවෙන් යුක්ත වූයේ සප්පතිස්ස නම් වේ.

කලණ මිතුරාගේ අවවාදය හිසින් පිළිගන්නා වූ සුවචයෙක් යන අර්ථයි. නැතහොත් හිතසුවයෙහි පිහිටුවීම් වශයෙන් ඉදිරියට බලය පතුරුවයි යන අර්ථයෙන් පටිස්ස නම් වේ.

අවවාද දෙන්නා වූ ගුරුවරයාය. ආදරය යෙදුණු ඒ සුවච බව සමග පවතී යන අර්ථයෙන් සප්පතිස්ස නම් වේ. ගුරුවරුන් කෙරෙහි ගුරු ගෞරවය බහුල වූ. **සගාරවො** යනු සයවැදෑරුම් ගෞරවයෙන් යුක්ත වූ. **කරං මිත්තානවචනං** යනු කල්‍යාණ මිත්‍රයන්ගේ අවවාදය කරමින් අවවාදය අනුව පිළිපදිමින්. **සම්පජානො** යනු සත්තැනක පිහිටි මනා නුවණින් යුක්ත වූ. **පතිස්සතො** යනු කමටහන වැඩිදියුණුවට පමුණුවන්නට සමත් වූ සිහියෙන් සිහිඇත්තා වූ, සිහියෙන් කටයුතු කරන්නා වූ. **අනුපුබ්බෙන** යනු සීලය මුල්කොට ඇති විශුද්ධි පිළිවෙළින්, එහි ද විදර්ශනා පිළිවෙළින් මෙන් ම මාර්ග පිළිවෙළින් ද. **සබ්බ සංයෝජනක්ඛයං** යනු කාමරාග සංයෝජනාදී සියලු සංයෝජනයන් ගෙවා දැමීමෙන් සියලු සංයෝජනයන් ක්ෂය කිරීම් සංඛ්‍යාත ආර්ය මාර්ගයේ අවසානය වූ

1. උදාන පාළි - මේඝිය වග්ග
2. කෝසල සංයුත්තය - දුතිය වග්ග

අර්හත්වය ද එයට අරමුණු වූ නිවනට ද පැමිණෙන්නේය එය අවබෝධ කරන්නේය යන අර්ථයි. මෙසේ ශාස්තෲන් වහන්සේ විසින් මේ සූත්‍ර දෙකෙහි දී ආර්ය මාර්ගයේ අවබෝධය පිළිබඳ ප්‍රධාන අංගය ගන්නා ලදැයි දතයුතුය.

**සත්වන සූත්‍ර වර්ණනාවයි.**

# 1.2.8

අටවන සූත්‍රයෙහි එකධම්මො යන මේ සූත්‍ර නික්ෂේපය කුමක්ද? මතු වූ කරුණක් නිසා දේශනා කරන ලද්දකි. (අට්ඨුප්පත්තිකය) මේ එහි සාරාංශ කථාවයි. දෙව්දත් අජාසත් රජුට වැරදි මත ගන්වා ඔහුගේ පියා වූ බිම්බිසාර රජු ඔහු ලවා මැරවූව ද බුදුරජාණන් වහන්සේ මැරවීමට මිනීමරුවන් (අභිමාරෙ) යෙදවූව ද ගල් පෙරළීමෙන් ලෝහිතුප්පාදක කර්මය සිදුකළ ද එපමණකින් ප්‍රකට නොවීය. නාලාගිරි ඇතා මුදාහැරීමෙන් ප්‍රකට විය. ඉක්බිති මහජන තෙමේ මෙබඳු වූ පාපියකු ගෙන රජතුමා හැසිරෙන්නේ යයි කෝලාහල කළේය. මහත් ඝෝෂාවක් ඇතිවිය. එය අසා රජතුමා තමා විසින් දෙනු ලබන පන්සියයක් බත්තලි නැවැත්වීය. දෙව්දතුන්ගේ උපස්ථානයට ද නොගියේය.

නුවරවැසියෝ ද තම තමන්ගේ කුලවලට (නිවෙස්වලට) එන දෙව්දත්ට හැන්දක් තරම්වත් බත් නොදුන්හ. හෙතෙම පිරිහුණු ලාභසත්කාර ඇතිව කුහක කමින් (නැති ගුණ අඟවමින්) ජීවත්වනු කැමතිව බුදුරජාණන් වහන්සේ වෙත එළඹ පංච වස්තූන් (කරුණු පහක්) ඉල්ලා දේවදත්තය, එයින් කමක් නැත. කැමති කෙනෙක් අරණ්‍යවාසී වේවායි ආදී වශයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රතික්ෂේප කරන ලදුව ඒ කරුණු පහෙන් රළු පැවතුම්වලට පහදින මෝඩ ජනයාට හඟවමින් පන්සියයක් වජ්ජිපුත්‍රක භික්ෂූන් ලවා සලාක ගන්වා සංඝයා බිඳ ඔවුන් රැගෙන ගයා ශීර්ෂයට ගියේය.

ඉක්බිති අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලා දෙනම ශාස්තෲන් වහන්සේගේ අණින් එහි වැඩමකොට දහම් දෙසා ඒ භික්ෂූන් ආර්ය ඵලයෙහි පිහිටුවා ආපසු ගෙන ආවාහුය. සංඝභේදය පිණිස උත්සාහ කරන දෙව්දතුන්ගේ අදහස රුචි වූ භික්ෂූහු එහිම ඒ අදහස දැඩිව ගෙන සිටියාහු සංඝයා බිඳෙන විටත් බිඳුනු විටත් එය අනුමත කළාහුය. එය ඔවුන්ට බොහෝ කාලයක් අහිත පිණිස දුක් පිණිස විය. දෙව්දත් ද නොබෝ කලකින්ම රෝගයෙන් මැඩුනේ දැඩිලෙස ගිලන් වූයේ මරණ කාලයෙහි ශාස්තෲන් වහන්සේ වඳින්නෙමියි කුඩා ඇඳකින් ගෙනඑනු ලබන්නේ දෙව්රම් වෙහෙර පොකුණු තෙර තබන ලදුව පොළොවෙහි විවරයක් සෑදුනුවිට එහි වැටී අවීචියෙහි උපන්නේය.

ඔහුගේ ආත්මභාවය (සිරුර) යොදුන් සියයක් විය. කල්පයක් නිරයෙහි පැසෙන්නේය. තල්කඳක් පමණ වූ යකඩ උල්වලින් විදින ලද්දේය. දේවදත්ත භික්ෂුවගේ පැත්ත ගත් ඔහුගේ අදහසෙහි සිටි පන්සියයක් කුලවල අය නෑයන් සමග නිරයෙහි උපන්නාහ. එක්දිනක් භික්ෂූහු ධර්මසභාවෙහිදී ඇවැත්නි, සංඝයා බිඳුවන ලද දෙව්දත් විසින් බැරෑරුම් කර්මයක් කරන ලදැයි යනුවෙන් කථාවක් මතු කළහ. ඉක්බිති ශාස්තෲන් වහන්සේ දම්සභාවට වැඩමකොට මහණෙනි, දැන් මෙහි ඔබ කවර කථාවෙකින් යුක්තව සිටියාහුදැයි විමසා මෙනම් කථාවෙන් යයි කී කල්හි, සංඝ භේදයෙහි ආදීනව (දොස්) දක්වමින් මේ සූත්‍රය වදාළහ. 'දෙව්දත් ද ඔහුගේ පැත්ත ගත් අය ද එසේ නිරයෙහි උපන් බව දැක සංඝ භේදයෙහි ආදීනව දක්වමින් භාග්‍යවතුන් වහන්සේ තමන්වහන්සේගේ අදහසින්ම මේ සූත්‍රය දේශනා කළහ'යි ඇතැමෙක් (කෙචි) කියති.

එහි **එකධම්මො** යනු අකුසල් වූ එක් මහා සාවද්‍ය ධර්මය යි. **ලොකෙ** යනු සත්ත්ව ලෝකයෙහි. **උප්පජ්ජමානො උප්පජ්ජති** යනු මෙහි භේදය පිණිස පවතින භණ්ඩන (දබර) ආදිය සංඝයා කෙරෙහි උපන් කල්හි ද ධර්මය අධර්මය යනාදී අටළොස් භේදකර වස්තු අතුරින් යම් කිසිවක් පැහැදිලි කිරීම් වශයෙන් ව්‍යවහාර කරන කල්හිද එහි කැමැත්ත ඇතිකිරීම පිණිස ප්‍රකාශ කරන (අස්වන) කල්හි ද ප්‍රකාශ කොට සලාක ගැන්වූ කල්හි ද සංඝභේදය උපදින්නේ නම් වෙයි. සලාක ගැන්වූ කල්හිම භික්ෂූන් සතර දෙනෙක් හෝ ඊට වැඩියෙන් හෝ වෙන්ව (පාමොක්) උදෙසීම හෝ (අපලෝකනාදී) සංඝ කර්මයක් හෝ කරනවිට සංඝභේදය උපදියි නම් වේ. උදෙසීම්, සංඝකර්ම කළවිට සංඝභේදය උපන්නේ නම් වේ.

කම්ම = (සංඝයා විසින් කරන අපලෝකනාදී චතුර්විධ විනය කර්ම), උද්දෙස = (පස්වැදෑරුම් පාතිමොක්ඛුද්දෙස අතුරින් එකක්), වොහාර = (අටළොස් භේදකර වස්තු අතරින් යමක් දක්වා කථා කිරීම), අනුසාවන = (කිම නුඹවහන්සේ මා උසස් කුලයෙන් පැවිදි වූවකු බව නොදන්නහුද ආදී වශයෙන් භික්ෂූන්ගේ කනට කොට කීම), සලාකගාහ = (භික්ෂූන්ගේ සිත් පොළඹවා ඉරටු, උණපතුරු ආදී සලාක ගැන්වීම) යන සංඝභේදයට කරුණු වූ මේ පහ අතරින් කම්ම හෝ උද්දෙසය පමණක්ම ප්‍රමාණවත් වේ. වොහාර, අනුසාවන, සලාක ගාහ යන මේවා පූර්වභාග හෙවත් පළමුවෙන් සිදුවන කරුණුය.

බහුජන අහිතාය යන ආදියෙහි මහජනයාගේ ධ්‍යාන මාර්ග ආදි සම්පත් වැළැක්වීමෙන් අයහපත (අහිත) පිණිස, ස්වර්ග සම්පත් වැළැක්වීමෙන් අසුඛාය, නොසැප පිණිස, අපායෙහි ඉපදීමට හේතුවන බැවින් අනත්ථාය පරිහානිය පිණිස, අකුසල ධර්ම වශයෙන් අහිතාය හිත (යහපත) මාත්‍රයක් පමණවත් නැති බැවින් අහිත පිණිස, සුගතියෙහිද කායික චෛතසික දුක්ඛාය දුක් පිණිස උපදින්නේය යනුවෙන් සම්බන්ධ වෙයි. දෙවමනුස්සානං යන මෙය බොහෝ ජනයාට යනුවෙන් කී කල්හි ඉතා උසස් පුද්ගලයන්ගේ වශයෙන් දැක්වීම (නිර්දේශය) වේ. වෙනත් ක්‍රමයක් : බහුජන අහිතාය යනු මහත් වූ බහුජන සත්ත්ව සමූහයට අහිත පිණිස, මෙලොව පරලොව අනර්ථය පිණිස යන අර්ථයි. අසුඛාය යනු මෙලොව පරලොව නොසැප පිණිස, (මෙලොව-පරලොව) දෙයාකාර දුක් පිණිස යන අර්ථයි. අනත්ථාය යනු පරමාර්ථය ප්‍රතික්ෂේප කිරීම පිණිස, නිර්වාණය පරම අර්ථයයි. ඊට වඩා උසස් අර්ථයක් නැත. අහිතාය යනු මාර්ගය ප්‍රතික්ෂේප කිරීම පිණිස, නිවනට පමුණුවන මාර්ගයට වඩා උසස් වූ හිතයක් නම් නැත. දුක්ඛාය යනු ආර්ය සැප නැතිකර ගැනීමෙන් සංසාර දුක් පිණිස, ආර්ය සැපයෙන් තොර වූ එය අවබෝධ කරගන්නට නුසුදුසු අය සංසාර දුකෙහි කරකැවෙති. ආර්ය සැපයට වඩා උසස් සැපයක් නම් නැත. 'අයං සමාධි පච්චුප්පන්න සුඛො චෙව ආයතිංච සුඛවිපාකො' 'මේ සමාධිය වර්තමාන සැප ඇත්තේ ද මතු සැපවිපාක ඇත්තේ ද වෙයි' යනුවෙන් එහෙයින් කියන ලදී.

දැන් සංඝභේදය ස්වරූප වශයෙන් දක්වා එහි අහිතාදී ඒකාන්ත හේතුභාවය ප්‍රකාශ කරන්නට **'සංඝෙ ඛො පන භික්ඛවෙ භින්නෙ'** 'මහණෙනි, සංඝයා බිඳීම නිමිතිකොට (හේතුකොට) 'යනාදිය වදාළහ. එහි **භින්නෙ** යනු නිමිත්තාර්ථයෙහි සත්තමී (භුම්ම) වචනය යි. 'අධනානං ධනෙ

අනුප්පදියමානෙ' 'ධනය නැති අයට ධනය දීම නිමිතිකොට' යන්න මෙනි. භේදයට හේතුව යන අර්ථයි. **අඤ්ඤමඤ්ඤං භණ්ඩනානි** යනු සිවු පිරිස අතර ද එයට පක්‍ෂ වූවන් අතර ද මෙය ධර්මය යි, මෙය ධර්මය නොවේ යයි ඔවුනොවුන්ගේ විවාද, භණ්ඩනය වනාහි කලහයේ මුල් අවස්ථාවයි. **පරිභාසා** යනු ඔබට මේ මේ අනර්ථය කරන්නෙමු යනුවෙන් භය ඉපදවීම් වශයෙන් කරන තර්ජනයයි. **පරික්ඛෙපා** යනු ජාති ආදී වශයෙන් හාත්පසින් වචන දමා ගැසීම, දස ආක්‍රොශ වස්තුවෙන් නින්දා කිරීම, පහත්කොට සැලකීම. **පරිච්චජනා** යනු උක්ඛේපනීය කර්ම කිරීම් ආදී වශයෙන් පිටකිරීම (නෙරපීම) **තත්‍ථ** යනු ඒ නිමිත්තෙහි හෝ භණ්ඩන ආදියෙහි. **අප්පසන්නා** යනු රත්නත්‍රය සතු ගුණ නොදන්නා වූ. **නප්පසීදන්ති** යනු ධර්මචාරීහුය. සමචාරීහුය යනාදී වශයෙන් භික්‍ෂූන් කෙරෙහි යම් මේ පහදින ආකාරයක් වේද එසේ නොපහදිත්. උන්වහන්සේලාගේ වචනය ඇසිය යුතුයයි ඇදහිය යුතුයයි නො හඟිත්. එසේ ම ධර්මය කෙරෙහිත් ශාස්තෲන් වහන්සේ කෙරෙහිත් නොපැහැදුනාහුම වෙත්. **එකච්චානං අඤ්ඤථත්තං** යනු නොවැඩුණු ශ්‍රද්ධාව ඇති පෘථග්ජනයන්ගේ ප්‍රසාදයෙහි වෙනස් බවක්.

ගාථාවෙහි **ආපායිකො** යනාදියෙහි අපායෙහි ඉපදීමට සුදුසු වූ හෙයින් ආපායික නම් වේ. එහි ද අවීචි සංඛ්‍යාත මහා නිරයෙහි උපදියි යන අර්ථයෙන් **නෙරයිකො** නේරයික නම් වේ. එක් අන්තර කල්පයක් සම්පූර්ණ කොට එහි සිටියි යන අර්ථයෙන් **කප්පට්ඨො** කප්පට්ඨ නම් වේ. සංඝභේද සංඛ්‍යාත වෙන්වීමෙහි ඇලුනේය යන අර්ථයෙන් **වග්ගරතො** වග්ගරත නම් වේ. අදැහැමි බැවින් **අධම්මො** අධර්ම නම් වේ. භේදකරවස්තු කරණකොට සංඝභේද සංඛ්‍යාත වූම අධර්මයෙහි සිටියේය යන අර්ථයෙන් **අධම්මට්ඨො** අධම්මට්ඨ නම් වේ. **යොගක්ඛෙමා විධංසති** යනු අර්හත්වයෙන් යහපතෙන් පිරිහෙයි. සතර යෝගයන්ගෙන් උවදුරු නොවූ බැවින් යෝගක්ෂේම නම් වූ රහත් බවද නිවන ද යන එයින් ඔහුගේ පිරිහීමෙහි කිවයුත්තක් ම නැත. දෘෂ්ටියෙන් ශීලයෙන් සමාන වූ ස්ථිර වූ අර්ථයෙන් **සංඝං** සංඝ නම් වේ. එහෙයින් ම එකට විනය කර්මාදිය කිරීමෙන් **සමග්ගං** හිතවත් වූ **භින්වාන** පෙර කියන ලද ලක්‍ෂණ ඇති සංඝභේදයෙන් බිඳුවා. **කප්පං** ආයු කල්පය, මෙහිදී එය අන්තර කල්පයමයි. **නිරයම්හි** යනු අවීචිමහා නිරයෙහි.

**අටවන සූත්‍ර වර්ණනාවයි.**

# 1.2.9

නවවන සූත්‍රයෙහි **එකධම්මො** යනු එක් කුශල ධර්මයක්, නිවැරදි ධර්මයක්. මේ ධර්මයයි මේ ධර්මය නොවේයයි ආදි වශයෙන් ඉදින් සංඝයා කෙරෙහි විවාදයක් උපදින්නේ නම් එහිදී ධර්මයට කැමති නුවණ ඇති තැනැත්තා විසින් ඉදින් මේ විවාදය වැඩිදියුණු වන්නේ නම් සංඝ රාජිය පිණිස හෝ සංඝභේදය පිණිස හෝ පවතින්නේය යන මේ කාරණය විද්‍යමාන වන්නේය යනුවෙන් මෙසේ සිතාබැලිය යුතුය.

ඉදින් ඒ අධිකරණය තමා විසින් ඔසවාගෙන (දැඩිව ගෙන) සිටියේ නම් ගින්නක් පාගන්නා කෙනෙකු මෙන් වහාම එයින් නැවතිය යුතුය. එසේම අනුන් විසින් හෝ දැඩිව ගෙන සිටින ලද එය සන්සිඳුවීමට තමා සමත් නම් උත්සාහවත් වී දුරකට වුවද ගොස් එය සන්සිඳෙන ආකාරයට පිළිපැදිය යුතුය. ඉදින් තමා සමත් නොවන්නේ නම් ඒ විවාදය මතු මත්තෙහිත් වැඩෙන්නේම නම් නොසන්සිඳෙන්නේ නම් ඒ කරුණෙහිලා සුදුසු වූ ශික්ෂාකාමී වූ එකට බඹසර හැසිරෙන භික්ෂූන් වහන්සේලා උත්සාහවත් කොට යම් ධර්මයකින්, යම් විනයකින් යම් ශාස්තෲ ශාසනයකින් ඒ අධිකරණය සන්සිඳේ නම් එසේ සන්සිඳවිය යුතුය. මෙසේ සන්සිඳුවන්නා වූ භික්ෂුවට සංඝයා සමගි කිරීමේ යම් කුශල ධර්මයක් වේද මෙහිදී මෙය 'එකධම්මො' යනුවෙන් අදහස් කරන ලදී. ඒ භික්ෂුව සැක ඇතිවූ දෙපැත්තෙහිම සිටින භික්ෂූන්ට ද ඔවුන්ට අනුව පැවතීම් වශයෙන් සිටි භික්ෂුණීන්ට ද උපාසකයන්ට ද උපාසිකාවන්ට ද ඔවුන්ගේ ආරක්ෂක දේවතාවන්ට ද බ්‍රහ්මයන්ට ද අහිත වූ දුක්ගෙන දෙන්නා වූ ක්ලේශ ධර්මය ඉවත්කොට මහත් වූ පුණ්‍ය රාශියකට කුසල් ගලායාමට හේතුවීමෙන් දෙවියන් සහිත ලෝකයාට හිතසැප ගෙන දෙන්නෙක් වෙයි.

එහෙයින් '**එකධම්මො භික්ඛවෙ ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජන හිතාය**' 'මහණෙනි, එක් ධර්මයක් ලෝකයෙහි උපදිනු ලබන්නේ බොහෝදෙනාට හිත (යහපත) පිණිස 'යනාදිය වදාරණ ලදී. එහි අර්ථය මුලින් කියන ලද (අනන්තර) සූත්‍රයෙහි වදාළ ආකාරයට විරුද්ධ ලෙසින් දතයුතුය. **සංඝසාමග්ගී** යනු සංඝයාගේ සමගි බව භේදයක් නැති බව එක්ව විනයකර්ම කරන බවද එක්ව පාමොක් උදෙසන බව ද වේ.

ගාථාවෙහි **සුඛා සංඝස්ස සාමග්ගී** යනු සැපයට හේතුවීමෙන් සමගිය සැපයයි වදාරණ ලදී. 'සුඛො බුද්ධානං උප්පාදො'[1] 'බුදුවරුන්ගේ උපත සැපයකි' යන්න මෙනි. **සමග්ගානඤ්චානුග්ගහො** යනු සමගි වූවන්ගේ සමගිය අනුමෝදන් වීමෙන් අනුග්‍රහ කිරීම, සමගියට අනුරූප වීම, යම්සේ ඔවුහු සමගිය අත නොහරිත් ද එසේ ගැනීම තැබීම අනුබලදීම යන අර්ථයි. **සමග්ගං කත්වා** යනු බිඳුණු හෝ සංඝරාජියට පත්වූ හෝ සංඝයා සමගිකොට, අර්ථ සහිත වූවක් කොට **කප්පං** යනු ආයුෂ කල්පයම **සග්ගම්හි මොදති** යනු කාමාවචර දිව්‍ය ලෝකයෙහි අනිත් දෙවිවරුන් කරුණු දහයකින් මැඩපවත්වා දිවසැප අනුභව කරමින් කැමති දේ සිදුවීමෙන් ම සතුටු වෙයි, නැලවෙයි, ක්‍රීඩා කරයි.

නවවන සූත්‍ර වර්ණනාවයි.

## 1.2.10

දසවන සූත්‍රයෙහි උපත කුමක් ද? අර්ථෝත්පත්තියමය. එක්දිනක් දම්සභාවෙහි හුන්නා වූ භික්ෂූහු 'ඇවැත්නි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් බොහෝ පින්කම් කරයි. ඇතැම් පුද්ගලයෙක් බොහෝ පව්කම් කරයි. ඇතැම් පුද්ගලයෙක් පින්පව් දෙක මිශ්‍රව කරයි. මෙහි මිශ්‍රව කර්ම කරන පුද්ගලයාගේ පරලොව කෙබඳු ද' යනුවෙන් කථාවක් මතු කළහ.

ඉක්බිති ශාස්තෲන් වහන්සේ දම්සබාවට වැඩමකොට පනවන ලද උතුම් ආසනයෙහි වැඩහිඳිමින් ඒ කථාව අසා මහණෙනි, මරණාසන්න කාලයෙහි කිලිටි වූ සිත් ඇති පුද්ගලයා විසින් දුගතිය කැමතිවිය යුතුයයි දක්වමින් මේ කාරණය මුල්කොට උපන් මේ සූත්‍රය වදාළහ.

---

1. ධම්මපද - බුද්ධ වග්ග

එහි **ඉධ** යනු දේශය දැක්වීමෙහි නිපාතයයි. ඒ මේ නිපාතය කිසියම් තැනක 'ප්‍රදේශය' ගෙන කියනු ලැබේ. '**ඉධෙව තිට්ඨමානස්ස දෙවභූතස්ස මෙ සතො**'[1] 'මෙහි ම සිටින දෙවි වූ ම මා විසින්' යන ආදියෙහි මෙනි. කිසියම් තැනක 'ශාසනය' ගෙන කියනු ලැබේ. '**ඉධෙව භික්ඛවෙ සමණො ඉධ දුතියො සමණො**'[2] 'මහණෙනි, මේ ශාසනයෙහිම පළමු ශ්‍රමණයා වෙයි. මෙහිම දෙවන දෙවන ශ්‍රමණයා වෙයි.' ආදියෙහි මෙනි. කිසිතැනක පදපූරණය පමණක යෙදේ. '**ඉධාහං භික්ඛවෙ භුත්තාවී අස්සං පවාරිතො**'[3] 'මහණෙනි, මම වැළඳූයෙම් උවමනා පමණ වළඳ අවසන් කළෙම්' ආදියෙහි මෙනි. කිසිතැනක ලෝකය ගෙන කියනු ලැබේ. '**ඉධ තථාගතො උප්පජ්ජති**'[4] 'තථාගතයන් වහන්සේ මේ ලෝකයෙහි උපදිති' ආදියෙහි මෙනි. මෙම සූත්‍රයෙහි ද ලෝකයෙහි ම යයි දතයුතුය.

**එකච්චං** යනු එක්, එක්තරා යන අර්ථයයි. **පුග්ගලං** යනු සත්ත්වයාය. ඔහු කැමති පරිදි කුසල් අකුසල් ද එහි විපාක ද සම්පූර්ණ කිරීමෙන් මරණ වශයෙන් ද ගලායෑම් වශයෙන් ද පුග්ගල යයි කියනු ලැබේ.

**පදුට්ඨචිත්තං** යනු දූෂණයෙන් ක්‍රෝධයෙන් දූෂිත වූ සිත. නැතහොත් පදුට්ඨචිත්තං යනු රාගාදී දෝෂයෙන් දූෂිත වූ සිත. මෙහි ද එකච්චං යන මෙය දූෂිත වූ සිත් ඇති පුද්ගලයාට විශේෂණයකි. යමෙකුට ප්‍රතිසන්ධි ගෙනදෙන කර්මයට ඉඩක් ඇතිකළේ ද එසේ කියන ලද හෙතෙම, යමෙකුට අකුශල පැවැත්මෙන් සිත නවත්වා කුශල වශයෙන් බැසගන්නට නො හැකි ද මෙසේ ආසන්න වූ මරණය ඇත්තේ. **එවං** යනු දැන් කිවයුතු ආකාරය දක්වයි. **චෙතසා** යනු තමාගේ සිතෙන් අනුන්ගේ සිත් දන්නා නුවණින්. **චෙතො** යනු ඒ පුද්ගලයාගේ සිත. **පරිච්ච** යනු වෙන්කොට (පිරිසිඳ) **පජානාමි** දනිමි. මෙය යථාකම්මූපග ඤාණයට (මියගොස් ඉපදීමට හේතු වූ කර්මය දැනගන්නා නුවණට) වෙනස් නොවේද? එය ඇත්තය. එකල්හි පවතින අකුසල සිත වශයෙන් මෙය කියන ලදී. **ඉමම්හි චායං සමයෙ** යනු මේ කාලයෙහි, මේ හේතු එකතු වූ කල්හි හෝ **අයං පුග්ගලො** මේ පුද්ගලයා පෘථග්ජන ජවන වීථියෙන් පසුකාලයෙහි **කාලං**

---

1. දීඝ නිකාය - සක්කපඤ්හ සුත්ත
2. මජ්ඣිම නිකාය - චූල සීහනාද සුත්ත
3. මජ්ඣිම නිකාය - ධම්මදායාද සුත්ත
4. මජ්ඣිම නිකාය - චූල්ලහත්ථි පදෝපම සුත්ත

**කරෙය්‍ය** ඉදින් කලුරිය කරන්නේ නම් යන අර්ථයි. ජවනය ඇතිවන මොහොතෙහි කලුරිය කිරීමක් නැත.

**යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ** යනු ගෙන එන ලද කිසිවක් ගෙනවුත් තබන ලද්දාක් මෙන් තමාගේ කර්මයෙන් නිරයෙහි බහා තබන ලද්දේම ය තබන ලද්දේම ය යන අර්ථයි. **කායසස භෙදා** යනු උපාදින්න (තෘෂ්ණාදියෙන් අල්ලා ගන්න ලද) ස්කන්ධ හැරදැමීමෙන්. **පරමමරණා** යනු ඊට පසුව උපන් ස්කන්ධ අල්ලා ගැනීමෙහි. නැතහොත් 'කායසස භෙදා' යනු ජීවිතින්ද්‍රිය සිඳ දැමීමෙන්. 'පරමමරණා' යනු චුතියෙන් මත්තෙහි. **අපායං** යන ආදී සියල්ල නිරයට සමාන වචනමය. නිරය වනාහි 'අය' යයි කියන ලද සැපයෙන් ඉවත්වූයේ යන අර්ථයෙන් අපාය නම් වේ. ස්වර්ග මෝක්ෂයට හේතු වූ පුණ්‍ය සම්මත 'අය' යෙන් ඉවත් වූයේ යන අර්ථයෙන් ද අපාය නම් වේ. දුකේ ගතිය, දුකට පිළිසරණ යන අර්ථයෙන් දුග්ගති නම් වේ. ද්වේෂ බහුල බැවින් හෝ දුෂ්ට කර්මයෙන් උපන්නා වූ ගතිය යන අර්ථයෙන් ද දුග්ගති නම් වේ. නරක කර්ම කළ අය මෙහි විවසව. වැටෙති.

අඟපසඟ බිඳමින් නැසෙමින් මෙහි වැටෙති යන අර්ථයන් හෝ විනිපාත නම් වේ. මෙහි ආශ්වාද නම් වූ 'අය' මෙහි නැතැයි ආශ්වාද නැති අර්ථයෙන් නිරය නම් වේ.

නැතහොත් අපාය ගැනීමෙන් තිරිසන් යෝනිය කියනු ලැබේ. තිරිසන් යෝනිය වනාහි සුගතියෙන් පහවූ බැවින් අපාය නම් වේ. මහේශාක්‍ය නාගරාජාදීන්ගේ හටගැනීම ඇති හෙයින් දුගතිය නොවේ. දුගතිය ගැනීමෙන් ප්‍රේත විෂය කියනු ලැබේ. එය සුගතියෙන් පහ වූ බැවින් ද දුකට පිහිට වූ බැවින් ද අපාය ද දුගතිය ද වෙයි. අසුරයන්ට සමාන විනිපාතයක් නැති බැවින් විනිපාත නොවේ. විනිපාතය ගැනීමෙන් අසුරකාය කියනු ලැබේ. එය කියන ලද ආකාර ඇති අර්ථයෙන් අපාය ද දුගතිය ද වෙයි. සම්පූර්ණ ශරීරවලින් වැටුණු බැවින් විනිපාත යයි ද කියනු ලැබේ. මෙහි වනාහි සියලු පදවලින් නිරයම කියන ලද්දේය. **උපපජ්ජන්ති** යනු ප්‍රතිසන්ධිය ගනිති.

ගාථා අතරින් පළමු ගාථාව සංගායනා කාලයෙහි ධර්මය සංගායනා කළ ස්ථවිරයන් වහන්සේලා විසින් තබන ලදී. **ඤත්වා** යනු පූර්වකාල

ක්‍රියාවයි. (අතීත කාලයට අයත් පූර්ව ක්‍රියාවයි) දැනීම මුල්කොට ඇති ප්‍රකාශ කිරීමයි. 'සිංහයා දැක බියවෙයි' යන්න මෙන් ඤත්වා ශබ්දය හේතු අර්ථය ඇත්තේ හෝ වෙයි. දැනීම් හේතුව යන අර්ථයි.

**බුද්ධො භික්ඛූන සන්තිකෙ** යනු භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ සමීපයෙහි භික්ෂූන්ට ඉන්පසු ඇති ගාථා දෙකින් කියනු ලබන අත්‍ථං බ්‍යාකාසි කාරණය වදාළහ. ඉතිරිය කියන ලද ආකාරයෙන්ම ය.

**දසවන සූත්‍ර වර්ණනාවයි.**

**දෙවන වර්ග වර්ණනාව නිමියේ ය.**

## 1.3.1

තුන්වන වර්ගයෙහි පළමු සූත්‍රයෙහි **පසන්න චිත්තං** යනු රත්නත්‍රය පිළිබඳ ශ්‍රද්ධාවෙන් (ඇදහීමෙන්) ද කර්මඵල පිළිබඳ ශ්‍රද්ධාවෙන් ද ප්‍රසන්න වූ මනස. **සුගතිං** යනු සුන්දර වූ ගතිය (ස්ථානය) **සග්ගං** යනු රූපාදී සම්පත්වලින් යහපත් වූ අග්‍ර වූ යන අරුතින් සග්ග නම්. **ලොකං** යනු ලෝකයට අයත්. මෙහි පින් පව්වල ඵල (විපාක) විනාශවන අර්ථයෙන් හෝ ලෝක නම් වේ. මෙහි ද සුගතිය ගැනීමෙන් මනුෂ්‍ය ලෝකය ද ගනු ලැබේ. ස්වර්ගය ගැනීමෙන් දේවලෝකයම ගනු ලැබේ. ඉතිරිය මුලින් කියන ලද පරිදිමය.

**පළමු සූත්‍ර වර්ණනාවයි.**

# 1.3.2

දෙවන සූත්‍රයෙහි මා භික්ඛවෙ පුඤ්ඤානං යන මෙහි 'මා' යනු ප්‍රතික්ෂේප කිරීමෙහි නිපාතය යි. පුඤ්ඤ ශබ්දයඃ

**'කුසලානං භික්ඛවෙ ධම්මානං සමාදාන හෙතු එවමිදං පුඤ්ඤං පවඩ්ඪති'**

'මහණෙනි, කුසල ධර්මයන් සමාදන් වීම් හේතුවෙන් මෙසේ මේ පින වැඩේ.' යනාදියෙහි පුණ්‍ය ඵලයෙහි (විපාකයෙහි) ආයේය.

**'අවිජ්ජාගතො යං භික්ඛවෙ පුරිස පුග්ගලො පුඤ්ඤඤ්චෙව සංඛාරං අභිසංඛරොති'**[1]

'මහණෙනි, අවිද්‍යාව අනුව ගිය මේ පුරුෂයා පුණ්‍ය සංස්කාර ද රැස් කරයි' ආදියෙහි කාමාවචර රූපාවචර අරූපාවචර යහපත් හැසිරීමෙහි ආයේය.'

**'පුඤ්ඤූපගං භවති විඤ්ඤාණං'**

'විඤ්ඤාණය දෙවන භවයට පැමිණියේ වෙයි. (එළඹියේ වෙයි) ආදියෙහි සුගති විශේෂ වූ දෙවන භවයෙහි (උපදින ලෝකයෙහි) ආයේය.

**'තීණිමානි භික්ඛවෙ පුඤ්ඤකිරිය වත්ථූනි දානමයං පුඤ්ඤකිරියවත්ථු, සීලමයං පුඤ්ඤකිරියවත්ථු, භාවනාමයං පුඤ්ඤකිරිය වත්ථු'**[2]

'මහණෙනි, දානමය පුණ්‍යක්‍රියා වස්තුවය, ශීලමය පුණ්‍යක්‍රියා වස්තුවය, භාවනාමය පුණ්‍යක්‍රියා වස්තුවයයි මේ පුණ්‍ය ක්‍රියා වස්තු තුනකි.' ආදියෙහි කුශල චේතනාවෙහි ආයේය.

මේ සූත්‍රයෙහි දී ත්‍රෛභූමික කුශල ධර්ම දතයුතුය.

---

1. සංයුත්ත නිකාය - රුක්ඛ වග්ග
2. අංගුත්තර නිකාය - තික නිපාත

භායිත්ථ යන මෙහි ඤාණභය, සාරජ්ජ භය යනුවෙන් භය දෙපරිදිය. එහි

'**යෙපි තෙ භික්ඛවෙ දෙවා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලා උච්චෙසු විමානෙසු චිරට්ඨිතිකා තෙපි තථාගතස්ස ධම්මදෙසනං සුත්වා යෙභුය්‍යෙන භයං සන්තාසං සංවෙගං ආපජ්ජන්ති**'[1] 'මහණෙනි, දීර්ඝායුෂ ඇති ශරීර වර්ණයෙන් යුක්ත වූ, සැපබහුල වූ උස් විමානවල බොහෝකල් සිටින දෙව්වරු ද තථාගතයන් වහන්සේගේ ධර්මදේශනාව අසා බොහෝසෙයින් භයට, තැති ගැනීමට, සංවේගයට පැමිණෙත්' යනාදියෙහි ඤාණ භය ආයේය ය.

'**අහුදෙව භයං අහු ඡම්භිතත්තං අහු ලොමහංසො**'[1]

(මහා ගෝවින්ද බමුණාට) 'භයක් ඇතිවූයේමය. තැති ගැනීමක් ඇති වූයේමය. ලොමුදැහැ ගැනීමක් වූයේමය.' යනාදියෙහි සාරජ්ජ භය ආයේය.

මේ සූත්‍රයෙහි ද සාරජ්ජභය ම ආයේය. මේ එහි අර්ථයයි: මහණෙනි, බොහෝ කාලයක් කය වචන දෙක හික්මවා ගැනීම, වත්පිළිවෙත් පිරීම, එක් අසුනක හිඳීම, එක් අසුනක නිදීම, ඉන්ද්‍රිය දමනය, ධුතංග ධර්මවලින් සිත මැඩීම (නිග්‍රහය), සිහිනුවණින් යෙදීම කමටහන්හි යෙදීම් වශයෙන් වීර්ය ඇරඹීම යන මේ ආදී භික්ෂුව විසින් නිතර පවත්වා ගතයුතු පින්. ඒවා කෙරෙන් (ඒවාට) බිය නොවව් (නොවන්න) තැති ගැනීමට නොපැමිණෙන්න. මෙලොවදී ඇතැම් සැප ලබාදෙන, පරලොව නිවන්සැප ලබාදෙන පින් වලක්වන බියෙන් බිය නොවන්න. (පුඤ්ඤානං යන) මෙය පංචමී (අපාදාන = අවධි) අර්ථයෙහි ඡට්ඨී (සම්බන්ධ) විභක්ති වචනයකි. (නිස්සක්කෙ හි ඉදං සාමිවචනං)

දැන් එයින් බියනොවිය යුතු බවෙහි කාරණය දක්වමින් **සුඛස්සෙතං** යනාදිය වදාළහ. එහි සුඛ ශබ්දය

---

1. දීඝ නිකාය - මහා ගෝවින්ද සුත්ත

**'සුඛො බුදධානං උප්පාදො'**[1] - 'බුදුවරුන්ගේ උපත සැපයකි.

**'සුඛා විරාගතා ලොකෙ'**[2] - 'ලෝකයෙහි නො ඇලීම සැපයකි' ආදියෙහි සැපයට මුල යන අර්ථයෙහි ආයේය.

**'යස්මා ච ඛො මහාලි රූපං සුඛං සුඛානුපතිතං සුඛාවක්කන්තං'**[3]

'මහාලි යම් හෙයකින් රූපය සැපද සැපය මත්තෙහි වැටෙන ලද්දේ ද, සැපයට බැසගන්නා ලද්දේ ද' ආදියෙහි සැප අරමුණෙහි ආයේය.

**'යාවඤ්චිදං භික්ඛවෙ න සුකරං අක්ඛානෙන පාපුනිතුං යාව සුඛා සග්ගා'**

'මහණෙනි, දෙව්ලෝ මෙතෙක් සැප ඇතැයි වචනයෙන් කියා නිම කරන්නට පහසු නොවේ.

ආදියෙහි සැපයට ප්‍රත්‍ය (හේතු) වන ස්ථානයෙහි ආයේය.

**'සුඛො පුඤ්ඤස්ස උච්චයො'**[4] 'පින් රැස්කිරීම සැපය' යනාදියෙහි සැප හේතුවෙහි ආයේය.

**'දිට්ඨධම්ම සුඛ විහාරා එතෙ ධම්මා'**[5]

'මේ ධර්මයෝ මේ ජීවිතයේ දීම සැප විහරණයෝ වෙති.

**'නිබ්බාණං පරමං සුඛං'**[6] 'නිවන උතුම් සැපය යි' යනාදියෙහි නිවනෙහි ආයේය.

---

1. ධම්මපද - බුද්ධවග්ග
2. මහාවග්ග පාලි - මුචලින්දකථා
3. දීඝනිකාය - මහාලි සුත්ත
4. ධම්මපාද - පාප වග්ග
5. 
6. ධම්මපද -බුද්ධ වග්ග

'සුඛස්ස ච පහාණා' 'සැපය දුරුකිරීමෙන්' යනාදියෙහි සැප වේදනාවෙහි ආයේය.

'අදුක්ඛමසුඛං සන්තං'[1] 'ශාන්ත වූ ඒ අදුක්ඛමසුඛ වේදනාව' යනාදියෙහි උපෙක්ඛා වේදනාවෙහි ආයේය.

'ද්වෙපි මයා ආනන්දවෙදනා වුත්තා පරියායෙන සුඛා වෙදනා දුක්ඛා වෙදනා'

'ආනන්ද, මා විසින් පරියායෙන් (එක් ක්‍රමයකින්) සැපවේදනාව දුක්වේදනාව යයි වේදනා දෙකක් දේශනා කරන ලදී.' යනාදියෙහි ප්‍රිය සැපයෙහි ආයේය.

'සුඛො විපාකො පුඤ්ඤානං' 'පින්වල විපාකය සැපය' යනාදියෙහි ප්‍රිය විපාකයෙහි ආයේය. මේ සූත්‍රයෙහි ද ප්‍රිය විපාකයෙහි (ඉට්ඨ විපාක) ආයේ ය.

ඉට්ඨස්ස යන ආදියෙහි සෙවිය යුතු හෙයින් ද අනිෂ්ට බවට විරුද්ධ වීම් වශයෙන් ද ඉෂ්ට වූ. සිත්කලු වීම් වශයෙන් ද, මනසෙහි හැසිරීම් (ගමන් කිරීම්) වශයෙන් ද, පිළිසරණ වීම් වශයෙන් ද **කන්තස්ස** නම් වූ. ප්‍රිය කළ යුතු හෙයින් ද, තෘප්තිමත් කිරීම් වශයෙන් ද **පියස්ස** නම් වූ. සිතීමට සුදුසු හෙයින් ද මන වඩන හෙයින් ද **මනාපස්ස** යන අර්ථයයි දතයුතුය. **යදිදං පුඤ්ඤානි** යන මේ වචනය ඉෂ්ට වූ සැප විපාකයට නමකි. මේ සැපයමයි. යදිදං පුඤ්ඤානි යනුවෙන් ඵලය සමග හේතුවේ නොබිඳෙන සම්බන්ධය කියයි. ඔහු විසින් කරන ලද රැස්කරන ලද පින්වලට අවශ්‍යයෙන් ම ඵලය ලැබෙන බව අසා අප්‍රමාද තැනැත්තා විසින් පින් කළ යුතුයයි පුණ්‍යක්‍රියාවෙහි යොදවයි. ඒ පින් කිරීමෙහි ඔවුන්ට ආදරය උපදවයි.

දැන් තමන් වහන්සේ විසින් 'සුනෙත්ත' නමින් සිටි කාලයෙහි කරන ලද පින්කමෙන් බොහෝ කලක් විඳින ලද භවාන්තරයෙන් වැසී තිබුණු උසස් ම පුණ්‍ය විපාකය ගෙනහැර පා ඒ අර්ථය ප්‍රකට කරමින්

1. ඉතිවුත්තක - තික නිපාත - පඨම වග්ග

'අභිජානාමි ඛො පනාහං' යනාදිය වදාළහ. එහි **අභිජානාමි** යනු අති විශිෂ්ට ඥානයෙන් දනිමි. ප්‍රත්‍යක්ෂ වශයෙන් අවබෝධ කරමි. **දීඝරත්තං** යනු බොහෝකලක්. **පුඤ්ඤාණං** යනු දානාදී කුශල ධර්මයන්ගේ. **සත්තවස්සානි** යනු සත් අවුරුද්දක්. **මෙත්තචිත්තං** යනු ස්නේහ කෙරේනුයි මෙත්තා නම් වේ. ඇලුම් කරයි යන අර්ථයි. මිතුරා කෙරෙහි වීම හෝ මෙය මිතුරාගේ පැවැත්මය යන අර්ථයෙන් මෙත්තා නම් වේ.

**ලක්ෂණාදී** වශයෙන් හිත ආකාරය පැවතීම ලක්ෂණයයි. හිත (යහපත) ළඟට පැමිණවීම කෘත්‍යයයි (රසයයි.) ද්වේෂය හික්මවාගැනීම වැටහෙන ආකාරය යි. සත්ත්වයන්ට මනාප බව දැක්වීම ආසන්න කාරණයයි. ව්‍යාපාදය සන්සිඳීම මෛත්‍රියේ සම්පත්තිය යි. සෙනෙහස ඇතිවීම විපත්තිය යි. ඒ මෛත්‍රිය මෙයට ඇත යන අරුතින් මෙත් සිත නම් වේ. **භාවෙත්වා** යනු මෛත්‍රී සහගත සිත වඩා, චිත්ත ශීර්ෂයෙන් සමාධිය කියන ලද්දේය. එහෙයින් මෛත්‍රී සමාධිය මෛත්‍රී බ්‍රහ්මවිහාරය උපදවාගෙන එසේම වැඩීම ද සිදුකොට,

**සත්ත සංවට්ට විවට්ටකප්පෙ** යනු මහා කල්ප හතක්. සංවට්ට, විවට්ට දෙක ගැනීමෙන් ම සංවට්ටට්ඨායි, විවට්ටට්ඨායි යන දෙක ද ගන්නා ලදී. **ඉමං ලොකං** යනු කාමලෝකය. **සංවට්ටමානං සුදං** යනු සංවට්ටමානං, 'සුදං' යනු නිපාත මාත්‍රයකි. විනාශවන කල්හි යන අර්ථයි. 'සංවට්ටමානෙ සුදං' යනුවෙන් ද කියත්. **කප්පෙ** යනු ලෝකයෙහි, කල්ප ශීර්ෂයෙන් ලෝකය කියන ලදී. ලෝකය විනාශවන කල්හි කල්පයද විනාශ වේමය. '**කාලො ඝසති භූතානි සබ්බානෙව සහත්තනා**' 'කාලය තමා සමග සියලු සත්ත්වයන් කා දමයි' යනුවෙන් මෙසේ කීහ. 'ආභස්සරූපගො හොමි' යනුවෙන් කියන ලද බැවින් ගින්නෙන් විනාශ වීම් වශයෙන් මෙහි කල්ප විනාශය දතයුතුය. **ආභස්සරූපගො** යනු එහි ප්‍රතිසන්ධි (ඉපදීම්) වශයෙන් ආභස්සර බඹලොවට එළඹියේ යන අරුතින් ආභස්සරූපගො, **හොමි** වෙමි. **විවට්ටමානෙ** යනු හටගන්නා කල්හි, උපදින කල්හි යන අර්ථයි. **සුඤ්ඤං බ්‍රහ්මවිමානං උපපජ්ජාමි** කිසියම් සත්ත්වයකුගේ ඉපදීමක් එහි නැති හෙයින් ප්‍රථමධ්‍යාන භූමිසංඛ්‍යාත යම් හිස් වූ බ්‍රහ්ම විමානයක් වේද කල් ඇතිව හටගත් ඒ බ්‍රහ්ම විමානයක පිළිසිඳගැනීම් වශයෙන් උපදිමි, එළඹෙමි.

බ්‍රහමා යනු කාමාවචර සත්ත්වයන්ට වඩා ශ්‍රේෂ්ඨ අර්ථයෙන් ද ඒ ඒ ආකාරයෙන් වඩන ලද ගුණ ඇති බ්‍රහ්මවිහාර වශයෙන් උපන් අර්ථයෙන්ද බ්‍රහ්මයා නම් වේ. බ්‍රහ්ම පාරිසජ්ජ, බ්‍රහ්ම පුරෝහිත බ්‍රහ්මයන්ට වඩා මහත් වූ බ්‍රහ්මයා මහා බ්‍රහ්ම නම් වේ. එහෙයින් ම ඔවුන් වැඩගෙන සිටි බැවින් **අභිභූ** නම් වේ. ඔවුන් විසින් කිසියම් ගුණයකින් මැඩ නොපවත්වන ලද යන අරුතින් **අනභිභූතො** නම් වේ. **අඤ්ඤදත්‍ථු** යනු ඒකාන්ත වචනයෙහි නිපාතයකි. **දසො** යනු දකිනසුලු වූයේ, හෙතෙම අතීත, අනාගත, වර්තමාන යන කාල පිළිබඳ තොරතුරු දැකීමෙහි සමත් වූයේ, අභිඥා ඥානයෙන් දැකිය යුතු දේ දකිමි යන අර්ථයි. ඍද්ධිපාද භාවනා බලයෙන් සෙසු බඹුන්ගේ සිත් ද තමාගේ සිත ද මගේ වශයෙහි පවත්වමි යන අර්ථයෙන් **වසවත්‍ති හොමි** යනු යෙදිය යුතුය.

එකල්හි බෝධිසත්ත්වයන් වහන්සේ අෂ්ට සමාපත්ති ලබාගත් කෙනෙක්ව සිටිමින් ද සත්ත්වයාගේ හිත (යහපත) ද තමාගේ පාරමී පිරීම ද බලමින් ඒ ධ්‍යානභූමි දෙකෙහි ඇල්ම උපදවා මෛත්‍රී බ්‍රහ්මවිහාර වශයෙන් ඔබිමොබ සැරිසැරූහ. එහෙයින් 'සත්‍තවස්සානි -පෙ- වසවත්‍ති' යන (මේ සූත්‍රයෙහි කොටස) වදාරන ලදී.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ රූපාවචර පිනේ විපාක මහත් බව දේශනා කොට දැන් කාමාවචර පිනේ ද විපාක දක්වමින් '**ඡත්තිංසක්ඛත්තුං**' තිස්හය වාරයක්' යනාදිය වදාළහ. එහි **සක්කො අහොසිං** යනු තිස්හය වාරයක් අන්තැනක නූපදී නිරතුරුව ශක්‍රයා වීමි. **දෙවනමින්දො** යනු තව්තිසාවෙහි දෙව්රජ. 'රාජා අහොසිං චක්කවත්ති' යන ආදියෙහි සතර ආශ්චර්ය ධර්මවලින් ද සතර සංග්‍රහ වස්තුවලින් ද ලෝකය සතුටු කරයි (රංජනය කරයි) යන අර්ථයෙන් රාජා නම් වේ. චක්‍ර රත්නය පවත්වයි ද සම්පත් චක්‍ර සතරින්* රඳා පවතී ද ඒවායින් අන් අය යොදවයි ද අන් අයට යහපත පිණිස ඉරියව් නමැති චක්‍රයේ පැවැත්ම මොහු කෙරෙහි ඇත යන අරුතින් **චක්කවත්ති** නම් වේ.

මෙහි රාජා යනු සාමාන්‍ය යි. චක්කවත්ති යනු විශේෂණය යි. දැහැමින් හැසිරෙයි යන අර්ථයෙන් **ධම්මිකො**, සත්‍යයෙන් (ඥායෙන)

---

* සම්පත් චක්‍ර සතර : 1. සුදුසු පෙදෙසක වාසය, 2. සත්පුරුෂ ඇසුර, 3. තමන් ශ්‍රද්ධා ආදියෙහි පිහිටුවා ගැනීම, 4. පෙර කළ පින් ඇති බව. අංගුත්තර නිකාය - චතුක්ක නිපාත - චක්ක වග්ග - 1 සූත්‍රය

තැන්පත්කමින් (සමෙන) පවතී යන අර්ථයි. දැහැමින් ම රාජ්‍යය ලැබ රජ උපන්නේය යන අරුතින් ධම්මරාජා නම් වේ. අනුන්ට යහපත පිණිස පවතින ධර්ම අනුගමනය කිරීමෙන් හෝ දැහැමි (ධම්මිකො) වෙයි. තමාට යහපත පිණිස පවතින ධර්ම අනුගමනය කිරීමෙන් හෝ දැහැමි රජ (ධම්මරාජා) වෙයි. සතර දිසාවට අධිපති යන අරුතින් චාතුරන්තො, සතරමහා සාගරය කෙළවරකොට ඇති සතරාකාර දිවයින් සරසන ලද බැවින් ද පෘථිවියට අධිපති යන අර්ථයි.

තම රට ඇතුළත හා පිටත සියලු විරුද්ධ රජවරු ද දඬුමුගුරුවලින් තොරව, ආයුධවලින් තොරව දිනුවේය යන අරුතින් විජිතාවී නම් වේ. ජනපදයෙහි ස්ථාවර භාවයට ස්ථිර භාවයට පත්වූයේ කිසිවකුට එතැනින් සෙලවිය නොහැකිය, ජනපදය ඔහු කෙරෙහි ස්ථාවර බවට පත්වූයේ අනුයුක්ත වූයේ තම කටයුතුවල නිරත වූයේ නො සැලෙන්නේ කම්පා නොවන්නේ යන අරුතින් ජනපදත්ථාවරියප්පත්තො නම් වේ.

චක්‍ර රත්නය, හස්ති රත්නය, අශ්ව රත්නය, මාණික්‍ය රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය, පරිනායක (පුත්‍ර) රත්නය යන මේ සප්ත රත්නයෙන් යුක්ත වූයේය යන අරුතින් සත්තරතන සමන්නාගතො වෙයි. රජතුමා ඒ රත්න අතුරින් චක්‍ර රත්නයෙන් නො දිනූ රටවල් දිනයි. හස්ති අශ්ව රත්නවලින් දිනූ රටවල සැපසේ හැසිරෙයි. පරිනායක රත්නයෙන් දිනූ රටවල් ආරක්ෂා කරගනියි. ඉතිරි රත්නවලින් උපභෝග සැප අනුභව කරයි.

පළමු රත්නයෙන් රජුගේ උත්සාහ ශක්තිය යෙදීම ද, අවසාන රත්නයෙන් මන්ත්‍ර ශක්තිය යෙදීම ද හස්ති, අශ්ව, ගෘහපති රත්නවලින් ප්‍රභූ ශක්තිය යෙදීම ද මැනවින් සම්පූර්ණ වෙයි. ස්ත්‍රී හා මාණික්‍ය රත්නවලින් තුන්ආකාර ශක්ති යෙදීමේ ඵලය ද ලැබේ. හෙතෙම ස්ත්‍රී හා මාණික්‍ය රත්නවලින් පරිභෝග සැප අනුභව කරයි. ඉතිරි ඒවායින් උපභෝග සැප අනුභව කරයි. විශේෂයෙන් ඔහුගේ පළමු රත්න තුන අද්වේෂ කුසල මූලයෙන් උපන් කර්මානුභාවයෙන් සම්පූර්ණ වේ. මැද ඇති රත්න තුන අලෝභ කුසල මූලයෙන් උපන් කර්මානුභාවයෙන් සම්පූර්ණ වේ. අවසාන රත්නය අමෝහ කුසල මූලයෙන් උපන් කර්මානුභාවයෙන් සම්පූර්ණ වේයයි දතයුතුය.

**පදෙස රජ්ජස්ස** යනු කුඩා රාජ්‍ය ගැන. **එතදහොසි** යනු තමාගේ සම්පත් නුවණින් සලකා බලන්නා වූ ඔහුට අවසන් සක්විති රජ කාලයෙහි මෙය මා විසින් කරන ලද කුමන කර්මයක ඵලයක් ද යනාදී මේ අදහස ඇතිවිය. ඒ ඒ භවයෙහි කරන ලද හැමතන්හි ප්‍රයෝජනවත් වූ කර්ම ඵලයයි යන මේ අදහස ඇති වූයේමය. මේ යෝජනාව ඒ සක්විති කාල වශයෙනි. **එවං මහද්ධිකො** යනු මාණික්‍ය රත්නය, ස්ත්‍රී රත්නාදිය ප්‍රමුඛ කොට ඇති භාණ්ඩාගාර, වාහන සම්පත්තියෙන් ද ජනපදයෙහි ස්ථාවර භාවයට පැමිණීමෙන් ද මෙසේ මහත් සෘද්ධිමත් වූ. **එවං මහානුභාවො** යනු රත්නාදියෙන් යුක්තවීම නිසා කිසිවකුටත් පීඩාවක් නොකරමින්ම සියලු රජුන් විසින් හිසින් (සිරසින්) පිළිගන්නා ලද අනුශාසනා, ආකාශ ගමන් ආදී (වශයෙන්) මෙසේ මහත් ආනුභාව ඇති, **දානස්ස** යනු ආහාර ආදී දිය යුතු වස්තු පරිත්‍යාගයේ. **දමස්ස** යනු ඇස ආදී ඉඳුරන් දමනයේ ද සමාදන්වීම් වශයෙන් රාගාදී කෙලෙස් දමනයේ ද, **සංයමස්ස** යනු කය වචන දෙකෙහි සංයමයේ. එහි සමාදාන වශයෙන් ඇති මේ කෙලෙස් දමනය භාවනාමය පිනයි. මේ සූත්‍රයෙහි දී මෛත්‍රී බ්‍රහ්මවිහාරයෙන් උපන් ඒ භාවනාමය පින අදහස් කරන ලදී. උපචාර - අර්පණා භේදයෙන් දෙයාකාර වූ ඒ භාවනාමය පින අතුරින් ද අර්පණාවට පැමිණි භාවනාමය පින අදහස් කරන ලදී. එහෙයින් කියන ලද ආකාර ඇති ධ්‍යාන භූමි දෙකෙහි ඔහුගේ උපත සිදුවිය. (අද්වේස, අලෝභ, අමෝහ වශයෙන් සිදුකරන ලද) ඉතිරි ත්‍රිවිධ පුණ්‍යකර්මානුභාවයෙන් සුදුසු පරිදි පැමිණි සක්විති ආදී ස්වභාවය දතයුතුය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ තමන්වහන්සේ කාය ශාක්ෂි කොට පින්වල විපාක මහත් බව ප්‍රකාශකොට දැන් ඒ අර්ථය ම ගාථා බන්ධනයෙන් දක්වමින් 'පුඤ්ඤමෙව' යනාදිය වදාළහ. එහි **පුඤ්ඤමෙව සො සික්ඛෙය්‍ය** යහපත කැමති කුලපුත්‍රයා පින්පල ඉපදවීමෙන් තමාගේ සිත පිනවීම් වශයෙන් පුඤ්ඤ යනුවෙන් ලබන ලද නම් ඇති ත්‍රිවිධ කුශලයෙහිම හික්මෙන්නේය. එම කුශලය ඇසුරු කරන්නේය. රැස්කරන්නේය. උපදවන්නේය යන අර්ථයි.

**ආයතග්ගං** යනු මහත්ඵල ඇති බැවින් උසස් ඵල ඇති බැවින් ආයතග්ග නම් වෙයි. ප්‍රියමනාප ඵල ඇති බැවින් පැතිරෙයි, උතුම් වෙයි යන අර්ථයෙන් ද ආයතග්ග නම් වේ. යෝනිසෝ මනසිකාරාදි ප්‍රත්‍යයෙන්

වඩා උසස් බැවින් අග්‍ර යන අරුතින් ආයතග්ග නම් වේ. 'ත' කාරය පද සන්ධි කිරීම සඳහාය. නැතහොත් මනෝඥ වූ ඵල ලැබීමෙන් අග්‍ර යන අරුතින් ප්‍රධාන වූයේ යන අරුතින් ආයතග්ග නම් වේ. එයම සුඛුද්‍රයං සැප විපාක යන අර්ථයි. ඒ පින කුමක්ද? කෙසේ එහි හික්මෙන්නේදැයි වදාළහ: 'දානඤ්ච සමචරියඤ්ච මෙත්තචිත්තඤ්ච භාවයෙ' යන මෙහි **සමචරියං** යනු කාය විසමාදිය දුරුකොට කායසසමාදියෙහි හැසිරීම. ඉතා පිරිසිදු ශීලය යන අර්ථයි. **භාවයෙ** යනු තමාගේ සිතෙහි උපදවන්නේය වඩන්නේය. **එතෙ ධම්මෙ** යනු ඒ දානාදී සුචරිත ධර්ම.

සුඛ සමුද්‍රයෙ යනු සැප අනුසස් ඒවායේ ආනිසංස ඵලය ද සැපයමයි දක්වයි. **අබ්‍යාපජ්ඣං සුඛං ලොකං** යනු කාමච්ඡන්දාදි බාධා නැති බැවින් අබ්‍යාපජ්ඣ වූ නිදුක් වූ. අනුන් පෙළීමක් නැතිවීමෙහි දී කිවයුත්තක් නැත. ධ්‍යාන සමාපත්ති වශයෙන් ධ්‍යාන පින්වල සැප බහුල බැවින් සැප වූ ඒකාන්ත සැප වූ බඹලොවට, ඉතිරි පින්වලින් ඒ අතිත් සම්පත්තිභව සංඛ්‍යාත සැප ලොවට. **පණ්ඩිතො** ප්‍රඥාවන්ත තැනැත්තා. **උපපජ්ජති** එළඹෙයි. මෙසේ මේ සූත්‍රයෙහි ද ගාථාවලද සසර සම්පත් ම දේශනා කරන ලදී.

දෙවන සූත්‍ර වර්ණනාවයි.

# 1.3.3

තෙවන සූත්‍රයෙහි **භාවිතො** යනු උපදවන ලද්දේ ද වඩන ලද්දේ ද, **බහුලීකතො** යනු නැවත නැවත කරන ලද. **අත්‍ථො** යනු හිත (යහපත) එය කෙලෙස් නැති බැවින් (අරණීයතො) ද එළඹිය යුතු බැවින් ද අර්ථයයි කියනු ලැබේ. **සමධිගය්හ තිට්ඨති** යනු මනාව අල්ලාගෙන දුරුනොකොට පවතී. **දිට්ඨධම්මිකං** යනු ප්‍රත්‍යක්ෂ වූ ආත්මභාවය දිට්ඨධම්මයයි කියනු ලැබේ. දිට්ඨධම්මයෙහි වීම දිට්ඨධම්මිකය. මෙලොවට ඇතුළත් යන අර්ථයි. **සම්පරායිකං** යනු ස්වභාව වශයෙන් පරලොව

යා යුතු හෙයින් සම්පරාය නම් වේ. පරලොවයි, සම්පරායෙහි වීම සම්පරායික ය. පරලොවට ඇතුළත් යන අර්ථයි. ඒ දිට්ඨධම්මික නම් වූ අර්ථය කුමක්ද? සම්පරායික නම් වූ අර්ථය කුමක් ද? කෙටියෙන් මෙලොව සැපය ද දැන් මෙලොව සැප ගෙන දෙන දෙය ද දිට්ඨධම්මික අර්ථයයි. ඒ කෙසේද යත්, ගිහියන්ට සම්පත් උපකරණ, (ගොවිතැන ගව පාලනය ආදී) නිවැරදි කර්මාන්ත ඇති බව, සෞඛ්‍ය කටයුතු සංවිධානය, ශරීරය ඇතුළත හා පිටත වස්තූන් පිරිසිදුව තබාගැනීම, නිසිලෙස පිළියෙල කළ ශිල්පායතන හා විද්‍යායතන, සංග්‍රහ කරන ලද පිරිවර ජනයා ඇති බව යන මේ ආදිය යි.

පැවිද්දන්ට සිවුරු, දානය, සෙනසුන්, බෙහෙත් යන ජීවත්වීමට අවශ්‍ය අංග නිදුකින් (පහසුවෙන්) ලැබීම, ඒවා පරිහරණය කිරීමෙහි දී නුවණින් සලකා පරිහරණය කිරීම, නුවණින් සලකා දුරුකිරීම, ඇතුළත පිටත වස්තු පිරිසිදුව තබාගැනීම, අල්පේච්ඡ බව, ලද දෙයින් සතුටු වීම, කාය-චිත්ත විවේකය, දැකීම්, ඇසීම් ආදියෙහි නොඇලීම යන මේ ආදියයි. සුදුසු ප්‍රදේශයක වාසය කිරීම, සත්පුරුෂයන් ඇසුරු කිරීම, සදහම් ඇසීම, නුවණින් මෙනෙහි කිරීමාදිය දෙපිරිසට ම පොදුය. දෙපිරිසටම සුදුසුය යි දතයුතුය.

අප්පමාදො යන මෙහි අප්‍රමාදය ප්‍රමාදයට විරුද්ධ ආකාරයෙන් දතයුතුය. ඒ ප්‍රමාදය නම් කුමක් ද? ප්‍රමාදවන ආකාරයයි. 'තත්‍ථ කතමො පමාදො? කාය දුච්චරිතෙ වා වචී දුච්චරිතෙ වා මනො දුච්චරිතෙ වා පඤ්චසු වා කාමගුණෙසු චිත්තස්ස වොස්සග්ගො, වොස්සග්ගානුප්පදානං, කුසලානං වා ධම්මානං භාවනාය අසක්කච්චකිරියතා, අසාතච්ච කිරියතා, අනට්ඨිතකිරියතා, ඔලීනවුත්තිතා, නික්ඛිත්ත ඡන්දතා, නික්ඛිත්ත ධුරතා, අනාසෙවනා, අභාවනා, අබහුලීකම්මං, අනධිට්ඨානං, අනනුයොගො, පමාදො, යො එවරූපො පමාදො, පමජ්ජනා, පමජ්ජිතත්තං අයං වුච්චති පමාදො'[1]

'එහි ප්‍රමාදය කුමක්ද? කාය දුශ්චරිතයෙහි හෝ වචී දුශ්චරිතයෙහි හෝ මනෝ දුශ්චරිතයෙහි හෝ පංචකාම ගුණයන්හි හෝ සිත මුදාහැරීමක් පුන පුනා මුදාහැරීමක්, කුශල ධර්මයන්ගේ වැඩීම පිණිස සකස් නොකොට කටයුතු කරන බවක්, නිතර නොකරන බවක්, ඉඳහිට කරන බවක්, ඉඳහිට

1. විභංගප්පකරණය - ඛුද්දක වත්‍ථු විභංග - බු.ජ.මු. 198 පිට

කරන බැවින් හැකුළුණු බවක්, කුසල් කිරීම පිණිස අවශ්‍ය වීර්යයට ඇති කැමැත්ත බහාතැබීමක්, බහා තැබූ වීර්යය ඇති බවක්, සේවනය නොකිරීමක්, නොවැඩීමක්, බහුල වශයෙන් නොකිරීමක්, නොපිහිටීමක්, නොපිළිපැදීමක්, ප්‍රමාදයක්, යම් මෙබඳු ප්‍රමාදයක්, ප්‍රමාද ආකාරයක්, ප්‍රමාද බවක් වේද මෙය ප්‍රමාදයයි කියනු ලැබේ.

එහෙයින් කියන ලද ආකාරයට විරුද්ධ ආකාරයෙන් අප්‍රමාදය දතයුතුය. අර්ථ වශයෙන් ඒ අප්‍රමාදය සිහියෙන් වෙන්ව නොවිසීමයි. නිතර එළඹසිටි සිහියට ද එය නමකි. අන් අය වනාහි සිහිනුවණ යෙදීමෙන් පැවති අරූප ස්කන්ධ අප්‍රමාදයයි කියති.

**භාවිතො බහුලීකතො** යන්න (මේ සූත්‍ර වර්ණනාව මුලදී) කියන ලදී. මේ අප්‍රමාදය කෙසේ වැඩිය යුතුද? අප්‍රමාද භාවනාව නම් වූ වෙන්වූ එක් භාවනාවක් නැත. යම්කිසි පුණ්‍යක්‍රියාවක්, කුශල ක්‍රියාවක්, ඇත්නම් ඒ සියල්ල අප්‍රමාද භාවනාව යනුවෙන් ම දතයුතුය. විශේෂ වශයෙන් නිවනට හේතු වූ සරණගමනය, කය වචනයන්ගේ සංවරය ද ගෙන සියලු සීල භාවනා, සියලු සමාධි භාවනා, සියලු ප්‍රඥා භාවනා සහ සියලු කුසල භාවනාවන් අනවජ්ජ (භාවනා) අප්‍රමාද භාවනායයි දතයුතුය.

අප්‍රමාද යන මෙය මහත් වූ අර්ථයක් ප්‍රකට කරයි. මහත් වූ අර්ථයක් ගෙන සිටියි. සියලුම ත්‍රිපිටක බුද්ධවචනය ගෙනවුත් 'අප්පමාද' යන පදයේ අර්ථ ලෙස කියන ධර්මකථිකයා තොටුපලක් නොවන තැනකින් ඉවත්ව ගියේ යයි නොකිව යුතුය. කුමක් හෙයින් ද? අප්‍රමාද යන පදයේ මහත් බව නිසාය. එසේ ම සම්මා සම්බුදුරජාණන් වහන්සේ කුසිනාරාවෙහි සල්ගස් දෙකක් අතර පිරිනිවන්පාන සමයෙහි වැඩහුන් සේක් අභිසම්බෝධියේ පටන් වසර හතළිස් පහකදී තමන්වහන්සේ විසින් දේශනා කළ ධර්මය එක් පදයකින් එක්තැන්කොට දක්වමින් 'අප්පමාදෙන සම්පාදෙථ' 'නො පමාව කටයුතු කරන්න' යනුවෙන් භික්ෂූන්ට අවවාද දුන් සේක. එසේම '**සෙය්‍යථාපි භික්ඛවෙ යානි කානිචි ජංගමානං පාණානං පදජාතානි සබ්බානි තානි හත්ථිපදෙ සමොධානං ගච්ඡන්ති, හත්ථිපදං තෙසං අග්ගමක්ඛායති යදිදං මහන්තත්තෙන, එවමෙව ඛො භික්ඛවෙ යෙ කෙචි කුසලා ධම්මා සබ්බෙ තෙ අප්පමාද මූලකා අප්පමාදසමොසරණා අප්පමාදො තෙසං අග්ගමක්ඛායති**'[1]

1. මජ්ඣිම නිකාය - මහාහත්ථිපදෝපම සුත්ත

'මහණෙනි, ඇවිදින සතුන්ගේ සියලු පාද ඇත් පියවරෙහි ඇතුළත්වීමට පැමිණෙයි. ඇත් පියවර මහත් බැවින් ඒ සියලු පාද අතුරෙන් අග්‍රයයි කියනු ලැබේ. මහණෙනි, එසේම සියලුම කුශල ධර්ම අප්‍රමාදය මුල්කොට ඇත. අප්‍රමාදය එක්තැන් වීම කොට ඇත. ඒවාට අප්‍රමාදය අග්‍රයයි කියනු ලැබේ යනුවෙන් වදාරණ ලදී.

ගාථාවන්හි **අප්පමාදං පසංසන්ති** යනු දන්දීමාදී පුණ්‍ය ක්‍රියාවන්හි අප්‍රමාද වීම පඬිවරු, නුවණ ඇති අය බුදුවරු ආදීහු පසසති. වර්ණනා කරති. ස්තුති කරති. කුමක් හෙයින් ද? **අප්පමත්තො උභො අත්ථෙ අධිගණ්හාති පණ්ඩිතො** ප්‍රමාද නොවූ පඬිවරයා (නුවණ ඇත්තා) උභය අර්ථය අයත් කරගන්නා හෙයිනි. ඒ උභය අර්ථය කුමක් ද? **දිට්ඨෙව ධම්මෙ යො අත්ථො යො චත්ථො සම්පරායිකො** මෙලොව අර්ථයත් පරලොව අර්ථයත් ය. මෙසේ මෙහි පදයෝජනාව දතයුතුය. 'දිට්ඨෙව ධම්මෙ යො අත්ථො' යනු ගිහියාට 'අනවජ්ජානි කම්මානි' 'නිවැරදි කටයුතු', 'අනාකුලා ච කම්මන්තා' ආදී වශයෙන් කියන ලද ගොවිතැන ගව පාලනය ආදි විධියෙන් ලැබිය යුතු අර්ථය (ප්‍රයෝජනය), පැවිද්දාට පසුතැවිලි නොවීමාදිය අර්ථයයි දතයුතුය. 'යො චත්ථො සම්පරායිකො' යනු මේ දෙකින් ම ධර්මචරියාව කියන ලදැයි දතයුතුය.

**අත්ථාභිසමයා** යනු දෙවදෑරුම් අර්ථයේ යහපතේ ප්‍රතිලාභයෙන්, ලැබිය යුතු බැවින් රැස්වීම, එක්වීම, එක්තැන් කිරීම යන අරුතින් සමය, ලාභය නම් වේ. 'සමය' යන්නම අභිසමයයි. අභිමුඛ භාවයෙන් සමය හෝ අභිසමය යි. මෙසේ මෙහි අභිසමය දතයුතුය. ධෛර්ය සම්පන්න තැනැත්තා ධීර වෙයි. මෙහි තුන්වන 'අත්ථ' ශබ්දයෙන් පරමාර්ථ නිර්වාණයේ ද සංග්‍රහය දතයුතුය. ඉතිරිය පහසුවෙන් දැනගත හැකිමය. මෙසේ මේ සූත්‍රයෙහි සසර සම්පත්තිය ම කියන ලදී. ගාථාවලදී නිර්වාණයේ ද සංග්‍රහය (එක් කිරීම) දතයුතුය. එහෙයින්

**අප්පමාදො අමතපදං පමාදො මච්චුනො පදං**
**අප්පමත්තා න මීයන්ති යෙ පමත්තා යථා මතා**[1]

අප්‍රමාදය නිවනට කරුණුය. ප්‍රමාදය මරණයට කරුණුය. නොපමා වූවෝ නො මැරෙති. පමා වූවෝ මළවුන් වැනි වෙති.

---

1. ධම්මපද - අප්පමාද වග්ග

**එතං විසෙසතො ඤත්වා අප්පමාදම්හි පණ්ඩිතා**
**අප්පමාදෙ පමොදන්ති අරියානං ගොචරෙ රතා**[1]

නුවණැත්තෝ අප්‍රමාදයෙහි මේ ගුණය වෙසෙසින් දැන අප්‍රමාදයෙහි සතුටු වෙති. ආර්යයන්ට ගෝචර වූ බෝධිපාක්ෂික, ලෝකෝත්තර ධර්මවල ඇලුනෝ වෙති.

**තෙ ඣායිනො සාතතිකා නිච්චං දළ්හපරක්කමා**
**ඵුසන්ති ධීරා නිබ්බාණං යොගක්ඛෙමං අනුත්තරං**[2]

නිතර ධ්‍යානවඩන සුලු, නිතර පැවති වීර්ය ඇති. ඒ නුවණැත්තෝ නිර්භය වූ අනුත්තර වූ නිවන ස්පර්ශ කරති.

එහෙයින් 'අත්ථාභිසමය' යනු මෙහි ලෝකෝත්තර වශයෙන් ද අර්ථය දතයුතුය.

තෙවන සූත්‍ර වර්ණනාවයි.

## 1.3.4

සිවුවන සූත්‍රයෙහි **එකපුග්ගලස්ස** යන මෙහි පුග්ගලො යනු මේ ව්‍යවහාර කථාවයි. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ දේශනා, සම්මුති දේශනා පරමාර්ථ දේශනා යනුවෙන් දෙපරිදිය. එහි පුද්ගලයා සත්ත්වයා, ස්ත්‍රිය, පුරුෂයා, ක්‍ෂත්‍රියයා, බමුණා, දෙවියා, මාරයා යන මෙබඳු වූ දේශනා සම්මුති දේශනා ය. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, ස්කන්ධ, ධාතු, ආයතන, සතිපට්ඨාන යන මෙබඳු වූ දේශනා පරමාර්ථ දේශනා ය. එහිදී භාග්‍යවතුන් වහන්සේ සම්මුති වශයෙන් කරන දේශනාව අසා

1. ධම්මපද - අප්පමාද වග්ග
2. ධම්මපද - අප්පමාද වග්ග

විශේෂත්වයකට පත්වන්නට සමත් අයට සම්මුති දේශනාව දේශනා කරති. පරමාර්ථ වශයෙන් කරන දේශනාව අසා විශේෂත්වයකට පත්වන්නට සමත් අයට පරමාර්ථ දේශනාව දේශනා කරති.

මේ ඒ කරුණෙහිලා උපමාවකි. දේශ භාෂාවන්හි දක්ෂ ත්‍රිවේදයේ අරුත් පැහැදිලි කරන ගුරුවරයා දෙමළ බසින් කී කල්හි අරුත් දැනගන්නා වූ අයට දෙමළබසින් කියයි. අන්ධක භාෂා ආදිය අතුරින් එක්තරා බසකින් කී කල්හි අරුත් දැනගන්නා අයට ඒ ඒ බසින් කියයි. මෙසේ ඒ තරුණයෝ දක්ෂ උගත් ගුරුවරයකු වෙත පැමිණ වහාම ශිල්ප උගනිති. එහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගුරුවරයා මෙනි. කිවයුතු ස්වභාවයෙහි පිහිටි ත්‍රිපිටකය ත්‍රිවේදය මෙනි. සම්මුති පරමාර්ථ දෙකෙහි දක්ෂ බව දේශ භාෂාවෙහි දක්ෂ බව මෙනි. සම්මුති පරමාර්ථ වශයෙන් අවබෝධ කිරීමෙහි සමත් හික්මවීමට සුදුසු අය නොයෙක් දේශයන්හි භාෂා දන්නා තරුණයන් මෙනි. භාග්‍යවතුන් වහන්සේ සම්මුති පරමාර්ථ වශයෙන් කරන දේශනා ගුරුවරයා දෙමළ භාෂාදිය කීම මෙනි යනුවෙන් දතයුතුය. එහිදී මෙසේද කීය.

**දුවෙ සච්චානි අක්ඛාසි සම්බුද්ධො වදතං වරො**
**සම්මුතිං පරමත්ථඤ්ච තතියං නූපලබ්භති**

කියන්නවුන් අතර උතුම් වූ සම්බුදුරජාණන් වහන්සේ සම්මුති පරමාර්ථ යන සත්‍ය දෙක වදාළහ. තෙවන සත්‍යයක් නොලැබේ.

**සංකෙතවචනං සච්චං ලොකසම්මුති කාරණා**
**පරමත්ථවචනං සච්චං ධම්මානං තථලක්ඛණා**

ලෝක සම්මුතියක්ය යන කාරණයෙන් ලෝවැසියන් විසින් නියම කරගත් වචනය සත්‍යය. ධර්මයන්ගේ සත්‍ය ලක්ෂණයෙන් පරමාර්ථ වචනය සත්‍යය.

**තස්මා වොහාර කුසලස්ස ලොකනාථස්ස සත්ථුනො**
**සම්මුතිං වොහරන්තස්ස වොහාරො අරියොව සො**

එහෙයින් සම්මුතිය කථාකරන, කථා ව්‍යවහාරයෙහි දක්‍ෂ වූ ලෝකනාථ වූ, ශාස්තෘන් වහන්සේගේ ඒ ව්‍යවහාරය ආර්ය ව්‍යවහාරයක් ම වෙයි.

තවද කරුණු අටකින් භාග්‍යවතුන් වහන්සේ පුද්ගල කථාව ප්‍රකාශ කරති.

1. පාපයට ඇති ලජ්ජා භය පැහැදිලි කිරීම පිණිස.
2. කර්මය තමා අයත් කොට ඇති බව පැහැදිලි කිරීම පිණිස.
3. වෙන් වෙන්වූ මිනිස් ස්වරූපය පැහැදිලි කිරීම පිණිස.
4. ආනන්තරිය (කර්ම) පැහැදිලි කිරීම පිණිස.
5. බ්‍රහ්මවිහාර පැහැදිලි කිරීම පිණිස.
6. පෙර විසූ ආකාරය පැහැදිලි කිරීම පිණිස.
7. දන්දීම පිරිසිදු වන ආකාරය (දක්ඛිණා විසුද්ධි) පැහැදිලි කිරීම පිණිස.
8. ලෝකයේ කථා ව්‍යවහාරය දුරු නොකිරීම පිණිස.

ස්කන්ධ, ධාතු ආයතන, ලජ්ජා වෙයි. බිය වෙයි යනුවෙන් කී කල්හි මහජන තෙමේ 'ස්කන්ධ - ධාතු - ආයතන ලජ්ජා වෙයි. බියවෙයි යනුවෙන් කියන මේ කතාව කුමක්දැයි නොදනී. මුළාවට පත් වෙයි. සතුරු හෝ වෙයි. ස්ත්‍රිය ලජ්ජා වෙයි. බිය වෙයි. පුරුෂයා, ක්‍ෂත්‍රියයා, බමුණා ලජ්ජා වෙයි යනුවෙන් කී කල්හි දැනගනියි. මුළාවට පත් නොවෙයි. සතුරු හෝ නොවෙයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ හිරිඔතප් පැහැදිලි කිරීම පිණිස පුද්ගල කථාව දේශනා කරති.

ස්කන්ධ කර්මය තමා අයත්කොට ඇත. ධාතු, ආයතනයයි කී කල්හි ද මේ ක්‍රමය මය. එහෙයින් කර්මය තමා අයත්කොට ඇති බව පැහැදිලි කිරීම පිණිස පුද්ගල කථාව දේශනා කරති.

වෙළුවන ආදී මහා විහාර ස්කන්ධ විසින් කරවන ලදී. ධාතු විසින් ආයතන විසින් කරවන ලදී යයි කී කල්හිද ඒ ක්‍රමයමය. ස්කන්ධ මව ජීවිතයෙන් තොර කරයි. පියා, රහතන් වහන්සේ ජීවිතයෙන් තොර කරයි. ලේ සෙලවීමේ කර්මය, සංඝභේදය කරයි.

ධාතු, ආයතන ඒවා කරයි යනුවෙන් කී කල්හිද ඒ ක්‍රමයමය. ස්කන්ධ මෛත්‍රී කරයි. ධාතු, ආයතන මෛත්‍රී කරයි යනුවෙන් කී කල්හිද ඒ ක්‍රමයමය. ස්කන්ධ පෙර විසූ ආකාරය සිහිකරයි. ධාතු, ආයතන ද එසේ සිහිකරයි කී කල්හිද ඒ ක්‍රමයමය. එහෙයින් වෙන් වෙන් වූ මිනිස් ස්වරූපය පැහැදිලි කිරීම පිණිස, ආනන්තරිය පැහැදිලි කිරීම පිණිස බ්‍රහ්මවිහාර පැහැදිලි කිරීම පිණිස, පෙර විසූ ආකාරය (පුබ්බෙ නිවාස) පැහැදිලි කිරීම පිණිස ද පුද්ගල කථාව දේශනා කරති.

ස්කන්ධ දානය පිළිගනියි. ධාතු, ආයතනාදිය දානය පිළිගනියි කී කල්හි ද මහජන තෙමේ ස්කන්ධ, ධාතු, ආයතන පිළිගනියි යනුවෙන් මේ කීම කුමක්දැයි නොදනියි. මුළාවට පත්වෙයි. සතුරු හෝ වෙයි. පුද්ගලයෝ පිළිගනිති යනුවෙන් කී කල්හි දනියි. මුළාවට පත් නොවෙයි. සතුරු හෝ නොවෙයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ දක්ඛිණා විසුද්ධිය පැහැදිලි කිරීම පිණිස පුද්ගල කථාව දේශනා කරති. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේලා ලෝක සම්මුතිය ද දුරු නොකරති. ලෝක ව්‍යවහාරයෙහි, ලෝ වැසියන්ගේ වචනයෙහි සිටිමින් ම දහම් දෙසති. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ලෝක සම්මුතිය දුරු නොකිරීම පිණිස ද පුද්ගල කථාව දේශනා කරති. උන්වහන්සේ මෙම සූත්‍රයෙහි දී ද ලෝකව්‍යවහාර වශයෙන් දේශනා කළ යුතු අර්ථය දේශනා කරමින් 'එක පුග්ගලස්ස' යනාදිය වදාළහ.

එහි **එකපුග්ගලස්ස** යනු එක් සත්ත්වයකුගේ. **කප්පං** යනු මහා කල්පයක්. මෙය අත්‍යන්ත සංයෝගයෙහි උපයෝග (කර්ම විභක්ති) වචනයකි. යම්තැනක සත්ත්වයන්ගේ සන්ධාවනය, සංසරණය (ධාවනය, සැරිසැරීම) ඇතිවේ නම් ඒ ස්ථානයේ වශයෙන් ගතයුතුය.

**අට්ඨිකංඛලො** යනු ඇට කොටස, අට්ඨි කලාප යනුවෙන් ද කියති. ඇට රාශිය යන අර්ථයි. **අට්ඨි පුඤ්ජො** යනු ඇට සමූහය. **අට්ඨිරාසි** යනු එයට ම සමාන වචනයකි. ඇතැමෙක් තුනටිය ප්‍රමාණයෙන් යට සමූහය කලාප නම් වේ යයි ද ඉන් ඉහළ තල්ගසක් පමණ උස ප්‍රමාණය පුඤ්ජ නම් වේ යයි ද ඉන් මත්තෙහි රාශි යයි ද කියති. එය ඔවුන්ගේ මතයක් පමණි. ඒ සියල්ල සමූහයට ම සමාන වචනයන්ය. උපමා ආකාරයෙන් වේපුල්ල පර්වතය ගැන වදාළහ. එහි **සචෙ සංහාරකො අස්ස** යනු ඉදින් නො විසිරීම් වශයෙන් එකතුකොට තබන කිසිවෙක් වන්නේ නම් යනුවෙන් සිතිවිල්ලක් වශයෙන් දේශනා කරයි.

**සමහතාඤච න විනසෙසයා** එසේ කිසිවකු විසින් රැස්කරන ලද ඒ ඇට රාශිය අතුරුදන් නොවීම් වශයෙන් කුණු නොවී සුණු විසුණු නොවී විනාශ නොවන්නේ නම් යනුවෙන් සිතිවිල්ලක් වශයෙන් දේශනා කරති.

මේ මෙහි අර්ථයයි: මහණෙනි, කර්ම ක්ලේශයන් නිසා තැනින් තැන ඉපදීම් වශයෙන් එක් මහා කල්පයක් ධාවනය කරන සැරිසරන එක් සත්ත්වයකුට අයත් ඇට එක්රැස් කොට තබන කෙනෙකුන් ඇත්නම් ඒ ඇට රාශියද විනාශ නොවී පවතින්නේ නම් උසින් මහතින් මේ වේපුල්ල පර්වතය තරම් වූ මහත් ඇට රාශියක් වන්නේය. මේ ක්‍රමය නිවුණු පහනක් මෙන් බිඳෙන ස්වභාවය ඇති සිරුර ඉවත දැමීමක් නැති ඕපපාතික ආත්මභාව සියල්ල ද ඇට නැති කුඩා ආත්ම භාවයන් සියල්ල ද හැර කියන ලදී. කිසියම් කෙනෙක් සිතිවිල්ලක් වශයෙන් මේ ක්‍රමය ආ බැවින් ඉදින් (ඕපපාතික හා ඇට නැති) ඔවුන්ට ද ඇට රාශියක් ඇත්නම් ඒවා ද සමග මේ ඇට රාශියේ ප්‍රමාණය කියන ලදැයි කියති. ලැබෙන ඇට සමූහය වශයෙන් සර්වඥතා ඥානයෙන් වෙන්කොට සලකාගෙන මේ ප්‍රමාණය කියන ලද බැවින් ඒ අර්ථය නොවේයයි අන් අය කියති. එහෙයින් (මුලින්) කියන ලද ආකාරයෙන් ම අර්ථය ගතයුතුය.

ගාථාවලදී **මහෙසිනා** යනු මහත් වූ ශීල ස්කන්ධ ආදිය සොයයි, ගවේෂණය කරයි යන අරුතින් මහෙසී නම් වේ. සම්මා සම්බුදුරජාණන් වහන්සේය. **ඉති වුත්තං මහෙසිනා** යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ 'දසබල සමන්නාගතො භික්ඛවෙ තථාගතො' 'මහණෙනි, තථාගතයන් වහන්සේ බල දහයකින් යුක්ත වෙති' යනාදියෙහි මෙන් තමන්වහන්සේ අන් පුද්ගලයකු මෙන් කොට දක්වති. **වෙපුලෙලා** යනු රජගහ නුවර පිරිවරා සිටි පර්වත පහ අතරින් විපුල (විශාල) බැවින් වෙපුල්ල යයි ලබන ලද නම් ඇති, එයින් ම **මහා** මහා වෙයි. පිහිටි දිශාභාගය වශයෙන් **උත්තරො** උතුර ය. **ගිජඣකූටසස ගිරිබ්බජෙ** යනු ගිරිබ්බජ පුර නම් වූ රජගහ නුවරට සමීපයෙහි. මෙපමණකින් භාග්‍යවතුන් වහන්සේ මෙපමණ කාලයකින් සිඳ නොදමන ලද භවයේ මුල් ඇති පිරිසිඳ නොදන්නා ලද වස්තු ඇති පෘථග්ජනයාගේ මේ සොහොනෙහි වැඩීම මෙබඳු යයි සසරෙහි ආදීනව (දොස්) දක්වා දැන් ආර්ය සත්‍යයන් අවබෝධ නොකිරීමෙන් ප්‍රතිවේධ නොකිරීමෙන් අන්ධ පෘථග්ජනයාගේ සොහොනෙහි වැඩීම මෙසේ වන අතර ඒ ආර්ය සත්‍ය දක්නා ලද ආර්ය පුද්ගලයාගේ මේ සොහොනෙහි වැඩීමක් නැතැයි දක්වමින් 'යතො අරිය සච්චානි' යනාදිය වදාළහ.

එහි **යතො** යනු යම්කලෙක. **අරිය සච්චානි** යනු කෙලෙස් නැති බැවින් ආර්ය වූයේ ද එයයි, සත්‍ය භාවයෙන් සත්‍ය වූයේ ද එයයි යන අරුතින් අරිය සච්චානි නම් වේ. ආර්යභාවය ඇතිකරන සත්‍ය යන අරුතින් හෝ අරියසච්චානි නම් වේ. බුද්ධාදී ආර්යයන් වහන්සේලා විසින් අවබෝධ කළයුතු සත්‍ය අරියසච්චානි (ආර්ය සත්‍යය) නම් වේ. නැතහොත් ආර්ය වූවහුගේ සත්‍යය ආර්ය සත්‍යයයි. කෙලෙසුන් කෙරෙන් දුරු වූ බැවින් දෙවියන් සහිත ලෝකයාට පිහිටකි යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ ආර්ය නම් වෙති. උන්වහන්සේ විසින් තමන් වහන්සේ විසින්ම උපදවා ගත් (සයම්භූ) ඤාණයෙන් දක්නා ලද බැවින් උන්වහන්සේගේ සත්‍ය යන අරුතින් ආර්ය සත්‍ය නම් වේ.

**සම්මප්පඤ්ඤාය පස්සති** යනු මනාසේ හේතු - න්‍යාය - විදර්ශනා ප්‍රඥාව සහිත මාර්ග ප්‍රඥාවෙන් පිරිසිඳ දැනීම - දුරුකිරීම - ප්‍රත්‍යක්‍ෂ කිරීම - වැඩීම - අවබෝධ කිරීම වශයෙන් දකියි. 'දුක්ඛං' යනාදිය ආර්ය සත්‍යයන්ගේ ස්වරූප දැක්වීමයි.

එහි නොයෙක් උවදුරුවලට ස්ථානයක් වන බැවින් ද පිළිකුල් බැවින් ද මෝඩ ජනයා කල්පනා කරන ලද ස්ථිර - යහපත් - සැප හා ආත්මයෙන් තොර නිසා හිස් බැවින් ද **දුක්ඛ** දුකය. මෙය කරණකොට දුක උපදී යන අරුතින් **දුක්ඛ සමුප්පාදො**, දුක්ඛ සමුදයයි. මෙහි මේ අරමුණ ප්‍රත්‍ය වීමෙන් දුක ඉක්මවයි යන අරුතින් **දුක්ඛස්ස අතික්කමො** නිවන නම් වේ. කෙලෙසුන් කෙරෙන් දුරු වූ බැවින් අරණීය වශයෙන් අරියො ආර්ය නම් වේ.

සම්මා දිට්ඨි ආදී අංග අට වශයෙන් **අට්ඨංගිකො**. කෙලෙස් මරමින් යයි, නිවනින් ප්‍රයෝජන ඇති අය විසින් යනු ලැබේ, තමා හෝ නිවන සොයයි යන අරුතින් **මග්ගො** නම් වේ. ඒ මාර්ගයෙන් ම දුක් සමනය කිරීමට, නැති කිරීමට යයි යන අරුතින් **දුක්ඛූපසමගාමී**, එය **යතො සම්මප්පඤ්ඤාය පස්සති** 'යම්කලෙක මනා වූ නුවණින් දකීද' යනු සම්බන්ධයයි. **සත්තක්ඛත්තුං පරමං සන්ධාවිත්වාන පුග්ගලො** යනු මෙසේ චතුරාර්ය සත්‍ය දක්නා වූ ඒ සෝවාන් වූ ආර්ය පුද්ගලයා සියලු ඉන්‍ද්‍රිය මෘදු කෙනෙක්ව සත්වරක් කෙළවර කොට ඇති භවයන්හි තැනින් තැන ඉපදීම් වශයෙන් ධාවනයකොට සැරිසරා. ඉන්ද්‍රියයන්ගේ තියුණු - මධ්‍යම - මෘදු භාවයෙන් ඒකබීජී - කෝලංකෝල - සත්තක්ඛත්තුපරම යනුවෙන්

සෝවාන් පුද්ගලයෝ තිදෙනෙක් වෙති. ඔවුන් අතුරින් සියල්ලන්ට වඩා මෘදු වූ ඉන්ද්‍රිය ඇති පුද්ගලයාගේ වශයෙන් 'සත්තක්ඛත්තුපරමං සන්ධාවිත්වාන' යන මෙය වදාරණ ලදී. **දුක්ඛස්සන්තකරො හොති** යනු සංසාර දුක්වල අවසන් කිරීම කරන්නෙක් වෙයි. කෙසේද? **සබ්බසඤ්ඤොජනක්ඛයා** අනුපිළිවෙළින් ආර්ය මාර්ගය අවබෝධකොට ඉතිරි නොකොට සංයෝජනයන් ගෙවාදැමීමෙන් අර්හත් ඵලයෙන් ම දේශනාව මුදුන් පැමිණියේය.

සිවුවන සූත්‍ර වර්ණනාවයි.

## 1.3.5

සත්වන සූත්‍රයෙහි **එකධම්මං අතීතස්ස** යන්නෙහි උපත කුමක්ද? භාග්‍යවතුන් වහන්සේට ද භික්ෂු සංඝයාට ද මහත් ලාභසත්කාර උපන්නේය. තීර්ථකයන්ගේ ලාභසත්කාර පිරිහුනේය. නැසුණු ලාභසත්කාර ඇති, බැබලීමක් නැති, තේජස් නැති ඊර්ෂ්‍යාවෙන් යුක්ත වූ ඔවුහු 'එන්න නැගණිය, ඔබ ශ්‍රමණ ගෞතමයන්ට අසත්‍ය වූ කරුණකින් චෝදනාවක් කරන්න' යනුවෙන් චිංචි මානවිකා නම් පරිබ්‍රාජිකාව උනන්දු කරවූහ. ඈ සිවුපිරිස මැද දහම් දෙසන භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ අසත්‍ය කරුණකින් චෝදනා කළාය. ශක්‍රයා විසින් ඇගේ අසත්‍යභාවය ප්‍රකට කළ කල්හි මහජනයා විසින් චිඃ චිඃ කාලකණ්ණිය යි කියමින් විහාරයෙන් ඉවතට ඇද දමන ලද්දී පොළොව විවරයක් සාදා දුන් කල්හි අවීචියෙහි ගිනිදැල්වලට ඉන්ධනයක් (දර කැබැල්ලක්) බවට පත්වී අවීචි නිරයෙහි උපන්නාය. තීර්ථකයන්ගේ ලාභසත්කාර වඩාත් පිරිහුණේය.

භික්ෂූහු ධර්මසභාවෙහිදී 'ඇවැත්නි, චිංචිමානවිකාව මෙසේ උදාර ගුණ ඇති, පුද පූජා ලැබීමට අතිශයින් ම සුදුසු වූ, සම්මා සම්බුදුරජාණන් වහන්සේට බොරු චෝදනාවකින් දොස් නගා මහා විනාශයකට

පත්වූවාය'යි කථාවක් මතු කළාහුය. භාග්‍යවතුන් වහන්සේ ඒ කාරණය නිසා මහණෙනි, දැන් පමණක් නොව පෙරත් ඈ මට බොරු චෝදනාවකින් දොස් නගා මහා විනාශයකට පත්වූවාම යයි මහාපදුම ජාතකය දේශනාකොට මත්තෙහි දහම් දෙසමින් මේ කාරණය මුල්කරගෙන 'එකං ධම්මං අතීතස්ස' යන මේ සූත්‍රය දේශනා කළ සේක.

එහි **එකං ධම්මං** යනු වාක්සත්‍ය නම් වූ එකම ධර්මය **අතීතස්ස** යනු පහත් ව්‍යවහාර අට දුරුකොට උසස් ව්‍යවහාර අටෙහි පිහිටා 'සච්චං භණෙ න අලිකං' 'සත්‍ය කථා කරන්නේය, බොරු නො කියන්නේය'යි ආර්යයන් වහන්සේලා විසින් තබන ලද සීමාව ඉක්මවා සිටියා වූ. පුරුෂයාම පුද්ගලයායි ගෙන පුරිස පුග්ගලො නම් වේ, **තස්ස** ඒ පුරුෂයා විසින්. **අකරණීයං** කරන්නට නොහැකි, දැන දැන බොරු කියන පුද්ගලයා කිසියම් පාපකර්මයක් කොට මෙය ඔබ විසින් කරන ලදදැයි ඇසූකල්හි මා විසින් නොකරන ලදැයි මුසාවාදයෙන්ම ඉවත දමයි. මෙසේ පිළිපදින තැනැත්තා කරන කිසි පාපකර්මයකට ලජ්ජා නොවෙයි. සත්‍යයේ සීමාව ඉක්මවූ හෙයිනි.

එහෙයින් **කතමං එකධම්මං යදිදං භික්ඛවෙ සම්පජාන මුසාවාදො** = මහණෙනි, කුමන එක් ධර්මයක් ද? මේ දැන දැන බොරු කීමයි යනුවෙන් වදාරණ ලදී. ගාථාවෙහි **මුසාවාදිස්ස** යනු මුසාවක් අභූතයක් (ඇති නොවූ දෙයක්) සත්‍ය නොවූ දෙයක් අනුන්ට දැන්වීම් වශයෙන් කියනසුලු, යමෙකුගේ වචන දහයකින් එකක්වත් සත්‍ය නොවේනම් එබඳු පුද්ගලයකු කෙරෙහි කිවයුත්තක්ම නැත. **ජන්තුනො** යනු සත්ත්වයාට (සත්ත්වයා විසින්) සත්ත්වයා වනාහි උපදින අර්ථයෙන් ජන්තු යයි කියනු ලැබේ. **විතිණ්ණ පරලොකස්ස** යනු අත්හැර දමන ලද පරලොව ඇති (තැනැත්තා විසින්), මෙබඳු පුද්ගලයා මිනිස් සම්පත්, දෙව්සම්පත් අවසානයෙහි නිවන් සම්පත් යන මේ සම්පත් තුන ම නොදකී. **නත්ථි පාපං** යනු එබඳු වූ ඔහු විසින් මෙ නම් පාපයක් නොකළ හැකියයි කියා දෙයක් නැත.

**පස්වන සූත්‍ර වර්ණනාවයි.**

# 1.3.6

සයවන සූත්‍රයෙහි **එවඤ්චෙ** යන මෙහි 'එවං' යනු උපමා ආකාර නිපාතයකි. 'චෙ' යනු සිතීමෙහි නිපාතයකි. **සත්තා** යනු රූප ආදියෙහි ඇලුණු පැටලුණු අය (සත්ත්වයෝ) **ජානෙය්‍යුං** යනු අවබෝධ කරත් නම්. **දාන සංවිභාගස්ස** යනු යම් චේතනාවකින් ආහාර ආදී දියයුතු දෙයක් එක්රැස්කොට අනුකම්පා චේතනාව පූජා චේතනාව යන චේතනා අතරින් එක්තරා චේතනාවකින් අනුන්ට දෙනු ලැබේ ද එය දානය යි. යම් චේතනාවකින් තමා විසින් අනුභව කළයුතු බැවින් ගන්නා ලද වස්තුවකින් එක් කොටසක් බෙදාදෙනු ලැබේ ද මේ සංවිභාගය යි. **විපාකං** යනු ඵලයයි. **යථාහං ජානාමි** යනු මම යම්සේ දනිම් ද, මෙය කියන ලද්දේ වෙයිඃ 'තිරිසන්ගත සතෙකුට වුව ද දන් දී ආත්මභාව සියයක ප්‍රවෘත්ති සැප මුහුකුරා යෑම් වශයෙන් සියගුණයක් (විපාක දෙන) දානයක් වෙයි' යන මේ ආදී වශයෙන්, මහණෙනි යම් ආකාරයකින් මම දානය බෙදා දීමේ ද **විපාකං** විපාකය කර්මවිපාක ඥාන බලයෙන් ප්‍රත්‍යක්‍ෂ වශයෙන් දනිම් ද මෙසේ මේ සත්ත්වයෝ දනිත්නම්. **න අදත්වා භුඤ්ජෙය්‍යුං** යනු අනුභව කළයුතු තමා සතු දෙයකින් අනුන්ට නොදී අනුභව නො කරත්. දීම සිදුකොටම අනුභව කරත්. **න ච තෙසං මච්ඡෙරමලං චිත්තං පරියාදාය තිට්ඨෙය්‍ය** යනු තම සම්පත් අනුන්ට පොදු වීම නොඉවසන බව ලක්‍ෂණ කොට ඇති, සිතේ බබලන බව කෙළෙසන උපක්ලේශ වූ කලු ධර්ම (අකුශල ධර්ම) අතරින් එක්තරා කලු ධර්මයක් වන මසුරුමල, නැතහොත් කියන ලද ආකාර ඇති මසුරුමල ද දානයට අනතුරු කරන ඊර්ෂ්‍යාව, ලෝභය, ද්වේෂය ආදී (කෙලෙස්) මලයක් ද ඒ සත්ත්වයන්ගේ සිතෙහි යම් සේ දාන චේතනාව නොපවතී ද සුපිරිසිදු නොවේ ද එලෙස අල්ලාගෙන, හාත්පසින් ගෙන, මැඩපවත්වාගෙන නො සිටින්නේය. දන් දීමෙහි විපාකය (ඵලය) මනාකොට දන්නා වූ කවර තැනැත්තෙක් තමාගේ සිතෙහි මසුරුමලට ඉඩ දෙන්නේ ද? **යොපි නෙසං අස්ස චරිමො ආලොපො** යනු ඒ සත්ත්වයන්ට ඇති සියලු (බත්) පිඬුවලට පසුව ලැබෙන අන්තිම පිඬක් වේද. **චරිමං කබලං** යනු එයටම සමාන වචනයකි. මෙය කියන ලදීඃ මේ සත්ත්වයන් ස්වභාවයෙන් තම තමන්ට යැපීමට ප්‍රමාණවත් වූ පිඬු අතරින් එකම පිඬක් තමා වෙනුවෙන් තබා අනිත් සියලු පිඬු ඕනෑකමින් පැමිණි පැමිණි අයට දී (කලින්) තබන ලද පිඬුව 'අවසන් පිඬුව' නම් වේ. **තතොපි න අසංවිභජිත්වා භුඤ්ජෙය්‍යුං** සචෙ

**නෙසං පටිගාහකා අසසු** යනු දානය බෙදා කොටසක් දීමේ විපාක ප්‍රත්‍යක්ෂ වශයෙන් මා මෙන් දන්නා අය ඇත්නම් ඔවුහු ඒ සත්ත්වයන් අතර ආහාර පිළිගැනීමට සිටින අයට කියන ලද ආකාර ඇති අවසන් පිඬුවෙනුත් වෙන්කොට එක් කොටසක් පරිත්‍යාගකොට ම අනුභව කරති.

'යසමා ච බො' 'යම් හෙයකින් වනාහි' ආදී වශයෙන් කම්පල ප්‍රත්‍යක්ෂ නොකිරීමේ හේතුවෙන් ම ඒ සත්ත්වයෝ දානය බෙදා දීමෙහි නො පවතිත් යනුවෙන් අදහස් කරන ලද අර්ථය කරුණකින් සම්පාදනය කරයි. එසේම ඔවුන් අනිත් පින්වල නොපිළිපැදීමේ ද පව්වල පිළිපැදීමේ ද කාරණය දක්වන ලදැයි දතයුතුය.

ගාථාවන්හි - **යථාවුතතං මහෙසිනා** යනු මහර්ෂී වූ භාග්‍යවතුන් වහන්සේ විසින් '**තිරචඡානගතානං දානං දතවා සතගුණා දකඛිණා පාටිකංඛිතබබා**' 'තිරිසන්ගත සතුන්ට දන් දී එම දානයේ අනුසස් සිය ගුණයකින් කැමතිවිය යුතුය' ආදී වශයෙන් ද මෙම සූත්‍රයෙහි ම 'එවඤෙච සතතා ජානෙය්‍යුං' 'ඉදින් සත්ත්වයෝ මෙසේ දනිත් නම්' ආදී වශයෙන් කියන ලද පරිදි යමක් ඇත්නම් නුවණින් විමසා බැලීමෙන් (ඤාණ චාරෙන) ඒ කියන ලද පරිදි සිත දැනගන්නා ලදී යන අර්ථයි. **විපාකං සංවිභාගසස** යනු තමාගේ ආහාරයෙන් කොටසක් බෙදාදීමේ විපාකයත් මෙසේ නම් දානයක විපාක ගැන කවර කථා ද? **යථා හොති මහපඵලං** යනු ඒ විපාකය මහත්ඵල වන අයුරු මේ සත්ත්වයෝ දනිත්නම් යනු සම්බන්ධයයි.

**විනෙය්‍ය මචෙඡරමලං** යනු මසුරුමල ඉවත්කොට කම්පල ඇදහීමද රත්නත්‍රය ඇදහීම ද විශේෂ වශයෙන් පැහැදුනු සිතෙන් කෙලෙසුන් කෙරෙන් දුරු වූ බැවින් **අරියෙසු** ශීලාදී ගුණයෙන් යුක්ත වූවන් කෙරෙහි **දිනනං** දෙන ලද ස්වල්ප වූ ද දානය **මහපඵලං** මහත්ඵල වෙයි. උන්වහන්සේලා කෙරෙහි සුදුසු කාලයෙහි **දජ්ජුං** දෙන්නාහුය. මහත්ඵල බව ඇතිකිරීම් වශයෙන් දක්ෂිණාවට (දානයට) සුදුසුවෙත් යන අරුතින් දක්ෂිණාවට සුදුසු වූ, මනාව පිළිපන්නා වූ ඒ **දකඛිණෙය්‍යසු** දක්ෂිණාවට සුදුස්සන් කෙරෙහි **දකඛිණං** පරලොව ගැන විශ්වාසකොට දිය යුතු දාන වස්තුව මහා දානයක් වන පරිදි **දතවා** දී, නැතහොත් දන් දී, 'දකඛිණෙය්‍යසු දකඛිණං' 'දක්ෂිණාව දීමට සුදුස්සන් කෙරෙහි' යනුවෙන් කෙසේ දානය දිය යුතුදැයි වදාළහ. **ඉතො මනුසසතතා** මිනිසත් බවෙන්

**චුතා** චුත වූවාහු, පිළිසිඳ ගැනීම් වශයෙන් **සගං ගච්ඡන්ති දායකා** දායකයෝ ස්වර්ගයට යති, **කාමකාමිනො** යනු කැමති විය යුතු උදාර දිව්‍ය සම්පත් ලබන ලද ස්වභාව සම්පතින් යුත් කර්මයෙන් පැමිණිය යුත්තෙහි මනාව කිරීමෙන් කැමති සම්පත් ඇත්තාහු, සියලු කාමයෙන් යුක්ත වූවාහු **මොදන්ති** කැමති පරිදි සැපවිඳිති යන අර්ථයි.

සයවන සූත්‍රයයි.

## 1.3.7

සත්වන සූත්‍රයෙහි **යානි කානිචි** යනු ඉතිරි නොකොට සියල්ල ගැනීම. **ඔපධිකානි පුඤ්ඤකිරිය වත්ථූනි** යනු ඒවායේ නියම කිරීමයි. එහි ස්කන්ධයෝ උපධි යයි කියනු ලැබෙත්. උපධියට කාරණ වූ සීලය හෝ ඒවායේ (පුණ්‍ය ක්‍රියාවන්ගේ) උපධීන්ට ඇති ප්‍රයෝජන හෝ ඔපධිකානි වේ. සම්පත්ති භවයෙහි ආත්මභාව ඇතිකරන ප්‍රතිසන්ධි - ප්‍රවෘත්ති විපාක දෙන්නා වූ. **පුඤ්ඤකිරිය වත්ථූනි** යනු පුණ්‍යක්‍රියා වූයේ ද ඒවාය, ඒ ඒ ඵල - ආනිශංසයන්ට වස්තු වූයේ ද ඒවාය යන අරුතින් පුඤ්ඤකිරිය වත්ථූනි නම් වේ. ඒවා කෙටියෙන් දානමය, සීලමය, භාවනාමය යනුවෙන් ත්‍රිවිධ වෙයි. එහි කිවයුතු දේ මතු තික නිපාත වර්ණනාවෙහි ප්‍රකට වන්නේය.

**මෙත්තාය චෙතො විමුත්තියා** යනු මෛත්‍රී භාවනා වශයෙන් ලබන ලද තික - චතුක්ක ධ්‍යාන සමාපත්තියේ. මෛත්‍රියයි කී කල්හි උපචාරයද අර්පණාවද ලැබෙයි. (ගැනෙයි) චෙතො විමුත්ති යනුවෙන් කී කල්හි අර්පණා ධ්‍යානයම ලැබෙයි. එහිදී (අර්පණා ධ්‍යානයේදී) නීවරණ ආදී විරුද්ධ ධර්මයන්ගෙන් සිත මැනවින් මිදුණ බැවින් චෙතො විමුත්ති යයි කියනු ලැබේ. **කලං නාඝන්ති සොළසිං** යනු මෛත්‍රී බ්‍රහ්ම විහාරයේ දාසයෙන් කොටසක් තරම්වත් ඕපධික පුණ්‍යක්‍රියා වස්තු නොවටී. මෛත්‍රී චේතෝ විමුක්තියේ විපාකය කොටස් දහසයකට බෙදා එයින් එක්

කොටසක් නැවත කොටස් දහසයකට බෙදා ඉන් එක් කොටසක් තරම්වත් ඕපධික පුණ්‍යක්‍රියා වස්තු නොවටී යන මෙය කියන ලදී.

අධිගගහෙත්‍වා යනු මැඩපවත්වා. **භාසතෙ** යනු උපක්ලේශවලින් පිරිසිදු වූ හෙයින් බබළයි. **තපතෙ** යනු එහෙයින් ම සියලු ප්‍රතිවිරුද්ධ ධර්ම තවයි. **විරොචති** යනු මුලින් කී කරුණු දෙක නිසා විශේෂයෙන් දීප්තිමත් වෙයි. සඳඑළිය නම් වූ මෛත්‍රී චේතෝ විමුක්තිය පහවූ උපක්ලේශ (බාධා) ඇති සඳඑළිය මෙන් බබළයි. හිරු රැස් අඳුර දුරළන්නා සේ විරුද්ධ ධර්මයන් විනාශ කරමින් තවයි. ඕසධී තාරකාව බබලන්නාක් මෙන් විශේෂයෙන් දීප්තිමත් වෙයි. **සෙය්‍යථාපි** යනු උපමා දැක්වීම් අර්ථයෙහි නිපාතයකි.

තාරකරූපානං යනු තාරකාවන්ගේ. **චන්දියා** යනු මෙය චන්ද්‍රයාට අයත්ය යන අරුතින් චන්දී නම් වේ. ඒ චන්ද්‍රයාගේ. **පභාය** ආලෝකයෙන් සඳඑළියෙන් යන අර්ථය. **වස්සානං** යනු වර්ෂා කාල යනුවෙන් බහුවචන වශයෙන් ලබන ලද ව්‍යවහාර ඇති ඍතුවේ. **පච්ඡිමෙ මාසෙ** කත්තික හෙවත් ඉල් මාසයෙහි. **සරදසමයෙ** යනු සරත් කාලයෙහි. අස්සයුජකත්තික මාස (වප් මස, ඉල්මස) ලෝකයෙහි සරත් ඍතුව යයි කියනු ලැබේ. විදෙධ පහ වූ, වැහි පහවීමෙන් දුරට ගිය යන අර්ථයි. එහෙයින් ම විගතවලාහකෙ දෙවෙ පහ වූ වැහිවලාකුළු ඇති අහසෙහි යනුවෙන් කීහ. **නභං අබ්භුස්සුක්කමානො** උදාවන තැනින් අහසට පැන නගිමින් තමගතං යනු අඳුර. **අභිවිහච්ච** යනු නසා, දුරුකොට **ඔසධී තාරකා** යනු උත්සන්න වූ ආලෝකය මෙයින් දෙනු ලැබේ යනුවෙන් හෝ ඖෂධවලට අනුබලයක් දෙන නිසා හෝ ඔසධී යනුවෙන් ලබන ලද නම් ඇති තාරකාව, මෙහිදී කුමක් නිසා භාග්‍යවතුන් වහන්සේ විසින් ආශ්‍රව සහිත බව තිබියදීත් මෛත්‍රිය අනිත් ඕපධික පින්වලට වඩා විශේෂකොට කියන ලද්දේ ඇයි? ශ්‍රේෂ්ඨ අර්ථයෙන් ද නිදොස් බැවින්දැයි පිළිතුරු කියනු ලැබේ. සත්ත්වයන් කෙරෙහි මනා වූ පිළිවෙතක් වන බැවින් මෙම විහාර ශ්‍රේෂ්ඨය. සියලු සත්ත්වයන් කෙරෙහි මෙම මෛත්‍රී ධ්‍යාන යහපත් ප්‍රතිපත්ති වෙයි. බ්‍රහ්මයෝ යම්සේ නිදොස් සිත් ඇත්තාහු වාසය කරත් ද මෙසේ එම ධ්‍යානවලින් යුක්ත වූ යෝගීහු බ්‍රහ්මයන්ට සමානව වාසය කරති. එසේ මේවා (මෛත්‍රී ධ්‍යාන) බ්‍රහ්මවිහාර යයි කියනු ලැබේ. මෙසේ ශ්‍රේෂ්ඨ අර්ථයෙන් ද නිදොස් බැවින් ද සත්ත්වයන් කෙරෙහි මනා වූ පිළිවෙතක් වන බැවින් ද මෛත්‍රියම අනිත් ඕපධික පින්වලට

වඩා විශේෂකොට කියන ලදී. මෙසේ ඇතිකල්හි කුමක් නිසා මෙසේ විශේෂකොට කියන ලද ද? අනිකුත් බ්‍රහ්ම විහාරයන්ට පිහිටවන තැනක් වන බැවින් ද දානාදී සියලු යහපත් ධර්මයන් සම්පූර්ණ කරන බැවින් ද විශේෂකොට කියන ලදී. මේ මෛත්‍රිය සත්ත්වයන් කෙරෙහි හිතවත් ආකාර පැවැත්ම ලක්‍ෂණ කොට ඇත්තේය. යහපත ළඟට පැමිණවීම රස (කෘත්‍ය)යයි. ද්වේෂය දුරුකිරීම වැටහෙන ආකාරයයි. ඉදින් ඒ මෛත්‍රිය සීමාරහිතව (සීමාවක් නැතිව) භාවිත කරන ලද ද බහුල වශයෙන් පුරුදු කරන ලද නම් ඉන්පසු කරුණා ආදී භාවනා සම්පූර්ණ වෙයි යන අරුතින් මෛත්‍රිය අනිත් බ්‍රහ්ම විහාරයන්ට පිහිටවන තැනකි. එසේ ම සත්ත්වයන් කෙරෙහි හිතවත් බව ඇතිකල්හි ඔවුන්ගේ දුක් නොඉවසන බව, සම්පත් බොහෝ කල් පැවැත්මට කැමති බව, පක්‍ෂපාත බවක් නැති බැවින් හැමතන්හි සමව පවතින සිත් ඇති බැවින් ද සුවසේ ඉටුවෙයි. මෙසේ ද සියලු ලෝකයාට හිතසුව ඇති කිරීමෙහි ඇලුණු මහා සත්ත්ව, බෝධිසත්ත්වයන් වහන්සේලා මොහුට දිය යුතුය, මොහුට නොදිය යුතුයයි උතුම් අය සෙවීම් වශයෙන් විභාග නොකොට සියලු සත්ත්වයන්ට සියලු සැපයට හේතුව වූ දානය දෙති. ඔවුන්ගේ හිතසැප පිණිසම සිල් සමාදන් වෙති. සීලය සම්පූර්ණ කිරීම සඳහා නෛෂ්ක්‍රම්‍යය (නෙක්ඛම්ම) ඇසුරු කරති. ඔවුන්ගේ හිතසැප කෙරෙහි මුළානොවීම පිණිස ප්‍රඥාව පිරිසිදු කරති. හිතසුව වැඩිකිරීම පිණිස ම දැඩිව වීර්ය ආරම්භ කරත්.

උතුම් වීර්ය වශයෙන් වීරභාවයට පත්වූවාහු සත්ත්වයන්ට නොයෙක් ආකාර යහපත බලාපොරොත්තුවෙන් ම අපරාධය (වරද) ඉවසති. මෙය ඔබට දෙන්නෙමි, කරන්නෙමි යනාදී වශයෙන් කරන ලද ප්‍රතිඥාව (පොරොන්දුව) කඩ නොකරති. ඔවුන්ගේ හිතසුව පිණිසම නොසෙල්වෙන අධිෂ්ඨානයෙන් යුක්ත වෙති. ඔවුන් කෙරෙහි නොසෙල්වෙන මෛත්‍රිය ඇති නිසා පළමුකොට උපකාර කරන්නාහු යහපත බලාපොරොත්තුවෙන් ම ඔවුන්ගේ විකාර වැඩවලදී උදාසීන වෙති. පළමුකොට උපකාර කිරීම නිසා ප්‍රතිඋපකාර බලාපොරොත්තු නොවෙති. මෙසේ උන්වහන්සේලා පාරමී පුරා දසබල - චතුර් වෛශාරද්‍ය ඥාන - ෂට් අසාධාරණ ඥාන - අටළොස් (18) ආවේණික බුද්ධ ධර්ම ප්‍රභේද ඇති සියලුම කල්‍යාණ ධර්මයන් සම්පූර්ණ කරත්. මෙසේ දානාදී සියලු කල්‍යාණ ධර්මයන් සම්පූර්ණ කරන්නී මෛත්‍රිය යනුවෙන් මේ විශේෂය දැක්වීම පිණිස ඒ මෛත්‍රිය අනිත්වාට වඩා විශේෂකොට කියන ලදී. එහෙත් අනිත් ඕපධික පින්වලට වඩා මෛත්‍රියේ මහානුභාව බව

වේලාම සූත්‍රයෙන් ප්‍රකට කළ යුතුයි. එහි දී භාග්‍යවතුන් වහන්සේ විසින් වේලාම (බමුණාගේ) දානයට වඩා සෝවාන් වූ එක් කෙනෙකුට දෙන දානය වඩා මහත්ඵලය යයි කියන ලදී. මෙසේ සකදාගාමී එක්කෙනෙකුට දෙන දානය සෝවාන් සියදෙනෙකුට දෙන දානයට වඩා මහත්ඵලයයි කියන ලදී. -පෙ- භාග්‍යවතුන් වහන්සේට දෙන දානය පසේබුදුරජාණන් වහන්සේලා සියනමකට දෙන දානයට -පෙ- එයට වඩා බුද්ධප්‍රමුඛ සංඝයාට දෙන දානය, එයටත් වඩා සතර දිශාවෙහි සංඝයාට විහාර දානය, එයටත් වඩා සරණගමනය,එයටත් වඩා සීල සමාදානය, එයටත් වඩා (ඇඟිලි දෙකට සුවඳ වර්ගයකින් ටිකක් ගෙන) එම සුවඳ සිඹින තරම් කාලයක් මෛත්‍රී භාවනා කිරීම වඩා මහත්ඵලයයි කියන ලදී.

'**යඤ්ච ගහපති වෙලාමො බ්‍රාහමණො දානං අදාසි මහාදානං, යොචෙකං දිට්ඨි සම්පන්නං භොජෙය්‍ය ඉදං තතො මහප්ඵලතරං, යො ච සතං දිට්ඨිසම්පන්නානං භොජෙය්‍ය -පෙ- සුරාමේරය මජ්ජපමාදට්ඨානා වෙරමණිං. යො ච අන්තමසො ගන්ධූහනමත්තම්පි මෙත්තචිත්තං භාවෙය්‍ය ඉදං තතො මහප්ඵලතරං**'[1] යනුවෙන් වදාළහ. මහග්ගත (රූපාවචර) පිනක් බැවින් කුඩා පිනකට වඩා මෛත්‍රියේ වඩාත් අධික බව ගැන කිවයුත්තක් නැත. එය 'යං පමාණකතං කම්මං න තං තත්‍රාවසීයති න තං තත්‍රාව තිට්ඨති' ප්‍රමාණ වශයෙන් කරන ලද යම් කර්මයක් වේ නම් එය එහි ඉතිරි නොවේ, එය එහි නො සිටියි' යනුවෙන් කියන ලදී. කාමාවචර කර්මය වනාහි ප්‍රමාණ වශයෙන් කරන ලද්ද නම් වේ. මහග්ගත කර්මය වනාහි ප්‍රමාණය ඉක්මවා ඔදිස්සක (සියලු ස්ත්‍රීහු ආදී සීමාවක් ඇති අයුරින් ද දිසා (නැගෙනහිර දිග සියලු සත්ත්වයෝ ආදී දිශා) වශයෙන් ද මෛත්‍රිය පැතිරවීම් වශයෙන් වඩා මෛත්‍රී කරනලද බැවින් අප්‍රමාණ වශයෙන් කරන ලද්ද නම් වේ. ඒ මහග්ගත කර්මය අතර කාමාවචර කර්මය ලැග සිටින්නට හෝ ඒ කර්මය මැඩගෙන තමාගේ (කාමාවචර) විපාකයට අවකාශයක් ගෙන සිටින්නට හෝ හැකි නොවෙයි. ඉක්බිති මහග්ගත කර්මයම ඒ කුඩා කර්මය ස්වල්ප ජලයක් යට කරගෙන සිටින මහා සැඩපහරක් මෙන් මැඩගෙන තමාට (මහග්ගත කර්මයට) අවකාශ ගෙන සිටියි. ඒ (කාමාවචර කුඩා කර්ම) විපාකය මැඩපවත්වා (තමාම (මහග්ගත කර්මයම) බ්‍රහ්මයන් සමග වාසය කරන බවට පමුණුවයි යන මෙය එහි අරුතයි.

---

1. = අංගුත්තර නිකාය / බු.ජ.මු. 5 භාගය / නවක නිපාතය / 436-438 පිටු.

ගාථාවන්හි - **යො** යනු යම්කිසි ගිහියෙක් හෝ පැවිද්දෙක්. **මෙත්තං** යනු මෛත්‍රී ධ්‍යානයයි. **අප්පමාණං** යනු භාවනා වශයෙන් ද අරමුණු වශයෙන් අප්‍රමාණ වූ, අශුභ භාවනාදියෙහි මෙන් අරමුණෙහි එක් කොටසක් ගැනීම නොකොට ඉතිරි නොකොට (සියල්ලන්ට) පැතිරවීම් වශයෙන් අනොධිසො ඵරණ වශයෙන් ද අප්‍රමාණ අරමුණු ඇති බැවින් ප්‍රගුණ භාවනා වශයෙන් ද අප්‍රමාණය. **තනුසංයොජනා හොන්ති** යනු මෛත්‍රී ධ්‍යානය පාදකකොට විමසා බලා පහළ ආර්ය මාර්ගයන් අවබෝධ කරන්නා වූ ඔහුගේ පටිඝ සංයෝජනාදිය පහසුවෙන් ම දුරුවෙමින් තුනී වෙයි. එහෙයින් **පස්සතො උපධික්ඛයං** යනුවෙන් වදාළහ. උපධික්ඛය යනුවෙන් නිවන කියනු ලැබේ. එම නිවන ප්‍රත්‍යක්ෂ කිරීම් වශයෙන් අවබෝධ කිරීම් වශයෙන් මාර්ග ඥානයෙන් දකී. නැතහොත් 'තනු සංයෝජනා හොන්ති' යනු මෛත්‍රී ධ්‍යානය ආසන්න කාරණයකොට වඩන විදර්ශනාවෙන් අනුපිළිවෙළින් උපධික්ඛය නම් වූ රහත් බවට පැමිණ එය දකින තැනැත්තාගේ දස සංයෝජනාම තුනී වේ යයි කියනුම කිම. දුරුවේ යනු අර්ථයි. නැතහොත් 'තනු සංයොජනා හොන්ති' යනු පටිඝයත් පටිඝය හා යෙදුණු සංයෝජනත් තුනී වෙයි. 'පස්සතො උපධික්ඛයං' යනු ඒ ක්ලේශ උපධීන්ගේම ඛය (ගෙවීම) නම් වූ මෛත්‍රිය අවබෝධ කිරීම් වශයෙන් දකින තැනැත්තාගේ. මෙසේ මෙහි අර්ථය දතයුතුය.

මෙසේ කෙලෙස් පහවීමත් නිර්වාණවබෝධයත් යනුවෙන් මෛත්‍රී භාවනාවේ මුදුන්පැමිණි අනුසස් ලෙස දක්වා දැන් අනිකුත් අනුසස් ද දක්වන්නට 'එකම්පි චෙ' යනාදිය වදාළහ. එහි **අදුට්ඨචිත්තො** යනු මෛත්‍රී බලයෙන් මනාව යටපත් කළ ව්‍යාපාදය ඇති බැවින් ඛ්‍යාපාදයෙන් දූෂිත නොවූ සිත් ඇති යමෙක්. **මෙත්තායති** යනු හිත (යහපත) පැතිරවීම් වශයෙන් මෛත්‍රී කරයි. **කුසලො** යනු අධික ලෙස (අතිශය) දක්‍ෂයෙක් හෝ මහ පින්වන්තයෙක් හෝ පටිඝ (තරහ) ආදී අයහපත දුරුකිරීමෙන් බිය නැති කෙනෙක් හෝ. **තෙන** ඒ මෛත්‍රී කිරීමෙන්. **සබ්බෙ ච පාණෙ** යන මෙහි 'ච' ශබ්දය අමතර එකකි. **මනසානුකම්පං** යනු සිතෙන් අනුකම්පා කරන්නා වූ, එයින් එක් සත්ත්වයකු කෙරෙහි ද කරන මෛත්‍රිය මහත් කුශල රාශියකි. සියලු ප්‍රාණීන් කෙරෙහි තමාගේ ප්‍රිය පුතුට මෙන් යහපත පැතිරවීමෙන් සිතෙන් අනුකම්පා කරන්නා වූ තැනැත්තා **පහූතං** බොහෝ, ස්වල්ප නොවූ, සීමාවක් නැති මහාකල්ප හැටහතරකදී ද

තමාගේ (මෛත්‍රී කුශල කර්මයේ) විපාකය බැඳ පවත්වන්නට සමත් උදාර පිනක් **අරියො** පිරිසිදු සිත් ඇති පුද්ගලයා **පකරොති** නිෂ්පාදනය කරයි. **සත්තසණ්ඩං** යනු සත්ත්ව නම් වූ සමූහයකින් යුක්ත වූ, පිරුණා වූ, සත්ත්වයන්ගෙන් අඩු නොවූ මිනිසුන්ගෙන් ගැවසුණා වූ යන අර්ථයි. **විජිත්වා** යනු දණ්ඩක් නැතිව, ආයුධයක් නැතිව ධර්මයෙන් ම දිනා (ජයගෙන). **රාජිසයො** යනු ඍෂිවරුන් සමාන දැහැමි රජවරු. **යජමානා** යනු දන් දෙමින් **අනුපරියගා** යනු හැසිරුණාහුය.

අසසමෙධං යනාදියෙහි පැරණි රජකාලයෙහි 1. සස්සමේධය, 2. පුරිසමේධය, 3. සම්මාපාසය, 4. වාජපෙය්‍යය යනුවෙන් රජවරුන් ලෝකවාසීන්ට සංග්‍රහ කළා වූ සතර සංග්‍රහ වස්තුවක් විය.

1. එහිදී උපයාගනු ලබන අස්වැන්නෙන් දහයෙන් කොටසක් ගැනීම (හෙවත් මහජනයාට දීම) සස්සමේධය නම් වේ. ගොවිතැන් කිරීමෙහි ශස්‍ය පිළියෙළ කිරීමෙහි නුවණ ඇති බව යන අර්ථයි.

2. මහායෝධයන්ට හයමාසික බත් - වැටුප් දීම පුරිසමේධ නම් වේ. පිරිස්වලට සංග්‍රහ කිරීමෙහි නුවණැති බව යන අර්ථයි.

3. දිළිඳු මිනිසුන්ගේ අතින් ලිපියක් ගෙන පොළියක් නැතිව තුන් අවුරුද්දක් දහස, දෙදහස පමණ වූ මුදල් දීම සම්මා පාස නම් වේ.

එය වනාහිපාස (තොණ්ඩු) වලින් හදවත් (සිත්) බැඳ තබන්නාක් මෙන් මිනිසුන් මැනවින් බැඳ තබයි, එහෙයින් සමමාපාස (යහපත් තොණ්ඩුව) යයි කියනු ලැබේ.

4. පියා, මාමා ආදී මොළොක් වචනවලින් සංග්‍රහ කිරීම වාජපෙය්‍ය නම්. ප්‍රියවචන, ප්‍රියවචන ඇති බව යන අර්ථයි. මෙසේ සතර සංග්‍රහවෙන් සංග්‍රහ ලබන ලද රට සමෘද්ධ වෙයි. බොහෝ ආහාරපාන ඇති නිර්භය වූ අර්බුද නැති රටක් වෙයි. මිනිස්සු ප්‍රමෝදයෙන් සතුටුවෙමින් දරුවන් ලයෙහි නටවමින් නො වැසූ ගෙවල් ඇතිව වාසය කරත්. නිවෙස්වල දොරවල්වල අගුළු නැති බැවින් මෙය නිරග්ගල යයි කියනු ලැබේ. මෙය පැරණි යුගයට අයත් වූ දෙයයි. මෙය පැරණි යුගයට අයත් ස්වභාවයයි.

පසුකලෙක ඔක්කාක රාජ්‍ය කාලයෙහි බමුණෝ මේ සතර සංග්‍රහ වස්තු ද රටේ මේ සම්පත් ද පෙරළා දමමින් මුල් උදුරා දමා අස්සමේධ, පුරිසමේධ ආදී යාග පහක් කළාහුය. මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ විසින් (සුත්ත නිපාතයේ) බ්‍රාහ්මණ ධම්මිය සූත්‍රයෙහි දී

**තෙසං ආසි විපල්ලාසො දිස්වාන අණුසො අණුං -පෙ-**
**තෙ තත්ථ මන්තෙ ගන්ථෙත්වා ඔක්කාකං තදුපාගමුං'*** යනුවෙන් දේශනා කරන ලදී.

'අතිශයින් ස්වල්පමාත්‍ර වූ පස්කම්ගුණ ද දැක ඔවුන්ට වෙනස් වූ සංඥා ඇතිවිය. -පෙ- ඒ නිමිතිකොට ඒ බමුණෝ වේද මන්ත්‍ර ගොතා ඒ ඔක්කාක රජු වෙත එළඹියහ.

මෙහි දී අශ්වයකු යාගයට පුදති (මරති), පෙළති යන අරුතින් අස්සමේධ නම් වෙයි. අති විශේෂ යාග දෙකකින් යාග කළයුතු යාග කණු විසිඑකක් ඇති, එක් මැදුම් දිනයකදී ම පන්සිය අනූහතක් සත්ත්වයන් ඝාතනයෙන් බියකරු වූ, භූමිය ද මිනිසුන් ද හැර සෙසු සියලු සම්පත් දන් දෙන යාගයට මේ විශේෂ වචනයකි.

මෙහි දී පුරුෂයකු යාගයට පුදති (මරති), පෙළති යන අරුතින් පුරිසමේධ නම් වෙයි. අති විශේෂ යාග සතරකින් යාග කළයුතු භූමිය ද සමග අශ්වමේධ යාගයේ දී කියන ලද සම්පත් දන් දෙන යාගයට මේ විශේෂ වචනයකි.

මෙහි දී සම්මය හෙළති, වීසිකරති යන අරුතින් සම්මාපාස නම් වෙයි. වියගසේ සිදුරෙහි ඇතුල්කරන දඬුව නම් වූ සම්මය වීසිකොට එය වැටුණු තැන වේදිකාවක් තනා ගෙන යා හැකි යාග කණු ආදිය සමග සරස්වතී නදියෙහි ගිලුණු තැන් පටන් විරුද්ධ දිශාවට යන තැනැත්තා විසින් යැදිය යුතු සත්‍ර යාගයට මෙය විශේෂ වචනයකි.

---

* මෙහි දක්වා ඇත්තේ ගාථා තුනහමාරකට අයත් පේළි හතෙන් මුල් පේළිය හා අවසාන පේළිය පමණි.

මෙහි දී වාජ (පානයකි) පානය කරති යන අරුතින් වාජපෙය්‍ය නම් වෙයි. එක් විශේෂ යාගයකින් සතුන් දාහත්දෙනෙකුගෙන් යැදිය යුතු බෙලි දණ්ඩකින් කළ යාග කණුවක් ඇති දාහත දාහත බැගින් දන් දෙන යාගයට මෙය විශේෂ වචනයකි.

මෙහි අගුලක් නැත යන අරුතින් නිරග්ගල නම් වෙයි. අති විශේෂ යාග නවයකින් යැදිය යුතු භූමිය ද පුරුෂයන් ද සමග අශ්වමේධයෙහි කියන ලද සම්පත් දන්දෙන සබ්බමේධ යන පර්යාය නම් ඇති අශ්වමේධ විකල්පයකට මෙය විශේෂ වචනයකි.

**චන්‍දප්පභා** යනු සඳඑළියෙන්. **තාරගණා ච සබ්බෙ** යනු සියලුම තරු සමූහය සඳඑළියෙන් සොළොස් කලාවෙන් කලාවක්වත් නො වටින්නේ යම්සේ ද මෙසේ මේ අශ්වමේධාදී යාග, කියන ලද ලක්ෂණයෙන් මනාකොට භාවිත කරන ලද මෛත්‍රී සිතේ සොළොස් කලාවෙන් කලාවක්වත් අනුභව නොකරයි, නො පැමිණෙයි, නොවටී යන අර්ථයි.

දැන් මෛත්‍රී භාවනාවේ මෙලොව පරලොව අනිකුත් අනුසස් දැක්වීමට 'යො න හනති' යනාදිය වදාරන ලදී. එහි **යො** යනු මෛත්‍රී බ්‍රහ්මවිහාර භාවනාවෙහි යෙදුණු පුද්ගලයා. **න හනති** යනු එහෙයින්ම මෛත්‍රී භාවනානුභාවයෙන් බොහෝදුරට යටපත් කරන ලද ව්‍යාපාදය ඇති බැවින් කිසිදු සතෙකුට හිංසා නොකරයි. දඬුමුගුරු ආදියෙන් නො පෙළයි. **න ජිනාති** යනු එකට එක කිරීම, කලහයට තුඩුදෙන කථා කිරීම් ආදී වශයෙන් කිසිවක් නො දිනයි. එකට එක කිරීමක් නැති බැවින් විපත්තියක් කිරීම් වශයෙන් හෝ නඩුකීම් ආදියෙන් හෝ කිසිවක් දිනා නොගනියි. **න ජාපයෙ** යනු අන්‍යයන් යොදවා හෝ අනුන්ගේ ධනහානිය නොකරවන්නේය. **මෙත්තංසො** යනු මෛත්‍රී සිත් කොටස. මෛත්‍රීයෙහි අංශය, දුරුනොකරන අර්ථයෙන් අවයවයක් වූයේ යන අරුතින් මෙත්තංසො නම් වේ. **සබ්බභූතෙසු** යනු සියලු සත්ත්වයන් කෙරෙහි එසේම. **වෙරං තස්ස න කෙනචි** කිසියම් ම කාරණයකින් ඔහුගේ අකුශල වෛරයක් නැත. පුද්ගල වෛර නම් වූ විරෝධයක් කිසියම්ම පුරුෂයකු සමග ඒ මෛත්‍රී විහාරී පුද්ගලයාගේ නැත.

මෙසේ මේ ඒකක නිපාතයෙහි පිළිවෙළින් මුලසිට ඇති සූත්‍ර දහතුන ද (පළමුවන වර්ගයේ සූත්‍ර 10+දෙවන වර්ගයෙන් මුල් සූත්‍ර 3 = 13), සේඛ සූත්‍ර දෙක ද (දෙවන වර්ගයේ 6 වන 7 වන සූත්‍ර දෙක) යන සූත්‍ර පසළොසෙහි (15) නිවන (විවට්ට) කියන ලදී.

නීවරණ සූත්‍රය (දෙවන වර්ගයේ 4 වන සූත්‍රය), සංයෝජන සූත්‍රය (දෙවන වර්ගයේ 5 වන සූත්‍රය), අප්පමාද සූත්‍රය (තුන්වන වර්ගයේ 3 වන සූත්‍රය) අට්ඨි සඤ්චය සූත්‍රය (තුන්වන වර්ගයේ 4 වන සූත්‍රය) යන මේ සූත්‍ර හතරෙහි සසර හා නිවන (වට්ට-විවට්ට) කියන ලදී. ඉතිරි සූත්‍රවල (අටෙහි) සසර ම කියන ලදී.

**පරමත්ථදීපනී ඛුද්දක නිකායට්ඨකථා ඉතිවුත්තකයේ**
**ඒකක නිපාත වර්ණනාව නිමියේ ය.**

## 2.1.1

දුක නිපාතයෙහි **ද්වීහි** යනු ගණන වෙන්කිරීමයි. ධම්මෙහි යනු වෙන්කළ ධර්ම දැක්වීමයි. ද්වීහි ධම්මෙහි යනු අකුශල ධර්ම දෙකින්. **සමන්නාගතො** යනු යුක්ත වූයේ. දිට්ඨෙව ධම්මෙ යනු මේ ආත්මභාවයෙහිම. **දුක්ඛං විහරති** යනු සතර ඉරියව්වෙහිදී කෙලෙස් දුකෙන් ද කායික චෛතසික දුකෙන් ද දුකසේ වාසය කරයි. **සවිඝාතං** යනු සිතේ අසහනයෙන් ද කයේ අසහනයෙන් ද අසහන සහිත වූ. **සඋපායාසං** යනු බලවත් වූ කෙලෙස් වෙහෙසින් ද සිරුර ගැන කලකිරීමෙන් ද බලවත් වෙහෙස වශයෙන් උපායාස සහිත වූ. **සපරිළාහං** යනු කෙලෙස්වලින් තැවීමෙන් ද කෙලෙස්වලින් දැවීමෙන් ද දාහය සහිත වූ. **කායස්ස භෙදා** යනු උපාදින්න ස්කන්ධ පරිත්‍යාගයෙන් **පරම්මරණා** යනු එයට අනතුරුව මතු උපන් ස්කන්ධයන් ගැනීමෙහි. නැතහොත් 'කායස්ස භෙදා' යනු ජීවිත ඉන්ද්‍රිය නැසීයාමෙන්. 'පරම්මරණා'

යනු චුතියෙන් මතු. **දුග්ගති පාටිකංඛා** යනු දුගති නම් වූ සතර අපායන් අතුරෙන් එක්තරා ගතියක් (උපදින තැනක්) කැමතිවිය යුතුය. ඒකාන්තයෙන් සිදුවන දෙයක් යන අර්ථයි.

අගුත්තද්වාරො යනු නොවසන ලද (නොරක්නා ලද) දොරටු ඇත්තේ. නොවසන ලද දොරටු ඇත්තේ කොතැන්හිද? **ඉන්ද්‍රියෙසු** ඉන්ද්‍රියයන්හි යයි කීහ. එයින් මනස සයවැනි කොට ඇති ඉඳුරන්ගේ අසංවරය කීහ. පිළිගැනීම් පරිභෝග කිරීම් වශයෙන් භෝජනයෙහි ප්‍රමාණය නොදනියි යන අරුතින් **භොජනෙ අමත්තඤ්ඤූ** නම් වේ. 'ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතාය භොජනෙ අමත්තඤ්ඤුතාය' යනුවෙන් ද කියති. ඉඳුරන්හි නොරක්නා ලද දොර ඇති බව කෙසේ ද? රක්නා ලද දොර ඇති බව කෙසේද? චක්ඛුන්ද්‍රියයෙහි සංවරයක් හෝ අසංවරයක් හෝ නැත. චක්ඛුප්පසාදය නිසා සිහිය හෝ මුළා වූ සිහිය හෝ නූපදී. නමුත් රූප අරමුණක් ඇස හමුවට ආ විට භවංගය දෙවරක් ඉපිද නැතිවී ගිය කල්හි කිරිය මනෝධාතුව ආවර්ජන කෘත්‍යය සිදුකරමින් ඉපිද නැතිවෙයි. ඉන්පසු චක්ඛු විඤ්ඤාණය දර්ශන කෘත්‍යය ද ඉන්පසු විපාක මනෝධාතුව සම්පටිච්ඡන කෘත්‍යය ද ඉන්පසු විපාක අහේතුක මනෝවිඤ්ඤාණ ධාතුව සන්තීරණ කෘත්‍යය ද ඉන්පසු කිරිය අහේතුක මනෝවිඤ්ඤාණ ධාතුව වොත්ථපන කෘත්‍යය ද සිදුකරමින් ඉපිද නැතිවෙයි. එයට අනතුරුව ජවන් සිත දුවයි. ඒ භවංග කාලයෙහි හෝ ආවර්ජනාදීන් අතුරෙන් එකක් ඇතිවන කාලයෙහි හෝ සංවරයක් හෝ අසංවරයක් නොවේ. ජවනය ඇතිවන මොහොතෙහි ඉදින් දුසිල්බවක් හෝ සිහිමුළාවීමක් හෝ නොදැනීමක් හෝ නො ඉවසීමක් හෝ කුසීත බවක් හෝ උපදියි නම් අසංවර වෙයි. මෙසේ වන්නා වූ එය චක්ඛුද්වාරයෙහි අසංවරය යි කියනු ලැබේ.

කුමක් නිසාද? එසේ ඇතිකල්හි ද්වාරය ද භවංගය ද ආවර්ජනාදී වීථි සිත් ද නොරක්නා ලද්දේ වෙයි. කෙසේ ද? නුවර සිවු දොරටු නොවැසූ කල්හි නිවෙස්වල දොරවල්, කොටු, ගර්භ ආදිය වසන ලද්දේ වුවද ඇතුල්නුවර සියලු භාණ්ඩ නො රක්නා ලද්දේ ම වෙයි. නුවර දොරටුවලින් සොරු ඇතුල් වී කැමති දෙයක් රැගෙන යති. එසේ ම ජවනයෙහි දුසිල් බව ආදිය උපන්කලහි එය අසංවර වූ කල්හි (චක්ඛු ආදී) ද්වාරය ද භවංගය ද ආවර්ජනය ද වීථි සිත් ද නොරක්නා ලද්දේ වෙයි. එය නැතිකල්හි ජවනයෙහි ශීලාදිය උපන් කල්හි ද්වාරය ද භවංගය ද

ආවර්ජනාදී වීථි සිත් ද රක්නා ලද්දේ වෙයි. කෙසේද? නුවර දොරවල් වැසූ කල්හි ඇතුල්නුවර යමක් නොවැසුවද ඇතුල්නුවර සියලු භාණ්ඩ සුරක්ෂිතම වෙයි. නුවර දොරවල් වැසූ කල්හි සොරුන්ගේ පිවිසීමක් නැත. එසේම ජවනයෙහි ශීලාදිය උපන්කල්හි ද්වාරය ද භවංගය ද ආවර්ජනාදී වීථිසිත් ද රක්නා ලද්දේ වෙයි. එහෙයින් ජවන් උපදින මොහොතෙහි උපදින සිල්වත් බව ආදිය චක්ඛු ද්වාරයෙහි සංවරයයි කියනු ලැබේ. අනිත් ද්වාරයන්හි ද මේ ක්‍රමයමයි. මෙසේ ඉන්ද්‍රියයන්හි නොරක්නා ලද දොරටු ඇති බව ද රක්නා ලද දොරටු ඇති බව ද දතයුතුය.

භෝජනයෙහි පමණ නොදැනීම කෙසේද? පමණ දැනීම කෙසේද? යම් පුද්ගලයෙක් බොහෝ ආසා ඇත්තෙක් (මහිච්ඡ) වී පිළිගැනීමෙහි පමණ නො දනියි. යම්සේ කච්ඡපුට වෙළෙන්දා ආභරණ පොදිය අතින් ගෙන උකුලෙහි දමාගත යුතු දෙයක් එහි ද දමාගෙන මහජනයා දකිද්දීම අසවල් දේ ගන්න, අසවල් දේ ගන්නැයි මුඛයෙන් ඝෝෂා කරයි ද එසේම මහිච්ඡ පුද්ගලයා අල්පමාත්‍ර වූ ද තමාගේ සීලයක් හෝ (උගත්) ග්‍රන්ථයක් හෝ ධුතාංගයක් හෝ යටත් පිරිසෙයින් වනයෙහි වාසය කිරීම් මාත්‍රයකුදු දන්නා වූම මහජනයාට වර්ණනා කරයි. එසේ වර්ණනා කොට ගැල් (කරත්ත) වලින් ගෙනවුත් පිළිගන්වන ලද ප්‍රත්‍යයන් ඇති නොකියා පිළිගනියි. තුනක් පුරවන්නට නො හැකිය, ගින්න දර (ඉන්ධන) වලින් ද සමුද්‍රය ජලයෙන් ද මහිච්ඡ පුද්ගලයා (ආහාරපානාදී) ප්‍රත්‍යයෙන් ද පිරවිය නොහැක.

> **අග්ගික්ඛන්ධො සමුද්දො ච මහිච්ඡො චාපි පුග්ගලො**
> **බහුකෙ පච්චයෙ දිය්‍යෙන තයො පෙතෙ න පූරයෙ**

ගිනිකඳ ද සමුදුර ද මහිච්ඡ පුද්ගලයා ද යන මේ තිදෙනා බොහෝ ප්‍රත්‍යයන් දුන්කල්හි ද නො පිරේ.

මහිච්ඡ පුද්ගලයා වැදූ මවගේ ද සිත ගැනීමට නොහැකි වෙයි. මෙබඳු තැනැත්තා නූපන් ලාභය නො උපදවයි. උපන් ලාභයෙන් ද පිරිහෙයි. මෙසේ පිළිගැනීමෙහි පමණ නො දන්නේ වෙයි. යමෙක් දැහැමින් සෙමෙන් (සාමයෙන්) ලැබුවා වූද ආහාරය ගිජු වූයේ, මුසපත් වූයේ ආසාවට බැසගත්තේ, දොස් නො දක්නේ ඡන්දරාගයෙන් යුක්ත

වූයේ (අනිස්සරණ පඤ්ඤා) ආහාරහත්ථක, අලංසාටක, තත්‍රවට්ටක, කාකමාසක, භුත්තවමිතක යන බමුණන් අතරින් එකක- මෙන් අනුවණින්, වැරදි අයුරින් බඩතදවන කල් ඇතිතාක් ඇතිතාක් අනුභවකොට ඇඳ පුටුවල හිඳීමෙන් හා සතුවලින් ලැබෙන සැපය ද (සෙය්‍යසුඛං), නිදීමේදී වම් පැත්තට දකුණු පැත්තට හැරීමෙන් ලැබෙන සැපය ද (පස්සසුඛං), නිදි සුවයද (මිද්ධසුඛං) අනුව යෙදී වාසය කරයි. මේ පරිභෝගයෙහි පමණ නොදැනීමයි.

යමෙක් ඉදින් දියයුතු දේ බොහෝ ඇතත් දායකයා ටිකක් දෙනු කැමතිනම් දායකයාගේ අදහස් වශයෙන් ටිකක් ගනියි. දියයුතු දේ ටිකක් ඇතත් දායකයා බොහෝ දෙනු කැමැත්තේ නම් දියයුතු දේ ගැන සැලකීම් වශයෙන් ටිකක් ගනියි. දිය යුතු දේ බොහෝ ඇත. දායකයා ද බොහෝ දෙනු කැමැත්තේ නම් තමන්ගේ ශක්තිය දැන ප්‍රමාණයෙන් යුක්තවම ගනියි යනුවෙන් ද මෙසේ කියන ලද පිළිගැනීමේ පමණ දැනීම් වශයෙන් ද 'පටිසංඛායොනිසො ආහාරං ආහාරෙති නෙවදවාය න මදාය' 'ප්‍රත්‍යවේක්ෂා කොට නුවණින් ආහාර අනුභව කරයි. සෙල්ලම් පිණිස නොවේ. මද වැඩීම පිණිස නොවේ' ආදී වශයෙන් ලැබුවා වූද පිණ්ඩපාතය ගිජු නොවූයේ මුසපත් නොවූයේ, ආසාවට බැස නොගන්නේ දොස් දක්නේ ඡන්දරාගයෙන් තොරවූයේ (නිස්සරණ පඤ්ඤා) අනුභව කරයි යනාදී වශයෙන් කියන ලද අයුරින් ප්‍රත්‍යවේක්ෂා කොට ප්‍රත්‍යවේක්ෂා ඥානයෙන් දැන ආහාර අනුභව කිරීම් සංඛ්‍යාත පරිභෝගයෙහි පමණ දැනගැනීම් වශයෙන් ද භෝජනයෙහි පමණ දන්නා බව යන මෙය භෝජනයෙහි පමණ දැනීම නම් වේ. මෙසේ භෝජනයෙහි පමණ නොදන්නා බව ද පමණ දන්නා බව ද වේයයි දතයුතුය.

ගාථාවන්හි - **චක්ඛුං** යනාදියෙහි ආශ්වාදනය කරයි යන අරුතින් චක්ඛු නම්, (චක්ඛතීති චක්ඛු). රූපය ආශ්වාදනය කරයි, සමවිසම කියන්නාක් මෙන් වෙයි යන අර්ථයි. අසයි යන අරුතින් **සොතං** නම්. ආඝ්‍රාණය කරයි යන අරුතින් **ඝාණං** නම්. ජීවිත නිමිත්ත වූ ආහාර රසය ජීවිතයයි. එය කැඳවයි යන අරුතින් **ජිව්හා** නම්. කුත්සිත (සාසව) ධර්මයන්ට උත්පත්තිස්ථාන වූයේ **කාය** නම්. මනියි, දැනගනියි යන අරුතින් මන (මනුතෙ විජානාතීති මනො) නම් වෙයි. පැරැන්නෝ වනාහි දැනගනියි යන අරුතින් 'මන' (මුනාතීති මනො) යයි කීහ. නැලියෙන් මනින්නාක් මෙන් මහා තරාදියක දරන්නාක් මෙන් අරමුණ දැනගනියි යන අර්ථයි.

මෙසේ පළමුකොට මෙහි පදාර්ථය දතයුතුය. භාව අර්ථ වශයෙන් මාංශ චක්‍ෂු ප්‍රඥා චක්‍ෂු යනුවෙන් ඇස (චක්‍ෂු) දෙපරිදිය. ඒ අතරින් ප්‍රඥා චක්‍ෂුව 1. බුද්ධ චක්ඛු 2. සමන්ත චක්ඛු, 3. ඤාණ චක්ඛු, 4. දිබ්බ චක්ඛු, 5. ධම්ම චක්ඛු යනුවෙන් පස් ආකාරය. එහි **'අද්දසං ඛො අහං භික්ඛවෙ බුද්ධචක්ඛුනා ලොකං වොලොකෙනෙතා'** 'මහණෙනි, බුදුඇසින් ලොව දෙස බලන්නා වූ මම දුටුවෙමි' යන මෙය බුද්ධචක්ඛු (බුදුඇස) නමි. **'සමන්තචක්ඛු වුච්චති සබ්බඤ්ඤුතඤාණං'** 'සර්වඥතා ඥානය සමන්තචක්ඛු යයි කියනු ලැබේ.' මෙය සමන්තචක්ඛු (සමතැස) නමි. **'චක්ඛුං උදපාදි'** 'ඇස පහළවිය' යන මෙය ඤාණචක්ඛු (නුවණැස) නමි. **'අද්දසං ඛො අහං භික්ඛවෙ දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන'** 'මහණෙනි, පිරිසිදු වූ දිවැසින් මම දුටුවෙමි' යන මෙය දිබ්බචක්ඛු නමි. **'විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි'** 'කෙලෙස් දූවිලි නැති පහවූ කෙලෙස්මල ඇති දහම් ඇස පහළවිය' යන මෙය පහළ මාර්ග තුන නම් වූ (සෝවාන්-සකදාගාමි-අනාගාමි මාර්ග) ධම්මචක්ඛු නමි.

සසම්භාර චක්ඛු, පසාද චක්ඛු යනුවෙන් මාංශ චක්ෂුවද දෙපරිදිය. එහි ඇස්වළෙහි පිහිටි, යටින් ඇස්වළෙහි ඇති ඇටයෙන් ද ඉහළින් බැම ඇටයෙන් ද දෙපසින් ඇස් මුදුනෙන් ද ඇතුළත හිස්මොළයෙන් ද බැහැර ඇස් ලොම්වලින් ද සීමා වූ මස්පිඬුව, කෙටියෙන් (1.පඨවි, 2.ආපෝ, 3.තේජෝ, 4.වායෝ යන) ධාතු සතර 5.වර්ණ, 6.ගන්ධ, 7.රස, 8.ඕජා, 9.සම්භව, 10.සණ්ඨාන, 11.ජීවිත, 12.(ස්ත්‍රී-පුරුෂ) භාව, 13.කාය ප්‍රසාදය, 14.චක්ඛුප්පසාදය යන රාශි දාහතර, විස්තර වශයෙන් ධාතු හතර, එය ඇසුරුකොට ඇති, 5.වර්ණ, 6.ගන්ධ, 7.රස, 8.ඕජා, 9.සණ්ඨාන, 10.සම්භව යන මේ දහය (කර්ම-චිත්ත-ඍතු-ආහාර යන) සතරින් හටගන්නා බැවින් (චතුසමුට්ඨානිකත්තා) හතළිහක් වෙයි. ජීවිත (ඉන්ද්‍රිය) (ස්ත්‍රී-පුරුෂ) භාව. කායප්‍රසාදය, චක්ඛුප්පසාදය යන සතර ඒකාන්තයෙන් කර්මයෙන් හටගන්නා ඒවාය යන මේ (40+4) හතළිස් හතරක් වූ රූපයන්ගේ වශයෙන් හතළිස් හතර රාශියක් වෙයි. සුදු වූ වට වූ පළල් වූ ප්‍රකට වූ මහත් වූ යමක් ඇසයයි හඳුනන්නා වූ ලෝවැසි තෙම ඇස නො හඳුනයි. (චක්‍ෂු) වස්තුව ඇස වශයෙන් හඳුනයි. යම්තැනක සුදු වූද, කළු වූද, ලේ පැහැවූද, පඨවි වූද, ආපෝ වූද, තේජෝ වූ ද වායෝ වූද සෙම බහුල බැවින් සුදු වූද, පිත බහුල බැවින් කළු වූ ද ලේ බහුල බැවින් ලේ පැහැවූද පඨවිය බහුල බැවින් තද වූද ආපෝ බහුල බැවින් වැගිරෙන්නා වූ ද තේජෝ බහුල බැවින් දැවෙන්නා වූ ද වායෝ බහුල බැවින් තැනින්

තැනට යන්නා වූ ද ඇස්වලෙහි පිහිටියා වූ නහරවැලින් හිස්මොළයෙහි බැඳුණු යම් මස් පිඬුවක් වේද, මේ 'සසම්භාර චක්ඛු' නම් වේ. මෙහි සිටි මෙහි බැඳුණු සතරමහාභූත ඇසුරුකොට ඇති ප්‍රසාදය පසාදචක්ඛු නම් වේ. මෙය චක්ඛු විඤ්ඤාණාදීන්ට සුදුසු පරිදි වස්තු (වත්ථු) භාවයෙන් ද ද්වාර භාවයෙන් ද පවතී.

සෝත (කණ) ආදියෙහි ද දිබ්බසෝත, මංසසෝත යනුවෙන් කණ දෙපරිදිය. **'දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්ත මානුසකයා උභො සද්දෙ සුණාති'**[1] 'පිරිසිදු වූ මිනිස් කණ ඉක්මවා සිටියා වූ දිවකණින් (දෙව්-මිනිස් වශයෙන් ද දුර-ළඟ වශයෙන් ද) ශබ්ද දෙක අසයි' යන මෙය දිබ්බසෝත (දිව්‍යශ්‍රෝත) යයි. සසම්භාර සෝතය ද පසාද සෝතය ද යන මාංශශ්‍රෝතය මුලින් ඇස පිළිබඳව කියන ලද අයුරින්ම සියල්ල දතයුතුය. නාසය, දිව පිළිබඳවද එසේමය.

කය වනාහි චෝපනකාය, කරජකාය, සමූහකාය, පසාදකාය ආදී වශයෙන් බොහෝ ආකාර වේ. එහි **'කායෙන සංවුතා ධීරා අථො වාචාය සංවුතා'**[2] යම් නුවණැත්තෙක් කායද්වාරයෙන් සංවර ද නැවත වචනයෙන් සංවරද' යන මෙය චෝපනකාය නම් වේ. **'ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති'**[3] 'මේ කයින් අනිත් කයක් මවයි' යන මෙය කරජකාය (දෙමව්පියන් නිසා හටගත් කය) නම් වේ. සමූහ කය වනාහි විඤ්ඤාණාදි සමූහ වශයෙන් නොයෙක් ආකාර ඇත්තේය. එය එසේමය. **'ඡ ඉමෙ ආවුසො විඤ්ඤාණකායා'**[4] 'ඇවැත්නි, මේ විඤ්ඤාණ කාය හයකි යනාදියෙහි විඤ්ඤාණ සමූහය කියන ලදී. **'ඡ ඵස්සකායා'**[5] ස්පර්ශ කාය හයකි' යනාදියෙහි ඵස්ස සමූහය කියන ලදී. එසේ ම 'කාය පස්සද්ධි කායලහුතා' 'චෛතසිකයන්ගේ සංසිඳීම, චෛතසිකයන්ගේ සැහැල්ලු බව' යනාදියෙහි වේදනා ස්කන්ධය කියන ලදී. 'ඉධෙ කච්චො පඨවිකායං අනිච්චතො අනුපස්සති ආපොකායං තෙජොකායං වායොකායං කෙසකායං ලොමකායං' 'මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් පඨවි

1. මජ්ඣිම නිකාය - ගෝපක මොග්ගල්ලාන සුත්ත
2. ධම්මපද - කෝධවග්ග
3. දීඝනිකාය - සාමඤ්ඤඵල සුත්ත
4. මජ්ඣිම නිකාය - සම්මාදිට්ඨි සුත්ත
5. ධම්ම සංගනිප්පකරණ

කය, ආපෝ කය, තේජෝ කය, වායෝ කය, කෙස් කය, ලොම් කය, අනිත්‍ය වශයෙන් විමසා බලයි යනාදියෙහි පඨවි ආදී සමූහය කියන ලදී. **'කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා'**[1] යන මෙය පසාදකාය නම් වේ. මේ සූත්‍රයෙහි දී පසාදකාය (ප්‍රසාදකය) දතයුතුය. එම කය, කාය විඤ්ඤාණාදියට සුදුසු පරිදි වස්තු භාවයෙන් ද ද්වාර භාවයෙන් ද පවතියි.

මනස වනාහි සියලු විඤ්ඤාණය කියනු ලැබේ. එසේ ම මෙහි ද්වාර භාවය අදහස් කරන ලද බැවින් ද්වාර වූ ආවර්ජනා සහිත භවංගය දතයුතුය.

**එතානි යස්ස ද්වාරානි අගුත්තානීධ භික්ඛුනො** යම් භික්‍ෂුවකට මනස හයවැනි කොට ඇති මේ දොරටු සය සිහිය අතහැරීමෙන් ප්‍රමාදයට පැමිණි බැවින් සිහිය නමැති කවුළුවෙන් නොවසන ලද්දේ.

**භොජනම්හි -පෙ- අධිගච්ඡති** ඒ භික්‍ෂුව කියන ලද අයුරින් භෝජනයෙහි පමණ නොදන්නේ ඉඳුරන්හි ද සංවර නැත්තේ රාගාදි වශයෙන් මේ ජීවිතයේ දී ද පරලොව දුගතියට ඇතුළත් වූ කායික දුකද රාගාදි කෙලෙසුන් කෙරෙහි තැවීම් වශයෙන් ද ආශාවන් විනාශවීම් වශයෙන් සිතේ දුකදැයි හැම අයුරින් ම දුක්ම ලබයි දුකට ම පැමිණෙයි. මෙය මෙසේ හෙයින් දෙපරිදි වූ දුක් ගින්නෙන් මෙලොව ද පරලොව ද **ඩය්හමානෙන කායෙන ඩය්හමානෙන චෙතසා දිවා වා යදිවා රත්තිං** දැවෙන කයින් දැවෙන සිතින් දවල් ද රෑ ද නිතරම **තාදිසො** එබඳු පුද්ගලයා **දුක්ඛං විහරති** දුකසේ වසයි. ඔහුට සැප විහරණයක හටගැන්මක් නැත. සසර දුක්වලින් ඉවත්ව යාමෙහි කිවයුත්තක් නැත.

**පළමු සූත්‍ර වර්ණනාවයි.**

---

1. අංගුත්තර නිකාය - තික නිපාත - රථකාර වග්ග

## 2.1.2

දෙවන සූත්‍රයෙහි (පළමු සූත්‍රයට) කියන ලද ආකාරයට විරුද්ධ වශයෙන් අර්ථය දතයුතුය.

## 2.1.3

තෙවන සූත්‍රයෙහි **තපනීයා** යනු මෙලොවත් පරලොවත් තවත් පෙළත්, වෙහෙසත් යන අරුතින් තපනීය (තැවීමට හේතුවන) ධර්මයෝ වෙත්. මෙලොව ද පරලොව ද තැවීම දුකය. එය පහල වීමෙන් ද අනුබල දීමෙන් ද හිත වූයේනුයි තපනීය නම් වේ. නොහොත් එය කරණකොට තැවෙත් යන අරුතින් තපනීය නම් වේ. පසුතැවිල්ල විපිළිසරවීම යන අර්ථයි. එයට හේතුවීම් වශයෙන් හිතවත් යන අරුතින් තපනීයා නම් වේ. **අකත කල්‍යාණො** යනු මොහු විසින් නො කළ කල්‍යාණ (යහපත), භද්‍රක (යහපත), පින ඇත්තේ ය යන අරුතින් අකත කල්‍යාණ නම් වේ. ඉතිරිපද දෙක එයටම සමාන වචනය. පින පැවැත්ම යහපත් බව පිණිස ද මතු සැප ඇති බව පිණිස ද යහපත් අර්ථයෙන් කල්‍යාණ යයි ද සාසව ධර්මයන් සෙලවීම් අරුතින් **කුසල** යයි ද දුකට බියවූවන් සසරට බිය වූවන් රකින අරුතින් **භීරුත්තාණා** යයි ද කියනු ලැබේ. **කතපාපො** යනු මොහු විසින් කරන ලද, රැස්කරන ලද පාපය ඇත්තේය යන අරුතින් කතපාපො නම් වේ. ඉතිරි පදදෙක එයටම සමාන වචනය. අකුශල කර්මය ලාමක අර්ථයෙන් පාප යයි ද තමාගේ (ඒ පාපයේ) පවතින ක්‍ෂණයෙහි ද විපාක ක්‍ෂණයෙහි ද ඝෝර (දරුණු) ස්වභාවයෙන් යුක්ත බැවින් ද **ලුද්දං** යයි ද කෙලෙස් කරණකොට ඇතිවන දුශ්ශීල ස්වභාවයෙන් **කිබ්බිසං** යයි ද කියනු ලැබේ.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ 'ද්වෙ ධම්මා තපනීයා' පසුතැවිල්ලට හේතුවන ධර්ම (කරුණු) දෙකක් යනුවෙන් ධර්මාධිෂ්ඨාන (ධර්මය මුල්කිරීම්) වශයෙන් උදෙසා (මාතෘකාව තබා) 'අකතං කුසලං ධම්මං කතඤ්ච අකුසලං ධම්මං' නොකළ කුශල ධර්මය ද කළ අකුසල ධර්මය ද

යනුවෙන් පුද්ගල අධිෂ්ඨාන (පුද්ගලයා මුල්කිරීම්) වශයෙන් නිර්දේශ (විස්තර) කළහ. දැන් ඒ ධර්මයන්ගේ පසුතැවිල්ලට හේතුවන බව දක්වමින් **සො අකතං මෙ කල්‍යාණනති තපපති කතං මෙ පාපනති තපපති** යනුවෙන් වදාළහ. සිත තැවීමෙන් තවයි, පසුතැවෙයි, ශෝක කරයි යන අර්ථයි.

ගාථාවල - දුෂ්ට චරිතය හෝ කෙලෙස්වලින් කුණු වූ බැවින් හෝ දුෂ්ට චරිතය = **දුච්චරිතං,** කයින් කරන දුසිරිත හෝ කායික වශයෙන් පැවති දුසිරිත හෝ කාය දුශ්චරිතය යි. මෙසේ වචී, මනෝ දුශ්චරිතද දතයුතුය. මේ කාය දුශ්චරිතාදිය කර්මපථ බවට පැමිණි ඒවා ලෙස අදහස් කරනු ලැබේ. කර්මපථ බවට නොපැමිණි අකුසලයක් වූ දේ සඳහා **යඤ්චඤ්ඤං දොසසඤ්හිතං** යනුවෙන් වදාළහ. එහි අර්ථය: කර්මපථ බවට නොපැමිණි නිෂ්පරියාය (වෙනත් ක්‍රමයක් නැති) වශයෙන් කාය කර්මාදී සංඛ්‍යාවට නො යන රාගාදි කෙලෙස් සමග ඇලුණු දොස් සහිත අකුසලයක් ඇත්නම් එයද සිදුකොට යන අර්ථයි. **නිරයං** යනු ආශ්වාද නැති අරුතින් නිරය යනුවෙන් ලබන ලද නම් ඇති සියලුම දුගති. එබඳු වූ ඒ පුද්ගලයා අය සංඛ්‍යාත සැප ප්‍රතික්ෂේපයෙන් සැමතන්හි සුගති දුර්ගතිවල නිරය දුකට එළඹෙයි යනුවෙන් මෙසේ මෙහි අර්ථය දතයුතුය. කාය දුශ්චරිතය පිළිබඳ මේ පසුතැවීම් භාවයෙහි නන්ද යක්ෂයා නන්ද මාණවකයා නන්ද ගව ඝාතකයා දෙසොහොයුරන් යන මොවුන්ගේ කතා පුවත් කිවයුතුය.

ඒ දෙසොහොයුරෝ එළදෙනක මරා මස් දෙකොටසක් කළහ. ඉන්පසු මල්ලී මට දරුවන් බොහෝ ඇත. මට මේ බඩවැල් දෙක දෙන්නැයි අය්යාට කීය. එවිට අයියා සියලු මස් දෙකට බෙදන ලදී. නැවත කුමක් ඉල්ලන්නෙහිදැයි කියා මල්ලීට පහරදී මරණයට පත්කළේය. ආපසු හැරී බලන අයියා ඔහු මළබව දැක මවිසින් බරපතල දෙයක් කරන ලදී. ඒ මම නිකරුණේ ම ඔහු මැරුවෙමියි සිතක් ඉපදවීය. ඉක්බිති ඔහුට බලවත් පසුතැවිල්ලක් ඇතිවිය. ඔහු සිටගෙන සිටින තැනදී ද හිඳගෙන සිටින තැනදී ද ඒ කර්මය ම සිහිකරයි. සිතට සැනසුමක් නොලබයි. අනුභව කරන ලද පානය කරන ලද කන ලද දේවල ඔජාව සිරුරෙහි නොපැතිරෙයි. ඇට සම් පමණක් ම විය.

ඉක්බිති එක් තෙරුන්වහන්සේ නමක් 'උපාසක, ඔබ ඉතාම කෙට්ටුය. ඇටසම් පමණක් ඇත. ඔබේ රෝගය කෙබඳු ද? නැතිනම් කිසියම්

පසුතැවිලි වන කර්මයක් කරන ලදදැ'යි ඔහුගෙන් විමසීය. හෙතෙම එසේය, ස්වාමීනියි කියා සියල්ල දැන්වීය. ඉක්බිති උන්වහන්සේ 'උපාසක ඔබ විසින් බැරෑරුම් කර්මයක් කරන ලදී. අපරාධයක් නොවන තැනක අපරාධයක් කරන ලදැ'යි ඔහුට කීහ. හෙතෙම ඒ කර්මයෙන් ම කලුරියකොට නිරයෙහි උපන්නේය. වචී දුශ්චරිතයට සුප්‍රබුද්ධ ශාක්‍ය, කෝකාලික, චිංචිමානවිකාදීන්ගේ කතා පුවත් කිවයුතුය. මනෝ දුශ්චරිතයට උක්කල ජයභඤ්ඤාදීන්ගේ කතා පුවත් කිවයුතුය.

**තෙවන සූත්‍ර වර්ණනාවයි.**

## 2.1.4

සතරවන සූත්‍රයෙහි - තෙවන සූත්‍රයට කියන ලද ආකාරයට විරුද්ධ ආකාරයෙන් අර්ථ දතයුතුය.

**සතරවන සූත්‍ර වර්ණනාවයි.**

## 2.1.5

පස්වන සූත්‍රයෙහි **පාපකෙන සීලෙන** යනු ලාමක වූ සීලය, සීලය බිඳීම සිදුකරන අසංවරයයි කියති. එහි ඉදින් දුශ්ශීල භාවයෙන් ඒ අසීලයම අසංවරය වේ. කෙසේ සීලයයි කියනු ලැබේ ද? එහිලා මේ අදහස වන්නේයඃ ලෝකයෙහි නොදක්නා ලද්ද දක්නා ලදැයි කියනු ලැබේද සිල් නැති තැනැත්තා සිල්වතෙකැයි කියනු ලැබේ ද එසේම මෙහි අසීලයත් අසංවරයත් සීලයයි ව්‍යවහාර කරනු ලැබේ. නැතහොත් **'කතමෙ ච ගහපති අකුසලා සීලා අකුසලං කායකම්මං අකුසලං වචීකම්මං**

**පාපකො ආජීවො**[1] 'ගෘහපතිය, අකුසල සීල යනු කවරක් ද? අකුසල වූ කාය කර්මය, අකුසල වූ වචීකර්මය ලාමක වූ දිවිපැවැත්මයි' යන වචනයෙන් අකුසල ධර්මයන් කෙරෙහි ද සීල ව්‍යවහාරය ඇත්තේමය. එහෙයින් පුරුද්දක් වශයෙන් ස්වභාවයෙන් සිදු වූ දෙයක් මෙන් ප්‍රකෘතිය වූ සියලු හැසිරීම් සීලය යි කියනු ලැබේ.

එහි යමක් අදක්‍ෂභාවයෙන් උපන් අර්ථයෙන් අකුසල වේද ලාමක වේද ඒ සඳහා 'පාපකෙන සීලෙන' යයි කීහ. **පාපිකාය දිට්ඨියා** යනු සියලු මිථ්‍යාදෘෂ්ටි ලාමකම ය. විශේෂ වශයෙන් අහේතුක දෘෂ්ටිය, අකිරිය දෘෂ්ටිය, නාස්තික දෘෂ්ටිය යන මේ දෘෂ්ටි තුන වඩාත් ලාමකය. එහි ලාමක වූ සීලයෙන් යුක්ත වූ පුද්ගලයා ප්‍රයෝග විපතට පත්වූයේ වෙයි. ලාමක වූ දෘෂ්ටියෙන් යුක්ත වූ පුද්ගලයා ආසය විපතට පත්වූයේ වෙයි. මෙසේ ප්‍රයෝග හා ආසය විපතට පත් වූ පුද්ගලයා නිරයට එළඹෙන්නෙක් වේමය. එහෙයින් '**ඉමෙහි ඛො භික්ඛවෙ ද්වීහි ධම්මෙහි සමන්නාගතො පුග්ගලො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ**' 'මහණෙනි, මේ ධර්ම දෙකින් යුක්ත වූ පුද්ගලයා ගෙන එන ලද දෙයක් බිම තබන්නාක් මෙන් නිරයෙහි උපදී' මෙහි 'ද්වීහි ධම්මෙහි සමන්නාගතො' යන මේ ලක්‍ෂණ වචනය දතයුතුය යනු නිර්දේශයයි (මාතෘකාවයි) එය 'ඉදින් මොව්හු ආබාධිතයෝ වෙත්නම් මොවුන්ට මේ බෙහෙත දිය යුතුය'යි ලෝකයෙහි යම් නිර්දේශයක් (නියම කිරීමක්) ඇද්ද එමෙනි. මෙබඳු අනිත් තැන්වලද මේ ක්‍රමයමයි. **දුප්පඤ්ඤා** යනු ප්‍රඥාව නැති තැනැත්තා.

**පස්වන සූත්‍රයයි.**

## 2.1.6

සයවන සූත්‍රයෙහි **භද්දකෙන සීලෙන** යනු කාය සුචරිතාදී චතුපාරිශුද්ධි ශීලයෙන්. එය අඛණ්ඩ (නො කැඩුණු) සීල ස්වභාවයෙන් ද සීලය තමාට යහපත් බැවින් ද සමථ විදර්ශනාදී යහපත් ගුණ කැඳවන

1. මජ්ඣිම නිකාය - ම.ප. - සමණ මණ්ඩික සුත්ත

බැවින් ද භද්දක යයි කියනු ලැබේ. **භද්දිකාය දිට්ඨියා** යනු කම්මස්සකත (කර්මය තමා අයත්කොට ඇතැයි යන) ඥාණයෙන් ද කර්මපථ සම්මා දිට්ඨියෙන් ද එහි යහපත් (භද්දක) වූ සීලයෙන් ප්‍රයෝග සම්පන්න පුද්ගලයෙක් වෙයි. යහපත් වූ දෘෂ්ටියෙන් ආසය සම්පන්න පුද්ගලයෙක් වෙයි. මෙසේ ප්‍රයෝග හා ආසය යන දෙකින් යුක්ත පුද්ගලයා ස්වර්ගයට යන්නේ වෙයි. එහෙයින් **ඉමෙහි බො භික්ඛවෙ ද්වීහි ධම්මෙහි සමන්නාගතො පුග්ගලො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ** 'මහණෙනි, මේ ධර්ම දෙකින් යුක්ත වූ පුද්ගලයා ගෙන එන ලද්දක් බිම තබන්නාක් මෙන් ස්වර්ගයෙහි උපදී' යනුවෙන් වදාරන ලදී. **සප්පඤ්ඤො** යනු ප්‍රඥාවන්ත පුද්ගලයා. ඉතිරිය පහසුවෙන් දතහැක්කේම ය.

**සයවන සූත්‍රයයි.**

# 2.1.7

සත්වන සූත්‍රයෙහි **අනාතාපී** යනු කෙලෙසුන් තවන අර්ථයෙන් ආතාප නම් වේ. වීර්යය යි. එය මොහුට ඇත්තේය යන අරුතින් ආතාපී නම් වේ. ආතාපී නොවන්නේ අනාතාපී නම් වේ. සම්‍යක් ප්‍රධානයෙන් තොරවූ කුසීත පුද්ගලයායි කියන ලද්දේ වෙයි. පාපයට තැතිගැනීම ඔත්තාපයයි කියනු ලැබේ. එය ඔහුට ඇත්තේය යන අරුතින් ඔත්තාපී නම් වේ. ඔත්තාපී නො වන්නේ අනොත්තාපීය. ඔත්තාපය (පාපයට තැතිගැනීම) නැති තැනැත්තා නොහොත් වීර්යයට විරුද්ධ වූයේ අනාතාප නම්. කුසීත බවයි. එය මොහුට ඇත්තේය යන අරුතින් අනොත්තාපී නම් වේ. '**යං න ඔත්තප්පති ඔත්තප්පිතබ්බෙන න ඔත්තප්පති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා**'[1] 'යමකින් බියවිය යුත්තට බිය නොවේද ලාමක අකුසල ධර්මවලට පැමිණීමට (පත්වීමට) බිය නොවේද?'

1. ධම්ම සංගණිප්පකරණ - නික්ඛේප කණ්ඩ - බු.ජ.මු. 484 පිට

මෙසේ කියන ලද ඒ පාපයට බිය නොවීම අනොත්තාපය යි. එය මොහුට ඇත්තේය යන අරුතින් අනොත්තාපී යනුවෙන් මෙසේ මෙහි අර්ථය දතයුතුය. **අභබ්බා** යනු නුසුදුසු. **සම්බොධාය** යනු ආර්ය මාර්ගය පිණිස. **නිබ්බාණාය** යනු කෙලෙසුන් අතිශයින් සන්සිඳීම පිණිස අමෘතමහා නිර්වාණය පිණිස. **අනුත්තරස්ස යොගක්ඛෙමස්ස** යනු අර්හත් ඵලය පිණිස, එයට වැඩියෙන් උසස් දෙයක් නැති බැවින් අනුත්තර වූ, සතර යෝගයන්ගෙන් තූපන් බැවින් ක්ෂේමය නිර්භයය යන අරුතින් යොගක්ඛෙමයයි කියනු ලැබේ. **අධිගමාය** යනු පැමිණීම පිණිස. **ආතාපී** යනු වීර්යය ඇති පුද්ගලයා, හෙතෙම 'අකුසල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුශල ධර්මයන්ගේ වැඩීම පිණිස අරඹන ලද වීර්ය ඇත්තේ බලවත් වූයේ දැඩි වූ උත්සාහය ඇත්තේ කුශල ධර්මයන්හි ඉවත් නොකළ වීර්ය ඇත්තේ වාසය කරයි' යනුවෙන් මෙසේ කියන ලද වීර්ය ආරම්භයෙන් යුක්ත වූයේ කෙලෙසුන් අතිශයින්ම තවන ස්වභාවය ඇත්තේ යන අරුතින් ආතාපී නම් වේ. **ඔත්තාපී** යනු

**යං ඔත්තප්පති, ඔත්තප්පි තබ්බෙන ඔත්තප්පති**
**පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා**[1]

'යමකින් බියවිය යුත්තට බියවේද, ලාමක වූ අකුශල ධර්මයන්ගේ පැමිණීමට (පත්වීමට) බියවේද' යනුවෙන් මෙසේ කියන ලද ඔත්තප්පයෙන් (පාපයට බියවීමෙන්) යුක්ත වූ බැවින් ඔත්තප්පන සීලය (පාපයට බියවන ස්වභාවය) ඔත්තාපී නම් වේ. මෙය ඔත්තාපී යයි කියන ලදී. එයින් තොර නොවූ බැවින් පාපයට ඇති ලජ්ජාවෙන් ද යුක්ත වූයේ ම වෙයි යන අරුතින් හිරිඔතප් දෙකින් යුක්ත වූයේ අනුමාත්‍ර වූ ද වරදෙහි බියදක්නා සුලු වූයේ සීලය සම්පූර්ණ කරන්නෙක් වෙයි. මෙසේ මොහුගේ සීල සම්පදාව දක්වන ලද්දේ වෙයි.

'ආතාපී' යනු මේ ක්‍රමයෙන් මොහුගේ කෙලෙස් තවන ලද බව දැක්වීමෙන් සමථ විදර්ශනා භාවනාවෙහි යෙදුණු බව දක්වන ලදී. කියන ලද ආකාර ඇති වීර්යයද ශ්‍රද්ධා-සති-සමාධි-ප්‍රඥාවන්ගෙන් තොර නොවෙයි යනුවෙන් විමුක්තිය මුහුකුරුවන (මෝරවන) ශ්‍රද්ධාව පස්වනුකොට ඇති ඉන්ද්‍රිය අර්ථ වශයෙන් කියන ලද්දේම වෙයි. ඒ

1. ධම්ම සංගණිප්පකරණ - නික්ඛේප කණ්ඩ - බු.ජ.මු. 484 පිට

ඉන්ද්‍රිය ධර්ම සිද්ධ වූ කල්හි අනිත්‍ය සංඥාවත් අනිත්‍යයෙහි දුක්ඛ සංඥාවත්, දුකෙහි අනත්ත සඤ්ඤාව, පහාණ සඤ්ඤාව, විරාග සඤ්ඤාව, නිරෝධ සඤ්ඤාව යන නිබ්බේධභාගිය (ආර්ය මාර්ගයට අදාළ) සඤ්ඤා හය සිද්ධවූයේ ම වෙයි යනුවෙන් මෙසේ මේ ධර්ම දෙකින් යුක්ත තැනැත්තාගේ ලෞකික සීල-සමාධි-ප්‍රඥාවන්ගේ සිදුවීමෙන් මාර්ග-ඵල-නිවනට පැමිණීම පිණිස සුදුසු බව දක්වමින් 'ආතාපී ඛො භික්ඛවෙ -පෙ- අධිගමාය' යනුවෙන් වදාළහ.

ගාථාවන්හි - **කුසීතො** යනු මිථ්‍යා විතර්ක (වැරදි කල්පනා) බහුල බැවින් කාම-ව්‍යාපාද-විහිංසා නම් වූ පිළිකුල් පාපධර්මවලින් ආශ්‍රිත වූයේ සම්බන්ධ වූයේ යුක්ත වූයේය යන අරුතින් කුසීත නම් වෙයි. පිළිකුල් දහමට ගිලාබසී (සීදති) හෝ යහපත් ප්‍රතිපත්තියෙන් බැහැරවෙයි (අවසීදති) යන අරුතින් (සීදති, අවසීදති යන තැන්වල ඇති 'ද' කාරයට 'ත' කාරය කොට කුසීත නම් වේ. **හීන වීරියො** යනු වීර්ය නැති, සතර ඉරියව්වෙහිම වීර්ය කිරීමෙන් තොර වූයේ, අනුත්සාහයෙහි ස්ථිර වූ ස්වභාවය ඇති සිතේ අලස බව නම් වූ ථීනයේ ද සම්පත් නැතිකරන කයේ (චෛතසිකයේ) අලස බව නම් වූ මිද්ධයේ ද නිතර පැවතීමෙන් ථීනමිද්ධය බහුලකොට ඇත්තේ. පාපයට පිළිකුල් කරන ලක්‍ෂණය නම් වූ හිරිය නැති බැවින් ද එයට ප්‍රතිවිරුද්ධ වූ අහිරිකයෙන් යුක්ත වූ බැවින් ද **අහිරිකො** නම් වේ. හිරි-ඔතප්-වීර්ය නැති බැවින් යහපත් ප්‍රතිපත්තිය කෙරෙහි ඔහුගේ ආදරයක් නැත යන අරුතින් **අනාදරො** නම් වේ. දෙයාකාරයෙන් ම එබඳු ස්වභාව ඇති පුද්ගලයා විසින් (හිරිඔතප් හා වීර්ය යන) දෙවැදෑරුම් ක්‍රියා නොකිරීමෙන් අනාදර නම් වේ.

**ඵුට්ඨුං** යනු ස්පර්ශ කරන්නට, **සම්බොධි මුත්තමං** යනු සම්බෝධි නම් වූ උතුම් වූ අර්හත් බව ලබන්නට නුසුදුසුය යන අර්ථයි. **සතිමා** යනු බොහෝ කලකට පෙර කරන ලද දේ ද කියන ලද දේ ද සිහිකිරීමෙහි සමත් වූ සිහිය හා ප්‍රඥාව ඇති බැවින් සතර සතිපට්ඨානයෙහි යෙදීමෙන් සිහි ඇති **නිපකො** යනු සත්තැනක පවතින සම්පජඤ්ඤ නම් වූ ද කමටහන් පරිහරණය කරන ප්‍රඥාව නම් වූ ද නුවණින් යුක්ත වූ බැවින් නිපකො නම් වේ. **ඣායී** යනු අරමුණ නැවත නැවත සිතීමෙන් ද ලක්‍ෂණ නැවත නැවත සිතීමෙන්දැයි යන ධ්‍යාන දෙකෙන් ම ධ්‍යාන ඇත්තේ. **අප්පමත්තො** යනු **දිවසං චංකමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති**' 'දවාලෙහි සක්මනෙන් ද හිඳීමෙන් ද

ආවරණ (නීවරණ) ධර්මවලින් සිත පිරිසිදු කරයි' යනාදී ක්‍රමයෙන් කමටහන භාවනා කිරීමෙන් අප්‍රමාද වූයේ.

**සංයෝජනං ජාතිජරාය ඡෙත්‍වා** යනු ජාතියෙන් මෙන් ම ජරාවෙන් ද සත්ත්වයන් එකට සම්බන්ධ කරයි යන අරුතින් සංයෝජන යනුවෙන් ලබන ලද නම් ඇති කාමරාගාදී දසවිධ වූ උපන් කෙලෙස් අනුසය නැසීම් වශයෙන් සහමුලින් උපුටා දමා, නැතහොත් 'සංයොජනං ජාතිජරාය ඡෙත්‍වා' යනු ජාති ජරාවේ සංයෝජනය සිඳදමා, සංයෝජන සිඳ නො දමන ලද තැනැත්තාගේ ජාති, ජරා නො සිඳන ලද්දේ සහමුලින් උපුටා නොදමන ලද්දේම වෙයි. යමෙකුගේ සංයෝජන සිඳින ලද ද ඔහුගේ ජාති ජරා සිඳ දමන ලද්දේම ය. කාරණය (හේතුව) සහමුලින් උපුටා දමන ලද හෙයිනි. එහෙයින් සංයෝජන සිඳ දමන තැනැත්තාම ජාතිජරා ද සිඳියි. එහෙයින් 'සංයෝජනං ජාති ජරාය ඡෙත්‍වා' යි කියන ලදී. **ඉධෙව සම්බොධිං මනුත්තරං ඵුසෙ** යනු මේ ආත්ම භාවයෙහි ම අග්‍ර මාර්ගය වූ අර්හත්වය හෝ ස්පර්ශ කරන්නේය. අර්හත්වයට පැමිණෙන්නේ ය.

සත්වන සූත්‍රයයි.

# 2.1.8

අටවන සූත්‍රයෙහි **නයිදං** යන මෙහි 'න' යනු ප්‍රතික්ෂේප කිරීමෙහි නිපාතය යි. එයට (න කාරයට) 'වුසසති' යන මේ පදයෙන් සම්බන්ධය ඇතිවෙයි. 'ය' කාරය පද සන්ධි කරයි. 'ඉදං' ශබ්දය '**එකමිදාහං භික්ඛවෙ සමයං උක්කට්ඨායං විහරාමි සුභගවනෙ සාලරාජමූලෙ**'[1] 'මහණෙනි, මම එක් කලෙක උක්කට්ඨා නුවර සුභග වනයෙහි සාලරාජ මූලයෙහි වාසය කරමි' යනාදියෙහි (එකං-ඉදං-අහං) නිපාත මාත්‍රයකි. 'ඉදං ඛො තං

---

1. ම.නි. - මූ.ප - බ්‍රහ්ම නිමන්තනික සුත්ත

භික්ඛවෙ අප්පමත්තකං ඔරමත්තකං සීලමත්තකං'[1] 'මහණෙනි, (තථාගතයන්ගේ ගුණ කියන පෘථග්ජන තෙමේ යමකින් එය කියන්නේ නම්) මේ (ඔහු කියන) ඒ ගුණය මඳ වූ සුළු වූ සිල් පමණක්ම වූ එකකි' යනාදියෙහි කියන ලද පරිදි ආසන්න ප්‍රත්‍යක්ෂයෙහි ආයේය.

ඉදං හි තං ජෙතවනං ඉසිසංඝ නිසෙවිතං
ආවුත්ථං ධම්ම රාජෙන පීති සංජනනං මම'[2]

'භික්ෂු සමූහය විසින් නිතර ඇසුරුකරන ලද ධර්මරාජයන් වූ බුදුරජාණන් වහන්සේ විසින් වාසයකරනලද ඒ මේ ජේතවනය මට ප්‍රීතිය උපදවන්නේම ය' යනාදියෙහි කියන්නා වූ ආසන්න ප්‍රත්‍යක්ෂයෙහි ආයේය. මෙහි ද කියන්නා වූ ම ආසන්න ප්‍රත්‍යක්ෂයෙහි යයි දතයුතුය.

බ්‍රහ්මචරිය ශබ්දය :

1. කිං තෙ වතං කිං පන බ්‍රහ්මචරියං
කිස්ස සුචිණ්ණස්ස අයං විපාකො
ඉද්ධී ජුතීබලවිරියූපපත්ති
අක්ඛාහි මෙ නාග මහාවිමානං

නාරජතුමනි, පෙර භවයෙහි කවර ව්‍රතයක් පුරුදු කළේ ද? කිනම් බ්‍රහ්මචර්යාවක් පුරුදු කළේ ද? මෙය කවර කර්මයක විපාකයක් ද? නාග සෘද්ධිය, නාග තේජස, කායික හා චෛතසික බලය හා නා ලොව උපතද මේ මහා විමානය ද කෙසේ ලද්දේ ද?

අහඤ්ච භරියා ච මනුස්සලොකෙ
සද්ධා උභො දානපතී අහුම්හ
ඔපානභූතං මෙ ඝරං තදාසි
සන්තප්පිතා සමණ බ්‍රාහ්මණා ච

පණ්ඩිතුමනි, පෙර මිනිස් ලොව දී මම ද මාගේ බිරිඳ ද යන අපි දෙදෙනා ශ්‍රද්ධා ඇති දානපතීහු වීමු. මාගේ නිවෙස එකල පැන්හලක් වැන්න. අප විසින් මහණ බමුණෝ ද තෘප්තියට පත්කරන ලද්දෝය.

1. දී.නි - බ්‍රහ්මජාල සුත්ත
2. සං.නි. - දේවපුත්ත සංයුත්ත

**තමෙමවතං තං පන බ්‍රහමචරියං**
**තසස සුචිනනසස අයං විපාකො**
**ඉඩ්ඪි ජුතීබල විරියූපපතති**
**ඉදඤච මෙ ධීර මහා විමානං**

පණ්ඩිතුමනි, එය මගේ ව්‍රත සමාදානයයි. එය මගේ බඹසරය. මනාසේ පුහුණු කළ කුශල කර්මයන් නිසා නාග ඍද්ධිය, නාග තේජස, නාග බලය කායික චෛතසික වීරිය නාලොව උපත සහ මාගේ මහා විමානය ද යන මේවා ලදිමි.

මේ පුණ්ණක (විධුර) ජාතකයෙහි දානයෙහි ආයේය.*

2. **කෙන පානි කාමදදො - කෙන පානි මධුසසවො**
**කෙන තෙ බ්‍රහමචරියෙන - පුඤඤං පානිමහි ඉජඣති**

කුමන පුණ්‍ය කර්මය හේතුවෙන් ඔබගේ අත කැමති සම්පත් දෙන්නේ වේද? කුමන හේතුවෙන් ඔබගේ අත කැමති වස්තු වගුරුවන්නේ වේද? ඔබගේ කුමන උතුම් හැසිරීමක හේතුවෙන් ඔබ අතෙහි පින්ඵල පහළ වේද?

**තෙනපානි කාමදදො - තෙන පානි මධුසසවො**
**තෙන මෙ බ්‍රහමචරියෙන - පුඤඤං පානිමහි ඉජඣති**

ඒ පුණ්‍ය කර්මය හේතුවෙන් මාගේ අත කැමති සම්පත් දෙන්නේ වෙයි. ඒ හේතුවෙන් මාගේ අත කැමති වස්තු වගුරුවන්නේ වෙයි. මාගේ ඒ උතුම් හැසිරීම හේතුවෙන් මා අතෙහි පින් ඵල පහළ වෙයි.

මේ අංකුර ප්‍රේත වස්තුවෙහි වතාවත් කිරීමෙහි ආයේය.

3. **ඉදං බො තං භිකඛවෙ තිතතිරියං නාම බ්‍රහමචරියං අහොසි**

'මහණෙනි, ඒ මේ තිත්තිරිය නම් වූ බ්‍රහ්මචර්යාවක් විය' යනුවෙන් මේ තිත්තිර ජාතකයෙහි පන්සිල්හි ආයේය.

---

* (ජාතක පාළි - බු.ජ.මු. 3 භාගය 278 - 280 පිට)

4. **තං ඛො පන පඤ්චසිඛ බ්‍රහ්මචරියං නෙව නිබ්බිදාය න විරාගාය -පෙ- යාවදෙව බ්‍රහ්මලොකූපපත්තියා**

පංචසිඛ ඒ බ්‍රහ්මචර්යාව කළකිරීම පිණිස නොවේම ය, නො ඇලීම පිණිස නොවේම ය. බඹලොව ඉපදීම පිණිස ම පවතී යනුවෙන් මේ මහා ගෝවින්ද සූත්‍රයෙහි බ්‍රහ්ම විහාරයෙහි ආයේය.

5. **පරෙ අබ්‍රහ්මචාරී භවිස්සන්ති මයමෙත්ථ බ්‍රහ්මචාරිනො භවිස්සාම'**

අන්‍යයෝ බඹසර නොහැසිරෙන්නෝ වන්නාහුය. අපි මෙහි බඹසර හැසිරෙන්නෝ වන්නෙමු' යනුවෙන් සල්ලේඛ සූත්‍රයෙහි මෛථුනයෙන් වැළකීමෙහි ආයේය.

6. **මයඤ්ච භරියා නාතික්කමාම**
**අම්හෙ ච භරියා නාතික්කමන්ති**
**අඤ්ඤත්‍ර තාහි ච බ්‍රහ්මචරියං චරාම**
**තස්මා හි අම්හං දහරා න මීයරෙ**

අපි ද භාර්යාවන් ඉක්මවා නොයම්හ. භාර්යාවෝ ද අප ඉක්මවා නොයති. ඔවුන් හැර අනෙක් ස්ත්‍රීන් කෙරෙහි බඹසර හැසිරෙම්හ. එහෙයින් අපගේ බාලයෝ නොමැරෙති.

යනුවෙන් මහා ධම්මපාල ජාතකයෙහි තම බිරිඳගෙන් සතුටු වීමෙහි (සදාර සන්තොසයෙහි) ආයේය.

7. **අභිජානාමි ඛො පනාහං සාරිපුත්ත චතුරංගසමන්නාගතං**
**බ්‍රහ්මචරියං චරිතා තපස්සී සුදං හොමි**

'ශාරිපුත්‍රය, මම අංග සතරකින් යුක්ත වූ බඹසර හැසිරුනෙමි යි දනිමි. තපස් ඇත්තෙම් වෙමි.' යනුවෙන් ලෝමහංස (මහාසීහනාද) සූත්‍රයෙහි වීර්යයෙහි ආයේය.

8. **හීනෙන බ්‍රහ්මචරියෙන ඛත්තියෙ උපපජ්ජති**
**මජ්ඣිමෙන ච දෙවත්තං උත්තමෙන විසුජ්ඣති**

'හීන වූ බ්‍රහ්මචර්යාවෙන් ක්‍ෂත්‍රියයන් කෙරෙහි උපදී. මධ්‍යම වූ බ්‍රහ්මචර්යාවෙන් දේවත්වයට එළඹේ. උතුම් බ්‍රහ්මචර්යාවෙන් විශුද්ධියට පැමිණේ' යනුවෙන් නිමි ජාතකයෙහි ආත්මදමන වශයෙන් කළ අංග අටකින් යුත් උපෝසථයෙහි ආයේය.

9. **ඉදං ඛො පන පඤ්චසිඛ බ්‍රහ්මචරියං එකන්ත නිබ්බිදාය -පෙ- අයමෙව අරියො අට්ඨංගිකො මග්ගො**

'පංචසිඛ, මේ බඹසර වනාහි ඒකාන්තයෙන් කලකිරීම පිණිස - පෙ- මේ අරිඅටඟ මගමය.' යනුවෙන් මහාගෝවින්ද සූත්‍රයෙහි ආර්ය මාර්ගයෙහි ආයේය.

10. **තයිදං බ්‍රහ්මචරියං ඉද්ධඤ්චෙව ච ඵීතඤ්ච විත්ථාරිකං බාහුජඤ්ඤං පුථුභූතං යාවදෙව මනුස්සෙහි සුප්පකාසිතං**

'ඒ මේ බඹසර සමෘද්ධ ද, වෘද්ධියට පැමිණියේ ද, පැතිර ගියේ ද බොහෝදෙනා විසින් දන්නා ලද්දේ ද, පළල් වූයේ ද, නුවණැති සියලු දෙව් මිනිසුන් අතර මැනවින් ප්‍රකට වූයේ ද යනුවෙන් පාසාදික සූත්‍රයෙහි ශික්‍ෂා තුන ඇතුළත් වූ සියලු ශාසනයෙහි ආයේය.

මෙහි ද ආර්ය මාර්ගයෙහි ද ශාසනයෙහි ද යන අර්ථවල පවතී. **වුසසති** යනු වාසය කරන්නේය, හැසිරෙන්නේය යන අර්ථයි. **ජනකුහනත්ථං** යනු අහෝ, (මේ) උත්තමයා සිල්වත්ය. වත්සම්පන්නය. අල්පේච්ඡය. ලද දෙයින් සතුටු වන්නේය. මහත් ඍද්ධි ඇත්තේය. මහත් ආනුභාව ඇත්තේය යනාදී ක්‍රමයෙන් ජනයාට සත්ත්වලෝකයාට පුදුමය දැනවීම පිණිස. **ජනලපනත්ථං** යනු මෙබඳු උත්තමයෙකුට දෙන ලද්ද මහත්ඵල වන්නේයයි පැහැදුනු සිත් ඇත්තවුන් විසින් කුමකින් ප්‍රයෝජනයක් ඇත්ද, කුමක් ගෙන ආ යුතුද යනුවෙන් මිනිසුන් ලවා කියවීම පිණිස. **ලාභ - සක්කාර - සිලොකානිසංසත්ථං** යනු 'මහණෙනි, මහණෙක් තෙමේ චීවර - පිණ්ඩපාත - සේනාසන - ගිලන්පස - බෙහෙත් පිරිකර ලබන්නෙක් වන්නෙමියි කැමති වන්නේ නම් ශීලයම සම්පූර්ණ කරන්නෙක් වන්නේය' යන සීලානිසංස භාවයෙන් කියන ලද සිවුපස ලාභයෙක් වේද, සිවුපසය සකස්කොට දීම නම් වූ ආදර - බහුමාන - ගරුකිරීම නම් වූ සත්කාරය යන යමක් වේද 'මොහු සිල්වතෙකි, බහුශ්‍රැතයෙකි, ඇසූ දේ මතකයෙහි

තබාගන්නෙකි, ඇරඹූ වීර්යය ඇත්තෙකි' ආදී ක්‍රමයෙන් උස්ව නැගෙන ස්තුති ඝෝෂා නම් වූ යම් ශ්ලෝකයක් වේද මේවා බඹසර හැසිරෙන්නවුන්ගේ මෙලොව ආනිසංසය. ඒ සඳහා 'ජනතාව මා ගැන මෙසේ දැනගනීවා' යනුවෙන් මෙසේ බඹසර විසීමක් ඇතිකල්හි, මොහු සිල්වතෙකි, යහපත් ධර්ම ඇත්තෙකි ආදී වශයෙන් ජනතාව මා ගැන දැනගනීවා, ගරුකරවා යනුවෙන් තමා තුළ ඇති ගුණ වශයෙන් බුහුමන් ලැබීම පිණිස ද යන කාරණය 'නයිදං බ්‍රහමචරියං වුසසති' (මේ බඹසර වසනු නොලැබේ) යන්නට සම්බන්ධ කරගත යුතුය.

ඇතැමෙක් 'ජනකුහනත්‍ථං' යන්නෙන් පහත් ආසාවක් ඇති ආසාවන්ගෙන් මඩනා ලද තැනැත්තාගේ සාමන්න ජප්පන (තමා තුළ නැති ගුණ ඇති ලෙස කීමෙන් ජනතාව විශ්මයට පත්කිරීම), ඉරියාපථ සන්නිස්සිත (යාම් ඊම් ආදියෙන් ජනතාව විශ්මයට පත්කිරීම), පච්චය පටිසේධන (වැඩියෙන් ලබාගනු කැමතිව මුලදී ලැබෙන චීවරාදිය ප්‍රතික්ෂේප කිරීම) නම් වූ ත්‍රිවිධ කුහන වස්තුවෙන් කුහන භාවයෙන් ජනතාව විශ්මයට පත්කිරීම පිණිස යන කාරණය අදහස් කරන බවත් එසේම 'ජනලපනත්‍ථං' යන්නෙන් පහත් ආසාවක් ඇති තැනැත්තාගේ සිවුපසය පිණිස පරිකථා (අවශ්‍ය දේ ලැබෙන ආකාරයට කථා කිරීම) ඔභාස (සිවුපසය ගැන කථා කිරීම) ආදී වශයෙන් ලපනා (චාටු කථා) වශයෙන් හෝ උල්ලපන (දායකයා උසස් කොට කථා කිරීම) වශයෙන් හෝ ජනතාවට කථා කිරීම පිණිස යන කාරණය අදහස් කරන බවත් එසේම 'ලාභ සක්කාර සිලොකානිසංසත්‍ථං' යන්නෙන් පහත් ආසාවන් ඇති තැනැත්තාගේ ලැබීම් වශයෙන් ගරුබවත් ලාභසත්කාර කීර්ති නම් වූ ආනිසංසත් යන දෙකම ලබාගැනීම පිණිස (නිෂ්පාදනය පිණිස) යන කාරණය අදහස් කරන බවත් **ඉති මං ජනො ජානාතු** යනු පහත් ආසාවක් ඇති තැනැත්තාගේ තුමා තුළ නැති ගුණයන්ට ගරුකරවා ගැනීමේ අදහසින් මෙසේ මා ගැන ජනතාව දැනගනීවා යි යනුවෙන් මේ බඹසර නොවසනු ලැබේ යයි මෙසේ මෙහි අර්ථය කියති.

මුලින් කියන ලද අර්ථය වඩාත් සාරවත්ය. අථ ඛො යන මෙහි 'අථ' යනු අන්‍ය යන අර්ථ ඇති නිපාතයකි. 'ඛො' යනු අවධාරණය කිරීමේ නිපාතයකි. එයින් කුහනාදියෙන් අන්‍ය අර්ථයක් සඳහා ම 'ඉදං භික්ඛවෙ බ්‍රහමචරියං වුසසති' යනුවෙන් දක්වති. ඒ ප්‍රයෝගය දක්වමින් 'සංවරත්‍ථාය පහානත්‍ථාය' යයි කීහ. එහි සංවරය, පාතිමොක්ඛ සංවරය.

සති සංවරය, ඤාණ සංවරය, ඛන්ති සංවරය, විරිය සංවරය යනුවෙන් පස් ආකාරය.

එහි 'ඉමිනා පාතිමොක්ඛ සංවරෙන උපෙතො හොති සමුපෙතො'[1] 'මේ ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් යුක්ත වූයේ මනාව යුක්ත වූයේ' යනාදී ක්‍රමයෙන් ආවා වූ මෙය ප්‍රාතිමෝක්ෂ සංවරය නම්. එය සීල සංවරයයි කියනු ලැබේ. 'රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති'[2] 'චක්ඛු ඉන්ද්‍රිය රකියි. චක්ඛු ඉද්‍රියයෙහි සංවරයට පැමිණෙයි' යනුවෙන් ආවා වූ මෙය සති සංවරයයි.

යානි සොතානි ලොකස්මිං (අජිතාති භගවා)
සති තෙසං නිවාරණං
සොතානං සංවරං බ්‍රෑමි පඤ්ඤායෙතෙ පිධීයරෙ[3]

'අජිතයෙනි, (යි භාග්‍යවතුන් වහන්සේ වදාළහ.) ලෝකයෙහි රූපාදී ආයතනවල ගලායන යම් තණ්හාදී ස්‍රොතස් (සැඩපහර) ඇද්ද ඒවාට සිහිය ආවරණයකි, රැකවරණයකි. ඒ සිහිය ස්‍රොතස්වල සංවරයයි කියමි. මාර්ග ප්‍රඥාවෙන් ඒ ස්‍රෝතස් වසනු ලැබේ.

මෙසේ ආවා වූ මෙය ඤාණ සංවරයයි.

ඛමො හොති සීතස්ස උණ්හස්ස[4] 'සීත උෂ්ණ ඉවසයි' යනාදී වශයෙන් ආවා වූ මෙය ඛන්ති සංවරය යි.

උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති[5] 'උපන්නා වූ කාම විතර්කය සිත තබා නොගනියි' ආදී වශයෙන් ආවා වූ මෙය විරිය සංවරයයි.

අර්ථ වශයෙන් වනාහි ප්‍රාණඝාතාදියෙන් වැලකීම් වශයෙන් ද වත්පිළිවෙත් කිරීම් වශයෙන් ද පැවති චේතනා ද විරති ද කෙටියෙන්

1. විභංගප්පකරණ - 2 භා - බු.ජ.මු. - ඣාන විභංග
2. ම.නි. - මජ්ඣිම පණ්ණාසකය - සෙඛ සූත්‍රය
3. සුත්ත නිපාත - පාරායන වග්ග - අජිත සූත්‍රය
4. ම.නි. මූලපණ්ණාසකය - සබ්බාසව සූත්‍රය
5. ම.නි. - මූලපණ්ණාසකය - සබ්බාසව සූත්‍රය

කය වචන සංයමයයි. විස්තර වශයෙන් ආපත්ති ස්කන්ධ හත නො ඉක්මවීම සීල සංවරයයි. 'සතිය'ම සති සංවරය යි. නැතහොත් සතිය ප්‍රධාන වූ කුශල ස්කන්ධයයි. 'ඤාණය'ම ඤාණ සංවරයයි. ඉවසීම් වශයෙන් අදොස්සය ප්‍රධාන වශයෙන් පැවති කුශල ස්කන්ධය ඛන්ති සංවරයයි. පඤ්ඤා සංවරයයි, ඇතැමෙක් කියති. කාම විතර්කාදිය සිත තබා නොගැනීම් වශයෙන් පැවති වීර්යයම විරිය සංවරයයි. මේ සංවර අතරින් පළමුවැන්න කාය දුශ්චරිතාදී දුසිල්බව සංවර කිරීම් වශයෙන් 'සංවර' නමි. දෙවැන්න මුළා වූ සිහිය සංවර කිරීම් වශයෙන්ද තෙවැන්න නොදැනීම (අඤ්ඤාණය) සංවර කිරීම් වශයෙන් ද සිවුවැන්න නො ඉවසීම් සංවර කිරීම් වශයෙන් ද පස්වැන්න කුසීතකම සංවර කිරීම් වශයෙන් වැසීම් වශයෙන් සංවරයයි දතයුතුය. මෙසේ මේ සංවරය පිණිස 'සංවරත්ථං' නමි, සංවරය ඇතිකරගැනීම සඳහා යන අර්ථයි.

ප්‍රහාණය ද තදංග ප්‍රහාණ, විෂ්කම්භන ප්‍රහාණ, සමුච්ඡේද ප්‍රහාණ, පටිප්පස්සද්ධි ප්‍රහාණ, නිස්සරණ ප්‍රහාණ යනුවෙන් පස් ආකාරය.

ඒ සම්බන්ධයෙන් යමක් කිවයුතුද එය මුලදී ඒකක නිපාතයෙහි පළමු සූත්‍ර වර්ණනාවෙහි දී කියන ලද්දේම ය. ඒ පස් ආකාර ප්‍රහාණයෙන් ඒ ඒ ආකාරයෙන් රාගාදී කෙලෙසුන් දුරුකිරීම් අර්ථයෙන් හෝ ඉක්මවන අර්ථයෙන් හෝ ප්‍රහාණ පිණිස 'පහානත්ථං' ප්‍රහාණය සිදුකිරීම පිණිස යන අර්ථයි.

එහි සංවරයෙන් සිතට (චිත්ත සන්තානයට) කෙලෙසුන් ඇතුල්වීම වැළැක්වීමද ප්‍රහාණයෙන් කෙලෙසුන් සිතට ඇතුල්වීම වැළැක්වීමත් සහමුලින් උදුරා දැමීමත් කියති. (සංවර-ප්‍රහාණ) යන දෙකින් ම සුදුසු පරිදි කරුණු දෙකම සිදුවේ යයි දතයුතුය. සීලාදී ධර්මයන්ට = සංවර කිරීම් වශයෙන් සංවරය ද දුරුකිරීම් වශයෙන් ප්‍රහාණය ද වෙයි. ගාථාවල **අනීතිහං** යනු මෙලොව ද පරලොව ද උවදුරුවලට 'ඊති' යයි කියනු ලැබේ. ඒ ඊති විනාශ කරයි දුරුකරයි යන අරුතින් 'ඊතිහ' නම් වේ. 'අනු ඊතිහං' යන්න 'අනීතිහං' වෙයි. එනම් ශාසන බ්‍රහ්මචර්යාව හා මාර්ග බ්‍රහ්මචර්යාවයි. නැතහොත් ඊතිහු අනර්ථයන් සමග නැසෙත් යෙත් පවතිත් යන අර්ථයෙන් ඊතිහ නම් වේ. එනම් තෘෂ්ණාදී උපක්ලේශය. මෙහි 'ඊතිහ' නැත යන අරුතින් අනීතිහං නම් වේ. නැතහොත් ඊතිහා යනු කියන ලද ආකාර අර්ථයෙන් තීර්ථක සමය යි. (තීර්ථක දහමයි.)

එයට ප්‍රතිවිරුද්ධ වූ මෙය (සාසන බ්‍රහ්මචර්යාව) අනීතිහං නම් වේ. 'අනිතිහ' යනු ද පාඨයකි. එහි අර්ථය ඒකාන්ත වශයෙන් ගැනීමක් නැති හෙයින් ධර්මයෙන් මෙසේ පිරිහෙති යන අර්ථයෙන් විචිකිච්ඡාව 'ඉතිහං' නම් වේ.

සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ බැවින් අනුශාසනා කළ පරිදි පිළිපදින්නවුන්ට සැක නැති බව සිදුකිරීම් වශයෙන් මෙහි 'ඉතිහං' නැත යන අරුතින් 'අනිතිහං' නමි. අපරප්පච්චය (අනුන්ගේ කීමෙන් විශ්වාස නොකරත් යන අර්ථයි. මෙය 'පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි' යනුවෙන් ද 'අතක්කාවචරො' යනුවෙන් ද කියන ලදී. ගාථාව කීමේ පහසුව පිණිස අනීතිහං යනුවෙන් දීර්ඝ ලෙස කියති.

නිවන නමැති ඔගධයට, පතිට්ඨං (පිහිටට), පාරං (පරතෙරට) යයි යන අරුතින් නිබ්බාණොගධගාමී වෙයි. විමුක්ති රසය ඇති බැවින් ඒකාන්තයෙන් ම නිවනට පමුණුවන්නා යන අර්ථයි. ඒ නිබ්බාණොගධ ගාමිනං නිවන තුළට ගමන් කරන්නා වූ බ්‍රහ්මචර්යාව. **සො** යනු සමතිස් පාරමී පුරා සියලු කෙලෙස් බිඳ අනුත්තර වූ සම්මා සම්බෝධිය අවබෝධ කළා වූ ඒ භාග්‍යවතුන් වහන්සේ. **අදෙසයී** දේශනා කළහ.

එයින් තොරව නිවනට බැසගැනීමක් සිදුනොවන බැවින් ද නිවන අරමුණු නොකොට මාර්ගය නොපවතින බැවින්ද 'නිබ්බාණොගධො' යන්න ආර්ය මාර්ගයට ද කියනු ලැබේ.

එය ද ඒ ඒකාන්ත වූ තැනට පමුණුවමින් ගමන් කරන්නේය යන අර්ථයෙන් නිබ්බාණොගධගාමී නම් වේ. නැතහොත් 'නිබ්බාණොගධගාමිනං' යනු නිවන තුළට යන්නා වූ, මාර්ග බ්‍රහ්මචර්යාව නිවන අරමුණුකොට එය තුළම පවතී යනුයි.

**මහන්තෙහි** යනු මහාත්ම වූ, උදාර අදහස් ඇත්තන් විසින් මහත් වූ නිවන හෝ මහත් වූ ශීලස්කන්ධාදිය හෝ සොයයි, ගවේෂණය කරයි යන අරුතින් මහෙසිනො නම් වේ. එනම් බුද්ධාදී ආර්යයෝය. උන්වහන්සේලා විසින් **අනුයාතො** අනුගමනය කරන ලද්දේ ය. **යථා බුද්ධෙන දෙසිතං** යනු යම්සේ අභිඤ්ඤෙය්‍යාදි ධර්මයන් අභිඤ්ඤෙය්‍යාදි භාවයෙන් ම සම්මා සම්බුදු වූ මා විසින් දේශනා කරන ලදී. මෙසේ යෙ

යමෙක් මේ මාර්ග බ්‍රහ්ම චර්යාව ඒ සඳහා ශාසනයෙහි බ්‍රහ්මචර්යාව ද **පටිපජ්ජන්ති** පිළිපදිති. ඔවුහු මෙලොව පරලොව අර්ථවලින් සුදුසු පරිදි අනුශාසනා කරන්නා වූ **සත්ථු** ශාස්තෘ වූ මගේ **සාසන කාරිනො** අවවාද අනුව ක්‍රියා කරන්නාහු සියලු සංසාර **දුක්ඛස්ස අන්තං** දුකෙහි කෙළවර, නොපැවැත්ම **කරිස්සන්ති** කරන්නාහ. නැතහොත් දුකෙහි කෙළවර වූ නිවන ප්‍රත්‍යක්ෂ කරන්නේය.

අටවන සූත්‍රයයි.

## 2.1.9

නවවන සූත්‍රයෙහි **අභිඤ්ඤත්ථං** යනු කුශලාදී ස්වභාවයෙන් ද ස්කන්ධාදී බෙදීමෙන් ද සියලු ධර්මයන් අති විශිෂ්ට ඥානයෙන් නොවෙනස් වූ ආකාරයෙන් දැනගැනීම පිණිස. **පරිඤ්ඤත්ථං** යනු (කාම-රූප-අරූප යන) භූමි තුනට අයත් ධර්මයන් මේ දුකය යනාදී වශයෙන් වෙන්කොට දැනගැනීම පිණිස ද ඉක්මවීම පිණිස ද. එහි දතයුතු දේ දැනගැනීම චතුස්සත්‍යයට විෂය වෙයි. වෙන්කොට දැනගත යුතු දේ දැනගැනීම දුක්ඛ සත්‍යයට විෂය වෙයි. පහකිරීම ප්‍රත්‍යක්ෂ කිරීම භාවනාවෙන් හා අවබෝධයෙන් තොරව නො පවතින හෙයින් පහකිරීම (පහාන) ආදිය ද මෙහි ගන්නා ලදැයි දතයුතුය. ඉතිරිය මුල් සූත්‍රයෙහි කියන ලද්දේමය.

නවවන සූත්‍රයයි.

# 2.1.10

දසවන සූත්‍රයෙහි **සුඛසොමනස්ස** බහුලො යන මෙහි **සුඛං** යනු කායික සැපය යි. **සොමනස්සං** යනු චෛතසික සැපයයි. එහෙයින් යමෙකුට කායික වූ ද චෛතසික වූ ද සැපය නිතර පවතී ද හෙතෙම සුඛ සොමනස්ස බහුලො කායික - මානසික සැප බහුලකොට ඇත්තේ වේ යයි කියන ලදී. **යොනි** යනු '**චතස්සො ඛො ඉමා සාරිපුත්ත යොනියො**'[1] 'සැරියුත් මේ යෝනි සතරකි' යනාදී තැන්වල ස්කන්ධ කොටස් යෝනි යනුවෙන් ආයේය. 'යොනි හෙසා භූමිජ ඵලස්ස අධිගමාය' 'භූමිජය, ඵලය අවබෝධ කිරීම පිණිස මේ යෝනි (කාරණ) යයි. ආදියෙහි කාරණයයි. '**න චාහං බ්‍රාහ්මණං බ්‍රෑමි යොනිජං මත්තිසම්භවං**'[2] 'මවගේ යෝනියෙන් උපන් බැමිණි මවක කුස උපන්නා හට බ්‍රාහ්මණයයි මම නොකියමි. '**තමෙනං කම්මජා වාතා උබ්බත්තෙත්වා උද්ධංපාදං අධොසිරං සම්පරිවත්තෙත්වා මාතු යොනිමුඛෙ සම්පටිපාදෙති**' 'ඒ මොහු කර්මයෙන් උපන් වාතයෙන් උදුරා පා උඩට හිස යටට සිටින ලෙස පෙරළා මවගේ යෝනි මුඛයෙහි යොදයි' යනාදී තැන්වල මූත්‍ර මාර්ගයයි. මෙහි වනාහි කාරණය අදහස් කරන ලදී. **ආරද්ධා** යනු පටන්ගන්නා ලද්දේ හෝ උත්සාහ කරන ලද්දේ හෝ පරිපූර්ණ කරන ලද්දේ හෝ සම්පාදනය කරන ලද්දේ හෝ.

**ආසවානං ඛයාය** යන මෙහි වැගිරෙත් යන අරුතින් ආසව නම් වේ. ඇසින් ද වැගිරෙති. -පෙ- මනසින් ද වැගිරෙති. ගලාබසිතියි කියන ලද්දේ වෙයි. ධර්ම වශයෙන් ගෝත්‍රභූ තෙක් ද අවකාශ වශයෙන් භවාග්‍රය තෙක් ද වැගිරෙත් යන අරුතින් ආසව නම් වේ. ඒ ධර්ම ද ඒ අවකාශය ද ඇතුල්කොට ගලාබසිති යන අර්ථයි. (ආසවා යන්නෙහි ඇති) මේ 'ආ' කාරය ඇතුලත් කිරීමේ අර්ථ ඇත්තේය. බොහෝ කල් පල්කිරීම් අර්ථයෙන් සුරා ආදිය ආසව වැනිනුයි ආසව නම් වේ. ලෝකයෙහි බොහෝකල් පල්කරන ලද සුරා ආදිය ආසවයයි කියනු ලැබේ. බොහෝ කල් පල්කරන අර්ථයෙන් ඒවාම ආසව වන්නට සුදුසුය.

---

1. මජ්ඣිම නිකාය - මහාසීහනාද සූත්‍රය
2. ධම්මපද - බ්‍රාහ්මණ වර්ගය

**පුරිමා භික්ඛවෙ කොටි න පඤ්ඤායති අවිජ්ජාය ඉතො පුබ්බෙ අවිජ්ජා නාහොසි'**[1]

'මහණෙනි, මෙයින් පෙර අවිද්‍යාව නොවීයයි අවිද්‍යාවේ මුල් කෙළවර නොපෙනේ' යනාදී මෙය කියන ලදී. දික් වූ සංසාර දුක ගලයි යන අරුතින් ආසව නම් වේ. මෙහි කෙලෙසුන් ආසවයයි කියන ලද තන්හි මුල් නිර්වචන යෙදේ. පසුව කී නිර්වචනය කර්මයෙහි යෙදේ. හුදෙක් කර්ම හා කෙලෙස් පමණක් ම ආසව නොවේ. නොයෙක් ආකාර උවදුරුද ආසව නම් වේ.

අභිධර්මයෙහි 'කාමාසව, භවාසව, දිට්ඨාසව, අවිජ්ජාසව යයි ආසව සතරකි' යනුවෙන් කාමරාගාදී කෙලෙස් ආසවයයි ආයේය.

සූත්‍රයෙහි ද

**නාහං චුන්ද දිට්ඨධම්මිකානං යෙව ආසවානං සංවරාය ධම්මං දෙසෙමි**[2]

'චුන්ද, මම මෙලොවදී ඇතිවන ආසවයන්ගේ සංවරය පිණිසම දහම් නොදෙසමි' යන මෙහි විවාදයට මුල් වූ කෙලෙස් ආසව යනුවෙන් ආයේය.

**යෙන දෙවූපපත්‍යස්ස ගන්ධබ්බො වා විහංගමො**
**යක්ඛත්තං යෙන ගච්ඡෙය්‍ය මනුස්සත්තඤ්ච අබ්බජෙ**
**තෙ මය්හං ආසවා ඛීණා විද්ධස්තා විනලීකතා**[3]

යම් කාමාදී ආශ්‍රවයන් නිසා මට දෙව්ලොව උපත වේනම් අහසෙහි හැසිරෙන ගාන්ධර්වයෙක් වෙම් නම්, යම් ආශ්‍රවයක් නිසා යක්ෂ බවට යානම් මිනිස් බවට යා නම් ඒ මාගේ ආශ්‍රවයෝ ගෙවුණාහ. විනාශ කළහ. පහකළ බැඳීම් ඇත්තාහ.

---

1. සංයුත්ත නිකාය
2. අංගුත්තර නිකාය - නවක නිපාත
3. අංගුත්තර නිකාය - චතුක්ක නිපාත - චක්ක වග්ග

මෙහි ත්‍රෛභූමික කර්ම ද ඉතිරි අකුසල ධර්ම ද ආසව නම් වේ.

'දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය සම්පරායිකානං ආසවානං පටිඝාතාය'

යන මෙහි අනුන් නැසීම, විපිළිසර වීම, වධයට පත්වීම, සිරගත වීම ආදියද අපාය දුකට හේතු වූ නොයෙක් ආකාර උවදුරු ද ආසව නම් වේ. ඒ මේ ආසවයන් විනාශ කිරීමෙහිලා **'දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය සම්පරායිකානං ආසවානං පටිඝාතාය'**[1] යනුවෙන් දෙපරිදි කොට ආසව ආයේය.

සළායතනයෙහි 'තයොමෙ ආවුසො ආසවා - කාමාසවො, භවාසවො, අවිජ්ජාසවො'[2] 'ඇවැත්නි, කාමාසව, භවාසව, අවිජ්ජාසව යයි මේ ආසව තුනකි. එසේ අනිත් සූත්‍රවල ද අභිධර්මයෙහි ද ඒවාම දිට්ඨි ආසවය සමග සතරාකාරයකින් ආයේය. නිබ්බේධික පරියායෙහි

1. අත්‍ථි භික්ඛවෙ ආසවා නිරය ගමනීයා
2. අත්‍ථි ආසවා තිරච්ඡානයොනි ගමනීයා
3. අත්‍ථි ආසවා පෙත්තිවිසය ගමනීයා
4. අත්‍ථි ආසවා මනුස්ස ලොක ගමනීයා
5. අත්‍ථි ආසවා දෙවලොක ගමනීයා[3]

'මහණෙනි, නිරය ගමනට හේතුවන ආසව ඇත, තිරිසන් යෝනියට යාමට හේතුවන ආසව ඇත. ප්‍රේත විෂයට යාමට හේතුවන ආසව ඇත. මනුෂ්‍යලෝක ගමනට හේතුවන ආසව ඇත. දිව්‍යලෝක ගමනට හේතුවන ආසව ඇත' යනුවෙන් පස් ආකාරයකින් ආසව ආයේය. මෙහි කර්මය ම ආසව යනුවෙන් අදහස් කරන ලදී. ඡක්ක නිපාතයෙහි **'අත්‍ථි භික්ඛවෙ ආසවා සංවරා පහාතබ්බා'** 'මහණෙනි, සංවරයෙන් පහකළයුතු ආසව ඇත' යනාදී ක්‍රමයෙන් හය ආකාරයකින් ආසව ආයේය. සබ්බාසව සංවර පරියායෙහි ඒ හය ආකාරයම දැකීමෙන් දුරුකළයුතු ධර්ම සමග

---

1. පාරාජික පාළි - පඨම පාරාජිකා
2. මජ්ඣිම නිකාය - සම්මා දිට්ඨි සූත්‍රය
3. අංගුත්තර - ඡක්ක නිපාතය - බු.ජ.මු. 206 පිට

හත් ආකාරයකින් ආසව ආයේය. මෙම සූත්‍රයෙහිදී වනාහි අභිධර්ම ක්‍රමයෙන් ආසව සතර අදහස් කරන ලදැයි දතයුතුය.

ඛයාය යන මෙහි ආශ්‍රවයන්ගේ යම් ක්‍ෂයවීමක්, විනාශවීමක්, බිඳීමක්, අනිත්‍ය බවක්, අතුරුදන් වීමක් යන ආශ්‍රවයන්ගේ ස්වභාවය බිඳීම 'ඛය' යයි කියනු ලැබේ. **'ජානතො අහං භික්ඛවෙ පස්සතො ආසවානං ඛයං වදාමි'**[1] මහණෙනි, දන්නා වූ දක්නා වූ මම ආශ්‍රවයන්ගේ ක්‍ෂය වීම කියමි.' යන මෙහි ආශ්‍රවයන්ගේ ක්‍ෂීණ ආකාරය, නැති බව, අතිශයින්ම හට නොගැනීම ආසවක්ඛය යි කියන ලදී.

**සෙක්ඛස්ස සික්ඛමානස්ස උජුමග්ගානුසාරිනො**
**ඛයස්මිං පඨමං ඤාණං තතො අඤ්ඤා අනන්තරා**[2]

'ආර්ය මාර්ගය පිළිපදින සුලු හික්මෙන ශෛක්‍ෂයා හට පළමුව ක්‍ෂය නම් ලද මාර්ගයෙහි ඥානය උපදනේය. ඒ සතරවන මාර්ග ඥානයෙන් අනතුරුව අර්හත්ඵලය උපදනේය.' මෙහි ආර්ය මාර්ගය ආසවක්ඛය යයි කියන ලදී. 'ආසවානං ඛයා සමණො හොති' ආශ්‍රවයන්ගේ ක්‍ෂය වීමෙන් ශ්‍රමණයා වෙයි' යන මෙහි ඵලය යි.

**පරවජ්ජානු පස්සිස්ස නිච්චං උජ්ඣාන සඤ්ඤිනො**
**ආසවා තස්ස වඩ්ඪන්ති ආරා සො ආසවක්ඛයා'**[3]

'අනුන්ගේ වරද දකිනසුලු නිරතුරුව අනුන්ට දොස් කියනසුලු ඒ භික්‍ෂුවට ආශ්‍රවයෝ වැඩෙති. හෙතෙම නිවනින් දුරයි' මෙහි නිවන ආසවක්ඛය නම් වේ. මෙම සූත්‍රයෙහි ඵලය සඳහා ආසවානං ඛයාය යනුවෙන් කියන ලදී. අර්හත්ඵලය පිණිස යන අර්ථයි.

**සංවෙජනීයෙසු ඨානෙසු** සංවේගයට හේතු වූ ජාති ආදී සංවේග වස්තු කෙරෙහි, ජාති, ජරා, ව්‍යාධි, මරණ, අපායට යාමට සුදුසු බව, අතීත සංසාර දුක, අනාගත සංසාර දුක, වර්තමානයේ ආහාර සෙවීමේ

---

1. මජ්ඣිම නිකාය - සබ්බාසව සූත්‍රය
2. අංගුත්තර නිකාය - තික නිපාතය
3. ධම්මපද - මලවග්ගය

දුක යන මේ සංවේග වස්තු සංවේගය ඇතිකර ගැනීමට සුදුසු තැන්නම් වේ. තව ද ලෝක සත්ත්වයා ගිනිගන්නා ලද්දේ වෙයි. වැඩෙහි යෙදුණේ වෙයි. කාමරාගයෙන් ඇලුණේ වෙයි. වැරදිමගට පිළිපන්නේ වෙයි. ලෝවැසියා ජරාවෙන් මරණය වෙත ගෙනයනු ලැබේ. ලෝවැසියා අනාරක්ෂිතය. අස්වැසීමට සහායකයෙක් නැත්තේය. දිගින්දිගට නොපවතින (අශාස්වත) මේ ලෝවැසියා සියල්ල හැර යායුතුය. ලෝවැසියා අඩුපාඩු සහිතය. (ඌනො) අතෘප්තිමත්ය. තෘෂ්ණාවට දාස වෙයි යන මේ ආදී සංවේගයට හේතු වූ කරුණු මෙහිදී දතයුතුය.

**සංවේජනෙන** යනු ජාති ආදී සංවේග වස්තුන් නිසා උපන් භය නම් වූ සංවේගයෙන්, අර්ථ වශයෙන් වනාහි පාපයට ඇති බිය සමග ඥාණය සංවේගය නම් වේ. **සංවිගගසස** යනු මව්කුසට බැසගැනීම් ආදී වශයෙන් ඉපදීම් ආදී නොයෙක් දුක්වලින් උපන් සංවේගය පිළිබඳව. 'සංවෙජිත්වා' යනුවෙන් ද කියත්. **යොනිසො පධානෙන** උපාය ඥානයෙන් උපදවන වීර්යයෙන්, සම්මා වායාමයෙන් යන අර්ථයි. එය වනාහි යම්සේ අකුසල ධර්මයෝ ප්‍රහීණ වෙත් ද, කුසලධර්ම භාවනාවෝ (වැඩීම්) සම්පූර්ණ බවට යත් ද මෙසේ වීර්යයෙන් උතුම් බව සෑදීම් වශයෙන් ද 'පධාන' යයි කියනු ලැබේ.

එහි සංවේගයෙන් භවාදියෙහි කිසි පිහිටක්, ආරක්ෂාවක් පිළිසරණක් නොදක්නේ එහි නොපසුබසිමින් නොඇලුණු මනසින් යුතුව එයට ප්‍රතිපක්ෂ වූ පෙරළා දැමූ සංඥා ඇත්තේ ඒකාන්තයෙන් නිවනට නැමුනේ වෙයි. හෙතෙම කල්‍යාණ මිත්‍ර ආශ්‍රයෙන් නුවණින් මෙනෙහි කිරීම බහුලකොට ඇත්තේ පිරිසිදු අදහසින් කරන ප්‍රයෝග ඇත්තේ සමථ විදර්ශනාවන්හි සුදුසු අයුරින් යෙදුණේ සියලු සංස්කාර කෙරෙහි කලකිරෙයි. නොඇලෙයි. විදර්ශනාවට උනන්දු කරවයි. එහිලා යම් මේ නුවණින් මෙනෙහි කිරීම බහුලකොට ඇත්තේ වේද පිරිසිදු සිතින් කරන ලද ප්‍රයෝග ඇත්තේ සමථ විදර්ශනාවන්හි සුදුසු අයුරින් යෙදුනේ වේද ඒ කාරණයෙන් මෙලොවදීම ඔහුගේ සුඛ සෝමනස්ස බහුල බව දතයුතුය. සමථයෙහි පිහිටියා වූ විදර්ශනාවන්හි සුදුසු අයුරින් යෙදුණා වූ මොහු සියලු සංස්කාරයන්හි කලකිරෙයි, නොඇලෙයි, විදර්ශනාවට උනන්දු කරවයි යන යමක් වේද ඒ කාරණයෙන් ඔහු විසින් **යොනි ආරද්ධා ආසවානං ඛයාය** ආශ්‍රවයන් ක්ෂය කිරීම පිණිස කාරණය ආරම්භ කරන ලදීයයි දතයුතුය.

ගාථාවන්හි සංවිජ්ජෙථෙ ව සංවේගය ඇති කරන්නේමය. 'සංවිජිත්වා' යනුවෙන් ද කියති. කියන ලද ආකාරයෙන් සංවේගයට පත්ව යන අර්ථයි. **පණ්ඩිතො** යනු ප්‍රඥාව සහිත තැනැත්තා, ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය කියන ලද්දේ වෙයි. **පඤ්ඤාය සමවෙක්ඛිය** යනු සංවේග වස්තුවලින් සංවේගයට පත්වීම් වශයෙන් ප්‍රඥාවෙන් මැනවින් විමසා බලා, නැතහොත් ප්‍රඥාවෙන් මැනවින් විමසා. සෙස්ස හැමතන්හි නොගැඹුරු අර්ථ ඇත්තේමය.

**මෙසේ පරමත්ථදීපනී ඉතිවුත්තකට්ඨ කථාවෙහි දුක නිපාතයෙහි ප්‍රථම වර්ග වර්ණනාව නිමියේ ය.**

## 2.2.1

දෙවන වර්ගයෙහි පළමුවන සූත්‍රයෙහි **තථාගතං භික්ඛවෙ** යන මෙහි තථාගත ශබ්දය සත්ත්ව ව්‍යවහාර, සම්මා සම්බුද්ධ ආදියෙහි දක්නා ලැබේ. එය එසේමය. **'හොති තථාගතො පරම්මරණා'**[1] යනාදියෙහි සත්ත්ව ව්‍යවහාරයෙහි යෙදේ. **'තථාගතං දෙවමනුස්ස පූජිතං බුද්ධං නමස්සාම සුවත්ථි හොතු'**[2] යනාදියෙහි සම්මා සම්බුදුරජාණන් වහන්සේ කෙරෙහි යෙදේ. 'තථාගතං දෙවමනුස්ස පූජිතං ධම්මං නමස්සාම සුවත්ථි හොතු' යනාදියෙහි ධර්මයෙහි යෙදේ. **'තථාගතං දේවමනුස්ස පූජිතං සංඝං නමස්සාම සුවත්ථි හොතු'** යනාදියෙහි සංඝයා කෙරෙහි යෙදේ. මේ සූත්‍රයෙහි වනාහි සම්මා සම්බුදුරජාණන් වහන්සේ කෙරෙහි යෙදේ.

එහෙයින් 'තථාගතං' යන මෙහි කරුණු අටකින් භාග්‍යවතුන් වහන්සේ තථාගතයයි කියනු ලැබේ. කවර අටකින්ද?

---

1. දීඝනිකාය - බ්‍රහ්මජාල සූත්‍රය
2. සුත්තනිපාත - රතන සූත්‍රය

1. තථා ආගතොති = තථාගතො
2. තථා ගතොති = තථාගතො
3. තථලක්ඛණං ආගතොති = තථාගතො
4. තථ ධම්මෙ යථාවතො අභිසම්බුද්ධොති = තථාගතො
5. තථ දස්සිතාය = තථාගතො
6. තථවාදිතාය = තථාගතො
7. තථා කාරිතාය = තථාගතො
8. අභිභවනට්ඨෙන = තථාගතො

1. භාග්‍යවතුන් වහන්සේ කෙසේ 'එසේ ආ හෙයින් තථාගත නම් වෙත් ද?'

යම් ප්‍රාර්ථනාවකින් යම්සේ දාන පාරමිතාව පුරා සීල-නෙක්ඛම්ම-පඤ්ඤා-විරිය-ඛන්ති-සච්ච-අධිට්ඨාන-මෙත්තා-උපෙක්ඛා පාරමී පුරා මේ දස පාරමී දස උපපාරමී දස පරමත්ථ පාරමී යන සමතිසක් පාරමී පුරා ශරීර අවයව පරිත්‍යාග, ජීවිත පරිත්‍යාග, ධන පරිත්‍යාග, භාර්යාව පරිත්‍යාග, රාජ්‍ය පරිත්‍යාග යන මේ පංචමහා පරිත්‍යාග සිදුකොට විපස්සී ආදී සම්මා සම්බුදුරජාණන් වහන්සේලා යම්සේ ආවාහු ද එසේ අපගේ භාග්‍යවතුන් වහන්සේ ද ආ හෙයින් තථාගත නම් වෙති.

එය කියන ලද අයුරු මෙසේය.

**යථෙව ලොකම්හි විපස්සි ආදයො**
**සබ්බඤ්ඤුභාවං මුනයො ඉධාගතා**
**තථා අයං සක්‍යමුනීපි ආගතො**
**තථාගතො වුච්චති තෙන චක්ඛුමා**

යම්සේ මේ ලෝකයෙහි විපස්සී ආදී මුනිවරු සර්වඥ බවට පැමිණියාහු ද එසේ මේ ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ ද සර්වඥ බවට පැමිණියාහුය. එහෙයින් නුවණ ඇස ඇති භාග්‍යවතුන් වහන්සේ තථාගත යයි කියනු ලැබේ.

මෙසේ එසේ ආ හෙයින් තථාගත නම් වෙති.

2. කෙසේ 'එසේ ගිය හෙයින් තථාගත නම් වෙත් ද?'

යම්සේ උපන් කෙණෙහිම විපස්සී ආදී බුදුවරු සම වූ පාවලින් පොළොවෙහි පිහිටා උතුරු දෙසට මුහුණලා පියවර හතක් ගියාහුද එසේ අපගේ භාග්‍යවතුන් වහන්සේ ද ගියහෙයින් තථාගත නම් වෙති. එය කියනලද අයුරු මෙසේය.

**මුහුත්තජාතොව ගවම්පතී යථා**
**සමෙහි පාදෙහි ඵුසී වසුන්ධරං**
**සො වික්කමී සත්තපදානි ගොතමො**
**සෙතඤ්ච ඡත්තං අනුධාරයුං මරූ**

ගෞතමයන් වහන්සේ උපන් කෙණෙහිම ශ්‍රේෂ්ඨ ගවයකු මෙන් සම වූ පාවලින් පොළව ස්පර්ශ කළාහුද, ඒ ගෞතමයන් වහන්සේ පියවර හතක් ගමන් කළහ. දෙවියෝ සේසත ද දැරූහ.

ගන්ත්වාන සො සත්තපදානි ගොතමො
දිසා විලොකෙසි සමා සමන්තතො
අට්ඨංගුපෙතං ගිරමබ්භුදීරයී
සීහො යථා පබ්බත මුද්ධ නිට්ඨිතො

ඒ ගෞතමයන් වහන්සේ සත් පියවරක් ගොස් හාත්පස දිශාවන් බැලූහ. පර්වත මුදුනක සිටි සිංහයකු සේ අංග අටකින් යුත් හඬ නැගූහ.

මෙසේ එසේ ගිය හෙයින් තථාගත නම් වෙති.

3. කෙසේ තථ ලක්ෂණයට පැමිණි හෙයින් (තථ ලක්ෂණය අවබෝධ කළ හෙයින්) තථාගත නම් වෙත්ද?

සියලුම රූප අරූප ධර්මයන්ගේ සත්‍ය වූ නොවෙනස් වූ ස්ව ලක්ෂණයට සාමාන්‍ය ලක්ෂණයට ඤාණ ගතියෙන් පැමිණි හෙයින් නොවැරදීම පැමිණි හෙයින් (ස්ව ලක්ෂණය, සාමාන්‍ය ලක්ෂණය අවබෝධ කළ හෙයින්) තථාගත නම් වෙති. එය කියන ලද අයුරු මෙසේය.

**සබ්බෙසං පන ධම්මානං - සක සාමඤ්ඤ ලක්ඛණං**
**තථමෙවාගතො යස්මා - තස්මා නාථො තථාගතො**

සියලු ධර්මයන්ගේ සත්‍ය වූම ස්වකීය හා සාමාන්‍ය ලක්‍ෂණයට පැමිණි හෙයින් නාථයන් වහන්සේ තථාගත නම් වෙති. මෙසේ තථ ලක්‍ෂණයට පැමිණි හෙයින් (තථ ලක්‍ෂණය අවබෝධ කළ හෙයින්) තථාගත නම් වෙති.

4. කෙසේ තථ ධර්මයන් තත් වූ පරිදි අවබෝධ කළ හෙයින් තථාගත නම් වෙත් ද?

තථ ධර්ම නම් චතුරාර්ය සත්‍යයයි. එය මෙසේ වදාළහ. **'චත්තාරිමානි භික්ඛවෙ තථානි අවිතථානි අනඤ්ඤථානි, කතමානි චත්තාරි? ඉදං දුක්ඛං අරියසච්චන්ති භික්ඛවෙ තථමෙතං අවිතථමෙතං අනඤ්ඤථමෙතං'** යනු විස්තරයයි. ඒවා භාග්‍යවතුන් වහන්සේ අවබෝධ කළහ. එහෙයින් තථ ධර්මයන් අවබෝධ කළ බැවින් තථාගත නම් වේ. මෙහි ගත ශබ්දය අවබෝධ කළ අර්ථය ඇත්තේය. මෙසේ තථ ධර්මයන් තත් වූ පරිදි අවබෝධ කළ හෙයින් තථාගත නම් වෙති.

5. කෙසේ තථ දස්සිතාවෙන් තථාගත නම් වෙත් ද?

දෙවියන් සහිත වූ ලෝකයෙහි -පෙ- දෙවිමිනිසුන් සහිත අප්‍රමාණ වූ ලෝකධාතුවල අප්‍රමාණ වූ සත්ත්වයන්ගේ ඇස් දොර (චක්ඛුද්වාර) හමුවට එන යම් රූපාරම්මණයක් ඇද්ද, භාග්‍යවතුන් වහන්සේ එය සියලු ආකාරයෙන් දනිති, දකිති. මෙසේ දන්නා වූ දක්නා වූ උන්වහන්සේ විසින් එය ඉෂ්ටාදී වශයෙන් හෝ දිට්ඨ-සුත-මුත-විඤ්ඤාත අතුරෙන් ලැබෙන ආකාර වශයෙන් හෝ ඒ රූපායතන රූපය කවරේද යත්, යම් රූපයක් සතරමහා භූතයන් නිසා උපන් පැහැසටහන වූයේ සනිදර්ශන සප්‍රතිඝ වූ නිල්ය කහය ආදී ක්‍රමයෙන් නොයෙක් නම්වලින් වාර දහතුනකින් හෝ ක්‍රම පනස්දෙකකින් හෝ බෙදනු ලබන්නේ එසේම වෙයි. වෙනත් අයුරකින් නොවේ. කන්දොර (සෝතද්වාර) ආදිය හමුවට එන ශබ්දාදියෙහිද මේ ක්‍රමයයි. එය භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලදී.

**'යං භික්ඛවෙ සදෙවකස්ස ලොකස්ස -පෙ- සදෙව මනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා තමහං ජානාමි තමහං අබ්භඤ්ඤාසිං තං තථාගතස්ස විදිතං තං තථාගතො න උපට්ඨාසි'**[1]

---

1. අංගුත්තර නිකාය - චතුක්ක නිපාතය - කාළකාරාම සුත්ත

'මහණෙනි, දෙවියන් සහිත -පෙ- දෙව්මිනිසුන් සහිත ප්‍රජාව විසින් යම් රූපායතනයක්, ශබ්දායතනයක්, ගන්ධායතනයක්, රසායතනයක්, ඵොට්ඨබ්බායතනයක් ධර්මායතනයක් ගන්නා ලද ද සොයාගන්නා ලදද සිතින් ලුහුබඳනා ලද ද ඒ හැම මම දැනගතිමි. ඒ හැම තථාගතයන් වහන්සේ විසින් දන්නා ලදී. ඒ හැම තථාගතයන් වහන්සේ සදොර අරමුණු කරා තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් වැද නොගත්හ. මෙසේ තථදස්සිතාවෙන් තථාගත නම් වෙති. එහි තථදස්සී අර්ථයෙහි තථාගත යන පදයේ හටගැන්ම දතයුතුය.

6. කෙසේ තථවාදිතාවෙන් තථාගත නම් වෙත් ද?

භාග්‍යවතුන් වහන්සේ යම් රාත්‍රියක අනුත්තර වූ සම්මා සම්බෝධිය අවබෝධ කළාහුද යම් රාත්‍රියක අනුපාදිසේස නිර්වාණ ධාතුවෙන් පිරිනිවි සේක් ද මේ අතර හතළිස් පස් අවුරුද්දක් පමණ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ විසින් සුත්ත ගෙය්‍ය ආදී වශයෙන් යමක් දේශනා කරන ලද ද ඒ සියල්ල පිරිසිදුය, පිරිපුන්ය, රාග මද නැති කිරීමෙන් එක සමානය, සත්‍යය, අසත්‍යය නොවේ.

එහෙයින් 'යඤ්ච චුන්ද රත්තිං තථාගතො අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුජ්ඣති, යඤ්ච රත්තිං අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායති, යඤ්ච එතස්මිං අන්තරෙ භාසති ලපති නිද්දිසති සබ්බං තං තථෙව හොති න අඤ්ඤථා, තස්මා තථාගතොති වුච්චති'[1]

චුන්ද, යම් රාත්‍රියක තථාගතයන් වහන්සේ අනුත්තර සම්මා සම්බෝධිය අවබෝධ කරත් ද යම් රාත්‍රියක අනුපාදිසේස නිර්වාණ ධාතුවෙන් පිරිනිවෙත් ද ඒ අතර යමක් කියත් ද විස්තර කරත්ද ඒ සියල්ල එසේම වෙයි, අන් අයුරකින් නොවේ. එහෙයින් තථාගතයයි කියනු ලැබේ' යනුවෙන් වදාළහ.

මෙහි ගත ශබ්දය 'වචනය' යන අර්ථ ඇත්තේය. මෙසේ තථවාදිතාවෙන් තථාගත නම් වෙති. ප්‍රකාශනය ආගද නම් වේ. වචනය යන අර්ථය යි. සත්‍ය වූ නොවෙනස් වූ වචනය මොහුට ඇත යන අර්ථයෙන් 'ද' කාරයට 'ත' කාරය කොට තථාගතො යනුවෙන් සිද්ධ වේ. මෙසේ මෙහි පද සිද්ධිය දතයුතුය.

---

1. අංගුත්තර නිකාය - චතුක්ක නිපාතය - ලෝක සූත්‍රය

7. කෙසේ තථා කාරිතාවෙන් තථාගත නම් වෙත් ද?

භාග්‍යවතුන් වහන්සේගේ වචනයට කය අනුලොම්ය. කයට වචනය අනුලොම්ය. එහෙයින් යථාවාදී තථාකාරී (කියන දෙයට අනුව කටයුතු කරන) යථාකාරී තථාවාදී (කරන දෙයට අනුව කියන) ද වෙති.

එහෙයින් **'යථාවාදී භික්ඛවෙ තථාගතො තථාකාරී, යථාකාරී තථාවාදී, ඉති යථාවාදී තථාකාරී යථාකාරී තථාවාදී තස්මා තථාගතොති වුච්චති'**[1] 'මහණෙනි, තථාගතයන් වහන්සේ කියන දෙයට අනුව කටයුතු කරති. කටයුතුවලට අනුව කියති. මෙසේ යථාවාදී තථාකාරී වෙති. යථාකාරී තථාවාදී වෙති. එහෙයින් තථාගත යයි කියනු ලැබේ' යනුවෙන් වදාළහ. මෙසේ තථාකාරිතාවෙන් තථාගත නම් වෙති.

8. කෙසේ අභිභවන අර්ථයෙන් තථාගත නම් වෙත් ද?

භාග්‍යවතුන් වහන්සේ ඉහළින් භවාග්‍රයත් යටින් අවීචියත් කෙළවරකොට සරසින් අප්‍රමාණ ලෝකධාතුවල සියලු සත්ත්වයන් සීලයෙන් ද සමාධියෙන් ද ප්‍රඥාවෙන් ද විමුක්තියෙන් ද විමුක්ති ඥාන දර්ශයෙන් ද මැඩ පවත්වති. උන්වහන්සේට සමකිරීමක් හෝ ප්‍රමාණ කිරීමක් නැත. අතුලයහ (අසමානයහ) අප්‍රමාණයහ. අනුත්තරයහ. දෙවියන්ට අතිදේවයහ. ශක්‍රයන්ට අතිශක්‍රයහ බ්‍රහ්මයන්ට අති බ්‍රහ්මයහ සියලු සත්ත්වයන්ට උතුම් වෙති. එහෙයින් තථාගත වෙති.

එහෙයින් **'සදෙවකෙ භික්ඛවෙ ලොකෙ** -පෙ- **සදෙවමනුස්සාය තථාගතො අභිභූ අනභිභූතො අඤ්ඤදත්‍ථු දසො වසවත්ති. තස්මා තථාගතොති වුච්චති'** 'මහණෙනි, දෙවියන් සහිත -පෙ- ඉතිරි දෙව්මිනිසුන් සහිත සත්ත්ව ප්‍රජාවෙහි තථාගතයන් වහන්සේ සියල්ලන් මැඩගෙන සිටිනා සේක් අන් අය විසින් නො මඩනා ලදහ. ඒකාන්තයෙන් සියල්ල දක්නා සේක් තමා වශයෙහි සිටුනා සේක. එහෙයින් තථාගත යයි කියනු ලැබේ' යනුවෙන් වදාළහ.

මේ එහි පද සිද්ධියයි. බෙහෙතක් වැනිවූයේ = අගද ය, (වචනය.) එය දේශනා විලාසයත් පින් රාශියත් ය.

---

1. අංගුත්තර නිකාය - චතුක්ක නිපාතය - ලෝක සුත්ත

එයින් උන්වහන්සේ, මහත් ආනුභාව ඇති වෛද්‍යවරයෙක් දිව්‍ය බෙහෙතින් සර්පයන් මැඩ පවත්වන්නාක් මෙන් සියලු පරවාදීන් ද දෙවියන් සහිත ලෝකයා ද මැඩපවත්වති. මෙසේ සියලු ලෝවැසියන් මැඩපැවැත්වීමෙහිලා සත්‍ය වූ නොවෙනස් වූ කියන ලද ආකාර ඇති බෙහෙත උන්වහන්සේට ඇත්තේය යනුවෙන් 'ද'කාරයට 'ත'කාරය කොට තථාගත යයි දතයුතුය. මෙසේ මැඩපවත්වන අර්ථයෙන් තථාගත නම් වෙති. "අපි ච තථාය ගතො අවගතො'ති තථාගතො" තවද තථයට ගියහ. (එය) අවබෝධ කළහ යන අරුතින් තථාගත නම් වෙති. එහි තීරණ පරිඤ්ඤාව වූ තථයෙන් සියලු ලෝකය (දුක)අවබෝධ කළහ යන අරුතින් තථාගත නම් වෙති. පහාණ පරිඤ්ඤාව වූ තථයෙන් ලෝක සමුදය අවබෝධ කළහ, ඉක්මවූහ යන අරුතින් තථාගත නම් වෙති. ප්‍රත්‍යක්ෂ කිරීම වූ තථයෙන් ලෝක නිරෝධයට ගියහ. (එය) අවබෝධ කළහ යන අරුතින් තථාගත නම් වෙති. භාවනාව වූ තථයෙන් ලෝක නිරෝධගාමිනී ප්‍රතිපදාවට එළඹියහ, පිළිපන්හ යන අරුතින් තථාගත නම් වෙති. මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලදී. (ඒ මෙසේය) **'ලොකො භික්ඛවෙ තථාගතෙන අභිසම්බුද්ධො ලොකස්මා තථාගතො විසංයුත්තො, ලොක සමුදයො භික්ඛවෙ තථාගතෙන අභිසම්බුද්ධො ලොකසමුදයො තථාගතස්ස පහීනො, ලොක නිරොධො භික්ඛවෙ තථාගතෙන අභිසම්බුද්ධො ලොක නිරොධො තථාගතස්ස සච්ඡිකතො, ලොක නිරොධගාමිනී පටිපදා භික්ඛවෙ තථාගතෙන අභිසම්බුද්ධා ලොකනිරොධ ගාමිනී පටිපදා තථාගතස්ස භාවිතා. යං භික්ඛවෙ සදෙවකස්ස -පෙ- සබ්බං තං තථාගතෙන අභිසම්බුද්ධං තස්මා තථාගතොති වුච්චති'**[1]

'මහණෙනි, ලෝකය (දුක්ඛ සත්‍යය) තථාගතයන් වහන්සේ විසින් පසක් කරන ලදී. තථාගතයන් වහන්සේ ලෝකයෙන් (දුක්ඛ සත්‍යයෙන්) වෙන් වූහ. 'මහණෙනි, ලෝක සමුදය (තෘෂ්ණාව) තථාගතයන් වහන්සේ විසින් පසක් කරන ලදී. තථාගතයන් වහන්සේ විසින් ලෝක සමුදය ප්‍රහීණ කරන ලදී. මහණෙනි, ලෝක නිරෝධය තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලදී. ලෝක නිරෝධය තථාගතයන් වහන්සේ විසින් පසක් කරන ලදී. මහණෙනි, ලෝක නිරෝධගාමිනී ප්‍රතිපදාව තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලදී. ලෝකනිරෝධගාමිනී

---

1. අං. නි. - චතුක්ක නිපාත - උරුවෙල වග්ග - ලෝක සූත්‍රය

ප්‍රතිපදාව තථාගතයන් වහන්සේ විසින් වඩන ලදී. මහණෙනි, දෙවියන් සහිත යම් -පෙ- ඒ හැම තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලදී. එහෙයින් 'තථාගත' යයි කියනු ලැබේ.

තවත් කරුණු අටකින් භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වෙති.

1. තථාය ආගතොති = තථාගතො
2. තථාය ගතොති = තථාගතො
3. තථානි ආගතොති = තථාගතො
4. තථා ගතොති = තථාගතො
5. තථා විදොති = තථාගතො
6. තථා පවත්තිකොති = තථාගතො
7. තථෙහි අගතොති = තථාගතො
8. තථා ගතභාවෙන = තථාගතො යනුවෙනි.

1. කථං තථාය ආගතොති තථාගතො?

සත්‍යය සඳහා පැමිණියේ යන අරුතින් තථාගත නම් වන්නේ කෙසේද?

සුමේධ තාපස කාලයෙහි දීපංකර බුදුරජාණන් වහන්සේගේ පාදමූලයෙහි දී

**මනුස්සත්තං - ලිංග සම්පත්ති - හෙතු - සත්ථාරදස්සනං**
**පබ්බජ්ජා - ගුණ සම්පත්ති - අධිකාරො ච ඡන්දතා**
**අට්ඨධම්මසමොධානා අභිනීහාරො සමිජ්ඣති**'[1]

'මිනිසත් බව, පුරුෂයකු වීම, රහත්වීමට පින් (හේතු) ඇති බව, ශාස්තෘන් වහන්සේ නමක් ජීවමානව දැකීම, කිරියවාදී පැවිද්දකු වීම, පංච අභිඥා අෂ්ට සමාපත්ති ලාභියකු වීම, තම ජීවිතය බුදුන්ට පරිත්‍යාග කිරීම, බුද්ධකාරක ධර්ම පිරීමට මහත් කැමැත්ත ඇති බව යන කරුණු අට එක්වීමෙන් ප්‍රාර්ථනාව සිදුවෙයි' යනුවෙන් මෙසේ කියන ලද ගුණ අටකින් යුක්ත වූ ප්‍රාර්ථනාව පෝෂණය කරන්නා වූ භාග්‍යවතුන් වහන්සේ

---
1. බුද්ධ වංස පාළි

විසින් මම (සසර සයුර) තරණය කළ කෙනෙක් වී දෙවියන් සහිත ලෝවැසියා තරණය කරවන්නෙමි. මම (සසරින්) මිදුන කෙනෙක් වී මුදවන්නෙමි. මම දමනය වී දමනය කරවන්නෙමි. දුක් නැසූ කෙනෙක් වී දුක් විනාශ කරවන්නෙමි. පිරිනිවි කෙනෙක් වී පිරිනිවවන්නෙමි. පිරිසිදු කෙනෙක් වී පිරිසිදු කරවන්නෙමි. අවබෝධ කළ කෙනෙක් වී අවබෝධ කරවන්නෙමි'යි යනුවෙන් යම් වචනයක් ප්‍රතිඥාවක් කරන ලද ද එය පවත්වන ලදී. (ආරක්ෂා කරන ලදී.) ඒ කාරණය කියන ලදී.

**කිමෙම එකෙන තිණ්ණෙන පුරිසෙන ථාමදස්සිනා**
**සබ්බඤ්ඤුතං පාපුණිත්වා සන්තාරෙස්සං සදෙවකං**[1]

තමාගේ බලය දකින පුරුෂයකු විසින් තනිව තරණය කිරීමෙන් මට කවර ප්‍රයෝජනයක් ද? සර්වඥතාඥානයට පැමිණ දෙවියන් සහිත ලෝවැසියන් තරණය කරවන්නෙමි.

**ඉමිනා මෙ අධිකාරෙන කතෙන පුරිසුත්තමෙ**
**සබ්බඤ්ඤුතං පාපුණිත්වා තාරෙමි ජනතං බහුං**[1]

පුරුෂෝත්තම වූ බුදුන් කෙරෙහි කරන ලද මාගේ මේ අධික සත්කාරයෙන් සර්වඥතා ඥානයට පැමිණ බොහෝ ජනතාව සසරින් එතෙර කරවමි.

**සංසාරසොතං ඡින්දිත්වා විද්ධංසෙත්වා තයො භවෙ**
**ධම්මනාවං සමාරුය්හ සන්තාරෙස්සං සදෙවකං**[1]

සංසාර නමැති ශ්‍රෝතස සිඳ දමා තුන්භවය නසා දහම් නැවට නැගී දෙවියන් සහිත ලෝකයා එතෙර කරවන්නෙමි.

**කිමෙම අඤ්ඤාත වෙසෙන ධම්මං සච්ඡිකතෙනිධ**
**සබ්බඤ්ඤුතං පාපුණිත්වා බුද්ධො හෙස්සං සදෙවකං**[1]

මේ ආත්ම භාවයෙහි දී අප්‍රකට වේශයෙන් ධර්මය ප්‍රත්‍යක්ෂ කිරීමෙන් මට කවර ප්‍රයෝජනයක් ද? සර්වඥතා ඥානයට පැමිණ දෙවියන් සහිත ලෝකයෙහි බුදු වන්නෙමි.

1. බුද්ධවංස පාළි

ඒ මේ මහා ප්‍රතිඥාව සියලු බුද්ධකාරක ධර්ම සමූහය සෙවීම නුවණින් විමසාබැලීම, සමාදානය යන මේවා පිළිබඳ (මූලික) කාරණය වූ බොරු නොකියන්නා වූ ලෝකනාථයන් වහන්සේ මහාකල්ප ලක්‍ෂයක්ද අසංඛ්‍ය කල්ප සතරක් ද සකස්කොට නිරතුරුව ඉතිරි නොකිරීම් වශයෙන් දාන පාරමිතාව ආදී වූ පාරමී තිහක් පුරා ශරීර අංග පරිත්‍යාග කිරීම් ආදී මහා පරිත්‍යාග පහ පරිත්‍යාග කොට සත්‍ය අධිෂ්ඨාන ආදී අධිෂ්ඨාන සතර වර්ධනය කොට පින් රාශිය, ඥාණ රාශිය රැස්කොට පුබ්බයෝග, පුබ්බචරිය, ධම්මක්ඛාන, ඥාතත්‍ථචරියාදිය උසස් බවට පමුණුවා බුද්ධ චරියාව ඉහළම කෙළවරට පමුණුවා අනුත්තර වූ සම්මා සම්බෝධිය අවබෝධ කළහ.

එහෙයින් ඒ මහා ප්‍රතිඥාව සත්‍යය, අසත්‍ය නොවේ. අන් අයුරකින් නොවේ. ඒ ප්‍රතිපදාවේ කෙස්ගසක අග තරම්වත් අසත්‍යයක් නැත. එසේම දීපංකර දසබලයන් වහන්සේ, කොණ්ඩඤ්ඤ දසබලයන් වහන්සේ සුමංගල දසබලයන් වහන්සේ -පෙ- කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ යන මේ සූවිසි සම්මා සම්බුදුරජාණන් වහන්සේලා පිළිවෙළින් උපන්නාහු 'මොහු බුදුවන්නේය'යි උන්වහන්සේට විවරණ දුන්හ. මෙසේ සූවිසි බුදුවරුන් සමීපයෙහි ලබන ලද විවරණ ඇත්තේ කරන ලද ප්‍රාර්ථනා ඇති බෝධිසත්ත්වයන් විසින් ලැබිය යුතු යම් ඒ ආනිසංස කියන ලදද, ඒවා ලබාගෙනම ආවේයයි මෙසේ ඒ කියන ලද පරිදි සත්‍ය වූ මහා ප්‍රතිඥාව කරණකොට බුදුබවට ආයේය. බුදුබව අවබෝධ කළේය යන අරුතින් තථාගත නම් වේ. මෙසේ 'තථාය ආගතොති තථාගතො' සත්‍යය සඳහා ආ හෙයින් තථාගත නම් වේ.

2. කථං තථාය ගතොති තථාගතො?

සත්‍යය සඳහා ගියේ යන අරුතින් තථාගත නම් වන්නේ කෙසේද? ලෝකනාථයන් වහන්සේගේ යම් මේ මහා කරුණාවක් වීද, මහා දුක් එක්රැස් වීම පිණිස කටයුතු කරන සත්ත්ව කොටස දැක එයට උපකාර කිරීමට අන් කිසිවෙක් නැත. මම ම මේ සංසාර දුකින් මිදුණේ (ඔවුන්) මුදවන්නෙමියි උත්සාහවත් වූ සිත් ඇත්තේ මහාභිනීහාරය (බුදුබවට ප්‍රාර්ථනා) කළාහු ද එසේ කොට ප්‍රාර්ථනාව පරිදි සියලු ලෝකයාට යහපත සිදුකිරීම පිණිස උත්සාහවත් වූයේ තමාගේ කාය ජීවිත දෙක්හි අපේක්‍ෂාවක් නැත්තේ ඇසීම් පමණකිනුත් අනුන්ගේ සිතේ තැතිගැනීමක්

ඇතිකරන අති දුෂ්කර වූ දුක් හැසිරීමක හැසිරෙමින්, මහාබෝධි සත්ත්වයන්ගේ ප්‍රතිපත්ති පිරිහෙන පැත්තට හෝ කෙලෙසෙන පැත්තට හෝ පවතින පැත්තට හෝ අයත් නොවී මත්තෙහි දියුණුවන පැත්තටම නැඹුරු වූයේ වේද, එසේ පිළිපදිමින් අනුපිළිවෙළින් ඉතිරි නොකොට බෝධිසම්භාර ධර්මයන් රැස්කොට අභිසම්බෝධියට (බුද්ධත්වයට) පැමිණියාහුද, ඉන්පසුව ද ඒ මහා කරුණාවෙන් ම මෙහෙයවන ලද සිත් ඇත්තේ තනිව විසීමේ ඇල්ම ද පරම ශාන්ත නිවන්සැපය ද හැර බාල (අනුවණ) ජනතාව බහුලකොට ඇති ලෝකයෙහි ඔවුන් විසින් මතුකරන ලද සම්මාන අවමාන විකාර සැලකිල්ලට නොගෙන හික්මවීමට සුදුසු ජනතාව හික්මවමින් ඉතිරි නොකොට බුද්ධකෘත්‍යය (බුදුවරයකු විසින් කළයුතු කටයුතු) නිමකළ සේක. එහි භාග්‍යවතුන් වහන්සේගේ සත්ත්වයන් කෙරෙහි වූ මහා කරුණාවෙන් විමසා බලන ආකාරය අන්තැනක පැහැදිලි වන්නේය. බුදු වූ ලෝකනාථයන් වහන්සේගේ සත්ත්වයන් කෙරෙහි ඇති මහා කරුණාව යම්සේ ද මෙසේ ම බෝධිසත්ත්වයන්ගේ මහාභිනීහාර කාලාදියෙහි දැයි මෙසේ සැමතැන හැමදා එක සමාන බැවින් සත්‍යය, අසත්‍ය නොවේ. අන් අයුරකින් නොවේ. එහෙයින් (මේ) අවස්ථා තුනෙහි ම සියලු සත්ත්වයන් කෙරෙහි සමාන වූ ක්‍රියාවෙන් ඒ මහා කරුණාවෙන් සියලු ලෝකවාසීන්ගේ හිත පිණිස ගියේ පිළිපන්නේ යන අරුතින් තථාගත නම් වේ. මෙසේ තථාය ගතොති තථාගතො. සත්ත්වයන්ගේ හිත පිණිස ගියේ ය යන අරුතින් තථාගත නම් වේ.

3.1 කථං තථානි ආගතොති තථාගතො?

සතර ආර්යමාර්ග ඥාන අවබෝධ කළ හෙයින් කෙසේ තථාගත නම් වෙත් ද? සතර ආර්ය මාර්ග ඥාන 'තථානි' නම් වේ. ඒවා නම් මේ දුක ය, මේ දුක්ඛ සමුදය ය. මේ දුක්ඛ නිරෝධය ය, මේ දුක්ඛනිරෝධගාමිනී ප්‍රතිපදාවය. මෙසේ ඒ දතයුතු සියල්ල ඇතුළත් වූ පැවැත්ම-නැවැත්ම යන ඒ දෙකටම හේතු වූ සතර ආර්ය සත්‍යයන් සම්බන්ධව ඇති දුක පිළිබඳ පෙළන අර්ථය, සංඛත අර්ථය, සන්තාප අර්ථය, විපරිණාම (පෙරළෙන) අර්ථය, සමුදය පිළිබඳ රැස්කරන අර්ථය, නිදාන අර්ථය, සංයෝග අර්ථය, පළිබෝධ අර්ථය, නිරෝධය පිළිබඳ නිදහස්වීම් (නිස්සරණ) අර්ථය පවිවේක අර්ථය, අසංඛත අර්ථය, අමත අර්ථය, මාර්ගය පිළිබඳ සසරින් නික්මයන අර්ථය, හේතු අර්ථය, දර්ශන අර්ථය, අධිපති අර්ථය යනාදී බෙදීම් පිළිබඳව ද යථාභූත ස්වභාවය අවබෝධයට

ඇති බාධක වූ කෙලෙසන පක්ෂය සහමුලින් නැසීමෙන් ලබන ලද අසමය අභිසමය නම් වූ නොවෙනස් ආකාරයෙන් පැවති ධර්මයන් පිළිබඳ ස්වභාව ලක්ෂණයට ස්වලක්ෂණයට අවිරුද්ධ වශයෙන් සත්‍යය, අසත්‍ය නොවේ, අන් අයුරකින් නොවේ. අනිකකු විසින් අවබෝධ කරවීමට යෝග්‍ය නොවූ ඒවා භාග්‍යවතුන් වහන්සේ තමන්වහන්සේ ම අවබෝධ කළහ. එහෙයින් මාර්ගඥාන අවබෝධ කළ හෙයින් තථාගත නම් වෙති.

3.2 මාර්ගඥාන යම්සේද එසේ ම භාග්‍යවතුන් වහන්සේගේ තුන්කල්හි නොගැටෙන ඤාණ, පටිසම්භිදා ඤාණ සතර, විශාරද බව ඇතිකරන ඤාණ සතර, ගති පරිච්ඡේද ඤාණ පහ, අසාධාරණ ඤාණ හය, බොජ්ඣංග හත පැහැදිලි කරන ඤාණ මාර්ගාංග අට පැහැදිලි කරන ඤාණ, අනුපූර්ව විහාර සමාපත්ති ඤාණ නවය, බල ඤාණ දහය ද පැහැදිලි කළ යුතුය. එහි අප්‍රමාණ ලෝකධාතුවල අප්‍රමාණ සත්ත්වයන්ගේ හීන ආදී වශයෙන් භේද භින්න වූ අතීත ස්කන්ධ ආයතන ධාතුවල ස්වභාව කටයුතු ආදිය, අවස්ථා විශේෂාදිය ස්කන්ධ හා බැඳුණු නම් ගොත් ආදී යමක් දතයුතුද, ඉන්ද්‍රිය නොවන දේ හා බැඳුණු (අතින්ද්‍රිය පටිබද්ධ) ඉතා සියුම් වූ සරස පිහිටි බොහෝ දුර දේශවල රූප ධර්මයන්හි ඒ ඒ ප්‍රත්‍යයෙන් උපන් දේවල වර්ණය - සටහන-ගන්ධය-රසය-ස්පර්ශය ආදී යම් විශේෂයක් ඇද්ද ඒ හැමතන්හිම අල්ලෙහි තබන ලද නෙල්ලි ගෙඩියක් මෙන් ප්‍රත්‍යක්ෂ වශයෙන් නොබැඳුණු, නොහැපුණු භාග්‍යවතුන් වහන්සේගේ ඤාණය පවතී. එසේම අනාගත වූ ද වර්තමාන වූ ද මේ තුන් කාලයෙහිම (පැවති ඤාණ) අප්පටිහත (නොහැපුණු) ඤාණ නම් වේ. එය කී පරිදි මෙසේය.

> **අතීතංසෙ බුද්ධස්ස භගවතො අප්පටිහතඤාණං අනාගතංසෙ බුද්ධස්ස භගවතො අප්පටිහතඤාණං පච්චුප්පන්නංසෙ බුද්ධස්ස භගවතො අප්පටිහතඤාණං**[1]

'අතීතය පිළිබඳ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ නොහැපුණු (නොනැසුණු) ඤාණය පවතී. අනාගතය පිළිබඳ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ නොහැපුණු ඤාණය පවතී. වර්තමානය පිළිබඳ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ නොහැපුණු ඤාණය පවතී.'

---

1. පටිසම්භිදා මග්ග - ඤාණ කථා

ඒවා වනාහි ඒ ඒ තැන ධර්මයන් පිළිබඳ ස්වභාව ලක්‍ෂණයට ස්වලක්‍ෂණයට අවිරුද්ධ හෙයින් සත්‍යය වේ. අසත්‍ය නොවේ. අන් අයුරකින් නොවේ. භාග්‍යවතුන් වහන්සේ ඒ ඤාණ තමන් වහන්සේ ම අවබෝධ කළහ. මෙසේ ඤාණ අවබෝධ කළ හෙයින් තථාගත නම් වෙති.

3.3 එසේම අත්ථ පටිසම්භිදාව, ධම්ම පටිසම්භිදාව, නිරුත්ති පටිසම්භිදාව, පටිභාණ පටිසම්භිදාව යනුවෙන් පටිසම්භිදා සතරකි. එහි අර්ථයෙහි ප්‍රභේද ගැන සිතාබැලීමට (සලලක්ඛණ), ප්‍රකට කිරීමට (විභාවන), විභාග කිරීමට (වවත්‍ථානකරණ) සමත් අර්ථයෙහි ප්‍රභේදගත ඥානය අත්‍ථ පටිසම්භිදාව ය. ධර්මයෙහි ප්‍රභේද ගැන සලලක්ඛණ, විභාවන, වවත්‍ථානකරණ යන මේවා කිරීමට සමත් ධර්මයෙහි ප්‍රභේදගත ඥානය ධම්මපටිසම්භිදාවය. නිරුක්තියෙහි ප්‍රභේද ගැන සල්ලක්ඛණ, විභාවන, වවත්ථානකරණ යන මේවා කිරීමට සමත් නිරුක්ති අභිලාශයෙහි (වචනයෙහි) ප්‍රභේදගත ඥානය නිරුත්ති පටිසම්භිදාව ය. පටිභාණයෙහි ප්‍රභේද ගැන සලලක්ඛණ, විභාවන, වවත්‍ථාන යන මේවා කිරීමට සමත් වූ පටිභාණයෙහි ප්‍රභේදගත ඥානය පටිභාන පටිසම්භිදාවය. මේ කාරණය මෙසේ කියන ලදී. '**අත්‍ථෙ ඤාණං අත්‍ථපටිසමභිදා, ධම්මෙඤාණං ධම්ම පටිසමභිදා, අත්‍ථධම්ම නිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්ති පටිසමභිදා ඤාණෙසු ඤාණං පටිභාන පටිසමභිදා**'[1]

අර්ථයෙහි ඥානය අර්ථ ප්‍රතිසංවිදාය, ධර්මයෙහි ඥානය ධර්ම ප්‍රතිසම්භිදා ය, ඒ අර්ථයෙහි හා ධර්මයෙහි ස්වභාව නිරුක්ති සංඛ්‍යාත ශබ්දයෙහි ඥානය නිරුක්ති ප්‍රතිසංවිදාය, හැමතන්හි ඇති ඥානය ප්‍රතිභාන ප්‍රතිසංවිදාය ය'

මෙහි හේතු අනුසාරයෙන් ශාන්ත බැවින් ද අවබෝධ කළයුතු බැවින් ද කෙටියෙන් හේතුඵලය අත්‍ථ (අර්ථ) නම් වේ. ප්‍රභේද වශයෙන් ප්‍රත්‍යයෙන් උපන් දෙය, නිවන, කියන ලද අර්ථය, විපාකය, ක්‍රියා යන මේ ධර්ම පහ 'අත්‍ථ' නම් වේ. ඒ අර්ථය විමසාබලන තැනැත්තාගේ ඒ අර්ථයෙහි ප්‍රභේදගත ඤාණය අත්‍ථපටිසම්භිදාව ය. කෙටියෙන් ධර්ම යනු ප්‍රත්‍යයයි. යම්හෙයකින් ඒ ඒ ප්‍රත්‍යය ඒ ඒ අර්ථය නියම කරයි ද

1. විභංගප්පකරණය - පටිසම්භිදා විභංගය - බු.ජ.මු. 2-118 පිට

පවත්වයි ද පමුණුවයි ද එහෙයින් 'ධර්ම' යයි කියනු ලැබේ. ප්‍රභේද වශයෙන් වනාහි යම් ඵලයක් උපදවන හේතුව, ආර්ය මාර්ගය, කියන ලද්ද (භාසිතය), කුසලය, අකුසලය යන මේ ධර්ම පහ 'ධර්ම' නම් වේ. ඒ ධර්මය නුවණින් විමසා බලන තැනැත්තාගේ ඒ ධර්මයෙහි ප්‍රභේදගත ඥානය ධම්මපටිසම්භිදාව ය. මේ අදහස (මෙසේ) කියන ලදී.

'දුක්ඛෙ ඤාණං අත්ථපටිසම්භිදා. දුක්ඛ සමුදයෙ ඤාණං ධම්මපටිසම්භිදා. දුක්ඛ නිරොධෙ ඤාණං අත්ථ පටිසම්භිදා. දුක්ඛ නිරොධගාමිනියා පටිපදාය ඤාණං ධම්ම පටිසම්භිදා. 'හෙතුම්හි ඤාණං ධම්ම පටිසම්භිදා. හෙතුඵලෙ ඤාණං අත්ථ පටිසම්භිදා. 'යෙ ධම්මා ජාතා භූතා සඤ්ජාතා නිබ්බත්තා අභිනිබ්බත්තා පාතුභූතා ඉමෙසු ධම්මෙසු ඤාණං අත්ථපටිසම්භිදා. යම්හා ධම්මා තෙ ධම්මා ජාතා භූතා සඤ්ජාතා නිබ්බත්තා අභිනිබ්බත්තා පාතුභූතා තෙසු ධම්මෙසු ඤාණං ධම්ම පටිසම්භිදා. 'ජරාමරණෙ ඤාණං අත්ථ පටිසම්භිදා. ජරාමරණ සමුදයෙ ඤාණං ධම්ම පටිසම්භිදා. ජරා මරණ නිරොධෙ ඤාණං අත්ථපටිසම්භිදා. ජරා මරණ නිරොධ ගාමිණියා පටිපදාය ඤාණං ධම්ම පටිසම්භිදා. 'ජාතියා, භවෙ, උපාදානෙ, තණ්හාය, වෙදනාය, ඵස්සෙ, සළායතනෙ, නාමරූපෙ, විඤ්ඤාණෙ, සංඛාරෙසු ඤාණං අත්ථ පටිසම්භිදා. සංඛාර සමුදයෙ ඤාණං ධම්මපටිසම්භිදා. සංඛාර නිරොධෙ ඤාණං අත්ථපටිසම්භිදා. සංඛාර නිරොධගාමිනියා පටිපදාය ඤාණං ධම්මපටිසම්භිදා. 'ඉධ භික්ඛු ධම්මං ජානාති සුත්තං ගෙය්‍යං -පෙ- වෙදල්ලං අයං වුච්චති ධම්ම පටිසම්භිදා. සො තස්ස තස්සෙව භාසිතස්ස අත්ථං ජානාති අයං ඉමස්ස භාසිතස්ස අත්ථො අයං ඉමස්ස භාසිතස්ස අත්ථොති, අයං වුච්චති අත්ථ පටිසම්භිදා'[1]

'දුකෙහි ප්‍රභේදගත ඤාණය අත්ථ පටිසම්භිදාවය. දුක්ඛ සමුදයෙහි ප්‍රභේදගත ඤාණය ධම්ම පටිසම්භිදාවය. දුක්ඛ නිරෝධයෙහි ඤාණය අත්ථ පටිසම්භිදාවය. දුක්ඛ නිරෝධ ගාමිනී ප්‍රතිපදාවෙහි ප්‍රභේදගත ඤාණය ධම්ම පටිසම්භිදාවය'

'හේතුවෙහි ප්‍රභේදගත ඤාණය ධම්ම පටිසම්භිදාව ය. හේතුඵලයෙහි ඤාණය අත්ථ පටිසම්භිදාව ය.'

1. විභංගප්පකරණ - පටිසම්භිදා විභංග - බු.ජ.මු. 2 භාගය - 118-120 පිටු

'යම් (යම්) ධර්ම උපන්නේ ද හටගත්තේ ද ප්‍රත්‍ය එක්වීමෙන් උපන්නේ ද හටගත්තේ ද විශේෂයෙන් උපන්නේ ද පහළ වූයේ ද මේ ධර්මයන්හි ප්‍රභේදගත ඥාණය අත්‍ථපටිසම්භිදාව ය. යම් (යම්) ධර්ම කෙරෙන් ඒ ධර්ම උපන්නේ ද හටගත්තේ ද ප්‍රත්‍ය එක්වීමෙන් උපන්නේද විශේෂයෙන් උපන්නේ ද පහළ වූයේ ද ඒ ධර්මයන්හි ප්‍රභේදගත ඥාණය ධම්ම පටිසම්භිදාවයි.'

'ජරාමරණයෙහි ප්‍රභේදගත ඥාණය අත්‍ථපටිසම්භිදාව යි. ජරාමරණ සමුදයෙහි ප්‍රභේදගත ඥාණය ධම්ම පටිසම්භිදාව ය. ජරාමරණ නිරෝධයෙහි ප්‍රභේදගත ඥාණය අත්‍ථපටිසම්භිදාවය. ජරා මරණ නිරෝධ ගාමිනී ප්‍රතිපදාවෙහි ප්‍රභේදගත ඥාණය ධම්ම පටිසම්භිදාවය.

'ජාතියෙහි ප්‍රභේදගත ඥාණය, භවයෙහි ප්‍රභේදගත ඥාණය, උපාදානයෙහි ප්‍රභේදගත ඥාණය, තෘෂ්ණාවෙහි ප්‍රභේදගත ඥාණය, වේදනාවෙහි ප්‍රභේදගත ඥාණය, ස්පර්ශයෙහි ප්‍රභේදගත ඥාණය, සළායතනයෙහි ප්‍රභේදගත ඥාණය, නාමරූපයෙහි ප්‍රභේදගත ඥාණය, විඥ්ඥාණයෙහි ප්‍රභේදගත ඥාණය, සංස්කාරයන්හි ඥාණය, අත්‍ථපටිසම්භිදාවය. සංස්කාර සමුදයෙහි ඥාණය, ධම්ම පටිසම්භිදාව ය. සංස්කාර නිරෝධයෙහි ඥාණය, අත්‍ථ පටිසම්භිදාවය. සංස්කාර නිරෝධගාමිණී ප්‍රතිපදාවෙහි ඥාණය, ධම්ම පටිසම්භිදාවය.' 'මේ සසුනෙහි භික්‍ෂුව සුත්ත, ගෙය්‍ය -පෙ- වේදල්ලය යන ධර්මය දනීද මෙය ධම්ම පටිසම්භිදාවය. හෙතෙම මෙය මේ භාවිතයේ අර්ථය යි, මෙය මේ භාෂිතයේ අර්ථය යි ඒ ඒ භාෂිතයේ අර්ථයම දනී ද මෙය අත්‍ථ පටිසම්භිදාව යයි කියනු ලැබේ.'

**'කතමෙ ධම්මා කුසලා : යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති සොමනස්ස සහගතං ඥාණ සම්පයුත්තං රූපාරම්මණං වා -පෙ- ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ තස්මිං සමයෙ ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති ඉමෙ ධම්මා කුසලා, ඉමෙසු ධම්මෙසු ඥාණං ධම්ම පටිසම්භිදා, තෙසං විපාකෙ ඥාණං අත්‍ථපටිසම්භිදා'**[1]

'කුශල ධර්ම කවරේද යත්, යම් කලෙක රූපාරම්මණයක් හෝ -පෙ- ධර්මාරම්මණයක් හෝ යළි යම් යම් අරමුණක් හෝ අරබයා

---

1. විභංගප්පකරණ - පටිසම්භිදා විභංග

සෝමනස්ස සහගත ඤාණ සම්පයුත්ත කුසල සිත උපදින්නේ වේද එසමයෙහි ස්පර්ශය වෙයි. -පෙ- අවික්ෂේපය (සිතේ නොවිසිරීම) වෙයි. මේ ධර්ම කුශල්ය. මේ ධර්මයන්ගේ ප්‍රභේදගත ඤාණය ධම්ම පටිසම්භිදාවය. ඒවායේ විපාකයෙහි ප්‍රභේදගත ඤාණය අත්‍ථපටිසම්භිදාවය. 'මේ ආදී විස්තරය. ඒ අර්ථයෙහි ද ඒ ධර්මයෙහි ද ස්වභාව නිරුක්ති විකල්ප නොවන ව්‍යවහාරය අභිලාපයයි.

ඒ ස්වභාව නිරුක්ති අභිලාපයෙහි (වචනයෙහි) සියලු සත්ත්වයන්ගේ මුල් භාෂාව වූ මාගධී භාෂාවෙහි මේ ස්වභාව නිරුක්තිය ය, මේ ස්වභාව නිරුක්තිය නොවේය යනුවෙන් ප්‍රභේදගත ඤාණය නිරුක්ති පටිසම්භිදාවය. කියන ලද ආකාර ඇති ඒ ඤාණයන්හි අරමුණු (ගෝචර) කටයුතු (කෘත්‍ය) ආදී වශයෙන් විස්තර වශයෙන් පැවති සියලු ඤාණයන් අරමුණුකොට නුවණින් විමසා බලන තැනැත්තාගේ ඒ ඤාණයෙහි ප්‍රභේදගත ඤාණය පටිභාන පටිසම්භිදාව ය. මෙසේ මේ සිවුපිළිසිඹියා ඤාණ භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේ විසින් ම අවබෝධ කරන ලද අර්ථ ධර්ම ආදී වූ තමාගේ ඒ ඒ විෂයෙහි අවිරුද්ධ වශයෙන් නොවෙනස් ආකාරයෙන් පැවතීම් වශයෙන් සත්‍යය, අසත්‍යය නොවේ. අන් අයුරකින් නොවේ. මෙසේ ද භාග්‍යවතුන් වහන්සේ 'තථානි ආගතොති = තථාගතො' තථ නම් වූ පටිසම්භිදා ඤාණ අවබෝධ කළ හෙයින් තථාගත නම් වෙති.

3.4 එසේම දතයුතු යම් කිසිවක් ඇත්නම් ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේ විසින් දැනගන්නා ලදී. දක්නා ලදී. අවබෝධ කරන ලදී. මනා සේ අවබෝධ කරන ලදී. එසේම උන්වහන්සේ විසින් ස්වභාව ලක්‍ෂණ අවබෝධ කිරීම් වශයෙන් යහපත් ආකාරයෙන් දතයුතු (අභිඤ්ඤෙය්‍ය) ධර්ම අභිඤ්ඤෙය්‍ය වශයෙන් අවබෝධ කරන ලදී. සාමාන්‍ය ලක්‍ෂණ අවබෝධ කිරීම් වශයෙන් ද අනිත්‍යාදී කෘත්‍ය විමසාබැලීම් වශයෙන් ද පතුරුවා දතයුතු (පරිඤ්ඤෙය්‍ය) ධර්ම පරිඤ්ඤෙය්‍ය වශයෙන් අවබෝධ කරන ලදී. දුරු කළයුතු (පහාතබ්බ) ධර්ම දුරුකිරීම් වශයෙන් අවබෝධ කරන ලදී. ප්‍රත්‍යක්‍ෂ කළයුතු (සච්ඡිකාතබ්බ) ධර්ම ප්‍රත්‍යක්‍ෂ කිරීම් වශයෙන් අවබෝධ කරන ලදී. වැඩිය යුතු ධර්ම වැඩීම් වශයෙන් අවබෝධ කරන ලදී. මෙනම් වූ ඒ ධර්ම උන්වහන්සේ විසින් අවබෝධ නොකරන ලදැයි යම් ආකාරයකින් කරුණු සහිතව යොදන්නට (ඉදිරිපත් කරන්නට) සමත්

කිසියම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ නැත. දුරු කළයුතු යම් කිසිවක් ඇත්නම් භාග්‍යවතුන් වහන්සේගේ ඒ සියල්ල ඉතිරි නැතිව බෝධිමූලයෙහිදීම ප්‍රහීණ විය. නැවත නූපදින ස්වභාව ඇත්තේය. දුරු කළයුතු දේ දුරුකිරීම පිණිස මත්තෙහි කළයුත්තක් නැත.

එසේම උන්වහන්සේ විසින් ලෝභ - දෝස - මෝහ - විපරීත මනසිකාර - අහිරික - අනොත්තප්ප - ථීනමිද්ධ - ක්‍රෝධ - උපනාහ - මක්ඛ - පලාස - ඉස්සා - මච්ඡරිය - මායා - සාඨෙය්‍ය - ථම්භ - සාරම්භ - මාන - අතිමාන - මද - පමාද - අකුසල් මුල් තුන - දුශ්චරිත - විපරීත විසම සංඥාමල - විතක්ක මල - ප්‍රපංච ඒසනා තණ්හාව - විපරියේස සතර - ආසව - ග්‍රන්ථ - ඕඝ - යෝග - අගති - තණ්හා - උපාදාන - අභිනන්දන පහ - නීවරණ - චෙතෝඛිල - චෙතසො විනිබන්ධ - විවාදමූල හය - අනුසය හත - මිච්ඡත්ත අට - ආඝාත වස්තු නවය - තණ්හා මූලක දස අකුසල කර්මපථ - අනේසන විසිඑක - දෘෂ්ටි හැටදෙක - තණ්හා විචරිත එකසිය අට ආදී ප්‍රභේද ඇති කෙලෙස් එක්දහස් පන්සීය වාසනා (සසර පුරුදු) සහිතව දුරුකරන ලදී. සහමුලින් නසන ලදී. උදුරාදමන ලදී. මෙනම් වූ ඒ කෙලෙස් උන්වහන්සේ විසින් ප්‍රහීණ නොකරන ලදැයි යම් ආකාරයකින් කරුණු සහිතව යොදන්නට (ඉදිරිපත් කරන්නට) සමත් කිසියම් ශ්‍රමණයෙක් හෝ -පෙ- බ්‍රහ්මයෙක් හෝ නැත.

භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ (පංච ආනන්තරිය - භික්ෂුණී දූෂක යන) කර්ම - (පණ්ඩක - තිරිසන් - උභතෝ ඛ්‍යඤ්ජනකයන්ගේ ප්‍රතිසන්ධි නම් වූ) විපාක (නියත මිථ්‍යා දෘෂ්ටි නම් වූ) ක්ලේශ (ආර්ය) උපවාද - (දැන දැන ශික්ෂාපද කැඩීමෙන් ආපත්තිවලට පැමිණීම නම් වූ) ආණාවීතික්කම යන ප්‍රභේද ඇති අන්තරායික ධර්ම කියන ලද ද ඒකාන්තයෙන් ඒවා ඇසුරු කරන්නාට අනතුරු පිණිස සමත් නොවේ යයි යම් ආකාරයකින් කරුණු සහිතව යොදන්නට (ඉදිරිපත් කරන්නට) සමත් කිසියම් ශ්‍රමණයෙක් හෝ -පෙ- බ්‍රහ්මයෙක් නැත.

භාග්‍යවතුන් වහන්සේ විසින් ඉතිරි නොකොට සසර දුකින් නික්මීම පිණිස ශීල - සමාධි - ප්‍රඥා සංග්‍රහය කොටස් හතකින් යුත් ප්‍රභේද තිස්හතක් ඇති ආර්ය මාර්ගය පෙරටුකොට ඇති අනුත්තර වූ නිවනට

පමුණුවන ධර්මය දේශනා කරන ලදී. ඒ ධර්මය ඒකාන්තයෙන් ම පිළිපදින තැනැත්තාට අයත් සසර දුකින් එතරට පමුණුවයි. උන්වහන්සේ විසින් නිවනට පමුණුවන ධර්මය යනුවෙන් දේශනා කළ ධර්මය නිවනට නොපමුණුවන්නේයයි යම් ආකාරයකින් කරුණු සහිතව යොදන්නට (ඉදිරිපත් කරන්නට) සමත් ශ්‍රමණයෙක් හෝ -පෙ- බ්‍රහ්මයෙක් හෝ නැත.

ඒ කාරණය මෙසේ කියන ලදී. 'සමමා සමබුදධසස තෙ පටිජානතො ඉමෙ ධමමා අනභිසමබුදධා'[1] සම්මා සම්බුද්ධ වෙමි'යි ප්‍රතිඥා කරන්නා වූ ඔබ විසින් මෙනම් ධර්ම අවබෝධ නොකරන ලදැ'යි යන විස්තරය (යෙදිය යුතුය)

මෙසේ තමාගේ ඥානප්‍රහාණ දේශනා විශේෂයන්ගේ නොවෙනස්වන ස්වභාවය අවබෝධ කිරීම් හේතුවෙන් නොවෙනස්ව පැවති භාග්‍යවතුන් වහන්සේගේ ඒ විශාරද ඥාන සතර සත්‍යය අසත්‍ය නොවේ. වෙනස් නොවේ. මෙසේ ද භාග්‍යවතුන් වහන්සේ චතුර්වෛශාරද්‍ය ඥාන අවබෝධ කළහ යන අර්ථයෙන් තථාගත නම් වෙති.

3.5 එසේම නිරය ගතිය, තිරිසන් ගතිය, ප්‍රේත ගතිය, මනුෂ්‍යගතිය, දේවගතිය යනුවෙන් ගති පහකි. ඒවා අතරින් සංජීවාදී අටමහා නිරය, කුක්කුළ ආදී උස්සද නිරය දාසය, ලෝකාන්තරික නිරය ද යන මේ සියල්ල ඒකාන්ත දුක් බැවින් ආශ්වාද නැති අර්ථයෙන් නිරය ද තමාගේ කර්මයෙන් යායුතු ගතිය ද නිරයගති ය. තීව්‍ර අන්ධකාරය ඇති සීත නරක ද මේවායෙහි ම ඇතුළත් වෙයි. පණුවන් - කුඩා සතුන් - පළඟැටියන් - සර්පයන් - පක්ෂීන් - බල්ලන් - සිවලුන් ආදී සත්තු හරහට ඇදෙන බැවින් තිරච්ඡාන (තිරිසන්) නම් වෙති. ගති යනු ද ඔවුහුමය යන අරුතින් තිරච්ඡාන ගති නම් වේ. ඛුප්පිපාසිත, පරදත්තුපජීවී, නිජ්ඣාමතණ්හික ආදීහු දුක් බහුල බැවින් උසස් සැපයෙන් පහවූවාහු ඉවත් වූවාහු යන අරුතින් 'පේත' නම් වෙති. ගති යනුද ඔවුහුමය යන අරුතින් පේත ගති නම් වේ. කාලකඤ්ජක ආදී අසුරයෝ ද ප්‍රේතයන් කෙරෙහි ම ඇතුළත්ය. කුඩා දිවයින් වැසියන් සමග දඹදිව ආදී සතරමහා දිවයින් වාසීහු මනසින් ඉතා අධික බැවින් මනුෂ්‍යයෝ වෙති. ගති යනු ද ඔවුහුමය යන අරුතින්

1. මජ්ඣිම නිකාය - මහා සීහනාද සූත්‍රය

මනුස්සගති නම් වේ. චාතුර්මහා රාජිකයේ පටන් නේවසඤ්ඤා නාසඤ්ඤායතනය තෙක් ඇති මේ දේවනිකාය විසිහය තමාගේ ඍද්ධි ආනුභාවයෙන් ක්‍රීඩා කරයි, බබලයි යන අරුතින් දේව නම් වෙයි. ගති යනු ද ඒ දේව නිකායමය යන අරුතින් දේවගති නම් වේ. ඒ මේ ගති වනාහි ඒ ඒ කර්ම වෘත්තයෙන් උපන් භව විශේෂයක් හෙයින් අර්ථ වශයෙන් විපාක ස්කන්ධ ද කටත්තා රූපය ද වේ. එහි මෙනම් ගති මෙනම් කර්මයෙන් උපදී. ඒ කර්මයට අයත් ප්‍රත්‍ය විශේෂවලින් මෙසේ (ගති වශයෙන්) කොටස් බෙදී ගිය බැවින් මේ සත්ත්ව නිකායන් වෙන් වී ඇත. මෙසේ කොටස් වශයෙන් බෙදුණු ඒ ඒ සත්ත්ව නිකායට අයත් හේතුඵල වෙන්කොට දැක්වීම් වශයෙන් කරුණු වශයෙන් හේතු වශයෙන් භාග්‍යවතුන් වහන්සේගේ ඤාණය පවතී. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ

**පංච ඛො ඉමා සාරිපුත්ත ගතියො, කතමා පංච? නිරයො, තිරච්ඡාන යෝනි, පෙත්තිවිසයො, මනුස්සා, දෙවා. නිරයඤ්චාහං සාරිපුත්ත පජානාමි නිරයගාමිඤ්ච මග්ගං නිරයගාමිනිඤ්ච පටිපදං - යථා පටිපන්නො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපගො හොති, තඤ්ච පජානාමි'ති ආදි.**[1]

'ශාරිපුත්‍රය, මේ ගති පහකි. කුමන පහක්ද? නරකය, තිරිසන්යෝනිය, ප්‍රේතවිෂය, මනුෂ්‍යයෝය, දෙවියෝය (යනුයි) ශාරිපුත්‍රය, මම නිරයත් නිරයට යන මාර්ගයත් නිරයගාමිනී ප්‍රතිපදාවත් දනිමි. යම්සේ පිළිපන්නේ කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ දුකට පිහිට වූ නපුරු ලෙස වැටෙන නිරයට එළඹියේ වෙයි ද එය දනිමි' යනාදිය වදාළහ.

ඒ මේ භාග්‍යවතුන් වහන්සේගේ ඤාණ ඒ ඒ විෂයෙහි නොවෙනස් ලෙස පැවතීම් වශයෙන් අවිරුද්ධ වීම් වශයෙන් සත්‍යය, අසත්‍ය නොවේ. අන් අයුරකින් නොවේ. මෙසේ ද භාග්‍යවතුන් වහන්සේ 'තථානි ආගතොති = තථාගතො' යනුවෙන් එම ඤාණයන් අවබෝධ කළ හෙයින් තථාගත නම් වෙති.

3.6 එසේ ම සත්ත්වයන්ගේ ශ්‍රද්ධාදිය යෙදීමේ විකලතාව (අඩු බව) අවබෝධයෙන් කෙලෙස් අඩු බව කෙලෙස් වැඩි බව ආදී විශේෂතා

1. ම.නි. - මහා සීහනාද සුත්ත

පැහැදිලි කරන පණස් ආකාරයකින් පැවති භාග්‍යවතුන් වහන්සේගේ ඉන්‍ද්‍රිය පරොපරියත්ත (ශ්‍රද්ධාදී ඉන්‍ද්‍රියයන්ගේ අඩු වැඩි බව දන්නා) ඥාණයද. මේ කාරණය මෙසේ කියන ලදී:

**සද්ධො පුග්ගලො අප්පරජක්ඛො, අසද්ධො පුග්ගලො මහාරජක්ඛො'**[1]

'සැදැහැති පුද්ගලයා අල්ප කෙලෙස් ඇත්තෙකි. සැදැහැ නැති පුද්ගලයා වැඩි කෙලෙස් ඇත්තෙකි' යන විස්තරය යෙදිය යුතුය.

**'යඤ්ච අයං පුග්ගලො අප්පරජක්ඛො සස්සත දිට්ඨිකො අයං උච්ඡෙද දිට්ඨිකො අයං අනුලොමිකාය ඛන්තියං ඨිතො අයං යථාභූත ඤාණෙ ඨිතො අයං කාමාසයො න නෙක්ඛම්මාදි ආසයො අයං නෙක්ඛම්මාසයො න කාමාදි ආසයොති ආදිනා, ඉමස්ස කාමරාගො අතිවිය ථාමගතො න කාමරාගාදිකොති ආදිනා, ඉමස්ස පුඤ්ඤාභිසංඛාරො අධිකො න අපුඤ්ඤාභිසංඛාරො න ආනෙඤ්ජාභිසංඛාරො, ඉමස්ස අපුඤ්ඤාභි සංඛාරො අධිකො න පුඤ්ඤාභිසංඛාරො න ආනෙඤ්ජාභිසංඛාරො, ඉමස්ස ආනෙඤ්ජාභිසංඛාරො අධිකො න පුඤ්ඤාභිසංඛාරො න අපුඤ්ඤාභිසංඛාරො. ඉමස්ස කාය සුචරිතං අධිකං ඉමස්ස වචී සුචරිතං ඉමස්ස මනො සුචරිතං, අයං හීනාධිමුත්තිකො අයං පණීතාධිමුත්තිකො, අයං කම්මාවරණෙන සමන්නාගතො, අයං කිලෙසාවරණෙන සමන්නාගතො, අයං විපාකාවරණෙන සමන්නාගතො, අයං න කම්මාවරණෙන සමන්නාගතො, න කිලෙසාවරණෙන, න විපාකාවරණෙන සමන්නාගතො'**

'මේ පුද්ගලයා කෙලෙස් අඩුකෙනෙකි. මොහු ශාස්වත දෘෂ්ටි ඇත්තෙකි. මොහු උච්ඡේද දෘෂ්ටි ඇත්තෙකි. මොහු අනුලෝමික ක්‍ෂාන්තියෙහි සිටියෙකි. මොහු යථාභූත ඥාණයෙහි සිටියෙකි. මොහු කාමාසය ඇත්තෙකි. නෙක්ඛම්මාදී ආසය නැත්තෙකි. මොහු නෙක්ඛම්මාදී ආසය ඇත්තෙකි. කාමාදී ආසය නැත්තෙකි යනාදී වශයෙන් ද මොහුගේ කාමරාගය අතිශයින් තහවුරු වී ඇත. පටිඝාදිය එසේ නොවේ. මොහුගේ පටිඝය අතිශයින් තහවුරු වී ඇත. කාමරාගාදිය එසේ නොවේ යනාදී වශයෙන් ද මොහුගේ පුණ්‍යාභිසංඛාරය අධිකය. අපුණ්‍යාභිසංඛාරය

1. පටිසම්භිදා මග්ග - ඥාණකථා

අධික නැත. ආනෙඤ්ජාභි සංඛාරය අධික නැත. මොහුගේ අපුඤ්ඤාභි සංඛාරය අධිකය. පුඤ්ඤාභිසංඛාරය අධික නැත. ආනෙඤ්ජාභිසංඛාරය අධික නැත. මොහුගේ ආනෙඤ්ජාභි සංඛාරය අධිකය. පුඤ්ඤාභි සංඛාරය අධික නොවේ. අපුඤ්ඤාභිසංඛාරය අධික නොවේ. මොහුගේ කාය සුචරිතය අධිකය. මොහුගේ වචී සුචරිතය අධිකය. මොහුගේ මනෝ සුචරිතය අධිකය. මොහු හීනාධිමුක්තිකයෙකි (පහත් අදහස් ඇත්තෙකි.) මොහු පණීතාධිමුත්තිකයෙකි (යහපත් අදහස් ඇත්තෙකි). මොහු කර්මාවරණයෙන් යුක්ත වූවෙකි. මොහු ක්ලේශාවරණයෙන් යුක්ත වූවෙකි. මොහු විපාකාවරණයෙන් යුක්ත වූවෙකි. මොහු කර්මාවරණයෙන් යුක්ත නොවූවෙකි. ක්ලේශාවරණයෙන් යුක්ත නොවූවෙකි. විපාකාවරණයෙන් යුක්ත නොවූවෙකි' යනාදී වශයෙන් ද සත්ත්වයන්ගේ ආසය ආදියේ ඇති තතු පැහැදිළි කිරීම් වශයෙන් පැවති භාග්‍යවතුන් වහන්සේගේ යම් ආසයානුසය ඤාණයක් වී ද 'ඉධ තථාගතො සත්තානං ආසයං ජානාති අනුසයං ජානාති චරිතං ජානාති අධිමුත්තිං ජානාති භබ්බාභබ්බෙ සත්තෙ ජානාති'[1]

'මෙහි තථාගතයන් වහන්සේ සත්ත්වයන්ගේ ආසය (චිත්ත සන්තානය) දැනගනිති. අනුසය (තහවුරු වූ කාමරාගාදිය) දැනගනිති. චරිතය (පෙර කළ කර්ම) දැනගනිති. අධිමුත්ති (උස්-පහත් අදහස්) දැනගනිති. භව්‍ය අභව්‍ය (ආනන්තරිය කර්මාදිය ඇති නැති) සත්ත්වයන් දැනගනිති' යනාදිය මේ සඳහා කියන ලදී.

උඩුකයින්, යටිකයින්, මැද (පසුපස) කයින්, දකුණු ඇසින්, වම් ඇසින්, දකුණු කන් සිදුරෙන්, වම් කන් සිදුරෙන්, දකුණුනාසා සිදුරෙන්, වම් නාසා සිදුරෙන්, දකුණු උරහිසින්, වම් උරහිසින්, දකුණු අතින්, වම් අතින්, දකුණු පයින්, වම් පයින්, ඇඟිල්ලෙන්, ඇඟිලි අතරින්, ලෝමයෙන්, ලෝම කූපයෙන් ද ගිනිකඳ දියකඳ පවත්වන ලද අන්‍යයන්ට පොදු නොවූ විවිධ විකුර්වන ඍද්ධි මවන භාග්‍යවතුන් වහන්සේගේ යම් යමක පාටිහීර ඤාණයක් වීද

**ඉධ තථාගතො යමක පාටිහාරියං කරොති අසාධාරණං සාවකෙහි - උපරිම කායතො අග්ගික්ඛන්ධො පවත්තති. හෙට්ඨිම කායතො උදකධාරා**

1. පටිසම්භිදා මග්ග - ආසයානුසය ඤාණය - බු.ජ.මු. 1 භා 230 පිට

**පවත්තති හෙට්ඨිම කායතො අග්ගික්ඛන්ධො පවත්තති උපරිම කායතො උදකධාරා පවත්තති'**[1]

'මෙහි තථාගතයන් වහන්සේ ශ්‍රාවකයන්ට පොදු නොවූ (අසාධාරණ වූ) යමක මහා ප්‍රාතිහාර්යය කරති. උඩුකයින් ගිනිකඳ පවත්වති. (පිටකරති) යටිකයින් දියකඳ පවත්වති. යටිකයින් ගිනිකඳ පවත්වති. උඩුකයින් දියකඳ පවත්වති' යනාදිය මේ සඳහා කියන ලදී.

රාගාදියෙන් ද ජාති ජරා ආදියෙන් ද නොයෙක් දුක්ඛ ධර්මවලින්ද උවදුරට පත් සත්ත්ව සමූහය එයින් ඉවත්කිරීමට කැමති වීම් වශයෙන් නොයෙක් ආකාරයෙන් පැවති භාග්‍යවතුන් වහන්සේගේ මහා කරුණාවට බැසගැනීමට ප්‍රත්‍ය වූ යම් මහාකරුණා සමාපත්ති ඤාණයක් වීද,

**කතමං තථාගතස්ස මහා කරුණා සමාපත්ති ඤාණං? බහුකෙහි ආකාරෙහි පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහා කරුණා ඔක්කමති'**[2]

'තථාගතයන් වහන්සේගේ මහාකරුණා සමාපත්ති ඤාණය කවරේද යත්, බොහෝ ආකාරවලින් (නුවණැසින් හා බුදුඇසින්) බලන්නා වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේලාගේ මහා කරුණාව සත්ත්වයන් කෙරෙහි බැසගනී. මේ ආදී වශයෙන් ද?'

**'ආදිත්තො ලොකසන්නිවාසොති පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහා කරුණා ඔක්කමති'**[3]

'සත්ත්ව සමූහය (ලෝක සන්නිවාසය) රාගාදියෙන් ගිනිගත්තා ලදැයි දක්නා වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේලාගේ මහා කරුණාව සත්ත්වයන් කෙරෙහි බැසගනී' මේ ආදී වශයෙන් ද අසූනව ආකාරයකින් බෙදීම කරන ලදී.

---

1. පටිසම්භිදා මග්ග - යමක පාටිහීර ඤාණය - බු.ජ.මු. 1 භා - 234 පිට
2. පටිසම්භිදා මග්ග - ඤාණ කථා
3. පටිසම්භිදා මග්ග - ඤාණ කථා

යම්තාක් ධර්මධාතු ඇද්ද සංඛත අසංඛතාදී දැනගත යුතු යම්තාක් දේ ඇද්ද ඒ සියල්ල පිළිබඳව පරෝපදේශයෙන් තොරව සියලු ආකාරයෙන් දැනගැනීමට සමත් කැමති පමණට බැඳුණු පැවතුම් ඇති අන්‍යයන්ට පොදු නොවූ භාග්‍යවතුන් වහන්සේගේ ඤාණය හැම ආකාරයෙන් ඉතිරි නොකොට සංඛත අසංඛත සම්මුති පද අවබෝධ කිරීමෙන් සබ්බඤ්ඤුත ඤාණය ද එහි ආවරණයක් නැති බැවින් ඇලීම් නැති පැවැත්ම සැලකිල්ලට ගෙන අනාවරණ ඤාණයයි ද කියනු ලැබේ. මේ මෙහි කෙටි අර්ථයයි. විස්තරය වනාහි අන් තැනක ප්‍රකට වන්නේය. මෙසේ භාග්‍යවතුන් වහන්සේගේ ඒ අසාධාරණ ඤාණ හය නොවෙනස් ආකාරයෙන් පැවති ඒ ඒ විෂයට අවිරුද්ධ වශයෙන් සත්‍යය, අසත්‍ය නොවේ. අන් අයුරකින් නොවේ. මෙසේ ද භාග්‍යවතුන් වහන්සේ තථානි ආගතො ඒ ඤාණ අවබෝධ කළ හෙයින් තථාගත නම් වෙති.

3.7 එසේම 'සත්තිමෙ භික්ඛවෙ බොජ්ඣංගාඃ සතිසම්බොජ්ඣංගො ධම්මවිචය සම්බොජ්ඣංගො විරිය සම්බොජ්ඣංගො පීති සම්බොජ්ඣංගො පස්සද්ධි සම්බොජ්ඣංගො සමාධි සම්බොජ්ඣංගො උපෙක්ඛා සම්බොජ්ඣංගො'ති'

'මහණෙනි, මේ බොජ්ඣංග සතකිඃ සති සම්බොජ්ඣංගය, ධම්මවිචය සම්බොජ්ඣංගය, විරිය සම්බොජ්ඣංගය, පීති සම්බොජ්ඣංගය, පස්සද්ධි සම්බොජ්ඣංගය, සමාධි සම්බොජ්ඣංගය, උපෙක්ඛා සම්බොජ්ඣංගය යි' මෙසේ ස්වරූප වශයෙන් ද

ලෝකෝත්තර මාර්ගක්ෂණයෙහි උපදින්නා වූ ලීන (සිතේ සැඟවීම) උද්ධච්ච (සිතේ විසිරීම), පතිට්ඨාන (පිහිටීම) ආයූහන (රැස් කිරීම) කාමසුඛ, අත්තකිලමථානුයෝග, උච්ඡේද, ශාස්වත අභිනිවේස ආදී නොයෙක් උවදුරුවලට ප්‍රතිපක්ෂ වූ 'සති' ආදී භේද ඇති යම් මේ ධර්ම සාමග්‍රියක් වේද ආර්යශ්‍රාවක තෙම යමක් කරණකොට අවබෝධ කරයි ද කෙලෙස් නින්දෙන් නැගිටී ද නැතහොත් චතුස්සත්‍ය අවබෝධ කරයි ද නැතහොත් නිවන ප්‍රත්‍යක්ෂ කරයි ද මෙසේ ඒ ධර්ම සාමග්‍රිය බෝධියයි කියනු ලැබේ. ඒ බෝධියේ අංග බොජ්ඣංග නම් වේ. නැතහොත් ආර්ය ශ්‍රාවකයා කියන ලද ආකාර ඇති ධර්මසාමග්‍රිය කරණකොට අවබෝධ කරයි යනුවෙන් පැහැදිලිකොට බෝධිය යි කියනු ලැබේ. ඒ බෝධියේ අංග බොජ්ඣංගයයි මෙසේ සාමාන්‍ය ලක්ෂණ වශයෙන් ද.

සති සම්බොජ්ඣංගය වැටහීම ලක්ෂණකොට ඇත. ධම්මවිචය සම්බොජ්ඣංගය සෙවීම ලක්ෂණකොට ඇත. විරිය සම්බොජ්ඣංගය උත්සාහය ලක්ෂණකොට ඇත. පීති සම්බොජ්ඣංගය පැතිරීම ලක්ෂණකොට ඇත. පස්සද්ධි සම්බොජ්ඣංගය සන්සිඳීම ලක්ෂණකොට ඇත. සමාධි සම්බොජ්ඣංගය නොවිසිරීම ලක්ෂණකොට ඇත. උපෙක්ඛා සම්බොජ්ඣංගය නුවණින් විමසාබැලීම ලක්ෂණකොට ඇත. මෙසේ විශේෂ ලක්ෂණ වශයෙන් ද,

**'තත්‍ථ කතමො සතිසම්බොජ්ඣංගො? ඉධ භික්ඛු සතිමා හොති පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො චිරකතම්පි චිරභාසිතම්පි සරිතා හොති අනුස්සරිතා'**[1]

'එහි සතිසම්බොජ්ඣංගය යනු කුමක් ද? මේ සසුනෙහි භික්ෂුව සිහි ඇත්තේ උතුම් සිහිනුවණින් යුක්ත වූයේ බොහෝ කලකට පෙර කරන ලද දෙය ද බොහෝ කලකට පෙර කියන ලද දෙය ද සිහි කරන්නේ නැවත නැවත සිහිකරන්නේ වෙයි' යනාදී වශයෙන් බොජ්ඣංග හත අන්‍යොන්‍ය උපකාර වශයෙන් එක් ක්ෂණයක පැවැත්ම දැක්වීම් වශයෙන් ද

**තත්‍ථ කතමො සති සම්බොජ්ඣංගො? අත්‍ථි අජ්ඣත්තං ධම්මෙසු සති අත්‍ථි බහිද්ධා ධම්මෙසු සති'**[2]

'එහි සති සම්බොජ්ඣංගය යනු කුමක් ද? අධ්‍යාත්ම ධර්මයන්හි සතියක් ඇත. බාහිර ධර්මයන්හි සතියක් ඇත' යනාදී වශයෙන් විෂය පැහැදිලි කිරීමෙහි තොරතුරු දැක්වීම් වශයෙන් ද,

**'තත්‍ථ කතමො සතිසම්බොජ්ඣංගො? ඉධ භික්ඛු සති සම්බොජ්ඣංගං භාවෙති විවෙකනිස්සිතං විරාග නිස්සිතං නිරොධ නිස්සිතං වොස්සග්ග පරිනාමිං'**

1.
2. } විභංගප්පකරණ - බොජ්ඣංග විභංග - බු.ජ.මු. 2 භා - 2, 4, 6 පිටු.
3.

'එහි සතිසම්බොජ්ඣංගය යනු කුමක්ද? මේ සසුනෙහි භික්ෂුව විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට පිරිනැමුණු සතිසම්බොජ්ඣංගය වඩයි' යනාදී වශයෙන් භාවනා විධි දැක්වීම් වශයෙන් ද,

**'තත්‍ථ කතමෙ සත්ත බොජ්ඣංගා? ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති -පෙ- තස්මිං සමයෙ සත්ත බොජ්ඣංගා හොන්ති සති සම්බොජ්ඣංගො -පෙ- උපෙක්ඛා සම්බොජ්ඣංගො, තත්‍ථ කතමො සති සම්බොජ්ඣංගො? යා සති අනුස්සති'**

'එහි සත්ත බොජ්ඣංග යනු මොනවාද? මේ සසුනෙහි භික්ෂුව යම්කලෙක ලෝකෝත්තර ධ්‍යානය වඩයි ද -පෙ- එසමයෙහි සත්ත බොජ්ඣංග වෙයි. සති සම්බොජ්ඣංගය -පෙ- උපෙක්ඛා සම්බොජ්ඣංගයයි. එහි සති සම්බොජ්ඣංගය කුමක්ද? යම් සිහිකිරීමක් නැවත නැවත සිහිකිරීමක්' යනාදී වශයෙන් ක්‍රම අනූහය දහසකට බෙදීමෙන් මෙසේ නොයෙක් නොයෙක් ආකාර වශයෙන් පැවති භාග්‍යවතුන් වහන්සේගේ බොජ්ඣංග පැහැදිලි කිරීමේ ඥාණයන් ඒ ඒ අර්ථයට විරුද්ධ නොවන ආකාරයට සත්‍යය, අසත්‍ය නොවේ. අන් අයුරකින් නොවේ. මෙසේ ද භගවා තථානි ආගතොති = තථාගතො, භාග්‍යවතුන් වහන්සේ බොජ්ඣංග පැහැදිලි කරණ ඥාණ අවබෝධ කළ හෙයින් තථාගත නම් වෙති.

3.8 එසේම **'තත්‍ථ කතමං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං? අයමෙව අරියො අට්ඨංගිකො මග්ගො, සෙය්‍යථීදං? සම්මා දිට්ඨි -පෙ- සම්මා සමාධි'**[1]

'එහි දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපදා ආර්ය සත්‍යය කුමක්ද? මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයමයි. ඒ කුමක්ද? සම්මා දිට්ඨිය -පෙ- සම්මා සමාධියයි.' මෙසේ ස්වරූප වශයෙන් ද

සියලු කෙලෙසුන්ගෙන් දුර බැවින් ද ආර්ය භාවය සිදුකරන බැවින් ද ආර්යඵල ලැබීම කරන බැවින් ද = අරිය නම් වේ. ආර්යයන් අටවැදෑරුම්

1. විභංගප්පකරණය - සච්ච විභංගය - බු.ජ.මු. 1 භාගය

බැවින් ද නිවන් අවබෝධයට ඒකාන්ත කාරණය වන බැවින් ද = අට්ඨංගිකය. කෙලෙස් මරමින් යයි. ප්‍රයෝජන ඇත්තන් විසින් සොයනු ලැබේ. නැතහොත් නිවන තමා ම සොයයි යනුවෙන් 'මග්ග' නම් වේ. මෙසේ සාමාන්‍ය ලක්‍ෂණ වශයෙන් ද, සම්මා දිට්ඨිය මනාව දැකීම (අවිපරීත දැකීම) ලක්‍ෂණය කොට ඇත. සම්මා සංකප්පය මනාව සිත නිවන් අරමුණට යොමු කිරීම ලක්‍ෂණකොට ඇත. සම්මා වාචාව සම්ප්‍රයුක්ත ධර්ම මනාව නුවණින් ගැනීම ලක්‍ෂණයකොට ඇත. සම්මා කම්මන්තය තමා හා සම්ප්‍රයුක්ත ධර්ම මනාව නගා සිටුවීම ලක්‍ෂණය කොට ඇත. සම්මා ආජීවය සම්ප්‍රයුක්ත ධර්ම මනාව පිරිසිදු කිරීම ලක්‍ෂණකොට ඇත. සම්මා වායාමය මනාව උත්සාහ කිරීම ලක්‍ෂණ කොට ඇත.

සම්මා සතිය අරමුණෙහි යථා ස්වභාවය මනාව වැටහීම ලක්‍ෂණය කොට ඇත. සම්මා සමාධිය මනාව සිත නොවිසිරීම ලක්‍ෂණය කොට ඇත. මෙසේ විශේෂ ලක්‍ෂණ වශයෙන් ද,

සම්මා දිට්ඨිය පළමුකොට තමාට විරුද්ධ වූ අනිකුත් කෙලෙස් සමග මිච්ඡා දිට්ඨිය දුරුකරයි. නිවන අරමුණු කරයි. නිවන ආවරණය කරන මෝහය දුරුකිරීමෙන්, මුළා නොවීම් වශයෙන් (සම්මා දිට්ඨිය) සමග යෙදුණු ධර්මයන් ද දකියි. එසේම සම්මා සංකප්පාදීහු ද මිච්ඡා සංකප්පාදිය දුරුකරති. (ඒවා) නිවන ද අරමුණු කරයි. සහජාත (එකට උපන්) ධර්මයන්ගේ අභිනිරෝපණය (මනාව සිත නිවන් අරමුණට යොමු කිරීම) ද, පරිග්ගහනය (මනාව නුවණින් ගැනීම) ද සමුට්ඨාපනය (මනාව නගා සිටුවීම)ද, උපට්ඨානය (අරමුණෙහි යථා ස්වභාවය මනාව වැටහීම)ද සමාදහනය (මනාව සිත නොවිසිරීම) ද සම්මා සංකප්පාදී අංගයෝ පිළිවෙළින් සිදුකරති. මෙසේ කෘත්‍ය විභාග (කටයුතු බෙදා දැක්වීම්) වශයෙන් ද

සම්මා දිට්ඨිය (මාර්ග ඥානයට) මුල් අවස්ථාවෙහි නානාක්‍ෂණිකව (නොයෙක් නොයෙක් අවස්ථාවල) වෙන වෙනම දුක් ආදිය අරමුණු වී මාර්ගය උපදින කාලයෙහි ඒක ක්‍ෂණිකව නිවනම අරමුණු කොට කෘත්‍ය වශයෙන් 'දුක්ඛෙ ඤාණං = දුක පිළිබඳ ඤාණය ආදී වූ නම් සතර ලබයි. සම්මා සංකප්ප ආදිය ද මුල් අවස්ථාවෙහි නානා ක්‍ෂණිකය, නානා අරමුණු ඇත්තේය. මාර්ගය උපදින කාලයෙහි ඒකක්‍ෂණිකය. ඒකාරම්මණය. (එක් මොහොතක එක් අරමුණක පවතී.)

ඒවා අතරින් සම්මා සංකප්පය කටයුතු වශයෙන් නෙක්ඛම්ම ආදී නම් තුනක් ලබයි. සම්මා වාචා ආදී (මාර්ගාංග) තුන මුල් අවස්ථාවෙහි බොරු කීමෙන් වැළකීම් ආදී බෙදීම්, විරති බවට ද චේතනා බවට ද පත්ව මාර්ග ක්‍ෂණයෙහි විරති බවටම පත්වේ. සම්මා වායාමය හා සම්මා සතිය කටයුතු වශයෙන් සම්මප්පධාන හා සතිපට්ඨාන වශයෙන් නම් හතරක් (සතර බැගින්) ලබයි. සම්මා සමාධිය වනාහි මාර්ගක්‍ෂණයෙහි ද ප්‍රථමධ්‍යානාදී වශයෙන් නොයෙක් ආකාර වෙයි. මෙසේ මුල් අවස්ථාවෙහි හා පසු අවස්ථාවෙහි පැවති බෙදීම් (විභාග) වශයෙන් ද

**'ඉධ භික්ඛු සම්මා දිට්ඨිං භාවෙති විවෙක නිස්සිතං'**[1] 'මේ සසුනෙහි භික්‍ෂුව විවේකය ඇසුරු කළ සම්මා දිට්ඨිය වඩයි' යනාදී වශයෙන් භාවනා විශේෂ (දැක්වීම්) වශයෙන් ද කියන ලද ආකාර ඇති සතිපට්ඨාන සම්මප්පධාන පැහැදිලි කරන ඥාණ ආදී අනන්ත අපරිමාණ භේද ඇති අන්‍යයන්ට පොදු නොවූ ප්‍රඥා විශේෂ වශයෙන් භාග්‍යවතුන් වහන්සේ ඒ ඥාණ අවබෝධ කළ හෙයින් තථාගත නම් වෙති. මෙසේ තථානි ආගතොති = තථාගතො, ඒ ඥාණ අවබෝධ කළ හෙයින් තථාගත නම් වෙති.

4. කථං තථා ගතොති = තථාගතො?

එසේ අවබෝධ කළහ යන අරුතින් කෙසේ තථාගත වෙත්ද? භාග්‍යවතුන් වහන්සේගේ යම් ඒ අභිජාතියක් - අභිසම්බෝධියක් - ධර්මවිනය පැණවීමක් - අනුපාදිසේස නිර්වාණ ධාතුවක් ඇද්ද ඒවා එසේමය. කුමක් කියන ලද ද? ලෝකනාථයන් වහන්සේ විසින් ඒ පතන ලද පවත්වන ලද යම් අර්ථයක් (ප්‍රයෝජනයක්) ඇද්ද ඒ අර්ථය ඒකාන්තයෙන් සිදුවීමෙන් විරුද්ධ නොවීම් වශයෙන් නොවෙනස්ව එසේ පැවැත්මෙන් සත්‍යය, අසත්‍ය නොවේ. අන් අයුරකින් නොවේ. එය එසේමය. මේ භාග්‍යවතුන් වහන්සේ බෝධිසත්ත්වයකු ලෙස සමතිසක් පාරමී පිරීම් ආදී කියන ලද ආකාර ඇති බුදුබවට අයත් සියලු හේතු සකස්කර තුසිත පුරයෙහි සිටිසේක් බුද්ධ කෝලාහලය අසා දසදහසක් සක්වල දෙවියන් එකට රැස්වී පැමිණ,

**කාලොයං තෙ මහාවීර උප්පජ්ජ මාතුකුච්ඡියං**
**සදෙවකං තාරයන්තො බුජ්ඣස්සු අමතං පදං**[2]

---

1. විභංගප්පකරණ - මග්ග විභංග - බු.ජ.මු. 2 භා - 20 පිට
2. බුද්ධවංස පාළි

'මහාවීරයන් වහන්ස, මේ ඔබට කාලයයි. මව්කුස උපදින්න, දෙවියන් සහිත ලෝවැසියා එතෙර කරමින් නිවන අවබෝධ කරන්න' යනුවෙන් ආයාචනා කරන ලද්දාහු උපන් පෙරනිමිති ඇත්තාහු පස්මහා බැලුම් බලා දැන් මම මනුෂ්‍ය යෝනියෙහි ඉපිද බුදුවන්නෙමියි (සිතා) ඇසළ පුන් පොහෝදින ශාක්‍යරාජ කුලයෙහි මහාමායා දේවියගේ කුසෙහි පිළිසිඳ ගෙන දසමාසයක් දෙවිමිනිසුන් විසින් මහත් පිරිවරින් යුතුව ආරක්ෂා කරමින් වෙසක් පුන්පෝදා අලුයම් කාලයෙහි අභිජාතියට පැමිණියහ.

උපන් මොහොතෙහි උන්වහන්සේගේ පිළිසිඳ ගැනීම සිදුවූ මොහොතෙහි මෙන් දෙතිස් පෙරනිමිති පහළවිය. මේ දසදහසක් ලෝකධාතු කම්පා විය. අතිශයින් කම්පා විය. වෙවුලන්ට විය. දසදහසක් සක්වල අප්‍රමාණ වූ අලෝකය පැතිරුණේය. අප්‍රමාණ වූ අලංකාරය දකිනු කැමැත්තන් මෙන් අන්ධයෝ ඇස් ලැබූහ. බිහිරෝ ශබ්ද ඇසූහ. ගොළුවෝ මැනවින් කතා කළහ. කුදු වූවෝ ඇද නැති සිරුරු ඇත්තෝ වූහ. කොර අය පයින් ගමන් කළහ. සිරගත වූ සියලු සත්ත්වයෝ දම්වැල් ආදී බැඳීම් වලින් මිදුණාහ. සියලු නරකයන්හි ගිනි නිවී ගියේය. ප්‍රේත විෂයෙහි සා (බඩගිනි) පිපාසාව සන්සිඳුණි. තිරිසන්ගත සත්ත්වයන්ට බියක් නොවීය. සියලු සත්ත්වයන්ගේ රෝග සන්සිඳුණි. සියලු සත්ත්වයෝ ප්‍රියවචන ඇත්තෝ වූහ. අශ්වයෝ මිහිරි හඬින් සිනාසුනහ. ඇත්තු ගර්ජනා කළහ. සියලු සංගීත භාණ්ඩ තම තමන්ගේ නාදය මුදාහළේය. මිනිසුන්ගේ අත් ආදියේ ඇති ආභරණ නොගැටී මිහිරි හඬින් ශබ්දය මුදාහළේය. සියලු දිසා ප්‍රසන්න විය. සත්ත්වයන්ට සැප ගෙන දෙමින් මෘදු ශීතල වා තය හැමීය. අකල්වැස්සක් වැස්සේය. පොළොවෙන් ජලය ඉහළට නැගී (මතුපිටට අවුත්) ගලා ගියේය. පක්ෂීහු අහස් ගමන අත්හළහ. ගංගාවෝ නොගලමින් සිටියහ. මහ සමුදුරෙහි දිය මිහිරි විය. බාධාවලින් තොර වූ හිරු බබළන කල්හි ම අහස්ගත සියලු තාරකාවෝ බැබළුනහ. අරූපාවචර දෙවියන් හැර ඉතිරි සියලු දෙවිවරු ද නිරයට අයත් සියල්ලෝ ද පෙනෙන රූප ඇත්තෝ වූහ.

ගස් - බිත්ති - දොර ජනෙල් - ගල් පර්වත ආදිය අනාවරණ (විනිවිද පෙනෙන) ඒවා විය. සත්ත්වයන්ගේ මරණයක් උපතක් නොවීය. සියලු දුගඳ මැඩපවත්වා දිව්‍ය සුගන්ධය හැමීය. ගෙඩි හැදෙන සියලුගස් පලදරන ඒවා බවට පත්විය. මහ සමුදුර හැමතැනම පස්පියුමෙන් වැසුණු

බිමක් විය. ගොඩ-දිය ආදී සියලු මල් පිපුණි. ගස්වල කඳෙහි කඳ පියුම්, අතුවල අතුපියුම් වැල්වල වැල්පියුම් පිපුණි. තැනිතලා පොළව, තැනිතලා ගල් බිඳී එක පිට එක හත හත බැගින් දඬු පියුම් නික්මුණි. අහසෙහි පහතට එල්ලෙන පියුම් හටගත්තේය. හාත්පස මල්වැස්සක් වැස්සේය. අහසෙහි දිව්‍ය තූර්ය භාණ්ඩ වාදනය විය. මුලු දසදහසක් ලෝකධාතුව වටා මුදාහළ මල් ගුලියක් මෙන් ද මිරිකා ගත් මල් මිටියක් මෙන් ද අලංකාර ලෙස පිළියෙළ කළ මල් ආසනයක් මෙන් ද එකම මල් මාලාවක් ඇති පැතිරුණු වල්විදුණාවක් ඇති මල්-දුම්-සුවඳ කවන ලද උසස් වූ ශෝභාවෙන් අගතැන්පත් වීය. ඒ පෙරනිමිති ද මත්තෙහි අවබෝධ කරන ලද නොයෙක් විශේෂ අධිගමයන්ගේ පෙරනිමිති ම විය. මෙසේ නොයෙක් අසිරිමත් දේ පහළවීමෙන් මේ අභිජාතිය උන්වහන්සේ විසින් පතන ලද යම් අර්ථයක් ඇද්ද ඒ අභිසම්බෝධිය ඒකාන්තයෙන් සිදුවීමෙන් සත්‍යම විය. අසත්‍ය නොවීය. අන් අයුරකින් නොවීය.

එසේ ම බුදුරජාණන් වහන්සේ විසින් ම හික්මවිය යුතු අවබෝධ කිරීමට සුදුසු බන්ධූහු වෙත් ද ඒ සියල්ලෝ ම ඉතිරි නොකොට භාග්‍යවතුන් වහන්සේ විසින් ම හික්මවන ලදහ. ශ්‍රාවකයන් විසින් නොවේ. ශ්‍රාවකයන් විසින් හික්මවිය යුතු, ධර්මය විසින් හික්මවිය යුතු අය ඒ ශ්‍රාවක ආදීන් විසින් හික්මවන ලද්දාහු හික්මවීමට යති. මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් පතන ලද යම් අර්ථයක් ඇද්ද, ඒ අර්ථය ඒකාන්තයෙන් සිදුවීමෙන් අභිසම්බෝධිය සත්‍යය අසත්‍ය නොවේ. අන් අයුරකින් නොවේ. තවද දතයුතු යම් යම් ධර්මයක යම් යම් ස්වභාවයක් අවබෝධ කළයුතුද ඒ ඒ ස්වභාවය අල්ලෙහි තබන ලද නෙල්ලි ගෙඩියක් මෙන් සිහිකිරීම් (ආවර්ජන) මාත්‍රයෙන් බැඳුණු තමන්වහන්සේගේ ඤාණයෙන් නොවෙනස් ලෙස ඉතිරි නොකොට භාග්‍යවතුන් වහන්සේ විසින් විශේෂයෙන් අවබෝධ කරන ලද්දේය යනුවෙන් මෙසේ ද අභිසම්බෝධිය සත්‍යය, අසත්‍ය නොවේ. අන් අයුරකින් නොවේ.

එසේ ම ඒ ඒ ධර්මයන් දෙසිය යුතු ඒ ඒ ආකාරය ද ඒ ඒ සත්ත්වයන්ගේ ආසය - අනුසය - චරියාව - අධිමුක්තිය මැනවින් බලා ධර්මතාව අතනොහරින්නා වූ ද පැණවීම් ක්‍රමය හා ව්‍යවහාර මාත්‍රය නො ඉක්මවන්නා වූ ද ධර්මතාව පැහැදිලි කරන්නා වූ ද වරදට අනුව අදහසට අනුව ධර්මයට අනුව අනුශාසනා කරන්නා වූ ද භාග්‍යවතුන් වහන්සේ විසින් හික්මවීමට සුදුසු අය හික්මවන ලදහ. ආර්යභූමියට

පමුණුවන ලදහ. උන්වහන්සේගේ ධර්මවිනය පැනවීම පවා ඒ අර්ථය පිණිසය. ඇති තතු (යථාභූත) පැවැත්මෙන් ද සත්‍යය, අසත්‍ය නොවේ. අන් අයුරකින් නොවේ. එසේම භාග්‍යවතුන් වහන්සේ විසින් පැමිණියා වූ යම් ඒ සෝපාදි ආදී වූ පඨවි - ඵස්ස - වෙදනාදී රූප අරූප ස්වභාවයෙන් තොර වූ කැඩෙන බිඳෙන බව නැති බැවින් ලෝක ස්වභාවය ඉක්මවූ, අඳුරෙන් මිශ්‍ර නොවූ බැවින් කිසි අයුරකින් බැබළවිය නොහැකි, ලෝක ස්වභාවය නැති බැවින්* (තිරිසන්-දේව) ගති ආදී ස්වභාව නැති, පිහිටීමක් නැති අරමුණු නැති අමෘතමහා නිර්වාණ ධාතුව ස්කන්ධ නම් වූ උපාදිවල ක්ලේශමාත්‍රයක්වත් නැති බැවින් අනුපාදිසේස යයි කියනු ලැබේ. එය මේ සඳහා කියන ලදී.

**'අත්‍ථි භික්‍ඛවෙ තදායතනං යත්‍ථ නෙව පඨවි න ආපො න තෙජො න වායො න ආකාසානඤ්චායතනං න විඤ්ඤාණඤ්චායතනං න ආකිඤ්චඤ්ඤායතනං න නෙවසඤ්ඤානාසඤ්ඤායතනං නායං ලොකො න පරො ලොකො න ච උභො චන්‍දිම සූරියා යමහං භික්‍ඛවෙ නෙව ආගතිං වදාමි න ගතිං න ඨිතිං න චුතිං න උපපත්තිං අප්පතිට්ඨං අප්පවත්තං අනාරම්මණමෙවෙතං එසෙවන්තො දුක්ඛස්ස'[1]**

'මහණෙනි, යම්තැනක පඨවි ධාතුව නැද්ද ආපෝ ධාතුව නැද්ද තේජෝ ධාතුව නැද්ද වායෝධාතුව නැද්ද ආකාසානඤ්චායතන සිත නැද්ද විඤ්ඤාණඤ්චායතන සිත නැද්ද ආකිඤ්චඤ්ඤායතන සිත නැද්ද නේවසඤ්ඤානාසඤ්ඤායතන සිත නැද්ද මේ (ස්කන්ධ) ලෝකය නැද්ද මෙයින් උපදනා අනිත් (ස්කන්ධ) ලෝකයකුත් නැද්ද (එහි අඳුරක් නැති බැවින් අඳුර දුරු කරන්නට) සඳහිරු දෙදෙනා නැද්ද එසේ වූ ඒ ආයතනය (නිවන) ඇත. මහණෙනි, කිසිවෙකුගේ පැමිණීමක් යාමක් සිටීමක් මරණයක් උපදීමක් එහි ඇතැයි නො කියමි. මෙය කිසිවක නොපිහිටි ප්‍රත්‍යවලින් නො පවත්නා කිසි අරමුණක නො එල්ලෙන දහමකි. මෙයම දුකෙහි කෙළවර ය.'

---

* අටුවාවේ එන ඔභාසාභාවතො මෙතැනට නොගැලපෙන හෙයින් ඡට්ඨ සංගායනා අටුවාවේ එන ලොකසභාවාභාවතො යන්නෙහි අර්ථය මෙහි යොදා ඇත.

1. උදාන පාළි - පාටලිගාමිය වග්ග 8 - සූත්‍රය 1 - බු.ජ.මු. 290 පිට.

ඒ නිවන සියලුම උපාදානස්කන්ධයන්ගේ විනාශයට යාමය, සියලු සංස්කාරයන්ගේ සංසිඳීමය. සියලු උපධීන්ගේ දුරුකිරීමය. සියලු දුක්වල සන්සිඳීමය. සියලු ආශාවන්ගේ උදුරා දැමීමය. සියලු සංසාර චක්‍රවල සිඳීමය. අත්‍යන්ත ශාන්ති ලක්ෂණයයි මෙසේ කියන ලද ස්වභාවයට කිසිකලෙකත් විරුද්ධනොවීම් වශයෙන් (අවිසංවාදනතො) සත්‍යය, අසත්‍ය නොවේ. අන් අයුරකින් නොවේ. මෙසේ ඒ අභිජාති ආදියට තථාගතයන් වහන්සේ එළඹියහ. ඒවා අවබෝධ කළහ. ඒවාට පිළිපන්හ. ඒවාට පත්වූහ යනුවෙන් තථාගත නම් වෙති. මෙසේ භාග්‍යවතුන් වහන්සේ තථා ගතොති තථාගතො එසේ අවබෝධ කළහ යන අරුතින් තථාගත නම් වෙති.

5. කථං තථාවිධොති = තථාගතො?
ඒ ආකාර වූ හෙයින් කෙසේ තථාගත වෙත් ද?

පෙර සම්මා සම්බුදුවරු යම් ආකාර වූවාහු ද මේ භාග්‍යවතුන් වහන්සේ ද ඒ ආකාර වූහ. කුමක් කියන ලද ද? ඒ භාග්‍යවතුන් වහන්සේලා මාර්ග ශීලයෙන් ඵල ශීලයෙන් සියලුම ලෞකික ලෝකෝත්තර ශීලයෙන්ද මාර්ග සමාධියෙන් ඵල සමාධියෙන් සියලුම ලෞකික ලෝකෝත්තර සමාධියෙන් ද මාර්ග ප්‍රඥාවෙන් ඵල ප්‍රඥාවෙන් සියලුම ලෞකික ලෝකොත්තර ප්‍රඥාවෙන් ද දිනපතා පරිහරණය කළයුතු කෝටි විසිහතර ලක්ෂයක් සමාපත්ති විහාරවලින් ද තදංග විමුක්තියෙන් ද විෂ්කම්භන විමුක්තියෙන් ද සමුච්ඡේද විමුක්තියෙන් ද පටිප්පස්සද්ධි විමුක්තියෙන් ද නිස්සරණ විමුක්තියෙන් දැයි මෙසේ කෙටියෙන් ද, විස්තර වශයෙන් වනාහි අනන්ත අපරිමාණ භේද ඇති සිතිය නොහැකි ආනුභාව ඇති සියලු සර්වඥ ගුණවලින් අපගේ මේ භාග්‍යවතුන් වහන්සේ ද එබඳු වෙති.

සියලුම සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ ආයුෂ විවිධත්වය, ශරීර ප්‍රමාණ විවිධත්වය, කුල විවිධත්වය, දුෂ්කර හැසිරීමෙහි විවිධත්වය, බුද්ධරශ්මි විවිධත්වය යන මේ විවිධත්ව පහෙන් විවිධත්වය ඇතිවන්නේය. (එහෙත්) සීලවිසුද්ධි ආදී විසුද්ධිවල ද සමථ විදර්ශනා ප්‍රතිපත්තියෙහි ද තමා විසින් අවබෝධ කළ ගුණ වල ද කිසිදු විවිධත්වයක් නැත. එහෙත් මැදින් බිඳී ගිය (වෙන් වූ) රන් කැබැල්ලක විශේෂයක් නැතුවාක් මෙන් ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේලා අතර විශේෂත්වයක් නැත. එහෙයින් පැරණි සම්මා සම්බුදුරජාණන් වහන්සේලා යම් ආකාරයකින් යුක්ත

වූවාහු ද මේ භාග්‍යවතුන් වහන්සේ ද ඒ ආකාරයෙන් යුක්ත වෙති. මෙසේ 'තථාවිධො' ඒ ආකාර ඇත්තේය යන අරුතින් 'තථාගතො' තථාගත නම් වෙති. මෙහි 'ගත' ශබ්දය විධ (ආකාර) යන අර්ථ ඇත්තේය. එහෙයින් ලෝකවාසීහු 'විධ' යන්න යෙදුණු 'ගත' ශබ්දයෙහි ප්‍රකාරය (ආකාරය) යන අර්ථය ඇතැයි කියති.

6. කථං තථා පවත්තිකොති = තථාගතො?
එසේ පැවතුම් ඇති හෙයින් තථාගත වන්නේ කෙසේද?

අන් අයට පොදු නොවූ ඍද්ධි ආනුභාවයෙන් යුක්ත හෙයින් ද ඉතා උසස් අයුරින් අත්ථපටිසම්භිදාදියේ කෙළවරට පැමිණි බැවින් ද අනාවරණ ඤාණය ලැබීමෙන් ද කයේ පැවැත්ම ආදියේ ගැටීමක් කිසිතැනක නැති බැවින් උන්වහන්සේගේ කය-වචන-සිතේ පැවැත්ම රුචි වූ පරිද්දෙන් ගියේය යන අරුතින් 'තථාගත' නම් වෙති.

මෙලෙස 'තථා' එසේ 'පවත්තිකො' පැවැත්ම ඇත්තේ යන අරුතින් 'තථාගතො' තථාගත නම් වෙති.

7. කථං තථෙහි අගතො ති = තථාගතො?
ඒ ඤාණවලින් පැමිණි හෙයින් තථාගත වන්නේ කෙසේද?

බෝධි සම්භාර (බෝධියට අවශ්‍ය කටයුතු) සිදුකිරීමෙහි දී එයට ප්‍රතිපක්ෂ පැවැත්ම නම් වූ ගතයක් (ගමනක්) උන්වහන්සේට නැත යන අරුතින් අගත නම් වෙති. මසුරුමල ආදියෙහි නොවෙනස් ලෙස ආදීනවද දානපාරමී ආදියෙහි නොවෙනස් ලෙස ආනිසංස ද ප්‍රත්‍යවේක්ෂණ ආදී ක්‍රමයෙන් පැවති ඤාණවලින් උන්වහන්සේගේ ඒ අගතභාවය සිදුවේ. මෙසේ ඒ ඤාණවලින් අගත වූයේ යන අරුතින් තථාගත නම් වෙති. නැතහොත් කෙලෙස් අභිසංස්කාරයන්ගේම පැවැත්ම නම් වූ ද ස්කන්ධයන්ගේම පැවැත්ම නම් වූ ද (නිරය ආදී වූ) පංච ගතිවල ගමනක් උන්වහන්සේට නැත යන අරුතින් අගත නම් වෙති. සෝපාදිසේස අනුපාදිසේස යන නිර්වාණයන්ගේ පැවැත්මෙන් උන්වහන්සේගේ ඒ මේ අගතභාවය වන්නේ ඒ ආර්යමාර්ග ඥානයන් කරණකොට ගෙන ය. මෙසේ ද භාග්‍යවතුන් වහන්සේ තථ නම් වූ ආර්යමාර්ග ඥානවලින් බැහැර නො ගියහ. යන අරුතින් තථාගත නම් වෙති.

8. කථං තථා ගතභාවෙන = තථාගතො?
එසේ ගිය බැවින් කෙසේ තථාගත වෙත් ද?

එසේ ගිය බැවින් ද එසේ යාමේ සත්භාවයෙන් ද, (එනම්) ඇති බැවින් යන අර්ථයි. යමක ඇති බැවින් භාග්‍යවතුන් වහන්සේ තථාගත යයි කියනු ලැබෙත් ද ඒ මේ තථාගතය කුමක් ද? (එනම්) සද්ධර්මය යි. සද්ධර්මය වනාහි : පළමුකොට ආර්ය මාර්ගය එකට බැඳී ඇති (යුගනද්ධ) සමථ විදර්ශනා බලයෙන් සහමුලින් උදුරා දැමීමෙන් සහමුලින් පහකිරීම් (සමුච්ඡේදප්පහාන) වශයෙන් යම්සේ යා යුතු ද එසේ ගියේ වෙයි. ඵලධර්මය වනාහි : තමාගේ මාර්ගයට අනුරූප වූ පටිප්පස්සද්ධිප්පහාන වශයෙන් යම්සේ යා යුතුද එසේ ගියේ එසේ පැවතියේ වෙයි. නිර්වාණ ධර්මය වනාහි යම්සේ ගමන් කරන ලදුව ප්‍රඥාවෙන් අවබෝධ කරන ලදුව සියලු සංසාර දුක් සන්සිඳීම පිණිස පැමිණේද, බුද්ධාදීන් විසින් එසේ ගමන්කරන ලද්දේ ප්‍රත්‍යක්ෂ කරන ලද්දේය යන අරුතින් තථාගත නම් වෙයි. පෙර බුදුරජාණන් වහන්සේලා විසින් සූත්‍ර ගෙය්‍ය ආදී වශයෙන් පැවති මුල් ප්‍රකාශන වශයෙන් ද හික්මවීමට සුදුසු අයගේ ආසය ආදියට අනුරූපව විමුක්තිය පිණිස පවත්වන ලද පර්යාප්ති ධර්මය යම්සේ ද, එසේ අපගේ භාග්‍යවතුන් වහන්සේ විසින් ද එසේ ගමන්කරන ලද්දේ කියන ලද්දේ පවත්වන ලද්දේය යන අරුතින් තථාගත නම් වෙයි.

යම්සේ භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද ද ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයන් විසින් අවබෝධ කරන ලද්දේය යන අරුතින් තථාගත නම් වේ. මෙසේ සියලුම සද්ධර්මය තථාගත නම් වේ. එහෙයින් ශක්‍ර දිව්‍යරාජයා '**තථාගතං දෙවමනුසස පූජිතං ධමමං නමසසාම සුවතථි හොතු**'[1] යනුවෙන් කීය. මෙසේ ඒ සද්ධර්මයම උන්වහන්සේට ඇත්තේය යන අරුතින් භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වෙති.

ධර්මය යම්සේද මෙසේ ආර්ය සංඝයා ද යම්සේ තමාට හිත පිණිස ද අනුන්ට හිත පිණිසද පිළිපන්නේ ඉතා පිරිසිදු පූර්වභාග සමථ විදර්ශනා ප්‍රතිපදාව පෙරටුකොට ඒ ඒ මාර්ගයෙන් යා යුතුද ඒ ඒ මාර්ගයට එසේ ගියේය යන අරුතින් තථාගත නම් වේ.

---

1. සුත්ත නිපාතය - රතන සූත්‍රය

යම්සේ භාග්‍යවතුන් වහන්සේ විසින් සත්‍ය, පටිච්ච සමුප්පාද ආදී න්‍යාය දේශනා කරන ලද ද එසේම අවබෝධ කළ හෙයින් (සංඝයා ද ඒ ධර්මය එසේ) දේශනා කිරීම් වශයෙන් ද තථාගත නම් වේ. එහෙයින් ශක්‍ර දිව්‍ය රාජයා **'තථාගතං දෙවමනුස්සපූජිතං සංඝං නමස්සාම සුවත්ථි හොතු'** යනුවෙන් කීය. ශ්‍රාවක වූ ඒ සංඝයා උන්වහන්සේට ඇත්තේය යන අරුතින් භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වෙති. මෙසේ 'තථා' එසේ 'ගතභාවෙන' ගිය බැවින් 'තථාගතො' තථාගත නම් වෙති.

මෙය ද තථාගතයන් වහන්සේගේ තථාගතභාවය පැහැදිලි කිරීමෙහි මුඛ මාත්‍රයක් පමණි. සියලු ආකාරයෙන් තථාගතයන් වහන්සේ ම තථාගතයන් වහන්සේගේ තථාගතභාවය වර්ණනා කරන්නාහුය. ඒ අප්‍රමාද පදයට මෙන් මහත් අර්ථ ඇත්තා වූ මහත් ගති (ආකාර) ඇත්තා වූ මහත් ඵලය ඇත්තා වූ මේ තථාගත පදය යුක්ති වශයෙන් ඇති බැවින් ත්‍රිපිටක බුද්ධ වචනය ඉදිරිපත් කරමින් සෑහීමකට පත් නොවීමෙන් ධර්මකථික තෙමේ ඉවත්ව ගියේ යයි නොකිව යුතුය. එහිලා මේ අදහස කියනු ලැබේ.

1. **යථෙව ලොකෙ පුරිමා මහෙසිනො**
**සබ්බඤ්ඤුභාවං මුනයො ඉධාගතා**
**තථා අයං සක්‍යමුනීපි ආගතො**
**තථාගතො වුච්චති තෙන චක්ඛුමා**

මේ ලෝකයෙහි පෙර මහර්ෂී වූ මුනිවරු යම්සේ සර්වඥභාවයට ආවාහු ද එසේ මේ ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ ද ආවාහුය. එහෙයින් (බුද්ධචක්ඛු ආදී) ඇස් ඇති බුදුරජාණන් වහන්සේ තථාගත යයි කියනු ලැබේ.

2. **පහාය කාමාදිමලෙ අසෙසතො**
**සමාධි ඤාණෙහි යථා ගතා ජිනා**
**පුරාතනා සක්‍යමුනී ජුතින්ධරො**
**තථා ගතො තෙන තථාගතො මතො**

කාම ආදී මල (අපිරිසිදු දේ) ඉතිරි නොකොට දුරුකොට පැරණි ජින නම් වූ බුදුවරු සමාධි ඤාණවලින් යම්සේ ගියාහුද පිළිපැද්දාහුද එහෙයින් තථාගත යයි දන්නා ලදී.

3. තථඤ්ච ධාතායතනාදි ලක්ඛණං
සභාවසාමඤ්ඤ විභාග භෙදතො
සයම්භු ඤාණෙන ජිනොයමාගතො
තථාගතො වුච්චති සක්‍ය පුංගවො

මේ ජිනයන් වහන්සේ ස්වභාව හා සාමාන්‍ය බෙදීම්වලින් සත්‍ය වූ ධාතු ආයතන ආදී ලක්‍ෂණයට ස්වකීය ඤාණයෙන් පැමිණියහ. (ලක්‍ෂණය අවබෝධ කළහ) එහෙයින් ශාක්‍ය ශ්‍රේෂ්ඨයන් වහන්සේට තථාගතය යි කියනු ලැබේ.

4. තථානි සච්චානි සමන්තචක්ඛුනා
තථා ඉදප්පච්චයතා ච සබ්බසො
අනඤ්ඤනෙය්‍යෙන යතො විභාවිතා
තථා ගතො තෙන ජිනො තථාගතො

අනිකකු විසින් අවබෝධ කරවීමට යෝග්‍ය නොවූ ද සමතැස් ඇත්තා වූ ද බුදුරදුන් විසින් සත්‍ය වූ ආර්ය සත්‍යයෝ ද එසේම පටිච්ච සමුප්පාදය ද සර්වප්‍රකාරයෙන් අවබෝධ කරන ලද්දාහු ද එහෙයින් තථා ගත යන අරුතින් ජිනයන් වහන්සේ තථාගත නම් වන සේක.

5. අනෙක භේදාසුපි ලොකධාතුසු
ජිනස්ස රූපායතනාදි ගොචරෙ
විචිත්තභෙදෙ තථමෙව දස්සනං
තථාගතො තෙන සමන්තලොචනො

නොයෙක් භේද ඇති ලෝකධාතුවල විසිතුරු භේද ඇති රූපායතනාදී අරමුණු එක එකක් තථ්‍ය (සත්‍යය). ඒ තථ්‍ය භාග්‍යවතුන් වහන්සේට දර්ශනය වේ. එහෙයින් සමතැස් ඇති බුදුරජාණන් වහන්සේ තථාගත නම් වෙති.

6. **යතො ච ධම්මං තථමෙව භාසති**
**කරොති වාචායනුරූප මත්තනො**
**ගුණෙහි ලොකං අභිභුය්‍යිරීයති**
**තථාගතො තෙනපි ලොකනායකො**

යම්හෙයකින් සත්‍ය වූම ධර්මය දෙසත් ද සිය වචනයට අනුරූප වූවක් කරත් ද ගුණයන්ගෙන් ලෝකයා ඉක්මවා ඉරියව් පවත්වත් ද එයින් ද ලෝකනායකයන් වහන්සේ තථාගත නම් වන සේක.

7. **තථා පරිඤ්ඤාය තථාය සබ්බසො**
**අවෙදි ලොකං පභවං අතික්කමි**
**ගතො ච පච්චක්ඛක්‍රියාය නිබ්බුතිං**
**සදා රිය මග්ගඤ්ච ගතො තථාගතො**

පිරිසිඳ දැනීම නම් වූ තථයෙන් සියලු ආකාරයෙන් ලෝකය (දුක) අවබෝධ කළහ. ප්‍රභවය (සමුදය) ඉක්මවූහ. ප්‍රත්‍යක්‍ෂ ක්‍රියාවෙන් නිවනට ගියහ. සැමදා ආර්ය මාර්ගයේ ද ගමන් කළහ. එහෙයින් තථාගත නම් වෙති.

8. **තථා පටිඤ්ඤාය තථාය සබ්බසො**
**හිතාය ලොකස්ස යතො යථාගතො**
**තථාය නාථො කරුණාය සබ්බදා**
**ගතො ච තෙනාපි ජිනො තථාගතො**

එසේම සත්‍ය වූ ප්‍රතිඥාවට අනුව සියලු ආකාරයෙන් ලෝකයාගේ හිතපිණිස යම්හෙයකින් පිළිපන්නාහු ද සත්‍ය වූ කරුණාවෙන් නාථයන් වහන්සේ සැමදා යුක්ත වූවාහු ද එහෙයින් ජිනයන් වහන්සේ තථාගත නම් වෙති.

9. **තථානි ඤාණානි යතො යමාගතො**
**යථාසභාවං විසයාවබොධතො**
**තථාභි ජාතිප්පභුතිං තථාගතො**
**තදත්ථ සම්පාදනතො තථාගතො**

යම්හෙයකින් මාර්ගඥාන ආදී තථ්‍යයන් අවබෝධ කළ සේක් ද, විෂයාවබෝධයෙන් (ඒ ඒ ඥාණ අවිපරීතාකාර පැවැත්මෙන්) යථා ස්වභාව ඇත්තේ ද එසේම (සිදුහත් බෝසත් උපත නමැති) අභිජාතියේ පටන් ඉදිරියට ඒ අර්ථයන් සම්පාදනය කිරීමෙන් තථාගත නම් වෙති.

10. යථා විධාසුං පුරිමා මහෙසිනො
තථා විධොයමපි තථා යථාරුචි
පවත්ත වාචා තනුචිත්ත භාවතො
තථාගතො වුච්චති අග්ග පුග්ගලො

පෙර මහර්ෂීහු යම්බඳු වූවාහු ද මුන්වහන්සේ ද එබඳු වූහ. එසේම රුචි වූ පරිද්දෙන් උන්වහන්සේගේ කය - වචන - සිත පැවතියේය. එහෙයින් අග්‍ර පුද්ගලයන් වහන්සේට තථාගතය යි කියනු ලැබේ.

11. සංබොධි සම්භාර විපක්ඛතො පුරෙ
ගතං න සංසාරගතම්පි තස්ස
න චත්ථි නාථස්ස භවන්ත දස්සිනො
තථෙහි තස්මා අගතො තථාගතො

ඒ භව කෙළවර දක්නා වූ නාථයන් වහන්සේට සම්බෝධිය ඇතිකරන ධර්ම රාශියට විරුද්ධ වූ ගමනක් ද පෙර නොවීය. (ස්කන්ධයන්ගේ පැවැත්ම නම් වූ) සංසාරයට යාමක් ද නැත. තථ නම් වූ ඥාණවලින් එබඳු ගමනක් නැති හෙයින් තථාගත නම් වෙති.

12 තථාගතො ධම්මවරො මහෙසිනො
යථා පහාතබ්බමලං පහීයති
තථාගතො අරියගණො විනායකො
තථාගතො සමංගිභාවතො

(උන්වහන්සේ දේශනා කළ ධර්මය) යම්සේ දුරුකළ යුතු කෙලෙස් මල දුරුකරයි ද එහෙයින් උතුම් වූ ධර්මය තථාගත නම් වෙයි. ආර්ය සංඝයා (ඒ ධර්මයට අනුව ගිය හෙයින් තථාගත නම් වෙයි. මහර්ෂි වූ විනායක වූ බුදුරජාණන් වහන්සේ (ඒ උතුම් ධර්මයෙන් ද ආර්ය සංඝයාගෙන් ද යන) මෙයින් යුක්ත බැවින් තථාගත නම් වෙති.

**අරහනතං සමමා සමබුදධං** යන මෙහි අරහ යන පදයේ අර්ථය මුලින් කියන ලද්දේමය. මනාකොට තමා ම සියලු ධර්මයන් අවබෝධ කළ බැවින් සම්මා සම්බුද්ධ නම්. දතයුතු යම්කිසි දෙයක් ඇත්නම් ඒ සියල්ල ගැන සියලු ආකාරයෙන් නොවෙනස් ලෙස තමා ම විශේෂයෙන් අවබෝධ කරන ලද බැවිනැයි කියන ලද්දේ වෙයි. මෙයින් පරෝපදේස රහිත සියලු ආකාරයෙන් සියලු ධර්ම අවබෝධයට සමත් වූ කැමැත්ත හා බැඳුණු පැවතුම් ඇති අනාවරණ ඤාණ නම් වූ මේ සර්වඥතා ඥානයේ ලැබීම දක්වන ලදී. සර්වඥතා ඥානයෙන් අනිකක් අනාවරණ ඥානයයි ද අන් ආකාරයකින් අසාධාරණ ඤාණ හය බුද්ධඤාණ යයි ද කීම විරුද්ධ නොවන්නේ ද? විරුද්ධ නොවේ. විෂයෙහි පවතින භේද වශයෙන් අන්‍යයන්ට අසාධාරණ (පොදු නොවූ) බව දැක්වීමට එකම ඤාණය දෙයාකාරයකින් කියන ලද බැවිනි.

ඉතිරි නැතිව සංඛත අසංඛත සම්මුති යන ධර්ම විෂය වන බැවින් ඒ එකම ඤාණය සබ්බඤ්ඤුත ඤාණය යි. එහි ද ආවරණ නැති බැවින් ඇලීම් බැඳීම් නැතිව හැසිරීම සලකා අනාවරණ ඤාණය යි කියන ලදී. පටිසම්භිදාවෙහි කියන ලද පරිදි මෙසේය. 'සබබං සංඛතාසංඛතං අනවසෙසං ජානාතීති = සබබඤ්ඤුත ඤාණං තතථ ආවරණං නතථීති අනාවරණ ඤාණං' 'සංඛත අසංඛත යන සියල්ල ඉතිරි නොකොට දන්නේය යන අරුතින් සබ්බඤ්ඤුත ඤාණය, ආවරණයක් නැත යන අරුතින් අනාවරණ ඤාණය' යනාදියයි. එහෙයින් ඒවායේ අර්ථ වශයෙන් භේදයක් නැත. ඒකාන්තයෙන්ම එය මෙසේ කැමතිවිය යුතුය.

අන් අයුරකින් සර්වඥතා ඥානය, අනාවරණ ඥානය යන ඥානවලට ආවරණ සහිත බවත් සියලු ධර්ම අරමුණු නොවන බවත් (යන අදහස) පැමිණෙන්නේ ද? (ඇතිවන්නේ ද?) භාග්‍යවතුන් වහන්සේගේ ඥානයේ අනුමාත්‍ර වූ ද ආවරණයක් නැත. අනාවරණ ඥානයට සියලු ධර්ම අරමුණු නොවන කල්හි යම්තැනක එය (අනාවරණය) නො පවතීද එහි ආවරණය ඇති බැවින් අනාවරණ බව නොවන්නේ ම ය. නැතහොත් සර්වඥතා ඥානයෙන් අනිකක්ම අනාවරණ ඥානය වේවා.

මෙහි වනාහි හැමතැනම නො හැපුණු බැවින් සබබඤ්ඤුත ඤාණයම අනාවරණ ඤාණය යයි අදහස් කරන ලදී. එය අවබෝධ කිරීමෙන් භාග්‍යවතුන් වහන්සේ සබබඤ්ඤූ, සබබවිදූ, සම්මා සම්බුද්ධ

යයි කියනු ලැබේ. (එය ද) එක්වරම සියලු ධර්මයන් අවබෝධ කිරීමෙන් නොවේ. එය පටිසම්භිදා වෙහි මෙසේ කියන ලදී.

**'විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුත ඤාණස්ස පටිලාභා සච්ඡිකා පඤ්ඤත්ති යදිදං බුද්ධො'**

'බුද්ධ යන යම් නමක් වීද ඒ බුද්ධනාමය භාග්‍යවත් බුදුවරයන්ට විමොක්ෂය (නිවන) කෙළවර දී බෝමුල සර්වඥතාඥානයේ ප්‍රතිලාභයත් සමග අර්හත්ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියකි.'

සියලු ධර්ම අවබෝධ කිරීමට සමත් ඤාණය අවබෝධ කිරීමෙන් භාග්‍යවතුන් වහන්සේගේ සන්තානයෙහි (සිතෙහි) ඉතිරි නැතිව ධර්මයන් අවබෝධ කරන්නට සමත් බව ඇතිවිය. මෙහිදී මේ ප්‍රශ්නය ඇසීය. පවතින්නා වූ මේ ඤාණය එක්වරටම සියලුම විෂයෙහි පවතී ද? නැතහොත් ක්‍රමයෙන් (ඒ ඒ කරුණෙහි) පවතී ද? මෙහිලා කුමක් කියයි ද? ඉදින් එක්වරම සියලු විෂයෙහි පවතී නම් අතීත අනාගත වර්තමාන අධ්‍යාත්ම බාහිර ආදී භේදභින්න වූ සංඛත අසංඛත ධර්ම ද සම්මුති ධර්ම ද එකට වැටහීමෙහි දී චිත්‍ර අඳින ලද වස්ත්‍රයක් දුරසිට බලන්නෙකුට එම චිත්‍ර බෙදා හදා අවබෝධ නොවන්නාක් මෙන් විෂය විභාග වශයෙන් අවබෝධ නො වන්නේය.

එසේ ඇතිකල්හි ද සියලු ධර්ම අනාත්මය යි විදර්ශනා කරන්නවුන්ට අනාත්ම වශයෙන් විෂය වන්නාක් මෙන් සියලු ධර්මයන් නිරූපනය නොකරන ලද ස්වරූපයෙන් භාග්‍යවතුන් වහන්සේගේ ඤාණයට අරමුණු වෙති යි යන (අදහසට) පැමිණෙයි. යමෙක් දතයුතු සියලු ධර්මවල පවතින ලක්ෂණයට විෂය වූ විකල්ප රහිත වූ බුදුවරුන්ගේ ඤාණය සියලු කල්හි පවතී ද එහෙයින් ඔවුහු සබ්බවිදූ (සියල්ල දන්නෝ)ය යි කියනු ලැබෙත් ද එසේ ද කියා **"චරං සමාහිතො නාගො තිට්ඨන්තො පි සමාහිතො"** "ඇවිදිමින් සන්සුන් වූ නාගයා (ඇතා) සිටියේ ද සන්සුන්ය' යන මේ වචනය ද මනාව කියන ලදැයි කියත් ද (ඔවුන්ගේ එම අදහස ද) කියන ලද දෝෂයට නැඹුරුව පවතී. පවතින ලක්ෂණය අරමුණු කර ඇති බැවින් ද අතීත අනාගත සම්මුති ධර්මවල එය නොමැති බැවින් භාග්‍යවතුන් වහන්සේගේ ඤාණය එක් කොටසක් අරමුණු වූවක් ම වන්නේය. එහෙයින් එක්වර ම ඤාණය පවතී යන්න සුදුසු නොවේ.

නැවත ක්‍රමයෙන් සියලු දේ විෂයෙහි ඥාණය පවතී යන්න ද සුදුසු නොවේ. ජාති, භූමි, ස්වභාව ආදී වශයෙන් ද දිශා, දේශ, කාල ආදී වශයෙන් ද නොයෙක් ලෙස බෙදී බිඳී ගිය දතයුතු ධර්මයන් ක්‍රමයෙන් ගනු ලබන කල්හි දතයුතු ධර්මයේ සීමාවක් නැති බැවින් ඒ දතයුතු දේ පිළිබඳ ඉතිරි නොවූ (සම්පූර්ණ) අවබෝධ නොලැබේ.

යමෙක් අර්ථයේ අවිසංවාදකත්වයෙන් (අසත්‍ය නොවන බැවින්) දතයුතු දෙයෙහි එක් කොටසක් ප්‍රත්‍යක්ෂ කොට ඉතිරි ඒවායෙහි ද මෙසේය යි නිශ්චය කර තීරණය කිරීමෙන් භාග්‍යවතුන් වහන්සේ සර්වඥ වන සේක, ඒ ඥාණය ද සැක නැති බැවින් අනුමානයක් නොවන්නේය. ලෝකයෙහි අනුමාන ඥානය සැකය හා බැඳී ඇතැයි කියත් ද ඔවුන්ගේ ඒ අදහස ද සුදුසු නොවේ. (එසේ වන්නේ) සියලු අර්ථය ප්‍රත්‍යක්ෂ කල්හි අවිසංවාදනයෙන් (අසත්‍ය නොවීමෙන්) දතයුතු දෙයෙහි එක් කොටසක් ප්‍රත්‍යක්ෂ කොට සෙස්සෙහි ද මෙසේය යි නිශ්චය කර තීරණය කිරීමක් නොලැබෙන හෙයිනි.

යම්හෙයකින් යම් ඒ ශේෂයක් වේද එය අප්‍රත්‍යක්ෂ වේ. නැවත එයද ප්‍රත්‍යක්ෂ වේ. එහි ඉතිරි බවක් නැත යන මේ සියල්ල සිදු නොවේ. කවර හෙයින්ද? විෂය නොවන්නක් පිළිබඳ විමසීමක් ඇති නිසාය. භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, බුද්ධවිෂය නොසිතිය හැකිය. නොසිතිය යුතුය. යමෙක් සිතන්නේ නම් උම්මත්තකයෙක් චිත්ත වික්ෂිප්තයෙක් වන්නේය' යන මෙය කියන ලදී. මේ වනාහි මෙහි නිගමනයයි. භාග්‍යවතුන් වහන්සේ විසින් සියල්ලම හෝ එක් කොටසක් හෝ දැනගන්නට කැමති වීද එහි නොහැපුණු පැවතුම් ඇති බැවින් ප්‍රත්‍යක්ෂ වශයෙන් ඥාණය පවතී. වික්ෂේපයක් නොමැති බැවින් නිත්‍ය වූ එකග්‍ර බව ද වේ. දැනගන්නට කැමති වූ සියල්ල පිළිබඳ අවිෂය බව ඇතිවිට ඒ පිළිබඳ කැමැත්ත හා බැඳුණු බවක් නොවන්නේය. 'සියලු ධර්ම භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ආවර්ජනය හා බැඳුණේය. කැමැත්ත හා බැඳුණේය. මෙනෙහි කිරීම හා බැඳුණේය. සිතිවිලි හා බැඳුණේය' යන වචනයෙන් ඒකාන්තයෙන්ම එය කැමතිවිය යුතුය. භාග්‍යවතුන් වහන්සේගේ අතීත-අනාගත විෂයී ඥානය ද් අනුමානයෙන් පැමිණීම තර්ක ගැනීම නැති නිසා ප්‍රත්‍යක්ෂයක්මය.

යම්විටෙක මේ පක්ෂයේ ද සියල්ල දැන ගන්නට කැමති වීද එහිම එක්වරම සියල්ල විෂය කර ඇති බැවින් නිරූපණය නොකරන ලද ස්වරූපයෙන් භාග්‍යවතුන් වහන්සේගේ ඥාණය පවතින්නේ යැයි කියන ලද දෝෂයට වැටීමක්ම නොවන්නේ ද? එය පිරිසිඳු කරන ලද බැවින් නැත්තේමය. අචින්ත්‍ය වූ ඒ බුද්ධවිෂය ශෝධනය කරන ලද්දේමය. අන්ලෙසකින්, බොහෝ ජනයාගේ ඥාණය සමව පවතින බැවින් භාග්‍යවත් බුදුවරුන්ගේ ඥාණයේ අචින්ත්‍ය බවක් නොවන්නේය. එහෙයින් සියලු ධර්මාරම්මණය ද එක් ධර්ම අරමුණක් මෙන් මනාව තීරණය කළ කල්හි ම ඒ ධර්ම එසේකොට පවතී යන මෙය මෙහි නොසිතිය යුත්තයි. දතයුතු දේ යම්පමණ ද ඥාණය ඒ පමණය. ඥාණය යම් පමණද දතයුතු දෙය ද එපමණය. ඥාණය දතයුතු දෙය කෙළවර කර ඇත්තේය. දතයුතු දෙය ඥාණය කෙළවරකර ඇත්තේය. මෙසේ එක් වැදෑරුම්ව හෝ වෙන් වෙන්ව හෝ වරක් හෝ ක්‍රමානුකූලව හෝ ඉච්ඡානුරූපී වූ සියලු ධර්ම මනාව තමන්ම අවබෝධ කරන ලද බැවින් භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධ නම් වෙති. ඒ සම්මා සම්බුදුරදුන්ටය.

ද්වෙ විතක්කා යනු සම්මා විතර්ක දෙකය. මෙය කරණකොට විතර්ක කරති. තමා හෝ විතර්ක කරයි. විතර්ක කිරීම් මාත්‍රය ම හෝ විතර්ක නමි. ඒ මේ විතර්කය අරමුණට සිත යොමුකිරීම ලක්ෂණය කොට ඇත. (අරමුණෙහි) හැපීම රසය (කෘත්‍ය) කොට ඇත්තේය. සිතට අරමුණු ගෙන ඒම වැටහීම (පච්චුපට්ඨාන) කොට ඇත. විෂය භේදයෙන් ඒ විතර්කය, දෙයාකාර කොට විතර්ක දෙකකැයි කියන ලදී. **සමුදාචරන්ති** යනු සමානව ද මනාව ද ඉහළ ඉහළ සීමාවෙහි හැසිරෙති. (සං+උ+ආ+චර ධාතුව) මෙහි 'ආ' කාරය මරියාදා (සීමාව) යන අර්ථ ඇත්තේ ය. ඒ යෝගයෙන් 'තථාගතං අරහන්තං සම්මා සම්බුද්ධං' යන මෙය සාමි (ෂට්ඨි විභක්ති) අර්ථයෙහි උපයෝග (දුතියා විභක්ති) වචනයකි. තථාගත වූ අර්හත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ඒ විතර්කයෝ ඒ ඒ විතර්කයට අයත් විෂයෙහි සමානවද මනාවද එකිනෙක සීමාව නො ඉක්මවමින් ඉහළට ඉහළට බහුලව නිතර හැසිරෙති, පවතිත් යන මෙය කියන ලද්දේ වෙයි.

ඒ විතර්කවල විෂය කුමක් ද? සීමාව කුමක් ද? ඒ සීමාව නො ඉක්මවා ඒ විතර්ක ඉහලට ඉහලට බහුලව නිතර නිතර පවතින්නේ කෙසේ ද? (එයට මේ පිළිතුර) කියනු ලැබේ. ඛෙම විතර්කය පවිවේක

විතර්කය යනුවෙන් මේ විතර්ක දෙකක් ඇත. ඒ අතරින් පළමුව ඛේම විතර්කය විශේෂයෙන් භාග්‍යවතුන් වහන්සේගේ කරුණාව සමග යෙදුණේ වෙයි. මෛත්‍රිය, මුදිතාව සමග යෙදීම ද ලැබේමය. එහෙයින් ඒ ඛේම විතර්කය මහාකරුණා සමාපත්තිය ද මෛත්‍රී ආදී සමාපත්ති ද පෙරටුකොට ඇති බවත් ඒවා සමග යෙදුණු බවත් දතයුතුය. පවිවේක විතර්කය ඵලසමාපත්තිය පෙරටුකොට ඇත්තේ ද ඒ සමග යෙදුණේ ද වෙයි. දිව්‍යවිහාර ආදී වශයෙන් ද ලැබේම ය.

මෙසේ ඒවාට ද විතර්කය විෂය වේ. එහෙයින් එක සිතක බහුලව පවතින දේ ද කලින් කලට සිය විෂයෙහිම හැසිරෙන බැවින් සීමාවක් නැත. සංකර පැවැත්මක් නැත. එහිදී ඛේම විතර්කය භාග්‍යවතුන් වහන්සේගේ කරුණාවට බැසගැනීම් ආදියෙන් දීපනය කළ යුතුය. පවිවේක විතර්කය සමාපත්තිවලිනි. මේ එහි පැහැදිලි කිරීමයිඃ මේ ලෝවැසියා සිත් තැවුල් ඇත්තේය. දුකින් පීඩා වූයේය යනාදියෙන් රාග ගිනි ආදියෙන් ලෝකසන්නිවාසයේ (ලෝවැසියාගේ) ගිනිගත් ආකාර ආදිය දැකීමෙන් මහා කරුණාව වනාහි සමාපත්තියේ මුල් අවස්ථාවේ ද සමාපත්තියෙහි දී ප්‍රථමධ්‍යාන වශයෙන් ද කිවයුතුය. මේ කාරණය (පටිසම්භිදාවෙහි මහා කරුණා සමාපත්ති ඤාණයෙහි) මෙසේ කියන ලදී.

"බොහෝ ආකාරයෙන් (නුවණැසින් හා බුදුඇසින්) බලන්නා වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේලාගේ මහා කරුණාව සත්ත්වයන් කෙරෙහි බැසගනී. ලෝකසන්නිවාසය (රාගාදියෙන්) ගිනිගන්නා ලදැයි දක්නා වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේලාගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසගනී. ලෝකසන්නිවාසය (නොයෙක් කටයුත්තෙහි) උත්සාහ සහිතයයි ද මරණයට නික්ම ගියේ යයි ද නොමගට බැසගත්තේ යයිද ලෝවැසියා අස්ථිර වූයේ ජරාවෙන් මරණයට ගෙනයනු ලැබේයයි ද ලෝවැසියා අස්වසාලිය හැකි කෙනෙක් නැත්තේ අනාරක්‍ෂක වූයේ යයි ද ලෝවැසියා තමා අයත්යයි ගන්නා ලද සියල්ල හැරපියා යායුතු හෙයින් තමා අයත් වූවක් නැතැයි ද ලෝවැසියා තෘෂ්ණාවට දාස වූයේ තෘප්තිමත් නොවූයේ අඩුපාඩු ඇත්තේ (ඌණ) යයි ද ලෝකසන්නිවාසය ඇසුරට සුදුස්සෙකු නැති කෙනෙකැයි ද අසරණ යයි ද අසරණ වූයේ යයි ද, ලෝවැසියා නොසන්සුන් වූයේ උද්ධච්චයෙන් යුක්තයයි ද ලෝකසන්නිවාසය බොහෝ රාගාදී උල්වලින් විදින ලද්දේ උල් සහිත වූයේ යයි ද කෙලෙස් කුඩුවෙහි බහාලන ලද්දේ අවිද්‍යා අන්ධකාරය

නමැති ආවරණය ඇත්තේ යයි ද ලෝකසන්නිවාසය අවිද්‍යාවට පිවිසියේ අවිද්‍යා අණ්ඩකෝෂයෙහි උපන්නේ (අන්ධ වූයේ) හාත්පසින් බඳිනා ලද්දේ නූලක් මෙන් අවුල් වූයේ, ගුල නම් වූ පක්‍ෂියාගේ කැදැල්ල වැනි වූයේ (මුදුතණ, බබුස්තණවලින් සකස්කළ ලණුවක් දිරාගිය විට වැටුණු කැබැල්ලක් ගෙන මේ ඒ තණකොළයේ මුල හෝ අගයයි යොදාගන්නට නොහැකි හෙයින්) මුදුතණ, බබුස්තණ වැනි වූයේ යයි ද 'අය' නම් වූ සැපයෙන් පහවූ දුකට ගති වූ (සැපයෙන් වැටුණු හෙයින්) විනිපාත වූයේ සසර නො ඉක්මවයි යනුවෙන් දක්නා වූ, අවිද්‍යාව නමැති විෂ දෝෂයෙන් මනාව තැවරුණේ යයි ද කෙලෙස් මඩ ඇත්තේ යයි ද රාග, දෝෂ, මෝහ නමැති ජටාවෙන් බැඳුනේ යයි ද තෘෂ්ණා නමැති සංඝටයෙහි ඇතුල් වූයේ යයි ද තණ්හා නමැති දැලින් හාත්පසින් වෙළන ලද්දේ යයි ද තෘෂ්ණා නමැති සැඩපහරින් අදිනු ලැබේ යයි ද තෘෂ්ණා සංයෝජනයෙන් බඳින ලද්දේ යයි ද තෘෂ්ණා අනුශයෙන් ශක්තිමත් බවට ගියේ යයි ද තෘෂ්ණා සන්තාපයෙන් තවනු ලැබේ යයි ද තෘෂ්ණා දැවිල්ලෙන් දවනු ලැබේ යයි ද දෘෂ්ටි නමැති කැදැල්ලට පිවිසියේ යයි ද දෘෂ්ටි ජාලයෙන් වෙළන ලදැයි ද දෘෂ්ටි නමැති සැඩපහරින් අදිනු ලැබේ යයි ද දෘෂ්ටි සංයෝජනයෙන් බඳින ලද්දේ යයි ද දෘෂ්ටි අනුශයෙන් ශක්තිමත් බවට ගියේ යයි ද දෘෂ්ටි සන්තාපයෙන් තවනු ලැබේයයි ද දෘෂ්ටි දැවිල්ලෙන් දවනු ලැබේ යයි ද

ජාතියෙන් ඇතුල් වූයේ යයි ද ජරාවෙන් ලුහුබඳිනා ලදැයි ද ව්‍යාධියෙන් මඩිනා ලදැයි ද මරණයෙන් පහකරන ලද්දේ යයි ද තෘෂ්ණාවෙන් උඩට ඔසවන ලදැයි ද ජරාව නමැති ප්‍රාකාරයෙන් වටකරන ලදැයි ද මරණය නමැති උගුලෙන් බැඳුනේ යයි ද මහා බන්ධනයෙන් බැඳුනේ යයි ද රාග බන්ධනයෙන්, දෝස බන්ධනයෙන් මෝහ බන්ධනයෙන් මාන බන්ධනයෙන් දෘෂ්ටි බන්ධනයෙන් කෙලෙස් බන්ධනයෙන් දුශ්චරිත බන්ධනයෙන් බඳින ලද්දේ යයි ද (කුශලයට බාධාකරන හෙයින්) මහාසම්බාධ නම් වූ රාගාදි කෙලෙස් ගොඩට බැසගත්තේ යයි ද මහා පළිබෝධයෙන් ආවරණය වූයේ යයි ද (නිරය ගති ආදී) මහා ප්‍රපාතයට වැටුණේ යයි ද (ජාති ආදී) මහා කාන්තාරයට පිවිසියේ යයි ද මහ සසරට පිවිසියේ යයි ද සංසාරය නමැති (ගමන්කිරීමට අපහසු හෙයින්) මහා දුර්ගයෙහි (යමින් එමින් එහිම) ඇවිදින්නේ යයි ද (කාම නමැති) මහ මඩෙහි ලැග ගත්තේ යයි ද ලෝක සන්නිවාසය (හැම උවදුරින්)

මඩනා ලද්දේ යයි ද ලෝක සන්නිවාසය රාග ගින්නෙන් ද්වේෂ ගින්නෙන් මෝහ ගින්නෙන් ජාතියෙන් -පෙ- දැඩි ආයාසයෙන් ගිනිගන්නා ලද්දේ යයි ද

ලෝක සන්නිවාසය (ජාතිය විසින් ජරා ආදී උවදුරට) ඔසවාගෙන යන ලද්දේය. පැමිණි දඬුවම් ඇත්තේ සොර වූයේ නිරතුරු අනාරක්‍ෂකව පෙළේ යයි ද රාගාදී වැරදි බැඳීම්වලින් බඳින ලද්දේ දම්ගෙඩිය කරා එළඹ සිටියේ යයි ද ලෝකසන්නිවාසය අනාථ වූයේ පරම දිළිඳු බවට පැමිණියේ යයි ද දුකින් පෙළන ලදුයේ දිගුකලක් පෙළුණේ යැයි ද නිරතුරු ගිජු වූයේ නිරතුරු හටගත් පිපාස ඇත්තේ යයි ද (ප්‍රඥාව නැති හෙයින්) අන්ධ වූයේ ඇස් නැත්තේ යයි ද නැසුණු ඇස් ඇත්තේ (අන්ධයා) රැගෙන යන කෙනෙකු නැත්තේ යයි ද වැරදි මගට බැසගත්තේ මග වරදවා ගත්තේ යයි ද (කාමාදී) මහා ඕඝයට පිවිසියේ යයි ද

(ශාස්වත, උච්ඡේද) දෘෂ්ටි දෙකෙන් හාත්පසින් ගෙන සිටියේ යයිද තුන් දුසිරිත්වලින් වැරදිමගට බැසගත්තේ යයි ද කාමාදී සතර යෝගයෙන් යුක්ත වූයේ (සතරයෝගයන් විසින් බඳිනා ලද්දේ) යයි ද සතර ග්‍රන්ථයන් විසින් ගෙතුණේ යයි ද සතර උපාදානයන් විසින් දැඩිකොට ගනු ලැබේයයි ද ගති පහට නැගුණේ යයි ද පස්කම් ගුණයන් විසින් ආශාකරනු ලැබේයයි ද පංච නීවරණ විසින් වසන ලදැයි ද සවැදෑරුම් විවාද මුල්වලින් විවාද කෙරේයයි ද (රූපාදී) සවැදෑරුම් තෘෂ්ණා කයින් ඇලේයයිද දෘෂ්ටි හයෙන් හාත්පසින් ගෙන සිටියේ යයි ද අනුසය හතෙන් ලුහුබඳිනා ලදැයි ද සංයෝජන හතෙන් යුක්ත යයි ද සත්වැදෑරුම් මානවලින් උස් වූයේ යයි ද අෂ්ටලෝක ධර්මයෙන් පෙරළේ යයි ද (මිථ්‍යාදෘෂ්ටි ආදී) මිථ්‍යත්ව අටෙන් ගෙනයන ලද්දේ යයි ද පුරුෂදෝෂ අටෙන් දූෂණය වේ යයි ද නව ආඝාත වස්තුවෙන් ගැටුණේ යයි ද නවවිධ මානයෙන් උස් වූයේ යයි ද තෘෂ්ණාමූලක ධර්ම නවයෙන් ඇලේයයි ද

දස ක්ලේශ වස්තුවෙන් කෙලෙසේ යයි ද දස ආඝාත වස්තුවලින් ගැටුණේ යයි ද දශ අකුශල කර්මපථවලින් යුක්ත යයි ද දස සංයෝජනවලින් බැඳුණේ යයි ද දශවිධ මිථ්‍යත්වවලින් ගෙනයන ලද්දේ යයි ද දසවස්තුක මිථ්‍යා දෘෂ්ටියෙන් යුක්ත යයි ද දසවස්තුක අන්තග්‍රාහික දෘෂ්ටියෙන් යුක්ත වූයේ යයි ද එකසිය අටක් වූ තණ්හාව නම් වූ ප්‍රපංචවලින්

(සසරෙහි) ප්‍රමාද කරන ලදැයි ද ලෝක සන්නිවාසය දෙසැටක් මිසදිටු වලින් හාත්පසින් ගෙන සිටියේ යයි ද, දක්නා වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේලාගේ මහා කරුණාව සත්ත්වයන් කෙරෙහි බැසගනී.

මම වනාහි තරණය කළෙමි. ලෝවැසියා තරණය නොකළේය.
මම වනාහි මිදුණෙමි. ලෝවැසියා නොමිදුණේය.
මම වනාහි දැමුණෙමි. ලෝවැසියා නොදැමුණේය.
මම වනාහි සිහිල් වූයෙමි. ලෝවැසියා සිහිල් නොවූයේය.
මම වනාහි අස්වැසුණෙමි. ලෝවැසියා අස්වැසුණේ නැත.
මම වනාහි පිරිනිවියෙමි. ලෝවැසියා පිරිනිවියේ නැත.

ඒකාන්තයෙන් මම තරණය කළෙම් අන් අය තරණය කරවන්නට, මිදුණෙම් මුදවන්නට, දැමුණෙම් දමන්නට, සිහිල් වූයෙම් සිහිල් කරන්නට අස්වැසුණෙම් අස්වසාලන්නට, පිරිනිවියෙම් පිරිනිවාලන්නට සමත්වෙමියි දක්නා වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේලාගේ මහා කරුණාව සත්ත්වයන් කෙරෙහි බැසගනී. මේ ක්‍රමයෙන් ද භාග්‍යවතුන් වහන්සේගේ මෛත්‍රිය සත්ත්වයන් කෙරෙහි බැසගැනීම පැහැදිලි කළ යුතුය.

කරුණාවට විෂය වූ දුකට ප්‍රතිපක්ෂ වූ සැපය සත්ත්වයන් කෙරෙහි පමුණුවමින් මෛත්‍රිය ද පවත්වයි යනුවෙන් මෙහි අව්‍යාපාද අවිහිංසා විතර්ක බෙම විතර්ක නම් වේ. පවිවේක විතර්කය වනාහි නෙක්ඛම්ම විතර්කයම යි. දිව්‍ය විහාර, ආර්ය විහාරයන්හි පූර්වභාගය වූ ඒ ප්‍රථමධ්‍යානයේ පැවැත්ම ප්‍රත්‍යවේක්ෂණ වශයෙන් දතයුතු ය.

එහි භාග්‍යවතුන් වහන්සේගේ දිනපතා පරිභෝග කිරීම් වශයෙන් කෝටි විසිහතර ලක්‍ෂයක් පමණ යම් සමාපත්ති විහාරයක් ඇද්ද, යම් සමාපත්තීන්ගේ පෙර හැසිරීම් බවෙන් පැවති සමාධි චර්යාවට හා ඤාණ චරියාවට අනුගත වූ ඤාණය කෝටි විසිහතර ලක්ෂයක් සමාපත්තිවල හැසිරීම මහා වජිරඤාණය යි කියනු ලැබේ. ඒ සමාපත්තීන්ගේ වශයෙන් භාග්‍යවතුන් වහන්සේගේ පවිවේක විතර්කයේ බහුල පැවැත්ම දතයුතුය. මේ අර්ථයම මහා සච්චක සූත්‍රයෙන් ද දතයුතුය. එහිදී භාග්‍යවතුන් වහන්සේ විසින් (මෙසේ) දෙසන ලදී. 'සො ඛො අහං අග්ගි වෙසසන තස්මිං යෙව පුරිමස්මිං සමාධි නිමිත්තෙ අජ්ඣත්තමෙව චිත්තං සන්නිසීදෙමි යෙනසුදං නිච්චකප්පං නිච්චකප්පං විහරාමි'

'ගිනිවෙස්න (සච්චකය) ඒ මම යම් ඵල සමාධියකින් නිතරම නිතරම වසම් නම් එම පූර්ව සමාධි නිමිත්තෙහි සිය සතන්හි ම සිත තබමි.'

සච්චක නිගණ්ඨ පුත්‍රයා විසින් 'ශ්‍රමණ ගෞතම තෙම මනා රූ ඇත්තේය. ප්‍රසාදය ඇතිකරන සුලුය. තොල් මනාව එක්වී ඇත. දිව තුනීය. වචනය මිහිරිය. එහෙයින් පිරිස සතුටු කරවමින් ඇවිදිතියි සිතමි. (දහම් දෙසමින් අනුන්ට) අවබෝධ කරවීම් බහුලව කථාකරන මොහුගේ සිතේ එකඟ බවක් නැතැ'යි කී කල්හි ඒකාන්තයෙන් සොර බඩු සහිතව සොරෙකු අල්ලා ගන්නාක් මෙන් ගිනිවෙස්න, තථාගතයන් වහන්සේ පිරිස සතුටු කරවමින් අවබෝධ කරවීම් බහුලව නොහැසිරෙති. සක්වළ කෙළවර කොට ඇති පිරිසට පවා දහම් දෙසමින් අනුබල දෙමින් පසුබට නොවෙමින් නො ඇලෙමින් හුදකලා වූයේ තනිව හැසිරෙමින් සුඤ්ඤතඵල සමාපත්තිඵල අනුව යෙදුණු බව දක්වන්නට මෙය භාග්‍යවතුන් වහන්සේ ගෙනැහර පෑහ. යම් මොහොතක පිරිස සාධුකාර දෙයිද නැතහොත් ධර්මය මෙනෙහි කරයි ද ඒ මොහොතෙහි මුල් අවස්ථාවෙන් කාලය සීමාකොට භාග්‍යවතුන් වහන්සේ ඵල සමාපත්තියට සමවදිති. සාධුකාර හඬ නො නිමි කල්හි ම ධර්මය මෙනෙහි කිරීම අවසානයෙහි ද සමාපත්තියෙන් නැගිට නැවැත්වූ තැන් පටන් ධර්මය දේශනා කරති. බුදුරජාණන් වහන්සේලාගේ භවංග පරිවාසය (හැසිරීම) සැහැල්ලුය. ආශ්වාස ප්‍රශ්වාස වාරයෙහි සමාපත්තිවලට සමවදිති. මෙසේ කියන ලද සමාපත්තිවල පූර්වභාග වශයෙන් භාග්‍යවතුන් වහන්සේගේ ඛේම විතර්කයේත් පවිවේක විතර්කයේත් බහුල පැවැත්ම දතයුතුය.

එහි ව්‍යාපාද විහිංසා විතර්ක ආදී කෙලෙස් පහකරන යම් අව්‍යාපාද විතර්කයක ද අවිහිංසා විතර්කයක ද ආනුභාවයෙන් කිසිතැනක භය නැති බැවින් ඒ විතර්කවලින් යුක්ත වූයේ නිර්භය බවට පැමිණ වාසය කරයි. එහෙයින් සියල්ලන්ට හැමදා ම නිර්භය ම වෙයි. අභය ම වෙයි. එහෙයින් දෙකම (අව්‍යාපාද විතර්ක හා අවිහිංසා විතර්ක) දෙකෙහි සත්සුන් බව ඇති කෙරේනුයි ඛේම විතර්ක නම් වේ. කාමවිතර්කාදි කෙලෙස් පහකරන යම් නෙක්ඛම්ම විතර්කයක ආනුභාවයෙන් කාය විවේක, චිත්ත විවේක, උපධි විවේක යන තුන්ආකාර වූ ද තදංග විවේක, විෂ්කම්භන විවේක, සමුච්ඡේද විවේක, පටිප්පස්සද්ධි විවේක, නිස්සරණ විවේක යන පස්ආකාර වූ ද විවේකය සම්පූර්ණ වීමට යයි. සුදුසු පරිදි

අරමුණු වශයෙන් ද යෙදීම් වශයෙන් ද පවිවේකය සමග යෙදුණා වූ ඒ විතර්කය පවිවේක විතර්කය යි. මේ විතර්ක දෙක මෙසේ බෙදන ලද විෂය ඇති නිසා ආදි කාර්මිකයන්ට (මුලින්ම කටයුතු කරන්නන්ට) එකිනෙකට උපකාර පිණිස පවතී. යම්සේ පවිවේක විතර්කය නූපන් ඛේම විතර්කයේ ඉපදීම පිණිසත් උපන්නා වූ ඛේම විතර්කයේ වැඩිවීම පිණිසත් විපුලබවත් පිණිස වෙයි ද,

ඛේම විතර්කය තෙමේ පවිවේක විතර්කයට ද එසේමය. කය හා සිත වස්තුකාම, ක්ලේශකාමවලින් දුරුවූ ක්‍ෂණයකින් මෛත්‍රී විහාරාදිය ඇති නොවේ. ව්‍යාපාද ආදියේ ප්‍රහාණයෙන් තොරව චිත්ත විවේකාදියේ හටගැනීමක් නැති බැවින් ම මේ ධර්ම එකිනෙකට බොහෝ උපකාර යයි දතයුතුය. ලෝකයාට හිත පිණිස සියලු ආකාරයෙන් පහවූ කෙලෙස් ඇති භාග්‍යවතුන් වහන්සේගේ ඛේම විතර්කය ද පවිවේක විතර්කය ද ආශ්වාස මාත්‍රයෙහි දී පවා හිතසැප ගෙන දෙන්නේමය. 'ඛෙමො ච විතක්කො පවිවෙකොච විතක්කො' යන්න සම්බන්ධ කළ යුතුය. මෙසේ නම් වශයෙන් කියන ලද (උද්දිට්ඨ) විතර්ක විස්තර කරන්නට (නිද්දිසිතුං) අබ්‍යාපජ්ඣාරාමො යනාදිය කීහ.

එහි කිසිවකුට කෝප නොවීම, දුක් නොදීම = අබ්‍යාපජ්ඣ නම්. ඒ අබ්‍යාපජ්ඣය ඔහුට සිත් ඇලවීම් වශයෙන් ආරාමයක් වේ යනුවෙන් අබ්‍යාපජ්ඣාරාමො නම්. අව්‍යාපජ්ඣයෙහි ඇලුණෝසේවනය කිරීම් වශයෙන් ඇලුණේය යනුවෙන් අබ්‍යාපජ්ඣරතො වේ. එසොව යනු එසො එව. එය ම යන අර්ථයි. ඉරියාය යනු කිරියාය, කය වචන ප්‍රයෝගයෙන් යන අර්ථයි. න කිඤ්චි ව්‍යාබාධෙමි යනු හීන ආදී වූ සතුන් අතරින් කිසියම් සතෙකු තෘෂ්ණා සහිත භය යෙදීමෙන් තසං තස වූ හෝ ඒ තෘෂ්ණාව නැති බැවින් පහකළ සියලු කෙලෙස් කම්පනයන් ඇති බැවින් ථාවරං ථාවර නම් වූ හෝ කිසිවකු නොපෙළමි. කිසිවකුට දුක් නොපමුණුවමි. කරුණා අදහස් ඇති මහාකරුණා සමාපත්තිය බහුලකොට ඇති භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේට වඩාම රුචි වූ කරුණා අදහසට අනුරූප වූවක්ම කීහ. එයින් අවිහිංසා විතර්කය ද අව්‍යාපාද විතර්කය ද දක්වයි. (මේ කරුණුවලින්) මෙය කියන ලද්දේ වෙයි:

'මම මේ ක්‍රියාවෙන් මේ ප්‍රතිපත්තියෙන් මෙසේ පිළිපදිමින් මෙසේ සමාපත්ති විහාරවලින් වාසය කරමින් මෙසේ පින් ඇත්තන් විසින් කරන

ලද සත්කාර ගරුකාර මානන වන්‍දන පූජන ඉවසමින් සත්ත්වයන් අතුරෙන් කිසිවකුත් නොපෙළමි. තවද මෙලොව, පරලොව, පරමාර්ථ නම් වූ නිවන යන ප්‍රභේද ඇති ඔවුන්ගේ හිත සැප ම වර්ධනය කරමි.'

**යං අකුසලං තං පහීනං** යනු එක්දහස් පන්සියක් ප්‍රභේද ඇති කෙලෙස් ද ඒවා සමග යෙදුණු අනන්ත ප්‍රභේද ඇති අනිකුත් යම් අකුසලයක් වේද, ඒ සියල්ල මවිසින් බෝධිමූලයෙහිදීම පහකරන ලදී. සහමුලින් නසන ලදී. මෙයින් සමෘද්ධිමත් වූ පවිවේකය සමග නිස්සරණ විවේකයෙන් සමුච්ඡේද පටිප්පස්සද්ධි විවේක දක්වයි. ඇතැමෙක් මෙහිදී තදංග විෂ්කම්භන විවේකයන් ද උදුරා දක්වති. ආගමනීය (පැමිණීමට සුදුසු) ප්‍රතිපදාව සමග භාග්‍යවතුන් වහන්සේ විසින් තමන් වහන්සේගේ කෙලෙස් ගෙවාදැමීම මෙහි කියන ලදී. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අප්‍රමාණ කල්පවලදී පුරුදුකරන ලද තමන්ගේ පවිවේක අදහස නිස්සරණ අදහස සමග දැන් මුදුන් පමුණුවාගෙන සිටිසේක් ඒ අදහස ඵලසමාපත්තියට සමවැදී තමන්ගේ කෙලෙස් පහකිරීම නුවණින් විමසා බැලීම ප්‍රධාන වශයෙන් ගෙන පැහැදිලි කරති. මෙහිදී ශාස්තෘන් වහන්සේ යම් අර්ථයක් සඳහා මේ විතර්ක දෙක උදුරා දැක්වූවාහු ද ඒ අර්ථය දක්වමින් **තසමාතිහ භික්ඛවෙ** යනාදිය කීහ. භාග්‍යවතුන් වහන්සේ මේ විතර්ක දෙක තමන්ගේ බහුල හැසිරීම දැක්වීම ප්‍රධාන වශයෙන් ගෙන එහි භික්ෂූන් වාසය කරවන්නට (යොදවන්නට) මේ දේශනාව ආරම්භ කළහ. එහි 'තසමාතිහ' යනු යම්හෙයකින් අබ්‍යාපජ්ඣ පවිවේකයෙහි ඇලුණු මට ඛේම-පවිවේක විතර්කම බහුල ලෙස පවතී. එහෙයින්. 'තිහ' යනු නිපාත මාත්‍රයකි.

**අබ්‍යාපජ්ඣාරාමා විහරථ** යනු සියලු සත්ත්වයන් කෙරෙහි මෛත්‍රී විහරණයෙන් ද කරුණා විහරණයෙන් ද ඇලෙමින් වාසය කරවු. එයින් ව්‍යාපාදයේත් ඒ සමග යෙදුණු කෙලෙසුන්ගේ ත් දුරුකිරීම වදාළහ. **තෙසං වො** යන මෙහි 'වො' යනු නිපාත මාත්‍රයකි. **පවිවෙකරාමා විහරථ** යනු කායාදි විවේකය ද තදංගාදී විවේකය ද යන සියලු විවේක ඇලුම් කළයුතු තැනක් කොට වාසය කරවු. **ඉමාය මයං** යනාදිය ඒවා අතරින් ඛේම විතක්කය පවතින ආකාරය දැක්වීම යම්සේ ද, මෙසේ **කිං අකුසලං** යනාදිය පවිවේක විතර්කය පවතින ආකාරය දැක්වීමයි. එහි යම්සේ නිවැරදි ධර්ම පුරනු කැමති කිංකුසල ගවේසී කෙනෙකු වී කුශලධර්ම

සෙවීම කළයුතුමය. වැරදි ධර්ම දුරුකරනු කැමැති තැනැත්තා විසින් අකුසල සෙවීම නො කළයුතුය යි 'කිං අකුසලං' යනාදිය කීහ.

එහි **කිං අකුසලං** යන මෙහි අකුසලය නම් කුමක් ද? ස්වභාව වශයෙන් මේ අකුසලයේ ලක්‍ෂණය කුමක්ද? රස = (කෘත්‍යය), පච්චුපට්ඨාන = (වැටහෙන ආකාරය), පදට්ඨාන = (ආසන්න කාරණය) මොනවාද? මෙසේ ස්වභාව කෘත්‍යාදී වශයෙන් අකුසලයේ ප්‍රත්‍යවේක්‍ෂණ විධිය දක්වයි. ආදි කර්මිකයාගේ වශයෙන් ද මේ විතර්කය ආයේ වෙයි. **කිං අප්පහීනං කිං පජහාම** යන මේ පද දෙක ශෛක්‍ෂ වශයෙන් ආයේ වෙයි. එහෙයින් 'කිං අප්පහීනං' යනු කාමරාග සංයෝජනාදී අකුසල් අතරින් අපගේ කුමන අකුසලයක් මාර්ග ඥානයෙන් සහමුලින් නොසිඳිනා ලදද? 'කිං පජහාම' යනු කුමන අකුසලයක් උදුරා දමමු ද? යනුයි. නැතහොත් 'කිං පජහාම' යනු විතර්ක පරියුට්ඨාන අනුසය අතරින් කුමන අකුසල කොටසක් දැන් අපි දුරුකරමුද යන අර්ථයි. ඇතැමෙක් වනාහි 'කිමප්පහීනං' යනුවෙන් කියති. දිට්ඨි සංයෝජනාදී වශයෙන් නොයෙක් භේද ඇති අකුසල අතරින් ඒ අපගේ කුමන අකුසලයක් කුමකින්, කුමන ආකාරයකින් කවර මාර්ග ඥානයකින් අප්‍රහීණදැයි කියන ලදී. ඉතිරිය කියන ලද අයුරින්මය.

ගාථාවන්හි : බුද්ධං යනු චතුරාර්ය සත්‍යයන් නොවෙනස්ව බුදුරජාණන් වහන්සේ ඥාණයෙන් අවබෝධ කළ බැවින් බුද්ධ නම් වේ. සත්‍යයෙන් තොර වූ දතයුතු දෙයක් නැති බැවිනි. ඒ බව මෙසේ වදාළහ.

**අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං භාවෙතබ්බඤ්ච භාවිතං**
**පහාතබ්බං පහීනං මෙ තස්මා බුද්ධොස්මි බ්‍රාහමණ**[1]

'බමුණ මා විසින් දතයුත්ත දන්නා ලදී. භාවිත කළ යුතු දේ භාවිත කරන ලදී. පහකළ යුතු දේ පහකරන ලදී. එහෙයින් බුද්ධ වෙමි.' මහාබෝධි සත්ත්වයන් වහන්සේ හැර අන්අය විසින් ඉවසන්නට උසුලන්නට නොහැකි බැවින් නොඉවසිය හැකි සියලු බෝධි සම්භාරයද මහාකරුණාධිකාරය ද ඉවසීම් වශයෙන් ඉසිලීම් වශයෙන්, එසේම අන්‍යයන් විසින් ඉවසන්නට මැඩපවත්වන්නට දුෂ්කර බැවින් ඉවසිය නොහැකි පස්මරුන් ඉවසීම්

1. ම.නි. - 2 භාග. බු.ජ.මු. - බ්‍රහ්මායු සූත්‍රය, සේල සූත්‍රය

වශයෙන් මැඩපැවැත්වීම් වශයෙන්, ආසය-අනුසය-චරියා-අධිමුත්ති ආදිය බෙදා දැක්වීමේ අවබෝධයෙන් සුදුසු පරිදි හික්මවීමට සුදුසු අයගේ මෙලොව-පරලොව පරමාර්ථවලින් අන්‍යයන් විසින් නො ඉවසිය හැකි (කළ නොහැකි) අනුශාසන නම් වූ බුද්ධ කෘත්‍යය ඉවසීම් වශයෙන් ඉසිලීම් වශයෙන් නැතහොත් එහි මැනවින් කිරීම් වශයෙන් **අසය්හසාහිනං** නොඉවසිය හැකි දේ ඉවසන සුලු වූ. **සමුදාචරන්ති නං** යන මෙහි 'න' යනු නිපාත මාත්‍රයකි. නැතහොත් 'නං තථාගතං' ඒ තථාගතයන් වහන්සේ යන අර්ථයි. තමාගේත් අනුන්ගේත් සිත්වල 'තම' නම් වූ මෝහාන්ධකාරය ඉවත දැම්මේය යන අරුතින් තමොනුදො නම් වෙයි. පරතෙරට නිවනට ගියේ යන අරුතින් පාරගතො නම් වේ. නැතහොත් මිදුනෙම් මුදවන්නෙමි යනාදී වශයෙන් පැවති මහාභිනීහාරයේ (මහා ප්‍රාර්ථනාවේ) හෝ සියලු සසර දුකේ හෝ සර්වඥ ගුණයන්ගේ හෝ පරතෙරට - පර්යන්තයට ගියේ යන අරුතින් පාරගතො නම් වේ. ඒ **තමොනුදං පාරගතං** එහෙයින්ම **පත්තිපත්තං** බුදුරජාණන් වහන්සේ (ට), සීලාදිය ද දසබල ඥාණ ආදිය ද සම්මා සම්බුදුරජාණන් වහන්සේලා විසින් පැමිණිය යුතු සියල්ලට පැමිණි යන අර්ථයි. **වසිමං** යනු ධ්‍යානාදියෙහි කැමැත්ත හා බැඳුණු උසස් වූ ආවර්ජනාදී වශීභාවයද ආර්ය ඍද්ධි නම් වූ අන්‍යයන්ට පොදු නොවූ චිත්තවශීභාවය ද උන්වහන්සේට ඇත්තේය යන අරුතින් වසිමා නම් වේ. **තං වසිමං** ඒ සිත් වසඟ බව ඇති යන අර්ථයි. සියලු කාමාදී ආශ්‍රව නැති බැවින් **අනාසවං**. කාය විසම ආදී විසම ගති වැමෑරූ බැවින් නැතහොත් විෂ නම් වූ සියලු කෙලෙස්මල තරණයකොට නැතහොත් විෂ වූ සියලු සසර දුක තමා තරණය කොට තරණය කරවන බැවින් වෙසසන්තරො නම් වේ. ඒ **වෙසසන්තරං** විශ්වන්තර වූ. **තණ්හක්ඛයෙ** අර්හත් ඵලයෙහි ද නිවනෙහිද **විමුත්තං** (තණ්හක්ඛය සංඛ්‍යාත අර්හත්ඵලයෙන්) මිදුණා වූ. මෝන නම් වූ ඥාණයෙන් ගමන් කිරීම් වශයෙන් හෝ කාය මොනෙය්‍යාදියෙන් අතිශය සමන්නාගත බැවින් **මුනි** නම් වේ. 'මුනි' යන්න වනාහි අගාරිය මුනි, අනගාරිය මුනි සෙඛ මුනි, අසෙඛ මුනි, පච්චෙක මුනි, මුනිමුනි යනුවෙන් අනේකවිධ මුනිවරු ඇත. එහි දැනගන්නා ලද ශාසනය ඇති පැමිණි මාර්ගඵල ඇති ගිහි අය අගාරිය මුනි නම් වේ. එබඳු වූ පැවිද්දා අනගාරිය මුනි නම් වේ. ශෛක්‍ෂ පුද්ගලයින් සත්දෙනා සේඛ මුනි නම් වේ. ක්‍ෂීණාශ්‍රව රහතන්වහන්සේ අසේඛ මුනි නම් වෙති. පසේබුදුරජාණන් වහන්සේ පච්චෙක මුනි නම් වෙති. සම්මා සම්බුදුරජාණන් වහන්සේ මුනිමුනි නම් වෙති. උන්වහන්සේම

මෙහි අදහස් කරන ලදී. මතු පුනර්භවයක් නැති බැවින් අන්තිම පශ්චිම දේහය කය දරයි යන අරුතින් අන්තිම දේහධාරී නම් වේ. ඒ **අන්තිමදෙහධාරිං** අන්තිම කය දරන්නා වූ. කෙලෙස් ආදී මාරයන් මනාව දුරුකළ බැවින් **මාර ජහං** නම් ය. එහෙයින්ම ජරාවට හේතුව සහමුලින් සිඳීමෙන් අනුපාදිසේස නිවනට පැමිණීම් වශයෙන් ප්‍රකට ජරාව ආදී සියලු **ජරායපාරගුං** ජරාවේ පරතෙරට පත්. ජරාව මුල්කර ගැනීමෙන් මෙහි ජාති-මරණ-සෝකාදියේ ද පරතෙර ගමන කියන ලදැයි දතයුතුය. **තං** මෙබඳු වූ තථාගතයන් වහන්සේට **දුවෙ විතක්කා සමුදාචරන්ති** යනු ද බ්‍රෑම් යනු ද සම්බන්ධ කරගත යුතුය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ පළමු ගාථාවෙන් විතර්ක දෙක සඳහන් කොට ඉන්පසු දෙවන ගාථාවෙන් පවිවේක විතර්කය දක්වා දැන් ඛේම විතර්කය දක්වන්නට 'සෙලෙ යථා' යන තුන්වන ගාථාව වදාළහ. එහි **සෙලෙ යථා පබ්බත මුද්ධනිට්ඨිතො** යනු ශෛලමය ඒක ඝන පර්වතයක් මුදුනෙහි සිටින ආකාරයෙන් ම. එහි සිටි තැනැත්තාට උඩට බෙල්ල එසවීම දික් කිරීම ආදී කටයුත්තක් නැත. **තථූපමං** යනු එයට සමාන වූ ගල් පර්වතයට උපමා වූ. මේ එහි කෙටි අර්ථයයි: යම්සේ ගල් පර්වතයක් මුදුනෙහි සිටියා වූ ඇස් ඇති පුරුෂයෙක් හාත්පස ජනතාව දකින්නේ ද එසේම සුමේධ වූ යහපත් ප්‍රඥාව ඇත්තා වූ සබ්බඤ්ඤුත ඤාණයෙන් සමන්තචක්ඛු වූ භාග්‍යවතුන් වහන්සේ ධර්මයෙන් කළ ප්‍රඥාවෙන් කළ ප්‍රාසාදයට නැග තමා පහවූ සෝක ඇත්තේ සෝකයට බැසගත් ජාති ජරාවලින් මැඩගත් ජනතාව සත්ත්වනිකාය බලති. විමසා බලති.

මේ වනාහි එහි අදහසයි: යම්සේ පර්වතයක් පාමුල හාත්පස මහත් කුඹුරක් සකස්කොට එහි නියරවල කුටි සාදා රාත්‍රියට ගිනි දල්වන්නේද අංග සතරකින් යුත් අන්ධකාරය ද ඇති වන්නේ නම් ඉක්බිති පර්වතය මුදුනෙහි සිටි බිම්පෙදෙස බලන්නා වූ ඒ ඇස් ඇති මිනිසාට කෙත ද නියරවල් ද කුටි ද එහි නිදාගත් මිනිස්සු ද නොපෙනෙති. කුටිවල ගිනිදැල් පමණක්ම පෙනෙන්නේය. මෙසේ ධර්මමය ප්‍රාසාදයට නැග සත්ත්ව සමූහය බලන තථාගතයන් වහන්සේට යම් ඒ නොකළ යහපත ඇති සත්ත්වයෝ වෙත්ද ඔවුහු එක් වෙහෙරක දකුණු පැත්තෙහි සිටියත් බුද්ධඤාණය ඉදිරියට නොඑති. රාත්‍රියෙහි විදින ලද ඊයක් මෙන් වෙති. කරන ලද යහපත ඇති හික්මවීමට සුදුසු යම් පුද්ගලයෝ වෙත් ද

ඔවුහුම දුර සිටියත් උන්වහන්සේගේ ඉදිරියට එති. ඔහු (බුදුඇසට පෙනෙන පුද්ගලයා) ගින්න මෙනි. හිමාලය පර්වතය මෙනි. මේ කාරණය (මෙසේ) කියන ලදී.

**දූරෙ සනෙතා පකාසෙනති - හිමවනෙතාව පබබතො**
**අසනෙතඋා න දිසසනති - රතතිඛිතතා යථා සරා'**[1]

(උත්සන්න වූ කුසල් මුල් ඇති භාවිත භාවනා ඇති) සත්පුරුෂයෝ දුර සිටියත් හිමාලය පර්වතය මෙන් බුදු නුවනට ප්‍රකට වෙති. මෙහි (මෙලොවම ගරුකොට සිතන) අඥාන පුද්ගලයෝ රාත්‍රියෙහි විදින ලද ඊයක් මෙන් නො පෙනෙත්.

මෙසේ මේ සූත්‍රයෙහි ගාථාවලදී භාග්‍යවතුන් වහන්සේ තමන්වහන්සේ අන් තැනැත්තකු මෙන් දැක්වූහ.

**පළමු සූත්‍රය යි.**

# 2.2.2

දෙවන සූත්‍රයෙහි **පරියායෙන** යන මෙහි 'පරියාය' ශබ්දය '**මධුපිණ්ඩික පරියායොත්වෙව නං ධාරෙහි**'[2] 'මධුපිණ්ඩික පරියාය යයි දරව' යනාදියෙහි දේශනාවෙහි ආයේය. '**අත්‍ථි ඛෙවස බ්‍රාහමණ පරියායො යෙන මං පරියායෙන සමමා වදමානො වදෙය්‍ය අකිරියවාදො සමණො ගොතමො**'[3] 'බමුණ, යම් කරුණකින් ශ්‍රමණ ගෞතමයෝ 'අකිරියවාදීහ'යි මනාව කියන තැනැත්තේ මට කියන්නේ නම් බමුණ ඒ කාරණය

1. ධම්මපද - පකිණ්ණක වග්ගය 26 - ගා 15
2. මජ්ඣිම නිකාය - මධු පිණ්ඩික සුත්ත
3. පාරාජික පාළි - වේරඤ්ජ කණ්ඩ

ඇත්තේමය යනාදියෙහි කාරණයෙහි ආයේය. **'කස්ස නු බො ආනන්ද අජ්ජ පරියායො භික්ඛුණියො ඔවදිතුං'**[1] 'ආනන්ද, භික්ෂුණීන්ට අවවාද දීමට අද කවරකුගේ වාරය ද?' යනාදියෙහි වාරයෙහි ආයේය. මේ සූත්‍රයෙහි වනාහි වාරයෙහිත් කාරණයෙහිත් සුදුසුය. එහෙයින් මහණෙනි, සුදුසු පරිදි කාරණයෙන් හෝ වාරයෙන් තථාගතයන් වහන්සේගේ ධර්මදේශනා දෙකක් ඇත යන මෙය මෙහි අර්ථය යි.

භාග්‍යවතුන් වහන්සේ හික්මවීමට සුදුසු අයගේ අදහසට අනුරූපව කිසිකලෙක මේ ධර්ම කුසලය, මේ ධර්ම අකුසලය, මේ ධර්ම වැරදිය, මේ ධර්ම නිවැරදිය, මේවා ඇසුරු කළ යුතුය, මේවා ඇසුරු නොකළ යුතුය යනාදී වශයෙන් කුශල-අකුශල ධර්මයන් බෙදමින් කුශල ධර්මයන් සමග අකුශල ධර්ම මිශ්‍ර නොකිරීම් වශයෙන් පනවමින් පාපය පාප වශයෙන් දකිව් යනුවෙන් දහම් දෙසති. කිසිකලෙක 'මහණෙනි, සතුන් මැරීම සේවනය කරන ලද්දේ, භාවිත කරන ලද්දේ, බහුල වශයෙන් කරන ලද්දේ නිරයට පමුණුවන්නේ වෙයි. තිරිසන් යෝනියට පමුණුවන්නේ වෙයි. ප්‍රේත විෂයට පමුණුවන්නේ වෙයි. සතුන් මැරීමේ ඉතා සුළු වූ කර්මයක් වේ නම් එය අල්ප ආයුෂ පිණිස පවතින්නේය' යනාදී වශයෙන් ආදීනව ප්‍රකාශ කරමින් පාපයෙන් කලකිරීමාදියෙහි යොදවමින් 'කලකිරෙන්න, නොඇලෙන්න' යනුවෙන් දහම් දෙසති.

**භවන්ති** යනු වෙති, පවතිත්. **පාපං පාපකතො පස්සථ** යනු සියලු පාපධර්ම මෙලොවදීත් පරලොවදීත් අයහපත දුක ගෙනදීම් වශයෙන් ලාමක වශයෙන් දකිව්. එහි **නිබ්බින්දථ** යනු ඒ පාපධර්මය අතිශයින් හීන බැවින් ලාමක අරුතින් පාපය. අදක්ෂබවෙන් හටගත් අරුතින් අකුසලය (අකොසල්ල සම්භූතට්ඨෙන අකුසලං). ස්වභාවයෙන් ප්‍රභාස්වර (බබළන) වූ ප්‍රසන්න වූ සිතේ ප්‍රභාස්වර ආදී ස්වභාවයන් විනාශ කිරීම් වශයෙන් සංකිලේසිකය. නැවත නැවත භව දුක ඉපදීම් වශයෙන් පෝනෝ භවිකය, දැවිලි තැවිලි සහිතව පවතින හෙයින් සදරථය. දුක් ම විපාක දෙන හෙයින් දුක්ඛ විපාකය, අප්‍රමාණ කාලයක් අනාගතයෙහි ජාති-ජරා-මරණ-ඉපදීම් වශයෙන් මත්තෙහි ජාති-ජරා-මරණයට සුදුසුය. සියලු හිත සැප දුරුකිරීමෙහි සමත්ය යනාදී ක්‍රමයෙන් නොයෙක් ආකාර ආදීනවද එය දුරුකිරීමේ අනුසස් ද මනා නුවණින් දකිමින් කලකිරෙන්න, කලකිරීමට

1. අංගුත්තර නිකාය - අට්ඨක නිපාත

පැමිණෙන්න, කලකිරීමෙන් විදසුන් වඩා ආර්යමාර්ග අවබෝධයෙන් පාපයෙහි **විරජ්ජථ** නොඇලෙන්න. එසේ ම **විමුච්චථ** පාපයෙන් මිදෙන්න. මාර්ගයෙන් සමුච්ඡේද විරාග වශයෙන් නො ඇලෙන්න. ඉන්පසු ඵලයෙන් පටිප්පස්සද්ධි විමුත්ති වශයෙන් මිදෙන්න.

නැතහොත් 'පාපං' යනු ලාමක වශයෙන් පාපය, (එයින්) කුමක් කියන ලද්දේ වේද? අනිත්‍ය, දුක්ඛ ආදී ස්වභාවයෙන් යමක් පිළිකුල් ද ආර්යයන් විසින් පිළිකුල් කරන සසර දුකට යමක් පමුණුවයි ද එහෙයින් පාප නම් වේ. කුමක් නිසා ඒ ත්‍රෛභූමික ධර්ම කියන ලද අර්ථයෙන් ලාමක වශයෙන් දැක එහි අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් රෝග වශයෙන් ගණ්ඩ (පිළිකාවක්) වශයෙන් සල්ල (උලක්) වශයෙන් අඝ (විපතක්) වශයෙන් ආබාධයක් යනාදී වශයෙන් විදසුන් වඩමින් කලකිරෙන්න ද? මේ **දුතියා** යනුවෙන් තත් වූ පරිද්දෙන් අහිත අනර්ථ පැහැදිලි කරන පළමුවන ධර්මදේශනය මුල්කොට එයින් පසු විවේචනයට මේ දෙවන ධර්ම දේශනයයි.

ගාථාවන්හි **බුද්ධස්ස** යනු සර්වඥ බුදුරජාණන් වහන්සේගේ. **සබ්බභූතානු කම්පිනො** යනු සියලු සත්ත්වයන් වෙත මහා කරුණාවෙන් අනුකම්පා ස්වභාවය ඇති. **පරියාය වචනං** යනු පර්යාය වශයෙන් කථනය, දේශනය. **පස්ස** බලන්න යනුවෙන් පිරිසට අමතති. පිරිසෙහි වැඩිහිටියා සඳහා හෝ කියන ලදී. ඇතැමෙක් තමන්වහන්සේම සඳහා භාග්‍යවතුන් වහන්සේ පස්ස යනුවෙන් වදාළහයි කීහ. **තත්‍ථ** යනු ඒ පාපයෙහි **විරජ්ජථ** යනු රාගය දුරුකරන්න යන අර්ථයි. ඉතිරිය කියන ලද අයුරින්මය.

**දෙවන සූත්‍රයයි.**

# 2.2.3

තෙවන සූත්‍රයෙහි **පුබ්බංගමා** යනු එකට ඉපදීම් වශයෙන් ද හේතු වශයෙන් දැයි දෙයාකාරයකින් පූර්වාංගම වෙයි. පෙරටුකොට ඇත්තේ වෙයි. ප්‍රධාන කාරණය වෙයි. අවිද්‍යාවෙන් තොරව අකුසල උපතක් නැත. **සමාපත්තියා** පැමිණීම පිණිස, ස්වභාව-ප්‍රතිලාභය පිණිස, ප්‍රාප්තිය පිණිස (රැස්කිරීම පිණිස). එහි අකුසලය පැවතීමෙහි ආදීනව (දොස්) වැසීමෙන් අනුවණින් මෙනෙහි කිරීමට හේතු වීමෙන් ද දුරු නොවීමෙන් ද අකුසල ධර්මයන්ට හේතුවක් බව දක්නා ලැබේ. මෙසේ ව්‍යාධි-මරණ ආදී දුකට ස්ථානයක් වීම් වශයෙන් සියලු ගති මෙහි දුගතිය. නැතහොත් රාගාදී කෙලෙස්වලින් දූෂිත ගති ඇති කය-වචන-සිතෙහි පැවැත්ම දුගතිය, කය වචන දෙකෙහි දුසිරිත්ය. **අස්මිං ලොකෙ පරම්හි ච** මෙලොවෙහි හෝ මනුෂ්‍ය ගතියෙහි, 'පරම්හි' යනු එයින් අන්‍ය වූ ගති. **අවිජ්ජා මූලිකා සබ්බා** ඒ සියලුම දුශ්චරිතයාගේ විපත්ති කියන ලද අයුරින් අවිද්‍යාව පෙරටුකොට ඇති බැවින් අවිජ්ජා මූලිකම වෙයි. **ඉච්ඡා ලොභ සමුස්සයා** නො පැමිණි කාමය සොයන ලක්ෂණයෙන් යුත් ඉච්ඡාවෙන් (කැමැත්තෙන්) ද පැමිණි කාමයට ඇලුම්කරන ලක්ෂණයෙන් යුත් ලොභයෙන් ද රැස්කරන ලද අරුතින් ඉච්ඡාලොභ සමුස්සයා නම් වේ. **යතො** යනු යම්හෙයකින් අවිද්‍යා හේතුවෙන් අවිද්‍යාවෙන් වසනලදුව. **පාපිච්ඡො** අවිද්‍යාවෙන් වසන ලද බැවින් පාපයට කැමති බවෙහි ආදීනව නොදකිමින් නැති ගුණයට ගරුකරවා ගැනීම් වශයෙන් (අසන්තගුණ සම්භාවනවසෙන) කුහකකම් ආදිය කරමින් පාපයට කැමැත්තේ වෙයි. ලෝභයෙන් ම අත්‍රිච්ඡතාව (අධික ආශා ඇති බව) ද ගන්නා ලදැයි දතයුතුය. **අනාදරො** ලෝකාධිපති පාපයට ඇති බිය නැති බැවින් සබ්‍රහ්මචාරීන් කෙරෙහි ආදර නැති, **තතො** යනු එහෙයින්, අවිද්‍යා, පාපිච්ඡතා, අහිරික, අනොත්තප්ප හේතුවෙන්. **පසවති** යනු කාය දුශ්චරිත ආදී ප්‍රභේද ඇති. **පාපං** පව් රැස් කරයි. **අපායං තෙන ගච්ඡති** යනු ඒ හේතුවෙන්, එසේ යෙදුනා වූ පාපයෙන් නිරය ආදී භේද ඇති අපායට යයි, පැමිණෙයි.

**තස්මා** යම්හෙයකින් ඒ අවිද්‍යාදී කරුණු ම සියලු දුසිරිත්වලට මූලහේතුව වීද සියලු දුගති කෙලෙස්වලට හේතුවීද එහෙයින් **තස්මා ඉච්ඡඤ්ච ලොභඤ්ච අවිජ්ජඤ්ච** එහෙයින් ඉච්ඡාව ද ලෝභය ද අවිද්‍යාව ද, 'ච' ශබ්දයෙන් අහිරිකය (පාපයට ලජ්ජා නැති කම) ද අනොත්තප්පය

(පාපයට බියනැති කම) ද ගැනේ. **විරාජයං** සමුච්ඡේද වශයෙන් දුරුකරමින්, කෙසේ දුරුකරයිද කීය. **විජ්ජං උප්පාදයං** යනු විදර්ශනා පිළිවෙළින් ද මාර්ග පිළිවෙළින් ද උත්සාහකොට අර්හත් මාර්ග විද්‍යාව තම සිතෙහි උපදවමින්. **සබ්බා දුග්ගතියො** යනු සියලුම දුසිරිත් නම් වූ දුගති, සංසාර දුකට ස්ථානයක් වීම් වශයෙන් දුක් වූ සියලු ගති පහ ද, **ජහෙ** දුරු කරන්නේය. ඉක්මවන්නේය. කෙලෙස් ප්‍රහාණයෙන් ම කර්මයද විපාකයද පහවෙයි.

**තෙවන සූත්‍රයයි.**

**පළමු බණවර වැනුම නිමියේ ය.**

# 2.2.4

සිවුවැන්නෙහි **සුපරිහීනා** යනු මනාව පිරිහුනා වූ. යෙ අරියාය **පඤ්ඤාය පරිහීනා** යම් සත්ත්ව කෙනෙක් පංචස්කන්ධය පිළිබඳ ඇතිවීම නැතිවීම අවබෝධ කිරීමෙන් ද චතුපච්චය (චතුස්සත්‍ය) අවබෝධ කිරීමෙන් ද කෙලෙසුන් කෙරෙන් දුරුව සිටියාහු ආර්ය වූ පිරිසිදු වූ විදර්ශනා ප්‍රඥාවෙන් ද මාර්ග ප්‍රඥාවෙන් ද පිරිහුනාහු ද ඔවුහු ලෞකික ලෝකෝත්තර සම්පත්වලින් අතිශයින් පිරිහුනාහු මහත් විනාශයට පත්වූවාහුය. ඔවුහු කවරහුද? යමෙක් කර්මාවරණයෙන් යුක්ත වූවාහු ද ඔවුහුය. ඔවුහු නියත මිථ්‍යාදෘෂ්ටි ඇති බැවින් ඒකාන්තයෙන් පිරිහුනාහු අසම්පූර්ණ වූවාහු මහත් විනාශයට පත් වූවාහුය. එහෙයින් **දුග්ගති පාරිකංඛා** යනුවෙන් දුගතිය කැමතිවිය යුතුයයි කීහ. විපාකාවරණයෙන් යුක්ත වූවෝ ද පිරිහුනාහුය.

නැතහොත් කුශල (සුකක) පක්ෂයෙහි **අපරිහීනා** නාම ත්‍රිවිධ ආවරණයෙන් තොර වූ සම්‍යක් දෘෂ්ටික වූ කම්මස්සකත ඤාණයෙන් ද යුක්තවූවාහු. ඉතිරිය කියන ලද්ද අනුසාරයෙන් දතයුතුය.

ගාථාවන්හි **පඤ්ඤාය** යනු නිස්සක්ක (පංචමී=අවධි) විභක්ති වචනයයි. විදර්ශනා ඥානයෙන් ද මාර්ග ඥානයෙන් ද. **පරිහානෙන** මෙය ඡට්ඨී (සම්බන්ධ) විභක්ති වචනය හෝ වෙයි. කියන ලද ආකාර ඇති ඤාණයේ පිරිහීමෙන්, උපදවා ගතයුතු දෙයෙහි නූපදීමම මෙහි පිරිහීමයි. **නිවිට්ඨං නාමරූපස්මිං** යනු නාමරූපයෙහි, උපාදාන ස්කන්ධ පසෙහි 'එය මගේය' ආදී වශයෙන් තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් ඇලීසිටුනා ලද, ගැලී සිටුනා ලද, එහෙයින් ම **ඉදං සච්චන්ති මඤ්ඤති** යනු මෙයම සත්‍යය අනික හිස්යයි හඟියි. 'සදෙවකෙ ලොකෙ' යනුවෙන් විභක්ති හරවාගත යුතුය. මෙසේ පළමු ගාථාවෙන් සංකිලේශ (දූෂිත) පක්ෂය දක්වා දැන් යමක නූපදීමෙන් නාමරූපයෙහි (තෘෂ්ණා-මාන-දෘෂ්ටි යන) මඤ්ඤනාවන් දැඩිව ගැනීම නිසා ක්ලේශ වෘත්තය පවතී, එය (ප්‍රඥාව) ඉපදීමෙන් ක්ලේශ වෘත්තයේ සිඳදැමීම වෙයි යනුවෙන් ප්‍රඥාවේ ආනුභාවය ප්‍රකාශ කරමින් 'පඤ්ඤාහි සෙට්ඨා ලොකස්මිං' යන ගාථාව වදාළහ. එහි **ලොකස්මිං** යනු සංස්කාර ලෝකයෙහි, සම්මා සම්බුදුරජාණන් වහන්සේ මෙන් සත්ත්වයන් කෙරෙහි සංස්කාරයන් කෙරෙහි ප්‍රඥාව සමාන ධර්මයක් නැත. කුශල ධර්මයෝ ප්‍රඥාව ශ්‍රේෂ්ඨ කොට ඇත්තාහ. ප්‍රඥාව ඇතිවීමෙන් සියලු නිවැරදි ධර්මයෝ සිදුවෙත්මය. එහෙයින් 'සම්මා දිට්ඨියට සම්මා සංකප්පය සෑහේ' යනාදිය කියන ලදී. යම් ප්‍රඥාවක් මෙහි අදහස් කරන ලද ද, ඒ ප්‍රඥාව ශ්‍රේෂ්ඨයයි පසසන ලදී. ඒ ප්‍රඥාවේ පැවැත්ම යම්සේ ද එය දක්වන්නට 'යායං නිබ්බෙධගාමිනී' යනාදිය කියන ලදී. එහි අර්ථය : යම් මේ ප්‍රඥාවක් නො කලකිරුණුවිරූ නො පළන ලද විරූ ලෝභස්කන්ධාදිය ගැන කලකිරවමින් ඒවා පළා දමමින් ගමන් කරයි පවතියි යන අරුතින් නිබ්බේධගාමිනී නම් වේ. ඒ ඒ භව-යෝනි-ගති-විඤ්ඤාණට්ඨිති-සත්තාවාසයන්හි සත්ත්ව නිකායන්හි ස්කන්ධයන්ගේ පළමු ඉපදීම නම් වූ යම් ජාතියක ද එයට නිමිත්ත වූ කර්මභවයේ ද ගෙවීම අවසානය නිවන රහත් බව මනාකොට නොවෙනස් අයුරින් දනියි ද ප්‍රත්‍යක්ෂ කරයි ද විදර්ශනා මාර්ග ප්‍රඥාව සමග මෙය ලෝකයෙහි ශ්‍රේෂ්ඨය.

දැන් කියන ලද ආකාර ඇති ප්‍රඥානුභාව සම්පන්න ක්ෂීණාශ්‍රවයන් (රහතන්) වහන්සේලාට ප්‍රශංසා කරමින් 'තෙසං දෙවා මනුස්සා ච' යන අවසාන ගාථාව වදාළහ. ඒ ගාථාවේ අර්ථය: චතුරාර්ය සත්‍යයන්හි පිරිසිඳ දැනීමාදී එම සොළොස් ක්‍රියාවන් නිම වූ බැවින් චතුස්සත්‍යාව

බෝධයෙන් **සම්බුද්ධානං**, සිහිය විපුල බවට පැමිණීමෙන් **සතිමන්තං**, කියන ලද ආකාරයෙන් සහමුලින් උදුරා දමන ලද මෝහය ඇති බැවින් ප්‍රඥාව විපුල බවට පැමිණීමෙන් **හාසපඤ්ඤානං**, පූර්ව භාගයෙහි සීලාදිය සම්පූර්ණ කිරීමේ පටන් නිර්වාණය ප්‍රත්‍යක්‍ෂ කරන තෙක් හාසය, වේදය, තුට්ඨිය, ප්‍රමෝදය බහුල බැවින් **හාසපඤ්ඤානං**, සියලු අයුරින් ගෙවුණු භව සංයෝජන ඇති බැවින් **අන්තිමසරීරධාරීනං** අවසන් ශරීර දරන රහතන් වහන්සේලාට දෙවියෝ ද මිනිස්සු ද **පිහයන්ති** කැමති වෙත්. අහෝ ප්‍රඥාවේ ආනුභාවය, අහෝ ඒකාන්තයෙන් අපි ද මෙසේ සියලු දුකින් එතෙර වූවෝ වන්නෙමු නම් මැනවැයි ඒ ස්වභාවය ලබන්නට කැමති වෙත්.

සිවුවන සූත්‍රයයි.

# 2.2.5

පස්වන සූත්‍රයෙහි **සුක්කා** යනු වර්ණයෙන් සුදු බව කරණකොට සුදු නොවේ. සුදු බව පිණිස පරම පිරිසිදු බව පිණිස පවතී යන අරුතින් උපන් පිරිසිදු බව කරණකොට සුදු නම් වේ. ස්වභාවයෙන් සියලු කුශල ධර්ම කලු බවට ප්‍රතිවිරුද්ධ බැවින් සුදුමය. ඒ කුශල ධර්මයන්ගේ උත්පත්තියෙන් සිත ප්‍රභාස්වර වෙයි. පිරිසිදු වෙයි. **ධම්මා** යනු කුශල ධර්මය. **ලොකං** යනු සත්ත්ව ලෝකයයි. **පාලෙන්ති** යනු දැරීමෙන් ඉසිලීමෙන් සීමාව තබමින් රකිති. **හිරි ච ඔත්තප්පඤ්ච** යන මෙහි මෙය කරණකොට ලජ්ජා වෙති හෝ ලජ්ජාවිය යුතු දෙයින් ලජ්ජා වෙයි යනුවෙන් හිරි නම් වෙයි. මෙය **'යං හිරීයති හිරීයිතබ්බෙන හිරීයති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා, අයං වුච්චති හිරි'**[1] 'යම් කරුණකට ලජ්ජාවිය යුතු බැවින් ලජ්ජා වෙයි ද, ලාමක අකුශල

1. ධම්ම සංගණිප්පකරණ, නික්ඛේප කණ්ඩ - බු.ජ.මු. 484 පිට.

ධර්මයන්ගේ පැමිණීමට ලජ්ජා වෙයි ද මෙය 'හිරි' යයි කියනු ලැබේ.' යනුවෙන් කියනලදී. මෙය කරණකොට බියවෙති හෝ බියවිය යුතු දෙයින් බියවෙති යනුවෙන් ඔත්තප්ප නම් වෙයි. මෙය **'යං ඔත්තප්පති ඔත්තප්පිතබ්බෙන ඔත්තප්පති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා', ඉදං වුච්චති ඔත්තප්පං**[1] 'යම් කරුණකින් තැතිගත යුතු බැවින් තැතිගනීද, ලාමක අකුශල ධර්මයන්ගේ පැමිණීමට තැතිගනී ද මෙය 'ඔත්තප්ප' යයි කියනු ලැබේ යනුවෙන් කියන ලදී.

එහි හිරිය ඇතුළතින් හටගනී. ඔත්තප්පය බැහැරින් හටගනී.

හිරිය ආත්මාධිපතිය, ඔත්තප්පය ලෝකාධිපතිය.

හිරිය ලජ්ජා ස්වභාව ඇත්තේය. ඔත්තප්පය භය ස්වභාව ඇත්තේය.

හිරිය ගරුකිරීම ලක්ෂණකොට ඇත්තේය. ඔත්තප්පය වරදට බිය දැක්වීම ලක්ෂණකොට ඇත්තේය.

එහි ඇතුළතින් හටගන්නා හිරිය කරුණු සතරකින් හටගනී.

ජාතිය ගැන සලකා බලා
වයස ගැන සලකා බලා
දක්ෂකම ගැන සලකා බලා
උගත්කම ගැන සලකා බලා යනුවෙනි. ඒ කෙසේද?

මේ පව්කිරීම නම් උසස් ජාති ඇත්තන්ගේ ක්‍රියාවක් නොවේ. හීන ජාති ඇති කේවට්ට (මස් මරන්නන්) ආදීන්ගේ ක්‍රියාවකි. එබඳු උසස් ජාති ඇත්තෙකුට මේ ක්‍රියාව කරන්නට සුදුසු නොවේයයි මෙසේ ජාතිය සලකා බලා සතුන් මැරීමාදී පව්කම් නොකරන්නේ හිරිය (ලජ්ජාව) උපදවයි. එසේ ම මේ පව්කිරීම නම් ළමයින් විසින් කළයුතු ක්‍රියාවකි. එබඳු (වැඩිහිටි) වයසෙහි සිටියහුට මේ ක්‍රියාවකරන්නට සුදුසු නොවේ යයි මෙසේ වයස සලකා බලා සතුන් මැරීමාදී පව්කම් නොකරන්නේ හිරිය උපදවයි. එසේම මේ පව්කිරීම නම් දුර්වල ජාතිකයන්ගේ ක්‍රියාවකි. එබඳු දක්ෂ බවින් යුතු කෙනෙකුට මේ ක්‍රියාව කරන්නට සුදුසු නොවේයයි මෙසේ දක්ෂ බව සලකා බලා සතුන් මැරීමාදී පව්කම් නොකරන්නේ හිරිය උපදවයි. එසේම මේ පව්කිරීම නම් නුවණ නැති අයගේ ක්‍රියාවකි.

1. ධම්ම සංගණිප්පකරණ, නික්ඛේප කණ්ඩ - බු.ජ.මු. 484 පිට.

පණ්ඩිතයන්ගේ ක්‍රියාවක් නොවේ. එබඳු පණ්ඩිතයෙකුට උගතෙකුට මේ ක්‍රියාව කරන්නට සුදුසු නොවේයයි මෙසේ උගත්කම සලකා බලා සතුන් මැරීමාදී පව්කම් නොකරන්නේ හිරිය උපදවයි. හිරිය හටගෙන තම සිතෙහි හිරිය සලකා බලා පව්කම් නොකරයි. මෙසේ හිරිය ඇතුළතින් හටගන්නේ වෙයි.

ඔත්තප්පය කෙසේ බැහැරින් හට ගනීද?

ඉදින් ඔබ පව්කම් කරන්නෙහි නම් සතර පිරිස් අතරෙහි ගැරහීමට පත්වන්නෙහිය.

**ගරහිස්සන්ති තං විඤ්ඤූ අසුචිං නාගරිකො යථා**
**වජ්ජිතො සීලවන්තෙහි කථං භික්ඛු කරිස්සසී**

නගරයෙහි වැසියෙක් යම්සේ අශුචියට ගරහයි ද එසේ නුවණැත්තෝ ඒ පාපයට ගරහන්නෝය. සිල්වතුන් විසින් වර්ජනය කරන ලද්දේය. භික්ෂුව, ඔබ ඒ පාපය කෙසේ කරන්නෙහිද? මෙසේ සලකා බලන තැනැත්තා බැහැරින් හටගත් ඔත්තප්පයෙන් පව්කම් නොකරයි. මෙසේ ඔත්තප්පය බැහැරින් හටගත්තේ වෙයි.

හිරිය කෙසේ ආත්මාධිපති වේද? මෙලොව ඇතැම් කුලපුත්‍රයෙක් තමා අධිපතිකොට ප්‍රධානියකු කොට එබඳු ශ්‍රද්ධාවෙන් පැවිදි වූ උගත් ධුතවාදී වූ කෙනෙකුට පව්කම් කරන්නට සුදුසු නොවේයයි පව්කම් නොකරයි. මෙසේ හිරිය ආත්මාධිපති (තමන් අධිපති) කොට ඇත්තේ වෙයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ

**'සො අත්තානං යෙව අධිපතිං කත්වා අකුසලං පජහති, කුසලං භාවෙති, සාවජ්ජං පජහති අනවජ්ජං භාවෙති, සුද්ධමත්තානං පරිහරති'**[1]

'හෙතෙම තමාම අධිපතිකොට අකුසලය දුරුකරයි. කුසලය වඩයි. වැරදි දේ දුරුකරයි. නිවැරදි දේ වඩයි. පිරිසිදු ආත්මය (ජීවිතය) පරිහරණය (ගත) කරයි' යනුවෙන් වදාළහ.

1. අ.නි. - තික නිපාතය - බු.ජ.මු. 268 පිටුව

ඔත්තප්පය කෙසේ ලෝකාධිපති වේද?

මෙලොව ඇතැම් කුලපුත්‍රයෙක් ලෝවැසියා අධිපතිකොට ප්‍රධානියෙකු කොට පව්කම් නොකරයි. එය කී අයුරු මෙසේය.

'මහා ඛො පනායං ලොකසන්නිවාසො, මහන්තස්මිං ඛො පන ලොක සන්නිවාසෙ සන්ති සමණ බ්‍රාහ්මණා ඉද්ධිමන්තො දිබ්බචක්ඛුකා පරචිත්ත විදුනො, තෙ දූරතොපි පස්සන්ති, ආසන්නාපි න දිස්සන්ති, චෙතසාපි චිත්තං පජානන්ති, තෙපි මං එවං ජානිස්සන්ති පස්සථ භො ඉමං කුලපුත්තං සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතො සමානො වොකිණ්ණා විහරති පාපකෙහි අකුසලෙහි ධම්මෙහීති ලොකං යෙව අධිපතිං කත්වා අකුසලං පජහති'[1]

'මේ ලෝක සන්නිවාසය නම් වූ සත්ත්ව සමූහය විශාලය. මහත් වූ සත්ත්ව සමූහය අතර ඍද්ධිමත් වූ දිවැස් ඇත්තා වූ පරසිත් දන්නා වූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ. ඔවුහු දුරදීම තමාව දකිති. ළංවූවාහු ද තමාට නොපෙනෙති. සිතින් ද සිත දැනගනිති. 'පින්වත්නි, බලන්න. මේ කුලපුත්‍රයා ශ්‍රද්ධාවෙන් ගිහිගෙයින් නික්ම පැවිදි වූයේ ලාමක අකුශල ධර්මවලින් ගැවසී ගත්තෙක් වාසය කරයි' යනුවෙන් ඔවුහු මා ගැන මෙසේ දැනගනිති'යි ලෝවැසියාම අධිපතිකොට අකුශලය දුරුකරයි.

මෙසේ ඔත්තප්පය ලෝවැසියා අධිපතිකොට ඇත්තේය. 'ලජ්ජා සභාව සණ්ඨිතා' යන මෙහි ලජ්ජා යනු ද ලජ්ජාවන ආකාරයයි. හිරිය එම ස්වභාවයෙන් සිටියේය. 'භයං' යනු අපාය භයයි. ඔත්තප්පය එම ස්වභාවයෙන් සිටියේය. ඒ දෙකම පාපය දුරුකිරීමෙහි ප්‍රකට වෙයි. එහි යකඩ ගුලි දෙකින් එකක් සීතල ද අශුචි තැවරුණු එකක් ද වෙයි. එකක් උණුසුම් ද ගිනිගෙන දැල්වෙන්නේ ද වෙයි. ඒ දෙකින් සීතල වූ යකඩ ගුලිය අශුචි තැවරුණු බැවින් පිළිකුල් කරන නුවණැත්තා නො ගනියි. අනිත් යකඩගුලිය දැවෙන බියෙන් නොගනියි. මෙසේ පණ්ඩිත තෙමේ ලජ්ජාවෙන් පිළිකුල් කරමින් පව් නොකරයි. ඔත්තප්පයෙන් අපායබිය ඇත්තේ පව් නොකරයි. මෙසේ හිරිය ලජ්ජා ස්වභාවයෙන් සිටියේය. ඔත්තප්පය භය ස්වභාවයෙන් සිටියේය.

1. අං.නි. - තික නිපාතය - බු.ජ.මු. 268 පිටුව

හිරිය කෙසේ ගෞරව කරන ලක්‍ෂණයෙන් යුක්ත ද? ඔත්තප්පය කෙසේ වරදට බියවන සුලු භය දක්නා ලක්‍ෂණයෙන් යුක්ත ද? ඇතැම් පුද්ගලයෙක් (තමාගේ) ජාතියේ මහත් බව (උසස් බව) සැලකීමෙන් ද, ශාස්තෲන් වහන්සේගේ උසස් බව සැලකීමෙන් ද ශාසන දායාදයේ උසස් බව සැලකීමෙන් ද සබ්‍රහ්මචාරීන්ගේ උසස් බව සැලකීමෙන් ද යන කරුණු සතරින් එහිලා ගෞරවයෙන් ගෞරව කරන ලක්‍ෂණයෙන් යුත් හිරිය (ලජ්ජාව) උපදවා පව් නොකරයි. ඇතැම් පුද්ගලයෙක් අත්තානුවාද (තමාට තමා දොස් කීමේ බිය, පරානුවාද (අනුන් තමාට දොස් කීමේ) බිය, දඬුවමට ඇති බිය, දුගතියට ඇති බිය යන කරුණු සතරින් වරදට බියවන්නේ වරදට බියවනසුලු භය දක්නා ලක්‍ෂණය ඇති ඔත්තප්පය උපදවා පව්කම් නොකරයි.

මෙහි ද ඒ ඒ තන්හි ප්‍රකට බැවින් කියන ලද ඇතුළත හටගැනීම් (අජ්ඣත්ත සමුට්ඨාන) ආදී වශයෙන් ඇති හිරි-ඔතප් කිසිකලෙක එකින් එක වෙන් නොවේ. අලජ්ජීන්ට ලජ්ජාවක් හෝ බයක් හෝ නැත. **ඉමෙ ච භික්ඛවෙ දෙව සුක්කා ධම්මා ලොකං න පාලෙය්‍යුං** යනු මහණෙනි, මේ නිවැරදි ධර්මයෝ දෙදෙන ඉදින් ලෝකය නො රක්නාහු නම් ඉදින් ලෝකපාලකයෝ නො වන්නාහු නම් **නයිධ පඤ්ඤායෙථ මාතා** යන මෙහි මේ ලෝකයෙහි තමා බිහිකළ මව ගැන මේ මගේ මවයයි ගරුසරු කිරීම් වශයෙන් සැලකීමක් නො පෙනේ. මව යයි (කියා කෙනෙක්) නො ලැබෙන්නේය. අනිත් පදවලදී ද මේ ක්‍රමයමයි. **මාතුච්ඡා** යනු මවගේ සහෝදරියයි. **මාතුලානි** යනු මාමාගේ බිරිඳය (නැන්දා), **ගරූනං** යනු මහ පියා (මහප්පා), සුළු පියා (බාප්පා), වැඩිමහල් සහෝදර ආදී ගරුකළ යුත්තන්ගේ. **සම්භෙදං** යනු සංකරවීමට (මිශ්‍රවීමට), සීමා බිඳීමට හෝ. **යථා අජෙළකා** යනාදී වචනවලින් උපමාව දක්වයි. මේ (එළු ආදී) සත්ත්වයෝ මේ මගේ මවය කියා හෝ, මවගේ සහෝදරිය කියා හෝ ගරුසරු කිරීම් වශයෙන් නො දනිති. යම් තැනැත්තියක කෙරෙහි රාගය උපන්නේ නම් ඒ තැනැත්තිය කෙරෙහි වැරදි ලෙස පිළිපදිති. (මෛථුන සේවනය කරති). එහෙයින් උපමාවක් ගෙනඑමින් එළුවන් ආදිය දැක්වූහ. මේ වනාහි එහි කෙටි අරුතයි. එළු ආදී තිරිසන් සත්තු හිරිඔතප් නැතිව මව යන හැඟීමක් නැතිව බිඳුණු සීමා ඇතිව හැමතන්හි යම්සේ සම්භේදයෙන් (මෛථුනයෙන් යුක්තව) පවතිත් ද මෙසේ මේ ලෝකය වනාහි ඉදින් ලෝකපාලක ධර්ම නැත්නම් හැමතන්හි සම්භේදයෙන්

පවතින්නේය. යම්හෙයකින් වනාහි ලෝකපාලක ධර්මයෝ ලෝකය පාලනය කරත් ද එහෙයින් සම්භේදයක් නැත.

ගාථාවන්හි **යෙසඤ්ච හිරි ඔත්තප්පං** 'ච' යනු නිපාත මාත්‍රයකි. යම් සත්ත්වයන්ගේ හිරිය ද ඔත්තප්පය ද, **සබ්බදා ච** හැමකල්හිම **න විජ්ජති** නොලැබේ. **වොක්කන්තා සුක්කමූලා තෙ** යනු ඒ සත්ත්වයෝ කුශල් මුල් සිඳ දැමීම ඇතිකරන කර්ම කිරීමෙන් කුශල කර්මයන්ට පිහිට වූ හිරිඔතප් නැති බැවින් කුශලයෙන් ඉවත්ව සිටි බැවින් කුශල මූලයෙන් ඉවත් වූවාහු නැවත නැවත උපදින මැරෙන ස්වභාව ඇති බැවින් ජාති මරණයට යන්නාහු සංසාරය නොඉක්මවති යන අර්ථයි. **යෙසඤ්ච හිරිඔත්තප්පං** යනු පිරිසිදු අදහස් ඇති යම් සත්ත්වයන්ගේ හිරිය ද ඔත්තප්පය ද යන මේ ධර්ම. සදා සියලු කල්හි, දිවා රෑ, නවක, මධ්‍යම, ස්ථවිර යන කාලයන්හි - **සම්මා උපට්ඨිතා** යනු මනාකොට එළඹ සිටියා වූ, පාපය පිළිකුල් කරන්නා වූ පාපයට බිය වන්නා වූ තදංගාදී වශයෙන් පාපය දුරුකරන්නා වූ. **විරූළ්හ බ්‍රහ්මචරියා** යනු ශාසන බ්‍රහ්මචර්යාවෙන් ද මාර්ග බ්‍රහ්මචර්යාවෙන් ද වැඩීමට පැමිණියා වූ අග්‍ර මාර්ග (අර්හත් මාර්ග) අවබෝධයෙන් සියලු ආකාරයෙන් සන්සිඳුණු කෙලෙස් ඇති බැවින් හෝ ශාන්ත ගුණ ඇති බැවින් හෝ ශාන්ත වූ, පුනර්භවය ඉවත දමන ලද බැවින් ක්ෂීණ වූවාහු පුනර්භවයක් නැත්තාහු වෙත්.

**පස්වන සූත්‍රයයි.**

# 2.2.6

හයවන සූත්‍රයෙහි **අත්ථි භික්ඛවෙ** යන මෙහි උපත කුමක් ද? එක් දිනක් නොයෙක් ආකාරයෙන් සංසාරයෙහි දොස් (ආදීනව) ප්‍රකාශ කොට පෙන්වීම් වශයෙන් නිවන හා සම්බන්ධ වූ භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම දේශනා කථාවක් නිසා භික්ෂූන්ට 'මේ සංසාරය භාග්‍යවතුන් වහන්සේ විසින් අවිද්‍යාදී කරුණුවලින් හේතු සහිතව කියන ලදී. ඒ අවිද්‍යාදී කරුණු

සංසිඳුනා වූ නිවන ගැන කිසි කරුණක් නොකියන ලදී. ඒ මේ අහේතුක වූ නිවන සච්ඡිකත පරමත්‍ථ (ප්‍රත්‍යක්‍ෂ කරන ලද පරමාර්ථ) වශයෙන් කෙසේ ලැබේද යන මේ අදහස ඇතිවිය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ භික්‍ෂූන්ගේ සැක දුරුකිරීම පිණිසද නොලැබෙන ස්වභාව ඇති බැවින් පරමාර්ථ වශයෙන් නිවනක් නම් නැතැයි කියන ලෝකායතිකයන් මෙන් වැරදි ලෙස පිළිපදින (බුදුසසුනෙන්) බාහිර බොහෝ දෘෂ්ටිවලට බැසගත්තවුන්ගේ මිථ්‍යාවාද බිඳීම පිණිස ද මේ අමාමහ නිවන පරමාර්ථ වශයෙන් ඇති බව දැක්වීම පිණිස ද ඒ නිවනෙහි කෙලෙසුන්ගෙන් නිදහස් බව ආදී ආනුභාව ඇති මේ සූත්‍රය ප්‍රීති වේගයෙන් උදාන වශයෙන් වදාළහ. එහෙයින් මේ සූත්‍රය උදාන පාළියෙහි ද කියන ලදී.

එහි **අත්‍ථි** යනු විද්‍යමාන වෙයි. පරමාර්ථ වශයෙන් ලැබේ. **අජාතං අභූතං, අකතං අසංඛතං** යන සියලු පද එකිනෙකට සමාන වචනය. නොහොත් වේදනාදිය මෙන් හේතුප්‍රත්‍ය එක්රැස්වීම නම් වූ කරුණු එක්වීමෙන් නූපන් නො නිපන් යන අරුතින් අජාත වූ, කරුණක් නැතිව තමා ම නොහටගත් පහළ නොවූ නූපන් යන අරුතින් අභූත වූ මෙසේ නූපන් බැවින් ද නොහටගත් බැවින් ද යම්කිසි කරුණකින් නොකරන ලද යන අරුතින් අකත වූ. නාමරූපාදී සංඛත ධර්මයන්ගේ උපන්-හටගත් ස්වභාවය ඇත්තේ වෙයි. අසංඛත ස්වභාවය ඇති නිවනෙහි උපන්-හටගත් ස්වභාවය නැතැයි දැක්වීම පිණිස අසංඛතයයි කියන ලදී. පටිලෝම වශයෙන් (අගසිට මුලට) එකට එකතුව හටගෙන ප්‍රත්‍යවලින් කරන ලද යන අරුතින් සංඛත නම් වේ. එසේ සංඛත නොවූයේ ද සංඛත ලක්‍ෂණ රහිත වූයේ ද අසංඛත නම් වේ. මෙසේ නොයෙක් කරුණුවලින් උපන් බව ප්‍රතික්ෂේප කළ කල්හි එකම කරුණකින් කරන ලද්දේ දැයි සැකය ඇතිකල්හි කිසිවකින් නොකරන ලදැයි දැක්වීම පිණිස 'අකතං'යි කියන ලදී. මෙසේ ප්‍රත්‍ය නැතිවම මෙය තමාම හටගත්තේ ද පහළ වූයේ ද යන සැකය නැවතීම පිණිස 'අභූතං' යි කියන ලදී. එහි (නිවනේ) මේ අසංඛත-අකත-අභූත බව සියල්ලෙන් සියල්ල නූපන් ධර්ම ඇති බව දැක්වීමට 'අජාතං'යි කියන ලදී. මෙසේ මේ පද සතරෙහි අර්ථ සහිත බව දතයුතුය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ 'අත්‍ථි භික්ඛවෙ අජාතං අභූතං අකතං අසංඛතං' යනුවෙන් පරමාර්ථ වශයෙන් නිවන ඇති බව වදාරා එහි

හේතු දක්වමින් **නො චෙතං භික්ඛවෙ** යනාදිය වදාළහ. මේ එහි කෙටි අර්ථයයි: මහණෙනි, ඉදින් අජාත ආදී ස්වභාව ඇති අසංඛත ධාතුව නොවන්නේ නම් මේ ලෝකයෙහි ජාති ආදී ස්වභාව ඇති රූපාදී ස්කන්ධ පංචකය නම් වූ සංස්කාරයේ ගැලවීමක් සංසාරය ඉතිරි නොකොට ලැබෙන සංසිඳීමක් නො පෙනෙන්නේය. නො ලැබෙන්නේය. නොවන්නේය. නිවන අරමුණුකොට පවතින සම්මා දිට්ඨි ආදී ආර්ය මාර්ග ධර්ම කෙලෙසුන් ඉතිරි නොකිරීම් වශයෙන් සහමුලින් සිඳදමති. එහෙයින් මෙහි සියලුම සංසාර දුකෙහි නොපැවැත්ම ඉවත්වීම නිදහස්වීම පෙනේ. මෙසේ අතිරේක කරුණෙනුත් නිවන ඇති බව දක්වා දැන් අනුපිළිවෙළ වශයෙන් දැක්වීමට **යසමා ච ඛො** යනාදිය වදාරණ ලදී. මෙහි ද යම්හෙයකින් අප්‍රත්‍ය ධර්ම අසංඛත ධර්ම ඇත්ද එය ද කියන ලද අර්ථ ඇත්තේමය.

**අත්‍ථි භික්ඛවෙ තදායතනං යත්‍ථ නෙව පඨවි**

'මහණෙනි, යම්තැනක පඨවිය නැති ද ඒ ආයතනය ඇත'

'**ඉදමපි ඛො ඨානං දුද්දසං යදිදං සබ්බසංඛාර සමථො සබ්බූපධිපටිනිස්සගො**'

'සියලු සංස්කාරයන්ගේ සන්සිඳීම වූ සියලු උපධීන්ගේ අත්හැරීම නම් වූ යම් මේ කරුණක් ඇත්ද මේ කරුණ ද දැකීමට අපහසුය.'

'**අසංඛතං ච වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි අසංඛතගාමිනිං ච පටිපදං**'

'මහණෙනි, ඔබට අසංඛත ධර්මය ද අසංඛත ගාමිණී ප්‍රතිපදාවද දෙසන්නෙමි.'

යනාදී නොයෙක් සූත්‍ර පදවලින් ද 'අත්‍ථි භික්ඛවෙ අජාතං' යන මේ සූත්‍රයෙන් ද නිර්වාණධාතුව පරමාර්ථ වශයෙන් ඇති බව සියලු ලෝකයාට අනුකම්පා කරන්නා වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලදී. එහෙයින් ප්‍රතික්ෂේප නොකළ යුතුය. එහිලා (නිවන) ප්‍රත්‍යක්ෂ නොකරන ලද නුවණැත්තන්ට ද සැකයක් හෝ විමතියක් නැත්තේමය. බුද්ධියක් නැති යම් පුද්ගලයෝ වෙත් ද ඔවුන්ගේ විමතිය දුරුකිරීම පිණිස එහිලා අදහස් කරන ලද දෙය මතුකර දැක්වීම් වශයෙන් මේ යුක්තිය පැහැදිලි කිරීමයි: දතයුතු ආකාරයෙන් ද වැඩිපුර වූ කාමයන්ටද

රූපයන්ටද ප්‍රතිපක්ෂ වූ එයට පිහිටක් නැති ස්වභාවය වූ නිස්සරණය පැනෙයි. මෙසේ ඒ ස්වභාවය ඇති සියලු සංඛත ධර්මයන්ට ප්‍රතිවිරුද්ධ වූ එයට පිහිටක් නැති ස්වභාවය ඇති නිස්සරණයක් විය යුතුය. යම් ඒ නිස්සරණයක් (දුකින් මිදීමක්) වේද, ඒ අසංඛත ධාතුවයි. වැඩිපුර කුමටද? සංඛත ධර්ම අරමුණුකොට ඇති විපස්සනා ඥාණය වන අනුලෝම ඥාණය පවා කෙලෙස් සමුච්ඡේද වශයෙන් පහකිරීමට නොහැකි වෙයි. එසේ සම්මුති සත්‍ය අරමුණුකොට ඇති ප්‍රථම ධ්‍යානාදියෙහි යෙදෙන ඥාණය විෂ්කම්භන වශයෙන් ම කෙලෙස් දුරුකරයි. සමුච්ඡේද වශයෙන් නොවේ. මෙසේ සංඛත ධර්ම අරමුණු කරන ඥාණය ද සම්මුති සත්‍ය අරමුණු කරන ඥාණය ද කෙලෙසුන් සහමුලින් පහකිරීමෙහි අසමත් බැවින් ඒ කෙලෙස් සමුච්ඡේද ප්‍රහාණය කරන ආර්යමාර්ග ඥානය ඒ දෙකටම වෙනස් වූ ස්වභාවය ඇති අරමුණක් විය යුතුය.

එය අසංඛත ධාතුවයි. එසේ 'අත්ථි භික්ඛවෙ අජාතං අභූතං අකතං අසංඛතං' යන මෙය භාග්‍යවතුන් වහන්සේ වදාළ හෙයින් නිවන පරමාර්ථ වශයෙන් ඇති බව පැහැදිලි කරන අවිපරීත (නොවෙනස්) වූ අර්ථයයි. භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද යමක් වේද එය නොවෙනස් අර්ථ ඇති පරමාර්ථයයි. ඊට උදාහරණ 'සියලු සංස්කාර අනිත්‍යයි. සියලු සංස්කාර දුකයි. සියලු ධර්ම අනාත්මයි' යනුයි. එසේම නිබ්බාණ ශබ්දය කිසිතැනක යථාභූත පරමාර්ථ විෂයෙහි සමීපව පැවතීම් වශයෙන් යෙදේ. සීහ ශබ්දය මෙනි. පරමාර්ථ වශයෙන් අසංඛත ධාතුවක් ඇත්තේමය. අනෙක ඊට වෙනස් මිදුණු ස්වභාව ඇති බැවින් පඨවි ධාතු වේදනාව මෙනි. මේ ආදී න්‍යායවලින් සාධාරණීකරණය කරන ලද අසංඛත ධාතුවේ පරමාර්ථ වශයෙන් ඇති බව දතයුතුය.

ගාථාවන්හි **ජාතං** යනු ඉපදෙන අර්ථයෙන් ජාත නම් වේ. ඉපදීම් ලක්ෂණයට පැමිණියේය යන අර්ථයි. **භූතං** වීම් අර්ථයෙන් භූත නම් වේ. (පෙර) නොවී හටගත්තේය යන අර්ථයි. **සමුප්පන්නං** හිතවත් බැවින් උපන්. (එයට) හිතවත් ධර්මවලින් උපන් යන අර්ථයි. **කතං** යනු කරුණු (හේතු) වූ ප්‍රත්‍යවලින් උපන්. **සංඛතං** යනු ඒ කරුණු ම එක්රැස්ව කරන ලද යන අරුතින් සංඛත නම් වේ. මේ සියල්ල ප්‍රත්‍යයෙන් උපන් දෙයට යොදන වචන ය. නිත්‍ය-සාර ආදිය නැති බැවින් අද්ධුවං ජරාවෙන් ද මරණයෙන් ද ඒකාන්තයෙන් ම ගලපන ලද්දේ **ජරාමරණසංඝාටං** නම් වේ. 'ජරාමරණ සංඝතං' යනුවෙන් ද කියති. ජරාවෙන් ද මරණයෙන් ද

උවදුරට පත්වූයේ පීඩාවට පත්වූයේ යන අර්ථයි. ඇස් රෝග ආදී නොයෙක් රෝගයන්ට කුඩුවක් (වාසස්ථානයක්) යන අරුතින් **රොගනිඩ්ඩං** නම් වේ. ස්වභාවයෙන් ද උපක්‍රම වශයෙන් ද බිඳෙන ස්වභාවය ඇති බැවින් **පභංගුරං** නම් වේ. සතරවැදෑරුම් ආහාරය ද තණ්හාව නම්වූ නෙත්තියද මේ උපාදන ස්කන්ධයාගේ ප්‍රභවයයි, හටගැනීමයි යන අරුතින් **ආහාර නෙත්තිප්පභවං** නම් වේ. සියලුම ප්‍රත්‍යය ආහාර වෙයි. මෙහි වනාහි නෙත්තිය ගැනීමෙන් තණ්හාව ගන්නා ලද බැවින් (ආහාරයෙන්) තණ්හාව ඉවත්කරන ලදැයි දතයුතුයි. එහෙයින් ආහාරය ද තණ්හාව ද මේ උපාදානස්කන්ධයාගේ උපතය යන අරුතින් ආහාරනෙත්තිප්පභවං නම් වේ. නැතහොත් ආහාරයම පමුණුවන අරුතින් පවතින අරුතින් නෙත්ති නම් වේ. මෙසේ ද ආහාරනෙත්තිප්පභවං නම් වේ.

නාලං තදභිනන්දිතුං යනු ඒ උපාදානස්කන්ධ පංචකය මෙසේ ප්‍රත්‍යයන්ට අයත් පැවතුම් ඇත. එහෙයින් ම අනිත්‍ය ද දුක් ද වේ. තණ්හා දෘෂ්ටිවලින් සතුටුවන්නට ආශ්වාද කරන්නට යුතු නොවේ. **තස්ස නිස්සරණං** යනු ජාතං භූතං ආදි වශයෙන් කියන ලද ඒ සත්කායේ මිදීම ඉවත්ව යාමයි. නොසන්සිඳුන ස්වභාව ඇති රාගාදී කෙලෙසුන්ගේ ද සියලු සංස්කාරයන්ගේ ද අභාවයෙන් එය සන්සිඳුන බැවින් වර්ණනා කරන ලද බැවින් ද **සන්තං** නම් වේ. තර්ක ඥානයට ගෝචර නොවන හෙයින් (තර්කයෙන් දැනගත නොහැකි හෙයින්) **අතක්කාවචරං** නම් වේ. නිත්‍ය වූ අර්ථයෙන් ධ්‍රුව නම් වේ. එහෙයින් ම **අජාතං අසමුප්පන්නං** හට නොගත්තා වූ නූපන්නා වූ. සෝකයට ඇති හේතූන් නැති බැවින් **අසොකං.** පහ වූ රාගාදී දූලි ඇති බැවින් **විරජං** සසර දුක් නැතිකරගනු කැමති අය විසින් පිළිපැදිය යුතු බැවින් **පදං.** ජාති ආදි දුක්ඛ ධර්මයන්ගේ නිරෝධයට (නැවතීමට) හේතුවන බැවින් **නිරොධො.** දුක්ඛ ධර්මයන් වූ සියලු සංස්කාරයන්ගේ සංසිඳීමට හේතු වූ බැවින් **සංඛාරූපසමො** එහෙයින් ම අත්‍යන්තයෙන් සැප ඇති බැවින් **සුඛො** මේ සියලු පදවලින් අමාමහ නිවනම වර්ණනා කරයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ පළමු ගාථාවට අතිරේක වශයෙනුත් දෙවන ගාථාවට අනුපිළිවෙළ වශයෙනුත් නිවන පැහැදිලි කළහ.

**භයවන සූත්‍රයයි.**

# 2.2.7

සත්වන සූත්‍රයෙහි **ද්වෙ මා** යනු ද්වෙ ඉමා, මේ දෙක. තණ්හාව 'වාන' යයි කියනු ලැබේ. තණ්හාවෙන් (වානයෙන්) නික්මීම හෝ මෙහි තණ්හාව නැත යන අරුතින් හෝ මෙය අවබෝධ කළ කල්හි තණ්හාවේ අභාවය යන අරුතින් හෝ 'නිබ්බාණං' නම් වේ. එයම සත්ත්වයෙක් නැති ජීවයක් නැති අර්ථයෙන් ද ස්වභාවය දරන අර්ථයෙන් ද 'ධාතු' වෙයි. මෙසේ 'නිබ්බාණධාතු' නම් වෙයි. ඉදින් නිවනේ පරමාර්ථ වශයෙන් භේදයක් නැතත් පර්යාය වශයෙන් පෙනේය යන අරුතින් ඒ පර්යාය භේදය සඳහා **ද්වෙ මා භික්ඛවෙ නිබ්බාණධාතුයො** යනුවෙන් වදාරා අදහස් කරන ලද ප්‍රභේද දක්වන්නට 'සඋපාදිසෙසා' යනාදිය වදාරන ලදී. එහි තණ්හාදිය විසින් ඵලභාවයෙන් ගනු ලැබේ යන අරුතින් උපාදි නම් වේ. ස්කන්ධ පංචකයයි. උපාදියම ඉතිරි වූයේ 'සඋපාදිසේසා' වෙයි. එය නැතිවීමෙන් **අනුපාදිසෙසා** වෙයි.

**අරහං** යනු දුරුවූ කෙලෙස් ඇති, ඈතට ගිය කෙලෙස් ඇති අර්ථයි. **'කථඤ්ච භික්ඛවෙ භික්ඛු අරහං හොති?** ආරකාසස හොනති **පාපකා අකුසලා** ධම්මා සංකිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා **ආයතිං ජාති ජරා මරණියා, එවං ඛො භික්ඛවෙ භික්ඛු අරහං හොති'**

'මහණෙනි, භික්ෂුව කෙසේ නම් අරහං වෙයිද? කිලුටු බව ඇති කරන, පුනර්භවය ඇතිකරන, කෙලෙස් වෙහෙස ඇතිකරන, දුක්විපාක ඇතිකරන මත්තෙහි ජාති-ජරා-මරණ ඇතිකිරීමට සුදුසු වූ ඔහුගේ ලාමක අකුසල ධර්මයෝ දුරුවූයේ වෙති. මහණෙනි, මෙසේ භික්ෂුව අරහං නම් වෙයි' යනුවෙන් මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලදී.

**ඛීණා සවො** යනු කාම ආසව ආදී සතර ආසවයෝ ම ක්ෂීණවූවාහු සහමුලින් සිඳින ලද්දාහු ප්‍රහීණ වූවාහු සන්සිඳුනාහු උපතට නුසුදුසු වූවාහු ඤාණ ගින්නෙන් දවන ලද්දාහු යන අරුතින් ඛීණාසව නම් වේ. **වුසිතවා** යනු ගරුකළයුතු අය සමග එකට විසීමෙහි ද ආර්ය මාර්ගයෙහිද දස ආර්ය වාසයන්හි ද විසුවේය. විශේෂයෙන් විසුවේය. කරන ලද වාසය ඇත්තේය. සිඳින ලද හැසිරීම ඇත්තේය යන අරුතින් වුසිතවා නම් වේ. **කතකරණීයො** යනු කල්‍යාණ පෘථග්ජනයා ද ගෙන ශෛක්ෂ

පුද්ගලයන් සත්දෙනා සතරමාර්ගවලින් කළයුතු දේ කරත්. ක්‍ෂීණාශ්‍රව ඇති තැනැත්තාගේ කළයුතු සියලු කටයුතු කරන ලදී. නිමකරන ලදී. දුක් දුරුකිරීම නම් වූ නිවන අවබෝධ කිරීම පිණිස මත්තෙහි කළයුත්තක් නැත යන අරුතින් කතකරණීය නම් වේ.

**තසස සමමා විමුතතසස සනත චිතතසස භිකඛුනො**
**කතසස පටිචයො නත්‍ථි කරණීයං න විජ්ජති**
යන මෙය කියන ලදී.

ඒ මනාකොට මිදුනු ශාන්තසිත් ඇති භික්‍ෂුවට කළ දෙය සඳහා නැවත කිරීමක් නැත. 'කළයුතු දෙයක් විද්‍යමාන නොවේ' යනුවෙන් මෙය කියන ලදී.

**ඔහිතභාරො** යන මෙහි ස්කන්ධභාර, ක්ලේශභාර, අභිසංස්කාර භාර යනුවෙන් බාර තුනක් ඇත. ඔහුගේ මේ භාර තුනම බහාතබන ලදී. ඉවත්කරන ලදී. හෙළන ලදී යන අරුතින් ඔහිතභාර නම් වේ. **අනුපපතතසදතෙථා** යනු සදර්ථයට පැමිණි, සකත්‍ථං යනුවෙන් කියන ලද්දේ වෙයි. 'ක' කාරයට 'ද' කාරය කරන ලදී. පැමිණි රහත්බව ඇත්තේ මොහු විසිනි යන අරුතින් 'අනුපපතතසදත්‍ථ නම් වෙයි. සදත්‍ථ යනු රහත් බව යයි දතයුතුය. එය තමා හා බැඳීමෙන් තමා අත්නොහරින අර්ථයෙන්ද තමාගේ පරමාර්ථයෙන් ද තමාගේ අර්ථය බැවින් 'සකත්‍ථ' වෙයි. **පරිකඛීණභව සංයොජනො** යනු කාමරාග සංයෝජනය, පටිඝ සංයෝජනය, මාන-දිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බත පරාමාස-භවරාග-ඉස්සා-මච්ඡරිය-අවිජ්ජා සංයෝජනය යන මේවා සත්ත්වයන් භවයන්හි හෝ භවයෙන් භවය හෝ යොදවයි බඳියි යන අරුතින් භව සංයෝජන නම් වේ. රහතන්වහන්සේගේ ඒවා ගෙවීගියේ, පහවූයේ, ඤාණ ගින්නෙන් දවන ලද්දේය යන අරුතින් පරික්ඛීණ සංයෝජන නම් වේ.

**සමමදඤඤාවිමුතෙතා** යන මෙහි සමමදඤඤා යනු මනාකොට දැන. ස්කන්ධයන්ගේ ස්කන්ධ (රාශි) අර්ථය, ආයතනයන්ගේ ආයතන (රැස්කිරීම්) අර්ථය, ධාතූන්ගේ ශූන්‍ය අර්ථය, දුකේ පෙළෙන අර්ථය, සමුදයේ ප්‍රභව (හටගන්නා) අර්ථය, නිරෝධයේ ශාන්ත අර්ථය, මාර්ගයේ දර්ශන අර්ථය, 'සබෙබ සංඛාරා අනිචචා' 'සියලු සංස්කාර අනිත්‍යය' යන

මේ ආදී භේදය මනාකොට තත් වූ පරිද්දෙන් දැනගෙන තීරණයකොට, තුලනයකොට, පැහැදිලිකොට, ප්‍රකටකොට යන මෙය කියන ලද්දේ වෙයි.

**විමුත්තො** යනු චිත්ත විමුක්තිය ද නිර්වාණ විමුක්තිය ද යන විමුක්ති දෙකයි. රහතන්වහන්සේ සියලු කෙලෙසුන්ගෙන් මිදුණු හෙයින් චිත්ත විමුක්තියෙන් ද මිදුනේ නිවනින් ද මිදුනේ වෙයි. එහෙයින් 'සම්මදඤ්ඤා විමුත්තො'යි කියන ලදී. **තස්ස තිට්ඨන්තෙව පඤ්චින්ද්‍රියානි** ඒ රහතන් වහන්සේගේ අවසාන භවයට හේතු වූ කර්මය යම්තාක් නො ගෙවේ ද ඒ තාක් ඇස ආදී ඉඳුරන් පහ පවතීමය. **අවිගතත්තා** යනු අනුප්පාද නිරෝධ (නූපදින ලෙස නිරුද්ධ වීම්) වශයෙන් නිරුද්ධ නොවූ බැවින්. **මනාපාමනාපං** යනු ඉටු අනිටු (හොඳ නරක) රූපාදී ගොදුරු. **පච්චනුභොති** යනු විඳියි. ලබයි. **සුඛ දුක්ඛං පටිසංවෙදෙති** යනු විපාක වූ සැප ද දුක ද විඳියි. ඒ දොරටුවලින් ලබයි.

මෙපමණකින් උපාදිසේසය දක්වා දැන් අනුපාදිසේස නිබ්බාණ ධාතුව දක්වන්නට 'තස්ස යො' යනාදිය කියන ලදී. එහි **තස්ස** යනු ඒ සඋපාදිසේස (පංචස්කන්ධය ඉතිරිව ඇති) රහතන් වහන්සේ යො **රාගක්ඛයො** යනු රාගයේ ගෙවීම, ගෙවුණු බව, අභාවය, අතිශයින් නූපදීම. සෙසු පදවලද මේ ක්‍රමයයි. මෙපමණකින් රාගාදීන්ගේ ක්ෂයවීම (ගෙවීම) සඋපාදිසේස නිබ්බාණධාතුව යයි දක්වන ලද්දේ වෙයි. **ඉධෙව** යනු මේ ආත්මභාවයෙහිම. **සබ්බ වෙදයිතානි** සුඛ ආදී සියලු අව්‍යාකත වේදනාවෝ, කුසල අකුසල වේදනා වනාහි කලින්ම පහ වී ඇත. **අනභිනන්දිතානි** යනු තෘෂ්ණාදියෙන් සතුටු නො වූවාහු **සීතිභවිස්සන්ති** යනු අතිශය සන්සිඳීමෙන් සංඛාර දරථ සන්සිඳීමෙන් සීතල වෙති. ප්‍රතිසන්ධි ගෙන නොදෙන නිරෝධයෙන් නිරුද්ධ වෙති යන අර්ථයි. හුදෙක් විඳින දේ පමණක් නොව ක්ෂීණාශ්‍රව සන්තානයෙහි සියලු පංචස්කන්ධයම නිරුද්ධ වෙත්. දේශනාව වේදයිත ශීර්ෂයෙන් කරන ලදී.

ගාථාවන්හි **චක්ඛුමතා** යනු බුද්ධචක්ඛු (බුදුඇස), ධම්මචක්ඛු (දහම් ඇස) දිබ්බචක්ඛු (දිවැස), පඤ්ඤාචක්ඛු (නුවණැස) සමන්තචක්ඛු (සමතැස) යන ඇස් පහෙන් ඇස් ඇත්තා වූ. **අනිස්සිතෙන** යනු තණ්හා-දිට්ඨි ඇසුරු කිරීම් වශයෙන් කිසි දහමක් ඇසුරු නොකළා වූ හෝ රාග බන්ධනාදියෙන් නොබැඳුනා වූ. **තාදිනා** යනු අංග හයකින් යුත් උපේක්ෂා

වශයෙන් හැමතන්හි ඉටු අනිටු ආදියෙහි එක් ස්වභාව ඇති තාදී ලක්‍ෂණයෙන් තාදී වූ භාග්‍යවතුන් වහන්සේ විසින්. **දිට්ඨ ධම්මිකා** යනු මේ ආත්ම භාවයෙහි වන්නේය, පවත්නේය. **භවනෙත්ති සංඛයා** යනු භවනෙත්ති නම් වූ තණ්හාව ගෙවී යාමෙන්. **සම්පරායිකා** ස්කන්ධ බිඳීමෙන් පරලොව හෝ පර භාගයෙහි හෝ වීම්. **යම්හි** යනු යම් අනුපාදිසේස පරිනිර්වාණයෙක්හි. **භවානි** යනු ලිංග වෙනස්කිරීම් වශයෙන් කියන ලදී. උප්පත්ති භව සියලු ආකාරයෙන් ඉතිරි නොකොට නිරුද්ධ වේ. නොපවතී. **තෙ** යනු ඔව්හු මෙසේ **විමුත්තචිත්තා** කෙලෙසුන්ගෙන් මිදුණු සිත් ඇත්තෝ වෙත්. **ධම්මසාරාධිගමා** යනු මේ ධර්ම විනයෙහි ධර්මයන් අතුරෙන් විමුක්තිය සාර බැවින් සාර වූ අර්හත්වය අවබෝධ කිරීම් වශයෙන්, **ඛයෙ** යනු රාගාදිය ක්‍ෂය වූ නිවනෙහි **රතා** ඇලුණා වූ. නොහොත් නිත්‍ය භාවයෙන් ද ශ්‍රේෂ්ඨ භාවයෙන් ද ධර්මයන් අතර සාරය වූ යන අරුතින් ධර්මසාරය වූ නිවන. එය 'විරාගො සෙට්ඨො ධම්මානං' 'ධර්මයන් අතුරෙන් විරාගය (නිවන) ශ්‍රේෂ්ඨය. 'විරාගො තෙසං අග්ගමක්ඛායති' 'ඒ අතරින් විරාගය අග්‍රයයි කියනු ලැබේ' යනුවෙන් ද කියන ලදී. ඒ ධර්මසාරය අවබෝධ කිරීමේ හේතුව. **ඛයෙ** සියලු සංස්කාර ගෙවුණා වූ අනුපාදිසේස නිවනෙහි ඇලුණා වූ. **පහංසු** යනු දුරුකළාහුය. **තෙ** යනු නිපාත මාත්‍රයයි. ඉතිරිය කියන ලද අයුරින්මය.

**සත්වන සූත්‍රයයි.**

# 2.2.8

අටවන සූත්‍රයෙහි **පටිසල්ලානරාමා** යනු ඒ ඒ සත්ත්ව-සංඛාරවලින් ආපසු හැරී සැඟවීම (විවේකයට පත්වීම) පටිසල්ලානයයි. තනිව විසීම, එකත්පසෙක ඇසුර, කාය විවේකය යන අර්ථයි. ඒ විවේකයට ඇලෙත්. රුචිකරත් යන අරුතින් 'පටිසල්ලානරාමා' නම් වේ. 'පටිසල්ලානාරාමා' යනුවෙන් ද පාඨයකි. කියන ලද ආකාර ඇති පටිසල්ලානයට (විවේකයට)

මොවුන්ගේ රමණය කිරීම් වශයෙන් ඇලීම (ආරාමය) 'පටිසල්ලානාරාමා' නම් වේ. **විහරථ** යනු මේ ආකාරයට පත්වී වාසය කරව් යන අර්ථයි. පටිසල්ලානයෙහි ඇලුණාහු සතුටු වූවාහු **පටිසල්ලානරතා** නම් වේ. මෙපමණකින් ජාගරියානු යෝගය (නිදි දුරුකිරීම)ද එයට නිමිත්ත වූ කයින් හුදකලා බව ද දක්වන ලදී. ජාගරියානුයෝගය, සීල සංවරය, ඉඳුරන්හි වසන ලද දොරටු ඇති බව, ආහාරයෙහි පමණ දන්නා බව, සිහිනුවණ යන මේ ධර්මයන්ගෙන් තොරව විවේකයෙහි ඇලීම නොපවතින හෙයින් ඒවාද මෙහි අර්ථ වශයෙන් කියන ලද්දේමයයි දතයුතුය.

**අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තා** යනු තමාගේ චිත්ත සමථයෙහි යෙදුණාහු. අජ්ඣත්තං යනු ද අත්තනෝ යනු ද එක අර්ථ ඇත්තේය. අකුරු පමණක් ම වෙනස්ය. මෙය සත්තමී (භුම්ම) අර්ථයෙහිය. 'සමථං' යනු 'අනු' ශබ්දය යෙදීමෙන් දුතියා (උපයෝග=කර්ම) විභක්ති වචනයකි. **අනිරාකතජ්ඣානා** යනු පිටතට නොගෙනෙන ලද ධ්‍යාන ඇත්තාහු හෝ විනාශ නොවූ ධ්‍යාන ඇත්තාහු. ඉවත්කිරීම හෝ විනාශය යන මෙය 'නිරාකතං' නමි. 'ථමභං නිරං කත්වා නිවාතවුත්ති' සිතේ තදගතිය ඉවත්කොට යටහත් පහත් පැවතුම් ඇති' යනාදියෙහි මෙනි. **විපස්සනාය සමන්නාගතා** යනු සත්ආකාර අනුපස්සනාවෙන් යුක්ත වූවාහු. අනිච්චානුපස්සනාවද දුක්ඛානුපස්සනාවද අනත්තානුපස්සනාව ද නිබ්බිදානුපස්සනාවද විරාගානුපස්සනාවද නිරෝධානුපස්සනාවද පටිනිස්සග්ගානුපස්සනාව ද සත්ආකාර අනුපස්සනා නම් වේ. ඒවා විසුද්ධි මග්ගයෙහි විස්තර කරන ලද්දේමය.

**බෲහෙතා සුඤ්ඤාගාරානං** යනු ශූන්‍යාගාරයන් වඩන්නාහු. මෙහි සුඤ්ඤාගාර යනු භාවනාවෙහි යෙදෙන තැනැත්තාට විවේකයෙන් යුක්ත සුදුසු වූ යම්කිසි තැනක්. සමථ විදර්ශනා වශයෙන් කමටහනක් ගෙන දිවා රෑ ශූන්‍යාගාරයකට පිවිස භාවනාවෙහි යෙදීම් වශයෙන් හිඳින්නා වූ භික්ෂූහු. ශූන්‍යාගාර වඩන්නාහු යයි දතයුතුය. එක් මහලක් ඇති පහයෙහි පවා වාසය කරමින් ධ්‍යාන කරන්නාහු ශූන්‍යාගාර වඩන්නාහුම යයි දතයුතුය. මෙහි ද 'පටිසල්ලානරාමා භික්ඛවෙ විහරථ පටිසල්ලානරතා' යනුවෙන් කයින් හුදකලා බවක යම් යෙදීමක් වේද එය පිරිසිදු සිල් ඇත්තාටය. සිල් නැත්තාට නොවේ. අපිරිසිදු සිල් ඇත්තාට හෝ නොවේ. රූපාරම්මණාදියෙන් ඔහුගේ සිත ඉවතට පෙරළා දැමීමක් නැති හෙයිනි.

අර්ථ වශයෙන් සීල විසුද්ධිය දක්වන ලදැයි යන මේ අර්ථය කියන ලද්දේමය. 'අජ්ඣත්තං චෙතො සමථමනුයුත්තා අනිරාකතජ්ඣානා' යන පද දෙකෙන් සමාධි භාවනාව ද 'විපස්සනාය සමන්නාගතා' යන මෙයින් ප්‍රඥා භාවනාවෙහි යෙදීමදැයි ලෞකික ත්‍රිශික්ෂාව දක්වන ලදී. දැන් ඒවායෙහි පිහිටියහුට අවශ්‍යයෙන්ම (ඒකාන්තයෙන් ම) ඇතිවන ඵලය දක්වන්නට 'පටිසල්ලානරාමානං' යනාදිය කියන ලදී.

එහි බ්‍රෑහෙතානං යනු වඩන්නවුන්ට. ද්වින්නං ඵලානං යනු තෙවන සිවුවන ඵල අතුරෙන්. පාටිකංඛං යනු කැමතිවිය යුතුය. ඒකාන්තයෙන් ම සිදුවන්නා වූ. අඤ්ඤා යනු අර්හත්වයයි. එය වනාහි පහළ මාර්ග ඥානවලින් දැනගන්නා ලද සීමාව 'නො ඉක්මවා'* දැනගැනීම් වශයෙන් ද සම්පූර්ණ දැනීම ඇති බැවින් මත්තෙහි දැනීම් කටයුත්තක් නැති බැවින් ද 'අඤ්ඤා'යි කියනු ලැබේ. සති වා උපාදිසෙසෙ කෙලෙස් උපාදි ඉතිරිව ඇතිකල්හි, පහකිරීමට නොහැකි කල්හි මේරූ ඥාණයෙන් දුරුකළයුතු යම් ක්ලේශයක් ඇත්නම් ඒවා නොමේරූ ඥාණය ඇතිකල්හි දුරු නොවෙයි. ඒ සඳහා 'සති වා උපාදිසෙසෙ'යි කීහ. කෙලෙස් ඇතිකල්හි ස්කන්ධ අභිසංඛාරයෝ සිටිත්මය. මෙසේ මේ සූත්‍රයෙහි අනාගාමි ඵලය අර්හත්වය යන ධර්ම දෙක දක්වන ලදී. මෙහි යම්සේ ද මෙයින් මතු සූත්‍ර දෙකෙහි ද එසේමය.

ගාථාවන්හි යෙ සන්තචිත්තා යනු යම් යෝගාවචර කෙනෙක් තදංග වශයෙන් ද විෂ්කම්භන වශයෙන් ද සන්සිඳුන කෙලෙස් ඇති බැවින් ශාන්ත වූ සිත් ඇත්තාහු. ප්‍රඥාවට නෙපක්ක යයි කියනු ලැබේ. එයින් යුක්ත වූ බැවින් නිපකා නම් වෙති. මෙයින් ඔවුන්ගේ කමටහන පරිහරණය කරන ඥාණය දක්වයි. සතිමන්තො ච ඣායිනො යනු සිටීම් හිඳීම් ආදියෙහිදී කමටහන දුරු නොකිරීමට හේතු වූ සිහියෙන් සිහි ඇත්තාහු. ආරම්මණ උපනිධ්‍යානයෙන් ද ලක්ෂණ උපනිධ්‍යානයෙන් ද ධ්‍යාන කරන්නාහු. සම්මා ධම්මං විපස්සන්ති කාමෙසු අනපෙක්ඛිනො යනු කලින්ම කාමයෝ ඇටසැකිල්ලකට උපමා ඇත්තාහු ආදී වශයෙන් වස්තු කාමයන්හි ද ක්ලේශ කාමයන්හි ද ආදීනව විමසා බැලීමෙන් බලාපොරොත්තු

---

* අට්ඨකථාවෙහි ඇති අනතික්කමිත්‍වා යන්නට නො ඉක්මවා යන අර්ථය මෙහි ලියා ඇත. එහෙත් අතික්කමිත්‍වා යනුවෙන් ගෙන ඉක්මවා යන අර්ථය යෙදීම වඩා සුදුසුයයි හැඟේ. (134 පිට 35 පේළිය)

නැත්තාහු ප්‍රයෝජනයක් නැත්තාහු ඒ කාමයන් දුරුකොට ලබන ලද උපචාර සමාධිය හෝ අර්පණා සමාධිය පාදක කොට නාමරූප ද නාමරූපයේ ප්‍රත්‍යයන් ද විමසා කලාප සිහිකිරීම් ආදී ක්‍රමයෙන් මනාකොට නොවෙනස් ලෙස පංචස්කන්ධ ධර්මයන් අනිත්‍යාදී වශයෙන් විදර්ශනා කරත්.

**අප්පමාදරතා** යනු කියන ලද ආකාර ඇති සමථ විදර්ශනා භාවනාවෙහි පමා නොවෙමින් ඇලුණාහු එහි අප්‍රමාදයෙන් ම දිවා රාත්‍රී කල් ගෙවන්නාහු. **සන්තා** යනු සමාන (අප්පමාදරතා සන්තා = අප්‍රමාදයෙහි ඇලුණාහු) 'සත්තා' යනු ද පාඨයකි. පුද්ගලයා යන අර්ථයි. **පමාදෙ භය දස්සිනො** නිරයෙහි උපදවන (නිරයෙහි ඉපදීම ආදියට හේතුවන) ප්‍රමාදයෙහි බිය දක්නාහු. **අභබ්බා පරිහානාය** යනු ඔවුහු මෙබඳු සමථ විදර්ශනා ධර්මවලින් හෝ මාර්ගඵලවලින් හෝ පිරිහීමට නුසුදුසු වෙති. සමථ විදර්ශනා වශයෙන් පැමිණි දෙයින් නො පිරිහෙත්. නො පැමිණි අන් ඒවාට ද පැමිණෙත්. **නිබ්බාණස්සෙව සන්තිකෙ** යනු නිවනේ ද අනුපාදා පරිනිර්වාණයේ ද සමීපයෙහිම ය. නොබෝ කලකින් ම එය අවබෝධ කරන්නාහුය.

අටවන සූත්‍රයයි.

## 2.2.9

නවවන සූත්‍රයෙහි **සික්ඛානිසංසා** යන මෙහි හික්මිය යුතු හෙයින් සික්ඛා නම් වේ. අධිසීල සික්ඛා, අධිචිත්ත සික්ඛා, අධිපඤ්ඤා සික්ඛා යනුවෙන් එය තුන්ආකාර වෙයි. ඒ ශික්ෂා ආනිශංස ද තුන් ආකාරය. ශික්ෂාවන්ට අයත් (ශික්ෂාවන් නිසා ලැබෙන) ලාභ-සත්කාර-කීර්ති යනු ශික්ෂා ආනිශංස නොවේ. **විහරථ** යනු ශික්ෂා ආනිශංස ඇත්තෝ වී වාසය කරව්. ශික්ෂා තුනෙහි අනුසස් දකින්නාහු වී ඒ ශික්ෂාවලින් ලැබිය යුතු

අනුසස්ම දකිමින් වාසය කරව් යන අර්ථයි. **පඤ්ඤුත්තරා** යනු ඒ ශික්ෂා අතරින් අධි ප්‍රඥා ශික්ෂා නම් වූ යම් ප්‍රඥාවක් වේද ඒ ප්‍රඥාව ඒ ශික්ෂා අතරින් උසස්ය, ප්‍රධානය, විශිෂ්ටය යන අරුතින් පඤ්ඤුත්තරා නම් වේ. යම්කෙනෙක් ශික්ෂා ආනිශංස ඇත්තාහු වාසය කරත් ද ඔවුහු ප්‍රඥාව උතුම්කොට ඇත්තෝ වෙති. **විමුත්ති සාරා** යනු අර්හත්ඵල නම් වූ විමුක්තිය ඒවායේ සාරය හෙයින් විමුත්තිසාර නම් වේ. කියන ලද ආකාර ඇති විමුක්තියම සාර වශයෙන් ගෙන සිටියාහු යන අර්ථයි. යම් කෙනෙක් ප්‍රඥාව උතුම්කොට ඇති ශික්ෂානිශංසය ඇත්තෝ වෙත් ද ඔවුහු භව විශේෂයක් නො පතති. එහෙත් විභවය කැමැත්තාහු විමුක්තියම සාර වශයෙන් ප්‍රාර්ථනා කරති.

**සතාධිපතෙය්‍යා** යනු ප්‍රධාන බව ඇතිකරන අර්ථයෙන් සතිය මේවා අතරෙන් අධිපතිය යන අරුතින් සතාධිපතෙය්‍යා නම් වේ. අධිපති යන වචනය ම අධිපතෙය්‍ය යනුවෙන් සිදුකොට සතර සතිපට්ඨානයන්හි පිහිටි සිත් ඇත්තාහු කායානුපස්සනාදිය මුල්කොට ගැනීමෙන් සමථ විදර්ශනා භාවනාවන්හි යෙදුණාහු යන අර්ථයි. නොහොත් 'සික්ඛානිසංසා' යනු මහණෙනි, මෙබඳු දුර්ලභ මොහොතක් ලැබුණු කල්හි ත්‍රිවිධ ශික්ෂාවෙහි හික්මීමම ආනිශංස කොට වාසය කරව්. මෙසේ වාසය කරමින් ද ප්‍රඥාවට උතුම් වූ ලෝකෝත්තර ප්‍රඥාවෙන් යුක්ත වී වාසය කරව්. මේ ආකාරයෙන් ද යුක්තව විමුක්තිය සාරකොට නිවන සාරකොට අනිකක් සරුකොට නොගෙන වාසය කරව්. සිහිය අධිපතිකොට වාසය කරව් යන යමක් ඇද්ද එසේ වීමට මේ උපායයි. සතිපට්ඨාන භාවනාවෙහි යෙදුණාහු වව්. හැමතන්හි ම සිහිය ආරක්ෂා කරන සිතින් වාසය කරව් යනුවෙන් මෙසේ මෙහි අර්ථය දතයුතුය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ ත්‍රිශික්ෂාවෙහි භික්ෂූන් යොදවමින් යම්සේ ඒ ශික්ෂා හික්මිය යුතු ද යම් අයුරකින් සම්පූර්ණ බවට යයි ද එය කෙටියෙන් දක්වා දැන් අනුශාසනා පරිදි පිළිපදින අයගේ ප්‍රතිඵල විශේෂය දැක්වීමෙන් ඒ ප්‍රතිපත්තියේ නොහිස් බව දක්වමින් 'සික්ඛානිසංසානං' යනාදිය වදාළහ. එය කියන ලද අර්ථ ඇත්තේමය.

ගාථාවන්හි - **පරිපුණ්ණසික්ඛං** යනු අග්‍රඵලය (රහත් ඵලය) පිණිස වන පිරිසිදු (පිරිපුන්) ශික්ෂාව, අසේඛ යන අර්ථයි. **අපහාණ ධම්මං** යන මෙහි කුප්ප වන විමුත්ති (වෙනස්විය හැකි විමුත්ති)වලට පහාණධම්ම යයි කියනු ලැබේ. පහාණධම්ම යනු පිරිහෙන ධර්මය, වෙනස්වන ධර්මය,

පහාණධම්ම නොවන්නේ අපහාණ ධම්මය, අකුප්පධම්මය, 'අප්පහාණ ධම්මෝ' යනු ද පාළියයි. ඒ අර්ථයමයි. ක්‍ෂයවීමම අන්ත වූයේ = ඛයනෙතා නම් වේ. ජාතියේ ක්‍ෂය වීම = ජාති ඛයනෙතා නම් වේ. නිවන ය. ක්‍ෂයවීම හෝ මරණය, ජාතිය ක්‍ෂයවීම නිවනමය. ඒ නිවන දක්නා ලද බැවින් **ජාතිඛයන්තදස්සී** ය.

**තස්මා** යනු යම්හෙයකින් ශික්‍ෂාව සම්පූර්ණ කිරීමේ අවසාන ආනිශංසය මේ ජරාවේ කෙළවරවීම වේද එහෙයින්. **සදා** යනු හැමකල්හි. **ඣානරතා** යනු ලක්‍ෂණ උපනිධ්‍යානය, ආරම්මණ උපනිධ්‍යානය යන දෙයාකාර ධ්‍යානයෙහි ඇලුණාහු. එහෙයින් ම සන්සුන් වූවාහු. **මාරසෙනං අභිභුය්‍ය** යනු කෙලෙස් සේනාවෙන් ද අනන්ත (අනර්ථ) සේනාවෙන් ද සේනාසහිත වූ සතරාකාර වූ ම මාරයා ඉතිරි නැතිව ම මැඩපවත්වා, ගුණ විනාශ කිරීමෙහිදී සහායක බවට පැමිණෙන බැවින් දේවපුත්ත මාරයාට ද කෙලෙස් සේනාව යයි කියනු ලැබේ. එසේම අනන්ත වූ රෝගාදිය මෘත්‍යුමාරයාගේ සේනාව යයි කියනු ලැබේ. එය කී අයුරු මෙසේය.

**කාමා තෙ පඨමා සෙනා දුතියා අරති වුච්චති**
**තතියා ඛුප්පිපාසා තෙ චතුත්ථී තණ්හා පවුච්චති**

(මාරය) ක්ලේශකාමයෝ ඔබගේ පළමු සේනාවය. අධිකුශල ධර්මයන්හි අරතිය (නොඇල්ම) දෙවන සේනාව යයි කියනු ලැබේ. කුසගින්න හා පිපාසය යන දෙක ඔබේ තුනවන සේනාවය. සොයන (පරියේසන) තණ්හාව ඔබේ සතරවන සේනාවයයි කියනු ලැබේ.

**පඤ්චමී ථීනමිද්ධං තෙ ඡට්ඨා භීරූ පවුච්චති**
**සත්තමී විචිකිච්ඡා තෙ මක්ඛො ථම්භො ච අට්ඨමො**

ඔබේ පස්වන සේනාව ථීනමිද්ධය යි, බිය හයවන සේනාවයයි කියනු ලැබේ. ඔබගේ සත්වන සේනාව විචිකිච්ඡාව ය. ගුණමකු බව හා තද බව ඔබගේ අටවන සේනාවයි.

**ලාභො සිලොකො සක්කාරො මිච්ඡාලද්ධො ච යො යසො**
**යො චත්තානං සමුක්කංසෙ පරෙච අවජානති**

ලාභය, ප්‍රශංසාවය, සත්කාරය, වැරදි ලෙස ලබන ලද යශසක් වේද (එය නවවැන්නය) යමෙක් තමා උසස්කොට දක්වයි නම් අනුන් පහත්කොට දක්වයි නම් (එය දසවැන්නය.)

**එසා නමුචි තෙ සෙනා කණ්හස්සාභිප්පහාරිනී**
**න නං අසූරො ජිනාති ජෙත්වා ච ලභතෙ සුඛං**[1]

මාරය, (මහණ බමුණන්ට) අනතුරුදායක වූ ඒ සේනා පාපී වූ ඔබගේය. ශූර නොවූ පුරුෂයා ඒ සේනාව නො දිනයි. (යලිත්) මාරසේනා ජයගෙන (මාර්ග-ඵල නම් වූ) සුවයට පැමිණෙයි.

මෙසේ ද කීහ.

**අජ්ජෙව කිච්චමාතප්පං කො ජඤ්ඤා මරණං සුවෙ**
**න හි නො සංගරං තෙන මහා සේනෙන මච්චුනා**[2]

අදම වීර්යය කළයුතුය. හෙට මරණය සිදුවේ යයි කවරෙක් දනීද? ඒ මහාසේනා ඇති මාරයා සමග අල්ලස් දීම් වශයෙන් අපගේ මිත්‍රත්වයක් නැත.

භවථ ජාතිමරණස්ස පාරගා යනු ඉපදීමේ ද මරණයේ ද පරතෙරට යන්නෝ නිවනට යන්නෝ වව්.

**නවවන සූත්‍රයයි.**

---

1. සුත්තනිපාත පාළි - පධාන සුත්ත
2. ම.නි. - උ.ප - භද්දේකරත්ත සුත්ත

# 2.2.10

දසවන සූත්‍රයෙහි **ජාගරෝ** යනු නො නිදා සිටින්නෙක්, පහවූ නිදි ඇත්තෙක්, නො නිදීමෙහි යෙදුනෙක්, දිවා රෑ කමටහන් මෙනෙහි කිරීමෙහි යෙදුණු කෙනෙක් යන අර්ථයි.

'කථඤ්ච භික්ඛවෙ භික්ඛු පුබ්බරත්තාපරරත්තං ජාගරියානුයොග මනුයුත්තො හොති? ඉධ භික්ඛු දිවසං චංකමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති, රත්තියා පඨමං යාමං චංකමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති, රත්තියා මජ්ඣිමං යාමං දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙති පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨාන සඤ්ඤං මනසිකරිත්වා, රත්තියා පච්ඡිමං යාමං පච්චුට්ඨාය චංකමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති, එවං භික්ඛු පුබ්බරත්තාපරරත්තං ජාගරියානුයොග මනුයුත්තො හොති'[1]

'මහණෙනි, භික්ෂුව දිවා රෑ දෙක්හි නිදිවැරීමෙහි යෙදුණු කෙනෙක් වන්නේ කෙසේද?

මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව දිවාකාලයෙහි සක්මන් කිරීමෙන් හා හිඳීමෙන් ද නීවරණ ධර්මවලින් සිත පිරිසිදු කරයි.

රාත්‍රියෙහි පළමුවන යාමයෙහි සක්මන් කිරීමෙන් ද හිඳීමෙන් ද නීවරණ ධර්මවලින් සිත පිරිසිදු කරයි.

රාත්‍රියෙහි මධ්‍යම යාමයෙහි දකුණු ඇලයට හැරීමෙන් දකුණු පය මත වම් පය මදක් ඈත්කොට තබා සිහි නුවණින් යුක්ත වූයේ අවදිවන හැඟීම මෙනෙහි කොට (සිතේ තබා) සිංහ සෙය්‍යාවෙන් නිදයි.

රාත්‍රියෙහි පශ්චිම (අවසන්) යාමයෙහි නැගිට සක්මන් කිරීමෙන් ද හිඳීමෙන් ද නීවරණ ධර්මවලින් සිත පිරිසිදු කරයි.

---

1. විභංගප්පකරණ-ඣාන විභංග - බු.ජ.මු. 2 භා - 42 පිට

මෙසේ භික්ෂුව දිවා රෑ දෙක්හි නිදිවැරීමෙහි යෙදුණු කෙනෙක් වෙයි' යනුවෙන් මේ කාරණය දේශනා කරන ලදී.

'ච' ශබ්දය එක්කිරීම් අර්ථ ඇත්තේය. ඒ 'ච' ශබ්දයෙන් කියන්නා වූ සති ආදී ස්වභාවයන් සම්පිණ්ඩනය (එක් කිරීම) කරයි.

අස්සා යනු (සියා) වන්නේ ය යන අර්ථයි. 'ජාගරො ච භික්ඛු විහරෙය්‍ය' යනුවෙන් ද කියති. හැමතන්හි ද හැමදාම ද කමටහන දුරු නොකිරීම් වශයෙන් සිහියෙන් වෙන්නොවී වාසය කිරීමෙන් **සතො** සිහි ඇත්තෙක් වන්නේය. **සම්පජානො** යනු (අභික්කන්තෙ පටික්කන්තේ යනාදී වශයෙන්) සත්තැනක පිහිටියා වූ ද (කායානුපස්සනා සතිපට්ඨානාදී වශයෙන්) සතර තැනක පිහිටියා වූ ද නුවණින් යුක්ත වීම් වශයෙන් නුවණින් යුක්ත වන්නේය. **සමාහිතො** යනු උපචාර සමාධියෙන් ද අර්පණා සමාධියෙන් ද සමාහිත වූවෙක් එකඟ වූ සිත් ඇත්තෙක් වන්නේය. **මුදිතො** යනු ප්‍රතිපත්තියේ අනුසස් දැකීමෙන් මතුමත්තෙහි ඇති විශේෂයන් අවබෝධ කිරීමෙන් වීර්ය ආරම්භයට ද නො හිස් බව දැකීමෙන් ද සතුටු වූවෙක් ප්‍රමෝදය බහුල වූවෙක් වන්නේය. **විප්පසන්නො** යනු එහෙයින්ම ප්‍රතිපත්ති වූ ශික්ෂාවන්හි ද ප්‍රතිපත්තිය දේශනා කරන්නා වූ ශාස්තෲන් වහන්සේ කෙරෙහි ද ශ්‍රද්ධාව බහුල බැවින් හොඳින් ප්‍රසන්න වූවෙක් වන්නේය. හැමතන්හි අස්සා = වන්නේය යන්න හෝ විහරෙය්‍ය = වාසය කරන්නේය යන්න සම්බන්ධ වෙයි.

**තත්‍ථ කාලවිපස්සී ච කුසලෙසු ධම්මෙසු** යනු එකල්හි විදර්ශනා වඩන්නෙක් වන්නේය. එහි එනම් කර්මස්ථානයෙහි යෙදීමෙහි කාලවිපස්සී කෙනෙක් කාලයට අනුරූපව විදර්ශනා කරන්නෙක් වන්නේය. කුමක් කියන ලද්දේ ද? විදර්ශනාව පටන්ගෙන කලාප සිහිකිරීම් ආදී වශයෙන් සිහිකරන්නේ ආවාස ආදී අසප්පාය හත දුරුකොට සප්පාය (සුදුසු දේ) ඇසුරු කරමින් අතරතුර අවසානයකට නොපැමිණ වීර්ය වඩන්නේ සිතේ එකඟ ආකාරය සලකමින් සකස්කොට නිරතුරුව අනිත්‍ය අනුපස්සනාදිය පවත්වන්නෙක් වන්නේය. යම්කලෙක විදර්ශනා සිත හැකිළුණේ වෙයිද එකල්හි ධම්මවිචය - විරිය - පීති නම් වූ ද යම්කලෙක සිත විසිරුණේද එකල්හි පස්සද්ධි - සමාධි - උපෙක්ඛා නම් වූ ද කුශල වූ නිවැරදි වූ බොජ්ඣංග ධර්ම කෙරෙහිදැයි මෙසේ ඒ ධර්ම කෙරෙහි

ඒ කාලයෙහි ඒ කර්මස්ථානයෙහි යෙදෙන කල්හි හෝ කාලයට අනුරූප වූ විදර්ශකයෙක් වන්නේය.

සතිසම්බොජ්ඣංගය වනාහි හැමතන්හි ම කැමතිවිය යුතුය. **'සතිඤ්ච ඛවාහං භික්ඛවෙ සබ්බත්ථිකං වදාමි'** යනුවෙන් ඒ කාරණය දේශිතය. මෙපමණකින් පුද්ගලයා මුල්කොටගත් දේශනාවෙන් නිදිවැරීම දක්වා යම් ධර්මයන් නිසා ජාගරියානුයෝගය සම්පූර්ණ වේ නම් ඒ ධර්ම වදාළහ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ ඇරඹූ විදර්ශනාව ඇති භික්ෂුවට කෙටියෙන් ම උපකාරක ධර්මයන් සමග සිහිකරන ධ්‍යාන (සම්මසනජ්ඣානං) (සම්මසනවාරං = සිහිකරන වාර හෝ) දක්වා දැන් එසේ පිළිපදින තැනැත්තාට ප්‍රතිපත්තියේ වඳ නැති බව දක්වමින් **ජාගරස්ස භික්ඛවෙ භික්ඛුනො** යනාදිය වදාළහ. ඒ ජාගරියානු යෝගයෙහි සිහි නුවණ සමාදානය සියලු අර්ථය ඇතිකරන සතුට හා ප්‍රසාදය (ශ්‍රද්ධාව) ගෙන දෙන්නේය (උපදවන්නේය). එහි කාල විපස්සනාව නම් විදර්ශනාවේ ගැබ් ගැනීමයි. මුහුකුරා යාමයි. උපක්ලේශවලින් මිදුණු වීර්යට පිළිපන්විදර්ශනා ඥානයෙහි තියුණු වූ ශූර වූ විදසුන් නුවණ උසුලන්නා වූ කල්හි යෝගියාට උසස් වූ සතුට ද ප්‍රසාදය ද ඇතිවෙයි. ඒවා ද විශේෂ අවබෝධය ලබන්නාගේ සමීපයෙහිම වෙයි. ඒ කාරණය

**යතො යතො සම්මසති ඛන්ධානං උදයබ්බයං**
**ලභතෙ පීති පාමොජ්ජං අමතං තං විජානතං**

**පාමොජ්ජ බහුලො භික්ඛු පසන්නො බුද්ධසාසනෙ**
**අධිගච්ඡෙ පදං සන්තං සංඛාරූපසමං සුඛං**

'යම් යම් කලෙක පංචස්කන්ධයන්ගේ ඇතිවීමද නැතිවීමද සලකා බලයි ද එකල්හි ධර්මය නිසා ප්‍රීතියද ප්‍රමෝදය (සතුට) ද ලබයි. එය නුවණැති අයට අමෘතයයි.'

(ස්වභාවයෙන් ම බුදුරජාණන් වහන්සේ කෙරෙහි) සතුට බහුල වූ බුදු සසුනෙහි පැහැදුණු භික්ෂුව සංස්කාරයන්ගේ සන්සිඳීම වන සැප වූ ශාන්ත පදයට (නිවනට) පැමිණෙන්නේය'යි කියන ලදී.

ගාථාවන්හි - **ජාගරන්තා සුණාථෙතං** යනු ඒ මගේ වචනය ඒකාන්තයෙන් ම ප්‍රමාද නින්දෙන් අවිද්‍යා නින්දෙන් අවදිවීම පිණිසය. නිදිවැරීමෙහි යෙදුනා වූ ඔබලා සිහිනුවණ ආදී ධර්ම සමග යෙදීමෙන් නිදිවැරීමෙහි යෙදුනාහු අසව්. **යෙ සුත්තා තෙ පබුජ්ඣථ** යනු යමෙක් කියන ලද ආකාර ඇති නින්දෙන් නිදි ගත්තාහු ද නින්දට ගිය ඒ ඔබලා නිදි වැරීමෙහි යෙදීම් වශයෙන් ඉන්ද්‍රිය-බල-බොජ්ඣංගයන් එක්කොට විදර්ශනාවට උත්සාහ ඇතිකරවමින් අප්‍රමාද ප්‍රතිපත්තිය වූ එයින් අවදිවව්. නොහොත් 'ජාගරන්තා' යනු ජාගර නිමිත්තය (නිදිවැරීමෙහි කාරණයයි) 'සුණාථෙතං' යන මෙහි 'එතං' යනු කියන ලද වචනයයි. ඒ වචනය කුමක්දැයි කීහ. 'යෙ සුත්තා තෙ පබුජ්ඣථ' යනාදියයි. එහි **යෙ සුත්තා** යනු යමෙක් කෙලෙස් නින්දෙන් නිදිගත්තාහුද ඒ ඔබලා ආර්ය මාර්ගය අවබෝධයෙන් අවදි වව්. **සුත්තා ජාගරිතං සෙය්‍යො** යනු අවදිවීමට මේ හේතුවන වචනයයි. යම්හෙයකින් කියන ලද ආකාර ඇති නින්දට වඩා කියන ලද ආකාර ඇති නිදිවැරීම ප්‍රයෝජන කැමති කුලපුත්‍රයාට ශ්‍රේෂ්ඨය. වඩා පැසසිය යුත්තකි, හිතසැප ගෙන දෙන්නේය. එහෙයින් අවදි වව්. **නත්ථි ජාගරතො භයං** යනු මේ එහි අනුසස් දැක්වීමයි. යම් පුද්ගලයෙක් ශ්‍රද්ධාදී නිදිවැරීමට හේතුවන (ජාගරණ) ධර්මවලින් යුක්තව නිදිවැරීම පෝෂණය කරයි ද පමා නින්දට නො එළඹෙයි ද ඔහුට අත්තානුවාද භය, පරානුවාද භය, දණ්ඩභය, දුග්ගති භය, ජාති ආදී නිමිති, සියලුම සසර භය නැත.

කාලෙන යනු ආවාස සප්පාය ආදිය ලබන ලද කාලයෙහි. **සො** යනු නිපාත මාත්‍රයකි. **සම්මා ධම්මං පරිවීමංසමානො** යනු විදර්ශනාවට අරමුණු වූ ත්‍රෛභූමික (කාම-රූප-අරූප යන භූමි තුනට අයත්) ධර්ම, මනාකොට න්‍යායයෙන් යම්සේ කලකිරීම්, නොඇලීම් ආදිය හටගනී ද එසේ හාත්පසින් විමසන්නේ, සියලු ආකාරයෙන් විදර්ශනා කරන්නා වූ යන අර්ථයි. **එකොදි භූතො** යනු තනිව, ශ්‍රේෂ්ඨව උදාවෙයි යන ඇරතින් එකොදි නම්, සමාධියයි. ඒ සමාධිය මොහුට වූයේ, උපන්නේ යන අරුතින් එකොදිභූතො නම්. ගින්න දල්වන ලදී (අග්ගිආහිත) ආදී ශබ්දයන්ට මෙන් මෙහි භූත ශබ්දයට අනිත් වචනයක් (යෙදීම) දතයුතුය. සමාධිය හටගත්තේ (සමාධියට) පත්වූයේ යන අරුතින් එකොදිභූතො වෙයි. මෙහිදී එකොදි යනුවෙන් මාර්ග සමාධිය අදහස් කරන ලදී. 'සමාහිතො' යන මෙහි පාදක ධ්‍යාන සමාධිය සමග විපස්සනා සමාධිය ප්‍රකාශිත ය. නොහොත් 'කාලෙන' යනු මාර්ගය අවබෝධ කරන කාලයෙහි.

'සම්මා ධම්මං පරිවීමංසමානො' යනු මනාසේම චතුස්සත්‍ය ධර්මය පරිඤ්ඤා අභිසමය වශයෙන් මනාකොට (චතුස්සත්‍ය ධර්මය) විමසමින්, එක අවබෝධයකින් අවබෝධ කරමින්. 'එකොදි භූතො' යනු තනිවී හෝ ශ්‍රේෂ්ඨ වී හෝ අසහායව හෝ උදාවෙයි යන අරුතින් එකොදි නම් වේ. චතුකිච්ච සාධක (කටයුතු හතරක් සිදුකරන) සම්‍යක්ප්‍රධානය (වීර්යය)යි. ඒ වීර්යය හටගත්තේය, උපන්නේය යන සියල්ල මුල් කරුණට සමාන වේමය. **විහනෙ තමං සො** මෙසේ වූ ඒ ආර්ය ශ්‍රාවකයා අර්හත් මාර්ගයෙන් අවිද්‍යා අන්ධකාරය ඉතිරි නැතිවම නසන්නේය. සහමුලින් විනාශ කරන්නේය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ ප්‍රතිපත්තියේ නො සිස් බව දක්වා දැන් එහි දැඩිව යොදවමින් 'තසමා භවෙ' යන අවසන් ගාථාව වදාළහ.

එහි **තසමා** යනු යම්හෙයකින් නිදිවැරීමෙන් යුක්ත තැනැත්තාගේ සිහියෙන් තොර නොවීම් ආදී වශයෙන් සමථ විපස්සනා භාවනාව සම්පූර්ණ බවට යයි, අනුක්‍රමයෙන් ආර්ය මාර්ගය පහළ වෙයි. එහෙයින් ඔහුට සියලු සසර බිය නැත. එහෙයින් **භවෙ** යනු ඒකාන්තයෙන් හෝ දැඩිව. **භජෙථ** යනු ඇසුරු කරන්නේය. මෙසේ නිදිවැරීම ඇසුරුකරන කෙලෙස් තවන වීර්ය ඇති බව ආදී ගුණවලින් යුතු භික්‍ෂුව සංයෝජන බිඳ අග්‍රඵල ඥානය නම් වූ **අනුත්තරං** ඊට වඩා උසස් දෙයක් නැති **සමෙබාධිං ඵුසෙ** සම්බෝධිය හෙවත් අර්හත්ඵලයට පැමිණෙන්නේය. සෙස්ස කියන ලද පරිදිමය.

**දසවන සූත්‍රයයි.**

# 2.2.11

එකොළොස්වන සූත්‍රයෙහි **ආපායිකා** යනු අපායෙහි උපදින්නාහුය යන අරුතින් ආපායිකා නම් වේ. එහි ම නිරයෙහි උපදින්නාහුය යන අරුතින් **නෙරයිකා** නම් වේ. **ඉදමපපභාය** දැන් මේ කියන්නා වූ දෙයාකාර

පාපයෙහි හැසිරීම අත්නොහැර, එසේ පිළිපැදීම් වශයෙන් එසේ උත්සාහ කිරීම් වශයෙන් පැවති වචනය ද සිත ද දෘෂ්ටිය ද අත්නොහැර යන අර්ථයි. **අබ්‍රහමචාරී** යනු උතුම් ලෙස ශ්‍රේෂ්ඨ ලෙස හැසිරෙයි යන අරුතින් බ්‍රහ්මචාරී වෙයි. උතුම් වූ ශ්‍රේෂ්ඨ වූ ආචාරය මොහුට ඇත්තේය යන අරුතින් බ්‍රහ්මචාරී වෙයි. බ්‍රහ්මචාරී නොවන්නේ අබ්‍රහ්මචාරීය. බ්‍රහ්මචාරියකු ලෙස හැසිරෙන දුස්සීලයා ය යන අර්ථයි. **බ්‍රහමචාරී පටිඤ්ඤා** යනු මම බ්‍රහ්මචාරියෙක් වෙමි යි ප්‍රතිඥා ඇත්තා වූ (කියන්නා වූ), **පරිපුණ්ණං** යනු කැඩීම් ආදියක් නැති බැවින් අඩු නොවූ **පරිසුද්ධං** යනු උපක්ලේශ නැති බැවින් පිරිසිදු වූ. **අමූලකෙන** යනු දැකීම් ආදී මුල් නැති, දක්නා ලද, අසන ලද, සැක කරන ලද යන මේ චෝදනා මුල්වලින් තොර. **අබ්‍රහමචරියෙන** යනු උතුම් නොවූ හැසිරීමෙන්. **අනුද්ධංසෙති** යනු මොහු පිරිසිදුයයි දනිමින් ම පාරජිකාවට හේතුවන කාරණයකින් පහරදෙයි හෝ චෝදනා කරයි හෝ ආක්‍රෝශ කරයි හෝ.

ගාථාවන්හි - **අභූතවාදී** යනු අනිකෙකුගේ දෝසයක් නොදැකම ඇති නොවූ කරුණකින් හිස් කරුණකින් බොරුවට අනිකෙකුට බොරු චෝදනා කරන තැනැත්තා. **කත්වා** යනු යමෙක් වනාහි පව්කමක් කොට මම එය නොකළෙමියි **කියයි. උභො පි තෙ පෙච්ච සමා භවන්ති** යනු ඒ දෙදෙනාම මෙලොවින් පරලොවට ගොස් නිරයට එළඹීම් වශයෙන් ගතියෙන් (උපතින්) සමාන වෙති. එහි උපත ම ඔවුන්ගේ සීමාවයි. ආයුෂය නොවේ. බොහෝ පව්කොට බොහෝකලක් පැසෙයි. පව් ස්වල්පයක් සිදුකොට ස්වල්ප කාලයක් ම පැසෙයි. යම්හෙයකින් ඔවුන් දෙදෙනාගේ ම කර්මය ලාමකම වේද එහෙයින් **නිහීන කම්මා මනුජා පරත්ථ** යි දේශනා කරන ලදී. 'පරත්ථ' යන පදයට පරව (පසුව) පෙච්ච යන පදය සම්බන්ධ වේ. පරලොවදී මෙයින් මියගොස් ඒ පහත් කර්ම ඇති අය සමාන වෙති. මෙසේ භාග්‍යවතුන් වහන්සේ බොරුවෙන් චෝදනා කිරීම් වශයෙන්ද ඇති දොස් වැසීම් වශයෙන් ද පැවති බොරුවේ විපාක දක්වා දැන් එතැන හුන්නා වූ බොහෝ පාප භික්ෂූන්ගේ දුශ්චරිත කර්මයට විපාක දැක්වීම් වශයෙන් සංවේගය ඇතිකිරීම පිණිස ගාථා දෙකක් වදාළහ.

එහි **කාසාවකණ්ඨා** යනු පඬු පොවන ලද කහවතින් වෙළන ලද බෙල්ල ඇති (උරහිසෙහි දැමූ කහවත ඇති) **පාපධම්මා** යන ලාමක

ධර්ම. **අසඤ්ඤතා** යනු කායාදියෙන් සංවරයක් නැති. **පාපා** යනු එබඳු වූ පාප පුද්ගලයෝ. **පාපෙහි කම්මෙහි** පව්කම්වලින් උපත ලබා 'තස්ස කායොපි ආදිත්තො සම්පජ්ජලිතො සජොතිභූතො සංඝාටිපි ආදිත්තා' 'ඔහුගේ කයද ඇවිල ගත්තේය. ගිනි දැල්වුණේය. ගින්නෙන් බැබලුණේය. සංඝාටිය (දෙපට සිවුර) ද ඇවිල ගත්තේය ආදි වශයෙන් ලක්ඛන සංයුත්තයෙහි කියන ලද ක්‍රමයෙන් මහා දුක් අනුභව කරත්මය. තෙවන ගාථාවෙහි මේ කෙටි අර්ථය යි. **යඤ්චෙ භුඤ්ජෙය්‍ය දුස්සීලො** සිල් නැති පුද්ගලයා කායාදියෙන් **අසඤ්ඤතො** සංවර නැත්තේ රටවැසියන් විසින් සැදැහැයෙන් දෙන ලද යම් **රට්ඨපිණ්ඩං** ආහාරයක් මම ශ්‍රමණයෙක් වෙමියි ප්‍රතිඥා දෙන පුද්ගලයා ගෙන වළඳන්නේ නම්, එයට වඩා ගිනිගත් ගින්දර පැහැය ඇති යකඩ ගුලියක් අනුභව කරන ලද්දේ ම **සෙය්‍යො** වඩා යහපත්ය. කුමක් නිසාද? ඒ හේතුවෙන් එකම ආත්ම භාවයක් දැවෙන්නේය. දුශ්ශීලයෙක් වී සැදැහැයෙන් දෙන දෙය අනුභවකොට නොයෙක් සියගණන් ජාතිවලදී නිරයෙහි උපදින්නේය.

**එකොළොස්වන සූත්‍රයයි.**

# 2.2.12

දොළොස්වන සූත්‍රයෙහි - **දවීහි දිට්ඨිගතෙහි** යන මෙහි දිට්ඨි ම දිට්ඨිගත නම් වේ. 'ගූථගතං මුත්තගතං' යනාදියෙහි මෙනි. ගන්නා ලද ආකාරයෙන් හිස් බැවින් දෘෂ්ටීන්ට ගිය මාත්‍රය යන අරුතින් දිට්ඨිට්ඨාන දිට්ඨිගත නම් වේ. ඒ දෘෂ්ටීන්ගෙන්. **පරියුට්ඨිතා** යනු මඩිනා ලද හෝ පීඩාවන්ට පත් 'චොරා මග්ගෙ පරියුට්ඨිංසු' 'සොරු (අන්‍යයන්ට) බාධාකාරී ලෙස මාර්ගයෙහි නැගීසිටියහ. යනාදියෙහි මෙන් පරියුට්ඨාන ශබ්දය බාධා අර්ථයෙහි හෝ වෙයි. **දෙවා** යනු උත්පත්ති දෙවියෝය. ඔවුහු වනාහි උසස්ම කාම ගුණවලින් (කාම සම්පත්වලින්) ක්‍රීඩාකරත් (විනෝද වෙත්) ධ්‍යානාදියෙන් ද ක්‍රීඩා කරත් (සතුටු වෙත්) ඍද්ධි ආනුභාවයෙන් කැමති කැමති ප්‍රයෝග කරා යති ප්‍රයෝජන ලබති යන අරුතින් ද ඔවුහු

දෙවිවරු යයි කියනු ලැබෙති. මනසින් අධික වූ බැවින් මනුෂ්‍ය නම් වේ. (මනසා උස්සන්නත්තා = මනුස්සා) මෙය උසස් ලෙසින් දැක්වීම් වශයෙන් කියන ලදී. 'සත්ථා දෙවමනුස්සානං' යන්නෙහි මෙනි. **ඔලීයන්ති එකෙ** යනු 'සස්සතො අත්තා ච ලොකො ච' 'ආත්මය ද ලෝකය ද ශාස්වතයයි භවයන්හි (ඔලීයන අභිනිවෙස වූ) ඇලීම දැඩිව ගැනීම වූ ශාස්වත භාවයෙන් ඇතැම් දෙවියෝ ද ඇතැම් මිනිස්සු ද ඇලෙති, හැකිලීමට පැමිණෙති, එයින් නො මිදෙති.

**අතිධාවන්ති** යනු පරමාර්ථ වශයෙන් බිඳුණු ස්වභාව ඇති ස්වභාව ධර්මයන්ට ඵල ස්වභාවයෙන් සම්බන්ධ වන යම් මේ හේතුවක් වේද, එය නොගෙන නානත්ත න්‍යාය ගැනීමෙන් ඒ ඒ තැන්හිම දුවති. එහෙයින් ආත්මයත් ලෝකයත් සහමුලින් සිඳෙයි, මරණින් පසු ආත්මයත් ලෝකයත් නොවේයැයි උච්ඡේදයෙහි හෝ භව නිරෝධ ප්‍රතිපත්තියෙහි ප්‍රතික්ෂේප කරන ධර්මතාව අතිධාවනය කරත්. ඉක්මවා යති. **චක්ඛුමන්තො ච පස්සන්ති** 'ච' ශබ්දය අතිරේක අර්ථයෙහි ය. පූර්වයෝග සම්පත්තියෙන් නුවණ මුහුකුරා යාමෙන් ප්‍රඥාවෙන් ඇස් ඇත්තා වූ දෙව් මිනිස්සු ඒ නුවණැසින් ම ශාස්වත උච්ඡේද යන අන්ත දෙකට නොගොස් මධ්‍යම ප්‍රතිපත්තිය දැකීමෙන් ප්‍රත්‍යක්ෂ කරත්. ඔවුහු මේ නාමරූප මාත්‍රයක් ය. ප්‍රත්‍යයෙන් හටගත්තේය. එහෙයින් ශාස්වත ද නොවේ, උච්ඡේදයක් ද නොවේයයි නොවෙනස් අයුරින් දකිති. මෙසේ හැකිලීම් ආදී වශයෙන් දක්වන ලද පුද්ගලයන් මුල්කොටගෙන දක්වන්නට 'කථඤ්ච භික්ඛවෙ' යනාදිය කියන ලදී. එහි **භව** යනු කාම භවය, රූප භවය, අරූප භවයයි. වෙනත් භව තුනක්ද ඇත. සඤ්ඤීභවය, අසඤ්ඤීභවය, නේවසඤ්ඤී නාසඤ්ඤීභවයයි. තවත් භව තුනක් ඇත. ඒකවෝකාර භවය, චතුවෝකාර භවය, පංචවෝකාර භවයයි මේ භව කරණකොට ඇලෙති, සතුටුවෙති යන අරුතින් **භවාරාමා** නම්. භවයන්හි ඇලුණාහු විශේෂයෙන් ඇලුණාහු යන අරුතින් **භවාරතා** නම්. භවයන්හි හොඳින් සතුටට පත්වූවාහු යන අරුතින් **භව සම්මුදිතා** නම්. **භව නිරෝධාය** යනු ඒ භවයන්ගේ අතිශයින් නිරෝධය පිණිස නූපදීම පිණිස. **ධම්මෙ දෙසියමානෙ** යනු තථාගතයන් වහන්සේ දේශනා කළ නෛර්යානික (සසර දුකින් එතෙර කරවන) ධර්මය දෙසන කල්හි. **න පක්ඛන්දති** යනු ශාස්වතයට ඇලීසිටින බැවින් හැකිළුණු ස්වභාව ඇති බැවින් ඇතුල් නොවෙයි, බැස නොගනී. **න පසීදති** යනු ප්‍රසාදයට නොපැමිණෙයි, එය නො අදහයි. **න සන්තිට්ඨති** යනු ඒ දේශනාවෙහි නොසිටියි.

**නාධිමුච්චති** යනු නොපිහිටයි. මෙසේ ශාස්වතයට ඇලීසිටීම් වශයෙන් භවයන්හි හැකිළීමට යති. **අට්ටීයමානා** යනු භවයෙහි ජරා-රෝග, මරණාදිය ද වධ-බන්ධන-ඡේදන (මැරීම්, සිරකිරීම්, කැපීම්) ආදිය ද දැක එම කරුණුවලින් විද්‍යමාන වීමෙන් යුක්තවීමෙන්, **භවෙන** භවයෙන් පෙළනු ලබන්නාහු දුකට පත්කළාහු, **හරායමානා** යනු ලජ්ජා වන්නාහු **ජිගුච්ඡමානා** පිළිකුලෙන් ගෙනයන්නාහු (දැවෙන්නාහු). **විභවං** යනු උච්ඡේදය. **අභිනන්‍දන්ති** යනු තණ්හා දිට්ඨි අභිනන්දනවලින් එයට බැසගෙන සතුටු වෙත්.

**යතො ඛො කිර භො** යනාදිය ඔවුන්ගේ සතුටුවන ආකාරය දැක්වීමයි. එහි 'යතො' යනු යදා = යම්කලෙක 'භො' යනු ඇමතීමයි. **අයං අත්‍තා** යනු කාරක (කරන්නා) ආදී ස්වභාවයෙන් තමා විසින් පරිකල්පනය කරන (සිතන) ලද දෙය සඳහා කියයි. **උච්ඡිජ්ජති** යනු සිඳෙය. **විනස්සති** යනු නො පෙනේ. විනාශ භාවයට යයි. **න හොති පරම්මරණා** යනු මරණින් මතු නොවෙයි. **එතං සන්‍තං** යනු තමාගේ උච්ඡේදාදි වූ මෙය සියලු භවය සන්සිඳීම් වශයෙන් ද සියලු තැවීම් සන්සිඳීම් වශයෙන් ද ශාන්ත ය. ශාන්ත බැවින් ම **පණීතං** ප්‍රණීතය. එය නොවෙනස්වන ස්වභාවයෙන් **යාථාවං** වෙයි. එහි 'සන්‍තං, පණීතං' යන මේ දෙක තණ්හාභිනන්දනයට (තණ්හාවෙන් සතුටුවීමට) කියත්. 'යාථාවං' යන්න දිට්ඨි අභිනන්දනයට කියති. **එවං** යනු කියන ලද ආකාර ඇති උච්ඡේදයට බැසගැනීමෙන්. **භූතං** යනු ස්කන්ධ පංචකයයි. එය වනාහි ප්‍රත්‍යයෙන් හටගත් බැවින් ද පරමාර්ථ වශයෙන් විද්‍යමාන (ඇති) බැවින් ද භූතං යනුවෙන් කියනු ලැබේ. එහෙයින් 'භූතමිදං භික්ඛවෙ සමනුපස්සථ'යි වදාළහ. භූත (හටගත් එකක්) වශයෙන්, නොවෙනස් වූ ස්වභාව වශයෙන් ස්වලක්ෂණ වශයෙන් සාමාන්‍ය ලක්ෂණ වශයෙන් ද දකියි. මේ ස්කන්ධ පංචකය නාමරූප මාත්‍රයකි. එහි මේ පඨවි ආදී ධර්ම රූපය යි. මේ ඵස්සාදී ධර්ම නාමයයි. මේවා ඒවායේ ලක්ෂණාදියයි. මේවා ඒවායේ අවිද්‍යාදී ප්‍රත්‍යයයි මෙසේ ප්‍රත්‍යය සහිතව නාමරූප දැකීම් වශයෙන් ද මේ සියලුම ධර්මයෝ නොවී හටගනිත්. හටගෙන නැතිවෙත්. එහෙයින් අනිත්‍යය, අනිත්‍ය බැවින් දුක්ය. දුක් බැවින් අනාත්මයයි මෙසේ අනිත්‍යානුපස්සනාදී වශයෙන් ද දකියි යන අර්ථයි. මෙපමණකින් තරුණ විදර්ශනාව කෙළවර වූ විදර්ශනා භූමිය දක්වන ලදී. **නිබ්බිදාය** යනු භූත නම් වූ උපන් ත්‍රෛභූමක ධර්මයන් පිළිබඳ කලකිරීම පිණිස, එයින් බලවත් විදර්ශනාව දක්වයි. **විරාගාය** යනු විරාගය පිණිස නොඇලීම

පිණිස, මෙයින් මාර්ගය දක්වයි. **නිරොධාය** යනු නිරෝධය පිණිස, මෙයින් ද මාර්ගයම දක්වයි. 'නිරෝධාය' යනු පටිපස්සද්ධි නිරෝධය සමග අනුපාදිසේස නිවන දක්වයි. **එවං චක්ඛුමනෙතා පස්සන්ති** යනු මෙසේ නුවණැස ඇත්තෝ පූර්වභාග සහිත මාර්ග ප්‍රඥා ඇසින් චතුස්සත්‍ය ධර්මය දකිති.

ගාථාවන්හි **යෙ භූතං භූතතො දිස්වා** යනු යම් ආර්ය ශ්‍රාවකයෝ භූත වූ ස්කන්ධ පංචකය භූත වශයෙන් අවිපරීත ස්වභාවයෙන් විදර්ශනා ප්‍රඥා සහිත මාර්ග ප්‍රඥාවෙන් දැක, එයින් පරිඤ්ඤාභිසමය (පරිඤ්ඤා අවබෝධය) දක්වයි. **භූතස්ස ච අතික්කමං** යනුවෙන් භාවනාභිසමය දක්වයි. ආර්යමාර්ගය භූතය ඉක්මවයි. එයින් භූතයේ ඉක්මීම කියන ලද්දේය. **යථාභූතෙ** යනු නොවෙනස් වූ සත්‍ය ස්වභාවය වූ නිවනෙහි. **විමුච්චන්ති** (කෙලෙසුන්ගෙන්) මිදෙත්. එයින් සච්ඡිකිරිය අභිසමය දක්වයි. **භවතණ්හා පරික්ඛයා** යනු සියලු ආකාරයෙන් භව තණ්හාව සමුච්ඡේද වශයෙන් ගෙවා දැමීම, එයින් සමුදය ප්‍රහාණය දක්වයි. **සවෙ භූත පරිඤ්ඤො සො** යන මෙහි 'සවෙ' යනු නිපාත මාත්‍රයකි. පංචස්කන්ධය නම් වූ භූතය පිළිබඳ පිරිසිඳ දැනගන්නා වූ ඔහු පංචස්කන්ධය ඉක්මවන උපාය මාර්ගයෙන් භව තණ්හාව ක්ෂය කිරීමෙන් පිරිසිඳ දන්නා ලද ස්කන්ධය ඇත්තේ එහෙයින් ම යථාභූත වූ නිවනෙහි ඇලුණේ වෙයි. **භවාභවෙ** යනු කුඩා වූ ද මහත් වූ ද උච්ඡේද ආදිය දැකීමෙන් හෝ **භවාභවෙ** යනු කුඩා වූ ද මහත් වූ ද, උච්ඡේද ආදිය දැකීමෙන් හෝ **වීත තණ්හා** බිඳ දමනලද කෙලෙස් ඇති භික්ෂුව **භූතස්ස** උපාදාන ස්කන්ධ නම් වූ ආත්ම භාවය **විභවා** මත්තෙහි නූපදීමෙන් **පුනබ්භවං** පුනර්භවයට නො පැමිණෙයි. පැණවීමක් නැති බවට ම යති යි අනුපාදිසේස නිර්වාණ ධාතුවෙන් දේශනාව නිමකළ සේක.

මෙසේ මේ වර්ගයෙහි එකොළොස්වන සූත්‍රයෙහි දී සසර දෙසන ලදී. තෙවන, සිවුවන, පස්වන සූත්‍රවල ද අවසාන (දොළොස්වන) සූත්‍රයෙහිද සසර හා නිවන (වට්ට-විවට්ට) දෙසන ලදී. ඉතිරි ඒවාහි නිවනම දෙසන ලදැයි දතයුතුය.

**පරමත්ථදීපනී ඛුද්දක නිකායට්ඨ කථා ඉතිවුත්තකයේ**
**දුකනිපාත වර්ණනාව නිමියේ ය.**

# 3.1.1

තික නිපාතයෙහි පළමු සූත්‍රයෙහි - තීණි යනු ගණන සීමා කිරීමයි. **ඉමානි** යනු ඉදිරිපත් කිරීමයි. (අභිමුඛ කරණය යි.) **අකුසල මූලානි** යනු සීමා කරන ලද ධර්ම දැක්වීමයි. එහි අකුසල ද ඒවාය. මුල් ද ඒවාය යන අරුතින් අකුසල මුල් ය. නැතහොත් අකුසලයන්ගේ හේතු අර්ථයෙන්, ප්‍රත්‍ය අර්ථයෙන් ප්‍රභව (උපදනා තැන) අර්ථයෙන්, ජනක (උපදවන) අර්ථයෙන්, සමුට්ඨාපක (උපදවන) අර්ථයෙන්, නිබ්බත්තක (උපදවන) අර්ථයෙන් 'මුල්' වෙයි යනුවෙන් අකුසල මුල්ය. අකුසල ධර්මයන්ගේ කරුණු යන අර්ථයි. කාරණය වනාහි යම්සේ පිහිටයි ද ඵලය මෙයින් පවතී යන අරුතින් හේතු යයි ද මෙය නිසා, මෙයින් එයි යන අරුතින් පච්චය යයි ද (පටිච්ච එතසමා එති), මෙතැනින් උපදියි යන අරුතින් පභව යයි ද තමාගේ ඵලය උපදවයි යන අරුතින් ජනක යයි ද උපදවයි. (සමුට්ඨාපෙති) යන අරුතින් සමුට්ඨාපක යයි ද උපදවයි (නිබ්බත්තෙති) යන අරුතින් නිබ්බත්තක යයි ද කියනු ලැබේ. මෙසේ පිහිටීම් අර්ථයෙන් මූල යයි ද එහෙයින් අකුසල මූලයයි ද අකුසලයන්ගේ මනාව පිහිටි බව සිදුකරන කරුණුයයි කියන ලද්දේ වෙයි.

ඇතැමෙක් වනාහි හැල් ආදියේ හැල්බීජ මෙන් ද මැණික් ප්‍රභාවන්ගේ මැණික් වර්ණය මෙන් ද අකුසලයන්ගේ අකුසල බව ඇතිකරන සාධකය ලෝභාදීන්ගේ මූල අර්ථයයි කියති. මෙසේ ඇතිකල්හි අකුසල චිත්ත සමුට්ඨාන රූපයන්හි ඒවායේ හේතුප්‍රත්‍යභාවය නො වන්නේය. ඒවා (අකුසල් මුල්) ඒවායේ (අකුසල්වල) අකුසල බව නො සාදයි. ප්‍රත්‍යය නොවන්නේ ද නොවෙයි. ඒ කාරණය **'හෙතු හෙතු සමපයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං හෙතුපච්චයෙන පච්චයො'**[1] යනුවෙන් කියන ලදී. අකුසල බව ඇතිකරන මූලහේතුවක් නැති බැවින් අහේතුක මෝහයේ අකුසල බව සිදු නොවන්නේය.

එසේ වුවත් ලෝභාදීන්ගේ ස්වභාව සිද්ධ වූ අකුසලාදි භාවය වන්නේය. එය ඇසුරු කළ දේවලට ලෝභාදිය බැඳී ඇත. ලෝභාදියේ මෙන් අලෝභාදියේ ස්වභාව සිද්ධ වූ කුසල භාවය මෙලෙස වේ. අලෝභාදිය කුසල්ම වේ. අව්‍යාකත නොවේ. එහෙයින් සම්ප්‍රයුක්ත

---

1. පට්ඨානප්පකරණය - පච්චය නිද්දේසය

ධර්මයන්හි මෙන් මුල්වලද කුසලාදි භාවය සෙවිය යුතුය. කුසලභාවයට යෝනිසෝ මනසිකාරාදිය මෙන් අකුසලභාවයට අයෝනිසෝ මනසිකාරාදිය කාරණයයි ගතයුතුය. මෙසේ අකුසල බව සිද්‍ධකිරීම් වශයෙන් ලෝභාදීන්ගේ මූලාර්ථය නොගෙන මනාව පිහිටි බව සිද්‍ධකිරීම් වශයෙන් (සුප්පතිට්ඨිතභාව සාධන වසෙන) ගනු ලබන කල්හි කිසි දෝෂයක් නැත. ලබන ලද හේතුප්‍රත්‍ය ඇති ධර්මයෝ වැඩුණු මුල් ඇති ගසක් මෙන් ස්ථිරව මනාව පිහිටියාහු වෙති. හේතුරහිත ධර්මයෝ තල බිජුවල සෙවල මෙන් මනාව නොපිහිටියාහු වෙති. හේතු මුල් (ආදි) අර්ථයෙන් අකුසලයන්ට උපකාර බැවින් මූල්ය යන අරුතින් අකුසල මූල්ය. යම්හෙයකින් මූලයකින් මිදුණු අකුසල සිතක ඉපදීමක් නැති ද එහෙයින් මුල් තුනෙන් සියලු අකුසල රාශිය හාත්පසින් ගෙන දක්වන ලදැයි දතයුතුය. ඒ අකුසල මුල් ස්වරූප වශයෙන් දක්වන්නට **ලොභො අකුසල මූලං** ආදිය කියන ලදී. එහිදී ලෝභාදියෙහි යමක් කිවයුතු නම් එය මුලින් කියන ලද්දේමය. එහි වනාහි තුන්වන (අනාගාමි) මාර්ගයෙන් විනාශ කළයුතු ලෝභාදිය ආයේය. මෙහි වනාහි ඉතිරි නැතිව සියල්ල ආයේය. මෙයම විශේෂය යි.

ගාථාවෙහි **පාපචෙතසං** යනු අකුසල ධර්ම යෙදීමෙන් ලාමක සිත. **හිංසන්ති** යනු තමාගේ පැවතීම් මොහොතෙහි ද මතු විපාක දෙන මොහොතෙහි ද බාධා කරත්. **අත්තසම්භූතා** යනු තමා කෙරෙහි හටගත්තා වූ **තචසාරං** යනු ගණ්ඨිතය, උණගස යන අර්ථයි. **සම්ඵලං** යනු තමාගේ ඵලය, මෙය කියන ලද්දේ වෙයි. කිහිරි-ඇට්ටේරිය මෙන් ඇතුළත හරයක් නැතිව පිට හරයක් ඇති බැවින් තචසාර යනුවෙන් ලබන ලද නම් ඇති උණ ආදිය යම්සේ තමාගෙන් (උණ ගසින්) උපන් ඵලයම තමා (උණගස) විනාශ කරයි ද (උණගසින් උපන්ඵලය උණගස විනාශ කරන්නේ යම්සේ ද) එසේම සීලාදි සාරයක් නැති ලාමක සිතක් ඇති පුද්ගලයා තමා තුළ උපන්නා වූ ම ලෝභාදිය (තමාව) විනාශ කරයි.

**පළමු සූත්‍රයයි.**

# 3.1.2

දෙවන සූත්‍රයෙහි ධාතුයෝ යනු තමාගේ ඵලය ද ස්වභාවය ද දරණ අර්ථයෙන් ධාතු නම්. මෙහි ඵලය උපදවන යමක් වේද එය තමාගේ ඵලය ද ස්වභාවය ද අනික ස්වභාවයම දරණ අර්ථයෙන් ද ධාතු නම්. **රූපධාතු** යනු රූප භවයයි. ධාතුව පැමිණි තැන භවයෙන් පිරිසිඳිය යුතුය. (සීමා කළ යුතුය.) භවය පැමිණි තැන ධාතුවෙන් පිරිසිඳිය යුතුය. මෙහි භවයෙන් පිරිසිඳීම (පරිච්ඡේදය) කියන ලදී. එහෙයින් **'කතමෙ ධම්මා රූපාවචරා? හෙට්ඨතො බ්‍රහ්මලොකං පරියන්තං කරිත්වා උපරිතො අකණිට්ඨෙ දෙවෙ අන්තො කරිත්වා එත්ථාවචරා එත්ථ පරියාපන්නා ඛන්ධධාතු ආයතනා, ඉමෙ ධම්මා රූපාවචරා'**[1]

'කවර ධර්ම රූපාවචර ද? යටින් බඹලොව සීමාකොට උඩින් අකනිටා දෙවියන් ඇතුලු කොට මෙහි හැසිරෙන මෙහි ඇතුළත් ස්කන්ධ-ධාතු-ආයතන යන මේ ධර්ම රූපාවචරය'යි මෙසේ කියන ලද රූපාවචර ධර්ම රූපධාතු ය.

**අරූපධාතු** යනු අරූප භවයයි. මෙහි ද භවයෙන් පිරිසිඳීම කියන ලදී. **'කතමෙ ධම්මා අරූපාවචරා? හෙට්ඨතො ආකාසානඤ්චායතනූපගෙ දෙවෙ අන්තො කරිත්වා උපරිතො නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගෙ දෙවෙ අන්තො කරිත්වා එත්ථාවචරා එත්ථ පරියාපන්නා ඛන්ධ ධාතු ආයතනා, ඉමෙ ධම්මා අරූපාවචරා'** 'කවර ධර්ම අරූපාවචරද? යටින් ආකාසානඤ්චායතනයට එළඹි දෙවියන් ඇතුලුකොට උඩින් නේවසඤ්ඤානාසඤ්ඤායතනයට එළඹි දෙවියන් ඇතුලුකොට මෙහි හැසිරෙන මෙහි ඇතුළත් ස්කන්ධ-ධාතු-ආයතන යන මේ ධර්ම අරූපාවචරය'යි මෙසේ කියන ලද අරූපාවචර ධර්ම අරූපධාතුය.

**නිරොධ ධාතු** යනුවෙන් නිවන දතයුතුය. වෙනත් ක්‍රමයක්: රූපය සහිත රූපය හා බැඳුණු ධර්ම ප්‍රවෘත්තිය (දහම් පැවැත්ම) රූපධාතුවය. (එනම්) පංචවෝකාර භවය ද ඒකවෝකාර භවය ද වේ. එයින් සියලු කාමභවයද රූප භවය ද එක්තැන් කරන ලද්දේ වෙයි. රූපය නැති ධර්ම ප්‍රවෘත්තිය අරූපධාතුව ය. චතුවෝකාර භවයයි. එයින් අරූපභවය එක්තැන්

---

1. ධම්ම සංගණිප්පකරණය

කරන ලද්දේ වෙයි. මෙසේ පද දෙකින් භව තුනත් සියලු සංසාර පැවැත්මත් දක්වන ලදී.

තෙවන පදයෙන් අසංඛත ධාතුවම සංග්‍රහ කරන ලදී. මෙහි මාර්ගඵල තක විනිම්මුත්ත (කාම-රූප-අරූප යන තුනෙන් මිදුණු) ධර්ම නම්.

ඇතැමෙක් වනාහි 'රූපධාතු' යනුවෙන් රූප ස්වභාව ධර්ම ද 'අරූප ධාතු' යනුවෙන් අරූප ස්වභාව ධර්ම ද යන පද දෙකෙන් ඉතිරි නොකොට පංචස්කන්ධය ගන්නා ලදැයි ද රූප තණ්හාවට විෂය වන ධර්ම 'රූපධාතු' යයි ද අරූප තණ්හාවට විෂය වන ධර්ම අරූප ධාතුයයිද කියති. ඒ සියල්ල මෙහි අදහස් කරන ලදී. එහෙයින් කියන ලද අයුරින්ම අර්ථය දතයුතුය.

ගාථාවන්හි **රූපධාතුං පරිඤ්ඤාය** යනු රූපය හා බැඳුණු ධර්ම ප්‍රවෘත්තිය ඤාත පරිඤ්ඤා යනාදී පරිඤ්ඤා තුනෙන් පිරිසිඳ දැන **අරූපෙසු අසණ්ඨිතා** යනු අරූපාවචර ධර්මයන්හි භවරාග වශයෙන් ද භව දිට්ඨි වශයෙන් ද නොපිහිටියා වූ ඇසුරු නොකළා වූ නොඇලුණා වූ. 'අරූපෙසු අසන්ධිතා' යනුවෙන් ද කියති. ඒ අර්ථයමයි. මෙපමණකින් ත්‍රෛභූමික ධර්මයන්ගේ පිරිසිඳ දැනීම කියන ලදී. **නිරොධෙ යෙ විමුච්චන්ති** යනු යමෙක් නිවන අරමුණු වූ අග්‍ර මාර්ග-ඵල වශයෙන් සමුච්ඡේද-පටිප්පස්සද්ධි වලින් ඉතිරි නොකොට කෙලෙසුන් කෙරෙන් මිදෙත් ද, **තෙ ජනා මච්චුහායිනො** යනු ඒ ගෙවා දැමූ ආශ්‍රව ඇති අය මරණය ඉක්මවූවාහුය. මෙසේ (කාම-රූප-අරූප යන) ධාතු තුන ඉක්මවීමෙන් නිවන් අවබෝධය දක්වා මේ ප්‍රතිපදාව ද ම විසින් ගිය මාර්ගය ද ඔබලාට දේශනා කළ මාර්ගයද වෙයි යනුවෙන් එහි ඔවුන්ගේ උත්සාහය උපදවමින් දෙවන ගාථාව වදාළහ. එහි **කායෙන** නාම කයින් මාර්ගඵලවලින්. **ඵුසයිත්වා** යනු පැමිණ. **නිරූපධිං** යනු ස්කන්ධාදී සියලු උපධි නැති. **උපධිප්පටිනිස්සග්ගං** යනු ඒ උපධීන්ගේම දුරුකිරීම් කාරණය, මාර්ග ඥානයෙන් නිවන ප්‍රත්‍යක්ෂ කිරීමෙන් සියලු උපධි දුරුකරන ලද්දාහු වෙති යන අරුතින් එය (මාර්ග ඥානය) ඒවා (උපධීන්) දුරුකරන කාරණයයි. **සච්ඡිකත්වා** යනු කලින් කල ඵලසමාපත්තියට සමවැදීමෙන් තමා ප්‍රත්‍යක්ෂ කොට.

**අනාසවො සම්මා සම්බුද්ධො** යනු අනාශ්‍රව වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ **අසොකං විරජං** ශෝක නැති කෙලෙස් දූවිලි නැති ඒ නිර්වාණ පදයම දේශනා කරති. එහෙයින් එය අවබෝධ කිරීම පිණිස උත්සාහ කළ යුතුය.

**දෙවන සූත්‍රය යි.**

## 3.1.3

තුන්වන සූත්‍රයෙහි **වෙදනා** යනු අරමුණු රසය විඳිති, අනුභව කරති යන අරුතින් වේදනා නම් වේ. එය විභාග වශයෙන් (බෙදා) දක්වන්නට **සුඛා වෙදනා** යනාදිය කියන ලදී. එහි 'සුඛ' ශබ්දය වස්තු-ද්වාර වශයෙන් මුලින් කියන ලද්දේමය. 'දුක්ඛ' ශබ්දය වනාහි 'ජාතිපි දුක්ඛා' 'ඉපදීම ද දුකය' යනාදියෙහි දුක්ඛ වස්තුවෙහි ආයේය. '**යස්මා ච ඛො මහාලි රූපං දුක්ඛං දුක්ඛානුපතිතං දුක්ඛාවක්කන්තං**'[1] 'මහාලිය, යම්හෙයකින් රූපය දුක ද දුක මත වැටුණේ ද දුකට බැස ගත්තේ ද' යනාදියෙහි දුක්ඛ ආරම්මණයෙහි ආයේය. '**දුක්ඛො පාපස්ස උච්චයො**'[2] 'පව් රැස්කිරීම දුකය' යනාදියෙහි දුක්ඛ ප්‍රත්‍යයෙහි (දුකට හේතුවෙහි) ආයේය. '**යාවඤ්චිදං භික්ඛවෙ න සුකරං අක්ඛානෙන පාපුණිතුං යාව දුක්ඛා නිරයා**'[3] 'මහණෙනි, නිරයවල් මෙතෙක් දුක් ඇති ඒවා යයි කීමෙන් මුදුන් පමුණුවා කියන්නට පහසු නොවේ. යන ආදියෙහි දුකට හේතුවන ස්ථානයෙහි ආයේය. '**සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා**'[4] 'සැප පහ කිරීමෙන් ද දුක පහ කිරීමෙන් ද' යනාදියෙහි දුක්වේදනාවෙහි ආයේය. මේ සූත්‍රයෙහි ද දුක්වේදනාවෙහි ම ආයේය. වචනාර්ථ වශයෙන් සැප

1. ඛන්ධසංයුත්තය - බු.ජ.මු. 3 භා - 120 පිට
2. ධම්මපදය - පාපවර්ගය
3. ම.නි. - උ.ප - බාල පණ්ඩිත සූත්‍රය 366 පිට
4. දී.නි. සාමඤ්ඤඵල සූත්‍රය

විඳී යන අරුතින් 'සුඛ' නම් වේ. දුක් විඳී යන අරුතින් දුක්ඛ නම් වේ. දුක් නොවේ සැප නොවේ යන අරුතින් අදුක්ඛමසුඛ නම් වේ. 'ම' කාරය පද සන්ධි කිරීම් වශයෙන් කියන ලදී. ඒවා අතරින් 'සුඛය' ප්‍රිය දේ අනුභව කිරීම ලක්‍ෂණ කොට ඇත. 'දුක්ඛය' අප්‍රිය දේ අනුභව කිරීම ලක්‍ෂණකොට ඇත. මේ දෙකටම වෙනස් අයුරින් අනුභව කිරීම ලක්‍ෂණකොට ඇත්තේ 'අදුක්ඛමසුඛය'. එහෙයින් සුඛ-දුක්ඛ වේදනාවන්ගේ උපත ප්‍රකට ය. අදුක්ඛමසුඛ වේදනාවේ උපත අප්‍රකටය.

සැපය උපදින කල්හි මුළු සිරුර කළඹන්නාක් මෙන් ද මිරිකන්නාක් මෙන් ද මුළු සිරුරෙහි පැතිරෙන්නාක් මෙන් ද සියවරක් පිරිසිදු කරනලද ගිතෙල් කවන්නාක් මෙන් ද සියවරක් සිඳින ලද තෙලක් සිරුරෙහි ගාන්නාක් මෙන් ද කලගෙඩි දහසක ජලයෙන් දාහය නිවන්නාක් මෙන් ද අනේ සැපයි අනේ සැපයි යනුවෙන් වචන කියමින් ම උපදියි.

දුක උපදින කල්හි මුළු සිරුර කළඹන්නාක් මෙන් ද මිරිකන්නාක් මෙන් ද මුළු සිරුරෙහි පැතිරෙන්නාක් මෙන් ද රත් වූ කබලක් ඇතුල් වන්නාක් මෙන් ද උණුකරන ලද තඹ ලෝහ වක් කරන්නාක් මෙන් ද අනේ දුකයි අනේ දුකයි යනුවෙන් විකාර දොඩවමින් ම උපදියි. මෙසේ සුඛ-දුක්ඛ වේදනාවන්ගේ උපත ප්‍රකටය. අදුක්ඛමසුඛ වේදනාව දැනගැනීම අපහසුය, අපැහැදිලිය, අඳුරුය, අප්‍රකට ය. ඒ අදුක්ඛමසුඛ වේදනාව සැප-දුක් වේදනාවන් ඉවත් වූ කල්හි මිහිරි අමිහිරි දෙක ප්‍රතික්‍ෂේප කිරීම් වශයෙන් මැදහත් ආකාරයෙන් යුක්ත වූයේ න්‍යාය වශයෙන් ගන්නා වූ තැනැත්තාට ම ප්‍රකට වෙයි. කෙසේද? ගල්තලාවක දෙපස මුවෙකු ගමන්ගත් අඩිපාර පෙනෙන්නට ඇතත් ගල්තලාව මතින් ගමන්කළ අඩිපාර පෙනෙන්න නැත. එහෙත් දෙපස ඇති අඩිපාර අනුසාරයෙන් ගලමතින් මුවා ගිය අඩිපාර දැනගන්නාක් මෙනි. (මුල අග පස් සහිත ප්‍රදේශයක හැසිරුණු මාර්ගය අනුව ගල්තලාවක් මතින් මුවෙකු ගිය මාර්ගය දැනගන්නාක් මෙනි) මෙසේ ඉටු-අනිටු (ප්‍රිය-අප්‍රිය) අරමුණුවල සැප දුක් විඳීමෙන් මැදහත් අරමුණ විඳීම් ස්වභාවයෙන් දැනගනු ලැබේ. මැදහත් අරමුණ ගැනීම වනාහි ප්‍රිය අප්‍රිය අරමුණු ගැනීම් නැති බැවින් ගල්තලාවක් මතින් යන ගමනක් මෙනි. එහි යම් විඳීමක් (අනුභව කිරීමක්) ඇද්ද එය අදුක්ඛමසුඛය. මෙසේ මෙහි සුඛ-දුක්ඛ-අදුක්ඛමසුඛ ස්වභාවයෙන් තුන් ආකාරකොට කියනු ලැබුවද ඇතැම් තැනක සුඛ-දුක්ඛ ස්වභාවයෙන් දෙයාකාරයකින් කියන ලදී.

ඒ බව මෙසේ වදාළහ. 'ද්වෙපි මයා ආනන්ද වෙදනා වුත්තා **පරියායෙන සුඛා වෙදනා දුක්ඛා වෙදනා**' 'ආනන්ද, මා විසින් සුඛ වේදනා දුක්ඛ වේදනා යනුවෙන් වේදනාව පරියාය වශයෙන් දෙයාකාර කොට දේශනා කරන ලදී' ඇතැම් තැනක සුඛ-දුක්ඛ-අදුක්ඛමසුඛ වශයෙන් වේදනා තුනක් මෙසේ දේශනා කරන ලදී. '**සුඛා වෙදනා ඨිති සුඛා විපරිනාම දුක්ඛා, දුක්ඛා වෙදනා ඨිති දුක්ඛා විපරිනාම සුඛා, අදුක්ඛමසුඛා වෙදනා ඤාණසුඛා අඤ්ඤාණ දුක්ඛා**' 'සුඛ වේදනාව වනාහි පැවැත්ම සැපය වෙනස්වීම දුකය, දුක් වේදනාව වනාහි පැවැත්ම දුකය වෙනස්වීම සැපය, අදුක්ඛමසුඛ වේදනාව දැනීම සැපය, නොදැනීම දුකය.' ඇතැම් තැනක '**යං කිඤ්චි වෙදයිතං සබ්බන්තං දුක්ඛස්මින්ති වදාමි**' 'විඳින යමක් ඇද්ද ඒ සියල්ල දුකෙහි ඇතුළත්යයි කියමි' යනුවෙන් සියල්ල දුක් ස්වභාවයෙන් කියන ලදී. එහිදී මේ කාරණය මතු වන්නේය. මෙහි කියන ලද අයුරින් වේදනා තුනක් ඇත්නම් මෙබඳු අනිත් සූත්‍රවලදී ද අභිධර්මයෙහි ද මෙසේ නොකියා කුමක් නිසා 'යං කිඤ්චි වෙදයිතං සබ්බන්තං දුක්ඛස්මින්ති වදාමි' යනුවෙන් මෙසේ කියන ලද ද? 'ද්වෙපි මයා ආනන්ද වෙදනා වුත්තා' යන්න සඳහා මෙය කියන ලදී. එහෙයින් එය පරියාය දේශනාවකි. 'භාග්‍යවතුන් වහන්සේ විසින් '**සංඛාරානිච්චතං ආනන්ද මයා සන්ධාය භාසිතං සංඛාර විපරිනාමතං යං කිඤ්චි වෙදයිතං සබ්බන්තං දුක්ඛස්මිං**' 'ආනන්ද, සංස්කාරවල අනිත්‍ය බව නිසා සංස්කාරවල වෙනස් වන බව නිසා විඳින යමක් ඇද්ද ඒ සියල්ල දුකෙහි ඇතුළත්ය'යි මා විසින් කියන ලදී. 'ද්වෙපි මයා ආනන්ද වෙදනා වුත්තා පරියායෙන' 'ආනන්ද, මා විසින් පර්යාය වශයෙන් (එක් ක්‍රමයකින්, අප්‍රධාන වශයෙන්) වේදනා දෙකක් කියන ලදී' යනුවෙන් මේ කාරණය කියන ලදී. මෙහි සුඛ, අදුක්ඛමසුඛ යන මේ වේදනා දෙකේ නිෂ්පර්යාය වශයෙන් දුක් බවක් නැත. හික්මවීමට සුදුසු අයගේ අදහස් (වලට ගැලපීම්) වශයෙන් එහි (සුඛ-අදුක්ඛමසුඛ දෙකෙහි) ඡන්දය නැති බව (තණ්හාව දුරුකිරීම) දැක්වීම පිණිස පර්යාය වශයෙන් දුක් බව දෙසන ලදී. ඒ පර්යාය දේශනාව එබඳුය. මේ වේදනා තුනකැයි කරන ලද දේශනාව ස්වභාව කථාය යි නම්කොට නිෂ්පරියාය දේශනාවය. මේ මෙහිලා ආචාර්යවරුන්ගේ සමාන අර්ථ කථාවය.

දුක පිළිබඳ යුගල වචනයෙන් වේදනා තුන පිළිබඳ දේශනාව පරියාය දේශනාවමය යනුවෙන් විතණ්ඩවාදියා කීය. එසේ නොකියන්නැයි ඔහුට කිවයුතුය. 'සංඛාරා නිච්චතං ආනන්ද මයා සන්ධාය භාසිතං සංඛාර

විපරිනාමතං යං කිඤ්චි වෙදයිතං සබ්බන්තං දුක්ඛස්මිං' 'ආනන්ද, මා විසින් විඳින සියල්ල දුකෙහි ඇතුළත්යයි කියන ලද්දේ සංස්කාරයන්ගේ අනිත්‍ය බව, සංස්කාරයන්ගේ විපරිනාමය නිසාය' යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් සියලු වේදනාවන්ගේ දුක් බව අදහස් කිරීම් වශයෙන් දෙසන ලදද එහෙයිනි.

ඉදින් වනාහි මෙහි වේදනාත්‍රය දේශනාව පරියාය දේශනාවක් වන්නේ නම් 'ඉදං මයා සන්‍ධාය භාසිතං තිස්සො වෙදනා' 'මා විසින් මේ සඳහා වේදනා තුන කියන ලදී' යනුවෙන් කිවයුතු වන්නේය. තවද ඇවැත්නි, වේදනාත්‍රය දේශනාවේ අදහස කුමක්දැයි යන මෙයම කිවයුතුය. (ඇසිය යුතුය.) මෘදු වූ දුක් වේදනාව සැපය, අධිමාත්‍ර වූ දුක්වේදනාව දුකය, මධ්‍යම වූ දුක්වේදනාව අදුක්ඛමසුඛයයි හික්මවීමට සුදුසු අයගේ අදහස් වශයෙන් කියන ලදී. ඒවායෙහි සත්ත්වයන්ගේ සැප ආදිය වැඩීමක් නැතැයි ඉදින් කියන්නේ නම් ඔහුට මෙසේ කිවයුතුය.

ඇවැත්නි, යම් කරුණකින් සියලු වේදනාවෝ දුක්යයි කියන්නාහු නම් දුක් වේදනාවේ ස්වභාවය කුමක් ද? ඉදින් යම් කාරණයකින් උපන්නා වූ සත්ත්වයෝ වියෝගය ම කැමති වෙත් ද එය දුක් වේදනාවේ ස්වභාවයයි (කියයි නම්) යම් කරුණකින් උපන්නා වූ සත්ත්වයෝ අවියෝගයම (වෙන් නොවීමම) කැමති වෙත් ද යම් කරුණකින් උපන්නා වූ සත්ත්වයෝ මේ දෙකම කැමති නොවෙත් ද එය දුක්වේදනා වන්නේ කෙසේදැයි (ඇසිය යුතුය.) එවිට තමා ඇසුරු කරන්නාගේ යම් විනාශ කිරීමක් වේද එය දුකයයි (කියයි නම්) තමා ඇසුරු කරන්නාට යම් අනුග්‍රහ කිරීමක් වේද එය දුක්වන්නේ කෙසේදැයි (ඇසිය යුතුය). එවිට ආර්යයෝ යමක් දුක් වශයෙන් දකිත් ද එය දුක් වේදනාවේ ස්වභාවයයි. ආර්යයෝ සංඛාරයන්ගේ දුක් බව නිසා වේදනාව දුක් වශයෙන් දකිති. එය ද නිතර පවතින ස්වභාවයයි කියයි. ඒ වේදනාවන්ගේ මෘදු-මධ්‍යම-අධිමාත්‍ර දුක් බව වන්නේ කෙසේද? ඉදින් සංඛාරයන්ගේ දුක් බව නිසාම වේදනාවන්ගේ දුක්බව වන්නේ නම් '**තිස්සො ඉමා භික්ඛවෙ දුක්ඛතා : දුක්ඛ දුක්ඛතා, විපරිනාම දුක්ඛතා, සංඛාර දුක්ඛතා**' යන දුක් පිළිබඳ මේ විභාග දේශනාව නිෂ්ප්‍රයෝජන වන්නේය. එසේ ඇතිකල්හි සූත්‍රයම වළක්වන ලද්දේ වන්නේය. පළමු රූපාවචර ධ්‍යාන තුනෙහි ඇති සුඛ වේදනා යන වචනයෙන් මෘදු වූ දුක් වේදනාව පැමිණෙයි. චතුර්ථ ධ්‍යානයෙහි ද

අරූප ධ්‍යානවලද ඇති අදුක්ඛමසුඛ වේදනා යන වචනයෙන් මධ්‍යම දුක් වේදනාව පැමිණෙයි. මෙසේ ඇතිකල්හි පළමු රූපාවචර සමාපත්ති තුන චතුර්ථ ධ්‍යාන සමාපත්තියට ද අරූප සමාපත්තිවලට ද වඩා ශාන්ත බවට පැමිණෙයි. වඩා ශාන්ත වඩා ප්‍රණීත සමාපත්තිවල දුක් වේදනාවේ අධික බව කෙසේ යෙදේ ද? එහෙයින් වේදනාත්‍රය දේශනාවේ පර්යාය දේශනා බව යුතු (සුදුසු) නැත. පළමු (රූපාවචර ධ්‍යාන) තුනෙහිදී දුකෙහි සැපයයි යමක් කියන ලද ද, (එය) සංඥා විපර්යාසයයි. එය කෙසේද? විපරිනාම දුක්ඛතාවෙන් ද සංඛාර දුක්ඛතාවෙන් ද යථාභූත අනවබෝධයෙන් ඒකාන්ත වශයෙන් යම් සුඛ සඤ්ඤාවක් වේද දුක් නිමිත්තෙහි යම් සුඛ නිමිත්ත සඤ්ඤාවක් වේද ඒ සඳහා එවම්පි සුඛා භික්ඛවෙ වෙදනා දුක්ඛතො දට්ඨබ්බා' 'මහණෙනි, මෙසේ ද සුඛ වේදනාව දුක් වශයෙන් දතයුතුය'යි කියන ලදී. මෙය වනාහි කෙසේද? මෙය වනාහි එහි ඒ විරාග උත්පත්තියේ උපාය භාවයෙන් ද සුඛවේදනාවේ බොහෝ දුක් අනුගත භාවයෙන් ද විපරිනාම දර්ශනයෙහි යෙදවීම පිණිස කියන ලදී.

එසේම දුකට හේතු බැවින් ද නොයෙක් දුක්ඛ ධර්මයන් සමග අනුබද්ධ බැවින් ද පණ්ඩිතයෝ සැපය ද දුකය යන අදහසට බැසගත්හ. මෙසේද සැපහේතුන්ට නියමයක් නැති බැවින් සුඛ වේදනාව නැත්තේමය. යම් කරුණුවලින් සැපවේදනාවට කෑම-ඇඳීම ආදිය හේතු වශයෙන් සම්මත ද වැඩියෙන් ද අකාලයෙහි ද පරිහරණය කරන්නා වූ ඒ කෑම-ඇඳීම ආදියම දුක් වේදනාවේ හේතු බවට පැමිණේ. යම් ම හේතුවකින් සැපයක් ඇද්ද ඒ හේතුවෙන් ම දුකයයි කියන්නට යුතු නැත. එහෙයින් ඒවා සැප හේතු නොවේ. දුක ඉවත්වීමෙහිදී බාලයන්ට සුඛ සඤ්ඤාව (සැප හැඟීම) ඇතිවෙයි. බොහෝ වේලාවක් සිටීම් ආදී ඉරියව්වලින් යුක්තව සිට එයින් වෙනත් ඉරියව්වකට මාරුවීමෙහිදී ද මහත් වූ බරක් උසුලන්නා වූ තැනැත්තාට ඒ බර බහා තැබීමෙහිදී ද (මුලින් ඇති වූ දුක) සන්සිඳීමෙහිදී යම්සේ සුඛ සංඥාවක් ඇතිවේද එමෙනි. එහෙයින් සැපයක් නැත්තේම ය. ඒ මේ සැපයට හේතුව මනාකොට පිරිසිඳ නොදැන ඒසැප හේතුවෙහි නියමයක් නැති බව පරිකල්පනය (අදහස් කිරීම) වූ අරමුණු මාත්‍රයම හුදෙක් සැපයට හේතුවය යි මෙනෙහිකොට මෙසේ කියන ලදී. ආධ්‍යාත්මික ශරීරයේ හටගත් අවස්ථා විශේෂය එක්වී ඒ දෙක සැපයට මුල් හේතුවයයි දතයුතුය. යම් ලෙසකින් ඒ දෙක සැප වේදනාවට

හේතු වේ ද එලෙසින් කිසි කලෙකත් දුක් වේදනාවට හේතු නොවේය යි සැපයට මුල් හේතුව තීරණය කරන ලද්දේම ය.

යම්සේ තේජෝ ධාතුව සහල්, යව, පලාකොල, ධාන්‍ය වර්ගවල යම්බඳු වූ අවස්ථාන්තරයකට (කිසියම් අවස්ථාවකට) පැමිණ මිහිරි බවට හේතුවක් වේද එබඳු අවස්ථාන්තරයකට පැමිණ කිසිකලෙකත් අමිහිරි බවකට හේතුවක් නොවේ. මෙය ද එසේය යි දතයුතුය. කිසිවිටක දුක ඉවත්වීමෙහිදී ම සැපයට හේතුවක් ලැබේ. එහි දී සැපයෙහි ම සැප හැඟීම වෙයි. දුක ඉවත්වීම් මාත්‍රයෙහි නොවේ. දුරගමන් වෙහෙසින් ක්ලාන්ත වූ තැනැත්තාට සම්බාහනය කිරීමෙහිදී ද ඉරියව් මාරු කිරීමෙහිදී ද යම්සේ සැප හැඟීමක් වේ ද එමෙනි.

අන් අයුරකින් වෙනත් කලකදී ද වෙහෙස ඉවත්වීමෙහිදී ද එබඳු සැප සංඥාවක් ඇති වන්නේය. දුක ඉවත්වීම් මාත්‍රයෙහි ද (දුක ඉවත්වන විට ම) සැපය යන පරිකල්පනාව ඇති වන්නේ වේදනා විශේෂයක් නොලැබෙන බැවිනි. ඒකාන්තයෙන් ම මෙය මෙසේ සිදුවිය යුතුය. යම්හෙයකින් සත්ත්වයෝ මහත් ආයාසයෙන් ප්‍රණීත වූ ම අරමුණු පතත් ද තණ්හාව ඉපදීම නිසා ප්‍රත්‍යයන් ලබන ලද තරමින් ඔවුන්ට ප්‍රතිකාර කරන්නට නොහැකිය. වේදනා ප්‍රත්‍යයෙන් තණ්හාව උපදී. එසේ ඇතිකල්හි සුවඳ - මිහිරි - සුඛ ස්පර්ශ ආදී වස්තූන් අතරින් යමක් ඇතිවීමෙන් සුඛ විශේෂ සංඥාවක් උපදින්නේ කවර දුක් විශේෂයක් ඉවත්වීමෙන් ඝාණ - ජිව්හා - කාය ද්වාරයන්හි ද දිව්‍ය සංගීතය හා සමාන පසඟතුරු හඬ අවධාරණයෙහි දී සෝත ද්වාරයෙහි ද සුඛ විශේෂ සංඥාවන් උපදී ද?* එහෙයින් දුක් වේදනාවෙහි ඇත්තා වූ ම දුකට හේතුව ඉවත්වීමෙහි සුඛ සංඥාව ඇති නොවෙයි. හුදෙක් දුක ඉවත්වීම් මාත්‍රයෙහි ද සුඛ සංඥාව ඇති නොවෙයි යනුවෙන් ආගම වශයෙන් ද යුක්ති වශයෙන් ද තීරණය කරන ලද්දේය.

'තිස්සො වෙදනා' යන භාග්‍යවතුන් වහන්සේගේ වේදනා තුන පිළිබඳ දේශනාව නීතත්ථ (පමුණුවන ලද අර්ථ ඇති) දේශනාවකි. නෙය්‍යත්ථ

---

* වෙදනා පච්චයා හි තණ්හා උපාදි. තථාභාවෙ ච සුගන්ධ මධුර සුඛ සම්ඵස්සාදී වත්ථූනං ඉතරීතර භාවෙන සුඛ විසෙසසඤ්ඤා ජායමානා කතමස්ස දුක්ඛ විසෙසස්ස අපගමනෙ ඝාණ ජිව්හා කායද්වාරෙසු සොතද්වාරෙ ච දිබ්බ සංගීත සදිස පංචංගික තුරිය සද්දාවධාරණෙ

(පමුණුවාගත යුතු අර්ථ ඇති) දේශනාවක් නොවේ යනුවෙන් හැඟවිය යුතුය. මෙසේ (විතණ්ඩවාදියා) මේ කාරණයට එළඹෙයි නම් මැනවි. නො එසේ නම් යම් ක්‍රියාවක් කොට සැපසේ යන්නැයි පිටත් කරවිය යුතුය.

මෙසේ මේ එකිනෙකට ප්‍රතිපක්ෂ ස්වභාව නියමකරන ලක්‍ෂණ ඇත්තා වූම වේදනා තුන භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලදී. එය ද විදර්ශනා කර්මස්ථානය වඩන යෝගාවචරයන්ට වේදනා මුඛයෙන් අරූප කර්මස්ථානය දැක්වීම පිණිසය. කර්මස්ථානය වනාහි රූපකර්මස්ථානය, අරූප කර්මස්ථානයයි දෙවැදෑරුම්ය. භාග්‍යවතුන් වහන්සේ එහිදී රූප කර්මස්ථානය කියමින් ඵස්ස වශයෙන් හෝ වේදනා වශයෙන් හෝ චිත්ත වශයෙන් හෝ කියති. ඇතැමෙකුට (ඉඳුරන්) හමුවට පැමිණි අරමුණු ආවර්ජනා කිරීමෙන් (සිතා බැලීමෙන්) එහි චිත්ත චෛතසික අතරින් පළමුව ඉදිරියට පත් ස්පර්ශය, ඒ අරමුණ ස්පර්ශ කරමින් උපදින්නේ ප්‍රකට වෙයි. ඇතැමෙකුට ඒ අරමුණ අනුභව කරමින් උපදින්නා වූ වේදනාව ප්‍රකට වෙයි. ඇතැමෙකුට ඒ අරමුණ දැනගනිමින් උපදින්නා වූ විඤ්ඤාණය ප්‍රකට වෙයි. මෙසේ ඒ ඒ පුද්ගලයන්ගේ අදහසින් ඵස්සාදී මුඛයෙන් ප්‍රකටවන ලෙසින් අරූප කර්මස්ථානය තෙවැදෑරුම්කොට කියති. එහිදී යමෙකුට ඵස්සය ප්‍රකට වේද, හුදෙක් ඵස්සය පමණක්ම නූපදී. ඒ සමග ඒ අරමුණම අනුභව කරන වේදනාව ද උපදී. හැඳින ගනිමින් සඤ්ඤාව ද උපදී. සිතමින් චේතනාව ද උපදී. දැනගනිමින් විඤ්ඤාණය ද උපදියි. මෙසේ ස්පර්ශය පස්වෙනිකොට ඇති ධර්මයන්ම ගනියි. යමෙකුට වේදනාව ප්‍රකට වේද හුදෙක් වේදනාව පමණක්ම නූපදී. එය සමග ස්පර්ශ කරමින් ඵස්සය ද උපදී. හැඳිනගනිමින් සඤ්ඤාවද උපදී. සිතමින් චේතනාව ද උපදී. දැනගනිමින් විඤ්ඤාණය ද උපදී. මෙසේ ස්පර්ශය පස්වෙනිකොට ඇති ධර්මයන්ම ගනියි. යමෙකුට විඤ්ඤාණය ප්‍රකට වේද හුදෙක් විඤ්ඤාණය පමණක් ම නූපදී. එය සමග ඒ අරමුණම ස්පර්ශ කරමින් ස්පර්ශය උපදී. අනුභව කරමින් වේදනාව ද උපදී. හැඳිනගනිමින් සඤ්ඤාව ද උපදී. සිතමින් චේතනාවද උපදී. මෙසේ ස්පර්ශය පස්වෙනිකොට ඇති ධර්මයන් ම ගනියි.

හෙතෙම මේ (ඵස්ස-වේදනා-සඤ්ඤා-චේතනා-විඤ්ඤාණ යන) ඵස්ස පංචමක ධර්ම කුමක් ඇසුරුකොට ඇත්දැයි සලකා බලමින් වස්තුව ඇසුරුකොට ඇතැයි දැනගනියි. වස්තුව නම් ශරීරයයි. 'ඉදඤ්ච පන මෙ

**විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධං'** 'මගේ මේ විඤ්ඤාණය ද මෙහි (මේ ශරීරයෙහි) සිටියේය. මෙහි බැඳුනේය' යන මෙය ඒ සඳහා කියන ලදී. එය අර්ථ වශයෙන් භූත රූප ද උපාදා රූප ද වෙයි. මෙසේ මෙහි වස්තුව රූපය යි. ඵස්ස පංචමක ධර්ම නාමය යි නාම රූප මාත්‍රයම දකියි. මෙහි රූපය රූපස්කන්ධය යි, නාමය සතර අරූප ස්කන්ධය යි, මෙසේ පංචස්කන්ධ මාත්‍රය වෙයි. නාමරූපයෙන් තොර වූ පංචස්කන්ධයක් ද පංචස්කන්ධයෙන් තොර වූ නාමරූපයන් ද නැත. හෙතෙම මේ පංචස්කන්ධ කුමක් හේතුකොට ඇත්දැයි සලකා බලන්නේ අවිද්‍යාදිය හේතුයයි දකියි. එහෙයින් මෙය ප්‍රත්‍යයයි ද ප්‍රත්‍යයෙන් උපන්නේ යයි ද අනික් සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නැත. පිරිසිදු සංඛාර ගොඩක් පමණකැයි ප්‍රත්‍ය සහිතව නාමරූප වශයෙන් ත්‍රිලක්ෂණයට නංවා විදර්ශනා පිළිවෙළින් අනිත්‍යය දුක්ඛය අනාත්ම යයි නුවණින් සලකා බලමින් හැසිරෙයි. හෙතෙම අද අද ම ප්‍රතිවේධය කැමැත්තෙන් එබඳු කාලයෙහි ඍතු සප්පාය (සුදුසු ඍතුව) හෝ පුද්ගල සප්පාය (සුදුසු පුද්ගලයන්) හෝ භෝජන සප්පාය (සුදුසු ආහාර) හෝ ධම්මසවණ සප්පාය (සුදුසු ධර්ම ශ්‍රවණය) හෝ ලැබ එක පර්යංකයකින් හුන්නේම විදර්ශනාව මුදුන්පමුණුවා රහත් බවෙහි පිහිටයි. මෙසේ මේ තුන්දෙනාගේ රහත්බව තෙක් කමටහන දතයුතුය. මෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ වේදනා වශයෙන් අවබෝධ කරන්නවුන්ගේ අදහසින් අරූප කර්මස්ථානය කියමින් වේදනා වශයෙන් දෙසූහ. එහි

**ලක්ඛණඤ්ච අධිට්ඨානං උප්පත්ති අනුසයො තථා**
**ඨානං පවත්ති කාලො ච ඉන්ද්‍රියඤ්ච ද්විධාදිතා**

ලක්ෂණය ද අධිෂ්ඨානය ද උත්පත්තිය ද අනුසය ද එසේ ම ස්ථානය ද, පවතින කාලය ද ඉන්ද්‍රිය ද ද්විධාදිතා (දෙයාකාර ආදිය)ද යන මේ ප්‍රකීර්ණකය දතයුතුය.

1. එහි ලක්ඛණං - ලක්ෂණය මුලදී කියන ලද්දේමය.

2. අධිට්ඨානං = අධිෂ්ඨානය යනු ඵස්සය යි. ඵස්ස පච්චයා වෙදනා යන වචනයෙන් ස්පර්ශය වේදනාවට අධිෂ්ඨානය යි. ඒ මෙසේය. වේදනාවට අධිෂ්ඨාන භාවයෙන් සම නැති එළදෙනගේ උපමාවට එය සමාන කරන ලදී. එහි සුඛ වේදනාව වින්දයුතු (සුඛවේදනීය) ස්පර්ශය සුඛවේදනාවට අධිෂ්ඨානය යි.

දුක් වේදනාව වින්දයුතු ස්පර්ශය දුක්වේදනාවට අධිෂ්ඨානයයි. අදුක්ඛමසුඛ වේදනාව වින්දයුතු ස්පර්ශය අදුක්ඛමසුඛ වේදනාවට අධිෂ්ඨානයයි. ආසන්න කාරණය යන අර්ථයයි. වේදනාව කුමකට පදට්ඨානය (ආසන්න කාරණය) වේද, 'වේදනා පච්චයා තණ්හා' යන වචනයෙන් තණ්හාවට ආසන්න කාරණය වෙයි. පැතීමට සුදුසු බැවින් සැපවේදනාව පළමුව තණ්හාවට ආසන්න කාරණය වේවා. අනිත්වා (දුක ආදිය) කෙසේ ද? (මෙසේ පිළිතුරු) කියනු ලැබේ. සැපයෙන් යුක්ත පුද්ගලයා ද එයට සමාන වූ හෝ ඊට වඩා උසස් වූ හෝ සැපය ප්‍රාර්ථනා කරයි. දුකෙන් මැඩගත් පුද්ගලයා ගැන කියනුම කවරේද? අදුක්ඛමසුඛ වේදනාව ද ශාන්තභාවයෙන් සැපය යි කියනු ලැබේ. මෙසේ වේදනා තුනම තණ්හාවට ආසන්න කාරණය යි.

3. උප්පත්ති යනු උත්පත්ති කාරණයයි. ඉෂ්ටාරම්මණ වූ සත්ත්ව-සංඛාර සැප වේදනාවට උත්පත්ති කාරණයයි. අනිෂ්ටාරම්මණ වූ ඒවාම (සත්ත්වයන් හා සංස්කාරයන්) දුක්වේදනාවට උත්පත්ති කාරණයයි. මධ්‍යස්ථාරම්මණ වූ ඒවාම අදුක්ඛමසුඛ වේදනාවට උත්පත්ති කාරණයයි. මෙහි විපාක වශයෙන් ද ඒ ආකාර ගැනීමෙන් ද ඉටු අනිටු බව දතයුතුය.

4. අනුසය යනු මේ වේදනා තුන අතුරෙන් සුඛ වේදනාවෙහි රාග අනුසය අතනොහැර පවතී. දුක්වේදනාවෙහි පටිඝ අනුසය අතනොහැර පවතී. අදුක්ඛමසුඛ වේදනාවෙහි අවිද්‍යා අනුසය අතනොහැර පවතී. **'සුඛාය ඛො ආවුසො විසාඛ වෙදනාය රාගානුසයො අනුසෙති'** 'ඇවැත් විසාඛයෙනි, සුඛ වේදනාවෙහි රාගානුසය අතනොහැර පවතී' යනාදී මෙය කියන ලදී. දිට්ඨි-මාන අනුසය ද මෙහි රාග පක්ෂයෙහි ඇතුළත් කළයුතුය. සැපයට සතුටුවීමෙන් (සුඛාභිනන්දනයෙන්) දෘෂ්ටි ගතිකයෝ ශාස්වතය යනාදියෙන් සක්කායෙහි බැසගනිති. මානයෙන් යුක්ත වූවෝ මම උසස් වෙමි ආදියෙන් මානය කියති. විචිකිච්ඡා අනුසය වනාහි අවිද්‍යා පක්ෂයෙහි ඇතුළත් කළයුතුය. ඒ බව පටිච්ච සමුප්පාද විභංගයෙහි 'වෙදනා පච්චයා විචිකිච්ඡා' යනුවෙන් කියන ලදී. ඒ ඒ සිතෙහි අනුසය අප්‍රහීණභාවයෙන් ශක්තිමත් බවට යයි. එහෙයින් මාර්ගයෙන් ප්‍රහීණ නොවූ බැවින් සුඛ වේදනාවෙහි රාගානුසය අතනොහැර පවතී. අනුරූප වූ කරුණු ලැබීමෙහි දී ඉපදීමට සුදුසු වූ රාගය එහි නිදාගත්තාක් මෙන් වේ යන අර්ථයි. සෙස්සෙහි ද මේ ක්‍රමය යි.

5. ඨානං යනු කය ද සිත ද වේදනාවට තැනයි. **'යං තස්මිං සමයෙ කායිකං සුඛං කාය සම්ඵස්සජං, සාතං සුඛං වෙදයිතං, යං තස්මිං සමයෙ චෙතසිකං සුඛං චෙතො සම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං'**

'එසමයෙහි යම් කායික සැපයක් කාය ස්පර්ශයෙන් උපන් මිහිරි වූ විඳින සැපයක් ඇද්ද එසමයෙහි යම් චෛතසික සැපයක් චෛතසික ස්පර්ශයෙන් උපන් මිහිරි වූ විඳින සැපයක් ඇද්ද' යන මෙය කියන ලදී.

6. පවත්තිකාලො යනු පවතින මොහොත ද පැවැත්මෙහි දැනීම ද යනුයි. පවතින මොහොතෙහි වනාහි සැපදුක් වේදනාවන්ගේ සැප දුක් බව නියම කරන ලද්දේ වෙයි. **'සුඛා ඛො ආවුසො විසාඛ වේදනා ඨිතිසුඛා, විපරිනාම දුක්ඛා, දුක්ඛා ඛො ආවුසො විසාඛ වෙදනා ඨිති දුක්ඛා විපරිනාම සුඛා'** 'ඇවැත් විසාඛයෙනි, සුඛ වේදනාව පැවතීම සැපය. පෙරළීම දුකය. ඇවැත් විසාඛයෙනි, දුක්ඛ වේදනාව පැවතීම දුකය. පෙරළීම සැපය'යි කීයේ එසේය. සැපවේදනාවේ ඇති බව සැපය. නැති බව දුකය. දුක්වේදනාවේ ඇති බව දුකය. නැති බව සැපය යන අර්ථයි. අදුක්ඛමසුඛ වේදනාවේ (පවත්තනාකලනං පවත්තියා ආකලනං අනාකලනං =) පැවැත්මෙහි දැනීම ද නොදැනීම ද සැප දුක් බව නියම කිරීම කරයි. **'අදුක්ඛමසුඛා ඛො ආවුසො වෙදනා ඤාණ සුඛා අඤ්ඤාණ දුක්ඛා'** 'ඇවැත්නි, අදුක්ඛමසුඛ වේදනාව දැනීම සැපය නොදැනීම දුකය'යි මෙය කියන ලදී.

7. ඉන්ද්‍රිය යනු මේ සැප ආදී වේදනා තුන සුඛ ඉන්ද්‍රිය, දුක්ඛ ඉන්ද්‍රිය, සෝමනස්ස ඉන්ද්‍රිය, දෝමනස්ස ඉන්ද්‍රිය, උපෙක්ඛා ඉන්ද්‍රිය යනුවෙන් අධිපති අර්ථයෙන් ඉන්ද්‍රිය වශයෙන් පස්වැදෑරුම්කොට බෙදන ලදී. කායික සැපය වනාහි සුඛ ඉන්ද්‍රියයි කියන ලදී. කායික දුක දුක්ඛ ඉන්ද්‍රිය යයි කියන ලදී. මානසික සැපය සෝමනස්ස ඉන්ද්‍රියය යි කියන ලදී. මානසික දුක දෝමනස්ස ඉන්ද්‍රිය යයි කියන ලදී. සැපත් නොවන දුකත් නොවන දෙයාකාරය ම උපෙක්ඛා ඉන්ද්‍රියයි කියන ලදී. කායික චෛතසික සුඛ-දුක්ඛ වේදනා සුඛින්ද්‍රිය, සොමනස්සින්ද්‍රිය, දුක්ඛින්ද්‍රිය, දෝමනස්සින්ද්‍රිය යනුවෙන් බෙදා කියන ලදී. අදුක්ඛමසුඛ වේදනාව එසේ නොකියන ලදී. මෙහිලා කාරණය කුමක් ද? භේදයක් නැති බැවිනි. සැපදුක් වේදනාවෝ

අනුග්‍රහ ස්වභාවයෙන් ද පැසවන (බාධක*) ස්වභාවයෙන් ද කයට අනුග්‍රහයත් පැසවීමත් (බාධාවත්*) වෙනත් අයුරකින් කරති. සිතට වෙනත් අයුරකිනි. අදුක්ඛමසුඛ වේදනාව එසේ නොවේ. එහෙයින් භේදයක් නැති බැවින් බෙදා නොකියන ලදී.

8. ද්විධාදිතා යනු සියලු වේදනා විඳිනු ලබන අර්ථයෙන් එක් ආකාරය. ඇසුරුකරන ආකාරයෙන් කායික, චෛතසික යනුවෙන් දෙපරිදිය. සුඛ-දුක්ඛ-අදුක්ඛමසුඛ යනුවෙන් තෙපරිදිය. සතරයෝනි වශයෙන් සිවු වැදෑරුම්ය. ඉන්ද්‍රිය වශයෙන් ද ගති වශයෙන් ද පස්වැදෑරුම්ය. ද්වාර වශයෙන් ද අරමුණු වශයෙන් ද සයවැදෑරුම්ය. සත්තවිඤ්ඤාණ ධාතු යෝගයෙන් සත් ආකාරය. අටලෝ දහමට ප්‍රත්‍ය වන බැවින් අටවැදෑරුම්ය. සැප ආදියට වෙන්වෙන්ව අතීත ආදී බෙදීමෙන් නව වැදෑරුම්ය. ඒවා ම ආධ්‍යාත්ම - බාහිර භේදයෙන් දහඅට වැදෑරුම්ය. එසේම රූපාදී අරමුණු හය අතුරින් එක එකක සැප ආදී වශයෙන් තුන තුන බැගින් යෙදීම කොට රූපාරම්මණයෙහි සැප වේදනාව ද උපදී, දුක් වේදනාවද උපදී, අදුක්ඛමසුඛ වේදනාවද උපදී. අනිත් ඒවාහිද එසේය. නැතහොත් අට්ඨාරස මනෝපවිචාර (මනෝපවිචාර දහඅට) වශයෙන් දහඅටකි. **'චක්ඛුනා රූපං දිස්වා සොමනස්සට්ඨානීයං රූපං උපවිචරති දොමනස්සට්ඨානීයං උපෙක්ඛට්ඨානීයං රූපං උපවිචරති. සොතෙන සද්දං -පෙ- මනසා ධම්මං විඤ්ඤාය සොමනස්සට්ඨානීයං උපවිචරති'**

'සොම්නසට හේතු වූ රූපයක් ඇසින් දැක රූපය විචාරයට ලක්කරයි. දොම්නසට හේතු වූ රූපයක් - උපේක්ෂාවට හේතු වූ රූපයක් විචාරයට ලක් කරයි. කණෙන් ශබ්දයක් -පෙ- මනසින් සොම්නසට හේතු වූ ධර්මයක් දැන විචාරයට ලක් කරයි' යනුවෙන් කියන ලදී. මෙසේ දහඅට ආකාර වෙයි. එසේම රූපාදී කාම ගුණ ඇසුරුකොට ඇති (ගේහසිත) සොම්නස් හයයි. ගේහසිත දොම්නස් හයයි. ගෙහසිත උපේක්ෂා හයයි. එසේම විදර්ශනාව ඇසුරුකොට ඇති (නෙක්ඛම්ම සිත) සොම්නස් ආදිය යනුවෙන් මෙසේ තිස්හය ආකාර වෙයි. අතීතයෙහි තිස්හයයි, අනාගතයෙහි තිස්හයයි, වර්තමානයෙහි තිස්හයයි යනුවෙන් එකසිය අටක් වෙයි. මෙසේ මෙහි දෙයාකාර ආදිය (ද්විධාදිතාව) දතයුතුය.

**ප්‍රකීර්ණක කථාව නිමියේ ය.**

---

* මේ ඡට්ඨ සංගායනා පිටපතෙහි ඇති බාධක සභාවා, බාධකත්ත්‍ව යන වචනවල අර්ථය. ඒවා වඩා සුදුසුයයි හැඟේ.

ගාථාවන්හි - **සමාහිතො** යනු උපචාර අර්පණා භේද ඇති සමාධියෙන් සන්සුන් වූ. එයින් සමථ භාවනාවෙහි යෙදීම දක්වයි. **සම්පජානො** යනු සාත්ථක සම්පජඤ්ඤ ආදී වූ සිවුවැදෑරුම් සම්පජඤ්ඤයෙන් යහපත් ආකාරයෙන් අනිත්‍යාදිය දනිමින්, එයින් විදර්ශනාවෙහි යෙදීම දක්වයි. **සතො** යනු සිහි ඇති, එයින් සමථ විදර්ශනා ක්‍රමයෙන් ධර්ම භාවනාව පරිපූර්ණත්වයට යයි. එයින් යුක්ත බව දක්වයි. **වෙදනා ච පජානාති** යනු මේ වේදනා මෙපමණයයිද වේදනාදිය ස්වභාව වශයෙන් ද විභාග වශයෙන් ද අනිත්‍යය, දුක්ය, පෙරළෙන ධර්මයන්ය යනුවෙන් අනිත්‍යාදි ලක්‍ෂණ වශයෙන් ද පූර්වභාගයෙහි පරිඥ්ඥා තුනෙන් දැනගනිමින් විදර්ශනා වඩා ආර්යමාර්ගයෙන් පරිඥ්ඥා ප්‍රතිවේධ යෙන් දැනගනියි. **වෙදනානඤ්ච සම්භවං** යනු සමුදය සත්‍යයයි. **යත්ථචෙතා නිරුජ්ඣන්ති** යනු මෙපමණකින් වේදනාවෝ යම්තැනක නිරුද්ධ (නැති) වෙත් ද එය නිරෝධ සත්‍යයයි. **ඛයගාමිනං** යනු වේදනාවන් විනාශයට යාම, ආර්ය **මග්ගඤ්ච** මාර්ගය ද දැනගනියි යනු සම්බන්ධ වෙයි. **වෙදනානං ඛයා** යනු මෙසේ චතුස්සත්‍යයන් අවබෝධ කරන්නා වූ ආර්ය මාර්ගයෙන් වේදනාවන්ගේ අනුත්පාද නිරෝධයෙන් (නැවත නූපදින ලෙස නැති කිරීමෙන්). **නිච්ඡාතො පරිනිබ්බුතො** තෘෂ්ණාව නැත්තේ පහකළ තණ්හාව ඇත්තේ ක්ලේශ පරිනිර්වාණයෙන් ද ස්කන්ධ පරිනිර්වාණයෙන්ද පිරිනිවියේ වෙයි.

**තෙවන සූත්‍රයයි.**

# 3.1.4

සතරවන සූත්‍රයෙහි **දුක්ඛතො දට්ඨබ්බා** යනු සැප වේදනාව විපරිනාම දුක්ඛ (වෙනස්වන දුක්) වශයෙන් දුකයයි නුවණැසින් දැකිය යුතුය. **සල්ලතො දට්ඨබ්බා** යනු ඉවතට ගැනීමට අපහසු අර්ථයෙන් ඇතුළත අනින (විදින) අර්ථයෙන් පෙළන අර්ථයෙන් දුක් බැවින් දුක්වේදනාව ශල්‍යයක් (උලක්) යයි දැකිය යුතුය. **අනිච්චතො** යනු ඇති වී

නැතිවන බැවින් උදයව්‍යය වන බැවින් ද තාවකාලික බැවින් ද නිත්‍යයට ප්‍රතිවිරුද්ධ බැවින් ද අදුක්ඛමසුඛ වේදනාව අනිත්‍යයයි දතයුතුය. ඒකාන්තයෙන් මෙහි සියලු වේදනා අනිත්‍ය වශයෙන් දැකිය යුතුය. අනිත්‍ය දර්ශනයෙන් වනාහි අතිශය අනිත්‍යයෙන් විරාගයට නිමිති වූ දුක දැකීම යන මේ අර්ථය දක්වමින් ශාස්තෘන් වහන්සේ 'සුඛා භික්ඛවෙ වෙදනා දුක්ඛතො දට්ඨබ්බා, දුක්ඛා වෙදනා සල්ලතො දට්ඨබ්බා'යි වදාළහ.

නැතහොත් පෘථග්ජනයෝ යම්තැනෙක සැපයෙහිම ඇලුණාහු ද එහි කලකිරවනු පිණිසත් එසේ කියන ලදී. එයින් මේ සංඛාර දුක්ඛතාවයෙන් දුක්බව දක්වන ලදී. 'යදනිච්චං තං දුක්ඛං' 'යමක් අනිත්‍යනම් එය දුකයි' යන විපරිනාම දුක් බව නිසා 'සුඛා භික්ඛවෙ වෙදනා දුක්ඛතො දට්ඨබ්බා' යනුවෙන් වදාරා මෙබඳු සැපයක් දුක ද නැතිනම් කෙබඳුදැයි සිතන්නවුන්ට දුක්ඛදුක්ඛතාවෙන් 'දුක්ඛා වෙදනා සල්ලතො දට්ඨබ්බා'යි වදාළහ. අනික වනාහි සංඛාර දුක්ඛතාවෙන් ම දුකයයි දක්වමින් 'අදුක්ඛමසුඛා වෙදනා අනිච්චතො දට්ඨබ්බා'යි වදාළහ. මෙහි ද 'සුඛා වෙදනා දුක්ඛතො දට්ඨබ්බා' 'සැප වේදනාව දුක් වශයෙන් දතයුතුය' යන මෙයින් රාගය සහමුලින් නසන උපාය දක්වන ලද්දේ ය. සැපවේදනාවෙහි වනාහි රාග අනුසය අත්නොහැර පවතී. 'දුක්ඛා වෙදනා සල්ලතො දට්ඨබ්බා' දුක්වේදනාව උලක් ලෙස දතයුතුය' යන මෙයින් ද්වේෂය සහමුලින් නසන උපාය දක්වන ලද්දේය. දුක්වේදනාවෙහි වනාහි පටිඝානුසය අතනොහැර පවතී. 'අදුක්ඛමසුඛා වෙදනා අනිච්චතො දට්ඨබ්බා' අදුක්ඛමසුඛ වේදනාව අනිත්‍ය වශයෙන් දතයුතුය' යන මෙයින් මෝහය සහමුලින් නසන උපාය දක්වන ලද්දේය. අදුක්ඛමසුඛ වේදනාවෙහි වනාහි අවිද්‍යා අනුසය අතනොහැර පවතී. එසේම පළමුවැන්නෙන් සුඛාස්වාදයට හේතුවන බැවින් තෘෂ්ණා සංක්ලේශයේ ප්‍රහාණය දක්වන ලදී. ඇති තතු දුක නොදන්නාහු එය පවත්වාගැනීම පිණිස දුසිරිතෙහි හැසිරෙති. (එහෙයින්) දෙවැන්නෙන් දුශ්චරිත සංක්ලේශයේ ප්‍රහාණය දක්වන ලදී. අනිත්‍ය වශයෙන් දකින්නහුගේ දෘෂ්ටි සංක්ලේශය අභාවයෙන් ද දෘෂ්ටි සංක්ලේශයට අවිද්‍යාව නිමිති වන බැවින් ද අදුක්ඛමසුඛ වේදනාව අවිද්‍යාව නිමිතිකොට ඇති බැවින් ද තෙවැන්නෙන් දෘෂ්ටි සංක්ලේශයේ ප්‍රහාණය දක්වන ලදී. පළමුවැන්නෙන් විපරිණාම දුක්ඛ පරිඤ්ඤාව හෝ වෙයි. දෙවැන්නෙන් දුක්ඛදුක්ඛ පරිඤ්ඤාව ද තෙවැන්නෙන් සංඛාර දුක්ඛ පරිඤ්ඤාව ද වෙයි. (නැතහොත්) පළමුවැන්නෙන් ඉෂ්ටාරම්මණ පරිඤ්ඤාව (පිරිසිඳ දැනීම) ද දෙවැන්නෙන් අනිෂ්ටාරම්මණ පරිඤ්ඤාව ද තෙවැන්නෙන්

මධ්‍යස්ථාරම්මණ පරිඤ්ඤාව ද වෙයි. තදාරම්මණ ධර්මයන්හි නොඇලුණු කල්හි අරමුණු ද නොඇලුණේම වෙයි.

නැතහොත් පළමුවැන්නෙන් රාග ප්‍රහාණය ප්‍රකාශ කිරීමෙන් දුක්ඛානුපස්සනාවෙන් අප්පණිහිත විමොක්ඛය දක්වන ලද්දේය. දෙවැන්නෙන් දෝෂ ප්‍රහාණය ප්‍රකාශ කිරීමෙන් අනිත්‍යානුපස්සනාවෙන් අනිමිත්ත විමෝක්ඛය ද තෙවැන්නෙන් මෝහ ප්‍රහාණය ප්‍රකාශ කිරීමෙන් අනත්තානුපස්සනාවෙන් සුඤ්ඤත විමොක්ඛය ද දක්වන ලද්දේ යයි දතයුතුය.

**යතො** යනු යම්කලෙක හෝ යම්හෙයකින් **අරියො** යනු කෙලෙසුන්ගෙන් දුර සිටියේ, පිරිසිදු වූයේ. **සම්මද්දසො** යනු සියලු වේදනාවන් හෝ චතුසත්‍යය නොවෙනස් ලෙස දකින්නා. **අච්ඡෙච්ඡි තණ්හං** යනු වේදනාවට මුල් වූ තණ්හාව අග්‍ර (අර්හත්) මාර්ගයෙන් සින්දේය. අනවසේස වශයෙන් සහමුලින් සින්දේය. **වාවත්තයී සංයොජනං** යනු දසවිධ සංයෝජන පෙරළා හැරියේය. මුල් නැති කළේය. **සම්මා** යනු හේතුවෙන්, කාරණයෙන්. **මානාභිසමයා** යනු මානයේ දර්ශන අභිසමය හෝ ප්‍රහාණ අභිසමය. අර්හත් මාර්ගය වනාහි කෘත්‍ය වශයෙන් මානය දකියි. මේ ඔහුගේ දස්සන අභිසමය යි. එයින් (අර්හත් මාර්ගයෙන්) දක්නා ලද එය (මානය) වනාහි ඍද්ධිමත් නාගයන් දැකීම නිසා ඇතිවන විස කරණකොට එම නාගයන් දක්නා ලද සත්ත්වයන්ගේ* ප්‍රාණය (ජීවිතය) නිරුද්ධ වන්නාක් මෙන් (දිට්ඨ විසෙන දිට්ඨසත්තානං ජීවිතං විය) එකෙණෙහි ම ප්‍රහීණ වෙයි. මෙය ඔහුගේ ප්‍රහාණ අභිසමය යි.

**අන්තමකාසි දුක්ඛස්ස** යනු මෙසේ අර්හත් මාර්ගයෙන් මානය දක්නා ලද බැවින් ද ප්‍රහීණ වූ බැවින් ද සියලු ම සංසාර දුක්ඛයාගේ කෙළවර නම් වූ අන්තය පිරිසිඳීම වටකිරීම කළේය. දුක අන්තිම ශරීරයට පමණක් ඉතිරි කළේයයි කියන ලද්දේ වෙයි.

ගාථාවන්හි - **යො** යනු යම් ආර්ය ශ්‍රාවකයෙක්. **අද්දක්ඛි** යනු දුටුවේය. සැප වේදනාව දුක් වශයෙන් දුටුවේය යන අර්ථයි. සැප වේදනාව

---

* **දට්ඨවිසේන දට්ඨසත්තානං ම.නි. - අ. 1භා - හේවා.වි.මු. 80 පිට** (සර්පයකු) දෂ්ට (කළවිට ශරීර ගතවන) විෂෙන් දෂ්ට (කරනු ලැබූ) සත්ත්වයන්ගේ

වනාහි විෂ මිශ්‍ර ආහාරයක් මෙන් පරිභෝග කාලයෙහි ආශ්වාදය දෙමින් වෙනස් වූ කාලයෙහි දුකම වෙයි. **දුක්ඛමද්දක්ඛි සල්ලතො** යනු උලක් ශරීරයට ඇතුල්වීමත්, (සිරුරෙහි) තිබීමත්, (සිරුරෙන්) උදුරාදැමීමත් පීඩාවක්ම ඇතිකරන්නේ යම් සේ ද එසේම දුක් වේදනාව ඉපදීමද පැවතීමද බිඳීයාම ද බාධා කරන්නේමය. එය උලක් වශයෙන් දුටුවේයයි කියන ලදී. **අදුක්ඛි නං අනිච්චතො** යනු සැප දුක් දෙකට වඩා ශාන්ත ස්වභාවය ඇති බැවින් වඩා ශාන්ත වූ ඒ අදුක්ඛමසුඛය අනිත්‍යය කෙළවරකොට ඇති බැවින් අනිත්‍ය වශයෙන් දුටුවේය. **සවෙ සම්මද්දසො** යනු හෙතෙම මෙසේ ත්‍රිවිධ වේදනාවන් මනාව දුක් ආදී වශයෙන් දකින්නේ. **යතො** යනු යම්හෙයකින්. **තත්‍ථ** යනු වේදනාවෙහි. **විමුච්චති** යනු සමුච්ඡේද විමුක්ති වශයෙන් මිදෙයි. යම්හෙයකින් සැප ආදිය දුක් ආදී වශයෙන් දුටුවේ ද එහෙයින් ඒ වේදනාව හා බැඳුණු ඡන්දරාග ප්‍රහාණයෙන් සමුච්ඡේද වශයෙන් ඒ වේදනාවෙන් මිදෙයි යන්න කියන ලදී. 'යං' ශබ්දය කී කල්හි 'තං' ශබ්දය ගෙනවුත් කිවයුතුය. නැතහොත් 'යතො' යනු කයින්-වචනයෙන්-සිතින් සංයත වූයේ හික්මුණේ. උත්සාහ කරයි, බලවත් ලෙස උත්සාහ කරයි යන අරුතින් යත නම් වේ. උත්සාහ කෙරෙයි යන අර්ථයයි.

**අභිඤ්ඤා වොසිතො** යනු වේදනා මුඛයෙන් චතුසත්‍ය කර්මස්ථානය වඩා ෂට් අභිඥාවෙන් නිමවන ලද කෘත්‍ය ඇති. **සන්තො** යනු රාගාදී කෙලෙස් සන්සිඳුවීමෙන් ශාන්ත වූ. **යොගාතිගො** යනු කාමයෝගාදී සතර වැදෑරුම් යෝගය ඉක්මවූ. (ලෞකික ලෝකෝත්තර වූ) උභය යහපත අවබෝධ කිරීමෙන් මුනි නම් වේ.

**සිවුවන සූත්‍රය යි.**

# 3.1.5

පස්වන සූත්‍රයෙහි **එසනා** යනු ගවේෂණය යි. පර්යේෂණය යි. සෙවීමයි. එය විභාග වශයෙන් දක්වන්නට 'කාමෙසනා' යනාදිය කියන ලදී. එහි **කාමෙසනා** යනු කාමයන් සෙවීම හෝ කාම කොටස් සෙවීම හෝ කාමෙසනාව ය. මේ කාරණය මෙසේ කියන ලදී :

**'තත්ථ කතමා කාමෙසනා? යො කාමෙසු කාමච්ඡන්දො කාමරාගො කාම නන්දි කාම සිනෙහො කාම පිපාසා කාම මුච්ඡා කාමජ්ඣොසානං අයං වුච්චති කාමෙසනා'**[1]

'එහි කාමේසනාව යනු කුමක් ද? කාමයන්හි යම් කාමච්ඡන්දයක් වේද කාමරාගයක් වේද කාම නන්දියක් වේද කාම ස්නේහයක් වේද කාම පිපාසයක් වේද කාම මූර්ඡාවක් වේද කාමජ්ඣොසානයක් (කාමයට බලවත් ඇල්මක්) වේද මෙය කාමේසනාවය යි කියනු ලැබේ.' එහෙයින් කාමරාගය කාමේසනාව යයි දතයුතුය.

භවේසනාවෙහි ද මේ ක්‍රමයම ය. මේ කාරණය ද මෙසේ කියන ලදී.

**'තත්ථ කතමා භවෙසනා? යො භවෙසු භවච්ඡන්දො -පෙ- භවජ්ඣොසානං අයං වුච්චති භවෙසනා'**[1]

'එහි භවේසනාව යනු කුමක් ද? භවයන්හි යම් භවච්ඡන්දයක් වේද -පෙ- භවජ්ඣොසානයක් වේද මෙය භවේසනාවය යි කියනු ලැබේ.' එහෙයින් භවය සොයන රාගය රූප අරූප භව පැතීම භවේසනාවයයි දතයුතුය.

බ්‍රහ්මචරිය පිළිබඳ සෙවීම බ්‍රහමචරියෙසනා නම් වේ. **'තත්ථ කතමා බ්‍රහමචරියෙසනා? සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා අන්තවා ලොකොති වා අනන්තවා ලොකොති වා තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා හොති තථාගතො පරම්මරණාති වා න හොති තථාගතො පරම්මරණාති වා හොති ච න ච හොති**

1. විභංගප්පකරණය - ඛුද්දක වත්ථු විභංගය - බු.ජ.මු 2 භා - 224 පිට

**තථාගතො පරම්මරණාති වා නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා යා එවරූපා දිට්ඨි, දිට්ඨිගතං, දිට්ඨිගහණං, දිට්ඨිකන්තාරො, දිට්ඨි විසූකායිකං, දිට්ඨිවිප්ඵන්දිතං, දිට්ඨි සංයෝජනං, ගාහො, පතිට්ඨාහො, අභිනිවෙසො, පරාමාසො, කුම්මග්ගො, මිච්ඡාපථො, මිච්ඡත්තං, තිත්ථායතනං, විපරියෙසගාහො අයං වුච්චති බ්‍රහ්මචරියෙසනා'**[1]

'එහි බ්‍රහ්මචරිය පිළිබඳ සෙවීම යනු කුමක් ද? ලෝකය ශාස්වතය කියා හෝ ලෝකය අශාස්වතය කියා හෝ ලෝකය අන්තවත්ය කියා හෝ ලෝකය අනන්තවත්ය කියා හෝ ආත්මයත් ශරීරයත් එකකැයි කියා හෝ ආත්මය අනිකකි, ශරීරය අනිකකි කියා හෝ සත්ත්වයා මරණින් පසු වෙයි කියා හෝ සත්ත්වයා මරණින් පසු නොවෙයි කියා හෝ සත්ත්වයා මරණින් පසු වෙයි ද නොවෙයි ද කියා හෝ සත්ත්වයා මරණින් පසු නොවෙයි, නොවන්නේ නොවෙයි කියා හෝ මෙබඳු වූ යම් (අසත්‍ය ලෙස දැකීම් අරුතින්) දෘෂ්ටියක්, (දෙසැටක් දෘෂ්ටිවලට ඇතුළත් හෙයින්) දෘෂ්ටිගතයක්, (වනගහනයක් මෙන් ඉක්මවීමට අපහසු හෙයින්) දෘෂ්ටි ගහනයක්, (සොරුන් ඇති, ජලය නැති කාන්තාරයක මෙන් සැක බිය ඇති හෙයින්) දෘෂ්ටි කාන්තාරයක්, (සම්මා දිට්ඨියෙන් විනිවිද දැකීමට විරුද්ධ අර්ථයෙන්) දෘෂ්ටි විසූකයක්, (දෘෂ්ටියෙන් විරූප ලෙස සෙලවුණු හෙයින්) දෘෂ්ටි විස්ඵන්දිතයක්, (අනිත්‍ය දේ නිත්‍යය ආදී වශයෙන් දැඩි ලෙස ගැනීම වූ) දෘෂ්ටි අභිනිවේශයක්, (අනිත්‍ය දේ නිත්‍යය ආදී වශයෙන් ගැනීම වූ) පරාමාසයක්, (වැරදි මගට බැසගත් හෙයින්) කුම්මග්ගයක්, (වැරදි මාර්ගයක් හෙයින්) මිච්ඡාපථයක්, (බොරු බවක් හෙයින්) මිච්ඡත්තයක්, (දෘෂ්ටි උපදින තැනක් හෙයින්) තිත්ථායතනයක්, (වැරදි ලෙස ගැනීමක් හෙයින්) විපරියෙසගාහයක් වේද මෙය බ්‍රහ්මචරියෙසනාවයයි කියනු ලැබේ. එහෙයින් දෘෂ්ටිගත සම්මතය ඇති බ්‍රහ්මචරිය පිළිබඳ සෙවීම දිට්ඨි බ්‍රහ්මචරියේසනාවය යි දතයුතුය. මෙපමණකින් රාග දෘෂ්ටීහු ඒසනාවය යි දක්වන ලද්දාහු වෙති. හුදෙක් රාග දෘෂ්ටීම ඒසනාව නොවේ. එය හා එක්ව සිටි කර්මය ද ඒසනා නම් වේ. මේ කාරණය මෙසේ කියන ලදී. :- '**තත්‍ථකතමා කාමෙසනා? කාමරාගො තදෙකට්ඨං අකුසලං කායකම්මං වචීකම්මං මනොකම්මං අයං වුච්චති කාමෙසනා**'[1] 'එහි කාමේසනාව කුමක්ද? කාමරාගය ද එය හා එක්ව සිටි අකුශල කාය කර්මය වචී කර්මය මනෝ කර්මය යන මෙය කාමේසනාව යයි කියනු ලැබේ.

---

1. විභංගප්පකරණය - ඛුද්දක වත්‍ථු විභංගය - බු.ජ.මු 2 භා - 224 පිට

**'තත්ථ කතමා භවෙසනා? භවරාගො තදෙකට්ඨං අකුසලං කායකම්මං වචීකම්මං මනොකම්මං අයං වුච්චති භවෙසනා'**[1]

'එහි භවේසනාව කුමක්ද? භවරාගය ද එය හා එක්ව සිටි අකුසල කාය කර්මය වචී කර්මය මනෝ කර්මය යන මෙය භවේසනාවය යි කියනු ලැබේ.'

**'තත්ථ කතමා බ්‍රහ්මචරියෙසනා? අන්තග්ගාහිකා දිට්ඨි තදෙකට්ඨං අකුසලං කායකම්මං වචීකම්මං මනොකම්මං අයං වුච්චති බ්‍රහ්මචරියෙසනා'**[2]

'එහි බ්‍රහ්මචරියේසනාව කුමක් ද? අන්තග්ගාහික දෘෂ්ටිය ද එය හා එක්ව සිටි අකුශල කාය කර්මය වචී කර්මය මනෝ කර්මය යන මෙය බ්‍රහ්මචරියේසනාවයයි කියනු ලැබේ' යනුවෙන් මෙසේ මේ ඒසනා තුන දතයුතුය.'

ගාථාවන්හි - **සම්භවං** යන මෙහි ඒසනාවන්ගේ උත්පත්තියට හේතු වූ අවිද්‍යාදිය හෝ තණ්හාව හෝ සම්භවය යි. සමුදය (හටගැනීම) යන අර්ථයි. **යත්ථ චෙතා නිරුජ්ඣන්ති** යනු බ්‍රහ්මචරිය ඒසනාව ප්‍රථම මාර්ග ඥානයෙන් (සෝවාන් මාර්ග ඥානයෙන්) නිරුද්ධ වෙයි. කාමේසනාව අනාගාමි මාර්ග ඥානයෙන් නිරුද්ධ වෙයි. භවේසනාව අර්හත් මාර්ගයෙන් නිරුද්ධ වෙයි යනුවෙන් දතයුතුය. ඉතිරිය කියන ලද ආකාරයෙන්ම ය.

**පස්වන සූත්‍රයයි.**

## 3.1.6

සයවැනි සූත්‍රයෙහි **බ්‍රහ්මචරියෙසනා සහ** යනු බ්‍රහ්මචරියෙසනාය සද්ධිං, විභක්ති ලෝපයෙන් මෙය දක්වා ඇත. මෙය කරණ අර්ථයෙහි

---

1 , 2. විභංගප්පකරණය - ඛුද්දක වත්ථු විභංගය - බු.ජ.මු 2 භා - 224 පිට

ප්‍රථමා විභක්ති වචනය හෝ වෙයි. බ්‍රහ්මචරියේසනාව සමග කාමේසනාව භවේසනාවදැයි ඒසනා තුනකි යන මෙය කියන ලද්දේ වෙයි. ඒවා අතරින් බ්‍රහ්මචරියේසනාව ස්වරූප වශයෙන් දක්වන්නට **ඉති සච්චපරාමාසො දිට්ඨිට්ඨානා සමුස්සයා** යනුවෙන් කියන ලදී. එහි අර්ථය: ඉති එවං සච්චන්ති පරාමාසො = ඉතිසච්ච පරාමාසො. මෙය ම සත්‍යය, අනිත්වා අසත්‍යයයි දෘෂ්ටිය පැවති ආකාරය දක්වයි. දෘෂ්ටීහුම සියලු අනර්ථයනට හේතුවන බැවින් දිට්ඨිට්ඨාන නම් වෙති. **'මිච්ඡාදිට්ඨි පරමාහං භික්ඛවෙ වජ්ජං වදාමි'** 'මහණෙනි, මිථ්‍යාදෘෂ්ටිය ඉහළම වරදයයි මම කියමි' යනුවෙන් ඒ කාරණය කියන ලදී. ඒ මිථ්‍යාදෘෂ්ටියම මතු මත්තෙහි වැඩෙමින් ලෝභාදී කෙලෙස් සමූහ වශයෙන් උපදවන්නා වූ මෙයම සත්‍යය ය අනිත්වා අසත්‍යයයි මිථ්‍යාවට බැසගන්නා වූ සියලු අනර්ථයන්ට හේතු වූ කෙලෙස් දුක් ඉපදවීමට හේතු වූ දෘෂ්ටීහු බ්‍රහ්මචරියේසනාවයයි කියන ලද්දේ වෙයි. මෙයින් පවතින ආකාර වශයෙන් ද ඉපදීම් වශයෙන් ද බ්‍රහ්මචරියේසනාව දක්වන ලදැයි දතයුතුය.

**සබ්බරාග විරත්තස්ස** යනු සියලුම කාමරාග භවරාගයන්හි නොඇලුණු එහෙයින් ම තෘෂ්ණාව ක්ෂයකිරීම නම් වූ නිවනෙහි (නිවන අරමුණුකොට) කෙලෙසුන්ගෙන් මිදුණු බැවින් **තණ්හක්ඛය විමුත්තිනො** තණ්හක්ඛය විමුත්ති නම් වූ රහතන් වහන්සේ විසින්. **එසනා පටිනිස්සට්ඨා** යනු කාමේසනාව ද භවේසනාව ද සියලු ආකාරයෙන් අත්හරින ලදී. පහකරන ලදී. **දිට්ඨිට්ඨානා සමූහතා** යනු බ්‍රහ්මචරිය ඒසනාව නම් වූ දෘෂ්ටි ද ප්‍රථම (සෝවාන්) මාර්ගයෙන් ම නසන ලදී. **එසනානං ඛයා** යනු මෙසේ මේ ඒසනා තුන ක්ෂය කිරීමෙන්, නැවත නූපදින ලෙස නිරෝධයට පත්කිරීමෙන්. බිඳුණු කෙලෙස් ඇති බැවින් **භික්ඛු** භික්ෂුව යයි ද සියලු ආකාරයෙන් ආශාවන් නැති බැවින් **නිරාසො** ආශා නැත්තෙක් යයි ද (සක්කාය) සමග යෙදුණු කෙසේද කෙසේදැයි යනුවෙන් පැවතිසැකය ද කෙසේද යන (සැකය නම් වූ සිතෙහි ඇනුණු) උල ද පහ වූ බැවින් **අකථංකථී** යයි ද කියනු ලැබේ.

**සයවැනි සූත්‍රය යි.**

# 3.1.7

සත්වන සූත්‍රයෙහි **කාමාසවො** යනු කාමයන්හි ආසවයයි. නැතහොත් කාම නම් වූ ආසවය = කාමාසවය යි. අර්ථ වශයෙන් වනාහි කාමරාගය ද රූපාදියෙහි ඇල්ම ද කාමාසවය යි. රූප අරූප භවයන්හි ඡන්දරාගය ද ධ්‍යානයට ඇති ආශාව ද ශාස්වත දෘෂ්ටි සහගත රාගය ද භව ප්‍රාර්ථනාව ද **භවාසවො** භවාසවයයි. අවිද්‍යාවම **අවිජ්ජාසවො** අවිද්‍යාසවයයි. **ආසවානඤ්ච සම්භවං** යන මෙහි අයොනිසො මනසිකාරයද (අනුවණින් මෙනෙහි කිරීම) අවිද්‍යාදී කෙලෙස් ද ආසවයන්ගේ හටගැනීමයි. මේ කාරණය මෙසේ කියන ලදී. '**අයොනිසො භික්ඛවෙ මනසිකරොතො අනුප්පන්නා, චෙව ආසවා උප්පජ්ජන්ති උප්පන්නාච ආසවා පවඩ්ඪන්ති**'

'මහණෙනි, අනුවණින් මෙනෙහි කරන්නාගේ නූපන් ආසව ද උපදී. උපන් ආසව ද වැඩෙයි.' '**අවිජ්ජා භික්ඛවෙ පුබ්බංගමා අකුසලානං ධම්මානං සමාපත්තියා අන්වදෙව අහිරිකං අනොත්තප්පං**' 'මහණෙනි, අවිද්‍යාව අකුශල ධර්මයන්ගේ පැමිණීමට පෙරටු වෙයි. අහිරික අනොත්තප්පයට ද පෙරටු වෙයි. **මග්ගඤ්ච ඛයගාමිනං** යනු ආශ්‍රවයන් ක්ෂය කරන්නා වූ ආර්ය මාර්ගය ද, එහි කාමාසවය අනාගාමි මාර්ගයෙන් පහවෙයි. භවාසවය ද අවිද්‍යාසවය ද අර්හත් මාර්ගයෙන් පහවෙයි. කාම උපාදානය මෙන් කාමාසවය ද අග්‍ර (අර්හත්) මාර්ගයෙන් විනාශ කළයුතු යයි ද කියති. ඉතිරිය කියන ලද අයුරින්ම ය.

**සත්වන සූත්‍රයයි.**

# 3.1.8

අටවන සූත්‍රයෙහි - පෙර නො කියන ලද්දක් නැත.

# 3.1.9

නවවන සූත්‍රයෙහි - තෘෂ්ණා කිරීම් අර්ථයෙන් = **තණ්හා** නම්. රූපාදි අරමුණට ආශාකරයි යන අරුතින් හෝ තණ්හා නම්. දැන් එය බෙදා දක්වන්නට 'කාම තණ්හා' යනාදිය කියන ලදී. එහි පංචකාම ගුණයට අයත් රාගය **කාමතණ්හා** නම්. රූප අරූප භවයන්හි ඡන්දරාගය, ධ්‍යානයට ඇති ආශාව ද ශාස්වත දෘෂ්ටි සහගත රාගය ද භව වශයෙන් පැතීම ද **භවතණ්හා** නම්. උච්ඡේද දෘෂ්ටි සහගත රාගය **විභව තණ්හා** නම්. තවද අවසන් තණ්හා දෙක හැර සෙසු සියලුම තණ්හා කාම තණ්හාමය. එය මෙසේ වදාළහ. '**තත්‍ථ කතමා භවතණ්හා? සස්සත දිට්ඨි සහගතො රාගො සාරාගො චිත්තස්ස සාරාගො අයං වුච්චති භව තණ්හා. තත්‍ථ කතමා විභව තණ්හා? උච්ඡෙද දිට්ඨි සහගතො රාගො සාරාගො චිත්තස්ස සාරාගො අයං වුච්චති විභවතණ්හා, අවසෙසා තණ්හා කාමතණ්හා**'[1]

'එහි භව තණ්හාව යනු කුමක්ද? ශාස්වත දෘෂ්ටි සහගත රාගයක් බලවත් රාගයක්, සිතේ බලවත් රාගයක් වේද මේ භව තණ්හාව යයි කියනු ලැබේ. එහි විභව තණ්හාව යනු කුමක්ද? උච්ඡේද දෘෂ්ටි සහගත රාගයක් බලවත් රාගයක් සිතේ බලවත් රාගයක් වේද, මේ විභව තණ්හාව යයි කියනු ලැබේ. (එයින්) අවශේෂ වූ තණ්හාව කාම තණ්හාව ය.

මේ තෘෂ්ණා තුන ද රූපතණ්හා -පෙ- ධම්ම තණ්හා යන අරමුණු භේදයෙන් වෙන් වෙන්ව සයවැදෑරුම් කොට දහඅටක් වෙයි. ඒවා ආධ්‍යාත්මික රූපාදියෙහි දහඅටක් ද බාහිර රූපාදියෙහි දහඅටක්දැයි තිස්හයක් වෙයි. මෙසේ අතීතයට තිස්හයක් ද අනාගතයට තිස්හයක් ද වර්තමානයට තිස්හයක්දැයි විභාග වශයෙන් එකසිය අටක් වෙයි. නැවත (ආපසු) සංග්‍රහ කිරීමේදී කාලභේදය නො සිතා ගන්නා වූ තණ්හාව තිස්හයක් වෙයි. රූපාදිය ආධ්‍යාත්මික බාහිර බෙදීම නොකර ගන්නා වූ තණ්හාව දහඅටක් වෙයි. රූපාදී අරමුණු බෙදීම් මාත්‍රයෙන් ගනු ලබන කල්හි හයක් ම වෙයි. අරමුණු බෙදීම ද නොකොට ගන්නා වූ තණ්හාව තුනක්ම වෙයි.

---

1. විභංගප්පකරණය - ඛුද්දක වත්‍ථු විභංගය - බු.ජ.මු 2 භා - 222 පිට

ගාථාවන්හි - **තණ්හායොගෙන** යනු තණ්හාව නම් වූ යෝගයෙන්, කාමයෝගයෙන් ද භව යෝගයෙන් ද **සංයුත්තා** යනු සම්බන්ධ වූ නැතහොත් භව ආදියෙහි මනාව යොදන ලද්දා වූ, එහෙයින් ම **රත්තචිත්තා භවාභවෙ** යනුවෙන් කීහ. කුඩා වූ ද මහත් වූ ද භවයෙහි ලැග ගත් සිත් ඇති යන අර්ථයි. නැතහොත් 'භවො' යනු ශාස්වත දෘෂ්ටියයි. 'අභවො' යනු උච්ඡේද දෘෂ්ටිය යි. එහෙයින් භවාභවෙ ශාස්වත උච්ඡේද දෘෂ්ටිවල ඇලුණු සිත්. මෙයින් භව තණ්හාව ද විභව තණ්හාව ද දක්වන ලදී. මේ කොටසෙහි **තණ්හා යොගෙන** යන මෙයින් කාමතණ්හාව දක්වන ලදැයි දතයුතුය. **තෙ යොගයුත්තා මාරස්ස** යනු ඒ මෙසේ වූ පුද්ගලයෝ මාරයාගේ පාස (තොණ්ඩුව) නම් වූ යෝගයෙන් යුක්ත වූවාහු බැඳුණාහු. රාගය වනාහි මාරයෝගය, මාරපාසයයි කියනු ලැබේ. එය මෙසේ කියන ලදී.

> **අන්තලික්ඛචරො පාසො ය්වායං චරති මානසො**
> **තෙන තං බාධයිස්සාමි න මෙ සමණ මොක්ඛසි**[1]

අහසෙහි හැසිරෙන අය පවා බැඳගන්නා වූ සිතෙහි හටගත්තා වූ යම් මේ රාග නමැති පාශයක් හැසිරේ ද, එයින් ඔබ පෙළන්නෙමි. මහණ, මාගේ විෂයෙන් නොමිදෙන්නෙහිය.

යෝග සතරෙන් උවදුරට පත් නොවූ බැවින් යොගක්ඛෙමං, (එනම්) නිවන ද අර්හත්වය ද වෙයි. එය අවබෝධ නොකිරීමෙන් අයොගක්ඛෙමිනො වෙයි. මතු මත්තෙහි කෙලෙස් අභිසංස්කාරයන් උපදවන හෙයින් = **ජනා** ප්‍රාණීහු. රූපාදියෙහි ඇලුණු යන අරුතින් **සත්තා** නම් වෙයි.

> **ඛන්ධානං පටිපාටි ධාතු ආයතනාන ච**
> **අබ්බොච්ඡින්නං වත්තමානා සංසාරොති පවුච්චති**

ස්කන්ධ - ධාතු - ආයතන යන මේවායේ පිළිවෙළ නොසිඳී පැවැත්ම සංසාරයයි කියනු ලැබේ.

---

1. සං.නි. මාර සංයුත්තය - බු.ජ.මු 1 භා - 204 පිට

මෙසේ කියන ලද ස්කන්ධාදීන්ගේ භවයෙන් භවයට යන උත්පත්ති නම් වූ **සංසාරං** සසරට යති. එයින් නො මිදෙති. කුමක් නිසාද? තණ්හා යෝගයෙන් යුක්ත බැවිනි. **ජාති මරණ** ගාමිනො නැවත නැවත ඉපදීමටත් මරණයටත් යන සුලු වූ. මෙපමණකින් සසර දක්වා දැන් නිවන දැක්වීමට 'යෙ ච තණ්හං පහනත්‍වාන' යන ගාථාව කීහ. ඒ ගාථාව මුලින් කියන ලද ක්‍රමය ඇති බැවින් මැනවින් දත හැක්කේමය.

නවවන සූත්‍රයයි.

# 3.1.10

දසවන සූත්‍රයෙහි උපත කුමක්ද? එක්දිනක් ශාස්තෘන් වහන්සේ ශෛක්‍ෂ පුද්ගලයන්ගෙන් බහුල වූ පිරිසෙන් පිරිවරන ලදුව වැඩහිඳිමින් ඔවුන්ගේ අදහස බලා මත්තෙහි විශේෂ අවබෝධයට උත්සාහය ඇතිකරවන්නට අශෛක්‍ෂ භූමිය පසසමින් මේ සූත්‍රය දේශනා කළහ. එහි 'අතික්කමම' යනාදියෙහි මේ කෙටි අර්ථය යි. **අතික්කමම** ඉක්මවා මැඩපවත්වා. **මාරධෙය්‍යං** මාරයාට ආධාරවන තැන, අධිපති තැන. **ආදිච්චොව** සූර්යයා යම්සේ වලාකුළු ආදී බාධාවන්ගෙන් මිදුණේ තමාගේ ඍද්ධියෙන්, ආනුභාවයෙන්, තේජසින් යන ගුණ තුනෙන් යුක්ත වූයේ අහසට නැගෙමින් මුළු අහසෙහි ඇති අඳුර ඉක්මවා මැඩපවත්වා විනාශ කොට **විරොචති** බබළයි ද ආලෝකය පතුරුවයි ද මෙසේම ක්‍ෂීණාශ්‍රව භික්‍ෂුව ධර්ම තුනකින් යුක්ත වූයේ සියලු බාධාවන්ගෙන් (උපක්ලේශවලින්) මිදුනේ මාරධෙය්‍ය නම් වූ (කාම-රූප-අරූප යන) භූමි තුනට අයත් ධර්මයන්ගේ පැවැත්ම මැඩගෙන බබළයි.

**අසෙක්ඛන** යන මෙහි ශික්‍ෂාවන්හි උපන් හෙයින් ශෛක්‍ෂ නම්. නැතහොත් ඒ ශික්‍ෂා ශෛක්‍ෂයන් සත්දෙනාගේය යන අරුතින් ද ශෛක්‍ෂ නම්. අවසන් නොකළ ශික්‍ෂා (හික්මීම්) ඇති බැවින් තුමූ ම හික්මෙත් යන අරුතින් ශෛක්‍ෂ නම් වේ. එනම් (සෝවාන් ආදී) මාර්ග ධර්ම (සතර) හා

මුලින් ඇති ඵලධර්ම තුනය. අග්‍රඵල ධර්ම (අර්හත්ඵල) වනාහි ඉන් මත්තෙහි හික්මීමක් නැති බැවින් ශෛක්‍ෂ නොවේ යන අරුතින් අශෛක්‍ෂ නම් වේ. යම්තැනක ශෛක්‍ෂභාවය ගැන සැකයක් ඇත්නම් මේ එහි ප්‍රතිශේධයයි ලෞකික ධර්මයන්හි ද නිවනෙහි ද අශෛක්‍ෂබව නොපැමිණීම දතයුතුය. ශීල-සමාධි-ප්‍රඥා සංඛ්‍යාත ශික්‍ෂා තමන්ට ප්‍රතිවිරුද්ධ කෙලෙස්වලින් තොර වූයේ පිරිසිදු වූයේ උපක්ලේශවල අරමුණු බවටවත් නොඑළඹීමෙන් ඉතා උසස් ශික්‍ෂා යයි කියන්නට සුදුසු වූයේ මාර්ගඵල අටෙහිම විද්‍යමාන වෙයි.

එහෙයින් සතර මාර්ගධර්ම හා මුලින් ඇති තුන් ඵලධර්ම මෙන් අර්හත් ඵලධර්ම ද ඒ ශික්‍ෂාවන්හි උපන්නේය යි ද ඒ ශික්‍ෂාවෙන් යුක්ත වූ රහතන් වහන්සේට අන් අයට මෙන් ශෛක්‍ෂභාවය ඇතිකල්හි මේ ධර්ම ශෛක්‍ෂයන්ට ඇතැයි ද හික්මෙන ස්වභාවය මොවුන්ට ඇත්තේය යනුවෙන් ද ශෛක්‍ෂය යනුවෙන් සැකයක් ඇතිවූයේ නම් ඒ සැකය නැවැත්වීම පිණිස කියන ලද ශෛක්‍ෂභාවය ප්‍රතික්‍ෂෙප කොට අශෛක්‍ෂය යි කියන ලදී.

අර්හත් ඵලයෙහි පවතින ශික්‍ෂාව වනාහි සම්පූර්ණයෙන් නිම වූ ශික්‍ෂා කෘත්‍යය ඇති බැවින් ශික්‍ෂා කෘත්‍යය නො කරයි. හුදෙක් ශික්‍ෂාඵල භාවයෙන් පවතී. එහෙයින් ඒවා ශික්‍ෂා යන වචනයට නුසුදුසුය. එයින් යුක්ත වූ තැනැත්තාට ශෛක්‍ෂ යන වචනය ද සුදුසු නොවේ. එය හා යෙදුණු ධර්ම හික්මෙන ස්වභාවයෙන් යුක්ත නොවේ. ශික්‍ෂාවන්හි උපන්නේ ද නොවේ යන මේ ආදී අර්ථවලින් අග්‍රඵල ධර්මයෝ ශෛක්‍ෂ නොවෙති. මුලින් ඇති ඵලයන්හි වූ ශික්‍ෂාවෝ සකදාගාමි මාර්ග විදර්ශනාදියට උපනිශ්‍රය (හේතු) භාවයෙන් ශික්‍ෂා කෘත්‍යය කරති යන අර්ථයෙන් ශික්‍ෂා යන වචනයට සුදුසුය. එයින් යුක්ත වූ තැනැත්තාට ද ශෛක්‍ෂ යන වචනය සුදුසුය. එය හා යෙදුණු ධර්ම ද ශෛක්‍ෂ යන වචනයට සුදුසුය. හික්මෙන ස්වභාවය ඇත්තේය යනුවෙන් ශෛක්‍ෂ ධර්මයෝ කියන ලද අර්ථවලින් ශෛක්‍ෂයෝ වෙත්ම ය.

නැතහොත් සෙක්ඛා (ශෛක්‍ෂ) යනු නො නිමි ශික්‍ෂාවන්ට වචනයකි. අසෙක්ඛා (අශෛක්‍ෂ) යන පදය නිම කළ ශික්‍ෂාවන් දක්වයි. ලෞකික ධර්ම හා නිවන අශෛක්‍ෂභාවයට පත් නොවේ. ශෛක්‍ෂයෝ ද

අශෛක්‍ෂයෝ ද වෘද්ධියට (වැඩීමට) පත්වූවාහු වෙති. ශෛක්‍ෂ ධර්මයන්හි වෘද්ධියට පත් කිසිවකුගේ අශෛක්‍ෂ බවට පැමිණීම සිදුවෙයි යන අරුතින් වෘද්ධියට පත් අර්හත් මාර්ග ධර්මයෝ කියන ලද අර්ථවලින් ශෛක්‍ෂ කර අශෛක්‍ෂ බවට පැමිණියාහු වේද? සමාන දේ තුළ එම ව්‍යවහාරය ඇති බැවින් එය (එසේ) නොවේ.

අර්හත් මාර්ගයෙන් පරිඥා ආදී කෘත්‍යකරණය ද විපාක බව ද හැර අර්හත්ඵලය නොයෙක් ආකාර නොවේ. එහෙයින් ඒ ශෛක්‍ෂ ධර්මයෝ ම අර්හත් ඵලභාවයට පැමිණියාහුය යි කීමට හැකිය. කුසල සැපයෙන් විපාක සැපය වඩාත් ශාන්ත බැවින් වඩා ප්‍රණීතය යන අරුතින් වෘද්ධියට පත් ඒ ධර්මයෝ ම අශෛක්‍ෂය යි කියනු ලැබෙත්.

ඒ අශෛක්‍ෂ ධර්මයන් ස්කන්ධ වශයෙන් මෙහි තුන් ආකාරයකට බෙදා ඒවායින් යුක්ත වීමෙන් ක්‍ෂීණාශ්‍රවයන් වහන්සේගේ ආනුභාවය පැහැදිලි කරන භාග්‍යවතුන් වහන්සේ 'අසෙකෙඛන සීලකඛන්‍ධෙන' යනාදිය වදාළහ. එහි ශීල ශබ්දයේ අර්ථ මුලදී කියන ලදී. 'ඛන්‍ධ' ශබ්දය රාශියෙහි, ප්‍රඥප්තියෙහි, රූඪියෙහි, ගුණයෙහි යන බොහෝ අර්ථවල දක්නා ලද ප්‍රයෝග ඇත්තේය (යෙදීම දක්නා ලදී). එය එසේමය. **'අසංඛෙයො අපපමෙයො මහා උදකකඛන්‍ධොතෙව සංඛං ගචඡති'** 'සංඛ්‍යාවක් නැති ප්‍රමාණයක් නැති මහා ජලකඳක් යන ගණනට යයි' යනාදියෙහි රාශි අර්ථයෙහි ආයේය. **'අද්‍දසා ඛො භගවා මහනතං දාරුකඛන්‍ධං ගංගාය නදියා සොතෙන වුය්හමානං'** 'භාග්‍යවතුන් වහන්සේ ගංගා නදියෙහි සැඩපහරින් ගසාගෙන යන මහත් දැවකඳක් දුටහ' යනාදියෙහි ප්‍රඥප්ති අර්ථයෙහි ආයේය. **'චිතතං මනො මානසං හදයං පණ්ඩරං මනො, මනායතනං විඤඤාණං විඤඤාණකඛන්‍ධො'** 'සිතය, මනසය, මානසය, හෘදය ය, පණ්ඩරය, මනසය, මනායතනය, විඥ්ඥාණය, විඥ්ඥාණස්කන්ධය ය' යනාදියෙහි රූඪියෙහි (ආරෝපනය කරන ලද අර්ථයෙහි) ආයේය. **'නඛො ආවුසො විසාඛ අරියෙන අටඨංගිකෙන මගෙගන තයො ඛන්‍ධා සංගහිතා, තීහි ච ඛො ආවුසො විසාඛ ඛන්‍ධෙහි අරියො අටඨංගිකො මගෙගා සංගහිතො'** 'ඇවැත් විසාඛයෙනි, ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් (සීල-සමාධි-ප්‍රඥා යන) ස්කන්ධ තුන සංග්‍රහ නොකරන ලදී. ඇවැත් විසාඛයෙනි, ස්කන්ධ තුනෙන් ආර්ය අෂ්ටාංගික

මාර්ගය සංග්‍රහ කරන ලදී.' යනාදියෙහි ගුණ අර්ථයෙහි ආයේය. මෙහි ද 'ගුණ' යන අර්ථයෙහිම ආ බව දතයුතුය. එහෙයින් අශෛක්‍ෂ වූ ශීල සංඛ්‍යාත ගුණයෙන් යන අර්ථයි.

**සමන්නාගතො** යනු යුක්ත වූ. මෙයින් සිත එකඟ කරයි. නැතහොත් තමා එකඟ කරයි. නැතහොත් එක්තැන් කිරීම ම 'සමාධි' නම්. (අනිත්‍යාදී) ආකාරවලින් දැනගනියි. යථා ස්වභාවය අවබෝධ කරයි යන අරුතින් පඤ්ඤා නම්. සීලයම ඛන්ධ වූයේ සීලක්ඛන්ධ නම්. ඉතිරි ඒවාහිද ඒ ක්‍රමයමයි. එහි අග්‍රඵලය වූ සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීවයද ස්වභාවයෙන් ම අශෛක්‍ෂ ශීලස්කන්ධය නම්. එසේම සම්මා සමාධිය අශෛක්‍ෂ සමාධි ස්කන්ධය යි. එයට උපකාරක වශයෙන් සම්මා වායාමයද සම්මා සතිය ද සමාධි ස්කන්ධයෙහි සංග්‍රහවට යයි.

එසේම සම්මා දිට්ඨිය ප්‍රඥා ස්කන්ධය යි. එයට උපකාරක වශයෙන් සම්මා සංකප්පය ප්‍රඥා ස්කන්ධයෙහි සංග්‍රහයට (එක්වීමට) යයි. මෙසේ මෙහි (අශෛක්‍ෂ සම්මා දිට්ඨි ආදී) අර්හත්ඵල ධර්ම අටම ස්කන්ධ තුනෙන් සංග්‍රහකොට දක්වන ලදැයි දතයුතුය. **යස්ස එතෙ සුභාවිතා** යනු යම් රහතන් වහන්සේ නමක විසින් මේ ශීලාදී අශෛක්‍ෂ ධර්ම ස්කන්ධ මනාව භාවිතා කරන ලද්දේ ද මනාව වඩන ලද්දේ ද. හෙතෙම (ඒ රහතන් වහන්සේ) 'ආදිච්චොව විරොචති' 'හිරු මෙන් බබලයි' යන්න සම්බන්ධ කරගත යුතුය. 'යස්ස චෙතෙ' යනුවෙන් ද කියයි. ඒ පදවල 'ච' ශබ්දය නිපාතයක් පමණි. මෙසේ මේ වර්ගයෙහි පළමු සූත්‍රයෙන් සසර ද අවසාන සූත්‍රයෙන් නිවන ද අනිත්වායින් (සූත්‍ර අටෙන්) සසර හා නිවනද කියන ලදී.

**දසවන සූත්‍රය යි.**

# 3.2.1

දෙවන වර්ගයෙහි පළමු සූත්‍රයෙහි - **පුඤ්ඤකිරිය වත්ථූනි** යනු පිදිය යුතු බව නමැති ඵලය උපදවයි හෝ තමාගේ සිත පිරිසිදු කරයි යන අරුතින් **පුඤ්ඤානි** නම් වේ. 'පින්' යනු ද ඒවාය. හේතුප්‍රත්‍යවලින් කළයුතු හෙයින් 'ක්‍රියා' ද ඒවාය යන අරුතින් පුඤ්ඤකිරිය නම් වේ. ඒවාම ඒ ඒ අනුසස්වලට කරුණුවීම් වශයෙන් පුඤ්ඤකිරියවත්ථු නම් වේ **දානමයං** යනු අනුග්‍රහ (උපකාර) වශයෙන් හෝ පූජා වශයෙන් හෝ නොසිඳින ලද භව මූලය (තණ්හාව) ඇති තමාගේ දාන වස්තුව අනුන්ට පරිත්‍යාග කිරීමේ චේතනාව - මෙය කරණකොට දෙනු ලැබේ යන අරුතින් 'දාන' නම්. දානය ම 'දානමය' නම්. සිවුරු ආදී සිවුපසය අතරින් හෝ ආහාර ආදී දසදාන වස්තු අතරින් හෝ රූපාදී අරමුණු හය අතරින් හෝ ඒ ඒ දෙය දෙන තැනැත්තාගේ, ඒවා සකස්කිරීමේ පටන් මුල් අවස්ථාවෙහි ද පරිත්‍යාග කරන කාලයෙහි ද දීමෙන් පසුව ද සොම්නස් සිතින් සිහිකරන කාලයෙහිදැයි යන කාල තුනෙහි කියන ලද අයුරින්ම පැවති චේතනාව දානමය පුණ්‍ය ක්‍රියා වස්තුව වෙයි.

**සීලමයං** යනු නිත්‍යශීල වශයෙන් හෝ උපෝසථ නියමාදී වශයෙන් හෝ පන්සිල් හෝ අටසිල් හෝ දසසිල් හෝ සමාදන් වන්නහුට ද සිල්පිරීම සඳහා පැවිදි වන්නෙමියි සිතා විහාරයට යන්නහුට ද පැවිදි වන්නහුට ද බලාපොරොත්තුව මුදුන් පමුණුවාගෙන මම ඒකාන්තයෙන් පැවිදි වූයෙමි, අනේ එය යහපතැයි සිහිකරන්නහුට ද ශ්‍රද්ධාවෙන් ප්‍රාතිමෝක්ෂ ශීලය පුරන්නහුට ද ප්‍රඥාවෙන් සිවුරු ආදිය ප්‍රත්‍යවේක්ෂා කරන්නහුට ද (ඇස ආදී ඉන්ද්‍රියයන්) හමුවට පැමිණි රූපාදී අරමුණු කෙරෙහි චක්ඛුද්වාරාදිය සිහියෙන් යුතුව සංවර කරගන්නහුට ද වීර්යයෙන් යුතුව ආජීවය (ජීවිකාව) පිරිසිදු කරන්නහුට ද පැවති කුශල චේතනාව (තුන්දොර) හික්මවන හෙයින් සීලමය පුණ්‍යක්‍රියා වස්තු නම් වේ.

එසේ ම පටිසම්භිදාවෙහි කියන ලද අයුරින් විදර්ශනා මාර්ගයෙන් ඇස අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් අනාත්ම වශයෙන් විදර්ශනා කරන්නහුට ද කන - නාසය - දිව - කය - මනස ද රූප -පෙ- ධර්ම (යන අරමුණු හය) ද චක්ඛු විඤ්ඤාණය - මනෝ විඤ්ඤාණය (යන විඤ්ඤාණ

හය) ද චක්ඛු ස්පර්ශය - මනෝ ස්පර්ශය (යන ස්පර්ශ හය) ද චක්ඛු ස්පර්ශයෙන් උපන් වේදනාව මනස ස්පර්ශයෙන් උපන් වේදනාව (යනවේදනා හය) ද රූපසඤ්ඤාව ධම්ම සඤ්ඤාව (යන සඤ්ඤා හය) ද ජරාව මරණය අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් අනාත්ම වශයෙන් විදර්ශනා කරන්නහුට ද ඇතිවන යම් චේතනාවක් වෙයි නම් එය ද පඨවි කසිණ ආදී තිස්අටක් වූ අරමුණු කෙරෙහි පැවති යම් ධ්‍යාන චේතනාවක් වෙයි නම් එය ද නිවැරදි වූ කර්මාන්ත, ශිල්ප, විද්‍යාවන් පුරුදු කිරීම් මෙනෙහි කිරීම් වශයෙන් පැවති යම් චේතනාවක් වෙයි නම් එය ද යන මේ සියල්ල මේ චේතනාව කරණකොට වඩයි යන අරුතින් භාවනාමය ද, කියන ලද ක්‍රමයෙන් පුණ්‍යක්‍රියා වස්තු ද වෙයි.

මෙහි (කියන ලද) එක එකක් වුව ද සුදුසු පරිදි මුලපටන් කයින් කරන්නහුට කාය කර්මය වෙයි. ඒ සඳහා වචන පිට කරන්නහුට වචී කර්මය ද කායික අවයවයක් හෝ වචනයක් හෝ නොසොල්වා සිතින් සිතන්නහුට මනෝ කර්මය වෙයි. ආහාර ආදිය දෙන්නහුට ද ආහාර ආදිය දෙමියි සිතා හෝ දාන පාරමිතාව සිහිකොට හෝ දෙන කාලයෙහි දානමය පුණ්‍යක්‍රියා වස්තුව වෙයි. වත් ශීර්ෂයෙහි සිට (දන්දීම චාරිත්‍රයක් යයි සලකාගෙන) දන්දෙන තැනැත්තාට ද ශීලමය පුණ්‍යක්‍රියා වස්තුව වෙයි. (දෙන සියල්ල) ක්ෂය වීම් වශයෙන් වැයවීම් වශයෙන් කර්ම වශයෙන් නුවණින් සලකා බලා දන් දෙන්නහුට ද භාවනාමය පුණ්‍යක්‍රියා වස්තුව වෙයි.

තවත් පුණ්‍යක්‍රියා වස්තු හතක් ඇත. (ගුණවතුන්ට) පිදීම සමග යෙදුණු පුණ්‍යක්‍රියා වස්තුව, වතාවත් කිරීම සමග යෙදුණු පුණ්‍යක්‍රියා වස්තුව, පින්දීම, පින් අනුමෝදන් වීම, බණකීම, බණ ඇසීම, දෘෂ්ටිය නිවැරදි කරගැනීම යන පුණ්‍යක්‍රියා වස්තු ය. සරණ ගමනයත් දෘෂ්ටිය නිවැරදි කරගැනීමෙහි ම ඇතුළත් වේ. මෙහි කියයුතු දෙය අන් අයුරකින් ප්‍රකට වන්නේය. (ඒ මෙසේය.) වැඩිහිටියකු දැක පෙරගමන් කිරීම, පාත්‍රසිවුරු පිළිගැනීම - වැඳීම - මාර්ගය ඉඩදීම (මගග සමපදාන) ආදී වශයෙන් පිදීම සමග යෙදීම (අපචායන සහගත බව) දතයුතුය. වැඩිහිටියන්ගේ වත්පිළිවෙත් කිරීම් වශයෙන්, ගමට පිඬු පිණිස වැඩිය භික්ෂුවක් දැක පාත්‍රය ඉල්ලාගෙන ගමේ ගෙවල්වලින් දානය ලබාගෙන ගෙනත්දීම් වශයෙන්, යන්න භික්ෂූන්ගේ පාත්‍රය ගේන්නැයි කියන වචනය

අසා වේගයෙන් ගොස් පාත්‍රය ගෙන ඒම් වශයෙන් ද වතාවත් කිරීම සමග යෙදීම (වෙයාවච්ච සහගත බව) දතයුතුය. සිවුපසය දී මල් හා සුවඳ වර්ගවලින් තුණුරුවන්ට පූජාකොට එබඳු අනිකුත් පින්කම් ද සිදුකොට සියලු සත්ත්වයන්ට (මේ) පින වේවායි පිරිනැමීම් වශයෙන් පින්දීම (පත්ති අනුප්පදාන) දතයුතුය. එසේ අනුන් විසින් දෙන ලද පින හෝ හුදෙක් අනුන් විසින් කරන ලද පින හොඳයි මැනවැයි කියා අනුමෝදන් වීම් වශයෙන් පින් අනුමෝදන් වීම (අබ්භානුමෝදනාව) දතයුතුය. තමා පුරුදු පුහුණු කළ ධර්මයක් යම් වස්තුවක් (පිරිකරක්) බලාපොරොත්තු නොතබා යහපත කැමැත්තෙන් අනුන්ට දේශනා කිරීම යන මෙය දේශනාමය පුණ්‍යක්‍රියා වස්තුව වෙයි. කෙනෙක් මෙසේ (දහම් දෙසීමෙන්) මා ධර්මකථිකයෙක් යනුවෙන් අන්‍යයෝ දැනගන්නාහුය යන කැමැත්තෙහි සිට ලාභසත්කාර කීර්ති ප්‍රශංසාදිය සලකා ගෙන ධර්මය දේශනා කරයි නම් ඒ ධර්මදේශනාව මහත්ඵල නොවේ. ඒකාන්තයෙන් මෙය තමාටත් අනුන්ටත් යහපත පිණිස පිළිපදින උපායවේයයි නුවණින් මෙනෙහි කිරීම පෙරදැරිකොට යහපත පැතිරීම් වශයෙන් මොළොක් සිතින් ධර්මය අසයි ද මෙය ශ්‍රවණමය පුණ්‍යක්‍රියා වස්තුවයි. මෙසේ මා සැදැහැත්තෙකැයි (අන් අය) දැනගන්නාහු යයි සිතා යම් බණ ඇසීමක් වේ නම් ඒ බණ ඇසීම මහත්ඵල නොවේ. දෘෂ්ටියෙහි ඍජුගමන දෘෂ්ටිය නිවැරදි කර ගැනීමයි. දන් දීමෙහි විපාක ඇත ආදී ක්‍රමයෙන් පැවති නිවැරදි දැකීමට මෙය වචනයකි. (දෘෂ්ටිය ඍජුකිරීම නම් වූ) මෙය වනාහි (දෘෂ්ටිය ඍජු කිරීමට) පෙර අවස්ථාවෙහි හෝ පසු අවස්ථාවෙහි හෝ ඤාණයෙන් තොර (ඤාණ විප්පයුත්ත) වුවද දෘෂ්ටිය ඍජුකරන කාලයෙහි ඤාණයෙන් යුක්ත (ඤාණ සම්පයුත්ත) වූයේම වෙයි.

ඇතැම් කෙනෙක් වනාහි විජානන පජානන වශයෙන් දකින දෘෂ්ටියෙහි දක්ෂ වූ සිත (දිට්ඨිකුසල විඤ්ඤාණය) ද කම්මස්සකත ඤාණය ආදිය ද සම්‍යක් දර්ශනයයි (මනා දැකීම යයි) කීවාහුය. එහි දක්ෂ වූ සිතෙන් (කුසලෙන විඤ්ඤාණෙන) නුවණ නූපන් කල්හි ද තමා විසින් කරන ලද පින් සිහිකිරීම, වර්ණනා කළ යුතු අයගේ ගුණ වර්ණනා කිරීම ආදිය ද ඇතුළත් කරන ලදී. කම්මස්සකත ඤාණයෙන් කම්මපථ සම්මා දිට්ඨියේ ඇතුළත් කිරීම වෙයි. අනිත් දිට්ඨිජ්ජුගතය සියල්ලටම නියම ලක්ෂණයයි. යම්කිසි පිනක් කරන තැනැත්තාගේ දෘෂ්ටියෙන් ඍජුභාවයෙන් ම එය මහත්ඵල වෙයි.

මුලින් කී දානමය ආදී පුණ්‍යක්‍රියා වස්තු තුනෙහි මේ පුණ්‍යක්‍රියා වස්තු හත ඇතුළත් කරන ලදී. එහි අපචායන - වෙය්‍යාවච්ච දෙක සීලමය පුණ්‍යක්‍රියා වස්තුවෙහි ඇතුළත් කරන ලදී. පත්ති අනුප්පදාන - අබ්භනුමෝදනා (පින් දීම - පින් අනුමෝදන් වීම) යන දෙක දානමය පුණ්‍යක්‍රියා වස්තුවෙහි ඇතුළත් කරන ලදී. ධර්මදේශනා කිරීම - ධර්මශ්‍රවණය කිරීම, භාවනාමය පුණ්‍යක්‍රියා වස්තුවෙහි ඇතුළත් කරන ලදී. දෘෂ්ටිය ඍජුකිරීම වනාහි (දාන-සීල-භාවනා) යන මේ පුණ්‍යක්‍රියා වස්තු තුනෙහිම ඇතුළත් කරන ලදී. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ 'තීනිමානි භික්ඛවෙ පුඤ්ඤකිරියවත්ථූනි. කතමානි තීනි? දානමයං -පෙ- භාවනාමයං පුඤ්ඤකිරිය වත්ථු' යනුවෙන් වදාළහ. මෙහි ද අටක් වූ කාමාවචර කුසල චේතනා වශයෙන් තුන් පුණ්‍ය ක්‍රියා වස්තුන්ගේ පැවැත්ම වෙයි. ප්‍රගුණ වූ ධර්මයක් කියන තැනැත්තාට ඇතැම් අනුසන්ධි සැලකීමට හසුනොවීම ඒ කීම සිදුවෙමින් යන්නා සේ ප්‍රගුණ වූ සමථ විදර්ශනා භාවනාවක යෙදෙන තැනැත්තාට අතරින් පතර ඤාණවිප්පයුත්ත සිතෙන් ද මෙනෙහි කිරීම පවතී. මෙසේ ඒ සියල්ල මහග්ගත කුසල චේතනාවන්ගේ වශයෙන් භාවනාමය පුණ්‍යක්‍රියා වස්තුවම වෙයි. අනිත් දෙක නොවෙයි. ගාථාවෙහි අර්ථය මුලදී කියන ලද්දේමය.

**පළමු සූත්‍රය යි.**

# 3.2.2

දෙවන සූත්‍රයෙහි **චක්ඛූනි** යනු චක්ඛනතීති = චක්ඛූනි, සම විසම තැන් ප්‍රකාශ කරන්නාක් මෙන් පවතී යන අර්ථයි. නැතහොත් චක්ඛනටෙඨන = චක්ඛූනි (චක්ඛන අර්ථයෙන් චක්ඛු) නම් වේ. මේ චක්ඛ නය නම් කුමක් ද? රසවිඳීමයි. (අස්සාදනයයි). ඒ බව 'මධුං චක්ඛති බ්‍යඤ්ජනං චක්ඛති (මීපැණි රසවිඳියි. ව්‍යඤ්ජන රසවිඳියි) යනුවෙන් කියති. මේවා අරමුණු රසය අනුභව කරන්නාක් මෙන් රසවිඳින්නාක්

මෙන් වෙයි. මෙසේ චක්ඛන අර්ථයෙන් චක්ඛු නම් වේ. ඒවා කැටිකොට ගත් කල්හි ඤාණචක්ඛු, මංස චක්ඛු යනුවෙන් දෙකකි. ඒවා අතරින් මාංශ චක්‍ෂුව මුලදී කියන ලද්දේමය. මෙහි ඤාණ චක්ඛුව (නුවණැස) වනාහි දිබ්බචක්ඛු, පඤ්ඤාචක්ඛු යනුවෙන් දෙයාකාර කොට කියන ලදී.

එහි **දිබ්බචක්ඛු** යනු දිබ්බසදිසත්තා = දිබ්බං, දේවතාවන්ට වනාහි සුචරිත කර්මයෙන් උපන්, පිත් සෙම් ලේ ආදියෙන් කරදරයක් නොවූ (එහෙයින්) උපක්ලේශයන්ගෙන් මිදුණු බැවින් දුර ඇති අරමුණු ගැනීමෙහි ද සමත් වූ දිව්‍ය ප්‍රසාද චක්‍ෂුවක් වෙයි. වීර්ය භාවනා බලයෙන් උපන් නුවණැස යම් බඳු ද මේ දිවැස ද එබඳුමය. මෙසේ දිව්‍යසමාන බැවින් දිව්‍ය නම් වෙයි. දිව්‍යවිහාර වශයෙන් ලබන ලද බැවින් ද තමා දිව්‍යවිහාර ඇසුරුකොට ඇති බැවින් ද ආලෝකයෙන් මහත් බැබලීම් ඇති බැවින් ද බිත්තියෙන් එහා පැත්තෙහි වූ රූප දැකීමෙන් මහා පැවැත්මක් ඇති හෙයින් ද දිව්‍ය (දිබ්බ) නම් වේ. ඒ සියල්ල ශබ්ද ශාස්ත්‍ර අනුසාරයෙන් දතයුතුය. දැකීම් අර්ථයෙන් 'චක්ඛු' ය. කටයුතු කිරීමෙන් ඇස වැනි යයි මෙසේ ද 'චක්ඛු'ය. දිව්‍ය වූයේත් ඇස වූයේත් එයමයි යනුවෙන් දිබ්බචක්ඛු නම් වේ.

දනී යනුවෙන් **පඤ්ඤා** නම්. (පජානාතීති පඤ්ඤා) කුමක් දනී ද? මේ දුකය යනාදී වශයෙන් චතුරාර්ය සත්‍යය දනී. මේ කාරණය **'පජානාතීති ඛො ආවුසො තස්මා පඤ්ඤාති වුච්චති, කිඤ්ච පජානාති? ඉදං දුක්ඛං'**[1] යනාදී වශයෙන් කියන ලදී.

අට්ඨකථාවෙහි වනාහි 'පඤ්ඤාපනවසෙන පඤ්ඤා, කින්ති පඤ්ඤාපෙති? අනිච්චන්ති පඤ්ඤාපෙති දුක්ඛන්ති පඤ්ඤාපෙති අනත්තාති පඤ්ඤාපෙති' 'පැණවීම් වශයෙන් ප්‍රඥා නම්. කුමක් පනවයි ද? අනිත්‍යයයි පණවයි. දුකයයි පණවයි. අනාත්මයයි පණවයි' යනුවෙන් කියන ලදී. ඒ මේ ප්‍රඥාව වනාහි ලක්‍ෂණාදී වශයෙන් ඇති තතු අවබෝධය ලක්‍ෂණ කොට ඇත. නැතහොත් නොපැකිළුණු අවබෝධය ලක්‍ෂණකොට ඇත. අවබෝධය (වනාහි) දක්ෂයකු විසින් විදින ලද ඊතලයක් මෙනි. විෂය බැබලවීම රසය යි, පහනක් මෙනි. නොමුළාවීම වැටහෙන ආකාරය යි, අරණ්‍යගත වූ දක්ෂ මාර්ගෝපදේශකයකු මෙනි.

---

1. මං.නි - මූ.ප. මහා වේදල්ල සූත්‍රය

විශේෂ වශයෙන් වනාහි මෙහි ආසවක්ඛය ඤාණය නම් වූ ප්‍රඥාව චතුස්සත්‍ය දැකීම් අර්ථයෙන් පඤ්ඤාචක්ඛු යනුවෙන් අදහස් කරන ලදී. **'චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි'**[1] 'ඇස පහළ විය, ඤාණය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය' යන මෙය ඒ සඳහා කියන ලදී. ඒවා අතරින් මසැස (මංසචක්ඛු) ස්වල්පය. දිවැස (දිබ්බචක්ඛු) විශාලය. අනික (පඤ්ඤා චක්ඛු) අප්‍රමාණය. මසැස රූප ය. අනිත් දෙක අරූපය. මසැස ද දිවැස ද ලෞකිකය. (ලෝකයට අයත්ය.) ආසව සහිතය. රූප අරමුණුකොට ඇත. අනික ලෝකෝත්තරය. ආසව රහිතය. චතුස්සත්‍ය අරමුණුකොට ඇත. මසැස අව්‍යාකතය, දිවැස කුසල ද වන්නේය. අව්‍යාකතද වන්නේය. පැනැස (පඤ්ඤාචක්ඛු) ද එසේය. මසැස කාමාවචරය. දිවැස රූපාවචරය. අනික (පැනැස) ලෝකෝත්තරයයි මේ ආදී වශයෙන් බෙදීම දතයුතුය.

ගාථාවන්හි - **අනුත්තරං** යන්න පැනැස සඳහා කියන ලදී. එය ආසවක්ඛය ඤාණය වීම් වශයෙන් අනුත්තරය. **අක්ඛාසි පුරිසුත්තමො** යනු පුරුෂයන්ට උතුම් වූ අග්‍ර වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ දෙසූහ. **උප්පාදො** යනු මසැසේ පැවැත්මයි. **මග්ගො** යනු උපාය යි. දිවැසට කාරණය යි. ස්වභාවයෙන්ම මසැස ඇති තැනැත්තාටම දිවැස උපදී. කසිණාලෝකය වඩා දිබ්බචක්ඛු ඤාණය උපදින හෙයිනි. එය ද කසිණ මණ්ඩලයෙහි උග්ගහ නිමිත්තෙන් තොරව නැත. **යතො** යනු යම්කලෙක. **ඤාණං** යනු ආසවක්ඛය ඤාණයයි. එහෙයින් ම 'පඤ්ඤාචක්ඛුං අනුත්තරං' යනුවෙන් වදාළහ. **තස්ස චක්ඛුස්ස පටිලාභා** යනු ඒ ආර්ය වූ ප්‍රඥා චක්ෂුසයේ පහළවීමෙන් වැඩීමෙන් සියලු සසර දුකින් **පමුච්චති** මිදෙයි.

**දෙවන සූත්‍රයයි.**

# 3.2.3

තුන්වන සූත්‍රයෙහි - **ඉන්ද්‍රියානි** යනු අධිපති බව යන අර්ථයෙන් ඉන්ද්‍රිය නම් වේ. එකට උපන් ධර්ම කෙරෙහි අධිපතියන් බවට පත්වූවාක් මෙන් ඒ එකට උපන් ධර්ම විසින් අනුව පැවතිය යුතු යම් දෙයක් ඇත්නම් ඒවා ඉන්ද්‍රිය නම් වේ. තවද භාග්‍යවතුන් වහන්සේ ඉන්‍ද්‍රය, ධම්මිස්සරය (ධර්මයට අධිපතිය), උසස් වූ චිත්ත අධිපති බවෙන් යුක්ත වූහ. ඒ ඉන්‍ද්‍රයන් වහන්සේ විසින් සියල්ලට පළමුව දුටු බැවින් අවබෝධ කළ බැවින් අනුන් විසිනුත් දක්නා ලද බැවින් දේශනා කරන ලද බැවින් පුරුදු කරන ලද බැවින් අරමුණු වැඩීමෙන් සේවනය කිරීමෙන් දක්නා ලද බැවින් ද ඉන්ද්‍රිය වේ. මාර්ගාවබොධයට හේතු වූ පුණ්‍යකර්මය හෝ ඉන්‍ද්‍ර ය. එහි ලිංග ද ඉන්ද්‍රිය වේ.

**අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං** යනු මුලක් නොපෙනෙන (අනමතග්ග) සසරෙහි නොදන්නා ලද අවබෝධ නොකරන ලද නිවන නොහොත් චතුස්සත්‍ය ධර්මය දැනගන්නෙමියි කියා පිළිපදින තැනැත්තාට මෙයින් මුල් අවස්ථාවෙහි උපන් ඉන්ද්‍රිය, සෝතාපත්ති මාර්ග ප්‍රඥාවට මේ වචනයකි. **අඤ්ඤින්ද්‍රියං** යනු ආජානන ඉන්ද්‍රියයි. මේ එහි වචනාර්ථයයි: 'ආජානාති' (යනු) ප්‍රථම මාර්ග ඥානයෙන් දක්නා ලද සීමාව නොඉක්මවාම දැනගනියි යන අරුතින් අඤ්ඤා නම් වේ. යම්සේ ප්‍රථම මාර්ග ප්‍රඥාව දුක් ආදියෙහි පිරිසිඳ අවබෝධ කිරීම් ආදී වශයෙන් පවතී ද එසේම මෙය ද පවතී. මෙසේ 'අඤ්ඤා' වූයේ ද එයමය. කියන ලද අර්ථයෙන් ඉන්ද්‍රිය වූයේ ද එයමය යනුවෙන් අඤ්ඤින්ද්‍රිය නම් වේ. දැනගන්නා අර්ථයෙන් ම දැනගත් ආර්ය පුද්ගලයාගේ ඉන්ද්‍රියය යන අරුතින් හෝ අඤ්ඤින්ද්‍රිය නම් වේ. සෝතාපත්ති ඵලයෙහි පටන් (රහත් මාර්ගය තෙක් ඇති) ස්ථාන හයෙහි පවතින ඤාණයට මෙය නමකි. **අඤ්ඤාතාවින්ද්‍රියං** යනු චතුස්සත්‍ය විෂයෙහි නිම වූ ඥාන කෘත්‍යය ඇති සම්පූර්ණයෙන් දැනගන්නා ලද ක්ෂීණාශ්‍රවයන් වහන්සේට ඉපදීම් වශයෙන් ද ඉන්ද්‍රිය අර්ථය හටගැනීම් වශයෙන් ද 'අඤ්ඤාතාවින්ද්‍රිය'නම් වේ. මෙහි ද පළමු හා අවසාන (පළමු හා තෙවන) ඉන්ද්‍රියයන් ප්‍රථම මාර්ගය (සෝවාන් මාර්ගය) වශයෙන් එක් ස්ථානයකට ද සතරවන ඵලය (අර්හත් ඵලය) වශයෙන් එක් ස්ථානයකට ද සම්බන්ධය. අනික

(දෙවන ඉන්ද්‍රිය) අනිත් මාර්ගඵල වශයෙන් ස්ථාන හයකට සම්බන්ධ යයි දතයුතුය.

ගාථාවන්හි - **සික්ඛමානස්ස** යනු අධිශීල ශික්‍ෂා ආදියෙහි හික්මෙන්නා වූ ඒවා වඩන්නා වූ. **උජුමග්ගානුසාරිනො** යනු අන්ත දෙක දුරුකළ බැවින් ආර්ය අෂ්ටාංගික මාර්ගය ඍජු මාර්ගයයි කියනු ලැබේ. ඒ ආර්ය මාර්ගය සිහිකිරීම් වශයෙන් (එහි ගමන් කිරීම් වශයෙන්) 'උජුමග්ගානුසාරිනො' වෙයි. පිළිවෙළින් (සෝවාන් ආදී) මාර්ග උපදවන්නා වූ තැනැත්තාට යන අර්ථයි. **ඛයස්මිං** යනු ඉතිරි නොකොට කෙලෙස් දුරුකිරීම් වශයෙන් ඛය නම් වූ අග්‍ර (අර්හත්) මාර්ගයෙහි ඤාණය **පඨමං** පළමුවම උපදී. **තතො අඤ්ඤා අනන්තරා** යනු ඒ මාර්ග ඥානයෙන් අනතුරුව (අතරක් නැතිව) අර්හත්ඵලය (අරහත්තං) උපදී. නැතහොත් **උජුමග්ගානුසාරිනො** යනු ලීන (නම් වූ සිතෙහි මැලිබව), උද්ධච්ච (නම් වූ සිතේ නොසන්සුන් බව), පතිට්ඨාන (නම් වූ සසර සයුරෙහි පිහිටා සිටීම) ආයූහන (නම් වූ කර්ම රැස්කිරීම) ආදිය දුරුකොට සමථ-විදර්ශනා දෙක (සෝවාන් මාර්ගයට පත්වීමට මුලින් කරන භාවනාවක් නිසා සමථ විදර්ශනා දෙක එක්වර නොව එකක් වඩා අනික වැඩීම් වශයෙන්) යුගනද්ධ කොට වැඩීම් වශයෙන් පැවති පූර්වභාග මාර්ගය සිහිකරන, අනුව යන, පිළිපදින තැනැත්තාගේ ගෝත්‍රභූ ඤාණයට අනතුරුව (සක්කාය) දිට්ඨිය සමග යෙදෙන කෙලෙසුන් ගෙවාදැමීම් වශයෙන් **ඛයස්මිං** සෝතාපත්ති මාර්ගයෙහි **පඨමං ඤාණං** (පළමු ඤාණය වන) අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය උපදී.

**තතො අඤ්ඤා අනන්තරා** යනු 'තතො' - පළමු ඤාණයෙන් 'අනන්තරා' - අනතුරුව පටන්ගෙන අග්‍ර මාර්ගය (අර්හත් මාර්ගය) තෙක් 'අඤ්ඤා' - අඤ්ඤින්ද්‍රිය උපදී. **තතො අඤ්ඤා විමුත්තස්ස** යනු 'තතො අඤ්ඤා' - අඤ්ඤින්ද්‍රියෙන් පසු අර්හත් මාර්ග ඥානයට අනතුරුව අර්හත්ඵල නම් වූ ප්‍රඥා විමුක්තියෙන් හෙවත් අඤ්ඤාතාවින්ද්‍රියෙන් 'විමුත්තස්ස' මිදුණා වූ. **ඤාණං වෙ හොති තාදිනො** යනු අර්හත් ඵලයට පත්වීමෙන් පසු කාලයෙහි ඉටු අනිටු ආදී අරමුණුවල නොවෙනස් වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේට ප්‍රත්‍යවේක්‍ෂණ ඥානය උපදී. කෙසේ උපදී ද? **අකුප්පා මෙ විමුත්තීති** මගේ අර්හත්ඵල විමුක්තිය වෙනස් නොවෙයි. (එසේ වෙනස් නොවන අයුරින් උපදින බව) කීහ. **භවසඤ්ඤා ජනක්ඛයා** යනුවෙන් ඒ වෙනස් නොවන බවට කාරණය දක්වයි.

දැන් එබඳු වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේට ස්තුති කරමින් (ප්‍රශංසා කරමින්) 'සවෙ ඉන්‍ද්‍රිය සමපනෙනා' යනුවෙන් තෙවන ගාථාව වදාළහ. එහි **ඉන්‍ද්‍රිය සමපනෙනා** යනු කියන ලද පරිදි ලෝකෝත්තර ඉන්‍ද්‍රිය තුනෙන් යුක්ත වූ, එහෙයින් පිරිසිදු වූ සන්සිඳීම ලබන ලද ශ්‍රද්ධාදී ඉඳුරන්ගෙන් යුක්තවූ පරිපූර්ණ වූ. එහෙයින්ම මනාව සන්සිඳුනා වූ (කෙලෙස් වශයෙන්) ඇසුරු නොකරන. චක්ඛු (ඇස) ආදී ඉඳුරන්ගෙන් යුක්ත වූ. එහෙයින් **සනෙතා** යනුවෙන් කීහ. සියලු කෙලෙස් දාහයන් සන්සිඳීමෙන් උපශාන්ත වූ යන අර්ථයි. **සනතිපදෙ රතො** යනු නිවනෙහි ඇලුණා වූ. මෙහි ද 'ඉන්‍ද්‍රිය සමපනෙනා' යන මෙයින් ඔහුගේ භාවිත කරන ලද මාර්ගය ඇති බව ද පිරිසිඳ දැනගන්නා ලද ස්කන්ධ ඇති බවද දක්වන ලදී. 'සනෙතා' යන මෙයින් පහවූ කෙලෙස් ඇති බව ද 'සනතිපදෙ රතො' යන මෙයින් ප්‍රත්‍යක්ෂ කරන ලද නිරෝධය (නිවන) ඇති බව ද දක්වන ලදී. සෙස්ස කියන ලද ක්‍රමයෙන් ම දතයුතුය.

**තෙවන සූත්‍රය යි.**

# 3.2.4

සතරවන සූත්‍රයෙහි අද්ධා යනු කාලයයි. 'අතීතො අද්ධා' යනාදියෙහි සූත්‍රාන්ත පර්යාය අභිධර්ම පර්යාය යනුවෙන් පර්යාය දෙකකි. එහි සූත්‍රාන්ත පර්යායයෙන් ප්‍රතිසන්ධියෙන් පෙර අවස්ථාව අතීත අද්ධය නම් වේ. චුතියෙන් පසුව අනාගත අද්ධය නම් වෙයි. චුති පටිසන්ධි දෙක සමග ඉන් අනතුරුව වර්තමාන අද්ධය නම් වෙයි. අභිධර්ම පර්යායයෙන් උත්පාද - ඨිති - භංග (ඉපදීම - පැවැත්ම - නැතිවීම) යන මේ ක්ෂණ තුනට පැමිණ නිරුද්ධ වූ ධර්ම අතීත අද්ධය (අතීත කාලය) නම්. ක්ෂණ තුනට නොපැමිණි ධර්ම අනාගත අද්ධය නම්. ක්ෂණ තුනෙන් යුක්ත වූයේ වර්තමාන අද්ධය නම්. වෙනත් ක්‍රමයක් : මේ අතීතාදී විභාගය අද්ධ - සන්තති - සමය - ඛණ වශයෙන් සතර ආකාරයකින් දතයුතුය.

ඒවා අතරින් අද්ධ විභාගය (කාලය බෙදීම) කියන ලදී. 'සන්තති' වශයෙන් සමාන වූ එක් උතුසමුට්ඨානයක් (ඍතුජ රූපයක්) ද එක් ආහාර සමුට්ඨානයක් (ආහාරජ රූපයක්) ද පෙරපසු වශයෙන් පවත්නේ වර්තමානයයි. එයින් පෙර වූ අසමාන වූ උතු - ආහාර යන සමුට්ඨාන අතීතය, එයින් පසු වූ ඒවා අනාගතය. එක් චිත්ත වීථියක, එක් ජවන් වාරයක, එක් සමාපත්ති වාරයක සමුට්ඨාන වන (උපදින්නා වූ) චිත්තජ රූප වර්තමානය, එයින් පෙර අතීත යයි ද එයින් පසු අනාගත යයි ද කියනු ලැබේ. කම්ම සමුට්ඨාන (කර්මයෙන් උපදින) රූපයන්ගේ පරම්පරා වශයෙන් වෙන් වෙන් වූ අතීතාදී භේදයක් නැත. ඒ ඍතු-ආහාර-චිත්ත යන මේවායින් උපදින රූපයන්ට උපකාර වශයෙන් ඒ කර්ම සමුට්ඨානයේ අතීතාදී බව දතයුතුය. 'සමය' වශයෙන් (කාල වශයෙන්) එක් මොහොතක, පෙරවරුව, සවස, රාත්‍රිය, දවල් යන කාලවල සන්තාන (පරම්පරා) වශයෙන් පවත්නාවූ රූප ධර්ම ඒ ඒ සමයෙහි වර්තමාන නම්. එයින් පෙර අතීතය, එයින් පසු අනාගතය. පළමුකොට මේ රූප ධර්මයන්හි ක්‍රමයයි.

අරූප ධර්මයන්හි වනාහි - ඛණ වශයෙන් උත්පාද ආදී ඛණ තුනට ඇතුළත් වූ අරූප ධර්ම වර්තමාන ය. එයින් පෙර අතීතය, එයින් පසු අනාගත ය. තව ද හේතු ප්‍රත්‍යයන්ගේ කටයුතු ඉක්මවන ලද ධර්ම අතීත ය, හේතුන්ගේ කටයුතු නිමවන ලද ධර්ම ද ප්‍රත්‍යයන්ගේ කටයුතු නො නිමි ධර්ම ද වර්තමානය. මේ කටයුතු දෙකට ම නොපැමිණි ධර්ම අනාගතය. තමාගේ (ඒ අරූප ධර්මයන්ගේ) කටයුතු සිදුවන මොහොතෙහි වර්තමානය, එයින් පෙර අතීතය, එයින් පසු අනාගත ය. මෙහි ද ඛණ ආදී කථාව නිප්පරියාය (ප්‍රධාන) වෙයි. අනිත්වා පරියාය (අප්‍රධාන) වෙයි. මේ අතීත ආදී භේදය ඇත්තේ (රූප-අරූප) ධර්මවලට මිස කාලයට නොවෙයි. අතීතාදී භේද ඇති මේ ධර්ම සලකාගෙන පරමාර්ථ වශයෙන් කාලය අවිද්‍යමාන වුවද මෙහිදී ඒ ව්‍යවහාරයෙන් අතීත ආදී වශයෙන් කියන ලදැයි දතයුතුය.

ගාථාවන්හි **අක්ඛෙය්‍යසඤ්ඤිනො** යන මෙහි කියනු ලැබේ, කතාකරනු ලැබේ, පනවනු ලැබේ යන අරුතින් 'අක්ඛෙය්‍ය' නම් වේ. කථාවස්තු ය. අර්ථ වශයෙන් රූපාදී පංචස්කන්ධය යි. ඒ කාරණය මෙසේ කියන ලදී. **'අතීතං වා අද්ධානං ආරබ්භ කථං කථෙය්‍ය, අනාගතං වා - පච්චුප්පන්නං වා අද්ධානං ආරබ්භ කථං කථෙය්‍ය'**

'අතීත කාලය හෝ අරබයා කතා කරන්නේය, අනාගත කාලය හෝ වර්තමාන කාලය හෝ අරබයා කතා කරන්නේය.'

**'තථා යං භික්ඛවෙ, රූපං අතීතං නිරුද්ධං විපරිණතං, 'අහොසී'ති තස්ස සංඛා, 'අහොසී'ති තස්ස සමඤ්ඤා, 'අහොසී'ති තස්ස පඤ්ඤත්ති, න තස්ස සංඛා 'භවිස්සතී'ති, න තස්ස සංඛා 'අත්ථී'ති**[1]

'මහණෙනි, යම් රූපයක් අතීත ද නිරුද්ධ ද විපරිණත ද 'වූයේය' යනු ඒ රූපයේ සංඛ්‍යාවයි. 'වූයේය' යනු ඒ රූපයේ නමයි. 'වූයේය' යනු ඒ රූපයේ පැණවීමයි. 'වන්නේය' යනු ඒ රූපයේ සංඛ්‍යාව නොවෙයි. 'ඇත' යනු ඒ රූපයේ සංඛ්‍යාව (ගිණීම, ගණන් ගැනීම) නොවේ. මෙසේ කියන ලද නිරුක්තිපථ සූත්‍රයෙන් ද මෙහි අර්ථය පැහැදිලි කරගත යුතුය.

මෙසේ කථාවස්තු භාවයෙන් අක්ඛෙය්‍ය නම් වූ ස්කන්ධ පංචකයෙහි මමය යි ද මගේය යි ද දෙවියාය යි ද මනුෂ්‍යයාය යි ද ස්ත්‍රියය යි ද පුරුෂයාය යි ද ආදී ලෙස පැවති සඤ්ඤා වශයෙන් අක්ඛෙය්‍ය සඤ්ඤී වෙති. පංච උපාදාන ස්කන්ධයෙහි සත්ත්ව පුද්ගල ආදී සඤ්ඤා ඇත්තෝය යන අර්ථයි. **අක්ඛෙය්‍යස්මිං** පංච උපාදාන ස්කන්ධයෙහි තණ්හා දිට්ඨි ගැනීම් වශයෙන් **පතිට්ඨිතා** රාගාදී වශයෙන් හෝ අට ආකාරයකින් පිහිටියේය. රාගයෙන් රත් වූ තැනැත්තා රාග වශයෙන් පිහිටියේ වෙයි. ද්වේෂයෙන් දුෂ්ට වූ තැනැත්තා ද්වේෂ වශයෙන් ද මුළා වූ තැනැත්තා මෝහ වශයෙන් ද දැඩිලෙස අල්ලා ගැනීම් ඇති තැනැත්තා දෘෂ්ටි වශයෙන් ද කෙලෙස් තම සිත්හි තහවුරුකොට ඇති තැනැත්තා අනුසය වශයෙන් ද බැඳුණු තැනැත්තා මාන වශයෙන් ද ස්ථිර නිගමනයකට නොගිය තැනැත්තා විචිකිච්ඡා වශයෙන් ද කැළඹුණු සිත් ඇති තැනැත්තා උද්ධච්ච වශයෙන් ද පිහිටියේ වෙයි. **අක්ඛෙය්‍යං අපරිඤ්ඤාය** යනු ඒ පංච උපාදාන ස්කන්ධය, (කාම-රූප-අරූප) යන ත්‍රෛභූමික ධර්ම ත්‍රිවිධ පරිඥාවන්ගෙන් පිරිසිඳ නොදැන ඒ පිළිබඳ නොදැනීම් හේතුවයි. **යොගමායන්ති මච්චුනො** යනු මරණයේ යෙදීමට මරණය සමග සංයෝගයට එළඹෙත්. විසංයෝග නොවේ යන අර්ථයි. නැතහොත් 'යොගං' යනු උපාය යි. එයින් යොදන ලද අතුරන ලද මරසෙනගට සුදුසු අනර්ථ ජාලයට ක්ලේශජාලයට යති යනුවෙන් කියන ලද්දේ වෙයි.

---

1. සං.නි. - ඛන්ධක වර්ගය - බු.ජ.මු 3 භා - 122 පිට

'න හි නො සංගරං තෙන මහා සෙනෙන මච්චුනා' 'ඒ මහා සේනාවක් ඇති මාරයා සමග අපගේ ගනුදෙනුවක් නැත' යනුවෙන් කියන ලදී.

මෙපමණකින් සසර දක්වා දැන් නිවන දක්වන්නට **අක්ඛෙය්‍යඤ්ච පරිඤ්ඤාය** යනාදිය කියන ලදී. එහි 'ච' ශබ්දය අතිරේක අර්ථයෙහිය. (එහි අර්ථයක් නැත). ඒ පංච උපාදානස්කන්ධය පිරිසිඳ දැනීමෙන් ලැබිය යුතු දෙය කියමින් ම විශේෂය හෙළිකරයි. **පරිඤ්ඤාය** යනු විදර්ශනාව සහිත මාර්ග ප්‍රඥාවෙන් (මේ) දුකයයි පිරිසිඳ (වෙන්කොට) දැන එය හා බැඳුණු කෙලෙස් පහකිරීමෙන් හෝ එය (පිරිසිඳ දැනීම) ඉක්මවා පරිඤ්ඤාවන් තුනේම කටයුතු මුදුන් පමුණුවා. **අක්ඛාතාරං න මඤ්ඤති** යනු සියලු ආකාරයෙන් (සත්ත්ව පුද්ගල ආදී) හැඟීම් සංඥා පහ වූ බැවින් ක්ෂීණාශ්‍රවයන් වහන්සේ (තිස්ස ආදී වශයෙන්) කිවයුතු පුද්ගලයකු (ඇතැයි) නොහඟිති. කාරක (කරන්නන්) ආදි ස්වභාවයක් කිසියම් ආත්මයක් (ඇතැයි) නොපිළිගනිති යන අර්ථයි.

**ඵුට්ඨො විමොක්ඛො මනසා සන්තිපදමනුත්තරං** යනු යම්හෙයකින් සියලු සංඛතයන්ගෙන් මිදුණු බැවින් විමොක්ඛ යනුවෙන් ද සියලු කෙලෙස් තැවීම් සන්සිඳුවන ස්ථානය වන බැවින් සන්තිපද යනුවෙන් ද ලබන ලද නම් ඇති නිර්වාණ ධර්මය ස්පර්ශ කරන ලද්දේ ද අවබෝධ කරන ලද්දේ ද එහෙයින් කියයුතු පුද්ගලයකු (ඇතැයි) නොහඟී. නැතහොත් 'පරිඤ්ඤාය' යන පදයෙන් දුක්ඛ සත්‍යයේ පිරිසිඳ දැනීම ද සමුදය සත්‍යයේ දුරුකිරීම ද කියා ඵුට්ඨො විමොක්ඛො මනසා සන්තිපද මනුත්තරං' යන මෙයින් මාර්ග - නිරෝධ සත්‍යයන් භාවනාවෙන් ප්‍රත්‍යක්ෂ කිරීම ප්‍රකාශකරයි. එහි අර්ථය : සහමුලින් නැතිකිරීම් වශයෙන් සියලු කෙලෙසුන් කෙරෙන් මිදෙයි යන අරුතින් විමොක්ඛ නම්. (එනම්) ආර්ය මාර්ගයයි. ඒ ක්ෂීණාශ්‍රවයන් වහන්සේ වනාහි උන්වහන්සේගේ මාර්ග සිතෙන් ස්පර්ශ කරන ලද්දේ භාවිත කරන ලද්දේ ද උන්වහන්සේ විසින් ම අනුත්තර වූ ශාන්තපදය යි කියන ලද නිවන ස්පර්ශ කරන ලදී. ප්‍රත්‍යක්ෂ කරන ලදී.

**අක්ඛෙය්‍ය සම්පන්නො** යනු පංචස්කන්ධය නිමිතිකොට විවිධ විපත්තිවලින් උවදුරට පත් වූ ලෝකයෙහි පහ වූ විපර්යාස ඇති බැවින් එයින් මනාව මිදුනේ පංචස්කන්ධය පිරිසිඳ දැනීමෙන් උපන් සම්පත්වලින්

සම්පන්න වූ යුක්ත වූ. සංඛාය සෙවී යනු ප්‍රඥාව විපුලත්වයට පත්වීමෙන් චීවරාදී ප්‍රත්‍යයන් නුවණින් විමසා බලාම ඇසුරුකරන ස්වභාවය ඇත්තා වූ ද පිරිසිඳ දන්නා ලද ධර්ම ඇති හෙයින් ද ඉන්ද්‍රියයන් හමුවට පැමිණි සියලු අරමුණු ඡලංගුපෙක්ඛා (ඉඳුරන් හයට අරමුණු හයක් ඇති හෙයින් ඒ අරමුණු හයෙහි උපේක්‍ෂා වීම්) වශයෙන් නුවණින් විමසා බලා ඇසුරුකරන සුලු වූ. ධම්මට්ඨො යනු අසේඛ ධර්මයන්හි හෝ නිර්වාණ ධර්මයෙහි ම හෝ පිහිටි. වෙදගු යනු අවබෝධ කළ යුතු චතුස්සත්‍යයේ පරතෙරට ගිය බැවින් වෙදගු නම් වේ. මෙසේ ගුණ ඇත්තා වූ රහතන් වහන්සේ භවාදීන්හි කිසිතැනක මතු පුනර්භවයක් නැති බැවින් මිනිසාය දෙවියාය යන ගණනට නො පැමිණෙයි. පැණවීමක් නැති බවටම යතියි අනුපාදා පරිනිර්වාණයෙන් දේශනාව නිමකළ සේක.

සතරවන සූත්‍රයයි.

## 3.2.5

පස්වන සූත්‍රයෙහි නපුරු චරිත හෝ දුෂ්ට චරිත = දුච්චරිතානි. කයින් කරන දුසිරිත හෝ කයින් පැවති දුසිරිත = කාය දුච්චරිතං. ඉතිරි ඒවාහි ද ඒ ක්‍රමයමයි. මේ දුසිරිත පැණවීම් වශයෙන් හෝ කර්මපථ වශයෙන් හෝ කිවයුතුය. එහි පළමුකොට පැණවීම් වශයෙන් (මෙසේය.) කායද්වාරයෙහි පණවන ලද ශික්‍ෂාපද ඉක්මවීම කාය දුශ්චරිතය යි. වචී ද්වාරයෙහි පනවන ලද ශික්‍ෂාපද ඉක්මවීම වචී දුශ්චරිතයයි. දෙකෙහිම පනවන ලද ශික්‍ෂාපද ඉක්මවීම මනෝ දුශ්චරිතයයි. මේ ප්‍රඥප්ති කථාවයි. ප්‍රාණඝාත ආදී චේතනා තුන කායද්වාරයෙහි උපන් කාය දුශ්චරිතයයි. එසේම මුසාවාද ආදී චේතනා සතර වචී දුශ්චරිතයයි. අභිධ්‍යා, ව්‍යාපාද මිථ්‍යා දෘෂ්ටි යන චේතනා සමග යෙදුණු ධර්ම තුන මනෝ දුශ්චරිතය යන මෙය කර්මපථ කථාව ය.

ගාථාවෙහි - කර්මපථ බවට පත් වූ ම පාප ධර්මය කාය දුශ්චරිතාදි භාවයෙන් කියන ලදී. එයින් අන්‍ය වූ පාපධර්මය ඇතුළත් කරන්නට 'යඤ්චඤ්ඤං දොස සංහිතං' යනුවෙන් දෙසන ලදී. එහි **දොස සංහිතං** යනු රාගාදී කෙලෙස් සහිත වූ. ඉතිරිය මනාව දතහැක්කේමය.

**පස්වන සූත්‍රයයි.**

## 3.2.6

හයවන සූත්‍රයෙහි - යහපත් චරිත හෝ සුන්දර චරිත = **සුචරිතානි.** කයින් කරන සුචරිතය හෝ කයින් පැවති සුචරිතය = **කාය සුචරිතං.** ඉතිරි ඒවාහිද ඒ ක්‍රමයමයි. මෙහි ද ප්‍රඥප්ති වශයෙන් ද කර්මපථ වශයෙන්දැයි කථාව දෙපරිදිය. එහි - කාය ද්වාරයෙහි පණවන ලද ශික්ෂාපද නො ඉක්මවීම **කාය සුචරිතං** කාය සුචරිතය යි. වචීද්වාරයෙහි පනවන ලද ශික්ෂාපද නො ඉක්මවීම **වචී සුචරිතං** වචී සුචරිතය යි. මේ ද්වාර දෙකෙහිම පනවන ලද ශික්ෂාපද නොඉක්මවීම **මනෝ සුචරිතං** මනෝ සුචරිතය යි. මෙය ප්‍රඥප්ති කථාව යි. ප්‍රාණඝාත ආදියෙන් වෙන්වන්නහුට උපන් විරති චේතනා තුන කාය සුචරිතය යි. මුසාවාද ආදියෙන් වෙන් වන්නහුට උපන් විරති චේතනා සතර වචී සුචරිතයයි. අනභිධ්‍යා, අව්‍යාපාද, සම්මා දිට්ඨි යන චේතනා සමග යෙදුණු ධර්ම තුන මනෝ සුචරිතය යන මෙය කර්මපථ කථාවය. ඉතිරිය කියන ලද පරිදිය.

**හයවන සූත්‍රයයි.**

# 3.2.7

සත්වන සූත්‍රයෙහි **සොචෙය්‍යානි** යනු පිරිසිදුකම් ය. කායසොචෙය්‍යං යනු කාය සුචරිතය. වචී සොචෙය්‍ය යනු වචී සුචරිතය ම ය. මනෝ සොචෙය්‍ය යනු මනෝ සුචරිතයමය. එහෙයින් 'තත්ථ කතමං කාය සොචෙය්‍යං? පාණාතිපාතා වේරමණී' 'එහි කයේ පිරිසිදුකම කුමක් ද? සතුන් මැරීමෙන් වැළකීම' යනාදිය දෙසන ලදී.

ගාථාවෙහි - සහමුලින් දුරු වූ සියලු ම කාය දුශ්චරිත ඇති බැවින් කයින් පිරිසිදු ය යනුවෙන් **කායසුචි** නම්. **සොචෙය්‍යසම්පන්නං** යනු සන්සිඳුවන ලද කෙලෙස් ඇති බැවින් සුපිරිසිදු වූ පිරිසිදුකමින් යුක්ත වූ. ඉතිරිය කියන ලද ක්‍රමයෙන්ම ය.

**සත්වන සූත්‍රය යි.**

# 3.2.8

අටවන සූත්‍රයෙහි **මොනෙය්‍යානි** යන මෙහි මෙලොව ද පරලොව ද තමාගේ යහපත ද අනුන්ගේ යහපත ද දනී යන අරුතින් මුනි නම් වේ.

කල්‍යාණ පෘථග්ජනයා සමග ශෛක්‍ෂ (හික්මෙන) පුද්ගලයන් සත්දෙනා ද රහතන් වහන්සේ ද මුනි නම් වෙයි. මෙහි වනාහි රහතන් වහන්සේම අදහස් කරන ලදී. මුනිවරයාගේ ස්වභාවය (පැවැත්ම) මුනිභාවයයි (එනම් මොනෙය්‍ය යි). රහතන් වහන්සේගේ කාය-වචී-මනෝ සමාචාරයන් ය. නැතහොත් මුනිභාවය ඇතිකරන මොනෙය්‍ය ප්‍රතිපදා ධර්ම මොනෙය්‍ය නම්.

මේ ඒවායේ විස්තරය යි. එහි කාය මොනෙය්‍ය යනු කුමක්ද?

ත්‍රිවිධ කාය දුශ්චරිතයන්ගේ ප්‍රහාණය කාය මොනෙය්‍ය ය.

ත්‍රිවිධ කාය සුචරිතය කාය මොනෙය්‍ය ය.

කය අරමුණුකොට (අනිත්‍යාදී වශයෙන්) පැවති ඥාණය කාය මොනෙය්‍ය ය.

කය පිරිසිඳ දැනීම කාය මොනෙය්‍ය ය.

කය පිරිසිඳ දැනීම සමග එකට යෙදුණු මාර්ගය කාය මොනෙය්‍ය ය.

කයෙහි ඡන්දරාගය දුරුකිරීම කාය මොනෙය්‍ය ය.

කාය සංස්කාර (ආශ්වාස-ප්‍රශ්වාස) නිරෝධයෙන් ලබන චතුර්ථධ්‍යාන සමාපත්තිය කාය මොනෙය්‍ය ය.

එහි වචී මොනෙය්‍ය යනු කුමක් ද?

සිවු වැදෑරුම් වචී දුශ්චරිතයන්ගේ ප්‍රහාණය වචී මොනෙය්‍ය ය.

සිවුවැදෑරුම් වචී සුචරිතය වචී මොනෙය්‍ය ය.

වචනය අරමුණුකොට (අනිත්‍යාදි වශයෙන්) පැවති ඥාණය වචී මොනෙය්‍ය ය.

වචනය පිරිසිඳ දැනීම වචී මොනෙය්‍ය ය.

වචනය පිරිසිඳ දැනීම සමග එකට යෙදුණු මාර්ගය වචී මොනෙය්‍ය ය.

වචනයෙහි ඡන්දරාගය දුරුකිරීම වචී මොනෙය්‍ය ය.

වචී සංස්කාර (විතක්ක-විචාර) නිරෝධයෙන් ලබන ද්විතීය ධ්‍යානය වචී මොනෙය්‍ය ය.

එහි මනෝ මොනෙය්‍ය යනු කුමක් ද?

ත්‍රිවිධ මනෝ දුශ්චරිතයන්ගේ ප්‍රහාණය මනෝ මොනෙය්‍ය ය.

ත්‍රිවිධ මනෝ සුචරිතය මනෝ මොනෙය්‍ය ය.

මනස අරමුණුකොට (අනිත්‍යාදි වශයෙන්) පැවති ඥාණය මනෝ මොනෙය්‍ය ය.

මනස පිරිසිඳ දැනීම මනෝ මොනෙය්‍ය ය.

මනස පිරිසිඳ දැනීම සමග එකට යෙදුණු මාර්ගය මනෝ මොනෙය්‍ය ය.

මනසෙහි ඡන්දරාගය දුරුකිරීම මනෝ මොනෙය්‍ය ය.

චිත්ත සංස්කාර (සඤ්ඤා-වේදනා) නිරෝධයෙන් ලබන සඤ්ඤා වේදයිත නිරෝධ සමාපත්තිය මනෝ මොනෙය්‍ය ය.

**නිද්ධොත පාපකං** යනු අංග අටකින් යුත් මාර්ග ඵලයෙන් මනාව සෝදාහළ පව්මල ඇති.

අටවන සූත්‍රය යි.

## 3.2.9

නවවන සූත්‍රයෙහි **යස්ස කස්සචි** යනු අනියම් වචනයකි. එහෙයින් **යම්කිසි** ගිහි පුද්ගලයෙකුගේ හෝ පැවිදි පුද්ගලයෙකුගේ. **රාගො අප්පහීනො** යනු සිත් අලවන අර්ථයෙන් රාගය සහමුලින් පහ නොවූයේ මාර්ගයෙන් නූපදින ස්වභාවයට නොපමුණුවන ලද්දේ. දෝස මෝහ දෙකෙහිද මේ ක්‍රමයමයි. එහි අපාය ගමනට සුදුසු රාග දෝස මෝහ ප්‍රථම (සෝවාන්) මාර්ගයෙන් ද ඕලාරික (ගොරෝසු) කාමරාග-දෝස දෙවන (සකෘදාගාමි) මාර්ගයෙන් ද ඒවාම ඉතිරි නොකොට තෙවන (අනාගාමි) මාර්ගයෙන්ද භවරාගයද ඉතිරි වූ මෝහය ද සිවුවන (අර්හත්) මාර්ගයෙන් ද පහවෙයි. මෙසේ මේවා පහවන කල්හි ඒ හා සමග යෙදුණු සියලුම කෙලෙස් පහවන්නේමය. මෙසේ මේ රාගාදිය යම්කිසි භික්ෂුවකගේ හෝ භික්ෂුණියකගේ හෝ උපාසකයෙකුගේ හෝ උපාසිකාවකගේ හෝ මාර්ගයෙන් පහ නොවූයේ. **බද්ධො මාරස්ස** යනු කෙලෙස් මාරයා විසින් බඳින ලද්දේ යයි කියනු ලැබේ. යම් මොහොතක කෙලෙස් මාරයා විසින් බඳින ලද ද එතැන් පටන් අභිසංඛාර ආදී මාරයන් විසින් ද බඳින ලද්දේම වෙයි. **පටිමුක්කස්ස මාරපාසො** යනු පටිමුක්කො අස්ස, මේ පහ නොවූ කෙලෙස් ඇති පුද්ගලයා විසින් ඒ පහනොවූ කෙලෙස් ඇති බැවින්ම මාරපාසය නම් වූ ක්ලේශය තමාගේ චිත්ත සන්තානයෙහි

ඇතුල් කරන ලද්දේය. ඒ ක්ලේශය විසින් තමා බන්දවන ලද්දේය යන අර්ථයි. නොහොත් මොහු විසින් මාරපාසය ඇතුල්කරන ලද්දේ වන්නේය. කුශල පක්ෂයෙහි **ඔමුක්කස්ස** යනු මොහු විසින් ඇතුල් නොකරන ලද්දේ මුදන ලද්දේ ඉවත්කරන ලද්දේ වෙයි. ඉතිරිය කියන ලද ආකාරයට විරුද්ධ ආකාරයෙන් දතයුතුය.

මෙහි ගාථා කුශල පක්ෂය වශයෙන් ම ආයේය. මේ එහි කෙටි අර්ථයයි. **යස්ස** යම් ආර්ය පුද්ගලයකු විසින් රාග-දෝස-අවිද්‍යා **විරාජිතා** ආර්ය මාර්ගයෙන් නිරුද්ධ කරන ලද්දේ **තං** ඔහු භාවනා වශයෙන් පුරුදුකරන ලද කය ඇති බැවින් සීලය ඇති බැවින් සිත ඇති බැවින් ප්‍රඥාව ඇති බැවින් භාවිත ආත්ම ඇති රහතන් වහන්සේලා අතරෙහි **අඤ්ඤතරං** ඇතුළත් වූ එක්තරා පුද්ගලයකු වූ **බ්‍රහ්මභූතං** බ්‍රහ්ම වූ හෝ ශ්‍රේෂ්ඨ වූ අර්හත්ඵලයට පැමිණි. අතීත ක්ෂීණාශ්‍රවයන් වහන්සේලා පෙර උපනිශ්‍රය සම්පත්තියෙන් යුක්ත වී යම්සේ ආවාහු ද උන්වහන්සේලා අන්ත දෙකෙන් තොර සීල සමාධි ප්‍රඥා ස්කන්ධවලින් යුක්ත වූ මධ්‍යම ප්‍රතිපදාවෙන් යම්සේ නිවනට ගියාහු ද නිවන අවබෝධ කළාහු ද උන්වහන්සේලා ස්කන්ධාදීන්ගේ තථ ලක්ෂණය (නියම ලක්ෂණය) තත් වූ පරිද්දෙන් යම් සේ අවබෝධ කළාහු ද උන්වහන්සේලා දුක් ආදී තථ ධර්මයන් නොවෙනස් අයුරින් යම්සේ දැනගත්තාහු ද, උන්වහන්සේලා රූපාදී අරමුණු දැකීම් මාත්‍රාදී වශයෙන් ම යම් සේ දුටුවාහු ද උන්වහන්සේලා යම්සේ අනාර්ය ව්‍යවහාර අට දුරුකොට ආර්ය ව්‍යවහාර වශයෙන් ම පැවති වචන ඇත්තාහු ද වචනයට අනුරූපව පැවති කය ඇත්තාහු ද කයට අනුරූපව පැවති වචනය ඇත්තාහුද මේ ආර්ය පුද්ගලයා ද එසේය යනුවෙන් **තථාගතං** තථාගත නම් වේ. චතුස්සත්‍යය අවබෝධ කළ බැවින් **බුද්ධං** බුද්ධ නම් වේ. පුද්ගල වෛරය, ක්ලේශ වෛරය අත්තානුවාද ආදී භය ද ඉක්මවූයේය යන අරුතින් **වේරභයාතීතං** වෛර භය දුරුකළා වූ, සියලු කෙලෙස්, අභිසංස්කාර ආදිය පහකළ බැවින් **සබ්බප්පහායිනං** සියල්ල දුරුකළ කෙනෙකැයි බුද්ධාදී ආර්යයෝ ආහු කියති. වර්ණනා කරති.

**නවවන සූත්‍රයයි.**

# 3.2.10

දසවන සූත්‍රයෙහි **න අතරි** තරණය නොකළේය. **සමුද්දං** යනු සංසාර සාගරය, නැතහොත් චක්ඛායතන ආදී සාගරය. ඒ දෙකම පිරවීමට අපහසුය යන අර්ථයෙන් සමුද්‍රය වැනි හෙයින් සමුද්‍රය නම් වේ. නැතහොත් සමුද්දන අර්ථයෙන් සමුද්‍රය නම් වේ. සත්ත්ව සන්තානයේ කෙලෙස් වැස්සීමෙන්ය, කෙලෙස් සරණින් (හැසිරීමෙන්) යන අර්ථයි. **සවීචිං** යනු ක්‍රෝධය හා උපායාසය (බද්ධ වෛරය) යන රළ සහිත වූයේ සවීචි නම් වේ. ඒ කාරණය **'වීචිභයන්ති ඛො භික්ඛු කොධූපායාසසෙසතං අධිවචනං'** 'මහණ, වීචිභය යන මෙය ක්‍රෝධ උපායාසයට නමකි' යනුවෙන් වදාළහ. **සාවට්ටං** යනු පංචකාම ගුණ නමැති සුළිවලින් සුළි සහිත වූ. මේ කාරණය **'ආවට්ටභයන්ති ඛො භික්ඛු පඤ්චන්නෙතං කාමගුණානං අධිවචනං'** 'මහණ, ආවට්ට භය යන මෙය පස්කම් ගුණයට වචනයකි' යනුවෙන් වදාළහ. **සගහං සරක්ඛසං** යනු තමාට ගොදුරු වූවන්ට අයහපත උපදවන හෙයින් චණ්ඩ මකරුන්ට මාලුවන්ට දියරකුසන්ට සමාන වූ විසභාග (අසමාන) පුද්ගලයන් සහිත වූයේ 'සගහ' නමි. ඒ බව **'සගහං සරක්ඛසන්ති ඛො භික්ඛු මාතුගාමසෙසතං අධිවචනං'** 'මහණ, සගහ සරක්ඛස යන මෙය කාන්තාවට නමකි' යනුවෙන් වදාළහ. **අතරි** යනු මාර්ගප්‍රඥාව නමැති නැවෙන් කියන ලද ආකාර ඇති සාගරයෙන් එතෙර වූයේ ය. **තිණ්ණො** යනු තරණය කළේය. **පාරගතො** යනු ඒ සාගරයේ එගොඩට පරතෙරට නිරෝධයට ගියේය. **ථලෙ තිට්ඨති** යනු එහෙයින්ම සංසාර නමැති සැඩ දියපහර ද කාමාදී සැඩ දියපහර ද ඉක්මවා බහා තබන ලද පව් ඇති බමුණු තෙමේ එගොඩෙහි පරතෙරෙහි නිවනෙහි සිටියේ යයි කියනු ලැබේ.

මෙහි ගාථා ද කුශල පක්ෂය වශයෙන් ම ආයේ ය. එහි **උම්මිභයං** (ඌමිභයං) යනු කියන ලද ආකාර ඇති උම්මිභය ය. මෙයින් බියවිය යුතුය යන අරුතින් එය උම්මිභය (රළබිය) නම් වේ. **දුත්තරං** යනු තරණය කිරීමට දුෂ්කර වූ. **අච්චතාරි** යනු ඉක්මවූයේය. **සංගාතිගො** යනු රාගාදී සංග පහ ඉක්මවූ බැවින් පහ වූ බැවින් සංගාතිග නම් වේ. **අත්ථංගතො සො න පමාණමෙති** යනු මෙසේ වූ ඒ රහතන් වහන්සේ රාගාදී ප්‍රමාණකර ධර්මයන් අතිශයින්ම අස්තයට දුරුකිරීමට ගිය බැවින්

අත්‍ථංගත නම් වෙති. එහෙයින් ම සීලාදී ධර්මස්කන්ධ සම්පූර්ණ කිරීමෙන්ද යුක්ත වූ මෙබඳු පුද්ගලයා සීලයෙන් සමාධියෙන් ප්‍රඥාවෙන්දැයි මෙසේ කිසිවකු විසින් ප්‍රමාණ කරන්නට (මනින්නට) නොහැකි වූයේ ප්‍රමාණයකට නො එයි. නැතහොත් අනුපාදිසේස නිවන නම් වූ අස්තයට (නිමාවට) ගියා වූ ඒ රහතන් වහන්සේ (දෙව් මිනිස් ආදී) මෙනම් ගතියෙහි සිටියාහු ද මෙබඳු වූ නාම ගෝත්‍රයෙන් සිටියාහු යනුවෙන් ද ප්‍රමාණ කරන්නට නොහැකි බැවින් ප්‍රමාණයකට නො එති. නො එළඹෙති. එහෙයින්ම අමොහයී මච්චුරාජං ඒ මාරයා විසින් ලුහුබඳින්නට නොහැකි වන්නාහුයයි කියමි. මෙසේ අනුපාදිසේස නිබ්බාණ ධාතුවෙන් ම දේශනාව නිමකළ සේක.

මෙසේ මේ වර්ගයෙහි පළමු පස්වන හයවන සූත්‍රවල දී සසර කියන ලදී. දෙවන සත්වන අටවන සූත්‍රවල නිවන කියන ලදී. ඉතිරි සූත්‍රවල දී සසර හා නිවන කියන ලදැයි දතයුතුය.

**දසවන සූත්‍රයයි.**

**දෙවන වර්ග වර්ණනාව නිමියේ ය.**

# 3.3.1

තුන්වන වර්ගයෙහි පළමු සූත්‍රයෙහි **දිට්ඨා** මයා යනු ම විසින් දක්නා ලදී. මගේ සර්වඥතා ඥානයෙන් (සමන්ත චක්ඛුනා) ද දිවැසින් ද යන මේ දැසින් දක්නා ලදී යන ප්‍රත්‍යක්ෂ වශයෙන් දන්නා ලදී. එයින් අනුන්ගෙන් අසාගෙන කීම (අනුස්සවාදිං) ප්‍රතික්ෂේප කරති. මේ අර්ථය (මෙතැන්හිම) දැන්මම පාළියෙහි එන්නේය. **කාය දුච්චරිතෙන සමන්නාගතා** යනු කාය දුශ්චරිතයෙන් යුක්ත වූ. **අරියානං උපවාදකා** යනු බුද්ධාදී ආර්යයන්ට යටත් පිරිසෙයින් සෝවාන් වූ ගිහි අයට ද ගුණ නැසීමෙන් බොරු චෝදනා කිරීමෙන්, දොස් කියන්නා වූ ආක්‍රෝශ කරන්නා වූ ගරහන්නා

වූ සත්ත්වයෝ. **මිච්ඡාදිට්ඨිකා** (ඇත්ත ඇති සැටියෙන් නොව) වෙනත් අයුරින් (විපරීතව) දකින්නා වූ සත්ත්වයෝ. **මිච්ඡාදිට්ඨිකම්ම සමාදානා** යනු මිථ්‍යා දර්ශනය හේතුවෙන් පිළිගත් නානාවිධ කර්ම ඇති සත්ත්වයෝම මිථ්‍යා දර්ශනය මුල්කොට ගත් කාය කර්මාදියෙහි අන්‍යයන්ද සමාදන් කරවත්. මෙහි වචී-මනෝ දුශ්චරිත ගැනීමෙන්ම අරියූපවාදය, මිථ්‍යා දෘෂ්ටිය ද ගත්කල්හි (එම අරියූපවාද ආදිය) නැවත කීම (ඒවා) මහාසාවද්‍ය බව දැක්වීම පිණිසය. ඒවා අතරින් ආර්ය උපවාදය මහාසාවද්‍යය ආනන්තරිය සමානය. ඒ බව '**සෙය්‍යථාපි සාරිපුත්ත භික්ඛු සීල සම්පන්නො සමාධි සම්පන්නො පඤ්ඤා සම්පන්නො දිට්ඨෙව ධම්මෙ අඤ්ඤං ආරාධෙය්‍ය එවං සම්පදමිදං සාරිපුත්ත තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ**'[1] 'සාරිපුත්ත, යම්සේ භික්ෂුව ශීල සම්පන්න වූයේ සමාධි සම්පන්න වූයේ ප්‍රඥා සම්පන්න වූයේ මේ ජීවිතයේදීම නිවන ලබාගනීද සාරිපුත්ත, මේ කාරණයද මෙසේයයි කියමි. ඒ කීම අතනොහැර ඒ සිත අතනොහැර ඒ දෘෂ්ටිය බැහැර නොකොට (සිටියේ) ගෙනඑන ලද්දක් බහා තබන්නාක් මෙන් නරකයෙහි උපදින්නේ වෙයි' යනුවෙන් මෙසේ වදාළහ.

මිථ්‍යා දෘෂ්ටියට වඩා මහාසාවද්‍ය වූ අනිකක් නම් නැත. ඒ බව '**නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං මහා සාවජ්ජ(තර)ං යථයිදං භික්ඛවෙ මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි පරමානි භික්ඛවෙ වජ්ජානි**'[2] 'මහණෙනි, යමක් මෙසේ මහාසාවද්‍ය වේද, මහණෙනි, මේ මිථ්‍යාදෘෂ්ටිය යම්බඳු ද එබඳු එක් ධර්මයක්වත් මම නො දකිමි. මහණෙනි, වැරදි දේවල් මිථ්‍යාදෘෂ්ටිය පරමකොට ඇත්තේය' යනුවෙන් වදාළහ. **තං ඛො පන** යනාදිය කියන ලද අර්ථයේ තමා විසින් ප්‍රත්‍යක්ෂ කරන ලද බව වඩා දැඩිකොට දක්වන්නට අරඹන ලදී. එය මැනවින් දැනගත හැක්කේමය.

ගාථාවන්හි - **මිච්ඡා මනං පණිධාය** යනු අභිධ්‍යාදීන්ගේ වශයෙන් සිත අනුවණින් තබා. **මිච්ඡාවාචං අභාසිය** යනු වැරදි වූ මුසාවාද ආදී වශයෙන් වචන කතාකොට. **මිච්ඡාකම්මානි කත්වාන** යනු ප්‍රාණඝාත ආදී වශයෙන් කායකර්ම කොට. නැතහොත් 'මිච්ඡා මනං පණිධාය' යනු මිථ්‍යාදෘෂ්ටි වශයෙන් සිත වැරදි (විපරීත) ලෙස පිහිටුවා (තබා). සෙසු පද

1. ම.නි. - මූ.ප - මහා සීහනාද සූත්‍රය. බු.ජ.මු. 174-176 පිටු
2. අං.නි. - ඒ.නි. - ඒකධම්මපාළි - බු.ජ.මු. 68 පිට

දෙකෙහි ද මේ ක්‍රමයමයි. දැන් ඔහුගේ දුසිරිතෙහි හැසිරීමේ කාරණය තත් වූ පරිදි දක්වයි. **අප්පස්සුතො** යනු තමාගේ ද අනුන්ගේ ද යහපත ගෙන දෙන (දහම්) ඇසීමෙන් තොර වූයේ යන අර්ථයි. **අපුඤ්ඤකරො** යනු එහෙයින් ම ආර්ය ධර්මය පිළිබඳ අදක්ෂ බැවින් දරුණු ක්‍රියා කරන්නා වූ පාපධර්ම ඇත්තේ. **අප්පස්මිං ඉධ ජීවිතෙ** යනු 'ඉධ' මිනිස්ලොවෙහි ජීවත්වන ඉතා සුළු කාලය තුළ. ඒ බව '**යො චිරං ජීවති සො වස්සසතං අප්පං වා භීයො**'[1] 'යමෙක් බොහෝ කලක් ජීවත් වේද, හෙතෙම වසර සියයක් හෝ ඊට ස්වල්පයක් අඩුවෙන් හෝ වැඩියෙන් ජීවත් වෙයි.' යනුවෙන් ද 'අප්පමායු මනුස්සානං' 'මිනිසුන්ගේ ආයුෂය අල්පය' යනුවෙන් ද වදාළහ. එහෙයින් බහුශ්‍රැත වූ ප්‍රඥාව ඇති තැනැත්තා වහ වහා පින්කොට ස්වර්ගයට එළඹියේ හෝ නිවනින් කෙළවර වූයේ හෝ වෙයි. යමෙක් වනාහි අල්පශ්‍රැත ද පව්කරන්නේ ද ඒ අනුවණයා කය බිඳීමෙන් (මරණින් පසු) නිරයට එළඹෙයි.

**පළමු සූත්‍රය යි.**

## 3.3.2

දෙවන සූත්‍රයෙහි - පළමු සූත්‍රයෙහි කියන ලද ආකාරයට විරුද්ධ ආකාරයෙන් අර්ථය දතයුතුය.

**දෙවන සූත්‍රය යි.**

---

1. සං.නි. - මාර සංයුත්ත - පඨම ආයු සුත්ත - බු.ජ.මු. 1 හා 198 පිට

# 3.3.3

තුන්වන සූත්‍රයෙහි **නිස්සරණීයා** ඉවත්වීම හා බැඳුණු. ධාතුයො යනු සත්ත්ව වශයෙන් ශූන්‍ය ස්වභාව. **කාමානං** යනු කෙලෙස් කාමයන්ගේද වස්තු කාමයන්ගේ ද නැතහොත් 'කාමානං' යනු කෙලෙස් කාමයන්ගේ, කෙලෙස් කාමයෙන් ඉවත්වීම වස්තුකාමයෙන් ඉවත්වීම ම වෙයි. අන් අයුරකින් නොවේ. මේ කාරණය,

**න තෙ කාමා යානි චිත්‍රානි ලොකෙ**
**සංකප්පරාගො පුරිසස්ස කාමො**
**තිට්ඨන්ති චිත්‍රානි තථෙව ලොකෙ**
**අථෙත්ථ ධීරා විනයන්ති ඡන්දං'**[1]

ලෝකයෙහි විසිතුරු වූ රූපාදී අරමුණු ඇද්ද ඒවා 'කාම' නොවේ. පුරුෂයාගේ අදහස් කරන ලද රාගය කාමය යි. ලෝකයෙහි විසිතුරු වූ රූපාදී අරමුණු එසේම සිටී. එහෙයින් පණ්ඩිතයෝ මේ අරමුණුවල ඡන්දරාගය දුරුකරති.

**නිස්සරණං** යනු ඉවත්වීම. **නෙක්ඛම්මං** යනු ප්‍රථමධ්‍යානය, විශේෂ වශයෙන් ඒ අශුභාරම්මණය දතයුතුය. යමෙක් වනාහි ඒ ධ්‍යානය පාදකකොට සංස්කාරයන් විමසා බලා තුන්වන මාර්ගයට පත්ව අනාගාමී මාර්ගයෙන් නිවන ප්‍රත්‍යක්ෂ කරයි. ඔහුගේ සිත අතිශයින්ම කාමයන්ගෙන් ඉවත්කරන ලදැයි යන මෙය ඉතා උසස් මට්ටමින් කාමයන්ගේ ඉවත්වීම දතයුතුය. **රූපානං** යනු රූපධර්මයන්ගේ, විශේෂයෙන් අරමුණු සමග කුසල-විපාක-කිරිය භේදයෙන් සියලුම රූපාවචර ධර්මයන්ගේ, **ආරුප්පං** යනු අරූපාවචර ධ්‍යානය. ඇතැමෙක් වනාහි 'කාමානං' යන පදයට සියලුම කාමාවචර ධර්මයන්ගේ යන අර්ථය කියති. 'නෙක්ඛම්මං' යනු ද රූපාවචර ධ්‍යාන පහ යනුවෙන් කියති. එය අට්ඨකථාවන්හි නැත. යෙදෙන්නේ ද නැත. **භූතං** යනු උපන්. **සංඛතං** යනු එක්රැස්ව ප්‍රත්‍යවලින් කරන ලද. **පටිච්ච සමුප්පන්නං** යනු කාරණයකින් උපන්. පද තුනෙන්ම (කාම-රූප-අරූප යන) භූමි තුනට අයත් ධර්මයන් ඉතිරි නොකර ගනියි. **නිරොධො** යනු නිවන යි. මෙහි ද ප්‍රථම ධාතුවෙන් කාමයන් පිළිබඳ

1. සං.නි. මාර සංයුත්තය - බු.ජ.මු 1 භා - 198 පිට

විශේෂ දැනීම කියන ලදී. දෙවන ධාතුවෙන් රූපයන් පිළිබඳ විශේෂ දැනීම කියන ලදී. තෙවන ධාතුවෙන් සියලු සංඛත ධර්මයන් පිළිබඳ විශේෂ දැනීම සියලු භවයන්ගෙන් නික්මීම කියන ලදී.

ගාථාවන්හි - **කාමනිස්සරණං ඤත්වා** යනු ඉදං කාමනිස්සරණං කාමයෙන් වෙන්වීම මෙසේයයි දැන, මෙය කරණකොට ඉක්මවයි යන අරුතින් ඉක්මවීම වෙයි. (එනම්) ඉක්මවන උපායයි. ඒ **අතික්කමං** අරූපාවචර ධ්‍යානය දැන. මෙහි දී සියලු සංස්කාර සන්සිඳෙයි යන අරුතින් සියලු සංඛාර සමථය (සබ්බ සංඛාර සමථො) එනම් නිවන ය. එය ඵුසං ස්පර්ශ කරන්නා වූ. (ලබන්නා වූ) ඉතිරිය මුලින් කියන ලද අයුරින්මය.

**තෙවන සූත්‍රය යි.**

# 3.3.4

සතරවන සූත්‍රයෙහි **රූපෙහි** යනු රූපාවචර ධර්මයන්ට වඩා **සන්තතරා** අතිශයින් ශාන්තය. රූපාවචර ධර්ම වනාහි කෙලෙස් මැඩපැවැත්වීමෙන් ද ඕළාරික අංග ප්‍රහාණයෙන් ද සමාධියට භූමිය වන බැවින් ද ශාන්ත නම් වේ. **ආරුප්පා** අරූපාවචර ධ්‍යාන වනාහි (මුලින් කී) ඒ අංගවලින් ශාන්ත වූ බැවින් ද අරමුණු වශයෙන් ශාන්ත වූ බැවින් ද අතිශයින් ශාන්ත පැවතුම් ඇති හෙයින් රූපාවචර ධ්‍යානයට වඩා ශාන්ත යයි කියන ලදී. **නිරොධො** යනු නිවන ය. අවශේෂ සංස්කාර සියුම් බවට පත්වීමෙන් ද කෙලෙස්දරථ (විඩාව) සන්සිඳුණු හෙයින් ද නිවන අරමුණු වීමෙන් ද සතරවන අරූපාවචර ධ්‍යානයට වඩා ඵලසමාපත්තියම ශාන්තය. සියලු සංස්කාර සන්සිඳීම නම් වූ නිවන ගැන කියනුම කිම. එහෙයින් **ආරුප්පෙහි නිරොධො සන්තතරො** යි කියන ලදී.

ගාථාවන්හි **රූපූපගා** යනු රූප භවයට එළඹි, මෙහි රූප භවය රූපයයි කියන ලදී. 'රූපුපපත්තියා මග්ගං භාවෙති' යනාදියෙහි මෙනි. **ආරුප්පට්ඨායිනො** යනු අරූපාවචර සත්ත්වයෝ. **නිරොධං අප්පජානන්තා ආගන්තාරො පුනබ්භවං** යන මෙයින් රූපාවචර අරූපාවචර ධර්මවලට වඩා නිරෝධයේ ශාන්තබවම දක්වයි. **අරූපෙසු අසණ්ඨිතා** අරූප රාගයෙන් අරූප භවයන්හි නොපිහිටියාහු, ඔවුහු ද පිරිසිඳ දන්නාහු යන අර්ථයි. **නිරොධෙ යෙ විමුච්චන්ති** යන මෙහි 'යෙ' යනු නිපාත මාත්‍රයකි. ඉතිරිය මුලින් කියන ලද පරිදිමය.

සතරවන සූත්‍රය යි.

# 3.3.5

පස්වන සූත්‍රයෙහි **පුත්තා** යනු තමාට උපන් එනම් ඖරස පුත්‍රයෝය. නැතහොත් හදාවඩාගත් පුතුන් ආදී අය. **සන්තො** යනු ඇත්තා වූ. **සංවිජ්ජමානා ලොකස්මිං** යනු මේ ලෝකයෙහි ලැබෙන්නා වූ. ඇති බැවින් 'සන්තා' ය. ප්‍රකට බැවින් 'විජ්ජමානා'ය. **අතිජාතො** යනු තමාගේ ගුණවලින් මව්පියන් ඉක්මවා උපන්, මව්පියන්ට වඩා අධික ගුණ ඇත්තා වූ යන අර්ථයි. **අනුජාතො** යනු ගුණධර්මවලින් මව්පියන්ට අනුරූපව උපන්, ඔවුන්ට සමාන වූ ගුණ ඇත්තේ යන අර්ථයි. **අවජාතො** යනු ගුණධර්මවලින් මව්පියන්ට අවම ගුණ ඇත්තෙක්ව උපන්, ඔවුන්ට වඩා හීනගුණ ඇත්තේ යන අර්ථයි. යම් ගුණධර්මවලින් යුක්ත වූ පුත්‍රයා මව්පියන්ගේ ගුණවලට අධික වූයේ ද සම වූයේ ද පහත් වූයේ ද යනුවෙන් අදහස් කරන ලදී. ඒවා බෙදා දක්වන්නට 'කථඤ්ච භික්ඛවෙ පුත්තො අතිජාතො හොති' යනුවෙන් කියනු කැමැත්තෙන් විමසීම සිදුකොට 'ඉධ භික්ඛවෙ පුත්තස්ස' යනාදී වශයෙන් නිර්දේශය (විස්තර කොට දැක්වීම) ආරම්භ කරන ලදී.

එහි **න බුද්ධං සරණං ගතා** යනාදියෙහි 'බුද්ධ' යනු සියලු ධර්මයන්හි නොහැපුණු ඤාණ නිමිත්තෙන් අනුත්තර වූ විමෝක්ෂය ලබා ගැනීම පුරුදු කළ ස්කන්ධ සන්තානය ඇති සර්වඥතා ඥානයට ආසන්න කාරණය වූ සත්‍යාවබෝධය හෝ හේතු කරගෙන පැනවීම් කරන සත්ත්වයන්ට උසස් වූ බුදුරදුන්ය.

එය කියන ලද අයුරු මෙසේය. '**බුද්ධොති යො සො භගවා සයම්භූ අනාචරියකො පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අභිසම්බුජ්ඣි, තත්ථ ච සබ්බඤ්ඤුතං පත්තො, බලෙසු ච වසීභාවං**'[1] 'බුද්ධ යනු යමෙක් භාග්‍යවත් වූයේ (සත්‍යයන්) අවබෝධ කළේ ගුරුවරුන් නැත්තේ පෙර නොඇසූ ධර්මයන්හි තමා සත්‍යයන් අවබෝධ කළේ ඒ සත්‍යයන්හි ද සර්වඥබවට පැමිණියේ බලධර්මයන්හි ද වශීභාවයට පැමිණියේ වේද හෙතෙමේය' පළමුකොට මෙය අර්ථ වශයෙන් 'බුද්ධ' යන පදය පැහැදිලි කිරීමයි. ව්‍යඤ්ජන (පද) වශයෙන් වනාහි සසර පුරුදු සහිත කෙලෙස් නින්දෙන් අතිශයින්ම බැහැර වූ හෙයින් බුද්ධ හෝ පටිබුද්ධ හෝ වෙතියි බුද්ධ නම් වේ. බුද්ධියේ විකසිත භාවයෙන් හෝ බුද්ධ හෝ විබුද්ධ හෝ වෙතියි බුද්ධ නම් වේ. අවබෝධ කළේය යනුවෙන් බුද්ධය. අවබෝධ කරවයි යනුවෙන් බුද්ධය. මේ ආදී ක්‍රමයෙන් දතයුතුය. එය කියන ලද අයුරු මෙසේය. '**බුජ්ඣිතා සච්චානීති** = **බුද්ධො, බොධෙතා පජායාති බුද්ධො, සබ්බඤ්ඤුතාය** = **බුද්ධො, සබ්බදස්සාවිතාය** = **බුද්ධො, අනඤ්ඤනෙය්‍යතාය** = **බුද්ධො, විසවිතාය බුද්ධො, ඛීණාසව සංඛාතෙන බුද්ධො, නිරුපක්කිලෙස සංඛාතෙන** = **බුද්ධො, එකන්තවීතරාගොති** = **බුද්ධො එකන්තවීතදොසොති** = **බුද්ධො, එකන්තවීතමොහොති** = **බුද්ධො, එකන්ත නික්කිලෙසොති බුද්ධො, එකායන මග්ගං ගතොති බුද්ධො, එකො අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුද්ධොති** = **බුද්ධො, අබුද්ධි විහතත්තා බුද්ධිපටිලාභාති** = **බුද්ධො, බුද්ධොති නෙතං නාමං මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං, න ඤාතිසාලොහිතෙහි කතං, න සමණ බ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං, අත්ථො විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියාමූලෙ සහ සබ්බඤ්ඤුත ඤාණස්ස පටිලාභා සච්ඡිකාපඤ්ඤත්ති යදිදං බුද්ධො**'ති[1]

'සත්‍යයන් අවබෝධ කළේය යනුවෙන් බුද්ධය, ප්‍රජාවට අවබෝධ කරවයි යනුවෙන් බුද්ධය, සර්වඥ බැවින් බුද්ධය, (සියල්ල දන්නා බැවින්

බුද්ධය) සියල්ල දක්නා බැවින් බුද්ධය, අනුන් විසින් අවබෝධ නොකරවිය යුතු බැවින්, තමාම අවබෝධ කළ බැවින් බුද්ධය, නොයෙක් ගුණ ගලන හෙයින් බුද්ධය = (පියුමක් මෙන් පිපෙන හෙයින් බුද්ධය), ක්ෂීණාශ්‍රව නාමයෙන් බුද්ධය, උපක්ලේශ නැත, නාමයෙන් බුද්ධය, ඒකාන්තයෙන් වීතරාග (පහකළ රාගය ඇති) හෙයින් බුද්ධය, ඒකාන්තයෙන් වීතදෝස (පහකළ ද්වේෂය ඇති) හෙයින් බුද්ධය, ඒකාන්තයෙන් වීතමෝහ (පහකළ මෝහය ඇති) හෙයින් බුද්ධය, ඒකාන්තයෙන් කෙලෙස් නැති බැවින් බුද්ධ ය, ඒකායන මාර්ගයට ගිය හෙයින් බුද්ධය, තනිව අනුත්තර වූ සම්මා සම්බෝධිය අවබෝධ කළ හෙයින් බුද්ධය, අබුද්ධිය නැසූ හෙයින් බුද්ධිය ලැබූ හෙයින් බුද්ධය, බුද්ධ යන ඒ නම මව විසින් නොකරන ලදී, පියා විසින් නොකරන ලදී, සොහොයුරා විසින් නොකරන ලදී, සොහොයුරිය විසින් නොකරන ලදී, මිතුරන් මෙහෙකරුවන් විසින් නොකරන ලදී, මව්-පිය දෙපසට අයත් ලේ නෑයන් විසින් නොකරන ලදී, ශ්‍රමණ බ්‍රාහ්මණයන් විසින් නොකරන ලදී, දෙවියන් විසින් නොකරන ලදී, බුද්ධ යන නම අර්හත්ඵලය නම් වූ විමෝක්ෂ අන්තයෙහි භාග්‍යවත් වූ බුදුවරුන්ට සර්වඥතාඥානය ලැබීමත් සමග අර්හත්ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් පැණවීමකි.

හිංසාකරන හෙයින් (හිංසතීති) සරණ නම් වේ. සියලු අයහපත, අපාය දුක සියලු සසර දුක හිංසා කරයි විනාශ කරයි යන අර්ථයි. **සරණං ගතා** යනු භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ අපගේ පිහිටය, පරායනය, පිළිසරණය, විපත නසන තැනැත්තෝ ය, යහපත සිදුකරන තැනැත්තෝය යන මේ අදහසින් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වෙතට යමු, උන්වහන්සේ භජනය කරමු, සේවනය කරමු, පයිරුපාසනය කරමු මෙසේද දනිමු, අවබෝධ කරමුයි (සිතා) මෙසේ ගිය අය එළඹි අය බුදුන්සරණ ගිය අය වෙති. එය ප්‍රතික්ෂේප කිරීමෙන් බුදුන් සරණ ගියාහු නො වෙති.

**ධම්මං සරණං ගතා** යනු අවබෝධ කරන ලද මාර්ගය ඇති, ප්‍රත්‍යක්ෂ කරන ලද නිවන ඇති, අනුශාසනා කළ අයුරින් පිළිපැදීම් ඇති අය සතර අපායෙහි නොවැටෙන්නවුන් කොට දරයි යන අරුතින් ධම්ම නම් වෙයි. එය අර්ථ වශයෙන් ආර්ය මාර්ගයත් නිවනත් වෙයි. මේ කාරණය මෙසේ කියන ලදී. **'යාවතා භික්ඛවෙ ධම්මා සංඛතා අරියො අට්ඨංගිකො මග්ගො තෙසං අග්ගමක්ඛායති'**[1] 'මහණෙනි, යම්තාක් සංඛත

ධර්ම ඇද්ද අරිඅටඟි මග ඒවාට අග්‍රයයි කියනු ලැබේ' යනු විස්තරයයි. හුදෙක් ආර්යමාර්ගය හා නිවන පමණක්ම නොවේ. තවදුරටත් ආර්යඵලයන් සමග පර්යාප්ති ධර්මය ද ධර්මය වෙයි. ඡත්තමාණවක විමාන වස්තුවෙහි මෙය මෙසේ කියන ලදී :-

රාගවිරාගමනෙජමසොකං - ධම්මමසංඛතමප්පටිකූලං
මධුරමිමං පගුණං සුවිභත්තං - ධම්මමිමං සරණත්ථමුපෙහි

රාගය දුරුකරන්නා වූ තෘෂ්ණා රහිත වූ ශෝක රහිත වූ මේ මාර්ගඵල නිර්වාණ ධර්මය ද (සියලු කල්හි) පිළිකුල් නොවූ මිහිරි වූ ප්‍රගුණ වූ මැනවින් බෙදන ලද මේ පර්යාප්ති ධර්මය ද පිහිට පිණිස එළඹෙන්න.

එහි 'රාගවිරාගො' යනුවෙන් (ආර්ය) මාර්ගය කියන ලදී. 'අනෙජමසොකං' යනුවෙන් ඵලය කියන ලදී. 'ධම්මමසංඛතං' යනුවෙන් නිවන කියන ලදී. 'අප්පටිකූලං මධුරමිමං පගුණං සුවිභත්තං යනුවෙන් පිටක තුනෙන් බෙදා දක්වන ලද සියලු ධර්මස්කන්ධය කියන ලදී. ඒ ධර්මය කියන ලද ආකාරයෙන් පිහිට කොට ගියාහු දහම් සරණ ගියාහු වෙති. එයට විරුද්ධ ආකාරයෙන් දහම් සරණ නොගියාහු වෙති.

දෘෂ්ටි ශීල සමූහයෙන් ස්ථිර වූයේ යන අරුතින් සංඝ නම් වේ. ඒ සංඝයා අර්ථ වශයෙන් ආර්ය පුද්ගලයන් අටදෙනාගේ සමූහය යි. ඒ කාරණය ඒ ඡත්තමාණවක විමාන කථාවෙහි ම (මෙසේ) කියන ලදී :-

යත්ථ ච දින්න මහප්ඵලමාහු - චතූසු සුචීසු පුරිසයුගෙසු
අට්ඨ ච පුග්ගල ධම්මදසාතෙ - සංඝමිමං සරණත්ථමුපෙහී

යම් ආර්ය සංඝරත්නයක් කෙරෙහි දෙන ලද්ද මහත්ඵලයයි කීවාහුද පිරිසිදු පුරුෂ යුග සතරෙක්හි වූ සිවුසස් හා නිවන් ප්‍රත්‍යක්ෂ වශයෙන් දක්නා වූ ඒ පුද්ගලයෝ අටදෙනෙකි. මේ සංඝයා පිහිට පිණිස එළඹෙන්න.

ඒ සංඝයා කියන ලද ආකාරයෙන් පිහිටකොට ගියාහු සඟ සරණ ගියාහු වෙති. එයට විරුද්ධ ආකාරයෙන් සඟ සරණ නො ගියාහු වෙති.

මෙහි සරණ ගමනයේ දක්ෂ බව පිණිස සරණය, සරණගමනය, සරණ යන තැනැත්තා ද සරණගමනයෙහි ප්‍රභේදය, ඵලය, කෙලෙසීම, බිඳීම, පිරිසිදුවීම යන මේ ආකාරය දතයුතුය. පළමුකොට එහි පදාර්ථ වශයෙන් හිංසාකරන හෙයින් සරණ නම් වේ. ඒ සරණ යාමෙන් ම සරණ යන අයගේ භය, තැතිගැනීම, දුක්, දුගති, කෙලෙස් විනාශ කරයි යන අර්ථයි. රත්නත්‍රයට මේ නමකි. නැතහොත් යහපත පැවැත්වීමෙන් ද අයහපත නැවැත්වීමෙන් ද සත්ත්වයන්ගේ භය විනාශ කරයි යන අරුතින් බුද්ධ නම් වෙයි. භව කතරින් එතෙර කිරීමෙන් අස්වැසීම දීමෙන් ද ධර්මය නම් වෙයි. අල්ප වශයෙන් වුවද කටයුතු කරන්නන්ට මහත්ඵල ලැබීම සිදුකිරීමෙන් සංඝයා නම් වෙයි. එහෙයින් මේ ක්‍රමයෙන් ද තෙරුවන පිහිටකි (සරණකි).

එයට ඇති ප්‍රසාදයෙන් ද ගරුකිරීම් ඇති බැවින් ද පහවූ කෙලෙස් ඇති එය පිහිටකොට යන ආකාරයෙන් පැවති සිතේ ඉපදීම සරණගමනයයි. එයින් යුක්ත වූ සත්ත්වයා සරණ යයි, කියන ලද ආකාර ඇති සිත ඉපදීමෙන් ඒ තෙරුවන මට සරණය. ඒවා පරායනය යනුවෙන් මෙසේ එළඹෙයි යන අර්ථයි. මෙසේ පළමුකොට සරණය, සරණගමනය, සරණ යන තැනැත්තා යන මේ තුන දතයුතුය.

ප්‍රභේද වශයෙන් සරණගමනය ලෞකික ලෝකෝත්තර වශයෙන් දෙපරිදිය. ලෝකෝත්තර සරණගමනය දක්නා ලද සත්‍ය ඇති අයගේ මාර්ග ඥානය ඇතිවන මොහොතෙහි සරණගමනයට ඇති උපක්ලේශ සහමුලින් සිඳ දැමීමෙන් අරමුණු වශයෙන් නිවන අරමුණු වී කෘත්‍ය (කටයුතු) වශයෙන් මුළු තෙරුවන ම (සරණයාම) සිදුවෙයි. පෘථග්ජනයන්ගේ ලෞකික සරණගමනයට ඇති උපක්ලේශ (බාධාවන්) මැඩපැවැත්වීමෙන් අරමුණු වශයෙන් බුද්ධාදී ගුණ අරමුණු වී (සරණ යාම) සිදුවෙයි. එය අර්ථ වශයෙන් බුද්ධාදී වස්තු (රත්න) කෙරෙහි ශ්‍රද්ධාව ලැබීමයි. ශ්‍රද්ධාව මූලික කොට ඇති සම්මා දිට්ඨිය දසපින් කිරියවත්වල ඇති දිට්ඨිජ්ජුකම්මය යි කියනු ලැබේ.

ඒ මේ (ලෞකික) සරණමනය ආත්ම සන්නිර්යාතන, තත්පරායණ, ශිෂ්‍යභාවූපගමන, ප්‍රණිපාත යනුවෙන් සතර ආකාරයකින් පවතී. එහි ආත්ම සන්නිර්යාතන (සරණගමන)ය නම් අද පටන් කොට මම ජීවිතය

බුදුරජාණන් වහන්සේට ධර්මයට සංඝයාට භාරකරමි යනුවෙන් මෙසේ බුද්ධාදීන්ට ආත්ම පරිත්‍යාගයයි. තත්පරායණය නම් අද පටන්කොට මම බුද්ධ පරායණ කෙනෙක්මි (බුදුන් පිහිටකොට ඇත්තෙක්මි) ධර්ම පරායණ කෙනෙක්මි. සංඝපරායණ කෙනෙක්මි යනුවෙන් මා පිළිගන්නැයි මෙසේ ඒ තෙරුවන පිළිසරණ බව තත්පරායණයයි. ශිෂ්‍ය භාවූපගමන නම් අද පටන්කොට මම බුදුරජාණන් වහන්සේගේ ධර්මයේ සංඝයාගේ අතවැසියෙක්මි යනුවෙන් මා පිළිගන්නැයි (කියා) මෙසේ ශිෂ්‍යභාවයට එළඹීමයි.

ප්‍රණිපාත නම් අද පටන්කොට මම බුද්ධාදී වස්තු තුනට ම අභිවාදනය (පසඟ පිහිටුවා වැඳීම) පච්චුට්ඨානය (දැක අසුනෙන් නැගිටීම) අඤ්ජලිකම්මය (ඇඟිලි දහය එක්කොට දෑත් නළලෙහි තබා වැඳීම) සාමීචි කම්මය (ආසන පැනවීම් ආදී සුදුසු ක්‍රියා) කරමි යනුවෙන් මා පිළිගන්නැයි මෙසේ බුද්ධාදීන් කෙරෙහි ඉතාම යටහත් පහත් ලෙස ගරුකිරීමයි. මේ සතර ආකාරයෙන් එකකින් සරණ යෑම කරන තැනැත්තා විසින් සරණගමනය ගන්නා ලද්දේම වෙයි.

තව ද භාග්‍යවතුන් වහන්සේට, ධර්මයට, සංඝයාට ආත්මය පරිත්‍යාග කරමි, ජීවිතය පරිත්‍යාග කරමි, මගේ ආත්මය ද ජීවිතය ද පරිත්‍යාග කරන ලද්දේම ය, ජීවිතය කෙළවරකොට බුදුන් සරණ යමි, බුදුරජාණන් වහන්සේ මට පිහිටය, ආරක්ෂාවය යනුවෙන් මෙසේ ද ආත්ම සන්නිර්යාතනය දතයුතුය. **'සත්ථාරඤ්ච වතාහං පස්සාමි භගවන්තමෙව පස්සාමි, සුගතඤ්ච වතාහං පස්සාමි භගවන්තමෙව පස්සාමි, සම්මා සම්බුද්ධඤ්ච වතාහං පස්සාමි භගවන්තමෙව පස්සාමි'** ඒකාන්තයෙන් මම ශාස්තෲන් වහන්සේ දකිම් ද මම භාග්‍යවතුන් වහන්සේ ම දකිමි, ඒකාන්තයෙන් ම මම සුගතයන් වහන්සේ දකිම්ද මම භාග්‍යවතුන් වහන්සේම දකිමි, ඒකාන්තයෙන් මම සම්මා සම්බුදුරජාණන් වහන්සේ දකිම්ද මම භාග්‍යවතුන් වහන්සේම දකිමි'යි මෙසේ මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේගේ සරණගමනය මෙන් ශිෂ්‍යභාවූපගමනය දතයුතුය.

**සො අහං විචරිස්සාමි ගාමා ගාමං පුරා පුරං**
**නමස්සමානො සම්බුද්ධං ධම්මස්ස ච සුධම්මතං**[1]

---

1. සුත්ත නිපාතය - ආළවක සූත්‍රය

'ඒ මම සම්බුදුරජාණන් වහන්සේ නමදිමින් ධර්මයේ සුධර්මත්වය කියමින් ගමින් ගම නුවරින් නුවර හැසිරෙන්නෙමි.'

මෙසේ ආලවක ආදීන්ගේ සරණගමනය මෙන් තත්පරායණය දතයුතුය. **'අථ ඛො බ්‍රහමායු බ්‍රාහමණො උට්ඨායාසනා එකංසං උත්තරාසංගං කරිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවතො පාදානි මුඛෙන ච පරිචුම්බති පානීහි ච පරිසම්බාහති නාමංච සාවෙති බ්‍රහමායු අහං භො ගොතම බ්‍රාහමණො, බ්‍රහමායු අහං භො ගොතම බ්‍රාහමණො'**[1] 'ඉක්බිති බ්‍රහ්මායු බමුණු තෙම ආසනයෙන් නැගිට උතුරු සළුව එකාංශකොට භාග්‍යවතුන් වහන්සේගේ පා ළඟ සිරසින් වැටී භාග්‍යවතුන් වහන්සේගේ පා මුහුණෙන් සිඹියි, දෑතින් පිරිමදියි, පින්වත් ගෞතමයන් වහන්ස, මම බ්‍රහ්මායු බමුණා වෙමි, පින්වත් ගෞතමයන් වහන්ස, මම බ්‍රහ්මායු බමුණා වෙමියි නම ද ප්‍රකාශ කරයි' යනුවෙන් මෙසේ ප්‍රණිපාතය දතයුතුය.

ඒ මේ ප්‍රණිපාතය වනාහි ඤාති-භය-ආචරිය-දක්ඛිණෙය්‍ය වශයෙන් සිවුවැදැරුම් වෙයි. එහි දක්ඛිණෙය්‍ය ප්‍රණිපාතයෙන් සරණගමනය සිදුවෙයි. අන් ඒවායින් සරණගමනය සිදු නොවෙයි. ශ්‍රේෂ්ඨ වශයෙන් සරණ ගනීද ශ්‍රේෂ්ඨ වශයෙන් බිඳෙයි. එහෙයින් යමෙක් 'මොහු ම ආර්යයෙකි, ලෝකයෙහි සියලු සතුන්ට උතුම් ය, අග්‍ර දක්ඛිණෙය්‍ය ය (දන්දීමට ඉතාම සුදුසුය) යනුවෙන් සිතා වඳියි ද ඔහු විසින්ම සරණය ගන්නා ලද්දේ වෙයි. ඤාතියෙකි යන හැඟීමෙන්, භයෙන්, ගුරුවරයාය යන හැඟීමෙන් යුතුව වඳින තැනැත්තා විසින් සරණය නොගන්නා ලද්දේ වෙයි. මෙසේ අන්‍ය තීර්ථකයන් අතර පැවිදි වූ ඤාතියකු (දැක) 'මොහු මගේ ඤාතියෙකි' යනුවෙන් සිතා වඳින්නා වූ මෙසේ සරණ ගිය උපාසකයෙකුගේ හෝ උපාසිකාවකගේ සරණය නො බිඳෙයි. පැවිදි නොවූ කෙනෙකුට වැඳීම ගැන කියයුත්තක්ම නැත. එසේම හෙතෙම රටවැසියන් විසින් පුදන ලද බැවින් ඔහුට නොවැඳීමෙන් අයහපතක් කරන්නේ යයි සිතා භය නිසා රජුට වඳින තැනැත්තාගේ සරණය නොබිඳෙයි. එසේම යම්කිසි ශිල්පයක් උගන්වන තීර්ථකයෙකුට 'මොහු මගේ ගුරුවරයාය යන හැඟීමෙන් යුතුව වඳින තැනැත්තාගේ සරණය නොබිඳෙයි. මෙසේ සරණගමනයේ ප්‍රභේද දතයුතුය.

---

1. ම.නි. 2 භා - බ්‍රහ්මායු සුත්ත - බු.ජ.මු. 594 පිට.

මෙහි ද ලෝකෝත්තර සරණගමනයේ විපාකඵලය යනු සතර සාමඤ්ඤඵලයයි. සියලු දුක් ක්‍ෂයකිරීම ආනිසංසඵලය යි. මේ කාරණය

**යො ච බුද්ධං ච ධම්මං ච සංඝං ච සරණං ගතො -පෙ-**
**එතං සරණමාගම්ම සබ්බදුක්ඛා පමුච්චති**[1]

'යමෙක් බුදුන් ද දහම් ද සඟුන් ද සරණ ගියේ නම් -පෙ- ඒ සරණයට පැමිණ සත්ත්වයා සියලු දුකින් මිදෙයි' යනුවෙන් කියන ලදී.

තවදුරටත් (සංස්කාරයන්) නිත්‍ය වශයෙන් නො පිළිගැනීම් ආදියෙහිද ලෝකෝත්තර සරණගමනයේ ආනිසංසඵලය දතයුතුය. මේ කාරණය මෙසේ කියන ලදී. '**අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො යං දිට්ඨිසම්පන්නො පුග්ගලො කංචි සංඛාරං නිච්චතො උපගච්ඡෙය්‍ය, සුඛතො උපගච්ඡෙය්‍ය කංචි ධම්මං අත්තතො උපගච්ඡෙය්‍ය, මාතරං ජීවිතං වොරොපෙය්‍ය, පිතරං ජීවිතා වොරොපෙය්‍ය, අරහන්තං ජීවිතා වොරොපෙය්‍ය, දුට්ඨචිත්තො තථාගතස්ස ලොහිතං උප්පාදෙය්‍ය, සංඝං භින්දෙය්‍ය, අඤ්ඤං සත්ථාරං උද්දිසෙය්‍ය, නෙතං ඨානං විජ්ජති**'[2]

'මහණෙනි, යම්හෙයකින් මාර්ග දෘෂ්ටියෙන් යුත් (සෝවාන්) පුද්ගල තෙමේ කිසි සංස්කාරයක් නිත්‍යයයි ගන්නේය, සුඛය යි ගන්නේය, කිසි ධර්මයක් ආත්මයයි ගන්නේය, මව ජීවිතයෙන් තොර කරන්නේය, පියා ජීවිතයෙන් තොර කරන්නේය, රහත් කෙනෙකු ජීවිතයෙන් තොර කරන්නේය, දුෂ්ට වූ සිතින් තථාගතයන් වහන්සේගේ (සිරුරෙහි) ලේ සොලවන්නේය, සංඝයා බිඳින්නේය, අන්‍ය ශාස්තෘ කෙනෙකුන් උදෙසා සිටින්නේය යන යමක් වේද, ඒ කරුණ විද්‍යමාන නොවේ.'

භව සම්පත් හා භෝග සම්පත් ලෞකික සරණගමනයේ ඵලය යි. මේ කාරණය මෙසේ කියන ලදී.

**යෙ කෙචි බුද්ධං සරණං ගතාසෙ - න තෙ ගමිස්සන්ති අපායං**
**පහාය මානුසං දෙහං දෙවකායං පරිපූරෙස්සන්ති**[3]

'යමෙක් බුදුන් සරණ ගියාහු ද ඔවුහු අපායට නොයති. මිනිස් කය අතහැර දිව්‍ය කය පුරවති. (මැරෙන මිනිස්සු දෙව්ලොව උපදිති.)

1. ධම්මපද - බුද්ධ වග්ග - 12-13-14 ගාථා
2. අං.නි - 1 භා - අට්ඨාන පාළි බු.ජ.මු. 54-56 පිටු
3. දී.නි - මහාසමය සුත්ත

අතිකක් ද කියන ලදී.

'අථ ඛො සක්කො දෙවානමින්දො අසීතියා දෙවතා සහස්සෙහි සද්ධිං යෙනායස්මා මහා මොග්ගල්ලානො තෙනුපසංකමි -පෙ- එකමන්තං ඨිතං ඛො සක්කං දෙවානමින්දං ආයස්මා මහාමොග්ගල්ලානෝ එතදවොච, සාධු ඛො දෙවානමින්ද බුද්ධං සරණගමනං හොති. බුද්ධං සරණගමන හෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති, තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති - දිබ්බෙන ආයුනා, දිබ්බෙන වණ්ණෙන, දිබ්බෙන සුඛෙන, දිබ්බෙන යසෙන, දිබ්බෙන ආධිපතෙය්‍යෙන, දිබ්බෙහි රූපෙහි, දිබ්බෙහි සද්දෙහි දිබ්බෙහි ගන්ධෙහි, දිබ්බෙහි රසෙහි, දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි -පෙ- ධම්මං සංඝං -පෙ- ඵොට්ඨබ්බෙහි'[1]

'ඉක්බිති ශක්‍ර දිව්‍යරාජයා අසූදහසක් දේවතාවන් සමග ආයුෂ්මත් මහමුගලන් මහරහතන් වහන්සේ වෙත එළඹියේ ය. -පෙ- එකත්පසෙක සිටි ශක්‍ර දිව්‍යරාජයාට ආයුෂ්මත් මහමුගලන් මහරහතන් වහන්සේ මෙය කීහ. දිව්‍යරාජය බුදුන් සරණයාම යහපත් වෙයි. බුදුන් සරණ යාම හේතුවෙන් දිව්‍යරාජය, මෙලොව ඇතැම් සත්ත්වයෝ කය බිඳීමෙන් මරණින් පසු සුගති නම් වූ ස්වර්ග ලෝකයෙහි උපදිති. ඔවුහු දිව්‍ය ආයුෂයෙන්, දිව්‍ය වර්ණයෙන්, දිව්‍ය සැපයෙන්, දිව්‍ය යසසින් (පිරිවර) දිව්‍ය අධිපති බවෙන්, දිව්‍යරූපවලින්, දිව්‍ය ශබ්දවලින්, දිව්‍ය සුවඳින්, දිව්‍ය රසවලින්, දිව්‍ය ස්පර්ශවලින් යන කරුණු දහයෙන් අනිත් දෙවිවරුන් ඉක්මවා සිටිති. -පෙ- ධර්මය - සංඝයා -පෙ- ස්පර්ශවලින්'

වේලාම සූත්‍රාදී වශයෙන් ද සරණගමනයේ ඵල විශේෂය දතයුතුය. මෙසේ සරණගමනයේ ඵලය දතයුතුය. මෙහි ත්‍රිවිධ වස්තු කෙරෙහි (රත්නත්‍රය කෙරෙහි) ඇති නොදැනීම, සැකය, මිථ්‍යාඥානය යනාදියෙන් ලෞකික සරණගමනය කෙලෙසෙයි. මහත් බැබලීම් ඇති නොවෙයි. මහා පැතිරීමක් නොවේ. ලෝකෝත්තර සරණගමනයේ කෙලෙසීමක් නැත. ලෞකික සරණගමනයේ වැරදි-නිවැරදි යනුවෙන් භේද (බිඳීම්) දෙකක් ඇත. එහි අනික් ශාස්තෘන් කෙරෙහි ආත්ම සන්නිර්යාතන ආදී කරුණුවලින් සරණගමනයේ වැරදි බිඳීම සිදුවෙයි. එය අනිටුඵල ඇති එකකි. කලුරිය කිරීමෙන් නිවැරදි බිඳීම සිදුවෙයි. එය විපාක නැති බැවින්

1. සං.නි. - මොග්ගල්ලාන සං.බු.ජ.මු. 4 භා - 510 පිට

ඵලයක් නැත. ලෝකෝත්තර සරණගමනයේ බිඳීමක් ඇත්තේම නැත. භවන්තරයෙහි ද (මරණින් පසු ලබන ආත්මභාවවලදී ද) ආර්ය ශ්‍රාවකයා අනිත් ශාස්තෘවරයකු උදෙසා නොසිටියි. මෙසේ සරණගමනයේ කෙලෙසීමද බිඳීම ද දතයුතුය. පිරිසිදු කිරීම ලෞකික සරණගමනයට පමණි. කෙලෙසීම ඇත්තේ යමකද එහෙයින් එහි පිරිසිදු කිරීම සිදුවිය යුතුය. ලෝකෝත්තර සරණගමනය නිතරම පිරිසිදුය.

පාණාතිපාතා යන මෙහි ස්වභාවයෙන් ම ප්‍රාණය නිරුද්ධවීමට පෙර (ජීවත්වන) අතරතුරදීම ප්‍රාණය නැසීම = අතිපාතය යි. සෙමින් නිරුද්ධ වීමට නොදී ඉක්මණින් නැසීම යන අර්ථයි. ආයුධ ආදියකින් මැඩපවත්වා නැසීම හෝ අතිපාතයයි. ප්‍රාණඝාතයයි කියන ලද්දේ වෙයි. මෙහි 'පාණො' යනු සත්ත්වයා යනුවෙන් ව්‍යවහාර කරනු ලබන ස්කන්ධ පරම්පරාවයි. පරමාර්ථ වශයෙන් රූප ජීවිතින්ද්‍රිය හා අරූප ජීවිතින්ද්‍රියයි. රූප ජීවිතින්ද්‍රිය විනාශ කළ කල්හි (එය හා පැවති) සම්බන්ධතාවෙන් ඒ අරූප ජීවිතින්ද්‍රිය විනාශ වෙයි. ඒ ප්‍රාණය කෙරෙහි ප්‍රාණ සංඥාව ඇති තැනැත්තාගේ, ජීවිතේන්ද්‍රිය සිඳ දමන උපක්‍රමයෙන් උපදවන කය වචන දොරටු අතරින් එක්තරා ද්වාරයක පැවති වධක චේතනාව පාණාතිපාතයයි. යම් චේතනාවක පවතින ජීවිතින්ද්‍රියට ඇසුරු වූ උපක්‍රම කිරීමට හේතු වූ මහාභූත හේතුවෙන් උපදින මහාභූත පෙර උපන් ඒවාට සමානව නූපදියි. අසමානවම උපදී. එබඳු ප්‍රයෝග උපදවන ඒ චේතනාව පාණාතිපාතයයි. ලබන ලද උපක්‍රම ඇති (පඨවි ආදී) භූතයෝ පෙර උපන් භූත මෙන් ප්‍රකට නොවේ. මෙසේ (පෙර උපන් භූතයන් හා සමානව උපදින භූතයන්ට) සමාන ජාතීන්ට කරුණු නොවේ. 'කය-වචන යන දොරටු අතරින් එක්තරා ද්වාරයක පැවති' (කාය වචී ද්වාරානං අඤ්ඤතරද්වාරප්පවත්තා) යන මෙයින් මනෝද්වාරයෙහි පැවති වධක චේතනාවෙන් ප්‍රාණඝාතයක් නො සිදුවන බව දැක්වීම වෙයි.

කුළුම්බ සූත්‍රයෙහි ද **'ඉධෙ කච්චො සමණො වා බ්‍රාහ්මණො වා ඉද්ධිමා චෙතො වසිප්පත්තො අඤ්ඤා කුච්ඡිගතං ගබ්භං පාපකෙන මනසානුපෙක්ඛිතා හොති'** 'මෙලොව ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ ඍද්ධිමත් වූයේ සිතෙහි වශීභාවයට පත්වූයේ මැගේ කුසෙහි ඇති ගැබ පාපී මනසින් විමසන ලද්දේ වෙයි යනුවෙන් විද්‍යාමය ඍද්ධිය අදහස් කරන ලදී. එය ද වචීද්වාරය හැර උපදවන්නට නොහැකි නිසා වචීද්වාර වශයෙන්ම උපදී. එහිදී භාවනාමය ඍද්ධිය අදහස් කරන

ලදැයි කියන්නවුන්ගේ වාදය කුසලත්තිකය, වේදනත්තිකය, විතක්කත්තිකය යන වෙනස් වෙනස් භූමි සමග විරුද්ධ වෙයි, (නො ගැලපෙයි).

ඒ මේ ප්‍රාණඝාතය ගුණ නැති තිරිසන්ගත සතුන් අතරින් කුඩා සතුන් නැසීමෙන් අල්පසාවද්‍ය වෙයි. මහ සතුන් මැරීමෙන් මහා සාවද්‍ය වෙයි. කුමක් නිසාද? ප්‍රයෝගය මහත් බැවිනි. ප්‍රයෝගය සමවූ කල්හි ශරීර විශාලවීම් ආදියෙන් මහාසාවද්‍ය වෙයි. ගුණවත් මිනිසුන් ආදීන් අතරින් අල්පගුණ ඇති ප්‍රාණීන් මැරීමෙන් අල්පසාවද්‍යය. මහාගුණ ඇති ප්‍රාණීන් මැරීමෙන් මහා සාවද්‍යය. ශරීරගුණ සමවූ කල්හි කෙලෙසුන්ගේ ද උපක්‍රමවල ද මොළොක් භාවයෙන් අල්පසාවද්‍යය, දැඩි භාවයෙන් මහා සාවද්‍යය. මෙහි ද ප්‍රයෝගවල, ශරීරවල මහත්බව ආදියෙන් ඇතිවන මහාසාවද්‍ය බව ඒ ප්‍රත්‍ය (හේතු)වලින් උපදින චේතනාවේ බලවත් භාවයෙන් (සිදුවන බව) දතයුතුය.

අදහස් කරන ලද ප්‍රයෝගය ඉක්මණින් නිෂ්පාදනය (සිදු) වීම් වශයෙන් බොහෝ වාරයක් පැවති ජවනවලින් ලබන ලද සේවනය ද ඇති කෘත්‍යසාධක (කටයුතු සිදුකරන) නිශ්චිත චේතනාවෙන් ප්‍රයෝගයේ මහත් බව ඇති කල්හි වුව ද කිසිකලෙක කුඩා වූ ද විශාල වූ ද ප්‍රාණීන් කෙරෙහි ප්‍රයෝගය සම වූ කල්හි විශාල වූ ප්‍රාණියා නසන තැනැත්තාගේ චේතනාව වඩා බලවත් ලෙස උපදී. මෙසේ වස්තුවේ (මරණයට පත්වන සත්ත්වයන්ගේ ශරීරවල) මහත් බව ද චේතනාවේ බලවත් බවට කරුණකි. මෙසේ මේ (ප්‍රයෝග-වස්තු) දෙක ම චේතනාවේ බලවත් බවෙන් ම මහා සාවද්‍ය (මහත් වූ දොස් සහිත) බවට හේතු වෙයි.

එසේම නැසිය යුතු සත්ත්වයාගේ මහත් වූ ගුණ ඇති කල එහි පැවති උපකාර චේතනාව මෙන් ක්ෂේත්‍ර විශේෂයෙන් උපන් උපකාර චේතනාව ද බලවත්ව වඩා බලවත්ව උපදී. මෙසේ මෙහි මහාසාවද්‍ය බව දතයුතුය. එහෙයින් ප්‍රයෝගය-වස්තුව ආදී ප්‍රත්‍යයන්ගේ මහත්බව ඇතිකල්හි ද ගුණ මහත් බව ආදී ප්‍රත්‍යවලින් චේතනාවේ බලවත් බව වශයෙන් ම මහාසාවද්‍ය බව දතයුතුය.

ඒ ප්‍රාණඝාතයට ප්‍රාණියෙක් වීම, ප්‍රාණියෙක් යන හැඟීම ඇති බව වධක සිත, මරණ උපක්‍රමය, එයින් මරණය සිදුවීම යන කරුණු පහක් ඇත. ප්‍රාණඝාතය කරුණු පහකින් යුක්තය යනුවෙන් කරුණු පහකින්

තොර නොවූයේ යයි දතයුතුය. ඒ කරුණු පහ අතරින් ප්‍රාණියෙක් යන හැඟීමත් වධක සිතත් ප්‍රාණඝාතයේ මුල් අවස්ථාවට අයත් වෙයි. උපක්‍රමය වධක චේතනාවෙන් උපදවන ලද්දේ වෙයි. ඒ උපක්‍රමයට සාහත්ථික, ආණත්තික, නිස්සග්ගිය, ථාවර, විජ්ජාමය, ඉද්ධිමය යනුවෙන් ප්‍රයෝග හයක් ඇත. ඒවා අතරින් සියතින් උපන්නේ සාහත්ථිකය, අනුන්ගේ අණ අනුව පැවතියේ ආණත්තිකය, ඊතල, සිරි (ආයුධයකි) ආදිය දමාගැසීම් වශයෙන් පැවතියේ නිස්සග්ගිය ය. බොරු වලවල් කැණීම් ආදී වශයෙන් පැවතියේ ථාවර ය. හූනියම් කරන අයගේ මෙන් මන්ත්‍ර ජපකිරීම් ප්‍රයෝගය විජ්ජාමය ය. දාඨා කොට්ටකයන්ගේ (දත් ඇඳි එකට තදකොට (දත්සපා) අනුන් බියගැන්වීමට හැකියාව ඇත්තන්ගේ) මෙන් කර්ම විපාකයෙන් උපන්නේ ඉද්ධිමය ය.

මෙහිලා මොහොතක් මොහොතක් පාසා සංස්කාර නිරුද්ධවන ස්වභාවය ඇතිකල්හි මේ චිත්ත චෛතසික පරම්පරාව කවරෙක් නසයි ද කවරෙක් නසනු ලැබේ ද? ඒ චිත්ත චෛතසික පරම්පරාව අරූපී බැවින් සිඳීම් බිඳීම් ආදී වශයෙන් නැසීමට සමත් නොවේ. නැසිය යුතුද නොවේ. ඉක්බිති ඒ රූප පරම්පරාව චේතනාවක් නැති බැවින් ලී කැබැල්ලකට උපමා ඇත්තේය. මෘත ශරීරයක මෙන් ඒ රූප පරම්පරාවෙහි සිඳීමාදියෙන් ප්‍රාණඝාතයක් නො ලැබේ. කියන ලද පරිදි පහරණ ප්‍රහාරාදි ප්‍රාණඝාතයේ ප්‍රයෝගය ද අතීත සත්ත්ව සංස්කාරයන්හි වන්නේ ද, අනාගත හෝ වර්තමාන ඒවාගේ ද වන්නේ ද? එහිදී ඒවාගේ අවිද්‍යමාන ස්වභාව ඇති බැවින් පළමුව අතීත හා අනාගත කාලවල නො හමුවෙයි.

වර්තමානයේ සංස්කාරවල ද ක්‍ෂණික බව නිසා ස්වභාවයෙන් ම නැතිවන ස්වභාව ඇතිබැවින් පහරදීම් ගැසීම් ආදී ප්‍රයෝග හේතු ඇති මරණයක් නොවේ. සංස්කාරයන්ගේ චලනයක් නැති බැවින් ඒ ප්‍රයෝගය කවරෙකුගේ ද? ක්‍ෂණික භාවය කරණකොට මරණ අදහසට සමාන කාලයෙහි ම, (මැරීමේ) ක්‍රියාව අවසන් වනතුරු මැරෙන තැනැත්තාගේ පැවැත්මක් නොවන නිසා ප්‍රාණය නැතිවන්නේ (ප්‍රාණඝාතය) කවරෙකුගේ ද? කර්මයෙන් බැඳීමක් නො වේද?

(ඒ ගැන මෙසේ) කියනු ලැබේ. කියන ලද වධක චේතනාවෙන් යුක්ත වූ සත්ත්වයාය යි නම් ලද සංස්කාර රාශිය තෙමේ නසන්නා ය. ඔහු සමග පැවති මරණ ප්‍රයෝගයට නිමිත්ත ඉවත්ව (තෙන

පවත්තිතවධප්පයොග නිමිත්තං අපගමමෙ) එයින් විඤ්ඤාණ ජීවිතින්ද්‍රිය මැරුණේය යන ව්‍යවහාරයට වස්තු වූ කියන ලද මරණ ප්‍රයෝග නොකිරීමෙහි දී, පෙර මෙන් පැවතීමට සුදුසු වූ රූප අරූප ධර්ම සමූහය හෝ චිත්ත චෛතසික පරම්පරාව ම හෝ නසනු ලැබේ. මරණ ප්‍රයෝගයට ගොදුරුවන දෙයක් නැති කල්හි (අවිසයභාවෙ) ඔහුගේ (රූප-වේදනා-සඤ්ඤා-සංඛාර-විඤ්ඤාණ යන) පංචවෝකාර භවයෙහි රූප පරම්පරාවට අයත් පැවැත්ම ඇති බැවින් භූතරූපයන්හි කරන ලද ප්‍රයෝග වශයෙන් ජීවිතින්ද්‍රිය සිඳීමෙන් (නැසීමෙන්) එය ද විනාශ වේ යනුවෙන් ප්‍රාණඝාතයේ නො හටගැන්මක් නොවේ. අහේතුක ද නොවේ. ප්‍රයෝගය නිෂ්ප්‍රයෝජන ද නොවේ.

වර්තමාන (පවත්නා) සංස්කාරයන් කෙරෙහි කරන ලද ප්‍රයෝග වශයෙන් එයට අනතුරුව ඉපදීමට සුදුසු සංස්කාර කලාපය (සමූහය) එසේ නූපදීමෙන් ක්ෂණික සංස්කාරයන්ගේ ක්ෂණික මරණය මෙහි මරණය ලෙස අදහස් නොකරන ලද බැවින් කියන ලද පරිදි සන්තති (පරම්පරා) මරණයේ ද සහේතුක බව ඇති බැවින් අහේතුක මරණයක් නොවේ.

සංස්කාර සිතෙන් මෙහෙයවීමක් නැතිවිට හේතු ඇති පරිදි ඉපිද ඇතැයි යන පමණින්ම තම තමන්ට ගැලපෙන ප්‍රතිඵල ඇතිකිරීමට නියත කරුණුම ඇති කෙරේයැයි කියනු ලැබෙත්. යම්සේ ප්‍රදීපය ප්‍රකට වේද එසේම ඝාතක ව්‍යවහාරයද යෙදේ. වධක චේතනාව සමග එකට හටගන්නා හුදු චිත්ත චේතසික කලාපයේ ප්‍රාණඝාතය අදහස් නොකරන ලදී. සන්තාන වශයෙන් පවතින දෙයෙහිම ප්‍රාණඝාතය අදහස් කරන ලදී. ප්‍රාණඝාතය නිසා කර්ම බන්ධනයක් ඇත්තේමය. සන්තාන (පරම්පරා) වශයෙන් පවතින ප්‍රදීපයන්ගේ ප්‍රයෝජන කාර්යයක් දක්නා ලැබේ. මේ පරීක්ෂාව අදත්තාදාන ආදියේදී ද යෙදෙන පරිදි දැක්විය යුතුය. එහෙයින් පාණාතිපාත නම්. **න පටිවිරතා** යනු නොවැළකුණාහු යනුයි.

නුදුන් දෙයක් ගැනීම අදින්නාදානය යි. අන්සතු දෙය ගැනීම, සොරකම යනුවෙන් කියන ලද්දේ වෙයි. එහි 'අදින්නං' යනු අනුන් විසින් අයිතිකොට ගන්නා ලද්ද ය. යම්තැනක (තමාට අයත් දෙයක් පිළිබඳව) කැමති පරිදි කටයුතු කරන තැනැත්තා දඬුවමට සුදුසු නොවේ. දොස් ලැබීමට සුදුසු නොවේ. ඒ අනුන් අයත් වස්තුවෙහි අනුන් අයත්කොට ගන්නා ලදැයි යන සංඥාව ඇති තැනැත්තාගේ එය නො දෙන

(තදාදායක) උපක්‍රමයෙන් හටගත් සොර චේතනාව අදින්නාදානය යි. අනුන් අයත් හීන (බාල) දෙයක් සොරකම් කිරීමෙන් අල්පසාවද්‍ය වෙයි. උසස් (වටිනා) දෙයක් සොරකම් කිරීමෙන් මහාසාවද්‍ය වෙයි. කුමක් හෙයින් ද? වස්තුවෙහි වටිනාකම නිසාය. එසේම අන් සතු කුඩා දෙයක් සොරකම් කිරීමෙන් අල්පසාවද්‍යය. මහත් දෙයක් සොරකම් කිරීමෙන් මහා සාවද්‍යය. කුමක් හෙයින් ද? වස්තුව මහත් බැවිනුත් ප්‍රයෝගය මහත් බැවිනුත්ය. වස්තුව සමාන කල්හි ගුණයෙන් වැඩි අය සතු වස්තුවක් සොරකම් කිරීමෙන් මහා සාවද්‍යය. ගුණයෙන් අධික ඒ ඒ පුද්ගලයා සලකාගෙන ඊට වඩා ඊට වඩා ගුණයෙන් හීන පුද්ගලයා සතු දෙය සොරකම් කිරීමෙන් අල්පසාවද්‍යය. වස්තුන්ගේත් ගුණයන්ගේත් සමභාවය ඇතිකල්හි කෙලෙසුන්ගේත් ප්‍රයෝගයේත් මොළොක් භාවයෙන් අල්පසාවද්‍ය වෙයි. (ඒවායේ) තීව්‍රභාවයෙන් මහාසාවද්‍ය වෙයි. අදින්නාදානයට අන්සතු දෙයක් වීම, අන්සතු දෙයක් යන හැඟීම, සොරසිත, උපක්‍රමය, එයින් ගැනීම යන කරුණු පහක් ඇත. සාහත්ථික ආදී ප්‍රයෝග හයකි. ඒවා ද සුදුසු පරිදි ථෙය්‍යවහාර, පසය්හාවහාර, පටිච්ඡන්නාවහාර, පරිකප්පාවහාර, කුසාවහාර යන මේ සොරකම් කිරීම් වශයෙන් පවතී. මෙහි ද මන්ත්‍ර ජපකිරීමෙන් අන්සතු දේ ගැනීම විද්‍යාමය ප්‍රයෝගය යි. මන්ත්‍රවලින් තොරව ඍද්ධියේ ආනුභාවයෙන් සිදුවන කාය-වචී ප්‍රයෝගයෙන් අන්සතු දේ ගැනීම ඍද්ධිමය ප්‍රයෝගයයි දතයුතුය.

කාමෙසු යනු මෛථුන හැසිරීම්වල. මිච්ඡාචාරො ඒකාන්ත වශයෙන් නින්දිත වූ පහත් හැසිරීම. ලක්ෂණ වශයෙන් අසත්ධර්මයෙහි යෙදීමේ (මෛථුනයෙහි යෙදීමේ) අදහසින් කායද්වාරයෙහි පැවති නොයා යුතු ස්ථානය ඉක්මවා යාමේ චේතනාව කාමෙසු මිච්ඡාචාරයයි. එහි නොයා යුතු තැන නම් පළමුකොට පුරුෂයන්ට මව විසින් රකින ලද ස්ත්‍රිය ආදී දසදෙනා ද ධනක්කීත (මිලදී ගන්නා ලද) ස්ත්‍රිය ආදී ස්ත්‍රීන් දසදෙනා ද යන (විවාහක) ස්ත්‍රීන් විසිදෙනා (නොයා යුතු තැන්) වෙති. ස්ත්‍රීන් අතරින් සාරක්ඛා (මව්ගැබේ සිටින විටදීම යමෙකු විසින් වෙන්කරගත් ස්ත්‍රිය) සපරිදණ්ඩා (අසවල් ස්ත්‍රිය වෙතට ලිංගික ඇසුරට යන පුරුෂයාට මෙපමණ දඩයක් ගසනු ලැබේ යනුවෙන් වෙන්කරගත් ස්ත්‍රිය) යන ස්ත්‍රීන් දෙදෙනාට ද ධනක්කීතාදී ස්ත්‍රීන් දසදෙනාට ද යන දොළොස් දෙනාට අන්‍ය පුරුෂයන් නොයා යුතු ස්ථානයයි. ඒ මේ මිථ්‍යාචාරය සීලාදී ගුණ නැති නොයායුතු ස්ථානයට යාමෙහිදී අල්පසාවද්‍යය. සීලාදී

ගුණ සම්පන්නයන් වෙත යාමෙහි දී මහාසාවද්‍ය ය. ගුණ නැති කල්හිද බලහත්කාරයෙන් වැරදි හැසිරීමෙහි යෙදෙන්නහුට මහාසාවද්‍ය වෙයි. (ස්ත්‍රී-පුරුෂ) දෙදෙනාම සමානච්ඡන්දයෙන් වැරදි හැසිරීමෙහි යෙදීමෙන් අල්පසාවද්‍යය - සමානච්ඡන්දය ඇතිකල්හි ද කෙලෙසුන්ගේ ද උපක්‍රමවලද මොළොක් භාවයෙන් අල්පසාවද්‍ය වෙයි. ඒවායේ තීව්‍රභාවයෙන් මහාසාවද්‍ය වෙයි. මිථ්‍යාචාරය සිදුවීමට නොයා යුතු වස්තුවක් (ස්ත්‍රියක් හෝ පුරුෂයකු) වීම, එය සේවනය කිරීමේ සිත, සේවනය කිරීමේ ප්‍රයෝගය, (ලිංග) මාර්ගයෙන් (ලිංග) මාර්ගය ප්‍රවේශය ඉවසීම යන කරුණු සතරක් ඇත. එහිදී තමාගේ රුචියෙන් මිථ්‍යාචාරයෙහි හැසිරෙන්නහුට (සේවනය කිරීමේ ප්‍රයෝගය හැර) කරුණු තුනක් ද බලහත්කාරයෙන් මිථ්‍යාචාරයෙහි හැසිරෙන්නහුට (එසේම) කරුණු තුනක් ද ඉතිරි නොකොට ගැනීමෙන් කරුණු සතරක්දැයි දතයුතුය. (කාම මිථ්‍යාචාරය) සිදුවීම වනාහි (මාර්ග ප්‍රවේශවීම හැර) කරුණු තුනකින්ම සිදුවෙයි. සාහත්ථික නම් වූ එකම ප්‍රයෝගය වෙයි.

**මුසා** යනු රැවටීම පෙරටු කොටගත් තැනැත්තාගේ අර්ථය බිඳ දමන කය වචන ප්‍රයෝගය, රවටන අදහසින් ඔහුගේ අනුන් රවටන කය වචන ප්‍රයෝගයෙන් හටගත් චේතනාව මුසාවාදය යි. වෙනත් ක්‍රමයක් 'මුසා' යනු නූපන්, සත්‍ය වශයෙන් නැති සිද්ධියයි. 'වාදො' යනු ඒ කාරණය සත්‍ය වශයෙන් හැඟවීමයි. එහෙයින් අසත්‍ය සිද්ධියක් සත්‍ය වශයෙන් අනුන්ට හඟවනු කැමති තැනැත්තාගේ එසේ හඟවන ප්‍රයෝගයෙන් හටගත් චේතනාව මුසාවාදය යි. ඒ මුසාවාදය යම් අර්ථයක් (ප්‍රයෝජනයක්) විනාශ කරයි ද ඒ අර්ථයේ අල්පභාවය කරණකොටගෙන අල්පසාවද්‍ය වෙයි. මහත්බව කරණකොටගෙන මහාසාවද්‍ය වෙයි.

තවද ගිහියන්ට තමා සතු දෙයක් නොදෙනු කැමතිව නැතැයි ආදී ක්‍රමයෙන් පැවති මුසාවාදය අල්ප සාවද්‍යය. සාක්ෂිකරුවෙකු වී අර්ථය විනාශකිරීම් වශයෙන් කියන ලද මුසාවාදය මහාසාවද්‍ය වෙයි.

පැවිද්දන්ට තෙල් ටිකක් හෝ ගිතෙල් ටිකක් ලැබ සිනාසෙන අදහසින් 'අද ගමේ තෙල් ගඟක් ගලති'යි සිතම් යනුවෙන් පැරණි කථා ක්‍රමයෙන් පැවති මුසාවාදය අල්පසාවද්‍ය වෙයි. නොදුටු දෙයක් දක්නා ලදැයි ආදී ක්‍රමයෙන් කියන්නවුන්ට මහාසාවද්‍ය වෙයි. එසේම යමක

අර්ථය විනාශ වෙයි ද එහි අල්පගුණ ඇති බව කරණකොටගෙන අල්පසාවද්‍ය වෙයි. මහාගුණ ඇති බව කරණකොටගෙන මහාසාවද්‍ය වෙයි. කෙලෙසුන්ගේ මෘදු බව තීව්‍ර බව වශයෙන් ද අල්පසාවද්‍ය මහාසාවාද්‍ය බව ලැබෙන්නේමය. ඒ මුසාවාදයට අසත්‍ය වස්තුවක් වීම, රැවටීමේ සිත, උත්සාහය, අනික් තැනැත්තා ඒ අර්ථය දැනගැනීම යනුවෙන් කරුණු සතරකි. රවටන අදහසින් ප්‍රයෝග කල කල්හි ද අනිත් තැනැත්තා විසින් එහි අර්ථය නොදත් කල්හි රැවටීම සිදුනොවන හෙයින් අනිත් තැනැත්තා ඒ අර්ථය දැනගැනීම එක් කරුණක් ලෙස දතයුතුය. ඇතැමෙක් වනාහි අසත්‍ය වචනය, රැවටීමේ සිත, අනිත් තැනැත්තා ඒ අර්ථය දැනගැනීම යනුවෙන් කරුණු තුනකැයි කියති. ඉදින් වැටහීමේ වේගය අඩු නිසා අනිත් තැනැත්තා (සන්නිට්ඨාපක) තීරණය කිරීමේ චේතනාව පැවති බැවින් විමසා බලා ඒ අර්ථය දනියි ද (කිරිය - සමුට්ඨාපක) ක්‍රියාව උපදවන චේතනාව ඇතිවන මොහොතෙහි ම මුසාවාද කර්මයෙන් බැඳේ.

සුරා යනු පිට්ඨසුරා (පිටිවලින් සෑදූ සුරා), පූවසුරා (කැවුම් ආදියෙන් කළ සුරා), ඔදන සුරා (බත්වලින් කළ සුරා), කිණ්ණ පක්ඛිත්ත (රා මණ්ඩි දමා කළ සුරා) සම්භාර සංයුත්ත (නොයෙක් දේ දමා සකස් කළ සුරා) යනුවෙන් සුරා වර්ග පහක් ඇත. මෙරය යනු පුප්ඵාසව (කිතුල් ආදී මල් රසය එනම් තෙලිදිය පැසවා සකස් කළ ආසව), ඵලාසව (මිදි ආදී ඵල රසයෙන් කළ ආසව), මධ්වාසව (මීපැණි ආදියෙන් සකස් කළ ආසව), ගුළාසව (උක්පැණියෙන් සකස් කළ ආසව), සම්භාර සංයුත්ත (නොයෙක් වර්ගවල රසයෙන් කළ ආසව) යනුවෙන් ආසව වර්ග පහක් ඇත. ඒ දෙකම මත්කරවන අර්ථයෙන් මජ්ජ මද්‍ය නම් වේ.

යම් චේතනාවකින් එය පානය කරයි ද එය ප්‍රමාදයට කාරණයක් වන බැවින් පමාදට්ඨානං නම් වෙයි. ලක්‍ෂණ වශයෙන් වනාහි කියන ලද ආකාර ඇති සුරාමේරය නම් වූ මද්‍යය බීජ අවස්ථාවේ පටන් මත්වීම් වශයෙන් කාය ද්වාරයෙහි පැවති ප්‍රමාද චේතනාව සුරාමේරය මජ්ජපමාදට්ඨානය යි. ඒ සුරාමේරය පානයට මත්බව, බොනු කැමති සිත, උත්සාහය, ගිලීම යන කරුණු සතරක් ඇත. අකුසල සිතින්ම එය පානය කළයුතු බැවින් ඒකාන්තයෙන් ම සාවද්‍ය බව වෙයි. මත්පැන් බව නොදන්නා වූ ද ආර්ය ශ්‍රාවකයන්ගේ මුඛයට මත්පැන් නොපිවිසෙයි.

(මත්පැනක් බව) දන්නා ආර්යශ්‍රාවකයන් ගැන කියනුම කවරේද? අල්ලට ගතහැකි තරම් ස්වල්පයක් පානය කිරීම අල්පසාවද්‍යය. අඩ ලාහක් පමණ පානය ද ඊට වඩා පානය කිරීමෙන් ද මහාසාවද්‍ය වෙයි. කය සොලවන්නට සමත් වන ලෙස බොහෝ සේ පානයකොට ගම්පැහැරීම ආදී කර්ම කරන්නාට මහාසාවද්‍යම වෙයි.

පාපකර්මය වනාහි ප්‍රාණඝාතයට පැමිණ ක්ෂීණාශ්‍රවයන් මැරීමෙහිදී මහාසාවද්‍ය වෙයි. අදින්නාදානයට පැමිණ ක්ෂීණාශ්‍රවයන් සතු දේ ගැනීමෙහි දී මහාසාවද්‍ය වෙයි. මිථ්‍යාචාරයට පැමිණ ක්ෂීණාශ්‍රව භික්ෂුණිය සමග සිල්පදය ඉක්මවීමෙහිදී මහාසාවද්‍ය වෙයි. මුසාවාදයට පැමිණ මුසාවාදයෙන් සංඝභේදය කිරීමෙහිදී මහාසාවද්‍ය වෙයි. සුරාපානයට පැමිණ කය සෙලවීමට සමත් ලෙස බොහෝ පානය කොට ගම් පැහැරීම් ආදී කර්මය මහාසාවද්‍ය වෙයි. සියලුම චේතනාවලට වඩා මුසාවාදයෙන් සංඝභේදය කිරීම මහාසාවද්‍යය. එය සිදුකොට කල්පයක් නිරයෙහි පැසෙයි.

දැන් ඒවායෙහි ස්වභාව වශයෙන්, අරමුණු වශයෙන්, වේදනා වශයෙන්, මුල් වශයෙන්, කර්ම වශයෙන්, ඵල වශයෙන් යන හය ආකාරයෙන් විනිශ්චය දතයුතුය. එහි ස්වභාව වශයෙන් - ප්‍රාණඝාතාදී සියල්ල ම චේතනා ස්වභාවය වෙයි. අරමුණු වශයෙන් ප්‍රාණඝාතය ජීවිතින්ද්‍රිය අරමුණෙන් සංස්කාරය අරමුණුකොට ඇත්තේ වෙයි. අදින්නාදානය සත්ත්වාරම්මණය හෝ සංස්කාර අරමුණු කොට ඇත්තේ වෙයි. මිථ්‍යාචාරය ස්පර්ශ වශයෙන් සංස්කාර අරමුණ ඇත්තේ වෙයි. සත්ත්ව අරමුණ යයි ඇතැමෙක් කියති. මුසාවාදය සත්ත්ව අරමුණු හෝ සංස්කාර අරමුණ ඇත්තේ වෙයි. සුරාපානය සංස්කාර අරමුණ ඇත්තේ වෙයි. වේදනා වශයෙන් - ප්‍රාණඝාතය දුක්වේදනා ඇත්තේ වෙයි. අදින්නාදානය වේදනා තුනම ඇත්තේ වෙයි. මිථ්‍යාචාරය සුඛ - මධ්‍යස්ථ වශයෙන් වේදනා දෙකක් ඇත්තේ වෙයි. සුරාපානය ද එසේය. නිගමනය කළ සිතින් ඒ දෙකම මධ්‍යස්ථ වේදනාව ඇත්තේ නොවෙයි. මුසාවාදය වේදනා තුනම ඇත්තේ වෙයි. මූල වශයෙන් ප්‍රාණඝාතය දෝස මෝහ වශයෙන් මුල් දෙකක් ඇත්තේ වෙයි. අදින්නාදානය ද මුසාවාදය ද දෝස මෝහ වශයෙන් හෝ ලෝභ මෝහ වශයෙන් හෝ මුල් දෙකක් ඇත්තේ වෙයි. මිථ්‍යාචාරය ද සුරාපානය ද ලෝභ මෝහ වශයෙන් මුල් දෙකක් ඇත්තේ වෙයි. කර්ම වශයෙන් මුසාවාදය පමණක් වචීකර්මය වෙයි. ඉතිරි සතර කායකර්මය වෙයි. ඵල වශයෙන් - සියල්ලම අපායෙහි

ඉපදීම නම් වූ ඵලය ද සුගතියෙහි අල්පායුෂ්ක බව ආදී නොයෙක් ආකාර අයහපත් ඵලද ඇතතේ වෙයි යනුවෙන් මෙසේ මෙහි ස්වභාවාදී වශයෙන් විනිශ්චය දතයුතුය.

අපපටිවිරතා යනු සමාදාන විරතියේ ද සම්පත්ත විරතියේ ද අභාවයෙන් වෙන් නොවූවාහු. **දුස්සීලා** එහෙයින්ම පංචසීලයේ අභාවයෙන් සිල් නැත්තාහු. **පාපධම්මා** යනු ලාමක ධර්ම, පහත් හැසිරීම්. **පාණාතිපාතා පටිවිරතො** යනු ශික්ෂාපද සමාදානයෙන් ප්‍රාණඝාතයෙන් වැළකුනේ දුරසිටියේ. ඉතිරි ඒවාහිද මේ ක්‍රමයයි.

මෙහි ද ප්‍රාණඝාතයෙන් වැළකීම ආදිය ස්වභාව වශයෙන් ද අරමුණු වශයෙන් ද වේදනා වශයෙන් ද මූල වශයෙන් ද කර්ම වශයෙන් ද සමාදාන වශයෙන් ද බිඳීම් වශයෙන් ද ඵල වශයෙන් ද විනිශ්චය දතයුතුය. එහි ස්වභාව වශයෙන් - චේතනා පහත් විරති පහත් වෙයි. දේශනාව විරති වශයෙන් ආයේය. ප්‍රාණඝාතයෙන් වළකින තැනැත්තාගේ 'යා තස්මිං සමයෙ* පාණාතිපාතා ආරති විරති' යනුවෙන් මෙසේ කියන ලද කුශල චිත්තය සමග යෙදුණු යම් විරතියක් වේද, ඒ විරතිය ප්‍රභේද වශයෙන් සම්පත්ත විරති, සමාදාන විරති, සමුච්ඡේද විරති යනුවෙන් ත්‍රිවිධය.

එහි වරදක් කිරීමට කරුණක් එළඹිවිට තමාගේ ජාතිය, වයස, උගත්කම ආදිය සලකා අපට මෙය සිදුකිරීම නුසුදුසුයයි සිතා වරද නොකරන්නා වූ ශික්ෂාපද සමාදන් නොවූ අයට උපදින විරතිය සම්පත්ත විරති නම් වෙයි. ශික්ෂාපද සමාදානයත් ඉන් ඔබ්බෙහි තම ජීවිත පරිත්‍යාගයත් සිදුකොට වරද නොකරන්නා වූ ශික්ෂාපද සමාදන් වූ අයට උපදින විරතිය සමාදාන විරති නම් වේ. යම් විරතියක් උපන් තැන් පටන් සතෙකු මරන්නෙමියි යන සිතක් ආර්ය පුද්ගලයන්ට නූපදී ද ඒ ආර්ය මාර්ගය සමග යෙදුණු විරතිය වනාහි සමුච්ඡේද විරති නම් වේ. ඒවා අතරින් සමාදාන විරතිය මෙහි අදහස් කරන ලදී.

ආරම්මණ වශයෙන් - ප්‍රාණඝාත ආදියේ යෙදෙන අරමුණුම (ප්‍රාණඝාතයෙන් වැළකීම ආදී වූ) මේවායේ ද අරමුණු වෙයි. ඉක්මවිය යුතු බැවින් ම විරති නම් වේ. නිවන අරමුණු වූ ආර්ය මාර්ගය කෙලෙස් දුරුකරන්නේ යම්සේ ද එසේම ජීවිතින්ද්‍රිය ආදිය අරමුණු වූ ඒ කුසලධර්ම

---

* සමයෙ යන වචනය අටුවාවේ නැත. විභංගප්පකරණයේ සික්ඛාපද විභංගයේ ඇත. බු.ජ.මු. 2 හා 108 පිට

ප්‍රාණඝාත ආදී දුසිල් බව දුරුකරයි. වේදනා වශයෙන් සියල්ලම සුඛ වේදනාය. මුල් වශයෙන් ඥාණ සම්ප්‍රයුක්ත (නුවන යෙදුණු) සිතෙන් යුතුව වැළකෙන්නහුට අලෝභ, අදෝස, අමෝහ වශයෙන් මුල් තුනක් ඇතිවෙයි. ඥාණ විප්‍රයුක්ත (නුවණ නොයෙදුණු) සිතෙන් යුතුව වැළකෙන්නහුට අලෝභ, අදෝස වශයෙන් මුල් දෙකක් ඇතිවෙයි. කර්ම වශයෙන් - මුසාවාදයෙන් වැළකීම වචීකර්ම ය. අනිත් ඒවා කාය කර්මය. සමාදාන වශයෙන් - ගරුකළයුතු අනිත් කෙනෙකුගේ සමීපයෙහිදී සීල සමාදානය නොලබන තැනැත්තා විසින් තමාම හෝ පන්සිල් (මම පන්සිල් සමාදන් වෙමි යනුවෙන් කියා) එක්වරම හෝ සිල්පද වෙන වෙනම කියා හෝ සමාදන් වීමෙන් සමාදන් වූයේ වෙයි. බිඳීම් වශයෙන් ගිහියන්ට යම් යම් ශික්ෂාපදයක් කඩයි නම් ඒ ඒ ශික්ෂාපදයම බිඳෙයි. අනිත්වා නොබිඳෙයි. කුමක් නිසාද? ගිහියෝ නිරතුරුවම සිල් ඇත්තෝ නොවෙති. ඔවුහු (තමන්ට) හැකි හැකි සිකපදයක් ම රකිති. (සාමණේර) පැවිද්දන්ට වනාහි එක් සිල්පදයක් කැඩුණුවිට සියල්ල බිඳෙයි.

ඵල වශයෙන් - මෙහි සතුන් මැරීමෙන් වැළකීමෙන්

1. නො අඩුව පිහිටි අඟපසඟ ඇති බව
2. ආරෝහ පරිනාහ සම්පත් ඇති බව
3. ජව සම්පත්ති ඇති බව.
4. මනාව පොළොවෙහි පිහිටි පියවර ඇති බව.
5. මනහර (සිත් ඇදගන්නා) බව.
6. මෘදු මොළොක් බව.
7. නිර්මල, පිරිසිදු බව
8. සූරවීර ගති ඇති බව.
9. මහා බලවත් බව.
10. නොපැකිල කිවහැකි වචන ඇති බව.
11. සත්ත්වයන්ට ප්‍රියමනාප බව.
12. කේලාම් කියා බිඳවිය නොහැකි පිරිවර ඇති බව.
13. තැති නොගන්නා බව.
14. විනාශ කිරීමට අපහසු බව.
15. පර උපක්‍රමවලින් මරණයට පත්නොවන බව.
16. මහත් පිරිවර ඇති බව.
17. මුළු සිරුරම සුරූපී (වර්ණවත්) බව.

18. නිසිලෙස නිසිතැන පිහිටි අඟපසඟ ඇති බව.
19. අල්ප ආබාධ ඇති බව.
20. ශෝක නොකරන බව.
21. ප්‍රියමනාප අයගෙන් වෙන් වන්නට සිදුනොවන බව.
22. දීර්ඝායුෂ ඇති බව යන

මේ ආදී ඵල ලැබේ.

සොරකම් කිරීමෙන් වැළකීමෙන්

1. මහත් වූ ධන ධාන්‍ය ඇති බව.
2. අනන්ත භෝග සම්පත් ඇති බව.
3. ඇත්තා වූ භෝග තහවුරු වන බව.
4. කැමති භෝග වහා ලැබෙන බව.
5. රජවරුන් ආදී අයට පොදු නොවූ වස්තුව ඇති බව.
6. උසස් භෝග ඇති බව.
7. ඒ ඒ තැනදී ප්‍රධාන කෙනෙකු වන බව.
8. නැත යන බවක් නොදන්නා බව.
9. සැපසේ වාසය කරන බව.

මේ ආදී ඵල ලැබේ.

අබ්‍රහ්මචරියාවෙන් වැළකීමෙන්

1. පහවූ සතුරන් ඇති බව.
2. සියලු සත්ත්වයන්ට ප්‍රියමනාප බව.
3. ආහාරපාන ඇඳුම් පැළඳුම් ලැබෙන බව.
4. සැපසේ නිදන බව.
5. සැපසේ පිබිදෙන බව.
6. අපාය බියෙන් මිදුනු බව.
7. ස්ත්‍රී බව, නපුංසක බව ලැබීමට නුසුදුසු බව.
8. ක්‍රෝධය අඩු බව.
9. සකස්කොට කටයුතු කරන බව.
10. (සැක බිය නිසා) බිම බලාගෙන නොසිටින බව.
11. පහසුවෙන් සිත් සතුටු කරවිය හැකි බව.
12. පිරිපුන් ඉඳුරන් ඇති බව.

13. පිරිපුන් ලක්‍ෂණ ඇති බව.
14. සැක නැති බව.
15. අඩු උනන්දුවකින් කටයුතු කරගත හැකි බව.
16. සැප විහරණ ඇති බව.
17. කිසිතැනක බිය නොවන බව.
18. ප්‍රියයන්ගෙන් වෙන් නොවන බව.

මේ ආදී ඵල ලැබේ.

යම්හෙයකින් (කාම) මිථ්‍යාචාරයෙන් වැළකීමේ ඵලයන් ද මෙහි ම ඇතුළත් වෙයි ද එහෙයින් අබ්‍රහ්මචර්යාවෙන් වැළකීමේ (ඵලයන් මෙහි දක්වන ලදී.)

බොරු කීමෙන් වැළකීමෙන්

1. අතිශයින් ප්‍රසන්න ඉඳුරන් ඇති බව.
2. මනා වූ මිහිරි කටහඬක් ඇති බව.
3. සමානව පිහිටි සුදෝසුදු දත් ඇති බව.
4. ඉතා මහත් නැති බව.
5. ඉතා කෙට්ටු නැති බව.
6. ඉතා උස නැති බව.
7. ඉතා මිටි නැති බව.
8. සැප ස්පර්ශ ඇති බව.
9. මහනෙල් මල්සුවඳ ඇති මුඛයක් ඇති බව.
10. සුවච කීකරු පිරිවර ජනයා ඇති බව.
11. විශ්වාස කළයුතු වචන ඇති බව.
12. නෙළුම් පෙත්තක් සමාන මොළොක් රත්පැහැ තුනී දිවක් ඇති බව.
13. නො සැඟවුණු බව.
14. උඩඟු නොවන බව යන මේ ආදියයි.

මදයට ප්‍රමාදයට කරුණු වූ මත්පැන් පානයෙන් වැළකීමෙන්

1. අතීත අනාගත වර්තමාන කටයුතුවල අප්‍රමාද බව.
2. ඥානවන්ත බව.

3. හැමකල්හි එළඹ සිටි සිහි ඇති බව.
4. උපන් කටයුතුවලදී තැනට ගැලපෙන වැටහීම් ඇති බව.
5. අලස නැති බව.
6. (ජඩ නොවීම) නොහික්මුණු ක්‍රියා නැති බව.
7. ගොළු නැති බව.
8. තැති නොගන්නා බව.
9. එකට එක නොකරන බව.
10. ඊර්ෂ්‍යා නොකරන බව.
11. මසුරුමල නැති බව.
12. සත්‍ය වචන කතාකරන බව.
13. කේලාම්-එරුෂ-හිස්වචන කථා නොකරන බව.
14. කළගුණ දන්නා බව.
15. කළ උපකාරයට ප්‍රතිඋපකාර කරන බව.
16. භෝග ඇති බව.
17. සිල්වත් බව.
18. ඍජු ගති පැවතුම් ඇති බව.
19. ක්‍රෝධ නොකරන බව.
20. පව් කිරීමට ලජ්ජා බිය ඇති බව.
21. ඍජු අදහස් ඇති බව.
22. උසස් බව.
23. පණ්ඩිත බව.
24. යහපත-අයහපත තේරුම් ගැනීමේ හැකියාව ඇති බව යන මේ ආදී ඵලයන්ය.

මෙසේ මෙහි සතුන් මැරීමෙන් වැළකීම ආදියේ ද ස්වභාව ආදී වශයෙන් විනිශ්චය දතයුතුය.

**සීලවා** යනු කියන ලද පරිදි පන්සිල් වශයෙන් සිල්වත් වූ. **කල්‍යාණ ධම්මො** යනු සුන්දර ධර්මය යි. සරණගමනයෙන් විස්තර කළ දෘෂ්ටි සම්පත්තියෙන් යුක්ත ප්‍රඥාව ඇති යන අර්ථයි. යම් පුත්‍රයෙක් වනාහි ශ්‍රද්ධාව නැති දුශ්ශීල වූ මව්පියන් ඇතිකල්හි තමා ද එබඳු නම් ඔහුද අවජාතම යයි දතයුතුය. අශ්‍රද්ධාව ආදී අවජාත භාවයේ ලක්‍ෂණය මෙහි කියන ලදී. ඒ අවජාතක දරුවා කෙරෙහි ඒ ලක්‍ෂණ ද විද්‍යමාන වෙයි.

මව්පියන් උපමාකොටගෙන අතිජාත බව ආදිය කියන ලදී. **යො හොති කුල ගන්ධනො** යනු කුලය නසන කුලය විනාශ කරන්නාය. මෙහි 'ගන්ධ' ශබ්දය නැසීම් අර්ථයෙහි ය. 'උප්පලගන්ධපච්චත්ථිකො' යනාදියෙහි මෙනි. ඇතැමෙක් 'කුලධංසනො' යනුවෙන් ද කියති. ඒ අර්ථයමයි. **එතෙ ඛො පුත්තා ලොකස්මිං** යනු මේ අතිජාත ආදී වූ පුතුන් තිදෙනාම මේ සත්ත්ව ලෝකයෙහි පුත්තු නම් වෙති. මෙයින් තොර පුතුන් නැත. මොවුන් අතරින් වනාහි **යෙ භවන්ති උපාසකා** යමෙක් සරණගමන සම්පත්තියෙන් උපාසකයෝ වෙත් ද, කම්මස්සකත ඥාණයෙන් (මේ කර්මය තමාගේය. මේ කර්මය තමාගේ නොවේයයි දන්නා ප්‍රඥාවෙන්) කර්මය ගැන දක්ෂ වූ, පණ්ඩිත වූ ප්‍රඥාවන්ත වූ ඔවුහු ද පංචසීලයෙන් දස සීලයෙන් **සම්පන්නා** පරිපූර්ණ වූවාහුය. යාචකයන්ගේ වචනය දනිති. ඔවුන්ගේ මුහුණෙහි ස්වභාවය දැකීමෙන්ම අදහස සම්පූර්ණවීම් වශයෙන් = **වදඤ්ඤූ** නම් වේ. 'දෙන්න' යනුවෙන් කියන ඒ යාචකයන්ගේ වචනය අසා මොවුහු පෙර දන් නොදී මෙසේ වූවාහුය. මා එසේ නොවිය යුතුයයි (සිතා) ඔවුන්ට පරිත්‍යාග කිරීමෙන් ඒ (පෙර දන් නොදුන්) අර්ථය දනිති යන අරුතින් 'වදඤ්ඤූ' නම් වෙති.

කර්මය ස්වකීයකොට ඇති බව යනාදිය පැහැදිලි කරන පණ්ඩිතයන්ගේ වචනය දනිති යන ඇරතින් 'වදඤ්ඤූ' නම් වෙති. 'පදඤ්ඤූ' යනුවෙන් ද කියති. පදානියා පරිත්‍යාගශීලීහු යන අර්ථයි. එහෙයින්ම පහවූ මසුරු මල ඇති බැවින් **වීතමච්ඡරා** නම් වෙති. අබ්භඝනා යනු අබ්භ නම් වූ මේඝයෙන් හෝ ඝන වැහිවලාවෙන් **මුත්තො චන්දො** මිදුණු සඳ මෙන් උපාසක ආදී **පරිසාසු** පිරිස්වලදී ද ක්ෂත්‍රිය ආදී පිරිස්වලදී ද **විරොචරෙ** බබලත්, ශෝභමාන වෙති යන අර්ථයි.

**පස්වන සූත්‍රය යි.**

# 3.3.6

හයවන සූත්‍රයෙහි **අවුට්ඨිකසමො** යනු නොවසින වැහිවලාවක් වැනි, ඇතැම් වැහිවලාවක් වලාපටල සියයක් වලාපටල දහසක් වී නැගී නාදකරමින් ගොරවමින් විදුලි කොටමින් එක් දියබිඳක්වත් නොහෙළා බැහැර වෙයි. එයට උපමා වූ එක් පුද්ගලයෙක් දක්වමින් 'අවුට්ඨික සමො'යි වදාළහ. **පදෙසවස්සී** යනු එක් පෙදෙසකට වසින වැහිවලාවක් වැනි, එක් පෙදෙසකට වසින වැස්සක් වැනියයි යන අරුතින් 'පදෙසවස්සී'ය. එකම තැන සිටින මිනිසුන් අතරින් ඇතැමෙකු තෙමෙන ලෙස ඇතැමෙකු නොතෙමෙන ලෙස එක් වැසිවලාවක් මඳ වශයෙන් වසියි. එම වැස්සට උපමාකොට 'පදෙස වස්සී' යනුවෙන් එක් පුද්ගලයකු දක්වති. **සබ්බත්ථාභිවස්සී** යනු පෘථිවි පර්වත සමුද්‍ර ආදී වූ මුලු පොලෝතලයෙහි මහවැසි වසින වැහිවලාවක් වැනි. ඇතැම් වැහිවලාවක් මුලු සක්වල ගැබ පැතිරී හැමතන්හිම මහවැසි වසී. (දඹදිව ආදී) සිවුමහ දිවයින්වලට වසින ඒ මහවැහිවලාව එක්පුද්ගලයෙකුට උපමාකොට 'සබ්බත්ථාභිවස්සී' යනුවෙන් කියන ලදී.

**සබ්බෙසානං** යනු 'සබ්බෙසං' සියල්ලන්ට. මේ 'සබ්බෙසං' යන පාඨයම හෝ නියම වචනය යි. **න දාතා හොති** නො දෙන ස්වභාවය ඇත්තේ වෙයි. තද මසුරු බැවින් කිසිවකුට කිසිවක් නොදෙයි යන අර්ථයි. දැන් දානයේ කෙත (දන් පිළිගැනීමට සුදුසු අය) ද දෙය්‍ය ධර්මය (දිය යුතු දෙය) ද බෙදා දක්වන්නට 'සමණ බ්‍රාහමණා' යනාදිය කීහ. සන්සිඳුවන ලද පව් ඇති ශ්‍රමණයෝ ද පැවිදි වූ පමණින් ශ්‍රමණයෝ ද බහා තබන ලද පව් ඇති බ්‍රාහ්මණයෝ ද (බමුණු ජාතියෙහි) ඉපදීම් පමණින් බ්‍රාහ්මණයෝ ද මෙහි දී **සමණ බ්‍රාහමණා** යනුවෙන් අදහස් කරන ලදී. **කපණා** නම් දුප්පත් දිළිඳු මිනිස්සු. **අද්ධිකා** නම් වියහියදම් නැති මගියෝ. **වණිබ්බකා** නම් යහපත් වූ ප්‍රියමනාප වූ නිවැරදි වූ දෙයක් සුදුසු කාලයෙහි සතුටු සිත් ඇතිව පැහැදුනු සිත් ඇතිව දෙන්න, මෙසේ දන්දෙන්නා වූ අය සුගතියට යති, බඹලොවට යති ආදී ක්‍රමයෙන් දානයෙහි යොදවමින් දානයේ ගුණයට ස්තුති කරමින් හැසිරෙන අය යි. **යාචකා** නම් මිටක් විතර (යමක්) දෙන්න, අල්ලට ගතහැකි යමක් දෙන්න, සරාවක් (කුඩා භාජනයක්) පමණ දෙන්න යනුවෙන් ස්වල්ප දෙයක් පවා ඉල්ලමින් හැසිරෙන අය. එහි ශ්‍රමණ බ්‍රාහ්මණයන් ගැනීමෙන් ගුණ ක්ෂේත්‍රය ද

උපකාරී ක්ෂේත්‍රය ද දක්වති. කපණ ආදී අය ගැනීමෙන් කරුණා ක්ෂේත්‍රය දක්වති. **අන්නං** යනු කෑ යුතු අනුභව කළයුතු යමක්. **පානං** යනු අඹපැන් ආදී පානයක්. **වත්ථං** යනු හඳින පොරවන ආදී ඇඳුමක්. **යානං** යනු යටත් පිරිසෙයින් ගමන සිදුකරදෙන පාවහනක් ද ගෙන රථ, දෝලා ආදිය. **මාලා** යනු (මල්මාලා වශයෙන්) ගෙතු නොගෙතු වශයෙන් භේද ඇති සියලු මල්. **ගන්ධං** ඇඹරූ හෝ නො ඇඹරූ හෝ යම්කිසි සුවඳ ජාතියක් ද සුවඳ උපකරණ ද. **විලෙපනං** යනු සම පැහැගන්වන දෙයක්. **සෙය්‍යා** යනු ඇඳ පුටු ද උතුරුසළුවක් පලසක් ආදී නිදාගැනීමට සුදුසු වස්තුවක්. සෙය්‍යා යන්න ගැනීමෙන් මෙහි ආසනය ද ගන්නා ලදැයි දතයුතුය. **ආවසථං** යනු වාතය අව්ව ආදී හිරිහැර දුරුකරන නිවහනක්, **පදීපෙය්‍ය** යනු (තෙල් දමා පහන් දැල්වීමට සුදුසු) පහන් තැටි ආදී පහන් උපකරණ.

**එවං බො භික්ඛවෙ** යනු දිය යුතු දාන වස්තුව ඇතිකල්හිත් ප්‍රතිග්‍රාහකයන්ට මෙසේ දියයුතු වස්තුව සම්පූර්ණයෙන් නොදෙන්නා වූ පුද්ගලයා වැසි නොවසින වැහිවලාවක් සමාන වෙයි. මේ කාරණය කියන ලද්දේ වෙයි. මහණෙනි, වැහිවලාව පටල සියයක් පටල දහසක් ඇතිව නැගී කිසි වැස්සක් නැතිව ඉවත්ව යයි. මෙසේ ම උසස් වූ මහත් වූ භෝග එක්රැස්කොට නිවසෙහි වාසය කරමින් කිසිවකුට බත් හැන්දක් පමණ හෝ කැඳ කෝප්පයක් පමණ හෝ නොදී ඉවත්ව යයි, අවසඟව මාර මුඛයට යයි. ඔහු නොවසින වැස්ස වැනි වෙයි. මේ ක්‍රමයෙන් ඉතිරි ඒවායෙහි ද නිගමනය දතයුතුයි. මේ පුද්ගලයන් තිදෙනා අතරින් පළමුවැන්නා ඒකාන්තයෙන්ම ගැරහිය යුතුය. දෙවැන්නා ප්‍රශංසා කිරීමට සුදුසුය. තෙවැන්නා වඩාත් ප්‍රශංසා කිරීමට සුදුසුය. පළමුවැන්නා ඒකාන්තයෙන් ම සියල්ලන්ට ම පහත්ය. දෙවැන්නා මධ්‍යමය. තෙවැන්නා උතුම්යයි දතයුතුය.

ගාථාවන්හි **සමණෙ** යනු කර්ම විභක්ති (උපයෝග) බහුවචනය යි. ඉතිරි පදවලද එසේමය. **ලද්ධා** යනු ලැබ, දක්ෂිණාවට සුදුසු ශ්‍රමණයන්ට (දානයෙන්) පවරා (ඒ ගැන) විමසන ලද්දේ **න සංවිභජති අන්නං පානඤ්ච භොජනං** යනු ආහාරයක් හෝ පානයක් හෝ අනුභව කළයුතු අතිත් භෝජනයක් හෝ වේද එය නො බෙදයි. මේ මෙහි කෙටි අර්ථය යිඃ යමක් අවශ්‍ය බැවින් තමන් වෙත පැමිණි ශ්‍රමණ ප්‍රතිග්‍රාහකයන් ලැබූ යමෙක් ආහාර ආදියෙන් බෙදීම් මාත්‍රයක්වත් නොකරයි නම් ඔහු වෙනත් දානයක් දෙයිද? **තං** මෙබඳු වූ තදමසුරු **පුරිසාධමං** නිහීන පුද්ගලයා

පණ්ඩිතයෝ **අවුට්ඨිකසමොති** ආහු නොවසින වැහිවලාවක් වැනි යයි කියති.

**එකච්චානං න දදාති** දිය යුතු දේ විශාල ලෙස ඇති කල්හිත් ඇතැම් සත්ත්වයන්ට (අයට) ඔවුන් කෙරෙහි ක්‍රෝධ වශයෙන් හෝ දාන වස්තුවෙහි ලෝභ වශයෙන් හෝ නොදෙයි. **එකච්චානං පවෙච්ඡති** යනු ඇතැම් අයට පමණක්ම දෙයි. **මෙධාවිනො** නුවණැති පණ්ඩිත ජනයා. **සුභික්ඛවාචො** යනු යමෙක් (තමන් වෙත) පැමිණි යාචකයන්ට ආහාර දෙන්න පානවර්ගයක් දෙන්න යනාදී වශයෙන් ඒ ඒ දෙය දෙවයි. හෙතෙම සුලභ ආහාර ඇති බැවින් මොහුට සුභික්ෂ වචන ඇත්තේය යන අරුතින් සුභික්ෂ වචන ඇත්තේ නම් වෙයි. 'සුභික්ඛ වසසී' යනුවෙන් ද කියති. යම්සේ ලෝවැසියා සුභික්ෂ (මැනවින් ආහාරපාන ඇත්තේ) වෙයි ද මෙසේ හැමතැන මහවැසි වසින මහ වැසිවලාව 'සුභික්ඛවසසී' නම් වෙයි. මෙසේ මොහු ද මහදන් දීමෙන් හැමතැන මහවැසි වසින සුභික්ෂ වැස්සකි. **ආමෝදමානො පකිරෙති** යනු තුටුපහටු සිත් ඇති තැනැත්තා සියතින් දන් දෙමින් ප්‍රතිග්‍රාහක ක්ෂේත්‍රයෙහි (කෙතෙහි) දාන වස්තුව විසුරුවන්නෙකු මෙන් වෙයි. වචනයෙන් ද **දෙථ දෙථ** දෙන්න දෙන්න යයි කියයි. දැන් ඔහු මනාව වසින ලද වැස්සක් (සුභික්ඛ වසසිත) බව දක්වන්නට **යථාපි මෙඝො** යනාදිය කියන ලදී. මේ එහි කෙටි අර්ථයයිඃ යම්සේ මහවැස්සක් පළමුව මඳ හඬින් **ථනයිත්වා** නාදකොට නැවත මහහඬ නගමින් සියලු නදී-කඳුරු වෙත **ගජ්ජයිත්වා පවස්සති** හැමතැනම ජලයෙන් ගොඩබිම් ද පහත්බිම් ද වෙත ගලායමින් පුරවයි, එකම දියකඳක් කරයි. **එවමෙව ඉධ** මෙසේම මේ සත්ත්ව ලෝකයෙහි **එකච්චො** ඇතැම් උසස් **පුග්ගලො** පුද්ගලයෙක් සියල්ලන්ට සමබැවින් ඒ මහවැහිවලාව මෙන් වැසි ලැබිය යුතු හෙයින් **තාදිසො** එබඳුය. යම්සේ **ධනං උට්ඨානාධිගතං** තමාගේ නැගී සිටි වීර්යයෙන් උපන් ධනයක් වේද එසේ අලස නොවී එය ද **ධම්මෙන** පිළිවෙළින් දැහැමින් එක්රැස්කොට ඒ උපන් ආහාර පානයෙන් ද අනිත් දියයුතු දෙයින් ද **පත්තෙ** පැමිණි **වණිබ්බකෙ සම්මා** වණිබ්බකයන් මනාව දේශයට කාලයට අනුරූපව ද කැමැත්තට අනුරූපව ද තෘප්තියට පමුණුවයි. හොඳින් (ආහාරපාන පිළිගන්වයි) පවරයි.

**හයවන සූත්‍රය යි.**

# 3.3.7

සත්වන සූත්‍රයෙහි **සුබානි** යනු සැපයට නිමිති. **පත්‍ථයමානො** යනු කැමති වෙමින් පතමින්. **සීලං** යනු ගිහි සිල් ද පැවිදි සිල් ද, ගිහියා ගිහි සීලය ද පැවිද්දා සිවු පිරිසිදු සීලය ද යන අදහසයි. **රක්‍ඛෙය්‍ය** යනු සමාදන්ව නො ඉක්මවමින් මනාකොට රකින්නේය. **පසංසා මෙ ආගච්ඡතු** යනු මට යහපත්වූ කීර්තියක් පැමිණේවායි කැමතිවන්නා වූ පණ්ඩිත නුවණැත්තා සිල් රකින්නේය. පළමුකොට අසවලා, අසවල් කුලයෙහි පුත්‍ර, සිල්වත්ය ගුණධර්ම ඇත්තෙකි, සැදැහැතෙකි, පැහැදුනු කෙනෙකි, දායකයෙකි, කාරකයෙකි ආදී වශයෙන් පිරිස මැද සිල්වත් වූ ගිහියා පිළිබඳ යහපත් වූ කීර්තියක් පැන නගී. අසවල් භික්ෂුව සිල්වත්ය, වත්සම්පන්නය, නො ඇලුණු කෙනෙකි, සැපසේ එක්ව වාසය කරන්නෙකි, ගෞරව ඇත්තෙකි ආදී වශයෙන් -පෙ- පැන නගී. මේ කාරණය "**පුන ච පරං ගහපතයො සීලවතො සීලසම්පන්නස්ස කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති**" 'නැවතත් ගෘහපතිවරුනි, සිල්වත් වූ සීලසම්පන්න වූ තැනැත්තාගේ යහපත් වූ කීර්ති ශබ්දයක් පැන නගී' යනුවෙන් ද එසේම '**ආකංඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො චස්සං මනාපො ගරු ච භාවනීයො චාති සීලෙස්වෙවස්ස පරිපූරකාරී**' 'මහණෙනි, ඉදින් භික්ෂුව සබ්‍රහ්මචාරීන්ට ප්‍රිය හා මනාපද වෙම්වා, ගුරුවරයෙකුට මෙන් සැලකිය යුතු කෙනෙක් වෙම්වා, සම්භාවනීය (ගෞරව ලැබිය යුතු) කෙනෙක් වෙම්වායි (සිතා එබන්දෙක් වීමට) කැමති නම් නොඅඩුව සිල් සම්පූර්ණ කරන කෙනෙක් වන්නේය' යනුවෙන් ද කියන ලදී.

**භොගා මෙ උප්පජ්ජන්තු** යන මෙහි පළමුකොට සිල්වත් වූ යහපත් ගුණධර්ම ඇති ගිහියා පිළිබඳවයි. හෙතෙම ඉදින් ගොවිතැනින් හෝ වෙළඳමෙන් හෝ රාජ්‍ය සේවකයෙකු ලෙසින් හෝ යම් යම් ශිල්පයකින් ජීවිකාව ගෙනයයි ද ඒ ඒ ශිල්ප නිසිකල නිසිපරිදි අතිශය අප්‍රමාදභාවයෙන් යුතුව ඉටුකරයි. ඉන්පසු ඔහුට නූපන් භෝග (ධනය හා දේපල) හටගනී. උපන් භෝග ද වැඩිදියුණු වීමට පත්වෙයි. ශීලාචාර සම්පන්න වූ අප්‍රමාදව වාසය කරන සිහි ඇති සීලයෙන් යුක්ත පැවිද්දාගේ ශීල සම්පත්තිය කෙරෙහි ද අල්පේච්ඡතාදී ගුණ කෙරෙහි ද පැහැදුණු මිනිස්සු උසස් උසස් ප්‍රත්‍ය ගෙන එති. මෙසේ උන්වහන්සේට නූපන් භෝග (සිවුපසය) උපදී. උපන් භෝග ද ස්ථිර වෙයි. ඒ බව '**පුනච පරං ගහපතයො සීලවා**

**සීලසම්පන්නො අප්පමාදාධිකරණං මහන්තං භොගක්ඛන්ධං අධිගච්ඡති'** 'නැවත ද ගෘහපතිවරුනි, සිල්වත් වූ සීලසම්පන්න තැනැත්තා අප්‍රමාදය නිසා මහත් වූ භෝග රාශියක් ලබයි' යනුවෙන් ද එසේ ම **'ආකංඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛුලාභී අස්සං චීවර - පිණ්ඩපාත - සෙනාසන - භෙසජ්ජපරික්ඛාරානන්ති සීලෙසෙවස්ස පරිපූරකාරී'** 'මහණෙනි, ඉදින් භික්ෂුව සිවුරු-පිඬු (ආහාර) - සෙනසුන් - බෙහෙත් ලබන කෙනෙක් වෙම්වායි කියා කැමති නම් නො අඩුව සිල් සම්පූර්ණ කරන කෙනෙක් වන්නේය' යනුවෙන් ද දෙසන ලදී.

ගාථාවන්හි - **පත්ථයානො** යනු පතමින්. **තයො සුඛෙ** යනු සැප තුන. **විත්තලාභං** යනු ධනලාභය, භෝග හටගැනීම යන අර්ථයි. විශේෂ වශයෙන් මෙහි ප්‍රශංසාවෙන් චෛතසික සැපය ද භෝගවලින් කායික සැපය ද ඉතිරි කරුණින් උත්පත්ති සැපය ද. එසේම පළමු වැන්නෙන් මෙලොව සැපය ද තුන්වැන්නෙන් පරලොව සැපය ද දෙවැන්නෙන් සැප දෙකම ද ගන්නා ලදැයි දතයුතුය. දැන් ප්‍රශංසාව ආදී කාරණයට ශීලය මෙන් ප්‍රශංසාදියේ විශේෂ කාරණා වන පාපමිත්‍රයන් වර්ජනය කිරීම, කල්‍යාණමිත්‍ර සේවනය ද දොස් හා අනුසස් සමග දක්වමින් 'අකරොන්තො' යනාදිය කීහ. එහි **සංකියො** යනු පාපයෙහි සැකකළ යුත්තෙක් වෙයි. මොහු පාපීපුරුෂයන් සමග හැසිරන නිසා ඒකාන්තයෙන් මොහු විසින් පාපයක් කරන ලද්දේ හෝ වෙයි. කරන්නේ හෝ වෙයි. **අස්ස** යනු පාපී ජනතාව ඇසුරුකරන මේ පුද්ගලයාගේ (හිස) මත්තෙහි හෝ මේ පුද්ගලයාගේ **අවණ්ණො** හටනොගත් කරුණකින් හෝ පාපී පුරුෂයන් ඇසුරුකරන නිසා (නුගුණ) **රූහති** වැඩීමට මහත්බවට පැමිණෙයි. පැතිරෙයි. 'අස්ස' යනු සත්තමී අර්ථයෙහි ඡට්ඨී වචනය හෝ (භුම්මත්ථෙ සාමිවචනං), ඒ පුද්ගලයා කෙරෙහි යන අර්ථයි. **සචෙ තාදිසකො හොති** යනු යමෙක් යම්බඳු වූ පාපමිත්‍රයකු හෝ කල්‍යාණ මිත්‍රයකු හෝ භජනය කරයි ද සේවනය කරයි ද ඒ පුද්ගලයා භූමිභාග වශයෙන් ජලය මෙන් (අපිරිසිදු බිමකට හෝ පිරිසිදු බිමකට වැටෙන ජලය භූමි කොටස අනුව අපිරිසිදු හා පිරිසිදු බවට පත්වන්නාක් මෙන්) එබඳුම පුද්ගලයෙක් වෙයි. පාපධර්ම ඇත්තෙක් හෝ යහපත් ධර්ම ඇත්තෙක් වෙයි. කවර හෙයින් ද? **සහවාසො හි තාදිසො** යම්හෙයකින් සමග විසීම, එකට සිටීම පළිඟු මැණික් කෙරෙහි උපරාගය මෙන් පුරුෂයාගේ ඇසුරට පත් වූ පුද්ගලයාගේ ස්වභාවය ගන්වයි. එහෙයින් සමග වාසය නොකළ යුතුය යන අදහසයි.

**සෙවමානො සෙවමානං** යනු ප්‍රකෘතියෙන් පිරිසිදු වූ කලින් කල තමන් ඇසුරුකරන පුද්ගලයකු සේවනය කරන භජනය කරන පාපී පුද්ගල තෙමේ, නැතහොත් (පිරිසිදු) ඔහු විසින් ඇසුරු කරන්නා වූ (පාපී) පුද්ගල තෙමේ. **සම්ඵුට්ඨො සම්ඵුසං** යනු ඒ ප්‍රකෘතියෙන් (ස්වභාවයෙන්) පිරිසිදු වූ පුද්ගලයා විසින් සමග වාසයෙන් එක්ව සිටීමෙන් ස්පර්ශ කරන ලද්දා වූ පාප පුද්ගලයා තමා ම එසේ ඒ පිරිසිදු පුද්ගලයා ස්පර්ශ කරන්නේ. **සරො දිද්ධො කලාපං වා** යනු විෂ පොවන ලද විෂ තවරන ලද ඊතලය යම්සේ ඊතල සමූහයට ඇතුළු වූයේ ඊ (සර) සමූහය නම් වූ සර කලාපය තමා විසින් (ඒ විෂ ඊතලය විසින්) ස්පර්ශ කරන ලද විෂ ආලේප නොවූ ඊතලමිටිය ද (විසෙන්) ආලේප කරන්නා සේ පාපී පුද්ගලයා පාපයෙන් පිරිසිදු පුද්ගලයා ආලේප කරයි. (තවරයි) **උපලෙපභයා ධීරො** යනු ධිති (උත්සාහ) සම්පන්න හෙයින් ධීර වූ පණ්ඩිත පුරුෂයා (පව් තැවරෙන බියෙන්) පාපමිත්‍රයන් ඇත්තෙක් නොවන්නේය.

**පූතිං මච්ඡං කුසග්ගෙන** යනු යම්සේ පිළිකුල් බැවින් කුණු වූ මාලුවා කුසතණ අගින් යම් පුරුෂයෙක් **උපනය්හති** මාලු මුලක් ලෙසින් ඔතයි ද ඔහුගේ ඒ කුසතණ කුණු නොවුන ද කුණුමාලු සම්බන්ධයෙන් කුණු දුගඳම හමයි. **එවං බාලූපසේවනා** යනු බාලජනයන් ඇසුරු කිරීම මේ ආකාරය යි දතයුතුය. **එවං ධීරූපසේවනා** යනු යම්සේ සුවඳ නැති කොල තුවරලා සමග සම්බන්ධවීමෙන් සුවඳ හමයි ද මෙසේ පණ්ඩිතයන් ඇසුරු කිරීමෙන් ස්වභාවයෙන් සිල් නැති තැනැත්තාගේ සීල සමාදානාදී වශයෙන් සිල් සුවඳ හැමීමට කාරණයක් වෙයි. **තස්මා** යනු යම්හෙයකින් අයහපත් මිතුරන් ඇසුරෙන් ද යහපත් මිතුරන් ඇසුරෙන් ද මෙබඳු වූ මේ ආදීනව හා ආනිසංස වෙයිද, එහෙයින් **පත්තපුටස්සෙව** තුවරලා (කට්ට කුමංක්ජල්) බැඳි කොලපත් ගොටුවක් මෙන් දුගඳ හා සුවඳ වස්තු සමග එක්වීමෙන් ද අසත්පුරුෂයන් හා සත්පුරුෂයන් ඇසුරෙන් ද **ඤත්වා සම්පාකමත්තනො** දුක හා සැප විපාක ඉපදීම **ඤත්වා** දැන, **අසන්තෙ** පාපමිත්‍රයන් **න උපසෙවෙය්‍ය** ඇසුරු නොකරන්නේය. **සන්තෙ** උපශාන්ත වූ වැමෑරූ දොස් ඇති පසසන ලද පණ්ඩිතයන් ඇසුරු කරන්නේය. ඒ එසේමය. **අසන්තො නිරයං නෙන්ති සන්තො පාපෙන්ති සුගතිං** අසත්පුරුෂයන් නිරයට පමුණුවති. සත්පුරුෂයන් සුගතියට පමුණුවති. මෙසේ භාග්‍යවතුන් වහන්සේ පළමු ගාථාවෙන් කියනලද ආකාර සැප

නිමිති තුන දක්වා ඉන්පසුව එන ගාථා පහෙන් ප්‍රතිවිරුද්ධ දෙය දුරු කිරීම සමග ප්‍රශංසාවේ හා සැපයේ පැමිණීම දක්වා අවසාන ගාථාවෙන් සැප තුනම පැමිණෙන කාරණය සමග අවසාන සැපය දක්වයි.

**සත්වන සූත්‍රය යි.**

# 3.3.8

අටවන සූත්‍රයෙහි **භිදුරායං** යනු භිදුරො අයං. බිඳීම ස්වභාවකොට ඇති මේ. **කායො** යනු රූප කයයි. එය වනාහි අංග ප්‍රත්‍යංගයන්ගේ හා කේසාදීන්ගේ සමූහාර්ථයෙන් ද මෙසේ පිළිකුල් වූ කෙස් ආදීන්ගේ උපදින ප්‍රදේශය යන අරුතින් ද කාය නම්. මේ එහි වචනාර්ථයයි. මෙහි උපදී යන අරුතින් ආය නම්. කුමක් උපදී ද? පිළිකුල් වූ කෙස් ආදියයි. මෙසේ පිළිකුල් දේවල ඉපදීම යන අරුතින් ද කාය නම්. අර්ථ වශයෙන් වනාහි පරම්පරා වශයෙන් පවත්නා වූ සතරමහා භූත හා උපාදාය ධර්මයන්ගේ සමූහය, මේ අර්ථය කියන ලද්දේ වෙයි. මහණෙනි, මේ සතරමහා භූතවලින් උපන් රූපකාය බිඳෙන ස්වභාව ඇත්තේ මොහොතක් මොහොතක් පාසා නැසෙන ස්වභාව ඇත්තේ ය. 'භිඤ්ඤරායං' යනු ද පාඨයකි. ඒ අර්ථයමයි. **විඤ්ඤාණං** යනු භූමි තුනට අයත් කුශලාදී සිතය. වචනාර්ථය වනාහි ඒ ඒ අරමුණ දැනගනියි යන අරුතින් විඤ්ඤාණ නම් වේ යනුයි. හඳුනාගැනීම් (සංජානන) දැනගැනීම් (පජානන)වල දක්ෂ වූ අරමුණ දැනගන්නා (විජානන) වූ යම් අවබෝධයක් වේ ද එය විඤ්ඤාණය යි.

**විරාගධම්මං** යනු නො ඇලෙන ධර්මය, විනාශවන ස්වභාවය ඇත්තේය යන අර්ථයි. **සබ්බෙ උපධි** යනු ස්කන්ධ උපධි, ක්ලෙශ උපධි, අභිසංස්කාර උපධි, පංචකාම ගුණ උපධි යන සියලුම උපාදානස්කන්ධ - ක්ලේශ - අභිසංස්කාර - පංචකාම ගුණ, ධර්ම බවට පත්ව නොවීම්

(අභාව) අර්ථයෙන් අනිත්‍යය, ඇතිවීම-නැතිවීම පෙළීම යන අරුතින් දුකය. ජරාවෙන් ද මරණයෙන් ද යන දෙයාකාර වූ වෙනස්වන ස්වභාවය ඇති බැවින් ප්‍රකෘතිය දුරුකරන අරුතින් විපරිනාම ධර්ම වේ. මෙසේ මෙහි අනිත්‍ය දර්ශනයට පහසුව පිණිස රූපධර්මයන් ද විඤ්ඤාණය ද වෙනම ගෙන නැවත උපධි බෙදා දැක්වීමෙන් සියලුම ත්‍රෛභූමික ධර්මයන් එකට ගෙන අනිත්‍ය දුක්ඛ අනුපස්සනා ප්‍රධානකොට ගෙන එසේම අවබෝධ කරන පුද්ගලයන්ගේ අදහස් වශයෙන් විමසාබලන (සම්මසන) වාරය කියන ලදී. ඒකාන්තයෙන් ම මෙහි ලක්‍ෂණ දෙකක් පමණක් ම පාලියෙහි ආයේය. 'යං දුක්ඛං තදනත්තා' යන වචනයෙන් දුක්ඛ ලක්‍ෂණයෙන් ම අනත්ත ලක්‍ෂණයත් දක්වන ලද්දේමයයි දතයුතුය.

ගාථාවල - **උපධීසු භයං දිස්වා** යනු උපධි තුනෙහි භයතුපට්ඨාන ඤාණ වශයෙන් බිය දැක, ඒවාට බිය වියයුතු බව දැන, මෙයින් බලවත් විදර්ශනාව දක්වයි. භයතුපට්ඨාන ඤාණයම බෙදා විශේෂ වශයෙන් ආදීනවානුපස්සනාව ද නිබ්බිදානුපස්සනාව ද කියනු ලැබේ. **ජරාමරණමජ්ඣගා** යනු මෙසේ විමසා බලන්නේ විදර්ශනා ඥානය මාර්ගයෙන් එකට ගටා මාර්ග පිළිවෙළින් රහත්බවට පත්වූයේ ජාතිමරණ ඉක්මවූයේ නම් වෙයි. කෙසේද? **සම්පත්වා පරමං සන්තිං** යනු උසස් වූ උතුම් වූ අනුත්තර වූ ශාන්ත වූ සියලු සංස්කාරයන්ගේ සන්සිඳීම නම් වූ නිවනට පැමිණ. මෙසේ වූයේ ද **කාලං කංඛති භාවිතත්තො** යනු සතර ආර්යමාර්ග වශයෙන් භාවනා අවබෝධය සම්පූර්ණ වීමෙන් වඩන ලද කාය-සීල-චිත්ත ප්‍රකාශයට පැමිණීමෙන් භාවිත වූ ආත්මය ඇත්තේ මරණයටද ජීවිතයටද සතුටු නොවන්නේ හුදෙක් තමාගේ ස්කන්ධ පරිනිර්වාණ කාලය කැමති වෙයි. උන්වහන්සේට කිසිතැනක කිසි ප්‍රාර්ථනාවක් නැත. එහෙයින්

**නාභිනන්දාමි මරණං නාභිනන්දාමි ජීවිතං**
**කාලං ච පටිකංඛාමි නිබ්බිසං භතකො යථා**

මරණයට සතුටුනොවෙමි. ජීවිතයට ද සතුටු නොවෙමි. කුලිය කැමති මෙහෙකරුවා මෙන් කාලය (පමණක්) කැමති වෙමි'යි කීහ.

**අටවන සූත්‍රයයි.**

# 3.3.9

නවවන සූත්‍රයෙහි **ධාතුසො** යනු ධාතු වශයෙන්, ධාතු යනු අධ්‍යාශය ධාතු, අදහසේ ස්වභාවය අදහස් කරන ලදී. අධිමුත්ති යනුවෙන් ද කියනු ලැබේ. **සංසන්දන්ති** යනු ඒ ධාතු සමානතාවෙන් ධාතුව අනුව අදහස අනුව ඇලෙති, එක්වෙති. **සමෙන්ති** යනු ඒ සමාන අදහස් ඇති බැවින් ම එක්සිත්ව එකතු වෙති. ඔවුනොවුන් ඇසුරු කරති. ඔවුනොවුන් වෙත එළඹෙති. තමාගේ රුචිය, අදහස, ඉවසීම, දෘෂ්ටි හෝ ඒ ඒ තැනදී සම කරමින් පවත්වති. **හීනාධිමුත්තිකා** යනු මොවුන්ට හීන වූ කාමගුණ ආදිය කෙරෙහි අදහස් ඇත්තේය යනුවෙන් හීනාධිමුක්තිකයෝ හීන අදහස් ඇත්තෝ වෙති. **කල්‍යාණාධිමුත්තිකා** යනු මොවුන්ට යහපත් වූ නෙක්ඛම්ම ආදී අදහස් ඇත්තේය යනුවෙන් කල්‍යාණ අධිමුත්තිකයෝ, ප්‍රණීත අදහස් ඇත්තෝ වෙති.

ඉදින් ආචාර්ය උපාධ්‍යායවරු සිල්වත්හු නොවෙත් ද අන්තේවාසික සද්ධිවිහාරිකයෝ සිල්වත් වෙත් ද ඔවුහු ආචාර්ය උපාධ්‍යායයන් වෙත නො එළඹෙත්. තමා හා සමාන සුදුසු භික්ෂූන් වෙත ම එළඹෙත්. ඉදින් ආචාර්ය උපාධ්‍යායවරු සිල්වත් වෙත් ද අන් අය (අන්තේවාසික-සද්ධිවිහාරිකයෝ) සිල්වත් නොවෙත් ද ඔවුහු ආචාර්ය උපාධ්‍යායයන් වහන්සේලා වෙත නො එළඹෙත්. තමා හා සමාන පහත් (හීන) අදහස් ඇති අය වෙතම එළඹෙත්. මෙසේ එළඹීම හුදෙක් දැන් පමණක්ම නොවෙයි. අතීත-අනාගතයෙහි ද එසේයයි දක්වමින් 'අතීතම්පි භික්ඛවෙ' යනාදිය වදාළහ. කෙටියෙන් කිලිටි බව ඇතිකරන ධර්මයන්හි (කරුණුවල) බැසගත්තෝ හීනාධිමුක්තිකයෝය. (හීන අදහස් ඇත්තෝය) පිරිසිදු බව ඇතිකරන ධර්මයන්හි බැසගත්තෝ කල්‍යාණාධිමුක්තිකයෝය. (යහපත් අදහස් ඇත්තෝය.) මේ දුස්සීලයන්ගේ දුස්සීලයන් සේවනය කිරීම සිල්වතුන්ගේ සිල්වතුන් සේවනය කිරීම, ප්‍රඥාව නැති අයගේ ප්‍රඥාව නැති අය සේවනය කිරීම, ප්‍රඥාවන්තයන්ගේ ප්‍රඥාවන්තයන් සේවනය කිරීම නියම කරන්නේ කවුද? අධ්‍යාශය ධාතුව (අදහස) නියම කරයි.

බොහෝ භික්ෂූහු එක්තරා ගමක පිඬුසිඟා වඩිති. ඒ මිනිස්සු බොහෝ බත් (දානය) ගෙනවුත් පාත්‍ර පුරවා තම තමන්ට ගැලපෙන භික්ෂූන් සමග

වළඳන්නැයි කියා පාත්‍ර දී ආපසු යැවූහ. භික්ෂූහු, ඇවැත්නි, මිනිසුන් අදහස් වශයෙන් ගැලපෙන ක්‍රියාවෙහි යොදවති'යි කීවාහුය. මෙසේ අදහස (තමාම) නියම කරයි. ධාතුසංයුත්තයෙන් (අදහස් එකට යෙදීමෙන්) මේ අර්ථය පැහැදිලි කළයුතුය. ගිජ්ඣකූට පර්වතයෙහිදී ගිලන් නිසා සැතපුණු භාග්‍යවතුන් වහන්සේ රැකවරණය පිණිස පිරිවරාගෙන වැඩවසන සැරියුත් මුගලන් රහතන් වහන්සේලා අතරින් තමාගේ පිරිස සමග හැසිරෙන එක එක රහතන් වහන්සේ දෙස බලා 'මහණෙනි, බොහෝ භික්ෂූන් සමග සක්මන් කරන සැරියුත් දකිව්ද? යනුවෙන් භික්ෂූන් ඇමතූහ. එසේය ස්වාමීනි(යි භික්ෂූහු පිළිතුරු දුන්හ.) මහණෙනි, ඒ සියලු භික්ෂූහු මහා ප්‍රඥාවන්තයෝ ය යි සියල්ල විස්තර කළයුතුය.

ගාථාවන්හි **සංසග්ගා** යනු කිලිටිවීම් වශයෙන් එකට වාසය කිරීම් වශයෙන් යෙදුනාහු. නැතහොත් දර්ශන සංසර්ගය, ශ්‍රවණ සංසර්ගය, සමුල්ලාපන සංසර්ගය, සම්භෝග සංසර්ගය, කාය සංසර්ගය (දැකීමෙන් උපන් රාගය, ඇසීමෙන් උපන් රාගය, කතාබහ කිරීමෙන් උපන් රාගය, ස්ත්‍රියකගේ භාණ්ඩයක් පුරුෂයකු ළඟ තබාගෙන පරිහරණය කිරීමාදී වශයෙන් පරිහරණය කිරීමෙන් උපන් රාගය, අත් පා ඇල්ලීම් ආදී වශයෙන් උපන් රාගය) යන පස්වැදෑරුම් සංසර්ග අතරින් යමකින් සංසර්ග වීමෙන්. **වනතො ජාතො** යනු (සෝවාන් ආදී) මාර්ගයෙන් විනාශ නොකළ ක්ලේශය උපන්නේ. **අසංසග්ගෙන ඡිජ්ජති** යනු සංසර්ගයට ප්‍රතිවිරුද්ධ වූ කාය විවේක (හුදකලා වාසය) ආදියෙන් මුල් අවස්ථාවෙහි (කෙලෙස්) සිඳ නැවත සම්පූර්ණයෙන් ම සංසර්ගයෙන් තොරවීමෙන් සමුච්ඡේද විවේකයෙන් සිඳෙයි. පහවෙයි. මෙපමණකින් කෙටියෙන් හීන අධිමුත්තියේ (පහත් අදහසේ) හටගැනීම ද නැතිවීම ද දක්වන ලද්දේ වෙයි. යම්හෙයකින් ඒ සංසර්ග ද ඒ කෙලෙස් ද කුසීත බව ඇතිවීම් වශයෙන් උපදී ද එසේම වැඩේ ද වීර්යය ආරම්භ කිරීම් වශයෙන් නොවේද එහෙයින් හීන අදහස් ඇති කුසීත පුද්ගලයන් දුරුකොට යහපත් අදහස් ඇති වීර්යය ආරම්භ කළ පුද්ගලයන් ඇසුරු කිරීමෙන්, එක්ව නොවිසීමෙන් සංසර්ගයෙන් උපන් කෙලෙස් සිඳිය යුතුයයි කියන ලද අර්ථය විස්තර වශයෙන් දක්වමින් කුසීතයන් ඇසුරුකිරීමේ ආදීනව (දොස්) පළමුව ප්‍රකාශ කරන්නට 'පරිත්තං දාරුං' යනාදිය කීහ.

එහි **පරිත්තං දාරුං** යනු කුඩා ලී පහුරක්. **යථා සීදෙ මහණ්ණවෙ** යනු යම්සේ කුඩා පහුරකට නැගී මහ සමුදුර තරණය කරන්නට කැමැත්ත ඇති තැනැත්තා වෙරළට නොපැමිණ මුහුද මැදදීම ගිලෙන්නේය. වැටී මාලුන්ට කැස්බෑවන්ට ආහාරයක් වන්නේය. **එවං කුසීතං ආගමම සාධුජීවීපි සීදති** යනු මෙසේම කුසීත වූ ඇරඹූ වීර්යය නැති කෙලෙස් වසඟයට ගියා වූ පුද්ගලයකු නිසා ඔහු සමග කරන ලද ඇසුර ඇති යහපත් ජීවිතය ඇති, පිරිසිදු ජීවිතය ඇති පිරිසිදු සීලය ඇති තැනැත්තා පවා පහත් ඇසුරෙන් උපන්නා වූ කාම විතර්කාදීන් විසින් කනු ලබන්නේ එගොඩට යන්නට අසමත් වූයේ සසර සයුරෙහිම ගිලෙයි.

**තසමා** යනු යම්හෙයකින් කුසීත පුද්ගල ඇසුර මෙසේ අයහපත ගෙන දේද එහෙයින් ඒ කුසීත පුද්ගලයා වෙත පැමිණ අලස බව අනුව කටයුතු කිරීමෙන් පිළිකුල් ලෙස ගිලෙයි යන අරුතින් **කුසීතං** නම් වේ. එහෙයින් ම **හීන වීරියං** වීර්යය නැති අයහපත් මිතුරා දුරුකරන්නේය. ඒකාන්තයෙන්ම කාය විවේකාදීන්ගේ ද තදංග විවේකාදීන්ගේ ද වශයෙන් **පවිවිත්තෙහි** පවිවිත්ත වූ, ඒ කෙලෙසුන්ගෙන් ම දුර වූ හෙයින් **අරියෙහි** පිරිසිදු වූ, නිවන දෙසට යොමු කරන ලද සිත් ඇති බැවින් **පහිතත්තෙහි,** පහිතත්ත වූ අරමුණු-ලකුණු නැවත නැවත සිහිකිරීම් වශයෙන් ධ්‍යාන වැඩීමෙන් **ඣායීහි** ඣායී වූ හැමකල්හි ඔසවා ගත් වීර්යය ඇති බැවින් **ආරද්ධවිරියෙහි** ඇරඹූ වීර්ය ඇති පණ්ඩිතයන් සමගම නුවණැත්තන් සමගම වාසය කරන්නේය. එක්ව වාසය කරන්නේය.

**නවවන සූත්‍රය යි.**

# 3.3.10

දසවන සූත්‍රයෙහි - **පරිහානාය සංවත්තනති** යනු වෘද්ධිය නැතිවීම පිණිස වෙයි. මාර්ගය ලැබීමට උවදුරු පිණිස පවතී. ලැබුවා වූ (අවබෝධ කළ) මාර්ගයේ පරිහානියක් නම් නැත. **තයො ධම්මා** යනු ධර්මයෙහි පිහිටීම් වශයෙන් (ධම්මාධිට්ඨාන වසෙන) දක්වන ධර්ම පුද්ගලයා කෙරෙහි පිහිටි (පුග්ගලාධිට්ඨානාය) දේශනාවෙන් බෙදමින් 'ඉධ භික්ඛවෙ සෙඛො භික්ඛු' යනාදිය වදාළහ. එහි කටයුතු ඇරඹීම් වශයෙන් මොහුගේ ඇලීම - යන අරුතින් **කම්මාරාමො** කර්මාන්තයෙහි ඇලුණේ වෙයි. කටයුතුවල ඇලුණේ යන අරුතින් **කම්මරතො** නම් වෙයි. කටයුතුවල ඇලීමෙහි යෙදුනේ යුක්ත වූයේ යන අරුතින් **කම්මාරාමතං අනුයුත්තො** නම් වෙයි. එහි කටයුත්ත නම් මෙසේ කළයුතු වූ කටයුත්තය. කෙසේද? සිවුරු පිළිබඳ විමසීමට සිවුරු සකස් කිරීමට උපකාර කිරීම, පාත්‍ර පසුම්බි, අංසකඩ, පටිය, ඬබරාව (පෙරහන්කඩ විශේෂයක්), පාත්‍රය තබන දරණුව, පය තබන පුවරුව, ඉදල්-කොහු යන මේ ආදී උපකරණ සකස් කිරීම ද විහාරයෙහි කැඩුණු බිඳුණු තැන් පිළිසකර කිරීම ද වෙයි. ඇතැම් පුද්ගලයෙක් මේ කටයුතු කරමින් මුලු දවසම මේවාම කරයි. ඒ සඳහා මෙය කියන ලදී.

යම් පුද්ගලයෙක් මේ කටයුතු කරණ වේලාවෙහිම ඒවා කරයි. උද්දේස (පාඩම් අසාගන්නා) වේලාවෙහි දී පාඩම අසා ගනී. පාඩම් කරන වේලාවේදී පාඩම් කරයි. සෑමලු (චෛත්‍යමලු) ඇමදීම් ආදී වත් කරන වේලාවෙහි සෑමලු ඇමදීම් ආදී වත් කරයි. හැමතන්හිම භාවිත කරන කමටහන් (සබ්බත්ථක කම්මට්ඨාන) හෝ විශේෂයෙන් භාවිතා කරන කමටහන් (පාරිහාරිය කම්මට්ඨාන) හෝ මෙනෙහි කරන වේලාවෙහි මෙනෙහි කරයි නම් එය කම්මාරාමය නොවෙයි. '**යානි බො පන තානි සබ්‍රහමචාරීනං උච්චාවචානි කිං කරණීයානි, තත්‍ථ දක්ඛො හොති අනලසො, තත්‍රූපායාය වීමංසාය සමන්නාගතො අලං කාතුං අලං සංවිධාතුං**'[1] 'යම් ඒ විමසා කළයුතු කටයුතු වේනම් එහි දක්ෂ වූයේ අලස නොවූයේ ඒ ඒ කරුණෙහිදී එය කළයුතු උපායමාර්ග විමසන ප්‍රඥාවෙන් යුක්ත වූයේ (එය තමන්) කිරීමට සමත් වූයේ ද අනුන් ලවා කරවීමට සමත් වූයේ ද වෙයි' යනාදී වශයෙන් ඔහුගේ ඒ කටයුතු ශාස්තෘන් වහන්සේ විසින්

---

1. අං.නි. 5 නි - 4 ව - 5 සූ. බු.ජ.මු. 180 පිට

අනුමත කරන ලද්දේම වෙයි. **භස්සාරාමො** යනු යම් පුද්ගලයෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රතික්ෂේප කරන ලද රාජකථාදී වශයෙන් දිවා රෑ කල්ගෙවයි ද මොහු කතාව කෙළවර කරන්නෙක් නොවේ. භස්සාරාම (කතාවෙහි ඇලුණු කෙනෙක්) නම් වෙයි. යමෙක් රෑ ද දවල් ද දහම් කියයි ද ප්‍රශ්න විසඳයි ද මොහු අල්ප වශයෙන් කථා කරන්නෙකි. කතාවෙහි සීමාව ඇත්තෙක්මය. කුමක් හෙයින් ද, **'සන්නිපතිතානං වො භික්ඛවෙ ද්වයං කරණීයං - ධම්මීවා කථා අරියො වා තුණ්හී භාවො'**[1] 'මහණෙනි, රැස් වූ ඔබ විසින් කළයුතු කටයුතු දෙකකි. එනම් දැහැමි කතාව හෝ ආර්ය වූ නිහඬ බවයි.' යනුවෙන් කියන ලද ආකාරයටම පිළිපදින්නේ වෙයි. (එහෙයිනි)

**නිද්දාරාමො** යනු යමෙක් ඇතිතාක් කුස පුරා අනුභවකොට ඇඳ පුටු ආදියෙහි නිදීමෙහි සැපයට (සෙය්‍ය සුඛ), නිදීමේදී වමට දකුණට හැරීමෙන් ඇතිවන සැපයට (පස්ස සුඛ), නිදි සුවයට (මිද්ධසුඛ) අනුව යෙදුනේ වෙයි ද, යමෙක් යමින් ද හිඳිමින් ද සිටිමින් ද ථීනමිද්ධයෙන් මැඩුනේ නිදයි ද මොහු නිද්දාරාම (නින්දෙහි ඇලුනෙක්) නම් වෙයි. කයෙහි ගිලන්කමින් යමෙකුගේ සිත භවංගයට බැසගනීද මෙය නිද්දාරාමය නොවේ. එහෙයින් ම **'අභිජානාමි ඛො පනාහං අග්ගිවෙස්සන ගිම්හානං පච්ඡිමෙ මාසෙ පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො චතුග්ගුණං සංඝාටිං පඤ්ඤාපෙත්වා දක්ඛිණෙන පස්සෙන සතො සම්පජානො නිද්දං ඔක්කමිතා'**[2] 'ගිනිවෙස්න (සච්චක ය) ගිම්හානයේ අවසන් මාසයෙහි දානය වැළඳීමෙන් පසුව පිණ්ඩපාතයෙන් වැලකුණේ සිවුර සතර පොටක් කොට පණවා දකුණු ඇළයෙන් සිහි ඇතිව, නුවණින් දනිමින් නින්දට බැසගත් බව දනිමි'යි වදාළහ. මෙහි දී කල්‍යාණ පෘථග්ජනයා ද සේඛ යයි දතයුතුය. එහෙයින් ඒ පෘථග්ජනයාට (සෝවාන් ආදී) විශේෂ අධිගම සියල්ලේ ද (සෝවාන් ආදියට පත්වූ) අන් අයට ඉහළ විශේෂ අධිගමයේද පිරිහීම පිණිස පවතීයයි දතයුතුය. කියන ලද ආකාරයට විරුද්ධ අයුරින් කුශල පක්ෂයෙහි අර්ථ පැහැදිලිකිරීම දතයුතුය.

ගාථාවන්හි - **උද්ධතො** යනු සිත අවුල්කරන උද්ධච්චයෙන් නොසන්සුන් වූ නොසන්සිඳුනා වූ (සිත් ඇති) **අප්පකිච්චස්ස** යනු අනුදැන වදාළ කියන ලද ආකාර කටයුතු නිසිකල්හිම කිරීම් වශයෙන් අල්ප කටයුතු ඇත්තෙක් වන්නේය. **අප්පමිද්ධො** යනු 'දිවසං චංකමෙන නිසජ්ජාය'

1-2 ම.නි. මූ.ප. අරිය පරියෙසන / මහා සච්චක සූත්‍ර

දවල් කාලයෙහි සක්මනෙන් ද හිඳීමෙන් ද යනාදී වශයෙන් කියන ලද ජාගරියානුයෝගයෙන් නිදි නැත්තෙක් වන්නේ ය. **අනුද්ධතො** යනු හස්සාරාමතාවෙන් කතාකිරීමට ඇති කැමැත්තෙන් හසසාරාම නොවී සිතේ උපන් අවුල් සහගත බව දුරු කිරීමෙන් නොසන්සුන් නොවූයේ සන්සිඳුන සිත් ඇත්තේ, සමාහිත වූ යන අර්ථයි. ඉතිරියට පෙර කියන ලද ක්‍රමය ඇති බැවින් දැනගැනීම පහසුය. මෙසේ මේ වර්ගයෙහි පළමු-දෙවන-සිවුවන-පස්වන-සයවන-සත්වන-අටවන-නවවන සූත්‍රවල (සූත්‍ර අටෙහි) සසර කියන ලදී. අනිත් සූත්‍ර දෙකෙහි දී සසර හා නිවන කියන ලදී.

**දසවන සූත්‍රය යි.**

**තුන්වන වර්ගයේ වර්ණනාව නිමියේ ය.**

## 3.4.1

සතරවන වර්ගයේ පළමු සූත්‍රයෙහි **අකුසලා විතක්කා** යනු අදක්ෂ බැවින් උපන් විතර්ක, මිථ්‍යා විතර්ක යන අර්ථයි. **අනවඤ්ඤත්ති පටිසංයුත්තො** යන මෙහි 'අනවඤ්ඤත්ති' යනු අනුන්ගෙන් අවඥාවක් නැති බව තමා ගැන පිළිකුල් නොකරන බව, නින්දා නො ලබන බව, 'අහෝ, අන් අයමට අවමන් නොකරන්නාහු නම් යනුවෙන් මෙසේ පැවති කැමැත්තෙන් යුක්ත වූ, ඒ අවඥාවක් නැති බව පිළිබඳව යෙදුනා වූ, මිශ්‍ර වූ හෝ එය නිමිතිකොට පැවති විතර්කය අනවඤ්ඤත්ති පටිසංයුත්ත විතර්කය යි. එහෙයින් අනිත් ගිහියෝ ද පැවිද්දෝ ද කෙසේ නම් මා පහත්කොට නො පිළිගන්නාහු දැයි යනුවෙන් සම්භාවනා (ගරුකිරීම) ලබාගැනීමේ කැමැත්තෙන් ආසාවෙහි පිහිටා පැවති විතර්කයට මේ වචනයකි.

**ලාභ-සක්කාර-සිලොක පටිසංයුත්තො** යනු සිවුරු ආදිය ලැබීම ද සත්කාරය ද කීර්ති ශබ්දය ද අරමුණුකිරීම් වශයෙන් යෙදුණු **පරානුද්දයතා**

**පටිසංයුත්තො** යනු අනුන් කෙරෙහි ඇති දයානුකම්පාවේ මුවාවෙන් (ප්‍රතිරූපයෙන්) උපන් ගේහසිත ප්‍රේමයෙන් යුක්තවූ. **'සංසට්ඨො විහරති රාජූහි රාජමහා මත්තෙහි බ්‍රාහමණෙහි ගහපතිකෙහි තිත්ථියෙහි තිත්ථිය සාවකෙහි - සහනන්දී, සහසෝකී, සුඛිතෙසු සුඛිතො දුක්ඛිතෙසු දුක්ඛිතො, උප්පන්නෙසු කිච්චකරණීයෙසු අත්තනො වොයොගං ආපජ්ජිතා'** 'රජවරුන් සමග, රජමහ ඇමතියන් සමග, බමුණන් සමග, ගෘහපතියන් සමග, තීර්ථකයන් සමග, තීර්ථක ශ්‍රාවකයන් සමග ඇලීගැලී වාසය කරයි. ඔවුන් සමග සතුටු වෙයි. ඔවුන් සමග ශෝක වෙයි. ප්‍රීතිමත් අවස්ථාවලදී ප්‍රීතිවෙයි. දුක් සහගත අවස්ථාවලදී දුක්වෙයි. වැඩකටයුතු ඇතිකල්හි තමා ඒවායෙහි යෙදෙයි' යන මෙය ඒ සඳහා කියන ලදී.

ගාථාවන්හි - අනුන්ගෙන් අවඥා නොලබනු කැමති බවෙන් යුක්ත වූ පුද්ගලයා **අනවඤ්ඤත්ති සංයුත්තො** නම් වෙයි. මොහුගේ ගෞරවය ලාභසත්කාර කෙරෙහිය ධර්මය කෙරෙහි නොවේ යන අරුතින් **ලාභසක්කාර** ගාරවො නම් වෙයි. සැපදුක් දෙකෙහි දී (තමා) සමග වන්නාහු යන අරුතින් අමච්චා නම් වෙයි. මිතුරන් සමාන උපස්ථායකයෝ, ගෙහසිත ප්‍රේම වශයෙන් ඔවුන් සමග සතුටුවන ස්වභාවය ඇත්තේ **සහනන්දී අමච්චෙහි** නම් වෙයි. මෙයින් අනුන් කෙරෙහි ඇති දයානුකම්පාවේ මුවාවෙන් උපන් ගේහසිත ප්‍රේමයෙන් යුක්ත වූ විතර්කය දක්වයි. ආරා **සංයොජනක්ඛයා** යනු මේ විතර්ක තුනෙන් මැඩගත්තා වූ පුද්ගලයා සංයෝජනයන් දුරුකිරීම වූ අර්හත්වයෙන් දුරෙහිය. ඔහුට ඒ අර්හත්වය දුර්ලභය යන අර්ථයි. **පුත්තපසුං** යනු පුතුන් ද සිවුපාවුන් ද, මෙහි 'පුත්ත' ශබ්දයෙන් බිරිඳ ආදියත් 'පසු' ශබ්දයෙන් අශ්වයන්-ගවයන්-කෙත්-වතු ආදියත් ඇතුළත් කරන ලදී. **විවාහෙ** යනු විවාහ කරවීමෙහි, මෙයින් ආවාහයත් ගන්නා ලදී. **සංගහානි** යනු ලබාගැනීමයි. පිරිකර ලබාගැනීම යන අර්ථයයි. **සන්ථවානී** යනුවෙන් ද කියති. මිතුරන් ඇසුරුකිරීම යන අර්ථයයි. හැමතන්හි 'හිත්වා' යනු සම්බන්ධයි. **භබ්බො සො තාදිසො භික්ඛු** යනු ඒ භික්ෂුව කියන ලද සියලු කෙලෙස් දුරුකොට ශාස්තෘන් වහන්සේ දේශනා කරන ලද යහපත් ප්‍රතිපත්තියෙන් දැකිය යුතු බැවින් එබඳු වූ, සසර භය දකින්නේය යන අරුතින් භික්ඛු නම් වේ. **උත්තමං සම්බොධිං** අර්හත්වයට පත්වන්නට සුදුසුය.

**පළමු සූත්‍රය යි.**

# 3.4.2

දෙවන සූත්‍රයෙහි - **සක්කාරෙන** යනු සත්කාරයට හේතු වූ දෙයින්. නැතහොත් 'සක්කාරෙන' යනු සත්කාර හේතුවෙන් හෝ සත්කාරයට හේතු වූ මුල් කාරණයෙන්. සත්කාරය නිසා මෙලොව ඇතැම් පුද්ගලයෝ ලාමක අදහස් ඇත්තාහු, ආසාවෙන් යුක්ත වූවාහු කැමති හැසිරීමෙහි සිට සත්කාර උපදවන්නෙමුයි නොයෙක් ආකාර නුසුදුසු වැරදි සෙවීම්වලට පැමිණ මෙලොවින් චුත වූවාහු අපායවල උපදිති. අන් අය කැමති පරිදි සත්කාරලබා එය නිමිතිකොට මානයට - මදයට මසුරුකමට ආදී වශයෙන් ප්‍රමාදයට පැමිණ මෙලොවින් චුත වූවාහු අපායවල උපදිති. 'සක්කාරෙන අභිභූතා පරියාදින්න චිත්තා' යන්න ඒ සඳහා කියන ලදී. එහි **අභිභූතා** යනු මැඩගත්. **පරියාදින්නචිත්තා** යනු ක්ෂය කර ගන්නා ලද සිත් ඇති, කැමති හැසිරීමෙන් ද මාන-මද ආදියෙන් ද ක්ෂයවීමට පත්කරන ලද කුසල සිත් ඇති. නැතහොත් 'පරියාදින්නචිත්තා' යනු හාත්පසින් ඇදගන්නා ලද සිත් ඇති, කියන ලද ආකාර ඇති අකුසල කොටසින් කුසල සිතේ හටගැනීම නොවේ ද එසේ හාත්පසින් ගන්නා ලද චිත්ත සන්තාන ඇති යන අර්ථයි. **අසක්කාරෙන** යනු තමා කෙරෙහි පවතින අසත්කාර හේතුවෙන් හෝ අසත්කාරයට හේතුවන මුල් කාරණය වන මාන ආදියෙන් අනුන් විසින් පිළිකුල් කොට පරිභවකොට **සක්කාරෙන අසක්කාරෙන ච** යනු යම්කිසි පුද්ගලයන් විසින් පවත්වන ලද සත්කාරයෙන් ද යම්කිසි පුද්ගලයන් විසින් පවත්වන ලද අසත්කාරයෙන් ද, යම්කිසි පුද්ගලයන් විසින් පළමුව සත්කාර කරන ලද්දාහු වී ඔවුන් විසින් ම ශ්‍රද්ධාව නැති බව ආදිය දැන පසුව සත්කාර නොකරන ලද්දාහු වෙති. එබඳු අය සඳහා 'සක්කාරෙන ච අසක්කාරෙන ච' යනුවෙන් කියන ලදී. එහි සත්කාරයෙන් මැඩගත් දෙව්දත් ආදී අය නිදසුන් ලෙස දැක්විය යුතුය. මේ කාරණය

**ඵලං වෙ කදලිං හන්ති ඵලං වෙළුං ඵලං නළං**
**සක්කාරො කාපුරිසං හන්ති ගබ්භො අස්සතරිං යථා**

'යම්සේ (කෙසෙල් කැන නම් වූ) ඵලය කෙසෙල්ගස නසයි ද ඵලය උණගස නසයි ද ඵලය බටගස නසයි ද (වෙළඹගේ) ගබ වෙළඹ නසයි ද එසේම සත්කාරය නරක පුරුෂයා නසයි. සත්පුරුෂයන් කෙරෙහි කරන ලද අසත්කාරයෙන් මැඩගත් දණ්ඩකී රජ කාලිංග රජ, මෙජ්ඣ

රජ ආදීහු නිදසුන් ලෙස දැක්විය යුතුය. මේ කාරණය (මෙසේ) කියන ලද්දේය.

කිසං හි වච්ඡං අවකිරිය දණ්ඩකී
උච්ඡින්නමූලො සජනො සරට්ඨො
කුක්කුලනාමෙ නිරයම්හි පච්චති
තස්ස පුලිංගානි පතන්ති කායෙ[1]

දණ්ඩකී නම් රජතෙම කිසවච්ඡ නම් තාපසයාට අවමන් කොට සපිරිවරින් රටවැසියා සහිතව සිඳින ලද මුල් ඇත්තේ (පිහිටක් නැතිව) කුක්කුල නම් නරකයෙහි පැසෙයි. ඔහුගේ සිරුරෙහි සහළඟුරු වැටේ.

යො සඤ්ඤතෙ පබ්බජිතෙ අවඤ්චයී
ධම්මං භණන්තෙ සමණෙ අදූසකෙ
තං නාලිකීරං සුනඛා පරත්ථ
සංගම්ම ඛාදන්ති විප්ඵන්දමානං[1]

යම් රජෙක් කිසිවකුට දුෂ්ට චේතනා පහළ නොකළ සන්සිඳුවන ලද පව් ඇති (දශකුශල නම් වූ) බණ දේශනා කරන්නා වූ සංයත වූ නිරපරාධ වූ පැවිද්දන් වෙහෙසූයේ ද වැලපෙන්නා වූ ඒ නාලිකීර නම් රජ පරලොවෙහිදී සුනඛයෝ රැස්ව කා දමති.

එසේම : උපහච්ච මානං මෙජ්ඣා
මාතංගස්මිං යසස්සිනෙ
සපාරිසජ්ජො උච්ඡින්නො
මෙජ්ඣාරඤ්ඤං තදා අහු[2]

යසස් ඇති මාතංග ඍෂිවරයා කෙරෙහි සිත දූෂ්‍ය කරගත් මෙධ්‍ය රජ තෙමේ පිරිස් සහිතව සිඳී ගියේය. එකල්හි මෙධ්‍යාරණ්‍යය ඇති විය. සත්කාරයෙන් ද අසත්කාරයෙන් ද මැඩගත්තා වූ අන්‍ය තීර්ථක (නිගණ්ඨ) නාථපුත්ත ආදී අය නිදසුන් ලෙස දැක්විය යුතුය.

---

1. සරභංග ජාතකය - චත්තාළීස නිපාතය - ජාතක පාළි
2. සංකිච්ච ජාතකය - ජාතක පාළි බු.ජ.මු. 2 භා - 276 පිට

ගාථාවන්හි **උභයං** යනු සත්කාරයෙන් ද අසත්කාරයෙන් ද යන දෙකින් **සමාධි න විකම්පති** යනු නො සෙල්වෙයි. එකඟ බවෙන් ම සිටියි. කවරෙකුගේ (සමාධිය) නො සෙල්වෙයි ද? **අප්පමාණ විහාරිනො** යනු යම් කෙනෙක් ප්‍රමාණකර ධර්ම වූ රාගාදිය මනාව ප්‍රහීණ වූ බැවින් අප්‍රමාණවිහාරී වූ රහතන් වහන්සේ නමක් වෙත් ද උන්වහන්සේගේ යයි කීහ. උන්වහන්සේ (අට) ලෝදහමින් කම්පා නොවෙති. **සුඛුමදිට්ඨි විපස්සකං** යනු ඵලසමාපත්ති ලැබීම සඳහා සියුම්ව දකින ප්‍රඥාවෙන් නිතර පවත්වන ලද විදර්ශනාව ඇති බැවින් සුඛුමදිට්ඨි විපස්සක නම් වේ. **උපාදානක්ඛයාරාමං** යනු සතර උපාදානයන්ගේ ක්‍ෂය වීම වූ අවසානය වූ අර්හත්ඵලයට මොහුගේ ඇලීම (ආරම්තබ්බං) යන අරුතින් උපාදානක්ඛයාරාම නම් වේ. ඉතිරිය කියන ලද අයුරින් දත යුතුය.

**දෙවන සූත්‍රය යි.**

# 3.4.3

තුන්වන සූත්‍රයෙහි **දෙවෙසු** යනු අරූපාවචර දෙවියන් ද අසඤ්ඤ දෙවියන් ද හැර අනිත් උත්පත්ති දෙවියන් අතර. **දෙවසද්දා** යනු දෙවියන්ගේ ප්‍රීතිය පළකරන ශබ්ද. **නිච්ඡරන්ති** යනු ඔවුනොවුන් අල්ලාප සල්ලාප වශයෙන් පවත්වති. **සමයාසමයං උපාදාය** යනු කලින් කල සලකා බලා මේ අදහස කියන ලද්දේ වෙයි. යම්කලෙක සිටියා වූ ඒ දෙවියෝ ඒ කාලයට පැමිණ ඔහු දකින්නාහ, එතැන් පටන් ඒ සපැමිණි කාලයට අවුත්. 'සමයං සමයං උපාදාය' යනුවෙන් ද ඇතැමෙක් කියති. ඒ වචනවල ඇත්තේ ඒ ඒ කාලය සලකා යන අර්ථයි.

**යස්මිං සමයෙ** යනු යම්කලෙක්හි (එනම්) 'අට්ඨිකංඛලූපමා කාමා' 'කාමයෝ ඇටසැකිල්ලකට බඳු උපමා ඇත්තෝය' යනාදියෙන් ද 'සම්බාධො ඝරාවාසො' 'ගිහිගෙයි වාසය බාධා සහිතය' යනාදියෙන් ද කාමයන්හි ද ගිහිගෙයි වාසයෙහි ද ආදීනව (දොස්) ද එයට විරුද්ධ

පක්ෂයෙන් කාමයන්ගෙන් නික්මීමේ අනුසස් ද මැනවින් දක්නා ලද්දේ වේද ඒ කාලයෙහි. එකල්හි ඒකාන්තයෙන් පැවිද්ද පිණිස ඔහුගේ සිත නැමෙයි. **අරියසාවකො** යනු ආර්ය වූ භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයා, ශ්‍රාවකභාවයට එළඹෙනු කැමති තැනැත්තා නැතහොත් නොවරදවාම ආර්ය ශ්‍රාවකයෙක් වන තැනැත්තා, අන්තිම භවික ශ්‍රාවක වූ බෝධිසත්ත්වයා සඳහා මේ ආරම්භයයි. **කෙසමස්සුං ඔහාරෙත්වා** යනු කෙස්ද රැවුල් ද බූගා දමා, ඉවත්කොට. **කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා** යනු කහටින් සායම් පෙවූ බැවින් කාසායානි කසාවත්, බඹසර හැසිරෙන්නවුන්ට සුදුසු වස්ත්‍ර හැඳ පොරවා. **අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය චෙතෙති** යනු ගිහිගෙයින් නික්ම අනගාරික පැවිද්දට පත්වන්නෙමියි පැවිද්ද පිණිස සිතයි, කල්පනා කරයි, පැවිදි වෙයි යන අර්ථයි. මෙහි ගිහිගෙට (ගිහි ජීවිතයට=අගාරයට) යහපත් වූ ගොවිතැන් වෙළඳම් ආදී කටයුතු 'අගාරිය'යි කියනු ලැබේ. එය ද පැවිද්දෙහි නැත. එහෙයින් පැවිද්ද 'අනගාරිය'යි දතයුතුය.

මාරෙන යනු කෙලෙස් මාරයා සමග. **සංගාමාය චෙතෙති** යනු යුද පිණිස සිතක් උපදවයි. මාරයා පරාජය කිරීමට යුද ඇඳුම් ඇඳගනී. යම් හෙයකින් මෙසේ පිළපදින පුද්ගලයාට දේවපුත්ත මාරයා ද අනතුරු කිරීම පිණිස උපක්‍රම කරයි. එහෙයින් 'මාරෙන' යන මෙහි දේවපුත්‍ර මාරයා සමග ද යන අර්ථය දතයුතුය. මේ මාරයා ඔහුගේ බලාපොරොත්තු විනාශ කරන්නේමය. යම්හෙයකින් පැවිදි වූ දිනයේ පටන් හෝ හිස රැවුල් බෑමේ පටන් හෝ සිල් සමාදන් වෙමින් පිරිසිදු කරමින් සමථ විදර්ශනාවන්හි ක්‍රියා කරමින් සුදුසු පරිදි තදංග ප්‍රහාණ, විෂ්කම්භන ප්‍රහාණයන්ගේ වශයෙන් ක්ලේශ මාරයා හෙළාදමයි. ප්‍රහාරයක් නැති බැවින් යුද්ධ කිරීමක් නම් නැත. එහෙයින් 'මාරෙන සද්ධිං සංගාමාය චෙතෙති' 'මාරයා සමග යුද පිණිස සිතයි' යනුවෙන් කියන ලදී.

**සත්තනනං** යනු කොටස් වශයෙන් සතක්. ප්‍රභේද වශයෙන් ඒවා වනාහි තිස්හතක් වෙයි. කෙසේද? 'සතර සතිපට්ඨාන, සතර සම්‍යක්ප්‍රධාන, සතර ඍද්ධිපාද, පංච ඉන්ද්‍රිය, පංචබල, සත්තබොජ්ඣංග, ආර්ය අෂ්ටාංගික මාර්ගය' යනුයි. මෙසේ ප්‍රභේද වශයෙන් තිස්හත් ආකාර ද සතිපට්ඨානාදී කොටස් වශයෙන් හතක් ම වේ යයි 'සත්තනනං' යනුවෙන් කියන ලදී.

**බොධිපක්ඛියානං** යනු අවබෝධ කරන අර්ථයෙන් බෝධි යනුවෙන් ලබන ලද නම් ඇති ආර්ය පුද්ගලයාගේ මාර්ගඥානයට හෝ (බෝධි) පක්ෂයෙහි වූයේ = බෝධිපක්ඛියානං, බෝධි කොටසෙහි වූ යන අර්ථයි. 'බෝධි පක්ඛිකානං' යනු ද පාඨයකි. බෝධි පක්ෂයෙහි ඇති හෝ බෝධි පක්ෂයෙහි යෙදුනා වූ යන අර්ථයි. **භාවනානුයොග මනුයුත්තො** යනු විදර්ශනාවට උත්සාහකොට ආර්යමාර්ග භාවනාවෙහි යෙදුනේ. විදර්ශනා කරන මොහොතෙහි සතිපට්ඨානාදිය පරියායෙන් (අප්‍රධාන වශයෙන්) බෝධිපක්ඛිය නමි. (සෝවාන් ආදී) මාර්ගයට පත්වන මොහොතෙහි ඒවා වනාහි නිප්පරියායෙන් (ප්‍රධාන වශයෙන්) බෝධිපක්ඛිය නම් වෙයි.

**ආසවානං ඛයා** යනු කාම ආසව ආදී සියලු ආශ්‍රවයන්ගේ ගෙවීයාමෙන්, ආශ්‍රවයන් ගෙවුණු කල්හි සියලු කෙලෙස් ගෙවුනේ ම වෙයි. එයින් අර්හත් මාර්ගය කියන ලද්දේ වෙයි. **අනාසවං** යනු ආශ්‍රව රහිත. **චෙතො විමුත්තිං පඤ්ඤා විමුත්තිං** යන මෙහි 'චෙතො' යන වචනයෙන් අර්හත්ඵල සමාධිය ද 'පඤ්ඤා'යන වචනයෙන් එය (ඒ සමාධිය) සමග යෙදුණු ප්‍රඥාව ද කියන ලදී. එහි සමාධිය රාගයෙන් මිදුණු බැවින් චෙතො විමුක්ති යයි ද ප්‍රඥාව අවිද්‍යාවෙන් මිදුණු බැවින් පඤ්ඤා විමුත්ති යයි ද දතයුතුය. භාග්‍යවතුන් වහන්සේ විසින් '**යො හිස්ස භික්ඛවෙ සමාධි, තදස්ස සමාධින්ද්‍රියං, යා හිස්ස භික්ඛවෙ පඤ්ඤා, තදස්ස පඤ්ඤින්ද්‍රියං. ඉති ඛො භික්ඛවෙ රාග විරාගා චෙතො විමුත්ති, අවිජ්ජා විරාගා පඤ්ඤා විමුත්ති**' 'මහණෙනි, ඔහුගේ යම් සමාධියක් ඇද්ද එය ඔහුගේ සමාධින්ද්‍රිය යි. මහණෙනි, ඔහුගේ යම් ප්‍රඥාවක් ඇද්ද එය ඔහුගේ පඤ්ඤින්ද්‍රිය යි. මහණෙනි, මෙසේ රාගයේ නො ඇල්මෙන් චෙතො විමුත්තිය ද අවිද්‍යාවේ නො ඇලීමෙන් පඤ්ඤා විමුත්තිය ද වේ. එහෙත් මෙහි සමථ ඵලය චෙතො විමුත්තිය, විදර්ශනා ඵලය පඤ්ඤා විමුත්තිය යි දතයුතුය.

**දිට්ඨෙව ධම්මෙ** යනු මේ ආත්මභාවයෙහි ම. **සයං අභිඤ්ඤා සච්ඡිකත්වා** යනු තමා විසින් ම අති විශිෂ්ට ප්‍රඥාවෙන් ප්‍රත්‍යක්ෂ කොට අනුන්ගේ කියමනක් පිළිනොගෙන දැන. **උපසම්පජ්ජ විහරති** යනු පැමිණ සම්පාදනය කොට වාසය කරයි. **තමෙව සංගාමසීසං අභිවිජිය අජ්ඣාවසති** යනු මාරයා පරාජය කොට දිනන ලද ජයග්‍රහණය ඇති බැවින් ඔහු විසින් කරන ලද සංග්‍රාමය නම් වූ ආර්ය මාර්ගයේ ශීර්ෂය වූ අර්හත්ඵල සමාපත්තිය වූ ප්‍රධානස්ථානය මැඩගනිමින් වාසය කරයි.

සමවදියි යන අර්ථය මය. මේ දේව ශබ්ද දක්නා ලද සත්‍ය ඇති දෙවියන් කෙරෙහි පවතී. විශේෂයෙන් සුද්ධාවාස දෙවියන් කෙරෙහි යයි දතයුතුය.

ගාථාවන්හි - **මහන්තං** යනු ශීලාදී ගුණ මහත් බැවින් මහත් වූ **වීතසාරදං** යනු ඇලීම ඇතිකරන කෙලෙසුන්ගේ අභාවයෙන් පහ වූ ඇල්ම ඇති, පහවූ මකු බව ඇති (පහවූ අසතුටු සිත් ඇති) **පුරිසාජඤ්ඤ** යනු අශ්ව ආදීන් කෙරෙහි අශ්ව ආජානීය සතුන් මෙන් පුරුෂයන් අතර ආජානීය වූ උත්තම පුරුෂයන් වහන්ස, **දුජ්ජය මජ්ජගූ** බොහෝ ජනයා විසින් දිනන්නට නොහැකි වූ ක්ලේශ වාහිනිය අභිභවනය කළහ. මැඩගත්හ. 'අජ්ජයී' යනුවෙන් ද කියති. දිනුවේය යන අර්ථයි. **ජෙත්වාන මච්චුනො සෙනං විමොක්ඛෙන අනාවරං** යනු තුන් ලෝකයෙහි පැතිරීම් වශයෙන් ද (කෙලෙස්) එක්දහස් පන්සියයක් ආදිය විභාග (බෙදීම්) වශයෙන්ද මහත් බැවින් අන්‍යයන් විසින් වළක්වාලීමට, ප්‍රතික්ෂේප කිරීමට නොහැකි බැවින් ද මාරයාගේ වැළැක්විය නොහැකි කෙලෙස් මරසෙනඟ විමෝක්ෂ වූ ආර්ය මාර්ගයෙන් දිනා ඔබවහන්සේ දිනීමට අපහසු වූ මරසෙනග දිනූ සේක් ද, ඒ ඔබවහන්සේට, **නමො තෙ පුරිසාජඤ්ඤ** "පුරුෂ ශ්‍රේෂ්ඨය, ඔබවහන්සේට නමස්කාර වේවා" යනු සම්බන්ධ වෙයි. **ඉති** යනු කියන ලද ආකාරයෙන්. **හි** යනු නිපාත මාත්‍රයකි. **එතං පත්තමානසං** අවබෝධ කරන ලද අර්හත්වය ඇති ක්ෂීණාශ්‍රවයන් වහන්සේට **දෙවතා නමස්සන්ති** මෙසේ කියන ලද අර්ථයම නිගමන වශයෙන් දක්වයි. නැතහොත් 'ඉති' යනු මේ කාරණයෙන්, ඒ කාරණය නම් කුමක් ද? මාරසේනාව (පරාජය කිරීමෙන් ලත්) ජයග්‍රහණයෙන් පැමිණි අර්හත්වය ඇති. මේ කාරණයෙන් මෙසේ දෙවිවරු නමස්කාර කරති යන අර්ථයි. දැන් ඒ කාරණය එල වශයෙන් දක්වන්නට **තං හි තස්ස න පස්සන්ති යෙන මච්චුවසං වජෙ** යනුවෙන් කියන ලදී. එහි අර්ථය යම්හෙයකින් ඒ ශ්‍රේෂ්ඨ පුරුෂයා පිළිබඳව සොයන දෙවිවරු යම් කරුණක් කරණකොට උන්වහන්සේ මාරයාගේ වසඟයට යත්ද එබඳු අනුමාත්‍ර වූ කරුණක් නො දකිත් ද එහෙයින් විශුද්ධි දෙවිවරු නුඹවහන්සේට නමස්කාර කරති.

**තුන්වන සූත්‍රය යි.**

# 3.4.4

සතරවන සූත්‍රයෙහි **යදා** යනු යම්කලෙක. **දෙවො** යනු උත්පත්ති දෙවියෙක් සම්මුති දේව, උප්පත්ති දේව, විසුද්ධිදේව යනුවෙන් දෙවිවරු තිදෙනෙකි. ඔවුන් අතුරෙන් සම්මුති දෙවිවරු නම් ක්‍ෂත්‍රිය රජවරු ය. උත්පත්ති දෙවිවරු නම් චාතුම්මහාරාජිකයේ පටන් ඊට ඉහළ දෙවිවරුය. විසුද්ධි දෙවිවරු නම් ක්‍ෂීණාශ්‍රවයෝය. මෙහි වනාහි කාමාවචර දෙවියෙක් අදහස් කරන ලදී. එහෙයින් 'දෙවො ති උපපත්ති දෙවො'යි කියන ලදී. **දෙවකායා** යනු දිව්‍ය සමූහයෙන් හෝ දිව්‍ය ස්ථානයෙන් හෝ දිව්‍ය ලෝකයෙන් හෝ යන අර්ථයි. මේ කාය ශබ්දය සමූහ-නිවාස වාචකය. **චවන ධම්මො** යනු මරණ ධර්මය, ආයු ගෙවීමෙන් හෝ පින නොවීමෙන් හෝ පැමිණි මරණය යන අර්ථයි.

**පඤ්චස්ස පුබ්බනිමිත්තානි පාතුභවන්ති** යනු පැමිණි මරණය ඇති මේ දිව්‍ය පුත්‍රයාට මරණය පිළිබඳ පෙරනිමිති පහක් උපදී හෝ ප්‍රකාශ වේ. **මාලාමිලායන්ති** යනු ඒ පැළඳි මල්මාලා මද්දහනෙහි අව්වට දමන ලද්දක් මෙන් මැලවූයේ පහවූ ශෝභාව ඇත්තේ වෙයි. **වත්ථානි කිලිස්සන්ති** සරත් සමයෙහි පහවූ වළාකුළු ඇති අහසෙහි උදාවෙන බාල සූර්යයාට සමාන ප්‍රභා (ආලෝකය) ඇති නොයෙක් නොයෙක් වර්ණ ඇති ඔහු විසින් හැඳ පෙරවූ වස්ත්‍ර එකෙණෙහිම මඩෙහි දමා පාගන ලද ඒවා මෙන් පහවූ ප්‍රභා ඇතිව මැලවුණේ වෙයි. **කච්ඡෙහි සෙදා මුච්චන්ති** යනු ඉතා පිරිසිදු ජාති මාණික්‍යයක් මෙන් ද ඉතා හොඳින් පුහුණු වූ ශිල්පියෙකු විසින් කරන ලද රන් පිළිමයක් මෙන් ද දහඩිය කුණු නැති සිරුරේ කිසිලි දෙකින් එකෙණෙහි දහඩිය දහරා ගලයි, වැගිරෙයි. හුදෙක් කිසිලිවලින් පමණක්ම නොවේ. ඔහුගේ මුලු සිරුර ම දහඩිය කුණු මුදාහරියි. ඔහුගේ කය පළඳනා ලද මුතුදැල් නමැති කේසරවලින් ගැවසී ගත්තාක් මෙන් වෙයි.

**කායෙ දුබ්බණ්ණියං ඔක්කමති** යනු පෙර ප්‍රතිසන්ධියේ (ඉපදීමේ) පටන් ඇති වූ ආනුභාවයට අනුව එක් යොදුනක් දෙයොදුනක් දොළොස් යොදුනක් තෙක් ප්‍රදේශයක ආලෝකය පතුරුවා බබලන, කැඩීම් පැලීම් ආදිය නැති කයක් වෙයි. සීත නැත. පීඩාකාරී උණුසුමක් නැත. දෙව්දුව සොළොස් හැවිරිදි තැනැත්තියක මෙන් වෙයි. දෙව්පුත් විසිහැවිරිදි

කෙනෙකු මෙන් වෙයි. එකෙණෙහි ප්‍රභාව නැති තේජස් නැති කයෙහි විරූප බව ඇතිවෙයි. පිහිටයි.

**සකෙ දෙවො දෙවාසනෙ නාභිරමති** යනු තමාගේ දෙවඟනන් සමූහය සමග ක්‍රීඩාකරන හැසිරෙන දිව්‍යාසනයෙහි නො ඇලෙයි. සිතේ තෘප්තියක් නැත. ඔහුට මනුෂ්‍ය ගණනින් සත්දිනකින් මරණය වන්නේ යන මේ පෙරනිමිති පහළ වෙයි. හෙතෙම ඒ පෙරනිමිති ඉපදීමෙන් ම රූප සම්පත්තියෙන් තොර වන්නෙමියි බලවත් ශෝකයෙන් මැඩගත්තේ වෙයි. එහෙයින් ඔහුගේ කයෙහි මහත් දාහයක් උපදී. එහෙයින් මුළු සිරුරෙන් දහඩිය වැගිරෙයි. වඩා වැඩිකලක් නුපුරුදු දුක් ඇත්තේ එය ඉවසන්නට නොහැකිව ඇතැමෙක් දැවෙමි දැවෙමියි කියමින් හඬමින් වැලපෙමින් කිසිතැනක ආශ්වාදයක් (තෘප්තියක්) නොලබමින් කිළිපොලමින් සුසුම්ලමින් ඒ ඒ තැන ඇවිදියි. ඇතැමෙක් සිහිය පිහිටුවා කය වචන දෙකින් විකාර නොකළ ද ප්‍රිය විප්‍රයෝග දුක්ඛය නොඉවසමින් පීඩාවිඳිමින් හැසිරෙයි.

මේ පෙරනිමිති වනාහි යම්සේ සියල්ලන්ට නොව ලෝකයෙහි මහා පින් ඇති රාජ රාජ මහාමාත්‍යවරුන්ට ම උල්කාපාත - භූමිචලන - චන්ද්‍රග්‍රහණ ආදී නිමිති පහළවෙයිද එසේම මහේශාක්‍ය දෙවියන්ටම පහළවෙයි. මරණය පිළිබඳ උපන් මේ පෙරනිමිති ඇතැම් දෙවිවරු දැනගනිති. සියලු දෙවිවරු නොදැන ගනිති. එහි යමෙක් මද කුශලයකින් උපන්නේ ද හෙතෙම දැන් චුතවූයේ කොහි උපදින්නෙම්දැයි නොදනිමි කියා බිය වෙයි. මහා පින් ඇති යමෙක් වේද හෙතෙම මා විසින් බොහෝ දන් දෙන ලදී, සිල් රකින ලදී, පින් රැස්කරන ලදී, මෙයින් චුත වූ මට සුගතියම කැමති යයි කියා බිය නොවෙයි. කම්පා නොවේ. මෙසේ එළඹි පෙරනිමිති ඇති දේවතාවා රැගෙන දෙවිවරු නන්දන වනයට පිවිසෙති. සියලු දිව්‍යලෝකවල නන්‍දන වනයක් ඇත්තේමය. **තීහි වාචාහි අනුමොදෙනති** යනු දැන් කියනු ලබන වචන තුනෙන් සතුටු කරත්. ප්‍රමෝදය උපදවත්, අස්වසත්. ආශීර්වාද වශයෙන් හෝ ඒ මොහොතට අනුරූප පරිදි සතුටු කරති. ඇතැමෙක් වනාහි අනුමොදෙනති යන පදයෙන් අවවාද කරතියි කියති. **ඉතො** යනු දෙව්ලොවින්. **හො** යනු ආලපනයයි. **සුගතිං** යනු සුන්දර ගතියයි. මිනිස්ලොව සඳහා කියති. **ගච්ඡ** යනු පිළිසිඳ ගැනීම් වශයෙන් එළඹෙන්න.

**එවං වුත්තෙ** යනු මෙසේ එකල ඒ දෙවිවරුන් විසින් ඔහුට 'ඉතො භො සුගතිං ගච්ඡ' යනාදියෙන් කිවයුතු වචන භාග්‍යවතුන් වහන්සේ කී කල්හි. **අඤ්ඤතරො** නමින්, ගෝත්‍රයෙන් අප්‍රකට වූ ඒ පිරිසෙහි සිටි අනුසන්ධි කුසල (දේශනාව කරන අතර ප්‍රශ්න කිරීමට සුදුසු අවස්ථාව දැනගැනීමෙහි දක්ෂ) එක් **භික්ඛු** භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ විසින් අවිශේෂයෙන් කියන ලද මේ සුගති ආදිය අපැහැදිලිය. එසේ නම් මම ඒවා වඩා පැහැදිලි කරවන්නෙමි'යි 'කිනනුඛො භන්තෙ' යනාදී මේ වචනය කීවේය. ශ්‍රද්ධාදී ගුණ විශේෂ ලැබීමේ කාරණයෙන් ද දේව උත්පත්තියට හේතුවන බැවින් ද මිනිසත් බව දෙවියන්ට රුචියයි 'මනුසසත්තං ඛො භික්ඛු දෙවානං සුගතිගමන සංඛාතං'යි වදාළහ. **සුගතිගමනං** යනු මනාව කියන ලද. වර්ණනා කරන ලද, ස්තුති කරන ලද යන අර්ථයි. **යං මනුසසභූතො** යන මෙහි 'යං' යනු ක්‍රියා පරාමර්ශනයයි. එයින් 'පටිලභති' යන මෙහි ප්‍රතිලභන ක්‍රියාව පරාමර්ශනය කරනු ලැබේ. යම් ශ්‍රද්ධා ප්‍රතිලාභයක් යන අර්ථයි. **මනුසසභූතො** යනු මිනිසුන් අතර උපන්නේ හෝ මිනිසත්බවට පත්වූයේ. යම්හෙයකින් දෙව්ලොව උපන්නවුන්ට තථාගත ධර්ම දේශනා ශ්‍රවණයට බොහෝසෙයින් දුර්ලභය. මිනිසුන්ට එසේ නොවේ. එහෙයින් 'මනුසසභූතො'යි කියන ලදී.

**තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ** යනු තථාගත වූ භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද ශික්ෂා තුන ඇතුළත් වූ ශාසනයෙහි. එය වනාහි ධර්මයෙන් ඉවත් නොවූ බැවින් ධර්ම ද සිතට අනුරූපව හික්මීමට සුදුසු අයගේ හික්මවීම ඇතිකරන හෙයින් විනය ද = ධර්ම විනය යි. උපනිශ්‍රය සම්පත්තියෙන් හෝ ධර්මයෙන් හෝ ඉවත්නොවූ බැවින් කෙලෙස් අඩු තැනැත්තා හික්මවයි යන අරුතින් ධර්මවිනය වෙයි. ධර්මයෙන් හෝ විනයෙන් මිස දඬුවලින් ආයුධවලින් හික්මවීම නොවේ යන අරුතින් = ධර්ම විනයයි. ධර්මයෙන් යුක්ත වූ විනය හෝ = ධර්ම විනයයි. නැතහොත් මාර්ගඵල සමග නිවන පිණිස ධර්මයෙන් ඇතිවන හික්මීම = ධර්මවිනයයි. මහාකරුණා සර්වඥතා ඥානය ආදී ධර්මයෙන් සිදුවන විනය = ධර්මවිනයයි.

භාග්‍යවතුන් වහන්සේ නිසැකවම ධර්මය වෙති. ධර්මයෙන්ම වූයේ වෙති. ධර්මකාය වෙති. ධර්මස්වාමී වෙති. ඒ ධර්මයේ විනය තාර්කික නොවේ යන අර්ථයෙන් හෝ ධම්මවිනය යැයි කියනු ලැබේ. ධර්මයෙහි

හෝ නිපදවිය යුතු විෂය වූ මාර්ගඵලයෙහි හෝ පැවැති විනය ධර්මවිනය නම්. ඒ ධර්මවිනයයෙහිය.

**සද්ධං පටිලභති** යනු 'සවාක්ඛාතො භගවතා ධම්මො' යනාදියෙන් ශ්‍රද්ධාව උපදවයි. ශ්‍රද්ධාවන්තයා වනාහි මේ ධර්ම විනයෙහි අනුශාසනා කළ පරිදි පිළිපැදීමෙන් මෙලොව පරලොව පරමාර්ථ ලබන්නෙහිය. **සුලද්ධලාභ සංඛාතං** යන මෙහි යම්සේ රන්-රුවන්-කෙත්-වතු ආදී ලාභය සත්ත්වයන්ට උපභෝග සැපය ගෙනදෙයි ද සා පිපාසා ආදී දුක් මැඩපවත්වයි ද ධනයෙන් දිළිඳු බව සන්සිඳුවයි ද මුතු ආදි රත්න ලැබීමට හේතුවෙයි ද ලෝක සන්තතිය (දරු මුණුබුරු පරම්පරාව) ගෙන දෙයි ද මෙසේ ලෞකික ලෝකෝත්තර ශ්‍රද්ධාව ද හටගත් ආකාරයට ලෞකික ලෝකෝත්තර විපාක සැප ගෙනදෙයි. ශ්‍රද්ධාව මුල්කොට ගෙන පිළිපදින අයගේ ජාති-ජරා ආදි දුක් මැඩපවත්වයි. ගුණයෙන් දිළිඳු බව සන්සිඳුවයි. සති සම්බොජ්ඣංග ආදී රත්න ලැබීමට හේතු වෙයි. ලෝක සන්තතියද ගෙන දෙයි.

මේ කාරණය

**සද්ධො සීලෙන සම්පන්නො යසො භොග සමප්පිතො**
**යං යං පදෙසං භජති තත්ථ තත්ථෙව පූජිතො**

'ශ්‍රද්ධාවෙන්, ශීලයෙන් යුක්ත වූ යසසින් (පිරිවරින්) හා භෝග සම්පත්තියෙන් යුක්ත වූ තැනැත්තා යන යන තැන පුදන්නේ වෙයි' යනුවෙන් කියන ලදී.

මෙසේ ශ්‍රද්ධාව ලැබීමේ යහපත් ලැබීම් ඇති බව දතයුතුය.

යම්හෙයකින් මේ අනුගාමික වූ අන්‍යයන්ට පොදු නොවූ සියලු සම්පත්වලට හේතු වූ ශ්‍රද්ධාව ලැබීම ලෞකික වූ රන්-රුවන්- ආදී ධනය ලැබීමට කාරණයක් වේද, (එහෙයින්) ශ්‍රද්ධාවන්තයාම දානාදී පින්කම් කොට උසස් උසස් සම්පත් උපකරණ ලබයි. ඒවායින් ද තමන්ගේ හා අනුන්ගේ යහපතම සිදුකරයි. ශ්‍රද්ධාව නැති තැනැත්තාට ඒවා මෙලොව ද පරලොව ද අයහපතම ගෙන දෙයි. මෙසේ ද ශ්‍රද්ධාවේ යහපත් ලැබීම් ඇතිබව දතයුතුය. එය එසේමය. 'සද්ධා බන්ධති පාථෙය්‍යං' 'ශ්‍රද්ධාව

(සසර ගමනට) මගවියදම් රැස්කරයි'. 'සද්ධා දුතියා පුරිසස්ස හොති' 'ශ්‍රද්ධාව පුරුෂයාගේ දෙවැන්නිය වෙයි' යනුවෙන් ද 'සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං' 'මෙලොව පුරුෂයාට ශ්‍රද්ධාව උතුම් ධනයකි' යනුවෙන්ද 'සද්ධා හත්ථො මානවො' 'ශ්‍රද්ධාව අතක් කොට ඇති මිනිසා' යනුවෙන් ද 'සද්ධා බීජං තපො වුට්ඨි' 'ශ්‍රද්ධාව බීජයකි, තපස වැස්සකි' යනුවෙන් ද 'සද්ධෙසිකො භික්ඛවෙ අරියසාවකො' 'මහණෙනි, ආර්ය ශ්‍රාවකයා ශ්‍රද්ධාව සොයන්නෙකි' යනුවෙන් ද 'සද්ධාය තරතී ඔඝං' ශ්‍රද්ධාවෙන් ඔඝය තරණය කරයි' යනුවෙන් ද නොයෙක් තැන්වල නොයෙක් කරුණුවලින් ශ්‍රද්ධාව වර්ණනා කරන ලදී.

දැන් සෝවාන් ආර්ය මාර්ගයට බැසගන්නා වූ (නියාම ඔක්කන්තියා) යම් ශ්‍රද්ධාවකින් ශාසනයෙහි කුශල ධර්මයන්හි මනාව පිහිටියේ නම් වේද ඒ ශ්‍රද්ධාව දක්වන්නට 'සා ඛො පනස්ස' යනාදිය කියන ලදී. එහි **අස්ස** යනු මොහුගේ වන්නේය යන අර්ථයි. **නිවිට්ඨා** යනු ඇතුළට බැස සිටි, චිත්ත සන්තානයට ඇතුළු වූ. **මූලජාතා** යනු හටගත් මුල් ඇති. ශ්‍රද්ධාවේ මුල නම් කුමක් ද? ඇදහිය යුතු වස්තුව කෙරෙහි නොසෙල්වෙන ආකාරයට හේතු වූ උපාය මනසිකාරය යි. තවද සත්පුරුෂ ඇසුර, සද්ධර්ම ශ්‍රවණය, යෝනිසෝ මනසිකාරය, ධර්මානුධර්ම ප්‍රතිපත්තිය යනුවෙන් සෝවාන් වීමට අවශ්‍ය අංග සතර (සෝතාපත්ති අංග) මුල් යයි දතයුතුය. **පතිට්ඨිතා** යනු ආර්ය මාර්ගය ලැබීමෙන් කිසිවකින් නොසෙල්වෙන ස්වභාවයෙන් පිහිටි. එහෙයින්ම 'දළ්හා අසංහාරියා'යි කීහ. **දළ්හා** යනු ස්ථිර. **අසංහාරියා** යනු කිසිවකු විසින් විනාශ කරන්නට හෝ පිරිහෙළන්නට හෝ ඉවත දමන්නට නොහැකි. මෙසේ ඒ දෙවිවරු ඔහුගේ සෝවාන් මාර්ගය ලැබීමට, ආශිර්වාද කරමින් මෙසේ කියති. තමාගේ දෙව්ලොව කම්සුව විඳීමට සුදුසුම ආර්ය පුද්ගලයාට ඔවුහු කැමති වෙති. එහෙයින් 'එහි දෙව පුනප්පුනං' දෙවිය නැවත නැවත එන්නැයි කීහ.

ගාථාවන්හි - පින ගෙවීමෙන් සිදුවන මරණයද ජීවිත ඉන්ද්‍රිය සිඳීමෙන්ම වේයයි **චවනති ආයුසංඛයා** යනුවෙන් කීහ. **අනුමොදතං** යනු (මියයන දෙවියාව) සතුටු කරන්නා වූ (දෙවියන්ගේ). **මනුස්සානං සහබ්‍යතං** මිනිසුන් සමග එක්වීමට, එක්වෙයි යන අරුතින් සහබ්‍යා ය. සමග පැවැත්මට, ඒ පැවැත්මේ වීම සහබ්‍යතා ය. **නිවිට්ඨස්ස** යනු සිතට ඇතුළු

වූයේ වන්නේය. යාවජීවං යනු ජීවිත පැවැත්ම තෙක්, පිරිනිවීම තෙක් යන අර්ථයි. අප්පමාණං යනු සකස්කොට කිරීම් වශයෙන් ද බොහෝකොට කිරීම් වශයෙන් ද උසස්කොට කිරීම් වශයෙන් ද බොහෝ වාරයක් කිරීම් වශයෙන් ද ප්‍රමාණයක් නැති. නිරූපධිං යනු කෙලෙස් - කෙලෙස් උපධි නැති - සුපිරිසිදු, නිර්මල යන අර්ථයි. යම්හෙයකින් ඒ දෙවිවරු කාමලෝකය ඉක්මවන හෙයින් (රූපාවචර අරූපාවචර නම් වූ) මහග්ගත කුශලයක් නො කැමති වෙත් ද, එහෙයින් මෙසේ මෙහි අර්ථය දතයුතුය. මේ දෙව්ලොවින් චුත වූයේ මිනිසුන් අතර ඉපදී නුවණැති බවට පත්වූයේ කාය දුශ්චරිතාදී සියලු දුශ්චරිත දුරුකොට කාය සුචරිතාදී උදාර විපුල හැම සුචරිතයම රැස්කොට ආර්ය මාර්ගයෙන් පැමිණි ශ්‍රද්ධාව ඇත්තෙක් වන්න. තමාගේ දේවලෝක උත්පත්තිය නො ඉක්මවන හෙයින් ලෝකෝත්තර මාර්ග අතරින් පළමු මාර්ගයට හෝ දෙවන මාර්ගයට කැමති වෙත් ද එහෙයින් (ඒ පළමු දෙවන) මාර්ගයන්ගේ වශයෙන් 'අප්පමාණං නිරූපධිං' යන පදවල අර්ථය දතයුතුය. දිට්ඨියත් ඒ හා සමග ඇති ඖළාරික කාමරාගාදී පමණින් යුතු කෙලෙසුන් සිඳ දැමීමෙන් 'අප්පමාණං' අපමණ වූ සත්වන භාවයේ පටන් ඉපදීමට සුදුසු වූ ස්කන්ධ උපධියේ ද එය උපදවන අභිසංඛාර උපධියේ ද ඒ ඒ මාර්ගයෙන් දුරුකරන ක්ලේශ උපධියේද ප්‍රහාණයෙන් ඒ උපධීන් නූපදින හෙයින් නිරූපධි නම් වූ නිවන ඇසුරුකොට ඇති බැවින් ද 'නිරූපධි' යනුවෙන් මෙසේ අතිශයින්ම අපායේ දොර වසන කර්මය දක්වා දැන් සියලු සම්පත් උපදවන කර්මය දක්වන්නට 'තතො ඔපධිකං' යනාදිය කියන ලදී.

ඔපධිකං යනු උපධිය පැසවන (උපදවන), ආත්මභාව සම්පත්තියද භෝග සම්පත්තිය ද උපදවන යන අර්ථයි. 'උපධි' යන්නෙන් වනාහි ආත්මභාවය කියනු ලැබේ. ඒ බව 'සන්තෙකච්චානි* පාපකානි කම්ම සමාදානානි උපධි සම්පත්ති පටිබාහිතානි න විපච්චන්ති' 'උපධි සම්පත්තියෙන් වලක්වන ලදුව විපාක නොදෙන ඇතැම් පාපකර්ම සමාදානයන් ඇත යනුවෙන් කියන ලදී.

කාමගුණයෝ ද (උපධි යයි) කියනු ලැබේ. ඒ බව 'උපධීහි නරස්ස සොචනං' 'උපධි කරණකොට මිනිසාගේ ශෝක කිරීම' යනුවෙන් මෙසේ ද වදාළහ. මේ එහි වචනාර්ථය යි. මෙහි සැපදුක් රැස්කරයි යන අරුතින්

---

* අත්ථෙකච්චානි යනුවෙන් විභංගප්පකරණ - 2 හා බු.ජ.මු. 182 පිටුවෙහි ඇත.

උපධි නම් වේ. ආත්මභාවය ද කාමගුණ ද වේ. මෙහි ස්වභාවය උපධි ඇතිකිරීමයි. උපධියට සුදුසුයි යන අරුතින් ඔපධිකං, පුඤ්ඤං පින යි. තං බහුං එය බොහෝකොට උදාර ලෙස කත්වා සිදුකොට. කෙසේද? දානෙන දානයෙන්, දානය වනාහි අනිත්වාට වඩා සිදුකිරීම පහසුයයි මෙසේ කියන ලදී. 'දානෙන' යන පදයෙන් අභය දානය ද කියන ලදී. ආමිස දානය පමණක්ම නොවේ. ශීලයේ සංග්‍රහවීමද දතයුතුය. යම්හෙයකින් වනාහි ඒ දෙව්වරු අසුර පිරිස් පිරිහීම ද ඒකාන්තයෙන් ම දේව පිරිසේ පිරීම ද කැමතිවෙත් ද එහෙයින් එයට උපායක් දක්වමින් අඤ්ඤෙපි මච්චෙ සද්ධම්මෙ බ්‍රහ්මචරියෙ නිවෙසය. 'අන්‍ය වූද මිනිසුන් ධර්මයෙහි ද බඹසරෙහි ද පිහිටුවව යි යනුවෙන් ධර්ම දානයෙහි යොදවත්. යදා විදූ යනු යම්කලෙක දෙවා දෙවං චවනතං චුතවන දෙවියා ගැන දෙව්වරු දැනගන්නාහු ද, එකල ඉමාය කියන ලද පරිදි අනුකම්පාය දුක් ඉවත්කරන කැමැත්තෙන් දෙව දෙවිය, මේ දිව්‍ය පිරිසෙහි පුනප්පුනං නැවත නැවත ඉපදීම් වශයෙන් එහි එන්න යි සතුටු කරත්.

සතරවන සූත්‍රය යි.

## 3.4.5

පස්වන සූත්‍රයෙහි - ලොකෙ යන මෙහි සත්ත්වලෝකය, සංස්කාර ලෝකය, අවකාශ ලෝකය යි ලෝක තුනකි. ඒවා අතරින් පරම්පරා වශයෙන් පවත්නා වූ ඉන්ද්‍රියබද්ධ වූ රූප ධර්මයන්ගේ ද අරූප ධර්මයන්ගේ ද රූප අරූප ධර්මයන්ගේ ද සමූහය සත්ත්වලෝකයයි. පෘථිවිය පර්වත ආදී ප්‍රභේද ඇත්තේ අවකාශ ලෝකය යි. ඒ ලෝක දෙකෙහිම ස්කන්ධයන් සංස්කාර ලෝකය යි. ඒවා අතරින් සත්ත්ව ලෝකය මෙහි අදහස් කරන ලදී. එහෙයින් 'ලොකෙ' යනු සත්ත්ව ලෝකයෙහි. එහි ද දෙව්ලොවෙහි නොවේ. බඹලොවෙහි නොවේ. මිනිස්ලොවෙහිය. අනිත් සක්වළක ඇති මිනිස්ලොවක ද නොවේ. මේ සක්වළෙහිම ය. එහිද හැමතැනම නොවේ. නැගෙනහිර දිශාවෙහි කජංගල

නම් නියම්ගම ඇත. එයට පසු මහාසාලා නියම්ගමය. ඉන් එහා ප්‍රත්‍යන්ත ජනපද ඇත. ඉන් මෙහා ඇතුළත. ගිනිකොන දිශාවෙන් සලලවතී නම් නදිය ඇත. ඉන් එහා ප්‍රත්‍යන්ත ජනපද ඇත. ඉන් මෙහා ඇතුළත. දකුණු දිශාවෙහි සේතකණ්ණික නම් නියම්ගම ඇත. ඉන් එහා ප්‍රත්‍යන්ත ජනපද ඇත. ඉන් මෙහා ඇතුළත. බටහිර දිශාවෙහි ථූන නම් බමුණුගම ඇත. ඉන් එහා ප්‍රත්‍යන්ත ජනපද ඇත. ඉන් මෙහා ඇතුළත. උතුරුදිශාවෙහි උසීරද්ධජ නම් පර්වතය ඇත. ඉන් එහා ප්‍රත්‍යන්ත ජනපද ඇත. ඉන් මෙහා මැද යනුවෙන් සීමාකරන ලද දිගින් යොදුන් තුන්සියයක් වූ පළලින් යොදුන් දෙසිය පණහක් වූ වට්ට යොදුන් නවසියයක් වූ මධ්‍යම දේශයෙහි තථාගතයන් වහන්සේ උපදිති. හුදෙක් තථාගතයන් වහන්සේ පමණක්ම නොවේ. පසේබුදුවරු අග්‍රශ්‍රාවකයන් වහන්සේලා, අසූමහා ශ්‍රාවකයන් වහන්සේලා බුද්ධමාතාව, බුද්ධ පියා, සක්විති රජවරු, අනිකුත් සාරබවට පත් බ්‍රාහ්මණ ගෘහපතීහු ද මෙහිම උපදිති. මෙහි වනාහි තථාගත වාරයෙහිම සියලු තැන් වශයෙන් මේ ක්‍රමය ලැබේ. අන් වාරවල එක් කොටසක් වශයෙන් ලැබේ.

උපපජ්ජමානා උපපජ්ජන්ති යන මේ වචන දෙකම නිම නොකළ (අඩාළ) වචනම ය. උපදින්නාහු බහුජන හිත පිණිස උපදිති. අනිත් කරුණකින් නොවේ යයි මෙසේ මෙහි අර්ථය දතයුතුය. මෙබඳු වූ මෙහි ලක්ෂණය අනිත් ශබ්ද ලක්ෂණයකින් වලක්වන්නට නොහැකිය. තවද උපදිමින් (උපපජ්ජමානා) යනුවෙන් ද උපදිති (උපපජ්ජන්ති) යනුවෙන් ද උපන් (උපපන්නා) යනුවෙන්දැයි මේ ප්‍රභේදය දතයුතුය.

තථාගතයන් වහන්සේ වනාහි මහාභිනීහාරය (මහා ප්‍රාර්ථනාව) කරමින්, බුදුබව ඇතිකරන ධර්ම සොයමින්, පාරමී පුරමින්, පස්මහ තෑගි පරිත්‍යාග කරමින්, ඥාතත්ථචර්යාව, ලෝකාර්ථ චර්යාව, බුද්ධි චර්යාව මුදුන් පමුණුවමින්, පාරමී පුරා තුසිත භවනයෙහි සිටිමින් එයින් බැස අවසන් භවයෙහි පිළිසිඳ ගනිමින්, ගිහි ජීවිතය ගතකරමින්, අභිනික්මන් කරමින්, මහත් වූ වීර්යය වඩමින්, මෝරාගිය ඥාණය ඇත්තාහු බෝමැඩට නැගී මාරබලය විනාශ කරමින්, ප්‍රථම යාමයෙහි පූර්වේනිවාසය සිහිකරමින්, මධ්‍යම යාමයෙහි දිවැස පිරිසිදු කරමින්, පශ්චිම යාමයෙහි පටිච්ච සමුප්පාදයෙහි නුවණ යොදවා නොයෙක් ආකාරයෙන් සියලු සංස්කාර විමසා බලා සෝවාන් මාර්ගය අවබෝධ කරමින්, අනාගාමී ඵලය ප්‍රත්‍යක්ෂ කරනතාක් උපදිමින් (උපපජ්ජමානො) නම් වෙයි. අර්හත්

මාර්ග ක්‍ෂණයෙහි උපදී (උප්පජ්ජති) නම් වෙයි. අර්හත් ඵලය ලබන ක්‍ෂණයෙහි වනාහි උපන්නේ (උප්පන්නො) නම් වෙයි.

ශ්‍රාවකයන්ට මෙන් පිළිවෙළින් ෂඩ්විධ ඥාන ආදිය උපදවන කාර්යයක් බුදුවරුන්ට නැත. අර්හත් මාර්ගයත් සමගම බුදුගුණ රාශි සියල්ල පැමිණියේ වෙයි. එහෙයින් උන්වහන්සේලා උපන් සියලු කටයුතු ඇති බැවින් අර්හත්ඵලය ලබන මොහොතෙහි උපන්නාහු (උපන්නො) නම් වෙති. මෙහි අර්හත්ඵලය ලබන මොහොත සඳහා උපදිත් (උප්පජ්ජන්ති) යනුවෙන් කියන ලදී. උපන්නාහු වෙති යන මෙය මෙහි අර්ථයි.

ක්ෂීණාශ්‍රව ශ්‍රාවකයා ද ශ්‍රාවක බෝධියට හේතු වූ පින් රැස් කරමින් පූර්වයෝග පූර්ව චර්යා ගත පච්චාගත (යාමේදී - ආපසු ඒමේදී පුරන) වත පුරමින් අන්තිම භවයෙහි උපදින්නේ අනුපිළිවෙළින් නුවණැති බවට පැමිණ සසර ආදීනව දැක පැවිදිවීමට සිතමින් පැවිද්ද මුදුන්පමුණුවා ශීලාදිය සම්පූර්ණ කරමින් ධුතංග සමාදන්ව පවතිමින් (සිටිමින්) නිදිවැරීමෙහි යෙදෙමින් ධ්‍යාන උපදවමින් විදර්ශනාව පටන්ගෙන පහළම (සෝවාන්) මාර්ගය ලබන්නේ ද 'උපදිමින්' නම් වෙයි. අර්හත් මාර්ග ක්‍ෂණයෙහි දී 'උපදී' නම් වෙයි.

අර්හත් ඵලය ලබන ක්‍ෂණයෙහි 'උපන්නේ' නම් වෙයි. ශෛක්‍ෂයා වනාහි පෙර කටයුතු පටන්ගැනීමේ සිට ගොත්‍රභූ ඥානය තෙක් 'උපදිමින්' නම් වෙයි. පළමු මාර්ග ක්‍ෂණයෙහි 'උපදී' නම් වෙයි. පළමු ඵලය (සෝවාන් ඵලය) ලැබුණු තැන් පටන් 'උපන්නේ' නම් වෙයි. මෙපමණකින් '**තයො මෙ භික්ඛවෙ පුගගලා ලොකෙ උප්පජ්ජමානා උප්පජ්ජන්ති**' යන පදවල අර්ථය කියන ලද්දේ වෙයි.

දැන් 'බහුජන හිතාය' යනාදියෙහි **බහුජනහිතාය** යනු මහජනයාගේ හිත (යහපත) පිණිස. **බහුජනසුඛාය** යනු මහජනයාගේ සැප පිණිස. **ලොකානුකම්පාය** යනු සත්ත්වලෝකයට අනුකම්පා පිණිස. කුමන සත්ත්ව ලෝකයාට ද? යමෙක් තථාගතයන් වහන්සේගේ ධර්මය අසා ධර්මය අවබෝධ කරයි ද අමාපැන් පානය කරයි ද ඒ සත්ත්ව ලෝකයට (අනුකම්පා පිණිස)

භාග්‍යවතුන් වහන්සේගේ ධම්මචක්කප්පවත්තන සූත්‍ර දේශනාවෙන් අඤ්ඤා කොණ්ඩඤ්ඤ ප්‍රමුඛ දහඅට කෝටියක් බ්‍රහ්මයෝ ධර්මය අවබෝධ කළහ. මෙසේ සුභද්ද පරිබ්‍රාජකයාගේ හික්මීම තෙක් ධර්මය අවබෝධ කළ සත්ත්වයන්ගේ ගණනක් නැත.

මහා සමය සූත්‍ර දේශනාව, මහාමංගල සූත්‍ර දේශනාව, චූල්ල රාහුලෝවාද සූත්‍ර දේශනාව, සමචිත්ත සූත්‍ර දේශනාව යන මේ ස්ථාන සතරෙහි දී ධර්මය අවබෝධ කළ සත්ත්වයන්ගේ සීමාවක් නැත. මෙසේ මේ අප්‍රමාණ වූ සත්ත්වලෝකයට අනුකම්පා පිණිස, ශ්‍රාවක රහතන් වහන්සේගේ ද ශෛක්‍ෂයාගේ ද උපත ලෝකානුකම්පාව පිණිසය. ධර්ම සේනාපති ආදී රහතන් වහන්සේලා විසින් ද ධර්ම භාණ්ඩාගාරික ආදී තෙරුන්වහන්සේලා විසින් ද දේශනා කරන ලද දේශනාවලින් ධර්මය අවබෝධයට පත් සත්ත්වයන්ගේ වශයෙන් ද පසුකල මහා මහින්ද ආදී තෙරුන්වහන්සේලා විසින් ද දේශනා කරන ලද දේශනාවලින් අවබෝධ කරන ලද සත්‍යයන්ගේ (සත්ත්වයන්ගේ) වශයෙන් අද තෙක් ද මෙයින් පසු අනාගතයෙහි ද ශාසනය නිසා ස්වර්ග-මෝක්‍ෂ මාර්ගයන්හි පිහිටන්නන්ගේ වශයෙන් ද මේ අර්ථය දතයුතුය.

තවද 'බහුජන හිතාය' යනු බොහෝ ජනයාට හිත පිණිස උන්වහන්සේලාගේ ප්‍රඥා සම්පත්තිය කරණකොට මෙලොව පරලොව හිත පිණිස උපදේශකයාය. 'බහුජන සුඛාය' යනු බොහෝ ජනයාට සැප පිණිස - ත්‍යාග සම්පත්තිය කරණකොට උපකරණ සැප සම්පත් දායකයාය. 'ලොකානුකම්පාය' යනු ලෝකයාට අනුකම්පා පිණිස - මෛත්‍රී කරුණා සම්පත්තිය කරණකොට මව්පියන් මෙන් ලෝකයාගේ ආරක්ෂකයෝ ය. ගෝපිතයෝ ය.

අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං යන මෙහි දෙව් මිනිසුන් ගැනීමෙන් සුදුසු (භබ්බ) පුද්ගලයන් හික්මවීමට සුදුසු (වෙනෙය්‍ය) සත්ත්වයන් ම ගෙන පළමු වාරයෙහි දී ඔවුන්ගේ නිවන් - මග - ඵල ලැබීම පිණිස තථාගතයන් වහන්සේගේ උපත දක්වන ලදී. දෙවන තෙවන වාරවලදී වනාහි රහතන් වහන්සේගේ ද ශෛක්‍ෂයාගේ ද වශයෙන් යෙදිය යුතුය. එහි 'අත්ථාය' යනු මේ පරම අර්ථය වූ නිවන පිණිසය යි කියන ලද්දේ වෙයි. 'හිතාය' යනු එයට පමුණුවන මාර්ගය පිණිස යයි

කියන ලද්දේ වෙයි. නිවනට පමුණුවන මාර්ගයට වඩා උතුම් යහපතක් නම් නැත. 'සුඛාය' යනු ඵල සමාපත්ති සැප පිණිසයයි ඊට වඩා උසස් සැපයක් නැති බැවින් කියන ලද්දේ වෙයි. මේ කාරණය 'අයං සමාධි පච්චුප්පන්න සුඛො චෙව ආයතිඤ්ච සුඛ විපාකො' 'මේ සමාධිය වත්මනෙහි සැප ද මතු සැප විපාක ද (වෙයි). 'තථාගතො' යනාදී පදයන්ගේ අර්ථය මුලින් කියන ලදී.

'විජ්ජාචරණ සම්පන්නො' යනාදියෙහි ත්‍රිවිද්‍යාව භය භෙරව සූත්‍රයෙහි ආවා වූ ක්‍රමයෙන් ද ෂළභිඤ්ඤා වශයෙන් විද්‍යා හය ද, අම්බට්ඨ සූත්‍රයෙහි ආවා වූ ක්‍රමයෙන් විද්‍යා අටදැයි (යනුවෙන්) ආවා වූ අනුන්ට පොදු නොවූ විද්‍යාවලින් ද සීලසංවරාදී පසළොස් චරණ ධර්මවලින්ද යුක්ත බැවින් **විජ්ජාචරණ සම්පන්නො** විද්‍යාචරණ සම්පන්න නම් වෙති. ශෝභන ගමන් ඇති බැවින් සුන්දර තැනට ගිය බැවින් හෝ මනාව ගිය බැවින් **සුගතො** සුගත නම් වෙති. හැම ආකාරයෙන්ම දන්නා ලද ලෝකය ඇති බැවින් **ලොකවිදූ** ලෝකවිදූ නම් වෙති. උන්වහන්සේට ඉහළින් කෙනෙක් නැති හෙයින් **අනුත්තරො** අනුත්තර වෙති. දමනය කළයුතු පුරුෂයන් හික්මවිය යුතු පුරුෂයන් හික්මවන හෙයින් **පුරිසදම්මසාරථී** පුරුෂදම්‍යසාරථීනම් වෙති. මෙලොව පරලොව උතුම් අර්ථයන් පිණිස සුදුසු පරිදි අනුශාසනා කරන හෙයින් **සත්ථා** සත්ථා නම් වෙති. දැනගත යුතු සියල්ල පිළිබඳව සියලු ආකාරයෙන් තමාගේ නුවණින් අවබෝධ කළ බැවින් **බුද්ධො** බුද්ධ නම් වෙති යන මෙය මෙහි සංක්ෂේපය යි. විස්තරය වනාහි විශුද්ධි මාර්ගයෙන් ගතයුතුය.

**සො ධම්මං දෙසෙති ආදි -පෙ- පරියොසාන කල්‍යාණං** ඒ භාග්‍යවතුන් වහන්සේ සත්ත්වයන් කෙරෙහි කාරුණික බව නිසා අනුත්තර වූ විවේක සැප ඇති ධර්මය දෙසති. එයද ස්වල්පයක් හෝ බොහෝකොට හෝ දේශනා කරමින් ආදි කල්‍යාණ ආදි ආකාරයටම දේශනා කරති. කෙසේද? එක් ගාථාවක් වුව ද හාත්පසින් යහපත් බැවින් ධර්මයේ පළමු පාදයෙන් ආදි කල්‍යාණය, දෙවන තෙවන පාදවලින් 'මජ්ඣ කල්‍යාණය, අවසන් පාදයෙන් පරියොසාන කල්‍යාණය, එක් අනුසන්ධියක් ඇති සූත්‍රයක නිදානයෙන් ආදි කල්‍යාණය, නිගමනයෙන් පරියොසාන කල්‍යාණය ඉතිරියෙන් මජ්ඣ කල්‍යාණය.

නොයෙක් අනුසන්ධි ඇති සූත්‍රයක පළමු අනුසන්ධියෙන් ආදි කල්‍යාණය අවසන් (පශ්චිම) අනුසන්ධියෙන් පරියොසාන කල්‍යාණය, ඉතිරි ඒවායින් මජ්ඣෙ කල්‍යාණය. සියලුම ශාසන ධර්මය තමාගේ, තමා තුළ වූ ශීලයෙන් ආදිකල්‍යාණය, සමථ විපස්සනා මාර්ගඵලවලින් මජ්ඣෙ කල්‍යාණය, නිවනින් පරියොසාන කල්‍යාණය. ශීල සමාධිවලින් ආදිකල්‍යාණය, විදර්ශනා මාර්ගවලින් මජ්ඣෙ කල්‍යාණය, ඵල හා නිවනින් පරියොසාන කල්‍යාණය. බුදුරජාණන් වහන්සේ විසින් මැනවින් අවබෝධ කළ බැවින් හෝ ආදිකල්‍යාණය (මුල යහපත්ය) ධර්මයේ යහපත් ස්වභාවයෙන් (ධම්ම සුධම්මතාය) මජ්ඣෙකල්‍යාණය (මැද යහපත්ය) සංඝයාගේ යහපත් ප්‍රතිපත්තියෙන් පරියොසාන කල්‍යාණය (අග යහපත්ය). එය අසා සත්‍යය පිණිස පිළිපන් තැනැත්තා විසින් අවබෝධ කළයුතු අභිසම්බෝධියෙන් (සම්මා සම්බුද්ධත්වයෙන්) ආදි කල්‍යාණය, පච්චේක බෝධියෙන් මජ්ඣෙ කල්‍යාණය, ශ්‍රාවක බෝධියෙන් පරියෝසාන කල්‍යාණය. මේ ධර්මය අසනුලබන්නේ නීවරණ විෂ්කම්භනයෙන් ඇසීමෙන්ද යහපත ගෙන දෙන හෙයින් ආදිකල්‍යාණය, පිළිපදිනු ලබන්නේ සමථ විදර්ශනා සැප ගෙන දෙන හෙයින් ප්‍රතිපත්තියෙන් ද සැපයම ගෙන දෙන හෙයින් මජ්ඣෙ කල්‍යාණය, එසේ පිළිපැදි ධර්මය ප්‍රතිපත්තිඵලය නිමවූ කල්හි තාදී බව ගෙනදෙන හෙයින් ප්‍රතිපත්ති ඵලයෙන් ද යහපතම ගෙනදෙයි. (කැඳවයි) යන අරුතින් පරියොසාන කල්‍යාණය. නාථ නම් වූ බුදුරජාණන් වහන්සේගෙන් හටගත් බැවින් ද ප්‍රභව ශුද්ධියෙන් ආදිකල්‍යාණය, ආත්ම ශුද්ධියෙන් මජ්ඣෙ කල්‍යාණය, කෘත්‍ය ශුද්ධියෙන් පරියොසාන කල්‍යාණය. එහෙයින් 'සො ධම්මං දෙසෙති ආදි -පෙ- පරියොසාන කල්‍යාණං' යනුවෙන් කියන ලදී.

භාග්‍යවතුන් වහන්සේ යම් ධර්මයක් දේශනා කරමින් ශාසන බ්‍රහ්ම චර්යාව ද මාර්ග බ්‍රහ්මචර්යාව ද ප්‍රකාශ කරත් ද නොයෙක් ක්‍රමවලින් පැහැදිලි කරත් ද එයට අනුරූප වූ අර්ථ සම්පත්තියෙන් සාත්ථං සාර්ථ ය. අක්ෂර සම්පත්තියෙන් සබ්‍යඤ්ජනං ව්‍යඤ්ජන සහිතය. සැකෙවින් දැක්වීම (සංකාසන), පළමුකොට දැක්වීම (පකාසන), විස්තර කිරීම (විවරණ), බෙදා දැක්වීම (විභජන) නොගැඹුරු අයුරින් ප්‍රකට කිරීම (උත්තානීකරණ), පැනවීම (පඤ්ඤත්ති) යන අර්ථ යෙදීමෙන් සාර්ථය (අර්ථ සහිතය), අක්ෂර - පද - ව්‍යඤ්ජන - ආකාර - නිරුක්ති - නිර්දේශ සම්පත්තියෙන් ව්‍යඤ්ජන සහිතය. අර්ථ ගැඹුරු බැවින් හෝ අවබෝධය ගැඹුරු බැවින්

සාර්ථය. ධර්ම ගම්භීර බැවින් දේශනා ගැඹුරු බැවින් ව්‍යඤ්ජන සහිතය. අර්ථ-පටිභාන පටිසම්භිදා විෂයෙන් හෝ අර්ථ සහිතය. ධර්ම-නිරුක්ති පටිසම්භිදා විෂයෙන් ව්‍යඤ්ජන සහිතය. පණ්ඩිතයන් විසින් දතයුතු බැවින්, පරීක්ෂණය කරන ජනතාව ප්‍රසාදයට පත් කරවන්නකි යන අරුතින් අර්ථ සහිතය. ඇදහිය යුතු බැවින් ලෞකික ජනතාව ප්‍රසාදයට පත්කරවන්නකි. යන අරුතින් සව්‍යඤ්ජනය, ගැඹුරු අදහස් ඇති බැවින් සාර්ථ ය. නොගැඹුරු පදවලින් යුතු බැවින් සව්‍යඤ්ජනය.

පමුණුවාගත යුතු දෙයක් නැති හෙයින් සියල්ල පරිපූර්ණ බැවින් **කෙවලපරිපුණ්ණං** වෙයි. ඉවත් කළයුතු දෙයක් නැති බැවින් නිර්දෝෂ භාවයෙන් **පරිසුද්ධං** පිරිසිදුය. තවද ප්‍රතිපත්තියෙන් අධිගමයෙහි සමත් බැවින් සාර්ථය. පර්යාප්තියෙන් ආගමෙහි සමත් බැවින් සව්‍යඤ්ජනය. ශීලාදී ධර්ම ස්කන්ධ (සීල-සමාධි-පඤ්ඤා-විමුත්ති-විමුත්තිඤාණ) පහ පරිපූර්ණ වීමෙන් පිරිපුන්ය. උපක්ලේශ නැති බැවින් ද සසරින් එතෙරවීම පිණිස පවතින හෙයින් ද ලෝකාමිසය බලාපොරොත්තු නැති හෙයින් ද පිරිසිදු ය. ශික්ෂා තුන අල්ලාගත් බැවින් උතුම් වූ ශ්‍රේෂ්ඨයන් විසින් හැසිරිය යුතු බැවින් ඔවුන්ගේ හැසිරීම වූ හෙයින් ද **බ්‍රහ්මචරියං** උසස් හැසිරීම ය. එහෙයින් 'සාත්‍ථං සබ්‍යඤ්ජනං -පෙ- පකාසෙති' යනුවෙන් කියන ලදී.

**පඨමො** යනු ගණන් කිරීමේ අනුපිළිවෙලින් ද සියලු ලෝකයට උතුම් බැවින් ද පළමුවන පුද්ගලයා. **තසෙසව සත්‍ථු සාවකො** යනු කියන ලද ගුණ ඇති ඒ ශාස්තෘ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ධර්මදේශනාව ඇසීම අවසානයේ උපන්නා වූ, ධර්ම සේනාපතීන් වහන්සේ සමාන ශ්‍රාවකයා, පූරණ ආදී අය මෙන් ප්‍රතිඥා මාත්‍රයෙන් ශාස්තෘන් වහන්සේගේ ශ්‍රාවකයෙක් නොවේ. **පාටිපදො** යනු ප්‍රතිපදා සංඛ්‍යාත ආර්ය මාර්ගයෙන් ආර්ය ජාතියෙහි උපන්නේය යන අරුතින් පාටිපද නම් වෙයි. නො නිමි ප්‍රතිපත්ති කෘත්‍යය ඇත්තා වූ, පිළිපදින්නා වූ යන අර්ථයි. සූත්‍ර-ගෙය්‍ය ආදී පර්යාප්ති ධර්මය මොහු විසින් බොහෝකොට අසන ලද්දේය යන අරුතින් **බහුස්සුතො** බහුශ්‍රැතය. ප්‍රාතිමෝක්ෂ සංවරාදී ශීලයෙන් ද ආරඤ්ඤිකාදී ධුතංග වත්වලින් ද යුක්ත වූයේ සමන්නාගත වූයේ **සීලවතුපපනෙනා** ශීලයෙන් හා ව්‍රතයෙන් යුක්ත වූයේ වෙයි.

මෙසේ ලෝකානුකම්පාව නම් යහපත කැමැත්තෙන් කරන ධර්ම දේශනාවය. ඒ ධර්ම දේශනාව ද මේ පුද්ගලයන් තිදෙනා කෙරෙහි බැඳී ඇතැයි භාග්‍යවතුන් වහන්සේ දක්වති. ඉතිරිය පහසුවෙන් දැනගත හැක්කේමය.

ගාථාවන්හි - **තසසතවයො** යනු ඒ ශාස්තෘන් වහන්සේගේම ප්‍රතිපත්තියෙන් ද ධර්ම දේශනාවෙන් ද උන්වහන්සේගේ අනුජාත වූ (ශ්‍රාවකයා). අවිද්‍යාන්ධකාරය පළවාහැර තමාගේ, අනුන්ගේ සිත්වල ධර්ම ආලෝකය නමැති ආලෝකය ඇතිකිරීමෙන් **පභංකරා.** ප්‍රභංකරයහ. **ධමමමුදීරයනතා** යනු චතුස්සත්‍ය ධර්මය කියනනාහු. **අපාපුරනති** යනු විවෘත කරත්. **අමතසස** යනු නිවනෙහි. **දවාරං** ආර්ය මාර්ගය. **යොගා** යනු කාමයෝග ආදියෙන්. **සත්‍ථවාහෙන** යනු හික්මවිය යුතු අයට සාර්ථ වාහකයාණ කෙනෙකු හෙයින් භව කාන්තාරයෙන් එතෙර කරවන හෙයින් භාග්‍යවතුන් වහන්සේ 'සත්‍ථවාහ' නම් වෙති. ඒ සාර්ථ වාහකයාණන් විසින්. **සුදෙසිතං මගග මනුකකමනති** යනු උන්වහන්සේ විසින් මනාකොට දේශනා කරන ලද ආර්ය මාර්ගය උන්වහන්සේගේ දේශනාවට අනුසාරයෙන් යති, පිළිපදිති. **ඉධෙව** යනු මේ ආත්ම භාවයෙහි ම. සෙස්ස පැහැදිලිය.

**පස්වන සූත්‍රය යි.**

# 3.4.6

සයවන සූත්‍රයෙහි - **අසුභානුපසසී** යනු අශුභය යි. ඒ අනුව බලන්නාහු, දෙතිස් ආකාර වශයෙන් ද උද්ධුමාතක ආදිය අතරින් ගන්නා ලද නිමිත්ත ළඟට පැමිණවීම් වශයෙන් ද කයෙහි අශුභය, අශුභාකාරය අනුව බලන්නවුන් බවට පත්ව වාසය කරව්. **ආනාපාන සති** යනු ආනාපානයෙහි සතිය යි. එය නිමිතිකොට පවත්නා සිහියයි. ආශ්වාස

ප්‍රශ්වාසය අල්ලා ගන්නා වූ සතිය යන අර්ථයි. මේ කාරණය 'ආනන්ති **අස්සාසො නො පස්සාසො, ආපානන්ති පස්සාසො නො අස්සාසො'** ආන යනු ආශ්වාසයයි, ප්‍රශ්වාසය නොවේ. ආපාන යනු ප්‍රශ්වාසයයි, ආශ්වාසය නොවේ.' යනාදියෙන් කියන ලදී. වො යනු තොපගේ. **අජ්ඣත්තං** යන මෙහි ගෝචර අධ්‍යාත්මය (සිත) අදහස් කරන ලදී. **පරිමුඛං** යනු අභිමුඛව (ඉදිරියට ගෙන) **සූපට්ඨිතා** යනු මනාව එළඹ සිටි. එයින් (මේ මතු කියන) අදහස කියන ලද්දේ වෙයි. තොපගේ ආනාපානසති කර්මස්ථානය ඉදිරියට ගෙන මනාව එළඹ සිටීවා. නැතහොත් 'පරිමුඛං' යනු පරිග්ගහිත නිය්‍යානය යි (අරමුණ අල්ලා ගැනීම හා එය ඉදිරියට ගෙන යාම) මේ කාරණය පටිසම්භිදාවෙහි **'පරීති පරිග්ගහට්ඨො, මුඛන්ති නිය්‍යානට්ඨො, සතීති උපට්ඨානට්ඨො, තෙන වුච්චති පරිමුඛං සතිං'** 'පරි' යනු අල්ලාගැනීම යන අර්ථය යි. 'මුඛං' යනු (ඒ අල්ලාගත් ආශ්වාස ප්‍රශ්වාස අරමුණ) ඉදිරියට පවත්වාගෙන යන අර්ථය යි. 'සති' යනු එළඹ සිටි ළඟට පැමිණි යන අර්ථය යි, එහෙයින් පරිමුඛං සතිං යනුවෙන් කියන ලදී.' ළඟට පැමිණි යන අර්ථය යි. එහෙයින් පරිමුඛං සතිං යි කියන ලදී' යනුවෙන් කියනු ලැබේ. මෙයින් සතර සතිපට්ඨානයට අයත් දාසය ආකාර වූ ආනාපාන සති කර්මස්ථාන භාවනාව දක්වන ලදැයි දතයුතුය.

මෙසේ කෙටියෙන් ම රාගචරිත-විතර්ක චරිත ඇති අයට ගැලපෙන පටික්කූල මනසිකාර කායානුපස්සනා වශයෙන් සමථ කර්මස්ථානය ද විදර්ශනා කර්මස්ථානය ද නියමකොට (උගන්වා) දැන් ශුද්ධ විදර්ශනා කර්මස්ථානය ම දක්වමින් **සබ්බ සංඛාරෙසු අනිච්චානුපස්සී විහරථ** සියලු සංස්කාරයන්හි අනිත්‍යානුපස්සීව වාසය කරව් යි කීහ. එහි අනිත්‍යය, අනිත්‍ය ලක්‍ෂණය, අනිත්‍ය අනුපස්සනාව, අනිත්‍ය අනුපස්සී යන මේ සතරේ සමූහය (චතුක්කය) දතයුතුය. ඇතිව නැතිවීම් වශයෙන් උදයව්‍යය (උදයබ්බය = ඇතිව නැතිවීම) යෙදීමෙන් ද තාවකාලික වශයෙන් ද නිත්‍යය ප්‍රතික්‍ෂේප කිරීම් වශයෙන් ද ස්කන්ධ පංචකය අනිත්‍ය නම්. ඒ ස්කන්ධ පංචකයේ ඇතිව නැතිවන ආකාරයක් වේද එය අනිත්‍ය ලක්‍ෂණය නම්. එය (අනිත්‍ය ලක්‍ෂණය) නිමිතිකොට පවත්නා විදර්ශනාව අනිත්‍යානුපස්සනාව යි. එය අනිත්‍යය යනුවෙන් විදර්ශනා කරන තැනැත්තා අනිත්‍යානුපස්සී නම්. මෙහි ද එකොළොස් ආකාර අශුභ කථාව ප්‍රථමධ්‍යානයට පමුණුවා සොළොස් (16) ආකාර ආනාපාන කථාව

චතුර්ථ ධ්‍යානයට පමුණුවා විදර්ශනා කථාව විස්තර වශයෙන් කිවයුතුය. ඒ කථාව සියලු ආකාරයෙන් **විශුද්ධි මාර්ගයෙහි** කියන ලදී. එහි කියන ලද අයුරින්ම දතයුතුය. දැන් අශුභානුපස්සනාදියෙන් උපදවා ගතයුතු ඵල විශේෂය දක්වන්නට 'අසුභානු පස්සීනං' යනාදිය කීහ.

එහි **සුභාය ධාතුයා** යනු ශුභ භාවයෙහි, ශුභ නිමිත්තෙහි යන අර්ථයි. **රාගානුසයො** යනු ශුභ අරමුණෙහි ඉපදීමට සුදුසු කාමරාග අනුසයයි. **සො** ඒ කාමරාගානුසය කෙස් ආදිය අතුරින් හෝ උද්ධුමාතක ආදිය අතරින් හෝ අශුභානුපස්සීන්ගේ අශුභ නිමිත්ත ගෙන එහි ප්‍රථම ධ්‍යානය උපදවා එය පදනම් කොට විදර්ශනාව පටන්ගෙන අවබෝධ කරන ලද අනාගාමි මාර්ගයෙන් **පහීයති** සියලු ආකාරයෙන් සහමුලින් සිඳී යනු ලැබේ යන අර්ථයි. මේ කාරණය '**අසුභා භාවෙතබ්බා කාමරාගස්ස පහානාය**' 'කාමරාගයේ පහවීම පිණිස අශුභය වැඩිය යුතුය' යනුවෙන් කියන ලදී.

බාහිරා යනු බාහිර වස්තු ඇති බැවින් ද අනර්ථය ගෙනදෙන හෙයින් ද බාහිර වූ - පිටත වූ. **විතක්කාසයා** යනු කාම කල්පනාදී වැරදි විතර්ක. පහනොවූ ආසය අනුව ගිය ඒවා ප්‍රත්‍ය සමවාය (එක්වීම) ඇතිකල්හි ඉපදීම් වශයෙන් 'විතක්කාසයා' යි කියන ලදී. මෙහි කාමරාගය ගැනීමෙන් කාම විතර්කයද ගන්නා ලද්දේමය. මෙසේ එයට අවශේෂ වූ විතර්කම කියන ලදැයි දතයුතුය. **විඝාත පක්ඛිකා** යනු දුක් පැත්තෙහි වූ හෝ බලාපොරොත්තු විනාශ කිරීම ඇතිකරන. **තෙ න හොන්ති** යනු ඒවා පහවෙයි. ව්‍යාපාද විතර්ක, විහිංසා විතර්ක, ඤාති විතර්ක, ජනපද විතර්ක, අමරා විතර්ක, අනවඤ්ඤත්ති පටිසංයුක්ත විතර්ක, ලාභ සත්කාර සිලොක පටිසංයුත්ත විතර්ක, පරානුද්දයතා පටිසංයුත්ත විතර්ක යන අට කාම විතර්කය සමග නවවිධ මහා විතර්ක අනාපාන සමාධියෙන් ද එය ඇසුරුකොට ඇති විදර්ශනාවේ පූර්ව භාගයෙන් (මුල් අවස්ථාවෙන්) ද විෂ්කම්භනය (යටපත් කිරීම) කරන ලදුව එය පදනම්කොට ලබාගත් ආර්ය මාර්ගයෙන් සුදුසු පරිදි ඉතිරි නොකොට ප්‍රහීණ වෙයි. මේ කාරණය 'ආනාපාන සති භාවෙතබ්බා විතක්කුපච්ඡෙදාය' යනුවෙන් කියන ලදී.

**යා අවිජ්ජා සා පහීයති** යනු සත්‍ය ස්වභාවය වසන්නා වූ සියලු අනර්ථකාරී සියලු සංසාර දුකට මුල් වූ යම් අවිද්‍යාවක් වේද,

අනිත්‍යානුපස්සීව වාසය කරන්නවුන්ගේ එය සහමුලින් සිඳෙයි. මෙය වනාහි භාග්‍යවතුන් වහන්සේ අනිත්‍ය ආකාරයෙන් නැගී සිටි ශුෂ්ක විදර්ශක ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ වශයෙන් කියන ලදී. මේ එහි කෙටි අර්ථය යි. භූමි තුනට අයත් සියලු සංස්කාරයන් අතරින් අනිත්‍යාදී වශයෙන් විමසා බැලීම පටන්ගෙන අනිත්‍යයයි පවත්නා වූ වුට්ඨානගාමිනී විදර්ශනා මාර්ගයෙන් උත්සාහ කෙරේද, අනුක්‍රමයෙන් අර්හත් මාර්ගය උපදී. ඒ අනිත්‍යානුපස්සීව වාසය කරනවුන්ගේ අවිද්‍යාව ඉතිරි නැතිව පහවෙයි. අර්හත් මාර්ග විද්‍යාව උපදී. 'අනිච්චානුපස්සීනං විහරතං' යන මෙය ඔවුන්ට අනිත්‍ය ලක්‍ෂණය ප්‍රකට බැවින් අනිත් ලක්‍ෂණ දෙක ගැනීමේ උපාය බැවින් හෝ කියන ලදී. එකම ලක්‍ෂණයක් අනුපස්සනා කිරීම් වශයෙන් නොවේ. මේ කාරණය '**යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා**' යමක් අනිත්‍ය ද එය දුකය, යමක් දුක ද එය අනාත්මය' යනුවෙන් කියන ලදී. '**අනිච්චසඤ්ඤිනො හි මෙඝිය අනත්තසඤ්ඤා සණ්ඨාති, අනත්තසඤ්ඤී අස්මිමාන සමුග්ඝාතං පාපුණාති**' 'මෙඝිය අනිත්‍ය සංඥාව ඇත්තාට අනත්තසඤ්ඤාව පිහිටයි. අනත්ත සඤ්ඤාව ඇති තැනැත්තා අස්මිමානය සහමුලින් නැසීමට පැමිණෙයි' යනුවෙන් අනිකක් ද කියන ලදී.

ගාථාවන්හි **ආනාපානෙ පතිස්සතො** යන මෙහි ආනාපාන නිමිත්තෙහි එළඹි එළඹි සිහි ඇති, එළඹි සිහිය යන අර්ථයි. **පස්සං** යනු ආශ්‍රවයන් ක්‍ෂය කරන ඤාණ ඇසින් සංස්කාර සන්සිඳීම වූ නිවන දකින්නා වූ. **ආතාපී සබ්බදා** යනු අතරතුර කෙළවර කිරීමකට නොපැමිණ අශුභානුපස්සනා ආදියෙහි නිතර කෙලෙස් තවන වීර්යය ඇත්තේ, සුදුසු පරිදි යෙදෙන, එහෙයින්ම **යතො** වෑයම් කරමින්, නැතහොත් ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් වෑයම් කරමින්, **තත්‍ථ** සියලු සංස්කාරයන්ගේ සන්සිඳීම වූ නිවනෙහි අර්හත්ඵල විමුක්තියෙන් මිදෙයි. ඉතිරිය කියන ලද ක්‍රමයමය.

**භයවන සූත්‍රය යි.**

# 3.4.7

සත්වන සූත්‍රයෙහි - **ධම්මානුධම්ම පටිපන්නස්ස** යන මෙහි ධම්ම නම් නවවිධ ලෝකෝත්තර ධර්මයයි. ඒ ධර්මයේ අනුධර්මය (එනම්) ශීල විශුද්ධි ආදී පූර්වභාග ප්‍රතිපදා ධර්මයයි. ඒ ධර්මානුධර්මයට පිළිපන් ඒ ධර්මානුධර්මය ලබන්නට පිළිපදින්නා වූ (භික්ෂුවට) **අයමනුධම්මො හොති** යනු මේ සුදුසු ස්වභාවය, යෝග්‍ය ස්වභාවය වෙයි. **වෙය්‍යාකරණාය** යනු කීම පිණිස. **ධම්මානුධම්ම පටිපන්නො යං** 'යං' යනු කරණාර්ථයෙහි ප්‍රථමා විභක්ති වචනය යි. යම් අනුධර්මයකින් ඔහු ඒ ධර්මානුධර්මයට පිළිපන්නේ යයි කියන්නේ ද එය මනාකොට කියන්නේ නම් වෙයි. ඒ හේතුවෙන් ඔහු නුවණැත්තන් විසින් ගැරහිය යුතු නොවන්නේය යන මෙය කියන ලද්දේ වෙයි. 'යං' යනු ක්‍රියා පරාමර්ශනය හෝ වෙයි. එයින් මේ ධර්මය ම කීම, ධර්ම විතර්කයම විතර්ක කිරීම, ඒ දෙක නැතිකල්හි ඥාන උපේක්ෂාවෙන් යුක්ත වීම ධර්මානුධර්ම ප්‍රතිපන්න භික්ෂුවට මොහු මෙසේ යයි කීමට අනුරූප හේතු, සුදුසු කාරණයයි (දක්වයි)

**භාසමානො ධම්මංයෙව භාසෙය්‍ය** යනු ඉදින් කථා කරන්නේ දසකථා වස්තු ධර්මය ම කථා කරන්නේය. එයට ප්‍රතිවිරුද්ධ මහිච්ඡතාදි අධර්මයක් කථා නොකරන්නේය. මේ කාරණය : **'යායං කථා අභිසල්ලෙඛිකා චෙතොවිවරණසප්පායා එකන්ත නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති. සෙය්‍යථීදං : අප්පිච්ඡකථා, සන්තුට්ඨි කථා, පවිවේක කථා, අසංසග්ග කථා, විරියාරම්භ කථා, සීලකථා, සමාධි කථා, පඤ්ඤා කථා, විමුත්ති කථා, විමුත්ති ඤාණ දස්සන කථා, එවරූපාය කථාය නිකාමලාභී හොති අකිච්ඡලාභී, අකසිරලාභී'.** 'යම් මේ කථාවක් කෙලෙස් කපා දැමීමට හිතද සිතේ පැහැදිලි කිරීම නම් වූ සමථ විදර්ශනාවන්ට ගැලපේද ඒකාන්තයෙන් සසරෙහි කළකිරීම පිණිස, සසරෙහි නො ඇලීම පිණිස, සසරෙහි නැවැත්ම පිණිස, සසරෙහි සංසිඳීම පිණිස, සසර ගැන විශේෂයෙන් දැනගැනීම පිණිස, කෙලෙස් නින්දෙන් තොරවීමෙන් සසරින් අවදිවීම පිණිස, නිවන පිණිස පවතී ද කෙසේද? ආසාවන් අඩු කිරීම පිළිබඳ කථා, ලද සිවුපසයෙන් සතුටුවීම පිළිබඳ කථා, කාය-චිත්ත-උපධි යන විවේක තුන පිළිබඳ කථා, දැකීම, ඇසීම, කථාකිරීම, ඇඳුම් ආදිය

පරිහරණය, අත්පා ඇල්ලීම් ආදී පස්ආකාර සංසර්ගයෙන් තොරවීම පිළිබඳ කථා, වීර්යය ආරම්භ කිරීම පිළිබඳ කථා, සීලය පිළිබඳ කථා, සමාධිය පිළිබඳ කථා, ප්‍රඥාව පිළිබඳ කථා, විමුක්තිය පිළිබඳ කථා, දහනව ආකාර ප්‍රත්‍යවේක්ෂණය පිළිබඳ කථා නම් වූ විමුක්ති ඥාන දර්ශනය පිළිබඳ කථා, මෙබඳුකථාවන් කැමති පරිදි ලබන්නෙක් වෙයි, පහසුවෙන් ලබන්නෙක් වෙයි, බොහෝ කොට ලබන්නෙක් වෙයි.' යනුවෙන් කියන ලදී. කෙලෙස් කපා හරින කථා අසන්නට ලබන තැනැත්තාම එය කියන්නේය. මෙයින් කල්‍යාණ මිත්‍ර සම්පත්තිය දක්වන ලදී.

**ධම්ම විතක්කං** යනු ධර්මයෙන් ඉවත් නොවූ නෙක්ඛම්ම විතක්කාදිය කල්පනා කරමින් ශීලාදී ප්‍රතිපදාව සම්පූර්ණ කරන්නෙමියි මතු මත්තෙහි උත්සාහ කරන්නේය. ශීලාදියට උපකාර නොවන ධර්මයන් දුරුකොට උපකාරක ධර්මයන් වැඩීම් වශයෙන් ද පිරිහෙන පැත්තට අයත් බව ඉවත් කොට පවතින පැත්තට අයත් බවෙහි ද නොසිට දියුණුවන පැත්තට ද විදර්ශනාව පැත්තට ද පැමිණවීම් වශයෙන් පැවති නොයෙක් ප්‍රභේද ඇති ඒ විතර්කය දතයුතුය. **නො අධම්ම විතක්කං** යනු කාම විතර්කයක් කල්පනා නොකරන්නේය යන අර්ථයි. **තදූභයං වා පන** යනු අනුන්ට අනුග්‍රහ පිණිස යම් මේ ධර්මය කීමක් කියන ලද ද තමාට අනුග්‍රහ පිණිස ධර්මය ගැන කල්පනා කිරීමද කියන ලදී. නැතහොත් ඒ දෙකම **අභිනිවජ්ජෙත්වා** නොපිළිපැද, නොකොට. **උපෙක්ඛකො** යනු එසේ ප්‍රතිපත්තියෙහි උදාසීන වූයේ සමථ විදර්ශනා භාවනාවම වඩමින් වාසය කරන්නේය. සමථ ප්‍රතිපත්තියෙහි හෝ උපේක්ෂාවෙන් යුක්ත වූවෙක් වී විදර්ශනාවෙහිම කටයුතු කරමින් වාසය කරන්නේය. විදර්ශනාවට උත්සාහවත් කරවා එහි ද සංස්කාර උපේක්ෂා ඥාන වශයෙන් උපේක්ෂාවෙන් යුක්ත වූවෙක් වී විදර්ශනා ඥානය මාර්ගයෙන් ගැලපෙන තුරු එය බලවත්ව සූරව ප්‍රසන්නව උසුලයි ද එසේ සිහි නුවණින් වාසය කරන්නේය.

ගාථාවන්හි - මොහුට සමථ-විදර්ශනා ධර්මය සිත් ඇලවිය යුතු අර්ථයෙන් ආරාමය වේ. ඒ අරුතින් **ධම්මාරාමො** වෙයි. ඒ ධර්මයෙහිම ඇලුණේය යන අරුතින් **ධම්මරතො** වෙයි. නැවත නැවත ඒ ධර්මයම සිතන හෙයින් **ධම්මං අනුවිචින්තයං** වෙයි. ඒ ධර්මය ආවර්ජනය කරන්නේ මෙනෙහි කරන්නේ යන අර්ථයි. **අනුස්සරං** යනු ඒ ධර්මයම මතු මත්තෙහි

භාවනා වශයෙන් සිහිකරන්නේ. නැතහොත් විමුත්තායතන ශීර්ෂයෙහි සිට අනුන්ට දේශනා කිරීම් වශයෙන් ශීලාදි ධර්මය සිත් ඇලවිය යුතු අර්ථයෙන් මොහුට ආරාමය යි යන අරුතින් 'ධම්මාරාමො' වෙයි. එසේම ඒ ධර්මයෙහි ඇලුණේය යන අරුතින් 'ධම්මරතො' නම් වෙයි. ඒ ශීලාදී ධර්මයන්ගේ පැවැත්ම සොයමින් කාම විතර්කාදියට අවස්ථාවක් නොදී නෙක්ඛම්ම සංකප්ප ආදී ධර්මයම සිතන හෙයින් 'ධම්මං අනුවිචින්තයං' වෙයි. ඒ දෙකම හෝ ඖළාරික වශයෙන් පිළිගනිමින් මධ්‍යස්ථ වී සමථ විදර්ශනා ධර්මයම මතුමත්තෙහි භාවනා වශයෙන් සිහිකරමින් - වැඩීම් වශයෙන් පවත්වමින්. **සද්ධම්මා** යනු ප්‍රභේද වශයෙන් තිස්හතක් වූ බෝධිපාක්ෂික ධර්මයෙන් ද නවවිධ ලෝකෝත්තර ධර්මයෙන්ද **න පරිහායති** නොපිරිහෙයි. නොබෝ කලකින්ම ඒ ධර්මය අවබෝධ කරයි යන අර්ථයි.

දැන් ඒ ධර්මය සිහිකරන විධිය දක්වමින් 'චරං වා' යනාදිය කීහ. එහි **චරං වා** යනු පිඬුසිඟීම් වශයෙන් ද සක්මන් කිරීම් වශයෙන් ද හැසිරෙමින්. **යදි වා තිට්ඨං** යනු සිටින්නේ හෝ. **නිසින්නො වා** හිඳින්නේ හෝ, **උද වා සයං** යනු නිදමින් හෝ (නිදන ඉරියව්වෙන් සිටිමින්) මෙසේ සතර ඉරියව්වෙහි ම **අජ්ඣත්තං සමයං චිත්තං** යනු කියන ලද පරිදි කර්මස්ථාන නම් වූ ගෝචර අධ්‍යාත්මයෙහි තමාගේ සිත රාගාදී කෙලෙසුන් සන්සිඳුවීම් වශයෙන් දුරුකිරීම් වශයෙන් සිත සන්සිඳුවමින් **සන්තිමෙවාධිගච්ඡති** යනු අත්‍යන්ත ශාන්තිය වූ නිවනට පැමිණෙයි.

**සත්වන සූත්‍රය යි.**

# 3.4.8

අටවන සූත්‍රයෙහි - **අකුසල විතක්කා** යනු අදක්ෂකමින් උපන් විතර්ක. 'අන්ධකරණා' යනාදියෙහි යමෙකුට (අකුසල විතර්ක) තමාම උපදීද එය ඇති සැටියෙන් දැකීම වැළැක්වීමෙන් අන්ධ කරන්නේය යන

අරුතින් **අන්‍ධකරණා** නම්. නුවණ නමැති ඇස ඇති නොකරන්නේය යන අරුතින් **අචක්ඛුකරණා** නම්. අනුවණ ඇති කරන්නේය යන අරුතින් **අඤ්ඤාණ කරණා** නම්. **පඤ්ඤානිරොධිකා** යනු ප්‍රඥා තුන නොපැවතීම සිදුකරමින් නිරුද්ධ වේ යන අරුතින් පඤ්ඤා නිරෝධිකා නම්. අයහපත් ප්‍රතිඵල ගෙනදෙන බැවින් දුක් නම් වූ විඝාත පක්‍ෂයෙහි පවතී යන අරුතින් **විඝාත පක්ඛිකා** නම්. කෙලෙසුන්ගේ නිවීමට නො පමුණුවයි යන අරුතින් **අනිබ්බාණ සංවත්තනිකා** නම්.

**කාම විතක්කො** යනු කාමය සම්බන්ධ වූ විතර්කය. එය කෙලෙස් කාම සහිතව වස්තුකාමයෙහි පවතී. ව්‍යාපාදය සම්බන්ධ වූ විතර්කය **බ්‍යාපාද විතක්කො** ව්‍යාපාද විතර්කයයි. හිංසාව සම්බන්ධ වූ විතර්කය **විහිංසා විතක්කො** විහිංසා විතර්කයයි. මේ දෙක සත්ත්වයන් කෙරෙහි ද සංස්කාර කෙරෙහි ද උපදී. කාමවිතර්කය වනාහි ප්‍රියමනාප සත්ත්වයන් ගැන හෝ සංස්කාරයන් ගැන හෝ කල්පනා කරන්නාට උපදියි. ව්‍යාපාද විතර්කය අප්‍රිය අමනාප සත්ත්වයන් කෙරෙහි හෝ සංස්කාර කෙරෙහි හෝ කිපී බලන කාලයේ පටන් (එය) නැසෙනතුරු උපදී. විහිංසා විතර්කය සංස්කාර කෙරෙහි නූපදී. දුකට පැමිණවිය යුතු සංස්කාරයක් නම් නැත. මේ සත්ත්වයෝ නැසෙත්වා හෝ මැරෙත්වා හෝ සිඳෙත්වා හෝ විනාශ වෙත්වා හෝ නොවෙත්වා යනුවෙන් සිතන කල්හි සත්ත්වයන් කෙරෙහි උපදී. මේවාම කාම සංකල්පනාදියයි. අර්ථ වශයෙන් වනාහි කාම විතර්කාදීන්ගේ ද කාම සංකල්පනාදීන්ගේ ද වෙන් කිරීමක් නැත. එය සම්බන්ධ වූ සඤ්ඤා ආදිය කාමසඤ්ඤා ආදියයි.

**'කාමපටිසංයුත්තො තක්කො විතක්කො මිච්ඡා සංකප්පො, අයං වුච්චති කාමධාතු, සබ්බෙපි අකුසලා ධම්මා කාමධාතු. බ්‍යාපාද පටිසංයුත්තො තක්කො විතක්කො මිච්ඡා සංකප්පො, අයං වුච්චති බ්‍යාපාද ධාතු. නවසු ආඝාත වත්ථූසු චිත්තස්ස ආඝාතො පටිඝාතො අනත්තමනතා චිත්තස්ස, අයං වුච්චති බ්‍යාපාද ධාතු විහිංසා පටිසංයුත්තො තක්කො විතක්කො මිච්ඡාසංකප්පො, අයං වුච්චති විහිංසා ධාතු, ඉධෙකච්චො පාණිනා වා ලෙඩ්ඩුනා වා දණ්ඩෙන වා සත්ථෙන වා රජ්ජුයා වා අඤ්ඤතරඤ්ඤතරෙන වා සත්තෙ විහෙඨෙති, අයං විහිංසාධාතු'**

'කාමය සම්බන්ධ වූ තර්කයක් විතර්කයක් මිථ්‍යා සංකල්පයක් වේද මෙය කාමධාතුව යි කියනු ලැබේ. සියලුම අකුසල ධර්ම කාමධාතුය.

ව්‍යාපාදය සම්බන්ධ වූ තර්කයක් විතර්කයත් මිථ්‍යා සංකල්පයක් වේද මෙය ව්‍යාපාද ධාතුවයි කියනු ලැබේ. නව ආඝාත වස්තු කෙරෙහි සිතේ ක්‍රෝධයක් (ආඝාතයක්) හැපීමක් වේද සිතේ අසතුටු බවක් වේද මෙය ව්‍යාපාද ධාතුවයි කියනු ලැබේ. විහිංසාව සම්බන්ධ වූ තර්කයක් විතර්කයක් මිථ්‍යා සංකල්පයක් වේද මෙය විහිංසා ධාතුවයි කියනු ලැබේ. මෙලොව ඇතැම් පුද්ගලයෙක් අතින් හෝ පස් කැටයකින් හෝ දණ්ඩකින් හෝ ආයුධයකින් හෝ වැලකින් හෝ අනිත් අනිත් දෙයකින් හෝ සත්ත්වයන් වෙහෙසයි ද මෙය විහිංසා ධාතුවයි කියනු ලැබේ.' යනුවෙන් පාළියෙහි ආ බැවින් කාමධාතු ආදීන්ගේ විශේෂයක් ලැබේ. එහි සබ්බ සංගාහික කථා, අසම්භින්න කථා යනුවෙන් කථා දෙකක් ඇත. එහි කාමධාතුව ගත්කල්හි අනිත් දෙකම ගනු ලැබූවා නම් වෙයි. එයින් වෙන්කොට මේ ව්‍යාපාද ධාතුවය මේ විහිංසා ධාතුවය යි දක්වයි. මේ සබ්බ සංගාහිකා නම් වේ. කාමධාතුව දේශනා කරන භාග්‍යවතුන් වහන්සේ ව්‍යාපාද ධාතුව ව්‍යාපාද ධාතු ස්ථානයෙහි ද විහිංසා ධාතුව විහිංසා ධාතු ස්ථානයෙහි ද තබා ඉතිරිය කාමධාතු නම් වේ යයි දෙසූහු ද මේ අසම්භින්න (අමිශ්‍ර) කථා නම් වේ.

යහපත් (කුශල) පැත්තෙහිදී (අකුශල පැත්තෙහි) කියන ලද ආකාරයට විරුද්ධ අයුරින් අර්ථය දතයුතුය. නෙක්ඛම්මය සම්බන්ධ වූ විතර්කය **නෙක්ඛම්ම විතක්කො** නෙක්ඛම්ම විතර්කයයි. එය අශුභ භාවනාවේ මුල් අවස්ථාවේදී කාමාවචර වෙයි. අශුභ ධ්‍යානයෙහි දී රූපාවචර වෙයි. ඒ ධ්‍යානය පදනම්කොට මාර්ග ඵල උපන් කාලයෙහි ලෝකෝත්තර වෙයි. අව්‍යාපාදය සම්බන්ධ වූ විතර්කය **අබ්‍යාපාද විතක්කො** අව්‍යාපාද විතර්කයයි. එය මෛත්‍රී භාවනාවේ මුල් අවස්ථාවෙහි කාමාවචර වෙයි. මෛත්‍රී ධ්‍යානයෙහි දී රූපාවචර වෙයි. ඒ ධ්‍යානය පදනම්කොට මාර්ගඵල උපන් කාලයෙහි ලෝකෝත්තර වෙයි. අවිහිංසාව සම්බන්ධ විතර්කය **අවිහිංසා විතක්කො** අවිහිංසා විතර්කයයි. එය කරුණා භාවනාවෙහි මුල් අවස්ථාව කාමාවචරය. කරුණා ධ්‍යානයෙහි දී රූපාවචරය. ඒ ධ්‍යානය පාදකකොට මාර්ගඵල උපන් කල්හි ලෝකෝත්තර ය.

අලෝභය ශීර්ෂය (ප්‍රධාන) වනවිට අනිත් දෙක ඒ අනුව යන්නේ වෙයි. මෛත්‍රිය ශීර්ෂය වනවිට අනිත් දෙක ඒ අනුව යන්නේ වෙයි. කරුණාව ශීර්ෂය වනවිට අනිත් දෙක ඒ අනුව යන්නේ වෙයි. මේවා ම

නෙක්ඛම්ම සංකප්පාදියයි. අර්ථ වශයෙන් නෙක්ඛම්ම විතක්කාදීන්ගේ ද නෙක්ඛම්ම සංකප්පාදීන්ගේ ද වෙන් කිරීමක් නැත. එය සම්බන්ධ වූ සඤ්ඤා ආදිය නෙක්ඛම්ම සඤ්ඤාදියයි.

**'නෙක්ඛම්ම පටිසංයුත්තො තක්කො විතක්කො සංකප්පො අයං වුච්චති නෙක්ඛම්මධාතු, සබ්බෙපි කුසලාධම්මා නෙක්ඛම ධාතු. අබ්‍යාපාද පටිසංයුත්තො තක්කො විතක්කො සංකප්පො, අයං වුච්චති අබ්‍යාපාද ධාතු, යා සත්තෙසු මෙත්ති මෙත්තායනා මෙත්තාචෙතො විමුත්ති, අයං වුච්චති අබ්‍යාපාද ධාතු. අවිහිංසා පටිසංයුත්තො තක්කො විතක්කො සංකප්පො අයං වුච්චති අවිහිංසා ධාතු, යා සත්තෙසු කරුණා කරුණායනා, කරුණා චෙතො විමුත්ති අයං වුච්චති අවිහිංසා ධාතු'**

නෙක්ඛම්මය සම්බන්ධ වූ තර්කයක් විතර්කයක් සංකල්පයක් වේද මෙය නෙක්ඛම්ම ධාතුවයි කියනු ලැබේ. සියලුම කුශලධර්ම නෙක්ඛම්ම ධාතුවය. අව්‍යාපාදය සම්බන්ධ වූ තර්කයක් විතර්කයක් සංකල්පයක් වේද මෙය අව්‍යාපාද ධාතුව ය. සත්ත්වයන් කෙරෙහි මෛත්‍රියක් මෛත්‍රී කිරීමක් මෛත්‍රී චේතෝ විමුක්තියක් වේද මේ අව්‍යාපාද ධාතුවයි කියනු ලැබේ. අවිහිංසාව සම්බන්ධ තර්කයක් විතර්කයක් සංකල්පයක් වේද මෙය අවිහිංසා ධාතුවයි කියනු ලැබේ. සත්ත්වයන් කෙරෙහි කරුණාවක් කරුණා කිරීමක් කරුණා චේතෝ විමුක්තියක් වේද මේ අවිහිංසා ධාතුවයි කියනු ලැබේ.' යනුවෙන් පාළියෙහි ආ බැවින් නෙක්ඛම්ම ධාතු ආදීන්ගේ විශේෂයක් ලැබේ. මෙහි ද සබ්බ සංගාහික අසම්භින්න යන කථාදෙ කියන ලද අයුරින් ම දතයුතුය. සෙස්ස පහසුවෙන් දතහැකි වේමය.

ගාථාවන්හි - **විතක්කයෙ** යනු විතර්ක (කල්පනා) කරන්නේය. **නිරාකරෙ** යනු තමාගේ සිතින් ඉවත් කරන්නේය, දුරු කරන්නේය, බැහැර කරන්නේය යන අර්ථයි. **සවෙ විතක්කානි විචාරිතානි සමෙති වුට්ඨීව රජං සමූහතං** යනු ගිම්හාන ඍතුවෙහි අවසන් (ඇසළ) මාසයෙහි පොළොවෙහි 'සමූහතං' හාත්පසින් නැගුණු දූවිල්ල මහත් වූ අකල් වැස්සක් ඇතිවීමෙන් එම වැස්ස ඒ දූවිල්ල සම්පූර්ණයෙන් සන්සිඳුවන්නා සේ 'සො' යෝගාවචරයා 'විතක්කානි' වැරදි කල්පනාවන් ද 'විචාරිතානි' ඒ සමඟ සම්බන්ධ විචාරයන් ද, 'සමෙති' සන්සිඳුවයි, සහමුලින් නසයි. එබඳු වූ **විතක්කූපසමෙන චෙතසා** සියලු වැරදි කල්පනාවන් සන්සිඳුවීමෙන්

විතර්ක සන්සිඳුවන ආර්ය මාර්ග සිතින්, ඉධෙව මේ ජීවිතයෙහිදීම, සන්තිපදං නිවන, සමජ්ඣගා අවබෝධ කරන ලද්දේ වෙයි.

අටවන සූත්‍රය යි.

## 3.4.9

නවවන සූත්‍රයෙහි - අන්තරාමලා යන මෙහි - අන්තරා ශබ්දය :-

**නදීතීරෙසු සණ්ඨානෙ සභාසු රථියාසු ච**
**ජනා සංගම්ම මන්තෙන්ති මඤ්ච තඤ්ච කිමන්තරං**[1]

ගංතෙරදී ද විඩා සන්සිඳුවන තැනදී ද සභාවලදී ද වීදිවලදී ද ජනතාව රැස්වී මා ගැන ද ඔබවහන්සේ ගැන ද කථා කරති. හේතුව කුමක්ද? යනාදී තැන්වල කාරණයෙහි ආයේය.

'**අද්දසා මං භන්තෙ අඤ්ඤතරා ඉත්ථී විජ්ජන්තරිකාය භාජනං ධොවන්ති**' 'ස්වාමීනි, භාජනයක් සෝදන එක්තරා ස්ත්‍රියක් විදුලිය කොටන මොහොතෙහි මා දුටුවාය' යනාදියෙහි මොහොතෙහි (ක්‍ෂණය යන අරුතෙහි) ආයේය. '**අපිචායං තපොදා ද්වින්නං මහානිරයානං අන්තරිකාය ආගච්ඡති**' 'තවද මේ තපෝදා නදිය මහානිරය දෙකක් අතරින් පැමිණෙයි' යනාදියෙහි විවරය යන අර්ථයෙහි ආයේය.

**පීතවත්ථෙ පීතධජෙ පීතාලංකාර භූසිතෙ**
**පීතන්තරාහි වග්ගූහි අපිලන්ධාව සොභති**[2]

රන්වන් වස්ත්‍ර ඇත්තීය. රන්වන් ධජ ඇත්තීය. රන්වන් අබරණින් බබළන්නීය. තී සිත්කලු වූ මනරම් වූ රන්වන් උතුරුසළුවෙන් නොසැරසුනීම හොබනෙහිය ආදියෙහි උතුරුසළුව යන අර්ථයෙහි ආයේය. '**යස්සන්තරතො න සන්ති කොපා**' 'යමෙකුගේ සිතෙහි කෝපය නැද්ද'

1. සං.නි. - වන සංයුත්තය - බු.ජ.මු 1 භා - 358 පිට
2. විමානවත්ථු - මල්ලිකා විමාන - බු.ජ.මු. 84 පිට

යනාදී තැන්වල සිත යන අර්ථයෙහි ආයේය. මෙහිද සිත යන අර්ථයෙහිම දතයුතුය. එහෙයින් අන්තරයෙහි - සිතෙහි වීම අන්තරා නම්. යම් සිතක ඉපිද ඒ සිත කිලිටි බව ඇතිකිරීමෙන් 'මල' නම් වේ. එහි මල ය, ශරීරමල චිත්තමල යනුවෙන් දෙපරිදිය.

ඒ අතරින් සිරුරෙහි උපන් දහඩිය කුණු ආදිය ද එහි ලැගගත් ආගන්තුක (පිටින් පැමිණි) දූවිලි ද ශරීරමල ය වෙයි. එය ජලයෙන් ඉවත්කළ යුතුය. රාගාදී සිත කිලිටිකරන දේ එසේ නොවේ.

රාගාදී සිත කිළිටි කරන චිත්තමල ආර්ය මාර්ගවලින් ම ඉවත්කළ යුතුය. පැරැන්නන් විසින් මේ කාරණය (මෙසේ) කියන ලදී.

**රූපෙන සංකිලිට්ඨෙන සංකිලිස්සන්ති මානවා**
**රූපෙ සුද්ධෙ විසුජ්ඣන්ති අනක්ඛාතං මහෙසිනා**

රූපය කිලිටිවීමෙන් මිනිස්සු කිළිටි වෙති'යි රූපය පිරිසිදු වූ කල්හි මිනිස්සු පිරිසිදු වෙතියි මහාර්ෂී වූ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා නොකරන ලදී.

**චිත්තම්හි සංකිලිට්ඨම්හි සංකිලිස්සන්ති මානවා**
**චිත්තෙ සුද්ධෙ විසුජ්ඣන්ති ඉතිවුත්තං මහෙසිනා**

සිත කිළිටු වූ කල්හි මිනිස්සු කිළිටි වෙති'යි සිත පිරිසිදු කළ කල්හි මිනිස්සු පිරිසිදු වෙතියි මෙසේ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලදී.

එහෙයින් භාග්‍යවතුන් වහන්සේ '**චිත්ත සංකිලෙසා භික්ඛවෙ සත්තා සංකිලිස්සන්ති, චිත්තවොදානා විසුජ්ඣන්ති**' 'මහණෙනි, සත්ත්වයෝ සිත කිළිටිවීමෙන් කිළිටි වෙති. සිත පිරිසිදු වීමෙන් පිරිසිදු වෙති'යි වදාළහ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ මෙහිදී ද චිත්තමල පිරිසිදු කිරීම පිණිස පිළිපැදිය යුතුයයි දක්වමින් 'තයො මෙ භික්ඛවෙ අන්තරා මලා' යනුවෙන් වදාළහ. යම්සේ මේ ලෝභාදිය සත්ත්වයන්ගේ සිතෙහි ඉපිද කිළිටි බව ඇතිකරන, නොයෙක් ආකාර කිළුටු සම්පාදක යන අරුතින් අන්තරා

මල නම් වේ. මෙසේ එක්ව අනුභව කොට එක්ව නිදා වැරදි සොයන (මිතුරු වෙසින් සිටින) සතුරකු මෙන් සිතෙහිම ඉපිද සත්ත්වයන්ට නොයෙක් ආකාර අනර්ථ ගෙනදෙන නොයෙක් ආකාර දුක් උපදවන ඒවාය යි දක්වමින් 'අනතරා අමිත්තා' යනාදිය කීහ.

එහි මිත්‍රයාට ප්‍රතිපක්‍ෂ වශයෙන් **අමිත්තා** අමිත්‍රයෝය. සතුරු ක්‍රියා කිරීම් වශයෙන් **සපත්තා** සපත්තයෝය. හිංසා කිරීමෙන් **වධකා** වධකයෝය. කෙළින්ම (ඍජුව) විරුද්ධකම් කරන හෙයින් පච්චත්ථිකා පච්චත්ථිකයෝය. එහිදී කරුණු දෙකකින් ලෝභාදියේ අමිත්‍රභව ආදිය දතයුතුය. වෛරී පුද්ගලයා වනාහි ඉඩක් ලබමින් තමාගේ වෛරී පුද්ගලයාගේ හිස ආයුධයකින් හෝ හෙළයි. උපායකින් හෝ මහත් අනර්ථයක් උපදවයි. මේ ලෝභාදිය ප්‍රඥාව නමැති හිස හෙළීමෙන් (කපා දැමීමෙන්) ද (අණ්ඩජ ආදී) යෝනි ප්‍රතිපාදනයෙන් ද ඊට වඩා බලවත් වූ අනතුරක් උපදවයි. කෙසේ ද? ඇස් දොරට (චක්ඛු ද්වාරයට) ප්‍රිය (අප්‍රිය) ආදී අරමුණු හමු වූ කල්හි සුදුසු පරිදි ඒවා නිමිතිකොට (නිසා) ලෝභාදිය උපදියි. මෙපමණකින් ඔහුගේ ප්‍රඥාව නමැති හිස හෙළන ලද්දේ (කපාදමන ලද්දේ) වෙයි. සෝත ද්වාරාදියෙහි ද මේ ක්‍රමයමයි. මෙසේ නුවණ නමැති හිස වැටීමෙන් අමිතුරන් ආදීන්ට සමාන බව දතයුතුය.

ලෝභාදිය වනාහි කර්මනිදාන වී අණ්ඩජ ආදී භේද ඇති යෝනි සතර ළඟට පමුණුවයි. ඔහුට යෝනි පැමිණීම (යෝනි ඇතිවීම) මුල්කොට ඇති මහා භය විසිපහත් දෙතිස්කර්ම (වධ) ත් ආයේ ම වෙයි. (ලෝභාදිය කර්මයන්ට මුල්වී යෝනි සතරත් එමෙන් ම භය විසිපහත්, දෙතිස්වධත් ලබාදෙයි.) මෙසේ යෝනි ප්‍රතිපාදනයෙන් (යෝනි සැපයීමෙන්) ද ඒවායේ අමිත්‍ර ආදීන්ට සමාන බව දතයුතුය. මෙසේ ලෝභාදිය අමිත්‍ර ආදීන්ට සමාන බැවින් ද සිතින් හටගත් බැවින් ද 'අන්තරා අමිත්තා' යනාදිය කියන ලදී. තවද අමිත්‍රයන් විසින් කරන්නට නොහැකි දෙය ද ලෝභාදිය කරයි. අමිත්‍ර බව ආදිය ද ලෝභාදියෙන් උපදී යන අරුතින් ඒවායේ අමිත්‍ර බව ආදිය දතයුතුය. මේ කාරණය (මෙසේ) කියන ලදී :-

**දිසො දිසං යං තං කයිරා වෙරී වා පන වෙරිනං**
**මිච්ඡා පණිහිතං චිත්තං පාපියො නං තතො කරෙ**

'සතුරෙක් සතුරෙකුට හෝ වෛරී පුද්ගලයෙක් වෛරී පුද්ගලයකුට හෝ යම් අනතුරක් කරන්නේ නම් වරදවා පිහිටුවන ලද සිත ඔහු එයටත් වඩා පාපියකු කරන්නේය.'

ගාථාවන්හි : තමාගේ ද අනුන්ගේ ද අනර්ථය උපදවයි යන අරුතින් **අනත්‍ථ ජනනො** නම් වෙයි. ඒ කාරණය (මෙසේ) කියන ලදී.

**'යදපි ලුද්‍ධො අභිසංකරොති - කායෙන වාචාය මනසා, තදපි අකුසලං යදපි ලුද්‍ධො ලොභෙන අභිභූතො පරියාදින්න චිත්තො පරස්ස අසතා දුක්ඛං උප්පාදෙති - වධෙන වා, බන්‍ධෙන වා, ජානියා වා, ගරහාය වා, පබ්බාජනාය වා - බලවම්හි බලත්‍ථො ඉති. තදපි අකුසලං ඉතිස්සමෙ ලොභජා ලොභනිදානා ලොභ සමුදයා ලොභ පච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති'**[1]

'ලෝභයෙන් මැඩගත් පුද්ගලයා කයින් වචනින් මනසින් යමක් රැස් කරයි ද එයද අකුසලය. ලෝභ වූයේ ලෝභයෙන් මැඩගන්නා ලද්දේ ලෝභයෙන් අල්ලාගත් සිත් ඇත්තේ 'මම බලවත් වෙමි. මම බලයෙන් ප්‍රයෝජන ඇත්තෙක් වෙමි' අනුන්ට මරණයෙන් හෝ බන්ධනයෙන් හෝ ධන හානියෙන් හෝ ගැරහීමෙන් හෝ නෙරපීමෙන් හෝ නැති දොසකින් දුක් උපදවා ද එය ද අකුශලය. මෙසේ ලෝභයෙන් හටගත් ලෝභය නිදානකොට ඇති ලෝභය සමුදය කොට ඇති ලෝභය ප්‍රත්‍යය කොට ඇති නොයෙක් පාපක අකුශල ධර්ම ඔහුට පහළ වෙයි.

අනිකක් ද කියන ලදී. **'රත්තො ඛො බ්‍රාහ්මණ රාගෙන අභිභූතො පරියා දින්නචිත්තො අත්තව්‍යාබාධායපි චෙතෙති, පරව්‍යාබාධායපි චෙතෙති, උභයව්‍යාබාධායපි චෙතෙති, චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති'**[2]

'බමුණ, රාගයෙන් රත් වූ (ඇලුණු) රාගයෙන් මැඩගන්නා ලද්දා වූ රාගයෙන් මැඩගන්නා ලද සිත් ඇත්තා වූ පුද්ගලයා තමාට ආබාධ පිණිස සිතයි. අනුන්ට ආබාධ පිණිස සිතයි. දෙපිරිසටම (තමාට - අනුන්ට) ආබාධ (විපත්) පිණිස සිතයි. චෛතසික දුක් දොම්නස් විඳියි' යනුවෙනි.

---

1 -2 අං.නි -තික නිපාත - බු.ජ.මු. 1 භා - 358/286 පිටු

**චිත්තප්පකොපනො** යනු සිතේ කැළඹීමයි. ලෝභය වනාහි ලෝභ කළ යුතු වස්තුවෙහි උපදිමින් සිත කළඹමින්, ප්‍රකෝප කරමින් වෙනසකට පත්කරමින් විකාරයට පමුණුවමින් උපදී. පැහැදීම් ආදී වශයෙන් පවතින්ට නොදෙයි. **භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති** යනු ඒ ලෝභ නම් වූ 'අන්තරතො' අභ්‍යන්තරයෙහි, තමාගේ සිතෙහි ම උපන් අනර්ථය ඇතිකරන සිත ප්‍රකෝපවීම් ආදී 'භයං' භයට හේතුව මේ බාල මහජනයා 'නාව බුජ්ඣති' නොදනී. **ලුද්ධො අත්ථං න ජානාති** යනු ආත්මාර්ථ පරාර්ථ ආදී භේද ඇති 'අත්ථං' හිතය (යහපත) ලෝභී පුද්ගලයා ඇති තතු නො දනී. **ධම්මං න පස්සති** යනු දශකුශල කර්මපථ ධර්මය 'ලුද්ධො' ලෝභයෙන් මැඩගන්නා ලද, ලෝභයෙන් මැඩගත් සිත් ඇති පුද්ගලයා 'න පස්සති' ප්‍රත්‍යක්ෂ වශයෙන් නොදකී. උත්තරි මනුෂ්‍ය ධර්ම ගැන කියනුම කවරේද? (එහෙයින්) '**රත්තො ඛො බ්‍රාහ්මණ රාගෙන අභිභූතො පරියාදින්න චිත්තො අත්තත්ථම්පි යථාභූතං නප්පජානාති, පරත්ථම්පි යථාභූතං නප්පජානාති, උභයත්ථම්පි යථාභූතං නප්පජානාති**' යනාදී මෙය කියන ලදී. **අන්ධංතමං** යනු අන්ධ බව ඇතිකරන අඳුර. **යං** යනු යම්තැනක, මෙය සත්තමී අර්ථයෙහි (භුම්මත්ථෙ) ප්‍රථමා විභක්ති වචනයයි. යම්කලෙක ලෝභය 'සහතෙ' මිනිසා මැඩගනියිද අන්ධභාවය ඇතිකරන අඳුර **තදා** එකල්හි වෙයි. 'යං' යනු කාරණ වචනය හෝ වෙයි. යම්හෙයකින් ලෝභය උපදින්නේ මිනිසා 'සහතෙ' මැඩපවත්වයි ද එහෙයින් එකල්හි අන්ධභාවය ඇතිකරන අඳුර වෙයි යනුවෙන් යෙදීම සිදුවන්නේ යත ශබ්දයන්ගේ ඒකාන්ත සම්බන්ධභාවය නිසාය. නැතහොත් 'යං' යනු ක්‍රියා පරාමර්ශනයයි. 'ලොභො සහතෙ' යන මෙහි ලෝභයේ යම් මේ 'සහනං' මැඩගැනීමක් කියන ලද ද, අන්ධභාවය ඇතිකරන අඳුරේ මේ ගමන, උපත යන අර්ථයි. නැතහොත් ලෝභය යම් මිනිසකු 'සහතෙ' මැඩගනියි ද ඔහුට එකල්හි අන්ධකාරය ඇතිකරන අඳුර ඇතිවෙයි. එයින් ද ලුද්ධො අත්ථං න ජානාති ලුද්ධො ධම්මං න පස්සති යනුවෙන් මෙසේ මෙහි අර්ථය දතයුතුය.

**යො ච ලොභං පහන්ත්වාන** යනු යම් පුද්ගලයෙක් මුල් අවස්ථාවෙහි තදංග වශයෙන් ද විෂ්කම්භන වශයෙන් ද සුදුසු පරිදි සමථ විදර්ශනාවලින් ලෝභය දුරුකොට එසේ දුරුකරන හේතුව **ලොභනෙය්‍යෙ** ඇලුම් කළයුතු දිව්‍ය රූපාදිය එළඹ සිටි කල්හි ද **න ලුබ්භති** බලවත් විදර්ශනානුභාවයෙන් ලෝභ නොකරයි. **ලොභො පහීයතෙ තම්හා** යනු ඒ ආර්ය පුද්ගලයා

කෙරෙන් ආර්ය මාර්ගයෙන් ලෝභය දුරු වේ, අත්‍යන්තයෙන්ම හැරදමයි. කෙසේද? **උදබින්දුව පොක්ඛරා** පියුම් කොළයෙන් දිය බිංදු පහවන්නාක් මෙනි. සෙසු ගාථාවල ද මේ ක්‍රමයෙන් අර්ථ දතයුතුය.

ද්වේෂය ගැන ද එසේය. '**යදපි දුට්ඨො අභිසංඛරොති** - කායෙන වාචාය මනසා, තදපි අකුසලං යදපි දුට්ඨො දොසෙන අභිභූතො පරියාදින්න චිත්තො පරස්ස අසතං දුක්ඛං උප්පාදෙති - වධෙන වා, බන්ධන වා, ජානියා වා, ගරහාය වා, පබ්බාජනාය වා - බලවම්හි බලත්ථො ඉති, තදපි අකුසලං. ඉතිස්ස මෙ දොසජා දොසනිදානා දොස සමුදයා දොස පච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්තීති[1] තථා දුට්ඨො බො බ්‍රාහ්මණ දොසෙන අභිභූතො පරියාදින්න චිත්තො අත්තව්‍යාබාධායපි චෙතෙති පරව්‍යාබාධායපි චෙතෙති, උභයව්‍යාබාධායපි චෙතෙති, චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙතීති තථාඃ දුට්ඨො **බො බ්‍රාහ්මණ දොසෙන අභිභූතො පරියාදින්න චිත්තො අත්තත්ථම්පි යථාභූතං නප්පජානාති, පරත්ථම්පි යථාභූතං නප්පජානාති, උභයත්ථම්පි යථාභූතං නප්පජානාති'**

'දුෂ්ට වූයේ කයින් හෝ වචනින් හෝ මනසින් හෝ යමක් රැස්කරයි ද එයද අකුශලය. දුෂ්ට වූයේ, ද්වේෂයෙන් මැඩගන්නා ලද්දේ, ද්වේෂයෙන් අල්ලා ගත් සිත් ඇත්තේ මම බලවත් වෙමි. මම බලයෙන් ප්‍රයෝජන ඇත්තෙක් වෙමි යි අනුන්ට මරණයෙන් හෝ බන්ධනයෙන් හෝ ධන හානියෙන් හෝ ගැරහීමෙන් හෝ නෙරපීමෙන් හෝ නැති දොසකින් දුක් උපදවයි ද එය ද අකුශලය මෙසේ ද්වේෂයෙන් හටගත් ද්වේෂය නිදානකොට ඇති ද්වේෂය සමුදය කොට ඇති ද්වේෂය ප්‍රත්‍යය කොට ඇති නොයෙක් පාපක අකුශල ධර්ම ඔහුට පහළ වෙයි.

එසේම ඃ බමුණ ද්වේෂයෙන් දුෂ්ට වූ ද්වේෂයෙන් මැඩගන්නා ලද්දා වූ ද්වේෂයෙන් මැඩගන්නා ලද සිත් ඇත්තා වූ පුද්ගලයා තමාට ආබාධ පිණිස සිතයි. අනුන්ට ආබාධ පිණිස සිතයි. දෙපිරිසටම ආබාධ (විපත්) පිණිස සිතයි. චෛතසික දුක් දොම්නස් විඳියි.

එසේම බමුණ, ද්වේෂයෙන් දුෂ්ට වූ ද්වේෂයෙන් මැඩගන්නා ලද්දා වූ ද්වේෂයෙන් මැඩගන්නා ලද සිත් ඇත්තා වූ පුද්ගලයා ආත්මාර්ථය ද

1. අං.නි - 3 නි - 2 පණ් - 2 ව - 9 සූ

තත් වූ පරිදි නොදනී. පරාර්ථය ද තත්වූ පරිදි නොදනී. උභයාර්ථයද තත්වූ පරිදි නොදනී. මෝහය ගැන ද එසේය. 'යදපි මූළ්හො අභිසංඛරොති කායෙන වාචාය මනසා' 'මුළා වූ තැනැත්තා කයින් වචනයෙන් මනසින් යමක් රැස්කරයි ද යනාදිය ද, 'මූළ්හො ඛො බ්‍රාහ්මණ මොහෙන අභිභූතො පරියාදින්න චිත්තො අත්තව්‍යාබාධායපි චෙතෙති' 'බමුණ, මුළා වූ තැනැත්තා මෝහයෙන් මැඩගන්නා ලද්දේ මෝහයෙන් ඇදගන්නා ලද සිත් ඇත්තේ තමාට විපත් පිණිස සිතයි ද යනාදිය ද 'අත්තත්ථම්පි යථාභූතං නප්පජානාති' ආත්මාර්ථය ද තත් වූ පරිදි නොදනී' යනාදිය ද ආවා වූ සූත්‍ර පද අනුසාරයෙන් දතයුතුය.

තාලපක්කංව බන්ධනා යනු උණුසුම හටගැනීමෙන් නටුවෙන් ගිලිහෙන තල්ගෙඩියක් මෙන් තුන්වන (අනාගාමි) මාර්ගඥානය ඉපදීමෙන් ඔහුගේ සිතෙන් ද්වේෂය දුරුවෙයි බැහැර වෙයි යන අර්ථයි. **මොහං විහනති සො සබ්බං** යනු ඒ ආර්ය පුද්ගලයා ඉතිරි නොකොට සියලු මෝහය සතරවන (අර්හත්) මාර්ගයෙන් 'විහනති' විනාශ කරයි - සහමුලින් සිඳියි. **ආදිච්චොවුදයං තමං** යනු හිරු 'උදයං' උදාවෙමින් 'තමං' අඳුර දුරුකරන්නාක් මෙනි.

**නවවන සූත්‍රය යි.**

# 3.4.10

දසවන සූත්‍රයෙහි 'තීහි භික්ඛවෙ අසද්ධම්මෙහි අභිභූතො' යන මෙහි උපත කුමක් ද? දෙව්දත් අවීචි මහා නිරයට පිවිසි කල්හි දේවදත්ත පාක්ෂික අන්‍ය තීර්ථකයෝ ද ශ්‍රමණ ගෞතමයන් විසින් ශාපකරන ලද දෙව්දත් පොළොව තුළට පිවිසියේ යයි බොරුවෙන් චෝදනා කළහ. එය අසා සසුනෙහි නො පැහැදුනා වූ මිනිස්සු මොවුන් කියන පරිදි මෙසේ මේ කාරණය සිදුවීදැයි සැක ඉපිදවූවාහුය. ඒ පුවත භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට දැන්වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, තථාගතයන්

වහන්සේ කිසිවකුටත් ශාප නොදෙති. එහෙයින් දේවදත්ත මා විසින් ශාප නොකරන ලද්දේය. තමාගේ කර්මයෙන් ම නිරයට පිවිසියේ යයි වදාරා ඔවුන්ගේ වැරදි අදහස ප්‍රතික්ෂේප කරමින් මේ කාරණය මුල්කොට මේ සූත්‍රය වදාළහ.

එහි **අසද්ධම්මෙහි** යනු අසත්පුරුෂ ධර්මවලින් හෝ ශාන්ත නොවන ධර්මවලින්. **අතෙකිච්ඡො** යනු බුදුරජාණන් වහන්සේලා විසින්ද අවීචියෙහි ඉපදීමෙන් නොවැළැක්විය හැකි බැවින් පිළියම් නැති හෙයින් පිළියම් නොකළ හැක්කේ වෙයි. පිළියම් කිරීමට නුසුදුසු වූයේ යන අර්ථයි. නැති ගුණ වෙනුවෙන් ගෞරව ලැබීමේ අදහසින් පැවති ලාමක (පහත්) කැමැත්ත මොහුට ඇත්තේය යන අරුතින් පාපිච්ඡො නම් වෙයි. ඒ පහත් කැමැත්ත ඇති බව **පාපිච්ඡතා** ය. මම බුදු වන්නෙමි, සංඝයා පරිහරණය (පාලනය) කරන්නෙමියි යනුවෙන් ඔහුට කැමැත්තක් උපන්නේය. කෝකාලික ආදී වූ පාපී ලාමක මිත්‍රයෝ මොහුට ඇත්තාහුය යන අරුතින් පාපමිත්‍රයාය. ඔහුගේ පාප මිත්‍රයන් ඇති බව **පාපමිත්තතාය.** ඒ පාපමිත්‍ර භාවයෙන්. **උත්තරිං කරණීයෙ** යනු ධ්‍යාන අභිඥාවන්ගෙන් මත්තෙහි කළයුතු - ලැබිය යුතු මාර්ගඵල නොලැබූ කල්හිම එය නොලැබ (අවබෝධ නොකොට) යන අර්ථයි. **ඔරමත්තකෙන** යනු අල්පමාත්‍ර වූ ධ්‍යාන අභිඥා මාත්‍රයෙන්. **විසෙසාධිගමෙන** යනු උත්තරී මනුෂ්‍ය ධර්ම ලැබීමෙන්. **අන්තරා** යනු මැද්දෙහි. **වොසානං ආපාදි** යනු (අර්හත්වය ලැබීමෙන්) කටයුතු නිම නොකළ කෙනෙක්ව සිටිමින් ම කටයුතු නිමකළ (අර්හත්වය ලැබූ) කෙනෙක් වෙමියි සිතමින් ශ්‍රමණ ධර්මයෙන් විනාශයට පැමිණියේය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රයෙන් විශේෂ වශයෙන් පෘථග්ජන භාවයෙහි ආදීනව (දොස්) ප්‍රකාශ කළහ.

යම්හෙයකින් ධ්‍යානාභිඥාවන් කෙළවර කොට ඇති සම්පත් උපදවා ගෙනත් නොයෙක් අනර්ථ ගෙන දෙන නොයෙක් නොයෙක් දුකට හේතු වූ නැති ගුණ වෙනුවෙන් ගෞරව අපේක්ෂාව ද අසත්පුරුෂයන් සමග ගැවසීමද අලසකමින් යුක්ත වීමද දුරුනොකරන තැනැත්තා අවීචියෙහි කල්පයක් සිටින පිළියම් කළ නොහැකි දරුණු දුක් රැස් කරන්නේය. එහෙයින් පෘථග්ජන බව බැරෑරුම්ය.

ගාථාවන්හි **මා** යනු ප්‍රතික්ෂේප කිරීමෙහි නිපාතයකි. **ජාතු** යනු ඒකාන්තයෙන්. **කොචි** යනු සියල්ල ඇතුළත් (සබ්බ සංගාහක) වචනයකි.

**ලොකසමිං** යනු සත්ත්ව ලෝකයෙහි. මේ සත්ත්ව ලෝකයෙහි කිසියම් පුද්ගලයෙක් ඒකාන්තයෙන් ලාමක (පහත්) ආසා ඇත්තෙක් (පාපිච්ඡයෙක්) නොවේවා යන මෙය කියන ලද්දේ වෙයි. **තදමිනාපි ජානාථ පාපිච්ඡානං යථා ගති** යනු පහත් ආසා ඇති පුද්ගලයන්ගේ 'යථා ගති' යම්බඳු උපතක්, යම් බඳු පරලොවක් ඇද්ද එය මේ කාරණයෙන් ද දැනගනිව් යනුවෙන් දෙව්දත් දක්වමින් මෙසේ වදාළහ.

**පණ්ඩිතොති සමඤ්ඤාතො** යනු (බුද්ධ වචනය නම් වූ) පර්යාප්ති බහුශ්‍රැතභාවයෙන් පණ්ඩිතයයි දන්නා ලද. **භාවිතත්තොති සම්මතො** ධ්‍යාන-අභිඥාවන්ගෙන් වඩන ලද සිත් ඇති කෙනෙකැයි ගෞරවයට භාජනය වූ. එය එසේමය. ඒ දෙව්දත් තෙර පෙරදී 'ගොධි පුත්‍රයා මහත් ඍද්ධි ඇත්තේය. ගොධිපුත්‍රයා (දෙව්දත්) මහත් ආනුභාව ඇත්තේය'යි ධර්ම සේනාපති සැරියුත් මහරහතන් වහන්සේ විසින් ප්‍රශංසා කරන ලද්දේ විය. **ජලංව යසසා අට්ඨා දෙවදත්තොති විස්සුතො** යනු තමාගේ කීර්තියෙන් පිරිවරින් දිලිසෙන්නාක් මෙන් බබලන්නාක් මෙන් සිටියා වූ දෙව්දත් යනුවෙන් මෙසේ 'විස්සුතො' ප්‍රකට විය. 'මෙ සුතනති' යනුද පාඨයකි. මා විසින් අසන ලද ඇසීම් මාත්‍රයකි. දින කීපයකින්ම (දෙව්දත්) එසේ වූ බැවින් ඔහුගේ ඒ පණ්ඩිත බව ආදිය ඇසීම් මාත්‍රයක්ම විය යන අර්ථයි.

**සො සමාන මනුචිණ්ණො ආසජ්ජ තං තථාගතං** යනු මෙසේ වූ ඒ දෙව්දත් තෙමේ :

බුදුරජ තෙමේ ද ශාක්‍ය පුත්‍රයෙකි, මම ද ශාක්‍ය පුත්‍රයෙක් වෙමි.

බුදුරජ තෙමේ ද ශ්‍රමණයෙකි, මම ද ශ්‍රමණයෙක් වෙමි.

බුදුරජ තෙමේ ද ඍද්ධි ඇති කෙනෙකි, මම ද ඍද්ධි ඇති කෙනෙක්මි.

බුදුරජ තෙමේ ද දිවැස් ඇති කෙනෙකි, මම ද දිවැස් ඇති කෙනෙක්මි.

බුදුරජ තෙමේ ද දිවකන් ඇති කෙනෙකි, මම ද දිවකන් ඇති කෙනෙක්මි.

බුදුරජ තෙමේ ද පරසිත් දන්නා කෙනෙකි, මම ද පරසිත් දන්නා කෙනෙක්මි.

බුදුරජ තෙමේ ද අතීත අනාගත වර්තමාන ධර්මයන් දනියි, මම ද ඒවා දනිමි යනුවෙන් තමාගේ පමණ නොදැන සම්මා සම්බුදුරජාණන් වහන්සේ තමාට සමතැන තැබීමෙන් සමාන බවට පැමිණෙමින් දැන් මම බුදු වන්නෙමි. භික්ෂු සංඝයා පාලනය කරන්නෙමි යන අභිමානය ප්‍රයෝජන කොට ඇත්තේ තථාගතයන් වහන්සේට 'ආසජ්ජ' හිරිහැර කොට, වෙහෙසා

'පමාදමනුහීනො' යනුවෙන් ද කියති. කියන ලද ආකාරයෙන් ප්‍රමාදයට පැමිණෙමින් ප්‍රමාදය නිසා භාග්‍යවතුන් වහන්සේ සමග යුගග්‍රාහයට (සමාන බවට) සිත් ඇතිකර ගැනීමත් සමග ම ධ්‍යාන අභිඥාවන්ගෙන් පිරිහුනේ වෙයි. **අවීචි නිරයං පතෙතා චතුද්වාරං භයානකං** යනු ගිනිදැල්වලින් හෝ එහි උපන් සත්ත්වයන්ගෙන් හෝ අතරක් නැති බැවින් අවීචි යනුවෙන් ලබන ලද නම් ඇති සතර පැත්තෙහි මහ දොරටු සතරක් යෙදීමෙන් දොරටු සතරක් ඇති අති භයානක මහා නිරයට පිළිසිඳ ගැනීම් ආදී වශයෙන් පැමිණියේ ය. එය එසේම කියන ලදී.

**චතුක්කණ්ණො චතුද්වාරො විභත්තො භාගසො මිතො**
**අයො පාකාර පරියන්තො අයසා පටිකුජ්ජිතො**

**තස්ස අයොමයා භූමි ජලිතා තෙජසා යුතා**
**සමන්තා යොජන සතං ඵරිත්වා තිට්ඨති සබ්බදා**[1]

ඒ මහා නිරයට කොන් සතරක් ඇත. දොරටු සතරක් ඇත. වෙන වෙනම කොටස් වශයෙන් බෙදන ලද යකඩ බැම්මෙන් වටකරන ලදී. යකඩ පියනින් වසන ලදී. ඒ නරකයේ යකඩින් කළ බිම ඇත. එය ද ගින්නෙන් දිලිසෙයි. ගිනිදලු සහිතය. හැමදා අවට යොදුන් සියයක් තැන පැතිර සිටියි.

**අදුට්ඨස්ස** යනු දූෂිත නොවූ සිත් ඇති තැනැත්තාට. **දුබ්භෙ** යනු ද්‍රෝහ කරන්නේ නම් **තමෙව පාපං ඵුසති** යනු දූෂිත නොවූ තැනැත්තාට ද්‍රෝහී වූ ඒ පාප පුද්ගලයා වෙත 'පාපං' හීන වූ පාපයේ විපාකය තෙමේ 'ඵුසති' පැමිණෙයි. (ඒ පාප පුද්ගලයා) මැඩගනියි. හෙස්මා* යනු මහත් බැවින් ද ගැඹුරු බැවින් ද බියට පත්කරන්නාක් මෙන්, මහත් ගැඹුර යන අර්ථයි. **වාදෙන** යනු දොස් නැගීමෙන්. **විහිංසති** යනු බාධා කරයි - හිරිහැර කරයි. **වාදො තම්හි න රූහති** යනු ඒ තථාගතයන් වහන්සේ කෙරෙහි අනුන් විසින් ආරෝපනය කරන දෝෂය 'න රූහති' නො සිටියි. සමුද්‍රයට විෂ කළයක් දැමීමෙන් දූෂණය කරන්නට නොහැක්කාක් මෙන් උන්වහන්සේගේ විකාරයක් නූපදියි යන අර්ථයි.

---

1. ම.නි. බාල පණ්ඩිත සුත්ත. බු.ජ.මු. 3 භා 366 පිට

* පෙළෙහි **යස්මා** ද **තස්මා** ද ඇත.

මෙසේ ගාථා හයකින් පාපිච්ඡතා ආදියෙන් යුක්ත පුද්ගලයාගේ නිරයට පැමිණෙන බව දැක්වීමෙන් දුකින් නොමිදුණු බව දක්වා දැන් එයට ප්‍රතිපක්ෂ වූ ධර්මයෙන් යුක්ත වූ තැනැත්තාගේ දුක් ක්‍ෂය වීම දක්වමින් 'තාදිසං මිත්තං' යන අවසාන ගාථාව වදාළහ. එහි අර්ථය **යස්ස** මනාව පිළිපැදීමෙන් යුක්ත වූ තැනැත්තාගේ **මග්ගානුගො** ප්‍රතිපත්ති මාර්ගය අනුව ගිය මනාව පිළිපන් තැනැත්තා. අල්පේච්ඡතාදී ගුණයෙන් යුක්ත වූ හෙයින් සියලු සංසාර **දුක්ඛස්ස ඛයො** දුකේ ක්‍ෂයවීමට අවසානයට පැමිණෙන්නේය. එබඳු බුදුකෙනෙකුන් හෝ බුදුසච්වකු හෝ **පණ්ඩිතො** ප්‍රඥාව ඇති තැනැත්තා තමාගේ, **මිත්තං කුබ්බෙථ** ඔහු සමග මිතුරුබව කරන්නේය, ඔහු සේවනය කරන්නේය, ඔහුම ඇසුරු කරන්නේය.

**දසවන සූත්‍රය යි.**

මෙසේ මේ වර්ගයෙහි හයවන සත්වන සූත්‍රවල නිවන (විවට්ට) කියන ලදී. අනිත් සූත්‍රවල සසර හා නිවන (වට්ට විවට්ට) කියන ලදී.

**සතරවන වර්ග වර්ණනාව නිමියේ ය.**

# 3.5.1

පස්වන වර්ගයෙහි පළමු සූත්‍රයෙහි **අග්ගප්පසාදා** යන මෙහි මේ අග්ග ශබ්දය ආදි (මුල), කෝටි (කෙළවර අග), කොට්ඨාස (කොටස) සෙට්ඨ (ශ්‍රේෂ්ඨ) යන අර්ථවල දක්නා ලැබේ. එය එසේමය. '**අජ්ජතග්ගෙ සම්ම දොවාරික ආවරාමි ද්වාරං නිගණ්ඨානං නිගණ්ඨීනං**'[1] 'යහළු දොරටුපාලය, අද සිට (අද මුල්කොට) නිගණ්ඨයන්ටත් නිගණ්ඨියන්ටත් දොර වසමි' '**අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතං**'[2] 'අද සිට දිවිහිම්කොට සරණ ගිය' ආදියෙහි මුල යන අර්ථයෙහි දක්නා ලැබේ. '**තෙනෙව**

1-2 ම.නි. උපාලි සූත්‍රය

**අංගුලග්ගෙන තං අංගුලග්ගං පරාමසෙය්‍ය** 'ඒ ඇඟිලි අගින් ම ඒ ඇඟිලි අග ස්පර්ශ කරන්නේ ද' **'උච්ඡග්ගං වෙලග්ගං'**[1] උක්ගස් කෙළවර, උණගස් කෙළවර ආදියෙහි කෙළවර යන අර්ථයෙහි දක්නා ලැබේ. **'අම්බිලග්ගං වා මධුරග්ගං වා තිත්තකග්ගං වා අනුජානාමි භික්ඛවෙ විහාරග්ගෙන වා පරිවෙණග්ගෙන වා භාජේතුං'** 'මහණෙනි, ඇඹුල් කොටස හෝ මිහිරි කොටස හෝ තිත්ත කොටස හෝ විහාර ගණනින් හෝ පිරිවෙන් ගණනින් බෙදන්නට අනුදනිමි යනාදියෙහි කොටස යන අර්ථයෙහි ද **'අයං ඉමෙසං චතුන්නං පුග්ගලානං අග්ගො ච සෙට්ඨො ච උත්තමො ච පවරො ච'** 'මේ පුද්ගලයන් සතරදෙනා අතරින් මොහු අග්‍ර ද ශ්‍රේෂ්ඨ ද උතුම් ද ප්‍රවර ද **'අග්ගොහමස්මි ලොකස්ස'** 'මම ලෝකයට අග්‍ර වෙමි' යනාදියෙහි ශ්‍රේෂ්ඨ යන අර්ථයෙහි ද දක්නා ලැබේ. මෙහි ද ඒ මේ අග්ග ශබ්දය ශ්‍රේෂ්ඨ අර්ථයෙහිම යයි දතයුතුය. අග්‍ර වූ දේවල් කෙරෙහි ශ්‍රේෂ්ඨ වූ දේවල් කෙරෙහි ප්‍රසාදයෝ හෝ අග්‍ර වූ ශ්‍රේෂ්ඨ වූ ප්‍රසාදයෝ = අග්ගප්පසාදා යන අර්ථයි. (අග්‍ර වූ දේවල් කෙරෙහි යන) මුල් අර්ථයෙහිද අග්ග ශබ්දයෙන් බුද්ධාදී රත්නත්‍රය කියනු ලැබේ.

ඒවා අතරින් පළමුකොට භාග්‍යවතුන් වහන්සේ අසමාන අර්ථයෙන්ද ගුණ විශිෂ්ට අර්ථයෙන් ද අසමසම අර්ථයෙන් ද අග්‍රයහ. උන්වහන්සේ මහාභිනීහාරය (බුදුබව පැතීම) ද දසපාරමිතාවන් පිරීමද මුල්කොට ඒ බෝධිසම්භාර ගුණවලින් මෙන්ම බුදුගුණවලින්ද සෙසු ජනයන් සමග අසමාන වූවාහු යි අසමාන අර්ථයෙන් අග්‍රයහ. මහාකරුණාදී යම් ගුණධර්ම ඇද්ද ඒවා සෙසු සත්ත්වයන්ගේ ගුණයන්ට වඩා විශිෂ්ටයයි ගුණවිශිෂ්ට අර්ථයෙන් ද සියලු සත්ත්වයන්ට උතුම් බැවින් අග්‍රයහ.

කලින් වැඩසිටි සම්මා සම්බුදුරජාණන් වහන්සේලා සියලු සත්ත්වයන් සමග අසමානයහ. ඒ සම්මා සම්බුදුරජාණන් වහන්සේලා සමග මේ (ගෞතම) සම්මා සම්බුදුරජාණන් වහන්සේම රූපකාය ගුණවලින් මෙන්ම ධර්මකාය ගුණවලින් ද සමාන වෙතියි අසමසම අර්ථයෙන් ද අග්‍රයහ. එසේම දුර්ලභ වශයෙන් පහළවන බැවින් ද අසිරිමත් මිනිස්බවක් ඇති බැවින් ද බොහෝ ජනයාට හිතසුව ගෙන දෙන හෙයින්ද දෙවැන්නෙක් නැති සහායකයෙක් නැති (අද්‍වතිය - අසහාය) බැවින් ද භාග්‍යවතුන් වහන්සේ ලෝකයෙහි අග්‍රයහයි කියනු ලැබේ. ඒ බව මෙසේ වදාළහ.

---

1. විසුද්ධි මග්ග - වායෝ කසිණ

**'එකපුග්ගලස්ස භික්ඛවෙ පාතුභාවො දුල්ලභො ලොකස්මිං කතමස්ස එකපුග්ගලස්ස? තථාගතස්ස අරහතො සම්මා සම්බුද්ධස්ස'**

'මහණෙනි, එක් පුද්ගලයෙකුගේ පහළවීම ලෝකයෙහි දුර්ලභය. කවර එක් පුද්ගලයෙකුගේ ද? තථාගත අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේය.

**'එකපුග්ගලො භික්ඛවෙ ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති අච්ඡරිය මනුස්සො'**

'මහණෙනි, ලෝකයෙහි එක් පුද්ගලයෙක් ඉපදීමට සමත් වූයේ ආශ්චර්යමත් මනුෂ්‍යයෙක්ව උපන්නේ වෙයි. (ලෝකයෙහි එක් අසිරිමත් පුද්ගලයෙක් උපන්නේය.)

**'එකපුග්ගලො භික්ඛවෙ ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජන -පෙ- සම්මා සම්බුද්ධො'**

'මහණෙනි, එක් පුද්ගලයෙක් ලෝකයෙහි ඉපදීමට සමත් වූයේ බොහෝ දෙනාට -පෙ- උපන්නේ වෙයි. සම්මා සම්බුදුරජාණන් වහන්සේය.

**'එකපුග්ගලො භික්ඛවෙ ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති - අදුතියො අසහායො අප්පටිමො අප්පටිසමො අප්පටිභාගො අප්පටි පුග්ගලො අසමො අසමසමො දිපදානං අග්ගො කතමො එකපුග්ගලො? තථාගතො අරහං සම්මා සම්බුද්ධො'ති**

'මහණෙනි, එක් පුද්ගලයෙක් ලෝකයෙහි ඉපදීමට සමත් වූයේ (වෙනත් සර්වඥ බුදුකෙනෙකුගේ ඉපදීමක් නැති හෙයින්) අද්විතීය ව (බුදු සිරුරට හෝ අවබෝධ කළ ධර්මයට හෝ සමාන වූවක් නැති හෙයින්) අසහාය ව (බුදු සිරුරට සමාන වෙනත් ප්‍රතිමාවක් නැති හෙයින්) අප්‍රතිම ව (බුදුසිරුරට සමාන බාහිර කිසිවෙක් නැති හෙයින්) අප්‍රතිසමව (බුද්ධ දේශිත ධර්මය වෙනත් අයුරකින් දේශනා කිරීමට සමත් වූවෙක් නැති හෙයින්) අප්‍රතිභාග ව (මම බුදුකෙනෙක් වෙමියි කීමට සමත් අනිකකු නැති හෙයින් අප්‍රති පුද්ගලව, (අන් කිසිවෙකුටත් සමාන නැති

හෙයින්) අසම ව, (පැරණි බුදුවරුන් හා සමාන හෙයින්) අසමසම ව දෙපා ඇති අයට අග්‍රව උපන්නේ වෙයි. කවර එක් පුද්ගලයෙක් ද? තථාගත අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේය.

ධර්මය ද සංඝයා ද අනිත් ධර්ම හා සංඝයා සමග අසමාන අර්ථයෙන් ද විශිෂ්ට ගුණ ඇති බැවින් ද දුර්ලභ පහළවීම් ආදියෙන් ද අග්‍රය. එය එසේමය. ඒ බුද්ධ දේශනාවේ ස්වාක්ඛාතාදී ගුණ විශේෂයන්ට බුද්ධශ්‍රාවක සංඝයාගේ සුපටිපන්නතාදී ගුණ විශේෂයන්ට සමාන වූ හෝ ස්වල්පයක් පහත් වූ හෝ අනිත් ධර්මයක්, සංඝයා කෙනෙක් නැත්තේය. ඊට වඩා ශ්‍රේෂ්ඨ වූවක් කොයින්ද? තෙමේ ම අනිත් ගුණයන්ට වඩා විශිෂ්ට ගුණ ඇති බැවින් ශ්‍රේෂ්ඨය. එසේම ඒවා දුර්ලභ ඉපදීම, අසිරිමත් බව, බොහෝ ජනයාට හිතසැප ගෙනදීම, අද්විතීය, අසහාය ආදී ස්වභාවයෙන් ද ශ්‍රේෂ්ඨය. යම් කරුණකින් භාග්‍යවතුන් වහන්සේ දුර්ලභව පහළවන සේක් ද ඒ කරුණෙන් ධර්මය ද සංඝයා ද දුර්ලභව පහළ වෙයි. අසිරිමත් බව ආදියෙහි ද මේ ක්‍රමයමයි.

මෙසේ අග්‍ර වූ ශ්‍රේෂ්ඨ වූ උත්තම වූ ප්‍රවර වූ ගුණ විශිෂ්ට වූ රත්නත්‍රය කෙරෙහි ප්‍රසාදයෝ = **අග්ගපපසාදා** අග්‍ර ප්‍රසාදයෝ යි. දෙවන අර්ථයෙහි වනාහි කියන ලද ආකාර ඇති අග්‍ර වූ බුද්ධාදිය කෙරෙහි උපන් අග්‍ර වූ ප්‍රසාදයෝ අග්‍ර ප්‍රසාදයෝයි. ආර්යමාර්ගයෙන් ආවා වූ යම් නොසෙල්වෙන ප්‍රසාද කෙනෙක් ඇද්ද ඒකාන්තයෙන් ඒ ප්‍රසාදයෝ අග්‍ර වූ ප්‍රසාදයෝ යන අරුතින් අග්‍රප්‍රසාද නම් වෙති. ඒ බව **'ඉධ භික්ඛවෙ අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති'** 'මහණෙනි, මේ සසුනෙහි ආර්යශ්‍රාවක තෙමේ බුදුරජාණන් වහන්සේ කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ වෙයි' යනාදිය මෙසේ වදාළහ. අග්‍ර වූ විපාක ඇති බැවින් ද ඒවා අග්‍රප්‍රසාද නම් වේ. 'අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො' යනුවෙන් එය දේශනා කරන ලදී. **යාවතා** යනු යම්තාක්. **සත්තා** යනු ප්‍රාණීහු. **අපදා** යනු පා නැති. **ද්විපදා** යනු දෙපා ඇති. ඉතිරි පද දෙකෙහි ද මේ ක්‍රමයමයි. වා ශබ්දය සමුච්චය (එක්කිරීම්) අර්ථ ඇත්තේ වෙයි. විකල්ප (සියල්ල ඇතුළත් නැති) අර්ථ ඇත්තේ නොවෙයි. **"අනුප්පන්නො වා කාමාසවො උප්පජ්ජති උප්පන්නො වා කාමාසවො පවඩ්ඪති"** යන්න මෙනි. මෙහි අනුප්පන්නො ච උප්පන්නො ච (නූපන්නා වූ ද උපන්නා වූ ද) යන අර්ථ ඇත්තේය.

'භූතානං වා සත්තානං ඨිතියා සම්භවෙසීනං වා අනුග්ගහාය' යන්න මෙනි. මෙහි භූතානං ච සම්භවෙසීනං ච (ඉපදීම අවසන් කළ සත්ත්වයෝද මතු ඉපදීම සොයන සත්ත්වයෝ ද) යන අර්ථ ඇත්තේය. 'අග්ගිතො වා උදකතො වා මිථුභෙදතො වා' යන්න මෙනි. මෙහි අග්ගිතො ච උදකතො ච මිථුභෙදතො ච (ගින්නෙන් ද ජලයෙන් ද මිත්‍රභේදයෙන් ද) යන අර්ථ ඇත්තේය. මෙසේ අපදා වා -පෙ- අග්ග මක්ඛායති යන මෙහි ද අපදා ච ද්විපදා ච යනුවෙන් සම්පිණ්ඩන වශයෙන් අර්ථය දතයුතුයි. එහෙයින් 'සමුච්චයත්ථො වා සද්දො න විකප්පත්ථො'යි කියන ලදී.

රූපිනො යනු රූපය ඇත්තා වූ. රූපය නැත්තා වූ යන අරුතින් අරූපිනො වෙයි. සඤ්ඤිනො යනු සඤ්ඤාව ඇත්තා වූ. සඤ්ඤාව නැත්තා වූ යන අරුතින් අසඤ්ඤිනො වෙයි. නෙවසඤ්ඤානාසඤ්ඤිනො නම් භවාග්‍රයට ඇතුළත් වූ. මෙපමණකින් ධර්මරාජයන් වූ බුදුරජාණන් වහන්සේ කාමභවය, රූපභවය, අරූපභවය, ඒකවෝකාරභවය, චතුවෝකාර භවය, පංචවොකාර භවය, සඤ්ඤීභවය, අසඤ්ඤීභවය, නෙවසඤ්ඤී නාසඤ්ඤී භවය යන නව ආකාර භවයෙහි සත්ත්වයන් ඉතිරි නොකොට ගෙන දැක්වූහ.

මෙහි රූපය ගැනීමෙන් කාමභවය ද රූප භවය ද පංචවෝකාර භවය ද ඒකවෝකාර භවය ද දක්වන ලදී. අරූපය ගැනීමෙන් අරූපභවය ද චතුවෝකාර භවය ද දක්වන ලදී. සඤ්ඤීභව ආදිය වනාහි ස්වරූප වශයෙන් ම දක්වන ලදී. අපදා (පා නැති) ආදිය ගැනීමෙන් කාමභව පංචවොකාර භව සඤ්ඤීභවයන්ගේ එක් කොටසක් දක්වන ලදී.

කුමක්නිසා වනාහි මෙහි දෙවන සූත්‍රයෙහි මෙන් 'දිපදානං අග්ගො' යනුවෙන් දෙපා ඇත්තවුන්ගේ ගැනීම නොකොට අපදා ආදිය ගැනීම කරන ලද ද? (එයට පිළිතුරු මෙසේ) කියනු ලැබේ. දෙවන සූත්‍රයෙහි වඩා ශ්‍රේෂ්ඨ වශයෙන් දිපද (දෙපා ඇත්තවුන්ගේ) ගැනීම ම කරන ලදී. මේ ලෝකයෙහි ශ්‍රේෂ්ඨයෙක් උපදින්නේ නම් පා නැති සිවු පා ඇති බොහෝ පා ඇති සතුන් අතර නූපදී. දෙපා ඇත්තවුන් අතුරෙහි ම උපදියි. කවර දෙපා ඇති සතුන් අතුරෙහි ද? මිනිසුන් අතුරෙහි ද දෙවියන් අතුරෙහි ද උපදියි. මිනිසුන් අතර උපදින්නේ සියලු ලෝකය වසඟයෙහි

පවත්වන්නට සමත් බුදුකෙනෙක් වී උපදී. අංගුත්තර අට්ඨකථාවෙහි වනාහි තිසහස්සී මහාසහස්සී ලෝකධාතුව වසඟයෙහි පවත්වන්නට සමත්යයි කියන ලදී. දෙවියන් අතර උපදින්නේ දසසහශ්‍රී ලෝකධාතුව වසඟයෙහි පවත්වන්නා වූ මහාබ්‍රහ්මයා වී උපදී. ඔහු බුදුරජාණන් වහන්සේගේ කැපකරුවෙකු බවට හෝ ආරාමිකයකු බවට පැමිණේ. මෙසේ එයටත් වඩා ශ්‍රේෂ්ඨ වශයෙන් ම දෙපා ඇත්තවුන් අතුරින් අග්‍රයයි එහිදී කියන ලදී. මෙහි වනාහි ඉතිරි නොකොට ගැනීම් වශයෙන් 'යාවතා හි සත්තා අත්තභාව පරියාපන්නා අපදා වා -පෙ- නෙවසඤ්ඤී නාසඤ්ඤිනො වා තථාගතො තෙසං අග්ගමක්ඛායති' යනුවෙන් මෙසේ කියන ලදී. මෙය නිද්ධාරණයෙහි (සමූහයකින් එකක් වෙන්කොට ගැනීමෙහි) සාමි (ෂෂ්ඨී) වචනයකි. ම කාරය පද සන්ධි කරන්නේ වෙයි. අග්ගො අක්ඛායති යනු පද විභාගයයි.

**අග්ගො විපාකො හොති** යනු අග්‍ර වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ කෙරෙහි පැහැදුනවුන්ගේ යම් ප්‍රසාදයක් වේද එය අග්‍ර වූයේ ද ශ්‍රේෂ්ඨ වූයේ ද උත්තම වූයේ ද (සියල්ලට) මත්තෙහි පිහිටියේ ද වෙයි. එහෙයින් එහි විපාකය ද අග්‍ර වූයේ ශ්‍රේෂ්ඨ වූයේ උත්තම වූයේ (සියල්ලට) මත්තෙහි පිහිටියේ වඩා උදාර වූයේ වඩා ප්‍රණීත වූයේ ද වෙයි. ඒ ප්‍රසාදය ලෞකික ලෝකෝත්තර භේදයෙන් දෙපරිදිය.

ඒවා අතුරෙන් පළමුව ලෞකික ප්‍රසාදය පිළිබඳව

**යෙ කෙචි බුද්ධං සරණං ගතාසෙ**
**න තෙ ගමිස්සන්ති අපායං**
**පහාය මානුසං දෙහං**
**දෙවකායං පරිපූරෙස්සන්ති**[1]

යමෙක් බුදුන් සරණ ගියාහු ද ඔවුහු අපායට නොයති. මිනිස් කය අතහැර දිව්‍ය කය සම්පූර්ණ කරති. (දෙවියන් අතර උපදිති)

**බුද්ධොති කිත්තයන්තස්ස යස්ස කායෙ භවති පීති**
**වරමෙව හි සා පීති කසිණෙනපි ජම්බුදීපස්ස**

1. දී.නි. මහාසමය සූත්‍රය

බුද්ධ යනුවෙන් කියන්නා වූ යමෙකුගේ කයෙහි යම් ප්‍රීතියක් වේද, ඒ ප්‍රීතිය දඹදිව තරම් විශාල කසිණයකින් උපදින ප්‍රීතියට වඩා උතුම්ය.

සතං හත්ථී සතං අස්සා - සතං අස්සතරී රථා
සතං කඤ්ඤා සහස්සානි - ආමුත්තමණිකුණ්ඩලා
එකස්ස පදවීතිහාරස්ස - කලං නාග්ඝන්ති සොළසිං[1]

ලක්‍ෂයක් ඇත්තු ද ලක්‍ෂයක් අශ්වයෝ ද ලක්‍ෂයක් අශ්වතරියෝ ද (එනම් කොටළුවාට දාව වෙළඹට උපන් වෙළඹුන්) ලක්‍ෂයක් වාහන (රිය) ද මිණිකොඩොල් ආභරණවලින් සරසන ලද ලක්‍ෂයක් කන්‍යාවෝද (යන ලාභ ලැබුනත් ඒවා බුදුන් දකින්නට යන තැනැත්තාගේ) එක් පියවරක් දහසයකට බෙදා ඒ එක් කොටසක් නැවත දහසයකට බෙදාගත් විට ලැබෙන කොටසක් තරම්වත් නොවටී.

'සාධු ඛො දෙවානමින්ද බුද්ධං සරණගමනං හොති, බුද්ධං සරණගමන හෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති : දිබ්බෙන ආයුනා, දිබ්බෙන වණ්ණෙන, දිබ්බෙන සුඛෙන, දිබ්බෙන යසෙන, දිබ්බෙන ආධිපතිතෙය්‍යෙන, දිබ්බෙහි රූපෙහි, දිබ්බෙහි සද්දෙහි, දිබ්බෙහි ගන්ධෙහි, දිබ්බෙහි රසෙහි, දිබ්බෙහි ඵොට්ඨබ්බෙහී'ති

දෙවියන්ට අධිපති ශක්‍රය, බුදුන් සරණ යාම යහපත් වෙයි. බුදුන් සරණ යාම හේතුවෙන් ශක්‍රය, මෙලොව ඇතැම් සත්ත්ව කෙනෙක් කය බිඳීමෙන් මරණින් පසු සුගති නම් වූ ස්වර්ග ලෝකයට පැමිණෙත්. ඔවුහු දිව්‍ය ආයුෂයෙන්, දිව්‍ය වර්ණයෙන්, දිව්‍ය සැපයෙන්, දිව්‍ය යසසින් (පරිවාර සම්පත්තියෙන්) දිව්‍ය අධිපතිබවෙන්, දිව්‍ය රූපවලින්, දිව්‍ය ශබ්දවලින් දිව්‍ය ගන්ධවලින්, දිව්‍ය රසවලින්, දිව්‍ය ඵොට්ඨබ්බවලින් යන කරුණු දහයෙන් අනිත් දෙවිවරුන්ට වඩා ශ්‍රේෂ්ඨ වෙති යන මේ ආදී සූත්‍ර පදයන්ගේ වශයෙන් ප්‍රසාදය පිළිබඳ ඵල විශේෂ යෙදීම දතයුතුය. එහෙයින් ඒ ලෞකික ප්‍රසාදය අපාය දුක් ඉවතට දැමීම සමග සම්පත්ති භවයන්හි සැපවිපාක දායකයෙකැයි දතයුතුය. ලෝකෝත්තර ප්‍රසාදය වනාහි ශ්‍රමණකමෙහි ඵලවිපාක දෙන්නෙකැයි ද සසරදුක් ඉවතට දමන්නෙකැයි ද දතයුතුය. මේ සියලු ප්‍රසාදය පිළිවෙළින් සසර දුක ඉවත දමන්නේමය.

1. සං.නි. යක්ඛ සංයුත්තය. බු.ජ.මු. 1 භා - 376 පිට

ඒ කාරණය 'මහණෙනි, යම්කලෙක ආර්ය ශ්‍රාවකයා තමාගේ ශ්‍රද්ධාව සිහි කරයි ද එසමයෙහි ඔහුට රාගයෙන් මැඩගත් සිතක් ඇති නොවේ. ද්වේෂයෙන් මැඩගත් සිතක් ඇති නොවේ. මෝහයෙන් මැඩගත් සිතක් ඇති නොවේ. එසමයෙහි ඔහුගේ සිත ඍජු වූයේ ම වෙයි. ඍජු වූ සිත් ඇත්තහුට ප්‍රමෝදය (බලවත් නොවූ ප්‍රීතිය) උපදී. ප්‍රමුදිත වූවහුට ප්‍රීතිය (බලවත් ප්‍රීතිය) උපදී -පෙ- මේ සඳහා කළයුතු අනිකක් නැතැයි දැනගනියි' යනුවෙන් දේශනා කරන ලදී.

**ධම්මා** යනු ස්වභාව ධර්මයෝය. **සංඛතා** යනු එකට එක්ව හටගෙන ප්‍රත්‍යවලින් කරනලද අර්ථයෙන් සංඛතා නම් වේ. ප්‍රත්‍ය සහිත ධර්මයෝ ය. හේතුවලින් ද ප්‍රත්‍යවලින් ද කිසිවකු විසින් ද නොකරන ලද අර්ථයෙන් **අසංඛතා** නම් වේ. ප්‍රත්‍ය නැති නිවනය. සංඛත ධර්මයන්ට ප්‍රතිවිරුද්ධ භාවයෙන් අසංඛත යනු වෙන්වූ වචනයකි. **විරාගො තෙසං අග්ගමක්ඛායති** යනු ඒ සංඛත අසංඛත ධර්ම අතරින් යම් විරාග නම් වූ අසංඛත ධර්මයක් වේද එය ස්වභාවයෙන් ම මෘදු තියුණු භාවයෙන් වඩාත් ශාන්ත භාවයෙන් වඩාත් ප්‍රණීත භාවයෙන් ගැඹුරු ආදී භාවයෙන් මද මර්දනය කිරීම් ආදී භාවයෙන් ද අග්‍රයයි ද ශ්‍රේෂ්ඨ යයි ද උත්තම යයි ද ප්‍රවරයයිද කියනු ලැබේ. **යදිදං** යනු නිපාතයකි. යම් මේ (යො අයං) යන අර්ථයි.

**මදනිම්මදනො** යනාදී සියල්ල නිවනට සමාන වචනමය. එය එසේමය. නිවනට පැමිණ මාන මද පුරිස මද ආදී සියලු මදය මඩිනු ලැබේ. යටත් කරනු ලැබේ. කාමපිපාසාදී සියලු පිපාස පහකරනු ලැබේ. කාම ආලය ආදී සියලු ආලය සහමුලින් නසනු ලැබේ. සියලු කර්ම වෘත්තය, ක්ලේශ වෘත්තය, විපාක වෘත්තය සිඳ දමයි. එකසිය අටවැදෑරුම් වූ සියලුම තෘෂ්ණාව ගෙවෙයි. සියලු කෙලෙස් නො ඇලෙයි. සියලු දුක් නිරුද්ධ වෙයි. එහෙයින් මදනිම්මදනො -පෙ- නිරොධො යනුවෙන් කියනු ලැබේ. යම් ඒ තෘෂ්ණාවක් වේද එය භවයෙන් භවය, ඵලයෙන් කර්මය හික්මවයි, මසයි යනුවෙන් (අර්ථ ඇති) කොට වාන යයි කියනු ලැබේ. ඒ වානය මෙහි නැත. නිවන අවබෝධ කළ කල්හි ආර්ය පුද්ගලයාට එය නැත්තේය යන අරුතින් හෝ **නිබ්බාණං** නම් වේ.

**අග්ගො විපාකො හොති** යන මෙහි ද 'යෙ කෙචි ධම්මං සරණං ගතාසෙ -පෙ-' 'ධම්මොති කිත්තයන්තස්ස යස්සකායෙ භවති පීති' 'සාධු ඛො දෙවානමින්ද ධම්මං සරණාගමනං හොති, ධම්මං සරණාගමන හෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ -පෙ- දිබ්බහි පොට්ඨබ්බෙහි' යන මේ ආදී සූත්‍ර පදයන්ගේ වශයෙන් ධර්මය කෙරෙහි ඇති ප්‍රසාදය පිළිබඳ ඵල විශේෂ යෙදීම දතයුතුය. මෙසේ මෙහි අසංඛත ධර්ම වශයෙන්ම අග්‍රභාවය ආයේ වෙයි. සියලු සංඛතයන්ගෙන් නික්මීම දැක්වීම පිණිස ආර්යමාර්ග වශයෙන් ද මේ අර්ථය ලැබෙන්නේමය. ඒ කාරණය **'යාවතා භික්ඛවෙ ධම්මා සංඛතා අරියො අට්ඨංගිකො මග්ගො තෙසං අග්ගමක්ඛායති'** මහණෙනි, යම්තාක් සංඛත ධර්ම වේද ඒවා අතරින් ආර්ය අෂ්ඨාංගික මාර්ගය අග්‍රයයි කියනු ලැබේ යනුවෙන් ද **'මග්ගානට්ඨංගිකො සෙට්ඨො'** මාර්ග අතරින් ආර්ය අෂ්ටාංගික මාර්ගය ශ්‍රේෂ්ඨයයි ද දේශනා කරන ලදී.

**සංඝා වා ගණා වා** යනු ලෝකයෙහි ජනසමූහ නම් වූ යම්තාක් සංඝ වූ හෝ ගණ වූ හෝ. **තථාගත සාවක සංඝො** යනු ආර්ය පුද්ගලයන් අටදෙනාගේ සමූහය නම් වූ දෘෂ්ටියෙන් ද ශීලයෙන් ද යන සමාන බවෙන් ස්ථිර වූ තථාගතයන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා.

**තෙසං අග්ගමක්ඛායති** යනු තමාගේ සීල-සමාධි-පඤ්ඤා-විමුත්ති ආදී ගුණ විශේෂ කරණ කොටගෙන ඒ සංඝයා අතරින් අග්‍ර වූයේ, ශ්‍රේෂ්ඨ වූයේ උත්තම වූයේ, ප්‍රවර වූයේ යයි කියනු ලැබේ. **යදිදං** යනු (යානි ඉමානි) යම් මේ. **චත්තාරි පුරිසයුගානි** යනු යුගල වශයෙන් පළමු (සෝවාන්) මාර්ගයට පත් වූ තැනැත්තා පළමු ඵලයට පත් වූ තැනැත්තා යනුවෙන් මේ එක යුගලයකි. සතරවන මාර්ගයට පත්වූ තැනැත්තා සතරවන ඵලයට පත්වූ තැනැත්තා තෙක් මේ එක් යුගලයකැයි මෙසේ පුරිසයුග සතරකි. **අට්ඨපුරිස පුග්ගලා** යනු පුරුෂ පුද්ගල වශයෙන් පළමු මාර්ගයට පත්වූ එක්කෙනෙක් ද පළමු ඵලයට පත්වූ එක්කෙනෙක්දැයි මේ ක්‍රමයෙන් පුරුෂ පුද්ගලයෝ අටදෙනෙක් වෙති. මෙහි පුරිස යනුවෙන් ද පුග්ගල යනුවෙන් ද එන මේ පද එක් අර්ථ ඇත්තේය. හික්මවිය යුතු පුද්ගලයන්ගේ වශයෙන් වනාහි මෙය දේශනා කරන ලදී. **එස භගවතො සාවකසංඝො** යනු යම් මේ යුග වශයෙන් පුරිස යුග සතරක් වේද වෙන් වශයෙන් භාග්‍යවතුන් වහන්සේගේ මේ ශ්‍රාවක සංඝයා පුරුෂ පුද්ගල වශයෙන් අටදෙනෙකි.

**ආහුනෙය්‍යො** යනාදියෙහි ගෙනවුත් පූජා කළයුතුය යන අරුතින් ආහුන නම්. දුර සිට වුවත් අවුත් සිල්වතුන් කෙරෙහි දිය යුතුය යන අර්ථයි. මෙය සිවුපසයට වචනයකි. මහත්ඵල භාවය ඇති කිරීම් වශයෙන් ඒ ආහුනය (සිවුපසය) පිළිගැනීමට සුදුසුය යන අරුතින් ආහුනෙය්‍ය නම් වේ. නැතහොත් දුරසිට අවුත් වුවද සියලු වස්තුව පවා මෙහි පූජා කළ යුතුය, සත්කාරාදීන්ගේ පිදීමට (යාගයට) සුදුසුය යන අරුතින් ආහවනීය නම් වේ.

බමුණන්ගේ යම් මේ ආහවනීය නම් ගින්නක් වේද, යම් තැනක පුදන ලද දෙය මහත් ඵලයැයි ඔවුන්ගේ විශ්වාසයක් වේද ඉදින් එය හෝමයේ මහත්ඵල බැවින් ආහවනීය (දුරසිට පිදිය යුතු) වේ. සංඝයාම පිදීමට සුදුසුය - සංඝයා කෙරෙහි පිදීම වනාහි මහත්ඵල වෙයි. ඒ බව මෙසේ වදාළහ.

**යො ච වස්සසතං ජන්තු අග්ගිං පරිචරෙ වනෙ**
**එකඤ්ච භාවිතත්තානං මුහුත්තමපි පූජයෙ**
**සා යෙව පූජනා සෙය්‍යො යඤ්චෙ වස්සසතං හුතං**

යම් පුද්ගලයෙක් වනයෙහි අවුරුදු සියයක් ගිනි පුදයි ද දමනය කළ ඉඳුරන් ඇති එක් අයෙකුට මොහොතක් වුවද පුදයි ද වසර සියයක් කරන ගිනි පිදීමට වඩා ඒ මොහොතක් කරන පූජාවම උතුම් ය. ඒ මේ නිකායාන්තර ආහවනීය යන පදය මෙහි ආහුනෙය්‍ය යන මේ පදය සමග අර්ථ වශයෙන් එකකි. ව්‍යඤ්ජන වශයෙන් කිසියම් පමණකට වෙනස්ය. එහෙයින් මෙසේ අර්ථ වර්ණනාව කරන ලදී.

**පාහුනෙය්‍ය** යන මෙහි වනාහි : දිශා අනුදිශාවලින් ආවා වූ ප්‍රියමනාප ඤාතිමිත්‍රයන් පිණිස සත්කාර වශයෙන් පිළියෙල කරන ලද ආගන්තුක දානයට පාහුන යයි කියනු ලැබේ. එබඳු වූ ආගන්තුකයන් හැර ඒ ආගන්තුක දානය සංඝයාට ම දීමට සුදුසුය. එසේම මෙය එක් බුද්ධාන්තරයක ද දක්නා ලැබේ. හාත්පසින් ගැවසී ගත්තේ ද වේ. ප්‍රියමනාප බව ඇති කරන කරුණුවලින් යුක්ත වූ (තැනැත්තා) යන මෙය මෙහි පදාර්ථය යි. මෙසේ පාහුනය මොහුට දීමට සුදුසුය, පාහුනය පිළිගැනීමට සුදුසුය යන අර්ථයෙන් පාහුණෙය්‍ය නම් වේ. යම් කෙනෙකුන්ට 'පාහවනීය'

යනුවෙන් පාළිය වේද ඔවුන්ට සංඝයා පළමුකොට සැලකීමට සුදුසු හෙයින් සියලුදෙනාට පළමුව සංඝයා කැඳවා උන්වහන්සේලා කෙරෙහි පිදිය යුතුය යන අරුතින් පාහවනීය නම් වේ. සර්වප්‍රකාරයෙන් හෝ පූජාවට සුදුසුය යන අරුතින් පාහවනීය නම් වේ. ඒ මෙය මෙහිදී ඒ අර්ථයෙන්ම පාහුනෙය්‍යා යැයි කියනු ලැබේ.

දක්ඛිණා යනු පරලොව අදහා දියයුතු දානය, ඒ දක්ෂිණාවට සුදුසුය, දක්ෂිණාවට හිත (සුදුසු) වූයේ හෝ මහත්ඵල බව ඇතිකිරීමෙන් පිරිසිදු කරන අරුතින් **දක්ඛිණෙය්‍යා** නම් වේ. සියලු ලෝකයා විසින් දෙඅත් හිසෙහි පිහිටුවා කරනු ලබන ඇඳිලි බැඳීමට සුදුසුය යන අරුතින් **අංජලිකරණීයො** නම් වේ.

**අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස** යනු සියලු ලෝකයාගේ අසමාන වූ පින් වැඩෙන ස්ථානය යි. යම්සේ රත්හැල් හෝ යව වැඩෙන තැන රත්හැල් කෙත යවකෙත යයි කියනු ලැබේ ද මෙසේ සංඝයා දෙවියන් සහිත ලෝකයාගේ පින් වැඩෙන ස්ථානයයි. සංඝයා ඇසුරුකොට ලෝකයාට නොයෙක් ආකාර හිතසැප උපදවන පින් වැඩෙයි. එහෙයින් සංඝයා ලෝකයාට අනුත්තර වූ පින්කෙතය. මෙහි ද 'යෙ කෙචි සංඝං සරණං ගතාසෙ -පෙ-' 'සංඝොති කිත්තයන්තස්ස යස්ස කායෙ භවති පීති' 'සාධු වො දෙවානමින්ද සංඝං සරණගමනං හොති, සංඝං සරණගමනහෙතු ඛො දෙවානමින්ද -පෙ- දිබ්බෙහි පොට්ඨබ්බෙහි' යනාදී සූත්‍ර පදයන්ගේ වශයෙන් සංඝයා කෙරෙහි ප්‍රසාදය පිළිබඳ ඵල විශේෂ යෙදීම ද එහෙයින් සංඝයාගේ අග්‍ර බව ද අග්‍රවිපාක ඇති බවද දතයුතුය. එසේම (තෙරුවන් නමැති) අනුත්තරිය ප්‍රතිලාභයෙන් සත්වන භවය මුල්කොට ඇති සසර දුක සහමුලින් නැසීම, අනුත්තර වූ සැපය ලැබීම යන මේ ආදී උදාර ඵල නිෂ්පාදනය කිරීම් වශයෙන් අග්‍රවිපාක ඇති බව දතයුතුය.

ගාථාවන්හි **අග්ගතො** යනු අග්‍ර වූ රත්නත්‍රය කෙරෙහි හෝ අග්‍රභාවයෙන් හෝ **පසන්නානං** පැහැදුනා වූ අයට. **අග්ගං ධම්මං** යනු අග්‍ර ස්වභාවය බුද්ධ සුබුද්ධත්වය ධර්ම සුධර්මත්වය සංඝ සුප්‍රතිපත්තිය යන රත්නත්‍රය පිළිබඳ අනිකකට සාධාරණ නැති උත්තම ස්වභාවය දසබල ආදී ස්වාක්ඛාත බව ආදී සුපටිපන්න බව ආදී ගුණ ස්වභාවය

හෝ **විජානතං** දන්නවුන්ට. මෙසේ සාධාරණ වශයෙන් අග්‍රප්‍රසාද වස්තුව දක්වා දැන් අසාධාරණ වශයෙන් එය විභාග වශයෙන් දැක්වීමට **අග්ගෙ** බුද්ධෙ යනාදිය දේශනා කරන ලදී. එහි **පසන්නානං** යනු අවෙච්ච ප්‍රසාදයෙන් (නොසෙල්වෙන ප්‍රසාදයෙන්) ද අනිත් ප්‍රසාදයෙන් ද ප්‍රසන්න වූ එහි ඇලුණවුන්ට **විරාගුපසමෙ** යනු විරාගයෙහි ද උපසමයෙහි ද සියලු රාගයේ ද සියලු කෙලෙසුන්ගේ ද අත්‍යන්ත විරාගයට (තණ්හාව දුරු කිරීමට) හේතු වූ ද අත්‍යන්ත උපසමයට (කෙලෙසුන් සන්සිඳුවීමට) හේතු වූ ද යන අර්ථයි. **සුඛෙ** යනු සසර දුක් ක්ෂය කරන බැවින් ද සංස්කාර සන්සිඳීමේ සැපය ඇති බැවින් ද සැප වූ. **අග්ගස්මිං දානං දදතං** යනු අග්‍ර වූ රත්නත්‍රය කෙරෙහි දන් දෙන්නවුන්ට දිය යුතු දේ දෙන්නවුන්ට. එහි ජීවමාන භාග්‍යවතුන් වහන්සේට සිවුපසයෙන් උපස්ථාන කරන්නෝ පූජා කරන්නෝ සත්කාර කරන්නෝ පිරිනිවි භාග්‍යවතුන් වහන්සේ උදෙසා ධාතු චෛත්‍ය ආදියට උපස්ථාන කරන්නෝ පූජා කරන්නෝ සත්කාර කරන්නෝ බුදුරජාණන් වහන්සේ කෙරෙහි දන් දෙන්නාහු නම් වෙති.

ධර්මයට පූජා කරන්නෙමුයි සිතා ධර්මධර යම් පුද්ගලයන් කෙරෙහි සිවුපසයෙන් උපස්ථාන කරන්නාහු පූජා කරන්නාහු සත්කාර කරන්නාහු ධර්මය බොහෝකල් පැවැත්මට ක්‍රියා කරන්නාහු ධර්මය කෙරෙහි දානය දෙන්නාහු නම් වෙති. එසේ ආර්ය සංඝයාට සිවුපසයෙන් උපස්ථාන කරන්නාහු පූජා කරන්නාහු සත්කාර කරන්නාහු ඒ ආර්ය සංඝයා උදෙසා අනිත් සංඝයා කෙරෙහි ද එසේ පිළිපදින්නාහු සංඝයා කෙරෙහි දානය දෙන්නාහු නම් වෙති.

**අග්ගං පුඤ්ඤං පවඩ්ඪති** යනු මෙසේ රත්නත්‍රය කෙරෙහි පැහැදුනු සිතින් උදාර පරිත්‍යාග ද උදාර පූජා සත්කාර ද පවත්වන්නවුන් විසින් දිනපතා අග්‍ර වූ උදාර වූ කුසල් රැස්කරනු ලැබේ. දැන් ඒ පිනේ අග්‍ර විපාක ඇති බැවින් අග්‍ර භාවය දැක්වීමට 'අග්ගං ආයු' යනාදිය දේශනා කරන ලදී. එහි **අග්ගං ආයු** දිව්‍යමය වූ හෝ මානුෂික වූ හෝ අග්‍ර වූ වඩා උදාර ආයුෂයයි. **පවඩ්ඪති** යනු මතුමත්තෙහි වැඩේ. **වණ්ණො** යනු රූප සම්පදාවයි. **යසො** යනු පරිවාර සම්පත්තියයි. **කිත්ති** යනු ගුණ ඝෝෂාවයි. **සුඛං** යනු කායික වූ චෛතසික වූ ද සැපයයි. **බලං** යනු කාය බලය ද ඤාණබලය ද වෙයි.

**අග්ගස්ස දාතා** යනු අග්‍ර වූ රත්නත්‍රයට පරිත්‍යාග කරන්නා වූ නැතහොත් අග්‍ර වූ දාන වස්තුව (දෙය්‍ය ද්‍රර්මය) දීම උසස්කොට එහි පින පවත්වන්නායි. **අග්ගධම්ම සමාහිතො** යනු අග්‍ර වූ ප්‍රසාද ධර්මයෙන් ද දානාදී ධර්මයෙන් ද 'සමාහිතො' යුක්ත වූයේ අචල ප්‍රසාදයෙන් යුක්ත වූයේ. ඒ පිනෙහි විපාක වූ බොහෝ ජනයාට ප්‍රියමනාප බව ආදී ධර්මවලින් යුක්ත වූයේ. **අග්ගප්පත්තො පමොදති** යනු යම් සත්ත්ව නිකායක උපන්නේ ඒ ඒ සත්ත්ව නිකායෙහි අග්‍රභාවයට ශ්‍රේෂ්ඨ භාවයට පැමිණියේ, අග්‍රභාවය වූ ලෝකෝත්තර මාර්ගඵලයට පැමිණියේ 'පමොදති' අභිරමණය කරයි. විශේෂයෙන් සතුටු වෙයි.

**පළමු සූත්‍රය යි.**

# 3.5.2

දෙවන සූත්‍රය කරුණක් ඇතිවීම් වශයෙන් දේශනා කරන ලදී. එක් කාලයක භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත නිග්‍රෝධාරාමයෙහි වැඩවාසය කරන කල්හි භික්ෂූහු ආගන්තුක භික්ෂූන්ට සෙනසුන් පනවමින් පාත්‍රා සිවුරු තැන්පත් කරමින් සිටින කල්හි සාමණේරයෝ ද සංඝයාගේ (සිවුරු පිරිකර ආදී) ලාභ බෙදන ස්ථානයෙහි දී පැමිණි නොපැමිණි භික්ෂූන්ගේ ලාභ ගනිමින් උස්හඬින් මහා හඬින් කථාකරන්නෝ වූහ. එය අසා භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් නෙරපූහ. ඒ සියල්ලෝම මේ ධර්ම විනයට අලුත පැමිණි නවකයෝ ය. මහා බ්‍රහ්මයා එය දැන අවුත් ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා පිළිගනිත්වා. ඒ නෙරපූ භික්ෂූන් සඳහා සමාව දෙන ලෙස යාඥා කළේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට අවකාශ දුන්හ. ඉක්බිති බ්‍රහ්මයා භාග්‍යවතුන් වහන්සේ විසින් මම කරන ලද අවකාශ ඇත්තේ වෙමියි සිතා භාග්‍යවතුන් වහන්සේට වැඳ පැදකුණු කොට නික්මුණේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා ආපසු පැමිණේවායි ආනන්ද ස්ථවිරයන් වහන්සේට ඒ බව දැක්වූහ. ඉක්බිති ඒ භික්ෂූහු ආනන්ද ස්ථවිරයන් වහන්සේ විසින් කැඳවන ලද්දාහු භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ තැතිගත් ස්වභාවය ඇතිව එකත්පසෙක හිඳගත්හ.

භාග්‍යවතුන් වහන්සේ උන්වහන්සේලාට ගැලපෙන දේශනාවක් විමසමින් මොවුහු ආමිෂ හේතුවෙන් නෙරපූහ. පිණ්ඩියාලෝප ධර්ම දේශනාව ඔවුන්ට ගැලපේයයි සිතා 'අනන්තමිදං භික්ඛවෙ' යන මේ දේශනාව දේශනා කළහ.

එහි මේ අන්ත ශබ්දය **'සන්ති භික්ඛවෙ එකෙ සමණ බ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා පුබ්බන්තානුදිට්ඨිනො'**[1] 'මහණෙනි, පූර්වාන්ත කල්පික වූ (අතීත ආත්මභාව සංඛ්‍යාත ඉක්මගිය ස්කන්ධ පරම්පරා කොටස තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් වරදවා ගත්) ඒ අතීත ස්කන්ධ පරම්පරා කොටස අනුව පහළ කොටගත් දෘෂ්ටි ඇති සමහර මහණ බමුණු කෙනෙක් ඇත්තාහ.' යනාදියෙහි කොට්ඨාස අර්ථයෙහි ආයේය. **'අන්තමකාසි දුක්ඛස්ස'** 'දුක් කෙළවර කළේය', **'අන්තවා අයං ලොකො පරිවටුමො'** 'මේ ලෝකය අන්තයක් ඇති එකකි, හාත්පසින්ම වටය' යනාදියෙහි වෙන්කිරීම් (පරිච්ඡේද) අර්ථයෙහි ආයේය. **'හරිතන්තං වා පථන්තං වා සෙලන්තං වා'** 'හරිත (වන) කෙළවර හෝ මාර්ගය කෙළවර හෝ ගල් පර්වතය කෙළවර හෝ 'යනාදියෙහි සීමා අර්ථයෙහි ආයේය. **'අන්තං අන්තගුණං'** 'බඩවැල, කුඩා බඩවැල' යනාදියෙහි ශරීර අවයව යන අර්ථයෙහි ආයේය. **'චරන්ති හෙකෙ පරිවාර ඡන්නා අන්තො අසුද්ධා බහි සොභමානා'** 'ඇතැමෙක් පිරිවරින් වැසී ඇතුළතින් අපිරිසිදුව පිටතින් ශෝභමානව හැසිරෙත්' යනාදියෙහි සිත යන අර්ථයෙහි ආයේය. **'අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි උදකානුග්ගතානි අන්තො නිමුග්ගපොසිනී'** 'ඇතැම් උපුල් හෝ රත්පියුම් හෝ සුදුපියුම් හෝ වේද, ජලයෙහි හටගත්තා වූ ජලයෙහි වැඩුණා වූ ජලයෙන් උඩට නොනැගුණා වූ ජලයෙහි ගැලී පෝෂණය වන්නා වූ යනාදියෙහි අභ්‍යන්තර අර්ථයෙහි ආයේය.

**මිගානං කොත්ථුකො අන්තො පක්ඛීනං පන වායසො**
**එරණ්ඩො අන්තො රුක්ඛානං තයො අන්තා සමාගතා**

'සිවුපාවුන් අතරින් සිවලා ලාමකය. පක්ෂීන් අතරින් කපුටා ලාමකය. ගස් අතරින් එරඬු ගස ලාමකය. ලාමක වූ තුනක් එක්රැස් විය.' යනාදියෙහි ලාමක අර්ථයෙහි ආයේය. මෙහි ද ලාමක අර්ථයෙහි ම දතයුතුය.

1. දී.නි. බ්‍රහ්මජාල සූත්‍රය

එහෙයින් **අන්තමිදං භික්ඛවෙ ජීවිකානං** යනු මහණෙනි, ජීවත්වීම සඳහා කරන ක්‍රියාවන් අතරින් මෙය (පිඬුසිඟීම) අන්තය, පශ්චිමය, ලාමකය, සියල්ලට පහත් ජීවිතය යන අර්ථයි. **යදිදං පිණ්ඩොල්‍යං** යනු යම් මේ පිණ්ඩපාතය සොයා යාමෙන් භික්ෂාව සොයා හැසිරීමෙන් ජීවිකාව කරන්නහුගේ ජීවිතය. මේ වනාහි මෙහි පදාර්ථයයි: පිඬු පිණිස හැසිරෙයි යන අරුතින් පිණ්ඩොල නම් වේ. (පිණ්ඩාය උලතීති = පිණ්ඩොලො) පිඬුසිඟා යන්නහුගේ ක්‍රියාව පිණ්ඩොල නම් වේ. පිණ්ඩ පර්යේෂණයෙන් කරන ජීවිකාව යන අර්ථයි. **අභිසාපො** යනු ආක්‍රෝශයයි. කිපුණු මිනිස්සු තමාගේ සතුරාට රෙදි කැබැල්ලක් හැඳ කබලක් ගත් අත් ඇතිව පිඬු (ආහාර) සොයමින් හැසිරෙන්නෙහි යයි ආක්‍රෝශ කරති.

නැතහොත් ඔබට නොකළයුතු දෙයක් ඇද්ද? ඒ ඔබ මෙසේ බලයෙන් හා වීර්යයෙන් යුක්ත වූයේ හිරි ඔතප් දුරුකොට පාත්‍රයක් ගත් අත් ඇතිව දිළිඳු වූ (පහත් වූ) පිඬ සිඟීමෙහි හැසිරෙන්නෙහිය යි මෙසේත් ආක්‍රෝශ කරත්මය.

**තඤ්ච ඛො එතං** යනු ඒ මේ ආක්‍රෝශයට සමාන පිඬුසිඟා හැසිරීම. **කුලපුත්තා උපෙන්ති අත්ථවසිකා** යනු මගේ ශාසනයෙහි ජාති (උපතින්) කුලපුත්‍රයෝ ද ආචාර (මනා හැසිරීමෙන්) කුලපුත්‍රයෝ ද, 'අත්ථවසිකා' (ලෞකික ලෝකෝත්තර අර්ථ සිද්ධිය නමැති) කාරණයට වසඟ වූ කුලපුත්‍රයෝ කරුණක් නිසා එළඹෙත්. 'රාජාභිනීතා' යනාදියෙහි රජු සන්තක දේ අනුභවකොට රජු විසින් බන්ධනාගාර ගතකරවන ලද යමෙක් (ඉන්) පලාගොස් පැවිදි වෙත් ද ඔවුහු රජු විසින් බන්ධනාගාරයට පමුණුවන ලද්දෝ **රාජාභිනීතා** නම් වෙති. යමෙක් වනාහි සොරුන් විසින් වනයෙහි දී අල්ලාගෙන ඔවුන් අතරින් ඇතැමෙකු මරනු ලබන කල්හි ඇතැමෙක් ස්වාමීනි, අපි ඔබලා විසින් මුදාහරින ලදුව ගෘහවාසය නොකොට (ගිහි ජීවිතය ගතනොකොට) පැවිදි වන්නෙමු. ඒ ඒ තැනදී යම් යම් බුද්ධපූජාදී පිනක් කරන්නෙමු ද ඒ ඒ තැන සිට ඔබලාට පින් අනුමෝදන් කරන්නෙමුයි කියා සොරුන් විසින් මුදාහරින ලද්දාහු පැවිදි වෙති, ඔවුහු **චොරාභිනීතා** නම් වෙති. සොරුන් විසින් මැරිය යුතු තැනැත්තා නෙරපා හැරිය බැවිනි. යමෙක් වනාහි ණය ගෙන ආපසු දීමට නොහැකි වන්නාහු පලාගොස් පැවිදි වෙති. ඔවුහු **ඉණට්ඨා** නම් වෙති. 'තඤ්ච ඛො එතං පිණ්ඩොල්‍යං කුලපුත්තා මම සාසනෙ නෙව රාජාභිනීතා -පෙ- න

ආජීවපකතා උපෙනති, අපි ච බො ඔතිණ්ණමහා ජාතියා -පෙ- පඤ්ඤායෙථා ති උපෙනති' යනු පද සම්බන්ධය යි.

එහි **ඔතිණ්ණමහා** යනු ඔතිණ්ණා අමහා, බැස ගත්තෝ වෙමු. 'ජාතියා' යනාදියෙහි ඒ ඒ සත්ත්ව නිකායෙහි ස්කන්ධයන්ගේ පළමු ඉපදීම **ජාති** ජාතියයි. මේරීම **ජරා** ජරාවයි. භේදය **මරණං** මරණයයි. ඥාති-රෝග-භෝග-සීල-දිට්ඨි යන විපත්වලින් ස්පර්ශ කරන ලද තැනැත්තාගේ තැවීම ඇතුලත පසුතැවිල්ල **සොකො** සෝකයයි. ඒවායින් ස්පර්ශ කරන ලද තැනැත්තාගේ විලාපය **පරිදෙවො** පරිදේවයයි. අප්‍රිය ස්පර්ශයෙන් හැපුණු කයේ කායපීඩාව **දුක්ඛං** දුකය. ක්‍රෝධයට හේතු කරුණු කෙරෙහි ගැටුණු සිතේ චිත්තපීඩාව **දොමනස්සං** දොම්නසය. ඥාති විපත් ආදියෙන් ම ස්පර්ශ කළ තැනැත්තාගේ විලාපයෙන් ද ඉවසීමට අසමත් තැනැත්තාගේ සිතේ තැවීමෙන් හටගත් බොහෝ වූ වෙහෙස **උපායාසො** උපායාසයයි. ඒ ජාති ආදියෙන් බැසගත්තාහු **දුක්ඛොතිණ්ණා** නම්. ඒ ජාති ආදී දුක්වලින් ඇතුළට වැදුණාහු. **දුක්ඛපරෙතා** යනු ඒ දුක්වලින් දුකට හේතු වූ කරුණුවලින් මැඩගත්තාහු. ජාති ආදිය වනාහි දුකට වස්තු බැවින් දුක්ය. දුක් බැවින් ද සෝක - පරිදේව - දුක්ඛ-දෝමනස්ස උපායාස දුක්ය. **අප්පෙවනාම -පෙ- පඤ්ඤායෙථ** යනු මේ සියලු සසර දුක් රාශියේ වෙන්කිරීමක් අවසාන කිරීමක් පෙනේ නම් ඉතා මැනවි.

'සො ච හොති අභිජ්ඣාලූ' යන මෙය යම් කුලපුත්‍රයෙක් දුක් කෙළවර කරන්නෙමියි කලින් සිත් උපදවාගෙන පැවිදි වූයේ පසුකලෙක ඒ පැවිද්ද ඒ ආකාරයට කරන්නට නොහැකි වෙයි. එය දක්වන්නට දේශනා කරන ලදී. එහි **අභිජ්ඣාලූ** යනු අනුන්ගේ භාණ්ඩවලට අධික ලෝභ ඇත්තේ. **තිබ්බසාරාගො** යනු බහුල රාග ඇත්තේ. **බ්‍යාපන්නචිත්තො** යනු ව්‍යාපාදයෙන් කුණු වූ බැවින් පෙරළුණු සිත් ඇත්තේ. **පදුට්ඨමන සංකප්පො** යනු තියුණු අං ඇති චණ්ඩ ගොනෙකු මෙන් නැසීම් වශයෙන් අනුන් ගැන දූෂිත සිත් ඇත්තේ. **මුට්ඨස්සති** යනු බත් සඟවන ලද කාක්කෙකු මෙන් ද මස් සැඟ වූ බල්ලකු මෙන් ද මුළා වූ සිහි ඇත්තේ. මෙතැනදී කරන ලද දෙය එතැන දී සිහි නොකරයි. **අසම්පජානො** යනු ප්‍රඥාව නැති - ස්කන්ධාදී වෙන්කිරීම් නැති. **අසමාහිතො** යනු සැඩ දිය පහරෙහි බඳිනා ලද නැවක් මෙන් නොපිහිටි. **විබ්භන්තචිත්තො** යනු

මාර්ගයට පිවිසි මුවෙකු මෙන් තැතිගත් සිත් ඇත්තේ. **පාකතින්ද්‍රියො** යනු අසංවර ඉඳුරන් ඇති ගිහියෝ අසංවර බැවින් තම සේවක පිරිස් දෙස යම් සේ බලත්ද එසේ අසංවර ඉඳුරන් ඇත්තේ වෙයි.

**ඡවාලාතං** යනු මළමිනියක් දැවූ තැන ඇති (සොහොනෙහි) ගිණිපෙනෙල්ලයි. **උභතොපදිත්තං මජ්ඣෙ ගූථගතං** යනු ප්‍රමාණයෙන් අඟල් අටක් පමණ වූ දෙකෙළවර ගිනිගත් මැද අශූචි තැවරුණු. **නෙවගාමෙ** යනු ඉදින් ඒ සොහොනෙහි ගිනි පෙණෙල්ල වියදඬු-නඟුල්-ගොණැස්ස (වක්වූ යට ලී) පැලන්පෝරු ආදිය පිණිස යොදන්නට හැකිනම් ගමේ දර කැබැල්ලකින් කරන කටයුත්ත පිණිස යෙදෙන්නේය. ඉදින් කෙතෙහි ඇති කුටියෙහි ඉණිවලින් කළ ඇඳන් ආදිය පිණිස යොදන්නට හැකිනම් වනයෙහි දර කැබැල්ලකින් කරන කටයුත්ත පිණිස යොදන්නේය. යම්හෙයකින් මේ කරුණු දෙක සඳහාම සොහොනෙහි ගිණිපෙනෙල්ල යෙදිය නොහැකි වේද, එහෙයින් මෙසේ දේශනා කරන ලදී. **තථූපමාහං** යනු මම මේ කියන ලද ආකාර ඇති පුද්ගලයා සොහොන් ගිනිපෙණෙල්ලට සමානකොට එයට උපමාකොට කියමි. **ගිහීභොගා ච පරිහීනො** යනු යම් පුද්ගලයෙක් ගෘහවාසයෙහි යෙදී සිටින ගිහියන් විසින් දායාද බෙදන කල්හි අන් අයුරකින් භෝගයක් ලැබිය යුත්තෙක් වන්නේද එයින් ද පිරිහුනේ වෙයි. **සාමඤ්ඤත්ථඤ්ච** යනු ආචාර්ය උපාධ්‍යායයන් වහන්සේලාගේ අවවාදයෙහි පිහිටා සිට පර්යාප්ති ප්‍රතිවේධ වශයෙන් පැමිණිය යුතු ශ්‍රමණ ඵලය ද සම්පූර්ණ නොකරයි. ශාස්තෘන් වහන්සේ මේ උපමාව වනාහි දුශ්ශීල පුද්ගලයාගේ වශයෙන් ඉදිරිපත් නොකළහ. පිරිසිදු සිල් ඇති අලස වූ අභිධ්‍යාදී දොස්වලින් දූෂිත සිත් ඇති පුද්ගලයාගේ වශයෙන් ඉදිරිපත් කළහයි දතයුතුය.

ගාථාවන්හි - **ගිහී භොගා** යනු කම්සැප පාවිච්චි කිරීමෙන්. **පරිහීනො** යනු පිරිහුනේ. **සාමඤ්ඤත්ථං** යනු (ධර්මය අවබෝධ කිරීම නම් වූ) ප්‍රතිවේධ බහුශ්‍රැත බව ද (ධර්මය ඉගෙනීම නම් වූ) පර්යාප්ති බහුශ්‍රැත බව ද. එබඳු පුද්ගලයා අලස බැවින් නො ඇසූවක් අසන්නට ඇසූ දෙයක් පිරිසිදු කරගන්නට නොහැකි වෙයි. භාග්‍යය නැති බැවින් දුෂ්ට භාග්‍යය ඇත්තේ යන අරුතින් **දුබ්භගො**, පෙර පින් නැති කාලකණ්ණි පුරුෂයා. **පරිධංසමානො** යනු විනාශ වූ ගුණ ඇත්තේ. **පකිරෙති** යනු විසුරුවයි. විනාශ කරයි. මේ සියල්ල ඇතිවන ශ්‍රමණඵලයේ නූපදීම සඳහා ම දේශනා කරන ලදී. **ඡවාලාතංව නස්සති** යනු එබඳු ඒ පුද්ගලයා කියන ලද

ආකාර ඇති සොහොන් ගිණිපෙනෙල්ලක් මෙන් කිසිවකට නොයෙදෙමින්ම (කිසිදු ප්‍රයෝජනයකට නොගෙනම) නැසෙයි. දෙපැත්තෙන්ම ගිලිහී ගිය (දැවුණු) බැවින් ම කය වචන දෙකින් ශික්ෂාපද කැඩීමක් නොකරන ලද්දේම සිත පිරිසිදු නොකිරීමෙන් නැසේ. ශික්ෂාපද කැඩීමක් කරන ලද්දේ නම් කියනුම කවරේද? **දුස්සීලො** යනු ඔහු අපාය දුකට කොටස්කරුවෙකු බව දැක්වීමෙන් දුසිල් බවෙහි දොස් දක්වා එයින් සත්ත්වයන් වෙන්කරනු කැමැත්තේ 'කාසාවකණ්ඨා' යනාදී ගාථාදෙක වදාළහ. එහි අර්ථය මුලින් කියන ලද්දේම ය.

**දෙවන සූත්‍රය යි.**

# 3.5.3

තුන්වන සූත්‍රයෙහි **සංඝාටිකණ්ණෙ** යනු සිවුරෙහි කෙළවර. ගහෙත්වා අල්ලාගෙන. **අනුබන්ධො අස්ස** අනුගමනය කරන්නේ වේද, මහණෙනි, මේ සසුනෙහි ඇතැම් භික්ෂුවක් තමාගේ අතින් මා විසින් පොරවන ලද සුගතමහා සිවුරෙහි කෙළවර අල්ලන්නාක් මෙන් මා අනුව යන්නේ ද මෙසේ මට වඩාත් සමීපව වාසය කරන්නේය යන මෙය කියන ලදී. **පාදෙ පාදං නික්ඛිපන්තො** යනු යන්නා වූ මගේ පියවරෙහි පියවර තැබූ තැන (මවිසින්) පා එසවූ සැණින් තමාගේ පාදය තබමින්. කරුණු දෙකින්ම සිටීම ගමන ආදියෙහි (මා) අත නොහැර හැමකල්හි මා සමීපයෙහි ම වාසය කරන්නේය යන මේ අදහස දක්වයි. **සෙ ආරකාව මය්හං අහඤ්ච තස්ස** යනු ඒ භික්ෂුව මා විසින් කියන ලද ප්‍රතිපදාව නොපුරන්නේ මගේ දුරෙහිම වේ. (මගෙන් ඈත් වූයේම වෙයි.) මම ද ඔහුගේ දුරෙහිම වෙමි. (මම ද ඔහුගෙන් ඈත් වූයේම වෙමි. මෙයින් මසැසින් තථාගතයන් වහන්සේ දැකීම, රූපකාය ඇතුළත් කිරීම කරුණක් නොවේ. නුවණැසින්ම දැකීම, ධර්මකාය ඇතුළත් කිරීම ප්‍රමාණයයි දක්වයි. එහෙයින් '**ධම්මං හි සො භික්ඛවෙ භික්ඛු නපස්සති, ධම්මං අපස්සන්තො න මං පස්සති**' 'මහණෙනි, ඒ භික්ෂුව ධර්මය නොදකී. ධර්මය නො දකින්නේ මා නොදකී' යනුවෙන් වදාළහ.

එහි ධම්මො ධර්මය නම් නවවිධ ලෝකෝත්තර ධර්මය යි. එය ද අභිධ්‍යාදියෙන් දූෂිත වූ සිතෙන් දක්නට නොහැකිය. එහෙයින් ධර්මය නොදැකීමෙන් ධර්මකාය නො දකී. එහෙයින් **'කිනෙන වක්කලි ඉමිනා පූතිකායෙන දිට්ඨෙන, යො ඛො වක්කලි ධම්මං පස්සති, සො මං පස්සති, යො මං පස්සති, සො ධම්මං පස්සති'** 'වක්කලි, මේ කුණු කය දැකීමෙන් ඔබට කවර ප්‍රයෝජනයක් ද, වක්කලි යමෙක් ධර්මය දකී ද, ඔහු මා දකී. යමෙක් මා දකී ද, ඔහු ධර්මය දකී' යනුවෙන්ද **'ධම්මභූතො බ්‍රහ්මභූතො'** 'ධර්මභූත බ්‍රහ්මභූත' යනුවෙන් ද **'ධම්මකායො ඉතිපි, බ්‍රහ්මකායො ඉතිපි'** ධර්මකාය යි ද, බ්‍රහ්ම කාය යි ද' යනාදිය කියන ලදී.

**යොජන සතෙ** යනු යොදුන් සියයක් පෙදෙසෙහි, යොදුන් සියයක් මත්තෙහි යන අර්ථයි. ඉතිරිය කියන ලද ආකාරයට විරුද්ධ ආකාරයෙන් දතයුතුය. ආර්ය මාර්ගය ලැබීම් වශයෙන් ඔහුගේ අභිධ්‍යාව බහුල කොට නැති බව ආදිය දතයුතුය.

ගාථාවන්හි **මහිච්ඡො** කාමයන්හි බහුල රාගය ඇති බැවින් මහත් ආසා ඇත්තේ. **විඝාතවා** දූෂිත වූ සිත් ඇති බැවින් සත්ත්වයන් කෙරෙහි ක්‍රෝධ වශයෙන් ද මහත් ආසා ඇති බැවින් ආසා කරන දේවල් නොලැබීමෙන් ද දූෂිත සිත් ඇත්තේ. **එජානුගො** යනු ඒජා නම් වූ තණ්හාවේ දාසයකු මෙන් වී එයට අනුව යන්නේ, රාගාදී කෙලෙස් දාහයෙන් මැඩගැනීමෙන් **අනිබ්බුතො** නො නිවුණා වූ. රූපාදී කාමයන් පිළිබඳ කැමති වීමෙන් **ගිද්ධො** ගිජු වූ. **පස්ස යාවඤ්ච ආරකා** යනු තණ්හාව නැති, නිවුණු, ආසාව නැති සම්මා සම්බුදුරජාණන් වහන්සේට අවකාශ වශයෙන් සමීපයෙහි සිටිමින් මහිච්ඡ වූ විඝාත වූ ඒජානුග වූ අනිබ්බුත වූ ගිජු වූ බාල පෘථග්ජනයා ධර්ම ස්වභාව වශයෙන් යම් පමණ දුරක සිටී ද ඔහුගේ ඒ දුර බව බලන්න, කීමට ද පහසු නැත යන අර්ථයි.

මේ කාරණය :

**නභඤ්ච දූරෙ පඨවී ච දූරෙ පාරං සමුද්දස්ස තථාහු දූරෙ**
**තතො හවෙ දූරතරං වදන්ති සතඤ්ච ධම්මො අසතඤ්ච රාජා**

'මහරජ, අහස ද දුර වේ. පොළොව ද දුර වේ. (අහසට පොළොව දුරය) සමුද්‍රයෙහි (මෙගොඩට) පරතෙර ද දුරෙහි පිහිටියේ ය.

සත්පුරුෂයන්ගේ ධර්මය හා අසත්පුරුෂයන්ගේ ධර්මය අතර ඊටත් වඩා දුරයයි කියති යනුවෙන් කියන ලදී.

**ධම්මමභිඤ්ඤාය** යනු චතුරාර්ය සත්‍ය ධර්මය, අභිඥාවෙන් දැන, ඤාත-තීරණ පිරිසිඳ දැනීම්වලින් සුදුසු පරිදි පූර්ව භාගයෙහි දැනගෙන. **ධම්මමඤ්ඤාය** යනු ඒ ධර්මය ම පසුකලෙක මාර්ග ඤාණයෙන් පිරිසිඳ දැනීම් වශයෙන් සීමාවන් ඇති අයුරින් දැනගෙන. **පණ්ඩිතො** යනු ප්‍රතිවෙධ බහුශ්‍රැත භාවයෙන් පණ්ඩිත වූ. **රහදොව නිවාතෙ ච** සුළං නොහමන තැන ඇති විලක් මෙන්. **අනෙජො** කෙලෙස් චලන නැත්තේ සංසිඳෙයි. යම්සේ ඒ විල සුළංනැති තැන වාතයෙන් පහර නොලබන්නේ සන්සිඳුනේම වේද එසේම මොහු ද හැම ආකාරයෙන් ම සන්සිඳුනු කෙලෙස් ඇත්තේ කෙලෙස් චලන නැත්තේ අර්හත් ඵල සමාධියෙන් **වූපසම්මති** හැමකල්හි උපශාන්ත ස්වභාවය ඇත්තේම වෙයි. **අනෙජො** යනු ඔහු මෙසේ තණ්හාව නැති ස්වභාවය ඇත්තේ රහත් වූයේ තණ්හාව නැති ස්වභාවය ඇති සම්මා සම්බුදුරජාණන් වහන්සේට අවකාශ වශයෙන් දුර සිටියත් ධර්ම ස්වභාව වශයෙන් නුදුරෙහිමය, සමීපයෙහිම ය.

**තෙවන සූත්‍රය යි.**

# 3.5.4

සතරවන සූත්‍රයෙහි - දවන අර්ථයෙන් ගින්න (අග්ගි) නම් වේ. රාගයම ගින්න වූයේ **රාගග්ගි** නම් වේ. රාගය උපදිමින් සත්ත්වයන් දවයි. එහෙයින් ගින්න (අග්ගි) යි කියනු ලැබේ. අනිත් (දෝස-මෝහ) දෙකෙහි ද මේ ක්‍රමයම යි. එහි යම් සේ ගින්න යම් ඉන්ධනයක් නිසා උපදී ද ඒ ඉන්ධනය දවයි. මහත් දැවීමක් ද වෙයි. එසේම ඒ රාගාදිය ද යම් සන්තානයක තමාම උපන්නේ ඒ සන්තානය දවයි. මහත් දැවීමක් ද වෙයි. නිවීමට අපහසු වෙයි. ඒ (රාග-දෝස-මෝහ) අතරින් රාග

දාහයෙන් තැවුණු හදවත් ඇති කැමති ලාභ නොලැබීමේ දුකෙන් මරණයට පත් වූ සත්ත්වයන්ගේ ප්‍රමාණයක් නැත. පළමුව මේ රාගය පිළිබඳ දවන බවයි. (රාගයේ දැවීමයි). දෝසය පිළිබඳ දැවීමෙන් විශේෂයෙන් මනෝපදෝසික දෙවියෝ ද මෝහය පිළිබඳ දැවීමෙන් ඛිඩ්ඩාපදෝසික දෙව්වරු ද නිදසුනය. මෝහ වශයෙන් වනාහි ඔවුන්ගේ සිහිමුළාවීම වෙයි. එහෙයින් ක්‍රීඩා වශයෙන් ආහාර ගන්නා වේලාව ඉක්මවන්නාහු කලුරිය කරති. පළමුව මේ රාගාදියේ මෙලොව දවන ස්වභාවයයි. පරලොව වනාහි නිරය ආදියෙහි ඉපිද තැවීම් වශයෙන් වඩාත් දරුණු වූයේ ද ඉවසීමට අපහසු වූයේ ද වෙයි. මේ අර්ථය ම ආදිත්ත පරියායෙන් ද පැහැදිලි කළ යුතුය.

ගාථාවන්හි **කාමෙසු මුච්ඡිතෙ** යනු වස්තුකාමයන්හි කාමයට වැටීම් වශයෙන් මුළාවට බාල බවට ප්‍රමාදයට වැරදි හැසිරීමට පැමිණියා වූ. ඛ්‍යාපනෙන දුෂ්ට සිත් ඇත්තේ. **දහති** යනුවෙන් සම්බන්ධ වේ. **නරෙ පාණාතිපාතිනො** යන මෙය ද්වේෂ ගින්න පිළිබඳවය. **අරියධම්මෙ අකොවිදෙ** යනු යමෙක් ස්කන්ධ ආයතනාදියෙහි සියලු ආකාරයෙන් ඉගෙනීමෙන් විමසීමෙන් මෙනෙහි කිරීම් රහිත ආර්ය ධර්මය පිළිබඳ අදක්ෂ වූවාහු ද ඔවුහු මුළාවෙන් මැඩගත්තාහු විශේෂයෙන් මුළාවට පත්වූවාහු නම් වෙතියි කියන ලදී. **එතෙ අග්ගී අජානන්තා** යනු මේ රාග ගිනි ආදිය මෙලොවෙහිදී ද පරලොවෙහිදී ද දවන්නේය යනුවෙන් නොදන්නා වූ. පිරිසිඳ අවබෝධ කිරීම් වශයෙන් ද (පරිඤ්ඤාභිසමය වශයෙන්) ප්‍රහාණය අවබෝධ කිරීම් වශයෙන් ද (පහාණාභිසමය වසෙන) අවබෝධ නොකරන්නා වූ.

**සක්කායාභිරතා** යනු සක්කාය නම් වූ පංච උපාදානස්කන්ධයෙහි තණ්හා-දිට්ඨි-මාන යන සතුටට හේතුවන කරුණුවලින් ඇලුණු. **වඩ්ඪයන්ති** යනු නැවත නැවත ඉපදීමෙන් වඩති, රැස්කරති. **නිරයං** යනු අටවැදෑරුම් මහා නිරය සොළොස් (16) වැදෑරුම් උස්සද නිරය යන සියල්ල ම නිරයයි. **තිරච්ඡානඤ්ච යොනියො** යනු තිරිසන් යෝනිය ද **අසුරං** යනු අසුරකය. **පෙත්තිවිසයඤ්ච** ප්‍රේත ලෝකය ද වඩ්ඪයන්ති යනුවෙන් සම්බන්ධ වෙයි. මෙපමණකින් රාග ගිනි ආදියේ මෙළොව ද පරලොව ද දවන ස්වභාවය දැක්වීම් වශයෙන් සසර දක්වා දැන් ඒවා නිවීමෙන් නිවන දක්වන්නට 'යෙ ච රත්තින්දිවා' යනාදිය දේශනා කරන ලදී.

එහි **යුත්තා** යනු භාවනාවෙහි යෙදීම් වශයෙන් යෙදුනාහු. කොතැන්හිද? **සම්මා සම්බුද්ධසාසනෙ** සම්මා සම්බුදු සසුනෙහි ය. එයින් අනිත් සසුනක රාග ගිනි ආදිය නිවීම නැති බව දක්වයි. එසේම අනිකකට පොදු නොවන ඒවා නිවන ආකාරය වූ අශුභ කර්මස්ථානය කෙටියෙන් දක්වමින්

**තෙ නිබ්බාපෙන්ති රාගග්ගිං නිච්චං අසුභසඤ්ඤිනො**
**දොසග්ගිං පන මෙත්තාය නිබ්බාපෙන්ති නරුත්තමා**
**මොහග්ගිං පන පඤ්ඤාය යායං නිබ්බෙධගාමිනී'ති**

'නිතර අශුභ සංඥා ඇති ඔවුහු රාග ගින්න නිවති. ඒ නරෝත්තමයෝ මෛත්‍රී භාවනාවෙන් ද්වේෂ ගින්න ද යම් මේ කෙලෙස් කඳු විනිවිද යන ප්‍රඥාවක් වේ නම් ඒ ප්‍රඥාවෙන් මෝහ ගින්න ද නිවති' යනුවෙන් වදාළහ.

එහි **අසුභ සඤ්ඤිනො** යනු දෙතිස් ආකාර වශයෙන් ද උද්ධුමාතක (ඉදිමුණු මළසිරුර) වශයෙන් ද අශුභ භාවනාවෙහි යෙදීමෙන් අශුභ සංඥා ඇති. **මෙත්තාය** යනු 'ඔහු මෛත්‍රී සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරයි' යනුවෙන් කියන ලද මෛත්‍රී භාවනාවෙන්. මෙහිදී අශුභ ධ්‍යානය ද පාදකකොට උපදවන ලද අනාගාමි මාර්ගයෙන් රාග දෝස ගිනි නිවීම දතයුතුය.

**පඤ්ඤාය** යනු විදර්ශනා ප්‍රඥාව සහිත මාර්ග ප්‍රඥාවෙන්. එහෙයින්ම 'යා යං නිබ්බෙධගාමිනී' යනුවෙන් වදාළහ. ඒ ප්‍රඥාව වනාහි කෙළෙස් කන්ද විනිවිද යයි පවතියි යන අරුතින් **නිබ්බෙධගාමිනී** යි කියනු ලැබේ. **අසෙසං පරිනිබ්බන්ති** යනු අර්හත් මාර්ගයෙන් ඉතිරි නොකොට රාග ගිනි ආදිය **නිබ්බාපෙත්වා** නිවා සවුපාදිසේස නිබ්බාණ ධාතුවෙහි සිටියාහු ප්‍රඥා විපුලත්වයට පැමිණීමෙන් **නිපකා** නිපක වූවාහු කලින්ම සම්‍යක්ප්‍රධාන වීර්යයෙන් සියලු ආකාරයෙන් කුසීතකම මනාව ප්‍රහීණ වූ බැවින් ඵලසමාපත්තියට සමවැදීමෙන් ද පසුබට නොවූ බැවින් ද **රත්තින්දිව මතන්දිතා** රෑ දාවල් දෙක්හි මැලි නොවූ. අවසාන සිත නිරුද්ධ වීමෙන් අනුපාදිසේස නිබ්බාණ ධාතුවෙන් **අසෙසං පරිනිබ්බන්ති** ඉතිරි නොකොට පිරිනිවෙති. එයින් ද **අසෙසං** ඉතිරි නැතිව වට්ටදුක්ඛං අච්චගුං සසර දුක ඉක්මවූවාහුය.

මෙසේ යමෙක් රාග ගිනි ආදිය නිවත් ද ඔවුන්ගේ අනුපාදිසේස නිර්වාණයෙන් නිවීම දක්වා දැන් අවබෝධ කළ ගුණවලින් ස්තුති කරමින් අවසාන ගාථාව වදාළහ. එහි **අරියද්දසා** යනු ආර්ය බුද්ධාදී උතුමන් විසින් දැකිය යුතු, කෙලෙසුන් කෙරෙන් දුර බැවින් ආර්ය වූ නිවන හෝ ආර්ය වූ සත්‍ය සතර ම දක්නා ලද අය හෝ යන අරුතින් අරියද්දස නම් වේ. වෙද නම් වූ මාර්ග ඥානයට, ඒ මාර්ග ඥානයෙන් සසර කෙළවරට ගියා වූ යන අරුතින් **වෙදගුනො. සම්මදඤ්ඤාය** යනු මනාව දතයුතු සියලු කුසලාදිය ද ස්කන්ධාදිය ද දැන. සෙස්ස කියන ලද අයුරින්මය.

**සිවුවන සූත්‍රය යි.**

# 3.5.5

පස්වන සූත්‍රයෙහි **තථා තථා** යනු ඒ ඒ ආකාරයෙන් **උපපරික්ඛෙය්‍ය** යනු විමසන්නේ හෝ කිරා බලන්නේ ය. **යථා යථාස්ස උපපරික්ඛතො** යනු යම් යම් අයුරකින් විමසා බලන්නා වූ මේ භික්ෂුවගේ. **බහිද්ධාචස්ස විඤ්ඤාණං අවික්ඛිත්තං අවිසටං** යනු බාහිර රූපාදී අරමුණෙහි උපදින විසිරීම නැති බැවින් වික්ෂිප්ත නොවූ, සන්සිඳුනා වූ - එහෙයින් ම නොවිසිර පවත්නේ වෙයි. එයින් 'මහණෙනි, යම් යම් අයුරකින් සංස්කාර ධර්මයන් විමසා බලන්නා වූ ආරම්භ කරන ලද විදර්ශනාව ඇති මේ භික්ෂුවට මුලදී සන්සුන් වූ ආකාරය සැලකීම් වශයෙන් සමථ නිමිත්ත ගෙන, සකස්කොට නිරතුරුව විමසුම් නුවණ පවත්වන්නා වූ තමාගේ විදසුන් සිත කමටහනෙන් බාහිර රූපාදී අරමුණක ඉපදීමක් නොවන්නේද ඉතා දැඩිව ඇරඹූ වීර්යය ඇති බැවින් උද්ධච්ච (විසිරීම්) පක්ෂයෙහි නොවන්නේ ද, ඒ ඒ ආකාරයෙන් භික්ෂුව විමසා බලන්නේය, කිරා බලන්නේය' යන මෙය කියන ලදී.

**අජ්ඣත්තං අසණ්ඨිතං** යනු යම්හෙයකින් මඳ වූ වීර්යය ඇතිකල්හි සමාධිය බලවත් බැවින් කුසීතකමෙන් මැඩපැවැත්වීමෙන් 'අජ්ඣත්තං' ගෝචර අධ්‍යාත්මය නම් වූ කර්මස්ථාන අරමුණෙහි හැකිලීම් වශයෙන් සිටි බැවින් සිටියේ නම් වෙයි. වීර්යය සම ලෙස යෙදීමෙන් නොසිටියේ නම් වෙයි. වීර්යයට පිළිපන්නේ වෙයි. එහෙයින් යම් යම් අයුරකින් විමසා බලන්නා වූ ඔහුගේ සිත අධ්‍යාත්මය නම් වූ කමටහන් අරමුණෙහි නොපිහිටියේ වන්නේ ද වීර්යයට පිළිපන්නේ වන්නේ ද ඒ ඒ ආකාරයෙන් විමසන්නේය. **අනුපාදාය න පරිතස්සෙය්‍ය** යනු යම් යම් අයුරකින් විමසා බලන්නා වූ මේ භික්ෂුවගේ 'මේ තෙමේ මම වෙමි. මේ තෙමේ මගේ ආත්මය වෙති'යි තෘෂ්ණා දෘෂ්ටි ගැනීම් වශයෙන් රූපාදිය අතුරෙන් කිසි සංස්කාරයක් නොගෙන එහෙයින්ම තෘෂ්ණා දෘෂ්ටි ගැනීම් වශයෙන් තැති ගැනීමක් නොවන්නේ ය. ඒ ඒ අයුරින් විමසන්නේය යනු සම්බන්ධයි.

කෙසේ විමසන්නා වූ භික්ෂුවට මේ තුන් ආකාරය ඇතිවන්නේද? උද්ධච්ච පක්ෂයට අයත් ධර්ම ද කුසීත පක්ෂයට අයත් ධර්ම ද දුරුකරමින් වීර්යය සමව යොදා, කල් ඇතිවම විදර්ශනාවට අයත් උපක්ලේශවලින් සිත පිරිසිදුකොට, යම්සේ මැනවින් විදර්ශනා ඥානයට විදර්ශනා වීර්යයට බැසගනියි ද, එසේ විමසන්නා වූ භික්ෂුවට.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ චතුස්සත්‍ය කර්මස්ථානික භික්ෂුවගේ පිළිවෙළින් ප්‍රතිපදා ඥාන දර්ශන විශුද්ධිය පිණිස අරඹන ලද ඉතා දැඩි වීර්යය, ඉතා ලිහිල් වීර්යය යන විදර්ශනා උපක්ලේශවලින් සිත පිරිසිදු කරන උපාය දක්වා දැන් එසේ පිරිසිදු කරන ලද විදර්ශනා ඥානය ඇතිකල්හි නොබෝ කලකින්ම විදර්ශනාව මාර්ගයෙන් ගළපා සියලු සසරදුක් ඉක්මවීම පිණිස පවතීයයි දක්වමින් 'බහිද්ධා චස්ස භික්ඛවෙ විඤ්ඤාණං' යනාදිය වදාළහ. එය කියන ලද අයුරින්මය. 'ආයතිං ජාති-ජරා-මරණ දුක්ඛ සමුදය සම්භවො න හොති' 'මත්තෙහි ජාති-ජරා-මරණ යන දුක් හටගැන්මක් නොවේ' යනුවෙන් යමක් කියන ලද ද මේ එහි අර්ථයයි: මෙසේ විදර්ශනාව මාර්ගයෙන් ගළපා මාර්ග පිළිවෙළින් අග්‍ර මාර්ගයෙන් ඉතිරි නොකොට කෙලෙස් ගෙවා දැමූ කල්හි මතු අනාගතයෙහි ජාතිය ජරාව මරණය යන සියලු සසර දුක් හටගැනීම (සමුදය) නම් වූ ඉපදීම (සම්භවය) නොවෙයි. නැතහොත් ජාතිය නම් වූ දුක්ඛ සමුදය ද ජරාමරණ නම් වූ දුක්ඛ සම්භවය ද නොවෙයි.

ගාථාවෙහි **සත්තසංගපපහීනස්ස** යනු තණ්හා සංග, දිට්ඨි සංග, මානසංග, ක්‍රෝධ සංග, අවිජ්ජා සංග, කිලෙස සංග, දුශ්චරිත සංග යන මේ සත් සංග ප්‍රහීණ බැවින් සත්සංග ප්‍රහීණ කළා වූ. ඇතැමෙක් වනාහි 'අනුසය හත ම සංග හතය'යි කියති. **නෙත්ති ජිනස්ස** යනු සිඳ දමන ලද භව නෙත්ති (තණ්හාව) ඇති. **වික්ඛීණො ජාති සංසාරො** යනු නැවත නැවත ඉපදීම් වශයෙන් පැවති, ඉපදීමට හේතුව වූ බැවින් ද ඉපදීම (ජාතිය) වූ සසර යන අරුතින් ජාති සංසාරයයි. එය භව නෙත්තිය සිඳ දැමීමෙන් ක්ෂීණ වූයේ වෙයි. එහෙයින් ම ඔහුට පුනර්භවයක් නැත.

**පස්වන සූත්‍රය යි.**

# 3.5.6

සයවන සූත්‍රයෙහි **කාමූපපත්තියො** යනු කාම ප්‍රතිලාභ හෝ කාම ප්‍රතිසේවනයෝය. **පච්චුපට්ඨිතකාමා** යනු නිරතුරු කාම, නිරතුරු අරමුණු - මිනිසුන් මෙනි. මිනිස්සු වනාහි තම සිත බැඳුණු වස්තුවෙහි (තමාගේ) බලය පවත්වති. යම්තැනක බැඳුණු සිත් ඇත්තාහු වෙත් ද සියයක් ද දහසක් ද දී ඒ කාන්තාව ම ගෙනවුත් නිතර පරිභෝග (පරිහරණය) කරති (බැඳුණු සම්පත බුදිති.) ඇතැම් දෙවියෝ ද (එසේය). චාතුම්මහාරාජිකයේ පටන් දෙව්ලෝ සතරෙහි වාසය කරන දෙවිවරු බැඳුණු වස්තුවෙහි ම බලය පවත්වති. මෙහි දී පංචසිඛ කථාවස්තුව නිදසුනකි. එසේම අපායට, නිරයට අයත් ඇතැම් සත්ත්වයින් හැර සෙසු අපාය සත්ත්වයෝ ද බැඳුණු වස්තුවෙහි ම (තමාගේ) බලය පවත්වති. මාළුවා තමාගේ මාළුදෙන සමග ද කැසුබුවා තමාගේ කැසුබුදෙන සමගදැයි මෙසේ සියලු තිරිසන්නු ද ප්‍රේතයෝ ද විනිපාතිකයෝ ද එසේය. එහෙයින් නිරයට අයත් සත්ත්වයන් හැර සෙසු අපාය සත්ත්වයන් ගෙන තුසිත දෙවිවරු තෙක් මේ සත්ත්වයෝ පච්චුපට්ඨිත කාම ඇත්තෝ නම් වෙති.

**නිම්මාණරතිනො** යනු තමන් මවාගත් නිර්මාණයෙහි ඇලීම ඔවුන්ට ඇත යනුවෙන් නිර්මාණරති නම් වෙති. ඔවුහු නිල් කහ ආදී වශයෙන් යම්බඳු රූපයකට කැමති වෙත්ද එවැන්නක් මවාගෙන ඇලෙති. ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් වහන්සේගේ ඉදිරියෙහි වූ මනාපකායික දෙව්වරුන් මෙනි. **පරනිම්මිතවසවත්තිනො** යනු අනුන් විසින් මවන ලද කාමයන්හි බලය පවත්වති යන අරුතින් පරනිර්මිත වසවර්තීහු නම් වෙති. ඔවුන්ගේ සිත දැන අන්‍යයෝ කැමති පරිදි කාම වස්තු නිර්මාණය කරති. ඔවුහු එහි බලය පවත්වති. ඔවුහු කෙසේ අනිකකුගේ සිත දනිත් ද? ඇසුරුකිරීම් වශයෙන් දනිති. යම්සේ දක්ෂ අරක්කැමියා අනුභව කරන රජුට යමක් යමක් රුචි වේද, ඒ ඒ දෙය දනියි. මෙසේ ස්වභාවයෙන් කැමති අරමුණ දැන එබන්දක්ම නිර්මාණය කරති. ඔවුහු එහි බලය පවත්වති. මෛථුන සේවනාදී වශයෙන් කාමයන් අනුභව කරති.

ඇතැමෙක් වනාහි 'සිනාසීම් පමණකින් ද බැලීම් පමණකින් ද වැළඳගැනීම් පමණකින් ද අත් අල්ලාගැනීම් පමණකින් ද ඔවුන්ගේ කාම කටයුත්ත ඉටුවේය'යි කියති. එය අටුවාවෙහි 'එය වනාහි නැතැයි' ප්‍රතික්ෂේප කරන ලදී. කයින් ස්පර්ශ නොකරන්නහුට ඵොට්ඨබ්බ කාම කටයුත්තක් සිදු නොවේ. කාමාවචර දෙව්ලෝ හයෙහි දෙවියන්ගේ කාමයෝ ප්‍රකෘති ස්වභාවයෙන් ම යුක්ත වෙති.

එය **ඡ එතෙ කාමාවචරා සබ්බකාම සමංගිනො**
**සබ්බෙසං එකසංඛාතං ආයු භවති කිත්තක'න්ති**

සියලු කාමයන්ගෙන් යුක්ත වූ ඒ කාමාවචර දෙව්ලෝ හයක් ඇත. (ප්‍රකෘති ස්වභාවයෙන් යුක්තවීම් වශයෙන්) එක් ආකාර ලෙස කියන ලද දෙව්ලෝ සියල්ලේ ආයුෂ කොපමණ වේද, යනුවෙන් කියන ලදී.

ගාථාවන්හි **යෙ චඤ්ඤෙ** යනු කියන ලද ආකාර ඇති දෙවියන් සමග අනිකුත් කාමභෝගී යම් මිනිස්සු වෙත් ද අපායට එළඹී ඇතැමෙක් වෙත් ද ඒ සියල්ලෝ ම. **ඉත්ථභාවඤ්ඤථාභාවං** ලබන ලද මේ ආත්මභාවයද උත්පත්ති භවන්තර නම් වූ මෙයින් මතු අනික් ආත්ම භාවදැයි (මේ ආත්මයත් මතු ආත්මයත්) යන දෙආකාර සංසාරය. **නාතිවත්තරෙ** නො ඉක්මවත්. **සබ්බෙ පරිච්චජෙ කාමෙ** යනු දිව්‍ය ආදි ප්‍රභේද ඇති

සියලු කාමයන් වන වස්තුකාමයන් ද ක්ලේශ කාමයන් ද දුරුකරන්නේය. ක්ලේශකාමයන් අනාගාමි මාර්ගයෙන් දුරුකරමින්ම වස්තුකාමයන් දුරුකරයි. **පියරූප සාතරූපගධිතං** යනු ප්‍රිය වූ රූපාදිය කෙරෙහි ඇතිවන සුඛ වේදනා ආස්වාදයෙන් ගිජු වූ. **ඡෙත්වා සොතං දුරච්චයං** අනිත් ශ්‍රෝත (සැඩ දියපහර)වලට වඩා ඉක්මවීමට අපහසු වූ තණ්හා සැඩපහර අර්හත් මාර්ගයෙන් සහමුලින් සිඳ. ඉතිරිය මුලින් කියන ලද ක්‍රමයෙන්මය.

**හයවන සූත්‍රය යි.**

## 3.5.7

සත්වන සූත්‍රයෙහි **කාමයොග යුත්තො** යනු පංචකාමගුණික රාගය කාමයෝගය යි. එයින් යුක්ත වූ = (කාම යෝග යුත්ත) කාමරාගයෙන් යුක්ත වූ පුද්ගලයා. සහමුලින් සිඳ නොදැමූ කාමරාගයට මෙය වචනයකි. රූප අරූප භවයන්හි ඡන්දරාගය භවයෝගය යි. එසේම ධ්‍යානයට ඇති ආශාව ද ශාස්වත දෘෂ්ටිය සමග යෙදුණු රාගය ද වෙයි. එයින් යුක්ත වූ = **භවයොගයුත්තො** පහනොවූ භවරාගය ඇති පුද්ගලයා යන අර්ථයි. **ආගාමී** යනු බඹලොව සිටියත් පිළිසිඳ ගැනීම් වශයෙන් මේ මිනිස්ලොවට පැමිණෙන ස්වභාවය ඇත්තේ. එහෙයින්ම **ආගන්තා ඉත්ථත්තං** යනුවෙන් වදාළහ. මිනිසත් බව නමැති ඉත්ථභාවයට පැමිණෙන ස්වභාව ඇත්තේ, මිනිසුන් අතර උපදින ස්වභාවය ඇත්තේය යන අර්ථයි. මෙහි ඒකාන්තයෙන් කාමරාගය මිනිස්ලොවට පැමිණෙන කාරණයයි. කාමරාගයෙන් යුක්ත යමෙක් ඇද්ද ඔහු ඒකාන්තයෙන් භවරාගයෙන්ද යුක්ත වූයේ වෙයි යනුවෙන් දැක්වීම පිණිස 'කාමයොග යුත්තො භික්ඛවෙ භවයොග යුත්තො' යනුවෙන් දෙකම එක්කොට දේශනා කරන ලදී.

**කාමයොග විසංයුත්තො** යන මෙහි අශුභ ධ්‍යානය ද කාමරාගයෙන් වෙන්වීමය. එය පාදකකොට ලබන ලද අනාගාමි මාර්ගය ඒකාන්තයෙන්ම

කාමරාගයෙන් වෙන්වීම නම් වෙයි. එහෙයින් තුන්වන මාර්ග ඵලයෙහි සිටියා වූ ආර්ය පුද්ගලයා කාමයෝග විසංයුත්තෝ යනුවෙන් කියන ලදී. යම්හෙයකින් වනාහි රූප අරූප භවයන්හි ඡන්දරාගය අනාගාමි මාර්ගයෙන් පහනොවේද එහෙයින් හෙතෙම පහ නොවූ භවයෝග ඇති බැවින් භව යොග යුත්තො යනුවෙන් කියන ලදී. අනාගාමි යනු පිළිසිඳ ගැනීම් වශයෙන් කාමලෝකයට නොපැමිණෙන්නාය. කාමරාගයෙන් වෙන්වීම් වශයෙන් ම ඉතිරි නොකොට ඔරම්භාගිය සංයෝජන මුලිනුපුටා දැමීමත් සමග අධ්‍යාත්ම සංයෝජන ඇති බව සිද්ධවීමෙන් මිනිස්ලොවට නො පැමිණෙන්නේ වෙයි. ආපසු නොඑන ස්වභාව ඇත්තේ එහිදී පිරිනිවෙයි.

ඉතිරි නැතිවම යමෙකුගේ භවරාගය පහවූයේ වේද ඔහුගේ අවිද්‍යා යෝග ආදී ඉතිරි කෙලෙස් ද ඒ හා එක්ව ඇති බැවින් පහවූයේම වෙයි. ඒ සම්පූර්ණයෙන් ගෙවීගිය භවසංයෝජන ඇති තැනැත්තා **අරහං ඛීණාසවො** අර්හත් ය යි ද ක්ෂීණාශ්‍රව ය යි ද කියනු ලැබේ. එහෙයින් 'කාමයොග විසංයුත්තො භික්ඛවෙ භවයොග විසංයුත්තො අරහං හොති ඛීණාසවො' 'මහණෙනි, කාම යෝගයෙන් වෙන් වූ, භව යෝගයෙන් වෙන්වූ පුද්ගල තෙමේ අර්හත් වූ ක්ෂීණාශ්‍රවයෙක් වෙයි යනුවෙන් දේශනා කරන ලදී. මෙහි ද චතුර්ථ ධ්‍යානයේ සුඛ-දුක්ඛ-සෝමනස්ස-දෝමනස්ස ප්‍රහාණය මෙන් ද තුන්වන මාර්ගයේ දිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බත පරාමාස සංයෝජන ගෙවීයාම මෙන් ද සතරවන මාර්ගයේ ගුණ කීම පිණිස කාමරාගයෙන් වෙන්වූ ආනාගාමි පුද්ගලයා කියන ලදැයි දතයුතුය. පළමු පදයෙන් සෝවාන් සකදාගාමීන් සමග සියලු පෘථග්ජනයා ගන්නා ලදී. දෙවන පදයෙන් වනාහි සියලු අනාගාමීහුද තෙවන පදයෙන් රහතන් වහන්සේදැයි රහත්බව කුළුගැන්වීමෙන් දේශනාව නිමකළහ.

ගාථාවන්හි **උභයං** යනු දෙකින් ම, කාමරාගයෙන් ද, භවරාගයෙන්ද යුක්ත වූ යන අර්ථයි. **සත්තා ගච්ඡන්ති සංසාරං** යනු පෘථග්ජනයෝ සෝවාන් වූවෝ සකදාගාමී වූවෝ යන මේ ත්‍රිවිධ සත්ත්වයෝ කාමරාග, භවරාග පහනොකළ බැවින් සසරට යති. එහෙයින්ම **ජාතිමරණ ගාමිනො** ජාතියට මරණයට යන්නෝ වෙති. මෙහි ඒකබීජි, කෝලංකෝල, සත්තක්ඛත්තුපරම යන සෝවාන් වූ තිදෙනා අතරින් සත්තක්ඛත්තුපරම පුද්ගලයා සියල්ලට වඩා මෘදුය. හෙතෙම අටවන භවයක් නො උපදවයි. තමාගේ වෙන්කරන ලද ජාති වශයෙන් සැරිසරයි. අනිත් තැනැත්තා ද

එසේය. සකදාගාමීන් අතරින් යම් පුද්ගලයෙක් මේ මිනිස්ලොවදී සකදාගාමි මාර්ගයට පැමිණ දෙව්ලොව ඉපිද නැවත මෙහි උපදී ද හෙතෙම වෙන්කරන ලද ජාති වශයෙන් සැරිසරයි. සකදාගාමි වූ යම් කෙනෙක් මිශ්‍ර ක්‍රමයෙන් තොරව ඒ ඒ තන්හි දෙවියන් අතරෙහිම හෝ මිනිසුන් අතරෙහිම හෝ උපදිත් ද ඔවුහු ඉහළ මාර්ගය ලැබීම පිණිස (ශ්‍රද්ධාදී) ඉන්ද්‍රියයන් මෝරා යනතුරු නැවත නැවත ඉපදීම් වශයෙන් සැරිසරත්මය. පෘථග්ජනයන් ගැන කිවයුත්තක් ම නැත. සියලු භව සංයෝජනයන් ගෙවී නැති බැවිනි.

එහෙයින්

**කාමයොගෙන සංයුත්තා භවයොගෙන චූභයං**
**සත්තා ගච්ඡන්ති සංසාරං ජාතිමරණගාමිනො**

'කාම යෝගයෙන් ද භවයෝගයෙන් ද යන දෙපරිද්දෙන් ම යුක්ත වූ සත්ත්වයෝ ජාතියට මරණයට යන්නාහු සසරට යති' යනුවෙන් දේශනා කරන ලදී.

**කාමෙ පහන්ත්වාන** යනු කාමරාග නම් වූ ක්ලේශකාමයන් අනාගාමි මාර්ගයෙන් දුරුකොට. **ඡින්නසංසයා** යනු මුලිනුපුටා දැමූ සැක ඇත්තාහු, එය ද සෝතාපත්ති මාර්ගයෙන්මය. සතරවන මාර්ගයේ ගුණ කීම පිණිස මෙසේ දේශනා කරන ලදී. රහතන් වහන්සේ වනාහි මෙහි ඡින්නසංසයා යනුවෙන් අදහස් කරන ලදහ. එහෙයින් ම **ඛීණමානපුනබ්භවා** යනුවෙන් වදාළහ. සියලු ආකාරයෙන් ගෙවුණු නවවිධ මානය ද මතු පුනර්භවය ද ඔවුන්ට ඇත්තේය යන අරුතින් ඛීණමාන පුනබ්භව නම් වෙති. මෙහි මානය ගැනීමෙන් ඒ හා එක්ව ඇති බැවින් හෝ ලක්ෂණ වශයෙන් හෝ සතරවන මාර්ගයෙන් දුරුකළ යුතු සියලු කෙලෙස් ගන්නා ලද්දේ වෙයි. ගෙවුණු මානය ඇති බැවින් ද සඋපාදිසේස නිබ්බාණධාතුව කියන ලද්දේ වෙයි. ගෙවුණු පුනර්භවය ඇති බැවින් අනුපාදිසේස නිබ්බාණ ධාතුව කියන ලද්දේ වෙයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේම ය.

**සත්වන සූත්‍රය යි.**

# 3.5.8

අටවන සූත්‍රයෙහි - **කල්‍යාණ සීලො** යනු සුන්දර සිල් ඇත්තා වූ, සමෘද්ධිමත් සිල් ඇත්තා වූ, පිරිපුන් සිල් ඇත්තා වූ. එහි සීලය සම්පූර්ණ වීම, සීල විපත්තියෙහි ආදීනව මැනවින් දැකීමෙන් ද සීල සම්පත්තියෙහි අනුසස් දැකීමෙන්දැයි කරුණු දෙකකින් සිදුවෙයි. මෙහි වනාහි සියලු බන්ධන (කෙලෙස්) වලින් මිදුණු සියලු ආකාරයෙන් පරිපූර්ණ වූ මාර්ග ශීලයේ ද ඵල ශීලයේ ද වශයෙන් කල්‍යාණ බව දතයුතුය. **කල්‍යාණ ධම්මො** යන්නෙන් සියලු බෝධිපාක්ෂික ධර්ම අදහස් කරන ලදී. එහෙයින් ඔහුට කල්‍යාණ වූ සතිපට්ඨානාදී බෝධිපාක්ෂික ධර්ම ඇත්තේය යන අරුතින් කල්‍යාණ ධම්මො නම් වෙයි.

**කල්‍යාණ පඤ්ඤො** යනු ද මාර්ගඵල ප්‍රඥා වශයෙන් ම කල්‍යාණ ප්‍රඥා ඇත්තා වූ. ලෝකෝත්තර ශීලාදී ධර්ම ම වෙනස්නොවන ස්වභාව ඇති බැවින් ඒකාන්ත කල්‍යාණ නම් වෙයි. කිසියම් කෙනෙක් වනාහි 'චතුපාරිශුද්ධි ශීල වශයෙන් කල්‍යාණ සීලය, විදර්ශනා මාර්ග ධර්ම කල්‍යාණ ධර්මය, මාර්ගඵල ප්‍රඥා වශයෙන් කල්‍යාණ ප්‍රඥාව' යයි කියති. ඇතැමෙක් 'ඒවා අශෛක්ෂ වූ ම ශීල-සමාධි-ප්‍රඥා යයි කියති.

අන් පිරිසක් 'සෝවාන්, සකදාගාමි අයගේ මාර්ගඵල ශීලය කල්‍යාණ ශීලය නම් වේ. එහෙයින් 'කල්‍යාණසීලො' යන මෙයින් සෝවාන් පුද්ගලයා ද සකදාගාමි පුද්ගලයා ද ගන්නා ලද්දාහු ම වෙති. ඔවුහු ශීලයන් සම්පූර්ණ කරන්නෝ නම් වෙති. අනාගාමි මාර්ගඵල ධර්ම ද අග්‍රමාර්ග ධර්ම ද කල්‍යාණ ධර්ම නම් වේ. එහි බෝධිපාක්ෂික ධර්ම භාවනාවෙන් පරිපූර්ණ බවට යයි. එහෙයින් 'කල්‍යාණධම්මො' යන මෙයින් තුන්වන මාර්ගස්ථයාගේ පටන් ආර්යයෝ තිදෙනා ගන්නා ලද්දාහු වෙති. ප්‍රඥාවේ මුදුන් පැමිණීමෙන් අග්‍රඵලයෙහි ප්‍රඥාව කල්‍යාණ ප්‍රඥා නම් වේ. එහෙයින් ප්‍රඥාවෙන් විපුලත්වයට පත් රහතන්වහන්සේ 'කල්‍යාණපඤ්ඤො' යයි කියන ලදී. මෙසේ ම පුද්ගලයෝ ගන්නා ලද්දාහු වෙති'යි කියති. මේ විස්තරයෙන් ඇති ප්‍රයෝජනය කුමක් ද? 'අග්‍ර වූ මාර්ගඵල ධර්ම මෙහි කල්‍යාණ ශීලාදියයි කියන ලදී' යන මෙය අපගේ රුචියයි. මේ ධර්ම විභාගයෙන් පුද්ගල විභාගය යි. ධර්ම විභාගයක් නොවේ.

කෙවලී යන මෙහි - කිසිවක් සමග මිශ්‍ර නොවූ බැවින් සියලු සංඛතවලින් නිදහස් වූ නිවනට 'කෙවල' යයි කියනු ලැබේ. එය ලබාගත් බැවින් රහතන් වහන්සේ 'කෙවලී' නම් වෙති. නැතහොත්, ප්‍රහාණයේ ද භාවනාවේ ද පරිපූර්ණත්වයෙන් ද අවසන් නිවැරදි ධර්ම පරිපූර්ණත්වයෙන් ද කල්‍යාණ අර්ථයෙන් ද නො ගෙවෙන අශෛක්ෂ සැප ඇති බැවින් ද අර්හත්වය කේවල ය. ඒ අර්හත්වය ලැබීමෙන් ක්ෂීණාශ්‍රවයන් වහන්සේ කේවලී ය. මාර්ග බ්‍රහ්මචරිය වාසය වැස නිමකොට සිටියේ යන අරුතින් **වුසිතවා** නම් වේ. උතුම් වූ අග්‍ර වූ අශෛක්ෂ ධර්මවලින් යුක්ත බැවින් **උත්තමපුරිසො** යයි කියනු ලැබේ.

**සීලවා** යන මෙහි කුමන අරුතකින් ශීල නම් වේද? ශීලන අර්ථයෙන් ශීලය නම් වේ. මේ ශීලනය නම් කුමක් ද? එක්තැන් කිරීමයි. සුසීල වශයෙන් කාය කර්මාදීන්ගේ නොවිසිරුණු බව යන අර්ථයි. නැතහොත් උපධාරණයයි (දරණුවයි), ධ්‍යානාදී කුශල ධර්මයන්ට පිහිටීම් වශයෙන් ආධාර බව යන අර්ථයි. එහෙයින් හික්මෙයි යන අරුතින් ශීල නම් වේ. (සීලති, සීලෙතීති වා සීලං), පළමුව මේ ශබ්ද ලක්ෂණ න්‍යායෙන් ශීලයේ අර්ථය යි. අන් පිරිසක් ශීර්ෂය (ප්‍රධාන) යන අර්ථය ශීල අර්ථ යයි ද (සිරට්ඨො සීලට්ඨො), ශීතල යන අර්ථය ශීල අර්ථයයි ද (සීතලට්ඨො සීලට්ඨො), ශාන්ත අර්ථය ශීල අර්ථයයි ද (සිවට්ඨො සීලට්ඨො) නිරුක්ති න්‍යායෙන් අර්ථ වර්ණනා කරති. ඒ මේ ශීලය, පරිපූර්ණ වශයෙන් හෝ අතිශය වශයෙන් හෝ මොහුට ඇත්තේය යන අරුතින් සීලවා නම් වේ. චතුපාරිශුද්ධි ශීල වශයෙන් ශීලයෙන් යුක්ත තැනැත්තා යන අර්ථයයි. එහි යම් ප්‍රධාන ශීලයක් වේද එය විස්තරකොට දැක්වීමට 'පාතිමොක්ඛ සංවර සංවුතො' යනාදිය දෙසන ලදැයි ඇතැම් ආචර්යවරුන්ගේ අදහසයි. අන් පිරිසක් - උභයාර්ථය (මෙලොව පරලොව ප්‍රයෝජන පිණිස) ප්‍රාතිමෝක්ෂ සංවරය භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලදැයි කියති. ප්‍රාතිමෝක්ෂ සංවරයම ශීලය යි. අන්තැන්හි ඉන්‍ද්‍රිය සංවරය, දොරටු සය රැකීම් පමණමය. ආජීව පාරිශුද්ධිය, දැහැමින් ප්‍රත්‍ය ඉපදවීම් මාත්‍රයමය. ප්‍රත්‍ය සන්නිශ්‍රිතය, ලබන ලද ප්‍රත්‍යයන් ප්‍රයෝජනය මේ යයි නුවණින් සලකා පරිභෝග කිරීම් මාත්‍රය මය. නිෂ්පර්යායයෙන් (වෙනස් නොකළ හැකි ආකාරයෙන්) ප්‍රාතිමෝක්ෂ සංවරයම ශීලය යි.

යමෙකුගේ ඒ ශීලය බිඳුනේ වේද, හෙතෙම හිස කැපූ පුරුෂයෙකු මෙන් අත් පා සෙසු කොටස් රකින්නේ ය යි නොකිව යුතුය. යමෙකුගේ ශීලය නිරෝගි ද හෙතෙම නො කපන ලද හිස ඇති පුරුෂයෙකු වැනිය. ඔහු ඒවා නැවත ප්‍රකෘතිමත් කොට රකින්නට හැකිවෙයි. එහෙයින් 'සීලවා' යන මෙයින් ප්‍රාතිමෝක්ෂ ශීලයම පෙන්වා දී එය විස්තර කරන්නට 'පාතිමොක්ඛ සංවර සංවුතො' යනාදිය දෙසන ලදී.

එහි **පාතිමොක්ඛං** යනු ශික්ෂාපද ශීලය යි. යමෙක් ඒ ශීලය රකීද ඒ ශීලය තෙමේ සිල් රකින පුද්ගලයා අපායාදී දුක්වලින් නිදහස් කරයි, මුදයි යන අරුතින් පාතිමොක්ඛ නම් වේ. සංවරණය සංවරයයි. කය වචන දෙකින් නො ඉක්මවීම ය. ප්‍රාතිමෝක්ෂය ම සංවරය යන අරුතින් ප්‍රාතිමෝක්ෂ සංවරයයි. ඒ ශීලයෙන් ආවරණය වූයේ වසන ලද කය වචන ඇත්තේ යන අරුතින් **පාතිමොක්ඛ සංවර සංවුතො** නම් වේ. මේ ඒ ශීලයෙහි ඔහුගේ පිහිටි බව දැක්වීමයි. **විහරති** යනු එයට අනුරූප විහරණයෙන් යුක්ත බව දැක්වීමයි. **ආචාරගොචරසම්පන්නො** යනු යටින් ප්‍රාතිමොක්ෂ සංවරයටත් ඉහළින් විශේෂයන්ගේ යෙදීමටත් උපකාරක ධර්ම දැක්වීමයි. **අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවි** යනු ප්‍රාතිමෝක්ෂ ශීලයෙන් ඉවත්නොවන ස්වභාවය දැක්වීමයි. **සමාදාය** යනු ඉතිරි නොකොටම ශික්ෂා පදයන්ගේ ගැනීම දැක්වීමයි. **සික්ඛති** යනු ශික්ෂාවෙන් යුක්ත බව දැක්වීමයි. **සික්ඛාපදෙසු** යනු හික්මිය යුතු කරුණු දැක්වීමයි.

වෙනත් ක්‍රමයක් : කෙලෙසුන්ගේ බහුල බැවින් ද පව්කිරීමෙහි පහසු බැවින් ද පින් කිරීමෙහි දුෂ්කර බැවින් ද බොහෝ වාරයක් අපායවල වැටෙන ස්වභාවය ඇත්තේ යන අරුතින් පාතී නම් වේ. පෘථග්ජනයාය. අනිත්‍ය බව නිසා හෝ භවාදීන්හි කර්මවේගයෙන් ඇද දමන ලද ජලය උඩට ගන්නා යන්ත්‍රයක් මෙන් චලනය නිසා කැරකෙමින් ගමන්කරන ස්වභාව ඇත්තේ යන අරුතින් පාතී නම් වේ. මරණ වශයෙන් හෝ ඒ ඒ සත්ත්ව නිකායෙහි ආත්මභාවයේ වැටෙන ස්වභාව ඇත්තේ යන අරුතින් පාතී නම් වේ. සත්ත්ව සන්තානයයි, සිතම ය. ඒ පාති නම් වූ සිත සසර දුකින් මුදයි යන අරුතින් පාතිමොක්ඛ නම් වේ.

සිතේ මිදීමෙන් සත්ත්වයා මිදුනේ වෙයි. 'චිත්තවොදානා විසුජ්ඣන්ති' 'සිත පිරිසිදු වීමෙන් (සත්ත්වයෝ) පිරිසිදු වෙති.' යනුවෙන්

ද අනුපාදාය ආසවෙහි චිත්තං විමුත්තං' 'අල්ලා නොගැනීමෙන් ආශ්‍රව කෙරෙන් සිත මිදුනේ වෙයි' යනුවෙන් ද දෙසන ලදී.

නැතහොත් අවිද්‍යාදි හේතුවෙන් සසරෙහි වැටෙයි, යයි, පවතියි යන අරුතින් පාති නම් වේ. **'අවිජ්ජා නීවරණානං සත්තානං තණ්හා සංයෝජනානං සන්ධාවතං සංසරතං'** 'අවිද්‍යා නීවරණයෙන් යුක්ත, තෘෂ්ණා සංයෝජනයෙන් යුක්තව දුවන්නා වූ (සසර) සැරිසරන්නා වූ සත්ත්වයන්ගේ'යි කියන ලදී. මෙය කරණකොට තණ්හාදි සංක්ලේශවලින් ඒ වැටෙන සත්ත්වයාගේ මිදීම වේ යන අරුතින් පාතිමොක්ඛ නම් වේ. 'කණ්ඨකාලො' යනාදීන්ගේ මෙන් මේ පදයේ සමාස සිද්ධිය දතයුතුය.

නැතහොත් දුකෙහි හෙළයි යොදයි යන අරුතින් පාති නම් වේ. සිතය. **'චිත්තෙන නීයති ලොකො චිත්තෙන පරිකස්සති'** 'ලෝවැසියා සිතෙන් ගෙනයනු ලැබේ. සිතෙන් එහාට මෙහාට අදියි' යනුවෙන් කියන ලදී. මෙය කරණකොට ඒ වැටෙන්නාගේ මිදීම වේ යන අරුතින් පාතිමොක්ඛ නම් වේ.

මෙය කරණකොට අපා දුකෙහි ද සසර දුකෙහි ද වැටෙයි යන අරුතින් පාති නම් වේ. තණ්හාදි ක්ලේශයයි. **'තණ්හා ජනෙති පුරිසං'** 'තණ්හාව පුරුෂයා උපදවයි' යනුවෙන් ද **'තණ්හා දුතියො පුරිසො'** පුරුෂයා තණ්හාව දෙවැන්නියකොට ඇත්තේය' යනුවෙන් ද කියන ලදී. ඒ සංක්ලේශ නම් වූ පාතියෙන් මිදීම වෙයි යන අරුතින් පාතිමොක්ඛ නම් වේ.

නැතහොත් මෙහි වැටෙයි යන අරුතින් පාතීති නම් වේ. ආධ්‍යාත්මික බාහිර ආයතන හයයි. **'ඡස්සු ලොකො සමුප්පන්නො ඡස්සු කුබ්බති සන්ථවං'** (ඇස ආදී) ආයතන හය හටගත් කල්හි ලොව හටගත්තේ වෙයි. ෂඩායතනයෙහි ආශ්‍රය කරයි යනුවෙන් දෙසන ලදී. ඒ ආධ්‍යාත්මික බාහිර ආයතන සය නම් වූ පාතියෙන් මිදීම යන අරුතින් පාතිමොක්ඛ නම් වේ. නැතහොත් මෙයට හෙළීම යෙදීම ඇත්තේය යන අරුතින් පාතී නම් වේ. සසරය. ඒ පාති නම් වූ සසරින් මිදීම යන අරුතින් පාතිමොක්ඛ නම් වේ.

නැතහොත් සියලු ලෝකයට අධිපති භාවයෙන් ධර්මයට අධිපති වූ භාග්‍යවතුන් වහන්සේ 'පති' යයි කියනු ලැබෙත්. උන්වහන්සේ කරණකොට මිදෙයි යන අරුතින් මොක්ඛ නම් වේ. පති නම් වූ භාග්‍යවතුන් වහන්සේගේ මිදීම - උන්වහන්සේ විසින් පණවන ලදැයි යන අරුතින් පතිමොක්ඛ නම්. පතිමොක්ඛයම පාතිමොක්ඛ නම්.

සියලු ගුණයන්ට මූලභාවයෙන් හෝ උත්තම අර්ථයෙන් 'පති' වූයේද එයමය කියන ලද අර්ථයෙන් 'මොකඛ' වූයේ ද එයම යයි 'පතිමොකඛ' නම් වේ. 'පතිමොකඛ' යම 'පාතිමොකඛ' නම් වේ. 'පාතිමොකඛනති මුඛමෙතං පමුඛමෙතං' යන විස්තරය කළයුතුය.

නැතහොත් **ප** යනු ආකාරයයි. **අති** යනු අච්චන්ත (අතිශයින් අධික) යන අර්ථයෙහි නිපාතය යි. එහෙයින් ආකාරවලින් අතිශයින් නිදහස් වෙයි යන අරුතින් පාතිමොක්ඛ නම් වේ. මේ ශීලය වනාහි තමා තදංග වශයෙන් ද සමාධි සහිත වූයේ විෂ්කම්භන වශයෙන් ද ප්‍රඥා සහිත වූයේ සමුච්ඡේද වශයෙන් ද අතිශයින් නිදහස් වෙයි. මිදෙයි යන අරුතින් පාතිමොක්ඛ නම් වේ.

වෙන් වෙන් වූ මෝක්‍ෂය හෝ පතිමොක්ඛ නම් වේ. ඒ ඒ ඉක්මවිය යුතු දෝෂයෙන් වෙන් වූ මෝක්‍ෂය යන අර්ථයයි. පතිමොක්ඛයම පාතිමොක්ඛ වේ.

නැතහොත් මොක්ඛ යනු නිවනයි. ඒ මෝක්‍ෂයට ප්‍රමුඛ වූයේ ප්‍රතිබිම්බය වූයේ පතිමොක්ඛයයි. ප්‍රාතිමෝක්‍ෂ සංවරශීලය වනාහි හිරුට අරුණ උදාවීම මෙන් නිවනේ උදාව වූයේ ඊට සමාන වූයේ වෙයි. සුදුසු පරිදි කෙලෙස් නිවන හෙයින් පතිමොක්ඛ නම් වේ. පතිමොක්ඛයම පාතිමොක්ඛ වේ.

එසේ නැතහොත් මෝක්‍ෂය වෙත පවතී. මෝක්‍ෂයට අභිමුඛ වේ යන අර්ථයෙන් පාතිමොක්ඛ නම්. පාතිමොක්ඛයම ප්‍රාතිමොක්ඛයයි. මෙසේ පළමුව මෙහිදී පාතිමොක්ඛ ශබ්දයේ අර්ථය දතයුතුය.

මෙය කරණකොට හික්මවයි වසාදමයි යන අරුතින් සංවර නම් වේ. ප්‍රාතිමෝක්ෂයම සංවරය වූයේ ප්‍රාතිමෝක්ෂ සංවරයයි. අර්ථ වශයෙන් වනාහි ඉක්මවිය යුතු ඒ ඒ ශික්ෂාපදවලින් වැලකී සිටීම ද චේතනා ද වේ. ඒ ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් යුක්ත වූයේ සමන්නාගත වූයේ 'පාතිමොක්ඛ සංවර සංවුතො' යි කියන ලදී. මේ කාරණය **විභංගයෙහි දී 'ඉමිනා පාතිමොක්ඛ සංවරෙන උපෙතො හොති සමුපෙතො උපගතො සමුපගතො සමපනෙනා සමනනාගතො, තෙන වුච්චති පාතිමොක්ඛ සංවර සංවුතො'**යි කියන ලදී. විහරති යනු ඉරියව් පැවැත්වීමෙන් වාසය කරයි, ඉරියව් පවත්වයි පවතී.

**ආචාරගොචර සමපනෙනා** යනු උණදඬු දීම ආදී මිථ්‍යාජීවය ද කයේ අසංවර ආදියද නොකිරීමෙන් සියලු ආකාරයෙන් අනාචාරය දුරුකොට කායික නොඉක්මවීම වාචසික නොඉක්මවීම ය යි මෙසේ කියන ලද භික්ෂුවට ගැලපෙන ආචාර සම්පත්තියෙන් ද වෛශ්‍යාවන් හැසිරෙන තැන් ආදි නුසුදුසු තැන් දුරුකොට පිඬුසිඟා යෑම් ආදී කරුණකට එළඹීමට සුදුසු තැන් නම් වූ ගෝචරයෙන් ද යුක්ත බැවින් ආචාරගෝචර සම්පන්න වූ.

තවද : යම් භික්ෂුවක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව සහිත වූයේ සබ්‍රහ්මචාරීන් කෙරෙහි (එක්ව බඹසර හැසිරෙන්නවුන් කෙරෙහි) ගෞරව සහිත වූයේ හිරිඔතප් දෙකින් යුක්ත වූයේ හොඳින් අඳනය අඳින ලද්දේ හොඳින් සිවුර පොරවන ලද්දේ පැහැදීම් ඇතිකරන ලෙස ඉදිරියට යාමෙන් ආපසු ඒමෙන් ඉදිරිපස බැලීමෙන් වටපිට බැලීමෙන් අත්පා දිගහැරීමෙන් හැකිලීමෙන් යටහෙළු ඇස් ඇත්තේ මනා ඉරියව් පැවැත්මෙන් යුක්ත වූයේ සිහිනුවණින් යුක්ත වූයේ අල්පේච්ඡ වූයේ, ලද දෙයින් සතුටු වූයේ, අතිශය විවේකයෙන් යුක්ත වූයේ පිරිස් සමග සම්බන්ධ නොවූයේ, ආභිසමාචාරික සිල් සකස්කොට කරන්නේ ගරුකිරීම් බහුලකොට ඇත්තේ වාසය කරයි ද මෙය ආචාරගෝචර සම්පන්න යයි කියනු ලැබේ. ගෝචරය වනාහි උපනිස්සය ගෝචරය, ආරක්ඛ ගෝචරය, උපනිබන්ධ ගෝචරයයි ත්‍රිවිධය.

එහිදී යමෙකු නිසා නොඇසූ දේ අසයි ද ඇසූ දේ පිරිසිදු කරගනියිද සැක දුරුකර ගනියි ද තමාගේ අදහස් නිවැරදි කරගනියි ද, සිත පහදවා

ගනියි ද, යමෙකුට අනුව භික්මෙන්නේ ශ්‍රද්ධාව වැඩේද ශීලයෙන්, ශ්‍රැතයෙන්, ත්‍යාගයෙන්, ප්‍රඥාවෙන් වැඩේද දසකථා වස්තු ගුණයෙන් යුක්ත වූ කියන ලද ලක්‍ෂණ ඇති මේ කල්‍යාණ මිත්‍රයා උපනිස්සය ගෝචර නම් වෙයි.

යම් භික්‍ෂුවක් ගම තුළට පිවිසියේ මාර්ගයට බැසගත්තේ යටහෙළු ඇස් ඇත්තේ වියගසක (බඹයක්) පමණ දුර දක්නේ සංවර වූයේ ගමන් කරයි ද ඇතෙකු දෙස නොබලමින් අශ්වයකු දෙස, රථයක් දෙස, ස්ත්‍රියක දෙස පුරුෂයකු දෙස නොබලමින් දිසා අනුදිසා (වටපිට) නොබලමින් ගමන් කරයි ද මේ ආරක්ඛ ගෝචරයයි.

උපනිබන්ධ ගෝචරය වනාහි භික්‍ෂුව තමාගේ සිත බැඳ තබන සතර සතිපට්ඨානයයි. '**කො ච භික්ඛවෙ භික්ඛුනො ගොචරො සකො පෙත්තිකො විසයො, යදිදං චත්තාරො සතිපට්ඨානා**' 'මහණෙනි, භික්‍ෂුවට තමා සතු වූ පියාගෙන් උරුම වූ හැසිරීමට සුදුසු පෙදෙස කුමක්ද? මේ සතර සතිපට්ඨානයයි' යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් දේශිතය. මෙසේ කියන ලද ආචාර සම්පත්තියෙන් ද ගෝචර සම්පත්තියෙන් ද යුක්ත වූ බැවින් ආචාර ගෝචර සම්පන්න නම් වේ.

**අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී** යනු අල්පමාත්‍ර වූද ඉතා කුඩා වූද නොදැන පැමිණි සේඛියා, අකුසල සිත් ඉපදීම ආදී භේද ඇති වරදෙහි භය දකින ස්වභාවය ඇත්තේ. යම් භික්‍ෂුවක් පරමාණුවක් තරම් කුඩා වරදක් යොදුන් හැටඅට ලක්‍ෂයක් උස සිනේරු (මහමෙර) පර්වත රාජයා සමානකොට දකී ද යමෙක් සියල්ලටම අඩු දුර්භාෂිත (වැරදි වචන කීම්) මාත්‍රයක් පාරාජික සිකපදයක් සමානකොට දකී ද මොහු අණුමාත්‍ර වරදෙහි භය දක්නා වූ තැනැත්තා නම්.

**සමාදාය සික්ඛති සික්ඛාපදෙසු** යනු ශික්‍ෂාපදයන්හි හික්මිය යුතු යමක් ඇත් ද එය සියලු ආකාරයෙන් ඉතිරි නොකොට සමාදන්ව හික්මෙයි, පවතී, පුරයි යන අර්ථයි.

**ඉති කල්‍යාණ සීලො** යනු මේ ආකාරයෙන් යහපත් ස්වභාව ඇත්තෙක් ව. පුද්ගල අධිෂ්ඨාන (පුද්ගලයා මතුකොට තැබීම්) වශයෙන්

දක්වනලද ශීලය 'එවං ඛො භික්ඛවෙ භික්ඛු කල්‍යාණසීලො හොති' යනුවෙන් කියන ලද පුද්ගල අධිෂ්ඨාන වශයෙන් ම නිගමනය කොට 'කල්‍යාණ ධම්මො' යනුවෙන් මෙහි කියන ලද ධර්ම දක්වනු කැමැත්තෙන් ඒ ධර්මයන්ට මේ ශීලය පිහිටීම (අධිෂ්ඨාන)යයි දක්වන්නට නැවත 'ඉති කල්‍යාණසීලො' යනුවෙන් කියන ලදී. 'සත්තන්නං බොධිපක්ඛියානං' ආදී සියල්ල මුලදී කියන ලද අර්ථ ඇත්තේමය. නැවත 'කල්‍යාණ සීලො' යනාදිය නිගමනය යි.

ගාථාවන්හි **දුක්කටං** යනු නොමනා ලෙස කරන ලද, දුශ්චරිතය යන අර්ථයි. **හිරිමනං** යනු ලජ්ජා ඇති ලජ්ජාවෙන් යුක්ත වූ, හැම අයුරින්ම පාපයේ පැවැත්ම. පිළිකුල් කරන ස්වභාවය යන අර්ථයි. ලජ්ජාව සහිත සිත හෝ 'හිරිමනං' නම්. හිරිය ගැනීමෙන් ම මෙහි ඔත්තප්පය ද (පාපයට බය) ගන්නා ලදැයි දතයුතුය. හිරි ඔත්තප්ප ගැනීමෙන් සියලු ආකාරයෙන් දුසිරිත් නැති බවට හේතු දක්වමින් කලණ සිල් ඇති බව හේතු වශයෙන් පැහැදිලි කරයි.

සම්බෝධිය නම් වූ ආර්ය මාර්ග ඥානයට යති, එය භජනය කරති යන අරුතින් සම්බෝධි ගාමිනො ය, බෝධිපාක්ෂික යන අර්ථයි. **අනුස්සදං** යනු රාගාදි කෙලෙස් නැති. 'තථාවිධං' යනුවෙන් ද කියති. 'බොධි පක්ඛිකානං ධම්මානං භාවනානුයොග මනුයුත්තො' 'බෝධිපාක්ෂික ධර්ම භාවනා කිරීමෙහි යෙදුණේ යනු යම් යම් අයුරකින් පෙර කියන ලද ද එපරිදිය එබඳුය යන අර්ථයි. **දුක්ඛස්ස** සංසාර දුක්ඛයාගේ හෝ සසර දුකට ඇති හේතු වේ. **ඉධෙව ඛයමත්තනො** ආශ්‍රවයන් ක්‍ෂය කිරීමෙන් තමාගේ සසර දුකට හේතු වූ සමුදය පක්‍ෂයට අයත් කෙලෙස් සමූහයේ 'ඉධෙව' මේ ආත්ම භාවයෙහිම 'ඛයං' නූපදීම දැනගනී.

මේ ආත්ම භාවයෙහි ම අවසාන චිත්ත නිරෝධයෙන් සංසාර දුක්ඛයාගේ ක්‍ෂය, ක්‍ෂීණ බව දැනගනියි. **තෙහි ධම්මෙහි සම්පන්නං** යනු ඒ කියන ලද ශීලාදී ධර්මවලින් යුක්ත වූ. **අසිතං** යනු තණ්හා-දිට්ඨිවල ඇසුර පහ වූ බැවින් අසිතං නම්. ඇතැම් තැනක අනිස්සිතං (යනුවෙන්ද ඇත) **සබ්බ ලොකස්ස** යනු සියලු සත්ත්ව ලෝකයෙහි සෙස්ස කියන ලද ක්‍රමයමයි.

**අටවන සූත්‍රය යි.**

# 3.5.9

නවවන සූත්‍රයෙහි **දානං** යනු දියයුත්ත ය. වස්තු සහිත චේතනාව හෝ දානය යි. සම්පත් පරිත්‍යාගයට මේ වචනයකි. **ආමිසදානං** යනු දිය යුතු බව වශයෙන් සිවුපසය ආමිසදාන නමි. ඒවා තණ්හාදියෙන් ආමර්ශනය (අතගෑම) කළයුතු බැවින් ආමිසයයි කියනු ලැබේ. ඒ ආමිස පරිත්‍යාග චේතනාව හෝ ආමිසදානය යි. **ධම්මදානං** යනු මෙලොව ඇතැමෙක් 'මේ කුශල ධර්මය, මේ අකුසල ධර්මය, මේ සාවද්‍ය ධර්මය, මේ නිරවද්‍ය (නිවැරදි) ධර්මය, මේ නුවණැත්තන් විසින් ගැරහිය යුතු ධර්මය, මේ නුවණැත්තන් විසින් පැසසිය යුතු ධර්මය, සම්පූර්ණයෙන් ගන්නා ලද මේ ධර්ම අහිත පිණිස දුක් පිණිස පවතී. මේ ධර්ම හිතසුව පිණිස පවතින්නේ ය'යි කුශල, අකුශල කර්මපථ බෙදමින් කර්ම, කර්මවිපාක, මෙලොව, පරලොව ප්‍රත්‍යක්ෂ වශයෙන් දක්වන්නාක් මෙන් ප්‍රකට කරමින් අකුසල ධර්මවලින් වලක්වමින් කුශල ධර්මයන්හි පිහිටුවමින් දහම් දෙසයි. මේ ධර්ම දානයයි.

යමෙක් වනාහි මේ ධර්ම අභිඥෙය්‍ය වශයෙන් දතයුතුය. පරිඥෙය්‍ය වශයෙන් දතයුතුය. මේවා පහකළ යුතුය. මේවා ප්‍රත්‍යක්ෂ කළ යුතුය. මේවා වැඩිය යුතුයයි (චතුරාර්ය) සත්‍යය ප්‍රකට කරමින් නිවන් ලැබීම පිණිස ප්‍රතිපත්ති ධර්මය දේශනා කරයි ද මේ කෙළ පැමිණි ධර්මදානය නමි. **එතදග්ගං** යනු (එතං අග්ගං) මෙය අග්‍රය. **යදිදං** යනු (යං ඉදං) යම් මේ ධර්මදානයක් කියන ලද ද මෙය මේ දාන දෙක අතරින් අග්‍රය. ශ්‍රේෂ්ඨය. උත්තමය. නිවන් පිණිස පවතින ධර්මදානය නිසා සියලු අනර්ථයෙන් මිදෙයි. සියලු සසර දුක ඉක්මවයි. ලෞකික ධර්ම දානය වනාහි සියලු දානයන්ගේ නිදානයයි. සියලු සම්පත්තීන්ගේ මූලය. එහෙයින්

> **සබ්බදානං ධම්මදානං ජිනාති සබ්බං රසං ධම්මරසො ජිනාති**
> **සබ්බං රතිං ධම්මරතී ජිනාති තණ්හක්ඛයො සබ්බදුක්ඛං ජිනාති**

'සියලු දන් පරදවා ධර්මදානය ජය ගනී. සියලු රස පරදවා ධර්ම රසය ජයගනී. සියලු ඇල්ම පරදවා ධර්මරතිය ජයගනී. සියලු දුක් පරදවා තණ්හාව ක්ෂයකිරීම ජයගනී' යනුවෙන් වදාළහ.

අභය දානය ද මෙහි ධර්මදානයෙහි ම සංග්‍රහ (ඇතුළත්) කරන ලදැයි දතයුතුය. සාධාරණ (පොදු) පරිහරණ අදහසින් තමා විසින් අනුභව කළයුතු සිවුපසයෙන් තමාම අනුභව නොකොට අනුන්ට බෙදා දීම **ආමිස සංවිභාග** නම්. සාධාරණ පරිහරණ අදහසින්ම තමා විසින් දැනගන්නා ලද අවබෝධ කරන ලද ධර්මය පිළිබඳ මන්දෝත්සාහී නොවී අනුන්ට උපදෙස් දීම **ධම්ම සංවිභාගය යි.** සිවුපසයෙන් ද සතර සංග්‍රහ වස්තුවෙන් ද අනුන්ට අනුග්‍රහය අනුකම්පනය **ආමිසානුග්ගහො** ආමිස අනුග්‍රහයයි. කියන ලද අයුරින්ම ධර්මයෙන් අනුන්ට අනුග්‍රහනය අනුකම්පනය **ධම්මානුග්ගහො** ධර්ම අනුග්‍රහයයි. සෙස්ස කියන ලද අයුරින්මය.

ගාථාවල **යමාහුදානං පරමං** යනු යම් දානයක් චිත්ත (සිත) ඛෙත්ත (ප්‍රතිග්‍රාහක) දෙය්‍ය ධර්ම (දාන වස්තුව)යන්ගේ උදාරත්වයෙන්පරමය උත්තම යනුයි. යෝග සම්පත් ආදිය පිරීම් වශයෙන් ඵලදැරීම් වශයෙන් හෝ අන්‍ය වූ ලෝභය මසුරුකම ආදී වූ ප්‍රතිපක්‍ෂ ධර්මවල මර්දනයෙන් ඒවාට හිංසා කිරීමෙන් උතුම් යයි භාග්‍යවත් බුදුවරු කීවාහුය.

**අනුත්තරං** යනු යම් දානයක් චේතනාදී සම්පත්තියෙන් ද සාතිශය පැවැත්මෙන් ද අග්‍රභාවයෙන් ද අග්‍රවිපාක ඇති බැවින් ද ඊට වඩා උසස් වූවක් නැති ද අනුත්තරභාවය සිදුකිරීම ද ආහු වදාළහ. **යං සංවිභාගං** යන මෙහි ද පරම අනුත්තර පද දෙක ගෙන යෙදිය යුතුය. **අවණ්ණයී** යනු වර්ණනා කළහ. '**භොජනං භික්ඛවෙ දදමානො දායකො පටිග්ගාහකානං පඤ්චඨානානි දෙති**' 'මහණෙනි, භෝජනය දෙන්නා වූ දායකයා ප්‍රතිග්‍රාහකයන්ට (පිළිගන්නා අයට) කරුණු පහක් දෙයි' යනාදියෙන්ද '**සචෙ භික්ඛවෙ ජානෙය්‍යුං දානස්ස සංවිභාගස්ස විපාකං**' 'මහණෙනි, ඉදින් සත්ත්වයෝ දානයේ ද බෙදාගැනීමේ ද විපාක දනිත් නම්' යනාදියෙන් ද ප්‍රශංසා කළහ. යම්සේ වනාහි දානය ද බෙදාගැනීමද පරම ද අනුත්තර ද වේද එය දක්වන්නට 'අග්ගමහි' යනාදිය දෙසන ලදී. එහි **අග්ගමහි** යනු ශීලාදී ගුණ විශේෂ යෙදීමෙන් ශ්‍රේෂ්ඨ වූ අනුත්තර වූ පුණ්‍යක්ෂේත්‍ර වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ කෙරෙහි ද ආර්ය සංඝයා කෙරෙහි ද. **පසන්න චිත්තො** යනු කර්මඵලය ඇදහීමෙන් ද රත්නත්‍රය පිළිබඳ ඇදහීමෙන් (ශ්‍රද්ධාවෙන්) ද සිත පහදවමින් විශ්වාස කරමින්. දිය යුතු දෙය ස්වල්පයක් ඇතිකල්හි ද චිත්ත සම්පත්තියෙන් ද ක්ෂේත්‍ර

සම්පත්තියෙන් ද දානය මහානුභාව වෙයි මහත් බැබලීම් වෙයි, මහා පැතිරීම වෙයි. ඒ කාරණය

**නත්‍ථි චිත්තෙ පසන්නම්හි අප්පිකා නාම දක්ඛිණා**
**තථාගතෙ වා සම්බුද්ධෙ අථ වා තස්ස සාවකෙ**

'සිත පැහැදුන කල්හි තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ වෙත හෝ උන්වහන්සේගේ ශ්‍රාවකයකු වෙත හෝ දෙන දානය අල්ප නොවේ' යනුවෙන් කියන ලදී.

**විඤ්ඤූ** යනු ප්‍රඥාව ඇත්තාවූ **පජානං** යනු මැනවින් දානඵලය දාන ආනිසංස දන්නා වූ. **කො න යජෙථ කාලෙ** දීමට සුදුසු කාලය පැමිණි කල්හි කවරෙක් නම් දානය නොදෙන්නේද? ශ්‍රද්ධාව, දිය යුතු දෙය, ප්‍රතිග්‍රාහකයන් යන මේ කරුණු තුන සම්මුඛ වූ කල්හිම දානය හටගනී. අන් අයුරකින් නොවේ. නැතහොත් දීමට සුදුසු කාලයෙහි ප්‍රතිග්‍රාහකයන්ට (කවරෙක් නම් දානය නොදෙන්නේ ද?) මෙසේ පළමු ගාථාවෙන් ආමිස දාන බෙදීමට අනුග්‍රහ දක්වා දැන් ධර්මදානය බෙදීමට අනුග්‍රහ දැක්වීමට 'යෙ ච භාසන්ති' යන දෙවන ගාථාව වදාළහ. එහි **උභයං** යනු 'භාසන්ති සුණන්ති' යනුවෙන් කියන ලද දේශක ප්‍රතිග්‍රාහක යන දෙදෙනාය. මේ වනාහි මෙහි කෙටි අර්ථයයි. යමෙක් **සුගතස්ස** භාග්‍යවතුන් වහන්සේගේ **සාසනෙ** සද්ධර්මයෙහි **පසන්නචිත්තා** ප්‍රසන්න සිත් ඇත්තාහු, විමුක්ති ආයතන ශීර්ෂයෙහි සිට (නිවන මුල්කොට ගෙන) දේශනා කරත් ද එසේම පිළිගනිත් ද ඒ දේශක ප්‍රතිගාහකයන්ගේ **සො** ඒ, ධර්මදාන - ධර්ම සංවිභාග - ධර්ම අනුග්‍රහ නම් වූ **අත්‍ථො** අර්ථය, පරම වූ අර්ථය සිදුකිරීම් වශයෙන් **පරමො** පරම වූ තෘෂ්ණා සංක්ලේශ ආදී සියලු කෙලෙස් මල පිරිසිදු කිරීමෙන් **විසුජ්ඣති** (සත්ත්වයා) පිරිසිදු වෙයි. කෙබඳු අයගේ ද? **යෙ අප්පමත්තා සුගතස්ස සාසනෙ** භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයෙහි යමෙක් අප්‍රමාද වූවාහුද ඔවුන්ගේ.

**සබ්බ පාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා**
**සචිත්ත පරියොදපනං එතං බුද්ධානසාසනං**

යනුවෙන් කෙටියෙන් මෙසේ ප්‍රකාශ කරන ලද සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ **සාසනෙ** අවවාදයෙහි අනුසාසනයෙහි නොපමා වූවාහු

අධිශීල ශික්ෂාදිය සකස්කොට පිළිපදිති. (සම්පාදනය කරති). **තෙසං විසුජ්ඣති** අර්හත්ඵල විශුද්ධියෙන් අතිශයින් ඔවුන්ගේ (පරමාර්ථය) පිරිසිදු වෙයි.

**නවවන සූත්‍රය යි.**

# 3.5.10

දසවන සූත්‍රයෙහි **ධම්මෙන** යනු න්‍යායයෙන්, යහපත් ප්‍රතිපත්ති නම් වූ හේතුවෙන්, කාරණයෙන්. යම් ප්‍රතිපදාවකින් ත්‍රිවිද්‍යාලාභියෙක් වේද ඒ ප්‍රතිපදාව මෙහි ධර්මයයි දතයුතුය. ඒ ප්‍රතිපදාව කුමක්ද? චරණ සම්පදාව ද විද්‍යා සම්පදාව ද වෙයි. **තෙවිජ්ජං** යනු පුබ්බේනිවාසානුස්සති ඤාණය ආදී විද්‍යා තුනෙන් යුක්ත වූ. **බ්‍රාහ්මණං** යනු බහා තබන ලද පව් ඇති බමුණා. **පඤ්ඤාපෙමි** යනු බමුණෙකැයි දන්වමි. පිහිටුවමි. **නාඤ්ඤං ලපිතලාපනමත්තෙන** යනු බමුණු කුලයක උපන් පමණින් බමුණෙකු කොට, අට්ඨක ආදී ඍෂිවරුන් විසින් කියන ලද දෑ කියන පමණින් (තෙවිජ්ජ බමුණකුගෙන්) අනිකකු බමුණෙකු කොට නො පණවමි. නැතහොත් 'ලපිතලාපනමත්තෙන' යනු ඉගෙනීම්-ඉගැන්වීම් පමණකින් බමුණෙකු කොට නොපණවමි. දෙයාකාරයෙන්ම බමුණෝ සාමවේදය ආදී වේද තුන ඉගෙනීමෙන් යම් ත්‍රිවිද්‍යා බමුණෙකු කියත් ද එය ප්‍රතික්ෂේප කරති. පරමාර්ථ වශයෙන් භො භො යනුවෙන් කථාකරන අවිද්‍යාවෙන් වසන ලද ඔවුහු ත්‍රිවිද්‍යා නොවූ බමුණෙකුට ත්‍රිවිද්‍යාලාභී බමුණෙක් යයි කියති. ත්‍රිවිද්‍යා ලාභී බමුණා මෙසේ වෙයි යනුවෙන් දැක්වීම පිණිස අවබෝධ කරගන්නා වූ පුද්ගලයන්ගේ අදහස් වශයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් මේ දේශනාව ආරම්භ කරන ලදී. එහි යම්හෙයකින් චරණ සම්පදාවෙන් තොරව විද්‍යා සම්පත්තියක් නැති හෙයින් විද්‍යා සම්පන්නයාම චරණ සම්පන්නයා වේද එහෙයින් චරණ සම්පදාව ඇතුළත් කොට විද්‍යාව මුල්කොට (විද්‍යා ශීර්ෂයෙන්)ම බමුණකු පණවනු කැමැත්තාහු 'ධම්මෙනාහං භික්ඛවෙ තෙවිජ්ජං බ්‍රාහ්මණං පඤ්ඤාපෙමි' 'මහණෙනි,

මම ධර්මයෙන්ම ත්‍රිවිද්‍යාලාභී බමුණකු පණවමි'යි දේශනාව මතුකොට 'කථඤ්චාහං භික්ඛවෙ ධම්මෙන තෙවිජ්ජං බ්‍රාහ්මණං පඤ්ඤාපෙමි' 'මහණෙනි, මම ධර්මයෙන් ත්‍රිවිද්‍යාලාභී බමුණකු කෙසේ පණවම්දැයි කියනු කැමැත්තෙන් විමසීමකොට පුද්ගලයා මත පිහිටි (පුග්ගලාධිට්ඨාන) දේශනාවෙන් විද්‍යා තුන බෙදමින් 'ඉධ භික්ඛවෙ භික්ඛු' 'මහණෙනි, මේ සසුනෙහි භික්ෂුව' යනාදිය වදාළහ.

එහි **අනෙකවිහිතං** යනු අනේකවිධ, නොයෙක් ආකාරයෙන් පැවති, වර්ණනා කරන ලද යන අර්ථයි. **පුබ්බෙනිවාසං** යනු මේ ජීවිතයට පෙර (සමනන්තර) අතීත භවය මුල්කොට ඒ ඒ තන්හි වසන ලද ස්කන්ධ පරම්පරාව, 'නිවුත්‍ථං' යනු වාසය කරන ලද, විඳින ලද, තමාගේ සිතෙහි ඉපිද නිරුද්ධ වූ හෝ විසූධර්මය. වාසය කරන ලද, ගෝචර නිවාසයෙන් වාසය කරන ලද, තමාගේ විඤ්ඤාණයෙන් දැනගන්නා ලද හෝ අනුන්ගේ විඤ්ඤාණයෙන් දැනගන්නා ලද සිඳුණ මග සිහිකිරීම් ආදියේය.

**අනුස්සරති** යනු 'එක් ජාතියක් ද ජාති දෙකක් දැයි මෙසේ ජාති පිළිවෙළින් අනුව ගොස් සිහිකරයි. නැතහොත් එක්ව සිහිකරයි. සිත යොමුකළ කල්හි පරිකර්මයට අනතුරුවම සිහිකරයි. **සෙය්‍යථීදං** යනු ආරම්භ ආකාරය දක්වන නිපාතයයි. එයින්ම යම් මේ පූර්වේනිවාසයක් අරඹන ලද්දේ වේද ඒ පූර්වනිවාසයේ ආකාරය දක්වමින් 'එකම්පි ජාතිං' යනාදිය වදාළහ. එහි **එකම්පි ජාති** එක් ප්‍රතිසන්ධියක් මුල්කොට ඇති චුතිය අවසානකොට ඇති එක් භවයකට ඇතුළත් වූ ස්කන්ධ පරම්පරාවයි. 'ද්වෙපි ජාතියො' යනාදියෙහි ද මේ ක්‍රමයමයි.

**අනෙකෙපි සංවට්ටකප්පෙ** යනාදියෙහි පිරිහෙන කල්පය සංවට්ට කල්පයයි. වැඩෙන කල්පය විවට්ට කල්පය යි. එහි සංවට්ට කල්පයෙන් පිරිහී පවතින (සංවට්ටට්ඨායී) කල්පය ද එය (සංවට්ටය) මුල්කොට ඇති බැවින් ගන්නා ලද්දේ වෙයි. විවට්ට කල්පයෙන් වැඩී ඇති (විවට්ටට්ඨායි) කල්පය ද ගැනේ. මෙසේ ඇතිකල්හි '**චත්තාරිමානි භික්ඛවෙ කප්පස්ස අසංඛෙය්‍යා කතමානි චත්තාරි? සංවට්ටො, සංවට්ටට්ඨායී, විවට්ටො,** විවට්ටට්ඨායී' 'මහණෙනි, කල්පයක් සම්බන්ධ අසංඛ්‍ය සතරක් ඇත. **කුමන සතරක්ද? සංවට්ට, සංවට්ටට්ඨායී, විවට්ට, විවට්ටට්ඨායී**' යනුවෙන් කියන ලද යම් ඒ අසංඛ්‍ය සතරක් වේද ඒවා ගන්නා ලද්දේ වෙයි.

එහි තේජෝ සංවට්ට, ආපෝ සංවට්ට, වායෝ සංවට්ට යයි සංවට්ට තුනකි. ආභස්සර, සුභකිණ්ණ, වේහප්ඵල යනුවෙන් සංවට්ට සීමා තුනකි. කල්පය තේජසින් (ගින්නෙන්) විනාශවන කල්හි ආභස්සරයෙන් පහළ ගින්නෙන් දැවේ. ජලයෙන්විනාශවන කල්හි සුභකිණ්හයෙන් පහළ ජලයෙන් විනාශ වෙයි. වාතයෙන් විනාශවන කල්හි වේහප්ඵලයෙන් යට වාතයෙන් විනාශ වෙයි. විස්තර වශයෙන් වනාහි කෝටි ලක්‍ෂයක් සක්වල එක්ව විනාශ වෙයි. මෙසේ පුබ්බේනිවාසය (පෙර විසීම) සිහිකරන්නා වූ මෙබඳු වූ මේ භික්‍ෂුව නොයෙක් සංවට්ටකල්ප, නොයෙක් විවට්ටකල්ප, නොයෙක් සංවට්ටවිවට්ට කල්ප සිහිකරයි. කෙසේද? 'අමුත්‍රාසිං' යනාදී ක්‍රමයෙනි. එහි **අමුත්‍රාසිං** යනු අසවල් සංවට්ට කල්පයෙහි අසවල් භවයෙහි හෝ යෝනියෙහි හෝ ගතියෙහි හෝ විඤ්ඤාණට්ඨිතියෙහි හෝ සත්තාවාසයෙහි හෝ සත්තනිකායෙහි හෝ මම වූයෙමි.

**එවනනාමො** යනු තිස්ස (යන නම) හෝ පුස්ස (යන නම) හෝ. **එවං ගොත්තො** යනු ගෝතම හෝ කස්සප හෝ **එවං වණ්ණො** යනු සුදු හෝ කළු. **එවමාහාරො** යනු ඇල්හාලේ බත් මස් හෝ වැටුණු ඵල භෝජනය හෝ. **එවං සුඛදුක්ඛ පටිසංවේදී** යනු නොයෙක් ආකාර කායික චෛතසික හෝ සාමිස නිරාමිස ආදී ප්‍රභේද ඇති සැපදුක් විඳින්නා වූ. **එවමායුපරියන්තො** යනු වසර සියයක් පමණ ආයු කෙළවර හෝ කල්ප අසූහාර ලක්‍ෂයක් පමණ ආයු කෙළවර. **සො තතො චුතො අමුත්‍ර උදපාදිං** යනු ඒ මම ඒ භවයෙන් යෝනියෙන් ගතියෙන් විඤ්ඤාණට්ඨිතියෙන් සත්තාවාසයෙන් සත්ත නිකායෙන් හෝ චුත වූයේ නැවත අසවල් නම් ඇති භවයෙහි යෝනියෙහි ගතියෙහි විඤ්ඤාණට්ඨිතියෙහි සත්තාවාසයෙහි සත්තනිකායෙහි හෝ පහළවීමි. **තත්‍රාපාසිං** යනු ඉන්පසු ඒ භවයෙහිම යෝනියෙහිම ගතියෙහිම විඤ්ඤාණට්ඨිතියෙහිම සත්තාවාසයෙහිම සත්ත නිකායෙහිම හෝ නැවත වූයෙමි (උපන්නෙමි.) 'එවනනාමො' යනාදිය කියන ලද අයුරින්මය.

නැතහොත් යම්හෙයකින් 'අමුත්‍රාසිං' යන මෙය අනුපිළිවෙළින් ඉහළට නැගෙන තමාගේ ප්‍රාර්ථනාවට අනුරූප වූ බලය ඇති පරිදි සිහිකිරීමයි. 'සො තතො චුතො' යනු ආපසු හැරෙන්නාගේ ප්‍රත්‍යවේක්‍ෂණය (නුවණින් බැලීම) යි. එහෙයින් 'ඉධූපපන්නො' යනු මෙලොව මේ උපතට අනතුරුව 'අමුත්‍ර උදපාදිං' යනුවෙන් කියන ලදී.

"තත්‍රාපාසිං" යනු ඒ භවයෙහි ම -පෙ- සත්තනිකායෙහිම හෝ වූයෙමි. 'එවනනාමො' යනු දත්ත හෝ මිත්ත හෝ. 'එවං ගොතෙතා' යනු වාසෙට්ඨ හෝ කස්සප. "එවං වණෙණා" යනු කළු හෝ සුදු හෝ. 'එවමාහාරො' යනු දිව්‍ය ආහාරය හෝ ඇල්හාලේ බත් ආදී ආහාර හෝ. 'එවං සුඛදුකඛපටිසංවේදී' යනු දිව්‍ය සැප විඳින්නා වූ හෝ මිනිස් සැප දුක් විඳින්නා වූ හෝ 'එවමායුපරියනෙතා' යනු මෙසේ ඒ ඒ පරම ආයුෂය කෙළවරකොට ඇත්තා වූ. 'සො තතො චුතො' යනු ඒ මම ඒ භව ආදියෙන් චුත වූයේ. 'ඉධූපපනෙනා' යනු මෙලොව මේ අවසන් භවයෙහි මිනිසෙක්ව උපන්නේ.

**ඉති** යනු මෙසේ. **සාකාරං සඋදෙදසං** යනු නාම-ගෝත්‍ර ආදී වශයෙන් සඋද්දේසය. වර්ණ ආදී වශයෙන් සාකාරය. නාමගෝත්‍රයෙන් වනාහි සත්ත්වයෝ තිස්ස, ගෝතම යයි කියනු ලැබෙත්. වර්ණ ආදියෙන් කළු සුදු යන විවිධත්වයෙන් ප්‍රකට වෙත්. එහෙයින් නාමගෝත්‍රය උද්දේසයයි. අනිත්වා ආකාරය.

**අයමසස පඨමා විජජා අධිගතා** යනු අයං මෙය (අසස=) මේ භික්ෂුව විසින් පළමුව අවබෝධ කිරීම් වශයෙන් පඨමාය, දැනගැනීම් අර්ථයෙන් විජ්ජාය, අධිගතා = ප්‍රත්‍යක්ෂ කළේ වෙයි. මොහු කුමක් දැනගැනීම කරයි ද? පුබ්බෙනිවාසයයි. **අවිජජා** යනු ඒ පූර්වේනිවාසයම නොදැන ගැනීම කරන අර්ථයෙන් ඒ පූර්වේනිවාසයේ වැසීම කරන මෝහය යි කියනු ලැබේ. **තමො** යනු ඒ මෝහයම සඟවන්නා යන අර්ථයෙන් තමො යයි කියනු ලැබේ. **ආලොකො** යනු ඒ විද්‍යාවම බබුළුවන අර්ථයෙන් අලොක නමි. මෙහි ද විද්‍යාව අවබෝධ කරන ලදී යන මේ අර්ථය ඇත. අනිත්වා ප්‍රශංසා වචනය. මෙහි යෙදීම වනාහි : ඒ භික්ෂුව විසින් මේ විද්‍යාව අවබෝධ කරන ලදී. ඒ අවබෝධ කළ විද්‍යාව ඇත්තාගේ අවිද්‍යාව නැසුනේ වෙයි. එහෙයින් විද්‍යාව උපන්නේ වෙයි. සෙසු පද දෙකෙහිද මේ ක්‍රමයමයි. 'යථාතං' යන මෙහි යථා යනු උපමා අර්ථයයි. **තං** යනු නිපාත මාත්‍රයකි. සිහියෙන් වෙන්ව නොවිසීමෙන් **අපපමතතසස** අප්‍රමාද වූ. වීර්ය නම් වූ ආතාපයෙන් **ආතාපිනො** වීර්ය ඇති. කයෙහි ද ජීවිතයෙහි ද අපේක්ෂා නැති බැවින් **පහිතතතසස**, පෙසිතතතසස යන අර්ථයි.

මේ අදහස කියන ලද්දේ වෙයි. යම් සේ අප්‍රමාදව කෙලෙස් තවන වීර්ය ඇතිව කයෙහි ද ජීවිතයෙහි ද අපේක්‍ෂා නැතිව වාසය කරන්නහුගේ අවිද්‍යාව නැසෙන්නේ ද විද්‍යාව උපදින්නේ ද අඳුර නැසෙන්නේ ද ආලෝකය උපදින්නේ ද එසේ ම ඒ භික්‍ෂුවගේ අවිද්‍යාව නැසුනේ වෙයි. විද්‍යාව උපන්නේ වෙයි. අඳුර නැසුනේ වෙයි. ආලෝකය උපන්නේ වෙයි. ඒ වීර්යයෙහි යෙදුනහුට අනුරූපවූම ඵලය ලැබ වාසය කරයි.

දිබ්බෙන චක්‍ඛුනා යන මෙහි යමක් කිවයුතුනම් එය මුලින් කියන ලද්දේමය. විසුද්ධෙන යනු චුති (මරණය) හා උපත (ඉපදීම) දැකීමෙන් දිට්ඨි විසුද්ධියට හේතුවන බැවින් විසුද්ධය. යමෙක් චුතිය පමණක් දකී ද උපත නොදකී ද හෙතෙමේ උච්ඡේද දෘෂ්ටිය ගනියි. යමෙක් උපත පමණක් දකී ද චුතිය නොදකීද හෙතෙමේ අලුත් සත්ත්වයන් පහළවීමේ දෘෂ්ටිය ගනියි. යමෙක් වනාහි ඒ දෙකම දකී ද හෙතෙමේ යම්හෙයකින් ඒ දෙයාකාර දෘෂ්ටිය ඉක්මවයි ද එහෙයින් ඒ දැක්ම දිට්ඨි විසුද්ධියට හේතු වෙයි. මේ බුද්ධපුත්‍රයා ඒ දෙකම දකියි. එහෙයින් 'චුති උපපාත දැකීමෙන් දිට්ඨි විසුද්ධියට හේතුවන බැවින් විසුද්ධ'යි කියන ලදී. එකොළොස් උපක්ලේශවලින් තොර බැවින් හෝ විසුද්ධය. ඒ බව '**විචිකිච්ඡා චිත්තස්ස උපක්කිලෙසො'ති ඉති විදිත්වා විචිකිච්ඡා චිත්තසස උපක්කිලෙසො පජහිතබ්බො, අයොනිසොමනසිකාරො, ථීනමිද්ධං, ඡම්භිතත්තං, උබ්බිලං, දුට්ඨුල්ලං, අච්චාරද්ධවිරියං, අතිලීනවිරියං, අභිජප්පා, නානත්තසඤ්ඤා, අභිජ්ඣායිතත්තං රූපානං චිත්තසස උපක්කිලෙසො පජහිතබ්බො**' යනුවෙන් මෙසේ වදාළහ. 'විචිකිච්ඡාව සිතේ උපක්ලේශයක් යයි මෙසේ දැන සිතේ උපක්ලේශයක් වූ විචිකිච්ඡාව දුරුකළ යුතුය. අයෝනිසෝ මනසිකාරය, ථීනමිද්ධය, තැති ගැනීම, (දැඩි උත්සාහය නිසා සිතේ ඇතිවන) ඉල්පීම, (කායදරථ, කයේ අලස බව නම් වූ) දුට්ඨුල්ලය, දැඩි වීර්යය, අඩු වීර්යය, තණ්හාව (නොයෙක් නොයෙක් රූප මෙනෙහි කිරීමෙන් ඇතිවන) නානත්තසඤ්ඤාව, (එක් ජාතියක රූප මෙනෙහි කිරීම නිසා ඇතිවන) රූපයන් පිළිබඳ අභිනිජ්ඣායනය සිතේ උපක්ලේශයකැයි දුරුකළ යුතුය' මෙසේ කියන ලද එකොළොස් උපක්ලේශවලින් කිලිටි නොවූ බැවින් විසුද්ධය.

මිනිස් පෙදෙස ඉක්මවා රූප දැකීමෙන් අතික්කන්තමානුසකය. මිනිස් මසැස ඉක්මවූ බැවින් හෝ අතික්කන්ත මානුසකය. එහෙයින්

**දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති** යනු මිනිසාගේ මාංස ඇසින් මෙන් සත්ත්වයන් බලයි. දකියි. **චවමානෙ උපපජ්ජමානෙ** යන මෙහි චුතිය ඇතිවන මොහොතෙහි හෝ උපත ඇතිවන මොහොතෙහි හෝ දිවැසින් වුවද දක්නට නොහැක. යමෙක් වනාහි චුතියට ආසන්න වූවාහු ද එකෙණෙහි (දැන්) චුතවන්නාහු ද ඔවුහු 'චවමාන' වෙති. යමෙක් පිළිසිඳ ගත්තාහු හෝ එකෙණෙහි උපන්නාහුද ඔවුහු 'උපපජ්ජමාන' යනුවෙන් අදහස් කරන ලදහ. එබඳු වූ ඒ චුතවන්නා වූ ද උපදින්නා වූ ද සත්ත්වයන් බලයි. දකියි.

**හීනෙ** යනු මෝහය හා යෙදුනු කර්මයෙන් යුක්ත බැවින් හීන වූ ජාති-කුල භෝගාදීන්ගේ වශයෙන් පහත්කොට දන්නා ලද නින්දාවට බඳුන් වූ (සත්ත්වයන්)

**පණීතෙ** යනු අමෝහය හා යෙදුණු කර්මයෙන් යුක්ත බැවින් එයට වෙනස් අයුරින් වූ (සත්ත්වයන්)

**සුවණ්ණෙ** යනු අදෝසය හා යෙදුණු කර්මයෙන් යුක්ත බැවින් ඉෂ්ට වූ (යහපත් වූ) කාන්ත වූ (ප්‍රිය වූ) මනාප වූ (සිත් අලවන්නා වූ) වර්ණයෙන් (පාටින්) යුක්ත වූ (සත්ත්වයන්)

**දුබ්බණ්ණෙ** යනු ද්වේෂය හා යෙදුණු කර්මයෙන් යුක්ත බැවින් අනිෂ්ට වූ අකාන්ත වූ අමනාප වූ වර්ණයෙන් යුක්ත වූ (සත්ත්වයන්), අභිරූප හා විරූප සත්ත්වයන් යන අර්ථයි.*

**සුගතෙ** යනු සුගතියට ගියා වූ (සත්ත්වයන්) අලෝභය හා යෙදුණු කර්මයෙන් යුක්ත බැවින් ආඪ්‍ය වූ මහත් ධන ඇත්තා වූ (සත්ත්වයන්).

**දුග්ගතෙ** යනු දුගතියට ගියා වූ (සත්ත්වයන්) ලෝභය හා යෙදුණු කර්මයෙන් යුක්ත බැවින් දිළිඳු වූ හෝ අල්ප වූ ආහාරපාන භෝජන ඇති (සත්ත්වයන්)

**යථා කම්මූපගෙ** යනු යම් යම් කර්මයක් රැස්කරන ලද ද ඒ ඒ කර්මයෙන් එළඹි (සත්ත්වයන්)

---

* සුවණ්ණා, දුබ්බණ්ණ යන වචන දෙකම සලකා අභිරූප හා විරූප සත්ත්වයන් යනුවෙන් යොදා ඇත.

එහි මුලින් ඇති 'චවමානෙ' යනාදී වචනවලින් දිබ්බචක්ඛු කෘත්‍යය (දිවැසින් කළයුත්ත) කියන ලදී. මේ පදයෙන් වනාහි යථාකම්මූපග ඤාණයෙන් කළ යුත්ත කියන ලදී. මේ එම ඤාණයේ උත්පත්ති ක්‍රමයයි. මේ ශාසනයෙහි භික්ෂුව පහළ නිරය දෙසට ආලෝකය වඩා නිරයට අයත් මහත් වූ දුක් අනුභව කරන සත්ත්වයන් දකියි. මේ දැකීම දිබ්බචක්ඛු ඤාණ කෘත්‍යයම ය. හෙතෙම කුමන කර්මයක් කොට මේ සත්ත්වයෝ ඒ දුක අනුභව කරත්දැයි යනුවෙන් මෙසේ මෙනෙහි කරයි. ඉන්පසු ඔහුට මෙනම් කර්මය සිදුකොට ය යි ඒ කර්මය අරමුණුකොට ඤාණය උපදී. එසේම මතු දෙව්ලොව දෙසට ආලෝකය වඩා නන්දන වනය, මිශ්‍රක වනය ඵාරුසක වනය යනාදියෙහි සම්පත් අනුභව කරන සත්ත්වයන් දකියි. මේ දර්ශනය ද දිබ්බචක්ඛු ඤාණ කෘත්‍යයම ය. හෙතෙම කුමන කර්මයක් කොට මේ සත්ත්වයෝ ඒ සම්පත් අනුභව කරත්දැයි යනුවෙන් මෙසේ මෙනෙහි කරයි. හෙතෙම කුමන කර්මයක් කොට මේ සත්ත්වයෝ ඒ සම්පත් අනුභව කරත්දැයි යනුවෙන් මෙසේ මෙනෙහි කරයි. ඉන්පසු ඔහුට මෙනම් කර්මය සිදුකොටයයි ඒ කර්මය අරමුණුකොට ඤාණය උපදී. මෙය යථාකම්මූපග ඤාණය නම්. මේ ඤාණයට වෙනම පරිකර්මයක් (මූලික සූදානමක්) නම් නැත. මේ ඤාණයට මෙන්ම අනාගතංසඤාණයට ද වෙනම පරිකර්මයක් නැත. දිබ්බචක්ඛුව පාදක (මූලික) කොට ඇති මේවා (යථා කම්මූපග ඤාණ, අනාගතංස ඤාණ) දිබ්බචක්ඛුව සමගම ඇතිවෙයි. 'කාය දුච්චරිතෙන' යනාදියෙහි යමක් කිවයුතුද එය මුලින් කියන ලද්දේම ය. මෙහි **විජ්ජා** යනු දිබ්බචක්ඛු ඤාණ විජ්ජාවය. **අවිජ්ජා** යනු සත්ත්වයන්ගේ චුති පටිසන්ධිය වසන අවිද්‍යාවය. සෙස්ස කියන ලද ක්‍රමයමයි.

තෙවන වාරයෙහි **විජ්ජා** යනු අර්හත් මාර්ගඥාන විද්‍යාවය. **අවිජ්ජා** යනු චතුස්සත්‍ය වසන අවිද්‍යාවය. ඉතිරිය මුලින් කියන ලද ක්‍රමයට අයත් බැවින් දැනගැනීම පහසුමය. 'එවං ඛො' යනාදිය නිගමනය යි.

ගාථාවන්හි මේ කෙටි අර්ථයයි. **යො** යමෙක් කියන ලද පරිදි **පුබ්බෙනිවාසං** පෙර විසීම අවබෝධ කළේ ද කියන ලද අයුරින් ප්‍රකටකොට දනියි ද, 'යො වෙදි' යනු ද පාඨයකි. යො අවෙදි දැනගෙන සිටියේ යන අර්ථයි.

(දෙව්ලෝ හය, රූපාවචර බඹලෝ පසළොස, අරූපාවචර බඹලෝ සතර යන අසඤ්ඤසත්තය යන) විසිහයක් වූ දිව්‍යලෝක නම් වූ සග්ගං ස්වර්ගය ද සතරවැදෑරුම් අපායඤ්ච අපාය ද කියන ලද ආකාරයෙන් දිවැසින් පස්සති දකියි. අථො යනු ඉන් පසු. ජාතික්ඛය ජාතිය ක්‍ෂයවීම නම් වූ රහත් බවට හෝ නිවනට පැමිණියේ, අවබෝධ කරන ලද්දේ. එහෙයින්ම අභිඤ්ඤා අති විශිෂ්ට වූ මාර්ග ප්‍රඥාවෙන් දැනගත යුතු චතුස්සත්‍ය ධර්මය දැන කටයුතු නිමකිරීමෙන් වොසිතො නිමාවට පැමිණියේ, මොනෙය්‍ය ධර්මවලින් යුක්ත බැවින් මුණි ක්‍ෂීණාශ්‍රවයන් වහන්සේ, යම්හෙයකින් එතාහි කියන ලද පරිදි ඒ තීහි විජ්ජාහි ත්‍රිවිද්‍යාවෙන් යුක්ත වූ බැවින් ද එයින් තෙවන විද්‍යාවෙන් හැම ආකාරයෙන් බහා තබන ලද පව් ඇති බැවින් ද තෙවිජ්ජො බ්‍රාහමණො ත්‍රිවිද්‍යාව ලැබූ බ්‍රාහ්මණයා නම් වෙයි. එහෙයින් මම ඒ ත්‍රිවිද්‍යාව ලැබූ බමුණාම තෙවිජ්ජ බ්‍රාහ්මණයා යි කියමි. කී පමණින් දෙඩූ පමණින් යජූර් ආදී මන්ත්‍රපද ඉගෙනගැනීම් පමණින් තෙවිජ්ජ බ්‍රාහ්මණ යයි නො කියමි. ත්‍රිවිද්‍යාලාභියායි නො කියමි.

### දසවන සූත්‍රය යි.

මෙසේ මේ වර්ගයෙහි දෙවන සූත්‍රයෙහි සසර (වට්ට) කියන ලදී. පස්වන අටවන දසවන සූත්‍රවලදීනිවන (විවට්ට) කියන ලදී. අනිත් සූත්‍රවල වට්ට-විවට්ට දෙක කියන ලදැයි දතයුතුය.

### පස්වන වර්ග වර්ණනාව යි.

## පරමත්ථදීපනී නම් වූ ඛුද්දක නිකායට්ඨකථාවට අයත් ඉතිවුත්තකයේ තික නිපාත වර්ණනාව නිමියේ ය.

# 4.1.1

චතුක්ක නිපාතයෙහි පළමු සූත්‍රයෙහි අහං යනු තමා දැක්වීමයි හෙවත් ආත්ම නිර්දේශය යි. යම් අනිකෙක් නොවේ ද ඒ නියකජ්ඣත්ත යයි කියන ලද ආත්මය (තමා) මම (අහං) යයි කියනු ලැබේ. අස්මි යනු යම් පරමාර්ථ බ්‍රාහ්මණ බවක් වේද එය එසේයයි පිළිගැනීම, මම යයි කියමින් තමා කෙරෙහි බ්‍රාහ්මණභාවය ඇති බව පිළිගනිමින් ශාස්තෲන් වහන්සේ 'අස්මි' (වෙමි)යි වදාළහ. 'මම බ්‍රහ්ම වෙමි. මහා බ්‍රහ්ම වෙමි'යිද 'මම ශ්‍රේෂ්ඨ වෙමි'යි ද පහනොවූ දිට්ඨි-මාන අනුසය ඇති පෘථග්ජනයෝ තමන්ගේ දිට්ඨි-මාන යන හැඟීම් සිත තුළ පිහිටුවීම් වශයෙන් යම් සේ කියත් ද මෙසේ (භාග්‍යවතුන් වහන්සේ විසින්) නොකියන ලදී. සියලු ආකාරයෙන් පහවූ දිට්ඨි-මාන අනුසය ඇති භාග්‍යවතුන් වහන්සේ ව්‍යවහාරය නො ඉක්මවමින් ලෝක ව්‍යවහාරයට අනුකූලව හික්මවිය යුතු අයගේ චිත්ත සන්තානයන්හි ධර්මය පිහිටුවමින් හුදෙක් එබඳු ගුණය තමා කෙරෙහි ඇති බව පිළිගනිමින් 'අහමස්මි' (මම වෙමි)යි කීහ.

බ්‍රාහ්මණො යනු බහාතබන ලද පව් ඇති බැවින්ය. ආර්ය මාර්ගය නම් වූ වේදයට* ඤය නැති බැවින් බ්‍රාහ්මණ වෙයි. මේ මෙහි අර්ථය යිඃ මහණෙනි, මම පරමාර්ථ වශයෙන් බ්‍රාහ්මණයෙක් වෙමි. භාග්‍යවතුන් වහන්සේ වනාහි සියලු ආකාරයෙන් පරිපූර්ණ වූ දාන-සංයම ආදී වත් සමාදාන වශයෙන් ඉතිරි නොකොට තපස් චර්යාවෙන් පරතෙරට ගිය සේක. මැනවින් වාසය කරන ලද බ්‍රහ්මචරිය වාසය ඇතිසේක්, සියලු වේදයන්ගේ පරතෙරට ගිය සේක. සපිරිසිඳු විද්‍යාචරණ ඇති සේක. හැම ආකාරයෙන් සෝදාහරින ලද පව්මල ඇති සේක. අනුත්තර ආර්ය මාර්ගයයි කියන ලද වේදය ගැන දේශනා කරන සේක. සුපිරිසිදු ශාසන බ්‍රහ්මචර්යාව පිළිබඳව දේශනා කරන සේක. එහෙයින් සියලු ආකාරයෙන් බහා තබන ලද පව් ඇති බැවින් වේදයට ඤය ඇති බැවින් වේදය කියන බැවින් භාග්‍යවතුන් වහන්සේ උසස් ම අර්ථයෙන් බ්‍රාහ්මණ යයි කියනු ලැබේ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ දෙවියන් සහිත ලෝකයෙහි තමන් වහන්සේගේ අනුත්තර වූ බ්‍රාහ්මණභාවය ප්‍රකාශකොට බ්‍රාහ්මණයෝ යම් මේ දානාදී කර්ම හයක් බමුණන්ට පණවත් ද ඒ සුපිරිසිඳු වූ දානාදී කර්මයන් උසස් අයුරින් තමන්වහන්සේ කෙරෙහි ඇති බව දක්වන්නට 'යාචයොගො' ආදිය වදාළහ.

**එහි යාචයොගො** යනු යාචකයන් සමග යුක්ත වූ. ඉල්ලති යන අරුතින් යාචකයෝ නම් වෙති. ඔවුහු වනාහි මෙහි දී හික්මවිය යුත්තෝය යි දතයුතුයි. ඔව්හු වනාහි 'දෙසෙතු භනෙත භගවා ධම්මං දෙසෙතු සුගතො ධම්මං' 'ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ ධර්මය දේශනා කරනු මැනවි. සුගතයන් වහන්සේ ධර්මය දේශනා කරනු මැනවි' යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ ධර්මදේශනාව ඉල්ලති. භාග්‍යවතුන් වහන්සේ ද ඔවුන්ගේ බලාපොරොත්තු විනාශ නොකොට කැමති පරිද්දෙන් ධර්මය දේශනා කරමින් ධර්ම දානය දෙති යන අරුතින් ඉල්ලීමට සුදුසු වූ සේක් (යාචයොගො) හැමදා හැමකල්හි ඔවුන්ගෙන් තොර නොවූහ.

නැතහොත් : 'යාචයොගො' යනු ඉල්ලීමට සුදුසු, අදහස් සම්පූර්ණ කිරීම් වශයෙන් ඉල්ලන්නට සුදුසු ය යන අර්ථයි. 'යාජයොගො' යනු ද පාඨයකි. එහි මහා දානයට 'යාජ' යයි කියනු ලැබේ. යිට්ඨං (මහා දානය) යන අර්ථයි. මෙහි වනාහි ධර්මදානය දතයුතුය. මහා දානයෙහි නියුක්ත වූයේ යන අරුතින් යාජයොග නම් වේ. **සදා** යනු හැමදා, නිතර පවත්වන සද්ධර්ම මහාදානය යන අර්ථයි. නැතහොත්, යාජ නම් වූ දානය සමග යොදවති යන අරුතින් යාජයොග නම් වේ. ත්‍රිවිධ දානයයි කියන ලද යාජයෙන් සත්ත්වයන් සුදුසු පරිදි යොදවති. ඒ දානයෙහි යොදවති යන අර්ථයි. 'යාජයොගො සතතං' යනු ද පාඨයකි.

**පයත පාණී** යනු පිරිසිදු අත් ඇත්තා වූ, යමෙක් දන්දීමෙහි ඇලුනේ ආමිසදානය දෙමින් සකස්කොට සියතින් දන් දීමට හැමදා සෝදන ලද අත් ඇත්තේ ම වෙයිද හෙතෙම පයතපාණී යයි කියනු ලැබේ. භාග්‍යවතුන් වහන්සේ ද ධර්මදානයෙහි ඇලුනේ සකස්කොට හැමකල්හි ධර්ම දානයෙහි යෙදුනාහුය යි සලකා 'පයතපාණී' යනුවෙන් කියන ලදී. 'සදා පයතපාණී' යනුවෙන් 'සදා' යන පදය ද මේ සමග යෙදිය යුතුය. ශාස්තෘන් වහන්සේ බෙදීමක් නැතිව වෙනෙය්‍ය ලෝකයාට (හික්මවීමට සුදුසු අයට) සද්ධර්ම දානය හැමදා හැමකල්හි පවත්වමින් එහි යෙදුනු තැනැත්තෙක් වී වාසය කරති.

වෙනත් ක්‍රමයක් : භාවනාව යෝගයයි කියනු ලැබේ. 'යොගා වෙ ජායතෙ භූරි' 'යෝගයෙන් ප්‍රඥාව උපදී' යයි එහෙයින් කීය. 'යාජයොගො' යනු යාජ භාවනාවට පරිත්‍යාග භාවනාවට අනුයුක්ත වූ (යෙදුණු) යන අර්ථයි. භාග්‍යවතුන් වහන්සේ අභිසම්බෝධියට පෙර බෝසත් කාලයේම

කරුණාවෙන් උත්සාහ කරන ලද්දේ සියලු ආකාරයෙන් දානය වර්ධනය කරමින් එහි උසස් අයුරින් කෙළවරට පැමිණි තැනැත්තෙක්ව අභිසම්බෝධියට පැමිණියහ. බුදු වී ද ත්‍රිවිධ දානය විශේෂ වශයෙන් ධර්ම දානය වැඩූහ. අන්‍යයන් ද එහි යෙදවූහ. එසේ උන්වහන්සේ වෛනෙය්‍ය යාචකයන් (හික්මවීමට සුදුසු අය) අතුරෙන් කෙනෙකුට සරණ දුන්හ. කෙනෙකුට පන්සිල් ද කෙනෙකුට දසසිල් ද කෙනෙකුට සිවු පිරිසිදු සිල් ද කෙනෙකුට ධුත ධර්ම ද කෙනෙකුට සතර ධ්‍යානයන් ද කෙනෙකුට අටසමවත් ද කෙනෙකුට පංච අභිඥා ද සතර මාර්ග ද සතර සාමඤ්ඤ ඵල ද ත්‍රිවිද්‍යාව ද සිවුපිළිසිඹියා දැයි මෙබඳු ලෞකික ලෝකොත්තර භේද ඇති ගුණ ධනය ධර්මදාන වශයෙන් අදහස් කළ පරිදි දෙමින් එසේ දෙන්නැයි අනුන් ද යොදවමින් පරිත්‍යාග භාවනාව වැඩූහ. එහෙයින් පරිත්‍යාග භාවනාවට අනුයුක්ත වූ යනුවෙන් කියන ලදී. 'පයතපාණී' යනු 'ආයතපාණී' හෝ වෙයි. අතට පත් යමක් දීමට එන්න ගන්නැයි දිගු කළ අත් ඇති කෙනෙකු මෙන් ගුරුමුෂ්ටි නොතබා සද්ධර්ම දානයෙහි යෙදුණේ යන අර්ථයි. නැතහොත් 'පයතපාණී' යනු උත්සාහවත් වූ අත් ඇත්තේ, ආමිස දානය දීමට උත්සාහවත් වූ අත් ඇති කෙනෙකු මෙන් ධර්මදානයෙහි කරන ලද උත්සාහ ඇත්තේ යන අර්ථයි.

අනතිම දෙහධරො යනු බ්‍රහ්මචරිය වාසයෙන් බ්‍රාහ්මණ කරණ ධර්ම සම්පූර්ණ කිරීමෙන් අවසන් ආත්මභාවය දරන්න වූ. බ්‍රහ්මචරිය වාසය නැති තැනැත්තාට වනාහි වසල කරණ ධර්මයන් දුරු නොකිරීමෙන් වසල ආදී නම් ඇත්තේ යාම් ඊම් වශයෙන් මච්කුස පිළිසිඳ ගැනීමක් වන්නේය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ අධික ලෙස බඹසර හැසිරීමෙන් තමන්ගේ බ්‍රාහ්මණ භාවය දක්වති. **අනුත්තරො භිසක්කො සල්ලකත්තො** යනු පිළියම් කිරීමට අපහසු වූ සංසාර දුක්ඛ රෝගයට පිළියම් කිරීම් වශයෙන් උතුම් වූ වෛද්‍යවරයෙක්, අන් අය විසින් උදුරා දැමීමට නොහැකි රාගාදී උල් කැපීම් වශයෙන් සහමුලින් උදුරාදැමීම් වශයෙන් උතුම් වූ සල්ලකත්තන (උල් කපා දමන) වෛද්‍යවරයෙක්. මෙයින් නිෂ්පර්යාය වශයෙන් (අන් ක්‍රමයක් නොමැති ආකාරයෙන්) තමා තුළ පිහිටි බ්‍රාහ්මණ කරණ ධර්මයන් අන්‍යයන්ගේ සිත් තුළ පිහිටුවමින් අන්‍යයන් ද බමුණන් බවට පත්කිරීම වදාළහ.

**තස්ස මෙ තුම්හෙ පුත්තා** යනු මහණෙනි, ඔබලා එබඳු වූ මගේ පුත්‍රයෝ වන්න. **ඕරසා** යනු හෘදයට සම්බන්ධ වූ. යම් සේ සත්ත්වයන් (දරුවන්) අතරින් ඖරස පුත්‍රයෝ විශේෂයෙන් පියා සතු වස්තුවට කොටස්කරුවෝ වෙත් ද එසේම ඒ ආර්ය පුද්ගලයෝ ද සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ දහම් ඇසීම අවසානයෙහි ආර්ය ජාතියෙහි උපන්නාහු උන්වහන්සේ සතු විමුක්ති සුඛයට ද ආර්ය ධර්ම රත්නයටද ඒකාන්තයෙන් කොටස්කරුවන් වන බැවින් ඕරස නම් වෙති.

නැතහොත් භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම දේශනාවේ ආනුභාවයෙන් ආර්යභූමියට බැසගන්නා වූ ද බැසගත්තා වූ ද ආර්ය ශ්‍රාවකයෝ ශාස්තෲන් වහන්සේගේ ළයෙහි උත්සාහයෙන් උපන් අභිජාති ඇති බැවින් නිෂ්පර්යාය වශයෙන් ඖරස පුත්‍රයෝ යයි කිය යුතු බවට සුදුසුය. එය එසේමය. භාග්‍යවතුන් වහන්සේ විසින් ආසය-අනුසය-චරියා-අධිමුත්ති ආදිය බැලීමෙන් වරදට අනුව සිතීමෙන් ද හදවතෙහි තබා වරදින් වළක්වා නිවරදෙහි පිහිටුවීමෙන් ශීලාදී ධර්ම නමැති ශරීර පෝෂණයෙන් සංවර්ධනය කරන ලද අය වෙත් ද (ඔවුහු ඖරස පුත්‍රයයි කීමට සුදුසුය)

**මුඛතො ජාතා** යනු මුඛයෙන් උපන් ධර්ම දේශනාවෙන් ආර්ය ජාතියෙහි උපන් බැවින් මුඛයෙන් උපන්නාහු, නැතහොත් අන්‍යයන්ට සාධාරණ (පොදු) නැති බැවින් සියලු කුශල ධර්මයන්ට ප්‍රධාන හෙයින් විශේෂයෙන් ප්‍රමුඛ වීම් (ප්‍රාතිමොක්ඛ) වශයෙන් හෝ වුට්ඨානගාමිනී විපස්සනා සංඛ්‍යාත විමොක්ෂ මුඛ වශයෙන් හෝ ආර්යමාර්ග ජාතියෙහි උපන්නාහුය යන අරුතින් මුඛයෙන් උපන්නාහු, ශික්ෂාත්‍රයෙහි සංග්‍රහ වූ ශාසන ධර්මයෙහි හෝ ආර්යමාර්ග ධර්මයෙහි හෝ උපන්නාහුය යන අරුතින් **ධම්මජා**, ඒ ධර්මයෙන් ම නිර්මාණය කරන ලද්දාහු මවන ලද්දාහු යන අරුතින් **ධම්මනිම්මිතා** සති-ධම්මවිචය ආදි ධර්මයට දායාද වූ අරුතින් **ධම්මදායාදා** ලාභසත්කාර ආදී ආමිෂයට දායාද නොවූ යන අරුතින් **නො ආමිසදායාදා** ධර්මයට දායාද වූ ආමිෂයට දායාද නොවූ (මගේ පුත්‍රයෝ) වව් යන අර්ථයි.

එහි ධර්මය නිෂ්පර්යාය ධර්මය, පර්යාය ධර්මය යි දෙපරිදිය. ආමිෂය ද නිෂ්පර්යාය ආමිෂය, පර්යාය ආමිෂය යි දෙපරිදිය. කෙසේද?

මාර්ග-ඵල-නිවන් යන ප්‍රභේද ඇති නවවිධ ලෝකෝත්තර ධර්මය නිෂ්පර්යාය ධර්මයමය. නිබ්බත්තිත ධර්මයමය. කිසියම් ක්‍රමයකින් හෝ කරුණකින් හෝ යන්තමින් හෝ ධර්මයක් නොවේ. යම් මේ නිවනට උපකාර වන කුසල් ඇත්ද එනම් මෙලොව ඇතැම් පුද්ගලයෙක් නිවන් පතමින් දන් දෙයි, සිල් සමාදන් වෙයි, පෙහෙවස් විසීම කරයි, සුවඳ-මල් ආදියෙන් ශාස්තෘන් වහන්සේට පූජා කරයි, බණ අසයි, දෙසයි, ධ්‍යාන-සමාපත්ති උපදවයි. මෙසේ කරමින් අනුපිළිවෙළින් නිෂ්පර්යාය අමා නිවන් ලබයි. මේ පර්යාය ධර්මයයි. එසේම සිවුරු ආදී සිවුපසය නිෂ්පර්යාය ආමිෂයමය. අනිත් ක්‍රමයකින් හෝ කරුණකින් හෝ යන්තමින් හෝ ආමිෂ නොවේ. යම් මේ සසරට උපකාරවන කුසල් ඇත්ද එනම් මෙලොව ඇතැම් පුද්ගලයෙක් සසර පතමින් සම්පත් භවය කැමැත්තෙන් දන් දෙයි. -පෙ- සමාපත්ති උපදවයි. මෙසේ කරමින් අනුපිළිවෙළින් දෙව්මිනිස් සම්පත් ලබයි. මේ පර්යාය ආමිෂය නම් වේ.

එහි නිෂ්පර්යාය ධර්මය ද භාග්‍යවතුන් වහන්සේටම අයත්ය. භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද බැවින් භික්ෂූහු මාර්ග-ඵල-නිවන් ලබති. එය 'බමුණ, ඒ භාග්‍යවතුන් වහන්සේ නූපන් මාර්ගය උපදවන තැනැත්තාය. නොහටගත් මාර්ගය හටගන්වන්නාය. -පෙ- දැන් වනාහි ශ්‍රාවකයෝ ද මාර්ගයට අනුව වාසය කරති. පසුව මාර්ගයෙන් යුක්ත වෙති' යනුවෙන් ද 'ඇවැත්නි, ඒ භාග්‍යවතුන් වහන්සේ දතයුත්ත දනිති. දැක්ක යුත්ත දකිති. (දැකීමෙහි අධිපති අරුතින්) චක්ඛු භූතයහ. (දැනීම ඇතිකරන අරුතින්) ඤාණභූතයහ. (පර්යාප්ති ධර්මය පවත්වන හෙයින් හෝ) ධර්මභූතයහ. (ශ්‍රේෂ්ඨ අර්ථයෙන්) බ්‍රහ්මභූතයහ. කියන්නාහුය. පවත්වන්නාහුය. අර්ථය ගෙන දෙන්නාහුය. අමෘතය දෙන්නාහුය. ධර්මයට ස්වාමීහුය. තථාගතයහ' යනුවෙන් ද කියන ලද්දේ ය.

පර්යාය ධර්මය ද භාග්‍යවතුන් වහන්සේටම අයත් ය. නිවන පතා දන් දෙමින් -පෙ- සමාපත්ති උපදවමින් ක්‍රමානුකූලව අමා නිවන ලබයි යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසූ බැවින් ම දනිති. නිෂ්පර්යාය ආමිසය ද භාග්‍යවතුන් වහන්සේට ම අයත් ය. භාග්‍යවතුන් වහන්සේ විසින් අනුමත කරන ලද හෙයින්ම භික්ෂූන් විසින් ජීවක වස්තුව මුල්කොට ප්‍රණීත චීවර (හොඳ සිවුරු) ලබන ලදී. 'මහණෙනි, ගෘහපතියන් විසින් දෙන සිවුරු පිළිගැනීමට අවසර දෙමි. කැමති කෙනෙක් පංසුකූල සිවුරු

පරිහරණය කරන්නෙක් වේවා, කැමති කෙනෙක් ගෘහපතියන් දෙන සිවුරු පිළිගනීවා, 'මහණෙනි, මම ලැබෙන දෙයින් සතුටුවීම ම වර්ණනා කරමි'යි වදාළහ. මෙසේ අනිත් ප්‍රත්‍යය ද භාග්‍යවතුන් වහන්සේ විසින් අනුමත කරන ලද හෙයින් ම භික්ෂූන් විසින් පරිභෝගයට ලබන ලදී.

පර්යාය ආමිෂය ද භාග්‍යවතුන් වහන්සේට ම අයත්ය. 'සම්පත්ති භවය පතමින් දන් දී සීලය -පෙ- සමාපත්ති උපදවා අනුපිළිවෙළින් පර්යාය ආමිෂය ද දිව්‍ය සම්පත්තිය ද මනුෂ්‍ය සම්පත්තිය ද ලබයි' යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ කියන ලද හෙයින් ම දනිති. යම්හෙයකින් නිෂ්පර්යාය ධර්මය ද පර්යාය ධර්මය ද නිෂ්පර්යාය ආමිෂය ද පර්යාය ආමිෂය ද භාග්‍යවතුන් වහන්සේටම අයත් ද එහෙයින් එහි තමන්වහන්සේගේ ස්වාමිභාවය දක්වමින් එහිද වඩා ශ්‍රේෂ්ඨ වූ අධික වූ හිත-සැප ගෙනදෙන දෙයට ඔවුන් යොදවමින් **තස්ස මෙ තුමෙහ පුත්තා ඔරසා -පෙ- නො ආමිස දායාදා'** යනුවෙන් මෙසේ වදාළහ.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ පිරිපුන් වත් සමාදානය ඇති, තපස් චර්යාව ඇති, මැනවින් වසන ලද බඹසර ඇති, සුපිරිසිදු විද්‍යාචරණයෙන් යුක්ත වූ සියලු වේදයන්ගේ පරතෙරට පත් වූ බහාතබන ලද සියලු පව් ඇති නිතර ඉල්ලීමට යෝග්‍ය වූ දෙවියන් සහිත ලෝකයෙහි අනුත්තර වූ දක්ෂිණාවට (දානයට) සුදුසු බවට පත් වූ උසස්ම අර්ථයෙන් තමාගේ බ්‍රාහ්මණභාවය ද තම ආර්ය ශ්‍රාවකයන්ගේ ඖරස පුත්‍ර භාවය ද දැන්වූහ.

භාග්‍යවතුන් වහන්සේ වනාහි **'සීහොති ඛො සිකඛවෙ තථාගතසෙසතං අධිවචනං අරහතො සමමා සමබුදධසස'** 'මහණෙනි, අර්හත් වූ සම්මා සම්බුදුරජාණන් වූ තථාගතයන් වහන්සේට සීහ යන මෙය වචනයකි යන මෙහි සිංහයකු සමානය. **'පුරිසො මගග කුසලොති ඛො තිසස තථාගතසෙසතං අධිවචනං'** 'තිස්ස, මාර්ගය කීමට දක්ෂ පුරුෂයා යනු තථාගතයන් වහන්සේට නමකි' යන මෙහි මාර්ගය කියන පුරුෂයාට සමානය. **'රාජා හමසමි සෙල'** 'සෙල, මම රජ වෙමි' යන මෙහි රජුට සමානය. **'භිසකෙකා සලලකතෙතාති ඛො සුනකඛතත තථාගතසෙසතං අධිවචනං'** 'සුනක්ඛත්ත, වෛද්‍යවරයා, සල්‍ය වෛද්‍යවරයා යනු තථාගතයන් වහන්සේට නමකි' යන මෙහි වෛද්‍යවරයාට සමානය. **'බ්‍රහමණොති ඛො භිකඛවෙ තථාගතසෙසතං**

අධිවචනං' 'මහණෙනි, බ්‍රාහ්මණ යනු තථාගතයන් වහන්සේට නමකි' යන මෙහි බ්‍රාහ්මණයාට සමානව තමා ගැන වදාරති, මෙහි ද බ්‍රාහ්මණයාට සමානකොට වදාළහ.

දැන් යම් යම් දානාදී කටයුතුවලින් යුක්ත වූ මේ සසුනෙන් බැහැර බමුණාගේ බ්‍රාහ්මණ කටයුතු සම්පූර්ණයයි හඟිත් ද ඒ දානාදියට වඩා තමාගේ දානාදිය අග්‍ර බව ශ්‍රේෂ්ඨ බව ප්‍රකාශ කරන්නට 'දෙවමානි භික්ඛවෙ දානානි' යන ආදිය අරඹන ලද්දේ වෙයි. එහි **යාගා** යනු මහා යඤ්ඤයෝය, මහාදාන යන අර්ථයි. යිට්ඨ යනුවෙන් කියනු ලබන දෙයයි. එහි වේලාමදාන, වෙස්සන්තර දාන, මහාවිජිතයඤ්ඤ සමාන ආමිස යාග දතයුතුය. මහාසමය සූත්‍රය, මංගල සූත්‍රය, චූල්ල රාහුලෝවාද සූත්‍රය, සමචිත්ත සූත්‍රය යනාදී දේශනා ධර්මයාගය. සෙස්ස මුලින් කියන ලද පරිද්දෙනි.

ගාථාවෙහි : **අයජි** යනු දුන්නේය. **අමච්ඡරී** යනු සියලු මසුරුකම් බෝධි මූලයෙහිදී ම මනාව පහ වූ බැවින් මසුරුකම නැති. **සබ්බසත්තානුකම්පී** යනු මහා කරුණාවෙන් සියලු සත්ත්වයන්ට ප්‍රිය පුතකුට මෙන් අනුග්‍රහ කරන ස්වභාවය.

වධකෙ දෙවදත්තෙ ච චොරෙ අංගුලි මාලකෙ
ධනපාලෙ රාහුලෙ චෙව සමචිත්තො මහා මුනී

දෙව්දත් වධකයා කෙරෙහි ද අංගුලිමාල සොරු කෙරෙහි ද ධනපාල ඇතා කෙරෙහි ද රාහුල කෙරෙහි ද මහාමුනි නම් වූ භාග්‍යවතුන් වහන්සේ සමසිත් ඇත්තෝ වෙතියි ඒ අදහස කියන ලදී. සෙස්ස මනාව දැනගත හැකිය.

**පළමු සූත්‍රය යි.**

# 4.1.2

දෙවන සූත්‍රයෙහි **අප්පානි** යනු ස්වල්ප. **සුලභානි** යනු පහසුවෙන් ලැබිය යුතු, යම්කිසි තැනකින් හෝ ලබන්නට හැකිවෙයි. **අනවජ්ජානි** යනු (සිවුපසය සෙවීමට) පැමිණි ආකාරයෙන් පිරිසිදු බැවින් ද කය සැරසීමාදී ක්ලේශවස්තු ඇතිවීමක් නැති බැවින් ද වැරදි නැති, නිදොස්. එහි සුලභ බැවින් සෙවීමේ දුක නැති බව දක්වන ලද්දේ වෙයි. ස්වල්ප බැවින් පරිහරණය කිරීමේ දුක නැති බව දක්වන ලද්දේ වෙයි. නිවැරදි බැවින් නොගැරහිය යුතු බැවින් භික්ෂුවට සුදුසු බව දක්වන ලද්දේ වෙයි. ස්වල්ප බැවින් තෘප්තිගැනීමට කරුණක් නොවන බව ද සුලභ බැවින් ඇලීමට කරුණක් නොවන බව ද නිවැරදි බැවින් ආදීනව (දොස්) වශයෙන් බැහැරවීම (නිස්සරණ) ප්‍රකටවන කරුණක් බව ද දක්වන ලද්දේ වෙයි. ස්වල්ප බැවින් ලැබෙන පරිද්දෙන් (යථාලාභෙන) සොම්නස නූපදී. සුලභ බැවින් අලාභයෙන් (නොලැබීමෙන්) දොම්නසක් නූපදී. නිවැරදි බැවින් විපිළිසර වීමට (පසුතැවිල්ලට) කරුණක් නැති බැවින් පසුතැවීමට හේතුවක් නොදැනීම නිසා ඇතිවන උපේක්ෂාවක් නූපදී.

**පංසුකූලං** යනු වීදියක් - සොහොනක් - කුණුගොඩක් ආදී යම්කිසි තැනක පස් උඩ සිටි බැවින් ඉහළට නැගුණු අර්ථයෙන් පස්ගොඩක් මෙනි යන අරුතින් පංසුකුල නම් වේ. පස් මෙන් පිළිකුල් බවට යයි යන අරුතින් පංසුකූලයයි මෙසේ ලැබූ නම් ඇති, වීදි ආදියෙහි වැටී ඇති රෙදි කැබලි එක්රැස්කොට සකස් කරන ලද සිවුර

**පිණ්ඩියාලොපො** යනු කෙණ්ඩා මස්පිඬුවේ බලයෙන් හැසිර ඒ ඒ ගෙයින් පිඬුවක් පිඬුවක් කොට ලබන ලද භෝජනය. **රුක්ඛමූලං** යනු විවේකයට සුදුසු යම්කිසි ගසක් සමීපය. **පූතිමුත්තං** යනු ගවයෙකුගෙන් ලබාගන්නා ලද යම් මුත්‍රා. සිරුර රන්වන් පැහැයෙන් යුක්ත වුවද කුණු කයක්මය. මෙසේ අලුත් මුත්‍රා වුවද කුණු මුත්‍රාමය. එහිදී ඇතැමෙක් ගොමුත්‍රයෙහි යොදන ලද අරළු කැබැල්ලක් පූතිමුත්තයයි කියති. තවත් අයෙක් වෙළඳසැල් ආදියෙන් කුණු වූ නිසා ඉවත දමන අයිතියක් නැති යම්කිසි බෙහෙතක් පූතිමුත්ත යනුවෙන් අදහස් කරන ලදැයි කියති.

යතො ඛො යනු ප්‍රථමා විභක්තියෙහි අවධි (පංචමී) විභක්ති වචනයකි. යං ඛො යනුවෙන් කියන ලද්දේ වෙයි. එයින් 'තුට්ඨො හොති' යනුවෙන් කියන ලද ක්‍රියාව ස්පර්ශ කරයි. (අල්ලා ගනියි). **තුට්ඨො** යනු සතුටු වූයේ. **ඉදමස්සාහං** යනු යම් මේ සිවුවැදෑරුම් කියන ලද ආකාර ඇති ස්වල්ප වූ සුලභ වූ ප්‍රත්‍යයෙන් සතුටක් ඇත් ද මෙය මේ භික්ෂුවගේ සීල සංවරාදීන් අතුරෙන් ශ්‍රමණභාවය ඇතිකරන්නා වූ පැවිද්ද පිළිබඳ වූ එක්තරා එක් අංගයක් යයි මම කියමි. සතුටු වූ තැනැත්තාගේ චතුපාරිසුද්ධි සීලය සම්පූර්ණ වෙයි. සමථ විපස්සනා භාවනාවෝ ද සම්පූර්ණව වීමට යති.

නැතහොත් ආර්ය මාර්ගය සාමඤ්ඤ නම් වේ. කෙටියෙන් බාහිර-අජ්ඣත්තිකයයි ඒ ආර්ය මාර්ගයේ අංග දෙකකි. එහි බාහිර වශයෙන් සත්පුරුෂ ආශ්‍රය ද සද්ධර්ම ශ්‍රවණය ද අජ්ඣත්තික වශයෙන් යෝනිසෝ මනසිකාරය ද ධර්මානුධර්ම ප්‍රතිපත්තිය ද වෙයි. ඒ අතරින් යම්හෙයකින් සුදුසු පරිදි ධර්මානුධර්ම ප්‍රතිපත්තිය වූ එයට අල්පේච්ඡතාව, සතුට, විවේකයට කැමති බව, පුද්ගලයින් සමග නොඇලුණු පැවතුම් ඇති බව, ඇරඹූ වීර්යය ඇති බව යන මේ ආදී ධර්ම මූලකාරණා වේද එහෙයින් 'ඉදමස්සාහං අඤ්ඤතරං සාමඤ්ඤඞ්ගං' යනුවෙන් කියමියි කියන ලදී.

ගාථාවන්හි **සේනාසනමාරබ්භ** යනු විහාරාදිය, ඇඳපුටු ආදිය යන සේනාසනයක් නිසා (අරබයා). **චීවරං පානභෝජනං** යනු අඳින සිවුරු ආදියක්, අඹපැන් ආදී පැනයක්, කෑ යුතු අනුභව කළයුතු ආදී වූ අනුභවයට සුදුසු දෙයක් නිසා යයි සම්බන්ධ වෙයි. **විඝාතො** නැසූ බව, සිතේ දුකක් **න හොති** නොවෙයි යනුවෙන් යෙදීම වෙයි. මේ එහි කෙටි අර්ථයයි. අසවල් ආවාසයෙහි නම් (සිවුරු ආදී) ප්‍රත්‍ය සුලභයයි ලැබිය යුතු තැනට යාමෙන් හෝ මට ලැබෙයි ඔබට නොලැබෙයි කියා විවාදයට පැමිණීමෙන් හෝ අලුත් කර්මාන්ත කිරීම් වශයෙන් හෝ සෙනසුන් ආදිය සොයන්නා වූ නොසතුටට පත් අයට කැමති දේ නොලැබීම් ආදියෙන් සිතේ යම් නැසුණු බවක් (දුකක්) වෙයි ද ඒ දුක ඒ ප්‍රත්‍යයන්හි සතුටු වූ තැනැත්තාට නොවෙයි. **දිසා නප්පටිහඤ්ඤති** යනු සතුටුවීමෙන් සිවුදිසා වශයෙන් දිසා නොගැටෙයි. මේ කාරණය

**චාතුද්දිසො අප්පටිසො ච හොති**
**සන්තුස්සමානො ඉතරීතරෙන**

ලද දෙයින් සතුටුවන තැනැත්තා සිවුදිශාවෙහි නොගැටුනේ වෙයි' යනුවෙන් කියන ලදී. යමෙකුට අසවල් තැනට ගියොත් නම් සිවුරු ආදිය ලබන්නෙමියි සිතක් උපදී ද ඔහුට දිසා ගැටෙයි. යමෙකුට එසේ සිතක් නූපදී ද ඔහුට දිසා නොගැටෙයි. (හෙවත් පටහැනි නොවේ) ධම්මා යනු ප්‍රතිපත්ති ධර්මය. **සාමඤ්ඤසසානුලොමිකා** යනු ශ්‍රමණ ධර්මයට හෝ සමථ විපස්සනා භාවනාවට හෝ ආර්ය මාර්ගයට හෝ සුදුසු වූ අල්පේච්ඡතාදිය. **අධිගගහිතා** යනු ඒ සියල්ල **තුටඨචිතතසස** සතුටු සිත් ඇති භික්‍ෂුව විසින් අයත්කරගන්නා ලද්දේ වෙයි. විරුද්ධ ධර්මයන් මැඩපවත්වා ගන්නා ලද්දේ වෙයි. අභ්‍යන්තරයට ගියේ වෙයි. බාහිරට නොගියේ වෙයි.

**දෙවන සූත්‍රය යි.**

# 4.1.3

තෙවන සූත්‍රයෙහි **ජානතො** යනු දන්නා තැනැත්තාට. **පසසතො** යනු දක්නා තැනැත්තාට. එසේ වුවත් මේ පද දෙකම එක අර්ථ ඇත්තේය. අකුරු පමණක් වෙනස්ය. මෙසේ ඇතිකල්හි ද ජානතො (දන්නා තැනැත්තාට) යන්නෙන් ඤාණ ලක්‍ෂණය ගෙන පුද්ගලයා දක්වයි. දැනගන්නා ලක්‍ෂණය වනාහි ඤාණය යි. පසසතො (දක්නා තැනැත්තාට) යන්නෙන් ඤාණබලය ගෙන පුද්ගලයා දක්වයි. දැකීම් බලය ගෙන ඤාණයෙන් යුක්ත පුද්ගලයා, ඇස් ඇති පුද්ගලයා රූප දකින්නාක් මෙන් ඤාණයෙන් විවෘත වූ ධර්මයන් දකියි.

නැතහොත් 'ජානතො' යන්නෙන් අනුබෝධ ඤාණයෙන් දන්නා තැනැත්තාට යන අර්ථය ද 'පසසතො' යන්නෙන් ප්‍රතිවේධ ඤාණයෙන් දක්නා තැනැත්තාට යන අර්ථය ද ප්‍රතිලෝම වශයෙන් ගත්කල සෝවාන්

(දස්සන) මාර්ග ඥානයෙන් දක්නා තැනැත්තාට යන අර්ථය ද භාවනා මාර්ගයෙන් දන්නා තැනැත්තාට යන අර්ථය ද දක්වයි.

ඇතැම් කෙනෙක් ඤාත පරිඤ්ඤා, තීරණ පරිඤ්ඤා, පහාන පරිඤ්ඤා යන තුන්ආකාර පරිඤ්ඤාවන්ගෙන් දන්නා තැනැත්තාට යන අර්ථය ද මුදුන්පැමිණි විදර්ශනාවෙන් දක්නා තැනැත්තාට යන අර්ථය ද කියති. නැතහොත් දුක, පිරිසිඳ අවබෝධයෙන් දන්නා තැනැත්තාට යයි ද නිරෝධය, ප්‍රත්‍යක්ෂ කිරීමෙන් දක්නා තැනැත්තාට යයි ද මේ දෙකම ගත් කල්හි පහාන - භාවනා දෙක්හි අවබෝධය සිද්ධවූයේම වෙයි යනුවෙන් චතුස්සත්‍යාවබෝධය කියන ලද්දේ වෙයි. යම්කලක මෙහි විදර්ශනා ඥානය අදහස් කරන ලද ද එකල්හි 'ජානතො - පස්සතො' යන පදයන්ගේ හේතු-අර්ථ පැහැදිලි කරන බව දතයුතුය. යම්කලක මාර්ගඥානය අදහස් කරන ලද ද එකල්හි මාර්ග කෘත්‍ය අර්ථය පැහැදිලි කරන ලද බව දතයුතුය.

ආසවානං ඛයං යනු ජානතො අහං භික්ඛවෙ පස්සතො ආසවානං ඛයං වදාමි 'මහණෙනි, මම දන්නා තැනැත්තාට දක්නා තැනැත්තාට ආශ්‍රවයන්ගේ දුරුකිරීම කියමි'යි මෙසේ ආ තැන්හි, **සබ්බාසව සංවර පරියායෙහි** ද 'ආසවානං ඛයා අනාසවං චෙතො විමුත්තිං' 'ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් අනාශ්‍රව වූ චේතෝ විමුත්තිය' යනාදී සූත්‍ර පදයන්හි ද ආශ්‍රවයන්ගේ ප්‍රහාණය වූ අත්‍යන්ත ක්ෂයවීම වූ හටනොගැනීම වූ ක්ෂය ආකාර ඇත්තා වූ නැති බව වූ ආශ්‍රවක්ෂය ය කියන ලදී. 'ආසවානං ඛයා සමණො හොතී'ති ආශ්‍රවයන්ගේ ක්ෂය වීමෙන් ශ්‍රමණයා වෙයි යනාදියෙහි ඵලය ද

**පරවජ්ජානුපස්සිස්ස නිච්චං උජ්ඣාන සඤ්ඤිනො**
**ආසවා තස්ස වඩ්ඪන්ති ආරා සො ආසවක්ඛයා**

'අනුන්ගේ වැරදි සොයන නිතර දොස් කියන හැඟීම ඇති තැනැත්තාගේ ආශ්‍රවයෝ වැඩෙති. ඔහු ආශ්‍රව ක්ෂයයෙන් දුරය' යනාදියෙහි නිර්වාණය ද

**සෙඛසස සිකඛමානසස උජුමගගානුසාරිනො**
**ඛයසමිං පඨමං ඤාණං තතො අඤඤා අනනතරා**
**තතො අඤඤා විමුතතසස ඤාණං වෙ හොති තාදිනො**

ත්‍රිවිධ ශික්‍ෂාවෙහි හික්මෙන්නා වූ ඍජු වූ ආර්ය මාර්ගයෙහි ගමන් කරන්නා වූ ශෛක්‍ෂ පුද්ගලයා හට ආශ්‍රවයන් ක්‍ෂය කිරීමෙහි පළමුවන ඤාණය (සෝවාන් මාර්ග ඤාණය) උපදී. ඉන්පසු රහත් බව වෙයි. ඒ අර්හත් මාර්ග ඥානයට අනතුරුව කෙලෙසුන් කෙරෙන් මිදුණා වූ රහතන් වහන්සේට ඒකාන්තයෙන් ප්‍රත්‍යවේක්‍ෂා ඤාණය වෙයි.' මෙසේ ආවා වූ **ඉන්‍ද්‍රිය සූත්‍රයෙහි** ද මෙහි ද මාර්ගය ආසවක්ඛය යයි කියන ලදී. එහෙයින් කියන ලද පරිදි දන්නා වූ දක්නා වූ තැනැත්තාට මම ආර්යමාර්ග අවබෝධය කියමි'යි කියන ලද්දේ වෙයි.

**නො අජානතො නො අපසසතො** යනු යමෙක් නො දනී ද නො දකී ද ඔහුට (ආශ්‍රවක්‍ෂය) නො කියමියි යන අර්ථයි. එයින් යම් අය නොදන්නහුට නොදක්නහුට සංසාර ශුද්ධිය කියත් ද (උන්වහන්සේ) ඔවුන් ප්‍රතික්‍ෂේප කරති. මුල්පද දෙකෙන් උපාය කියන ලද්දේ වෙයි. මෙයින් වැරදි ආකාරය (අනුපාය) ප්‍රතික්‍ෂේපය කියන ලද්දේ වෙයි. කෙටියෙන් මෙහි ඤාණය ආශ්‍රවයන් ක්‍ෂය කිරීම ද සෙස්ස එහි පිරිකර (අංග) යයි ද දක්වයි. දැන් යමක් දන්නා තැනැත්තාට යමක් දක්නා තැනැත්තාට ආශ්‍රවයන් ක්‍ෂය වෙයිද එය දක්වන්නට 'කිඤච භිකඛවෙ ජානතො' යනුවෙන් විමසීම ඇරඹූහ. එහි දැනීම් විවිධය. පණ්ඩිත ස්වභාවය ඇත්තා වූ ම කිසියම් භික්‍ෂුවක් කුඩ සාදන්නට දනියි. කිසියම් භික්‍ෂුවක් සිවුරු පිළිබඳ කඩ කැපීම් හෝ මැසීම් හෝ යනාදී එකක් කරන්නට දනියි. මේ ආකාර කටයුතු වත් ශීර්ෂයෙහි සිට කරන්නා වූ භික්‍ෂුවගේ ඒ දැනීම මාර්ග ඵලයන්ට ආසන්න හේතුව නොවේයයි නොකිව යුතුය. යමෙක් සසුනෙහි පැවිදිව වෙදකම් ආදිය කරන්නට දනියි ද මෙසේ දන්නා වූ ඔහුගේ ආශ්‍රවයෝ වැඩෙත්මය. එහෙයින් යමක් දන්නා වූ යමක් දක්නා වූ තැනැත්තාගේ ආශ්‍රවයන් ක්‍ෂය වෙයි ද එය ම දක්වමින් 'ඉදං දුකඛං' යනාදිය වදාළහ.

එහි යම් චතුස්සත්‍ය කර්මස්ථානයක් කිවයුතු ද එය මුල දී **යොනිසො මනසිකාර සූත්‍රයෙහි** කෙටියෙන් කියන ලද්දේමය. එහි වනාහි 'යොනිසො

භික්ඛවෙ භික්ඛු මනසිකරොනෙතා අකුසලං පජහති, කුසලං භාවෙති' 'මහණෙනි, නුවණින් මෙනෙහි කරන්නා වූ භික්ෂුව අකුසල් දුරුකරයි. කුසල් වඩයි' යනුවෙන් ආ බැවින් මේ දුකයයි නුවණින් මෙනෙහි කරයි යනාදී වශයෙන් අර්ථ පැහැදිලි කිරීම කරන ලදී. මෙහි 'ඉදං දුක්ඛනති භික්ඛවෙ ජානතො පස්සතො ආසවානං ඛයො හොති' 'මහණෙනි, මේ දුකයයි දන්නා වූ දක්නා වූ තැනැත්තාගේ ආශ්‍රවයන් ක්‍ෂය වෙයි' යනුවෙන් ආ බැවින් පිරිසිඳ ප්‍රතිවේධ කිරීම් වශයෙන් පිරිසිඳ අවබෝධ කිරීම් වශයෙන් මාර්ග ඥානයෙන් දන්නා වූ දක්නා වූ තැනැත්තාට ආශ්‍රවයන්ගේ ක්‍ෂය වීම වෙයි යනාදී ක්‍රමයෙන් යෙදිය යුතුය. ආශ්‍රවයන් අතුරෙන් ප්‍රථම (සෝවාන්) මාර්ගයෙන් දිට්ඨි ආසවය ක්‍ෂය වෙයි. තුන්වන (අනාගාමි) මාර්ගයෙන් කාම ආසවය ද සතරවන (අර්හත්) මාර්ගයෙන් භව ආසවය ද අවිද්‍යා ආශ්‍රවය ද ක්‍ෂය වෙයි යනුවෙන් දතයුතුය.

ගාථාවන්හි - **විමුත්ති ඤාණං** යනු විමුක්තියෙහි ද නිවනෙහි ද ඵලයෙහි ද ප්‍රත්‍යවේක්‍ෂණ ඥාණය යි. **උත්තමං** යනු උතුම් වූ ධර්මය අරමුණු වූ බැවින් උතුම් වූ. **ඛයෙ ඤාණං** යනු ආශ්‍රවයන්ගේ ද සංයෝජනයන්ගේ ද ක්‍ෂය වීමෙහි ක්‍ෂය කිරීමෙහි ඇතිවන ආර්යමාර්ග ඥානයයි. 'ඛීණා සංයොජනා ඉති ඤාණං' 'සංයෝජනයෝ ක්‍ෂය වූවාහුය යන ඥානය' යන්න ගෙනවුත් මෙහි ද සම්බන්ධ කළ යුතුය. එයින් පහ වූ කෙලෙස් ප්‍රත්‍යවේක්‍ෂණය දක්වයි. මෙසේ මෙහි ප්‍රත්‍යවේක්‍ෂණ ඥාන සතරම කියන ලද්දේ වෙයි. අර්හත්ඵලාවබෝධය අදහස් කළ බැවින් ඉතිරි වූ කෙලෙස් ප්‍රත්‍යවේක්‍ෂණයක් මෙහි නැත. යම්සේ මෙහි 'ජානතො පස්සතො' යනුවෙන් නිර්වාණාධිගමයෙන් සම්‍යක් දෘෂ්ටි කෘත්‍යය අධික කොට කියන ලද ද මෙසේ සම්‍යක් ප්‍රධාන කෘත්‍යය ද අධිකකොට ම කැමතිවිය යුතුය යි දක්වමින් 'නතෙවිදං කුසීතෙන' යන අවසාන ගාථාව වදාළහ.

එහි **නතෙවිදං** යනු න තු එව ඉදං. තු ශබ්දය නිපාත මාත්‍රයකි. **බාලෙන මවිජානතා** යනු ම කාරය පද සන්ධි කරයි. මේ වනාහි මෙහි කෙටි අරුතයි. ශෛක්‍ෂ මාර්ගයෙන් ද අශෛක්‍ෂ මාර්ගයෙන් ද මෙයට පැමිණිය යුතුය. අභිජ්ඣාකාය ග්‍රන්ථ ආදී සියලු ග්‍රන්ථයෙන්ගේ **පමොචනං** මිදීමට නිමිත්ත වූ නිවන 'ඉදං දුක්ඛං' යනාදී වශයෙන් චතුස්සත්‍ය තත් වූ පරිදි **අවිජානතා** නො දන්නා වූ එහෙයින්ම **බාලෙන** අඥානයා විසින්

යම්සේ අවබෝධ කරන්නට නො හැක්කේ ද මෙසේ **කුසීතෙන** වීර්ය නැති තැනැත්තා විසින් ද (අවබෝධ කරන්නට නොහැක්කේ ය), එහෙයින් එය අවබෝධ කිරීම පිණිස ඇරඹූ වීර්ය ඇති කෙනෙකු විය යුතු. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ 'ආරද්ධවිරියස්සායං ධම්මො නො කුසීතස්ස' මේ ධර්මය ඇරඹූ වීර්ය ඇති තැනැත්තාටය කුසීතයාට නොවේ යයි ද

**ආරභථ නික්ඛමථ යුඤ්ජථ බුද්ධසාසනෙ**
**ධුනාථ මච්චුනො සෙනං නළා ගාරං ව කුඤ්ජරො**

ආරම්භ කරන්න, කුසීතකමෙන් නික්මෙන්න, බුදු සසුනෙහි යෙදෙන්න. ඇතෙකු බටවලින් කළ ගෙයක් විනාශ කරන්නාක් මෙන් මාර සේනාව විනාශ කරන්නැයි ද වදාළහ.

**තෙවන සූත්‍රය යි.**

# 4.1.4

සතරවන සූත්‍රයෙහි **යෙ හි කෙචි** යනු යම් කෙනෙක්. **ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානන්ති** යනු මේ දුකය, දුක මෙපමණය, මෙයට වඩා නැතැයි නො වෙනස් වූ ස්වභාව ලක්ෂණ, ස්වලක්ෂණ වශයෙන් විදර්ශනා ප්‍රඥාව සහිත මාර්ග ප්‍රඥාවෙන් දුක්ඛ සත්‍යය නො දනිත්. අවබෝධ නොකරත්. ඉතිරි ඒවායෙහි ද මේ ක්‍රමයමය. 'න මෙ තෙ භික්ඛවෙ' යන ආදියෙහි මේ කෙටි අර්ථයයි: මහණෙනි, චතුස්සත්‍ය කමටහනෙහි නො යෙදෙන්නෝ පැවිදි මාත්‍රයක් ඇති ශ්‍රමණයෝ ද ජාතිය පමණක් ඇති බ්‍රාහ්මණයෝ ද වෙති. මා විසින් ඔවුහු සන්සිඳුවන ලද පාපයක් ඇති ශ්‍රමණයන් අතර ශ්‍රමණයා යයි ද බහාතබන ලද පව් ඇති බ්‍රාහ්මණයන් අතර බ්‍රාහ්මණයා යයි ද අසම්මතයහ නො අනුදන්නා ලදහ. (අනුමත නොකරන ලදහ.) කුමක් හෙයින්ද? ශ්‍රමණ කරණ ධර්මයන්ගෙන් ද බ්‍රාහ්මණකරණ ධර්මයන්ගෙන් ද තොර හෙයිනි. එහෙයින් 'න ච පනෙතෙ ආයස්මන්තො' යනාදිය වදාළහ.

එහි **සාමඤ්ඤත්ථං** යනු පැවිදි බව (සාමඤ්ඤ) නමැති අර්ථය, (සෝවාන් ආදී) පැවිදිඵල (සාමඤ්ඤඵල) සතර යන අර්ථයි. **බ්‍රහ්මඤ්ඤත්ථං** යනු එයටම සමාන වචනයකි. අන් අය වනාහි 'සාමඤ්ඤත්ථං' යනු සතර ආර්ය මාර්ග ද බ්‍රහ්මඤ්ඤත්ථං යනු සතර ආර්ය ඵලය යි ද කියති. ඉතිරිය කියන ලද පරිදිමය. කුශල පක්‍ෂය (සුක්ක පක්ඛා) කියන ලද ආකාරයට විරුද්ධ ආකාරයෙන් දතයුතුය. ගාථාවන්හි පෙර නොවූවක් නැත.

**සතරවන සූත්‍රය යි.**

# 4.1.5

පස්වන සූත්‍රයෙහි - **සීලසම්පන්නා** යන මෙහි සීලය නම් ක්‍ෂීණාශ්‍රවයන් (රහතන්) වහන්සේලාගේ ලෞකික ලෝකෝත්තර සීලයයි. එයින් යුක්තවූවාහු සීල සම්පන්න නම් වෙති. සමාධි පඤ්ඤාවන්හිද මේ ක්‍රමයමයි. විමුත්තිය වනාහි ඵල විමුත්තියමයි. විමුත්තිඤාණ දස්සනය ප්‍රත්‍යවේක්‍ෂණ ඤාණයයි. මෙසේ මෙහි සීලාදී තුන ලෞකික ලෝකෝත්තරය. විමුත්තිය ලෝකෝත්තරමය. විමුත්ති ඤාණදස්සනය ලෞකිකමය. මෙලොව පරලොව පරමාර්ථයෙන් (උසස් ප්‍රයෝජනවලින්) සුදුසු පරිදි අනුන්ට අවවාද කරති, අනුශාසනා කරති යන අරුතින් **ඕවදකා** නම් වෙති. **විඤ්ඤාපකා** යනු කර්මයත් කර්මඵලයත් අවබෝධ කරවන්නෝය. එහි ද මේ ධර්ම කුසල්ය, මේ ධර්ම අකුසල්ය, මේවා වැරදිය. මේවා නිවැරදිය යනාදී වශයෙන් කුශලාදි විභාග වශයෙන් හා ස්කන්ධාදි විභාග වශයෙන් ද ස්වලක්‍ෂණ වශයෙන් ද සාමාන්‍ය ලක්‍ෂණ වශයෙන්දැයි ක්‍රම තුනෙන් ධර්මයන් දන්වන්නෝ අවබෝධ කරවන්නෝ. **සන්දස්සකා** යනු ඒ ධර්මයන්ම අතින් ගෙන දක්වන්නාක් මෙන් අනුන්ට ප්‍රත්‍යක්‍ෂ වශයෙන් දක්වන්නෝ. **සමාදපකා** යනු සීලාදියෙහි සමාදන් නොවුනු තැනැත්තා එහි සමාදන් කරවන්නෝ. **සමුත්තේජකා** යනු මෙසේ කුසල ධර්මයන්හි පිහිටියවුන්ට මතු අධි චිත්තයෙහි (සමථයෙහි) යෙදවීම් වශයෙන් විශේෂ අධිගමයක් ඇතිවන පරිදි මැනවින් සිත උනන්දු

කරවන්නෝ, මෙසේ ඇසීම් වශයෙන් පිරිසිඳු කරවන්නෝ. **සමුත්තෙජකා** යනු ලැබුවා වූ ද මතු ලැබිය යුතු වූ ද ගුණ විශේෂයන් දැක්වීමෙන් ඔවුන්ගේ සිත මනාව සතුටු කරන්නෝ, ලබන ලද ආශ්වාද වශයෙන් මනාව සතුටු කරන්නෝ. **අලං සමක්ඛාතාරො** කී දෙය නොපිරිහෙළා මැනවින් අනුග්‍රහ අදහසින් කීමෙහි දක්ෂ වූවෝ. නැතහොත් : 'සන්දස්සකා' යනු දහම් දෙසමින් පැවැත්ම නැවැත්ම ස්වභාව ලක්ෂණ - ස්වලක්ෂණ වශයෙන් මැනවින් දක්වන්නෝ. 'සමාදපකා' යනු සිතෙහි පිහිටුවීම් වශයෙන් ඒ අර්ථයම ගන්වන්නෝ. 'සමුත්තෙජකා' යනු ඒ අර්ථය ගැනීමෙහි උත්සාහ ඇතිකිරීමෙන් මැනවින් පිරිසිඳු කරවන්නෝ බබළවන්නෝය. 'සම්පහංසකා' යනු ඒ අර්ථයෙන් ප්‍රතිපත්තියෙහි අනුසසුත් දැක්වීමෙන් මනාව සතුටු කරන්නෝ, 'අලං සමක්ඛාතාරො' යනු දක්ෂයන් වී කියන ලද ආකාරයෙන් ප්‍රකාශ කරන්නෝ. **සද්ධම්මස්ස** යනු ප්‍රතිවේධ සද්ධර්මය හෝ ත්‍රිවිධ සද්ධර්මයම හෝ දේශනා කරන්නෝ.

**දස්සනම්පහං** යනු දස්සනම්පි අහං. ඒ මේ දර්ශනය ඇසින් දැකීම (චක්ඛුදස්සන) නුවණින් දැකීම (ඤාණ දස්සන)යයි දෙපරිදිය. එහි - ප්‍රසන්න ඇස්වලින් ආර්යයන් වහන්සේලා ගේ දැකීම ඇසින් දැකීමයි. ආර්යභාවය ඇතිකරන දහම්ද ආර්යභාවය ද විදර්ශනා-මාර්ග ඵලයන්ද අවබෝධ කිරීම නුවණින් දැකීමයි. මේ අර්ථයෙහි (මෙහි) ඇසින් දැකීම අදහස් කරන ලදී. පැහැදුනු ඇස්වලින් ආර්යයන් වහන්සේලාගේ දැකීමද සත්ත්වයන්ට බොහෝ උපකාර වේමයි. **සවණං** යනු අසවල් රහතන් වහන්සේ අසවල් රටෙහි, හෝ අසවල් ජනපදයෙහි හෝ ගමෙහි හෝ නියම්ගමෙහි හෝ විහාරයෙහි හෝ ලෙණෙහි හෝ වාසය කරතියි කියන්නවුන්ගේ හඬ කණින් ඇසීමයි. එය ද බොහෝ උපකාර වේමය. **උපසංකමණං** යනු දානයක් හෝ දෙන්නෙමි, ප්‍රශ්නයක් හෝ අසන්නෙමි, ධර්මය හෝ අසන්නෙමි, සත්කාරයක් හෝ කරන්නෙමි යි යන මේ ආකාර සිතකින් ආර්යයන් වහන්සේලා වෙත එළඹීමයි. **පයිරුපාසනං** යනු ප්‍රශ්න ඇසීමට ඇසුරු කිරීමයි. ආර්යයන්ගේ ගුණ අසා උන්වහන්සේලා වෙත එළඹ ආරාධනා කොට දන් දී හෝ වත් පිළිවෙත් කොට හෝ ස්වාමීනි කුසලය යනු කුමක් ද? ආදී වශයෙන් ප්‍රශ්න ඇසීම යන අර්ථයි. වතාවත් ආදිය කිරීම පයිරුපාසනයම ය.

**අනුස්සරණං** යනු රාත්‍රි ස්ථානයක, දිවා ස්ථානයක හිඳින තැනැත්තා විසින් දැන් ආර්යයන් වහන්සේලා රුක් ගොමු, ලෙන්, මණ්ඩප ආදියෙහි

වැඩසිට ධ්‍යාන, විදර්ශනා, මාර්ග-ඵල සුවයෙන් කල්ගෙවතියි උන්වහන්සේලාගේ දිව්‍යවිහාර ආදී ගුණ විශේෂයන් අරමුණු කොට සිහිකිරීම යි. යම් තැනැත්තෙක් උන්වහන්සේලාගේ සමීපයෙන් අවවාද ලබන ලද්දේ වේද ඒ අවවාදය සිහිකොට මෙතැන සීලය කියන ලදී. මෙතැන සමාධිය කියන ලදී, මෙතැන විදර්ශනාව කියන ලදී, මෙතැන මාර්ගය කියන ලදී, මෙතැන ඵලය කියන ලදී යයි මෙසේ සිහිකිරීමයි. අනුපබ්බජං යනු ආර්යයන් වහන්සේලා කෙරෙහි සිත පහදවා ගිහිගෙයින් නික්ම උන්වහන්සේලා සමීපයෙහි පැවිදිවීම ය.

ආර්යයන් වහන්සේලා කෙරෙහි සිතපහදවා උන්වහන්සේලා සමීපයෙහි ම පැවිදිව උන්වහන්සේලාගේ ම අවවාද අනුශාසනා බලාපොරොත්තුවෙන් හැසිරෙන තැනැත්තාගේ පැවිද්ද අනුපබ්බජ්ජා (අනුව පැවිදිවීම) නම් වේ. අන්‍යයන් සමීපයෙහි අවවාද අනුශාසනා බලාපොරොත්තු වෙමින් හැසිරෙන තැනැත්තාගේ පැවිද්ද ද අනුපබ්බජ්ජා නම් වේ. ආර්යයන් වහන්සේලා කෙරෙහි පැහැදීමෙන් අන්තැනක පැවිදිව ආර්යයන් වහන්සේලා සමීපයෙහි අවවාද අනුශාසනා බලාපොරොත්තු වෙමින් හැසිරෙන තැනැත්තාගේ පැවිද්ද අනුපබ්බජ්ජාවම ය. අන්‍යයන් කෙරෙහි පැහැදීමෙන් අන්‍යයන් වෙත පැවිදිව අන් අයගේ අවවාද අනුශාසනා බලාපොරොත්තු වන තැනැත්තාගේ අන් පැවිද්ද අනුපබ්බජ්ජා නම් නොවේ. කියන ලද ආකාරයෙන් පැවිදි වූවන් අතර මහාකාශ්‍යප තෙරුන් වහන්සේගේ පැවිද්ද අනුව පැවිදි වූවෝ ලක්‍ෂයක් පමණ වූහ. එසේම උන්වහන්සේගේ සද්ධිවිහාරික (ශිෂ්‍ය) චන්‍දගුත්ත තෙරුන් වහන්සේගේ පැවිද්ද අනුව පැවිදි වූවෝ ද ලක්‍ෂයක් පමණ වූහ. උන්වහන්සේගේ සද්ධිවිහාරික සූරියගුත්ත තෙරුන් වහන්සේගේ පැවිද්ද අනුව පැවිදි වූවෝ ද ලක්‍ෂයක් පමණ වූහ. උන්වහන්සේගේ සද්ධිවිහාරික අස්සගුත්ත තෙරුන් වහන්සේගේ පැවිද්ද අනුව පැවිදි වූවෝ ද ලක්ෂයක් පමණ වූහ. උන්වහන්සේගේ සද්ධිවිහාරික යෝනක ධම්මරක්ඛිත තෙරුන් වහන්සේගේ පැවිද්ද අනුව පැවිදි වූවෝ ද ලක්ෂයක් පමණ වූහ. අසෝක රජුගේ මල්ලී වූ තිස්ස තෙරුන් වහන්සේ යෝනක ධම්මරක්ඛිත තෙරුන් වහන්සේගේ සද්ධිවිහාරික වූහ. උන්වහන්සේගේ පැවිද්ද අනුව පැවිදි වූවෝ කෝටි දෙකහමාරක් පමණ වූහ. දීප ප්‍රසාදක මහා මහින්ද තෙරුන්වහන්සේගේ පැවිද්ද අනුව පැවිදි වූ අයගේ ගණන සීමාවක් නැත. අද දවස තෙක් ලක්දිව ශාස්තෲන් වහන්සේ කෙරෙහි පැහැදීමෙන්

පැවිදි වන්නෝ මහා මහින්ද තෙරුන්වහන්සේගේ ම පැවිද්ද අනුව පැවිදි වෙති.

දැන් යම් කරුණකින් ඒ ආර්යයන් වහන්සේලාගේ දැකීමාදිය බොහෝ උපකාරයයි කියන ලද ද එය දක්වන්නට 'තථාරූපෙ' යනාදිය වදාළහ. එහි **තථාරූපෙ** යනු එබඳු සීලාදී ගුණසම්පන්න ආර්යයන් වහන්සේලා. යම්හෙයකින් දැකීම්-ඇසීම්-සිහිකිරීම් ද එළඹීම් (උපසංකමණ) ප්‍රශ්න ඇසීම් (පයිරුපාසන) ඇත් ද එහෙයින් ඒවා ගණන් නොගෙන උපසංකමණ, පයිරුපාසන ම දක්වන්නට 'සෙවතො භජතො පයිරුපාසතො' යනුවෙන් කියන ලදී. දැකීම්-ඇසීම්-සිහිකිරීම් වශයෙන් ආර්යයන් වහන්සේලා කෙරෙහි උපන් සැදැහැ ඇති තැනැත්තා උන්වහන්සේලා වෙත එළඹ පයිරුපාසනය කොට ප්‍රශ්න අසා ලබන ලද සවණානුත්තරිය ඇත්තේ සම්පූර්ණ නොවූ සීලාදී ගුණ සම්පූර්ණ කරන්නේය. එහෙයින් 'සද්ධාජාතො උපසංකමති, උපසංකමනෙතා පයිරුපාසති' 'සැදැහැ ඇත්තා එළඹෙයි. එළඹෙන තැනැත්තා ඇසුරු කරයි' යනාදිය කියන ලදී. එහි **සෙවතො** යනු වත්පිළිවෙත් කිරීම් වශයෙන් කලින් කල එළඹෙන තැනැත්තාගේ. **භජතො** යනු ප්‍රියකිරීමේ භක්තිය වශයෙන් ඇසුරු කරන්නාගේ. **පයිරුපාසතො** යනු ප්‍රශ්න ඇසීමෙන් ද ප්‍රතිපත්ති අනුකරණය කිරීමෙන් ද ඇසුරු කිරීමෙන්දැයි පද තුනේ අර්ථ විභාගය දතයුතුය. විමුත්තිඤාණ දස්සනයේ සම්පූර්ණවීම දහනවවන ප්‍රත්‍යවේක්ෂණ ඥානයේ ඉපදීමෙන් දතයුතුය.

**එවරූපා ච තෙ භික්ඛවෙ භික්ඛූ** යනාදියෙහි කියන ලද ආකාර ඇති ගුණයෙන් යුක්තවීමෙන් ඒ ආකාර වූ එබඳු වූ බිඳ දමන ලද සියලු කෙලෙස් ඇති භික්ෂූහු. උන්වහන්සේලා මෙලොව ආදී යහපතෙහි සත්ත්වයන් යෙදවීම් වශයෙන් අනුශාසනා කරන හෙයින් **සත්ථාරොතිපි** අනුශාසකයෝ ය යි ද කියනු ලැබෙත්. ජාති (ඉපදීම) නමැති කාන්තාරාදියෙන් එතෙර කරවන හෙයින් **සත්ථවාහාතිපි** සාත්තුනායකයෝ යයි ද කියනු ලැබෙත්. රාගාදී රණ දුරුකරන හෙයින් ද දුරුකරවන හෙයින් ද **රණඤ්ජහාතිපි** කෙලෙස් දුරුකළාහු ය යි ද කියනු ලැබෙත්. අවිඳු අඳුර දුරුකරන හෙයින් ද දුරුකරවන හෙයින් ද **තමොනුදාතිපි** අඳුර දුරුකළාහු ය යි ද කියනු ලැබෙත්. තමාගේත් අනුන්ගේත් සිත්වල ප්‍රඥාලෝකය, ප්‍රඥා ඕභාසය ප්‍රඥා බැබලීම කිරීමෙන් ඉපදවීමෙන් **ආලොකාදිකරාතිපි** ආලෝක ආදිය ඇතිකරන්නෝ ය යි ද කියනු ලැබෙත්.

එසේම ඥාන ප්‍රදීපය ඥාන ප්‍රභාව, ධර්ම ප්‍රදීපය, ධර්මප්‍රභාව දැරීමෙන් ද ඇතිකිරීමෙන් ද **උක්කාධරාතිපි,** ධර්මප්‍රදීපය දරන්නෝ ය යිද **පභංකරාතිපි** ආලෝක කරන්නෝ ය යි ද කියනු ලැබෙත්. කෙලෙසුන් කෙරෙන් දුරු වූ බැවින් ද පිරිහීමෙහි නො පැවැත්මෙන් ද දියුණුවෙහි පැවැත්මෙන් ද අන්‍යයන්ට ද එසේ වීමට හේතුවන බැවින් දෙවියන් සහිත ලෝකයා විසින් කෙලෙස් දුරුකිරීමට සුදුසු බැවින් ද **අරියාතිපි** ආර්යයෝ ය යි ද නුවණ ඇස දහම් ඇස සාතිශය ප්‍රතිලාභයෙන් (අතිශය වශයෙන් ලැබීමෙන්) **චක්ඛුමනෙතාතිපි** ඇස් ඇත්තෝ ය යි ද කියනු ලැබෙත්.

ගාථාවන්හි - **පාමොජ්ජකරණට්ඨානං** යනු නිරාමිස ප්‍රමෝදය උපදවන තැන, කාරණය. **එතං** යනු දැන් කිවයුතු නිදසුන සඳහා කියයි. **විජානතං** යනු කෙලෙස් පිරිසිදු කිරීමෙහි තත් වූ පරිද්දෙන් දන්නවුන්ට. **භාවිතත්තානං** යනු භාවිත සිත් ඇති (අයට) කාය භාවනා (විදර්ශනා) ආදියෙන් භාවිත (පුරුදුකළ) සිත් ඇති (අයට) යන අර්ථයි. **ධම්මජීවිනං** යනු මිථ්‍යාජීවය දුරුකොට දැහැමි ක්‍රමයෙන් ජීවත්වීම් වශයෙන්, දැහැමි ක්‍රමයෙන් හෝ ආත්මභාවය (ජීවිතය) පවත්වාගැනීම් වශයෙන්, සමාපත්ති බහුල බැවින් හෝ අග්‍රඵල ධර්මයෙන් හෝ ජීවත්වීම් වශයෙන් දැහැමි ජීවිත ඇති (අයට) මේ එහි කෙටි අර්ථයයි. (කාය-චිත්ත භාවනා වශයෙන්) වඩන ලද සිත් ඇති නිමවන ලද සමාධි-ප්‍රඥා-භාවනා ඇති එහෙයින් ම ධර්මයෙන් ජීවත්වන්නා වූ ආර්යයන්ගේ දර්ශනයයි. මෙය විපිළිසර (පසුතැවිලි) නොවීමට නිමිති වූ සීලාදියේ සම්පූර්ණ කිරීමට හේතු වන බැවින් දන්නා වූ ප්‍රඥාව ඇත්තවුන්ට ඒකාන්තයෙන් ම ප්‍රීති ප්‍රමෝදයට කාරණය වේ.

දැන් එයට ඒ කරුණක් වීම දැක්වීමට 'තෙ ජොතයනති' යන අවසාන ගාථා දෙක වදාළහ. එහි **තෙ** යනු ඒ වඩන ලද සිත් ඇති දැහැමි ජීවිත ඇති ආර්යයෝ. **ජොතයනති** යනු ප්‍රකට කරති. **භාසයනති** යනු සදහම් ආලෝකයෙන් ලෝකය බබුළුවති, ධර්මය දේශනා කරති යන අර්ථයි. **යෙසං** යනු යම් ආර්යයන්ගේ. **සාසනං** යනු අවවාදයයි. **සම්මදඤ්ඤාය** යනු පූර්වභාග ඥාණවලින් මනාව දැන. සෙස්ස කියන ලද අයුරෙන්මය.

**පස්වන සූත්‍රය යි.**

# 4.1.6

සයවන සූත්‍රයෙහි **තණ්හුප්පාදා** යන මෙහි මේවා කෙරෙහි උපදී යන අරුතින් උප්පාදා නම්. කුමක් උපදී ද? තණ්හාවයි. තණ්හාවේ ඉපදීම තණ්හුපපාදා නම් වේ. තණ්හාවට වස්තු තණ්හාවට කරුණු යන අර්ථයි. **යත්ථ** යනු යමක් නිමිතිකොට. **උපපජ්ජමානා** යනු උපදින ස්වභාවය. **චීවරහෙතු** යන මෙහි මනාප වූ චීවරයක් ලබන්නෙමියි චීවර කාරණයෙන් (හේතුවෙන්) උපදී. සෙසු පදයන්හිද මේ ක්‍රමයමයි. **ඉති භවාභවහෙතු** යන මෙහි වනාහි 'ඉති' යනු නිදර්ශන අර්ථයෙහි නිපාතයකි. චීවරාදි හේතු යම්සේ ද එසේ යන අර්ථයි.

මෙය කරණකොට නිරෝග බව වෙයි යන කරුණ ඉදිරිපත් කොට ප්‍රණීත ගිතෙල් වෙඬරු ආදිය අදහස් කරන ලදී. සම්පත්ති භවයන්හි ප්‍රණීත වඩා ප්‍රණීත දෙය භවාභවයයි කියති. නැතහොත් 'භවො' යනු සම්පත්තියයි. 'අභවො' යනු විපත්තිය යි. 'භවො' යනු වර්ධනය යි. 'අභවො' යනු හානියයි. ඒ නිමිති කොටගෙනත් තණ්හාව උපදියි යන අරුතින් 'භවාභව හේතු වා' යි කියන ලදී.

ගාථා - මුලින් කියන ලද අර්ථමය. එහෙත් **තණ්හාදුතියො** යනු තණ්හා සහායකයාය. මේ සත්ත්වයා මුලක් නොපෙනෙන සංසාරයෙහි සැරිසරන්නේ තනිවම සැරිසැරීමක් නොකරයි. තණ්හාව වනාහි දෙවැන්නියකොට සහායිකාව කොට ලැබගෙනම සැරිසරයි. එය එසේමය. බෑවුමකට වැටීම ගැන නොසිතා මීපැණි ගන්නා වූ වැද්දකු මෙන් නොයෙක් දොස් ඇති කුලයන්හි භවයන්හි අනුසස් ම දක්වන්නී ඈ අයහපත නමැති දැලෙහි සැරිසරවයි. **එතමාදීනවං ඤත්වා** යනු අතීත අනාගත වර්තමාන ස්කන්ධයන්හි මේ ආත්මය හා මතු ලබන ආත්මයදැයි යන නම් ලත් මේ ආදීනවය දැන. **තණ්හා දුක්ඛස්ස සම්භවං** යනු මේ තණ්හාව සංසාර දුකෙහි හටගැනීම, ප්‍රභවය, කාරණයයි දැන. මෙපමණකින් එක් භික්ෂුවකගේ විදසුන් වඩා රහත්බවට පත්වීම දක්වන ලදී. දැන් ඒ ක්ෂීණාශ්‍රවයන් වහන්සේට ස්තුති කරමින් 'වීතතණ්හා' යනාදිය වදාළහ. මෙහි යමක් නො කියන ලද ද එය මුලින් කියන ලද අයුරින්මය.

**සයවන සූත්‍රය යි.**

# 4.1.7

සත්වන සූත්‍රයෙහි **සබ්‍රහ්මකානි** යනු ශ්‍රේෂ්ඨයන් සහිත. **යෙසං** යනු යම් යම් කුලයන්ට (පවුල්වලට) අයත් වූ **පුත්තානං** යනු පුතුන් විසින්, පූජිතා යන ක්‍රියා ශබ්ද යෝගය ඇති හෙයින් මෙය කරණ විභක්ති අර්ථයෙහි සාමි වචනයයි හෙවත් ෂට්ඨී විභක්ති වචනය යි. **අජ්ඣාගාරෙ** යනු තමාගේ නිවසෙහි. **පූජිතා හොන්ති** යනු නිවසෙහි සිටින තැනැත්තා විසින් (මව්පියෝ) පෝෂණය කරන ලද්දාහු මෙන් මනාප වූ කය වචන දෙකින් (මව්පියන් වෙත) එළඹ සිටියේ වෙයි. මෙසේ මව්පියන් පුදන කුල බඹුන් සහිත යයි ප්‍රශංසා කොට මත්තෙහිත් ඒ පවුල්වලට ප්‍රශංසා කළයුතු බව දක්වමින් 'සපුබ්බදෙවතානි' යනාදිය වදාළහ. එහි 'බ්‍රහ්මා' යනාදිය ඒ පවුල්වල බ්‍රහ්ම ආදී ස්වභාවය සිදුකිරීම පිණිස කියන ලදී. මේ එහි අර්ථ පැහැදිලි කිරීමයි.

බ්‍රහ්ම යනු ශ්‍රේෂ්ඨ වචනයකි. මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන භාවනාවෝ සතර බ්‍රහ්මයා විසින් යම්සේ දුරු නොකරන ලද්දාහු වේ ද මෙසේ මව්පියන් විසින් පුතුන් කෙරෙහි භාවනාවෝ සතර දුරු නොකරන ලද්දාහු වෙති. ඒවා ඒ ඒ කාලයෙහි දතයුතුය. දරුවා කුසෙහි සිටින කල්හි කවදා නම් නිරෝගී පිරිපුන් අඟපසඟ ඇති පුතෙකු දකින්නෙමුදැයි කියා මව්පියන්ට මෛත්‍රී සිත උපදී. ළදරුවා උඩුකුරුව නිදනවිට උකුණන් විසින් හෝ මකුණන් විසින් හෝ දෂ්ට කරන ලදුව හෝ දුකසේ නිදන නිසා හෝ පීඩාවට පත්වූයේ හඬයි ද කෑගසයිද එවිට දරුවාගේ හඬ අසා මව්පියන්ට කරුණාව උපදී. ඒ මේ අත දුවමින් සෙල්ලම් කරන කාලයෙහි ඇලුම් කළයුතු වයසෙහි හෝ සිටින කල්හි දරුවා දැක මව්පියන්ගේ සිත ගිතෙලෙහි දැමූ සියක්වර පිරිසිදු කළ කපු පුළුන් රොදක් මෙන් මොළොක් වේද සතුටු වේද ප්‍රමුදිත වේද එවිට දෙමව්පියන්ට මුදිතාව ලැබේ. යම්කලෙක ඔවුන්ගේ පුත්‍රයා බිරිඳක් කැඳවාගෙන වුත් වෙන් වූ ගෙයක වාසය කරයි ද එකල්හි දැන් අපගේ පුතුට තමාගේ ස්වභාවයෙන් ජීවත්වන්නට හැකියයි මව්පියන්ට (ඔවුන් කෙරෙහි) මැදහත් බව උපදී. මෙසේ එකල උපේක්ෂාව ලැබේ. මෙසේ මව්පියන්ට පුතුන් කෙරෙහි සුදුසු කාලයෙහි සතරාකාර බ්‍රහ්ම විහාරය ලැබීම් වශයෙන් බ්‍රහ්මයාට සමාන පැවතුම් ඇති බැවින් 'බ්‍රහ්මාති භික්ඛවෙ

මාතාපිතුන්නං එතං අධිවචනං' 'මහණෙනි, බ්‍රහ්ම යන මෙය මව්පියන්ට යෙදෙන නමකි යනුවෙන් කියන ලදී.

පුබ්බදෙවා යන මෙහි දෙවියෝ නම් සම්මුති දේව, උප්පත්ති දේව, විසුද්ධි දේව යනුවෙන් තුන්ආකාර වෙති. ඔවුන් අතුරින් සම්මුති දේව නම් ක්ෂත්‍රිය රජවරුය. ඔවුහු දෙවියා ය දේවිය යයි ලෝකයෙහි ව්‍යවහාර කරනු ලැබෙත්. දෙවියන් මෙන් ලෝකයාට නිග්‍රහ කිරීමට අනුග්‍රහ කිරීමට සමත් වූවෝම වෙත්. චාතුර්මහා රාජිකයේ පටන් භවාග්‍රය තෙක් උපන් සත්ත්වයෝ උත්පත්ති දේව නම් වෙති. සියලු කෙලෙසුන් කෙරෙන් විශුද්ධ වූ හෙයින් රහතන් වහන්සේලා විශුද්ධි දේව නම් වෙති. මේ එහි වචනාර්ථයයි. "දිබ්බන්ති කීළන්ති ලළන්ති ජොතන්ති පටිපක්ඛං ජයන්තිවාති දෙවා." ක්‍රීඩා කරත්, බබළත්, විරුද්ධ පක්ෂය පරාජයකොට ජයගනිත් යන අරුතින් දේව නම් වේ.

ඔවුන් අතරින් විසුද්ධි දෙවියෝ සියල්ලන්ට වඩා ශ්‍රේෂ්ඨය. උන්වහන්සේලා අනුවණ ජනතාව විසින් කරන ලද අපරාධය ගණනකට නොගෙන ඒකාන්තයෙන් ම ඔවුන්ගේ අයහපත නැතිවීමත් යහපත ඇතිවීමත් කැමති වූවාහුම කියන ලද පරිදි බ්‍රහ්ම විහාරයෙහි යෙදීමෙන් අර්ථය පිණිස, හිත පිණිස, සැප පිණිස යම්සේ පිළිපදිත් ද දන්දීමට සුදුසු බැවින් උන්වහන්සේලා වෙත ඒ දන් දෙන්නවුන්ට මහත්ඵල මහානිසංස ගෙන දෙත් ද එසේම මව්පියෝ ද පුතුන්ගේ අපරාධය ගණින් නොගෙන ඒකාන්තයෙන්ම ඔවුන්ගේ අයහපතනැතිවීමත් යහපත ඇතිවීමත් කැමති වූවාහුම කියන ලද ආකාරයෙන්ම සතරාකාර බ්‍රහ්ම විහාරය ලැබීම් වශයෙන් අර්ථය පිණිස, හිත පිණිස, සැප පිණිස පිළිපදින්නාහු පරම දක්ෂිණාර්හයන් (දන්දීමට වඩාත්ම සුදුස්සන්) වී තමන් වෙත උපකාර කරන ලද හා කරන්නන්ට මහත්ඵල බව ද මහානිසංස බව ද ගෙන එත්. සියලු දෙවියන්ට වඩා පළමුකොට දරුවන්ට උපකාරවත් බැවින් දෙමාපියෝ පළමුකොට ම දෙවියෝ වෙත්. පූර්ව දේව වූ දෙමව්පියන් නිසා දරුවෝ පළමුව අනිත් දෙවිවරුන් දෙවිවරුන් ලෙස දැනගනිති. (ඒ දෙවිවරුන්ගේ) සිත් ගනිති. ඇසුරු කරති. සිත්ගන්නා විධිය දැන එසේ පිළිපදින්නාහු ඒ ප්‍රතිපත්තියෙන් ඵලය අවබෝධ කරත්. එහෙයින් ඔවුහු පසු දෙවිවරු නම් වෙති. එහෙයින් 'පුබ්බදෙවාති භික්ඛවෙ මාතාපිතුන්නං එතං අධිවචනං' 'මහණෙනි, පූර්වදේවතා යන මෙය මව්පියන්ට යෙදෙන නමකියි කියන ලදී.

පුබ්බාචරියා යනු පළමු ගුරුවරයෝ ය. මව්පියෝ පුතුන් හික්මවමින් ඉතා තරුණ (කුඩා) කාලයෙහි පටන් මෙසේ වාඩිවෙන්න, මෙසේ යන්න, මෙසේ සිටගන්න, මෙසේ නිදන්න, මෙසේ කන්න, මෙසේ අනුභව කරන්න, මොහුට ඔබ පියා යයි කිවයුතුය, මොහුට සහෝදරයා යයි කිවයුතුය, මැයට සහෝදරිය යයි කිවයුතුය, මෙය කරන්නට සුදුසුය, මෙය නුසුදුසුය, අසවලා වෙතට යාම සුදුසුය, අසවලා වෙත යාම නුසුදුසුයයි උගන්වති, හික්මවති. පසුකලක අනිත් ගුරුවරු ද ශිල්ප, හස්තමුද්‍රාව, ගණිතය යන මේ ආදිය උගන්වති, අන් අය (තෙරුවන්) සරණ දෙති, සීලයන්හි පිහිටුවති, පැවිදි කරති, දහම් උගන්වති, උපසම්පදා කරති, සෝවාන් ආදී මාර්ගවලට පමුණුවති. මෙසේ ඒ සියල්ලෝම පසු (පශ්චාත්) ගුරුවරු නම් වෙති. මව්පියවරු වනාහි සියල්ලන්ට පළමු ගුරුවරු වෙති. එහෙයින් 'පුබ්බාචරියාති භික්ඛවෙ මාතාපිතුන්නං එතං අධිවචනං' 'මහණෙනි, පූර්වාචාර්ය යන මෙය මව්පියන්ට යෙදෙන නමකි' යි කියන ලදී.

ආහුනෙය්‍යා යනු ආනෙත්වා හුනිතබ්බං - ගෙනවුත් පිදිය යුතු. දුරසිට වුවද ගෙනවුත් ඵල විශේෂ (විපාක) කැමතිවන තැනැත්තා විසින් ගුණවතුන් කෙරෙහි දිය යුතුය යන අරුතින් ආහුන නම් වේ. ආහාර-පාන-වස්ත්‍ර-නිවාස ආදියට එය නමකි. උපකාර කිරීමට සුදුසු ක්ෂේත්‍රය වන බැවින් ඒ ආහුනයට සුදුසු වෙත් යන අරුතින් ආහුනෙය්‍යා නම් වෙති. එහෙයින් 'ආහුනෙය්‍යාති භික්ඛවෙ මාතාපිතුන්නං එතං අධිවචනං' 'මහණෙනි, ආහුනෙය්‍ය යන මෙය මව්පියන්ට යෙදෙන වචනයකි.

දැන් ඒ මව්පියන්ගේ බ්‍රහ්ම ආදි ස්වභාවයන්ට කරුණු දක්වන්නට 'තං කිස්ස හෙතු, බහුකාරා' යනාදිය කියන ලදී. **තං කිස්ස හෙතු** යනු මව්පියන්ට ඒ බ්‍රහ්මාදිය නමකි. කුමන කරුණකින් ද යන අර්ථයි. **බහුකාරා** යනු බොහෝ උපකාර ඇත්තෝ වෙත්. **ආපාදකා** යනු ජීවිතය පාලනය කරන්නෝ වෙති. මව්පියන් විසින් පුතුන්ගේ ජීවිතය පාලනය කරන ලද්දේ, ගලපන ලද්දේ, නොසිඳී පැවතීම් වශයෙන් පවත්වන ලද්දේ, පිළියෙල කරන ලද්දේය. **පෝසකා** යනු අත් පා වඩා හදයෙහි ලේ පොවා පෝෂණය කරන්නෝ ය. **ඉමස්ස ලොකස්ස දස්සෙතාරො** පුතුන්ට මේ ලෝකයෙහි හොඳ නරක අරමුණු දැක්වීම නම් මව්පියන් නිසා හටගත්තේය යන අරුතින් දෙමව්පියෝ දරුවන්ට මේ ලෝකය දක්වන්නෝ නම් වෙති. මෙසේ දරුවන්ට බොහෝ උපකාර ඇති බවත් බ්‍රහ්ම ආදී

ස්වභාවයට කරුණුත් දක්වන ලදී. පුත්‍රයෙක් කිසියම් ක්‍රමයකින් යම් ලෞකික උපකාරයකින් ප්‍රතිඋපකාර කෙළවර (අවසන්) කරන්නට සමත් නොවේම ය.

ඉදින් පුතෙක් මව්පියන්ගේ උපකාරයට ප්‍රතිඋපකාර කරන්නෙමියි සිතා නැගිට නැගිට වෑයම් කරමින් දකුණු උරහිසෙහි මව ද අනිත් උරහිසෙහි පියා ද තබාගෙන (ඇඳුම්-ආහාර ආදී) සිවු පසයෙන්, ඇඟ ඉලීමෙන්, පිරිමැදීමෙන්, නැහැවීමෙන්, සම්බාහනය කිරීමෙන් ද දෙමව්පියන්ගේ මලමුත්‍ර පිළිකුල් නොකර කැමති සේ උවටැන් කිරීමෙන් ද වසර සියයක් ආයුෂ ඇති පුතෙක් ව වසර සියය පුරාම රැකබලා ගන්නේද ශ්‍රද්ධාදී ගුණ විශේෂයන්හි පිහිටුවීමෙන් මිස එපමණකින් පුතා විසින් මව්පියන්ට ප්‍රතිඋපකාර කරන ලද්දේ නොවෙයි.

'මහණෙනි, මම මවට ද පියාටද යන දෙදෙනාට ප්‍රත්‍යුපකාර කිරීම පහසු යයි නොකියමි. මහණෙනි, අවුරුදු සියයක් ආයුෂ ඇති යමෙක් අවුරුදු සියයක් ජීවත්වන්නේ එක් උරහිසක තබා ගැනීමෙන් මව රැකබලා ගන්නේ ද එක් උරහිසක තබා ගැනීමෙන් පියා රැකබලා ගන්නේද ඔහු ම ඔවුන්ගේ සිරුරු සුවඳසුණු ඉලීමෙන් හා අත්පා පිරිමැදීමෙන් හා සිහිල්පැන් උණු පැන් නැවීමෙන් හා අවයව සම්බාහනය කිරීමෙන් හා උපස්ථාන කරයි ද ඔවුහු (මව්පියෝ) ද ඒ උරහිස්වලම හිඳ මලමුත්‍ර පහ කරන්නාහු නම් මහණෙනි, එසේ වුව ද එය මව්පියන්ට උපකාරයක් හෝ ප්‍රත්‍යුපකාරයක් හෝ නොවේම ය.

මහණෙනි, බොහෝ සත්රුවන් ඇති මේ මහා පෘථිවියෙහි මව්පියන් සක්විති රාජ්‍යයෙහි පිහිටුවන්නේ වුවද මහණෙනි, මව්පියන්ට උපකාර කරන ලද්දේ හෝ ප්‍රත්‍යුපකාර කරන ලද්දේ හෝ නොවේ ම ය. එයට හේතු කවරේද? මහණෙනි, මව්පියෝ පුතුන්ට බොහෝ උපකාර ඇත්තෝය. පුතුන් වඩන්නෝය. පෝෂණය කරන්නෝය. මේ ලෝකය දක්වන්නෝ ය.

මහණෙනි, යමෙක් ශ්‍රද්ධාව නැති මව්පියන් ශ්‍රද්ධා සම්පත්තියෙහි මව්පියන් ශීල සම්පත්තියෙහි සමාදන් කරවයි ද වාසය කරවයි ද පිහිටුවයි ද මසුරු වූවන් ත්‍යාග සම්පත්තියෙහි සමාදන් කරවයි ද වාසය කරවයි ද පිහිටුවයි ද දුෂ්ප්‍රාඥයන් (නුවණ නැති දෙමාපියන්) ප්‍රඥාසම්පත්තියෙහි සමාදන් කරවයි ද වාසය කරවයි ද පිහිටුවයි ද මහණෙනි, මෙපමණකින්

මව්පියන්ට උපකාර කරන ලද්දේත් ප්‍රත්‍යුපකාර කරන ලද්දේත් අධික උපකාර කරන ලද්දේත් වෙයි යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලදී.

එසේම 'මව්පියන්ට උපස්ථාන කිරීම, අඹුදරුවන්ට සංග්‍රහ කිරීම'ද 'මහණෙනි, මව්පියන්ට උපස්ථාන කිරීම පණ්ඩිතයන් විසින් පණවන ලදී' යන මේ ආදී වශයෙන් මව්පියන්ගේ බොහෝ උපකාර පුතුන්ට ඇති බව දක්වන සූත්‍ර දතයුතුය.

ගාථාවන්හි වුච්චරෙ යනු කියනු ලැබෙත්. **පජාය අනුකම්පකා** යනු අනුන්ගේ ප්‍රාණය සිඳ දමා හෝ තමා සතු යම්කිසිවක් දුරුකොට හෝ තමාගේ දරුවන් නමැති ප්‍රජාව පෝෂණය කරත්, ආරක්ෂා කරත්. එහෙයින් (දෙමාපියෝ) තමාගේ ප්‍රජාවට දරුවන්ට අනුකම්පා කරන්නෝය, අනුග්‍රහ කරන්නෝය. **නමසෙසය්‍ය** යනු උදේ සවස උපස්ථානයට ගොස් මේ මගේ උතුම් පින්කෙතයයි නමස්කාර කරන්නේය. **සක්කරෙය්‍ය** යනු සත්කාර කිරීමෙන් ගරු බුහුමන් කරන්නේය. දැන් ඒ සත්කාරය දක්වමින් 'අන්නෙන' යනාදිය වදාළහ.

එහි **අන්නෙන** යනු කැඳවලින්, බත්වලින්, කෑයුතු දෙයින්. **පානෙන** යනු අටවැදෑරුම් පානයෙන්. **වත්ථෙන** යනු හඳින පොරවන වස්ත්‍රයෙන්. **සයනෙන** යනු ඇඳ පුටු කොට්ට මෙට්ට ආදී සෙනසුන් උපකරණවලින්. **උච්ඡාදනෙන** යනු දුගඳ දුරුකොට සුවඳවත් කරන ඇඟ ඉලීමෙන් **නහාපනෙන** යනු සීත කාලයෙහි උණුදියෙන් ද උෂ්ණ කාලයෙහි සිසිල් දියෙන් ද (මව්පියන්ගේ) සිරුරු දියවත්කොට නැහැවීමෙන්. **පාදානං ධොවනෙන ච** යනු උණුදියෙන් හා සිහිල්දියෙන් පා දෙවීමෙන් ද තෙල් ගැල්වීමෙන් ද,

**තාය නං පාරිචරියාය** යන මෙහි 'නං' යනු නිපාත මාත්‍රයකි. කියන ලද ආකාර ඇති වතාවත් හේතුකොටගෙන. නැතහොත් 'පාරිචරියාය' යනු භරණ-කිච්චකරණ - කුලවංස පතිට්ඨාපනාදී පස්වැදෑරුම් උපස්ථානයෙන්. එය කියන ලද්දේමය. ගෘහපතිපුත්‍රය, කරුණු පහකින් නැගෙනහිර දිශාව වූ මව්පියෝපුතා විසින් පෝෂණයකළ යුත්තාහ. ඔවුන් විසින් පෝෂිත වූ මම මහලුව සිටින ඔවුන් පෝෂණය කරන්නෙමියි ද,

මාපියන්ට පැමිණි කටයුතු ඔවුන් වෙනුවට මම කරන්නෙමියි ද, මාපියන් සතු වස්තුව නොනසා රකිමින් කුල පරපුර රැකගන්නෙමියි ද, මාපියන්ගෙන් ලත් දෑවැද්ද ඔවුන්ගේ අවවාද පරිදි භුක්ති විඳින්නෙමියිද තවද කලුරිය කළ මව්පියන්ට (දන් දී) පින්දෙන්නෙමියි දැයි යන මේ කරුණු පසින් පුතා විසින් නැගෙනහිර දිශාව වූ මව්පියෝ උපස්ථාන කරන ලද්දාහු කරුණු පසකින් පුතුට අනුකම්පා කරත්. (මව්පියෝ) පුතු පවින් වළක්වති, පිනෙහි යොදවත්, ශිල්ප හදාරවත්, සුදුසු ස්ත්‍රියක පාවා දෙත්. සුදුසු කල්හි දෑවැද්ද (තමා සතු වස්තුව දරුවන්ට) පවරා දෙත්.

තවදුරටත් යම් දරුවෙක් මව්පියන් ත්‍රිවිධ වස්තුන්හි (තෙරුවන්හි) පැහැදුනවුන් කොට සීලයන්හි පිහිටුවා හෝ පැවිද්දෙහි යොදවා හෝ උවටැන් කරයි ද මොහු මව්පියන්ට උපස්ථාන කරන්නවුන් අතරින් අග්‍රයයි දතයුතුය. ඒ මේ පාරිචරියාව පුතුගේ දෙලොව හිතසුව ගෙනදෙන බව දක්වමින් 'ඉධෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙ පමොදති' යනුවෙන් වදාළහ. එහි ඉධ යනු මේ ලෝකයෙහි. මව්පිය උවටැන්කරන පුද්ගලයාට පණ්ඩිත මිනිස්සු ඒ පාරිචරියාවෙන් ප්‍රශංසා කරත්, වර්ණනා කරත්, ස්තුති කරත්. (දෙමව්පියන්ට උවටැන් කරන) තැනැත්තාගේ ක්‍රියා දැක ඒ අනුව කටයුතු කරන අය තමන්ගේ ද මව්පියන් කෙරෙහි එසේ පිළිපැද මහත් වූ පින් රැස්කරත්. පෙච්ච යනු පරලොව ගොස් ස්වර්ගයෙහි සිටියා වූ මව්පිය උපස්ථායකයා දිව්‍ය සම්පත්වලින් සතුටු වෙයි, ප්‍රමෝදයට පත්වෙයි, වඩාත් සතුටු වෙයි.

**සත්වන සූත්‍රය යි.**

# 4.1.8

අටවන සූත්‍රයෙහි **බ්‍රාහමණ ගහපතිකා** යනු බ්‍රාහ්මණයෝ ද ගෘහපතියෝ ද. බමුණන් හැර ගිහිගෙයි වාසය කරන යම්කෙනෙක් වෙත් ද ඔවුහු මෙහි ගෘහපතියෝ යයි දතයුතුය. **යෙ** යනු අනියමයෙන් නිර්දේශය (විස්තර කිරීම) ස්පර්ශ කිරීමයි. **තෙ** යනු උපයෝග (ද්‍රුතියා=කර්ම) බහුවචනයයි. මේ වනාහි මෙහි කෙටි අර්ථයයි: මහණෙනි, ඔබලාට යම් බ්‍රාහ්මණ පිරිසක් වෙත් ද ගිහිගෙයි වසන පිරිසක් වෙත් ද ඒ බ්‍රාහ්මණ ගෘහපතියෝ ඔබලාට බොහෝ උපකාර ඇත්තාහුය. යම්තැනක අපි විපාකදීම් වශයෙන් ඉහළට (සැපයට) යන්නා වූ උත්පත්ති වශයෙන් ස්වර්ගයට හිත වූ, සැපවිපාක ඇත්තා වූ අග්‍ර වූ දිව්‍ය වර්ණ ආදිය උදාකර දෙන්නා වූ දක්ෂිණාව පිහිටවමුයි චීවරාදී ප්‍රත්‍යයෙන් නැවත නැවත උපස්ථාන කරත්. මෙසේ ආමිසදාන වශයෙන්, ආමිස සංවිභාග වශයෙන්, ආමිස අනුග්‍රහ වශයෙන් ගිහියෝ භික්ෂූන්ට උපකාර ඇත්තෝ යයි දක්වා දැන් ධර්ම දානයෙන්, ධර්ම සංවිභාගයෙන්, ධර්ම අනුග්‍රහයෙන් භික්ෂූන් ද ඔවුන්ට උපකාර ඇති බව දක්වන්නට 'තුම්හෙපි භික්ඛවෙ' යනාදිය කියන ලදී. එය කියන ලද අයුරින්මය.

මෙයින් කුමක් කියන ලද ද? පිණ්ඩාපචායනය (පිණ්ඩපාතයට ගරුකිරීම) කියන ලදී. මේ මෙහි අදහසය: මහණෙනි, යම්හෙයකින් මේ බ්‍රාහ්මණ ගෘහපතියෝ ඔබලාගේ ඤාතීහු නො වෙත්ද, මිත්‍රයෝ නොවෙත් ද, ණයකරුවෝ නොවෙත් ද එසේනම් මේ ශ්‍රමණයෝ මනා වූ මාර්ගයෙහි යන්නෝ වෙති. මනාව පිළිපදින්නාහු වෙති. උන්වහන්සේලා කෙරෙහි කරනු ලබන අපගේ පූජාවෝ මහත්ඵල වන්නාහ, මහානිසංස වන්නාහ යනුවෙන් ඵල විශේෂය කැමැත්තාහු ඔබලාට චීවරාදියෙන් උපස්ථාන කරති. එහෙයින් ඔවුන්ගේ ඒ අදහස සම්පූර්ණ කරමින් අප්‍රමාදීව කටයුතු කරව්. (මෙසේ මනා වූ පිළිවෙත් ඇතිව කරනු ලබන) ඔබලාගේ ධර්ම දේශනාව ද ඔවුන්ට ප්‍රයෝජනවත්ය. ඔවුන් (දායකයන්) විසින් භාරගත යුත්තක් ද වෙයි. (භික්ෂූන් නොවන) අන් අයගේ ධර්ම දේශනාව එසේ නොවේයයි මෙසේ මනා වූ ප්‍රතිපත්තියෙහි අප්‍රමාදව කටයුතු කළ යුතුය.

'එවමිදං භික්ඛවෙ' යානදියෙහි මේ කෙටි අර්ථයයි: මහණෙනි, මෙසේ මේ කියන ලද ආකාරයෙන් ගිහියන් විසින් පැවිද්දන් විසින් ආමිසදාන ධර්මදාන වශයෙන් ඔවුනොවුන් ඇසුරුකොට **ඔඝස්ස නිත්ථරණත්ථාය** කාමාදී වශයෙන් සතරාකාර ඔඝය දුරුකරනු පිණිස සියලු සසර දුක් කෙළවර කිරීම පිණිස උපෝසථ සීල, චතුපාරිසුද්ධි සීලාදී වශයෙන් ද **බ්‍රහමචරියං** මේ සාසන බ්‍රහ්මචරියාවෙහි ද මාර්ග බ්‍රහ්මචරියාවෙහි ද **වුස්සති** වසනු ලැබේ.

ගාථාවන්හි - **සාගාරා** යනු ගිහියෝ ය. **අනාගාරා** යනු ගිහිගෙය අත්හළ පැවිද්දෝය. **උභො අඤ්ඤොඤ්ඤනිස්සිතා** යනු ඒ දෙපිරිස ම ඔවුනොවුන් ඇසුරුකොට, ගිහියෝ පැවිද්දන්ගේ ධර්මදානය ඇසුරු කිරීමෙන් ද පැවිද්දෝ ගිහියන්ගේ (චීවරාදි) ප්‍රත්‍ය දානය ඇසුරු කිරීමෙන්ද **ආරාධයන්ති** සිදුකරත්, සම්පාදනය කරත්. **සද්ධම්මං** යනු ප්‍රතිපත්ති සද්ධර්මය ද ප්‍රතිවේධ සද්ධර්මය ද. එහි යමක් උතුම් ද එය දක්වන්නාහු **යොගක්ඛෙමං අනුත්තරං** යනුවෙන් රහත් බව ද නිවන ද වදාළහ. **සාගාරෙසු** යනු ගිහියන්ගෙන්, මෙය අවධි අර්ථයෙහි සත්තමී විභක්ති වචනය යි. (නිස්සක්කේ භුම්මවචනං) ගිහියන් සමීපයෙහි හෝ. **පච්චයං** යනු කියා ඉතිරි වූ පිණ්ඩපාතය හා බෙහෙත් යන ප්‍රත්‍ය දෙකයි. **පරිස්සය විනොදනං** යනු සතුවලින් ඇතිවන හිරිහැර ආදී හිරිහැර දුරුකරන විහාරාදී ආවාස.

**සුගතං** මනාව පිළිපන්නා වූ කල්‍යාණ පෘථග්ජනයා සමග අටවැදෑරුම් ආර්ය පුද්ගලයා, මෙහි ශ්‍රාවකයා 'සුගත' යනුවෙන් අදහස් කරන ලදී. **ඝරමෙසිනො** යනු ඝරං එසිනො, ගෙයි සිට ගෙයි වාසය කරමින් භෝග උපකරණ ද ගිහි සීලාදිය ද සොයන ස්වභාවය ඇත්තෝ යන අර්ථයි. **සද්දහානො අරහතං** යනු අර්හත් වූ ආර්යයන්ගේ වචනය හෝ උන්වහන්සේලාගේ මනා වූ පිළිවෙත හෝ අදහන්නා වූ, ඒකාන්තයෙන් මුන්වහන්සේලා මනාව පිළිපන්නාහුය, මුන්වහන්සේලා කියන ආකාරයට පිළිපදින අයට ඒ ප්‍රතිපත්තිය ස්වර්ග මෝක්ෂ සම්පත් පිණිස පවතී යනුවෙන් අදහන්නා වූ යන අර්ථයි. 'සද්ධාතා' යනු ද පාඨයකි. **අරියපඤ්ඤාය** යනු සුවිසුද්ධ ප්‍රඥාවෙන්. **ඣායිනො** යනු අරමුණ සිහිකිරීම් වශයෙන් ලක්ෂණ සිහිකිරීම් වශයෙන් යන දෙයාකාර ධ්‍යානයෙන් ධ්‍යාන කරන්නා වූ.

**ඉධ ධම්මං චරිත්වාන** යනු මේ ආත්මභාවයෙහි හෝ මේ ශාසනයෙහි හෝ ලෞකික ලෝකෝත්තර සැපයට මාර්ගය වූ සීලාදී ධර්ම පිළිපැද පිරිනිවීමට නො පැමිණෙන තාක් සුගතිගාමී වූ. **නන්දිනො** යනු ප්‍රීතිය හා සොම්නස යෙදීමෙන් සතුටුවන ස්වභාවය ඇත්තා වූ. ඇතැමෙක් වනාහි - ධම්මං චරිත්වාන මග්ගං' යනුවෙන් සෝවාන් මාර්ගයට පැමිණ යන අර්ථය බව කියති. **දෙවලොකස්මිං** යනු සයවැදෑරුම් කාම දිව්‍යලෝකයෙහි. **මොදන්ති කාමකාමිනො** කැමති කැමති කාම වස්තු පහළවීමෙන් කාම සැප කැමැත්තාහු කාමවන්තයෝ වී සතුටු වෙති.

අටවන සූත්‍රය යි.

# 4.1.9

නවවන සූත්‍රයෙහි **කුහා** යනු (අදාළ කාරණයට) සමීපව කතා කිරීම් ආදී වශයෙන් කුහන වස්තුවෙන් නැති ගුණ පෙන්වීම, නැති ගුණයට ගරුකරවා ගැනීමේ ආසාවෙන් කුහකකම් කොට අනුන් පුදුමයට පත්කරන්නා වූ (පුද්ගලයෝ) යන අර්ථයි. **ථද්ධා** යනු ක්‍රෝධයෙන් ද මානයෙන් ද තද වූ සිත් ඇත්තා වූ (පුද්ගලයෝ) '**කොධනො හොති - උපායාස බහුලො අප්පම්පි වුත්තො සමානො අභිසජ්ජති, කුප්පති බ්‍යාපජ්ජති, පතිත්ථීයති**' 'ක්‍රෝධ කරන්නෙක් වෙයි. සිත්තැවුල් බහුලකොට ඇත්තේ වෙයි, ස්වල්පයක් කියන ලද්දේ වුව ද කිපෙයි, ව්‍යාපාදයට පැමිණෙයි යනුවෙන් මෙසේ කියන ලද ක්‍රෝධයෙන් ද '**දුබ්බචො හොති - දොවචස්ස කරණෙහි ධම්මෙහි සමන්නාගතො අක්ඛමො අප්පදක්ඛිණග්ගාහී අනුසාසනිං**' 'දුර්වච වූවෙක් වෙයි. දුර්වචභාවය ඇතිකරන කරුණුවලින් යුක්ත වූයේ වෙයි, නො ඉවසන්නේ වෙයි, අනුසාසනාව ගරුකොට නොපිළිගන්නේ වෙයි' යනුවෙන් මෙසේ කියන ලද දුර්වච භාවයෙන් ද ජාතියෙන් මත්වූයේ, ගෝත්‍රයෙන් මත්වූයේ, ශිල්පයෙන් මත්වූයේ, නිරෝගිබවෙන් මත්වූයේ, තරුණ බවෙන් මත්වූයේ,

ජීවිතයෙන් මත්වූයේ යනුවෙන් මෙසේ කියන ලද ජාතිමදාදී භේද ඇති මදයෙන් ද ගරුකටයුතු ගුරුවරුන් කෙරෙහි උසස් ම අයුරින් ගරුනොකොට යකඩ කූරක් ගිලගෙන සිටියාක් මෙන් නොනැමෙන බවින් යුතුව හැසිරෙන්නා වූ.

**ලපා** යනු චාටුබස් කියන්නා වූ, මිථ්‍යාජීව වශයෙන් පවුල්වලට (කුලවලට) සංග්‍රහ කරන්නා වූ, (චීවරාදී) ප්‍රත්‍යය පිණිස යෙදුණු වචන වශයෙන් ද ලාභසත්කාරාදිය පිණිස අනුන්ට දොස්කීම් වශයෙන් ද චාටුබස් කියන්නා වූ (පුද්ගලයෝ) යන අර්ථයි.

**සිංගී** යනු 'තත්‍ථ කතමං සිංගං? යං සිංගං සිංගාරතා චාතුරතා චාතුරියං පරික්ඛත්තතා පාරික්ඛත්තියං' 'එහි සිංග' යනු කුමක්ද? යම් කෙලෙස් අඟක්, ශෘංගාර (නාගරික) බවක්, චතුර (දක්‍ෂ) බවක්, චාතුර්යයක්, දැඩි ශෘංගාර බවක්, බලවත් ශෘංගාර බවක් වේද, යනුවෙන් මෙසේ කියන ලද අං සමාන ප්‍රකට කෙලෙස්වලින් යුක්ත වූ (පුද්ගලයෝ). **උන්නළා** යනු උඩට ගිය බට ගස් - බට සමාන හිස් මානය ඔසවා හැසිරෙන්නා වූ (පුද්ගලයෝ) **අසමාහිතා** යනු හිතේ එකඟකමක් පමණවත් නොලබන්නා වූ (පුද්ගලයෝ).

**න මෙ තෙ භික්ඛවෙ භික්ඛූ මාමකා** යනු ඒ භික්‍ෂූහු මගේ නොවෙති, මා සමීපයෙහි නොවෙති. 'මය්හං' 'මගේ' යන මෙය තමන් වහන්සේ උදෙසා පැවිදිවූ බැවින් භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලදී. යම්හෙයකින් ඔවුහු කුහනාදිය යෙදීමෙන් මනාකොට නොපිළිපන්නාහුද එහෙයින් 'න මාමකා' යනුවෙන් කියන ලදී. **අපගතා** යනු ඉදින් ඔවුහු මගේ සසුනෙහි පැවිදි වූවාහු වුව ද අවවාදයට අනුව නොපිළිපැදීමෙන් මේ ධර්ම-විනයෙන් ඉවත් වූවාහුමය. ඔවුහු මේ සාසනයෙන් ඉතාමත් දුර සිටියාහුයයි දක්වයි. එය කියන ලද්දේම ය.

**නභඤ්ච දූරෙ පඨවී ච දූරෙ**
**පාරං සමුද්දස්ස තථාහු දූරෙ**
**තතො හවෙ දූරතරං වදන්ති**
**සතඤ්ච ධම්මං අසතඤ්ච රාජා'ති**

මහරජ, අහස ද දුරය. පොළොව ද දුරයයි (අහසට පොළොව දුරයයි) කීහ. සමුදුරට එගොඩ දුරයයි (මෙගොඩට එගොඩ දුරයයි) කීහ. සත්පුරුෂ ධර්මයට අසත්පුරුෂ ධර්මය ඊටත් වඩා දුරයයි කියති යනුවෙනි.

**වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති** යනු සීලාදී ගුණවලින් වර්ධනය වීම් වශයෙන් වෘද්ධියට, එහි නිශ්චල භාවයෙන් විරූළ්හියට හැමතැනම පැතිරුණු බැවින් සීලාදී ධර්මස්කන්ධ පරිපූර්ණ වීමෙන් වෙපුල්ලයට **න** ච තෙ ඒ කුහක ආදී ස්වභාව ඇති **භික්ඛූ** භික්ෂූහු නො පත් වෙති. නොපැමිණෙත් යන අර්ථයි.

**තෙ ඛො මෙ භික්ඛවෙ භික්ඛූ මාමකා** යන මෙහි ද 'මෙ' යනු තමන්වහන්සේ උදෙසා පැවිදි වූ බැවින් කියති. මනාව පිළිපන් හෙයින් 'මාමකා' යනුවෙන් කීහ. කියන ලද ආකාරයට වෙනස් ලෙසින් කුසල පක්ෂය දතයුතුය. එහි අර්හත් මාර්ගය තෙක් 'විරූහන්ති' නම් වේ. අර්හත්ඵලයට පත්කල්හි විරූළ්හියට වෙපුල්ලයට පැමිණියාහු නම් වෙත්. ගාථා මනාව දතහැකිමය.

**නවවන සූත්‍රය යි.**

# 4.1.10

දසවන සූත්‍රයෙහි **සෙය්‍යථාපි** යනු උපමා දක්වන අර්ථයෙහි නිපාතයකි. යම්සේ යන අර්ථයි. **නදියා සොතෙන ඔවුය්හෙය්‍ය** යනු වේගවත් සැඬපහරින් ගෙනයන ගංගා ජලයේ වේගයෙන් යටින් ගෙනයන්නේය, පහළට ගෙනයනු ලැබේ. **පියරූප සාතරූපෙන** යනු ප්‍රිය ස්වභාවය ද මධුර ස්වභාවය ද හේතුකොටගෙන, 'ඒ ගඟෙහි හෝ ගඟෙන් එගොඩ හෝ මැණික් රන් ආදී අනිත් ප්‍රියවස්තුවක් හෝ මිහිරි උපකරණයක් හෝ ඇත. එය ගන්නෙමියි ගඟට වැටී සැඬපහරින් ඇදගෙන යනු ලැබේ. **කිඤ්චාපි** යනු අනුදැනීමෙහි (අනුමතයෙහි) සම්භාවනා (වර්ණනා) නොකිරීමෙහි නිපාතයකි. කුමක් අනුදනියි ද? කුමක් ගරු නොකරයි ද? ඒ පුරුෂයා විසින් අදහස් කළ ප්‍රිය වස්තුව එහි

ඇති බව අනුමත කරයි. (පිළිගනියි) එසේ යාම ආදීනව (දොස්) ඇති බැවින් වර්ණනා නොකරයි. 'පින්වත් පුරුෂය, ඉදින් ඔබ විසින් අදහස් කළ ප්‍රිය වස්තුව එහි ඇතත් මෙසේ යාමෙහි මේ ආදීනවයයි. ඔබ යට ඇති විලට පැමිණ මරණයට හෝ මරණය හා සමාන යම් දුකකට හෝ පැමිණෙන්නෙහිය' යන මෙය කියන ලද්දේ වෙයි.

**අත්‍ථි චෙත්‍ථ හෙට්ඨා රහදො** යනු ඒ ගංගාව යට (පහළ) සැඩපහර ඇති කොටසෙහි අතිශයින් ගැඹුරු වූ ද පළල් වූ ද එක් මහාවිලක් ඇත. එය ද හාත්පසින් වාත පහරින් නැගුණු මැණික් පර්වතකුට සමාන වූ මහත් රැළිවලින් **සඋම්මී** රැළි සහිත වූ. විසම භූමි ප්‍රදේශවල වේග සහිතව ඇතුළට වදින මේ නදියෙහි මහත් වූ සැඩපහරින් තැන තැන පෙරළෙන මහත් වූ ජලය ඇති බැවින් වඩබාග්නිය සමාන සුළි සහිත වූ යන අරුතින් **සාවට්ටො**. ඒ විලට බැසගත් සත්ත්වයන් ම තමාගේ නිබඳ ආමිස ලෙස ගොදුරු කොට වසමින් අතිශය භයානක දර්ශන ඇති ඝෝර සිත් ඇති දියරකුසකු විසින් **සගහො සරක්ඛසො** සගහ, සරක්ඛස වූ. සැඩමසුන් මෝරුන් සහිත වූ හෙයින් හෝ 'සගහ' වෙයි. කියන ලද ආකාර ඇති රකුසා සහිත වූ හෙයින් හෝ 'සරක්ඛස' වෙයි. **යං** යනු මෙසේ බියසහිත වූ යම් විලක්. **අම්භො පුරිස** යනු ආලපනයයි. **මරණං වා නිගච්ඡසි** යනු ඒ දියරැළිවලින් වසා පැතිර සිටි හෝ ඒ සුළිවලට වැටුණේ හිස ඔසවන්නට නොහැක්කේ ඒ සැඩ මසුන් මකරාදීන්ගේ මුඛයෙහි වැටුණේ ඒ දියරකුසාගේ අතට පත්වූයේ මරණයට හෝ යයි. නැතහොත් ආයුෂ ඉතිරිව ඇති කල්හි එයින් මිදී ඉවතට යන්නේ ඒ රැළි ආදියෙන් උපන් ගැටීම් වශයෙන් **මරණමත්තං** මරණය පමණ වූ දුකට පැමිණෙයි.

**පටිසොතං වායමෙය්‍ය** යනු හෙතෙම පෙර සැඩපහරට අනුව පහළට යන්නේ ඒ පුරුෂයාගේ වචනය අසා මට අයහපතක් පැමිණියේලු. මම මරුකටට පෙරළෙම්ලුයි උපන් බලවත් භය ඇත්තේ කැරකෙමින් උත්සාහය දෙගුණකොට **හත්‍ථෙහි චපාදෙහි ච වායමෙය්‍ය** (අත්වලින්ද පාවලින් ද උත්සාහ කරන්නේය) තරණය කරන්නේය නොබෝ වේලාවකින් ම වෙරළට පැමිණෙන්නේය.

**අත්‍ථස්ස විඤ්ඤාපනාය** යනු චතුස්සත්‍ය අවබෝධයට අනුකූල වූ අර්ථයේ අවබෝධය පිණිස උපමාවක් කරන ලදී. **අයඤ්චෙත්‍ථ අත්‍ථො**

යනු යම් කරුණක් අවබෝධ කරවනු පිණිස උපමාවක් ගෙනෙන ලද ද මෙහි දැන් කියනු ලබන මා විසින් අදහස් කරන ලද උපමෙය අර්ථය මෙයම ය. **තණ්හායෙතං අධිවචනං** යන මෙහි සතර ආකාරයකින් තණ්හාව, සැඩදිය පහරට සමාන බව දතයුතුයි. අනුපිළිවෙලින් විශාල වීම් වශයෙන් ද නොකැඩී පැවතීම් වශයෙන් ද ගිලාබැස්සීම් වශයෙන් ද එතෙරවීමට අපහසුවීම් වශයෙන් ද යනුවෙනි.

1. ඉහළ මහවැසි ඇදහැලුණු විට ජලය පර්වත, කඳුරු, පැල්ම ශාඛා පුරවා එයින් බැස කුඩා වලවල් පුරවා එයින් බැස කුඩා නදී පුරවා එයින් මහා නදීන්ට වැටී එක දියපහරක් වී පැවතීම නදීසැඩපහර යයි කියනු ලැබේ. එසේම ආධ්‍යාත්මික බාහිරාදි වශයෙන් නොයෙක් භේද ඇති රූපාදී අරමුණුවල ලෝභය ඉපදී අනුපිළිවෙළින් විශාලවීමට යන්නේ තණ්හා සෝත යයි කියනු ලැබේ.

2. යම්සේ ගංගා සැඩපහර පැමිණීමේ (ආරම්භයේ) සිට මුහුදට වැටෙනතුරු කැඩීයාමකට හේතුවක් නැති බැවින් නොසිඳී නොකැඩී පැවතීම් වශයෙන් පවතී ද, මෙසේ තණ්හා සැඩපහර ද ආරම්භයේ පටන් කැඩී යාමකට හේතුවක් නැතිකල්හි නොකැඩී අපාය සමුදුරට මුහුණලා නොකැඩී පැවතීමෙන් පවතී.

3. යම්සේ ගංගා සැඬපහර, සැඬපහර ඇතුළට ගිය සත්ත්වයන් ගිලා බස්සයි ද හිස ඔසවන්නට නො දෙයි ද මරණයට හෝ මරණයට සමාන දුකකට හෝ පමුණුවයි ද මෙසේ තණ්හා සැඬපහර ද තමාගේ සැඬපහර ඇතුළට ගිය සත්ත්වයන් ගිලාබස්සයි ද ප්‍රඥාව නමැති හිස ඔසවන්නට නොදෙයි ද කුසල් මුල් සිඳිමින් ද කෙලෙස් ධර්මයන්ට පැමිණීමෙන් ද මරණයට හෝ මරණයට සමාන දුකකට හෝ පමුණුවයි.

4. යම්සේ ගංගා සැඬපහර මහෝඝ භාවයෙන් පවතින්නේ පහුරක් හෝ නැවක් හෝ බඳින්නට ද ගෙනයන්නට ද දක්ෂ පුරුෂයකු ඇසුරුකොට පරතෙරට යන්නට අදහස් කොට එයට ගැලපෙන ලෙස වෑයම් කරන තැනැත්තා විසින් එතෙරවිය යුතුය. අන් අයුරකින් නොවේ යනුවෙන් දුරුත්තරය (එතෙරවීම දුෂ්කරය). මෙසේ කාම ඕඝ, භව ඕඝ වූ තණ්හා සැඬපහර ද සීල සංවරය පුරන්නට සමථ විදර්ශනාවන්හි ක්‍රියා කරන්නට

නුවණැත්තා විසින් රහත්බවට පැමිණෙන්නෙමියි අදහසක් ඇතිකොට කල්‍යාණ මිත්‍රයන් ඇසුරුකොට සමථ විදර්ශනා නමැති නැවට නැගී මනාව වෑයම් කරන තැනැත්තා විසින් එතෙරවිය යුතුය. අන් අයුරකින් නොවේ යනුවෙන් දුරුත්තරය.

මෙසේ අනුපිළිවෙළින් විශාලවීම් වශයෙන්, නොකැඩී පැවතීම් වශයෙන්, ගිලාබැස්සීම් වශයෙන්, එතෙරවීමට අපහසුවීම් වශයෙන්දැයි සතර ආකාරයකින් තණ්හාව, සැඬදිය පහරට සමාන බව දතයුතුය.

**පියරූප සාතරූපං** යනු ප්‍රිය ජාතිකය ප්‍රිය ස්වභාවය ප්‍රියරූපය යි. මධුර ජාතිකය මධුර ස්වභාවය සාතරූපයයි. ඉෂ්ඨ ස්වභාවය (සිතට ප්‍රිය ගතිය) යන අර්ථයි. **ඡනෙනතං** යනු ජනනං එතං. **අජ්ඣත්තිකානං** යන මෙහි මෙසේ අපි ආත්මය යන ගැනීම ගෙනයමු යන මේ අදහසින් මෙන් තමා ප්‍රධානකොට පැවති යන අර්ථයෙන් අජ්ඣත්තික නම් වේ.

එහි ගොචරජ්ඣත්ත, නියකජ්ඣත්ත, විසයජ්ඣත්ත, අජ්ඣත්තජ්ඣත්ත යනුවෙන් අධ්‍යාත්මය සතරවැදෑරුම්ය. ඒවා අතරින් **'අජ්ඣත්තරතො සමාහිතො'** 'අධ්‍යාත්මයෙහි ඇලුණේ සන්සුන් වූයේ' යන මේ ආදියෙහි කියන ලද මෙය ගොචරජ්ඣත්ත (ගොචර අධ්‍යාත්ම) යයි. **'අජ්ඣත්තං සම්පසාදනං'** 'අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති' යනුවෙන් ආවා වූ මෙය නියකජ්ඣත්ත (නියක අධ්‍යාත්ම)යයි. **'සබ්බ නිමිත්තානං අමනසිකාරා අජ්ඣත්තං සුඤ්ඤතං උපසම්පජ්ජ විහරති'** සියලු නිමිති මෙනෙහි නො කිරීමෙන් ආධ්‍යාත්මික ශූන්‍යතාවට පැමිණ වාසය කරයි. 'මෙසේ ආවා වූ මෙය විසයජ්ඣත්ත (විෂය අධ්‍යාත්ම) යයි. **'අජ්ඣත්තිකා ධම්මා බාහිරා ධම්මා'** 'අධ්‍යාත්මික ධර්ම බාහිර ධර්ම' යන මෙහි කියන ලද්ද අජ්ඣත්තජ්ඣත්ත (අධ්‍යාත්ම අධ්‍යාත්ම) නම්. මෙහි ද එයම අදහස් කරන ලදී. එහෙයින් අජ්ඣත්තානි යන්නම අජ්ඣත්තිකානි වෙයි. නොහොත් කියන ලද ආකාර ඇති අර්ථයෙන් ම 'අජ්ඣත්තා ධම්මා බහිද්ධා ධම්මා' යනාදියෙහි මෙන් ඒ අධ්‍යාත්මයන්හි වූ දේ අජ්ඣත්තිකානි ඇස ආදිය යි, ඒ අධ්‍යාත්මයට අයත් දේවල.

**ආයතනානං** යන මෙහි උත්සාහ කරන හෙයින් ද (ආයතනතො), (චිත්ත-චෛතසික ධර්මයන්) විස්තර කරන හෙයින් ද (ආයානං තනනතො), මතු මත්තෙහි ගෙන යන හෙයින් ද (ආයතසස ච නයනතො)

ආයතන නම් වේ. ඇස ආදීන්හි ඒ ඒ ද්වාර වස්තුක වූ චිත්ත චෛතසික ධර්මයෝ ස්වකීය ස්වකීය අනුභවන (විඳීම්) ආදී වූ කෘත්‍යයෙන් උත්සාහ කරති, නැගීසිටිති, ගැටෙති, වෑයම් කරති. ඒ ආයභූත වූ (චිත්ත චෛතසික) ධර්මයන්, මේ ඇස ආදී ආයතනයෝ විස්තර කෙරෙත්. අග මුල නොදත හැකි (අනමතග්ග) මේ සසර පැවැත්තා වූ, ඉතාම දික් වූ යම් සසර දුකක් වේද, එය (ආයතනයෝ) ගෙන යති, පවත්වති. මෙසේ සර්වප්‍රකාරයෙන් මේ ධර්මයෝ උත්සාහ කරන හෙයින් ද, විස්තර කරන හෙයින් ද, මතුමත්තෙහි ගෙනයන හෙයින් ද ආයතනය යි කියනු ලැබෙත්. යළිත් නිවාසස්ථාන අර්ථයෙන් ද ආකරය යන අර්ථයෙන් ද රැස්වන (සමෝසරණ) තැන යන අර්ථයෙන් ද උපන් දේශය යන අර්ථයෙන් ද කාරණය යන අර්ථයෙන් ද ආයතනය දතයුතුය. ඒ එසේය. ලෝකයෙහි '**ඉස්සරායතනං දෙවායතනං**' යනාදියෙහි නිවාස ස්ථානය ආයතනයයි කියනු ලැබේ '**සුවණ්ණායතනං රතනායතනං**' යනාදියෙහි ආකරය ආයතනයයි කියනු ලැබේ. ශාසනයෙහි '**මනොරමෙ ආයතනෙ සෙවන්ති නං විහංගමා**'* මනරම් වූ ස්ථානයෙහි ඒ ගස පක්ෂීහු ඇසුරු කරත්' යනාදියෙහි රැස්වන තැන ආයතනයයි කියනු ලැබේ. '**දක්ඛිණාපථො ගුන්නං ආයතනං**' 'දක්ෂිණාපථය ගවයන් උපන් දේශයයි' යනාදියෙහි උපන්දේශය ආයතනයයි කියනු ලැබේ. '**තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ**' 'කරුණු ඇති කල්හි ඒ ඒ අභිඥාවෙහි ප්‍රත්‍යක්ෂභාවයට පැමිණෙන්නේය' යනාදියෙහි කාරණය ආයතනයයි කියනු ලැබේ.

ඇස ආදියෙහි ද ඒ ඒ චිත්ත චෛතසික ධර්ම වාසය කරයි. එයට අයත් පැවැත්ම ඇති හෙයින් මෙසේ ඇස ආදිය චිත්ත චෛතසික ධර්මයන්ගේ නිවාස ස්ථානයයි. ඇස ආදියෙහි ද ඒ චිත්ත චෛතසික ධර්ම ගැවසී ගත් හෙයින් ඇසුරුකොට ඇති හෙයින් දැයි මෙසේ ඇස ආදිය චිත්ත චෛතසික ධර්මයන්ගේ ආකරය වෙයි. එහි (චක්ඛු) වස්තු (චක්ඛු) ද්වාර භාවයෙන් රැස්වන තැන වශයෙන් සමෝසරණ ස්ථානයද වෙයි. එය ඇසුරුකොට ඇති බැවින් ද චිත්ත චෛතසික ධර්මයන් එහිම (ඇස ආදියෙහිම) ඉපදීම් වශයෙන් උපන් දේශයද වෙයි. ඇස ආදිය නැති කල්හි චිත්ත චෛතසිකයන් නැති හෙයින් කාරණය ද වෙයි.

මෙසේ නිවාසස්ථාන අර්ථයෙන් ද ආකරය යන අර්ථයෙන් ද රැස්වන තැන යන අර්ථයෙන් ද උපන් දේශය යන අර්ථයෙන් ද කාරණය යන අර්ථයෙන් ද යන මේ කරුණුවලින් ඇස ආදිය ආයතනයයි කියනු

ලැබේ. එහෙයින් 'ඡන්නන්තං අජ්ඣත්තිකානං ආයතනානං' මෙය ආධ්‍යාත්මික ආයතන හයට' යනුවෙන් කියන ලදී.

ඉදින් ප්‍රියරූපාදී ධර්ම ද **'රූපං ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති'** 'රූපය ලෝකයෙහි ප්‍රිය ස්වභාවයයි, මධුර ස්වභාවයයි, ඒ තෘෂ්ණාව උපදිනුයේ මෙහි උපදී' යනුවෙන් තණ්හාවට වස්තු වන බැවින් ප්‍රිය ස්වභාව - මධුර ස්වභාවයෙන් කියන ලදී. ඇස ආදිය අතහැර ආත්මභාව පැණවීමක් නැති හෙයින් මගේ ඇස, මගේ කණ ආදී වශයෙන් අධික ස්නේහයට වස්තු වන බැවින් ඇස ආදිය සාතිශය ප්‍රිය ස්වභාවය මධුර ස්වභාවය යි පෙන්වීම සුදුසුයයි දැක්වීමට 'පියරූප සාතරූපන්ති බො භික්ඛවෙ ඡන්නන්තං අජ්ඣත්තිකානං ආයතනානං අධිවචනං' 'මහණෙනි, ප්‍රියරූප සාතරූප යනුමේ ආධ්‍යාත්මික ආයතන හයට නමකි'යි කියන ලදී.

**ඕරම්භාගියානං** යන මෙහි කාමධාතුව ඕරං යි කියනු ලැබේ. එයට (ඕරයට) ඇතුළත් වූයේ = ඕරම්භාග නම් වේ. ප්‍රත්‍ය භාවයෙන් ඒ. ඕරම්භාගයන්ට හිත වූයේ යන අරුතින් ඕරම්භාගිය නම් වේ. (ඒ ඕරම්භාගිය) යමෙකුගේ පෙනෙන්ට ඇද්ද ඒ පුද්ගලයා සසරෙහි යොදවයි බඳියි යන අරුතින් සංයෝජන නම් වේ. සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, කාමරාග, බ්‍යාපාදවලට එය වචනයකි. ඒවා කාමභවයට එළඹි සංස්කාරයන්ට ප්‍රත්‍ය වී රූප අරූප ධාතුවෙන් (ලෝකයෙන්) පහළ බැවින් නිහීන බැවින් ඕරම්භාග වූ කාමභවය සමග සත්ත්වයන් යොදවයි. එහෙයින් ම ඒවා පහළ ඇති විලට සමාන බව දක්වන ලදැයි දතයුතුය.

**ඌම්භයන්ති බො භික්ඛවෙ කොධූපායාසස්සෙතං අධිවචනං** යනු මෙයින් බියවෙයි යන අරුතින් භය නම් වේ. ඌම්යම භය ය යන අරුතින් **ඌම්භය** නම් වේ. කිපෙන අර්ථයෙන් **කොධ** නම් වේ. ඒ ක්‍රෝධයම සිතේ ද ශරීරයේ ද මැඩීම, වෙවුලීම ඉපදවීමෙන් දැඩිය (බලවත්ය,) වෙහෙස අර්ථයෙන් **උපායාස** නම් වේ. මෙහි ද නොයෙක් වාරයක් පැවතී තමා සමාන ඒ සත්ත්වයා මැඩගෙන හිස ඔසවන්නට නොදී විනාශයට පැමිණවීමෙන් කොධ උපායාසය රළ හා සමානයයි දතයුතුය.

එසේ කාමගුණයන් නිසා කෙලෙස්වලින් මැඩගත් සත්ත්වයන් මෙතැනින් එතැනටත් එතැනින් මෙතැනටත් යනුවෙන් මෙසේ මනාප රූපාදී විෂය සංඛ්‍යාත තමා කෙරෙහි ඇවිදුවා යම්සේ එයින් පිටත වූ නෙක්ඛම්මයෙහි සිතක්වත් නො උපදී ද මෙසේ වසඟකොට දුකට පැමිණවීමෙන් දිය සුළියකට සමාන බව දතයුතුය. යම්සේ වනාහි ගෘහරාක්ෂසයා තමාගේ ගොදුරුබිමට ගිය අනාරක්ෂිත පුරුෂයා මැඩ අල්ලාගෙන ගොදුරුබිමෙහි නොසිටිය පුරුෂයාද රාක්ෂස මායාවෙන් ගොදුරුබිමට පමුණුවා බියකරු රූප දැක්වීමාදියෙන් තමාට උපකාර කරගැනීමට අසමත් බව දුබල බව ඇතිකොට ආවේශ වී වර්ණය - බලය භොග (ධනය) යස (පිරිවර) සැප ආදියෙන් වෙන්කරමින් මහත් වූ දුකට පමුණුවයි. මෙසේ ස්ත්‍රිය ද යෝනිසෝ මනසිකාරය නැති වීරබවක් නැති පුරුෂයා ස්ත්‍රී ලීලාවලින් තමාගේ ඉඟිබිඟි ආදී මායම්වලින් මැඩගෙන වීර ජාතියක සිටි පුරුෂයකු වුවද තමාගේ රූපාදියෙන් පෙළඹවීම් වශයෙන් ස්ත්‍රී මායාවෙන් ආවේශ වී තමාට උපකාර ධර්ම වූ සීලාදිය සම්පාදනය කරන්නට අසමත් බව දුබල බව ඇතිකරමින් ගුණ වර්ණනාදියෙන් වෙන් කරමින් මහත් වූ දුකට පමුණුවයි. මෙසේ ස්ත්‍රිය ගෘහ රාක්ෂසයකුට සමාන බව දතයුතුය. එහෙයින් '**ආවට්ටනති ඛො භික්ඛවෙ පඤ්චන්නෙතං කාමගුණානං අධිවචනං ගහරක්ඛසොති ඛො භික්ඛවෙ මාතුගාමස්සෙතං අධිවචනං**' 'මහණෙනි, දියසුළිය යන මෙය පංචකාම ගුණයන්ට නමකි. මහණෙනි, ගහරක්ඛස යන මෙය ස්ත්‍රියට නමකි'යි කියන ලදී.

**පටිසොතොති ඛො භික්ඛවෙ නෙක්ඛම්මස්සෙතං අධිවචනං** මහණෙනි, පටිසොත හෙවත් ඉහළට යන දියපහර යනු නෙක්ඛම්මයට නමකි) යන මෙහි පැවිද්ද ද උපචාරය සමග ප්‍රථමධ්‍යානය ද විදර්ශනා ප්‍රඥාවද නිවන ද නෙක්ඛම්ම නම් වේ. සියලුම කුසල ධර්ම නෙක්ඛම්ම නම් වේ. එය

**පබ්බජ්ජා පඨමං ඣානං - නිබ්බාණඤ්ච විපස්සනා**
**සබ්බෙපි කුසලා ධම්මා - නෙක්ඛම්මන්ති පවුච්චරෙ** යනුවෙන් කියන ලදී. තණ්හා සැඩපහරට පටිලෝම (පහළ සිට ඉහළට යාම්) වශයෙන් මේ පැවිද්ද ආදියේ පටිසෝතයට සමාන බව දතයුතුය. අවිශේෂයෙන් ධර්ම විනයම නෙක්ඛම්මය යි. ඒ නෙක්ඛම්මය පිළිබඳ අධිෂ්ඨානයත් පැවිද්දත් ධර්මවිනයත් තෘෂ්ණා සැඩපහරට විරුද්ධ සැඩපහර යයි කියනු ලැබේ. ඒ කාරණය

**පටිසොතගාමිං නිපුණං ගම්භීරං දුද්දසං අණුං**
**රාගරත්තා න දක්ඛින්ති තමොක්ඛන්ධෙන ආවුතා**

උඩුගං (චතුරාර්ය සත්‍යය) කරා යන්නා වූ නිපුණ (මෘදු) වූ ගැඹුරු වූ දුකසේ දැක්ක යුතු වූ සියුම් වූ චතුරාර්ය සත්‍ය ධර්මය රාගයෙන් රත් වූ අවිද්‍යා ස්කන්ධයෙන් වැසුනා වූ සත්ත්වයෝ නොදක්නාහුය'යි කියන ලදී.

**විරියාරම්භස්ස** යනු සතර වැදෑරුම් සම්‍යක් ප්‍රධාන වීර්යයට, අත්පාවලින් අංග හතරකින් යුත් ගංගා සැඩපහර තරණය කරන වීර්යයට, ඒ කාම ඕඝ ආදී ප්‍රභේද ඇති තණ්හා සැඩපහර තරණය කිරීමේ සමාන බව ප්‍රකටමය. එසේ සැඩපහර ඇති ගංතෙර සිටි ඇස් ඇති පුරුෂයාට කාමාදී සතර වැදෑරුම් ඕඝය (සැඩපහර) තරණය කොට කාම ඕඝාදි නදියේ පරතෙර වූ නිවන් ගොඩබිමෙහි සිටි ඇස් පහකින් ඇස් ඇති භාග්‍යවතුන් වහන්සේ සමාන බව ප්‍රකටමය. එහෙයින් 'චක්ඛුමා පුරිසො -පෙ- සම්බුද්ධස්ස'යි කියන ලදී.

මේ එහි උපමා ගැලපීමයි.

නොකැඩී පැවතීම් වශයෙන් (අනුප්පබන්ධවසෙන) පවත්නා වූ තණ්හා සැඩපහර (සෝතය) ගඟ සැඩපහර (නදීසොත) වැනිය. මුලක් නැති සසර සැරිසැරීම් වශයෙන් තණ්හා සැඩපහරින් පහළට ගෙනයන සත්ත්වයා ගඟ සැඩපහරින් පහළට ගෙනයන පුරුෂයා වැනිය. මොහුගේ ඇස ආදියෙහි ඇලීම එහි ප්‍රිය ස්වභාව මධුර ස්වභාව වස්තුවෙහි ඔහුගේ ඇලීම මෙනි. ක්‍රෝධ-උපායාස පස්කම්ගුණ ස්ත්‍රීන්ගෙන් ගැවසුන පංච ඕරම්භාගිය සමූහය, රළ සහිත, සුළි සහිත, ග්‍රාහරාක්ෂසයන් සහිත පහළ ඇති විල වැනිය. සියලු සසර දොස් ද දතයුතු සියලු ධර්ම ද ඇති සැටියෙන් දැන තණ්හා සැඩපහරෙහි පරතෙර වූ නිවන්තලයෙහි සිටි සමන්තචක්ඛු වූ භාග්‍යවතුන් වහන්සේ, ඒ අර්ථය (විපත) ඇති සැටියෙන් දැන ඒ සැඩපහර ඇති ගංතෙර සිටි ඇස් ඇති පුරුෂයා වැනිය. තණ්හා සැඩපහරින් පහළට ගසාගෙන යන පුරුෂයා කෙරෙහි මහාකරුණාවෙන් තණ්හාව ආදියේ ද එහි දොස් ද භාග්‍යවතුන් වහන්සේගේ දැක්වීම, ඒ ගඟ සැඩපහරින් පහළට ගසාගෙන යන පුරුෂයා කෙරෙහි අනුකම්පාවෙන් විල ගැනත් විලේ දොස් ගැනත් ඒ පුරුෂයාගේ කීම වැනිය. භාග්‍යවතුන්

වහන්සේගේ වචනය නොපිළිගන්නා තැනැත්තා(ගේ) අපායෙහි ඉපදීමද සුගතියෙහි දුකට පත්වීම ද, ඔහුගේ වචනය නොපිළිගෙන සැඩපහරට අසුවී යන ඒ පුරුෂයාගේ ඒ විලෙහිදී මරණයට පැමිණීම, මරණය සමාන දුකට පත්වීම වැනිය.

භාග්‍යවතුන් වහන්සේගේ වචනය පිළිගෙන තණ්හාදියෙහි දොස් දැක තණ්හා සැඩපහරෙහි පටිසෝතය (උඩදිසාව) වන පැවිද්ද ආදී නෙක්ඛම්ම වශයෙන් වීර්ය ආරම්භ කිරීම ද ඇරඹූ වීර්යය ඇති ඔහුගේ ඒ වීර්ය ආරම්භ කිරීමෙන් ම තණ්හා සැඩපහර ඉක්මවීම ද නිවන්තෙරට පැමිණ අර්හත්ඵල සමාපත්ති වශයෙන් කැමති පරිදි සැපසේ විසීම ද ඔහුගේ වචනය පිළිගෙන අත් පාවලින් වෑයම් කිරීම වැනි වූයේ ද ඒ වෑයම් කිරීමෙන් පරතෙරට පත්ව සැපසේ කැමති තැනකට යාම වැනි වූයේ ද වෙයි.

ගාථාවන්හි - **සහාපි දුක්ඛෙන ජහෙය්‍ය කාමෙ** යනු ධ්‍යාන මාර්ග අවබෝධය පිණිස සමථ විදර්ශනාවන්හි යෙදෙන භික්ෂුව ඉදින් ඒවායේ පූර්වභාග ප්‍රතිපදාව දුකසේ අපහසුවෙන් සම්පූර්ණ වේද සැපසේ මාර්ගයට නොබසී ද කෙලෙසුන්ගේ බලවත් බැවින් හෝ ඉන්ද්‍රියයන්ගේ නො තියුණු බැවින් හෝ එසේ ඇතිකල්හි පූර්වභාග භාවනාවෙන් දුකින් ම කාමයන් දුරුකරන්නේය. ප්‍රථම ධ්‍යානයෙන් විෂ්කම්භනය කරමින් තෙවන (අනාගාමි) මාර්ගයෙන් සහමුලින් සිඳ දමමින් ක්ලේශකාමයන් දුරුකරන්නේය. මෙයින් දුක්ඛාපටිපදා ධ්‍යාන-මාර්ග දක්වයි.

**යොගක්ඛෙමං ආයති පත්ථයානො** යනු අනාගාමි බව, අර්හත් බව කැමතිවන්නා වූ තැනැත්තා. මේ එහි අදහසයිඃ ඉදින් දැන් දුකසේ අපහසුවෙන් ධ්‍යාන, පූර්ව මාර්ග (සෝවාන්-සකදාගාමි-අනාගාමි) ලබමි. මෙයද මෙය ද නිසා මත්තෙහි අර්හත් බව ද ලැබ, කරන ලද කටයුතු ඇත්තෙක් පහවූ සියලු දුක් ඇත්තෙක් වන්නෙමියි **සහාපි දුක්ඛෙන** දුක් සහිතව ම ධ්‍යානාදියෙන් කාමයන් දුරුකරන්නේය. නැතහොත් යම් කාමවිතර්ක බහුල පුද්ගලයෙක් කල්‍යාණමිත්‍රයකුගේ (ලැබීම්) වශයෙන් පැවිද්ද ද ශීලය පිරිසිදු කිරීමද ධ්‍යානාදීන්ගේ පූර්වභාව ප්‍රතිපත්තිය ද පිළිපදිමින් දුකසේ අපහසුවෙන් කඳුළුපිරුණු මුහුණ ඇතිව හඬමින් ඒ විතර්කය විෂ්කම්භන වශයෙන් ප්‍රහාණය කරයි. 'සහාපි දුක්ඛෙන ජහෙය්‍ය

කාමෙ' යනුවෙන් ඒ සඳහා කියන ලදී. හෙතෙම වනාහි දුකසේ වුවද කාමයන් දුරුකරමින් ධ්‍යානය නිපදවා ඒ ධ්‍යානය පාදකකොට විදර්ශනා කරන්නේ අනුක්‍රමයෙන් රහත්බවෙහි පිහිටන්නේය. එහෙයින් 'යොගක්ඛෙමං ආයති පත්‍ථයානො'යි කියන ලදී. **සම්මප්පජානො** යනු විදර්ශනාව සහිත මාර්ග ප්‍රඥාවෙන් මනාව දන්නේ.

**සුවිමුත්තචිත්තො** යනු ඒ ආර්ය මාර්ගය ලැබීමට අනතුරුව ඵල විමුක්තියෙන් මනාව මිදුණු සිත් ඇත්තේ. **විමුත්තියා ඵස්සයෙ තත්‍ථ තත්‍ථ** යනු ඒ ඒ මාර්ග-ඵල ලබන කාලයෙහි විමුක්තිය, නිවන, ස්පර්ශ කරන්නේය. පැමිණෙන්නේ ය. ලබන්නේ ය. ප්‍රත්‍යක්‍ෂ කරන්නේ ය. 'විමුත්තියා' යන මේ සාමි (ෂට්ඨී විභක්ති) වචනය උපයෝග (කර්ම විභක්ති) අර්ථයෙහි යෙදේ. විමුක්තියට (නිවනට) අරමුණ වූ 'තත්‍ථ තත්‍ථ' ඒ ඒ ඵල සමාපත්ති කාලයෙහි තමාගේ ඵලසික ස්පර්ශ කරන්නේය, පැමිණෙන්නේ ය, නිවනට ඇතුළත් වූ ඵලසමාපත්තියෙන් වාසය කරන්නේය යන අර්ථයි. **ස වෙදගු** යනු ආර්ය ශ්‍රාවක තෙම වේද සංඛ්‍යාත මාර්ග ඥානයෙන් චතුරාර්ය සත්‍යයට ගිය බැවින් අවබෝධ කළ හෙයින් වෙදගු නම් වේ. **ලොකන්තගු** යනු ස්කන්ධ ලෝකයේ කෙළවරට ගියා වූ. ඉතිරිය මනාව දතහැකිමය.

දසවන සූත්‍රය යි.

# 4.1.11

එකොළොස්වන සූත්‍රයෙහි **චරතො** යනු යන්නා වූ හෝ ඇවිදින්නා වූ හෝ භික්‍ෂුවට. **උප්පජ්ජති කාමවිතක්කො** වා යනු වස්තුකාමයන්හි පහනොවූ රාගය ඇති බැවින් එබඳු ප්‍රත්‍යය ඇතිකල්හි කාමය හා බැඳුණු විතර්කය හෝ උපදියි. වෙ ඉදින් උපදී නම්. **බ්‍යාපාද විතක්කො** වා **විහිංසා විතක්කො** වා යනු ආඝාත නිමිත්ත, ව්‍යාපාදය හා බැඳුණු විතර්කය හෝ දඬුමුගුරු ආදියෙන් අනුන් වෙහෙසීම් වශයෙන් විහිංසාව

හා බැඳුණු විතර්කය හෝ උපදියි. 'ච' යන්න සම්බන්ධ වෙයි. **අධිවාසෙති** යනු කියන ලද පරිදි ප්‍රත්‍යයට අනුව තම සිත්හි උපන් ඒ කාමවිතර්කාදිය මේ කාරණයෙන් ද මේ විතර්කය ලාමකය, මේ කාරණයෙන් ද අකුසලය, මේ කාරණයෙන් ද සාවද්‍යය, එය තමාට දුක් පිණිස ද පවතී යනාදී ක්‍රමයෙන් නුවණින් සලකා නො බැලීම් වශයෙන් ඉවසයි. තමාගේ සිතට නංවා වාසය කරයි නම්, ඉවසීමෙන් ම **නප්පජහති** : තදංගාදී ප්‍රහාණ වශයෙන් දුරු නොකරයි, එහෙයින්ම **න විනොදෙති** : තමාගේ චිත්ත සන්තානයෙන් දුරු නොකරයි. ඉවත් නොකරයි. එසේ දුරු නොකිරීම් වශයෙන් **න බ්‍යන්තීකරොති** : කෙළවර නො කරයි. කෙලෙස් තවන වීර්ය ඇතිව නිවන් කරා මෙහෙයන ලද සිත් ඇති තැනැත්තා යම්සේ ද ඔවුන්ගේ ඇතුළත ද ඉතිරි නොවෙයි. යටත් පිරිසෙයින් කැඩුණු මාත්‍රයක්ද එසේ කරයි. මොහු වනාහි එසේ නොකරයි යන අර්ථයි. එබඳු වූයේ ම **න අනභාවං ගමෙති** නැවත නොඉපදීමට නොපමුණුවයි ද 'නප්පජහති ච න විනොදෙති ච' 'දුරු නොකරයි නම්, ඉවත් නොකරයි නම්' යනාදී වශයෙන් ච ශබ්දය යොදා අර්ථය දතයුතුය. **චරං** යනු හැසිරෙන්නා වූ (භික්ෂුව). **එවං භූතො** යනු මෙසේ කාමවිතර්ක ආදී පාප විතර්කවලින් යුක්ත වූයේ. **අනාතාපී අනොත්තප්පී** යනු කෙලෙස් තවන වීර්ය නැති බැවින් අනාතාපී, පාපයට තැති ගැනීම ඇති තැවීම ඇති තැවීම ලක්‍ෂණකොට ඇති ඔත්තප්පය නැති බැවින් අනොත්තප්පී. **සතතං සමිතං** යනු හැමකල්හි, නිරතුරුව. **කුසීතො හීනවීරියො** යනු කුසල ධර්මයන්ගෙන් පිරිහී අකුසල පක්‍ෂයෙහි පිළිකුලට ගිලාබැසීම් වශයෙන් ද කුසීතකමින් යුක්තවීම් වශයෙන් ද කුසීත වූ සම්‍යක් ප්‍රධාන වීර්යය නැති හෙයින් හීන වීර්ය ඇත්තේ වීර්යයෙන් තොර වූයේ යයි **වුච්චති** කියනු ලැබේ. **ඨිතස්ස** යනු ගමන නවතා සිටින්නහුට. විශේෂ වශයෙන් නිදන ඉරියව්වෙන් යුක්ත වූවහුට කුසීත පැත්තට බර හෙයින් එයින් යුක්ත වූවහුට යම්සේ ද එසේ විතර්ක උපදියි. එය දක්වන්නට 'ජාගරස්ස' යනුවෙන් කියන ලදී.

කුසල පක්‍ෂයෙහි - **තඤ්ච භික්ඛු නාධිවාසෙති** යනු ඇරඹූ වීර්යය ඇතිව වසන්නහුට ද මුලක් නැති සසරෙහි බොහෝ කලක් භාවිත කිරීමෙන් එබඳු ප්‍රත්‍ය යෙදීමෙන් හෝ සිහිමුළාවෙන් හෝ ඉදින් කාමවිතර්කාදිය උපදී නම්, භික්ෂුව ඒ විතර්කය තමාගේ සිතට නංවා ඉදින් නො ඉවසයි නම්, ඉදින් අභ්‍යන්තරයෙහි (සිතෙහි) වාසය නොකරවයි නම් යන අර්ථයි. නො ඉවසන්නේ කුමක් කරයි ද? **පජහති**

ඉවත දමයි. කුඩයෙන් කුණු ඉවත දමන්නාක් මෙන් ද? නැත. එහෙත් එය **විනොදෙති** දුරුකරයි. ඉවත් කරයි. කෙවිටෙන් ගොනෙකු ඉවත් කරන්නාක් මෙන් ද? නැත. එහෙත් එය **බ්‍යන්තීකරොති** කෙළවර කරයි. යටත් පිරිසෙයින් කැඩුණු මාත්‍රයක්වත් ඇතුළත ඉතිරි නොවන ලෙස කෙළවර කරයි. ඒවා එසේ කරන්නේ කෙසේද?

**අනභාවං ගමෙති** නැවත නො ඉපදීමට පමුණුවයි. විෂ්කම්භන ප්‍රහාණයෙන් යම්සේ සැපසේ විෂ්කම්භනය කරන ලද්දේ වේද එසේ ඒ විතර්ක ඉවත දැමීම කරයි යනුවෙන් කියන ලද්දේ වෙයි.

**එවම්භූතො** යන ආදියෙහි මෙසේ කාම විතර්කාදීන් නො ඉවසීමෙන් සුවිසුද්ධ ආසය (සිතක්) ඇත්තේ ඒ ආසය සම්පත්තියෙන් ද ඒ නිමිතිකොට ඇති ප්‍රයෝග සම්පත්තියෙන් ද පිරිසිදු සිල් ඇත්තේ ඉඳුරන්හි රක්නා ලද දොරටු ඇත්තේ භෝජනයෙහි පමණ දන්නේ සිහි නුවණින් යුක්ත වූයේ නො නිදා සිටීමෙහි (නිදි වැරීමෙහි) යෙදුනේ තදංගාදි වශයෙන් කෙලෙස් තවන ලක්‍ෂණයෙන් යුත් වීර්යයෙන් යුක්ත බැවින් **ආතාපී**, සියලු ආකාරයෙන් පාපයට තැති ගැනීමෙන් යුක්ත බැවින් **ඕත්තප්පී**, **සතතං** දිවා රෑ. **සමිතං** නිරතුරුව සමථ විදර්ශනා භාවනාවෙහි යෙදීම් වශයෙන් සතර වැදෑරුම් සම්‍යක් ප්‍රධාන සිදුවීමෙන් **ආරද්ධවිරියො පහිතත්තො** නිවන වෙත යවන ලද සිත් ඇත්තේ යි කියන ලදැයි යන අර්ථයි. සෙස්ස කියන ලද ක්‍රමයටම ය.

ගාථාවන්හි : **ගෙහ නිස්සිතං** යන මෙහි නිවැසියන් විසින් හැර නොදැමූ බැවින් හෝ ගෘහවාසීන්ගේ ස්වභාවය බැවින් හෝ ගෘහධර්මය බැවින් හෝ වස්තුකාමය ගෙය යි කියනු ලැබේ. (ගෙයට වස්තුකාමයයි කියනු ලැබේ) නොහොත් ගෙට බැඳී ඇති බැවින් හෝ ක්ලේශ කාමයන්ට නිවාසස්ථානයක් වූ බැවින් හෝ එය මූලාධාර කොට ඇති බැවින් හෝ කාම විතර්කාදිය ගෙහනිස්සිත නම් වේ.

**කුම්මග්ගං පටිපන්නො** යනු යම්හෙයකින් ආර්ය මාර්ගයට වැරදි මාර්ගයක් වීම් වශයෙන් අභිජ්ඣාදිය ද ඒ හා බැඳී ඇති ධර්ම ද කුම්මග්ගය (වැරදි මාර්ගය) නම් වෙයි. එහෙයින් කාම විතර්කාදිය බහුල පුද්ගලයා වැරදි මාර්ගයට බැසගත්තේ නම් වෙයි. **මොහනෙය්‍යෙසු මුච්ඡිතො** යනු මෝහයට පැමිණවීමට සුදුසු රූපාදියෙහි මුළාවූයේ මත්වූයේ ගිලගෙන

සිටියේ. **සම්බොධිං** යනු ආර්යමාර්ග ඥානය. **ඵුට්ඨුං** යනු ස්පර්ශ කරන්නට, පැමිණීමට. **සො තාදිසො** මිථ්‍යා සංකල්ප ගොදුරුකොට ඇති තැනැත්තා කිසිකලෙකත් එයට නො පැමිණෙයි යන අර්ථයි.

**විතක්කං සමයිත්වාන** යනු කියන ලද ආකාර මිථ්‍යා විතර්ක ප්‍රත්‍යවේක්ෂා භාවනා බලයෙන් සංසිඳුවා. **විතක්කූපසමෙ රතො** යනු නව මහා විතර්කයන් අතිශයින් සන්සිඳුනා වූ අර්හත්වයෙහිම හෝ නිවනෙහිම හෝ අදහස් වශයෙන් ඇලුණේ මනාව ඇලුණේ. **භබ්බො සො තාදිසො** යනු කියන ලද ආකාර ඇති මනාව පිළිපදින්නා වූ ඒ පුද්ගලයා පූර්ව භාගයෙහි සමථ විදර්ශනා බලයෙන් සුදුසු පරිදි සියලු විතර්කයන් තදංගාදි වශයෙන් සන්සිඳුවා ගෙන සිටියේ විදර්ශනාවට උත්සාහවත් කරවා මාර්ග පිළිවෙළින් අර්හත් මාර්ග ඥාන සංඛ්‍යාත වූද නිර්වාණ සංඛ්‍යාත වූද අනුත්තර වූ **සම්බොධිං ඵුට්ඨුං** සම්බෝධිය ලබන්නට සුදුසු වූවෙක් සමත් වූවෙක් වෙයි.

**එකොළොස්වන සූත්‍රය යි.**

# 4.1.12

දොළොස්වන සූත්‍රයෙහි **සම්පන්න සීලා** යන මෙහි 'සම්පන්න' යන්න පරිපුණ්ණ, සමංගී, මධුර වශයෙන් තුන් ආකාරය. ඒවායින්

**සම්පන්නං සාලිකේදාරං සුවා භුඤ්ජන්ති කොසිය**
**පටිවෙදෙමි තෙ බ්‍රහ්මෙ න නෙ වාරෙතු මුස්සහෙ**

කෝසිය, සරුවට වැඩුණු ඇල්වී කෙත ගිරව් අනුභව කරති. එය වළක්වන්නට නොහැක්කෙමි. බමුණ, එය ඔබට දන්වමි.

මෙහි 'සම්පන්න' ශබ්දය පරිපූර්ණ වූ අර්ථ ඇත්තෝය.

**'ඉමිනා පාතිමොක්ඛ සංවරෙන උපෙතො හොති සමුපෙතො උපගතො සමුපගතො සම්පන්නො සමන්නාගතො'** මේ ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් යුක්ත වූයේ වෙයි. (උපෙත -පෙ- සමන්නාගත යන වචන හය සමාන අරුත් ඇත) මෙහි සම්පන්න ශබ්දය යුක්ත වූයේ (සමංගීභාව) යන අර්ථ ඇත්තේය.

**'ඉමිස්සා භන්තෙ මහාපඨවියා හෙට්ඨිමං තලං සම්පන්නං සෙය්‍යථාපි ඛුද්දමධුං අනීලකං එවමස්සාදං'** ස්වාමීනි, මේ මහපොළොවෙහි යට පෙදෙස මිහිරි රසයෙන් සමෘද්ධ වෙයි. පිලවුන් නැති මීවදයක් මෙන් රසවත් වෙයි."

මෙහි සම්පන්න ශබ්දය මිහිරි (රසවත්) යන අර්ථ ඇත්තේය.

මෙහි (මේ සූත්‍රයෙහි) පරිපූර්ණ අර්ථයෙහිත් යුක්ත බවෙහිත් සුදුසුය. එහෙයින් 'සම්පන්න සීලා' යනු පරිපූර්ණ සිල් ඇත්තන් වී සීලයෙන් යුක්ත වූවන් වී යනුවෙන් ද මෙසේ මෙහි අර්ථය දතයුතුය.

එහි 'පරිපුණ්ණසීලා' යන මේ අර්ථයෙන් කෙතෙහි දොස් පහවීමෙන් කෙත සම්පූර්ණ වූවාක් මෙන් සම්පූර්ණ වූයේ නම් වෙයි. එහෙයින් කෙතෙහි දොස් පහවීමෙන් කෙත සම්පූර්ණ වූවාක් මෙන් සීලයෙහි දොස් පහවීමෙන් ශීලය සම්පූර්ණ වූයේය යි කියන ලදී යනුවෙන් කියන ලදී. සීලසමංගිනො යන මේ අර්ථයෙන් සීලයෙන් යුක්ත වූවන් වී එක්වූවන් වී වාසයකරව් යනුවෙන් කියන ලද්දේ වෙයි. එහි ශීල විපත්තියෙහි දොස් දැකීමෙන් ද ශීල සම්පත්තියෙහි අනුසස් දැකීමෙන් ද යන කරුණු දෙකින් ශීලයෙන් යුක්ත බව වෙයි. ඒ දෙකම විසුද්ධිමග්ගයෙහි කියන ලද අයුරින් දතයුතුය. එහි 'සම්පන්නසීලා' යන මෙපමණකින් භාග්‍යවතුන් වහන්සේ චතුපාරිශුද්ධි ශීලය වදාරා 'පාතිමොක්ඛ සංවර සංවුතා' යන මෙයින් වැඩිහිටි ශීලය (ජෙට්ඨක සීල) දැක්වූහ යනාදියෙන් මෙහි කිවයුතු දෙය මුලින් කියන ලද්දේමය.

**කිමස්ස උත්තරිං කරණීයං** යනු මෙසේ සීලයෙන් යුක්තව වාසය කරන ඔබ විසින් මත්තෙහි කුමක් කළ යුතුද? පිළිපැදිය යුතුද? යන අර්ථයි. මෙසේ 'සම්පන්නසීලා භික්ඛවෙ විහරථ' යනාදියෙන් සම්පාදන (සපයන) උපාය සමග සීල සම්පදාවෙහි භික්ෂූන් යොදවමින් නොයෙක් පුද්ගලයන් මුල්කොට දේශනාව අරඹා දැන් යම්හෙයකින් එක් පුද්ගලයකු

මුල්කර ගැනීම් වශයෙන් පැවතුන ද භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සියල්ලන්ට සාධාරණ බැවින් නොයෙක් පුද්ගලයන් මුල්කොට ම වෙයි. එහෙයින් එය එක් පුද්ගලයකු මුල්කර ගැනීම් වශයෙන් දක්වමින් 'චරතො චෙපි භික්ඛවෙ භික්ඛුනො' (මහණෙනි, හැසිරෙන්නා වූ ද භික්ෂුවගේ) යනාදිය වදාළහ.

එහි මෙය කරණකොට දැඩිසේ ආශා කරයි යන අරුතින් **අභිජ්ඣා** නම් වෙයි. අනුන්ගේ භාණ්ඩවලට දැඩිසේ ආශා කරන ලක්ෂණය ඇති ලෝභයට මෙය වචනයකි. මෙය කරණකොට සිත කෝපයට පත්වෙයි. කුණුවෙයි යන අරුතින් **බ්‍යාපාද** නම් වෙයි. 'මට අනර්ථය පිණිස හැසිරුණේය' ආදී ක්‍රමයෙන් පැවති දහනවයක් වූ ආඝාත වස්තුවලට විෂය වූ ද්වේෂයට මෙය වචනයකි.

එහි කාමච්ඡන්දය යනු කුමක්ද? කාමයන් පිළිබඳ කාමයට යම් කැමැත්තක් වේද (කාමච්ඡන්ද) කාමයට සෙනෙහසක් වේද (කාමසිනෙහො) කාමයට පිපාසයක් වේද (කාම පිපාසා) කාමයන් ගැන දැවිල්ලක් වේද (කාම පරිළාහො) කාමයෙන් සිහි නැති වේද (කාමමුච්ඡා) කාමය ගිලගැන්මක් වේද (කාමජ්ඣොසාන) යනුවෙන් ද එසේම ලෝභයක් ලෝභ ආකාරයක්, ලෝභ බවක්, ඇලීමක්, ඇලෙන ආකාරයක්, ඇලුණු බවක්, අභිධ්‍යාවක්, ලෝභ නම් වූ අකුසල මූලයක් යනාදී වශයෙන් ද, 'ද්වේෂයක්, ද්වේෂ ආකාරයක්, ද්වේෂ බවක්, ප්‍රකෘතිය (සාමාන්‍ය ස්වභාවය) හැරදැමීමක්, ප්‍රකෘතිය හැරදමන ආකාරයක්, ප්‍රකෘතිය හැරදමන බවක්, විරෝධයක්, ප්‍රතිවිරෝධයක්, චණ්ඩ බවක්, අසම්පූර්ණ වචන ඇති බවක් සිතේ නොසතුටු බවක්' ආදී වශයෙන් ද මේ දෙක ගැන ම විස්තර දතයුතුය. **විගතො හොති** යනු මේ අභිධ්‍යාව ද මේ ව්‍යාපාදය ද ඉවත් වූයේ වෙයි. පහවූයේය යන අර්ථයි. මෙපමණකින් කාමච්ඡන්ද නීවරණයේ ද ව්‍යාපාද නීවරණයේද පහවීම දක්වන ලද්දේ වෙයි.

**ථීනමිද්ධං** යනු ථීනය ද මිද්ධය ද වෙයි. ඒ අතරින් සිතේ වැඩට නුසුදුසු බව **ථීන** යයි අලසබවට මෙය වචනයකි. වේදනාදී ස්කන්ධ තුනේ (වේදනා-සංඥා-සංඛාර) වැඩට නුසුදුසු බව **මිද්ධය** යි. නිදාවැටෙන බවට මේ වචනයකි. 'එහි ථීනය යනු කුමක්ද? සිතේ යම් අදක්ෂ බවක්, වැඩට නුසුදුසු බවක්, පසුබැසීමක්, සැඟවුණු බවක් වේද, 'එහි මිද්ධය යනු

කුමක් ද? (චෛතසික නම් වූ) කයේ යම් අදක්‍ෂ බවක් වැඩට නුසුදුසු බවක්, වෙළීමක්, හාත්පසින් වසාතැබීමක් වේද ආදී ක්‍රමයෙන් මේ දෙක ගැන ම විස්තර දතයුතුය.

**උද්ධච්ච කුක්කුච්චං** යනු උද්ධච්චය ද කුක්කුච්චය ද වෙයි. එහි උද්ධච්චය නම් සිතේ නොසන්සුන් ආකාරය යි. කුක්කුච්චය නම් නොකළ යහපත ගැන කළ පාපය ගැන ඒ හේතුවෙන් විපිළිසර වීම. 'එහි උද්ධච්චය යනු කුමක්ද? සිතේ යම් උඩඟු බවක්, නොසන්සිඳුණු බවක් සිතේ විසිරුණු බවක් සිතේ භ්‍රාන්ත (කම්පා වූ) බවක් යනාදී වශයෙන් විස්තරය ද 'ඒකාන්තයෙන් මා විසින් යහපතක් නොකරන ලදී. කුසලයක් නොකරන ලදී. බිය දුරුකිරීමක් නොකරන ලදී. පාපයක් කරන ලදී. නපුරක් කරන ලදී. දරුණු ක්‍රියාවක් කරන ලදී' ආදී වශයෙන් මේ දෙක ගැනම පැවති ආකාරය දතයුතුය.

**විචිකිච්ඡා** යනු බුද්ධාදීන් කෙරෙහි සැකයයි. ශාස්තෲන් වහන්සේ කෙරෙහි සැක කරයි, විචිකිච්ඡා කරයි, ස්ථිර ලෙස සිතා නොගනී, නො පැහැදේ යනාදී වශයෙන් ද 'එහි විචිකිච්ඡාව යනු කුමක්ද? යම් සැකයක්, සැකයට පැමිණීමක්, සැකයට පැමිණි බවක්, විමතියක්, විචිකිච්ඡාවක්, ද්වේළ්හකයක් (සැකයක්) ද්වේධාපථයක් (සැකයක්) සංශයක්, එක් අංශයක් නොගැනීමක්, පසුබැසීමක්, හාත්පසින් පසුබැසීමක්, බැස නොගැනීමක්, සිතේ තැති ගැන්මක්, මනෝ විලේඛයක් (හිතේ සීරීමක්-සැකයක්) යනාදී ක්‍රමයෙන් ද ඒ ගැන විස්තර දතයුතුය.

මෙහි ද අභිජ්ඣා, ව්‍යාපාද ආදිය ඉවත්වීම් වශයෙන් ද පහවීම් වශයෙන් ද ඒවායේ විෂ්කම්භනයම (යටපත් කිරීම) අදහස් කරන ලදී. 'හෙතෙම (පංච උපාදානස්කන්ධ නමැති) ලෝකයෙහි අභිජ්ඣාව පහකොට ඉවත් වූ අභිධ්‍යාව ඇති සිතින් වාසය කරයි. අභිධ්‍යාවෙන් සිත මුදවයි. ව්‍යාපාද නම් වූ ක්‍රෝධය පහකොට ව්‍යාපාදය නැති සිතින් වාසය කරයි. ව්‍යාපාද නම් වූ ක්‍රෝධයෙන් සිත මුදවයි. ථීනමිද්ධය පහකොට ඉවත්වූ ථීනමිද්ධය ඇතිව ආලෝක සංඥා ඇතිව, සිහි ඇතිව නුවණැතිව වාසය කරයි. ථීනමිද්ධයෙන් සිත මුදවයි. උද්ධච්ච කුක්කුච්චය පහකොට උද්ධත නොවී (අනුද්ධතව) තම චිත්ත සන්තානය සන්සුන් සිත් ඇතිව වාසය කරයි. උද්ධච්ච කුක්කුච්චයෙන් සිත මුදවයි. විචිකිච්ඡාව පහකොට

ඉවත් වූ විචිකිච්ඡාව ඇතිව කුශල ධර්මයන්හි සැක නැත්තෙක්ව වාසය කරයි. විචිකිච්ඡාවෙන් සිත මුදවයි' යන මෙය ඒ සඳහා කියන ලදී.

එහි නීවරණයන්ගේ පහවීම සිදුවන අයුරු දතයුතුය. ඒවායේ පහවීම කෙසේ වේද? අශුභ නිමිත්ත ගැන නුවණින් මෙනෙහි කිරීමෙන් කාමච්ඡන්දයේ පහවීම වෙයි. ශුභ නිමිත්ත ගැන අනුවණින් මෙනෙහි කිරීමෙන් එහි ඉපදීම වෙයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි, ශුභ නිමිත්තක් ඇත. එහි නූපන්නා වූ කාමච්ඡන්දය ඉපදීම පිණිසත් උපන්නා වූ කාමච්ඡන්දය වැඩිවීම පිණිස විපුලබවට පත්වීම පිණිසත් මේ අයෝනිසෝ මනසිකාරය බහුල වශයෙන් කිරීම හේතුවය'යි වදාළහ. මෙසේ ශුභ නිමිත්ත පිළිබඳ අනුවණින් මෙනෙහි කිරීමෙන් උපදින කාමච්ඡන්දයට ප්‍රතිවිරුද්ධ වශයෙන් අශුභ නිමිත්ත පිළිබඳ නුවණින් මෙනෙහි කිරීමෙන් කාමච්ඡන්දයේ පහවීම වෙයි. එහි 'අශුභ නිමිත්ත' නම් අශුභයත් අශුභ අරමුණත් ය. 'යෝනිසෝ මනසිකාරය' නම් උපායට අනුව මෙනෙහි කිරීමත් (උපාය මනසිකාරය) නියම මාර්ගයට අනුව මෙනෙහි කිරීමත් (පථ මනසිකාරය) ය, අනිත්‍යයෙහි අනිත්‍යයයි ද දුකෙහි දුකයයි ද අනාත්මයෙහි අනාත්මයයි ද අශුභයෙහි අශුභ යයි ද මෙනෙහි කිරීම. එහි එය බහුල ලෙස පැවැත්වීම් වශයෙන් කාමච්ඡන්දය පහවෙයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි, අශුභ නිමිත්තක් ඇත. නූපන් කාමච්ඡන්දය නූපදීම පිණිසත් උපන් කාමච්ඡන්දය පහවීම පිණිසත් මේ යෝනිසෝ මනසිකාරය බහුල වශයෙන් කිරීම හේතුවය'යි වදාළහ.

තවදුරටත් : ධර්ම හයක් කාමච්ඡන්දය පහවීම පිණිස පවතී.

1. අශුභ නිමිත්ත ඉගෙනීම.
2. අශුභ භාවනාවෙහි යෙදීම.
3. ඉඳුරන්හි රකින ලද දොරටු ඇති බව.
4. භෝජනයෙහි පමණ දන්නා බව.
5. කල්‍යාණ මිතුරන් ඇති බව.
6. සුදුසු කථා ය.

(උද්ධුමාතක ආදී වශයෙන්) දශවිධ අශුභ නිමිත්ත ඉගෙන ගන්නා තැනැත්තාගේ ද කාමච්ඡන්දය පහවෙයි. (එය) වඩන තැනැත්තාගේ කාමච්ඡන්දය ද පහවෙයි. ඉඳුරන්හි වසන ලද දොරටු ඇති තැනැත්තාගේද

බත්පිඬු හතරක් පහක් වැළඳීමට ඉඩ ඇති කල්හි පැන් බී යැපෙන ගතිය ඇති භෝජනයෙහි පමණ දන්නා තැනැත්තාගේ ද කාමච්ඡන්දය පහවෙයි.

එහෙයින්

**චත්තාරො පඤ්ච ආලොපෙ අභුත්වා උදකං පිවෙ**
**අලං ඵාසු විහාරාය පහිතත්තස්ස භික්ඛුනො'** යි කියන ලදී.

බත් පිඬු හතරක් පහක් නො වළඳ පැන් බොන්නේය. කෙලෙස් තවන වීර්යයෙන් යුක්ත භික්ෂුවට එය පහසුවෙන් වාසය කිරීම පිණිස ප්‍රමාණවත් වෙයි.

**අසුභකම්මික තිස්ස** තෙරුන් සමාන කලණ මිතුරන් ඇසුරු කරන්නාගේ ද කාමච්ඡන්දය පහවෙයි. සිටීම-හිඳීම ආදියෙහිදී දස අශුභය ඇසුරුකොට ඇති සුදුසු කථාවෙන් ද කාමච්ඡන්දය පහවෙයි. එහෙයින් ධර්ම (කරුණු) හයක් කාමච්ඡන්දය පහවීම පිණිස පවතී'යයි කියන ලදී.

පටිඝ නිමිත්ත පිළිබඳව අනුවණින් මෙනෙහි කිරීමෙන් ව්‍යාපාදයේ ඉපදීම වෙයි. එහි පටිඝය (තරහ) ද පටිඝ නිමිත්තකි. පටිඝ අරමුණ ද පටිඝ නිමිත්තකි. අයෝනිසෝ මනසිකාරය හැමතැනම එකම ලක්‍ෂණයෙන් යුක්තය. එය (අයෝනිසෝ මනසිකාරය) ඒ (පටිඝ) නිමිත්ත පිළිබඳව බහුලව පැවතීම් වශයෙන් ව්‍යාපාදය උපදියි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි, පටිඝ නිමිත්තක් ඇත. නූපන් ව්‍යාපාදය ඉපදීම පිණිස උපන් ව්‍යාපාදය වැඩිවීම පිණිස විපුල බවට පත්වීම පිණිස මේ අයෝනිසෝ මනසිකාරය බහුල වශයෙන් කිරීම හේතුවය'යි වදාළහ. මෛත්‍රී චේතෝ විමුත්තිය පිළිබඳ නුවණින් මෙනෙහි කිරීමෙන් පටිඝයේ පහවීම වෙයි. එහි 'මෙත්තා' යනුවෙන් කී කල්හි අර්පණාව ද උපචාරය ද (ගැනීම) සුදුසුය. චේතෝ විමුත්තිය වනාහි අර්පණාවමය. යෝනිසෝ මනසිකාරය කියන ලක්‍ෂණයම ඇත්තේය. එහි එය (යෝනිසෝ මනසිකාරය) බහුල ලෙස පැවැත්වීම් වශයෙන් ව්‍යාපාදය පහවෙයි. එහෙයින් 'මහණෙනි, චේතෝ විමුක්තියක් ඇත. නූපන් ව්‍යාපාදය නූපදීම පිණිසත් උපන් ව්‍යාපාදය පහවීම පිණිසත් මේ යෝනිසෝ මනසිකාරය බහුල වශයෙන් කිරීම හේතුවය'යි වදාළහ.

තවදුරටත් : ධර්ම (කරුණු) හයක් ව්‍යාපාදය පහවීම පිණිස පවතී.

1. මෛත්‍රී නිමිත්ත ඉගෙනීම.
2. මෛත්‍රී භාවනාව.
3. කර්මය තමා අයත් දෙයක් කොට ඇති බව සිහිකිරීම.
4. නුවණින් සලකා බැලීම බහුල බව.
5. කල්‍යාණමිත්‍රයන් ඇති බව.
6. සුදුසු කථා යි.

ඔදිස්සක (සියලු ස්ත්‍රීහු ආදී වශයෙන් සීමාවක් ඇතිව) අනෝදිස්සක (සියලු සත්ත්වයෝ ආදී වශයෙන් සීමාවක් නැතිව) දිසාඵරණ (නැගෙනහිර ආදී දිසාවන්ට මෙත් පැතිරවීම) යන මේ ක්‍රම අතුරින් එක්තරා එකකින් මෛත්‍රිය ඉගෙන ගන්නා තැනැත්තාගේ ද ව්‍යාපාදය පහවෙයි. ඔධිසෝ - අනෝධිසෝ - දිසාඵරණ වශයෙන් මෛත්‍රිය වඩන්නාගේ ද ව්‍යාපාදය පහවෙයි. 'ඔබ ඔහුට කිපී කුමක් කරන්නෙහිද? ඔබ ඔහුගේ ශීලාදිය විනාශ කරන්නට හැකිවෙහි ද? ඔබ තමාගේ කර්මයෙන් අවුත් තමාගේ කර්මයෙන් ම යන කෙනෙක් නොවෙහිද? අනුන්ට කිපීම නම් ගිනිදැල් නැති අඟුරු, රත්වූ යකඩ කුරු, අශුචි ආදිය ගෙන අනුන්ට පහර ගැසීමට ඇති කැමැත්ත මෙන් වෙයි. ඔහු ද ඔබට කිපී කුමක් කරන්නේ ද? ඔහු ඔබගේ සීලාදිය විනාශ කරන්නට හැකිවන්නේ ද? ඔහු තමාගේ කර්මයෙන් අවුත් තමාගේ කර්මයෙන් ම යන්නේය. නොපිළිගත් ත්‍යාගයක් මෙන් පටිවාතයට (තමා දෙසට හමන වාතයට) දමාගසන ලද දූවිලි මිටක් මෙන් ඒ ක්‍රෝධය ඔහුගේම හිසමත වැටෙන්නේය'යි මෙසේ තමාගේ ද අනුන්ගේ ද යන දෙදෙනාගේ කර්මය තමා අයත්කොට ඇති බව නුවණින් සිහිකරන තැනැත්තාගේ ද නුවණින් සිහිකොට නුවණින් සිහිකිරීමෙහි නැවතී සිටිය තැනැත්තාගේ ද **අස්සගුත්ත** තෙරුන් වහන්සේ වැනි මෛත්‍රී භාවනාවෙහි ඇලුණු කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කරන්නාගේ ද ව්‍යාපාදය පහවෙයි. සිටීම, හිඳීම ආදී ඉරියව්වලදී මෛත්‍රිය ඇසුරුකොට ඇති සුදුසු කථාවෙන් ද (ව්‍යාපාදය) දුරුවෙයි. එහෙයින් 'කරුණු හයක් ව්‍යාපාදය දුරුවීම පිණිස පවතී' යනුවෙන් කියන ලදී.

අරති ආදියෙහි අයෝනිසෝ මනසිකාරයෙන් ථිනමිද්ධයේ ඉපදීම වෙයි. 'අරති' නම් කලකිරුණු බවයි.

'තන්දි' නම් කයේ අලස බවයි.

'විජම්භිකා' නම් ඈනුම් ඇරීම ඇඟ මැලි කැඩීම යි.

'භත්තසම්මදො' නම් බත් මතයයි, ආහාර ගැනීම නිසා ඇතිවන දාහයයි.

'චෙතසො ලීනත්තං' නම් සිතේ හැකිලුණු ආකාරයයි.

මේවා කෙරෙහි අයෝනිසෝ මනසිකාරය බහුල ලෙස පැවැත්වීම් වශයෙන් ථීනමිද්ධය උපදී. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි, අරතියක්, තන්දියක්, විජම්භිකාවක්, භත්ත සම්මදයක්, චේතසෝ ලීනත්තයක් ඇත. නූපන් ථීනමිද්ධයේ ඉපදීම පිණිසත් උපන් ථීනමිද්ධයේ වැඩිවීම පිණිසත් විපුලබවට පත්වීම පිණිසත් මේ අයෝනිසෝ මනසිකාරය බහුල වශයෙන් කිරීම හේතුව'යි වදාළහ.

ආරම්භධාතු ආදියෙහි යෝනිසෝ මනසිකාරයෙන් ථීනමිද්ධයේ පහවීම වෙයි.

'ආරම්භ ධාතු' නම් පළමුව පටන්ගන්නා ලද වීර්යයයි.

'නික්කමධාතු' නම් කුසීත බවෙන් නික්මීම් වශයෙන් ආරම්භ ධාතුවට වඩා බලවත් වූ වීර්යය යි.

'පරක්කම ධාතු' නම් මතු මතු තැනක (ඇතිවන ථීනමිද්ධය) මැඩ පැවැත්වීම් වශයෙන් නික්කම ධාතුවටත් වඩා බලවත් වූ වීර්යය යි.

මේ තුන් ආකාර වීර්යයෙහි යෝනිසෝ මනසිකාරය බහුල ලෙස පැවැත්වීම් වශයෙන් ථීනමිද්ධය පහවෙයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි, ආරම්භ ධාතුවක්, නික්කම ධාතුවක්, පරක්කම ධාතුවක් ඇත. නූපන් ථීනමිද්ධය නූපදීම පිණිසත්, උපන් ථීනමිද්ධය පහවීම පිණිසත් යෝනිසෝ මනසිකාරය බහුල වශයෙන් කිරීම හේතුවය'යි වදාළහ.

තවදුරටත් කරුණු හයක් ථීනමිද්ධය පහවීම පිණිස පවතී.

1. වැඩිපුර අනුභව කිරීමෙහි නිමිති ගැනීම.
2. ඉරියව් මාරුකරන බව.
3. ආලෝක සංඥාව මෙනෙහි කිරීම.

4. එළිමහනෙහි වාසය කිරීම.
5. කල්‍යාණ මිත්‍රයන් ඇති බව.
6. සුදුසු කථා යි.

ආහාර හත්‍ථක, අලංසාටක, තත්‍ථවට්ටක, කාකමාසක, භුත්තවමිතක යන (ආකාරයෙන් බමුණන් මෙන්) භෝජනය අනුභව කොට රාත්‍රී ස්ථානයක, දිවා ස්ථානයක වාඩි වී පැවිදි දහම ක්‍රියාත්මක කරන තැනැත්තාට මහ ඇතෙක් හාත්පසින් මැඩගෙන එන්නාක් මෙන් ථීනමිද්ධය පැමිණෙයි. බත්පිඬු හතරකට පහකට ඉඩ තබා පැන් බී යැපෙන භික්‍ෂුවට එය සිදු නොවේ. මෙසේ :

1. අතිභෝජනයෙහි (වැඩිපුර අනුභව කිරීමෙහි) නිමිති ගන්නා තැනැත්තාගේ ද ථීනමිද්ධය පහවෙයි.
2. යම් ඉරියව්වකදී ථීනමිද්ධය ඇතුල් වේනම් ඒ ඉරියව්වෙන් වෙනත් ඉරියව්වකට මාරුවෙන තැනැත්තාගේ ද
3. රාත්‍රියට සඳඑළිය, පහන්එළිය, පන්දම් එළිය දවාලට හිරුඑළිය මෙනෙහි කරන්නාගේ ද,
4. එළිමහනෙහි වාසය කරන තැනැත්තාගේ ද,
5. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ සමාන ථීනමිද්ධය පහවූ කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කරන්නාගේ ද ථීනමිද්ධය පහවෙයි.
6. සිටීම, හිඳීම ආදී ඉරියව්වලදී ධුතංග ඇසුරුකොට ඇති සුදුසු කථාවෙන් ද පහවෙයි.

එහෙයින් 'කරුණු හයක් ථීනමිද්ධය පහවීම පිණිස පවතී' යයි කියන ලදී.

සිත නො සන්සිඳීමෙහි අයෝනිසෝ මනසිකාරයෙන් උද්ධච්ච කුක්කුච්චයේ ඉපදීම වෙයි. 'අවූපසම' නම් නො සන්සිඳුණු ආකාරයයි. අර්ථ වශයෙන් ඒ උද්ධච්ච කුක්කුච්චයම ය. එහි අයෝනිසෝ මනසිකාරය බහුල ලෙස පැවැත්වීම් වශයෙන් උද්ධච්ච කුක්කුච්චය උපදී. එහෙයින් 'මහණෙනි, සිත නොසන්සිඳීමක් ඇත. නූපන් උද්ධච්ච කුක්කුච්චයේ ඉපදීම පිණිසත් උපන් උද්ධච්ච කුක්කුච්චයේ වැඩිවීම පිණිසත් විපුලබවට පත්වීම පිණිසත් මේ අයෝනිසෝ මනසිකාරය බහුල වශයෙන් කිරීම

හේතුව යයි වදාළහ. සමාධිය නම් වූ සිත සන්සිඳීමෙහි යෝනිසෝ මනසිකාරයෙන් උද්ධච්ච කුක්කුච්චයේ පහවීම වෙයි. එහෙයින් 'මහණෙනි, සිත සන්සිඳීමක් ඇත. නූපන් උද්ධච්ච කුක්කුච්චයේ නූපදීම පිණිසත් උපන් උද්ධච්ච කුක්කුච්චයේ පහවීම පිණිසත් එහි මේ යෝනිසෝ මනසිකාරය බහුල වශයෙන් කිරීම හේතුවය'යි වදාළහ.

තවදුරටත් : කරුණු හයක් උද්ධච්ච කුක්කුච්චය පහවීම පිණිස පවතී.

1. බහුශ්‍රැත බව.
2. විමසන බව.
3. විනයෙහි ස්වභාවය දන්නා බව.
4. වැඩිහිටියන් ඇසුරු කරන බව.
5. කල්‍යාණ මිත්‍රයන් ඇති බව.
6. සුදුසු කථාය.

1. නිකාය එකක් හෝ දෙකක් හෝ තුනක් හෝ හතරක් හෝ පහම හෝ පාළි වශයෙන් ද අර්ථ වශයෙන් ද ඉගෙන ගන්නා තැනැත්තාගේ බහුශ්‍රැත භාවයෙන් උද්ධච්ච කුක්කුච්චය පහවෙයි.

2. කැප අකැප මොනවාදැයි බොහෝ සෙයින් විමසා බලන තැනැත්තාගේ ද

3. විනය ප්‍රඥප්ති පුරුදු කිරීමෙන් අතිදක්ෂ වූ විනයෙහි ස්වභාවය දන්නා තැනැත්තාගේ ද

4. වැඩිහිටි මහලු තෙරුන් වෙත එළඹෙන තැනැත්තාගේ ද

5. **උපාලි තෙරුන් වහන්සේ** සමාන විනයධර කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කරන්නාගේ ද උද්ධච්ච කුක්කුච්චය පහවෙයි.

6. සිටීම් - හිඳීම් ආදියෙහි කැප අකැප දේ ඇසුරුකොට ඇති සුදුසු කථාවෙන් ද පහවෙයි.

එහෙයින් 'කරුණු' හයක් උද්ධච්ච කුක්කුච්චය පහවීම පිණිස පවතී යයි කියන ලදී.

විචිකිච්ඡාවට ස්ථාන වූ කරුණුවල අයෝනිසෝ මනසිකාරයෙන් විචිකිච්ඡාවේ ඉපදීම වෙයි. විචිකිච්ඡාවට ස්ථාන වූ කරුණු නම් නැවත නැවත විචිකිච්ඡාවට කරුණු වූ බැවින් විචිකිච්ඡාවම ය. එහි අයෝනිසෝ මනසිකාරය බහුල ලෙස පැවැත්වීම් වශයෙන් විචිකිච්ඡාව උපදී. එහෙයින් 'මහණෙනි, විචිකිච්ඡාවට ස්ථාන වූ කරුණු ඇත. නූපන් විචිකිච්ඡාව ඉපදීම පිණිසත් උපන් විචිකිච්ඡාව වැඩිවීම පිණිසත් විපුල බවට පත්වීම පිණිසත් මේ අයෝනිසෝ මනසිකාරය බහුල වශයෙන් කිරීම හේතුව'යයි වදාළහ. කුසලාදි ධර්මවල යෝනිසෝ මනසිකාරයෙන් විචිකිච්ඡාවේ පහවීම වෙයි. එහෙයින් 'මහණෙනි, කුසල අකුසල ධර්මයන් ඇත, වැරදි නිවැරදි ධර්ම ඇත. ඇසුරු කළයුතු නොකළයුතු ධර්ම ඇත, හීන ප්‍රණීත ධර්ම ඇත, කලු (අකුසල) ධර්මවලට ප්‍රතිවිරුද්ධ සුදු (කුසල) ධර්ම ද සුදු (කුසල) ධර්මවලට ප්‍රතිවිරුද්ධ කලු (අකුසල) ධර්ම ද (කණ්හ සුක්ක සප්පටිභාගා ධම්මා) ඇත. නූපන් විචිකිච්ඡාව නූපදීම පිණිසත් උපන් විචිකිච්ඡාව පහවීම පිණිසත් මේ යෝනිසෝ මනසිකාරය හේතුව යයි වදාළහ.

තවදුරටත් - විචිකිච්ඡාව පහවීම පිණිස කරුණු හයක් පවතී.

1. බහුශ්‍රැත බව.
2. විමසන බව.
3. විනයෙහි ස්වභාවය දන්නා බව.
4. ශ්‍රද්ධාව (අධිමොක්ඛ) බහුල බව.
5. කල්‍යාණ මිත්‍රයන් ඇති බව.
6. සුදුසු කථාය.

1. නිකාය එකක් හෝ (දෙකක් හෝ තුනක් හෝ හතරක් හෝ) පහම හෝ ඉගෙන ගන්නා තැනැත්තාගේ බහුශ්‍රැත භාවයෙන් විචිකිච්ඡාව පහවෙයි.

2. තුණුරුවන් නිමිතිකොට කුසලාදී භේද ඇති ධර්ම පිළිබඳව විමසීම බහුල තැනැත්තාගේ ද,

3. විනය ප්‍රඥප්ති පුරුදු කිරීමෙන් අතිදක්ෂ වූ තැනැත්තාගේ ද

4. තුණුරුවන් කෙරෙහි ඔකප්පනීය සද්ධාව නම් වූ ඇදහීම බහුල තැනැත්තාගේ ද

5. ශ්‍රද්ධාවෙහි ඇලුණු (සද්ධාධිමුත්ත) වක්කලි තෙරුන් වහන්සේ සමාන කල්‍යාණ මිත්‍රයන් සේවනය කරන තැනැත්තාගේ ද විචිකිච්ඡාව පහවෙයි.

6. සිටීම-හිඳීම ආදී ඉරියව්වල තෙරුවන් ගුණ ඇසුරුකොට ඇති සුදුසු කථාවෙන් ද පහවෙයි.

එහෙයින් 'කරුණු හයක් විචිකිච්ඡාවේ පහවීම පිණිස පවතී' යයි කියන ලදී.

මෙහි ද කියන ලද ආකාර ඇති ඒ ඒ කරුණු (ධර්ම) වලින් විෂ්කම්භන වශයෙන් ප්‍රහීණ වූ මේ නීවරණ අතුරින් පළමුකොට කාමච්ඡන්ද නීවරණය අර්හත් මාර්ගයෙන් අත්‍යන්තයෙන් (මුළුමනින්) ප්‍රහීණ වෙයි. එසේ ථීනමිද්ධ නීවරණය ද උද්ධච්ච නීවරණය ද අර්හත් මාර්ගයෙන් ප්‍රහීණ වෙයි. ව්‍යාපාද නීවරණය ද කුක්කුච්ච නීවරණය ද අනාගාමි මාර්ගයෙන් ද විචිකිච්ඡා නීවරණය සෝතාපත්ති මාර්ගයෙන් ද අත්‍යන්තයෙන් ප්‍රහීණ වෙයි. එහෙයින් ඒ නීවරණයන් එසේ පහවීම පිණිස උපකාර ධර්මයන් දැක්වීමට 'ආරද්ධං හොති විරියං' යනාදිය අරඹන ලදී. කියන ලද පරිදි අභිජ්ඣාදී නීවරණයන්ගේ පහවීම මෙය ම හෝ වෙයි. යම්හෙයකින් හීන වීර්යය ඇති බැවින් කුසීත බැවින් ද නොඑළඹි සිහිය ඇති බැවින් මුළාවූ සිහි ද නොසන්සිඳුණු කෙලෙස් දාහය ඇති බැවින් දාහයෙන් යුතු නාම කයින් ද රූපකයින් ද සමාධිගත නොවූ බැවින් විසිරුණු සිතෙන් ද ඒවා (මාර්ග) කිසිකලෙකත් උපදවන්නට නොහැකිය. අනිත්වා ගැන කවර කථාද? එහෙයින් නිසි ලෙස පිළිපන්

තැනැත්තාගේ අභිජ්ඣාදීන්ගේ ඒ ඉවත්වයාම පහවීම සිදුවෙයි. එය දක්වන්නට 'ආරද්ධං හොති විරියං' යනාදිය අරඹන ලදී.

එහි අර්ථය : ඒ නීවරණයන්ගේ ප්‍රහාණය පිණිස ද සියලුම ක්ලේශ ධර්මයන්ගේ සහමුලින් සිඳීම පිණිස ද **විරියං ආරද්ධං හොති** වීර්යය අරඹන ලද්දේ වෙයි. ඔසවාගත් දැඩි පැවැත්ම යයි කියන ලද්දේ වෙයි. අරඹන ලද වීර්යය ඇති බැවින් ම අතරත හැකිලීමකට නො පැමිණීමෙන් අසල්ලීන නම් වේ.

**උපට්ඨිතා සති අපම්මුට්ඨා** යනු තනිකර වීර්යයම නොවේ. සිහියද අරමුණට ඉදිරිපත් (අභිමුඛ) වීම් වශයෙන් එළඹියේ වෙයි. එසේ එළඹි බැවින් ම ද බොහෝ කලකට පෙර කරන ලද බොහෝ කලකට පෙර කියන ලද දේවල් පිළිබඳ සිහිකිරීමට සමත් බැවින් මුළා නොවූ.

පස්සද්ධො යනු කයෙහි ද සිතෙහි ද දාහයන් (දරථ) සන්සිඳුවීමෙන් ඔහුගේ කය ද සන්සිඳුනේ වෙයි. එහි යම්හෙයකින් නාම කය සන්සිඳුණු විට රූප කය ද සන්සිඳුනේ ම වෙයි ද එහෙයින් නාම කය රූප කය යයි විශේෂයක් නොකොට 'පස්සද්ධො කායො' යනුවෙන් කියන ලදී.

අසාරද්ධො යනු ඒ නාම-රූප කාය සන්සිඳුණු බැවින් ම අසාරද්ධ වූයේ, පහ වූ කෙලෙස් දරථ ඇත්තේ යයි කියන ලදී.

**සමාහිතං චිත්තං එකග්ගං** යනු ඔහුගේ සිත ද මනාකොට සන්සුන් වූයේ මනාව තබන ලද්දේ ඇතුළට වැදුනාක් මෙන් වෙයි. මනාව සන්සුන් වූ (සමාහිත) බැවින් ම එකඟ වන්නේ නොසෙල්වෙන්නේ නොසැලෙන්නේ කම්පා නොවන්නේ වෙයි. මෙපමණකින් ම ධ්‍යාන මාර්ගයන්ගේ පූර්වභාග ප්‍රතිපදාව කියන ලද්දේ වෙයි. එහෙයින් ම '**චරම්පි චෙ භික්ඛවෙ භික්ඛු එවං භූතො ආතාපී ඔත්තප්පී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තොති වුච්චති**' (මහණෙනි, හැසිරෙන්නා වූ ද මෙබඳු භික්ෂුව කෙලෙස් තවන වීර්යය ඇති පවට බිය ඇති නිතර සම්පූර්ණ කරන ලද වීර්යය ඇති නිවන් කරා මෙහෙයූ සිත් ඇති තැනැත්තෙකැයි කියනු ලැබේ.) යනුවෙන් දෙසන ලදී. එහි අර්ථය මුලදී කියන ලද්දේමය.

ගාථාවල **යතං චරෙ** යනු වීර්යය වඩමින් හැසිරෙන්නේ ය. සක්මන් කිරීමාදී වශයෙන් ගමන් කරමින් ද 'අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති' (නූපන් අකුශල ධර්මයන්ගේ නූපදීම පිණිස කැමැත්ත උපදවයි වෑයම් කරයි) ආදී ක්‍රමයෙන් කියන ලද සම්‍යක්ප්‍රධාන වීර්යය වශයෙන් වීර්යය වඩමින් ගැටෙමින් වෑයම් කරමින් අකුශල ධර්ම පහවන ආකාරයට කුශල ධර්ම වැඩීමට පරිපූර්ණ බවට පත්වන ආකාරයට මෙසේ ගමන් කරන්නේය යන අර්ථයි. ඉතිරි ඒවාහිද මේ ක්‍රමයයි. ඇතැමෙක් 'යතං' යනු මොහුගේ සංවරය යනුවෙන් අරුත් කියති. **තිට්ඨෙ** යනු සිටින්නේය. සිටීම කරන්නේය. **අච්ඡෙ** යනු හිඳින්නේය. **සයෙ** යනු නිදන්නේය. **යතමෙනං පසාරයෙ** යනු දිගුකළයුතු ඒ අත් පා ආදිය වීර්යය වඩමින් කියන ලද ආකාර ඇති වීර්යයෙන් යුක්ත වූවෙක්ම වී දිගහරින්නේය. හැමතැනම ප්‍රමාදය දුරුකරන්නේය යන අදහසයි. දැන් යම් සේ නිසිලෙස පිළිපදින තැනැත්තා වීර්යය වඩන්නේ නම් වේද ඒ ප්‍රතිපදාව දක්වන්නට 'උද්ධං' ආදිය කියන ලදී.

එහි **උද්ධං** යනු මත්තෙහි. **තිරියං** හරස් වශයෙන්, නැගෙනහිර දිශාව ආදි වශයෙන් හාත්පසින් ඇති දිශාභාගයන්හි යන අර්ථයි. **අපාචීනං** යනු යට. **යාවතා ජගතො ගති** යනු යම්තාක් සත්ත්ව සංස්කාර භේද ඇති ලෝකයේ පැවැත්මක් වේද ඒ හැමතන්හි යන අර්ථයි. මෙපමණකින් ඉතිරි නොවීම් වශයෙන් විමසා බලන ඤාණයේ විෂය ඇතුළත් කොට දක්වයි. **සමවෙක්ඛිතා** යනු මනාකොට හේතුවෙන් ක්‍රමයෙන් බලන්නෙක් අනිත්‍යාදි වශයෙන් විශේෂයෙන් බලන්නෙක් යයි කියන ලද්දේ වෙයි. **ධම්මානං** යනු සත්ත්ව ශුන්‍යතා ස්වභාවයන්ගේ **ඛන්ධානං** යනු රූපාදී පංචස්කන්ධයන්ගේ **උදයබ්බයං** යනු ඇතිවීම හා නැතිවීම. මෙය කියන ලද්දේ වෙයිඃ ඉහළ - හරහ - යට යන තුන් එකතුවෙහි මුලු ලෝකයෙහි අතීතාදී භේදභින්න වූ පංච උපාදාන සංඛ්‍යාත සියලු රූප අරූප ධර්මයන්ගේ අනිත්‍යාදිය විමසා බැලීමෙන් ලබන ලද උදයබ්බය ඤාණයෙන් ඇතිවීම විසිපස් ආකාරයකින් ද නැතිවීම විසිපස් ආකාරයකින් ද මනාව බලන්නෙක් වන්නේය.

**චෙතො සමථසාමීචිං** යනු සිතේ කෙලෙසුන් මුළුමනින් සන්සිඳුවීම් වශයෙන් චෙතෝ සමථ නම් වූ ආර්ය මාර්ගයට සුදුසු වූ ප්‍රතිපදාව වූ ඥාන දර්ශන විශුද්ධියයි. **සික්ඛමානං** යනු පිළිපදින්නා වූ වඩන්නා වූ

ඤාණ පරම්පරාව නිපදවන්නා වූ. **සදා** යනු සියලු කාලයෙහි, රාත්‍රියෙහි ද දවාලෙහි ද. **සතං** චතුසම්පජඤ්ඤයෙන් යුක්ත වූ සිහියෙන් සිහිඇතිව ක්‍රියාකරන, **සතතං පහිතතෙතා** යනු හැමකල්හි සිහි ඇත්තේ නිවන කරා යවන ලද සිත් ඇත්තා වූ. **තථාවිධං භික්ඛුං** මෙබඳු විහරණ ඇති භික්ෂුව බුද්ධාදී ආර්යයෝ **ආහු** කියති. සෙස්ස කියන ලද ආකාරයෙන්මය.

**දොළොස්වන සූත්‍රය යි.**

# 4.1.13

දහතුන්වන සූත්‍රයෙහි **ලොකො** යනු කැඩෙන බිඳෙන අර්ථයෙන් ලෝක නම් වේ. අර්ථ වශයෙන් පළමු ආර්ය සත්‍ය (දුක්ඛ-සමුදය) දෙකයි. මෙහි වනාහි දුක්ඛ ආර්ය සත්‍යය දතයුතුය. එය මේ සත්ත්ව ලෝකය, සංස්කාර ලෝකය, අවකාශ ලෝකය යනුවෙන් විභාග වශයෙන් ද ස්වරූප වශයෙන් ද මුලදී කියන ලද්දේම ය. එහෙත් ස්කන්ධ ලෝකය ආදී වශයෙන් ලෝකය නොයෙක් ආකාරය ඒ මෙසේ ය.

ලෝක යනු ස්කන්ධ ලෝකය, ධාතු ලෝකය, ආයතන ලෝකය, විපත්තිභව ලෝකය, විපත්ති සම්භව ලෝකය, සම්පත්ති භවලෝකය, සම්පත්ති සම්භව ලෝකය යි. සියලු සත්ත්වයෝ ආහාරයෙන් යැපෙති යනු එක් ලෝකයකි. නාමය ද රූපය ද ලෝක දෙකකි. තුන් වේදනාව ලෝක තුනකි. ආහාර සතර ලෝක සතරකි. පංචඋපාදානස්කන්ධය ලෝක පහකි. ආධ්‍යාත්මික ආයතන හය ලෝක හයකි. විඤ්ඤාණට්ඨිති හත ලෝක හතකි. අෂ්ට ලෝක ධර්මය ලෝක අටකි. සත්ත්වාවාස නවය ලෝක නවයකි. ආයතන දහය ලෝක දහයකි. ආයතන දොළස ලෝක දොළසකි. ධාතු දහඅටක ලෝක දහඅටකි යනුවෙන් මෙසේ බෙදන ලද ලෝකය පංච උපාදානස්කන්ධයන්හි ම සංග්‍රහයට, එක්වීමට යයි. උපාදානස්කන්ධයෝ ද 'දුක්ඛ ආර්ය සත්‍යය, ජාතිය දුකය -පෙ- කෙටියෙන්

පංච උපාදානස්කන්ධය දුකය' නම් වෙයි. එහෙයින් අර්ථ වශයෙන් පළමු ආර්ය සත්‍ය දෙකයි. මෙහි වනාහි දුක්ඛ ආර්ය සත්‍යය දතයුතුය'යි කියන ලදී.

කැඩෙන බිඳෙන අර්ථය විශේෂයක් නැතිව පංචස්කන්ධයන්හි නොලැබේද? ඇත්තයි, ලැබේ. යමක් නොකැඩේ යයි ගන්නා ලද ද එය එසේ නොවේ. ඒකාන්තයෙන් ම යමක් කැඩෙයි ද බිඳෙයි ද එය ලෝකයයි. උපාදාන ස්කන්ධයන්හිම ලෝක ශබ්දය ආරෝපණය කරන ලද්දේ යයි දතයුතුය. එහෙයින් **ලොකො** යනු දුක්ඛ ආර්ය සත්‍යයම ය.

ඉදින් මුලින් **තථාගත සූත්‍රයෙහි දී** තථාගත ශබ්දයට නොයෙක් නොයෙක් ක්‍රමයෙන් විස්තර වශයෙන් අර්ථ බෙදා දක්වනු ලැබුවද මේ පාළියෙහි අර්ථ වර්ණනා ක්‍රමයෙන් අර්ථ පැහැදිලි කිරීමයි.

**අභිසම්බුද්ධො** යනු 'අභිඤ්ඤෙය්‍යතො පරිඤ්ඤෙය්‍යතො' යනුවෙන් පෙර කියන ලද බෙදීමෙන් හෝ විශේෂයක් නැතිව ආසය-අනුසය-චරියා-අධිමුත්ති ආදී භේද වශයෙන් හෝ කුසල-අකුසල ආදි විභාග වශයෙන් හෝ වට්ට-පමණ-සණ්ඨාන ආදි භේද වශයෙන් හෝ විශේෂ වශයෙන් වනාහි මෙය ශාස්වත ආසය ය මෙය උච්ඡේද ආසය යනාදී වශයෙන් ද කර්කශ ලක්ෂණයෙන් පඨවි ධාතුවය වැගිරෙන ලක්ෂණයෙන් ආපෝ ධාතුවය ආදී වශයෙන් ද අති විශිෂ්ට වූ තමාගේම ඥාණයෙන් මනාව නොවෙනස්ව යම් යම් අර්ථයක් යම් යම් ආකාරයකින් අවබෝධ කළ යුතු ද ඒ ඒ ආකාරයෙන් අවබෝධ කරන ලද්දේය, දැනගන්නා ලද්දේය තමා විසින් ප්‍රත්‍යක්ෂ කරන ලද්දේය යන අරුතින් අභිසම්බුද්ධ නම් වේ. **ලොකසමා** යනු කියන ලද ආකාර ලෝකයෙන්. **විසංයුත්තො** යනු සම්බන්ධ නොවූ, ඒ හා බැඳුණු සියලු සංයෝජනයන් මනාව කපා දමන ලද බැවින් එයින් තොර වූයේය යන අර්ථයි.

**ලොක සමුදයො** යනු සූත්‍රාන්ත ක්‍රමයෙන් තෘෂ්ණාවය. අභිධර්මක්‍රමයෙන් වනාහි අභිසංස්කාරයන් සමග කෙලෙස් එක්දහස් පන්සියයයි. **පහීනො** යනු ජයශ්‍රී මහා බෝධි මූලයෙහි දී අර්හත් මාර්ග ඥානයෙන් සහමුලින් සිඳ දැමීම් වශයෙන් වාසනා (සංසාර පුරුදු) සහිතව පහ වූයේ. **ලොකනිරොධො** යනු නිවන ය. **සච්ඡිකතො** යනු තමා විසින් ප්‍රත්‍යක්ෂ කරන ලද්දේ. **ලොකනිරොධගාමිනී පටිපදා** යනු ශීලාදී ස්කන්ධ

තුන සංග්‍රහ කරන ලද ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. ඒ මාර්ගය ලෝක නිරෝධය වූ නිවනට යයි නිවන ලබයි. ඒ සඳහා ආර්යයන් වහන්සේලා විසින් පිළිපදිනු ලැබේ යන අරුතින් හෝ ලෝකනිරෝධගාමිනී පටිපදායයි කියනු ලැබේ. මෙපමණකින් 'තථානි' නම් වූ චතුරාර්ය සත්‍ය මනාව අවබෝධ කරන ලද්දේ තත්වූ පරිද්දෙන් යන ලද්දේ වෙයි යන අරුතින් තථාගත නම් වේ යන මේ අර්ථය දක්වන ලද්දේ වෙයි. චතුරාර්ය සත්‍යය තථානි නම් වේ. එය මෙසේ වදාළහ. '**චත්තාරිමානි භික්ඛවෙ තථමෙතං අවිතථමෙතං අනඤ්ඤථමෙතං**' මෙසේ විස්තරය දතයුතුය. යළිත් -සත්‍යය පිණිස යන ලද්දේ යන අරුතින් තථාගත නම් වේ. සත්‍යයට යන ලද්දේය යන අරුතින් තථාගත නම් වේ. 'ගතො' යනු අවබෝධ කරන ලද්දේ ඉක්මවූයේ, පැමිණියේ, පිළිපන්නේ යන අර්ථයි.

යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේ මුළු ලෝකය තීරණ පරිඥාවෙන් සත්‍ය ලෙස නොවෙනස් ලෙස අවබෝධ කළාහු ද එහෙයින් තථාගතයන් වහන්සේ විසින් ලෝකය මනාව අවබෝධ කරන ලද්දේය යන අරුතින් තථාගත නම් වෙති. ලෝක සමුදය ප්‍රහාණ පරිඥාවෙන් සත්‍ය ලෙස අවබෝධ කළාහුය ඉක්මවූවාහු ය යන අරුතින් තථාගත නම් වෙති. ලෝක නිරෝධය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස සත්‍ය ලෙස අවබෝධ කළාහුය, (ලෝක නිරෝධයට) පැමිණියාහුය යන අරුතින් තථාගත නම් වෙති. ලෝක නිරෝධගාමිනී ප්‍රතිපදාව සත්‍ය ලෙස නොවෙනස් ලෙස අවබෝධ කළාහුය, (එයට) පිළිපන්නාහුය යන අරුතින් තථාගත නම් වෙති යන මෙය කියන ලද්දේ වෙයි. මෙසේ මේ පාළියෙහි භාග්‍යවතුන් වහන්සේගේ තථාගතභාවය පැහැදිලි කිරීම් වශයෙන් අර්ථය දතයුතුය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ චතුරාර්ය සත්‍ය අවබෝධ කිරීම් වශයෙන් තමන් වහන්සේ ගේ තථාගතභාවය ප්‍රකාශකොට දැන් දක්නා ලද්දාදිය අවබෝධ කිරීම් වශයෙන් ද එය දැක්වීමට 'යං භික්ඛවෙ' යනාදිය වදාළහ. **අංගුත්තර අට්ඨක නිපාත අට්ඨකථාවේ** දී වනාහි 'චතූහි සච්චෙහි අත්තනො බුද්ධභාවං කථෙත්වා' 'චතුරාර්ය සත්‍යයෙන් තමන්වහන්සේගේ බුදුබව කියා' යනාදිය කියන ලදී. ඒ තථාගත ශබ්දයේ බුද්ධ ශබ්දයේ අර්ථ වශයෙන් නොයෙක් ආකාර නැතිබව දැක්වීමට කියන ලදී. පාළියෙහි පැවැත්ම එසේය.

එහි **දිට්ඨං** යනු රූපායතනයයි. **සුතං** යනු සද්දායතනයයි. **මුතං** යනු පැමිණ ගතයුතු බැවින් ගන්ධායතනය ද රසායතනය ද ඵොට්ඨබ්බායතනය ද වේ. **විඤ්ඤාතං** යනු සුඛ දුක්ඛ ආදී ධර්මාරම්මණය යි. **පත්තං** යනු සොයා හෝ නො සොයා හෝ ලබන ලද. **පරියෙසිතං** ලැබූවක් හෝ නොලැබූවක් හෝ සොයන ලද. **අනුවිචරිතං මනසා** යනු සිතෙන් සලකන ලද. කවරකු විසින් සලකන ලද මනසින් ද? 'සදෙවකසස -පෙ- සදෙවමනුසසාය' යනුවෙන් සම්බන්ධ විය යුතුය. එහි දෙවියන් සහිත වූයේ යන අරුතින් සදෙවක නම් වේ. ඒ **සදෙවකසස ලොකසස** දෙවියන් සහිත වූ ලෝකයා විසින්. සෙසු පදයන්හිද ඒ ක්‍රමයයි. **සදෙවක** යන වචනයෙන් මෙහි පළමු දෙව්ලෝ පහට අයත් කාමාවචර දෙව් පිරිස ගැනෙයි. **සමාරක** වචනයෙන් හයවන කාමාවචර දෙව්ලොවට අයත් දෙව්පිරිස ගැනෙයි. **සබ්‍රහමක** වචනයෙන් බ්‍රහ්මකායික ආදී බඹපිරිස ගැනෙයි. **සසසමණ බ්‍රාහමණී** වචනයෙන් ශාසනයට ප්‍රතිවිරුද්ධ වූ මහණ බමුණන් ද සංසිඳවූ පව් ඇති (සමිත) බහා තැබූ පව් ඇති (බාහිත) මහණ බමුණන් ද ගැනෙයි. **පජා** යන වචනයෙන් සත්ත්ව ලෝකය ගැනෙයි. **සදෙවමනුසස** යන වචනයෙන් සම්මුති දෙවියන් හා ඉතිරි මිනිසුන් ද ගැනෙයි. මෙසේ මෙහි පද තුනෙන් දේව-මාර-බ්‍රහ්මයන් සමග සත්ත්ව ලෝකය ද (සසසමණ බ්‍රාහමණියා පජාය, සදෙව මනුසසාය යන) පද දෙකෙන් ප්‍රජාව වශයෙන් සත්ත්ව ලෝකයම ගන්නා ලද්දේ යයි දතයුතුය.

තවත් ක්‍රමයක් : සදෙවක වචනය ගැනීමෙන් අරූපාවචර දේවලෝකය ගන්නා ලද්දේ වෙයි. සමාරක වචනය ගැනීමෙන් කාමාවචර දෙව්ලෝ හය ගන්නා ලද්දේ වෙයි. සබ්‍රහ්මක වචනය ගැනීමෙන් රූපී-බ්‍රහ්මලෝකය ගන්නා ලද්දේ වෙයි. සසසමණ බ්‍රාහ්මණ ආදි වචනයෙන් සම්මුති දෙවියන් සහිත ඉතිරි සත්ත්ව ලෝකය ගන්නා ලද්දේ වෙයි.

තවද මෙහි **සදෙවක** වචනයෙන් උසස් ම සීමාවෙන් සියලු ලෝකය විෂයකොට ඇති භාග්‍යවතුන් වහන්සේගේ අභිසම්බුද්ධභාවය ප්‍රකාශවන කල්හි 'මාරයා නම් මහානුභාව ඇත්තේය. සදෙව්ලොවට අධිපතිය. ඒවා තම වසඟයෙහි පවත්වන්නේය. බ්‍රහ්මයා වනාහි ඔහුටත් වඩා මහත් ආනුභාව ඇත්තේය. ඇඟිලි දහයෙන් දසදහසක් සක්වල ආලෝකය පතුරුවයි. උතුම් ධ්‍යාන සමාපත්ති සැපය විඳියි. ඍද්ධිමත් වූ දිවැස් ඇත්තා වූ පරසිත් දන්නා වූ මහානුභාව බොහෝ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ

විද්‍යමාන වෙති. මේ සත්ත්වකාය ද අනන්තය, අප්‍රමාණය. භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ සියල්ලන්ගේ ම විෂය ඉතිරි නොකොට ම මනාව අවබෝධ කරන ලද්දේ ද, යනුවෙන් යමෙකුට මෙබඳු සිතක් ඇතිවිය හැකිය. ඔවුන්ගේ සැකය දුරුකරමින් භාග්‍යවතුන් වහන්සේ 'සදෙවකස්ස ලොකස්ස' යනාදිය වදාළහ. පැරණි ආචාර්යවරු (මෙසේද) කීහ. 'සදෙවකස්ස' යන්නෙන් දෙවියන් සහිත අවශේෂ ලෝකය ද 'සමාරකස්ස' යන්නෙන් මාරයා සහිත අවශේෂ ලෝකය ද 'සබ්‍රහ්මකස්ස' යන්නෙන් බ්‍රහ්මයන් සහිත අවශේෂ ලෝකය ද හාත්පසින් ගනු ලැබේ. මෙසේ භව තුනට අයත් සියලුම සත්ත්වයන් පද තුනෙහි ඇතුළත් කොට නැවත පද දෙකෙන් හාත්පසින් ගනිමින් 'සස්සමණ බ්‍රාහමණියා පජාය, සදෙව මනුස්සාය' යනුවෙන් කීහ. මෙසේ පද පහෙන් ස්කන්ධ තුන සීමාකොට ඇති සියලු සත්ත්වයන් හාත්පසින් ගනු ලැබේ.

යස්මා තං තථාගතෙන අභිසම්බුද්ධං යන මෙයින් මෙය දක්වයි. අප්‍රමාණ ලෝකධාතු අතරින් දෙවියන් සහිත මේ ලෝකයෙහි නිල්, කහ යනාදී යම් රූප අරමුණක් ඇස් දොර හමුවට එයිද ඒ සියල්ල මේ සත්ත්වයා මේ මොහොතෙහි මෙනම් රූප අරමුණක් දැක සොම්නස් වූයේ හෝ දොම්නස් වූයේ හෝ මැදහත් වූයේ යයි මෙසේ තථාගතයන් වහන්සේ විසින් මනාව අවබෝධ කරන ලදී.

එසේ අප්‍රමාණ ලෝකධාතු අතරින් දෙවියන් සහිත මේ ලෝකයෙහි බෙරහඬක්, මිහිඟුබෙර හඬක් යනාදී යම් ශබ්ද අරමුණක් කන්දොර හමුවට එයිද මුල්ගඳ පොතුගඳ යනාදී යම් ගන්ධ අරමුණක් නාස් දොර හමුවට එයිද මුල්රස, කඳෙහි රස යනාදී යම් රස අරමුණක් දිව දොර හමුවට එයිද. කර්කශය, මොළොක්ය යනාදී පඨවි ධාතු තේජෝ ධාතු වායෝ ධාතු යන භේද ඇති ඵොට්ඨබ්බ අරමුණක් කය දොර හමුවට එයිද, මේ සත්ත්වයා මේ මොහොතෙහි මෙනම් ඵොට්ඨබ්බය ස්පර්ශකොට සොම්නස් වූයේ හෝ දොම්නස් වූයේ හෝ මැදහත් වූයේ යයි ඒ සියල්ල මෙසේ තථාගතයන් වහන්සේ විසින් මනාව අවබෝධ කරන ලදී.

එසේ අප්‍රමාණ ලෝකධාතු අතරින් දෙවියන් සහිත මේ ලෝකයෙහි සැප ආදී භේද ඇති දහම් අරමුණක් මනදොර හමුවට එයි ද, මේ සත්ත්වයා මේ මොහොතෙහි මෙනම් දහම් අරමුණ දැන සොම්නස්

වූයේ හෝ දොම්නස් වූයේ හෝ මැදහත් වූයේ යයි ඒ සියල්ල මෙසේ තථාගතයන් වහන්සේ විසින් මනාව අවබෝධ කරන ලදී.

මෙසේ : මේ දෙවියන් සහිත ලෝකයා විසින් දක්නා ලද (දිට්ඨ) අසන ලද (සුත) ආඝ්‍රාණය කළ, රසවිඳින ලද, ස්පර්ශ කරන ලද (මුත) දන්නා ලද (විඤ්ඤාත) යමක් ඇත්ද තථාගතයන් වහන්සේ විසින් එයින් අදිට්ඨ වූ හෝ අසුත වූ හෝ අමුත වූ හෝ අවිඤ්ඤාත වූ හෝ යන යමක් නැත. මේ මහජනයාට සොයා නො ලද අරමුණු ද ඇත. නොසොයා නො ලද අරමුණු ද ඇත. සොයා ලද අරමුණු ද ඇත. නො සොයා ලද අරමුණු ද ඇත. තථාගතයන් වහන්සේ විසින් නො ලැබූ, ඤාණයෙන් ප්‍රත්‍යක්ෂ නො කරන ලද කිසිවක් නැත. (සියල්ල ලැබුවේ ද ප්‍රත්‍යක්ෂ කළේ ද වෙයි.)

එහෙයින් ම අප්‍රමාණ ලෝකධාතුවල අප්‍රමාණ වූ සත්ත්වයන්ගේ ඇස්දොර හමුවට පැමිණෙන යම් රූපාරම්මණයක් ඇත්ද භාග්‍යවතුන් වහන්සේ ඒ සියල්ල සියලු ආකාරයෙන් දනිති. දකිති. මෙසේ එය දන්නා වූ දක්නා වූ භාග්‍යවතුන් වහන්සේ විසින් ඉටු අනිටු ආදී වශයෙන් හෝ දිට්ඨ-සුත-මුත-විඤ්ඤාත අතුරින් ලැබෙන පද වශයෙන් හෝ 'කතමං තං රූපං රූපායතනං ? යං රූපං චතුන්නං මහාභූතානං උපාදාය වණ්ණනිභා සනිදස්සනං සප්පටිඝං නීලං පීතකං ඒ රූපායතන රූපය කුමක් ද? සතරමහා භූතයන් නිසා උපන් (චක්ඛු විඤ්ඤාණයට ප්‍රකට වූ) පැහැ සටහන ඇත්තේ (චක්ඛු විඤ්ඤාණයෙන් දැකිය යුතු නිසා) සන්දර්ශන වූ (ගැටීම් සහිත නිසා) සප්‍රතිඝ වූ නිල්ය, කහය යනාදී ක්‍රමයෙන් නොයෙක් නම්වලින් වාර දහතුනකින්, ක්‍රම පනස් දෙකකින් බෙදන ලද ද එය එසේම වෙයි, අසත්‍ය නොවේ. කන්දොර ආදියෙහි හමුවට පැමිණෙන ශබ්ද ආදියෙහි ද මේ ක්‍රමයයි.

**තස්මා තථාගතොති වුච්චති** යනු යම්සේ ලෝවැසියා විසින් රූපාදී යම් අරමුණක් දක්නා ලද ද උන්වහන්සේ විසින් එසේ ම දක්නා ලද බැවින් තථාගතය යි කියනු ලැබේ. පාළියෙහි වනාහි 'අභිසම්බුද්ධ' යයි කියන ලදී. එය තථාගත ශබ්දය සමග සමාන අර්ථ ඇත. මෙයින් එසේ දැකීම් වශයෙන් තථාගත යයි මේ අර්ථය දක්වන ලද්දේ වෙයි. **ධර්ම සේනාපතීන් වහන්සේ විසින්**

**න තස්ස අද්දිට්ඨ'මිදත්ථි කිඤ්චි**
**අථො අවිඤ්ඤාත මජානිතබ්බං**
**සබ්බං අභිඤ්ඤාසි යදත්ථි නෙය්‍යං**
**තථාගතො තෙන සමන්තචක්ඛු** යන මෙය කියන ලද්දේය.

මේ තුන්ලෝකයෙහි උන්වහන්සේ විසින් වර්තමාන කාලයට අයත් නොදක්නා ලද කිසිවක් නැත. නැවත අතීත කාලයට අයත් නොදන්නා ලද කිසිවක් නැත. අනාගත කාලයට අයත් නො දන්නා ලද කිසිවක් නැත. තුන්කාලයට අයත් වූද කාලයට අයත් නැත්තා වූද දැනගත යුතු සියල්ල දැනගත්හ. ඒ කාරණයෙන් තථාගතයන් වහන්සේ සමන්තචක්ඛු (සබ්බඤ්ඤූ) නම් වන සේක.

**'යං භික්ඛවෙ සදෙවකස්ස ලොකස්ස -පෙ- සදෙවමනුස්සාය පජාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා තමහං පජානාමි තමහං අබ්භඤ්ඤාසිං, තං තථාගතස්ස විදිතං, තං තථාගතස්ස උපට්ඨාසි'**

දෙවියන් සහිත වූ ලෝකයා විසින් -පෙ- දෙව් මිනිසුන් සහිත වූ ප්‍රජාව විසින් දක්නා ලද රූපය ද, අසන ලද ශබ්දය ද, ගන්ධ රස ඵොට්ඨබ්බද සිතින් දැනගන්නා ලද ධර්මාරම්මණ ද පැමිණි අරමුණු ද සොයන ලද අරමුණු ද සිතින් සලකන ලද යම් අරමුණක් වේද මහණෙනි, මම එය දනිමි. මම එය දැනගතිමි. එය තථාගතයන් වහන්සේ විසින් දන්නා ලදී. එය තථාගතයන් වහන්සේට වැටහුනේය'යි භාග්‍යවතුන් වහන්සේ විසින් සූත්‍රාන්තයෙහිදී ද වදාරන ලදී.

**යඤ්ච භික්ඛවෙ රත්තිං තථාගතො, අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුජ්ඣති** යනු යම් වෙසක් පුණු පෝදා රැයක එසේ ආයේය යනාදි අරුතින් තථාගත වූ භාග්‍යවතුන් වහන්සේ බෝමැඩදී අපරාජිත පර්යංකයෙහි වැඩහිඳිමින් ත්‍රිවිධ මාරයන්ගේ හිස්මුදුන මැඩ වඩා උසස් දෙයක් නොමැති බැවින් අනුත්තර වූ සම්මා සම්බෝධිය ආසවක්ඛය ඤාණය සමග සබ්බඤ්ඤුත ඤාණය අවබෝධ කරත් ද **යඤ්ච රත්තං අනුපාදිසෙසාය නිබ්බාණධාතුයා පරිනිබ්බායති** යනු යම් වෙසක් පුණු පෝදා රැයකදීම කුසිනාරාවෙහි උපවත්තන නම් වූ මල්ල රජවරුන්ගේ

සල්වනයෙහි සල්ගස් දෙකක් අතරදී අනුපාදිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවෙත් ද **යං එතස්මිං අන්තරෙ** මේ සඋපාදිශේෂ අනුපාදිශේෂ නිර්වාණ ධාතු දෙක අතර හතළිස් පස්වසරක් පමණ වූ කාලයෙහි ප්‍රථම බෝධියේදී (අවුරුදු 15) මධ්‍යම බෝධියේදී (අවු 15) පශ්චිම බෝධියේදී (අවු 15) සූත්‍ර-ගෙය්‍ය ආදී ප්‍රභේද ඇති ධර්මය **භාසති** නිර්දේශ වශයෙන් ප්‍රකාශ කරත්ද **ලපති** උද්දේශ වශයෙන් ප්‍රකාශ කරත් ද, **නිද්දිසති** පටිනිර්දේශ වශයෙන් ප්‍රකාශ කරත් ද **සබ්බං තං තථෙව හොති** යනු මේ අතරතුර දේශනා කරන ලද ඒ සියලු සූත්‍ර-ගෙය්‍ය ආදී නවංග බුද්ධ වචනය අර්ථ වශයෙන්ද ව්‍යඤ්ජන (අක්ෂර) වශයෙන් ද නිදොස් වූයේ අඩු නැතිව වැඩි නැතිව සියලු ආකාරයෙන් පරිපූර්ණ වූයේ රාගමදය මඩින -පෙ- මෝහ මදය මඩින එහි කෙස්ගසක අග තරම්වත් වෙනසක් නැත. එක් මුද්‍රිකාවකින් මුද්‍රාතබන ලද්දක් මෙන් ද එක් නැලියකින් මනින ලද්දක් මෙන් ද එක් තුලාවකින් (තරාදියකින්) කිරන ලද්දන් මෙන් ද එය එසේම වෙයි. යමක් සඳහා එය දේශනා කරන ලද ද ඒකාන්තයෙන් ම එය සිදුවීම් වශයෙන් **නො අඤ්ඤථා** එහෙයින් සත්‍යය, අසත්‍ය නොවේ. අන් අයුරකින් නොවේ. **මේ තථාවාදී** බැවින් **තථාගත** යයි දක්වති. 'ද' කාරයට 'ත' කාරය කොට මේ ගත ශබ්දය ගද (ශබ්ද) අර්ථ ඇත්තේය. එහෙයින් සත්‍යය කියති යන අර්ථයෙන් තථාගත යන අර්ථ ඇත්තේය. නැතහොත් ආගදනං = ආගදො, වචනය යන අර්ථයයි. සත්‍ය වූ නොවෙනස් වූ වචනය මොහුට වන්නේ යයි ද 'ද' කාරයට 'ත' කාරය කොට තථාගතො යනුවෙන් මෙසේ මෙහි පද සිද්ධිය දතයුතුය.

**යථාවාදී තථාකාරී** යනු භාග්‍යවතුන් වහන්සේ මේ ධර්ම අකුසල්ය. වැරදි සහිතය. නුවණැත්තන් විසින් ගරහන ලදී. සමාදන්ව පුරන ලද්දේ අහිත පිණිස දුක් පිණිස පවතී' යනුවෙන් අනුන්ට දහම් දෙසමින් යම් ධර්මයන් දේශනා කරත් ද ඒ ධර්මයන් ඒකාන්තයෙන් ම තමන්වහන්සේ දුරුකළහ. භාග්‍යවතුන් වහන්සේ මේ ධර්ම කුසල්ය. නිවැරදිය. නුවණැත්තන් විසින් සමාදන්ව පුරන ලද්දේ හිත පිණිස සැප පිණිස පවතී' යනුවෙන් යම් ධර්මයන් දේශනා කරත් ද ඒකාන්තයෙන් ම උන්වහන්සේ ඒ ධර්මයන්ට පැමිණ වාසය කරති. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ යථාවාදී තථාකාරී යයි දතයුතුය.

යථාකාරී = තථාවාදී යනු මනාව ශීලාදිය පරිපූර්ණ වශයෙන් මනාව පිළිපන්නා වූ භාග්‍යවතුන් වහන්සේ තමන් යථාකාරී වෙත් ද එසේම දහම් දෙසීමෙන් අනුන් ද එහි පිහිටුවීම් වශයෙන් තථාවාදී නම් වෙති. භාග්‍යවතුන් වහන්සේගේ වචනයට කය ගැලපෙයි. කයට ද වචනය ගැලපෙයි. එහෙයින් යථාවාදී තථාකාරී, යථාකාරී තථාවාදී ද වෙති. මෙසේ වූ උන්වහන්සේගේ වචනය යම්සේ ද කය ද එසේ ගියේ පැවතියේ වෙයි. කය යම්සේ ද වචනය ද එසේ ගියේ පැවතියේය යන අර්ථයි.

අභිභූ අනභිභූතො යනු උඩින් භවාග්‍රය ද යටින් අවීචි නිරය ද අවසන් කොට ඇති හරහට අප්‍රමාණ ලෝකධාතුවල සියලු සත්ත්වයන් භාග්‍යවතුන් වහන්සේ සීලයෙන් ද සමාධියෙන් ද ප්‍රඥාවෙන් ද විමුක්තියෙන් ද විමුක්ති ඥාන දර්ශනයෙන් ද මැඩපවත්වති. උන්වහන්සේට තුලාවක් හෝ ප්‍රමාණයක් හෝ නැත. අසමය, අසමසමය, සමාන පිළිරුවක් නැත (අප්පටිමො), සමානයකු නැත (අප්පටිභාග), අසමාන පුද්ගලයෙකි (අප්පටි පුග්ගල), සමාන නැත (අතුල), ප්‍රමාණයක් නැත (අප්පමෙය්‍ය) වඩා උසස් කෙනෙක් නැත (අනුත්තර), ධර්මරාජය, දෙවියන්ට වඩා උතුම් දෙවියෙකි. ශක්‍රයන්ට වඩා උතුම් ශක්‍රයෙකි. බ්‍රහ්මයින්ට වඩා උතුම් බ්‍රහ්මයෙකි. එහෙයින් ම තමන්වහන්සේ කිසිවකු විසිනුත් මැඩ නොපවත්වන ලද්දේය යන අරුතින් අනභිභූත නම් වෙති.

අඤ්ඤදත්ථු යනු ඒකාන්ත අර්ථයෙහි නිපාතයකි. යම්කිසි දතයුතු දෙයක් ඇත්නම් ඒ සියල්ල අල්ලෙහි ඇති නෙල්ලි ගෙඩියක් මෙන් දකී යන අරුතින් දසො නම් වේ. ආසය (සිතේ ආකාර) ආදිය අවබෝධයෙන් ද යහපත ගෙනදීම් වශයෙන් ද සත්ත්වයන් භවත්‍රයට ගෙන ඒම් වශයෙන් සංස්කාරයන් සියලු ආකාරයෙන් මනාව පුරුදුකළ වශීතාවයෙහි දක්ෂ බැවින් සමාපත්ති ද නොවෙනස් වූ සිත ද තම වසඟයෙහි පවත්වයි යන අරුතින් වසවත්තී නම් වේ. මෙපමණකින් මැඩපවත්වන අර්ථයෙන් භාග්‍යවතුන් වහන්සේ තමන්වහන්සේගේ තථාගත බව දක්වති.

එහි පදසිද්ධිය මෙසේ දතයුතුය. බෙහෙතක් මෙන් = බෙහෙත, මේ කුමක් ද? දේශනා විලාසයත් පුණ්‍ය රාශියත් ය. එහෙයින් ම උන්වහන්සේ මහත් ආනුභාව ඇති වෛද්‍යවරයකු දිව්‍ය බෙහෙතින් සර්පයන් මැඩපවත්වන්නාක් මෙන් සියලු පරවාදීන් ද දෙවියන් සහිත

ලෝකයා ද මැඩපවත්වති. මෙසේ සියලු ලෝකය මැඩපැවැත්වීමෙහි සත්‍ය වූ නොවෙනස් වූ දේශනා විලාසය ද පුණ්‍ය රාශිය ද බෙහෙත (අගද) වන්නේය. 'ද' කාරයට 'ත' කාරය කොට (තථාගද) තථාගත වේයයි දතයුතුය.

එහෙයින් 'සදෙවකෙ භික්ඛවෙ ලොකෙ -පෙ- වසවත්ති, තස්මා තථාගතො ති වුච්චති' (මහණෙනි, දෙවියන් සහිත ලෝකයෙහි -පෙ- වසවර්තිය, එහෙයින් තථාගත යයි කියනු ලැබේ) යයි කියනු ලැබේ.

ගාථාවල : **සබ්බලොකං අභිඤ්ඤාය** යනු තුන්ලෝකයෙහි සත්ත්වයන්ගේ එක්ව වාසය දැන. **සබ්බලොකෙ යථාතථං** යනු ඒ තුන්ලෝකයෙහි සත්ත්වයන්ගේ එක්ව වාසය පිළිබඳ දැනගත යුතු යමක් වේ නම් ඒ සියල්ල සත්‍ය ලෙස නොවෙනස් ලෙස දැන. **සබ්බලොකවිසංයුත්තො** යනු සතර යෝගයන් ඉතිරි නොකොට පහකිරීමෙන් මුළු ලෝකයෙන් ම වෙන්වූ සේක් මිදුණු සේක්. **අනූසයො** යනු මුළු ලෝකයෙහිම තෘෂ්ණා දෘෂ්ටි දාහයන් කෙරෙන් අනූසය වූ, ඒ දාහයන් කෙරෙන් තොර වූ.

**සබ්බාභිභූ** යනු රූපාදී සියලු අරමුණු, සංස්කාර වූ සියල්ල, සියලුම මාරයන් මැඩපවත්වා සිටි සේක්. **ධීරො** ධෛර්ය සම්පන්න වූ සේක්. **සබ්බගන්ථප්පමොචනො** යනු සියලු අභිධ්‍යාකාය ග්‍රන්ථ ආදිය මුදා සිටි සේක්, තමන්වහන්සේගේ දේශනා විලාසයෙන් හික්මවීමට සුදුසු (සත්ත්වයන්ගේ) සිතෙන් (සිත්වලින් අභිධ්‍යාකායග්‍රන්ථාදී වූ) ඒවා මුදාලීමෙන් ද සියලු ක්ලේශ ග්‍රන්ථයන් මුදාසිටි සේක් **ඵුට්ඨස්ස** ඵුට්ඨා අස්ස, මෙය කරණ අර්ථයෙහි ෂට්ඨී වචනය යි. උන්වහන්සේ විසින් ස්පර්ශ කරන ලද්දී යන අර්ථයි. **පරමාසන්ති** යනු නිවන යි. එය උන්වහන්සේ විසින් ඥාන ස්පර්ශයෙන් ස්පර්ශ කරන ලද්දී එහෙයින් ම 'නිබ්බාණං අකුතො භයං' (කිසිතැනකින් බිය නැති නිවන) යයි කීහ. නැතහොත් **පරමා සන්ති** යනු උතුම් ශාන්තිය, කවර ශාන්තියක් ද? නිවනය. යම්හෙයකින් නිවනෙහි කිසිතැනකින් බියක් නැද්ද එහෙයින් එය **අකුතො භයං** යයි කියනු ලැබේ.

**අනීඝො** යනු නිදුක් වූ. **සබ්බකම්මක්ඛයප්පත්තො** යනු සියලු කර්මයන් ක්‍ෂය බවට අවසානයට අතිශයින් අභාවයට පත්වූ. **විමුත්තො උපධි සංඛයෙ** යනු උපධි ගෙවීම නම් නිවනෙහි එය අරමුණු කොට ඇති අර්හත්ඵල විමුක්තියෙන් මිදුණා වූ.

**එස සො** යනු එසො සො. ඒ මේ (තථාගතයන් වහන්සේ) **සීහො අනුත්තරො** හිරිහැර කරදර ඉවසන අරුතින් ද කෙලෙස් නසන අර්ථයෙන් ද තථාගතයන් වහන්සේ අනුත්තර (වඩාම උසස්) සිංහයා නම් වෙති. **බ්‍රහ්මං** යනු ශ්‍රේෂ්ඨ වූ **චක්කං** යනු ධර්මචක්‍රය. **පවත්තයී** වට තුනක් ඇති (තිපරිවට්ටං) දොළොස් ආකාර වූ (ද්වාදසාකාරං) (ධර්ම චක්‍රය) පැවැත්වූ සේක.

**ඉති** යනු මෙසේ තථාගතයන් වහන්සේගේ ගුණ දැන **සංගම්ම** යනු පැමිණ **තං නමස්සන්ති** යනු උන්වහන්සේ සරණ ගිය දෙව් මිනිස්සු ඒ තථාගතයන් වහන්සේට නමස්කාර කරති. මහත් වූ සීලාදී ගුණයෙන් යුක්ත බැවින් **මහන්තං** විශාරද ඥාණ හතරෙන් යුක්ත බැවින් **වීතසාරදං** දැන් යමක් කියන්නා වූ ඔව්හු නමස්කාර කරති. එය දැක්වීමට 'දන්තො' යනාදිය කියන ලදී. එය ප්‍රකට අර්ථ ඇත්තේය.

**දහතුන්වන සූත්‍රය යි.**

මෙසේ මේ චතුක්ක නිපාතයෙහි සයවන-සත්වන සූත්‍රවලදී සසර (වට්ටං) කියන ලදී. පළමු-දෙවන-තෙවන-දොළොස්වන-දහතුන්වන සූත්‍රවල නිවන (විවට්ටං) කියන ලදී.
ඉතිරි ඒවාහි වට්ට විවට්ට කියන ලදී යයි දතයුතුය.

**මෙසේ පරමත්ථදීපනී නම් වූ ඛුද්දක නිකායට්ඨ කථාවට අයත් ඉතිවුත්තකයේ චතුක්ක නිපාත වර්ණනාව නිමියේ ය.**

මෙපමණකින්

1. ධම්මිස්සරෙන ජගතො ධම්මා ලොකවිධායිනා
ධම්මානං බොධනෙය්‍යානං ජානතා දෙසනාවිධිං

ධර්මයට අධිපති වූ, ලෝකයාට ධර්මාලෝකය සම්පාදනය කරන්නා වූ ධර්මය අවබෝධ කරන අයට දේශනා කරන විධිය දන්නා වූ.

2. තං තං නිදානමාගම්ම සබ්බලොකහිතෙසිනා
එකකාදිප්පභෙදෙන දෙසිතානි මහෙසිනා

සියලු ලෝකයාට හිතෛෂී වූ මහාර්ෂී වූ බුදුරජාණන් වහන්සේ විසින් ඒ ඒ නිදානයට පැමිණ ඒකකාදී වූ ප්‍රභේදයෙන් යුතුව.

3. දසුත්තරසතං දෙව ච සුත්තානි ඉතිවුත්තකං
ඉතිවුත්තප්පභේදෙන සංගායිංසු මහෙසයො

4. ඡළභිඤ්ඤා වසිප්පත්තා පභින්න පටිසම්භිදා
යං තං සාසන ධොරය්හා ධම්මසංගාහකා පුරෙ

සූත්‍ර එකසිය දොළසක් වූ ඉතිවුත්තකය දේශනා කරන ලදී. ෂට් අභිඥාවන්ගේ බලවත් භාවයට පත් වූ ප්‍රතිසම්භිදා ප්‍රභේද ඇති ශාසන බර උසුලන්නා වූ ධර්මය සංග්‍රහ කළ මහාර්ෂී මහරහතන් වහන්සේලා පූර්වයේදී ඉතිවුත්තක යන භේදයෙන් සංගායනා කළාහුය.

5. තස්ස අත්ථං පකාසෙතුං පොරාණට්ඨ කථා නයං
නිස්සාය යා සමාරද්ධා අත්ථ සංවණ්ණනා මයා

පැරණි අට්ඨකථා න්‍යාය ඇසුරුකොට ඒ ඉතිවුත්තකයේ අර්ථය ප්‍රකාශ කරන්නට මා විසින් අර්ථ සංවර්ණනාවක් (අර්ථ පැහැදිලි කිරීමක්) ආරම්භ කරන ලද ද,

6. **සා තත්‍ථ පරමත්‍ථානං සුත්තන්තෙසු යථාරහං**
**පකාසනා පරමත්‍ථදීපනී නාම නාමකො**

7. **සමපත්තා පරිනිට්ඨානං අනාකුල විනිච්ඡයා**
**අට්ඨිංසප්පමාණාය පාළියා භාණවාරතො**

සුදුසු පරිදි එහි සූත්‍රවල පරමාර්ථයන්ගේ නිරවුල් විනිශ්චය ඇති පාළියේ භණවර වශයෙන් තිස්අටක් පමණ වූ නමින් **පරමත්‍ථදීපනී** ඒ ප්‍රකාශනය නිමාවට පැමිණියාය.

8. **ඉති තං සංඛරොන්තෙන යන්තං අධිගතං මයා**
**පුඤ්ඤං තස්සානුභාවෙන ලොකනාථස්ස සාසනං**

මෙසේ එය සකස් කිරීමෙන් මා විසින් ලබන ලද යම් ඒ පිනක් වේද එහි ආනුභාවයෙන් ලෝකනාථයන් වහන්සේගේ ශාසනයට

9. **ඔගාහෙත්වා විසුද්ධාය සීලාදිපටිපත්තියා**
**සබ්බෙපි පාණිනො හොන්තු විමුත්ති රස භාගිනො**

විශුද්ධ වූ ශීලාදී ප්‍රතිපත්තියෙන් බැසගෙන සියලු ප්‍රාණීහු විමුක්ති රසයට කොටස්කරුවෝ වෙත්වා.

10. **චිරං තිට්ඨතු ලොකස්මිං සම්මා සම්බුද්ධසාසනං**
**තස්මිං සගාරවා නිච්චං හොන්තු සබ්බෙපි පාණිනො**

සම්මා සම්බුද්ධ ශාසනය ලෝකයෙහි බොහෝ කල් පවතීවා. සියලු ප්‍රාණීහු නිතර එහි ගෞරව ඇත්තෝ වෙත්වා.

11. **සම්මා වස්සතු කාලෙන දෙවොපි ජගතිප්පති**
**සද්ධම්ම නිරතො ලොකං ධම්මෙනෙව පසාසතු**

සුදුසු කල්හි මනාව වැසි වසීවා. ලෝකයට අධිපති වූ සද්ධර්මයෙහි නිරත වූ දෙවි තෙමේ ද ධර්මයෙන් ම ලෝවැසියාට අනුශාසනා කෙරේවා.

**මෙසේ බදරතීර්ථ විහාරවාසී වූ ආචාර්ය ධර්මපාල ස්ථවිරයන් විසින් කරන ලද ඉතිවුත්තක අට්ඨකථාව නිමියේ ය.**


ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ දොළොස්වන
මහා නායක ධුර දරණ, මීරිගම ශාසනවර්ධන පිරිවෙන් විහාරාධිපති
අති පූජ්‍ය වේවැල්දෙණියේ මේධාලංකාර මාහිමිපාණන් වහන්සේගේ
ශිෂ්‍ය රත්නයක් වූ
කුඩුම්බිගල මහා තපෝවනාරාමාධිපතිව වැඩවිසූ,
අපවත් වී වදාළ පූජ්‍ය තාඹුගල ආනන්දසිරි ස්වාමීන් වහන්සේගේ
ශිෂ්‍ය
ත්‍රිපිටකවේදී, අධ්‍යාපනවේදී, ශාස්ත්‍රපති යන උපාධිධර
ගම්පහ-ඉඹුල්ගොඩ-පැරකුම්දෙණියේ ශ්‍රී වීරසිංහ පිරිවෙන් විහාරවාසී
ඇස්වත්තේ රේවත ස්ථවිර වන
ම විසින්
භදන්තාචාර්ය ධර්මපාල මහා ස්ථවිරපාදයන් වහන්සේ විසින්
විරචිත පාලි ඉතිවුත්තකට්ඨකථාවට කරන ලද
සිංහල පරිවර්තනය සමාප්ත යි.

# පාලි අට්ඨකථා සහ එහි පරිවර්තන වියත්හු

| | | |
|---|---|---|
| 1. | සුමංගල විලාසිනී - දීඝනිකායට්ඨ කථා-I | දයා ගුණසේකර මහතා<br>පී.එල්.කේ. පෙරේරා මහතා |
| 2. | සුමංගල විලාසිනී දීඝනිකායට්ඨ කථා-II | බී.එම්.පී. බාලසූරිය මහතා |
| 3. | පපඤ්චසූදනී මජ්ඣිම නිකායට්ඨ කථා I | ආඳාවල දේවසිරි හිමි |
| 4. | පපඤ්චසූදනී මජ්ඣිම නිකායට්ඨ කථා II | විජිතනන්ද සරත්චන්ද්‍ර මහතා |
| 5. | පපඤ්චසූදනී මජ්ඣිම නිකායට්ඨ කථා III | දයා ගුණසේකර මහතා |
| 6. | පපඤ්චසූදනී මජ්ඣිම නිකායට්ඨ කථා IV | බලපිටියේ සිරිසීවලී හිමි |
| 7. | සාරත්ථප්පකාසිනී සංයුත්ත නිකායට්ඨ කථා I | එන්.එච්. පෙරේරා මහතා |
| 8. | සාරත්ථප්පකාසිනී සංයුත්ත නිකායට්ඨ කථා II | හත්තොටුවේ ඉන්දරතන හිමි |
| 9. | සාරත්ථප්පකාසිනී සංයුත්ත නිකායට්ඨ කථා III | ජිනදාස ගොඩකන්ද මහතා |
| 10. | මනොරථපූරණී අංගුත්තර නිකායට්ඨ කථා I | කපිල අභයවංස මහතා |
| 11. | මනොරථපූරණී අංගුත්තර නිකායට්ඨ කථා II | කපිල අභයවංස මහතා |
| 12. | පරමත්ථජොතිකා ඛුද්දක පාඨට්ඨ කථා | මැදඋයන්ගොඩ<br>විජයකිත්ති හිමි |
| 13. | ධම්මපදට්ඨ කථා I | වැලමිටියාවේ<br>සිරිධම්මරක්ඛිත හිමි |
| 14. | ධම්මපදට්ඨ කථා II | පන්නල සුමේධ හිමි |
| 15. | පරමත්ථදීපනී උදානට්ඨ කථා | ඩබ්.ඇල්.පී. ධර්මදාස මහතා |
| 16. | පරමත්ථදීපනී ඉතිවුත්තකට්ඨ කථා | ඇස්වත්තේ රේවත හිමි |
| 17. | පරමත්ථදීපනී සුත්තනිපාතට්ඨ කථා | නිමල් ලාල් රංජිත් මහතා |
| 18. | පරමත්ථදීපනී සුත්තසංගහට්ඨ කථා | ආඳාවල දේවසිරි හිමි |
| 19. | පරමත්ථදීපනී පේතවත්ථු අට්ඨකථා | විජිතනන්ද සරත්චන්ද්‍ර මහතා |
| 20. | පරමත්ථදීපනී විමානවත්ථු අට්ඨකථා | ජිනදාස ගොඩකන්ද මහතා<br>ලක්‍ෂපතියේ සමාධි මෙහෙණිය |
| 21. | පරමත්ථදීපනී ථේරගාථා I | හත්තොටුවේ ඉන්දරතන හිමි |
| 22. | පරමත්ථදීපනී ථේරගාථා II | පී.එල්.කේ. පෙරේරා මහතා |
| 23. | පරමත්ථදීපනී ථේරිගාථා | ජී.එස්.බී. සේනානායක මහතා |
| 24. | සාරත්ථ සමුච්චය චතුභාණවාරට්ඨ කථා | වටගෙදර විමලබුද්ධි හිමි |
| 25. | ජාතකට්ඨ කථා පළමුවන භාගය | යාලේගම චන්දකිත්ති හිමි |
| 26. | ජාතකට්ඨ කථා දෙවෙනි භාගය | ටී.ජී. ජයතිලක මහතා |
| 27. | ජාතකට්ඨ කථා තෙවෙනි භාගය | පල්ලේගම සමිත හිමි |
| 28. | ජාතකට්ඨ කථා සිව්වෙනි භාගය | මාවනානේ සෝමින්ද හිමි |

| | | |
|---|---|---|
| 29. | ජාතකට්ඨ කථා පස්වෙනි භාගය | මාවනානේ සෝමින්ද හිමි |
| 30 | ජාතකට්ඨ කථා සයවෙනි භාගය | සරත්චන්ද්‍ර අමරතුංග මහතා |
| 31. | ජාතකට්ඨ කථා සත්වෙනි භාගය | එච්.ජී.එස්. නිශ්ශංක මහතා<br>පී.එල්.කේ. පෙරේරා මහතා |
| 32. | සද්ධම්මපජ්ජොතිකා චූලනිද්දෙස අට්ඨකථා | නිමල්ලාල් රංජිත් මහතා |
| 33. | සද්ධම්මපජ්ජොතිකා මහානිද්දෙස අට්ඨකථා | හත්තොටුවේ ඉන්දරතන හිමි |
| 34. | විසුද්ධ ජනවිලාසිනී අපදානට්ඨ කථා I | සරත්චන්ද්‍ර අමරතුංග මහතා |
| 35. | විසුද්ධ ජනවිලාසිනී අපදානට්ඨ කථා II | දයා ගුණසේකර මහතා |
| 36. | මධුරත්ථවිලාසිනී බුද්ධවංස අට්ඨකථා | කීර්ති නාරම්පනාව මහතා |
| 37. | පරමත්ථදීපනී චරියාපිටකට්ඨ කථා | මැදඋයන්ගොඩ විජයකිත්ති හිමි |
| 38. | සමන්තපාසාදිකා විනයට්ඨ කථා I | අම්බලන්ගොඩ ධම්මකුසල හිමි |
| 39. | සමන්තපාසාදිකා විනයට්ඨ කථා II | අම්බලන්ගොඩ ධම්මකුසල හිමි |
| 40. | සමන්තපාසාදිකා විනයට්ඨකථා III | අම්බලන්ගොඩ ධම්මකුසල හිමි |
| 41. | කංඛාවිතරණී ප්‍රාතිමෝක්ෂ වර්ණනා | කපිල අභයවංස මහතා |
| 42. | නෙත්තිප්පකරණට්ඨ කථා | මැදගම්පිටියේ විජිතධම්ම හිමි |
| 43. | පරමත්ථදීපනී පංචප්පකරණට්ඨ කථා | බී.එම්.පී. බාලසූරිය මහතා |
| 44. | පරමත්ථදීපනී පංචප්පකරණට්ඨ කථා | බී.එම්.පී. බාලසූරිය මහතා |
| 45. | සම්මොහවිනොදනී විභංගට්ඨ කථා | බී.එම්.පී. බාලසූරිය මහතා |
| 46. | අත්ථසාලිනී ධම්මසංගණිප්පකරණට්ඨ කථා | සෝමරත්න ගම්ලත් මහතා |
| 47. | සද්ධම්මප්පකාසිනී පටිසම්භිදා මග්ගට්ඨ කථා | ඩබ්ලිව්.ඇල්.පී. ධර්මදාස මහතා |
| 48. | විසුද්ධි මාර්ගය පළමුවන කොටස | හේමචන්ද්‍ර දිසානායක මහතා |
| 49. | විසුද්ධි මාර්ගය දෙවන කොටස | හේමචන්ද්‍ර දිසානායක මහතා |
| 50. | කංඛා විතරණී මාතිකට්ඨ කථා | |

නමින් අටුවාවක් ඇත. එය කංඛාවිතරණී ප්‍රාතිමෝක්ෂ වර්ණනාව හා එකම සමාන බැවින් පරිවර්තනය කර නැත.



THE BO-TREE AT ANARAJAPOORA.

ටෙනන්ට් 1859

භදන්ත බුද්ධඝොෂාචාර්‍යපාදයන් අනුරාධපුර
ශ්‍රී මහා බෝධිය අසල ප්‍රදේශයෙහි වැඩවසමින්
සිහළට්ඨකථා පාලියට පරිවර්තනය කළ බව
බොහෝදෙනාගේ විශ්වාසයයි

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස්: 2736737
විද්‍යුත් තැපැල: bcc456@sltnet.lk, info@buddhistcc.com
www.buddhistcc.net

ISBN 978-955-1604-43-1